2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය: 2020.06.15 **වෙලාව:- ප ව. 1.15**

සටහන් කළේ:- ධම්මිකා පෙරේරා විසිනි

ගරු විනිසුරු මඩුල්ල:-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - **සභාපති**

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - **සාමාජික**

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - **සාමාජික**

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - **සාමාජික**

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - **සාමාජික**

<u>පෙනී සිටීම:</u>

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතිඥතුමිය සමඟ ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස්, චතුරංග බණ්ඩාර, දිලන්ත එස්.කළුදුරුවගේ සහ අරින්ද්‍ර ජයසිංහ යන මහත්ම මහත්මීන් පෙනී සිටි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අහරදගරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ජනාධිපති නීතිඥ ෂමිල් පෙරේරා මහතා කොමිසමේ සාක්ෂි විමසීමේදි පෙනී සිටීමට අවසර දෙන ලදි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පෙර දින සාක්ෂි දුන් සාක්ෂිකරු නැවත කැඳවයි.
ගරු ස්වාමීන් වහන්සේ වෙනුවෙන් නීතිඥ පෙනී සිටීම පෙර පරිදිය.
සම්පූර්ණ නම : පූජ්‍ය ගලගොඩඅත්තේ ඥාණසාර ස්වාමීන් වහන්ස
ප්‍රතිඥා දී කැඳවයි.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය:</u>

ප : අවසරයි හාමුදුරුවනේ, හාමුදුරුවනේ අපි පෙර දිනයේදී C638 වශයෙන් සලකුණු කරන ලද ලේඛනයක් තියෙනවා ඔබ වහන්සේගේ අවධානයට මම ඒ ලේඛනය නැවත යොමු කරනවා මේ අවස්ථාවේදි , මෙතාක් ඔබ වහන්සේ ලබා දුන්න සාක්ෂිවලට අනුව ශ්‍රී ලංකාව තුළ මතවාද සංවිධාන වශයෙන් සංවිධාන 4 ක් මතවාද වශයෙන් ගොඩ නැගී තිබෙන බවට ඔබ වහන්සේ සාක්ෂියක් කියවුණා.

(එම ප්‍රශ්නය නැවත යොමු කරන ලෙස සභාපති විනිසුරු දන්වා සිටී)

ඔබ වහන්සේගේ සාක්ෂියේ කියවුනා මතවාද වශයෙන් ශ්‍රී ලංකාව තුල මතවාද ප්‍රධාන වශයෙන් 4 ක් මේ වන විට ගොඩනැගී තිබෙන බවට පෙර දිනයේදි සාක්ෂියක් කියවුණා හාමුදුරුවනේ?

පි : ඔව්.

ප : ඒ කියන්නේ ඔබ වහන්සේ කිව්වා ජමාතේ ඉස්ලමී, ඉක්වාන් මුස්ලිම්, තවුහිද් ජමාත් සහ තබ්ලික් ජමාත් වශයෙන් මතවාද වශයෙන් වෙන් වෙන් වුවත් එකම කාරණාවන් වෙනස් විදියට කියන මතවාද 4 ක් මේ වන විට ඇතුලත්ව තිබෙනවා කියලා, එහෙමනේ හාමුදුරුවනේ?

පි : ඔව්.

ප : දැන් ඔය කාරණාවන් දීර්ඝ වශයෙන් විස්තර කෙරෙන ලේඛනයක් තමයි ඔබ වහන්සේ පෙර දිනයේදී මේ සභාවට ඉදිරිපත් කලේ C638 කියන ලේඛනය මත?

පි : ඔව්.

ප : එම ලේඛනයේ තියෙන කාරණාවන් ගැන පැහැදිලි කිරීමක් ලබා ගැනීම සඳහා මේ ගරු සභාවට හාමුදුරුවනේ මා මේ ප්‍රශ්න කිහිපය අහන්නේ, දැන් ඔබ වහන්සේ සඳහන් කරලා තිබෙන තබ්ලික් ජමාත් කියන සංවිධානය ශ්‍රී ලංකාව තුල පවතිනවාට පෙර පැවති ඒ ශ්‍රී ලංකාවට ඇතුල්වීමට පෙර ඔබ වහන්සේගේ තොරතුරු අනුව සොයාගැනීම් වලට අනුව කොහේද මූලාරම්භය ඇති වෙලා තියෙන්නේ?

FAIR COMMENT BY JEZEEM

පි : කියන්න පුළුවන්. තබ්ලික් ජමාත් සංවිධානය ඉන්දියාවේ තමයි ආරම්භය. තබ්ලික් කියන්නේ, තබ්ලික් කියන වචනයේ තේරුම ඉස්ලාමය පතුරුවා හැරීම ඒගොල්ලන්ගේ භාෂාවෙන් තබ්ලික්. එතකොට ගෙයින් ගෙට ගිහිල්ලා ඉස්ලාමය පිළිබඳ හඳුන්වාදීම තමයි ඒකට අපි කියනවා වීදී සංචාරය කියලා, වීදී සංචාරය කරමින් ඉස්ලාමයට කැඳවීම තමයි ඒගොල්ලන්ගේ 1 වෙනි අරමුණ. එතකොට තබ්ලික් ජමාත් නිකාය ලංකාවේ හුගාක් ප්‍රදේශවල පැතිරිලා තියෙනවා, ඇත්ත වශයෙන්ම ඒකට නිදර්ශකයක් කිව්වොත් මහනුවර දළදා මාලිගාවට අයිති පූජා භූමියක ගොඩ නගලා තියෙන මීරක්කන් පල්ලිය ඒක සුෆි මුස්ලිම්ස්ලට අයිතිව තිබුණු පල්ලියක්. නමුත් අද වන කොට එය පාලනය කරන්නේ තබ්ලික් ජමාත්වරු. අනුක්‍රමයෙන් ඒ සුෆි ධර්මය අදහපු ඒ ස්වදේශික සාම්ප්‍රදායික අපේ මුස්ලිම් සහෝදරත්වය පවා මේ තබ්ලික් නිකායිකයන් බවට පත් වෙලා තියෙනවා. ඔවුන් තමයි ඇත්ත වශයෙන්ම දැනට ලංකාවේ ඉස්ලාමීය ආගමික වියතුන් හැටියට පෙනී ඉන්න, මේ ප්‍රශ්න සාකච්ඡා කිරීම සඳහා යොදා ගන්න, ශ්‍රී ලංකා ජමියතුල් උලමා සංවිධානයේ බාගෙට බාගයක්ම තබ්ලික් ජමාත් අය. ඒ තබ්ලික් ජමාත් ඒ මතවාදය තමයි ඒගොල්ලෝ පෝෂණය කරන්නේ, ප්‍රවර්ධනය කරන්නේ සහ අනෙක් මුස්ලිම් සමාජයන් විවිධ නිකායන්ට බොහොම අහිංසක විදියට ආගම අදහගෙන හිටපු අය ඒ රැඩිකල් මුස්ලිම් මතවාදයට කැඳවන සංවිධාන අතර තබ්ලික් ජමාත් සංවිධානය ලංකාවේ ප්‍රමුඛ නාමයක් අරගෙන තියෙනවා.

ප්‍ර : හාමුදුරුවනේ ඔබ වහන්සේගේ පිළිතුරේ උලමා සභාව ගැන ගැබ් වෙලා තිබුණු බැවින්, මේ ගරු සභාවට කියන්න උලමා සභාවේ තබ්ලික් ජමාත් නියෝජනය කරමින් සිටින නායකයා වශයෙන් ඉන්නේ කවුද?

පි : රිස්වි මුක්ති. මට නම් මොකද ගොඩක් නම් තියෙනවා. එකම වාගේ නම් නිසා අපිට අවශ්‍ය නම් ඒ ලේඛනයම දෙන්න පුළුවන්. ඒ නිලධාරී මණ්ඩලයෙත් සාතිශය බහුතරයක් ඉන්නේ තබ්ලික් ජමාත්, ජමාතේ ඉස්ලාම් කියන මේ නිකායන් දෙකට අයත් අය.

ප්‍ර : ඒ අතරින් තබ්ලික් ජමාත් නායකයෙකු වශයෙන් උලමා සභාව නියෝජනය කරමින් සිටින ප්‍රධාන පුද්ගලයා රිස්වි මුක්ති?

පි : රිස්වි මුක්ති. මොකද ඔහු ෆත්වා නිකුත් කරලා තියෙනවා, විශේෂයෙන් මේ අපේ වැදගත් කොමිෂමට සිහිපත් කිරීමට කැමතියි ඇත්ත වශයෙන්ම රටේ මේ මුස්ලිම් ප්‍රශ්නයක් තියෙනවාය කියලා සාකච්ඡාවට දොරටු විවර කර ගන්න අපිට අවස්ථාව ලැබුණෙම මේ රිස්වි මුක්ති මහත්මයගේ අමනෝජ්‍ය

FAIR COMMENT BY JEZEEM

ක්‍රියාකලාපය නිසා. ඒක තමයි ඔය පළවෙනිම සිද්ධිය හලාල් සිද්ධිය. අපි ඒක දකින්නේ සමාජ බෙදුම් වාදයේ පළමු පියවර හැටියට. ඒ රිස්වි මුක්ති මහත්මයා දිගින් දිගටම මේ මතවාදය වෙනුවෙන් පෙනී ඉන්නවා පමණක් නොවෙයි සාමකාමීව තිබුණු මුස්ලිම් සමාජය යම් දෙදරවා හැරීමකට ලක් කලා කිව්වොත් නිවැරදියි. කිසිම සාකච්ඡාවකින් තොරව අපි කතා කලෝතින් බහුතර සමාජයේ කිසිදු එකඟතාවයකින් නැතුව යම් යම් කාරණා සමාජගත කිරීමට අන්තවාදයක් ලෙසින් සමාජ ගත කිරීමට ඔහු තමයි ඇත්ත වශයෙන්ම පළමු පියවර තැබුවේ.

ප : දැන් මේ උලමා සභාවේ තබ්ලික් ජමාත් නියෝජනය ප්‍රතිශතයක් වශයෙන් වැඩිපුරම සිටින්නේ තබ්ලික් ජමාත්ද කියන කාරණාව පිළිබඳව ඔබ වහන්සේට කීමට හැකියාවක් තිබෙනවාද?

පි : ඔව්.

ප : හාමුදුරුවනේ ඔබ වහන්සේට උලමා සභාවේ සංයුතිය ප්‍රමාණාත්මක වශයෙන් දැනීමක් තිබෙනවාද හාමුදුරුවනේ ඒ කියන්නේ කී දෙනෙක් ඉන්නවද?

පි : උලමා සංවිධානයේ ඒ මුල් අවස්ථාවේ අපි දැනගෙන හිටියේ 40 ගණනක් කියලා,

ප : සභාව වශයෙන්?

පි : සභාව වශයෙන්. තියෙන ගැටළුව තියෙන්නේ සමහර ඒ තොරතුරු හොයාගෙන යන කොට අද තියෙන එක නෙමෙයි හෙට. ඒගොල්ලෝ මොනවා හරි දේකට උත්තරයක් දෙනවා වෙනත් ආකාරයකට.

ප : එයින් තබ්ලික් ජමාත් නියෝජනය සැලකිය යුතු ප්‍රමාණයක් තියෙනවා කියන එක තමයි ඔබ වහන්සේ පවසන්නේ?

පි : ඔව් සැලකිය යුතු ප්‍රමාණයක් කියලා කියන්නේ ඇත්ත වශයෙන්ම අපි මුලින්ම මේ ඔය ප්‍රශ්න ඇති වෙන කොට අපිත් එක්ක සාකච්ඡාවට ආපු අපේ වගකිව යුතු මහානායක හාමුදුරුවන් වහන්සේලා පවා දැනුවත් කලා ඒ අවස්ථාවල. ඒ ආපු පිරිස කිව්වේ ඇත්තටම අර මහ සම්ප්‍රදායේ නැත්නම් රටේ සෑහෙන කාලයක් ප්‍රශ්නයක් ඇති නොකරගෙන අපිත් සමඟ ජීවත් වුණු සුෆී මුස්ලිම්වරුන්ට කිසිම ඉඩක් නැහැ කියලා. ඒගොල්ලන්ගේ මතයට කිසිම ඉඩක් නැහැ කියලා. ඒකෙන් අදහස් වෙනවා සම්පූර්ණයෙන්ම තබ්ලික් ජමාත්, ජමාතේ ඉස්ලාම්, ඉක්වාන් මුස්ලිම් වැනි මත දරන සියළු දෙනාම මෙහි නියෝජනය වෙනවා. ඊටත් උඩින් තමයි අර ශූරා සභාව පිහිටවා ගත්තේ.

ප : හාමුදුරුවනේ මේ උලමා සභාවේ මේ පරිවර්ථනය කොයි කාලේ සිදු වුණාද කියන කාරණාව ගැන ඔබ වහන්සේට කියන්න

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පුළුවන්ද? ඒ කියන්නේ සාම්ප්‍රදායිකව හිටි මවුලවිතුමන්ලා එහෙම නැත්නම් උලමාවරුන් අභිබවා මේ ඔබ වහන්සේ නම් සඳහන් කරන්නට යෙදුනු තබ්ලික් ජමාත්, ජමාතේ ඉස්ලමීක් සසහ ඉක්වාන් මුස්ලිම් මතවාද දරන උලමාවරුන්ගේ ආගමනය සිදු වුනේ කොයි කාලේ වගේද කියලා කියන්න පුළුවන්ද?

පි : 1980 අග භාගයේ ඔය සෞදි තානාපති කාර්යාලය ලංකාවේ පිහිටුවායින් පස්සේ ඒ ඇති වුණු, ඒ සෞදියත් එක්ක ඇති වුණු සබඳකම් එක්ක ඒ අය ඒ විශ්ව විද්‍යාලවලට යන්න අවස්ථාව උදා කරගෙන, ඒ විශ්ව විද්‍යාලවලින් උසස් අධ්‍යාපනය ලබලා මේ වහබි, සලෆි වැනි මතවාදත් එක්ක තමයි ලංකාවට ආවේ. ඒ වගේම සල්ලිත් අරගෙන. එතකොට අනුක්‍රමයෙන් අර සාම්ප්‍රදායික මුස්ලිම්වරු අත තිබුණු ඒ මුස්ලිම් සමාජය හසුරුවා ගැනීමේ බලය අනුක්‍රමයෙන් ඔවුන් අතට පත්කර ගන්නවා. එතකොට 1990 වාර්තාවක් තියෙනවා අපිට ඒක ගන්න අමාරුයි, එය ඇහින් දුටු සාම්ප්‍රදායික මුස්ලිම්වරු අපත් සමඟ පවසා තිබෙනවා දවටගහ පල්ලියේ ලේඛනයක් තියෙනවා පිටු 4 ක, අවුරුදු 80 ඉක්මවපු මවුලවි කෙනෙක් අර කාගෙත් ගෞරවයට පත් වෙච්ච වැඩිහිටි මවුලවි කෙනෙක් ලියපු මට දැන් බොහොම වයසයි මට තවදුරටත් මේ මැදපෙරදිගින් එන අන්තවාදී අදහස් සහිත වූ මේ පුද්ගලයන්ගේ ක්‍රියාකාරකම්වලට මුහුණ දෙන්න අමාරුයි, ඒ නිසා මම මෙතනින් සමු ගන්නවා කියලා ලේඛනයක් තියෙනවා. ඒ ප්‍රෙෂර් එකට ඔහුට මුහුණ දී ගන්න බැරි වෙලා තියෙනවා. ඒ වගේම මට පෙන්වන්න පුළුවන් අර එදා කිව්වා වගේම ෆත්වා එකක් නිකුත් කරලා තියෙනවා කාත්තන්කුඩියේදී සුෆී මුස්ලිම්වරු සහ උලමාවරු දරන මත වාදයත් එක්ක ඇති වුණු ගැටුමකදී වළලපු මිනිය පවා ගොඩ අරගෙන විනාශ කරන්න කියලා. ඒ දීපු ෆත්වා එකක් තියෙනවා ඒකට අදාල ලේඛනයක් මම ඉදිරිපත් කරලත් තියෙනවා. මට තත්පරයක් දෙන්න. ඒක තියෙනවා මගේ ලඟ, මම මැතිනියනි ඉදිරිපත් කරලා තියෙනවා ලේඛනයක්

(සාක්ෂිකරු ලේඛනයක් පෙන්වා සිටී)

මෙන්න මේ සටහනේ ඒ සියළුම කරුණු ටික අඩංගු කරලා ලේඛනයක් හදලා තියෙනවා. මෙක අපිට බාර දුන්නෙත් ඒ සාම්ප්‍රදායික මුස්ලිම් සහෝදරයෝමයි, ඒකේ පින්තූරත් එක්කම

ප්‍ර : එහෙමයි හාමුදුරුවනේ ඒ ලේඛනය ...

පි : සමාවෙන්න මැඩම් මේක කියවන්න පුළුවන් චුට්ටක්. ශ්‍රී ලංකා රජයේ ව්‍යවස්ථාවට මානව හිමිකම් 9 වන පිටුවේ. මෙවැනි ප්‍රචණ්ඩත්වය නිමා දැකීමට සුෆී මුස්ලිම්වරුන්ගේ මූලස්ථානය වන

FAIR COMMENT BY JEZEEM

කාත්තන්කුඩි අංක 5 බදා ජුම්මා දේවස්ථානයේ පරිපාලන සභාවටත් ඉස්ලාමිය මූල ධර්මවාදයේ නියෝජිතයන් ලෙස ....

(එම කොටස කියවයි)

ඒ කියන්නේ සාම්ප්‍රදායික මුස්ලිම්වරුන්ට ඒගොල්ලන්ගේ ප්‍රශ්න විසඳා ගැනීමේදී කිසිම සහායක් දීලා නැහැ මේ වර්තමාන උලමා සභාව.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදි ස්වාමීන් වහන්සේ විසින් සඳහන් කරන්නට යෙදුනු කාරණාවන් එනම් තබ්ලික් ජමාත් නියෝජනය උලමා සභාව තුල සිදු වුණු ආකාරය පිළිබඳව එහි ප්‍රවණ්ඩත්වයන් සම්බන්ධයෙන් වූ කාරණාවන්වලට ලේඛනයක ඇති කොටසක් කෙරෙහි ගරු සභාවේ අවධානය යොමු කරමින් එම කාරණාවන් සම්බන්ධයෙන් සාක්ෂි ලබා දෙන බැවින්, එකී ලේඛනය එහි සඳහන්ව තිබෙන්නේ කාත්තන්කුඩිහි මූලධර්ම වාදය හා සහරාන්ගේ ත්‍රස්තවාදයේ ඓතිහාසික දැක්ම වශයෙන් සඳහන් කර තිබෙන ලේඛනය මෙම සභාවට C644 වශයෙන් සලකුණු කොට ඉදිරිපත් කිරීමටත්,

මේ අවස්ථාවේදි ස්වාමීන් වහන්සේ ලබාදුන් සාක්ෂියට අදාල තොරතුරු ඇතුලත් කොටස එම ලේඛනයේ 9 වන පිටුවෙහි සඳහන් වන බැවින් එකී 9 වන පිටුව C644A වශයෙන් සලකුණු කිරීමටත් අවසර අයැද සිටිනවා.

පි : සමාවෙන්න 10 වන පිටුවෙත් තියෙනවා. ඒකෙත් සටහන් කරලම තියෙන්නේ ඉන්පසු 2016 වර්ෂයේ කාත්තන්කුඩි ජමියතුල් උලමා ප්‍රවණ්ඩත්වයට තුඩු දෙන මෙම පත්‍රිකා බෙදා හරින ලදි. ජමෙයිතුල් උලමා සංවිධානයෙන් letterhead එකෙන් බෙදපු පත්‍රිකාවකුත් තියෙනවා 10 වන පිටුවේ.

ඒ අනුව 9 සහ 10 පිටු දෙකටම අවධානය යොමු කරමින් C644A සහ B වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා.

ප්‍ර : දැන් හාමුදුරුවනේ ඔබ වහන්සේ මේ සඳහන් කරන්නට යෙදුනේ උලමා සභාවේ තබ්ලික් ජමාත්හි ආගමනයත්, එහි ඇතිව තිබෙන අර්බුදකාරී තත්ත්වය සම්බන්ධයෙනුත්. මේ සභාවට ඔබ වහන්සේට කීමට හැකියාවක් තිබෙනවද තබ්ලික් ජමාත් මත වාදය ආරම්භ වුනේ මොන රටකද කියන කාරණාව?

පි : ඉන්දියාවේ.

ප්‍ර : එහි නිර්මාතෘ හැටියට සඳහන් වන්නේ කවුද?

පි : තබ්ලික් ජමාත් සංවිධානයේ නිර්මාතෘ ඉල්ලියාස් කියල කෙනෙක්. රට ඉන්දියාව. ඒගොල්ලන්ගේ මතවාදය වර්ධනය වෙලා ගොඩ නගපු ලෝකයේ පුරාම විහිදුනු සංවිධානය තලෙයිබාන්

FAIR COMMENT BY JEZEEM

සංවිධානය. මේ අය තමයි නබීතුමා පවා ඒ කාලේ ආරක්ෂා කරපු මොකද බුද්ධාගම අවුරුදු 2000 ගණනක් වන කොට ඉස්ලාමය වයස ගොඩක් අඩුයිනේ. ක්‍රිස්තියානිවලටත් පස්සේ. ඉතින් ඒ නබීවරුන්ගේ කාලෙවත් බාමියන් බුදු පිළිම විනාශ කලේ නැහැ. නමුත් මේ තලෙයිබාන්වරු සම්පූර්ණයෙන් බාමියන් පිළිම විනාශ කලා. ලංකාවේ මූලස්ථානය මාර්කස් නමින් කොළඹ 14, ග්‍රෑන්ඩ්පාස් පිහිටුවලා තියෙනවා. එම මර්කස් පල්ලිවල තමයි අර ඊයේ පොත් එහෙමයි විකුණන්න තියෙන්නේ.

ප : එහෙමයි හාමුදුරුවනේ මම අහන්න ගිය ප්‍රශ්නය ඒකයි, ඔබ වහන්සේ පෙරේදා මෙම ගරු සභාවේ අවධානයට ලක් කල ග්‍රන්ථය ඔබ වහන්සේ සඳහන් කලා මාකස් පල්ලියේදී මිලදී ගැනීමටද පවා හැකියාවක් තිබෙනවා කියා, කියන්නේ ඔවුන් එම ග්‍රන්ථවල ප්‍රචර්ධන කටයුත්තක නියැලෙනවා කිව්වොත් නිවැරදි ද?

පි : ඔව්. තවමත්.

ප : දැන් ඔය මතවාදය දරන ශ්‍රී ලංකාව තුල ඇති කරගෙන තිබෙන සිවිල් සංවිධාන තියෙනවද?

පි : තබ්ලික් ජමාත් විතරක් නෙමෙයි අර මුලින් කියපු ප්‍රධාන ආගමික මතවාදවලට අදාලව සිවිල් සංවිධාන හැටියට ඔය නිඩා පදනම, සම්සම් Foundation වැනි ආයතන හුඟක් පිහිටුවලා තියෙනවා. අපි අර පෙන්නපු සංවිධාන 43 කොයි කොයි එකට සම්බන්ධ වෙනවද කියලා අපිට කියන්න බැහැ, මෙන්න මේක මෙහෙමයි කියලා, හැබැයි මේ ඔක්කොම අතර තියෙන්නේ අන්තර් සම්බන්ධතාවයක්. ඒක හරි අමාරුයි අර කිරෙන් දිය වෙන් කර ගන්නවා වගේ ස්වර්ණ හංසයෙකුට වගේ අපිට හරි අමාරුයි, නමුත් මේ ඔක්කොම එකම මත වාදයේ ඉන්නේ. එකම වැඩ පිළිවෙලක ඉන්නේ, එකම ආක්‍රමණයක ඉන්නේ.

ප : දැන් ඔබ වහන්සේ සඳහන් කරන්නට යෙදුනා තබ්ලික් ජමාත් මතවාදයේ ප්‍රධාන වශයෙන්ම කෙරෙන්නේ ගෙන් ගෙට ගොස් ආගම ප්‍රචාරය කිරීම කියන කාරණාව. දැන් මේක වෙන වචනයකින් කිව්වොත් හාමුදුරුවනේ අන්‍යාගමිකයන් ඉස්ලාම් ආගමට හරවා ගැනීමක් සිදු වෙනවා කියලා තබ්ලික් ජමාත් මතවාදය හරහා ඒක නිවැරදි ද හාමුදුරුවනේ?

පි : ඔව් ඒගොල්ලන් ඒකට යොදලා තියෙනවා. ඒක ඔය මුස්ලිම් වර්ඩ් ලීග් එකෙත් වෙනමම පරිච්ඡේදයක් තියෙනවා ඒගොල්ලන් රටවල්වලට ආධාර කිරීමේදි ඒකත් අපිට ඉදිරිපත් කරන්න පුළුවන් ඒගොල්ලෝ විශාල මුදලක් වෙන් කරනවා මේ දවා කිරීමට. දවා කරනවා කියලා කියන්නේ ඉස්ලාම් නොවන අය

FAIR COMMENT BY JEZEEM

ඉස්ලාම් ආගමට හරහා ගැනීම. ඒවා නොයෙක් ක්‍රම හරහා සිද්ධ කරනවා. එතකොට ඔය තබ්ලික් ජමාත් කියන එකේ අදහස අර මුස්ලිම් නොවන අය පමණක් නෙමෙයි සාම්ප්‍රදායික මුස්ලිම් අය පවා ඔවුන්ගේ මත වාදයට හරවා ගැනීම සිද්ධ කරනවා. ඒකට කියන්නේ ගස්තු ආගමික ප්‍රචාරය කියලා. ඒ කියන්නේ අර පල්ලියට එන්න කියලා ප්‍රචාරය කරනවා වගේම ගෙයින් ගෙට ගිහිල්ලා එන්න කියලා ආරාධනා කරනවා. ඒකට කියන්නේ ගස්තු ආගමික ප්‍රචාරක කටයුතු කියලා. ගෙයින් ගෙට ගිහිල්ලා ඒක කරන්නේ.

ප : හාමුදුරුවනේ ඔබ වහන්සේගේ සංවිධානය සතුව තිබෙනවාද සංඛ්‍යාවක් වශයෙන් එහෙම නැත්නම් සංඛ්‍යාත්මක වශයෙන් ශ්‍රී ලංකාව තුළ වෙසෙන අන්‍යාගමිකයන් ඉස්ලාම් ආගමට පසුකාලීනව හරවා ගත් ප්‍රමාණයක්, අහවල් ප්‍රමාණයක් හරවා ගැනීම් සිදු වී තිබෙනවාය කියන කාරණාවට අදාල සංඛ්‍යා ලේඛනයක් තිබෙනවාද ඔබ වහන්සේගේ සංවිධානයේ?

පි : ඔව් එහෙම එකින් එක අපි ලඟ තියෙන තොරතුරු සොයා ගැනීම් අනුව පහුගිය අවුරුදු 5 ට 8000 ක් විතර කියලා තමයි අපේ දැනුමේ හැටියට අපි හොයාගෙන තියෙන්නේ. හැබැයි තොරතුරු හැටියට අපි එකතු කරගෙන තියෙනවා සාමාන්‍යයෙන් නම් 1000 ට වැඩි ප්‍රමාණයක්, ඒවා හොයා ගත්තේ පත්තරවල නම පල කරන්න ඕනනේ වාසගම් වෙනස් කිරීම. උදාහරණයක් විදියට ඉනෝකා ප්‍රියදර්ශනී ෆාතිමා වෙනවා. ඒක දාන්න ඕන පත්තරේ. දැන් අපි හඬ නැගුවාම සිංහල පත්තරවල දාන එක නැවැත්තුවා. දැන් දෙමල පත්තරවල දානවා. ඉතින් ඒ දෙමල පත්තරවල දාපු නම් වෙනස් කරපුවා විශාල ප්‍රමාණයක් අපි ලඟ තියෙනවා. සිංහල පත්තරවල ගිහිපුවත් විශාල ප්‍රමාණයක් අපි ලඟ තියෙනවා. ඒ වගේම අපට පුර්වයෙන් මේ ඉස්ලාම් අන්තවාදය ගැන, ඉස්ලාම් අන්තවාදයක් රට තුළ ගොඩ නැගෙනවා කියලා ඇත්ත වශයෙන්ම පරිශීලනය කලයුතු පොත් දෙකක් තියෙනවා. එකක් තමයි ඇමතිවරයෙක් හැටියටත් කටයුතු කරපු ඒ චම්පික රණවක මහත්මයා පොතක් ලිව්වා අල්ජිහාද් අල්කයිඩා කියලා. ඊට පෙරාතුව පොතක් ලිව්වා අඩසඳ කළුවර කියලා සුජීත් අක්කරවත්ත නමින්. ඉතින් ඒ කෘතිවලත් මේ සිද්ධීන් දක්වලා තියෙනවා පමණක් නෙමෙයි මැදපෙරදිග ගිය සිංහල ජනතාවගෙන් 80000 ක් පමණ ඉස්ලාම් ආගමට හරවලා තියෙනවා. අපට දුරකතන, මොකද අපි රජයක් නෙමෙයිනේ මැතිනියනි අපිට තියෙන්නේ බොහොම සීමිත සම්පත් මේ දුප්පත් දායකයෝ දෙන දේකින් මේ හැම දේම කරන්නේ. නිසරන

FAIR COMMENT BY JEZEEM

අධ්‍යාසයෙන්. වෙන අපේ අභිලාෂයක් නැහැ මේ කොමිෂමේ සාක්ෂි දීලා සමහර වෙලාවට ඒ මාධ්‍යවල යම් යම් දේ පලවුනාමත් ඒක එක එක දේශපාලන කණ්ඩායම් ගන්නේ ඒගොල්ලන්ට ඕන හැටියට. අපේ කිසිම තුන් හිතකවත් නැහැ පක්ෂ දේශපාලන අරමුණක්. ඉතින් අපිට තිබුනේ මේ ඇත්ත ගවේශණය කිරීම පමණයි. ඉතින් මේ කරුණු දිගින් දිගටම හෙළිදරව් කරන කොට මැද පෙරදිග රස්සාවල්වලට ගියපු මිනිස්සු අපිට අනන්තවත් කතා කරලා තියෙනවා. උදාහරණයක් විදියට එරටේ අපි හිතමු මොනවා හරි වෙසක් කාඩ් එකක් බැරි වෙලා හරි ලඟ තියා ගත්තු කෙනෙක් මුල්ලාවරයෙකුට අහුවුනොත්, මුල්ලාවරු කියන්නේ සෞදියේ ආගමික පොලිසියේ වැඩ කරන අය. ඒ මුල්ලවරු ඔවුන් සමීපයට ඇවිල්ලා දෙන පලමුවෙනි option එක නැත්නම් පළවෙනි අවස්ථාව ඔවුන්ට දෙන්නේ ඔබලා ඉස්ලාම් වෙනවා නම් උසාවි දාන්නේ නැහැ. කස පහර ගහන්නේ නැහැ, පොලිසියට ගෙනියන්නේ නැහැ. ඉතින් මිනිස්සු කියන්නේ මැටි ගොඩවල් නෙමෙයි, මිනිස්සු අතින් යම් යම් වචන වැරදීම් වෙන්න පුළුවන්, නොයෙක් ක්‍රියාකාරකම්වල යෙදෙනවා මොනවා හරි දේකට හසු වුනොත් ඒ අය කස පහර නොකා මොකද එහේ දඩුවම් දරුණු නිසා ඒ අය මොකද කරන්නේ ඉස්ලාමයට නිකම්ම ගොදුරු වෙනවා. ඒකත් ඒගොල්ලන්ගේ එක ක්‍රමයක්. ඒ වගේම අපිට ඉදිරිපත් කරන්න පුළුවන් මේ තියෙන්නේ නම් වාසගම් වෙනස් කිරීම සම්බන්ධයෙන් මේ දවා කිරීමට එකතු කරලා තියෙන ලේඛන. මේ දෙමලෙන් තියෙන ඒවා. මහ ගොඩක් උස්සගෙන ආවේ නැහැ මේ තොරතුරු. හැබැයි ඔප්පු කරන්න අවශ්‍ය තරම් සියළු දේ තියෙනවා. නම් කොහොමද මේ ඉස්ලාම් ආගමට හැරෙව්වේ. මොකක්ද පදනම කියලා මේ සිතියමේ නිදහසට බාධා කරලා යම් යම් වරදාන දීලා ඉස්ලාමයට හරපු අවස්ථා අපි හඳුනාගෙන තියෙනවා. කුරුණෑගල ප්‍රදේශයේ අපි මේ ගැන දැනුවත් කරලා සමුළුවක් තිබ්බට පස්සේ එක මුස්ලිම් සාම විනිසුරුවරයෙක් ඔහු ආරම්භ කලා ඉස්ලාමයට ගොදුරු කර ගන්න අය දිවුරුම් ප්‍රකාශ දීලම හරවා ගත්තා. මම අද පටන් මේ නම වෙනස් කරනවා, ආගමත් වෙනස් කරනවා, අද ඉදලා මේ ෂරියා නීතිය අනුව තමයි මම කටයුතු කරන්නේ කියලා. ඉතින් ඒක ඇත්තටම සොයා බැලිය යුතු කාරණාවක්.

ප්‍ර : දැන් හාමුදුරුවනේ ඔබ වහන්සේගේ පිළිතුරේ ගැබ් වුණා අන්‍යාගමිකයන් ඉස්ලාම් දහමට හරවා ගැනීමට අමතරව තබ්ලික් ජමාත් මතවාදයේ සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් තබ්ලික් ජමාත් මතවාදයට හරවා ගැනීමේ ක්‍රියාවත් ඔවුන් සිද්ධ කරනවා කියලා?

FAIR COMMENT BY JEZEEM

පි : ඔව්.

ප්‍ර : දැන් තබ්ලික් ජමාත් මතවාදය කියන්නේ ඔබ වහන්සේගේ දැනීමට අනුව සාම්ප්‍රදායික මුස්ලිම් මතවාදයට පටහැනි මතවාදයක්ද?

පි : ඔව්. ඒ කියන්නේ අපේ රටේ ජීවත් වුණු සාම්ප්‍රදායික මුස්ලිම්වරු අපේ සංස්කෘතියට අනුගත වුණා. දැන් උදාහරණයක් විදියට අපේ රටේ බහුදේව වාදීන් ඉන්නවා. දැන් පිළිම වන්දනා කරන බෞද්ධයෝ විතරක් නෙමෙයි හින්දු අය, ක්‍රිස්තියානි අය, කතෝලික අය ඒ නොයෙක් අය පිළිම වන්දනාවේ යෙදෙන අය. දැන් අපි කවදාවත් අහලා තිබුනේ නැහැනේ පිළිමතලාවේ බුදු පිළිමය කැඩීම දක්වා ඔය නැගෙනහිර පළාතේ යම් යම් පුරාවස්තුවලට හානි කලා මිසක ඒවා නොදැනුවත්කම නිසා වෙන්න පුළුවන්, ඒගොල්ලන්ගේ භාෂාවේ දැනුමේ හැටියට. ඊට පෙරාතුවත් මේ රටේ මුස්ලිම් මිනිස්සු හිටියානේ. හැබැයි ඒගොල්ලෝ කවදාකවත් ගිහිල්ලා පිළිම කැඩුවේ නැහැ. සංවිධානාත්මකව ඒවා කලේ නැහැ. සංවිධානාත්මකව පහර දෙන්න ආවේ නැහැ. මොනවා හරි සිංහල, මුස්ලිම් දැන් මෑත කාලෙනේ මේ මොනවා හරි අපි හිතමු කෝ මත්පැන් බෝතලයක් කඩාගෙන මුස්ලිම් මිනිහයි, සිංහල මිනිහයි ඒක බීලා එළියට ඇවිල්ලා ඇගේ හැප්පුනොත් දෙන්නට දෙන්නා මේ තබ්ලික් කාරයෝ වහබිකාරයෝ මේ ඔක්කොම එකතු වෙලා මේක සිංහල මුස්ලිම් කෝලාහලයක් හැටියට තමයි හන්වඩු ගැහුවේ. හැබැයි එදා අතීතයෙත් ඕන තරම් ප්‍රශ්න ඇති වුණා. ඒවා මිනිස්සු විසඳා ගත්තා. ඒ කියන්නේ අපේ සංස්කෘතියට අනුගතව, මේ මහපොළවට අනුගතව තමයි මේ සුෆී මුස්ලිම් මිනිස්සු ජීවත් වුනේ. දැන් උදාහරණයක් විදියට බේරුවල දර්ගා නගරය කියනවා. දර්ගා කියලා කියන්නේ සොහොන් කියන එකයි. පැරණි සොහොන්. ඒ සොහොන් වන්දනාව කරන්නේ නැහැ වහබි අය, සලෆි අය, ඉක්වාන් මුස්ලිම් අය, ජමාතේ ඉස්ලාමී අය, තබ්ලික් ජමාත් අය, තවුහිද් ජමාත් අය පිළිම වන්දනා කරන්නේ නැහැ. එතකොට ඒ පිළිම වන්දනා කරපු ඔය නැගෙනහිර පළාතේ මුස්ලිම් මිනිස්සුන්ට දිගින් දිගටම ඒ පහරදීම් කරන්න පටන් ගත්තේ ඔය සහරාන් ඇතුළු කල්ලි කණ්ඩායම්. ඒවා වෙන කොට එහෙනම් ජමෙයිතුල් උලමා කට්ටියට තිබුණානේ ඒක නවත්වන්න. හැබැයි ඔවුන් ඒක නැවැත්තුවේ නැහැ. ඒකෙන් අදහස් වෙන්නේ ඔවුනුත් ඉන්නේ ඒ මතයේ. එතකොට සුෆී මුස්ලිම් මිනිස්සු දැන් මැතිනියනි මට ඉතාම වැදගත් තව එකක් තියෙනවා මේක මම ඉදිරිපත් කලොත් හොඳයි කියලා හිතෙනවා. වැඩි ඈතක නෙමෙයි මැතිතුමනි මේ

FAIR COMMENT BY JEZEEM

2020 පෙබරවාරි 07 වෙනිදා. මේක ඉතාමත් වැදගත් ලේඛනයක් Zahira Development Council, ZDC කියලා සහිරා සංවර්ධන කවුන්සිලය. සහිරා මහා විද්‍යාලය, වැලිපිටිය, වැලිගම. ඉතින් අපිට එවනවා Secretary BBS කියලා එවන්නෙත් නිකම්ම කෙනෙක් නෙමෙයි Scholar කෙනෙක්.ආචාර්ය එම්.ආර්.මොහොමඩ් Economist, අධ්‍යාපන චේදියෙක්, ඔහු කියනවා අන්තවාදී Vahabi ideas and Radical Teaching within the school premises. මේ 2020. මේ ලේඛනයත් මට ඉදිරිපත් කරන්න පුළුවන්. ඔහු ඉතා පැහැදිලිව දක්වලා තිබෙනවා සාම්ප්‍රදායික පාසලක් වන එම්.එච්.එම් ඉනෙයතුල්ලා වන වහබි විදුහල්පතිතුමාගේ අන්තවාදී බේරුවල ජාමියා නලීමියා මද්‍රසාවෙහි ඉගෙන ගත් වැලිගම, අළුත් වීදියේ පදිංචි සාහිල් සුහයිල් නමැති පුද්ගලයාව ගෙන්වා පාසල් කාලය තුල ශිෂ්‍යයන්ට විවිධ අන්තවාදී වහබ්වාදී දේශනා පවත්වා ඇත. වහබ්වාදය ව්‍යාප්ත කරන පොත් සහ පත්‍රිකා නොමිලේ පාසැල් භූමිය තුල පැවැත්වෙන වේලාවේ බෙදා දී ඇත. මෙය බරපතල වරදකි. වහබි අන්තවාදී මද්‍රසාවල ඉගෙන ගත් බේරුවල ජාමියා නලීමියා මද්‍රසා එතුමාගේ මද්‍රාසවට අදාල බාහිර පුද්ගලයන් ගෙන්වා අන්තවාදය ශිෂ්‍යයන් තුල ව්‍යාප්ත කිරීමට එතුමා කටයුතු කලහ. උදාහරණ වශයෙන් වැලිගම ගල්බොක්කේ ඉපදුන අන්තවාදී වහබි එම්.යූ.එල්. වාසිල් නමැති පුද්ගලයා සහ අළුත්වීදියේ පදිංචි මු න්සීර් යන අයට පාසැල් භූමියේ නිදහසේ කටයුතු කිරීමට අනුමැතිය දී ඇත. ඒ වගේ දිගට විස්තරය තියෙනවා මේ කොලය තියෙන හින්දා. තව එකක් පෙරේදා කියපු නමක් බේරුවල ජාමියා නලීමියා අන්තවාදී මද්‍රසාවෙහි ඉගෙන ගත් අය අන්තවාදී වහාබි දේශපාලන ආක්‍රමණයට අළුත් දේශපාලන පක්ෂයක් යටතේ NFGG, National Front for Good Governnence නිරත වී සිටින බව සහ එයට සහිරා මහා විදුහලේ සියළුම සම්පත් පාවිච්චි කිරීම බරපතල වරදකි. මොහු විදුහල්පති විමෙන් පස්සේ ඔහුට මේ වැඩ කර ගෙන යන්න දෙන්නේ නැහැ මේ 2020 පෙබරවාරි 7 වෙනිදා අපට එවලා තියෙන ලිපියක්.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදි ස්වාමීන් වහන්සේ සඳහන් කරන්නට යෙදුනු කරුණු ඇතුලත් සහිරා මහා විද්‍යාලය වෙල්ලපිටිය, වැලිගම ලිපි ශීර්ෂය මත සකස් කරන ලද විශාරද එම්.ආර්. මොහොමඩ් සහිරා විදුහලේ පාසැල් සංවර්ධන සභාව වෙනුවෙන් සකස් කරන ලද එම ලේඛනය මෙම සභාවට C645

FAIR COMMENT BY JEZEEM

වශයෙන් සලකුණු කොට ඉදිරිපත් කිරීම සඳහා අවසර අයැද සිටිනවා.

පි : ඒකේ වැදගත්ම දේ මැතිතුමනි සියළුම වගකිව යුතු ආයතනවලට දැනුම්දීලත් තියෙනවා. පොලිසියට, අධ්‍යාපන අමාත්‍යාංශයට Bar Association එකට, Human Rights කොමිෂමට, CID එකට, NGO සම්බන්ධයෙන් Research කරන ආයතනවලට, මුස්ලිම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ඔක්කොටම දැනුම්දීලත් තියෙනවා

ප්‍ර : පිටපත් යොමු කරලා තිබෙන බව පේනවා මේ ලේඛනයෙන්?

පි : හොඳමයි.

ප්‍ර : දැන් හාමුදුරුවනේ ඔබ වහන්සේ සඳහන් කරන්නට යෙදුන පිළිතුරේ මා ඇහුවේ තබ්ලික් ජමාත් සංවිධානය ගැන නමුත් ඔබ වහන්සේ දිර්ඝ වශයෙන් පැහැදිලි කරලා සඳහන් කරන්නට යෙදුනා තබ්ලික් ජමාත්, වහබ්වාදයට අදාල සංවිධාන, තවුහිද් ජමාත්, ඉහ්වාන් මුස්ලිම්වරුන් ඒ වගේම ජමාතේ ඉස්ලමීක් ඒ සංවිධාන හැම එකකින්ම පොදුවේ පිළිම වන්දනාව බැහැර කරනවා, සොහොන්වලට ගරු කිරීම බැහැර කරනවා කියන පොදු ක්‍රමවේදයක් ඔවුන් සියළු දෙනාටම පොදු ක්‍රමවේදයක් තිබුණා කියලා ඒක හරිද හාමුදුරුවනේ?

පි : ඔව්. මේ ඔක්කොම එකම දෙයියෝ නේ, එක දෙයියයි පාරවල් ගොඩයි දෙයියෝ ගාවට එක්ක යන්න. අවසානයේදි කෙටියෙන් කියන්න තියෙන්නේ මේ මුස්ලිම් ආක්‍රමණයේ දැන් මේක පටන් අරන් තියෙන්නේ.

ප්‍ර : හාමුදුරුවනේ ඔබ වහන්සේගේ පිළිතුරේ සඳහන් වූ එක දෙයියා කියන කාරණාව මේ අයගේ පිළිගැනීම වන Oneness of God එහෙම නැත්නම් එකම දෙවිවරයෙක් පමණයි සිටින්නේ කියන මතවාදයට ගමන් කරනවා කිව්වොත් හරිද හාමුදුරුවනේ?

පි : ඔව්, ඒ වෙනුවෙන් මේ අය සමහරු දැන් අපිට, මට මිනිත්තුවක් ලැබුනොත් දැන් අපි කොහොමද වහබ්වරයෙක් කෙනෙක් හඳුනා ගන්නේ. සලෆි කෙනෙක් හඳුනා ගන්නේ, ඉහ්වාන් මුස්ලිම්වරයෙක් හඳුනා ගන්නේ, සාම්ප්‍රදායික මුස්ලිම් මිනිහෙක් හඳුනා ගන්නේ කොහොමද. දැන් මුස්ලිම් සමාජයේ අපි දැක්කේ නැහැ මීට අවුරුදු 10 ට 15 ට කලින් අපි උදාහරණයක් විදියට යුධ සමයේ අපි දැක්කේ නැහැ මුස්ලිම් කාන්තාවෝ නිකාබය සහ බුර්කාව පළඳිනවා. අපි දැක්කේ නැහැ. සම්පුර්ණම මුහුණු වහන අර ගෝනිබිල්ලන් වැනි ඒ විදියට ප්‍රදර්ශණය කරන ඒගොල්ලන් අපි දැක්කේ නැහැ. ඒ මුස්ලිම් කාන්තාවෝ අර අඳුරු තැනක හිර කළා. ඒක එක ලක්ෂණයක්. වහබ් එක ලක්ෂණයක්. ඊලඟට ඒ

FAIR COMMENT BY JEZEEM

අය නියෝග කළා පුරුෂයන් නම් සම්පූර්ණම දිගට ලෝගුව ඇදිය යුතුයි. ඔවුන් ලෝගුව අඳින්න පටන් ගත්තා. ඊලඟට පිරිමි රැවුල වැවිය යුතුයි. රැවුල වවන්න පටන් ගත්තා. ඒ වහබි කට්ටිය. නිකන් අයත් රැවුල් වවනවා. නමුත් බහුතරයක් ඒගොල්ලන්ගේ ගුරුවරු වෙනම හඳුන ගන්න පුළුවන්. ඒ කියන්නේ රැවුළ කපන විදි තියෙනවා, රැවුල වවන විදි තියෙනවා. සමහරු රැවුළ තඹ පාට කරනවා. මේක මහා සාගරයක් වගේ. මේක හරි නම් අපි ලංකාව වගේ රටක් මේ පොඩි දූපත රැක ගන්න නම් වෙනම මේ කොමිෂම වගේම ඇත්ත වශයෙන්ම මේ රජයේ මුදල් යොදවලා වෙනම ආයතනයක් පිහිටුවන්න ඕන මේක research කරන්න. මේක ඒතරම් ම ගැඹුරු එකක්. මොකද මේගොල්ලෝ මේ බබාලා නෙමෙයි. පූස් පැටව් නෙමෙයි. මේගොල්ලොන්ගේ වැඩ පිළිවෙළ හරිම සූක්ෂමයි. හරිම සූක්ෂමයි. අර සාම්ප්‍රදායික මුස්ලිම් මිනිස්සු සොහොන් වලට යනවා, ඊලඟට සමහර වෙලාවට භාවනා කරනවා, ඒ වගේ ඒගොල්ලන්ගේ දැන් අපි ජිහාදය ගැන පෙරේදා කතා කලා ඒ සාම්ප්‍රදායික මුස්ලිම් මිනිස්සුන්ගේ ජිහාදය කියලා ඒගොල්ලෝ ජිහාදය අර්ථ කථනය කර ගත්තේ තමන් තුළ උපදින කෙළෙස් සතුරන් මර්ධනය කර ගන්න. හැබැයි මේ වහබි, සලෆි, ඉහ්වාන් මුස්ලිම්, ජමාතේ ඉස්ලාමි, තවුහිද් ජමාත්, අල්ෂබාබ් වැනි දැන් අපි මේ කතා කරන සංවිධාන 50 ට ආසන්න අයගේ මතය ඒක නෙමෙයි. ජිහාදය අල්ලාහ් වෙනුවෙන් සටහන් කරන්න මේක අල්ල ගන්න. එතකොට තමයි දෙවියන් ලඟ කන්‍යාවියන් 7 දෙනා ලබන්න පුළුවන්. ඉතින් ඒක නිසා මේක හරිම හොඳින් සීරුවෙන් විමර්ශනය කරන්න ඕන එකක්.

ප්‍ර : හාමුදුරුවනේ ඔබ වහන්සේ සඳහන් කරන මෙම තබ්ලික් ජමාත් ක්‍රමවේදයට සාම්ප්‍රදායික ඉස්ලාම් ක්‍රමවේදයෙන් බැහැරව රටතොට ඇවිල්ලා තියෙන මේ මතවාදය ප්‍රචාරය කිරීම සඳහා යම් වැඩ සටහන් ඔබ වහන්සේගේ සංවිධානයෙන් ඔබ වහන්සේ හඳුනා ගත් යම් විශේෂිත වැඩ සටහන් මේ වනවිට රට තුළ ක්‍රියාත්මක වෙනවද?

පි : විශාල වශයෙන්.

ප්‍ර : නම් වශයෙන් සඳහන් කරන්න පුළුවන් වැඩ සටහන් කිහිපයක් තිබෙනවාද?

පි : නම් වශයෙන් කියන්නේ දැන්..

ප්‍ර : මුස්ලිම් පල්ලි තුළම සිදුවන වැඩ සටහන් උදාහරණයක් වශයෙන් මහල්ලා තබ්ලික් වැඩ සටහන?

පි : පුළුවන්, වීඩියෝ පට තමයි තියෙන්නේ. නොයෙක් තැන්වල ඒ කියන්නේ ඒගොල්ලන්ගේ තබ්ලික් නිකාය විසින් පාලනය කරන

FAIR COMMENT BY JEZEEM

මොකද මැතිතුමනි මේක තේරුම් ගන්න ඉතාම වැදගත් වෙනවා ඔය යුධ ජයග්‍රහණයෙන් පස්සේ අපිට බටහිර රටවලින් විශාල බලපෑමක් ඇති වුණා මේ ජිනීවා සිද්ධිය. ඒ ජිනීවා සිද්ධියේදී බටහිර යුරෝපයේ රටවල් අපිට සහාය නොදෙන කොට මේ යුධ අපරාධ චෝදනා සම්බන්ධයෙන් මැදපෙරදිග රාජ්‍යයන් තමයි අපිට සහයෝගයට හිටියේ. අපි ඔවුන්ට ඒකට ස්තූතිවන්ත වෙන්න ඕන. ඒ මැදපෙරදිග රාජ්‍යයන්ගේ සහයෝගය අපට ලැබෙන කොට එවකට ආණ්ඩුවේ හිටපු එක්තරා ඇමතිවරයෙක් මේ උලමා සභාවේ නායකයන්ට දැනුම් දෙනවා අපට මැදපෙරදිග සහාය උවමනයි. එතකොට ඒ මැදපෙරදිගත් එක්ක ගණුදෙනු කරන්නේ මේ ආගමික වියතුන්නේ, ජමියතුල් උලමා. අන්න හොඳ අවස්ථාවක් උදාකර ගත්තා මේ දේශපාලන හයිය ලබා ගෙන ඒගොල්ලන්ගේ මතවාදය ලංකාව තුළ ප්‍රවර්ධනය කරන්න නැත්නම් මේ සාම්ප්‍රදායික මුස්ලිම් මිනිස්සු තමන්ගේ අණසකට යටත් කර ගන්න ඒ අවස්ථාව තමයි ප්‍රයෝජනයට ගත්තේ. එතකොට ඔවුන්ට අවස්ථාවක් ලැබුණා දැන් අපි මැතිනියනි ඔය ගලේවෙල, කළාවැව අනෙක් පැත්තෙන් හොරොව්පතාන මේ පැත්තෙන් ඔය හක්මණ, වලස්මුල්ල ආදී ප්‍රදේශවලට යන කොට අපි තාමත් දකිනවා බොහොම පුංචි පල්ලි, පුංචි ස්ථීකරයක්, සමහර විට ඒ වට පිටාවට විතරයි ඇහෙන්නේ, ඒ සාම්ප්‍රදායිකව තිබුණු ඒ පල්ලි. එක එක නිකායවල් තියෙනවා ඔකේ තරිකා කියලා තියෙනවා, එක එක නම් වලින්. ඒ වෙන් වශයෙන් බෙදිලා හිටපු ඒ ආගමික නිකායන් ඔක්කොම ජමෙයිතුල් උලමා සංවිධානයට එකතු කර ගන්න කියලා දේශපාලන හයිය ලබා ගත්තා මේගොල්ලෝ. ඒක තමයි ලංකාවේ වෙච්ච භයානකම දේ.

ප්‍ර : හාමුදුරුවනේ ඔබ වහන්සේට මේ මොහොතේ මම සුළු බාධා කිරීමක් කරනවා, ඔබ වහන්සේට හැකියාව තියෙනවද ඔබ වහන්සේ ඔය සඳහන් කරන්නට යෙදුන දේශපාලන නායකත්වය කවුද කියලා නමකින් සඳහන් කරන්න?

පි : නම කියන්න පුළුවන් ආයි අල්ලලා හිරේ දායි ද දන්නේ නැහැ, එහෙම රටක්නේ. මම ලියලා දෙන්නම්.

ප්‍ර : එහෙමයි හාමුදුරුවනේ.

පි : නම ලියලා දෙන්න පුළුවන්. ඔහු තමයි මේ විල්පත්තුව කපන එකටත් වගකියන්න ඕන. මොකද මේවා හෙළිදරව් කරන කොට තියෙන ලොකුම ප්‍රශ්නය තමයි ඔන්න විපක්ෂයේ අය කියනවා ආණ්ඩුවේ කොන්ත්‍රාත් එකක් කරනවා, ආණ්ඩුවේ පැත්තේ අය කියනවා මේ විපක්ෂයේ කට්ටිය වෙනුවෙන් වැඩක් කරනවා

FAIR COMMENT BY JEZEEM

කියලා, ඒ නිසා තමයි මේ මතය හරියට කියා ගන්න බැරි වුණේ රටට.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

මේ අවස්ථාවේදි සාක්ෂිකරුට ලේඛනයක් ලබා දෙන අතර, එහි ඔහු එම දේශපාලන නායකයාගේ නම සඳහන් කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරයි. මෙය ලඝු ලේඛිකාවට ලබා දෙන අතර, එය ගරු ස්වාමින් වහන්සේගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරක් වශයෙන් සටහන් විය යුතු බවට නියෝග කරමි.

****

පි : බැසිල් රාජපක්ෂ.

ප්‍ර : දැන් මා අසපු ප්‍රශ්නය වුනේ හාමුදුරුවනේ ඒ පල්ලි තුළ කෙරෙන, මුස්ලිම් පල්ලි තුළ කෙරෙන මේ මතවාදය ප්‍රචාරය කිරීමට යම් යම් විශේෂ වැඩ සටහන් තිබෙනවාද, ඔබ වහන්සේ ඒ ගැන සොයා බලා තිබෙනවාද? ඒ පිළිබඳ කරුණුවලින් දැනුවත් වෙලා තිබෙනවාද කියන ප්‍රශ්නයයි ඇහුවේ හාමුදුරුවනේ?

පි : ඒවා අපිට පින්තූරත් තියෙනවා පොඩි වෙලාවකදි දෙන්න පුළුවන්. ඒ අය දුප්පත් අයට උපකාර කිරීම, ඊලඟට වැඩිහිටියන් සම්බන්ධයෙන් වැඩ පිළිවෙලවල්, ලේ දන්දීම්, ඊලඟට ප්‍රජා සත්කාරක සේවා, ඒ වගේ සමාජ සේවා වැඩ වල හුඟක් නිරත වෙනවා.

ප්‍ර : ඔබ වහන්සේ ලබා දුන් ලේඛනයේ සඳහන්ව තිබෙනවා විශේෂ වැඩ සටහන් 3 ක්. මහල්ලා තබ්ලික් වැඩ සටහන, විල්ලා තබ්ලික් වැඩ සටහන සහ බ්‍රහස්පතින්දා පල්ලිය තුළ කෙරෙන මර්කස් වැඩමුළු කියලා වශයෙන්?

පි : ඔව්.

ප්‍ර : මේවා ශ්‍රී ලංකාව තුළ දැනටත් ක්‍රියාත්මක වෙන ඔබ වහන්සේ සඳහන් කරන්නට යෙදෙන තබ්ලික් ජමාත් මතවාදය ප්‍රචාරය කිරීම සඳහා පල්ලි හරහා ගන්නා ක්‍රියාදාමයක් කියන කාරණාව කියලා කිව්වොත් හරිද හාමුදුරුවනේ?

පි : ඔව් ඇත්ත වශයෙන්ම මේ සියල්ල ක්‍රියාත්මක වුයේ පල්ලි හරහාම තමයි. දැන් ඔය තබ්ලික් ජමාත් ක්‍රියාකාරීව හිටපු කෙනෙක් තමයි ක්‍රිංස්බරි හෝටලයට බෝම්බේ තිබ්බෙත්. ඉතින් ඒ අය හැම බ්‍රහස්පතින්දාවකම මර්කස් වැඩමුළු පවත්වනවා පල්ලිවල. ඊලඟට ඔය පල්ලි ඇතුලේ තියෙන සම්ප්‍රදායට එහාට ගිහිං

FAIR COMMENT BY JEZEEM

මිනිසුන්ගේ මතය වෙනස් කිරීම සඳහා මේ විල්ලා, තබ්ලික් වැනි වැඩසටහන් ඒගොල්ලෝ ක්‍රියාත්මක කරනවා.

ප : හාමුදුරුවනේ ඔබ වහන්සේගේ පිළිතුරේ ගැබ් වුණා ලේ දන්දීමේ වැඩ සටහන් සම්බන්ධයෙන් කාරණාවක්, ඔබ වහන්සේට කරුණක් වශයෙන් මේ ලේ දන්දීමේ ක්‍රියාවෙහි නිරත වෙන අය සම්බන්ධයෙන් වන ඡායාරූප මේ සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා විමර්ශන අංශයට, ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්ද හාමුදුරුවනේ ලබාදී තිබෙන ඡායාරූප සම්බන්ධයෙන්?

(මේ අවස්ථාවේදි සාක්ෂිකාර ස්වාමීණි වහන්සේ විසින් ඡායාරූපයක් පෙන්වා සිටි)

ප : ඔය ඡායාරූපයේ ඉන්නේ කවුද හාමුදුරුවනේ?

පි : මේ ඉන්නේ සහරාන්.

ප : ඔය කොහේදී සිදු කෙරුණු ලේ දන්දීමේ ව්‍යාපාරයක්ද, ඒ පිළිබඳ කරුණු ඔබ වහන්සේ දැනුවත්ද?

පි : මේක කාත්තන්කුඩියේ මෙතන NTJ කියලා දැන්වීම් පුවරුවක් තියෙනවා පල්ලෙහා දෙමළ කියවන්න බැරි නිසා එඩ්රස් එක කියවන්න අමාරුයි.

ප : කොයි කාලේ වගේ සිදු කෙරුණු ක්‍රියාවලියක්ද යන්න ඔබ වහන්සේට කියන්න පුළුවන්ද?

පි : ඔය පින්තූරය අපිට හම්බ වුනේ 2017 හෝ 2016

ප : ඔබ වහන්සේ ඔය ඉදිරිපත් කරලා තියෙන ඡායාරූපය මේ විමර්ශන අංශයට ඉදිරිපත් කරලා තියෙන ඡායාරූපයේ ඉහලින් සඳහන් කරලා තියෙනවා මේ ලේ දන් දීමේ මුවාවෙන් රැවටීමක් සිදු වුණා කියන කාරණාව. එය පැහැදිලි කිරීමක් කරන්න හාමුදුරුවනේ?

පි : ඒ කියන්නේ මැතිනියනි අපි ඔය මං මේ කරුණු ටිකක් දිග්ගස්සා ගන්නේ මේක මේ පහදා ගන්න ඕනේ නිසා. අපි දැන් ඔය හලාල් සිද්ධිය වෙලාවේ මැතිතුමනි අපි ඔය ලේ දන් දීම ගැන ප්‍රශ්නයක් මතු වුණාම ඒගොල්ලෝ කිව්වා අපි ලේ දෙන්නේ නෑ. ඒ අය ලේ දන් දීම් කලේ නෑ ප්‍රතිපත්තියක් විදියට.

ප : හාමුදුරුවනේ මෙහි වර්ණ ඡායාරූපයක් දැනටමත් මේ සභාව වෙත ලකුණු වී තිබෙනවා C 323 වශයෙන්. ඒ අනුසාරණයෙන් ඔබ වහන්සේට පැහැදිලි කිරීම කරන්න පුළුවන්.

පි : 2016 කාත්තන්කුඩියේ. මොකද අල්ටකියාව කියන වචනය රැවටීම කියන කාරණය අපි කියන්නේ ඒ අය ලේ දන් දුන්නේ නෑ ප්‍රතිපත්තියක් විදියට. අපි ඇහුවා ඕගොල්ලෝ අපිට හලාල් ලකුණු එකතු කරනවානම් අපෙන් ලේ ගන්නේ ඇයි. ඒකට

FAIR COMMENT BY JEZEEM

උත්තරයක් විදියට මේගොල්ලන් ලේ දන් දීම් පටන් ගත්තා. ඉතින් අපි මේ ඒක තමයි කියන්නේ අල්ටකියාව කියලා. දැන් අල්ටකියා කියන වචනය කිව්වා කියලා මට වෙනම නඩුවක් තියෙනවා. මේ වචනේ කිව්වා කියලා. ඒකත් ඒගොල්ලන්ට අපහාසයක් කියලා. අල්ටකියා කියන්නේ රැවටීම, මුලා කිරීම, අන්‍ය සමාජය වංචා කිරීම, අන්‍ය සමාජය නොමඟ යැවීම ඒක තමයි අල්ටකියාව. ඒ අල්ටකියාවට අදාල ලේඛනත් අපි ඉදිරිපත් කරලා තියෙනවා. ඒකේ අහනවා බොරු කියන්න පුළුවන්ද. බොරු කියන්න අවසර දීලා තියෙනවා.

දැන් වෙලාව ප.ව. 2.00 යි
මෙතැන් සිට වාර්තා කරන්නේ මුතුමාලී මෙනවිය විසින්ය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව : ප.ව.02.00 යි.
පෙර සටහන් ල/ලේ : ධම්මිකා මිය
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ගරු ස්වාමීන් වහන්ස පොඩි බාධා කිරීමක් කරනවා. ඔබ වහන්සේගේ සාක්ෂියේදී දැනට අධිකරණයක් ඉදිරියේ අසන ලද නඩු සම්බන්ධයෙන් මොකුත් කියන්න එපා.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය</u>

ප්‍ර : දැන් ඔබ වහන්සේගේ සාක්ෂියේ කියවුණා සාම්ප්‍රදායික වශයෙන් ඉස්ලාම් ධර්මයේ ලේ දන් දීමේ ක්‍රියාවලිය සාමාන්‍යයෙන් සිදු වන්නේ නැහැ කියා?

පි : ඔව්.

ප්‍ර : ඒකට පදනමක් තියෙනවාද හාමුදුරුවනේ ඒ කියන්නේ ඒ ඔබ වහන්සේගේ දැනීමේ හැටියට ඉස්ලාම් ධර්මයට පදනමක් තියෙනවාද කොහේවත් ලියවිලා තියෙනවාද එහෙම නැත්නම් එය සම්ප්‍රදායක් හැටියට විතරක් කෙරුන් නැති දෙයක්ද නැත්නම් ඔවුන්ගේ ආගමේ සඳහන් වෙලා තියෙනවාද ඔබ වහන්සේට ඒ සම්බන්ධයෙන් දැනීමක් තියෙනවාද හාමුදුරුවනේ?

පි : ඇත්ත වශයෙන්ම අපි අහලා තිබු අසා තිබෙන අන්දමට ඒ අය ලේ දන් දෙන්නේ නැහැ. ලේ දෙන්නේ නෑ. ඒ අපි අර හලාල් සිද්ධිය කාලේ මේක ප්‍රශ්න මතු කළාම තමයි ලේ දන් දෙන්න පටන් ගත්තේ.

ප්‍ර : ඒ අනුසාරයෙන් පැවැත්වූ ලේ දන්දීමේ ව්‍යාපාරයකට සහරාන් නැමැති පුද්ගලයා සහභාගි වූ අවස්ථාවක ඡායා රූපයක් හැටියටද හාමුදුරුවනේ මේ අවස්ථාවේ ඔබ වහන්සේගේ අවධානය යොමු කළ C 323 ලේඛනය හඳුන ගන්නේ?

පි : ඔව්. ඒ කියන්නේ ඔවුන් ඒකෙන් අදහස් කළේ අපි ඒ ගොල්ලන් අර අන්තවාදීන් කියලා හංවඩු ගැහුණාම ඒ අය කියන්නේ නෑ නෑ අපි අන්තවාදීන් නෙවේ. අපි ලේ දන් දෙනවා, සමාජ සේවා කරනවා ඕගොල්ලන් වගේම තමයි අපිත් එහෙම කියලා තමයි මේ මතවාදය එතකොට මිනිස්සු අතරට ගෙනියන්න ලේසිනේ. තමන්ගේ වැඩ පිළිවෙල මතවාදය මේවා හරහා ගෙනියන්න ලේසියි. ලේ දන් දෙන එක උතුම් ක්‍රියාවක්. ඉතින් නමුත් සහරාන් මේක පාවිච්චි කළේ අර සාමාන්‍ය සමාජයට අපි අන්තවාදියෝ නෙවේ අපි නියම ඉස්ලාමීය තමයි. නියම හදීස්

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

තමයි අපි අනුගමනය කරන්නේ . උඹලාත් ඒවා අනුගමනය කරන්න කියන පණිවිඩය ලබා දීමට මිනිස්සු අතරට යෑම සඳහා මේ අය විවිධ සමාජ ක්‍රියාකාරකම් ආරම්භ කළා.

ප : එහෙමයි හාමුදුරුවනේ දැන් ඔබ වහන්සේ මේ දක්වා පැහැදිලි කිරීම කළේ තබ්ලික් ජමාත් කියන මතවාදය ගෙන් ගෙට ගොස් ආගම ප්‍රචාරය කිරීම ඒ ආගමත් සාම්ප්‍රදායික ඉස්ලාම් ධර්මය නෙවෙයි. ඔවුන් ඔබ වහන්සේ සඳහන් කරන්නට යෙදුණු සොහොන් පිළිගැනීමක් නැති, පිළිම වන්දනාවට එක හෙළා විරුද්ධ වන සාම්ප්‍රදායික මුස්ලිම් සමාජයේ තිබූ ඉස්ලාම් ධර්මයට එහා අන්තවාදී මතවාද ප්‍රචාරය කිරීමේ ක්‍රමවේදයක් හැටියට ගිය තබ්ලික් ජමාත් මතවාදය ගැන ඔබ වහන්සේ මේ පැහැදිලි කිරීම කරමින් ඉන්නේ මේ දක්වා?

පි : ඔව්.

ප : ඊළඟට හාමුදුරුවනේ මේ තවුහිද් ජමාත් මතවාදය එය ප්‍රධාන වශයෙන්ම සම්බන්ධ වෙන්නේ ජාත්‍යන්තර වශයෙන් ගත්තොත් මොන මතවාදයකටද තවුහිද් ජමාත් මතවාදය හාමුදුරුවනේ?

පි : තවුහිද් ජමාත්

ප : එහෙමයි හාමුදුරුවනේ.

පි : තවුහිද් ජමාත් සංවිධානයේ නිර්මාතෘවරයා අබ්දුල් වහාබ්. එතකොට එය ආරම්භ වුණේ සවුදියේ. ඒ මතවාදයෙන් ගොඩ නගපු ත්‍රස්ත සංවිධානය අල්කයිඩා. මේ තවුහිද් කියන වචනය මේක පොත සහීර්අල් බුහාරී ඒ ඔක්කොම ගෙනල්ලා තියෙනවා. තවුහිද් යනුවෙන් ආකාර 04 ක් අදහස් කෙරේ. අල්ලාහ් මුළු මහත් විශ්වයේම ආධිපත්‍ය දරන බවට විශ්වාසය තැබීම කෙටියෙන්ම කිව්වොත්. ඊළඟ එක අල්ලාහ් හැර නැමදුම් ලැබීමට අන් කිසිවෙකුටත් අයිතියක් නොමැති බවට විශ්වාසය තැබීම. ඒ වගේම.....

ප : හාමුදුරුවනේ ඔබ වහන්සේ ඒ සඳහන් කළේ තවුහිද් ජමාත් මතවාදය ඇතුළත් පොතකින්ද ඔය කරුණු සඳහන් කළේ?

පි : ඔව් ඒ කියන්නේ මැතිනියනි දැන් මේ අබ්දුල් වහබ්ගේ මේ වහබිසම් ගෙන්නේ.

ප : එහෙමයි.

පි : එතකොට ඒ අබ්දුල් වහබ් කියන්නේ මේ හදීස් තමයි ජීවන මාර්ගය. මේක අනුගමනය කළ යුතුයි. ඒ අනුව තමයි මේ තවුහිද් මතවාදය හරහා මේ සංවිධාන බිහි වෙලා මේ හදීසයන් මුස්ලිම් සමාජය තුළ ජනගත කරමින් දෙවියන්ට මේ ලෝකය යටත් කරන වැඩසටහනේ මේ ඉන්නේ. ඒ වෙනුවෙන් තමයි අර කියපු සියළු ත්‍රස්ත කල්ලි බිහි වෙලා තියෙන්නේ.

FAIR COMMENT BY JEZEEM

ප : හාමුදුරුවනේ පැහැදිලි කර ගැනීමක් සඳහායි මා මේ ප්‍රශ්නය අහන්නේ. හදීස්වල තිබෙන ප්‍රශ්නයක්ද හාමුදුරුවනේ හදීස්වල පරිවර්තනයන්හි තිබෙන ප්‍රශ්නයක්ද මෙහි තිබෙන්නේ?

පි : Original එකෙත් එහෙමයි. මේ පොත් ටික ගත්තොත් සමහර ඒවා තියෙනවා මුල් පරිච්ඡේදය යටට දානවා. යට පරිච්ඡේදය උඩට දානවා. මැද එක අගට දානවා. හැබැයි ඔක්කොම ටික එකට අරගෙන බැලුවොත් එකම අදහස. ඒක වෙනස් කරන්න බෑ. ඒ දෙවියන්ගේ නීතිය. මම දැන් තවුහිද් ජමාත් සංවිධානය අදාළව මට අවසර ලැබෙනවා නම් මැතිනියනි මේ වේලාවේම මේක ඉදිරිපත් කරන්න පුළුවන් නම් අපිට පහසුයි. ලංකාවේ තවුහිද් ජමාත් ව්‍යාපාරයේ තියෙන කොච්චර දුරට මේ ගොල්ලොන්ගේ මේ අදහස් රැඩිකල්ද කියලා ඔබතුමියලාට බලන්න පුළුවන්. අපිට අවස්ථාවක් මේ ලබා දුන්නොත්. ඒ වගේම තවුහිද් කියන්නේ මොකක්ද කියලා තවදුරටත් වචනයේ දැන් මේ පොත් පිංච මැතිතුමනි සිංහලෙන් තියෙනවා ඇතුලේ. අරාබියෙන් තමයි තියෙන්නේ Address. හැබැයි තවුහිද් ගැන මේක කියෙව්වොත් බය හිතෙනවා ඇතුළේ කරුණු. ඒ නිසා මේ පොත මට නැවත ලැබෙන්න පිටපතක් මේවා කර ගන්නවා නම් වැදගත් කියලා හිතනවා. මේ තවුහිද් කියන එක තවත් තේරුම් ගත්තොත් එතකොට මේක ලේසියි. "ක්‍රිස්තු දහම ක්‍රිස්තුස් වහන්සේ නමින්ද, බුද්ධාගම බුදුන් වහන්සේගේ නමින්ද, මාක්ස් වාදය කාල් මාක්ස්ගේ නමින්ද ව්‍යවහාර වේ. හින්දු ආගම හා යුදෙව් ආගම ඒ ඒ ආගම උපත ලැබූ සමාජයන්ගේ නමින් ව්‍යවහාර වේ. ඉස්ලාමය එවැනි ආගමක් නොවේ. එයට තනි මිනිසෙකු හෝ සමාජයක් සමඟ කිසිම විශේෂ බැඳීමක් නැත. මොහොමඩ් තුමාගේ නමින් ද එය පැවත එන්නේ නැත." මේ තවුහිද් කියන එකයි මේකේ උපුටලා ගන්න ඕනී. මොකද නබිතුමාටත් මෙයා respect කරන්නේ නෑ. "ඉස්ලාම් යන්නෙහි තේරුම කීකරු වීම. අවනත වීම යනු වේ. එයට ශාන්තිය සාමාදානය නම් අල්ලාහ්ට සම්පූර්ණයෙන් කීකරු වී ජීවත් වන්නේ නම්, ඉස්ලාම් අනුව ක්‍රියා කරන්නේ නම් ඔහු කරා ශාන්තිය හා සාමාදානය ළඟා වන්නේය. දෙවියන් රාශියක් ඇදහීම පිළිගන්නේ නැත. පිළිම, පින්තූර, ගස්, ගල්, ගින්දර, ඉර, හඳ මිනිසුන් කෙරේ වැඳ වැටීමක් නැත. භාර වීමක්ද නැත. මිනිසාගේ ස්වභාවික වුවමනාවන්ට විරුද්ධ නොවී නිසි ලෙස ලබා දෙන ආගමකි. දේශ භේදයක් නැත. ඇත්තේ එකම දෙවි අල්ලාහ් පමණකි. එකම මිනිස් සමාජයක්ය. එම නිසා

FAIR COMMENT BY JEZEEM

මුළු මිනිස් සමාජයම අවනත විය යුත්තේ එකම දෙවියන් වූ අල්ලාහ්ට පමණයි." මේ තමයි තවුහිද් .

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී ස්වාමිනි වහන්සේ අවධානය යොමු කරමින් කියවනු ලැබූ කොටස් ඇතුළත් පොත් දෙකක් මෙම සභාවට සළකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයැද සිටිනවා. එම පොත් දෙකෙහි මුල් පිටපත් ස්වාමින් වහන්සේ ඉල්ලා සිටින බැවින් මෙහි පිටපත් රඳවා තබා ගනිමින් සළකුණු කිරීමට යටත්ව "ලා ඉලාහා ඉල්ලල්ලාහ්" වශයෙන් නම සඳහන් වන කර්තෘ අබ්දුල් කරීම් අල්දීවාන් සිංහලෙන් අබූ ශා ඉරා මුහම්මදු හුසෙන් වශයෙන් නම් සඳහන් වන ප්‍රකාශකයාගේ නම අරාබි භාෂාවෙන් සඳහන් වන පොත RGG 29 වශයෙන් සළකුණු කිරීම සඳහාත්

පි : ඒ වගේම මැතිනියනි මේ පොත් හතර අදයි මේ මිලදී ගත්තේ. මේ බුහාරී පොත් හතරම අපි ලබා දෙනවා. මේකේ සම්පූර්ණයෙන්ම ඒක දේව වාදය තමයි තියෙන්නේ.

ප්‍ර : මේ පෙර දිනයේදී සඳහන් කරපු ලේඛනයම නේද හාමුදුරුවනේ?

පි : ඔව් ඒ ටිකයි දෙකයි. තව දෙකක් තියෙනවා. මේ තියෙන්නේ සිංහලි කියලා වෙනම ගහලා එවන්නේ අපිට.

සලාත් යන මාතෘකාව යටතේ සකස් කිරීම එස්.එම්.මන්සූර් වශයෙන් සඳහන් කරමින් The Cooperative office for call and foreigners guidance at sulthana ප්‍රකාශනය කැඳවීමේ හා මඟ පෙන්වීමේ සහයෝගී කාර්යාලය අල්බදීයා සමාජ ඒකකයේ රියාද් සවුදි අරාබියාව වශයෙන් 1993 ප්‍රකාශයට පත් කරන ලද මෙම පොත RGG 30 වශයෙන් සළකුණු කිරීමට අවසර අයැද සිටිනවා.

පි : ඒ වගේම මැතිතුමනි මට තව අපේ රටේ සැමට ඉස්ලාම් අ.පො.ස. උසස් පෙළ අභ්දීයා සහ ධර්මාචාරී පළවෙනි කොටස පොත් 03 ක් තියෙනවා. මවුලවියා එම්.අයි.එස්. සුහාරා ඉස්ලාහී බී ඒ උසස් පෙළට මේ පොත හඳුන්වලා දෙන්නේ. මවුලවියා මවුලවි එම්.එල්.එම්.ඊබ්‍රහීම් එම්.ඒ. හිටපු කථිකාචාර්ය පේරාදෙණිය විශ්ව විද්‍යාලය අධ්‍යක්ෂක තන්වීර් ඇකඩමිය අපි පෙරේදා තන්වීර් පෞද්ගලික ජාත්‍යන්තර පාසලක් ගැන මතක් කළා. මේ ඔප්පු වෙනවා. එතකොට

ප්‍ර : ඔව් .

පි : මේ අ.පො.ස. උසස් පෙළ සඳහා සැමට ඉස්ලාම් නමින් පළවෙනි කොටස යටතේ පොතේ තවුහිදය ගැන කියලා තියෙන්නේ කොහොමද? තවුහිදයට විත කරන වෙනත් චින්තනයන් තවුහිදය කියලා කියන්නේ ඒක දේවවාදය. ඒක දේවවාදයට තියෙන

FAIR COMMENT BY JEZEEM

ප්‍රශ්නය. ඒක දේවවාදය පිළිබඳ හැදෑරීමේදී එයට චින කරන ප්‍රතිවිරුද්ධ වෙනත් චින්තනයන් 05 ක් හඳුනා ගත හැකිය. එවැනි ප්‍රතිවිරුද්ධ දේව ප්‍රතිපත්ති පහම වැරදි ප්‍රතිපත්තීන් බව අල්කුර්ආනයේ පෙන්වා දෙන අතර එවැනි අන්ධ දේව භක්තිකයන් තවුහිදය වෙත කැඳවනු ලබයි. ඒවා මෙලෙස නම් වේ. ඒ කියන්නේ ඒක දේව වාදයට කැඳවනවා අපිව. පිළිම වන්දනාව, බහුදෙවිවරු වන්දනාව, අල්ලාහ්ට පරපුරක් නම් කිරීම ඒක නිසානේ convention කරන්නේ. මිනිස් දෙවිවරු ලෞකික ආශාවන් දෙවියන් කර ගැනීම. මේ ඔක්කොම ඒක දේවවාදයට කැඳවනවා. උඹට පිළිම වන්දනාකරුවන් මරාගෙන මැරුනොත් කන්‍යාවියන් 72 ක් දෙනවා කියලා ඔළුව සකස් කරනවා. ඉතින් මුන් මරනවා. ඉතින් අපි අවුරුදු දෙදහස් ගාණක ධර්මයක් අදහන මිනිස්සු මේක ඊට හුඟාක් කාලේකට පස්සේ ආගමක් නිසා මැරුම් කන්න ලෑස්ති නෑ අපි. ඊළඟට ඒ පොතේ 64 වෙනි පිටුවේ කියනවා මුර්දත්වරුන්ගේ දත්තත්වය. කවුද මේ මුර්දත්වරුන් කියලා කියන්නේ. ඉස්ලාමයට පිටුපා ගිය අය. දැන් මේ ඉගැන්වීම් තබලික් ජමාත් වහබි සලෆි මතවාද දරුණු නිසා ඒවාට පිටුපා යන මුස්ලිම් අයට මේ වෙනුවෙන් මේවාට එරෙහිව නැඟී හිටින්න බැරි හේතුව තමයි මෙන්න මුර්දත්වරුන්ට උදා කරන තත්ත්වය. මොකක්ද යමෙකු රිද්දත් කළ බව සැලවූ වහාම රිද්දත් කරනවා කියලා කියන්නේ ඉස්ලාමයට පිටු පා යෑම. යමෙකු රිද්දත් කියන වචනය අපි දන්නේ නැනේ රිද්දත් කළ බව සැලවූ වහාම ඒ කියන්නේ ඉස්ලාමයට පිටුපා ගිය බව සැලවූ වහාම ඔහුට තවුබා කරන මෙන් ආයාචනා කළ යුතුය. තවුබා කරනවා කියලා කියන්නේ පාපොච්චාරණය කරන්න ඕනේ. මම ගියා ඔව් මේක අතහැරලා කියලා. දින තුනක් ඇතුළත ඔහු තවුබා කළේ නම් පාපොච්චාරණය කළේ නම් ඔහුගේ තවුබා පිළිගනු මැනවි. දවස් තුනයිනේ. කමක් නෑ ආපහු ආවානේ. නැත්නම් මොකද කරන්න කියන්නේ තවුබා කිරීම ප්‍රතික්ෂේප කළහොත් ඔහුව මරා දැමීම වගකීමකි. යමෙකු ආගම අතහැර ගියේ නම් ඔහුව මරා දමන්න. බුහාරී ඔය පොත් වල තියෙන්නේ. ඉතින් මේක තියෙන්නේ සිංහලෙන් අ.පො.ස උසස් පෙළට උගන්වන්නේ. ඔහුගේ සත් ක්‍රියා සියල්ලම පරලොවදී පිළිනොගැනේ. ඔහුගේ දේපලවලින් ඔහුට හෝ ඔහුගේ ඥාතීන්ටද කොටස් අයිති නොවේ. 64 වෙනි පිටුව. මේකේ මෙතන තවත් විස්තර දක්වලා තියෙනවා. මේ තවුහිද් කියන්නේ ඒක දේවවාදය කියන එකත් මේකේ තහවුරු කරලා තියෙනවා 115 පිටුවේ. ඒ පොතේ 36 වෙනි පිටුව, 64 වෙනි පිටුව, 115 පිටුව, 116 පිටුව.

FAIR COMMENT
BY JEZEEM

ප : හාමුදුරුවනේ මේකේ මේ ඔබ වහන්සේ සඳහන් කළා එකම දෙවියෙක් සහ ඔහු පමණක් පිළිගත යුතුයි කියලා පිටුවක් සඳහන් කළා?

පි : මේ තියෙන්නේ මැඩම්.

ගරු සභාපතිතුමනි මේ වන විට ස්වාමීන් වහන්සේ සළකුණු කිරීමට යෙදුණු RGG 30 පොතෙහි මුළු මිනිස් සමාජයම අවනත විය යුත්තේ එකම දෙවියන් වූ අල්ලාහ්ට පමණක් යනුවෙන් සඳහන් කර තිබෙන පිටුව පළවෙනි පිටුව හැටියටයි තිබෙන්නේ අංක කිරීමේදී එම කොටස RGG 30 (A) වශයෙන් සළකුණු කිරීමට අවසර අයැද සිටිනවා.

ඒ වගේම සැමට ඉස්ලාම් වශයෙන් අ.පො.ස. උසස් පෙළ අභිදීයා සහ ධර්මාචාරී කොටස 01 යන නමින් Islamic Book House අංක 77, දෙමටගොඩ පාර , කොළඹ 09 විසින් ප්‍රකාශිත මවුලවියා එම්.අයි.එස්.සුහාරා විසින් රචිත පොත මේ අවස්ථාවේදී RGG 31 වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා. එකී පොතෙහි ස්වාමීන් වහන්සේ සඳහන් කරන ලද කරුණු ඇතුළත් 36 වෙනි පිටුව RGG 31 (A) වශයෙන්ද, 64 වෙනි පිටුව RGG 31 (B) වශයෙන්ද, 115 පිටුව RGG 31 (C) වශයෙන්ද , 116 පිටුව RGG 31 (D) වශයෙන්ද සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා.

පි : ඒ වගේම අර එදත් පෙන්නපු ඉස්ලාම් ධර්මය 07 පොතේ 95 වෙනි පිටුවේ හරි අපූරු කියමනක් කියලා තියෙනවා ලස්සන වදන් පෙළක්. හදීස් හදාරා යහගුණ ඇත්තෝ වෙමු මේ පොතේ. එතකොට කොච්චර ලස්සනද මේ පොතේ අමුවෙන්ම තියෙනවා හදීස් හදාරා යහගුණ ඇත්තෝ වෙමු. හැබැයි හදීස් මොනවාද කියලා කියන්නේ. හදීස් බලන්න වෙන්නේ එතකොට අවධානය දෙනවා ළමයාගේ ඔළුවට මේ ළමයා බලනවානේ හදීස් කියන්නේ මොනවාද කියලා ඉතින් හදීස් කියන්නේ මේ ඔය පොත් හතර. ඕක තියෙන්නේ ගහපන්, මරපන්, කපපන්, කොටපන්, අනිත් අයගේ දේවල් අල්ලගනින්, පිළිම විනාශ කරපන් ඒවා තමයි තියෙන්නේ. ඉතින් එතකොට කොහොමද යහගුණ ඇත්තෝ වෙන්නේ. අදහස දෙනවා හදීස්වලට. මේ නලිමිලාගේ වැඩ. 95 වෙනි පිටුව.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී ස්වාමීන් වහන්සේ අවධාණය යොමු කරන ඉස්ලාම් ධර්මයේ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් ප්‍රකාශිත 2011 වර්ෂයේ සිදු කරන ලද මුද්‍රණය සහිත රජයේ පෙළ පොත මෙම සභාවට RGG 32 වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා. එම පොතෙහි ස්වාමීන් වහන්සේ අවධානය යොමු කරන ලද හදීස් හදාරා යහගුණ ඇත්තෝ වෙමු යන

FAIR COMMENT BY JEZEEM

කාරණාව ඇතුළත් 95 වෙනි පිටුව RGG 32 (A) වශයෙන් සලකුණු කිරීමටත් අවසර අයැද සිටිනවා.

ප්‍ර : දැන් හාමුදුරුවනේ මා නැවතත් මේ පැහැදිලි කිරීමේ ඔබ වහන්සේට

පි : මේකත් දීලාම ඉන්නම්. කමක් නෑ නේද. තවුහිද් ගැන කියන නිසා මොකද පැහැදිලි කර ගන්න. මැතිතුමනි මේ 2016 නොවැම්බර් මාසේ 13 වෙනි ඉරිදා ලංකාදීප පුවත්පතට තවුහිද් ජමාත් සංවිධානයේ ලේකම් අබ්දුල් රාසික් කියන පුද්ගලයා ඔහුගේ Article එක මේ තියෙන්නේ. මුස්ලිම් ජනතාවට ඉස්ලාම් ධර්මයේ කරුණු හරියට උගන්වන්නයි අපි ආවේ. තව තැනක කියනවා දවටගහ පල්ලියේ තියෙන සොහොන් වන්දනාවටත් අපි විරුද්ධයි. ඒ කියන්නේ සුපියා අයට විරුද්ධයි කියන එකනේ. එතකොට අහනවා ඕගොල්ලොන්ගේ සාමාජිකයන් කීයක් ඉන්නවාද. අපේ නායකයො 09 දෙනෙක් ඉන්නවා ශාඛා 90 ක් තියෙනවා ලියා පදිංචි සාමාජිකයෝ 10000 ක් ඉන්නවා. ඊළඟට තුන්වෙනියට ප්‍රශ්න අහනකොට මේ සංවිධානයේ කොච්චර සාමාජිකයෝ ඉන්නවාද. එතන කියනවා ශාඛා 90 ක් අපිට තියෙනවා ලියා පදිංචි සමාජිකයන් 10000 ක් විතර ඉන්නවා. ලියා පදිංචි නොවූ සාමාජිකයන් 50000 ක් විතර ඉන්නවා. ඒ නිසා මේ පත්තරේ මේ පිටුවටත් අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා. 2016 නොවැම්බර් මාසේ 13 වෙනි ඉරිදා ලංකාදීප පත්තරේ 18 වෙනි පිටුව.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී ස්වාමීනි වහන්සේ ඉදිරිපත් කළ 2016 නොවැම්බර් මස 13 වෙනි ඉරිදා ලංකාදීප පුවත්පතෙහි 18 වෙනි පිටුවෙහි එම ලේඛනය RGG 33 වශයෙන් සලකුණු කිරීම සඳහා අවසර අයැද සිටිනවා.

පි : එතකොට මේ අබ්දුල් රාසික් කියන පුද්ගලයා තමයි මැතිතුමනි 70% ක් බෞද්ධයෝ ඉන්න රටක කිසිම බයක් සැකක් නැතුව බුදු හාමුදුරුවෝ මිනි මස් වැළඳුවාය, ත්‍රිවිධ රත්නය කියන්නේ මැණික් ගල් තුනක්ය, මැණික් ගල්වලට වඳින්නේ මෝඩයෝය කියලා ප්‍රසිද්ධ ප්‍රකාශයක් කරලා ඒක මුළු අන්තර්ජාලයේම පල වුණා. ඒක පෙන්නන්නත් පුළුවන් අපට. ඔහු අපි අදහන ශාස්තෘවරයාට අගෞරව කළා. ඒ සියල්ල කළේ බෞද්ධයෝ පොළඹවා ගැනීමට. අපි ගිහින් ඔහුගේ බෙල්ල ඉල්ලුවේ නෑ. අපි ගිහින් නඩුවක් දැම්මා. ශ්‍රී ලංකා තවුහිද් ජමාත් කාත්තන්කුඩි ශාඛාව සහරාන් හෂීම් එක්ක ආරම්භ කෙරුවේ අබ්දුල් රාසික්. මිනිහා තාම එළියේ. ඔහුගෙන් තමයි උපදෙස් ගන්නේ. ඊළඟට

FAIR COMMENT BY JEZEEM

වව්නියාවේ පුලස්තිනි මහේන්ද්‍රන් සාරා නමින් මඩකලපුවේ ඉස්සර ඒ ළමයාගේ නම පුලස්තිනි මහේන්ද්‍රන් අන්තිමේදී ඇය convert වුණා මොහොමදු හස්තුන් සහ සාරා කියලා. මේ සම්බන්ධයෙන් මේ මාතාව පැමිණිලි ගණනාවක් කරලා තියෙනවා. පොලිසි වලට, රහස් පොලිසියට. දැන් ඇය තාමත් ජීවතුන් අතරද නැද්ද කියලා දන්නේ නෑ. මේ අබ්දුල් රාසික් තමයි මොහොමදු හස්තුන් එක්කලා මේ සාරාව විවාහ කෙරෙව්වේ. කටුවපිටිය මරාගෙන මැරුණු පුද්ගලයා. ඉතින් මේ මෑතකදීත් ඒ පින්තූර පළ වුණා. දැනටත් ඔහු ඒ conversion කර ගෙන යනවා. ඒ විතරක් නෙවෙයි බාල වයස්කාර දැරියන් ඉල්ලලා උද්ඝෝෂණයක් කළා. ඒ විඩියෝ පටයත් අපිට පෙන්වන්න පුළුවන්. ඒ විතරක් නෙවෙයි මහා සංඝ රත්නයට අපහාස කළා දිගින් දිගටම මේ අබ්දුල් රාසික්. විඩියෝ පටය අපිට අවසර දුන්නොත් අපිට පෙන්වන්න පුළුවන්. ඔහුගේ ඒ අදහස් ටික සහ මේ එකම නීතියයි. එය අපේ රටේ නීතිය පිළිගන්නේ නෑ ඒගොල්ලෝ. මැතිනියනි මේකත් දෙන්නම් පින්තූරත් එක්කම තියෙනවා ඒකේ.

ගෞරවයෙන් ගරු සභාපතිතුමනි සමාව අයැද සිටිනවා නිවැරදි කිරීමක් කිරීමට අවසර අයැද සිටිනවා. RGG 32 වශයෙන් සලකුණු කරන ලද ඉස්ලාම් ධර්මය 7 ශ්‍රේණිය අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙහි පොත පෙළපොත පෙර දිනයේදී C 619 වශයෙන් සලකුණු කිරීමක් කර තිබෙන බැවින් අද දිනයේදී RGG 32 වශයෙන් කරන ලද සලකුණු කිරීම ඉල්ලා අස්කර ගැනීමට අවසර අයැද සිටිනවා. එසේම එහි 95 පිටුව අද දිනයේදී RGG 32 (A) වශයෙන් සලකුණු කරනු ලැබුවා. එම සලකුණු කිරීම ඉල්ලා අස්කර ගෙන එම 95 පිටුව C 619 (C) වශයෙන් නැවත සලකුණු කිරීම සඳහා ගෞරවයෙන් අවසර අයැද සිටිනවා. සමාව අයැද සිටිනවා සිදු වූ ප්‍රමාද දෝෂය සම්බන්ධයෙන්. ඒ වගේම ගෞරවයෙන් ගරු සභාපතිතුමනි ඉන් අනතුරුව සලකුණු කිරීම කරන ලද RGG 33 ලේඛනය 2016 නොවැම්බර් 18 දිනැති ඉරිදා ලංකාදීප පුවත්පතෙහි එම පිටුව ඇතුළත් ලේඛනය RGG 32 වශයෙන් නැවත සළකුණු කිරීම සඳහා අවසර අයැද සිටිනවා.

පි : 18 වෙනි පිටුව.

ප්‍ර : ස්වාමීන් වහන්සේ මේ අවස්ථාවේදී ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ කුමන කරුණක් අරභයා වූ විඩියෝ පටයක්ද හාමුදුරුවනේ?

පි : ඔවුන් කියනවා මේ ඒ ගොල්ලොන්ට ඕනේ විශ්ව දේව නීතිය කියලා.

FAIR COMMENT BY JEZEEM

ප : මේ කොහේ සිදු වූ කාරණාවක්ද?

පි : ඒක මාළිගාවත්තේ පැවති උද්ඝෝෂණයකදී දැන් GSP plus අර ඒ සහනය ලංකාවට අහිමි වෙන අවස්ථාවේදී අහිමි කරන්න ඒ යෝජනා වෙච්චි අවස්ථාවේදී මම කිව්වේ මුස්ලිම් කණ්ඩායම් එළියට බැස්සා කියලා උද්ඝෝෂණ කරන්න. ඒ ගොල්ලෝ GSP අස්සේ ඒ ගොල්ලොන්ට ඕනේලු විශ්ව දේව නීතිය. ඉතින් මේකේ කියවෙන කොට සභාවට තේරුම් ගන්න පුළුවන් වෙයි ඒ ගොල්ලෝන්ගේ මොකක්ද මේ තවුහිද් කියන එක තේරුම් ගැනීමටයි විඩියෝ පටය ඉදිරිපත් කරන්නේ. මේක මාළිගාවත්තේ තමයි

ප : කොයි කාලේ සිදු වූ උද්ඝෝෂණයක්ද හාමුදුරුවනේ?

පි : 2014 විතර. 2014 ඒක අපිට දිනේ දෙන්න පුළුවන්.

ප : එහෙමයි හාමුදුරුවනේ.

පි : හොඳමයි.

ගරු සභාපතිතුමනි අවසර අයැද සිටිනවා මේ අවස්ථාවේදී එම විඩියෝ පටය ප්‍රදර්ශනය කිරීම සඳහා

ගරු සභාවේ අවධානය යොමු කර සිටිනවා ඒ මේ අවස්ථාවේ ප්‍රදර්ශනය වන විඩියෝ පටයේ දර්ශනය වන පුද්ගලයන් SLTJ නමින් අකුරු සඳහන් කරමින් වන T – shirt ඇඳගෙන සිටින බව මේ අවස්ථාවේදී සභාවේ අවධානයට යොමු කර සිටිනවා.

පි : ශ්‍රී ලංකා තවුහිද් ජමාත්. ඇති නේද තව මම හිතන්නේ ගොඩක් දිගට තියෙනවා. අපට ඕනී වුණේ අර විශ්ව දේව නීතිය කියන එක සහ බාලවයස්කාර දරුවන් ගැන අවධානයට යොමු කරන්න.

මේ අවස්ථාවේදී ගරු සභාවේ අවධානයට යොමු කරන ලද ස්වාමීනි වහන්සේ ඉදිරිපත් කරන ලද විඩියෝ පටය RGG 33 වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා.

ප : එම විඩියෝ පටය ඇතුළත් CD පටයක් තිබෙනවාද අපේ හාමුදුරුවනේ?

පි : අපි හාර දුන්නා.

ප : CD පටයක් තිබෙන බැවින් එම CD පටය සලකුණු කිරීමටයි අවසර අයැද සිටින්නේ. එකී විඩියෝ පටයෙහි කතාව පැවැත්වූ ප්‍රධාන පුද්ගලයා වශයෙන් සිටි අය කවුරුන් හැටියට ද හාමුදුරුවනේ හඳුනා ගන්නේ?

පි : ශ්‍රී ලංකා තවුහිද් ජමාත් සංවිධානයේ ලේකම් අබ්දුල් රාසික්. දැන් පෙනී ඉන්නේ සීලෝන් තවුහිද් ජමාත් කියලා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : වර්තමානයේ?

පි : වර්තමානයේ. මොකද මේක තමයි අර මුලින්ම කියපු දේ සංවිධාන ගණනාවක් හදන්න කිව්වා. මුලින් පටන් ගත්තා TNTJ තමිල්නාඩු. ඊට පස්සේ SLTJ පටන් ගත්තා. දැන් NTJ, UTJ, CTJ එක එක TJ TJ TJ නමින් සංවිධාන 10 ක් දක්වා විතර තියෙනවා.

ප්‍ර : ඔබ වහන්සේ මේ අවස්ථාවේදී මෙ RGG 33 CD පටය තුළින් සඳහන් කරන්නට යෙදුණු කාරණාව වුයේ බාල වයස්කාර දරුවන් වශයෙන් හඳුන්වමින් විවාහය පවත්වා ගෙන යෑමට අදාළව තවුහිද් ජමාත් හි පැහැදිලි කිරීම කියලා ඔබ වහන්සේ සඳහන් කරන්නට යෙදුණා?

පි : ඒගොල්ලෝ කියන්නේ මේකට නීති ඕනේ නෑ මනසෙන් පුළුවන් මල්වර වුණානම් අවුරුදු 7 න් ඒකත් පුළුවන්. මේ තියන පවතින නීති වැදගත් නෑ කියන එක තමයි කියන්නේ. ඒ වගේම අර අපට ඕනී ෂරීයා නීතිය කියන එක. ඒක විශ්ව නීතිය. ඒ කියන්නේ තවුහිද් ඒක දේව වාදයට ගොනු කරගැන්ම.

ප්‍ර : දැන් හාමුදුරුවනේ අපි පැහැදිලි කිරීමක් ලබා ගනිමින් සිටියේ තවුහිද් ජමාත් කියන මතවාදය කොහෙන්ද ආරම්භ වුණේ කවුද එහි නායක වශයෙන් ජාත්‍යන්තරව සිටින්නේ යන කාරණා වගේම ශ්‍රී ලංකාව තුළට එය ඇතුළත් වී තිබෙන්නේ කොයි ආකාරයට ද කියන කරුණ සම්බන්ධයෙන්. ඔබ වහන්සේ පැහැදිලි කළා මෙය වහබිසම් එහෙම නැත්නම් වහබ් සංවිධාන වශයෙනුයි හඳුනා ගන්නේ කියලා. ඒ වගේම ඔබ වහන්සේ පැහැදිලි කළා එය තවුහිද් යන නම ඇතුළත් කරමින් සංවිධාන විවිධ නම්වලින් ඇතුළත් වී ශ්‍රී ලංකාව තුළ මතවාදය පතුරවමින් තිබෙනවා කියන කාරණාව?

පි : ඔව්.

ප්‍ර : සංවිධාන වශයෙන් ඔබ වහන්සේට නම් සඳහන් කළ හැකි සිවිල් සංවිධාන තියෙනවාද හාමුදුරුවනේ මේ සම්බන්ධයෙන්? වහබිසම් එහෙම නැත්නම් වහබ් මතවාද ඇතුළත් වන? ඔබ වහන්සේ පෙරේදා දිනයේදී සලකුණු කිරීමක් කළා C 607 නැමැති සංවිධාවලට අදාළ ලේඛනයක් ?

පි : එහෙමයි.

ප්‍ර : ඒ ලේඛනයට අවධානය යොමු කරමින් ඔබ වහන්සේ මේ ගරු සභාවට පැහැදිලි කිරීමක් කරන්න එම ලේඛනයේ තිබෙන සියළු සංවිධාන මේ වහබ්වාදයට අදාළවද එහෙම නැත්නම් එයින් කිහිපයක්ද යන කාරණාව?

FAIR COMMENT BY JEZEEM

පි : මේ සියළුම සංවිධාන මා ඒ අතින් ලකුණු කරලා තියෙන සංවිධාන අතර විශේෂයෙන් අවධානය යොමු කරන්න පුළුවන් සංවිධාන කිහිපයක් තියෙනවා. JASM ජමාත් අන්සාරියා සුන්නත් මොහොමදියා සංවිධානය පරගහදෙණියේ. ඒ වගේම ACTJ, SLTJ, UTJ, NTJ, CTJ, ATJ, RAS ඒ වගේම සිවිල් සංවිධාන හැටියට ඒ වහබ් සංවිධානමයි. IIRO, IRO, මුස්ලිම් ඒඩ්, AMYS අල්ෂබාව් කියන ආයතනය, ඒ වගේම වාමී කියන ආයතනය ඇතුළු කොට ඔය ලේඛනයේ ඉදිරිපත් කරලා තියෙනවා මේ වහබ් මතවාදය ඒ වගේම සලෆි මතවාදය ඉහ්වාන් මුස්ලිම් මතවාදය වැනි මේ මතවාදය ගෙන යාම සඳහා ගොඩ නගලා තියෙන අරාබි කාන්තා පාසල්, පිරිමි පාසල් ඒවත් ඇත්තටම අර සංවිධානය හැටියටම තමයි පවත්වාගෙන යන්නේ. ඒ නමින් මතු පිටින් පේනවා ඉස්කෝලේ. හැබැයි සංවිධානය තමයි මේක ක්‍රියාත්මක කරන්නේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : ගරු ස්වාමීන් වහන්ස සංවිධානවල නම් කියන කොට පොඩ්ඩක් හේමිට කියන්න ඒක ලියන්න අමාරුයි ඒවා.

පි : හොඳමයි මේ ලේඛනයේ ඔක්කොම තියෙනවා මැතිතුමනි.

ප්‍ර : නෑ හරි

පි : හොඳමයි.

ප්‍ර : ලියා ගන්න ඕනී ඒක හින්දා.

පි : හොඳමයි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය</u>

ප්‍ර : එහෙමයි හාමුදුරුවනේ. දැන් ඔබ වහන්සේ සඳහන් කළා මේ ඔබ වහන්සේ පෙර දිනයේදී සලකුණු කිරීමට ඉදිරිපත් කරන ලද C 607 ලේඛනයේ සඳහන් වන ලේඛන අතරින් වහබ්වාදයට මූලික වශයෙන්ම අවනත වූ සංවිධාන කිහිපයක් JASM, ACTJ, SLTJ, UTJ, NTJ, CTJ, ATJ, RAS වශයෙන් සංවිධාන වගේම සිවිල් සංවිධාන වශයෙන් IIRO, IRO, මුස්ලිම් ඒඩ්, AMYS සහ වාමී වශයෙන් සංවිධාන?

පි : ඔව්.

ප්‍ර : ඔබ වහන්සේ දැන් පිළිතුරේ සඳහන් කළේ ඒ සංවිධාන කිහිපය?

පි : ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ අතරින් මා විශේෂයෙන් අවධානය යොමු කළොත් JASM කියන සංවිධානය හාමුදුරුවනේ එහි යම් කිසි විශේෂිත කාරණාවක් ඔබ වහන්සේගේ අවධානයට යොමු වී තිබෙනවාද මේ JASM සංවිධානයෙන් මොකක් හරි කාරණාවක් සිදු වූ බවක් ඔබ වහන්සේ සොයා ගෙන තිබෙනවාද මේ අන්තවාදී ක්‍රියාවක්?

පි : ඇත්ත වශයෙන්ම මේ JASM සංවිධානය ගැන විශාල අවධානයක් යොමු කළ යුතුයි කියලා අපි විශ්වාස කරනවා. මුළු ලංකාවෙන්ම ගත්තොත් එකම තැනයි අපිට හම්බ වුණේ මේ ඒ පින්තූරේ. මම පෙරේදාත් සඳහන් කළා මේ පල්ලි ඉදිරියෙන් නිශ්ශබ්ද වෙනු. Silence please Mosque ahead කියලා හැබැයි සිංහලෙන් තියෙන්නේ පල්ලිය ඉදිරියෙන් නිශ්ශබ්ද වෙනු. නියෝගයක්. එතකොට මේක පිහිටලා තියෙන්නේ හරියටම මාවතගම පරගහදෙණිය නගරයේ ඒ පොඩි පල්ලියක් තියෙනවා ඒ පල්ලිය ඉස්සරහා විශාල පුවරුවක්. මේ විශාල පුවරුවක්. පරගහදෙණියේ මා දන්නා පරිදි පහුගිය කාලේක ඔය නෙත් FM නාළිකාවෙත් මේ සම්බන්ධයෙන් විශේෂ වැඩ සටහනක් කළා බැලුම්ගල වැඩ සටහන එහිදී සම්පූර්ණයෙන්ම සිංහල ගම්මානයක් මුස්ලිම් කරලා මේ ප්‍රශ්නේ එනකොට දැන් ඒ ගමම අනාථ කරලා තියෙනවා මේ ගොල්ලෝ. ඒ විතරක් නෙවෙයි ඒ පරගහදෙණියේ තමයි ඒ අපිට පොතක් ලැබුණා. ඇත්ත වශයෙන්ම ඒ තොරතුරු හොයා ගෙන යන කොට තමයි ඒවා හම්බ වෙන්නේ. එක්දාස් නමසිය හතළිස් ගණන්වල 47 ඒ සුෆි මුස්ලිම් මිනිස්සු අභිබවලා මේ වහබ්වාදී මතය පරගහදෙණිය ප්‍රදේශයේ ආරම්භ වුණා කියලා. ඒ විතරක් නෙවෙයි කෘතියේම සඳහන් කරලා තියෙනවා අර ෂරීයා නීතිය ඉස්මතු කරපු අවස්ථාවල් ඒ කියන්නේ සිද්ධීන් 500 ක් වාර්තා කරලා තියෙනවා මේ පොතේ. ඒක අපේ නීතිඥ මහතා කියෙව්වොත් හොඳයි සෙරන්ඩිබ් කියන පොතේ.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී ස්වාමීන් වහන්ස අවධානය යොමු කරනවා ගරු සභාවේ Sarandib වශයෙන් නම සඳහන් කරන An Ethnological study of the muslims of Sri Lanka යන නම යටතේ ආසිෆ් හුසේන් කර්තෘ විසින් රචිත නෙෆ්වූන් ප්‍රකාශකයෝ 21/11,04 වන පටුමඟ, අරලිය උයන, දෙපානම, පන්නිපිටිය යන ලිපිනය යටතේ ප්‍රකාශයට පත් කරන ලද පොතක්. එම පොතෙහි ගරු ස්වාමීන් වහන්සේ මේ අවස්ථාවේදී 618 වන පිටුවට අවධානය යොමු කරමින් සලෆි මුස්ලිම් ඇදහීමක් සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරනවා. ඒ අනුව 618 පිටුව සහිත එම කොටස එම ලේඛනය RGG 34 වශයෙන් සළකුණු කිරීමට අවසර අයැද සිටිනවා

FAIR COMMENT BY JEZEEM

ඉංග්‍රීසියෙන් සටහනක් කියවයි

ප්‍ර : හාමුදුරුවනේ ඔබ වහන්සේ මේ අවධානය යොමු කළ කොටස JASM සංවිධානය පැහැදිලි කිරීම සඳහායි ඔබ වහන්සේ මේ 618 පිටුවට ගරු සභාවේ අවධානය යොමු කළේ. JASM වශයෙන් හැඳින්වෙන්නේ මොකක්ද හාමුදුරුවනේ?

පි : ජමාත් අන්සාරීයා සුන්නත් මොහොමදීයා සංවිධානය.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : නැවත කියන්න ස්වාමීන් වහන්ස?

පි : ජමාත් අන්සාරීයා සුන්නත් මොහොමදීයා සංවිධානය.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය</u>

ප්‍ර : එම සංවිධානය පරගහදෙණිය ප්‍රදේශයේ කුරුණෑගල පිහිටා තිබෙන බව ඔබ වහන්සේ සඳහන් කළා. එහි මූලාරම්භයක් පැහැදිලි කිරීමට ද ඔබ වහන්සේ මේ 618 පිටුව සඳහන් කළේ?

පි : ඔව් ඒ කියන්නේ අපිට ඇත්ත වශයෙන්ම මුලාශ්‍ර අපි හොයා ගෙන යන්නේ මේ සහරාන්ගේ පිපිරීම සහ පාස්කු ප්‍රහාරය නිකම් අහඹුවක් නෙවෙයි. මේකට ඉතිහාසයක් තියෙනවා. මේක ටික ටික මේ මතවාදය ගොඩනැගිලා ගොඩනැගිලා මරාගෙන මැරීම දක්වාම මේක දියුණු වෙලා තියෙනවා කියන එක ඔප්පු කරන්න. ඒ වගේම අපිට තව ග්‍රන්ථයක් හම්බ වුණා මේක.

****

ඉංග්‍රීසියෙන් සටහනක් කියවයි.

දැන් වේලාව : පස්වරු 03.00 යි.
මෙතැන් සිට ල/ලේ :- ධම්මිකා මිය.

President's Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් කරන්නේ මුතුමාලී මෙනවිය විසින්ය.
වේලාව ප.ව. 3.00 යි
මෙතැන් සිට ධම්මිකා පෙරේරා විසින්ය.

ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ශි හේරත් මහත්මිය:

ප්‍ර : ඒ වගේම හාමුදුරුවනේ ඔබ වහන්සේ අවධානය යොමු කළා මේ සංවිධාන අතර TJ වශයෙන් සඳහන් වන සංවිධාන 6 ක්. ඒ TJ වශයෙන් තියෙනවා නම් ඒ සංවිධාන මොනවද හාමුදුරුවනේ?

පි : TJ කියන්නේ තවුහිද්.

ප්‍ර : තවුහිද් ජමාත්?

පි : ඔව්. ඒකෙන් මේක ඇත්තටම අපි අවධාරණය කර ගන්න ඕනේ අර කියනවානේ ඔඩ්ඩොහාබි සංවිධාන පනහක් හදලා නායකයෝ වෙනම 50 ක් හදන්න කියලා. ලංකාවේ වහබි ව්‍යාපාරය ගොඩ නහන්න. එතකොට දැන් SLTJ එක පටන් ගත්තේ ඔය ඉස්සෙල්ලා වීඩියෝ එකේ පෙන්නපු අබ්දුල් රාසික් සහ සහරාන් හෂීම්. හැබැයි සහරාන් හෂීම් නායකත්වය දෙනවා ඊට පස්සේ NTJ එකට. තවුහිද් ජමාත් සංවිධානය තියා ගන්නවා අබ්දුල් රාසික්. ඊට පස්සේ UTJ කියලා තව එකක් හැදෙනවා.

ප්‍ර : SLTJ එක තියා ගන්නවා?

පි : SLTJ එක තියා ගන්නවා, දැන් කියනවා නෑහැ අපි SLTJ ඒ කාලේ හිටියා දැන් නැහැ. දැන් CTJ සිලෝන් තවුහිද් ජමාත්. තව එකක් තියෙනවා ATJ කියලා. ඒක තියෙන්නේ අකුරණ. ඔය විදියට TJ, TJ නමින් සංවිධාන ගණනාවක් තියෙනවා.

ප්‍ර : ඒ වගේම හාමුදුරුවනේ IIRO වශයෙන් සඳහන් සංවිධානය මොකක්ද?

පි : IIRO සංවිධානයේ ප්‍රබල සාමාජිකයෙක් තමයි නායකයා ඔහු උලමා සභාවේ නායකයෙක්, නවුෆර් මවුලවි IIRO සංවිධානයේ. ඒක තියෙන්නේ මාළිගාවත්තේ.

ප්‍ර : දීර්ඝ නම ඔබ වහන්සේට සඳහන් කිරීමට හැකියාවක් තිබෙනවද? IIRO කියන්නේ මොකක්ද?

පි : පුළුවන්. IIRO කියලා කියන්නේ International Islamic Relief Organization ජාත්‍යන්තර ඉස්ලාමීය සහනාධාර සංවිධානය, අංක 658/91, මහවිල උද්‍යානය, කොළඹ 9.
මම ආයේ කියන්නම්. නම IIRO ජාත්‍යන්තර ඉස්ලාමීය සහනාධාර සංවිධානය. අංක 658/91, මහවිල උද්‍යානය, පුපුරුවා ගත්තෙත්

FAIR COMMENT BY JEZEEM

එම ස්ථානයේමයි. මහවිල උද්‍යානය, කොළඹ 9. ලියාපදිංචි අංකය: 21431. ලියාපදිංචි දිනය: 1994.04.20.

ප : හාමුදුරුවනේ ඔබ වහන්සේ සඳහන් කරන්නට යෙදුනා මෙහි නායකයෝ වශයෙන් සිටින්නේ නවුෆර් මවුලවි නැමැත්තෙක් කියලා?

පි : ඔව් ඔහු උලමා සභාවේ සාමාජිකයෙක්.

ප : ඔහු ප්‍රබල ක්‍රියාකාරිකයෙක් කිව්වොත් හරිද?

පි : ඔව්.

ප : ඔහු මේ වන විට ඉන්නේ කොහේද කියලා ඔබ වහන්සේ දන්නවද?

පි : එහෙම ස්ථානයක් දන්නේ නැහැ, නමුත් ජීවතුන් අතර ඉන්නවා.

ප : ඔහු සහරාන් සමඟ සබඳකම් පැවැත් වූ පුද්ගලයෙක්ද?

පි : එහෙම කියන්න දන්නේ නැහැ, නමුත් මේ සංවිධාන ජාලයේ ඔක්කොම වෙන වෙන මුහුණුවරවලින් තමයි ඉන්නේ. මොකද ඒකේ ප්‍රධාන කාර්යාලය තියෙන්නේ සෞදි අරාබියාවේ ජෙඩාවල. මේකේ සභාපති මවුලවි ඉම්රාන් මේ IIRO සංවිධානයේ නිකාය ඒ කියන්නේ මේගොල්ලන් සිවිල් සංවිධානයක් විදියට පෙනී ඉන්නවා. නිකාය ඇත්තටම තවුහිද් ජමාත් නිකාය.

ප : ඔබ වහන්සේ ඒ අනුව සඳහන් කරන්නේ මේ IIRO සංවිධානයේ මව් සංවිධානය සෞදි අරාබියාවේ තිබෙනවාය, එහි ශාඛාවක් හැටියටයි මෙය ශ්‍රී ලංකාව තුල මෙය පවතින්නේ කියලද?

පි : ඔව්.

ප : ඒ කියන්නේ ඔවුන්ට අරමුදල් ගලා ඒමකුත් ඒ හරහා සිදු වෙනවා කියලා ඔබ වහන්සේ සොයා ගැනීමක් කරලා තියෙනවද?

පි : එහෙම අපිට හොයන්න අමාරුයි මොකද අපි රජයේ නොවන නිසා. නමුත් මේක නිකාය තවුහිද් ජමාත් නිකාය.

ප : ඒ වගේම ඔබ වහන්සේ මේ සංවිධාන අතර සඳහන් කලා AMYS කියලා සංවිධානයක්, AMYS කියන සංවිධානයේ නම දීර්ඝ වශයෙන් සඳහන් කලොත් නම මොකක්ද හාමුදුරුවනේ AMYS කියන්නේ?

පි : ඒක අල්ෂබාබ් කියලා සංවිධානයක් තියෙනවා. ඒක තියෙන්නේ කොළඹ මරදාන මාළිගාකන්දේ. ඒ අල්ෂබාබ් සංවිධානයේ AMYS මේ නමින් ආයුධ සන්නද්ධ ව්‍යාපාරයක් තියෙනවා සෝමාලියාවේ. එතකොට මේ අල්ෂබාබ් එක්කම ලියවෙච්ච නමක් තමයි AMYS කියන එක. මේකේ නායකයා, ලංකාවේ නායකයා තාසිම් මවුලවි. මොහු ඉන්නෙත් උලමා සභාවේ. උලමා සභාවේ ප්‍රබල සාමාජිකයෙක්. මට මේ AMYS කියන එක ඔළුවට

FAIR COMMENT BY JEZEEM

එන්නේ නැහැ. මම ලියලා තිබුණේ මතක නැහැ දැන්. හොයා ගන්නත් පුළුවන්.

ප : තාසිම් මවුලවි වශයෙන් මෙහි නායකයා හැටියට ඔබ වහන්සේ සඳහන් කරන්නට යෙදුනා පුද්ගලයෙක් ඔහු සම්බන්ධයෙන් ඔබ වහන්සේට වැඩිමනත් වශයෙන් තොරතුරු තියෙනවද ඔහු කවුද? කොහේ පුද්ගලයෙක්ද කියන කාරණාවන්?

පි : මම ඉතා හොඳින් දන්නවා ඔහු ජමෙයිතුල් උලමා සංවිධානයේ ප්‍රබල සාමාජිකයෙක්. එහි සාමාජිකයන් අතර ඔහු ප්‍රබලයෙක්.

ප : මොන ප්‍රදේශයෙන් පැමිණි පුද්ගලයෙක්ද කියලා ඔබ වහන්සේට..?

පි : එහෙම කියන්න දන්නේ නැහැ.

ප : ඔබ වහන්සේ දැන හඳුනා ගෙන කතා බහ කරලා තියෙනවද මේ තාසිම් මවුලවි?

පි : මට මතක විදියට කතා කරලා තියෙනවා. දැන් මෑත කාලේ නෙමෙයි අර හලාල් සිද්ධිය වෙන කාලයේ. මොකද මවුලවිවරු අපි 10 ක් හෝ 12 ක් අපි ගෙනාවා අපි එක පැත්තකින් ගෙන්නුවා, අනික් පැත්තෙන් ඒ මවුලවිවරු ගෙන්නුවා. ඒ වෙලාවේ මේ කණ්ඩායම ආවා. මට දැක්කොත් කියන්න පුළුවන් එහෙම නැතුව නිශ්චිත මතකයක් නැහැ ඇත්ත වශයෙන් මේ අහවලා කියලා. මොකද එකම විදියට, එකම විදියේ රෙදිවල්, එකම විදියේ තොප්පි ඉතින් හරි අමාරුයි අඳුනන ගන්න.

ගෞරවයෙන් ගරු සභාපතිතුමනි MT 2 වශයෙන් මේ සභාවට ලකුණු වී තිබෙන ලේඛනය ස්වාමීන් වහන්සේට පෙන්වා සිටීමට අවසර පතනවා.

ප : හාමුදුරුවනේ බලන්න මේ ඡායාරූපයේ ඔබ වහන්සේ සඳහන් කරන තාසිම් මවුලවි ඉන්නවද කියලා?

පි : අමාරුයි, එහෙම හඳුනා ගන්න අමාරුයි. දැන් මේ බැලුවොත් මේ පිංතූරයේ මේ පැත්තේ ඉන්න එක්කෙනයි දෙකම එක වගේනේ. හාමුදුරුවොත් හඳුනා ගන්න අමාරුයි එහෙම මතක නැහැ, කාදිනල්තුමාව අඳුනනවා. මේ හාමුදුරුවොත් එහෙම නමින් දන්නේ නැහැ. මට අවස්ථාවක් දෙනවා නම් පිංතූරත් එක්කම ගෙනල්ලා දෙන්නම් තාසිම් මවුලවි. නවුෆර් මවුලවි, තාසිම්ලා ඔය ඔක්කොලගේම.

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : පිංතූරය විතරක් ගේන්න?

පි : පුළුවන්. හොඳමයි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ශි හේරත් මහත්මිය:</u>

ප්‍ර : හාමුදුරුවනේ මේ AMYS කියන අකුරුවලින් සඳහන් වෙන්නේ Association of Muslim Youth of Sailan වශයෙන් කියන සංවිධානය කියලා අන්තර් ජාලයේ සඳහන් වෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබ වහන්සේ ඒක පිළිගන්නවද ඒ ක්‍රමයටද තියෙන්නේ කියලා?

පි : ඔව් ඒ අකුරු ටික හරි වෙන්න පුළුවන්. මට පටලැවිල්ලක් තිබුණා මොකද මේ දෙකම යන්නේ එකට අල්ෂබාබ් එකත් එක්ක. මේ අල්ෂබාබ්මද, ඒකේ තව ශාඛාවක්ද මොකක්ද කියලා කෙටි අකුරුවලින් තියෙන හින්දා පැටලිලි සහගතයි. ඒකයි මම හරියට ඒක තහවුරු කරලා කිව්වේ නැත්තේ.

ප්‍ර : දැන් වාමි එහෙම නැත්නම් WAMY කියන සංවිධානය සම්බන්ධයෙන් ඔබ වහන්සේගේ තොරතුරු මොනවාද හාමුදුරුවනේ?

පි : වාමි කියලා කියන්නේ World Association Muslim Youth. ලෝක මුස්ලිම් තරුණ සංවිධානය.

ප්‍ර : ඔව් මෙහි ශ්‍රී ලංකාවේ කාර්යාලයක් තියෙනවද?

පි : තියෙනවා.

ප්‍ර : කොහේද තියෙන්නේ?

පි : තියෙන්නේ අංක 658/3/1/1 ඒකත් මහවිල උද්‍යානයේ කොළඹ 9. ලියාපදිංචි අංකය AN643 , ලියාපදිංචි දිනය: 1997.12.12

ප්‍ර : ශ්‍රී ලංකාවේ ලියාපදිංචියට අදාල අයිතිකරුවකු හෝ ප්‍රධානියෙකු හෝ එහි නායකයෙකු සඳහන් වෙනවද?

පි : මේ සංවිධානයේ මම ඒක කියන්නම් මැතිනියනි, මේකේ සභාපති හැටියට පෙනී සිටියේ සුඩාන ජාතික ඕමාර් එදිරිස් සල්දීර් කියන මහත්මයා. ඔහුගේ නිකාය ජමාතේ ඉස්ලාම්. ප්‍රධාන කාර්යාලය තියෙන්නේ රියාද්, අංක 11443, රියාද්, සෞදි අරාබියාව. එතකොට මේ වාමි මුස්ලිම් තරුණයන් වෙනුවෙන් හදපු සංවිධානය ප්‍රබල සංවිධානයක්. ඇත්ත වශයෙන්ම අපට මේ ඉස්ලාම් අන්තවාදය දරුණු තැනකට අනාගතයේදි පත් වෙන්න පුළුවන් හාමුදුරුවනේ මේ ගැන අපිට උදව් කරන්න මේ සාමාන්‍ය සාම්ප්‍රදායික ස්වදේශික මුස්ලිම් මිනිස්සු ආරක්ෂා කර ගන්න කියලා අපිට තොරතුරු සපයපු කණ්ඩායම් අතර මේ වාමි එකේ

FAIR COMMENT BY JEZEEM

ඉගෙන ගත්තු තරුණයෝ තමයි ආවේ. ඒගොල්ලෝ දැන ගෙන හිටියා මේක ඒතරම් භයානක එකක් කියලා. වාමි එකේ ඉගෙන ගනිපු අය. ඒ තරුණයෝ තමයි කිව්වේ මේක හොඳ තත්ත්වයක් නෙමෙයි, මේක ඉතාම දරුණුයි කියලා. දැන් මේ සංවිධානයේ මෙරට අධ්‍යක්ෂකවරයෙක් ලෙස හිටපු සුඛාන් ජාතික ඕමාර් එදිරිස් කියන පුද්ගලයා විකිලීස්වලට අනුව ඔහු ත්‍රස්තවාදියෙක් හැටියට නම් කරලා තියෙනවා. සංවිධානයේ ලංකාවේ අධ්‍යාපන අංශය භාරව හිටියේ ඉෂාක් කියලා නැමැත්තෙක්. දැනට ISIS අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරියෙක් ලෙස කටයුතු කරනවා. ISIS එකේ අධ්‍යාපන අංශය භාර එක්කෙනෙක් හැටියට දක්වලා තියෙනවා හැබැයි මේ ඉෂාක් විතරයි නම තියෙන්නේ, අනික් මුල් නම් හොයා ගැනීමට අපිට හැකියාවක් නැහැ.

ප්‍ර : මේ ඉෂාක් කියන්නේ හාමුදුරුවනේ ශ්‍රී ලාංකික ඉස්ලාම් ජාතිකයෙක්ද?

පි : ඔව්. ශ්‍රී ලාංකික ජාතිකයෙක්. ඔහු මේ ISIS සංවිධානය වෙත තරුණයන් යොමු කිරීම සඳහා මේ රටේ නේවාසික තරුණ කඳවුරු පාසැල් දරුවන් සඳහා පවත්වලා තියෙනවා කියලා වාර්තා වුණා. ඇත්ත වශයෙන් ඔය ඩී.එස්. සේනානායක විද්‍යාලයට ගියපු හුඟක් අය මේ වාමි ව්‍යාපාරයට හසුවුණා මුස්ලිම් දරුවෝ. ඔවුන් සාක්ෂිවලටත් කැඳවන්න පුළුවන් අවශ්‍ය නම්.

ප්‍ර : හාමුදුරුවනේ නම් වශයෙන් කියන්න කවුරු හරි කෙනෙක් ඉන්නවද හාමුදුරුවනේ නම ලියලා හරි දෙන්න පුළුවන් නම්?

පි : එදා දීපු නම් වල ඉන්නවා දෙන්නෙක්. එතකොට මේ ඉෂාක් කියන පුද්ගලයගේ අයියා තමයි ගලේවෙල කරාටි ගුරුවරයෙක් හැටියට වැඩ කරලා නිලාම් හැටියට මේ ඉෂාක් ගේ අයියා නිලාම් ඔහු සිරියාවේදි අවුල්කි සේනාංක සටන්කරුවෙක් හැටියට මුලින්ම මරණයට පත් වුණා කියලා ලංකාවේ මාධ්‍යය වාර්තා කෙරුවේ. ඉෂාක්ගේ අයියා කරාටේ ගුරුවරයෙක්, ඔහු සිරියාවට යනවා සිරියාවට ගිහිල්ලා අවුල්කි කියන සේනාංකයට බැඳෙනවා එහි සටන්කරුවෙක් හැටියට, ගුවන් ප්‍රහාරයකින් මරුමුවට පත් වෙනවා. මුලින්ම ඔහු තමයි හඳුනා ගත්තේ සිරියාවේදි මියගිය පලමු ශ්‍රී ලාංකික ISIS සටන්කරුවා හැටියට.

ප්‍ර : දැනට මේ සභාව වෙත ඉදිරිපත් වී තිබෙන සාක්ෂි අනුව සිරියාවේදි මියගිය නිලාම් යනුවෙන් පුද්ගලයෙක් සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් වී තිබෙනවා හාමුදුරුවනේ, ඔබ වහන්සේ මේ සඳහන් කරන්නේ ඔහු ගැනමද?

FAIR COMMENT BY JEZEEM

පි : ඔව් මේ ISIS සඟරාවෙත් ඔහු ගැන සඳහන් කරලා තිබෙනවා නිලාම් ගැන මේ පිංතූරයෙන්. ISIS සඟරාවේ. තවම මැතිතුමනි මේ අන්තර් ජාලයේ ඒ සඟරාව තියෙනවා, ඇත්තටම colour පිංතූරේ ගන්න පුළුවන් අපිට වෙලාව පිළිබඳ ගැටළුවක් තිබුණා.

දාබීක් (Dabiq) වශයෙන් සඳහන් වන ස්වාමීන් වහන්සේ පවසන ආකාරයට එය ISIS සංවිධානයේ සඟරාවක් වශයෙන් එය සඳහන් කරන්නේ, එහි මරණයට පත් වූ පුද්ගලයා සම්බන්ධයෙන් විස්තරයක් වශයෙන් අබුසුරයියා සේලානී Amongst the Believers are Men Abu Hurayh Sailani වශයෙන් සඳහන් කරමින් ඡායාරූපයක්ද ඇතුලත් කරමින් තිබෙන මෙම ලේඛනයේ කොටස, එම සඟරාවේ කොටස, 12 වන නිකුතුව පිටුව 57 ගරු සභාපතිතුමනි එය RGG 35 වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා.

සටහන් වෙන ආකාරයට දිනයක් පේන්නේ නැහැ ගරු සභාපතිතුමනි, කෙසේ වෙතත් සඳහන් කරන්නේ ඔවුන් ලෝකේ යන කැලැන්ඩරයට වැඩ කරන්නේ නැහැ කියලා ඔවුන් ඉස්ලමික් කැලැන්ඩරයට.

පි : මැතිතුමනි අපිට පුළුවනි ISIS සංවිධානය සම්බන්ධයෙන් මේතාක් පලවෙලා තියෙන සියළුම සඟරා PDF file එකක් විදියට ලබා දෙන්න පුළුවන්.

ප්‍ර : දැන් හාමුදුරුවනේ ඔබ වහන්සේ මෙහි ශ්‍රී ලංකාවේ වාමී සංවිධානයේ ශ්‍රී ලංකාවේ පවතින ස්ථානයක් ගැන සඳහන් කලා, ශ්‍රී ලංකාවේ අධ්‍යක්ෂකවරයෙක් වශයෙන් සිටි සුඩාන් ජාතිකයෙක් ගැන සඳහන් කලා, ඒ වගේම ISIS සංවිධානයේ අධ්‍යාපන අංශය මෙරට භාරව සිටි පුද්ගලයෙක් වශයෙන් ඉෂාක් නමැති පුද්ගලයා සම්බන්ධයෙන් සඳහන් කලා, ඊට අමතරව මේ ආයතනයේ පිහිටි කාර්යාලයේ පිහිටීම ස්ථානය කාටද අයිති කියලා ඔබ වහන්සේ දන්නවද?

පි : දැන් ඒ ආයතනය පිහිටුවා තිබූ ස්ථානයේ අයිතිකරුවන් අසාද් නැමැත්තාගේ පුතුන් දෙදෙනා නම් දෙක නම් මතක නැහැ, දැනට පාස්කු ප්‍රහාරය හේතුවෙන් අත්අඩංගුවට අරගෙන ඉන්නේ. ඊට කලින් කියන්න උවමනායි අර නිලාම් කියලා සිරියාවේදි මැරුම් කෑ පුද්ගලයාගේ මස්සිනාවරු දෙදෙනෙක් තවුෂි නමින් හඳුන්වන ISIS ඒ ඉස්ලමික් ස්ටේට් එකනේ ඒක, ඒගොල්ලන්ගේ දුරකථන දෙපාර්තමේන්තුවේ වැඩ කරලා තියෙනවා. ඒ වගේම තාකීර් කියලා පුද්ගලයෙක් මියගිහිල්ලා තියෙනවා, ඔහුගේ බෑණා

FAIR COMMENT BY JEZEEM

කෙනෙක් වන සුහයිර් කියලා පුද්ගලයෙක් ISIS සංවිධානයේ භෞත විකිත්සකවරයෙක් ලෙස කටයුතු කරලා තියෙනවා. මේ වාමී ආයතනයේම ඉගෙන ගනිපු උදවිය.

ප්‍ර : මේ අය ඔබ වහන්සේ මේ නම් සඳහන් කරපු තාකීර්, සුහේර් යන අය ISIS සංවිධානයට සම්බන්ධව ඉදලා මියගිය ශ්‍රී ලාංකික ඉස්ලාම් භක්තිකයන් වශයෙන්ද ඔබ වහන්සේ මේ තොරතුරු සපයන්නේ?

පි : ඔව්. තවුසිත්, තාකීර් කියන දෙන්නා මියගිහිල්ලා තියෙනවා. සුහයිර් කියන එක්කෙනා භෞත විකිත්සකවරයෙක් හැටියට කටයුතු කරනවා කියලා වාර්තා වුණේ ඒ අවස්ථාවල. මොකද මේ පුද්ගලයාගේ තොරතුරු හොයාගෙන ගියාට පස්සේ ඒ දවස්වල මාධ්‍යය වාර්තා කලා. අර සිරියාවේදි මියගිය නිලාම් ගැන වාර්තා වෙච්චාම මේගොල්ලෝ ඔක්කොම රටින් පිටුවහල් වුණා කියලා. ඊට පස්සේ තමයි බුද්ධි අංශ ඔක්කොම වාර්තා කරලා කිව්වේ මේ අය මේ මේ ස්ථානවල ස්ථානගත වෙලා ඉන්නවා කියලා.

ප්‍ර : ඔබ වහන්සේට මේ තොරතුරු ලබා දුන්නේ ශ්‍රී ලංකාවේ බුද්ධි අංශයේ කවුරු හරි කෙනෙක්ද හාමුදුරුවනේ?

පි : නැහැ අපි මේ ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන් සහ විශේෂයෙන් මේ ISIS අයගේ ප්‍රචණ්ඩත්වය පිළිබඳව ඉතාම හොඳ අවධානයෙන් ඒ කියන්නේ දවස ගානේම වගේ මේ ගැන හොයා බලන අපේ කණ්ඩායමක් ඉන්නවා. ඉතින් ඒ අය එක්කලා තමයි ඒ තොරතුරු අපි Share කර ගන්නේ.

ප්‍ර : ඔබ වහන්සේට අවබෝධයක් තියෙනවද මේ තොරතුරු ජාතික බුද්ධි අංශයේ අයත් දැන ගෙන හිටියා කියන කාරණය?

පි : ඔව් LTTE වගේ සංවිධානයක් පරාජය කරපු බුද්ධි අංශයක් තියෙන රටක මේවා මහහැරෙන්න විදියක් නැහැ.

ප්‍ර : ඔබ වහන්සේගේ දැනුමෙන් මේ තොරතුරු ඔවුන් හා හුවමාරු වුණාද? ඔබ වහන්සේට දැන ගන්න ඔවුන්ගෙන් ලැබුණා හෝ ඔබ වහන්සේගෙන් ඔවුන්ට හෝ දැන ගන්න ලැබුණද මේ ISIS සංවිධානයට සම්බන්ධව මියගිය තවුසි, තාකීර් සම්බන්ධයෙන් ඒ වගේම එහි භෞත චිකිත්සකයෙකු වශයෙන් සේවය කරන සුහයිර් සම්බන්ධයෙන් තොරතුරු?

පි : ඔව් සමහර විට මැතිනියනි දැන් අපි තොරතුරු Share කර ගන්න කොට සමහර විට මගේ පන්සලේ රියදුරා බුද්ධි අංශයේ කෙනෙක්ද කියන්න මම දන්නේ නැහැනේ, බුද්ධි අංශය වැඩ කරන්නේ එහෙමනේ. ඉතින් අපිත් එක්ක සාකච්ඡාවලට එන දානේ ගේන, රියදුරා හැටියට ඉන්න, අතුපතු ගාන්න එන ඒ ඕනම

FAIR COMMENT BY JEZEEM

කෙනෙක් බුද්ධි අංශ ඇවිත් අපි ලඟ වැඩ කරනවා වෙන්න පුළුවන්. ඉතින් එහෙම තොරතුරු යනවා වෙන්නත් පුළුවන්. එහෙම තොරතුරු අපිට ගේනවා වෙන්නත් පුළුවන්. එහෙම ස්ථානගත කරනවා.

ප : නැහැ හාමුදුරුවනේ මම ඇහුවේ ඔබ වහන්සේ සාකච්ඡා කරමින්, තොරතුරු හුවමාරු කරමින් හිටිය බවට පෙර දිනයේදි සාක්ෂියක් දුන්නානේ හාමුදුරුවනේ?

පි : ඔව්.

ප : එතකොට මම ඇහුවේ අපේ හාමුදුරුවොත් එක්ක කතා බහ කරලා ඒ කියන්නේ තොරතුරු හැටියට බුද්ධි අංශවලට දුන්නද මේ කාරණාවන් ඔබ වහන්සේ දුන්නද නැත්නම් ඔවුන් ඔබ වහන්සේට දුන්නද කියලා?

පි : නැහැ අපිට ලැබෙන හැම තොරතුරක්ම වගේ බුද්ධි අංශ දැනුවත් කරලා තියෙනවා.

ප : ඒහෙමයි හාමුදුරුවනේ ඒ කාරණාව තමයි මට දැන ගන්න ඕන වුනේ, ..

පි : සමාවෙන්න මැතිනියනි මොකද මට ඒකට ඉදිරිපත් කරන්න පුළුවන්. දැන් ඒවා එකක්වත් හොර රහසේ කරන දේවල් නෙමෙයි, ඇත්ත වශයෙන්ම මම මේ ලේඛන ඉදිරිපත් කරන්නම ඕන. 2014.07.14 වෙනිදා මට කැඳවීමක් ලැබෙනවා ආරක්ෂක අමාත්‍යාංශයේ පැවැත්වෙන සාකච්ඡාව සඳහා කියලා. මගේ නම්න්ම. 2014.07.14 වෙනි දින පැය 9 ට ආරක්ෂක අමාත්‍යාංශයේ දි විශේෂ සාකච්ඡාවක් පැවැත්වෙනවා ඒ සඳහා ඔබ වහන්සේ ගේ පැමිණිම ගෞරවයෙන් බලාපොරොත්තු වෙනවා කියලා. ඒකෙදී අපි සාකච්ඡා කෙරුවේ එවකට රටේ බෞද්ධ සංවිධාන මතුකරමින් තියෙන මේ ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන් තියෙන ඔක්කොම කරුණු ටික අපි ගොනු කරලා අපි යෝජනාවලියක් විදියට එදා ආරක්ෂක අමාත්‍යාංශයට අපි භාර දුන්නා මෙන්න මේවා තමයි අපිට තියෙන ගැටළු කරුණාකරලා මේවට අවධානය යොමු කරලා මේවා තහනම් කරන්න හෝ පාලනය කරන්න කියලා. පළවෙනි එක තමයි 1. තවුහිද් ජමාත් ඇතුළු අන්තවාදී සංවිධානවල පුද්ගලයන් හඳුනා ගෙන විදෙස් ජාතිකයන් මෙරටින් පිටුවහල් කිරීම. ඒ අපේ ඉල්ලීමක්. ඒ වගේම මුස්ලිම් කාන්තාවන්ගේ මුහුණු වසා ගත් බුර්කාය ඇඳුම රට තුළ ප්‍රචලිත වීම. ඉස්ලාම් ආගම ඉගැන්වීමේ ස්වරූපයෙන් පවත්වාගෙන යනු ලබන මද්‍රසා වැනි පාසැල් තුලින් මූලධර්මවාදය ව්‍යාප්ත කිරීමේ දේශණ පැවැත්වීම. මේ ආදී වශයෙන් කාරණා ඒ විතරක් නෙමෙයි අපි 14 වන අංකය යටතේ කිව්වා Online Visa

FAIR COMMENT BY JEZEEM

සහ On–arrival Visa මගින් රට තුළට සැක කටයුතු පුද්ගලයන් සහ ආගම් ප්‍රචාරය සඳහා විදේශිකයින් ඇතුල් වෙනවා මේවා පාලනය කරන්න. ඒ අපි මේ පිළිබඳව අවධානයෙන් හිටපු හින්දා මේ තොරතුරු ඔක්කෝම ගොනු කරලා ගිහිල්ලා කිව්වා. ඒ විතරක් නොවෙයි සූරා කවුන්සිල් සහ ජමෙයිතුල් උලමා ගැනත් කිව්වා පරිස්සමෙන් කටයුතු කරන්න මේගොල්ලන්ගෙන් උපදෙස් ගන්න එපා මේගොල්ලෝ තමයි මේ ප්‍රශ්නේ ඇති කරන්නේ කියලාහිට. ඒ ලියවිල්ලත්..

ප්‍ර : හාමුදුරුවනේ ඔය කැඳවීම සිදු වන්නට හේතු පාදක වුනේ ඔබ වහන්සේ 2014 ජුලි මාසේ යම් අවස්ථාවක මාධ්‍ය සාකච්ඡාවක සහරාන් සම්බන්ධයෙන් කරුණු හෙළිදරව් වුණාය කියලා පෙර දිනයේදි සාක්ෂියක් දුන්නා ඔබ වහන්සේ?

පි : ඔව්.

ප්‍ර : ඒ වීඩියෝ පටය මේ වනවිට අන්තර් ජාලයේ සොයා ගැනීමටත් නොහැකි බව ඔබ වහන්සේ සඳහන් කරන්නට යෙදුනා,

පි : ඔව්.

ප්‍ර : ඒ වීඩියෝ පටයේ අන්තර්ගත වෙන ඔබ වහන්සේ කියූ කරුණු ඔබ වහන්සේ අත්පොත් තබා ගත් ඔබ වහන්සේගේ අත්අකුරෙන් ලියැවුණු සටහනක් ඔබ වහන්සේ සතුව තිබෙන බව පෙර දිනයේ සාක්ෂියේදී කියැවුණා.?

පි : ඔව්.

ප්‍ර : ඒ සටහන මේ සභාවේ විමර්ශන අංශයටත් ඔබ වහන්සේ ලබා දීලා තියෙනවා?

පි : ඔව්.

ප්‍ර : දැන් ඒ සටහනේ තියෙන කාරණා මාධ්‍ය ප්‍රකාශයක සඳහන් කළාට පසුව තමයි ඔබ වහන්සේගේ කැඳවීම අද දින ඔබ වහන්සේ මේ ඉදිරිපත් කරන ලේඛනය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලැබුණේ කියන කාරණාව තමයි ඔබ වහන්සේ අද මේ කියන්නේ?

පි : නැහැ මැතිනියනි මම අර ඔබ තුමිය ඇහුවේ බුද්ධි අංශවල තොරතුරු දෙනවද කියලා, ඒ සිද්ධියෙන් පස්සේද කියන්න මට මතක නැහැ. මම, අපි ආරක්ෂක අමාත්‍යාංශයටම ගිහිල්ලා ඒ ඒ අවස්ථාවල මතු වෙන සියළුම කරුණු විවෘතව ඒ අදාල ප්‍රධානීන්ට දුන්නා කියන එකයි මට ඔප්පු කරන්න ඕන වුණේ.

ස්වාමීන් වහන්ස ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂක අමාත්‍යාංශය වෙත තොරතුරු සඳහා සාකච්ඡාවකට පැමිණීමට කැඳවන ලිපිය ගරු සභාපතිතුමනි මේ සභාවේ විමර්ශන ඒකකයට ලබා දී තිබෙනවා. එම ලිපිය මේ අවස්ථාවේදී C646 වශයෙන් සලකුණු කොට

FAIR COMMENT BY JEZEEM

ඉදිරිපත් කිරීමට අවසර පතනවා. එම ලිපිය 2014.07.14 දිනැතිවයි යොමු කර තිබෙන්නේ.

එම සාකච්ඡාවේදි මෙම ස්වාමීන් වහන්සේ විසින් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට යෝජනා වශයෙන් ඉදිරිපත් කරන ලද කරුණු 25 ක් ඇතුලත් ලේඛනයක්, එම කරුණු එදින සිදු වූ සාකච්ඡාවේදී රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කොට අවධානය යොමු කරමින් ඉදිරිපත් කල බවට සඳහන් කරමින් ලේඛනයක් ඉදිරිපත් කර තිබෙනවා ගරු සභාපතිතුමනි, එම ලේඛනය පිටු දෙකකින් සමන්විතයි. එය C647 වශයෙන් සලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා

එම C646 ලේඛනයේ දිනය වශයෙන් මා සඳහන් කලේ ගරු සභාපතිතුමනි 2014.07.14 වශයෙන්. එය නිවැරදි විය යුතුයි එම ලේඛනය මගින් ආරාධනය කර තිබෙන සාකච්ඡාව පැවැත්වෙන දිනය හැටියටයි එහි සඳහන්ව තිබෙන්නේ 2014.07.14 දිනට යෙදී තිබෙන සාකච්ඡාවක් සඳහා ආරාධනයක් හැටියටයි එම ලේඛනය ඉදිරිපත් වී තිබෙන බවට නිවැරදි කිරීමක් කලයුතු වෙනවා ගරු සභාපතිතුමනි.

ප්‍ර : හාමුදුරුවනේ මේ වකවානුව වන විට රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් සිටියේ කවුද හාමුදුරුවනේ?

පි : ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා.

ප්‍ර : එතුමා සහභාගී වුණාද ඔබ වහන්සේගේ මේ සාකච්ඡාවට?

පි : එතුමා සහභාගී වුණා. එතුමා සහභාගී වෙච්ච රැස්වීම් 5 ට, 6 ට වැඩියි. සමහර අවස්ථාවල ඒ අපි, ඔව් මේ කැඳවීම් කරන අවස්ථාවේදී රාජ්‍ය ආරක්ෂක ලේකම්තුමා ඒ විතරක් නෙමෙයි එවකට සමස්ථ බුද්ධි අංශයේම නායකයාව හිටපු හෙන්දවිතාරණ මැතිතුමා ආදී ඒ ප්‍රධානීන් හිටියා.

ප්‍ර : එහෙමයි හාමුදුරුවනේ. දැන් ඒ කාලය වකවානුව වෙන කොට 2014 ජූලි මාසේ වෙන විට ඔබ වහන්සේ රැස්කර ගෙන තිබුණු බොදුබල සේනා සංවිධානය හරහා රැස්කර තිබුණු සියළු තොරතුරු වාගේ ඔබ වහන්සේ මේ රැස්වීමේදී සාකච්ඡාවට බඳුන් කළාද මේ ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන්?

පි : ඔව්.

ප්‍ර : දැන් ඔබ වහන්සේ දීර්ඝ පැහැදිලි කිරීමක් කලා මේ වන විට තවුහිද් ජමාත් මතවාදය කියලා හැඳින්වෙන්නේ කුමක්ද, එය ශ්‍රී ලංකාව තුළට ඇතුල් වී තිබෙන්නේ මොන ආකාරයටද, ඒ පිළිබඳ

FAIR COMMENT BY JEZEEM

විශේෂ අවස්ථා සම්බන්ධයෙන් මේ මතවාදයේ අන්තවාදී පැත්ත ඒ සියල්ල ඔබ වහන්සේ පැහැදිලි කිරීම් කරලා තිබෙනවා.

පි : එහෙමයි.

ප්‍ර : මා ඊලඟට අවතීර්ණ වන්න බලාපොරොත්තු වන්නේ තවත් මෙවැනි මතවාදයක් සම්බන්ධයෙන්. ඊට ප්‍රථමයෙන්ම ඔබ වහන්සේට තවුහිද් ජමාත් සංවිධානය සම්බන්ධයෙන් ගරු සභාවට ඉදිරිපත් කරන්න තවත් කරුණු තිබෙනවාද ගරු හාමුදුරුවනේ මේ තවුහිද් ජමාත් සංවිධානයට අදාලව?

පි : ඔව් මොකද අපි මේ රැස්වීමට යන කොට අපි නිකම්ම ගියේ නැහැ. ඒ ඉස්ලාම් ධර්මය කියාගෙන එහි ඇතැම් ඉගැන්වීම් නිසා අන්තගාමිත්වයට ගිය ඒ කණ්ඩායම් ගැනත් ලංකාවේ මොන විදියටද මේ සංවිධාන බිහි වුණේ කියන මේ ඉතිහාසය සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළා. මට නමුත් කලින් වෙලාවේදී මට ඒ පරීක්ෂණය සඳහා ඒ ලේඛනය දෙන්න බැරි වුණා. මේකේ අදාල කරුණු හුඟක් තියෙනවා. මට වැදගත්ම කාරණාවක් කියන්න අවසර දෙනවා නම්, අපි එහිදි අවධාරණය කළා අල්කයිඩා සංවිධානයේ වහබි දර්ශනය මත එනම් ඉස්ලාම් ආගමේ රැඩිකල් මතවාදයක් දරන සංකල්පය මූලික කරගෙන බිහි වී ඇති අතර, ශ්‍රී ලංකාවේ තවුහිද් ජමාත් සංවිධානයද මේ 2014 අපි කිව්වේ, ශ්‍රී ලංකා තවුහිද් ජමාත් SLTJ එවැනි රැඩිකල් මත තුළ පිහිටා ක්‍රියා කරනු ලබයි. තවුහිද් යනු එකම දෙවියෙකු ඇදහීම යන අර්ථයයි. තවුහිද් සංකල්පය 80 දශකයේ පමණ සෞදි අරාබියේ සිට ශ්‍රී ලංකාවට පැමිණ ඇත. ඒ වගේ කරුණු එක්ක තබ්ලික් ජමාත් ගැන, ජමාතේ ඉස්ලාම් ගැන ඔක්කොම තියෙන ලේඛනය මම භාර දෙනවා. මට හැබැයි ආපහු ඕනේ කොපියක්.

ප්‍ර : හාමුදුරුවනේ මේ ලේඛනය, ඔබ වහන්සේ මේ ඉදිරිපත් කරන ලේඛනය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට ඔබ වහන්සේ ලේඛනයක් හැටියට භාර දුන්නද?

පි : ඔව් මට මතක විදියට භාර දුන්නා ඔව්. මතකය නිවැරදි නම්...

****

<u>**ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:**</u>

ප්‍ර : ගරු ස්වාමීන් වහන්ස C646 වශයෙන් ඉදිරිපත් කරන ලද්දේ ඒ සාකච්ඡාවට සහභාගී වීම සඳහා වූ ආරාධනයක් කියලා කිව්වොත් නිවැරදි ද?

පි : ඔව්.

ප්‍ර : එම ආරාධනාවේ සඳහන් වෙනවා, තවද මෙම ලිපිය සමඟ ඉදිරිපත් කරන වාර්තාවේ සඳහන් ගැටළු පිළිබඳව අදහස් ලිඛිතව

FAIR COMMENT BY JEZEEM

බලාපොරොත්තු වන අතර කියලා එතකොට ඒ ලිපිය සමඟ තමා අර ඔබ වහන්සේ ප්‍රකාශ කරපු අර පිටු 2 කේ ලේඛනය තියෙන්නේ?

පි : එහෙමයි.

ප්‍ර : එයින් අදහස් වන්නේ ඔබ වහන්සේ මේ රැස්වීමට ඉස්සෙල්ලා එම ගැටළු ආරක්ෂක අමාත්‍යාංශයට ලැබෙන්නට සැලැස්සුවද? ඊට පස්සෙද මේ රැස්වීම තියන්නේ ඒ ගැටළු සාකච්ඡා කරන්න?

පි : කලින් අපි වාචිකවත්, ඇතැම් අවස්ථාවල ලිඛිතවත් ඉදිරිපත් කරපු කරුණුත්, මාධ්‍යය මගින් අපි අනාවරණය කරපු කරුණුත් සලකා බලලා තමයි අපිට එන්න කිව්වේ. ඉතින් මට දැන් ඇත්ත වශයෙන්ම මතක නැහැ කොයි, කොයි මොහොතේද මේවා ඉදිරිපත් කලේ කියලා. මොකද ඒ දවස්වලට අපිට දිගටම තොරතුරු ගලාගෙන ආවා විශාල තොරතුරු ප්‍රමාණයක්. මේක ඉස්ලාම් සම්බන්ධයෙන් හොයන ගවේශක කණ්ඩායමක් විසින් තමයි අපිට මේක සකස් කර දුන්නේ. අපි ඒ තොරතුරු ඔක්කොම එකට කළමනාකරණය කරලා පහසුවෙන් ඉදිරිපත් කරන්න උවමනාව නිසා.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ශි හේරත් මහත්මිය:</u>

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදි ස්වාමීන් වහන්සේ සඳහන් කරන්නට යෙදුනා එම 2014.07.14 වෙනි දින ආරක්ෂක අමාත්‍යාංශයේ පැවැත්තූ සාකච්ඡාවේදි ලිඛිතව එම සාකච්ඡාවට ඉදිරිපත් කරන ලද ලේඛනයක්....

පි : මැතිනියනි ඒක නිවැරදි කලොත් හොඳයි. ලිඛිතව දුන්නද කියලා මට මතක නැහැ, මේ කරුණු ඉදිරිපත් කලා. ඔය ලියවිල්ලම දුන්නද කියන්න මට මතකයක් නැහැ. ඔය සටහනේ තියෙන කරුණු ඉදිරිපත් කළා. ඒක වාචිකව කළා වගේ තමයි මතක.

ප්‍ර : හාමුදුරුවනේ මෙය ලිඛිත ආකාරයට යම් අවස්ථාවක මේ අවස්ථාවේ ඔබ වහන්සේ භාර දෙන ලේඛනය ආරක්ෂක අමාත්‍යාංශය වෙත භාර දීමක් සිද්ධ කළාද එම සාකච්ඡාවේ දිනයේදීම නොවුනත් පසු අවස්ථාවකවත්?

පි : ඔය ලේඛනයම, ඔය ආකාරයෙන්ම දුන්නද කියලා මතකයක් නැහැ. ඔබ තුමිය ප්‍රශ්න අහනවා වගේ මොකක්ද මේ තවුහිද් කියන්නේ, තවුහිද් ගැන ලියලා දෙන්න ඇති. මේ කොල ඔය විදියටම දුන්නේ නැහැ. ඒකයි මම කිව්වේ.

ප්‍ර : මේ කරුණු?

පි : කරුණු සාකච්ඡාවට බඳුන් කළා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එහෙම වුනොත් හාමුදුරුවනේ C647 කියලා සලකුණු කරන ලද පිටු 2 කින් යුක්ත කාරණා 25 ක් තිබිච්ච කරුණුමද පැහැදිලි වශයෙන් මෙහි තවදුරටත් විකාශනය කරලා දාලා තියෙන්නේ?

පි : ඔව්.

ප්‍ර : එම සාකච්ඡාවේදි සාකච්ඡාවට බඳුන් වුණා කියලා මේ වන විටත් ඔබ වහන්සේ ලබා දී තිබෙන C647 කියන ලේඛනයක් අපි ගරු සභාවට සලකුණු කළා?

පි : ඔව්.

ප්‍ර : ඒ ලේඛනයේ තියෙන කරුණුමද ඔබ වහන්සේ දැන් ඉදිරිපත් කරපු පිටු 7 ක් සහිත ලේඛනයේ විශාල වශයෙන් පැහැදිලි කරලා සඳහන් කරලා තියෙන්නේ?

පි : ඔව් මොකද අර කලින් ඉදිරිපත් කරපු ලේඛනයේ අපිට සමහර වර්ෂය එහෙම දාන්න අමතක වුණා. මේ කරුණු හොයාගෙන යන කොට තමයි මට ඊයේ තමයි ඇත්තටම මේ ලේඛනය හම්බ වුණේ. පරණ තොරතුරු ගොඩක තිබිලා. නමුත් ඒ අපිම අධ්‍යයනය කරපු ඒ කරුණු මේකට දාලා තිබුණේ නැහැ වර්ෂවල් තමයි තියෙන්නේ. වර්ෂ සහ සමහර නම්.

ප්‍ර : දැන් හාමුදුරුවනේ ඔබ වහන්සේ මේ සාකච්ඡාවට සහභාගී වීමෙන් අනතුරුව මේ කරුණු ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට, එයට සහභාගී වූ අනික් නිලධාරීන්ට පැහැදිලි කිරීමක් කලාම ඔබ වහන්සේට ඔවුන්ගෙන් ලැබුණු ප්‍රතිචාර මොනවාද?

පි : ඒ අවස්ථාවේදි එක පළමුවෙනි අවස්ථාවේ එවකට ආරක්ෂක ලේකම්වරයා ගෝඨාභය රාජපක්ෂ මහත්තයා කිව්වේ හාමුදුරුවනේ ඒ සාකච්ඡාව සඳහා මෙතන ඉන්න අපේ ස්වාමීන් වහන්සේ නමකුත් සහභාගී වුණා අපේ සංවිධායක හාමුදුරුවෝ. හාමුදුරුවනේ අපි යුද්දේ ඉවර කරලා හුස්ම ගත්තා විතරයි, මේ ප්‍රශ්නේ බරපතලකම අපිට තේරෙනවා, අපි මේ ගැන ක්‍රියා කරනවා, මේ ගැන සොයා බලනවා, ඒ වෙනුවෙන් ඇත්තටම අපේ ඒ බලගැන්වීම හරහා වෙනමම බුද්ධි ජාලයකුත් ආරම්භ කලා කියලා තමයි අපේ දැනුවත් වීම. අනිත් නිලධාරීනුත් ඉතාම සාවදානව මේ කරුණුවලට කන් දුන්නා. ඒ අය සමහර දේවල් අපි යෝජනා හැටියට ඉදිරිපත් කරපුවා රජය සමඟ සාකච්ඡා කරලා සම්පූර්ණ කරන බවටත් ඒ කාලේ පොරොන්දු වුණා.

ප්‍ර : ඒ අනිත් නිලධාරීන් අතර ඔබ වහන්සේට නම් වශයෙන් කීමට හැකි අය මතකයක් තිබෙනවද හාමුදුරුවෙන් මේ සාකච්ඡාවට සහභාගී වුණේ කවුද කියලා?

පි : ජනරාල් හෙන්දවිතාරණ මැතිතුමා. ඒ වගේම සම්පූර්ණ නම මට මතක නැහැ, DIG මහත්මයෙක් සහභාගී වුණා වාකිෂ්ට මැතිතුමා,

FAIR COMMENT BY JEZEEM

SIS හෝ ඒ සංවිධානයේ හිටපු ප්‍රධානියෙක්, ඒ වගේම සුරේෂ් සලේ මැතිතුමා, ආරක්ෂක ලේකම්තුමා අනිත් අය ඇත්තටම මතකයට එන්නේ නැහැ හුඟක් කලින් නිසා.

ප්‍ර : ඔබ වහන්සේගේ පාර්ශවයෙන් ඔබ වහන්සේ හැරුණු කොට කවුද හාමුදුරුවනේ මේ කරුණු දැක්වීමට ගියේ මේ සාකච්ඡාවට?

පි : සංවිධානයට මම ලේකම් හාමුදුරු හැටියටත්, අපේ ජාතික සංවිධායක මෙතනත් වැඩ ඉන්නවා ඒ විතාරන්දෙනියේ නන්ද හාමුදුරුවෝ. අපේ සභාපති හාමුදුරුවෝ කිරම විමලජෝති නායක හාමුදුරුවෝ, මූල්‍ය ලේකම් හාමුදුරුවෝ, අපි සංවිධානයට වෙනම අවස්ථා දුන්නා. ඊලඟට පොදුවේ තවත් සංවිධාන කිහිපයක නියෝජිතයන් එක්කලත් අපි සාකච්ඡාවට ගියා. තවත් අවස්ථාවක මහානායක හාමුදුරුවරු එක්කලා අපි ආරක්ෂක ලේකම්තුමා සමඟ අපි වෙනම සාකච්ඡා කලා. එදා දවසේ අර ඉහත කී නම් ටික තමයි අපි සහභාගී වුණේ. මතක නැහැ මොකද ඒ සිද්ධීන් දවස දවස ගොඩනැගුන නිසා හැම දවසකම වගේ මුණගැහීම් කරලා තියෙනවා.

ප්‍ර : හාමුදුරුවනේ ඔබ වහන්සේ සඳහන් කරන්නට යෙදුනා දැන් මේ 2014 ජුලි මාසේ 14 වෙනි දින පවත්වන්නට යෙදුන සාකච්ඡාවට අමතරව වරින්වර ආරක්ෂක අමාත්‍යාංශයට ඔබ වහන්සේ වැඩම කළ බව විවිධ සාකච්ඡාවන් සඳහා මේ ඉස්ලාම් අන්තවාදයට අදාලව කරුණු දැක්වීම සඳහා?

පි : ඔව්.

ප්‍ර : සාමාන්‍යයෙන් කී වතාවක් විතර මෙවැනි සාකච්ඡා පැවැත්තුනාද හාමුදුරුවනේ?

පි : 6, 7 වතාවක්.

ප්‍ර : ඒ සෑම අවස්ථාවකදීම රජය පාර්ශවය වෙනුවෙන් ආරක්ෂක අමාත්‍යාංශය වෙනුවෙන් සිටි පුද්ගලයන් අතර හැම සාකච්ඡාවකටම වගේ සහභාගී වුණ පුද්ගලයන් ඔබ වහන්සේට මතකයක් තියෙනවද සියළුම සාකච්ඡාවලට වගේ?

පි : සියළුම සාකච්ඡාවලට සහභාගී වුණු නිලධාරියා තමයි සුරේෂ් සලේ මැතිතුමා. අවස්ථා 2,3 ක වගේ අවස්ථා 3 ක් කියලා ගත්තොත් ඒක හරි හෙන්දවිතාරණ මැතිතුමා, දුරකථනයෙන් අපි දැනුවත් කරලා තියෙනවා අපි සමහර අවස්ථාවල. ඔය ටික තමයි. තව බුද්ධි නිලධාරීන්, කියන්නේ යම් යම් කරුණු වඩා හොඳින් දැන ගැනීම සඳහා ඒ ඒ අවස්ථාවට ඒගොල්ලන්ගේ අර පහළ නිළයන් කැඳවනවා. ඒ අයගේ නම් නම් ඇත්ත වශයෙන් මතක නැහැ. මොකද අපිට නම් දෙන්නෙත් වෙන නමක්ද දන්නේ නැහැනේ ඒ නිසා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : හාමුදුරුවනේ ඔබ වහන්සේ මේ සාකච්ඡාවන් සඳහා 6, 7 වතාවක් සහභාගී වුණේ කාල වකවානුව පිළිබඳ මතකයක් තිබෙනවද හාමුදුරුවනේ, 2014 ජූලි මාසේ 14 මේ එක සාකච්ඡාවක්, ඉන් අනතුරුව?

පි : ඔව් දැන් ඔය මගේ අතේ දැනට තිබෙන්නේ කැඳවීම් ලිපියක් විතරයි ඔය. අනික් ලිපි කොහේද කියලා මතක නැහැ. දැන් සිද්ධිය ගැන ගත්තොත් හලාල් සිද්ධිය වෙලාවේ කිහිප වතාවක් මුණ ගැහුණා.

ප්‍ර : 2013 වර්ෂයේ?

පි : ඔව් 2013 වර්ෂයේ. ඊලඟට පුරාවස්තු දැන් නැගෙනහිර පළාතේ මොට්ටයාගල දාගැබ දෙකට මැදින් සමතලා කරලා ඒ ප්‍රශ්නය ඇති වෙච්ච වෙලාවේ පුරා විද්‍යා දෙපාර්තමේන්තුවත් එක්කලා සාකච්ඡා කළා. පුරා විද්‍යා දෙපාර්තමේන්තුවට ගියේ ආරක්ෂක අමාත්‍යාංශයේ සාකච්ඡාවට ගිහිල්ලා. එහෙම සිද්ධි වශයෙන් කියන්න මතකයක් නැහැ. මොකද අපිට විශ්වාසය තිබුණා මේගොල්ලන් ලව්වා මේක කරන්න පුළුවන් කියලා.

ප්‍ර : හාමුදුරුවනේ මම ඒ ප්‍රශ්නේ අහන්න හේතු පාදක වුනේ 2015 ජනවාරි මාසයේ ජනාධිපතිවරණයක් පැවැත්වෙනවනේ,

පි : ඔව්.

ප්‍ර : ඒ අනුව ආරක්ෂක අමාත්‍යවරයා මාරු වෙනවානේ?

පි : ඔව්.

ප්‍ර : ඒ මාරුවට පසුවත් ඔබ වහන්සේ මේ දැනුවත් කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයට සාකච්ඡා සඳහා සහභාගී වුණාද කියන කාරණාව දැන ගැනීමටයි?

පි : නැහැ, අපිව නෙමෙයි මේ ෆයිසර්වත් ගණන් ගත්තේ නැහැ.

ප්‍ර : මොකද හාමුදුරුවනේ 2015 ජනවාරි මාසෙන් පසුවත් සුරේෂ් සලේ මහතා තවදුරටත් ඔහුගේ තනතුරේ රැඳී ඉන්නවා අගෝස්තු මාසය තරම් වන කාලයක් දක්වා. ඒ වකවානුවෙත් ඔබ වහන්සේ ඒ මහතාට මේ තොරතුරු ලබා දෙමින් සාකච්ඡාවට සහභාගී වුණාද කියන කාරණාව දැන ගැනීමටයි මා ඒ ප්‍රශ්නය ඇහුවේ?

පි : නැහැ, නැහැ. ආණ්ඩු මාරු වුණායින් පස්සේ එතුමා මුණ ගැසුනේ නැහැ. ඒ කියන්නේ 2015 ආණ්ඩුව වෙනස් වුණානේ, ඊට පස්සේ අපි මුණ ගැහුනේ නැහැ. ඒ කියන්නේ සාකච්ඡාවකට කැඳෙව්වෙත් නැහැ, මුණ ගැහුනෙත් නැහැ, අපිට දැන ගන්න ලැබුනේ මොකද ඒගොල්ලෝ ඒ වෙලාවේ හිටියේ බොහොම අවදානම් කලාපයක. මම හිතන්නේ රටින් ගියා ඊට පස්සේ.

ප්‍ර : දැන් හාමුදුරුවනේ අපි කතා කරමින් හිටි මතවාද සංවිධාන අතර ජමාතේ ඉස්ලාමීය කියන මතවාදයක පිහිට වූ සංවිධානයකුත් ඊට

FAIR COMMENT BY JEZEEM

අදාල සිවිල් සංවිධානත් මේ රට තුළ තිබෙන බවට ඔබ වහන්සේ පෙර දිනයේදී සාක්ෂි ලබා දීලා තියෙනවා?

පි : ඔව්.

ප්‍ර : මේ ජමාතේ ඉස්ලමික් කියන සංවිධානයේ මූලාරම්භය මොන රටේද?

පි : කියන්නම්, ජමාතේ ඉස්ලාම් සංවිධානය පකිස්ථානයේ තමයි බිහි වෙන්නේ. ඒකේ නායකයා නිර්මාතෘවරයා මවුදුදි කියලා නායකයෙක්. ජමාතේ ඉස්ලාම්.

ප්‍ර : මේ සංවිධානයේ ශ්‍රී ලංකාව තුළට ආගමනයක් වෙන්නේ කොයි කාලේ වගේද?

පි : ජමාතේ ඉස්ලාම්, 1954 වර්ෂයේ මවුලවි M.ඊබ්‍රාහිම් නැමැත්තා විසින් ජමාතේ ඉස්ලාමය ශ්‍රී ලංකාවේ ආරම්භ කරන ලදි. පකිස්ථානයේ ක්‍රියාත්මක වන ජමාතේ ඉස්ලාම් ලංකාවේ පිහිටුවන්නේ ජමාතේ ඉස්ලාම් කියලා දේශපාලන ව්‍යාපාරයක් තියෙනවා පකිස්ථානයේ. ඒ අනුරුවට අනුව තමයි ලංකාවේ ජමාතේ ඉස්ලාම් ව්‍යාපාරය ආරම්භ කරන්නේ.

ප්‍ර : ඒ අනුව හාමුදුරුවනේ ඔබ වහන්සේ කරන ලද තොරතුරු සොයා ගැනීම්වලින් හොයා ගන්න පුළුවන්ද හාමුදුරුවනේ ශ්‍රී ලංකාව තුළ පිහිටුවන ලද ජමාතේ ඉස්ලාමීය සංවිධානයට අනුග්‍රහය දැක්වීමක් පකිස්ථානයේ මව් සංවිධානය මූල්‍යමය හෝ වෙනත් ආකාරයකින් සිද්ධ වුණාද කියන කාරණාව ඔබ වහන්සේ දන්නවාද?

පි : එහෙම කියන්න නම් තොරතුරු නැහැ අපි ලභ. නමුත් අපි හොඳටම දන්නවා පකිස්ථානය තමයි ලෝකේ මේ මරාගෙන මැරෙන ප්‍රහාරවලට, ඊලඟට සන්නද්ධමය ක්‍රියාකාරකම් සඳහා ඇත්තටම පකිස්ථානයේ ඔය තියෙන සංවිධාන තමයි පුහුණුව ලබා දෙමින් පිටරටවල් වලට යවන්නේ. ඒක නිකම් මරාගෙන මැරෙන මිනිස්සු තනන ෆැක්ටරියක් වගේ. 1990 ගණන් වල 94 අවුරුද්දේ මදුසා 20000 ක් වැහුවා ජනරල් පර්වේෂ් මුශාරක් අගමැති තුමා ඇවිල්ලා මේ ප්‍රශ්නය නිරාකරණය කරන්න ඕන කියලා. ඉතින් අපි හිතනවා මොකද යම් යම් කණ්ඩායම් පකිස්ථානු ජාතිකයන් මෙහේ ඇවිල්ලා වීසා නැතුව අවි ජාවාරම්, මත්කුඩු ජාවාරම් ඒ වගේම ඔය ගණිකා ව්‍යාපාරය සඳහා කණ්ඩායම් එක්කගෙන ඒම් ආදී නොයෙක් දේවල් වලට හසු වුණා. ඉතින් අපි දන්නේ නාහැ ඒ අතර කොහොමද මේ සබඳකම් ඇති වන්නේ කියලා. ඒ වගේම ඔය වදපෙති සම්බන්ධයෙන් කතා කලා පහුගිය කාලයේ. ඒත් පකිස්ථාන් ජාතිකයෝ තමයි බහුල වශයෙන් හම්බ වුණේ යම් යම් ඔය කෑම වර්ගවලට යොදන ආහාර

FAIR COMMENT BY JEZEEM

රස කරන රසකාරක ගෙනල්ලා. මට නම මතකයකට එන්නේ නැහැ.

ප්‍ර : දැන් හාමුදුරුවනේ මේ ජමාතේ ඉස්ලාමිය සංවිධානය 1959 ශ්‍රී ලංකාව තුළට පිහිටුවීමක් සිද්ධ කරලා ඉන් අනතුරුව මේ හරහා සිවිල් සංවිධාන ඒ මතය ප්‍රචලිත කිරීමට අදාල වන සංවිධාන බිහි කිරීමක් ඔවුන් සිද්ධ කරලා තියෙනවද?

පි : ජමාතේ ඉස්ලාම්

ප්‍ර : එහෙමයි හාමුදුරුවනේ.

පි : එහෙම සෘජුව කියන්න අමාරුයි, නමුත් මේ අය මේ ලංකාවේ පිහිටුවලා තියෙනවා පදනමක් MFCD කියලා. මුස්ලිම් සංස්කෘතික සංවර්ධන පදනම.

ප්‍ර : Muslim Foundation for cultural and Development?

පි : MFCD. මුස්ලිම් සංස්කෘතික සංවර්ධන පදනම. අංක 1A, බණ්ඩාරනායක මාවත, කොළඹ 12. ඒගොල්ලන්ගේ මතවාදය නියෝජනය කරන්නෙත් ජමාත් ඉස්ලාම් නිකාය කියලාමයි.

ප්‍ර : එය හාමුදුරුවනේ ඔබ වහන්සේගේ තොරතුරුවලට අනුව රාජ්‍ය නොවන සංවිධානයක් හැටියට ස්වේච්ඡා සංවිධානයක් හැටියටද පවතින්නේ?

පි : ඔව් එය ලියාපදිංචි අංකය නම් අපිට හොයා ගන්න බැරි වුණා. දුරකථන අංක තියෙනවා. නමුත් ඔවුන් සංස්කෘතික සංවර්ධන පදනම හැටියට තමයි ක්‍රියාත්මක වෙන්නේ.

ප්‍ර : ඒ විදේශාධාර ලබන සංවිධානයක් හැටියට තියෙනවා කිව්වොත් හරිද හාමුදුරුවනේ?

පි : අනිවාර්යයෙන්ම.

ප්‍ර : ඒකට විදේශාධාර ගලා ඒමක් සිදු වන බව ඔබ වහන්සේ රැස්කර ගත් තොරතුරුවල තියෙනවා?

පි : තියෙනවා. මොකද හේතුව ඒ අය මේ සංස්කෘතික කටයුතු සංවර්ධනය කිරීම යටතේ කියලා දැන් ඔය Cultural Shows ඒ වගේ දේවල් පෙන්වන්න පිරිස් හුවමාරු කර ගන්න මොකද මෙවැනි පදනමක් යොදා ගත්තාම හරි පහසුයි සංචාරයට. වීසා ලබා ගන්න, යුරෝපෙට වීසා ලබා ගන්න, වෙනත් රටවල්වලට වීසා ලබා ගන්න, ඒ වගේම අර සංස්කෘතික ක්‍රියාකාරකම්වල තමයි අපි නියැලෙන්නේ, අපේ කිසිම මේ අන්තවාදයක් නැහැයි කියන එක මතුපිටට පෙන්නන්න එවැනි කටයුතු සඳහා මේ අය සංස්කෘතික ක්‍රියාකාරකම් තමයි ඉස්සරහාට යොදන්නේ.

දැන් වේලාව : ප.ව. 4.00 යි

මෙතැන් සිට ල/ලේ :- මුතුමාලී මෙනවිය විසින් සටහන් කරන ලදි.

FAIR COMMENT BY JEZEEM

වේලාව : ප.ව. 04.00 යි.
පෙර සටහන් ල/ලේ : ධම්මිකා මිය.
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි.

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය

ප්‍ර : කුමන රටවල්වලින් මේ සංවිධානයට ආධාර ගලා එනවාද කියලා ඔබ වහන්සේ තොරතුරු රැස් කර ගැනීමක් කරගෙන තියෙනවාද?

පි : එහෙම කියන්න අමාරුයි. අපි දන්නවා මේ විශේෂයෙන් ඔය world Muslim Leagueවිසින් මේ සියළුම සංවිධානවලට සල්ලි දෙනවා. ඊළඟට ජමාතේ ඉස්ලාම් සංවිධානය ඉන්දියාවේ තහනම් කළා. අසල්වැසි බංගලාදේශය තහනම් කළා. අපේ රටේ තාම තහනම් කරලා නෑ. මා දන්නා තරමට ඒ රටවල් දෙකේ ජමාතේ ඉස්ලාම් තහනම්. ඒ වගේම පකිස්ථානයෙත් තහනම් සංවිධානයක්. මේ ප්‍රශ්න නිර්මාණය වුණාට පස්සේ.

ප්‍ර : MFCD සංවිධානයට අමතරව තවත් ජමාතේ ඉස්ලාමීය සංවිධානය යටතේ ඒ මතවාදය ප්‍රචලිත කරමින් තිබෙන සිවිල් සංවිධාන තියෙනවාද මේ රට තුළ?

පි : අනේ මැතිනියනි ආපහු අහන්න.

ප්‍ර : අනිකුත් සංවිධාන? MFCD හැරුණු කොට ජමාතේ ඉස්ලාමීය යටතේ තිබෙන අනිත් සංවිධාන. ඔබ වහන්සේට අවබෝධයක් තියෙනවාද ශ්‍රී ලංකා ඉස්ලාමීය ශිෂ්‍ය සංවිධානය ?

පි : ඔව්.

ප්‍ර : ජමාතේ ඉස්ලාමීය යටතේ පවතින ශිෂ්‍ය සංවිධානයක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ පවතින බව?

පි : ඔව්.

ප්‍ර : ඒ සංවිධානයට අදාළ වන ආකාරයේ සාක්ෂි මේ සභාව වෙත මේ වන විට ඉදිරිපත් වී තිබෙනවා. ඒ අනුව ඔබ වහන්සේ රැස් කර ගත් තොරතුරු මොනවාද කියලා ගරු සභාවට කියන්න ශ්‍රී ලංකා ඉස්ලාමීය ශිෂ්‍ය සංවිධානය සම්බන්ධයෙන් ?

පි : ඒ අය පිහිටුවා ගෙන තියෙනවා මේ ශිෂ්‍ය සංවිධානයක් තලබා කියලා. ඇත්ත වශයෙන්ම ඒ ශ්‍රී ලංකා ඉස්ලාමීය ශිෂ්‍ය සංවිධානයේ ක්‍රියාකාරීකයෙක්ව හිටපු තරුණයෙක් තමයි අර බුදු පිළිම කඩන්නේ මාවනැල්ලේ. මේ මේ පිළිමතලාවේ

ප්‍ර : හාමුදුරුවනේ නම් කියන්න එපා කියලයි මම හිතන්නේ වඩාත් සුදුසු වෙන්නේ. සමහරක් විට ජීවතුන් අතර ඉන්න අය නිසා

පි : හොඳමයි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ අයට මතු අවස්ථාවක නඩු කටයුතු පැවරීමට හැකියාවක් තිබෙන නිසා ඔබ වහන්සේ සිද්ධිමය වශයෙන් කරුණු සඳහන් කරන කොට නම් කියන්නේ නැතුව කියනවා නම් හාමුදුරුවනේ වඩාත් සුදුසුයි.

පි : හොඳමයි. ඊළඟට ඒ

ප්‍ර : මොහොතක් හාමුදුරුවනේ. හාමුදුරුවනේ ඔබ වහන්සේ කෙළින්ම දත් තොරතුරක් තිබෙනවා නම් නමක් සඳහන් කරන්න හාමුදුරුවනේ. පෞද්ගලිකවම දන්නවා නම් එහෙම නැතුව හාමුදුරුවනේ අසා දැනගත් තොරතුරු වශයෙන් කියනවා නම් නම් සඳහන් කරන්න එපා කියන කාරණාව තමයි ස්වාමීන් වහන්සේ කියන්න තියෙන්නේ.

පි : හොඳයි.

ප්‍ර : පැහැදිලි කරන්න හාමුදුරුවනේ ඔබ වහන්සේ කියමින් සිටි දේ?

පි : ඒ ශ්‍රී ලංකා ඉස්ලාමීය ශිෂ්‍ය සංවිධානය ඍජුවම මේ සහරාන් හෂීම්ගේ වැඩ පිළිවෙලත් එක්ක ඒ කියන්නේ තවුහිද් ව්‍යාපාරයත් එක්ක බද්ධ වෙලා වැඩ කරපු සංවිධානයක් බව අපි පසුව ඉතාම හොඳින් දැන ගත්තා. ඊළඟට මේ අය වෙනත් විදියකට මේ තරුණ කොටස් ආගම්වලට ඉස්ලාම් ආගමට හරවා ගැනීම සඳහා මේ හිරා පදනම තුළිනුත් මේ ජමාතේ ඉස්ලාමීය වැඩ කරනවා. ඒ ජමාතේ ඉස්ලාම් සංවිධානයට සම්බන්ධ එකක් තමයි හිරා පදනමත්. පොත් මුද්‍රණය කිරීම, ඉස්ලාම් ආගමට හරවා ගැනීම සඳහා ඒ අය කටයුතු කරනවා. ඒ වගේම තව ජමාතේ ඉස්ලාම් මතවාදය තුළ නැත්නම් ඒ නිකාය තුළ ඉඳගෙන වැඩ කරන සංවිධානයක් තමයි සැරන්ඩිබ් කියන්නෙත්. ඒ ආයතනයත් විදේශීය ආධාර ලබන සංවිධානයක්. ඒ වගේම අන්තවාදී විදේශීය සංවිධාන ගණනාවක් එක්ක OMCED කියලා මේ ඒකට කියන්නේ මේ Organization for Muslim Students Education Development

ප්‍ර : OMSED හාමුදුරුවනේ?

පි : OMSED.

ප්‍ර : එහෙමයි.

පි : කියන ආයතනය.

ප්‍ර : Islamic Federation of students Organization

පි : ඔව්. ඒ ජාත්‍යන්තර සංවිධානත් එක්කත් සම්බන්ධකම් පවත්වනවා.

ප්‍ර : දැන් මේ හිරා සංවිධානය මොන වගේ ක්‍රියාවලියක නිරත වෙන සංවිධානයක්ද හාමුදුරුවනේ ?

FAIR COMMENT BY JEZEEM

පි : හිරා සංවිධානය හිරා Foundation හැටියට තමයි අපි හඳුන ගෙන තියෙන්නේ.

ප්‍ර : එහෙමයි හාමුදුරුවනේ.

පි : මම හිතනවා ඒ අපේ ළඟ ඒ තියෙන පොත්පත් තියෙන සංවිධානයම වෙන්න ඕනී මේ සංවිධානය කියලා. නමුත් අර පහුගිය කාලේ නැගෙනහිර පළාතේ ප්‍රසිද්ධ දේශපාලකයෙක්ගේ නමක් ඇදුණා මේ හිරා පදනමට. ඔහුගේ සියළු ගනුදෙනු නැත්නම් ඔවුන්ට විදේශ ආධාර ගලා එන්නේ මේ හිරා පදනම හරහා. ඔවුන් තමයි නැගෙනහිර විශ්ව විද්‍යාලය හදන්න මුල් වුණේ. ඒ වගේම ලංකාව පුරා ජමාතේ ඉස්ලාම් මතවාදය නැත්නම් මේ වහබ්වාදය පතුරුවා හැරීම සඳහා මේ අය මේ විශාල වශයෙන් මුද්‍රිත පොත්පත් බෙදා හරිනවා හිරා පදනම හරහා.

ප්‍ර : ඔබ වහන්සේ සඳහන් කරන්නට යෙදුණා හිරා පදනමට සම්බන්ධිත දේශපාලඥයෙකු සිටින බවට ඔබ වහන්සේට තොරතුරු තියෙන බව. ඔබ වහන්සේට ප්‍රසිද්ධ මාධ්‍යය ඉදිරියේ නම සඳහන් කරන්නට හැකියාවක් තිබෙනවා නම් එහෙම සඳහන් කරන්න. නැත්නම් ලියා හෝ ගරු සභාවට ලබා දෙන්න?

පි : පුළුවන්. ඔහු ප්‍රසිද්ධ කෙනෙක්. හිස්බුල්ලා මහත්මයා. නැගෙනහිර පළාතේ.

ප්‍ර : ඔහු සහ හිරා සංවිධානය අතර තිබෙන සම්බන්ධය මොන වගේ එකක් කියලාද ඔබ වහන්සේගේ තොරතුරුවලට අනුව දැන ගන්න ලැබෙන්නේ?

පි : ඒ කියන්නේ සංස්කරණයට යටත්ව කියන්න පුළුවන් අපිට අපි දැන ගත් තොරතුරුවල හැටියට මොකද අපිට සෘජුව කියන්නේ නැති නිසා අපිට දැන ගන්න ලැබුණේ ඔහුගේ පුතාගේ නමින් තමයි හිරා සංවිධානය තියෙන්නේ කියලා . හිරා Foundation එක. ඒක නිකම් පවුලේ සංවිධානයක් වගේ.

ප්‍ර : හාමුදුරුවනේ ඔබ වහන්සේ මේ අවස්ථාවේදී හිරා සංවිධානය නම් කරන්නේ ජමාතේ ඉස්ලාමීය මතවාදය යටතේ පැවත එන සංවිධානයක් හැටියටද?

පි : ඔව්. ඒ ජමාතේ ඉස්ලාම් මොකද නැගෙනහිර පළාතේ මේ සියල්ල ක්‍රියාත්මකයිනේ. දැන් ඒක හරියට උදාහරණෙකින් කිව්වොත් අපි හැමදාම යන පන්සලක හාමුදුරුවෝ මූණ බලලා හිනා වුණේ නැතිනම් මම ආයේ ඔය පන්සලට යන්නේ නෑ කියලා අනිත් පන්සලකට යනවා වගේ වැඩක් තමයි මේ. අපි හිතමු එක සංවිධානයක වැඩ කරනවා එතන පොඩි හරි ඒ අරමුණක නැත්නම් ටක්ගාලා අනිත් සංවිධානයට යනව. මේ ඔක්කොම

FAIR COMMENT BY JEZEEM

වහබි සංවිධාන තමයි නම් විතරයි වෙනස්. ක්‍රියාමාර්ග වෙනස්. නමුත් ඒගොල්ලන්ගේ මතවාදය ඒ ජමාතේ ඉස්ලාම් නිකායට සම්බන්ධයි. මොකද ජමාතේ ඉස්ලාම් තමයි මේ ආසියානු කලාපයේ ඔය ආධාර හුවමාරු කර ගැනීම සම්බන්ධයෙන් නම් දරන ඒ මතවාදය තුළ ඉන්නේ. ඉතින් ඒක අපිට විශ්වාසක් ඇති වුණේ ඒක එහෙම වෙන්න ඇති කියලා අර මලික් අබ්දුල්ලා නමින් විශ්ව විද්‍යාලය හදන්න කෝටි 1500 ක මුදලක් එහෙම කොහොමද එන්නේ. ඉතින් ඒ ඔක්කොම ආවේ හිරා පදනමට කියලා තමයි අපි දැන ගත්තේ.

ප්‍ර : ඒ කියන්නේ හාමුදුරුවනේ මේ හිස්බුල්ලා මහතා දේශපාලඥයෙක් වශයෙන් සිටින හිස්බුල්ලා මහතා මේ ජමාතේ ඉස්ලාමීය මතවාදයට අනුගත වූ පුද්ගලයෙක් වශයෙන් ඔබ වහන්සේට තොරතුරු තියෙනවාද?

පි : අපි එහෙම අනුමාන කරනවා.

ප්‍ර : ඒ වගේම මේ සෙරන්ඩිබ් වශයෙන් හඳුන්වන ආයතනය මොන වගේ එකක්ද හාමුදුරුවනේ මොනවගේ සංවිධානයක්ද?

පි : ඒ සංවිධානයක් විදේශ ආධාර ලබන සංවිධානයක්.

ප්‍ර : කොහේද පවතින්නේ?

පි : සෙරන්ඩිබ් සංවිධානය තියෙන්නේ අංක 44/1, නන්දන උයන, කොළඹ 04.

ප්‍ර : බම්බලපිටිය?

පි : කොළඹ 04.

ප්‍ර : එහෙමයි හාමුදුරුවනේ.

පි : එතකොට ඒකේ නම තියෙන්නේ සෙරන්ඩිබ් අධ්‍යාපන පදනම කියලා. ඒකේ සභාපති මොහොමඩ් රීෂා කියලා කෙනෙක්. 1991 පටන් ගන්නේ. ආගමික නිකාය තබලික් ජමාත් ආගමික නිකාය.

ප්‍ර : එහෙමයි හාමුදුරුවනේ. දැන් ඔබ වහන්සේ සඳහන් කළා ශ්‍රී ලංකාව තුළ OMSED එහෙම නැත්නම් Organization for Muslim Students Education Development නැමැති ජාත්‍යන්තර සංවිධානයට අනුගතව ශ්‍රී ලංකාව තුළත් ශාඛා පවතින බව. ඒ ශාඛා අන්තවාදී මත දරන එහෙම නැත්නම් ජමාතේ ඉස්ලාමීය මත දරමින් ශ්‍රී ලංකාව තුළ පවතින හැටියටද ඔබ වහන්සේට තොරතුරු ලැබී තිබෙන්නේ?

පි : ජමාතේ ඉස්ලාම් හැටියටත් තොරතුරු අපි හොයා ගෙන තියෙනවා යම් පමණකට. නමුත් මේ සියල්ලටම ඒ කියන්නේ දැන් ඔය නම් උඩින් සඳහන් කරපු ඔක්කෝටම මුදල් ගලා එන්නේ ඒගොල්ලන්ට වැඩිමනත් ලෙස මේ Muslim world League එකෙන්. ඉතින් අපිට අමාරුයි මේක කොයි එකද හරියට කියලා

FAIR COMMENT BY JEZEEM

නිවැරදි කර ගන්න. Muslim world League එක මේ ඔක්කොටම සල්ලි දෙන බව නම් අපි දනන්වා. මොකද නැගෙනහිර පළාතට ගිහිල්ලා බැලුවොත් හැම එකකම Muslim world League Muslim world League කියලා ගහලා තියෙනවා. විවිධ පාරවල්වල, හදපු ගොඩනැගිලිවල, නිවාස වල, පල්ලිවල ඒවා ඉතින් නිකාය භේද නෑ. හැබැයි Muslim world League එකෙන් හැමෝටම සල්ලි දීලා තියෙනවා.

ප්‍ර : හාමුදුරුවනේ එවැනි ඡායාරූප ගත කරන ලද ඡායාරූපයක් ඔබ වහන්සේට සභාවට ඉදිරිපත් කිරීමට හැකියාවක් තිබෙනවාද ඔය කියන ආකාරයට?

පි : ගෙනල්ලා දෙන්න පුළුවන් අද නම් හැබැයි මේ මොහොතට නෑ. අපි ළඟ තියෙනවා. කාත්තන්කුඩි හැමතැනකම වගේ තියෙනවා.

ප්‍ර : එහෙමයි හාමුදුරුවනේ.

පි : පින්තූරත් තියෙනවා. අපි හිතුවේ නෑ ඕන වෙයි කියලා.

ප්‍ර : PMJD වශයෙන් සංවිධානයක් තිබෙන බවට ඔබ වහන්සේට දැනුවත් වීමක් තියෙනවාද ?

පි : ඔව් අකුරණ ප්‍රදේශයේ ක්‍රියාත්මක වන දේශපාලන ව්‍යාපාරයක්.

ප්‍ර : එය මොන වගේ සංවිධානයක් හැටියටද ?

පි : දේශපාලන ව්‍යාපාරයක්. ඒ කියන්නේ අර ජමාතේ ඉස්ලාම් මං අර මුලින් මතක් කළේ පකිස්ථානයේ දේශපාලන සංවිධානයක අනුරුවටයි හැදුවේ කියලා?

ප්‍ර : එහෙමයි හාමුදුරුවනේ.

පි : එතකොට ඒ ජමාතේ ඉස්ලාම් නිකාය විසින් බල දේශපාලනයට ඇතුල් වීම සඳහා බල දේශපාලනයට බලපෑම් කිරීම සඳහා අර පකිස්ථානයේ තියෙන ඒ සංවිධානයට අනුරූපිව මේ සංවිධාන පිහිටුවලා තියෙනවා කියන එක තමයි අපි හොයා ගත්තේ දේශපාලන සංවිධාන හැටියට.

ප්‍ර : සම්පූර්ණ නම හාමුදුරුවනේ ඔබ වහන්සේට කීමට හැකියාවක් තියෙනවාද PMJD කියන්නේ?

පි : PMJD People's Movement for Justice and Development

ප්‍ර : එය දේශපාලන පක්ෂයක් වශයෙන් ලංකාවේ ලියා පදිංචි වෙලා තියෙනවාද හාමුදුරුවනේ නැත්නම් දේශපාලන ක්‍රියාවල නියැලෙනවාද?

පි : දේශපාලන ක්‍රියාවලියට අවතීර්ණ වුණා ඒ උදවිය 2015. මම 2015 ඇත්ත වශයෙන්ම මේ ඔය PMGG, PMJD, NFGG ආදී මේ සියළු සංවිධාන ගැන විශේෂ සමුළුවක් කැඳවලා Hyde park පිටියේදී විශේෂ හෙළිදරව්වකුත් කළා. මට අවශ්‍ය නම් විනාඩි

FAIR COMMENT BY JEZEEM

කිහිපයකට ඒ විඩියෝ පටය පෙන්වන්න පුළුවන්. එතකොට මට මගේ මතකයත් තව අලුත් කර ගන්නත් පුළුවන් මේ අවසර ලැබෙනවා නම්.

****

<u>ගරු සභාපති ජනක් ද සිල්වා මැතිතුමා</u>

කොමිෂන් සභාවේ කටයුතු සවස 04 පසු වී විනාඩි 35 වන තෙක් කල් තබමි.
දැන් වේලාව : පස්වරු 04.15

****

දැන් වේලාව : - ප.ව.04.55 යි.
තේ විවේකයෙන් පසු කොමිෂන් සභාව නැවත රැස් වේ.
සාක්ෂිකරු නැවත ප්‍රතිඥා දෙයි.

<u>ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය</u>

ප්‍ර : හාමුදුරුවනේ ඔබ වහන්සේ විඩියෝ පටයක් සම්බන්ධයෙන් සාක්ෂියක් ලබා දීමට බලාපොරොත්තු වෙන බව මේ විවේකයට පෙර සඳහන් කළා. ඒ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරන්න හාමුදුරුවනේ?

පි : අර මීට පූර්වයෙන් සිහිපත් කළා වගේ ඔබතුමිය අර අහපු දේශපාලන සංවිධාන ගැන 2015 මේ බලපෙරලියත් එක්ක ඒ ගොල්ලන් ඒ බලය අභ්‍යාස කිරීමට සුදානමින් ඉන්නවා කියන එක තමයි මට ඔප්පු කරන්න ඕනී වුණේ. ඒ වගේම මැතිතුමනි මේ අද විශේෂයෙන් විඩියෝ පට දෙකක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා සහරාන් හෂීම්ගේ. ඔහු 2017 අවුරුද්දේදී නැගෙනහිර කාත්තන්කුඩියේදී ඉතාම දරුණු අන්දමේ අදහස් දැක්වීමක් කරනවා මේ හදීස් සහ ජිහාදය පිළිබඳ. ඉතින් ඒ විඩියෝ පට දෙකත් ලබා දීමට බලාපොරොත්තු වෙනවා සහ ඒවා ප්‍රසිද්ධ මාධ්‍යවල ප්‍රසිද්ධියේ අන්තර්ජාලය තුළ පළ වෙලා තියෙද්දීත් ලෝකය පුරාම බෙලි කපා ගෙන බෙලි කපා ගෙන එනකොට ඇයි අපේ ආරක්ෂක අංශ සහ එහි ප්‍රධානීන් මේවා සොයා නොබැලුවේ ඇයි කියන එකත් විශාල ප්‍රශ්නයක්. ඒ වෙනුවෙන් ඒ හඬපට දෙකත් අපි දෙන්න බලාපොරොත්තු වෙනවා.

ප්‍ර : හාමුදුරුවනේ පෙර ඉදිරිපත් කරන ලද විඩියෝ පටය කවදා දිනයක සිදු කරන ලද කතාවක් ඇතුළත් විඩියෝ පටයක්ද?

පි : 2014 දෙසැම්බර් මාසේ මැතිවරණයට පෙර.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මීට අදාළ CD පටයක් තිබෙනවාද ස්වාමීන් වහන්සේ?

පි : අපිට දෙන්න පුළුවන්.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී ස්වාමීන් වහන්සේ විසින් ගරු සභාවේ අවධානයට ලක් කරන ලද 2014 දෙසැම්බර් මාසයේදී සිදු කරන ලදැයි කියවෙන කතාවක කරුණු ඇතුළත් මෙම විඩියෝ පටය සහිත CD තැටිය RGG 36 වශයෙන් සලකුණු කිරීම සඳහා අවසර අයැද සිටිනවා.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී ස්වාමීන් වහන්සේ විසින් විඩියෝ පටයක් ඉදිරිපත් කරනවා මේ සභාවේ අවධානය සඳහා එම විඩියෝ පටය ආරම්භක අවස්ථාවේදී ද්‍රවිඩ භාෂාවෙන් අකුරු මෙම තීරය මත දිස්වෙනවා. එම අකුරුවලින් සඳහන් වන කාරණාව කුමක්ද යන්න මේ සභාවේ භාෂා පරිවර්තක මහතා හරහා ලබා ගැනීමට ක්‍රියා කරන මෙන් ගෞරවයෙන් අයැද සිටිනවා.

****

<u>කොමිෂන් සභාවේ භාෂා පරිවර්තක ජෝන් කන්දසාමි මහතා</u>

තීව්‍රවාත අමෙප්පෙ ඉස්ලාමිය කිලාපත්තුක්කාක එදුත්තුක්කාට්ටුම් සකරාන් මසූති

අන්තවාදී සංවිධානය ඉස්ලාම් කිලාෆතය පිණිස පැහැදිලි කරන සහරාන් මස්වුදී.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය</u>

ප්‍ර : හාමුදුරුවනේ මේ ඉදිරිපත් කරන විඩියෝ පටය හාමුදුරුවන් වහන්සේ කොහෙන් ලබා ගත්ත එකක්ද හාමුදුරුවනේ අන්තර්ජාලයෙන් ලබා ගත්තු එකක්ද?

පි : අන්තර්ජාලයෙත් තිබුණා. විශේෂයෙන් මුස්ලිම් අර අපි කියන සාම්ප්‍රදායික මුස්ලිම් අය තමයි ලබා දුන්නේ මොකද ඒ අය මේකට විරුද්ධව හුහාක් හඬ නහලා තිබුණා. නමුත් මේක මාධ්‍යවල පල වුණේ නෑ. මේ මෑතකදී ලැබුණේ. මේකේ තියෙන ප්‍රධානත්වය තමයි ඔහු කියන්නේ මොනම හේතුවක් නිසාවත් ජිහාත් මාර්ගය අත හරින්න බෑ. හදිසියෙන් ඉවත් වෙන්න බැහැ. එහෙම වුනොත් අපි විනාශ වෙනවා. වහාම සටන් කරන්න සුදානම් වෙන්න කියන එක තමයි මේකේ අන්තර්ගතය.

ප්‍ර : හාමුදුරුවනේ මේ මොහොතේ මේ භාෂා පරිවර්තක මහතා විසින් කියවන්නට යෙදුණු මෙම ද්‍රවිඩ අකුරු සහිත මේ කොටස ඔබ වහන්සේට මේ විඩියෝ පටය ලැබෙන අවස්ථාවේදීත් සඳහන්ව තිබුණාද ඒ කොටස ඇතුළත් කරලා තියෙන්නේ කොයි අවස්ථාවකද කියලා දන්නවාද ?

පි : එහෙම කියන්න තේරුමක් නෑ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබ වහන්සේගේ

පි : අපි අවධානය යොමු කළේ ඇත්තටම කතාවට.

ප්‍ර : කතාවට. එහෙමයි ස්වාමීන් වහන්සේ.

පි : ලැබෙන අවස්ථාවේත් තිබුණා. මේ අපි මොකුත් add කරලා නෙවෙයි.

ප්‍ර : කොයි කාල වකවානුවේද හාමුදුරුවනේ මේක ඔබ වහන්සේට ලැබෙන්නේ කොයි කාලේද කතාව කරලා තියෙන්නේ කොයි කාලේද?

පි : පාස්කු ප්‍රහාරයෙන් පස්සේ . පාස්කු ප්‍රහාරයෙන් පස්සේ.

ප්‍ර : ඔබ වහන්සේට ලැබුණේ?

පි : ඔව්.

ප්‍ර : මේ කතාව කරලා තියෙන්නේ කොයි කාලේ වගේද කියලද කියන්න පුළුවන්ද?

පි : 2017 මාසේ සටහන් නෑ. 2017 කියලා තමයි සඳහන් කළේ.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී මෙම විඩියෝ පටයේ රූප පෙළකට පසුව නැවත වතාවක් මේ තිරය මත ද්‍රවිඩ අකුරුවලින් යමක් දර්ශනය වන බැවින් එම ද්‍රවිඩ අකුරුවලින් සටහන් වන සටහන කියවා ගරු සභාවට එහි පරිවර්තනයක් ලබාදීම සඳහා භාෂා පරිවතර්තක මහතා වෙත නියෝගයක් කරන මෙන් ගෞරවයෙන් අයැද සිටිනවා.

****

<u>ගරු සභාපති විනිසුර ජනක් ද සිල්වා මැතිතුමා</u>

එලෙස නියෝග කරමි.

****

<u>කොමිෂන් සභාවේ භාෂා පරිවර්තක ජෝන් කන්දසාමි මහතා</u>

ISIS අමෙප්පින් ඉලංගෙක්කාන තලෙවර් සකරාන් මසූති අව්වමෙප්පෙ ආදරිත්තු නිදි තිරට්ටුම් නෝක්කිලුම් ඉළෙඤර්කළ් මත්තියිල් ආයුදප් පෝරාට්ටත්තෙ ඌක්කුවික්කුම් වකෙයියිලුම් කිළක්කු මාකාණත්තින් මට්ටක්කළප්පු මාවට්ටත්තිලුළ්ළ කාත්තාන්කුඩි නකරිල් ආට්රිය විසේට උරෙ.

ISIS සංවිධානයේ ලංකාවේ නායකයා වන සහරාන් මස්වූදී යන අය එම සංවිධානයට පක්ෂ පාතීව ආධාර ලබා ගැනීමේ චේතනාවෙන් තරුණයන් අතර ආයුධ අරගලය උසුගැන්වූ ආකාරයෙනුත් නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ කාත්තන්කුඩියේදී කරන ලද විශේෂ කතාව.

****

FAIR COMMENT — BY JEZEEM

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී දර්ශනය වන විඩියෝ පටයෙහි NTJ මාධ්‍යය අංශය NTJ media unit වශයෙන් සඳහනක් තිබෙන බවත්, ඒ වගේම තිරය මත කතාව කරන පුද්ගලයාගේ කතාව යන අතරවාරයේදී දුරකථන අංක වගේම face book සමාජ ජාලයේත්, වට්ස්ඇප් සමාජ ජාලයේත් සම්බන්ධවීම්වලට අදාළ සටහන් දක්නට ලැබෙන බවත් E-mail ලිපිනයක සටහනක්ද ඇතුළත්ව තිබෙන බවට ගරුසභාවේ අවධානය යොමු කර සිටිනවා.

පි : මැතිතුමනි අපි මේ විඩියෝ පටය සම්බන්ධයෙන් එක විඩියෝ එකක් පමණක් දෙන්නම් මෙතුමා මේ මුල් කොටස හරියටම කිව්වා. අද දිනයේදී අර කාලය පිළිබඳව ගැටලුවක් තිබුණු නිසා මේ සහතික කරන ලද උසාවිය අභියසින් මේ හඬ පටයේ සිංහලට පරිවර්තනය කර ගෙන ආවා. ඒක සහතික කරලාත් ගෙනාවා. වේලාව ඉතුරු කර ගන්න ඕනේ නම් මම ඉක්මනට කියවන්නම්. කියවන්නත් පුළුවනි සිංහල තේරුම.

ප්‍ර : මේක කොච්චරක් දිගයිද?

පි : මිනිත්තු

මේ අවස්ථාවේදී ස්වාමීන් වහන්සේ විසින් ඉදිරිපත් කරන ලද විඩියෝ පටයෙහි දර්ශන ඇතුළත් CD තැටිය මෙම සභාවට RGG 37 වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා. ඒ වගේම මේ අවස්ථාවේදී ස්වාමීන් වහන්සේ සඳහන් කරන්නට යෙදුණා ගරු සභාපතිතුමනි එම විඩියෝ පටයෙහි දේශකයා විසින් සම්පූර්ණයෙන්ම ද්‍රවිඩ භාෂාවෙන් කතාවක් කරන බැවින් එහි සිංහල පරිවර්තනය දිවුරුම් දුන් භාෂා පරිවර්තකයෙකු හරහා ලබා ගත් සිංහල පරිවර්තනයේ පිටපතක් ගරු සභාවට ඉදිරිපත් කරන බවට. එකී පරිවර්තනය අඩංගු ලේඛනය RGG 37 (A) වශයෙන් සලකුණු කිරීමටත් අවසර අයැද සිටිනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ඊට අමතරව කොමිෂන් සභාවේ භාෂා පරිවර්තක විසින් මෙම RGG 37 දරන CD තැටියේ අඩංගු මොහොමඩ් සහරාන්ගේ කතාව සම්පූර්ණයෙන් සිංහලයට පරිවර්තනය කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට නියෝග කරන අතර එය එසේ කළ පසු RGG 37 (B) වශයෙන් ලකුණු කරන බව සටහන් කර තබමි.

****

FAIR COMMENT
BY JEZEEM

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය</u>

ප්‍ර : හාමුදුරුවනේ මුලින්ම මේ ඉදිරිපත් කරන ලද විඩියෝ පටයේ පෙනි සිටින කතාව පවත්වන පුද්ගලයා කවුද කියන කාරණාව ඔබ වහන්සේ පෞද්ගලිකව දන්නවා හෝ ඔබ වහන්සේ දැන ගත් කාරණාවක් වශයෙන් හෝ කියන්න ගරු සභාවට?

පි : මුලින් SLTJ සංවිධානයේ ඉඳලා ඊට පස්සේ NTJ සංවිධානය හදා ගත්තු එහි නායකයා මොහොමඩ් සහරාන් හෂීම්.

ප්‍ර : මොහොමඩ් සහරාන් ඔබ වහන්සේ පෞද්ගලිකව හමු වී තිබෙනවාද?

පි : එක වතාවක් අපට එක සිද්ධියකදී මොහු මුණ ගැහුණා වගේ මතකයක් තියෙනවා. අපි තවමත් හොයනවා ඒ ඔහුමද කියලා මුහුණ අර සමහර අවස්ථාවල රැවුල වවාගෙන ඊළඟට රැවුල කපා ගෙන ටිකක් හොයා ගන්න අමාරුයි. අර නිපෝන් හොටලයේ පැවැති මාධ්‍ය හමුවේදී සංවාදයක් ඇති වුණේ සහරාන්ද කියන එක ගැන අපි තවමත් හොයමින් ඉන්නවා. ඒ රූපය නම් සමානයි. ඒ හැරෙන්න මුහුණට මුහුණ මුණ ගැහිලා නෑ.

ප්‍ර : සහරාන් වශයෙන් ඔහුව හඳුන්වා දෙමින් ඔබ වහන්සේ සමඟ කතා බහක නියැලෙන්න ඔහු මුණ ගැහිලා තිබුණාද යම් අවස්ථාවක?

පි : නෑ.

ප්‍ර : එහෙම මුණ ගැහිලා නෑ?

පි : නෑ.

ප්‍ර : මේ පෙනි සිටින්නේ සහරාන් බවට ඔබ වහන්සේ තහවුරු කර ගත්තේ මේ ඉන්නේ සහරාන් කියන කාරණාව මේ කතාව තුළින් මතු වෙනවාද එහෙම නැත්නම් කවුරු හරි ඔබ වහන්සේට කිව්වද?

පි : නෑ සහරාන්ගේ විඩියෝ පට අපි ගොඩක් බලලා තියෙනවා. ඉතින් මේ ඔහුමයි කියන එක තහවුරු වෙනවා. ස්ථිරයි.

ප්‍ර : හාමුදුරුවනේ මේ කතාව මේ විඩියෝ පටයේ ඇතුළත් කතාවේ පරිවර්තනය ඔබ වහන්සේ සතුව තියෙනවා යැයි කියලා ඔබ වහන්සේ දැන් ඉදිරිපත් කළ ලේඛනයක් හැටියට. ඒ සිංහල පරිවර්තනයට අනුව මේ කතාවේ ගැබ්ව තියෙන්නේ මොනවාද?

පි : ගැබ්ව තියෙන්නේ ඔහුගේ දර්ශනය. ඔහු නැෂනල් තවුහිද් ජමාත් සංවිධානය හරහා ලංකාවේ ඉස්ලාම් තරුණයන් අන්තවාදයට කැඳවා ගැනීම සඳහා ඔහු ඉදිරිපත් කරන ජීහාද් මාර්ගය. ඒ වගේම හදීස්. ඉතින් මම මේ විඩියෝ පටය ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වුණ හේතුව අපි මේ ගෙනවිත් තියෙන හදීස් ග්‍රන්ථවල ඉගැන්වීම් හා සහරාන්ගේ ක්‍රියාකාරකම් දෙකම

LAW COMMENT BY JEZEEM

සමානයි. කිසි වෙනසක් නෑ. ඒ හදීස් මතම තමයි ඔහු සන්නද්ධ වී තිබෙන්නේ කියන එක ඔප්පු කිරීමට .

ප : හාමුදුරුවනේ ඔබ වහන්සේ සතුව තිබෙන පරිවර්තනයෙන් කරුණු වශයෙන් මේ ගරු සභාවට ප්‍රධාන කරුණු වශයෙන් යමක් කියන්න හාමුදුරුවනේ මෙහි ගැබ්ව තියෙන්නේ මොනවද කියන කාරණාව?

පි : මොහු මේ කතාව කියන ISIS සංවිධානයේ ලංකාවේ නායකයා වන සහරාන් මස්වූදීගේ සංවිධානයට සහය දක්වා ආධාර ලබා ගැනීමේ අරමුණින් තරුණයන් මධ්‍යයේ සන්නද්ධ යුද්ධය උනන්දු කිරීම සඳහා නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ කාත්තන්කුඩි ප්‍රදේශයේ පැවැත්වූ විශේෂ දේශනාව. ඒකේදී ඔක්කොම කියන්නද නැත්නම් අවශ්‍යම ටික කියන්නද. විනාඩියකින් කියවන්නත් පුළුවන් වෙයි. බොහොම චුට්ටයි ටිකයි තියෙන්නේ.

ප : එහෙමයි හාමුදුරුවනේ.

පි : ඔහුගේ කතාව ආරම්භ කරන්නේ මෙහෙමයි. දයාබර සහෝදරියනි, කිලාෆතය, කිලාෆතය කියලා කියන්නේ ආණ්ඩුකාරවරුන්ගේ පාලනය කියන එකයි. දයාබර සහෝදරියනි, කිලාෆතය මඟින් ලැබෙන කුසල් 05 ක් ලෝකය විසින් අනුමැතිය ලබා දීමට ආරම්භ කර ඇත. සැලසුම් කර එය ඔබට වසන් කරනු ලැබේ. සැලසුම් කර එය ඔබට වසන් කරනු ලැබේ. නින්දෙන් අවදි වනු. ඔබ වෙනුවෙන් කිලාෆතයක් මෙම ලෝකයේ නිර්මාණය වී ඇත. ඔබ වෙනුවෙන් කිලාෆතයක් මෙම ලෝකයේ නිර්මාණය වී ඇත. දෙපාරක් කියනවා ඔහු. එහි අගනුවර සිරියාවේ රකාහි පිහිටා ඇත. එහි අගනුවර සිරියාවේ රකාහි පිහිටා ඇත. එම රජයේ අරමුණ අල්ලාහ්ට භය වී අල්ලාහුට ආලා සාක්ෂි ලෙස තබා පවසමි. ඔවුන්ගේ පාදකය අල්කුර්ආන සහ අස්සුන්නා වේ. ඔවුන් මුස්ලිම්වරුන් ඝාතනය කළේ නැත. ඔවුන් සතුව මුස්ලිම් සටන්කරුවන් මිලියන 18 ක් සිටිති. රජයන් 35 ක් ඔවුන් සතුව පවතී. ඔවුන් සතුව මුස්ලිම් සටන්කරුවන් ආපහු කියනවා මිලියන 18 ක් සිටී. ඔවුන් විනාශ කිරීම සඳහා ඇමරිකාව පෙරමුණ කර ගෙන රටවල් 68 ක් ඔවුන්ට එරෙහිව යුධ වදී. මෙම යුද්ධයේ නාමය ත්‍රස්තවාදය මුල් උපුටා දමයි යන්නයි. රජයන් 35 ක කිලාපත් පාලනය සිදු වෙමින් පවතී. කාෆීර්වරුන්ට භයේ, මුනාෆික්වරුන්ට භයේ, පවාදෙන්නන්ට භයේ මෙම සත්‍ය සිදුවීම ජමාතේ වසන් කළේ නැත. මන්ද යත් ජමාතේ විනාශ කරනු ලැබුවොත් ද ආලිම්වරුන් ඝාතනය කරනු ලැබුවද සිරගත කරනු ලැබුවද වෙනත් කණ්ඩායමක් අල්ලාහ්

FAIR COMMENT BY JEZEEM

විසින් ගෙන්වනු ලැබේ. ඔවුන් කතා කිරීමෙන් පමණක් සීමා වන්නේ නැත. වෙනත් ජීහාදය ඔබ අත්හැරියහොත් අල්ලාහ් විසින් ඔබ හට අගෞරවාත්මක දෙයක් පෙන්වනු ලැබේ. ඔබ නැවත ආගම වෙත හැරෙන තාක්කල් එම අගෞරවයෙන් ඔබව මුදා ගනු නොලැබේ. මුස්ලිම් භක්තිකයන්ගේ අගෞරවය කුමක් දැයි දන්නෙහිද? පසු බැසීමට හේතුව කුමක් දැයි දන්නෙහිද? භක්තිකයන් විසින් ජීහාදය අත්හැරීමයි. භක්තිකයන් විසින් ජීහාදය අත්හැරීමයි. ඉස්ලාමය යනු හජ්ජි උපවාසය සහ සකාත් පමණක් නොවේ. අල්ලාහ්ගේ මාර්ගය සටන් කිරීමත් ජීහාදයයි. අපේ භක්තිකයන්ගේ ජීවිත ලේ වලින් ලියන ලද්දකි. මුස්ලිම්වරුන්ගේ කණ්ඩායමක් අල්ලාහ්ගේ ආගම වෙනුවෙන් නිරායුධව අවසන් දිනය දක්වා සටන් කරති. කණ්ඩායමක් සටන් කරමින් සිටි නම් අරාබි රටවල් සටන් කළේ නැත්තේ ඇයි. අල්ලාහ්ගේ සතුරන් සමඟ එක්ව සිටින්නේ ඇයි. එසේ නම් යුධ වදින්නන් කවුද. ජනතාවනි සිතන්න. BBC, ABC, රොයිටර්, අල්ජසීරා පවසන ප්‍රවෘත්ති විශ්වාස කර සටන් කරුවන් ත්‍රස්තවාදීන් ලෙස හෝ හාරීස් ලෙස හෝ තීරණය නොකරන්න. අල්ලාහ් මෙයට සාක්ෂි දරයි. අප දන්නා කරුණු ජනතාවට එලෙසම පවසන්නෙමු. හැකිතාක් පවසන්නෙමු. ජනතාව ගෞරවයෙන් ජීවත් වනුයේ ජීහාදය නිසාය. ජීහාදය අත්හැරියහොත් ඔබ අගෞරවයට ලක්වේය යන්න අල්ලාහ්ගේ රසූල්වරයාගේ ප්‍රකාශයයි. දේවදූතයාගේ ප්‍රකාශයයි. සමාජය අවදිවව්. සමාජය අවදිවව්. සමාජය අවදිවව්. මේ සිද්ධිය පිළිබඳව අල්කුර්ආනය මඟින් ඉගෙන ගනිව්. අල් හදීස් කියවන්න. ජීහාදය පිළිබඳ කතා කරන්නා ත්‍රස්තවාදියා යනු කාෆීර්වරුන්ගේ මුස්ලිම් නොවන්නන්ගේ මතයයි. හොර මෝඩයන් විශ්වාස නොකරනු. මුදල් වලට පාවා දෙන පුද්ගලයන් විශ්වාස නොකරන්න. කවරෙක් හෝ විශ්වාස නොකරන්න. ඔබ ඉගෙන ගන්න. ඉස්ලාමයේ පණ ජීහාදය වන බව ඔබ හට පැහැදිලි වේ. මේවා පිළිබඳව කතා කරන පුද්ගලයන් කවුරුන් ද. මොවුන් ත්‍රස්තවාදීන් ලෙස නම් කළේ ඇයිද යන සත්‍ය ඔබ හට දැන ගැනීමට ලැබෙනු ඇතැයි කියා මෙම කතාව අවසන් කරමි. අස්වලාම් අලෙයික්කුම්. මේක තමයි පරිවර්තනය පළවෙනි විඩියෝවේ.

ප්‍ර : එහෙමයි හාමුදුරුවනේ.

ගරු සභාපතිතුමනි මෙම අවස්ථාවේදී මෙම RGG 37 විඩියෝ පටයෙහි ඇතුළත් සහරාන් ලෙසට හඳුන්වා ගනු ලැබූ පුද්ගලයා කතාව පවත්වන ආකාරයේ වූ

FAIR COMMENT BY JEZEEM

නිශ්චල ඡායාරූපයක් ලබා ගෙන එය මෙම සභාවට C 648 වශයෙන් සලකුණු කිරීම සඳහා අවසර අයැද සිටිනවා.

ප්‍ර : ඔබ වහන්සේ සතුව තවත් විඩියෝ පටයක් තිබෙනවා මා හිතන හැටියට සහරාන් විසින් ජනතාව ආමන්ත්‍රණය කරපු?

පි : ඔව්.

ප්‍ර : එයත් මේ අවස්ථාවේ ඉදිරිපත් කරන්න පුළුවන්ද හාමුදුරුවනේ?

පි : මැතිනියනි ඒක අපිට සිංහල පරිවර්තනය කර ගන්න වේලාව මදි වුණා. ඒ කියන්නේ .

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : නෑ. ඒක කමක් නෑ.

පි : ඒක අපිට පස්සේ කර ගන්න පුළුවන්. මෙතනට භාර දීලා තියෙනවා.

ප්‍ර : නෑ ස්වාමීන් වහන්සේ දැනට භාර දීලා තියෙනවා නම් අපි ඒක ලකුණු කරමු. ඒක කොමිෂන් සභාවෙන් පරිවර්තනය කර ගන්න පුළුවන්.

පි : හොඳමයි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය</u>

මේ අවස්ථාවේදී ස්වාමීන් වහන්සේ විසින් ඉදිරිපත් කරන ලද විඩියෝ පටය ද්‍රවිඩ භාෂාවෙන් තිබෙන විඩියෝ පටයක් හැටියටයි තියෙන්නේ ස්වාමිනි. එහි සිංහල පරිවර්තනයක් කිරීම සඳහා සභාවේ භාෂා පරිවර්තක වෙත නියෝගයක් කරන මෙන් ගෞරවයෙන් අයැද සිටිනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේදී කොමිෂන් සභාවේ පහසුව උදෙසා කොටස් වශයෙන් භාෂා පරිවර්තකට පරිවර්තනය කරන ලෙසට නියෝග කරනවා.

****

<u>කොමිෂන් සභාවේ භාෂා පරිවර්තක</u>

මිනිස්සුන් විසින් සීමා දමා වෙන් කරන ලද දේශයන්, දේශයන් නොවේ. මෙම දේශ ප්‍රේමීත්වය නිසා විශාල හානි ඉස්ලාම් ආගමට සිදු වෙනවා. එක්කෙනෙක් කියනවා නම් මවුබිම වෙනුවෙන් මවුබිමට ප්‍රේම කරන මවුබිම වෙනුවෙන් සටන් කරන මවුබිම වෙනුවෙන් ලේ හැලීමට සුදානමින් සිටිනවා යැයි පැවසුවොත් ඔහු ඉස්ලාම් ධර්මයෙන් පිටවී ගිය වෙන් වී ගිය අයෙකු ලෙස

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සලකන්න වෙනවා. සමහර අයවලුන් බොහොම ගාම්භීරව කියා හිටිනවා මම හමුදාවේ සේවය කරනවා. පොලිසියේ සේවය කරනවා කියලා. නමුත් එය එසේ නොවේ. මුස්ලිම් හමුදා භටයෙක් රට මවුබිම වෙනුවෙන් දිවි පිදුවොත් එහි ඇති ප්‍රයෝජනය කුමක්ද? මෙහිදී කිසිදු දේශප්‍රේමීත්වයක් නැත. දේශප්‍රේමීත්වය යනු ඉස්ලාමීය අධ්‍යාපනයට සමාන දෙයකි. සමහර අය ජාතික කොඩිය ඔසවනු ලබති. මුස්ලිම් කොල්ලෙක් සිටගෙන ඇති. මුස්ලිම් කෙල්ලෙක් හිජාබ් දාගෙන ඇති. හින්දු කොල්ලෙක් සිටගෙන ඇති. එවිට ඔවුන් සියළු දෙනා එක්වී රට ගොඩනගමු යැයි කියමින් කොඩිය ඔසවනු ලබති. මෙම අතීතය අනුව කාබීර් සහ මුවීන් අතරේ වෙනස්කම් ඇති වෙන්නේ කෙසේද කියා දේශප්‍රේමීත්වය හේතුකොට ගෙන රටේ ජනතාව බෙදා වෙන් නොකර එකම මවකගේ දරුවන් සේ සැලකිය යුතුයි. මවුලව්වරුන් මෙසේ පැවසීමට භය වෙති. මවුලව්වරුන් කියන්නේ දේශප්‍රේමීත්වය නිසා රටේ ජනතාව වෙන් කර බැලිය යුතු නෑ සියළු දෙනාම එක සේ සැලකිය යුතුයි කියලා. ආගම් භේදය නැතුව එකම මවකගේ දරුවෙක් ලෙස ජීවත් විය යුතු යැයි පවසනවා. නමුත් මෙම ජාතිකත්වය කාබීර් සහ මුස්ලිම්වරු සහ මුස්ලිම්වරුවත් හොඳ අයත් නරක අයත් එකට එක් කරයි. මෙය අල්ලාහ් විසින් සඳහන් කරන ලද වෙනස්කම බිඳ දමනු ලබයි. දේශප්‍රේමීත්වය යනු ඉස්ලාමීයේ සඳහන් ජීහාතයේ ප්‍රතික්ෂේප කරන එක් ක්‍රියාවකි. මුස්ලිම් ජනතාව සම්බන්ධයෙන් බැලීමේදී ඔවුන් ප්‍රිය කළ යුතු එකම දේශය දාරුල් සලා වේ. ඔවුන් විසින් එසවිය යුත්තේ තාවුත් යන කොඩිය මිස වෙන කොඩියක් නෙවේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මෙම **CD** පටයේ අඩංගු දෙමළ කතාව කොමිෂන් සභාවේ භාෂා පරිවර්තක විසින් සිංහලට පරිවර්තනය කර කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතු බවට නියෝග කරමි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය</u>

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී ප්‍රදර්ශනය කෙරුණු විඩියෝ පටය ඇතුළත් **CD** තැටිය **RGG 38** වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා. ඒ වගේම එහි පෙනී සිටින කථිකයා සහරාන් වශයෙන් ස්වාමීන් වහන්සේ සඳහන් කරන්නට යෙදුණා. ඔහු එහි කතා කරන දර්ශනයක් ඇතුළත් නිශ්චල ඡායාරූපය **RGG 38 (A)** වශයෙන් ගරු සභාවට ඉදිරිපත් කිරීමටත් අවසර අයැද සිටිනවා. ඒ වගේම එම **CD** තැටියෙහි ඇතුළත්ව තිබෙන කරුණු සිංහල භාෂාවට පරිවර්තනය කිරීමෙන් අනතුරුව ලබා ගන්නා ලේඛනය **RGG 38 (B)** වශයෙන් සළකුණු කිරීමටත් අවසර අයැද සිටිනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : හාමුදුරුවනේ ඔබ වහන්සේ සඳහන් කරන්නට යෙදුණා මගේ ප්‍රශ්නේකට පිළිතුරක් හැටියට ඔබ වහන්සේට මුණ ගැහිලා තිබෙනවාද සහරාන් කියන කාරණාවට නිපෝන් හෝටලයේ පැවැති ඔබ වහන්සේගේ මාධ්‍ය සාකච්ඡාවකට පුද්ගලයෙක් පැමිණ ඔබ වහන්සේ සමඟ ආරවුලකට එළඹුණා. එම පුද්ගලයා ඔබ වහන්සේ විශ්වාස කරනවා ඒ අවස්ථාවේ සිටි පුද්ගලයා සහරාන් බවට විශ්වාස කරන බවට ඔබ වහන්සේ සඳහන් කරන්නට යෙදුණා පිළිතුරක් හැටියට?

පි : ඔව් ඔළුවේ නිකම් ඇඳිලා තිබුණා ඒ රූපේ. අර ඔළුවේ දාගෙන ඉන්න එකයි. අර ISIS කොඩිය ඔස්සන වේලාවේ ඔහු ඔළුවේ පැළඳ ගෙන හිටපු එකයි ඒ ඇඳුමයි ඒ පෙනුමයි ඒ රැවුලයි එයාමදෝ කියලා. නමුත් ඒක මට තහවුරු කර ගන්න විදිහක් නෑ.

ප්‍ර : ස්ථිරට කියන්න බෑ.

පි : අනුමානයක් විතරයි.

ප්‍ර : ඔබ වහන්සේට ඒ ඔබ වහන්සේ ඔය කියන අවස්ථාවට අදාළ නිශ්චල ඡායාරූපයක් පෙන්වා සිටියොත් හඳුනා ගැනීමට හැකියාවක් තියෙනවාද ඔබ වහන්සේ සහභාගි වුණු එම නිපෝන් හෝටලයේ පැවැති මාධ්‍ය සාකච්ඡාවේ අවස්ථාවක් ද ඒ කියන කාරණාව හඳුනා ගන්න පුළුවන්ද හාමුදුරුවනේ?

පි : පුළුවන්.

ප්‍ර : ඔබ වහන්සේට හඳුනා ගැනීමට තිබෙන්නේ හාමුදුරුවනේ ඔබ වහන්සේ පෙනි සිටිනවාද මෙහි, මෙය නිපෝන් හෝටලයේ පැවැති ඔබ වහන්සේ ඔය සඳහන් කරන මාධ්‍ය සාකච්ඡාව තිබුණු අවස්ථාවේ ඇති වූ සිද්ධියක් දක්වන ඡායා රූපයක් ද කියන කාරණාවයි?

පි : හොඳමයි.

ප්‍ර : එහි පිටපතක් ගන්නවා හාමුදුරුවනේ එතකම්.

පි : ඔව් මේක තමයි. මේ ඉන්නේ මම. මට සැකයි මේ මේයාමද කියලා. මේ පින්තූරේ හරි ඒ නිපෝන් හෝටලයේ ඒ සිද්ධිය ඇති වූ ස්ථානයේ.

ප්‍ර : හාමුදුරුවනේ මේ ඔබ වහන්සේ සඳහන් කරන නිපෝන් හෝටලයේ පැවැති මාධ්‍ය සාකච්ඡාව කොයි අවුරුද්දේ පැවති එකක්ද හාමුදුරුවනේ?

පි : 2014.

ප්‍ර : 2014 වර්ෂයේදී.

FAIR COMMENT
BY JEZEEM

මේ අවස්ථාවේදී ස්වාමීන් වහන්සේ විසින් නිපෝන් හෝටලයේ 2014 වර්ෂයේදී පැවැති මාධ්‍ය සාකච්ඡාවකදී උන් වහන්සේ පෙනි සිටින ඡායාරූපයක් හැටියට එම නිපෝන් හෝටලයේ පැවැති මාධ්‍ය සාකච්ඡාවේදී ගන්නා ලද ඡායාරූපයක් හැටියට භඳුනා ගන්නා ලද ඡායාරූපය C 649 ලෙස සලකුණු කිරීම සඳහා ගෞරවයෙන් අවසර අයැද සිටිනවා.

ප්‍ර : හාමුදුරුවනේ අපි මේ ඔබ වහන්සේ ගරු සභාව දැනුවත් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද විඩියෝ පට සභාවට ඉදිරිපත් කිරීමට හේතු පාදක වුණේ මේ එක් එක් අන්තවාදී මත දරන සංවිධාන සහ මතවාදී සංවිධානය එම සංවිධාන පිටු පස සිටින්නේ කවුද ඒ සම්බන්ධයෙන් ඔබ වහන්සේ දන්නා තොරතුරු මොනවාද කියන කරුණු සභාවට පැහැදිලි කරමින් සිටින අවස්ථාවකදී?

පි : ඔව්.

ප්‍ර : එහෙමනේ හාමුදුරුවනේ?

පි : ඔව්.

ප්‍ර : එහිදී මා විශේෂයෙන් ප්‍රශ්නයක් ඇහුවා ඔබ වහන්සේ සඳහන් කරන්නට යෙදුණා සිවිල් සංවිධාන සම්බන්ධයෙන් සඳහන් කරන කොට හිරා Foundation . එහෙම නැත්නම් හිරා වශයෙන් හැඳින්වෙන HIRA වශයෙන් හැඳින්වෙන සංවිධානයක් ගැන?

පි : ඔව්.

ප්‍ර : එම සංවිධානයේ ලියාපදිංචිව තිබෙන්නේ ඔබ වහන්සේ සඳහන් කරන්නට යෙදුණා දේශපාලඥයෙකු වශයෙන් සිටින හිස්බුල්ලා මහතාගේ පුතාගේ නමින් කියලා?

පි : ඔව්.

ප්‍ර : ඔබ වහන්සේගෙන් මම ඒ අවස්ථාවේ ප්‍රශ්නයක් ඇහුවා ඒ අනුව ඔබ වහන්සේට කියන්න තොරතුරු තිබෙනවාද දේශපාලඥයෙකු වන හිස්බුල්ලා මහතා ජමාතේ ඉස්ලාමීය සංවිධානයේ අනුගාමිකයෙක් වශයෙන් ද හඳුන් වන්න පුළුවන් කියලා?

පි : ඔව්.

ප්‍ර : මම හිතනවා ඔබ වහන්සේ ඉන් අනතුරුව කරපු ප්‍රකාශයකට අනුව එහි නිවැරදි කිරීමක් කළ යුතුව තිබෙන බව ඔබ වහන්සේ සඳහන් කරනවා?

පි : ඔව්.

ප්‍ර : ඔබ වහන්සේ දැන් මේ සඳහන් කරන ආකාරයට හිරා සංවිධානයට සම්බන්ධිත යැයි කියන හිස්බුල්ලා දේශපාලඥයා කුමන මතවාද දරන්නෙක් හැටියටද ඔබ වහන්සේට දැන ගන්න ලැබිලා තියෙන තොරතුරු අනුව තියෙන්නේ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : හිරා පදනම පිහිටලා තියෙන්නේ දෙහිවල ගාලුපාරේ. ඔවුන් ඒ ගොල්ලොන්ගේ ඒ වැඩ පිළිවෙල ගොඩනගන්නේ තවුහිද් නිකායට අනුව. තවුහිද් ජමාත් නිකායට අනුව.

****

දැන් වේලාව : ප.ව.05.40 යි.
මෙතැන් සිට ල/ලේ :- ධම්මිකා මිය.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පෙර සටහන් කරන්නේ මුතුමාලී මෙනවිය විසින්ය.
වේලාව ප.ව.5.40 යි
මෙතැන් සිට ධම්මිකා පෙරේරා විසින්ය.

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ශි හේරත් මහත්මිය:

ප්‍ර : ඔබ වහන්සේ පෙර පිළිතුරක් දුන්නා නම් ජමාතේ ඉස්ලාමිය සංවිධානයට අනුවයි කියලා එහි නිවැරදි වීමක් වෙන්න ඕනද හාමුදුරුවනේ?

පි : නැහැ, ඒ කියන්නේ මේගොල්ලෝ අර ඕනම එකක තියෙනවානේ මොකක්ද, කුමන නිකායද කියලා ඇහුවොත් තවුහිද් ජමාත් නිකාය නමුත් ජමාතේ ඉස්ලාම් එකෙත් ඉන්නවා. ඌනපුර්ණයක් තමා කරන්න උප මාතෘකාව තියෙන්නේ. එපමණක් නෙමෙයි ඉතා පැහැදිලිව අපි සියළු රජයන්ටත් කිව්වා හිරා පදනම සඳහා විශාල වශයෙන් ආධාර මුදල් ලැබිලා තියෙනවා. නැගෙනහිර පළාතට ගියොත් ඒක බලා ගන්න පුළුවන් මොන තරම් වෙනසක් තියෙනවද කියලා. ඒකට Brotherhood එකෙනුත් මුදල් එන බවට අපට දැන ගන්න ලැබුණා. ඒ වගේම Muslim World League එකෙනුත් ආධාර ලැබෙන බව පැහැදිලිව කියන්න පුළුවන්.

ප්‍ර : Muslim Brotherhood කියලා ඔබ වහන්සේ සඳහන් කලා?

පි : ඔව් Muslim Brotherhood.

ප්‍ර : ඒ වගේම හාමුදුරුවනේ ඔබ වහන්සේ සඳහන් කරන්නට යෙදුනා OMSED වශයෙන් සංවිධානයක් සඳහන් කරලා එය Organization for Muslim Student Education Development කියන සංවිධානය ජාත්‍යන්තර වශයෙන් තිබුණ සංවිධානයක් එය මා ඔබ වහන්සේගෙන් ප්‍රශ්නයක් ඇහුවාම එය මොන මතවාදයකටද යන්නේ කියලා ඔබ වහන්සේ සඳහන් කළා අල්ෂබාබ් මතවාදය එහෙම නැත්නම් එම සංවිධානයකට අනුගත වෙමින් යන ශ්‍රී ලංකාවේ තිබෙන සංවිධානයක් හැටියට?

පි : OMSED එක ගැන එහෙම කිව්වේ නැහැ. ඒ සංවිධානය ජාත්‍යන්තර සංවිධානයක්. ජාත්‍යන්තර ශිෂ්‍ය සංවිධානයක්. ඒ ශිෂ්‍ය සංවිධානය එක්ක අර ඉහත කී වාමී ඇතුළු ඒ තරුණ කොටස් එකතු බව තමයි සඳහන් කලේ.

ප්‍ර : ඔබ වහන්සේ අල්ෂබාබ් යන්න සඳහන් කලේ කුමන කරුණක් පදනම් කරගෙනද? AMYS සංවිධානය? තාසිම් මවුලවි ඉන්න සංවිධානය?

FAIR COMMENT
BY JEZEEM

පි : ඔව් සෙයිලාම් මුස්ලිම් තරුණ සංගමය ගැන මුලින් මට අමතක වීමක් සිද්ධ වුනේ. අල්ෂබාබ් සංවිධානය තමයි ඒ සෙයිලාන් මුස්ලිම් තරුණ සංවිධානය ගොඩ නඟලා තියෙන්නේ. එය තියෙන්නේ අංක 149, මාළිගාකන්ද පාර, කොළඹ 10. ඒක ආරම්භ කරලා තියෙන්නේ 2005.09.12 වෙනිදා. ඒකේ සභාපති මවුලවි M.S.M තාසිම්. මුස්ලිම් වාණිජ බැංකුව ඒගොල්ලන්ගේ බැංකු ගිණුම් පවත්වාගෙන ගිහිං තියෙන්නේ. ඒගොල්ලනුත් ආගමික නිකාය තවුහිද් ජමාත් නිකාය.

ප්‍ර : එය අල්ෂබාබ් සංවිධානය කියලා ඔබ වහන්සේ සඳහන් කරන්නට යෙදුනේ ඒ හා සබැඳියි කියලා එය සෝමාලියාවේ දැනට ක්‍රියාත්මක වන..

පි : ආයුධ සන්නද්ධ ව්‍යාපාරයක්.

ප්‍ර : හැටියටයි?

පි : හැටියටයි.

ප්‍ර : ඔබ වහන්සේට තොරතුරු තිබෙනවා එම සංවිධානය මේ AMYS සංවිධානය සමඟ අනුගතවීමක් වී තිබෙනවාය කියන කාරණාව?

පි : ඔව් අල්ෂබාබ් නමින් සෝමාලියාවේ ආයුධ සන්නද්ධ සංවිධානයක් තියෙනවා. එතකොට අහඹු ලෙස මේ මාළිගාකන්දට කොහොමද අල්ෂබාබ් ආවේ, එතකොට අපි දන්නේ නැහැ එය පාතාලේ එක්ක සම්බන්ධද, මොන ක්‍රියාකාරකම් එක්ක සම්බන්ධ ද, ත්‍රස්ත සම්බන්ධකම් තියෙනවද කියලා, නමුත් අපි දන්නවා මේක සම්පූර්ණයෙන්ම වගේ ඒ movement එකේම කොටසක්. මොකද එක අවස්ථාවක එක්තරා පාතාල නායකයෙකු අල්ලා ගැනීමට ගිය අවස්ථාවේ ඒ ප්‍රදේශයේදී ඒ පිරිමි පාතාල නායකයා පලා ගියේ කළු නිකාබය පැළඳගෙන මුස්ලිම් කාන්තාවක් සේ. මුස්ලිම් කාන්තාවන් 4 දෙනෙක් සමඟ තමයි ඒ පාතාල නායකයා පැනලා ගියේ. ඔහු අවසානයේදී ඝාතනය වුණා. මොකද අල්ෂබාබ් නමින් සංවිධානය මෙහේ පිහිටුවලා තියෙනවා. අපිට හරියටම කියන්න බැහැ ඒ සෝමාලියාවේ අල්ෂබාබ් ත්‍රස්ත සංවිධානයත් එක්ක සම්බන්ධ ද කියලා. අපි සැක කරනවා එහෙම වෙන්න පුළුවන් කියලා අර වගේ මතවාදය නිසා.

ප්‍ර : දැන් හාමුදුරුවනේ අද දවසේ ආරම්භයේදි ඔබ වහන්සේ සාක්ෂි ලබා දෙන්න ආරම්භ කරපු අවස්ථාවේ දී මුල්ම අවස්ථාවේ ඔබ වහන්සේ මේ විවිධ මතවාද සම්බන්ධයෙන් කියන අවස්ථාවේ උලමා සභාව සම්බන්ධයෙන් එහි සංයුතිය සම්බන්ධයෙන් සඳහන් කරන්නට යෙදුනා?

පි : ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ උලමා සභාව කියලා ඔබ වහන්සේ හඳුන්වන්නේ කුමක්ද?

පි : උලමාවරු හැටියට හඳුන්වන්නේ ඉස්ලාම් ආගම පිළිබඳ එහි සංස්කෘතිකාංග පිළිබඳ මිනිස්සුන්ට යම් යම් ප්‍රශ්ණ පැන නැගුනාම ඉස්ලාමික ආගමික උගතුන් හැටියට පෙනී ඉන්නා කණ්ඩායමයට තමයි මේ උලමා සභාව කියලා කියන්නේ. උලමාවරු කියලා කියන්නේ.

ප්‍ර : එයට රාජතාන්ත්‍රය තුළ පිළිගැනීමක් ලබා දී තිබෙනවාද මේ උලමා සභාවට?

පි : 1927 අවුරුද්දේ තමයි ආරම්භ කරන්නේ, 2002 අවුරුද්ද වෙන කොට එය රජය පිළිගත් පුණ්‍ය ආයතනයක් හැටියට, සංවිධානයක් හැටියට ඒගොල්ලෝ සංස්ථාපිත කරලා තියෙනවා.

ප්‍ර : ශ්‍රී ලංකාවේ මුස්ලිම් කටයුතුවලට අදාලව දෙපාර්තමේන්තුවක් පවතින බව ඔබ වහන්සේ දන්නවද?

පි : ඔව්.

ප්‍ර : එම රාජ්‍ය දෙපාර්තමේන්තුව මේ උලමා සභාව සමඟ සම්බන්ධකම් පවත්වනවද?

පි : ඔව් ඒ මුස්ලිම් කටයුතු සම්බන්ධයෙන් ආගමික කටයුතු අමාත්‍යාංශයට අනුබද්ධව තියෙන්නේ, ඒ මුස්ලිම් කටයුතු අමාත්‍යාංශය වෙන්න පුළුවන්, සංස්කෘතික කටයුතු ඒ අංශය වෙන්න පුළුවන්, වකුප් සභාව වෙන්න පුළුවන්, මේ සියළු දේට ආගමික වශයෙන් ඒ දර්ශනය ඉදිරිපත් කරන්නේ උලමාවරු. ඒ උලමාවරුන්ගේ සංඛ්‍යාව 4000 ක් හැටියට තමයි ගණන් බලලා තියෙන්නේ. ඒ උලමාවරු 4000 ක් විතර ඉන්නවා කියලා. ඉතින් ඒ අය ඒගොල්ලන්ගේ නමම ඒකයි. ජමෙයිතුල් උලමා සංවිධානය කියලා කියන්නේ ඉස්ලාමීය විද්වතුන්ගේ සංගමය. එතකොට ඒ අය දැන් මට හොඳටම මතකයි ඔය හලාල් සිද්ධිය ඇති වෙච්ච වෙලාවේ අපිව කැඳෙව්වා පාර්ලිමේන්තුවට. පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවකට. ඒ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේදි අපි මේ කුර්ආනීය ඉගැන්වීම්, ඒ සියළු දේවල් සහ ලෝක තත්ත්වයන් හරියට පැහැදිලි කරලා දුන්නට පස්සේ ඒ මොහොතට පැමිණි මුස්ලිම් ඇමතිවරු බොහොමයක් හිටියා. මන්ත්‍රීවරු හිටියා, පක්ෂ විපක්ෂයකින් තොරව, ඒ අය එක පැත්තක අපි එක පැත්තක අපි මේ හලාල් සම්බන්ධයෙන් ඇයි අප විරෝධතාවය දක්වන්නේ කියලා කරුණු ඉදිරිපත් කරන අවස්ථාවේදි මට ඉතා හොඳින් මතකයි, අද වගේ මතකයි මේ බොරැල්ල ප්‍රදේශයේ ජීවත් වෙන ෆවුසි අමාත්‍යවරයා එයා කිව්වා හාමුදුරුවනේ අපි මේවා ගැඹුරට දන්නේ නැහැ. අපි සාමාන්‍ය විදියට මේ වැඩ කර ගෙන ඉන්නවා. මේ වගේ මොනවා හරි

FAIR COMMENT BY JEZEEM

ගැටළුවක් ආපුවාම ඉතින් මේ උලමලනේ අපට උපදෙස් දෙන්නේ, අපි උලමාවරුන්ගෙන් තමයි මේ කුර්ආනයේ මේක ඇත්තද නැත්තද කොයි එකද කරන්න ඕනේ, හලාල් කොහොමද දැන ගන්නේ හරාම් කරන්නේ මේ ඔක්කොම දැන ගන්නේ අපි උලමාවරුන්ගෙන්. ඉතින් ඒකෙන් අපි තේරුම් ගත්තා මේ උලමාවරු තමයි මේ ඔක්කොටම වඩා උඩින් ඉන්නේ කියලා.

ප : ඒ කියන්නේ හාමුදුරුවනේ ශ්‍රී ලංකාව තුළ යම් ඉස්ලාම් ධර්මයට අදාල උපදෙස් ලබා ගැනීමක් අවශ්‍යතාවයක් මතු වූ අවස්ථාවක මේ ජමෙයිතුල් උලමා සංවිධානය හරහා එම උපදෙස් ලබා ගැනීමක් සිදු වෙන බවට ඔබ වහන්සේට දැනීමක් තියෙනවද? එහෙමද අවබෝධ වුනේ ඔබ වහන්සේට උපදේශයක් අවශ්‍ය වෙන කොට ඔවුන්ගේ උපදෙස් තමයි පතන්නේ කියලා?

පි : ඔව් දැන් ආසන්නම උදාහරණය මේ පාස්කු ප්‍රහාරයෙන් රටේ මිනිස්සු කම්පනයට පත් වෙලා, කම්පනයට පත් වූ අවස්ථාවේ අපේ ස්වාමීන් වහන්සේ නමක් මහනුවර උපවාසයක් කළා. ඒ ආණ්ඩුවෙන් ඉවත් වෙන්න කියලා ඇමතිවරු එක්කෙනෙකුට හෝ දෙන්නෙකුට ආණ්ඩුකාරවරු දෙදෙනෙකුට. ඒ වෙලාවේදී ලොකු ගැටළුවකට පත් වුණා. එයට අපිත් මැදිහත් වුණා. ඒ වෙලාවේදී ඇත්ත වශයෙන්ම උලමාවරු තමයි අවසාන නියෝගය දුන්නේ. බොරැල්ලේ එක්තරා නිවසකට පැමිණිලා මොකද මම ඒ වෙලාවේ මේ ප්‍රශ්නය ලේ හැලීමක් දක්වා දුර දිග යන්න නොදී මමයි ඒකට සෘජුවම මැදිහත් වුණේ. ජනාධිපතිවරයා එක්ක කතා කරමින්, මහනුවර තත්ත්වය සහ රටේ ඇති වන, මෝදු වෙමින් තිබුණු මේ ආතතිය පිළිබඳ මමයි ඒ දැනුම්වත් කිරීම කලේ. ඉතින් මම හොඳටම දැන ගත්තා උලමාවරු අවසානයේදි කිව්වා නෑ හතර දෙනෙක් නෙමෙයි ඔක්කොම ආණ්ඩුවෙන් අයින් වෙන්න. ඉතින් ඒතරම් ඔවුන්ගේ ඒ අනුශාසකත්වය බලවත්.

ප : හාමුදුරුවනේ මගේ ප්‍රශ්නේ වුනේ ඔබ වහන්සේට අවබෝධයක් තියෙනවද ඔබ වහන්සේගේ තොරතුරු අනුව රජය යම්කිසි තීරණයක් ගන්න අවස්ථාවේදී ඉස්ලාම් ධර්මයට අදාල යම්කිසි ගැටළුවක් නිරාකරණය කිරීමක් සිදු වුනොත් ඔවුන් උපදෙස් පතන්නේ මේ උලමාවරුන්ගේ ජමෙයිතුල් උලමා සංවිධානයෙන්ද කියන කාරණාව එය සැලකෙන්නේ එවැනි ඉස්ලාමීය විද්වතුන්ගේ සංගමයක් හැටියටද කියන කාරණාව?

පි : ඔව්.

ප : රජය යම් තීරණයක් ගැනීමට අවශ්‍ය වූ අවස්ථාවකදී?

පි : අනිවාර්යයෙන්ම ඒ උලමා සභාවේ මතයත් විමසනවා. මොකද ඒගොල්ලන් තමයි පෙළ පොත් හදන්න උපදෙස් දෙන්නේ,

FAIR COMMENT BY JEZEEM

ඒගොල්ලෝ තමයි නිකාබය දානවද, බුර්කාව දානවද, මේක මුහුණ වහනවද, අයින් කරනවද තීරණය කරන්නේ, ඒගොල්ලෝ තමයි කසාද සම්බන්ධයෙන් තීරණය කරන්නේ. ඒ වගේම ෆත්වා නිකුත් කිරීම සම්බන්ධයෙන් ඒගොල්ලෝ තමයි ඒවට බලපෑම් කරන්නේ. ඉතින් ආණ්ඩුවේ පොදු නිගමනයක් ආවා එක වෙලාවක රාජ්‍ය ආරක්ෂාව ගැන කල්පනා කරලා මේ සම්පූර්ණ මුහුණ වැහීම අයින් කරන්න ඕන කියලා. උලමලා කිව්වා ඒකට අපිට ඉඩ දෙන්න බැහැ කියලා. ඉතින් ඒ නිරන්තරව ඒ උපදෙස් ගැනීම් සහ ඒ අය තමයි මෙතන ඇත්තටම තීරක කණ්ඩායම.

ප්‍ර : ඒ අනුව ඔබ වහන්සේ මේ දක්වා අද දවසේදී ලබා දුන් සාක්ෂියට අනුව ඔබ වහන්සේ කියන්නේ මේ වන විට ජමෙයිතුල් උලමා සභාවේ නියෝජනය දැන් අන්තවාදී කණ්ඩායම් කෙරෙහි යොමු වෙලා තියෙනවා කියන කාරණාව?

පි : ඉතාම වගකීමෙන් මම කියන්නේ.

ප්‍ර : හාමුදුරුවනේ ශූරා සභාව කියන්නේ මොකක්ද?

පි : ශූරා සභාව හැදුවේ හලාල් ප්‍රශ්නෙන් පස්සේ. උලමා සභාවට දිගින් දිගටම අපි එක වෙලාවක කිව්වා ඒක වැදගත් සභාවේ වරදවා හිතන්න එපා අපට මේක දරා ගන්න බැරි තැන අපි එක වචනයක් පාවිච්චි කලා මේ උලමලා මේ විදියට නටන්න ආවොත් අපි උලමලා බකමූණෝ කරනවා කියලා. ඊට පස්සේ මේක හොඳටම රිදුනා මේගොල්ලන්ට. සතියක් ගියේ නැහැ මෙන්න ශූරා සභාවක් නමින් නිවේදන නිකුත් වෙනවා. ඒ සිද්ධියෙන් පස්සේ තමයි ශූරා සභාවක් ලහිලහියේ පිහිටුවා ගත්තේ එය උලමා සභාවටත් උඩින් තියෙන සංවිධානයක් හැටියට මම දන්නේ නැහැ ඒගොල්ලන් අතර දෙගොල්ලෝ එකටම වැඩ කරනවද, වෙන්ව වැඩ කරනවද කියලා හැබැයි ශූරා සභාවකුත් ඉතාම ඉක්මණින් පිහිටුවා ගත්තා ඒ හලාල් අර්බුදය වෙලාවේ.

ප්‍ර : ඒ ශූරා සභාවේ නායකයා හැටියට ඉන්නේ කවුද හාමුදුරුවනේ?

පි : මට දැන් නම් නම මතක නැහැ, ශූරා සභාවේ.. සමාවෙන්න ඉනාමුල්ලා ඒ ශූරා සභාවේ හිටියා කියලා මතකයි. සභාපතිගේ නම නම් මතක නැහැ.

ප්‍ර : ඔබ වහන්සේ ඉනාමුල්ලා වශයෙන් සඳහන් කරන එම පුද්ගලයා ඔබ වහන්සේ හඳුනනවද , කොහොමද ඔබ වහන්සේට ඔහු පැහැදිලි කිරීමට හැකියාව තියෙන්නේ?

පි : මම එදා පිංතූරෙන් පෙන්නුවා ඉනාමුල්ලා මහත්මයා ගැන ඔහු විදේශ කටයුතු අමාත්‍යාංශයේ වැඩ කරන කෙනෙක්. සහ ලංකාවට මොන ගණයේ ඉස්ලාම් නායකයෙක් ආවත් ඉස්ලාම්

FAIR COMMENT BY JEZEEM

රටක ඔහු තමයි ඒ සබඳකම් හදන්නේ. ඒ කියන්නේ හැම තැනක් එක්කම ඔහුගේ ගණුදෙනු තියෙනවා.

ප : හාමුදුරුවනේ ඔබ වහන්සේ දැන් සඳහන් කරන්නට යෙදුනා ඡායාරූපයක් පෙර දිනයේදී ඉදිරිපත් කළා කියලා, මා පෙන්වා සිටියොත් පෙර දිනයේ ඉදිරිපත් කරන ලද ඡායාරූප ඔබ වහන්සේට හඳුනා ගන්න පුළුවන්වද මොන ඡායාරූපයේද ඔහු පෙනී සිටින්නේ කියලා ඔබ වහන්සේ සඳහන් කරන ඔය ඉනාමුල්ලා නැමැත්තා?

පි : පුළුවන්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප : ඡායාරූපයේ කෙසේද ලකුණු කර තිබෙන්නේ ගරුස්වාමීන් වහන්ස?

පි : C612, C 613, C611 ඒ යුෂුෆ් අල්කර්දාවිත් එක්කත් ඉන්නවා. මැතිතුමනි මට ඒකටම අදාල කාරණාවක් කිව්වට කමක් නැද්ද මොකද මගේ අතේ තියෙනවා පොඩි පොත් පිංචක්. මේක Qatar Islamic Culture Center to contact us කියලා ඒක ඒගොල්ලන් එහෙන් එවන එකක්. මේකේ කතා අබ්දුල් කරීම් අල් දීවාන්. මේකේ ඉතාම පැහැදිලිව ඔය පිළිම වන්දනාකරුවන් ගැන කතා කරනවා. ඒ කියන්නේ මට පෙන්නන්න ඕනකම තියෙන්නේ සෞදියේ විතරක් නෙමෙයි තුර්කියේ විතරක් නෙමෙයි රටවල් ගණනාවක සබඳකම් තියෙනවා එකට. මේ කටාර් රාජ්‍යයෙන් පවා මේ සිංහල භාෂාවෙන් පොත් ගහලා එවලා තියෙනවා, ඉතාම පැහැදිලිව මේ 9(5) වගන්තිය කුර්ආනයේ තිබෙන ඒක තමයි අපි භීතියට පත් කරන කාරණාව. ඒකේ තියෙන්නේ නුඹලා ශුද්ධ වූ මාස 4 පහු වහාම නුඹලා පිළිම වන්දනාකරුවන් දුටු දුටු තැන කපා කොටා ඝාතනය කරන්න. නොඑසේ නම් මේක හැබැයි සිංහල එකේ නැහැ, ඒක තියෙන්නේ හරියටම ඉංග්‍රීසි එකේ. එතකොට නොඑසේ නම් ඔවුන්ව අතරමඟදී අල්ලා පහර දෙන්න යනාදි වශයෙන් 9(5) වගන්තිය. ඒක හරියටම මේ පොත්වලත් ඒක සඳහන් වෙනවා.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ශි මහත්මිය:</u>

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේ දී ස්වාමීන් වහන්ස පෙර ලබා දුන් සාක්ෂියෙහි ඇතුලත් වූ කරුණු අනුව උන්වහන්සේ හඳුනා ගනු ලැබුවා C612, C 613, සහ C611 ඡායාරූපයන් හි සිටින පුද්ගලයෙක් හැටියට මේ ඉනාමුල්ලා

FAIR COMMENT BY JEZEEM

කියන පුද්ගලයා. එම ස්ථාන පෙර දිනයේදී සලකුණු කිරීම් කර තිබෙනවා ස්වාමිණි ඒ ආකාරයටම ඉනාමුල්ලා වශයෙන් නම් සඳහන් කරමින්. එම ස්ථාන C612A වශයෙන් ඉනාමුල්ලා මහතා සිටින ස්ථානය, ඒ වගේම C611C වශයෙන් ඉනාමුල්ලා මහතා සිටින ස්ථානය සඳහන් කර තිබෙන බවත්, ඒ සම්බන්ධයෙන් ගරු සභාවේ අවධානය මේ අවස්ථාවේදී යොමු කර සිටිනවා.

පි : මේ පොතත් මට දෙන්න ඕන දෙන්න කලින් මේ පොතේ 10 වන පිටුවට අවධානය යොමු කලොත් ෂෙයිකුල් ඉස්ලාම් ඉබුනුත් නයිමියා මෙසේ පවසයි. ඉතා විශ්වාසීදායක ලෙස කට වචනයෙන් සාදා ප්‍රකාශ කර බාහිරව පවතින ඉස්ලාමීය නීති රීති පිළිපැදීම ප්‍රතික්ෂේප කරන සියල්ලන් හට එරෙහිව සටන් වැදීම අනිවාර්යය වේ. ඒ අය .....
(එම කොටස කියවයි)
10 වන පිටුවත්, 9 වන පිටුවත්, ඒ වගේම 7 වන පිටුව විශේෂයෙන්. මේ සම්බන්ධයෙන් අල්කුර්ආනයේ මෙසේ පවසයි. නබිතුමනි ඔබ දෙවියා තමා හැර අන් කිසිවකු නොවිඳිනා ලෙස අණකර ඇත. අල්කුර්ආන් 1723 ලා ඉල්ලාහි ඉල්ලල්ලාහ් යන තේරුම නියම අර්ථය මෙය වේ කියලා කෙනෙකු අල්ලාහ් දෙවියන් හැර අන් කෙනෙකු නැත. වැදීමට සුදුසු සත්‍ය දෙවියා අල්ලාහ් දෙවියන් හැර අන් කෙනෙකු නැත. යනුවෙන් පවසන අතර අල්ලාහ්ට ආදේශ කිරීමේදි නියැලී සිටින්නේ නම් හෙතෙම ඒකදේව වාදය තවුහිද් කරා හැරෙන තුරු ඔහුට එරෙහිව සටන් වැදිය යුතු යන්න ඉස්ලාමීය විද්වතුන්ගේ නිගමනය වේ. ඒ නිසා මේ කටාර් රාජ්‍යයෙන් මේ ගහලා එවන පොත් පිංච ඉදිරිපත් කරනවා. මේකේ කටාර් කියලා තියෙනවා, කටාර් ඉස්ලමික් කල්චර් සෙන්ටර්

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදි ස්වාමීන් වහන්සේ විසින් ඉදිරිපත් කරනු ලබන ලා ඉල්ලාහ් ඉල්ලල්ලාහ් අර්ථ විවරණය යන මාතෘකාව යටතේ කතෘ අබ්දුල් කරීම් අල්දීවාන් සිංහලෙන් අබුෂායිරා මහම්මදු හුසේන් වශයෙන් කතෘන් සඳහන් වන කටාර් ඉස්ලමික් කල්චරල් සෙන්ටර් වශයෙන් ද, එහි පිට කවරයේ දක්වා තිබෙන සිංහලෙන් කරුණු සඳහන් වන පොත් පිංචක් RGG 39 වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා. එහි 7,9 සහ 10 පිටු කෙරෙහි ස්වාමීන් වහන්ස අවධානය යොමු කරනු ලැබුවා. එම පිටු 3 පිළිවෙලින් RGG 39A 7 වන පිටුවටත්, RGG 39B 9 වන පිටුවටත්, RGG 39C 10 වන පිටුවටත් වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා.

FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

මේ අවස්ථාවේදි RGG 39 වශයෙන් ලකුණු කරන ලද ලේඛනයේ ඡායා පිටපතක් ලබාගෙන එහි සහතික කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරන අතර, එය ඉන්පසු මුල් ලේඛනය ගරු ස්වාමීන් වහන්සේට මුදා හරින ලෙසට නියෝග කරමි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ශි හේරත් මහත්මිය:</u>

පි : මැතිනියනි සමාවෙන්න අර මට ඉස්සෙල්ලා හොයා ගන්න බැරි වුණා හරිම විස්තරය කියන්න ඕන නිසා ජමෙයිතුල් උලමා ගැන දැනුයි හම්බ වුනේ මම චුට්ටක් කිව්වට කමක් නැද්ද.

ප්‍ර : එහෙමයි හාමුදුරුවනේ.

පි : සමස්ථ ලංකා උලමා සංවිධානය ඕල් සිලෝන් ජමෙයිතුල් උලමා ACJU ශ්‍රී ලංකාවේ පිහිටි මුස්ලිම් විද්වතුන්ගේ සංවිධානය ලෙස තමයි මෙය හඳුන්වන්නේ. 1927 නෙමෙයි 1924 දී ස්ථාපනය කර ඇති වර්ෂ 2000 දී අංක 51 දරන සමස්ථ ලංකා ජමෙයිතුල් උලමා සංවිධානය සංස්ථාගත කරන ලද පනත යටතේ නීතිගත කරලා තියෙනවා. මෙම සංවිධානය විසින් ලංකාවේ මුස්ලිම් ජනතාවගේ ආගමික හා ආද්‍යාත්මික සමාජ අවශ්‍යතාවයන් පිළිබඳව මඟ පෙන්වීමක් සහ නායකත්වයක් ලබා දෙනවා. මෙහි සාමාජිකයන් 4000 ක් පමණ සිටින අතර, සියළුම නිකායන් මෙහි නියෝජනය වේ. නමුත් මෙහි තියෙනවා අහමදියා මුස්ලිම් ජමාත් සංවිධානය කියලා එකක්, ඒ සංවිධානය පමණක් නියෝජනය වෙන්නේ නැහැ. දැන් අපි තාම හොයනවා ඒ සංවිධානය පරගහදෙනියේ තියෙන එකද කියලා, අහමදියා කියලා තියෙන හින්දා. ඒ අහමදියා සංවිධානය පමණක් ඒගොල්ලන්ගේ සාමාජිකයෝ පමණක් ජමෙයිතුල් උලමා සංවිධානයේ නියෝජනය වෙන්නේ නැහැ.

ප්‍ර : හාමුදුරුවනේ ඔබ වහන්සේගෙන් මම විමසමින් හිටියේ ශූරා සභාව සම්බන්ධයෙන්, ඔබ වහන්සේගෙන් මම අසා සිටියා එහි සිටින පුද්ගලයන් සම්බන්ධයෙන් ඔබ වහන්සේට නම් සඳහන් කරන්නට පුළුවන්ද කියා, ඒ අනුවයි ඔබ වහන්සේ ඉනාමුල්ලා නමැති නම සඳහන් කලේ. ඊට අමතරව ඔබ වහන්සේට නම් වශයෙන් මේ ශූරා සභාවේ සිටි පුද්ගලයන් කවුද කියලා නම් සඳහන් කරන්න හැකියාවක් තියෙනවද?

FAIR COMMENT BY JEZEEM

පි : නැහැ, මතකයට එන්නේ නැහැ, මොකද පහුගිය කාලේ මේ අධ්‍යයනවලින් ටිකක් බැහැරව හිටියා මොකද කියලා වැඩක් නැති නිසා.

ප්‍ර : ඔබ වහන්සේ මේ වන විට ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන C638 ලේඛනයෙහි ශූරා සභාව සම්බන්ධයෙන් ලේඛනගතව තිබෙනවා,
(ගරු සභාපතිතුමනි අවසර අයැද සිටිනවා. මේ අවස්ථාවේදී එය පෙන්වා සිටීමට C638 ලේඛනය)

පි : ඔව් මගේ ලඟත් තිබෙනවා මේක මට මොකක්දෝ අපහසුතාවයක් දැනෙනවා, ශූරා සභාව තාරික් මහමුද් අපේ සාම්ප්‍රදායික බදුර්දීන් මහමුද් කියලා ප්‍රසිද්ධ පුද්ගලයෙක් හිටියා, ඔහු ගේ පුතා තමයි මේකේ ආරම්භකයා. තව නවුෆර් මවුලවි කියලා එක්කෙනෙක් ඉන්නවා, ඔහු වහබි සලෆිත් මතවාද දෙකේම ඉන්න පුද්ගලයෙක්. ඊලඟට ඉනාමුල්ලා. ඉනාමුල්ලා කියන්නේ ජමාතේ ඉස්ලාම් ඉහ්වාන් මුස්ලිම්, මොහු තමයි ලංකාවේ යුෂුෆ් අල්කර්දාවිගේ නියෝජිතයා. ඉනාමුල්ලා. අවාසනාවට ඒ අයගෙන් තමයි උපදෙස් ගන්නේ ආණ්ඩු. කොහොමද මේක නවත් වන්නේ කියලා.

ප්‍ර : හාමුදුරුවනේ මුස්ලිම් කවුන්සිලය කියලා සඳහන් කරන්නේ මොකක්ද?

පි : අමීන් මහත්මයා සභාපතිත්වය දරන මුස්ලිම් කවුන්සලයයි මට මතක. ඔව් මුස්ලිම් කවුන්සලයේ ප්‍රධානියා N.M.අමීන්. ඔහු සම්බන්ධයෙන් අපි දීර්ඝ කාලයක් හෙළිදරව් කිරීම් කරලා තියෙනවා. නමුත් ඔහු ඇත්තටම සාමාන්‍ය මනුස්සයෙක් විදියට සාමාන්‍ය විදියට කලිසම, කමිසය අඳිමින් එහෙම තමයි පෙනී ඉන්නේ. ඒක නිසා කිසි කෙනෙක් විශ්වාස කරන්නේ නැහැ ඔහු එවැනි අන්තවාදී මත දරන පුද්ගලයෙක්ද කියලා ඔහුගේ හැසිරීමෙන්. නමුත් මොහු ගැන අපිට තියෙන තොරතුරු සහ ඉස්ලාම් සමාජයෙන් ම අපිට ලබාදෙන තොරතුරුවලට අනුව ඔය ඉහ්වාන් මුස්ලිම් ආගමේ වර්තමාන නායකයා හැටියට පෙනී සිටින යුෂුෆ් අල්කර්දාවිගේ මරාගෙන මැරෙන ක්‍රමය නිවැරදියි කියලා පෙනී ඉන්න ලංකාවේ කරලාවිගේ නියෝජිතයා වෙච්ච ඉනාමුල්ලා සමඟ යුෂුෆ් අල්කර්දාවි හමු වෙච්ච පුද්ගලයෙක් හැටියට තමයි අපි හඳුනගෙන තියෙන්නේ. ඔවුන් තමයි මොනවා හරි සිද්ධියක් කොහේ හරි වුණාම පළවෙනියෙන්ම මාධ්‍ය නිවේදන නිකුත් කරන්නේ මුස්ලිම් කවුන්සලය. ඒගොල්ලන් මෙහෙමයි හරි අහිංසකයි, හරි කීකරුයි අනික් අය තමයි ජාතිවාදී, අනික් අය තමයි ආගම්වාදී කියලා ඒ මාධ්‍යය හසුරුවන අය අතර

FAIR COMMENT BY JEZEEM

මේගොල්ලෝ උඩින්ම ඉන්නවා. චින්තන ජීහාදයත් එක්ක මේ මාධ්‍යය භාවිතාව හරිම ප්‍රබලයි ඒගොල්ලන්ගේ. අද වෙන කොට 2 ක් 3 ක් හැරුණු කොට එක්කෙනෙක්වත් නැහැ ඉංග්‍රිසියෙන් ලියන්න ලංකාවේ ඉංග්‍රීසි මාධ්‍යයට. ඒ නිසා තමයි සිංහලයෝ ගැන, බෞද්ධයෝ ගැන රටේ භික්ෂූන් ගැන මේ ප්‍රශ්නෙ ගැන මුළු ලෝකෙටම වැරදි මතකයක් දීලා තියෙන්නේ මේ අන්තවාදීන් විසින් ඒ පැන හසුරුවන නිසා.

ප්‍ර : මේ මුස්ලිම් කවුන්සලය කියන ආයතනය පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න හාමුදුරුවනේ දැන් ඔබ වහන්සේ සඳහන් කලා ජමෙයිතුල් උලමා සංවිධානය, ඒ වගේම ශූරා සභාව, ඔබ වහන්සේගේ සාක්ෂියෙන් කියවුණා ශූරා සභාව පසුකාලීනව ඇති වුණ දෙයක් ශ්‍රී ලංකාව තුළ ජමෙයිතුල් උලමා සංවිධානයටත් ඉහළින් පිහිටන ආකාරයටයි එය පිහිටා තිබෙන්නේ කියලා, මුස්ලිම් කවුන්සලය කියන එකෙහි ව්‍යුහගතවීම කොහොමද සිද්ධ වෙන්නේ කොහේද ඒක තියෙන්නේ, මොන ව්‍යුහය තුළ ඔවුන් මොන ආකාරයටද?

පි : වැඩිමනත් විස්තර නම් මුස්ලිම් කවුන්සලය ගැන හෙව්වේ නැහැ. මොකද එක පුද්ගලයෙක් දැන ගත්තාම ඇති නිසා. යම් යම් කරුණු පැන නැඟුන අවස්ථාවලදි හැම සාකච්ඡාවකටම වගේ මේ අමීන් මහත්මයා විතරයි එන්නේ. මම හිතන්නේ ඔහුද දන්නේ නැහැ සභාපතියි, භාණ්ඩාගාරිකයි, ලේකම් ඔක්කොම ඔහු වෙන්නත් පුළුවන් සමහර වෙලාවට. ඊට වැඩි කෙනෙක්ගේ නම් අපිට හම්බ වෙලා නැහැ. මුස්ලිම් කවුන්සලයේ සභාපති හැටියට අමීන් මහත්තයා පෙනී ඉන්න අවස්ථා විතරයි අපි දැකලා තියෙන්නේ.

ප්‍ර : හාමුදුරුවනේ ඔබ වහන්සේ කරුණක් වශයෙන් මේ සභාවට ඉදිරිපත් කළා මේ ෂරියා විශ්ව විද්‍යාලය ලෙස හඳුන්වන එහෙම නැත්නම් නැගෙනහිර විශ්ව විද්‍යාලය වශයෙන් හඳුන්වන විශ්ව විද්‍යාලයක් සෞදි අරාබියාවේ ආධාර මත ගොඩනැගුණු බව?

පි : ඔව්.

ප්‍ර : ඒ හා සමගාමීව ඒ හා සමාන වූ විශ්ව විද්‍යාල ලොව වෙනත් රටවල්වලත් ඇති වී තිබෙන බවට ඔබ වහන්සේට තොරතුරු ලැබිලා තිබෙනවාද?

පි : ඔව්. ඉන්දුනීසියාවේ එවැනි විශ්ව විද්‍යාලයක් තියෙනවා. දැන් ෂරියා නමින්ම ලෝකයේ බොහෝ රටවල්වල තියෙනවා විශ්ව විද්‍යාල. නමුත් අග්නිදිග විශ්ව විද්‍යාලයෙන් නැගෙනහිර අපිට බුදු පිළිමයක්වත් තියන්න දුන්නේ නැහැ, ඒ තරමටම බලපෑම් ඇති කලා පහුගිය කාලේම. ඒ කියන්නේ අපේ සිංහල ශිෂ්‍යයන්ට

FAIR COMMENT BY JEZEEM

වන්දනා කරන්න පොඩි බුදු මැදුරක් හදන්න ගියාම ඒකටත් ඉඩ දුන්නේ නැහැ නැගෙනහිර විශ්ව විද්‍යාලයේ. ඔලුවිල්. මට නම මතක නැහැ මැඩම්.

(මේ අවස්ථාවේ ලේඛනයකට අවධානය යොමු කරයි)

විශේෂයෙන්ම ඉන්දුනීසියාවේ ජකර්තා නගරයේ ආරම්භ කලා විශ්ව විද්‍යාලයක් 1980 සෞදි අරාබියාව විසින් මුදල් යොදවලා. ලිපියා විශ්ව විද්‍යාලය ඒක ඇත්ත වශයෙන්ම නැගෙනහිර හිස්බුල්ලා ගොඩ නඟපු මලික් අබ්දුල්ලා නමින් ගොඩ නගන්න ගියපු ඔය දැන් Batticaloa Campus වශයෙන් හඳුන්වන ඔය නැගෙනහිර ෂරියා විශ්ව විද්‍යාලය වගේම එකක්. ඒ ලිපියා විශ්ව විද්‍යාලයෙත් ඉස්ලමික් නීතිය, ඉස්ලමික් ලෝ අරාබි භාෂාව ඇතුළු පාඨමාලාවල් රැසක් ක්‍රියාත්මක කරන්න ඒ අය කටයුතු කරලා තියෙනවා. විෂය නිර්දේශ හා ගුරු අත්පොත් සෞදි අරාබියාවේ ඉදලා තමයි ඉන්දුනීසියාවට යවලා තියෙන්නේ. ඉතින් ඉන්දුනීසියානු රජය සෞදි රජය මැදිහත්වීම නැවැත්වීමට කටයුතු කරන්නේ නැතුව නිදහසේ ඔහේ ක්‍රියාත්මක වෙන්න ගිහිල්ලා තියෙනවා. දැන් ඒකේ ප්‍රතිඵලයක් විදියට පහුගිය කාලේ වාර්තා වුණා දිගින් දිගටම නැවත අර පිළිම කැඩීම් ආදී වශයෙන් තලෙයිබාන් පන්නයේ ක්‍රියාකාරකම්වල ඒ අය නියැළුණා කියලා.

ප : මේ ඉන්දුනීසියාවේ තිබී තිබෙන ලිපියා එහෙම නැත්නම් Lipia විශ්ව විද්‍යාලය ශ්‍රී ලංකාවේ ආරම්භ කරන්නට යෙදුනු ෂරියා විශ්ව විද්‍යාලය එහෙම නැත්නම් Batticaloa University යුනිවර්සිටි වශයෙන් හැඳින්වෙන විශ්ව විද්‍යාලයට සමානතාවයක් දක්වනවා එකම කරුණු අරඹයා මෙය ආරම්භ වෙන්නේ කියන කාරණාව ඔබ වහන්සේ දැනුවත් වුණේ කොහොමද හාමුදුරුවනේ?

පි : එකක් ඉන්දුනීසියාව කියන්නේ මීට පරම්පරා 5 කට 6 කට උඩදී සම්පූර්ණයෙන්ම බෞද්ධ රාජ්‍යයක්. එතකොට ඒ බෞද්ධ රාජ්‍යයේ අදත් ලෝකයේ පුදුම හතෙන් එකක් වන බෝරෝ බුදුර් පිහිටලා තියෙන්නෙත් ඉන්දුනීසියාවේ. තවමත් සමහර වෙලාවට ගුවන් යානාවේ යන කොට නමෝ බුද්ධාය කියලා සමහර ගුවන්යානාවල කියනවා. ඒතරම් ඒ බෞද්ධයෝ ලැදියි. අපේ දායකයෝ පවා ඉන්නවා ඉන්දුනීසියාවේ. ඉන්දුනීසියානු ජාතික බෞද්ධයෝ. ඒ අය තමයි අපිට හුඟක් තොරතුරු ලබා දෙන්නේ. වර්ෂයකට වරක් ඇවිල්ලා ඉන්දුනීසියන් බෞද්ධයෝ කෝට්ටේ රජමහා විහාරස්ථානයේ දානමය පුණ්‍ය කර්මයක් පවා කරනවා. ඉතින් ඒ නිසා ඒ අය අපිට තොරතුරු කියනවා හාමුදුරුවනේ ඔබ වහන්සේලාගේ රට බෙරා ගන්න, අපි ඉන්දුනීසියාවේ විඳින තත්ත්වය මේකයි කියලා. දැන් ඒගොල්ලන්ට ඉන්දුනීසියාවේ

FAIR COMMENT BY JEZEEM

ජීවත් වෙන්න බැරුව ඒ අය වැඩි කාලයක් ඇමරිකා එක්සත් ජනපදයේ තමයි ජීවත් වෙන්නේ. ඒ අයගෙන් ගොඩක් තොරතුරු අපි ලබා ගන්නවා. මොකද අපි කරන හෙළිදරව් කිරීම් ඒගොල්ලෝ බලනවා. එහේ වෙන්නෙත් මෙහේ වෙන්නෙත් කිසි වෙනසක් නැහැ එකම ආකාරයේ දේවල් නිසා ඒ අනුසාරයෙන් අපි අනුමානය කරනවා ඒ ලිපියා විශ්ව විද්‍යාලය වගේම එකක් තමයි මෙහේ ගොඩනැගෙන්නේ කියලා.

ප්‍ර : මෙම ලිපියා විශ්ව විද්‍යාලයේ තොරතුරු ඔබ වහන්සේ ඔය සඳහන් කරන්නට යෙදුන තොරතුරු ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්ව විද්‍යාලයේ හා අනුගත වන ආකාරයේ තොරතුරු බව සඳහන් කරන්නට ඔබ වහන්සේට තහවුරු කිරීමට යම්කිසි ලේඛනයක් තිබෙනවද හාමුදුරුවනේ?

පි : මම ඒ ලේඛනයේ පිටපතක් ඉදිරිපත් කරලා තියෙනවා.
(සාක්ෂිකාර ස්වාමීන් වහන්සේට ලේඛනයක් පෙන්වා සිටී)

ප්‍ර : මේ ලේඛනයද?

පි : ඔව්.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේ දී ස්වාමීන් වහන්සේ විසින් ඉදිරිපත් කර තිබෙන පිටු 2 කින් යුත් ලේඛනයක් එහි මාතෘකාව හැටියට තිබෙන්නේ Lipia Saudi Islamic and Arabic College of Indonesia වශයෙන් එම ලිපියා විශ්ව විද්‍යාලයේ තොරතුරු ඇතුලත් ලේඛනයක් එය මෙම ගරු සභාවට C650 වශයෙන් සලකුණු කිරීම සඳහා අවසර අයැද සිටිනවා.

ප්‍ර : එම කාරණාව ඔබ වහන්සේ මේ කලින් ලේඛනයෙන් ලබා දුන් කාරණාව පිළිබඳව එයට මුදල් ලැබෙන්නේ කොහෙන්ද, එම ලිපියා විශ්ව විද්‍යාලයේ මොන ආකාරයටද ආරම්භ වුනේ කියන කාරණාව ජාත්‍යන්තර අවධානයට ලක් කිරීමක් සිදු වෙලා තිබෙනවාද යම් අවස්ථාවක හෝ සඟරා මගින් හෝ මාධ්‍යය මගින් හෝ යම්කිසි ආකාරයකින් ඔබ වහන්සේට ඒ සම්බන්ධයෙන් තොරතුරු දැනුවත් වීමක් වෙලා තියෙනවද?

පි : ඔව් අපිට හුඟක් තොරතුරු සොයා ගන්න ලැබුණා මේ Muslim Word League එක ඔය පාස්කු ප්‍රහාරයෙන් පස්සේ ලංකාවට ආවා Muslim Word League එකේ නායකයෝ ඒ නායකයෝ ඇවිල්ලා උපදෙස් දුන්නා අපේ නායකයන්ට. ආධාරත් දුන්නා කියලා තමයි දැන ගන්න ලැබුණේ. මොකක්ද මේ මුස්ලිම් වර්ල්ඩ් ලීග් එක කියලා බොහොම ගැඹුරට අධ්‍යයනය කරද්දි අපිට ඉතාම වැදගත් තොරතුරු හොයා ගන්න ලැබුණා. ඒ කියන්නේ මොකද මුස්ලිම්

FAIR COMMENT BY JEZEEM

වර්ල්ඩ් ලීග් එක තමයි මේකේ පිටිපස්සේ ඉන්නේ. උදාහරණයක් විදියට ලිපියා විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය සංවිධානයක් ආරම්භ කරලා තියෙනවා KAMMI කියලා ඉන්දුනීසියන් භාෂාවෙන් තියෙන්නේ කෙෂාක්වා නකාසි මහ ෂියාමා මුස්ලිම් ඉන්දුනීසියා කියලා. ඒ ශිෂ්‍ය ව්‍යාපාරයේ අරමුණ වෙලා තිබුණේ ඒකට කරුණු හොයාගෙන ගියාම ඉන්දුනීසියාව සම්පූර්ණයෙන් ඉස්ලාම් රාජ්‍යයක් කරන්න. අද ඒක වෙලා ඉවරයි. ඊලඟට ලිපියා විශ්ව විද්‍යාලයේ උපාධි සඳහා ඉන්දුනීසියාවේ අනෙක් විශ්ව විද්‍යාලවලටත් ඒ බලපෑම ලැබීමෙන් දැන් ඒ වහබි සලෆි මතවාදයට ගිළගනිමින් ඉන්නවා අර සාම්ප්‍රදායිකව හිටපු ඉන්දුනීසියන් මුස්ලිම් ජාතිකයොත්. ඊලඟට මේකේ තියෙන මේ හා බැඳුනු තව සිද්ධියක් තමයි 2000 අවුරුද්දේ ඉන්දුනීසියාවේ වාසය කරන ක්‍රිස්තියානි ජනතාවට එරෙහිව ආරම්භ කලා ඉන්දුනීසියන් සලාෆි වොරියර්ස් ඔෆ් ජිහාඩ්, ලක්ෂාඩ් ජිහාඩ් LG කියලා අවසානයේදි 2002 වර්ෂයට පෙර වසර 2 ක් ඇතුලත ඒ කියන්නේ 2000 පටන් අරන් 2002 වෙන කොට දහස් ගණන් වූ මුස්ලිම් තරුණයන්ට අවි පුහුණුව ලබා දීලා ක්‍රිස්තියානි ජනතාවට එරෙහිව යුද්ධ කරන්න පොළඹවලා තියෙනවා. එම ජිහාඩ් කල්ලිය ආරම්භ කරලා තියෙන්නේ ජෆාර් උමාර් තාලිෆ් නැමැත්තෙක්. ඔහු ලිපියා විශ්ව විද්‍යාලයේ ඉගෙනුම ලබපු පුද්ගලයෙක් බවට නම් දරලා තියෙනවා. මේ වගේ මේ විශ්ව විද්‍යාලයයි නැගෙනහිර විශ්ව විද්‍යාලයයි අතර කිසිම වෙනසක් නැහැ කියලා අපිට නිගමනය කරන්න පුළුවන් මොකද ලෝකේ පුරා ඉන්න ත්‍රස්ත නායකයන්ට ඒ සංවිධාන බිහි කරන්න ගොඩනගන්න අපි යන්නේ කොහේද කියලා ඇහුවොත් අපි යන්නේ නැගෙනහිර විශ්ව විද්‍යාලයට කිසිම තහංචියක් නැහැ ඔවුන්ට ඕනෑ හැටියට මේ ගණුදෙනු කරන්න පුළුවන් පහසු තැනක් ගොඩ නැගීමක් හැටියට තමයි අපි සලකන්නේ නැගෙනහිර විශ්ව විද්‍යාලය.

ප්‍ර : ඉන්දුනීසියාවේ අධ්‍යාපනයට අදාලව ආධාර ලැබෙන ආකාරය සහ මේ කියන අන්තවාදී ඉස්ලාම් මතවාද පැමිණිමට අදාලව ජාත්‍යන්තර අවධානය යොමු කරපු ලේඛන ඔබ වහන්සේ සතුව තියෙනවාද? ඒ කියන්නේ සහරාවල පලවෙච්ච ලේඛන ආදී වශයෙන් ලේඛන?

පි : ඔව් යම් පමණක් අපි ඉදිරිපත් කළා කියලා මතකයි මට. විශේෂයෙන් මේ අපි ඒකට පාදක කර ගත්තේ ඔය Muslim Word League එක තමයි. ඒ Muslim Word League එක හරහා ආයෝජනය කරන අසීමාන්තික මුදල් වලින් විශ්ව විද්‍යාල

FAIR COMMENT — BY JEZEEM

පිහිටුවමින්, සමාජ සේවා ආයතන පිහිටුවමින් වෙන වෙනත් ආකාරයේ රාජ්‍ය නොවන සංවිධාන ගොඩ නගමින් ඔවුන්ගේ එකම අභිප්‍රාය මුස්ලිම් කලීපාතයක් ගොඩනැංවීම. ඒ අය ඕනෑම දෙයක් කරනවා ඒ වෙනුවෙන්. ඉතින් ඔය සාමාන්‍යයෙන් ලෝකේ පුරාම කියවුණු එක සිද්ධියක් තමයි ඉන්දුනීසියාවේ යම්කිසි සුළු ප්‍රමාණයක්, ඉතාම සුළු ප්‍රමාණයක් හිටියා ෂියා මුස්ලිම්ස්ලා. ෂියා මුස්ලිම්වරු. ඒ ෂියා මුස්ලිම් සුළුතරයට විරුද්ධව සටන් කිරීම සඳහා 1999 අවුරුද්දේ දී FPI කියලා ත්‍රස්ත කල්ලියක් හැදුවා. හබීබ් රිසාක් නමැති පුද්ගලයෙක්. ඔහුත් ලිපියා විශ්ව විද්‍යාලයේ ඉගෙනුම ලැබූ පුද්ගලයෙක් හැටියට ඒ කාලේ කතා කළා අපි කියවලා තියෙනවා යම් සඟරාවල. ඒ වගේම ෂියා මුස්ලිම් මිනිස්සුන්ට 2011 අවුරුද්දේ පෙබරවාරී මාසේ ඉදලා දෙසැම්බර් මාසේ වෙන කල් ප්‍රහාර එල්ල කරලා තියෙනවා දිගටම ෂියා මුස්ලිම්වරු. දැන් ඒ ෂියා මුස්ලිම් ගැන කවුරුත් කථා කරන්නේ නැහැ, ඉන්දුනීසියාවේ ක්‍රිස්තියානි ගැන කථා කරන්නෙත් නැහැ දැන් ඒ ත්‍රස්ත කල්ලිය අතේ තමයි පාලනය තියෙන්නේ.

ප : හාමුදුරුවනේ ඔබ වහන්සේ මෙම සභාවට සාක්ෂි දීමට පැමිණීමට පෙර ජනාධිපති කොමිෂන් සභාවේ විමර්ශන අංශයට ප්‍රකාශ වරින්වර ප්‍රකාශ 4 ක්ම ලබා දුන්නානේ හාමුදුරුවනේ?

පි : ඔව්.

ප : ඒ ප්‍රකාශ ලබා දෙන අවස්ථාවේදී ලේඛන ඔබ වහන්සේගේ ප්‍රකාශය තහවුරු කිරීමට අදාලව යම් යම් ලේඛන ලබා දීමක් සිද්ධ කළා?

පි : ඔව්.

ප : ඒ ලේඛන අතර ඔබ වහන්සේ ඔය දැන් සඳහන් කරපු කාරණාව ඒ කියන්නේ ලොව පුරා අන්තවාදය ප්‍රචලිත කිරීමට අදාලව සඟරාවල සහ වෙනත් මාධ්‍යය වල තිබුණු කරුණු ඔබ වහන්සේ අධ්‍යයනය කරන්නට යෙදුනා කියන කාරණාව ශ්‍රී ලංකාවට මුස්ලිම් ලීගය පැමිණීමත් සමඟ කෙරුණා කියන කාරණය තහවුරු කරන්න ඒ සඟරාවල පළ වෙච්ච ලිපි ඇතුලත් කරුණුත් ඔබ වහන්සේ විමර්ශන අංශයට භාර දීලා තියෙනවා?

පි : ඔව්.

ප : බලන්න හාමුදුරුවනේ මම මේ අවස්ථාවේ පෙන්වා සිටින මෙම ලේඛනය ඔබ වහන්සේ විසින් අප විමර්ශන අංශයට භාර දුන්න ලේඛනයක්ද කියලා?

(අදාල ලේඛනය සාක්ෂිකාර ස්වාමීන් වහන්සේට පෙන්වා සිටි)

FAIR COMMENT — BY JEZEEM

පි : ඔව්. ගිගා. ඒත් ඔය ලිපියා විශ්ව විද්‍යාලය සම්බන්ධයෙන්ම තමයි.

ප්‍ර : ඒ කියන්නේ ඉන්දුනීසියාවේ පැවති....

පි : විශ්ව විද්‍යාලය සම්බන්ධයෙන් ඒ වර්ල්ඩ් ලීග් එකේ සම්බන්ධය. සහ වහබ්වාදය ඇතුළු ඒ අන්තවාදය ගොඩ නැගීම සම්බන්ධයෙන් ඉතාම දිගු විස්තරයක් තියෙනවා.

ගරු මැතිතුමනි මේ අවස්ථාවේදී Giga Focus German Institute of Global and Area studies වශයෙන් හඳුන්වන සඟරාවක ජාත්‍යන්තර මුද්‍රණය ඉංග්‍රීසි මාධ්‍යය වශයෙන් 2014 අංක 7 යටතේ කරන ලද නිකුතුවක ඇතුලත් වන කරුණු සහිත ලේඛනයක් මෙම ගරු සභාවට ස්වාමීන් වහන්සේ විසින් ඉදිරිපත් කරනු ලබනවා. එම ලේඛනය පිටු 4 කින් යුක්තයි. එය මේ සභාවට C651 වශයෙන් සලකුණු කිරීම සඳහා අවසර අයැද සිටිනවා.

ප්‍ර : එම ලේඛනය හාමුදුරුවන් සඳහන් කරන්නට යෙදුන ආකාරයට ඉන්දුනීසියාවට අදාලව කරුණු ඇතුලත් වුණු ලේඛනයක්?

පි : ඔව්.

ප්‍ර : බලන්න හාමුදුරුවනේ මා දැන් පෙන්වා සිටින ලේඛනය ඔබ වහන්සේ ඉදිරිපත් කරපු ලේඛනයක්ද කියලා?

(අදාල ලේඛනය සාක්ෂිකාර ස්වාමීන් වහන්සේට පෙන්වා සිටී)

පි : ඔව්. The Guardian.

ප්‍ර : මේ අවස්ථාවේදි ඔබ වහන්සේ හඳුනා ගන්නා ලද සඟරාවේ අඩංගු ලේඛනය මොන රටවල් සම්බන්ධයෙන් අන්තවාදය පැතිරීමට අදාලව කරුණු දැක්වෙන ලේඛනයක්ද හාමුදුරුවනේ?

පි : “The Guardian”කියන සඟරාව ඇත්තටම ලෝකේ ප්‍රසිද්ධ සඟරාවක්. “Saudi Arabia Boasting Extremism in Europe“ says the former Ambassador සර් විලියම් පතේ සෞදි අරාබියාවේ හිටපු බ්‍රිතාන්‍ය තානාපතිවරයා ඔහු ඉතා පැහැදිලිව කියනවා Saudi Arabia has been funding mosques throughout Europe that have become hot beds of Extremism. ඒ කියන්නේ මේක summary එකක් විදියට ගත්තොත් Saudi Arabia was directly funding terrorist groups but rather than ideology that leads to Extremism. ඉතින් මේක අපිට බොහොම ප්‍රයෝජනවත් වුණා දැන් මෙතන දෙවන පිටුවේ තියෙනවා මුස්ලිම් Youth එක ගැනත්

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කියලා. අපි අර ලංකාවේ කථා කරපු WAMY එක. ඒ WAMY එක ගැනත් මොහු සඳහන් කරනවා.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී ස්වාමීන් වහන්සේ මේ ගරු සභාවේ අවධානයට ලක් කරන ලද "The Guardian" සඟරාවෙහි 2017.07.13 වෙනි දින පවතින ලිපියක් හැටියට ලේඛනයක්, පිටු 2 කින් යුක්ත ලේඛනයක් ඉදිරිපත් කර තිබෙනවා එය මෙම සභාවට C652 වශයෙන් සලකුණු කිරීම සඳහා අවසර අයැද සිටිනවා. එම ලිපිය ලියා තිබෙන පුද්ගලයා පැට්‍රික් වින්ටර් වශයෙන් නම සඳහන් වෙනවා ස්වාමීණි.

ප : ඊලඟට හාමුදුරුවනේ බලන්න මෙන්න මේ ලේඛනයඔබ වහන්සේ භාර දුන් ලේඛනයක් වශයෙන් හඳුනා ගන්න පුළුවන්ද කියලා
(ලේඛනයක් පෙන්වා සිටි)

පි : ඔව්.

ප : මේ ලේඛනය මොකක්ද හාමුදුරුවනේ?

පි : ඒකත් ඒ මුස්ලිම් වර්ල්ඩ් ලීගය විසින් වහබ්වාදය, ජිහාඩ් වාදය වැඩි දියුණු කිරීම සඳහා ඒගොල්ලන් කොහොමද වැඩ කරන්නේ කියලා තමයි තියෙන්නේ. Soft paper financing of religious, cultural and educational networks that nurture the Jihadi ideology, Wahabi Propaganda 2017 මැයි මාසේ 25 වෙනිදා මේක අපි හොයා ගත්තේ අර මුස්ලිම් කට්ටිය ලංකාවට එන කොට මොනවටද මේගොල්ලෝ එන්නේ, කවුද මේ මුස්ලිම් වර්ල්ඩ් ලීග් කියන්නේ කියලා, ඒකේ 2 වන පිටුවේ ඉතා පැහැදිලිව දක්වලා තියෙනවා 1970 කොහොමද මේ Charity පටන් ගත්තේ, කුමන අරමුණකින්ද මේවා පටන් ගත්තේ ඒ අදාල සියළුම කාරණා ඒගොල්ලන්ගේ මෙෂනරී සේවාව කොහොමද, ස්කොලස්ලා කොහොමද ගොඩ නගන්නේ, කොහොමද පොත් පත් පිළියෙල කරන්නේ, කොහොමද පල්ලි හදන්නේ, කොහොමද මද්‍රසා හදන්නේ, කොහොමද කොලේජස් හදන්නේ, කොහොමද ඉස්ලමික් සෙන්ටර්ස් හදන්නේ, ඒ වගේම පබ්ලෂින් හවුසස් ඒ කියන්නේ කොහොමද ගෙවල්වලට ගිහිල්ලා ප්‍රීචර්ස්ලා හදන්නේ මේ ඔක්කොම දක්වලා තියෙනවා මේකේ සවිස්තරාත්මකව.

ප : හාමුදුරුවනේ මෙය අන්තර් ජාලයෙන් බාගත කරන ලද ලේඛනයක්ද?

පි : ඔව්.

ප : එය කුමන වෙබ්අඩවියකින් ගත්ත හැටියට ඔබ වහන්සේට සඳහන් කරන්නට පුළුවන්ද?

FAIR COMMENT BY JEZEEM

පි : aoav.org.uk මෙකද බ්‍රිතාන්‍යයේ තියෙනවා Britain First කියලා සංවිධානයක්. බ්‍රිතාන්‍යයෙන් පහුගිය කාලය පුරාම මේ වහබ්වාදය සම්බන්ධයෙන් විශාල උද්ඝෝෂණ පැවැත්වුණා. ලන්ඩනයේ අපි මෙහේ මේ වහබ්වාදී අනතුර ගැන බොදු සමුළුව ආදි පවත්වලා මේවා හෙළිදරව් කරන කොට ඇත්ත වශයෙන්ම ලන්ඩනයේ පවා උද්ඝෝෂණය කලා අපේ සංවිධානයට විරුද්ධව. ඉතින් අපේ රට වගේම මිනිස්සු ආතතියෙන් ඉන්නවා එංගලන්තයෙත් මේ වහබ්වාදීන්ගේ අනතුර ඔවුන්ට හොඳින් දැනී තියෙන නිසා. ඉතින් ඒ නිසා ඒ රටේ විශාල වශයෙන් මේවා සම්බන්ධයෙන් හොයන ආයතන තියෙනවා ඒගොල්ලෝ මේවා ප්‍රසිද්ධියේ ප්‍රකාශයට පත් කරනවා. අපිටත් වඩා හොඳින් ගවේශණය කරලා.

ගරු සභාපතිතුමනි ඒ aoav.org.uk දරන වෙබ් අඩවියෙන් බාගත කළා යැයි ස්වාමීන් වහන්සේ සඳහන් කරන Soft power financing of religious, cultural and educational networks that nurture the Jihadi Ideology and Wahabi Propaganda වශයෙන් සඳහන් කරමින් AOAV 2017 මැයි 25 දිනැතිව ඇතුළත්ව තිබෙන ලිපියක් අඩංගු ලේඛනයක් පිටු 4 කින් සමන්විතයි. එම ලේඛනය මෙම සභාවට C653 වශයෙන් සලකුණු කිරීම සඳහා අවසර අයැද සිටිනවා.

ප්‍ර : හාමුදුරුවනේ බලන්න මේ ලේඛනය ඔබ වහන්සේ ඉදිරිපත් කරන ලද ලේඛනයක්ද කියලා?
(ලේඛනයක් පෙන්වා සිටී)

පි : ඔව්. ISIS South East Asia කියන එක නේද මැඩම්. එන්ටනැෂනල් වහබිසම්.

දැන් වේලාව : ප.ව. 4.00 යි
මෙතැන් සිට ල/ලේ :- මුතුමාලී මෙනවිය විසින්.

FAIR COMMENT
BY JEZEEM

වේලාව : ප.ව.06.40 යි.
පෙර සටහන් ල/ලේ : ධම්මිකා මිය.
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය</u>

ප්‍ර : මේ ලේඛනය කොහෙන්ද ඔබ වහන්සේ සොයා ගත්තේ? මෙය සඟරාවක තිබුණු ලේඛනයක්ද අන්තර්ජාලයෙන් බා ගත කරපු ලේඛනයක්ද?.

පි : මේක 2016 මැයි මාසේ 18 වෙනිදා අහමඩ් අබ්දුල් ෆවුසි අබ්දුල් හමීඩ් කියන කෙනෙක් ලියපු එකක්. විශේෂයෙන් මේ දකුණු ආසියාවේ ISIS එක කොහොමද වර්ධනය වෙන්නේ කියන එක සම්බන්ධයෙන් තියෙන ලියවිල්ලක්.

ප්‍ර : 57. මේ ලිපිය අඩංගුව තිබුණේ කොහේද හාමුදුරුවනේ සඟරාවකද අන්තර්ජාලයේද?

පි : මේක අපි ගත්තේ අන්තර්ජාලයෙන්. මේකේ වෙබ් අඩවිය නෑ. Writer විතරයි ඉන්නේ. ඒකේ අපි වැඩිමනත් කොටස තුන්වෙනි පිටුවේ අවධාරණය කරලා තියෙනවා. අපට කොහොමද මේ වහබි movement එක ලංකාවට බලපාන්නේ කියන කාරණාව ගැන.

ප්‍ර : ඒ වගේම හාමුදුරුවනේ බලන්න මා මේ මොහොතේ ඔබ වහන්සේට පෙන්වා සිටින ලේඛනය ඔබ වහන්සේ ඉදිරිපත් කළ ලේඛනයක්ද කියලා?

පි : මෙන්න මේක නේද මැඩම්. ඔව්.

ප්‍ර : එම ලේඛනය මා දැන් ඔබ වහන්සේට පෙන්වා සිටි ලේඛනය ඔබ වහන්සේ මොන ආකාරයට රැස් කර ගත්ත ලේඛනයක්ද?

පි : මේ ලේඛනයත් ඒ විදිහයමයි. අර Muslim word League එක සහ අපි අපේ රටේ පිහිටුවා තිබෙන ආයතන එක්ක මොකක්ද මේ ගොල්ලන් ගේ ගනුදෙනුව කියලා හොයන කොට තමයි මේ සියළු තොරතුරු අපි එකතු කර ගත්තේ. මොකද විශාල ප්‍රමාණයක් තියෙනවා ඒ සම්බන්ධයෙන්. මේක අපි අවධානය යොමු කළේ Muslim world league and world assembly of muslim youth අපි අර කතා කරපු Wamy කියන ආයතනය සඳහා කොහොමද මේගොල්ලො අරමුදල් සපයලා තියෙන්නේ කියන එක ගැන කතා කරලා තියෙනවා. ඉතින් ඒ නිසායි මේක ඉදිරිපත් කළේ. මේ වගේ තියෙන අන්තර් සම්බන්ධය පෙන්වීම සඳහා.

ප්‍ර : මෙය අන්තර්ජාලයෙන් ඔබ වහන්සේගේ සංවිධානය විසින් බා ගත කරන ලද්දක්ද හාමුදුරුවනේ?

FAIR COMMENT BY JEZEEM

පි : ඔව්. PEW Research Center නමින් ඒක එළියට ආවේ. මේ වගේ දහස් ගණන් දේවල් හොයා ගන්න පුළුවන්. නමුත් අපි උපුටා ගත්තේ අපේ රටට සහ දැනට ලංකාවේ මේ ඇති වෙලා තියෙන තත්ත්වය එක්ක කොහොමද මේගොල්ලන්ගේ ගනුදෙනු කියලා හරියටම සන්සන්දනය කර ගන්න ඕනී නිසා.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී PEW Research Center යන නම යටතේ පවතින වෙබ් අඩවියක් තුළින් බා ගත කරන ලදැයි මෙම ස්වාමීන් වහන්සේ විසින් සඳහන් කරන්නට යෙදෙන Muslim world league and world assembly of muslim youth යන මාතෘකාව යටතේ 2010 සැප්තැම්බර් 15 වෙනි දින සකසා ඇති ලිපියක් අඩංගු ලේඛනයක් පිටු තුනකින් සමන්විත එම ලේඛනය මෙම සභාවට C 654 වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා. එහි එම ලේඛනයේ අවසාන පිටුවේ අවසානයටම පෙනෙන ආකාරයට ගරු සභාවේ අවධානය යොමු කර සිටිනවා Make a Financial Contribution to support our work යනුවෙන් සඳහන් කරමින් කොටුවක් තිබෙනවා Donate කිරීම සඳහා මේ අන්තර්ජාලයේ තියෙන හැටියට මේ ලේඛනයේ පේන හැටියට එවැනි දෙයක් දක්නට තිබෙන බවට ගරු සභාවේ අවධානය යොමු කර සිටිනවා.

පි : ඒක සමහර වේලාවට ඒ Research Center ඒකේ Donation එකක් වෙන්නත් පුළුවන්. මේ Research කරන ආයතනයට Donation එකක් පිණිස දාපු එකක් වෙන්නත් පුළුවන්. ඊට උඩින් IIRO ගැනත් සඳහන් වෙනවා.

ප්‍ර : හාමුදුරුවනේ බලන්න මේ ලේඛනය ඔබ වහන්සේ ලබා දුන්නු ලේඛනයක්ද කියලා? Muslim Networks and Movements in western Europe.

පි : ඔව්.

ප්‍ර : ඒ ලේඛනය සඟරාවක තිබෙන ලේඛනයක් හැටියට ද අන්තර්ජාලයෙන්ද බා ගත කිරීමක්ද කරනු ලැබුවේ?

පි : මේකත් අපි අන්තර්ජාලයෙන් බා ගත කර ගත්තේ.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී The PEW Forum on religion and public life නැමැති අන්තර්ජාලයේ පවතින සඟරාවක් හැටියට PEW Research Center වෙබ් අඩවිය යටතේ පවතින අන්තර්ජාලයෙන් බා ගත කරන ලදැයි ගරු ස්වාමීන් වහන්සේ සඳහන් කරන පිටු 62 කින් යුක්ත සඟරාවක් එම සඟරාවේ පිටපතක් ලබා දී තිබෙනවා. එම සඟරාවේ සම්පූර්ණ වශයෙන්ම තිබෙන්නේ ගරු සභාපතිතුමනි Muslim Networks and movements in western Europe

FAIR COMMENT BY JEZEEM

වශයෙන් සඳහන් කරලා තිබෙන්නේ. එම සම්පූර්ණ ලේඛනය මෙම සභාවට C 655 වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා.

පි : ගරු මැතිතුමනි යමක් සඳහන් කළ යුතුයි අපේ නිරීක්ෂණයන්ට අනුව ඇත්ත වශයෙන් මේ වහබ් වාදය ඇතුළු කොට අපේ රටේ විතරක් නෙවෙයි අපිට ආසියාවේ, යුරෝපයේ අනිත් අරබිදීපල හැම තැනකම වගේ අපි යෝජනා කරනවා මේ සයිබර් අවකාශය අන්තර්ජාලය තමයි ඇත්තටම මේ ත්‍රස්තවාදීන්ගේ ඒ වැඩ පිළිවෙලවල් ගොඩ නැගීමට ඉතාම පහසු මාධ්‍යය හැටියට සන්නිවේදන මාධ්‍යය හැටියට යොදා ගෙන තියෙන්නේ. ඉතින් අපේ රටේ එවැනි Research එකක් නැත්නම් එවැනි Research කරන ආයතනයක් හෝ වැඩපිළිවෙලක් යොදා නොගත්තොත් අපි විශාල අමාරුවක වැටෙනවා. දැන් ඔය ඇමරිකානු 2014/01/05 වෙනිදා අද පත්තරේ අන්තර්ජාල සේවා අවභාවිතයෙන් ඒවා ත්‍රස්තවාදීන්ගේ තෝතැන්නක් බවට පත් වෙලා. ඇමරිකානු තාක්ෂණ සමාගම් වෙත බ්‍රිතාන්‍යයෙන් චෝදනාවක් කියලා ලේඛනයක් අපිට හම්බ වුණා. ඉතින් මේවාත් එක්ක අපිත් හොයලා බැලුවා කොහොමද කොහොමද මේවා වෙන්නේ කියලා. මම මේ කීමට කැමතියි මේ වෙන කොට මේ සයිබර් අවකාශයේ මේ ත්‍රස්තවාදය ඉතාම දරුණු විදිහට ගොඩ නැගෙනවා. අලුත්ම සටන් බිම තමයි සයිබර් අවකාශය. එතකොට ඒගොල්ලෝ හොයා ගත්ත කරුණු වලින් දැන් සහරාන් පාවිච්චි කරපු ඇප් එක තමයි ත්‍රීමා කියන ඇප් එක. ඔවුන්ගේ ඒ කණ්ඩායම් ජාල ගත කරන්න. මොකක් හරි දැන් ඒකට උදාහරණයක් අපිට පෙන්වන්නත් පුළුවන් පසුව. ත්‍රීමා කියන ඇප් එකත් ඒ වගේම සිග්නල් කියන ඇප් එකත් බොටිම් කියන ඇප් එකත් මේවා ත්‍රස්තවාදීන් පමණක් නොවෙයි පාතාල ක්‍රියාකාරකම්වලටත් මේවා යොදා ගන්නවා. මේවාට රහසිගතව ඇතුල් වෙලා එකට ගොනු වෙලා ත්‍රස්ත ජාල හදනවා. ඇමරිකා එක්සත් ජනපදයේ රීටා කාන්ස් කියලා කාන්තාවක් අලුත් සයිට් එකක් හදලා තියෙනවා site International කියලා. ඒගොල්ලෝ ඕනම එකක් ඉතා ඉක්මනින් හොයා ගන්නවා. ඉතින් අපේ රටෙත් ඒ තාක්ෂණය දියුණු වුනොත් අපිට පුළුවන් වෙයි අනාගතයේ මේ සයිබර් අවකාශය හරහා ගොඩ නැගෙන ත්‍රස්තවාදය පරාජය කරන්න. දැන් උදාහරණයක් විදිහට ගත්තොත් ලංකාවේ Virtusa ආයතනයේ Virtusa පරිගණක ආයතනයේ වැඩ කරපු ආදීල් අමීස් දැන් මේ සහරාන්ගේ මේ ප්‍රහාරයත් එක්ක දැන් ඔහු අත්අඩංගුවේ. එතකොට Virtusa වගේ ආයතනයක වැඩ

FAIR COMMENT BY JEZEEM

කරන්නේ බොහොම දැනුම තියෙන කෙනෙක්. ඉතින් ආදීල් අමීස් 2017/2018 වර්ෂවල ISIS මතවාදය කලින් මතවාදය ඉතාම දරුණුවට ගෙනිච්චා මේ face book මාධ්‍යය තුළ. ඔහු 2017 ඔහුගේ FB පිටුවේ පල කරනවා කොළඹ කේන්ද්‍ර කර ගෙන ඉස්ලාමීය කළු කොඩිය ඔසවනවා කියලා ISIS ලාගේ කළු කොඩිය ඔසවනවා කියල. ඉතින් ඒ කාලේ අපේ ආරක්ෂක අංශය ඒවා ගණන් ගත්තේ නෑ. ආදිල් අමීස්. එතකොට ඒකට අපි දැක්කා 145 දෙනෙක් like කරලා තිබුණා. එතකොට ඒ 145 දෙනා දැන් කොහේද ඉන්නේ. ඒ ගොල්ලෝ like කළා කියන්නේ මේ මතවාදයට කැමති කියන එකනේ කොළඹ කළු කොඩි ඔසවන්න. ඉතින් මම ඒ විතරක් නෙවෙයි ඔවුන් කියලා තිබුණා අපි ඉක්මනින් කොළඹ කළු කොඩි ඔසවලා මුස්ලිම් කලීපාතය පිහිටුවනවා කියලා. ඉතින් ඒ නිසා ඒ සයිබර් අවකාශයෙන් සිද්ධ වෙන මේ හානිය ගැන ඉතාම ගැඹුරු ලෙස අපි බැලිය යුතුයි. සහරාන් පහළ මධ්‍යම පන්තියට ආමන්ත්‍රණය කළා වගේම දැන උගත් දරුවන් හැටියට අර දැන උගත් IT හසුරුවන සමාජයට ආදීල්ලා වගේ අය කතා කළා.

ප්‍ර : ඔබ වහන්සේ සාක්ෂි ලබා දෙමින් මේ දක්වා ලේඛන කිහිපයක්ම සලකුණු කරනු ලැබුවා මේ අන්තවාදය ලොව පුරා ව්‍යාප්ත වන ආකාරය තහවුරු කිරීමට අදාළ වන ලේඛන වශයෙන් ඔබ වහන්සේ පරිශීලනය කරපු ලේඛන වශයෙන් ලේඛන කිහිපයක් මේ ගරු සභාවට ඉදිරිපත් කළා. ඒ ලේඛන ඔබ වහන්සේ මෙම විමර්ශන අංශයට භාර දුන් ලේඛන වශයෙනුයි සලකුණු කිරීම කළේ. බලන්න හාමුදුරුවනේ මේ ලේඛනය ඔබ වහන්සේ භාරදුන් ලේඛනයක්ද කියලා?

පි : ඔව්.

ප්‍ර : මෙය මොන ආකාරයට ලබා ගන්නා ලද්දක්ද හාමුදුරුවනේ අන්තර්ජාලයෙන් බා ගත කරන ලද ලේඛනයක්ද?

පි : මේක ඇත්ත වශයෙන්ම අපි අර ඉස්ලාමය පිළිබඳ හුඟාක්ම කරුණු නොදන්න නිසා අපට හිතවත් දැන උගත් මුස්ලිම් උගත් මහතෙකු මා විහාරස්ථානයට කැඳවා ගෙන අපි එකතු කර ගත්තු තොරතුරු ඔහු හා සාකච්ඡා කරලා අපේ අවබෝධය සඳහා එකතු කර ගත්තු තොරතුරු. ඇත්ත වශයෙන්ම ඔහුගෙන් තමයි මේ තොරතුරු ලබා ගත්තේ.

ප්‍ර : නමුත් මේ ලේඛන දිහා බැලු බැල්මට පෙන්නේ හාමුදුරුවනේ මෙය සඟරාවකින් ගත්ත ලේඛනයක් හැටියටද අන්තර්ජාලයෙන් ගත්ත ලේඛනයක් හැටියටද?

FAIR COMMENT BY JEZEEM

පි : මම හිතන්නේ අන්තර්ජාලයෙන් ඒ ගොල්ලො හොයා ගත්තු තොරතුරු මට ඒ මේ ඇත්තටම මේ ෆයිල් එකම හදලා ගෙනත් දුන්නේ අපේ මුස්ලිම් සහෝදරයෙක්.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී http://ijtihadnet.com පිටුව 296 A review on destroying the graves by wahabism යන මාතෘකාව යටතේ Wahabies breaking graves වශයෙන් ද සඳහන් කරමින් පවතින පිටු හයකින් යුත් ලේඛනයක් ගරු සභාපතිතුමනි එය මෙම සභාවට C 656 වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා.

ප්‍ර : හාමුදුරුවනේ බලන්න මේ ලේඛනය ඔබ වහන්සේ මේ විමර්ශන අංශයට ලබා දුන් ලේඛනයක්ද කියලා?

පි : ඔව්.

ප්‍ර : එම ලේඛනය අන්තර්ජාලයෙන් බා ගත කරන ලද ලේඛනයක් හැටියටද ඔබ වහන්සේට ඉදිරිපත් වන්නේ?

පි : ඔව්.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී https://www.iseasédu.sg/images/pdf/iscas යන වෙබ් අඩවියෙහි මුල් අවස්ථාවේදී පළ වුණා වශයෙන් කරුණු ඇතුළත් වන ISIS in South East Asia Internationalized Wahabism is a major factor යන මාතෘකාවෙන් 2016 මැයි 18 දිනැතිව අහමඩ් ෆවුසි අබ්දුල් හමීඩ් යන පුද්ගලයා විසින් රචිත ලිපියක් සහිත මෙම ලේඛනය මෙම සභාවට C 657 වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා.

ප්‍ර : හාමුදුරුවනේ බලන්න මේ ලේඛනය ඔබ වහන්සේ ඉදිරිපත් කරන ලද ලේඛනයක්ද කියලා මා දැන් පෙන්වා සිටින ලේඛනය?

පි : Terrorism වලට නේද. ඔව්.

ප්‍ර : එම ලේඛනය ඔබ වහන්සේ ලබා ගත්තේ මොන ක්‍රමයකටද හාමුදුරුවනේ?

පි : ඒත් අන්තර්ජාලයෙන්මයි.

ප්‍ර : අන්තර්ජාලයෙන් බා ගත කිරීමක් හැටියට?

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදීත් https://jamestown.org යන අන්තර්ජාල වෙබ් අඩවියෙන් The James Town Foundation Global Research and Analysis යන ආයතනය වශයෙන් හඳුන්වා ගනිමින් එහි තිබෙන ලේඛනයක් පිටු 4 කින් සමන්විත එම ලේඛනයේ මාතෘකාව වශයෙන් Terrorism Monitor වශයෙන් සඳහන් කර තිබෙනවා. එහි දිනය වශයෙන් 2005 මැයි 06 වෙනි දින සඳහන් කර තිබෙන බවත් සටහන් කරමින්

FAIR COMMENT BY JEZEEM

එම ලේඛනය මෙම සභාවට C 658 වශයෙන් සලකුණු කිරීමට ගෞරවයෙන් අවසර අයැද සිටිනවා.

ප්‍ර : හාමුදුරුවනේ බලන්න මේ ලේඛනය ඔබ වහන්සේ ලබා දුන් ලේඛනයනක්ද කියලා ?

පි : ඔව්.

ප්‍ර : මේ ලේඛනය ඔබ වහන්සේ ලබා ගන්නෙත් අන්තර්ජාලය හරහාද?

පි : ඔව්.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී National Review online නැමැති අන්තර්ජාල වෙබ් අඩවිය හරහා පල වී තිබෙන 2003 ජූනි 29 දිනැති ලේඛනයක් එය සකස් කොට තිබෙන්නේ Steven Schwartz නැමැති පුද්ගලයෙක් බවට නම සඳහන් වෙනවා. මාතෘකාව Wahhabism and Islam in the US වශයෙන් සඳහන් වෙනවා. එම ලේඛනය මෙම සභාවට C 659 වශයෙන් සලකුණු කිරීම සඳහා ගෞරවයෙන් අවසර අයැද සිටිනවා.

ප්‍ර : හාමුදුරුවනේ සෙනසුරාදා දිනයේ පෙර දිනයේ ඔබ වහන්සේ සාක්ෂි ලබා දෙන අවස්ථාවේදී සාහි අල් බුහාරී විසින් රචිත හදීස් ඇතුළත් පොතක් සම්බන්ධයෙන් ඔබ වහන්සේ සාක්ෂි ලබා දුන්නා. ඔබ වහන්සේ පරිශීලනය කළා ඔබ වහන්සේ සතුව තිබෙන එම පොතෙහි පිටපතක් හදීස් පැහැදිලි කිරීම සඳහා එහෙම නේ හාමුදුරුවනේ?

පි : ඔව්.

ප්‍ර : දැන් අද දිනයේදී ඔබ වහන්සේ ඉදිරිපත් කරනවාද එම හදීස් ඇතුළත් ග්‍රන්ථය මේ සභාවට?

පි : එහෙමයි.

ප්‍ර : එය වෙළුම් කීයක් ලෙසට තිබෙන ග්‍රන්ථයක් හැටියට ද ඔබ වහන්සේ ඉදිරිපත් කරන්නේ?

පි : අරාබි භාෂාවෙන් වෙළුම් 9 ක් තියෙනවා.

ප්‍ර : එහෙමයි හාමුදුරුවනේ.

පි : දැනට අපිට කියවගන්න පුළුවන් හැටියට තියෙන්නේ වෙළුම් 4 යි. සිංහලයට පරිවර්තනය වෙලා.

ප්‍ර : එහෙමයි හාමුදුරුවනේ.

පි : ඒ වෙළුම් 4 තමයි ඔය ඉදිරිපත් කරලා තියෙන්නේ.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී වෙළුම් 4 කින් යුක්ත වන ලෙසට සිංහල භාෂා පරිවර්තනයක් ඇතුළත්ව තිබෙන සහියා අල් බුහාරි ඇරබික් සිංහල වශයෙන් නම් සඳහන් කරමින් තිබෙන ස්වාමීන් වහනසේ හදීස් ඇතුළත්ව

FAIR COMMENT BY JEZEEM

පවතින වෙළුම් 4 ක් ලෙසට සඳහන් කරමින් ඉදිරිපත් කර තිබෙන මෙම පොත් කට්ටලය C 660 වශයෙන් මෙම හදීසයන් ඇතුළත් ග්‍රන්ථ 660 වශයෙන් ලකුණු කර එහි පළවෙනි වෙළුම C 660 (A) වශයෙන්ද, වෙළුම දෙක C 660 (B) වශයෙන්ද, වෙළුම තුන C 660 (C) වශයෙන්ද, වෙළුම හතර C 660 (D) වශයෙන්ද සලකුණු කොට ඉදිරිපත් කිරීම සඳහා ගෞරවයෙන් අවසර අයැද සිටිනවා.

ප : ඔබ වහන්සේ පෙර දිනයේදී විශේෂයෙන් අවධානය යොමු කරනු ලැබුවා හදීසයේ එක්තරා පිටුවකට ඔබ වහන්සේ මේ හදීස් වලින් කියවෙන අන්තවාදීභාවය මේ පොතෙහි ඇතුලත් වන ආකාරයට තිබෙන අන්තවාදීභාවය ඉදිරිපත් කිරීම සඳහා. එම පිටුව ගෞරවයෙන් භාමුදුරුවනේ මේ සභාවට නැවත මතක් කරන්න.

පි : පටුනේ රෝම ඉලක්කමෙන් 20. පටුන පමණක් තමයි මේ අපි කියව ගෙන ගියේ. පටුනේ රෝම ඉලක්කමෙන් 20. පිටුව අපි කියෙව්වා. 01/11 ජීහාත් කියන එකේ ඉඳලා.

ප : පළවෙනි වෙළුමේද භාමුදුරුවනේ?

පි : ඒ කියන්නේ හතර වෙනි වෙළුමේ. සහීර් අල් බුහාරී volumn 4. 4 වෙනි වෙළුම.

ප : 4 වෙනි වෙළුමේ. පටුනේ 10 වෙනි පිටුව? ජීහාදය සම්බන්ධයෙන් පැහැදිලි කිරීමේදී ඔබ වහන්සේ මේ පැහැදිලි කිරීම ගත්තේ නේද භාමුදුරුවනේ?

පි : ඔව්.

ගරු සභාපතිතුමනි ඒ අනුව **C 660 (D) වශයෙන් සලකුණු කරන ලද වෙළුම හතරෙහි පටුන සඳහන් කර තිබෙන්නේ එහි රෝම ඉලක්කම්වලින්. 20 වෙනි පිටුව XX වශයෙන් සඳහන් කර තිබෙන පිටුවෙහි ඇතුළත් ජීහාද් යන්න පැහැදිලි කිරීම කර තිබෙන කොටස C 660 (D) 1 වශයෙන් සලකුණු කිරීම සඳහා ගෞරවයෙන් අවසර අයැද සිටිනවා.**

පි : මොකද මේ මැතිතුමනි අපි වැඩිමනත් ලෙස මේ හදීස් ගැන අවධානය යොමු කරන්නේ ඇත්තටම මේ කුර්ආනයේ ඉගැන්වීම්වලටත් වඩා මේ වහබ්වාදී කණ්ඩායම් වැඩිමනත් ලෙස මේ හදීස් ඉගැන්වීම් ගැන අවධානය යොමු කරලා තියෙන නිසා. මේ අන්තවාදී උන්මත්තකයින් බිහි වෙන්නේ මේ හදීස් ඉගෙන ගැනීමෙන්. එතකොට අපේ රටේ දැන් මේ 11 වන ශ්‍රේණියේ රජයෙන් පල කරලා තියෙන ඉස්ලාම් 11 වෙනි ශ්‍රේණියේ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ පොතේ 75 වෙනි පිටුව. 75 වෙනි පිටුවේ මට මේ හදීස් ගැන කියන්න මත්තෙන් ඒකේ වැදගත්කමයි කියන්න වුවමනාව තියෙන්නේ ඒකේ තියෙනවා

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මොහද්දීසීන් හය දෙනා සහ හදීස් වියතුන් පිළිබඳ විස්තර කියලා. ඉමාම් බුහාරී නැමැති පුද්ගලයා සහී හුල් බුහාරී කියන පොත ලියනවා. ඊළඟට ඉමාම් මුස්ලිම් කියන කෙනා සහීහ් මුස්ලිම් කියන ග්‍රන්ථය ලියනවා මේ හදීසයන්. ඉතින් මේක හරිම වැදගත් වෙනවා මේ අවධානයට ගැනීම. මොකද මේ හදීස් නිසා තමයි වැඩි වශයෙන් මේ මරාගෙන මැරෙන කල්ලි හැදෙන්නේ.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී ස්වාමීන් වහන්සේ දැනටමත් C 621 වශයෙන් සලකුණු කර ඇති පොතෙහි 75 වෙනි පිටුවට අවධානය යොමු කරන ලද බවට ගරු සභාවේ අවධානය යොමු කර සිටිනවා. ඒ අනුව එම පිටුවේ හදීසය සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් කරුණු ඇතුළත් වන බැවින් එම පිටුව C 621 (C) වශයෙන් සලකුණු කිරීම සඳහා ගෞරවයෙන් අවසර අයැද සිටිනවා.

පි : ඊළඟට මැනිතියනි මේකේ 79 වෙනි පිටුවත් වැදගත් මොකද ලොකු පොතක් නිසා. ඒකේ 79 පිටුවේ අන්තිම පරිච්ඡේදයේ කියනවා කොටස් 97 කින් සමන්විත මෙම ග්‍රන්ථයේ පරිච්ඡේද 1000 ටත් වැඩිය ඇත. හදීස් ග්‍රන්ථ වලින් මුල් තැන ගන්නා මෙම ග්‍රන්ථය කුර්ආනයට දෙවන ස්ථානය තබා සලකනු ලැබේ. මුස්ලිම් ලෝකයේ විශ්වාසයට පාත්‍ර මෙම හදීස් ග්‍රන්ථයට විචාර ග්‍රන්ථ 50 කට වඩා ලියවී ඇත. ෆත්හුල් බුහාරී ඒවායින් එකකි. සහිහුල් බුහාරී ග්‍රන්ථය ලොව පුරා සියයකටත් වඩා වැඩි භාෂාවලට පරිවර්තනය කර ඇත. ඒ කියන්නේ මේ හදීස්. ඉතින් හදීස්වලට අවධානය යොමු කරනවා.

ප්‍ර : ඔබ වහන්සේ මේ අවස්ථාවේ ඉදිරිපත් කරපු බුහාරී ලේඛනය ගැනද ඔය පොතෙහි සඳහන්ව තිබෙන්නේ?

පි : ඔව්. මම කියන්නේ එතකොට අපේ පෙළපොත්වලින් අපේ රටේ ඉස්ලාම් දරුවන්ට කෙළින්ම direct කරනවා මේ හදීස් බලන්න. හදීස් follow කරන්න. ඒ හදීස් follow කරන අය තමයි ශබ්ද නොකරම මේ අන්තවාදයට ගොදුරු වෙන්නේ.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී ස්වාමීන් වහන්සේ විසින් C 621 පෙළ පොතෙහි 79 පිටුවෙහි විශේෂයෙන්ම C 660 වශයෙන් වෙළුම් හතරකින් 660 (A), (B), (C) ,(D) වශයෙන් අද දින සලකුණු කරන්නට යෙදුණු හදීස් පොත් කෙරෙහි අවධානය කෙළින්ම යොමු කර තිබෙනවාය යන කාරණාව සඳහන් කර තිබෙන බවට සාක්ෂියක් ලබා දෙනවා. ඒ සම්බන්ධයෙන් ගරු සභාවේ අවධානය යොමු කරමින් එකී C 621 ලේඛනයේ 79 වෙනි පිටුවේ එම යොමු කිරීම ඇතුළත් කොටස සහිත එම ස්ථානය C 621 (D) වශයෙන් සලකුණු කිරීම සඳහා ගෞරවයෙන් අවසර අයැද සිටිනවා.

FAIR COMMENT BY JEZEEM

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : ස්වාමීන් වහන්ස ඔබ වහන්සේ මෙතෙක් කොමිෂන් සභාවට ලබා දුන් සාක්ෂි සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ යම් කිසි පැහැදිලි කර ගැනීම් අවශ්‍යයි.

පි : හොඳමයි.

ප්‍ර : අපි ඒ සම්බන්ධයෙන් ඔබ වහන්සේගෙන් විමසීමෙන් පසු ඔබ වහන්සේගේ සාක්ෂිය වෙනත් කොටසකට අපි අවතීර්ණ වෙනවා.

පි : හොඳමයි.

ප්‍ර : ඔබ වහන්සේ කොමිෂන් සභාවට දැන්වුවා මේ ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය 2013 සිට 2015 යන අවුරුදු දෙකක කාල සීමාවක් තුළ යම් කිසි දැනුවත් කිරීමක් කෙරුවා කියලා?

පි : ඔව්.

ප්‍ර : එම අවස්ථාවේදි ඔබ වහන්සේ ඒ ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන් කටයුතු කරන සංවිධාන පිළිබඳ දැනුමක් තිබ්බද එම සංවිධාන පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශයට දැන්වුවාද?

පි : අපිට මුලින්ම අහන්න ලැබුණු වචනය තමයි මේ වහබි, වහාබිකාරයෝ ඔය වගේ වචන ඇහුණා. ඊට පස්සේ සාමාන්‍ය සාම්ප්‍රදායික මුස්ලිම් සමාජයේ ඔය සිංහල මුස්ලිම් කොහේහරි ගැටුමක් ඇති වෙන තැනක අනේ හාමුදුරුවනේ ඕක මේ අපි සම්බන්ධ නෑ. ඕක මේ තව්කාරයෝනේ සම්බන්ධ . ඔබ වචන දෙක තමයි අපිට මුල් අවදියේ ඇහුණේ. වහබ් වාදය ගැන ඇහුණ තව්කාරයෝ කියන වචනය විතරයි ඇහුණේ. ඉතින් අපි ඒ අනුව යම්කිසි අධ්‍යයනයක් කළා ඔය 2010 ට කලින් මොකක්ද මේ ඔය වහබිසම් කියන්නේ මොකක්ද මේ කාටද මේ තව්කාරයෝ කියන්නේ. ඔය ගැන යම් කිසි අධ්‍යයනයක ඉන්න අවස්ථාවේ තමයි අපේ සංවිධානය පිහිටුවායින් පස්සේ අර සාම්ප්‍රදායික මුස්ලිම් තරුණයෝ ඇවිල්ලා අපට වැඩිමනත් ලෙස මේ කරුණු අධ්‍යයනය කිරීම සඳහා මහ පෙන්නුවේ. ඒ අනුව අපි එහෙන් මෙහෙන් ඒ කියන්නේ එතකොට පුපුරා යෑමක් මොකුත් තිබ්බේ නෑ. කාගේවත් දැඩි අවධානයක් යොමු වුනෙත් නෑ. නමුත් අපි හොයා ගත්තු තොරතුරු ඒ අදාළ අවස්ථාවන්හීදි ඇත්ත වශයෙන්ම ඒ මැතිතුමා ඇසු පරිදි ඒ දැනුවත් කිරීම් කළා අපිට පුළුවන් පමණින්. ඒ අය අවාසනාවකට වගේ මැතිතුමනි මේ රට බෞද්ධ රටක්. 365 දවසේ බණ අහනවා. බුද්ධාගමලු එක. පපුවට අත තියා ගන්නවා. හැබැයි බුද්ධාගම මොකක්ද කියලා

FAIR COMMENT BY JEZEEM

දන්නේ නැතුව. බෞද්ධ දර්ශනයේ කියන්නේම හේතුඵල වාදය. හේතුවක් නැතුව ඵලයක් උපදින්නේ නෑ කියන දර්ශනය. එතකොට ඒ මැද මාවත තේරුම් නොගෙන අපේ අය මේ හැම එකක් ගැනම සොයා බැලුවේ හරියට පාරේ accident එකක් වෙනවා වගේ. හැමදාම accident වෙනවා. පොලිසිය යනවා. අපරාධ සිදු වූ ස්ථානය කියලා ලකුණු කරනවා. වාර්තා කරනවා. ඒක තව accident එකක් විතරයි. ඔන්න ඔය වගේ ආකාරයක් තමයි අපි දැක්කේ මේ සිද්ධීන් ගැන අවධානය යොමු කරනවා අපේ පාලකයෝ. ඉතින් මුල් අවස්ථාවල්වලදී අපි ඇත්ත වශයෙන්ම වැඩි අධ්‍යයනයකින් පස්සේ අර අපට තොරතුරු කියපු තරුණයන් පවා අදාළ ආරක්ෂක අංශවල ප්‍රධානීන් මුණ ගැස්සුවා. ඒ ගොල්ලොන්ගෙන් වැඩි තොරතුරු ලබා ගන්න.

ප : ඔබ වහන්සේගේ පැහැදිලි කිරීමෙන් මට හැඟුනේ ඒ 2013 සිට 2015 කාල සීමාව තුළ ඔබ වහන්සේ විසින් යම් කිසි නිශ්චිත සංවිධානයක් මේ ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන් ඒ වන විට නිරීක්ෂණය කිරීමක් කරන්න බැරි වුණා කියන එක?

පි : නෑ අපි මෙතන කළා.

ප : නෑ ඒක තමා. මගේ ප්‍රශ්නේ ඒකයි ගරු ස්වාමීන් වහන්ස. ඒ ආරක්ෂක අමාත්‍යාංශය සමඟ තිබ්බ රැස්වීම් වල ඔබ වහන්සේගේ නිරීක්ෂණ අනුව ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන් සක්‍රීයව දායකත්වයක් තියෙන සංවිධාන ආරක්ෂක අමාත්‍යාංශයට දැන්වුවාද කියලා?

පි : දැන්වුවා.

ප : මොකක්ද ඔබ වහන්සේ ඒ අවස්ථාව වන විට මම දැනටම ඔබ වහන්සේගේ මතකය ගෙනියන්නේ 2013 සිට 2015 දක්වා කාලය තුළට. එම කාල සීමාවලදී ඔබ ආරක්ෂක අමාත්‍යාංශයට දැන්වූ ඉස්ලාම් අන්තවාදී කණ්ඩායම් මොකක්ද?

පි : ඔව් ඒක මට ඒ අපි සකස් කරපු ලේඛනයම මට දෙන්න පුළුවන් මැතිතුමනි. ඒ කාලේ මැතිතුමනි ශ්‍රී ලංකා තවුහිද් ජමාත් සංවිධානය ගැන දැනුවත් කළා. සමස්ත ලංකා තවුහිද් ජමාත් සංවිධානය ගැන සඳහන් කළා. සුන්නත් අන්සාර් සංවිධානය ගැන මොවුන් සංවිධානය කළා කල්මුණේ ශාඛාව සහ පරගහදෙණියේ. ඒ වගේම ජමාතේ ඉස්ලාමීය සංවිධානය ගැන අපි දැනුවත් කළා මූලස්ථානය දෙමටගොඩ ශාඛා අකුරණ, මාවනැල්ල, කින්නියා. සලාෆි සංවිධානය ගැන දැනුවත් කළා මූලස්ථානය කළුබෝවිල රෝහල පාර ශාඛාව මීගමුව. ඉස්ලාමීය ෂරියා පාසල් ගැන දැනුවත් කළා Lead the way Girl's International School 100% ක් ෂරියා ස්කෝලයක්. ඒක තියෙන්නේ දෙහිවල.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : නැවත ඒ නම සඳහන් කරන්න ගරු ස්වාමීන් වහන්ස?

පි : Lead the way Girl's International School ඉරියා ඉස්කෝලයක්. අංක 66, හැලන් ඇවනිවු, දෙහිවල, ඇලන් ඇවනිවු දෙහිවල and අංක 11, ඩී.එස්.ජයසිංහ මාවත, දෙහිවල. ඉස්කෝල දෙකක්. ඊළඟට සාකීර් නායක් ගැන දැනුවත් කළා. බිලාල් පිලිප්ස් ගැන දැනුවත් කළා. මැලේසියාවේ සවුදිවාදි නායකයෙක් වෙච්චි මොනාවුර් හට්ටාර් ගැන දැනුවත් කළා. අබ්දුල් රහීම් අලී ගැන දැනුවත් කළා. ඔය WAMY එක ගැන අර මුලින් කියපු. ඔය සියළුම සංවිධාන ගැන දැනුවත් කළා. ලංකාවට ආපු විදේශීය දේශකයන් ගැන අපි දැනුවත් කළා. ඒවාට පැමිණිලි කළා. ඒ අනුව ඒ විදේශයෙන් ඇවිල්ලා සංචාරක වීසා යටතේ ඇවිල්ලා මෙහේ දේශන පවත්වපු දෙසිය ගණනක් රටින් පිටුවහල් කරන්න නියෝගත් කළා. ඔවුන් පිටුවහල් කළා. ඉතින් ඒ වගේ අපි කියපු අපි හොයා ගත්තු තොරතුරු ඔක්කොම දැනුවත් කළාට පස්සේ ඇත්ත වශයෙන්ම ඒ කාල සීමාවේ අපට සතුටු විය හැකි මට්ටමකට යම් යම් ක්‍රියාකාරකම් ඒගොල්ලො යම් යම් ක්‍රියාමාර්ග ගත්තා.

ප්‍ර : ඔබ වහන්සේ මගේ ඊළඟට ප්‍රශ්නෙන් කොටසකට පිළිතුරක් ලබා දුන්නා. නමුත් තව තියෙනවා නම් ඒක කියන්න පුළුවන්. ඊළඟ ප්‍රශ්නේ කොටස වෙන්න ගියේ එම කාල සීමාවලදී ඒ කියන්නේ 2013 ඉඳලා 2015 කාල සීමාව තුළදී ලංකාවේ ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන් සක්‍රීයව දායකත්වයක් දක්වන පුද්ගලයින් සම්බන්ධයෙන් ඒ ආරක්ෂක අමාත්‍යාංශය දැනුවත් කළාද? එහෙම නම් ඒ පුද්ගලයින් කවුද?

පි : ඔව්. විශේෂයෙන්ම අපි ඒ වෙන කොට හඳුනා ගෙන හිටියේ ඒ කියන්නේ ඒ දවස්වල ඔය 2013 වගේ කාලයේදී සහරාන් හෂීම් ගැන අපි අහලා තිබුණේ නෑ. අපි අහලා තිබුණේ මොකද ඔය පස්සේනේ මොහොමඩ් සහරාන් හෂීන් කියලා සම්පූර්ණ නම හොයා ගත්තේ. එක්කෝ සහරාන් හෂීම් එහෙම නැත්නම් මොහොමඩ් හෂීම් නැත්නම් මොහොමඩ් සහරාන් ඔය නම් වලින් තමයි ඉන්නේ. ඒ කාලේදී අපි වඩාම අවධාරණය කෙරෙව්වා තමිල්නාඩුවේ TNTJ සංවිධානය ගැන. ඒ TNTJ සංවිධානය ගැන අපිට වඩා හොඳින් මතක හිටිනවා එක්තරා අවස්ථාවක දඹදිව වන්දනාවේ ගිය කණ්ඩායමක් නියෝජනය කරපු අපේ හාමුදුරුවෝ කෙනෙකුට මදුරාසියට ආසන්න Station එකකදී පහර දීමක් කළා. ඒ අදාළ තොරතුරු මමයි විජේදාස රාජපක්ෂ මහත්මයාට ලබා දුන්නේ. එතකොට ඒ පහර දීම කෙරුවේ

FAIR COMMENT BY JEZEEM

තමිල්නාඩු තවුහිද් ජමාත් සංවිධානයට අයිති පිරිස. මොකද ඒ වෙන කොට තමිල්නාඩු සවුදිවාදි නායකයෝ ලංකාවට ඇවිල්ලා රිසි සේ මෙහේ දේශන පවත්වමින් ඒ කටයුතු කර ගෙන හිටියා. මොකද ලංකාවේ ආණ්ඩුව වඩාත් අවධානය යොමු කරලා තිබුණේ LTTE එක පරාජය කිරීමත් ඒ ප්‍රශ්නාත් යුධ සමය ඇතුලේ මේ සංවර්ධන කටයුතු Highway අරවා මේවා කතාන්දරවල තමයි හිටියේ.

ප්‍ර : අවසරයි හාමුදුරුවනේ පොඩි බාධා කිරීමක් ඒ තමිල්නාඩු තවුහිද් සංවිධානයේ නායකයාගේ නම කියන්න පුළුවන්ද?

පි : පුළුවන් තමිල්නාඩු තවුහිද් ජමාත් නායකයාගේ නම

ප්‍ර : කොමිෂම ඉදිරියේ දැනටමත් යම් සාක්ෂියක් තියෙනවා.

පි : එහෙමයි මේ සටහනේ තියෙනවා මැතිතුමනි. කො.වේ.අයි ද නම මතකයට එන්නේ නෑ.

ප්‍ර : ජේනුල් ආබ්දීන් කියන එක්කෙනා.

පි : ජේනුල් ආබ්දීන්.

ප්‍ර : හරිනේ?

පි : දකුණු ඉන්දීය වහබ්වාදී නායකයා.

ප්‍ර : හරිනේද?

පි : හරි. ජේනුල් ආබ්දීන්.

ප්‍ර : එතකොට ඊට අමතරව ලංකාවේ පුද්ගලයින් සම්බන්ධයෙන්?

පි : ඊට පස්සේ මැතිතුමනි අපි හොඳටම දැන ගෙන හිටියා කිසිම ප්‍රශ්නයක් නැතුව මොකද LTTE එක හොඳටම ඉවර වෙලා තියෙද්දී හාමුදුරුවොන්ට එහෙම ගහන්න ඕනේ නෑ ඕන තරම් දඹදිව වන්දනාවේ යනවා දහස් ගණන්. එතකොට තමයි අපි හොයා ගත්තේ මෙතන මාලිගාවත්තේ, බණ්ඩාරවෙල, මාවනැල්ලේ ඇතැම් තැන් වල SLTJ ක්‍රියාකාරකම් බොහොම උද්වේගයෙන් සංවිධානය වෙනවා. අන්න එතනදී අපි හඳුන ගත්ත මේ අබ්දුල් රාසික් කියන පුද්ගලයා. එතකොට අපි පළවෙනියටම පැමිණිලි කළේ අර අපිට 2014 අවුරුද්දේ ආරක්ෂක අමාත්‍යාංශයට කැදෙව්වහාම අපේ යෝජනාවේ පළවෙනි ඉල්ලීමත් මේ තවුහිද් ජමාත් ඇතුළු තවුහිද් කණ්ඩායම් තහනම් කරන්න කියන එක. ඉතින් ඒ අබ්දුල් රාසික් ගැන අපි දැනුවත් කළා. ඊළඟට ඔය මුස්ලිම් කවුන්සිලය ගැන අපි කිව්වා. ඊළඟට උලමා සභාවේ කරුණු ගැන උලමා සභාව ගැන කිව්වා. ඔය මවුලවිවරු කිහිප දෙනෙක් ගැනම අපි නම් ඉදිරිපත් කළා. ඒ අවස්ථාවල යම් තර්ජනයක්ව අනාගතේ තර්ජනයක් වෙන්න පුළුවන් මේ ගොල්ලන්ගේ මතවාදය කියලා අපිට දැනුනු සියළු දෙනා ගැනම වගේ අපි දැනුවත් කළා. ඒ විතරකුත් නෙවෙයි ඒක අපි හය

FAIR COMMENT BY JEZEEM

නැතුව කියන්න ඕනී මැතිතුමනි කිසිම අවබෝධයක් තිබුණේ නෑ මේ ඉස්ලාම් අන්තවාදය ගැන ඇත්ත වශයෙන්ම. අපි ඉස්ලාම් අන්තවාදය ගැන මුලින්ම කරුණු කියන කොට කියන්න කණගාටුයි ඇත්තටම ඒ ගොල්ලොත් වගකියන්න ඕනී එවක ආණ්ඩුව තීරණය කරනවා අපිව වහාම නතර කරන්න. මැතිතුමනි බොදුබල සේනා සංවිධානය පිහිටුවලා මේ ඉස්ලාම් ඇතැම් සහෝදරයන් අපි ළඟට ඇවිල්ලා මේ තොරුතුරු කියන කොට අපිට දරාගන්න බැරි තරම් භීතියක් ඇති වුණා. ඉස්සෙල්ලාම අපි කළේ මොකක්ද අමාත්‍යවරු හතර දෙනෙක් එතකොට දෙදෙනෙක් අමාත්‍යවරු තව එක්කෙනෙක් මන්ත්‍රී කෙනෙක්. ඔව් අමාත්‍යවරු තුන්දෙනෙකුත් මන්ත්‍රීවරයෙකුත් ද්‍රවිඩ සන්ධානයේ මන්ත්‍රීවරයෙකුත් අපේ කාර්යාලයට ගෙන්වලා අපි කිව්වා මෙන්න මේ වගේ ප්‍රශ්නයක් තියෙනවා අපි පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ නැනේ. ඕගොල්ලොනේ පාර්ලිමේන්තුවේ ඉන්නේ. ඕගොල්ලොනේ සිංහල ජාතිය ගැන බෞද්ධකම ගැන කතා කරන්නේ. කරුණාකරලා මේ ප්‍රශ්නය ගැන කතා කරන්න කියලා .

ප : ඔබ වහන්සේට නම් කරන්න පුළුවන්ද?

පි : පුළුවන්. ඉස්සෙල්ලාම ගෙන්නුවේ විමල් වීරවංශ ඇමතිවරයා, දිනේෂ් ගුණවර්ධන ඇමතිවරයා, චම්පික රණවක ඇමතිවරයා එතකොට ඒ ගොල්ලෝ ඒ ආණ්ඩුවේ ඔහු ගම්මන්පිළ මහත්මයා . විමල් වීරවංශ මහත්මයාට අපි ගෙන්වලා කිව්වා මේ වගේ අපි බොදු බල සේනා සංවිධානය හැදුවේ ශාසනික අර්බුද ටික විසඳගන්න. මේ හොර බුදුවරු රහතුන්ලා පහළ වෙනවා. බෞද්ධ ග්‍රන්ථ නියාමන පනත ගෙනල්ලා නෑ. ඒක නිසා එක එකා පොත් ලියලා ධර්මය විකෘති කරනවා. මේ වගේ වැඩ පිළිවෙලක් තියෙනවා හොර සංඝයා වහන්සේලා ගොඩක් ඉන්නවා. මේක ලොකු ප්‍රශ්නයක්. ඒ වැඩේ කරන්න වෙන්නේ නෑ මහත්තයෝ දැන් මෙන්න මේ මුස්ලිම් අන්තවාදය සම්බන්ධයෙන් ගොඩක් තොරතුරු අපිට ලැබිලා තියෙනවා කරුණාකරලා අපිට ඕගොල්ලො උදව් කරන්න මේක ගෙනියන්න. මේ වැඩේ හොයන්න ඕනී. මේවා පිපිරෙන්න කලින් ලක් තැනම ලොප් කරන්න ඕනී. ඉස්සෙල්ලාම දැනුවත් කළේ ඒ මනුෂ්‍යයා. අවාසනාවකට පළමු ප්‍රහාරය එල්ල කළෙත් අපිට ඔහුමයි. ඒ තමයි ලංකාවේ දේශපාලනය. අපි උද්වේගයෙන් මුස්ලිම් ප්‍රශ්නයක් තියෙනවා වහබිසම් මේක Promote වෙනවා. මේක වැඩි දියුණු වෙනවා කියලා කියන කොට තීන්දුවක් ගත්තා අපිට ගහන්න. ඉස්සෙල්ලාම අපේ

FAIR COMMENT BY JEZEEM

Image එක නැති කරන්න මිනිස්සු අතර අපිව වඩා චිත්තාරාධනීය විදිහට පිළිගන්න කොට මේක දරා ගන්න බැරි වුණා. ඒ ගොල්ලෝ උපකල්පනය කළා ආ... මේ හදන්නේ පාර්ලිමේන්තුවට එන්න වෙන්න ඇති කියලා ආ... මේ නෝර්වේ කුමන්ත්‍රණයක්. මොහු මේ කරන්නේ මේ කරන්නේ මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුවේ මුස්ලිම් ඡන්ද නැති කරන්න කියලා මතයක් හැදුවා. ඒ එක්කම අනිත් පැත්තෙන් කියන්න පටන් ගත්තා මංගල සමරවීර උන්නැහේ මේකේ පිටිපස්සේ ගෝඨාභය රාජපක්ෂ ඉන්නවා. රහස් ගිණුමකින් සල්ලි දෙනවා බොදුබල සේනාවට කියලා දැන් අපි අර කතා කරන මාතෘකාව නෙවෙයි කතා කරන්නේ ඇත්තටම මේක නෝර්වේ Project එකක්ද මේක ගෝඨා සල්ලි දෙනවාද වෙන වෙන මානයන්ට මේක ගෙනිච්චා. ඇත්ත කතාව කියා ගන්න කිසිම තැනක අවම තරමින් ජාතික රූපවාහිනි එකේ විනාඩි පහක් දුන්නේ නෑ මේ මේවා ගැන කතා කරන්න. කිසිම රජයේ මාධ්‍යයක. පෞද්ගලික මාධ්‍ය වල ඇතැම් අවස්ථාවල එකක් දෙකක් දුන්නා ඒ ඔක්කොම දේශපාලනය විසින් හසුරුවන්නේ. ඒ නිසා මේ තුන්සියක් මරාගෙන මැරීම දක්වා කාරණාව මේවා බොහොම ලේසියෙන් අපිට මේ විසඳ ගන්න තිබුණා ඒ අවස්ථාවල ඉඩ දුන්නා නම්. ඉතින් ඒ මැතිඇමතිවරු දැනුවත් කළා. වගේ වගක් නැතුව හිටියා. ඒ ගොල්ලන්ට කියවීමක් තිබුණේ නෑ මැතිතුමනි මේ ඉස්ලාම් අන්තවාදය කියන්නේ මොකක්ද කියලා. ඊළඟට අපි මේ ඉස්ලාම් අන්තවාදය ගැන විශේෂයෙන්ම මේ හදීස් ඒ වගේම කුර්ආන් ඉගැන්වීම් , සුන්නා ගැන අර මේ අපේ මැතිනිය ප්‍රශ්න කළා වගේම අපි ගෙන්වා ගත්තා සවුදියේ ලියපු අර එළහමේ ලියපු සටහන්වලින්ම සකස් කරපු කුර්ආනය. මොකද මෙහේ කුර්ආන් ගොඩාක් තියෙනවා. එකම වගන්තිය කුර්ආන් පහක බැලුවොත් පස් විදිහක්. හැබැයි එකම අර්ථයෙන්. එක එක විදිහට තමයි ලියලා තියෙන්නේ. ඒ නිසා මේ ගැන ඉතාම ඉහළ අධ්‍යයනයක් කරපු සිංහල මහත්මයෙක් ඔහු ගැන අපිට පෞද්ගලිකව කියන්න පුළුවන් ඒක ප්‍රසිද්ධියේ කිව්වොත් ඔහුට තර්ජනයක්. මැතිතුමනි 2015 ට පෙර හා පසුත් මාධ්‍ය ආයතන ප්‍රධාන මාධ්‍ය ආයතන දෙකක අයිතිකරුවන්ට ඔහු ගෙන්වලා දේශන තිබ්බා. මොකක්ද මේ වෙන්නේ කියලා. ඒ වගේම ඇතැම් හමුදා නිලධාරීන්ටත් අපි අවස්ථාව උදා කරලා දුන්නා මේ ගැන අධ්‍යයනය කරන්න ඉගෙන ගන්න . ඔන්න ඊට පස්සේ තමයි ඉස්ලාම් ගැන මොකක්ද මේ ඉස්ලාම් අන්තවාදය කියලා

FAIR COMMENT BY JEZEEM

හොයන්න පටන් ගත්තේ. ඉතින් ඒ කැප කිරීම සහ ඒ යුතුකම අපි කළා.

ප : ගරු ස්වාමීන් වහන්සේ ඔබ වහන්සේට පුළුවන්ද ඔබ වහන්සේ ප්‍රකාශ කරන්නට යෙදුණු ඒ දේශන පවත්වපු මහත්මාගේ නම අපිට රහසිගතව ලියලා දෙන්න?

පි : පුළුවන්. මොකද ඔහු වැඩ කරන්නේ මුස්ලිම් රටක. ඒ ලබපු අත්දැකීම් එක්ක ඔහු දිගින් දිගට දිගින් දිගට ඉංග්‍රීසියෙන් ඔහු මේක study කරලා තියෙනවා. ඔහු අපි, අපි සම්බන්ධ වෙන්නේ නැතුව අපි දැනුවත් කරලා ඔහු

මේ අවස්ථාවේදී සාක්ෂිකරුට ලබා දෙන ලද ලේඛනයක ඔහු විසින් සඳහන් කරන්නට යෙදුණු පුද්ගලයාගේ නම කොමිෂන් සභාවට සටහන් කර ලබා දෙයි. එම ලේඛනය කොමිෂන් සභාවේ යතුරු ලේඛිකාවට ලබා දෙන අතර එහි ඇති නම ගරු ස්වාමීන් වහන්සේගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරක් වශයෙන් සටහන් කර ගන්නා ලෙස නියෝග කරමි.

පි : ප්‍රියන්ත වතුදුර. අපි ඇතැම් නීතිඥ මහතුන් දැනුවත් කළා. වෛද්‍යවරු දැනුවත් කළා. ව්‍යාපාරිකයන් දැනුවත් කළා. දේශපාලඥයන් යම් පමණකට ඒ ගොල්ලෝ ඉතින් ඔක්කොම දන්නවා වගේනේ ඉන්නේ යම් පමණකට දැනුවත් කළා. ඒ වගේම සාමාන්‍ය මිනිස්සු අපි මහනුවර, කුරුණෑගල, කොළඹ, බදුල්ල පුත්තලමේ එක තැනකුත් ඔය වගේ ස්ථාන පහක වගේ ඒ මහත්මයා එක්ක ගිහිල්ලා සාමාන්‍ය හාමුදුරුවරුන්ට මේ ගැන උනන්දුවක් දක්වන අයටත් අපි ඒ මේකේ නියම කතාව මොකද ඉස්ලාම් ගැන කවුරුත් ඉගෙන ගන්නේ නැති නිසා ඒ දැනුවත් කිරීම් කළා.

ප : ඔබ වහන්සේ ප්‍රකාශ කරන පරිදි එම 2013 සිට 2015 කාලය තුළ ඔබ වහන්සේ සහ ඔබ වහන්සේගේ සංවිධානය විසින් ආරක්ෂක අමාත්‍යාංශයට කරන ලද තොරතුරු ලබාදීම්වලට අනුව යම් කිසි තැනැත්තන් අත්අඩංගුවට ගැනීමක් සිදු වුණාද?

පි : සමහර විට අප්‍රසිද්ධියේ එහෙම වුණාද කියන්න නම් දන්නේ නැහැ. හැබැයි කොහේවත් පිපිරුවෙත් නෑ. කොහේවත් මරාගෙන මැරෙන ප්‍රහාර හෝ එවැනි සිද්ධීන් වුණේ නැහැ. නමුත් අපි දැන ගෙන හිටියා මේක අවුස්ස ගන්න නොයෙක් විදිහේ වැඩ කරන බව. දැන් අලුත්ගම කියන්නේ එහෙම සිද්ධියක්. නමුත් ඒවාත් ඔක්කොම අපේ කර මත තමයි පැටෙව්වේ. අපි එදා ඉඳලා අදටත් කියනවා තවමත් අලුත්ගම සම්බන්ධයෙන් කොමිසමක් දාන්න. මේ ගැන අග මුල හොයන්න. නිකම් චෝදනා කරන්න එපා කියලා. නමුත් අද

FAIR COMMENT BY JEZEEM

වෙනකම් කිසිම ආණ්ඩුවක් අලුත්ගමට කොමිෂමක් දෙන්නේ නෑ. අලුත්ගම සිද්ධිය සම්බන්ධයෙන්. නමුත් අපිට විශ්වාසයෙන් කියන්න පුළුවන් ඒ කාලේ ඒ රාජ්‍ය ආරක්ෂාව ගැන සහ මේ ප්‍රශ්නේ අපි දැනුවත් කළාට පස්සේ විශේෂ අවධානයක් යොමු කරවමින් මොකද සමහර අවස්ථාවලදී අපිට ආරංචි වුණා අපි තීව්‍ර ලෙස මේවා හඬ නඟා හෙළිදරව් කරන කොට ඔය අන්තගාමී මුස්ලිම් පාර්ශව වලින් එවක ජනාධිපතිතුමාට බලපෑම් එල්ල වෙනවා ඇයි මේ හාමුදුරුවෝ අත්අඩංගුවට ගන්නේ නැත්තේ. ඔයාට ඡන්ද නැති වෙයි කින්ද මන්ද කියලා කිව්වහාම Security Council එකේදී ඒ සමහර කතා වෙච්චි අවස්ථා තිබිලා තිබුණා කොහොමද හාමුදුරුවෝ අත්අඩංගුවට ගන්නේ මේ කියන ඒවා ඇත්තනේ කියලා. හාමුරුදුරුවෝ කියන භාෂාවේ වරදක් ඇති. හැබැයි ඒ මනුස්ස කියන දේ අහන්න. කියන විලාසය වැදගත් නැහැ කියලා . ඉතින් අපි ඒ කරුණු වලින් තේරුම් ගත්තා ඔවුන් බරපතල විදිහට මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරපු බව.

ප : දැන් ඔබ වහන්සේ කියන පරිදි මේ තොරතුරු හුවමාරුව 2013 ඉඳලා 2015 වෙනකම් පැවැතියා ආරක්ෂක අමාත්‍යාංශයේදී?

පි : ඔව්.

ප : දැන් 2015 න් පස්සේ එවැනි තොරතුරු හුවමාරුවක් කිරීමට ඔබ වහන්සේ සහ ඔබ වහන්සේගේ සංවිධානය ප්‍රයත්න දැරුවාද එහි ප්‍රතිඵලය කුමක්ද?

පි : ආණ්ඩු දෙකෙන්ම බැට කෑවා. කලින් ආණ්ඩුවේ බලධරයන් හිතාගෙන හිටියා ආරක්ෂක අංශ නෙවෙයි දේශපාලකයොනේ තීන්දු ගන්නේ. දේශපාලකයෝ හිතින් හිතුවා මේ කරන්නේ මහින්ද රාජපක්ෂ මහතාගේ ඡන්ද කඩන ව්‍යාපෘතියක්. මේක වෙන කාගේ හරි project එකක්. 2015 බලයට ආපුවාම අනිත් පාර්ශවය හිතුවා ආ.. මේ මහින්දගේ කට්ටිය මේ ගොල්ලන් කියන ඒවා අපි ගණන් ගන්නේ නෑ. මොකද අපිට ඡන්දේ දුන්නේ මුස්ලිම් අය. එහෙත් අම්පාරේ එක්තරා සිද්ධියක් මතු වුණා. මානික්කමඩුව සම්බන්ධයෙන්. ඔය දිසාපතිවරු, නියෝජ්‍ය පොලිස්පතිවරු ඔක්කොම ඇවිල්ලා ඒ බෞද්ධයෝ අසරණ වෙච්ච වේලාවේ මම අම්පාරට ගිහිල්ලා ඒ ප්‍රශ්නේට මැදිහත් වෙලා මානික්කාමඩුව කියන ඓතිහාසික තැන දිසාපියට අයිති. එය මායා මඩුව කරලා දිසාපති කෙනෙක්වත් අවසරයක් දෙන්නේ නෑ එක්කෝ සම්පූර්ණයෙන් ඒක අල්ල ගන්න ගියේ. ඉතින් අපි ඒක මැදිහත් වෙලා නැවැත්තුවා. ඒක ලොකු සිද්ධියක් බවට පත් වුණා. මුස්ලිම් සමාජයෙන් බලපෑම් ආවා. මේ අපි ආණ්ඩුව ගේන්නත් උදව් කරලා ඇයි හාමුදුරුවෝ ඇවිල්ලා මෙහෙම

කරන්නේ එහෙම කොහොමද වෙන්නේ කියලා ඔන්න බලපෑම් ආපුවාම ජනාධිපතිවරයා විසින් එක අවස්ථාවක අපිව කැඳෙව්වා. ඒ වගේම ඒ කැඳවන්න එක හේතුවක් වුණා.

ප්‍ර : නම සඳහන් කරන්න?

පි : මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා. ඊළඟට තව සිද්ධියක් වුණා .

ප්‍ර : ඒ රැස්වීමක් තිබ්බද ඔබ වහන්සේ මොනවාද දැන්නුවේ ජනාධිපතිතුමාට?

පි : දැන් ඔය මානික්කමඩුව සිද්ධිය ඇති වුණාට පස්සේ ටිකක් මේක අවුල් වෙලා ගියා. ඒ ගොල්ලො හිතුවා ආණ්ඩු බලය ගත්තාම අපි නිහඬ වෙයි. මොනවාත් කරන එකක් නෑ දැන් හරි කියලා. නමුත් අපි හිටපු අපි සීරුවෙන් හිටියා. මොනවද වෙන්නේ කියලා ඒ අනුව අම්පාරට ගිහිල්ලා ප්‍රශ්නෙත් එක පැත්තක තියා ගත්තා. ඒ සමයේම ආරම්භක අවස්ථාවේම වව්නියාවේ බෝගස්වැව ප්‍රදේශයේ බරපතල ප්‍රශ්නයක් ඇති වුණා. අපි යුද්ධයෙන් පස්සේ රට පුරා ගිහිල්ලා බණ කියලා දෙතුන් දහසක් බෝගස්වැව පදිංචි කරන්න ඒ වැඩ පිළිවෙල කළා. හමුදාව තමයි ඒකට උදව් කළේ. එහේ සිංහල බෙල්ට් එකක් හදන්න. ඒ අලුත් ආණ්ඩුව ආවා විතරයි ඒ මිනිස්සුන්ට තිබුණු සියළු පහසුකම් නැති කෙරුවා. වතුර ටික දුන්නේ නෑ. වියළි ආහාර ටික දුන්නේ නෑ. ඒ මූලික අයිතිවාසිකමුත් කප්පාදු කළාට පස්සේ ඒ මිනිස්සු පළා යන්න හැදුවා. මම එතෙන්ට ගිහිල්ලා ඒ මිනිස්සු මුණ ගැහුණාම මිනිස්සු මහ විලාප තියලා හඬලා අනේ හාමුදුරුවනේ අපිව බේරගන්න කිව්වාට පස්සේ අපි බොහොම සංවේදීතාවයට පත් වෙලා ඊට දවස් දෙකකට පස්සේ තමයි මේ ජනාධිපතිවරයාව හම්බ වුණේ. අපි හම්බ වෙලා කිව්වා කරුණාකරලා මේක කරන්න දෙන්න බෑ. කරන්න දෙන්න එපා. වහාම නැවත පෙර තිබූ පරිද්දෙන් හමුදාවෙන් දීපු ඒ සහාය ලබා දෙන්න වැඩ කරන්න හමුදාපතිට දැන් නියෝග කරන්න කියලා. ඒක කළා. එ දවස මේ ප්‍රශ්න ගැන කිව්වා. හුහක් වෙලා නෙවෙයි. මිනිත්තු 20 ක් විතර වගේ කාලයක් අරගෙන දැනුවත් කළා.

ප්‍ර : සමාවෙන්න හාමුදුරුවනේ කවුද ඒ රැස්වීමේ හිටියේ? කොයි වකවානුවේද කියලා පොඩ්ඩක්?

පි : මට දිනේ මතක නෑ

ප්‍ර : වර්ෂය මතකද?

පි : 2015 අග භාගය මට ලියුම නම් ගේන්න අමතක වුණා. 2016 වගේ. 2016 මැයි විතර. මතක නෑ. 2016 වර්ෂයේ වෙන්න ඕනී. ඊට පස්සේ

ප්‍ර : ස්වාමීන් වහන්සේ එතන රැස්වීමේ කවුද හිටියේ කියලා කියන්න?

FAIR COMMENT
BY JEZEEM

පි : ඒ රැස්වීමේදී හිටියා ඇමතිවරු දෙදෙනෙක් හෝ තුන්දෙනෙක් හිටියා.

දැන් වේලාව : ප.ව. 07.40 යි.
මෙතැන් සිට ල/ලේ :- ධම්මිකා මිය.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පෙර සටහන් කරන්නේ මුතුමාලී මෙනවිය විසින්ය.
වේලාව ප.ව.7.40 යි
මෙතැන් සිට ධම්මිකා පෙරේරා විසින්ය.

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:

ප්‍ර : නම මතකද ස්වාමීන් වහන්ස?

පි : නම මතක නැහැ, මොකද මේ යක්ෂයෝ අද එක පැත්තක ඉන්නවා, හෙට එක පැත්තක ඉන්නවා. කොහේ බැලුවත් එක පින්තූරේ නේ පේන්නේ. එහෙම මතක නැහැ. නමුත් 2 වන අවස්ථාවේදි මැතිතුමනි අපි ඒ දිගින් දිගට, දිගින් දිගට ආයේ පොඩ්ඩක්වත් නිහඬ නොවී කරුණු වාර්තා කරන කොට ප්‍රසිද්ධියේම අපිට ලියුම් එවලා කැඳෙව්වා ජනාධිපති මන්දිරයට. එහිදී ජෝන් අමරතුංග මහත්මයා හිටියා, මුස්ලිම් නායකයෝ අතාවුල්ලා මහත්මයා, මුස්ලිම් නායකයෝ දෙන්නෙක් හෝ තුන් දෙනෙක් හිටියා. උලමා සභාවේ කට්ටිය හිටියා. විජේදාස රාජපක්ෂ මහත්මයත් හිටියා. එහිදි බොහොම උද්වේගයෙන් මම ඒ සභාව ඇමතුවා. අපේ නායක හාමුදුරුවරුත් හිටියා.

ප්‍ර : එවකට ආරක්ෂක ලේකම්වරයා හිටියද?

පි : නැහැ, නැහැ, ආරක්ෂ අංශ ප්‍රධානීන් කවුරුවත් හිටියේ නැහැ මගේ මතකය. එතකොට අපේ නායක හාමුදුරුවොත් මට අවස්ථාව දුන්නා. එතනදී ඔය මානික්කමඩුව ගැනත්, ඊට පස්සේ සෝමාවතියේ වෙමින් තියෙන දේවල්, එකී මෙකී නොකී බොහෝ දේක බොහෝම රෞද්‍ර විදියට ජනාධිපතිවරයා ඉස්සෙල්ලාම ඇහුවා කවුද ඕගොල්ලන්ට බලතල දුන්නේ යනාදි වශයෙන් ඒවා ඉතින් කතාව පැවැත්තුවා. පන්සලට ආවා එච්චරයි. එතනින් එහාට මොකක්වත් වුණේ නැහැ.

ප්‍ර : ඔබ වහන්සේ ප්‍රකාශ කරන පරිදි 2015 ට පසු මේ ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන් සෘජුව ආරක්ෂක අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ සාකච්ඡාවක් වුණේ නැද්ද?

පි : නැහැ මැතිතුමනි නැහැ, කිසිම අඩු තරමින් බුද්ධි නිලධාරියෙක්වත් ඇවිත් අපෙන් තොරතුරක්වත් ගත්තේ නැහැ, ඊටත් වඩා පොලිස් මූලස්ථානයට කොච්චර පැමිණිලි කළාද. පැමිණිල්ලක් විභාගවත් කළේ නැහැ. අපි හැම සිද්ධියක් ගැනම පැමිණිලි කළා. මම නෙමෙයි අපේ සංවිධානයේ පොඩි හාමුදුරුවෝ ගිහිල්ලා මොකක් හරි තැනක issue එකක් එන කොට වහාම මේක සොයා බලන්න කියලා පැමිණිලි කළා. පැමිණිල්ලක් විභාගවත් කළේ නැහැ. පැමිණිල්ලක් විභාගවත් කළේ නැහැ. නමුත් අපි මාධ්‍යයෙන්

FAIR COMMENT BY JEZEEM

කරන්න තියෙන හෙළිදරව් මාධ්‍යයෙන් කළා. අපිට අන්තිමට අපි හිතුවා වැඩක් නැහැ මේගොල්ලෝ හම්බ වෙලා කියලා. ඊට පස්සේ ඊමේල්වලින් අපි යැව්වා ඉතින්. මෙන්න මෙහෙම දෙයක් වෙනවා පුළුවන් නම් හොයලා බලන්න කියලා. කියලා වැඩක් නැති නිසා.

ප්‍ර : ඔබ වහන්සේ සඳහන් කරන්නට යෙදුනු ඒ පොලිස් පැමිණිලි ඒ කියන්නේ ප්‍රධාන මූලස්ථානයට කරපු පොලිස් පැමිණිලි වල පිටපත් ඔබ වහන්සේ ගාව තියෙනවද?

පි : පිටපත් නම් ගත්තේ නැහැ, අපිට ඒ දින නම් සමහර දේවල්..

ප්‍ර : සාමාන්‍යයෙන් ස්වාමීන් වහන්ස පැමිණිල්ලක් කෙරුවාම ඒ පැමිණිල්ලේ අංකය කොළයක ලියලා දෙනවා, එවැනි වාර්තා හෝ තියෙනවාද ඔබ වහන්සේ ලඟ?

පි : එහෙම කළේ නැහැ මැතිතුමනි මොකද ශත පහකටවත් ඒ පොලිසි ගැන විශ්වාසයක් තිබුණේ නැහැ අපිට. පැමිණිල්ලක් දාන්න, මොකද මාධ්‍යය වල අහනවානේ මේ ගැන පැමිණිලි කළාද කියලා. ඒක සනාථ කරන්න ඕන හින්දා පැමිණිල්ලක් දානවා. මොකද විභාග වෙන්නේ නැහැ කියලා අපි දැනන් හිටියා. විභාග කරන්ව ඒ නිලධාරීන්ට එක්කෝ ඉස්ලාම් ගැන අවබෝධයක් තියෙන්න ඕනේ, එහෙම මෙලෝ අදහසකුත් නැහැ, එහෙම අවබෝධයකුත් නැහැ, ඉතින් ඒ නිසා අපිට ඒක එච්චර අපි ගත්තේ නැහැ තදට. නමුත් දින වකවානු නම් අපට බොහෝ දේවල් නම් මතකයි. දැන් අපි උදාහරණයක් විදියට බදුර්දීන් උන්නැහේ ගැන පැමිණිලි දාලා ඇති එක දෙතුන් සීයක්. ඒ වගේම මේ කුර්ආනයේ ඉගැන්වීම් සහිත මේ ඉගැන්වීම් තහනම් කරන්න කියලා පැමිණිලි කලා. විල්පත්තුව සම්බන්ධයෙන් නැවත නැවතත් පැමිණිලි කළා. ඊට පස්සේ සෝමාවතීය සම්බන්ධයෙන් පුර්වයෙන් මතක් කළ පරිදි ඒවා ගැන පැමිණිලි කළා. අපිට හොයා ගන්න බැරිකමකුත් නැහැ. ගන්න පුළුවන් පැමිණිලි දාපුවා. දින තියෙනවානේ.

ප්‍ර : අපි අවස්ථාවක් දෙන්නම් හොයා ගන්න පුළුවන් වුනොත් ?

පි : අපිට බොහෝ විට හොයා ගන්න පුළුවන්.

ප්‍ර : දැන් ඔබ වහන්සේට හැඟෙන පරිදි ඔබ වහන්සේ සහ ඔබ වහන්සේගේ සංවිධානය විසින් කරන ලද ඒ පැමිණිලි සම්බන්ධයෙන් කිසියම් ක්‍රියාමාර්ගයක් නොගැනීමට හේතුව මොකක්ද?

පි : දේශපාලනය.

ප්‍ර : මම එතනින් මගේ ඊලඟට ප්‍රශ්නයට අවතීර්ණ වන්නම්, ඔබ වහන්සේට හිතන හැටියට ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂයක්,

FAIR COMMENT BY JEZEEM

ආගම නැත්නම් ජාතිය මත පදනම්ව ලියාපදිංචි කිරීමට අවස්ථාව ලබා දිය යුතුද නැද්ද?

පි : සම්පූර්ණයෙන් තහනම් කලයුතුයි. ජාති, ආගම්, පක්ෂ මත දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීමට අවසර නොදිය යුතුයි. අපි ඔය මතය ගෙන ඒම සඳහා තමයි අපි අර බොදුජන පෙරමුණ නමින්ම පක්ෂයක් ඉල්ලුවේ. අපි හිතුවා අනිවාර්යයෙන් අපට විරෝධතාවය එනවා. අපි ඒක කවුළුවක් කර ගෙන අපිට උවමනා කළා ආ... බොදුජන පෙරමුණටද තහනම් එහෙමනම් මුස්ලිම් කොංග්‍රසයත් අයින් කරන්න. එහෙනම් ද්‍රවිඩ සංධානයත් අයින් කරන්න. එන්න මුල ඉදලා. අපි අගනේ ඉන්නේ. ඒ මතවාදය හැදීමේ උවමනාව අපිට තිබුණා. ඒ නිසා තමයි බොදුජන පෙරමුණ කියන එකම නම දාලා මොකද මේක බරපතල ප්‍රශ්නයක් මැතිතුමනි, දැන් එක්සත් ජාතික පක්ෂය කියලා එකක් තියෙනවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියලා එකක් තියෙනවා, දැන් අළුතින් පොදුජන පෙරමුණ කියලා එකක් තියෙනවා. මේ තුනේමත් මුස්ලිම් අය ඉන්නවා. මේ තුනේමත් මුස්ලිම් නියෝජනයක් තියෙනවා. ඒ මුස්ලිම් අය ඒ ඒ ජාතික ලැයිස්තුවලත් ඉන්නවා. ඒගොල්ලන්ටම අදාලව මුස්ලිම් කොංග්‍රසය තියෙනවා. බදුර්දීන්ගේ තව පක්ෂයක් තියෙනවා. අතාවුල්ලගේ තව පක්ෂයක් තියෙනවා. ඒ මුස්ලිම් නමින්මත් පක්ෂ තියෙනවා. ඊලඟට ඊට අමතරව යහපාලනය සම්බන්ධයෙන් මේ සංකල්පයම ගෙනාවේ මුස්ලිම් අය. එතකොට පහර දෙන්න ලේසියි. ඒගොල්ලොත් පක්ෂ හදාගෙන තියෙනවා. එතකොට ප්‍රධාන පක්ෂ ධාරාවෙනුත් ඒගොල්ලන්ගේ Quota එක ලබා ගන්නවා. තමන්ගේ ජාති පදනමින් තියෙන පක්ෂ වලිනුත් ඇවිල්ලා Bargain කරලා ඒ ඉල්ලීම් දිනා ගන්නවා. අපේ මහ මෝඩයෝ ටික අපටත් අර 70 ට බෙදන්නෙත් එක හැන්දෙන් 7 ට බෙදන්නෙත් එක හැන්දෙන් 2 ට බෙදන්නෙත් එක හැන්දෙන්. ඓතිහාසිකව අපේ උරුමය තමයි අවසානෙදී මේගොල්ලෝ ඔක්කොම තරඟෙට වනසලා තියෙන්නේ. ඉතින් ද්‍රවිඩ පක්ෂ කොච්චර තියෙනවද, ඒත් එහෙමමයි. ඒ නිසා ඇත්ත වශයෙන්ම අපි ඉදිරියට වැඩ කරනවා මේ ජාතිය, ආගම මත පදනම්ව දේශපාලන පක්ෂ පිහිටුවීම ඇත්ත වශයෙන්ම තහනම් කලයුතුයි කියලා. අපි එවැනි මතයක් ගොඩ නඟන්න බලාපොරොත්තු වෙනවා.

ප්‍ර : ඊට හා සබැඳි මගේ ඊලඟ ප්‍රශ්නය, ලංකාවේ අධ්‍යාපන පද්ධතිය විශේෂයෙන්ම පාසැල් ජාතිය හෝ ආගම මත පදනම්ව පවත්වාගෙන යා යුතුද?

FAIR COMMENT BY JEZEEM

පි : මේ යුගයේ ඒකට ඉඩක් නැහැ මැතිතුමනි. අතීත කාලේ නම් අපට යටත් විජිත සමයේ ඒ තිබුණු තලා පොඩි කිරීම් වැනි දේවල් එක්ක බෞද්ධයෝ බෞද්ධයන්ට පාසැලක් හදා ගත්තා. හින්දු අයට ඒ ලැබුණු වරදාන අනුව ඒගොල්ලෝ හදා ගත්තා. හැබැයි දැන් ඒ රට නෙමෙයි තියෙන්නේ. මේ ගෝලීය තත්ත්වයන් අනුව අපිට පේනවා ලෝකයේ දියුණු රටවල අධ්‍යාපන ක්‍රමය එකක්. අධ්‍යාපනයෙන් තමයි අවශ්‍ය හොඳ ආකල්ප එක්ක හොඳ දරුවෝ හදන්නේ. ඉතින් ඒ ආකල්ප ඇති කරන්න විදියක් නැහැ තවමත් මේ තියෙන්නේ යල් පැන ගිය අධ්‍යාපන ක්‍රමයක්. ඉතින් මේ අධ්‍යාපන ක්‍රමය සම්පූර්ණයෙන්ම වෙනස් වෙන්න ඕන. ජාති ආගම් මත පදනම්ව තියෙන ඒ පාසැල් පද්ධතිය වෙනුවට ජාතික පාසැල් පද්ධතියක් එක්ක මෙහේ කොළඹ උගන්වන විෂයම යාපනෙත් උගන්වන්න ඕන. ඒ එක්කම මොණරාගලත් උගන්වන්න ඕන. පොඩි දරුවාගේ පටන් ළඳරු පාසැල් අධ්‍යාපනය එකක් කොහොමද මේ රටේ විනය හදන්නේ. පාරේ යන හැටි ටොපියක් කාලා කොලයක් දාන එක, මේ ඔක්කොම දැන් අද ළඳරු පාසැල් ටික ගත්තත් ඒක මහ ලොකු දෙයක් නෙමෙයි. අවම තරමින් ළඳරු දරුවෝ ගෙනියන වාහනයක් හඳුනා ගන්න බැහැ අපිට. වෙන රටක නම් අපි දන්නවා මේ වාහනයේ යන්නේ ළඳරු පාසැල්වල පොඩි දරු පැටව්. එතකොට වැඩි අවධානයක් දෙනවා ඒ දරුවන්ගේ ජීවිතවලට. එතනවත් සකස් කර ගන්න බැරුව මේ ජාතික ඒකාබද්ධතාවයක් ගැන කතා කරනවා. හින්දු කොලේජ් එක ඒගොල්ලන්ට ඕන විදියට ඉගෙන ගන්නවා, සහිරා කොලේජ් එක ඒගොල්ලන්ට ඕන විදියට ඉගෙන ගන්නවා, ආනන්දේ අය වෙන අභිමානයක ඉන්නවා, රෝයල් එකේ වෙනම ඉන්නවා, තෝමියන් කට්ටිය වෙනම ඉන්නවා, ඒගොල්ලෝ වෙන වෙන බලකඳවුරු හදාගෙන කතා කරනවා අපි එකට ඉමුයි කියනවා. ඒත් එකට ඉන්න විදියක් නැහැ, ඒ නිසා ඒ ජාති ආගම් මත ඇත්ත වශයෙන්ම මේ අධ්‍යාපන ක්‍රමය පවත්වාගෙන යන එක විශාල හානියක්. අපේ රට ඇතුලේ බෞද්ධයෝ බහුතරය බව හැබෑව, යම්කිසි වැඩ පිළිවෙලක් එනවා නම් මේක සිංහල බහුතරය සහ බහුතර සිංහල බෞද්ධයෝ ඉන්න රට, ඒ සිංහල බෞද්ධ අනන්‍යතාවයත් පිළිඅරගෙන මේ රටේ ඉතිහාසය, මේ රටේ ශිෂ්ඨාචාරය , මේ රටේ පස පොළව මොකක්ද කියලා හඳුනා ගන්න පුළුවන් විදියට මේ දරුවෝ ටික ගොඩ නඟනවා නම් මේ අන්තවාද බිහි වෙන්න ඉඩක් නැහැ. නමුත් අවාසනාවකට අපේ රටේ ඉතිහාසය ඉගෙන ගන්නේ නැති මුස්ලිම් දරුවෝ අරාබි ඉතිහාසය ඉගෙන ගන්නවා. නැගෙනහිර ඉතිහාසය

FAIR COMMENT BY JEZEEM

දන්නේ නැති දරුවෝ අරාබි ඉතිහාසය දන්නවා. ලංකාවේ නීතිය, ලංකාවේ හෙල්මට් එක දාන්න ඕනද නැද්ද කියන එක දන්නේ නැති එවුන් ෂරියා නීතිය ගැන ඉගෙන ගන්නවා. මේ රටේ නීතිය ගැන ඉගෙන ගන්නේ නැහැ. ඉතින් ඒ නිසා එක රටක්, එක නීතියක්, එක අධ්‍යාපන ක්‍රමයක් මේ රටට අනිවාර්යයෙන්ම මේ රට තුළ ගොඩ නගන්න ඕන කියන විශ්වාසය අප තුළ තියෙනවා.

ප : පැහැදිලි කර ගැනීමක් සඳහා මම අහන්නේ, ඔබ වහන්සේ ඉන් අදහස් කරන්නේ ජාතිය නැත්නම් ආගම පමණක් පදනම් වූ පාසැල් තියෙන්න හොඳ නෑ, පාසැල්වල සියළුම ජාතීන්වල සම්මිශ්‍රණයක් තියෙන්න ඕන කියන එකද ඔබ වහන්සේ අදහස් කලේ නැත්නම් වෙන එකක්ද?

පි : මම හිතනවා දැන් අපිට එහෙම තනිව හුදකලාවේ යන්න බැහැ. මොකද අපි ජාති, ආගම් පදනමකින් තොරව මේ පාසැල් මිශ්‍ර වෙනවා නම් අපිට හමුවෙයි අර බාකිර් මාකර්ල වගේ මිනිස්සු. අපේ මහා සමාජයත් එක්ක මුහු වෙන්න ඒ දරුවන්ට අවස්ථාවක් නැහැ. අපිට අපේ ප්‍රමුඛතාවයන් අපිට පන්සල ඇතුලේ අපට අවශ්‍ය බෞද්ධයන් හදන්න පුළුවන්. කතෝලිකයට පල්ලිය ඇතුලේ ඒක හදන්න පුළුවන්. ඉස්ලාම් සංස්කෘතිය රැක ගන්න ඒක ඉස්ලාම් පල්ලියේ කරන්න පුළුවන්. හැබැයි අධ්‍යාපන ක්‍රමය එකක් වෙන්න ඕන කියලා අපි බරපතල විදියට විශ්වාස කරනවා. මොකද මේ ගෝලීය තර්ජනයට අපිට මුහුණ දෙන්න බැහැ නැතුව. ගෝලීය තර්ජනයට මුහුණ දෙන්න නම් අපි පුංචි රටක් මේ රටේ මුස්ලිම් මිනිස්සු අපේ මුස්ලිම් මිනිස්සු බවට පත් කරන්න ඕන, ඒ කියන්නේ සිංහලේ මුස්ලිම් මිනිස්සු බවට පත් කර ගන්න ඕන. සිංහලේ දෙමළ මිනිස්සු බවට පත් කර ගන්න ඕන. සිංහලේ කතෝලිකයන් බවට පත් කරන්න ඕන. කතෝලික මිනිස්සු වතිකානුවේ පය තියාගෙන ඉන්නවා, මුස්ලිම් අය පය තියාගෙන ඉන්නවා කොහේද මදීනා වල, දෙමළ අය තියාගෙන ඉන්නවා මදුරෙයි, ඉතින් මෙහේ කැලී කැලි කොටස් ඉල්ලනවා. හැමදාම ප්‍රශ්න. ඒ හින්දා මේ ජාති ආගම් මත පදනම් නොවී මිශ්‍ර පාසැල් ඇති වුනොත් හැමෝම දෙමළ ඉගෙන ගනීයි, දෙමළ දරුවෝ සිංහල ඉගෙන ගනී, සංස්කෘතිය එකිනෙකා අවබෝධ කර ගනී, මම හිතනවා ඉතාම හොඳ ලස්සන විවිධත්වයක් ඇති පරිසරයක් නිර්මාණය වෙයි. එතකොට මේ අන්තවාද කියන ඒවා බිහි වෙන්න තියෙන ඉඩකඩ අඩු වෙයි. මොකද මිනිස්සු හඳුනා ගන්නවා හඳවතෙන්. දැන් අපි ඈතයි. දැන් අපිට හඳුනා ගන්න බැහැ මුස්ලිම් මිනිස්සු එකට ගිහිල්ලා එක තැනක කන්න බැහැ, උන් එක්ක වාඩි වුණාම හලාල් බලනවා. අපිටත් පොඩි චකිතයක්

FAIR COMMENT
BY JEZEEM

එනවා. අපිට මොනවද කවන්නේ කියලා. ඉතින් ඒ වගේ හැම එකෙන්ම අපි බෙදීලා වෙන් වෙලා. උපතේ සිට මරණය දක්වාම තියෙන්නේ බෙදුනු බිඳුණු සංස්කෘතියක්. ඉතින් ඒකෙන් බැහැ ජාතික සමඟියක් ගොඩ නගන්න.

ප : ගරු ස්වාමීන් වහන්ස ඔබ වහන්සේ කියන පරිදි මේ ඉස්ලාම් අන්තවාදයට විරුද්ධව ඔබ වහන්සේගේ සංවිධානය ආරම්භ වෙනවා 2013 වර්ෂයේදි. සමාවෙන්න 2012 වර්ෂයේදී?.

පි : 2012. මැයි මාසේ 7 වෙනිදා.

ප : දැන් ඒ ආකාරයට ඉස්ලාම් අන්තවාදයට විරුද්ධව ලංකාවේ තියෙන දේශපාලන පක්ෂ තුළ මතවාදයක් ඇති වෙලා තියෙනවද ඔබ වහන්සේ දෙන පිළිතුරට හේතු මොනවාද?

පි : දැන් නම් වීරයෝ ගොඩක් බිහි වෙලා ඉන්නවා. දේශපාලනිකව. පාස්කු ප්‍රහාරයෙන් පස්සේ. හැබැයි ඊට කලින් ඒගොල්ලෝ වහබි කියන කොට මේ පිස්සු ඒවා කොහේද මේ හොඳ මුස්ලිම් මිනිස්සු අපිත් එක්ක වල් ඌරුමසුත් කනවා මෙයා කිය කියා හිටියේ. හැබැයි දීලා ඇද්දට පස්සේ තමයි කට්ටිය දැන් කතා කරන්නේ හරි වහබි ගැන කතා කරනවා, මේක නතර කරන්න ඕන කියනවා, මද්‍රසා නතර කරන්න ඕන කියනවා, හැබැයි මුලින් අපි මේවා කියද්දි මේවා නෝර්වේ කුමන්ත්‍රණ මේ මුස්ලිම් ජන්ද කඩන්න, අනේ අප්පේ කිය කියා තමයි මැතිතුමනි මේවා ඒගොල්ලෝ කතා කලේ. දැන් නම් යම් අවදියක් තියෙන බව පේනවා.

ප : දැන් ඔබ වහන්සේගේ දැනුම අනුව පෙර කාලවලදි ඔබ වහන්සේ සඳහන් කරපු සාම්ප්‍රදායික මුස්ලිම් ජනතාව මේ රටේ ජීවත් වුණු අනිත් ජාති සහ ආගම් වාදී ජනතාව සමඟ සාමයෙන් හිටියද?

පි : අනිවාර්යයෙන්ම ඔව්. ඒ කියන්නේ සිද්ධි, ඔය අපේ ඉතිහාසය අරන් බැලුවොත් 1915 දී ඒ ඇති වුණු සිද්ධිය, ඉතින් ඒවා සමනය වෙලා ඇවිල්ලා මිනිස්සු ඉතාම හොඳින් ඉස්සරහාට ඇවිල්ලා තියෙනවා. ව්‍යාපාර කරගෙන හොඳට අපි කවදාවත් ඒ ව්‍යාපාර වර්ජනය කෙරුවේ නැහැ, අපේ කාන්තාවෝ නොදී හිටියේ නැහැ, ඒගොල්ලෝ ඉතින් අපේ මුස්ලිම් අය හැටියට සාම්ප්‍රදායික ස්වදේශික පාරම්පරික මුස්ලිම් මිනිස්සු, ඇතැම් මුස්ලිම් මිනිස්සු දන්සැල් දුන්නා. ඇතැම් මුස්ලිම් මිනිස්සු පන්සල්වලට ඉඩම් දීපුවා අපි දන්නවා. පන්සල පොඩි නම් ඒගොල්ලන්ගේ ඉඩම නම් අල්ලපු වැටේ තියෙන්නේ හාමුදුරුවනේ මම දෙන්නම් අක්කරයක් කියලා එහෙම දීපු මුස්ලිම් මිනිස්සු ඔන තරම් ඉන්නවා මේ රටේ. තවමත් දන්දෙන මුස්ලිම් මිනිස්සු ඉන්නවා. ඉතින් ඒ අපේ සාම්ප්‍රදායික මුස්ලිම් සමාජය, අන්‍යාගමිකයන් එක්ක ඒ ඕනෑම අවස්ථාවකදි රට දැය වෙනුවෙන් පෙනී ඉදලා, දැන් අපි යුද්ධය

LAW COMMENT BY JEZEEM

ගත්තොත් ඇත්ත වශයෙන්ම 27000 අපේ තරුණයෝ ජීවිත දෙන කොට 97 දෙනයි මුස්ලිම් අය යුද්දෙට බැදුනේ. නමුත් මුස්ලිම් උදවිය බුද්ධි අංශයේ හුඟක් වැඩ කළා. ඒකෙත් ඉහළම දැනුම තිබුණු බුද්ධි නිලධාරීන් හිටියේ මුස්ලිම් අය. නිලාබ්දීන්ලා වගේ, මුතාලිෆ්ලා වගේ අය. ඉතින් ඒ අයට අපි හැමදාම ගෞරව කරනවා ඒ මුස්ලිම් ජාතිකයන්, මැලේ මුස්ලිම් ජාතිකයන්. ඉතින් ඒ සාම්ප්‍රදායික මුස්ලිම් මිනිස්සු අපිත් එක්ක ඉතාම හොඳ සහජීවනෙන් හිටියා.

ප : ඔබ වහන්සේට හැඟෙන පරිදි එවැනි ආගමික සහ ජාතීන් වශයෙන් සංහිදියාවක් ඇති වෙන්න හේතු වුණු කරුණු මොනවාද? මම ඒ ප්‍රශ්නය අහන්නේ ඔබ වහන්සේගේ සාක්ෂියේදි ඔබ වහන්සේ කිහිප අවස්ථාවකදී මේ හදීස් ග්‍රන්ථය සම්බන්ධයෙන් සඳහනක් කෙරුවා. එතකොට ඒ හදීස් ග්‍රන්ථය ඒ ඔබ වහන්සේ කතා කරන අප රට තුළ ආගමික හා ජාතීන් වශයෙන් සංහිදියාවක් තියෙන කොටත් මේ හදීස් ග්‍රන්ථයම තමයි තිබ්බේ. ඔබ වහන්සේගේ දැනුම අනුව ඔබ වහන්සේ පිළිගන්නා පරිදි ඒ පෙර කාලවලදී එවැනි සංහිදියාවක් තිබෙන්නට හේතු වුණු කරුණු මොනවාද?

පි : ඇත්ත වශයෙන්ම මැතිතුමනි දැන් අර 2007 කාලෙදී අලවි මව්ලානා වැනි ඒ සාම්ප්‍රදායික මුස්ලිම්වරු මේ අනතුර දැකලා මේවා හෙළිදරව් කරලා තියෙනවා. ඊට කලින් ඔය අමීර් අලී වැනි බොහෝ දැන උගත් මම හිතන්නේ ඕස්ට්‍රේලියාවේ මහා කොමසාරිස්වරය වෙලාත් හිටියා. ඔහු පවා මේ ඉස්ලාම් අන්තවාදය නැත්නම් ලංකාවේ මුස්ලිම් මිනිස්සුන්ගේ වෙනස්වීම් ගැන බොහෝ වාර්තා තියලා තියෙනවා. ඒ කියන්නේ සටහන් තබලා තියෙනවා. ඉතින් ඒවා ගැන අපේ දේශපාලකයෝ අවධානය යොමු නොකිරීම එක කාරණයක්. දෙවෙනි කාරණාව තමයි මේ තානාපති කාර්යාලවල ඒගොල්ලන්ගේ Agenda ගෙනයාම සඳහා අර මුස්ලිම් ලීග් වැනි ඒ ආයතනවලින් මුදා හරින මේ අසීමාන්තික ධනස්කන්ධය. ඒ වගේම වෙනදා වගේ නෙමෙයි ලෝකේ විවෘතයි. තාක්ෂණය දියුණුයි. සන්නිවේදන මෙවලම් බොහොමයි. ඉතින් ඕනෑ කෙනෙක් එක්ක ගණුදෙනු කරන්න පුළුවන්. ඉතින් ඒ විදේශයන්හි ඔව් අපි දැක්කා අර විල්පත්තුවේ එක සිද්ධියක් කියන්න පුළුවන් ඒකේ ජාසිම් city කියලා එකක් හදනවා මෙහේ. ඉතින් මොකටද ජාසිම් ඉන්නේ සෞදියේ මෙහේ හදනවා city එක. ඒ ඇමතිට සල්ලි ගොඩක් හම්බ වෙනවා ඒක කරන්න. ඉතින් මේවා සමහර වෙලාවට මේවයේ ඉන්න මුල් අය දේශපාලනිකව ඉන්න අය මේවා පොතක් පතක්වත් බලන්නේ

FAIR COMMENT BY JEZEEM

නැතුව ඇති හැබැයි ඒගොල්ලන්ට හම්බ වෙනවා යහමින් සල්ලි. ඒ සල්ලි එක්ක දේශපාලන රැකවරණය ලබා ගන්නවා අර අන්තවාදය පෝෂණය කරන උදව්ය. ඕනෑම ආගමක මැතිතුමනි දැන් අපේ බෞද්ධ ආගම තුළත් අපි කියන ඔය ටිකක් අන්තවාදී වගේ කණ්ඩායම් බිහි වෙලා ඉන්නවා. හැබැයි කවදාවත් අපි මිනී මරා ගන්නේ නැහැ බුදුහාමුදුරුවෝ වෙනුවෙන් හරි නිකාය වෙනුවෙන් හරි. උදාහරණයක් විදියට අපේ ග්‍රාමවාසී තියෙනවා, අපි ග්‍රාමවාසී භික්ෂූන් වහන්සේලා. අපි නැකතට, මඟුලට, තුලාවට, දරුවෙක් කුසට ආපු දවසේ ඉදලා පාංසකුලය දීම දක්වා අපි ගිහි අය එක්ක සම්බන්ධයි. අපි ග්‍රාමවාසී භික්ෂූන්. එතනින් එහාට ගිය වනවාසී භික්ෂූන් කොටසක් ඉන්නවා. ඒ අය බණ භාවනා කරගෙන ආරණ්‍යවල, භාවනා ආයතනවල ඒ විදියට. ඒ වගේම තමයි අපි ඔය කතෝලික ආගම ගත්තොත් කතෝලික ආගමේ සාම්ප්‍රදායික පල්ලි තියෙනවා, කතෝලික අය රෝමානු කතෝලික අය, ඇන්ග්ලිකන් අය, රෙපරමාදු, ප්‍රොතෙස්තන්ත, ලොතරියානු ආදි එක එක නම්වලින් ඒගොල්ලොත් ඒ ගොල්ලන්ගේ පල්ලිවල සුපුරුදු පරිදි වැඩ රාජකාරී කරගෙන යනවා, ඊට අමතරව අපි තමයි අළුතෙන්ම ආගමට නායකත්වය දෙන්නේ කියලා අර fundamental Groups 455 ක් මෙහේ ඇවිත් වැඩ කරනවා ඇවිල්ලා. ඇමරිකානු ආධාර ලබමින්. ඒගොල්ලෝ ආගමික කෝලාහල නිර්මාණය කරනවා හැබැයි සාම්ප්‍රදායික පල්ලියට උත්තරයක් නැහැ. කාදිනල්තුමාටවත් ඒකට උත්තරයක් නැහැ. අපි හම්බ වුණාම කියනවා අපිටත් මේක තර්ජනයක්, හැබැයි ගන්න action එකක් නැහැ. මොකද නීතියක් නැහැ, නීති හදන්නේ නැහැ පාලකයෝ. ඒ වගේම තමයි සාම්ප්‍රදායික මුස්ලිම් සමාජය තිබුණා, සාම්ප්‍රදායික නැමදුම් ක්‍රමයක් තිබුණා, ඒ මිනිස්සු පස් වේලක් සලාතය කළා, ඒ කියන්නේ පස්වේලක් වැන්දා, ඒගොල්ලන් දන්න ගොඩක් නෙමෙයි ටිකක් දන්න ඒ ඉස්ලාමය තුළ ජීවත් වුණා. ඒ අතරේම ඒ සාම්ප්‍රදායික මිනිස්සුම පදානුගතාර්ථව ඒ කියන්නේ අරාබි පද ඉංග්‍රීසියට පරිවර්ථනය වෙලා ඒක ඒගොල්ලෝ දන්න හැටියට පරිවර්ථනය කලා. දැන් ඒවා තමයි මේ තියෙන්නේ. එතකොට මේ හදිසියන් පිළිබඳ දිගින් දිගටම ඉගෙන ගත්ත කණ්ඩායම් දැන් අපි මුල හොයාගෙන ගියොත් සමහර ඒවා පටන් අරගෙන තියෙන්නේ 1947, සමහර ඒවායේ මුල 1951 සමහර ඒවා 1970 ගණන්වල, සමහර සංවිධාන බිහි වෙලා තියෙනවා 1980, සමහර ඒවා 90 ගණන්වල. ඉතින් එක එක ideologies නැත්නම් එක එක මතවාදි කල්ලි ඒ ඒ කාල වල ටික ටික දියුණු වෙලා ඇවිල්ලා

FAIR COMMENT BY JEZEEM

දැන් ඔක්කොම එකට වැඩ කරනවා. ඒ Global ජිහාදය වෙනුවෙන්. ඉතින් මේක හරිම සංකීර්ණයි. දැන් මේක ලේසි නැහැ මොකද ඒ දරුවන්ගේ ඔළු ගෙඩිවලට විෂ ගිහිල්ලා ඉවරයි. මේක පිලිකාවක්. ඒනිසා තමයි මේ ඉස්ලාම් ප්‍රශ්නය හරියට දැන නොගෙන වේලාසනින් දැන නොගත්තොත් ඉස්ලාම් නිසා විනාශ වෙච්ච රටවල් වලට සිදුවූ දේ දැකලා ඉස්ලාමීක වියතුන්ම කියනවා බටහිර යුරෝපයෙත් Islam is cancer කියලා. ඉස්ලාමය යනු පිළිකාවක්. අපහාසයක් නෙමෙයි ඒ නියම ඉස්ලාමය නෙමෙයි මේ හදීසයන් හරහා ගොඩ නගා ගෙන තිබෙන උත්මත්තක මතවාද. ඉතින් පිලිකාවක් වැළදුනොත් අපිට විකල්ප 2 යි තියෙන්නේ. එකක් පිළිකාවක් වැළදිලා තියෙනවා, ඒකට Treat කර කර ඉන්න පුළුවන් spread වෙන්න නොදී. ව්‍යාප්ත වෙන්න නොදී. එහෙම නැත්නම් ඉතින් කොහොමත් දැන් ඉතින් වැළදිලා කියලා කාලා බීලා ඔහේ ඉන්න පුළුවන්. මොකද හදීස්වලට අනුව අපට නම් කිසිම chance එකක් නැහැ. යුදෙව්වන්ටයි, ක්‍රිස්තියානීන්ටයි ජීසියා බද්ද කියලා පොඩි එකක් දීලා ඉන්න පුළුවන්. හැබැයි බෞද්ධයන් ගැන කතාවක්වත් නැහැ. අපට විකල්ප 2 යි තියෙන්නේ. එකක් එක්කෝ මුස්ලිම් වෙන්න ඕනේ නැත්නම් ඉතින් අල්ලාහු අක්බර් කියලා බෙල්ල කපන කල් බලාගෙන ඉන්න ඕනේ. ඒතරම් දරුණුයි මේ ආගමික මතවාද.

ප්‍ර : ඔබ වහන්සේ හදීස් යනුවෙන් අදහස් කරන්නේ අර අරාබි භාෂාවෙන් සිංහල භාෂාවට සහ වෙනත් භාෂාවලට පරිවර්ථනය කරපු ග්‍රන්ථ සම්බන්ධයෙන්ද?

පි : හදීසය කියන්නේ මැතිතුමනි නබී නායකතුමා ඒ ඒ අවස්ථාවල ඔහුගේ ලඟම හිටපු අනුගාමිකයන්ට කරපු දේශණා. ඒ කියන්නේ නබීතුමාගේ ජීවන දර්ශනය. අබ්දුල් වහබ් කියන්නේ මෙන්න මේ නබීතුමාගේ දර්ශනය තමයි දර්ශනය. ඒකයි අර කියවෙන්නේ කුර්ආනයට වඩා කුර්ආනයෙන් පස්සේ ශ්‍රේෂ්ඨතම ග්‍රන්ථය හදීසය කියලා. ඒ නිසා තමයි සමහරු හුඟක් අය මේ හදීසය තමයි උතුම්ම කියලා පිළිගන්නේ. ඒක තමයි අබ්දුල් වහබ්ගේ දර්ශනය. ඒ අබ්දුල් වහබ්ගේ දර්ශනයට අනුව තමයි වහාබි, සලෆි, ඉහ්වාන් මුස්ලිම්, ජමාතේ ඉස්ලාම්, තවුහිද් ජමාත්, මේ වගේ මතවාද ගොඩනැගිලා තියෙන්නේ අර අබ්දුල් වහබ්ගේ දර්ශනයට අනුව. ඒ හදීසයන් 9 න් 4 ක් තමයි මේ තියෙන්නේ. එතකොට ඒවායි දැන් එක උදාහරණයක් පෙන්නන්න පුළුවන් මැතිතුමනි, ඕන කෙනෙකුට බලන්නත් පුළුවන් අන්තර් ජාලයට ගිහිල්ලා මොනවද

FAIR COMMENT BY JEZEEM

හදිස් කියලා බැලුවොත් ISIS එක දැන් මෑතකදී සම්මන්ත්‍රණයක් තිබුණා ප්‍රංශයේ. ඒකට ආවේ අර ලැජ්ජා කෘතිය ලියපු තස්ලිමා නස්රීන්. එයාගෙන් ප්‍රශ්නයක් ඇහුවා මොකක්ද ඉස්ලාම් ගැන කියන්නේ, IS ගැන, එයා කෙටි උත්තරයයි දුන්නේ දේශනය කළේ නැහැ මොකද එයාට තර්ජනයක් තියෙනවා කියලා එයාට දැනුනා. එයා ටක් ගාලා එතනින් ගියා. Quran is theory, ISIS Practices කිව්වා. කුර්ආනයේ theory තියෙනවා මේගොල්ලෝ Practice කරන්න බලන්න හදීස් එක කියලා. ඒ අනුව ඉරාකයේ මොසොල් නගරයට ගියපුවාම ඒ ISIS කණ්ඩායම් ඇවිල්ලා ඒගොල්ලෝ කිව්වා අපි දැන් අල්ලා ගත්තා ඉරාකයේ මොසොල් නගරය. ඊට පස්සේ පෙන්නුවා හදීසය. කිව්වා අපි දැන් මේ නගරය අල්ලගෙන තියෙන්නේ උඹලා මුස්ලිම් වෙන්න ඕන. ඒ ගොල්ලන් ක්‍රිස්තියානි බැහැ කිව්වා. එහෙනම් උඹලට මුස්ලිම් වෙන්න බැරිද, බැහැ එහෙනම් උඹලා මේ නගරයේ ඉන්න ඕනනේ ඔව් එහෙනම් ජිසියා බද්ද ගෙවපන්. ඒ ක්‍රිස්තියානින් කිව්වා බැහැ අපිට ගෙවන්න, මොකටද අපි ගෙවන්නේ මේක අපේ නගරේ. එහෙනම් සමූල ඝාතනය වෙන්න ලෑස්ති වෙයන් කියලා ඔක්කොම මරලා දැම්මා. ඒ වීඩියෝස් ඔක්කොම අපිට බලතහැකි. එතකොට ඒ හදිස්. ඒ විදියටම ක්‍රියාත්මක කරනවා දෙවියන්ගේ නම කියලා. එහෙම කරන්න කියලා මේවයේ ඔවුන්ට උගන්වලා තියෙනවා. අපි නැති කල යුත්තේ අන්න ඒ ඉගැන්වීමයි. ඒක තමයි අපි මේ මුස්ලිම් සමාජයත් එක්ක ප්‍රබුද්ධ සංවාදයක් හදා ගන්න ඕන මට පුළුවන්නම් එක මිනිත්තුවක් දෙනවා නම් මැතිතුමනි අර අපේ සභ සමුළුවේදි අපි කරපු ඒක පොඩ්ඩක් පෙන්නන්න පුළුවන් නම් ඔබතුමාට, මොකද හාමුදුරුවරු හය හත්දාහකට අපි මේ කතාව කිව්වා. කරුණා කරලා අපි මේ ඩයලොග් එක පටන් ගනිමු. ගහ ගන්න නෙමෙයි, සාම්ප්‍රදායික මුස්ලිම් සමාජයට ආරාධනා කළා එන්න, අපි බෙදන්නේ නැතුව අපට ගැලපෙන ඉගැන්වීම් කොයි එකද මේ රටට ඕන තරම් දේවල් ඇතිනේ මේකේ, මේ ප්‍රාථමික ඒ කාලේ මේ කාන්තාරවල සිද්ධ වුණු දේවල් දැන් ඕන නැහැනේ. දැන් අපි ඒකට උදාහරණයකුත් කිව්වා. අපි බුදු හාමුදුරුවන්ගේ කාලේ අපි සිවුරු පෙරෙව්වේ පාංසකූල සිවුරු. ඒ කියන්නේ මිනියක් ඔතලා සොහොන් කනත්තට ගිහිල්ලා දාපු රෙදි ටික අරගෙන ඇවිල්ලා තමයි සිවුරු හැදුවේ. දැන් අපි බුද්ධ කාලේ එහෙම කලා කියලා දැන් අපි එහෙම මළමිනි ඔතපු රෙදි ගන්නේ නැහැ. දැන් ඕන තරම් සිවුරු රෙදි තියෙනවා ඕන තරම් ෆැක්ටරී තියෙනවා රෙදි

FAIR COMMENT BY JEZEEM

කර්මාන්තය දියුණුයි. දැන් අපි රෙදි අරගෙන මහ ගන්නවා. දැන් අපි අර පරණ එක ගන්නේ නැහැ. අපි ඒ උපමාත් කියලා කිව්වා දැන් ඉස්සර නබීතුමාගේ කාලයේ යුද්ධ තියෙන්න ඇති ප්‍රශ්න තියෙන්න ඇති එක එක ප්‍රශ්න. ඒ කාලෙදි තිබුණු ඒ කරුණු දැන් වර්තමානයට ගලපන්න එපා. අපි තෝරගමු මේ කුර්ආනයේ ඉගැන්වීම්, හදීස්වලින් අපට ගැලපෙන Teachings මොනවද අන්න ඒවා Practice කරමු. එතකොට මේ ප්‍රශ්නෙ ඉවරයි කියලා. අපි හැමදාමත් කිව්වා වගේ අපි තවමත් කියනවා මේකට දේශපාලන උත්තරයක් නැහැ. දේශපාලන උත්තර හොයන්න හොයන්න මේක උඩුදුවලා පටලැවෙනවා. මේ ඉස්ලාම් උම්මත්තක අන්තවාදය පරාජය කරන්න පුළුවන් නම් එය ලංකාවේ භික්ෂුන්ට විතරයි කියලා මම විශ්වාස කරනවා බරපතල විදියට. මොකද හේතුව අපි තුළ තමයි මේ හේතු ඵලවාදය ගැන දැනීම තියෙන්නේ. අපිට උගන්නවන්න පුළුවන් නම් මුස්ලිම් දරුවෙකුට පුතේ මේක බලන්න මොකක්ද මේකේ ඇති වෙන මේකේ හේතුව බලන්න, මේකෙන් ඇති වෙන ඵලය බලන්න. මොකක්ද ජීවිතය කියලා උගන්වන්න පුළුවන් දර්ශනය තියෙන්නේ අපට විතරයි. මොකද කතෝලික අයටත් ඒකට ලොකු ඉඩක් නැහැ. ඒගොල්ලොත් නිර්මාණවාදී දෙවියෝ පිළිගන්නේ. අනෙක් කිසිම ආගමකට මේකට උත්තර නැහැ. ඉතින් අපි හිතනවා එවැනි දාර්ශනික සංවාදයක් දැන් එවැනිම එකක් වුණානේ මැතිතුමනි 1848 ගොගොල් කියලා පුජකයෙක් ඇවිල්ලා අර බුද්ධාගම සම්බන්ධයෙන් වැරදි ලිව්වට පස්සේ මිගෙට්ටුවත්තේ හාමුදුරුවෝ කල්පනා කළා දැන් මේකට මිනිස්සු සේනා සංවිධානය කරන්න බැහැ. හොඳම දේ බුද්ධිමය වශයෙන් සංවාද කරන එක. ඒ අනුව බයිබලය ගත්තා. ඒ පූජකයා ලියපු දේවල් වල වැරදි ටික පෙන්නුවා. වාද පහක් කළා. එක ගල් කැටයක් ගැහුවේ නැහැ, ලේ හැළුවේ නැහැ අපි පංචමහා වාදය ජයග්‍රහණය කෙරුවා. අදත් ඒ පදනම උඩ තමයි මේ අපි කටයුතු පවත්වන්නේ. ඉතින් ඒ වගේ මේ ඉස්ලාම් ප්‍රශ්නෙටත් උත්තරය තියෙන්නේ ඇත්ත වශයෙන්ම සංවාදය ඇතුලේ. මේකට වේදිකාව හදන්නේ නැහැ මේ පාලකයෝ. සමාවෙලා වුට්ට වෙලාවක් අපිට ඉඩ දුන්නොත් මැතිතුමාට මේ දරපු උත්සාහය තේරුම් ගන්න පුළුවන් වෙයි.

(අදාල වීඩියෝ දර්ශනය තිරයේ දිස්වීමට සලස්වයි)

****

FAIR COMMENT
BY JEZEEM

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ශි හේරත් මහත්මිය:</u>

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදි ස්වාමීන් වහන්සේ විසින් ගරු සභාවේ අවධානයට යොමු කරන ලද වීඩියෝ පටය ඇතුලත් CD තැටිය RGG 40 වශයෙන් සලකුණු කිරීම සඳහා ගෞරවයෙන් අවසර අයැද සිටිනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

RGG 40 යන CD තැටියේ අඩංගු ගරු ස්වාමිණි වහන්සේගේ කථාව ලිඛිතව සකස් කර කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට කොමිෂන් සභාවේ භාෂා පරිවර්ථකට නියෝග කරන අතර, එය එසේ කිරීමෙන් පසු RGG 40A වශයෙන් ලකුණු කරන බව සටහන් කර තබමි. ස්තූතියි ස්වාමීන් වහන්ස.

පි :මේකේ තව වීඩියෝ එකක් තියෙනවා ඒකත් බලලා හිටියොත් ලේසියේ තත්පර බොහොම වැටී වෙලාවක් තියෙන්නේ මැතිතුමනි. මොකද මේ කලින් දිනයේ කිව්වා පොඩ්ඩක් විකාශය කරන්න ඕන කියලා. මොකද කතෝලික නායකයන්ටත් ගිහිල්ලා අපි ඉල්ලීමක් කලා මේක ලොකු ප්‍රශ්නයක් වෙනවා අපිට පොඩි අවස්ථාවක් දෙන්න කියලා. ඒ අය ඒකට නිහතමානී වුනේ නැහැ ඒ වෙලාවේ.

(අදාල වීඩියෝ දර්ශනය තිරයේ දිස්වීමට සලස්වයි)

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ශි හේරත් මහත්මිය:</u>

ප්‍ර : අපේ හාමුරුවනේ මේ අවස්ථාවේ ඔබ වහන්සේ අවධානය යොමු කරන ලද කොටස මීට පෙර මෙම සභාවේ ඉදිරිපත් වුණු කථාවක තිබුණු කොටසක්ද?

පි : ඔව් මහරගම වීඩියෝ පටයම ඒ වීඩියෝ පටයේම තියෙනවා.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදි C636 වශයෙන් මේ වන විට සලකුණු කොට ඉදිරිපත් වී තිබෙන එම CD තැටියෙහි මේ අවස්ථාවේ ගරුතර ස්වාමීන් වහන්ස සභාවේ අවධානයට යොමු කරන ලද කොටස C636B වශයෙන් සලකුණු කිරීම සඳහා අවසර අයැද සිටිනවා.

ප්‍ර : හාමුදුරුවනේ පැහැදිලි කිරීමක් කිරීමට සටහන් වීම සඳහා මේ **C636B** කියන කොටසේ තිබෙන්නේ මොකක් ගැනද කියලා ඔබ වහන්සේගේ වචනයෙන් සඳහන් කලොත් මොකද සටහනට **CD**

FAIR COMMENT BY JEZEEM

තැටිය ඇතුල් වෙන්නේ නැති නිසා ඒ ගැන වචනයෙන් සඳහන් කලා නම් පහසුයි හාමුදුරුවනේ?

පි : මේ අන්තිමට කියපු වීඩියෝ එක නේද?

ප්‍ර : එහෙමයි අපේ හාමුදුරුවනේ.

පි : ඒක ඇත්තටම අපි එහෙම කිව්වේ ඒ අවස්ථාව වෙන කොට, අපේ සමුළුව තියෙන අවස්ථාව වෙන කොට කතෝලිකයන් බහුලව ජීවත් වෙන මීගමුව ඒ ප්‍රදේශවල විශාල ඔය අන්තවාදී මත දරන කණ්ඩායම් පැලපදියම් වෙලා හිටියා. ඒ වගේම පහසු තෝතැන්නක් වෙලා තිබුණා ඒ පරිසරය සංචාරක පුරවරයක් වීම මීගමුව ආදී ඒ ප්‍රදේශ. එතකොට ඕන කෙනෙකුට රිසි සේ වැඩ කටයුතු කර ගන්න පුළුවන් වැඩි අවධානයක් නැහැ. ඒ නිසා ඒ අර කතෝලික ක්‍රිස්තියානි ජනතාව අවදි කරන්න ඒගොල්ලන්ට මේ අවදානම පෙන්වා දීම සඳහායි ඒ ප්‍රකාශය කලේ ඒ සමුළුවේදී.

ප්‍ර : මොකක්ද හාමුදුරුවනේ කරපු ප්‍රකාශය?

පි : කිතු සේනාවක් හදා ගන්න කියලා කිව්වේ මේ ඉස්ලාම් අන්තවාදය ගැන තේරුම් ගන්න.

ප්‍ර : එහෙමයි හාමුදුරුවනේ.

****

<u>ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා:</u>

ප්‍ර : අවසරයි හාමුදුරුවනේ, ඔබ වහන්සේ වෙහෙසට පත් වෙලා ඉන්දැද්දි ප්‍රශ්න කිහිපයක් අහන්න ඕනේ, ඔබ වහන්සේ මෙතෙක් වෙලා ඊයේ, අද, පෙරේදා අද දීපු සාක්ෂිය සලකා බලාගෙන යන කොට හාමුදුරුවනේ, ඔබ වහන්සේගේ සාක්ෂියෙන් අනාවරණය වෙනවා, දැනෙනවා අවුරුදු 8 ක් තිස්සේ 2012 ඉදලා ඔබ වහන්සේ මේ පිළිබඳව දැනුවත් කරන්නට උත්සාහ කළා. දැනුවත් කළා ඒත් නිසි තැන්වලට ඒක ඔළුවට වැටෙන්නේ නැතුව ඇතියි කියන අදහස එනවා. ඔබ වහන්සේට හිතෙන විදියට දැන් මේ පිළිබඳව තීරණයක් ගත යුත්තේ දේශපාලඥයෝ නේද?

පි : අනිවාර්යයෙන්ම මොකද ඒගොල්ලෝ තමයි ප්‍රතිපත්ති සකස් කරන්නේ. ඒගොල්ලෝ තමයි තින්දු ගන්නේ.

ප්‍ර : එතකොට මේ දේශපාලඥයන්ගේ අවස්ථාවාදිත්වය හෝ බල ලෝභිත්වය නිසා ඔවුන් එවැනි තීරණ නොගත්තා යැයි කිව්වොත් ඔබ වහන්සේ මොනවද ඒ ගැන කියන්නේ?

පි : ඒගොල්ලන් එකක් හිතුවේ නැහැ මේ වගේ ප්‍රහාරයක් වෙයි කියලා අපේ රටේ. මොකද ඒ සියළුම දේශපාලන නායකයන්ට එක්කලා අපි ඉහත කී සියළු මුස්ලිම් නායකයෝ හරි ලහයි. එතකොට ඒ මුස්ලිම් නායකයෝ ඇසුරු කරනවා ඒගොල්ලෝ

FAIR COMMENT — BY JEZEEM

වෙන වෙන වැඩ. ඉතින් අර කරුණු හෙළිදරව් කරද්දීත් මේවා කුමන්ත්‍රණ එහෙම නැත්නම් මේ එක සමාජයක් වෙන විදියට අවුල් කරන්න මාන බැලීම වැනි එවැනි මානසිකත්වයන්ගෙන් නොබලා ඇත්ත වශයෙන්ම මේ කියන කරුණු අධ්‍යයනය කරන්න අවම තරමින් Monitoring Center එකක්වත් අවම තරමින් අපි ඒ වගේ දේවල් ඉල්ලුවා, එහෙමවත් එක සතයකුදු අපට එහෙම සහයෝගයක් ලබා දුන්නේ නැහැ ඇත්ත වශයෙන් මේවා විධිමත් විදියට ජනගත කරන්න හෝ ඒ අයව අවධානයට පත් කර ගන්න මේවා නිකම් හුදු දේශපාලන කාරණා පමණක් බවට පත් වුණා.

ප : දැන් හාමුදුරුවනේ මේ ඔක්කොම කියලා තියෙද්දි අවසානයේ බෝම්බ පුපුරලා මහා විනාශයක් සිද්ධ වුණා, දැන් ආපහු හැරිලා බලන කොට හැඟෙනවා, ඒ වගේම දැනෙනවා මෙය සම්පූර්ණයෙන්ම අවධානය යොමු නොකිරීම සහ නොසැලකිලිමත්භාවය නිසා සිද්ධ වෙච්ච බවක්?

පි : ඔව්.

ප : එතකොට ඔබ වහන්සේ මේ දේශපාලඥයන්ට මේ කොමිෂම හමුවේ කිසියම් පණිවිඩයක් දෙන්න කැමතිද, බලාපොරොත්තු වෙනවද?

පි : මට කෙටියෙන් කියන්න තියෙන්නේ මේ රටේ දේශපාලකයෝ බුදුනුත් රවට්ටනවා, අල්ලහ්ත් රවට්ටනවා, ජේසුත් රවට්ටනවා. ඉස්සෙල්ලාම මේ ආගමයි දේශපාලනයයි පටලගන්නේ නැතුව දේශපාලකයෝ දේශපාලනය කරන්න ඕනේ. ඒගොල්ලන්ට අවාසි වෙන කොට ආගම ඉස්සරහාට දා ගන්නවා හරි බෞද්ධයෝ කවුරුත් ඉතින් ඇත්තටම තේරෙන්නේ නැහැ මේක මොකක්ද කරන්නේ කියලා, මොකද මේගොල්ලෝ අවුරුදු 70 ක් කරපු සෙල්ලම අවසානේදී අපේ ජීවිත අපේ අනාගත පරපුර උපන්නූපන් දරුපැටව් විශාල අනතුරකට වැටිලා ඉන්නේ. ඉතින් ඒ නිසා දැන්වත් අපිට ඉඩක් හදාගන්න ලැබුනොත් ඇත්ත වශයෙන් මේ කොමිෂමට මේ සාක්ෂි දුන්නයින් පස්සේ මම නම් බලාපොරොත්තු වෙන්නේ නැහැ මේ ගැන කතා කරන්නවත්, ඒතරම් අපිට වෙහෙස කරයි. මොකද අපි වැළලෙනදාට ද්‍රෝහියෙක් කියලා වළලාදායි ඒක තමයි මේ රටේ දේශපාලනය. ඒක ධර්මපාලතුමාටත් වුණා. වීරත්වය කියන්නේ දෙයක් වුණාට පස්සේ හොටු හූරන එක නෙමෙයි. කඳුළු පෙරන එක නෙමෙයි, දෙයක් වෙන්න කලින් ඒවා දුරතියා දැකලා ඒවා නවත්වා ගැනීම සඳහා කැප කිරීම් කරන එක. ඇත්ත වශයෙන්ම මැතිතුමනි මාව

FAIR COMMENT BY JEZEEM

සිරගත නොකලා නම් ඔය ජීවිත 300 අනිවාර්යයෙන්ම බේරෙනවා.

ප : ඔබ වහන්සේ ඒක පැහැදිලි කරන්න?

පි : ඊට හේතුව තමයි මැතිතුමනි ඔබතුමාලා දකින්න ඇති පළමුවන ප්‍රහාරය කොච්චිකඩේ පල්ලියට එල්ල වුණාට පස්සේ එක මිනිත්තු 5 ක් ඇතුළත ආරක්ෂක අංශ දැනුවත් කළ බවට ප්‍රවෘත්තියක් අන්තර්ජාලයේ පලවුණා. අපි මේවා කිව්වා මේ ප්‍රහාරය ගැන කියලා. මිනිත්තු කිහිපයයි ගියේ, මැතිතුමනි ඇත්ත වශයෙන් අපි එළියේ හිටියා නම් ඔය රජයේ නායකයන්ට දැනුම් දුන්නයි කියනවා, පොලිස්පතිට ආදී වශයෙන් මේ ඔක්කොටම කිව්වායි කියනවානේ මේ සිද්ධිය. ඉන්දියානු බුද්ධි අංශ කිව්වා, වෙන වෙලාව කිව්වා, ඇතැම් බුද්ධි අංශ ස්ථානගත කරලා හිටියා සමහර පල්ලි ලඟ, මෙහෙම ප්‍රහාරයක් වෙන්න පුළුවන් බලන්න කියලා. අනිවාර්යයෙන් මම දන්නවා කොහෙන් හරි බුද්ධි අංශයෙන් අපිටත් මේක කියනවා හාමුදුරුවනේ මෙන්න මේ වගේ දෙයක් වෙන්න පුළුවන් කියලා. එහෙනම් නිසැකවම මම මොන දේකට මුහුණ දෙන්න බලාගෙන හරි මාධ්‍යය හමුවක් තියලා කියනවා මෙන්න මේ වගේ ප්‍රහාරයක් එන්න නියමිතයි කතෝලිකයනි යන්න එපා පල්ලි, ඒක වෙන්නත් පුළුවන් නොවෙන්නත් පුළුවන්. ඒක risk එකක්. හැබැයි මේ කතා කරන කවුරුත් risk එක ගන්නේ නැහැ. ඒ කියන්නේ ඒවට කියන්නේ කැප කිරීම්. තමන් උපන් ජාතිය වෙනුවෙන් කරන කැප කිරීම්. ඉතින් අපි කැප කිරීම් කරපු අය, අනිවාර්යයෙන් ඔය කැප කිරීමත් කරනවා මම එළියේ හිටියා නම්. එතකොට ඒ බුද්ධි අංශත් සමහර අයට දුන්නාමත් සමහරු බයයි, මේක නොවුනොත් හිරේ යන්න වෙයිද, එතකොට දානවා බොරු ප්‍රවෘත්තියක් සමාජගත කළා, භීතියට පත් කළා කියලා ඔන්න නීතියට බයයි. නමුත් අපි නීතියට ගරු කරනවා ඒක වෙනම කථාවක්. නමුත් එවැනි අවදානම් සහගත ඒවා ආපුවාම අපි ඒවා වළක්වගත්ත තැන් තියෙනවා. දැන් ගිංතොට සිද්ධියක් වෙනවා ගහගන්න හදනවා කියන කොට මම ටක් ගාලා ගාල්ලට ගිහිල්ලා මම මැදිහත් වුණා. මැදිහත් වෙලා ඒ ප්‍රශ්නේ එතනම නිව්වා. ගම්පොළ පෙරහැරට ගහන්න සැලසුම් ඒ ගැටුම ඇති වෙන්න හදන වෙලාවේ ගම් වටත් කරලා තව පොඩ්ඩකින් මුළු මුස්ලිම් ගමටම ගහනවා. අපි එක පැය ½ කින් ඒක නැවැත්තුවා. ඒවගේ හුඟක් සිද්ධීන්වලට අපි මැදිහත් වෙලා ඒවා නතර කරලා තියෙනවා. ඒවට කියන්නේ කැප කිරීම් කියලා. නමුත් අවාසනාවකට ඒ කැප කිරීම් කරන මිනිස්සුන්ට මේ රටේ ඉඩක් නැහැ, ඒක තමයි සත්‍ය කතාව.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : හාමුදුරුවනේ දැන් ඔබ වහන්සේ කියන විදියට ඔබ වහන්සේ මේ පිළිබඳව සෑහෙන්න දැනුවත් කළා, ඒ වගේම කිවයුතු තැන්වලට දැනුම් දුන්නා, ඒ අවස්ථාවේදි කවුරුත් ඒක ගණන් ගත්තේ නැති වුනත් ඔබ වහන්සේට දැන් වැටහෙනවා නේද ඔබ වහන්සේ කියපු දේවල් දැන් හිස් මුදුනෙන් පිළිඅරගෙන ඒ පිළිබඳව නැවත නැවත ඒ අය හිතන්න පටන් අරන් තියෙනවා කියලා?

පි : ඔව් නමුත් දැන් මේ ප්‍රහාරය නිසා ඉස්ලාම් තරුණයන්ගේ හිත් දුෂණය වෙලා තියෙනවා. අපේ රළු බසින් ඇමතුවේ සමාජයට ආදරයෙන්, කරුණාවෙන් මෛත්‍රියෙන් ඒ කියන්නේ ඒ පණිවිඩය ජනගත කරන්න වෙන ක්‍රමයක් නැති නිසා සද්දෙට කිව්වොත්, සන්ටාරය සද්දෙන් ගැහුවොත් තමයි හැරිලා බලන්නේ මොකක්ද මේ සද්දේ කියලා. ඒක කාටවත් සිත් වේදනා ගෙන දෙන විදියට නෙමෙයි අපි කතා කලේ. ඒවා hate speech නෙමෙයි. මිනිස්සුන්ට තියෙන භයානක අනතුරක් කළින් පෙන්වා දීම සඳහායි අපි එහෙම කතා කලේ. නමුත් මේ ප්‍රහාරයෙන් පස්සේ රටේ බොහෝ මුස්ලිම් තරුණයන්ගේ හිත් දුෂණය වෙලා තියෙනවා. ඒගොල්ලෝ කල්පනා කරනවා ඇත්තටම මේ මුස්ලිම් අයට පහර දෙන්නේ ඇයි ලෝකයේ, ඇයි මුස්ලිම් අය කොන් කරන්නේ, ඇයි අපිට ගරහන්නේ, ඇයි අපේ රැවුලට බණින්නේ, ඇයි අපේ ඇඳුමට බණින්නේ, ඇයි අපේ ගෑණුන්ට බණින්නේ එතකොට හරි ඉක්මන් ක්‍රියාමාර්ග නොගත්තොත් ඇත්ත වශයෙන්ම මේ මුස්ලිම් සමාජය අන්තවාදයට තල්ලු වෙනවා වැඩියි. මේ සමහර දේවල් දැන් උදාහරණයක් විදියට මැතිතුමනි, කූරගල සිද්ධිය ගැන කතා කරන්නේ මීට අවුරුදු 30 ට 35 ට කලින් ඉදලා. දැන් මාධ්‍යය වලින් ඒක උලුප්පා දක්වනවා කූරගල හරි මුහුදු මහාවිහාරය හරි කියලා. ඒ සිද්ධිය නිමා වෙන්න කලින් දෙවනගල ගැන කතා කරනවා. දැන් මේ පාලකයෝ තේරුම් ගන්න එපැයි මුහුදු මහා විහාරය, කූරගල, දෙවනගල, මාණික්කමඩුව ඔය ආදී වශයෙන් පුරා වස්තු අල්ලන් ඉන්න තැන් එහෙම ප්‍රශ්ණයක් තියෙනවා ඒක කමිටුවකට දැම්මා මොකක්ද මේකේ Solution එක. නැත්නම් එක එක සිද්ධිවලට මාධ්‍යය හරහා හොයන්න ගියාට පස්සේ මුස්ලිම් අය කල්පනා කරනවා යකෝ මේක මාර වැඩක් නේ මේ වීගෙන එන්නේ. ඒගොල්ලෝ අන්තවාදයට බොහොම ඉක්මනට තල්ලු වෙන්න පුළුවන්. ඉතින් ඒ නිසා ඒකයි මම කිව්වේ මේ සමහර දේවල් වලට දේශපාලන උත්තර නැහැ කියලා. මේක ඇත්ත ප්‍රශ්නයක් තියෙනවා අපි මේක විවෘතව කතා කරමු, මේ අපිට ග්‍රන්ථ ඇත්තටම මේ කොමිෂමට කැමැත්තෙන් ඉදිරිපත් වෙලා අපි හිතුවේමත් මේ හදිස්

FAIR COMMENT BY JEZEEM

කුර්ආනයේ ඉගැන්වීම් අපි සියල්ල දන්නේ නැහැ, සියල්ලම දත් කියලා අපි පිළිගන්නේ නැහැ අපිට වැරදි වෙන්න පුළුවන්. එතකොට අපිට වෙන වැරදිත් හදාගෙන මුස්ලිම් සමාජයත් එක්ක අපිට හොඳ සංවාදයක් හදා ගන්න පුළුවන් නම් කොයි කුර්ආනයද ඔයගොල්ලෝ පරිහරණය කරන්නේ. මේ හදීස්වලින් ඕගොල්ලෝ පිළිගන්න ඒවා මොනවද නැති ඒවා මොනවද ඒ ආදී වශයෙන් අර බුද්ධිමය සංවාදයකට ගිහිල්ලා මේ සමාජයන් දෙක අතර දේශපාලකයන් අතට මේක නොදී කාදිනල් තුමාත් මැදිහත් කරගෙන, ආගමික අනෙක් අපේ නායක හාමුදුරුවරු මැදිහත් කරගෙන ඒවගේම මේවා කියවන අය, හුඟක් වෙලාවට අපේ අය මේවා කියවන්නේ නැහැ, නිකම් මතුපිටින් Islam is peace කියනවා ඉස්ලාමය යනු සාමයයි, ඔව් ඔව් සාමය ආගමනේ කියලා ඔක්කොම දැන් මේ දේපාලකයෝ ගෙනල්ලා තියෙන්නේ ලෙඩ්බෙත් අපේ ආසනේ එක්කම සුදු රෙද්දක් දාලා එයත් මෙතන වාඩි කරනවා. මේගොල්ලෝ හිතනවා එහෙම වාඩි කළාම මේක හරි, ආගමික සහජීවනය ගොඩ නැගෙනවා කියලා. කුරුක්කලුයි ඔක්කොම එකට තිබ්බාම එකම සම ආසනවල තියලා පිරිකරක් දුන්නාම හරියි කියලා. එහෙම වෙන්නේ නැහැ. ඉතින් මෙතනින් බාහිරව මේ සමාජයන් අතර හොඳ සංවාදයක් සඳහා මොකද මේ ආගම කියන එක හරිම සංවේදී ඉන්ද්‍රියක්. හැමෝම තමන්ගේ ආගමට ආදරෙයි. ඉතින් ඒ සංවේදී කරුණු ඉතාම සීරුවෙන් සහ ඉවසීමෙන් තමයි ඒවා සාකච්ඡා කරන්න ඕනේ, අපි කෑ ගහලා මේ දේ කිව්වේ පියවර නොගත්ත නිසා. සාමාන්‍යයෙන් සමාජය හරහා හෝ මේවාට මතයක් හදලා ඒ තුලින් හරි ඒ සමාජ මතය බලයක් බවට පත් කරගෙන උත්තරයක් හොයන්න. ඉතින් ඒවට ඉඩ දෙන්නෙත් නැහැ මොකද ඇත්තටම මේ දේශපාලනය මහා පුදුම කාලකණ්ණි දේශපාලනයක් මේ රටේ තියෙන්නේ. ඒගොල්ලෝ එක්කෝ තමන්ගේ පැවැත්ම උදෙසා ප්‍රශ්න නිර්මාණය කරනවා. දැන් තෙල්දෙණියේ එහෙම සිද්ධියක්. මට හොඳින් මතකයි ඒ වෙලාවේ අගමැතිවරයාට ආවා විශ්වාස භංගයක්. තමන්ගේම පක්ෂය ඇතුලෙන්. එතකොට දිගන ගහන්න පටන් ගත්තා. සතියක් විතර ගැටුම. දෝශාභියෝගය යට ගියා දිගන ගොඩ ගියා. දිගනින් බේරුනා. සමහර පාලකයෝ තමන්ගේ පැවැත්ම උදෙසා සිද්ධින් නිර්මාණය කරනවා. එහෙම නැත්නම් ස්වයං සිද්ධිවලින් ඇති වන දේවල් වලින් තමන්ගේ දේශපාලන උවමනාවන්වලට පාවිච්චි කරනවා. මේවා විසඳන්න කැමති නැහැ ඒගොල්ලෝ කැමති ප්‍රශ්න වැඩිවෙන තරමට. ඒගොල්ලෝ කැමති ගෝරි වැඩිවෙන තරමට. එතකොට NGO ස්

FAIR COMMENT
BY JEZEEM

වලට වැඩ තියෙනවා, මාධ්‍යය හමු ඕන තරම් පවත්වන්න පුළුවන්. මේවා ඉවර කරන්න බලන්නේ නැහැ ඒක තමයි අපිට මෙතෙක් තියෙන කියවීම.

ප : අවසන් ප්‍රශ්නය හාමුදුරුවනේ මගේ ඔබ වහන්සේට මතක ඇති මේ ප්‍රහාර එල්ල වුණාට පස්සේ නවසීලන්තයේ, ඔස්ට්‍රේලියාවේ, ජපානේ වගේ රටවල්වල ඒ රටවල්වල හිටපු ඒ රාජ්‍ය නායකයෝ ප්‍රකාශ කරලා තිබුණා අපේ රටේ ඉන්නවා නම් අපේ නීතියට එකඟ වෙලා ඉන්නේ නැත්නම් මේ රටින් වෙන තැනකට යන්න කියලා බොහොම එඩිතර ප්‍රකාශයක්. දැන් ඔබ වහන්සේ ඒ වගේ රටවල රාජ්‍ය නායකයන් සමඟ අපේ රටේ ඇති වෙච්ච තත්ත්වය කොයි ආකාරයෙන්ද දකින්නේ?

පි : ගෙදර තාත්තා හයියට හිටියොත් තමයි ගේ රැකෙන්නේ. රටේ පත්වන නායකයා අපිට පාට අදාල නැහැ ඒ නායකයා, නායකයා සියළු දෙනාගේම නායකයා. එතකොට අපේ රටේ තවමත් අපි මේ කතා කලාට මැතිතුමනි එක නීතියක් මේ රටේ නැහැනේ. නීති ගොඩයි. ඉතින් එක නීතියක් නැති රටක අයාලේ යන ජාතියක්. අයාලේ යන දේශපාලකයෝ. ඉතින් රුසියාවේ පූටිං ජනාධිපතිවරයා කිව්වා මෙහේ තියෙන්නේ එක නීතියයි. ඒ නීතියට ඉන්න පුළුවන් අය ඉන්න බැරි අය යන්න. ඔස්ට්‍රේලියාවේ ජූලියාගිලාඩ් එක කිව්වා බය නැතුව. ප්‍රංශයේ මාරියා ලුපේන්ල වගේ අය පලවෙනියෙන් ඇවිල්ලා එක දෙයි කිව්වේ. මෙහේ ෂරියා මෙහේ අභ්‍යාස කරන්න දෙන්න බැහැ. පළවෙනි වටයේම 5% ක් ජන්ද ගත්තා ප්‍රංශයේ. ඒවගේම ඩොනල්ඩ් ට්‍රම්ප් වැනි නායකයෙක් ජාතික වාදී රැල්ලකින් අපි වගේ නෙමෙයි නිර්දය විදියට ඒක විවේචනය කරලා ඒක රටක් හදනවා කියලා පටන් ගත්තා. අසල්වැසි ඉන්දියාවේ කෝටි 30 ක් මුස්ලිම්වරු ඉන්නවා. හැබැයි නරේන්ද්‍ර මෝදි මැතිතුමා හින්දු සමාජයට ආමන්ත්‍රණය කලා ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන් දැඩි පියවරක් ගත්තා. බහුතර හින්දුත්වයෙන් ඔහු ජයග්‍රහණය කළා. අද නීති පනවනවා. ප්‍රාන්ත වශයෙන් ප්‍රාන්තවල නීති හුඟක් හදලා තියෙනවා. එහේ කාති උසාවි බැහැ. දික් කසාදය සම්බන්ධයෙන් එක නීතියයි. ඉතින් ඒ විදියට ලෝකේ හැසිරෙද්දි අපේ රටේ මන් දන්නේ නැහැ මේ තටමන්නේ මොකද කියලා.

****

FAIR COMMENT
BY JEZEEM

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>

ප්‍ර : ස්වාමීන් වහන්ස මගේ මුල්ම ප්‍රශ්නය බුද්ධි අංශ, ඔබ වහන්සේ රක්ෂණ භාරයේ හිටියේ නැත්නම් බුද්ධි අංශ විසින් ඔබ වහන්සේට මේ පිළිබඳව දැනුම්දීමට හැකියාවක් තිබෙන බව ප්‍රකාශ කළා නේද?

පි : එහෙමයි.

ප්‍ර : එයින් අදහස් වන්නේ බුද්ධි අංශ මෙම පාස්කු ප්‍රහාරය පිළිබඳව දැනුවත්වී සිටි බව නේද?

පි : අනිවාර්යයෙන්ම. මොකද මැතිතුමනි පොඩි වචනයක් කිව යුතුයි. මොකද මැතිතුමනි අපේ රටේ බුද්ධි අංශය ඇත්තටම ලෝකේ වෙනත් බුද්ධි අංශවලට සම කල නොහැකියි. ඊට හේතුව පරාජය කරන්න බැහැ කියපු LTTE ය වගේ එකක් පරාජය කරන්න තරම් ශක්තිමත් බුද්ධි අංශයක්. එතකොට ඒ බුද්ධි අංශයම ඔය එක එක රාජ්‍ය නායකයන් යටතේත් හිටියා. හැබැයි නායකත්වය තමයි වැදගත්. කවුරු හෝ නායකයෙක් ඒ අණදීම අනුව ඒගොල්ලන් රැකබලා ගන්නා වූ ආකාරය අනුව තමයි ඒගොල්ලන්ගේ ක්‍රියාකාරකම් සිද්ධ වෙන්නේ. ඉතින් බුද්ධි අංශ මේවා සියල්ලම දැනගෙන සිටියා.

ප්‍ර : එසේ නම් බුද්ධි අංශ මෙම ප්‍රහාර නොවැලැක්වීම සම්බන්ධයෙන් වගකිව යුතු බවද ඔබ වහන්සේ කියන්නේ?

පි : බුද්ධි අංශවලට ..

ප්‍ර : දැනුවත්ව සිටියා නම් ?

පි : බුද්ධි අංශයක් කියන්නේ රටක ජීවනාලිය. හදවත වගේ. ඒගොල්ලෝ නෙමෙයි හැබැයි නියෝග දෙන්නේ. ඒගොල්ලන් කියන්නේ මෙන්න මෙහෙම දෙයක් වෙනවා කියලා අදාල නායක කාරකාදීන්ට දැනුම් දෙනවා. දේශපාලනය උඩට පණිවිඩය ගෙනියනවා SIS හරි හමුදා බුද්ධි අංශය, පොලිස් බුද්ධි අංශය, NIB එක ආදී වශයෙන් ඒ බුද්ධි අංශ නායකයින් හරහා රටේ නායකයන්ට කියනවා. Security Council එකේ මේක කතා කරනවා. ඊලඟට ඒගොල්ලන් වාර්තා කරනවා එච්චරයි. ඉතින් ඒ වාර්තා කල බවට පස්සේ මාධ්‍යයවලින් වාර්තා වුණා.

ප්‍ර : ඔබ වහන්සේ කිව්වා බුද්ධි අංශවලින් දැනුවත් වෙන්න තිබ්බා කියලා, එහෙම බුද්ධි අංශවලින් පිටස්තර දැනුවත්වීම් කරනවද කියන එක?

පි : අපිට මැතිතුමනි ඇත්ත වශයෙන් දැන් අපි සමාජ ක්‍රියාකාරකම්වල යෙදෙන කොට සාමාන්‍යයෙන් ක්‍රමයක් තමයි කවුරුන් හෝ බුද්ධි අංශවලට සම්බන්ධ කවුරුම හරි අපි ලඟ සමීප කරනවා. සමහර විට ඒගොල්ලෝ අපිට මේක කියනවා. කියන්නේ එයා අපි

FAIR COMMENT BY JEZEEM

දන්නේ නැහැ බුද්ධි අංශ කියලා. සමහර වෙලාවට document එකක් ගෙනල්ලා දෙනවා. සමහර වෙලාවට හාමුදුරුවනේ පොඩි පණිවිඩයක් තියෙනවා කෝල් එකක් ගන්න කියලා අරන් දෙනවා. ඔහු අපේ සමීපතම කෙනෙක්. අපි දන්නේ නැහැ ඔහු බුද්ධි අංශයද කවුද කියලා. නමුත් සිද්ධිය වෙන කොට ඇත්ත. ඉතින් ඒ බුද්ධි අංශයත් බලනවානේ අපි මොකටද මේ කෑ ගහන්නේ, අපි මොකටද මේ සංවිධාන හදන්නේ, අපි කවුරුත් එක්ක ද සම්බන්ධකම් තියෙන්නේ, අපි කොහේටද යන්නේ එන්නේ, මොකද මේ පාලකයෝ කියන අය ඉන්නේ බයෙන් නේ. අපි කොයි පැත්තකට හැරෙයිද, ඒගොල්ලන්ට අභියෝගයක් වෙයිද, ඒගොල්ලන්ගේ දේශපාලනයට මොකක් හරි අගතියක් වෙයිද, ඒ ආදී වශයෙන් නිසා ඔය හැම කොයි ආණ්ඩුත් මොනවා හරි සමාජයේ කැපී පෙනෙන භික්ෂූන් හෝ කවුරු හරි සමාජයේ ගැටෙන කවුරු හරි එනවා නම් ඒගොල්ලන් ගාවට අනිවාර්යයෙන් සම්බන්ධ කරනවා. ඉතින් කොහොම හරි මේක දැනෙනවාමයි. එහෙම කලින් අවස්ථාවලත් අපිට යම් යම් දේවල් දැනුවත් කරලා තියෙනවා.

ප්‍ර : ස්වාමීන් වහන්ස ඔබ වහන්සේ සාක්ෂි දෙන මුල් අවස්ථාවේදිම කිව්වා ක්‍රිස්තියානි ආගමට බෞද්ධයන් හැරවීමේ ව්‍යාපාරයක් තිබුණා කියලා. එයට කටයුතු කලා කිව්වා ක්‍රිස්තියානි ආගම, ඒ ක්‍රිස්තියානි ආගමේ මොන නිකායන්ද ඒ සම්බන්ධව කටයුතු කලේ?

පි : නිකායන් හැටියට ඇත්ත වශයෙන්ම ඒවා අමුතු නම් වලින් තියෙන්නේ. ඒවට කියන්නේ ඉවෙන්ජලිකල් ව්‍යාපාරය කියලා. ක්‍රිස්තියානි ඉවැන්ජලිකල් ව්‍යාපාරය අපි කියන්නේ. ඒ ක්‍රිස්තියානි ඉවැන්ජලිකල් ව්‍යාපාරය 2003 අවුරුද්ද වෙන කොට තිබුනේ 103 යි දැන් ඒ ප්‍රමාණය 455 දක්වා වර්ධනය වෙලා තියෙනවා. අපි අර ඉදිරිපත් කරපු බුද්ධ ශාසන කොමිෂන් සභා වාර්තාවේ ඒ ඔක්කෝගෙම නාම ලේඛනය තියෙනවා මැතිතුමනි. එතකොට ඒ අය ඇත්ත වශයෙන්ම කතෝලික සාම්ප්‍රදායික අපේ කතෝලික සහෝදරයන්ට විශාල අභියෝගයක්. බෞද්ධයන්ට කලින් ඒගොල්ලෝ තමයි දැන් අර බලන්න අර ඒක විනාශ කරන හැටි දැන්. කතෝලික පල්ලියේ පියතුමාට තියෙනවා අධිකාරී බලයක්. මේ තමයි මගේ මීසම, මගේ මීසමේ ඉන්නවා කතෝලික පල්ලියට සම්බන්ධ පවුල් 45 ක්, ඒගොල්ලන්ගේ ඇවතුම් පැවතුම් මේවයි, ඒගොල්ලන්ගේ ආර්ථික මට්ටම , මේවා ඔක්කොම දන්නවා පියතුමා. ඉවැන්ජලිකල් ව්‍යාපාරය කියන්නේ ඒ ජේසුතුමාම ඉස්සරහාට දාගෙන ඇවිල්ලා ඒගොල්ලෝ කියනවා

FAIR COMMENT BY JEZEEM

අපි පිළිම වඳින්නේ නැහැ, අපි සංගීතේ මොකද දැන් හරියට සරලව උදාරහණයක් කිව්වොත් ක්‍රිස්තියානි ව්‍යාපාරයේ උන් බෙහෙත් ගන්නේ නැතුව මැරෙනවා, මුමරාගෙන මැරෙනවා දෙවියන්ට. අන්තවාද දෙක. දැන් ඒ ඉවැන්ජලිකල් ව්‍යාපාරයේ උදවිය බෙහෙත් ගන්නේ නැහැ. දැන් ඒ වගේ මරණ සෑහෙන වාර්තා වුණා මේ රටේ. එතකොට ඒ අය කරන්නේ කතෝලික අර සාම්ප්‍රදායික කතෝලික උදවිය ලඟට ගිහිල්ලා කියනවා ඕක වැඩක් නැහැ මේ ෆාදර්ස්ලත් එක්ක ඕක නෙමෙයි නියම මෙන්න මේක තමයි නියම කියලා අර බෝතලේන් ව්‍යාපාරයට කැඳවනවා. ඒකේ නඩුකාරවරු ඉන්නවා විශාල ප්‍රමාණයක් ලංකාවේ හැරිලා, ඉහළ මට්ටම්වල හුඟක් අය නීතිඥ මහත්වරු ඉන්නවා

ප්‍ර : තවමත් එය ..?

පි : ඒක මැතිතුමනි හරිම ඒක මුස්ලිම් එකට එහාට ගිය එකක්. ඉහුවා විටනස් වගේ. මොකද ඒගොල්ලෝ ඉහළ තලේ මිනිස්සුන්ව තමයි ස්පර්ශ කරන්නේ.. දැන් ඔය මෑත කාලේ කියවුණා ඔය cricket team එක ගැන. ඒ වගේ අපි දන්න සමහර අපි විශ්වාස කරපු හොඳ නීතිඥ මහත්වරු එහෙම වෙලා තියෙනවා, නඩුකාර මහත්වරු එහෙම වෙලා තියෙනවා. වෛද්‍යවරු ටිකක් මේ tension එක වැඩිපුර අය මම දන්නේ නැහැ මොන හේතුවෙන් හරි ඉවැන්ජලිකල් එකට යනවා වැඩියි.

ප්‍ර : දැන් ඔබ වහන්සේගේ බොදුබල සේනා සංවිධානය මගින් එම ක්‍රියාමාර්ග නැවැත්වීම සඳහා ක්‍රියාමාර්ග අරන් තියෙනවද?

පි : අපි මැතිතුමනි අපි ඉතින් තරුණ කාලේ නම් ටිකක් ඔය රැඩිකල් විදිහට හැසිරුනා. බොරු කියන්න බැහැනේ භික්ෂූන් වහන්සේලා හැටියට. අපි යනවා ගිහිල්ලා ගහලා පන්නනවා. එහෙම දේවල් කලා. නමුත් අපි බුද්ධිය වැඩි දියුණු වීමත් එක්ක අපි අත්දැකීම් ලබන කොට අපි ඒවා අදාල වගකිව යුත්තන්ට ගිහිල්ලා කියලා මේක සිද්ධ වෙන්න දෙන්න එපා කියන තැනට අපි සෑහෙන්න මහන්සි ගත්තා ඒක නතර කරන්න. ඒකට හේතුව තමයි ඒ ක්‍රිස්තියානි මූලධර්ම වාදීන්ව නිර්දෙය විවේචනයට ලක් කරන කොට අපේ කතෝලික සාම්ප්‍රදායික මිනිස්සුන්ගෙත් හිත් රිදෙනවා. මොකද අපේ සාමාන්‍ය මිනිහා දන්නේ නැහැනේ කතෝලික කවුදා මොකද ඔක්කොම එන්නේ කුරුසේ ගහගෙනනේ. එතකොට අපි ඇඟිල්ල දික් කරන්නේ මූලධර්මවාදීන් දෙසට. හැබැයි ඇඟිල්ල වදින්නේ කතෝලික සාම්ප්‍රදායික සමාජයට. එතකොට ඒ මිනිස්සු එනවා අපිත් එක්ක අනේ මේ හාමුදුරුවෝලා අපිට මේගොල්ලෝ කතෝලික අපිටත්

FAIR COMMENT — BY JEZEEM

ගහනවානේ කියලා. ඉතින් මේ අන්තගාමී කණ්ඩායම් කරන මේ වැඩ වලින් ඇත්තටම මේ සමාජ පද්ධතියම බිඳ වැටෙනවා. ඒවට නීති ගේන්න කියලා අපි 2000 ඉදලා උද්ඝෝෂණ කළා, උපවාස කළා, බුද්ධ ශාසන අමාත්‍යාංශය ගිහිල්ලා වැටලුවා, ඒකේ ප්‍රතිඵලයක් විදියට එවකට බුද්ධශාසන අමාත්‍ය විජමු ලොකුබණ්ඩාර ඇමතිතුමා බුද්ධශාසන ඇමතිවරයා හැටියට කමිටුවක් හදන්න කියලා කමිටුවක් කැඳෙව්වා 31 දෙනෙක් ගෙන් යුක්ත. මම ඒ කමිටුවේ හිටපු ලාබාලම සාමාජිකයා. ඉතින් පාර්ලිමේන්තුවට භාමුදුරුවෝ 9 දෙනෙකුත් ගියා මේ පනත හදන්න ඕන කියලා. නමුත් අවාසනාවට ඒ පනත ගේන්න දුන්නේ නැහැ.

දැන් වේලාව : දැන් වේලාව ප.ව. 8.40 යි
මෙතැන් සිට ල/ලේ :- මුතුමාලි මෙනවිය විසින් සටහන් කරයි.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව : ප.ව.08.40
පෙර සටහන් ල/ලේ : ධම්මිකා මිය.
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : ඒ අන්‍යාගමික පනතෙන් බලාපොරොත්තු වුණේ මොකක්ද කරන්න?

පි : ඒ කියන්නේ මැතිතුමනි දැන් සාම්ප්‍රදායික බෞද්ධ ගමකට අපි කවුරුහරි එනවා ක්‍රිස්තියානි කෙනෙක්. ඒ ගොල්ලො පල්ලියක් හදන්නේ නැහැ. ඒ ගොල්ලො ගෙයක් කුලියට ගන්නේ. ගෙයක් කුලියට අරගෙන හැන්දෑ වෙනකොට හෝ සමහර වේලාවට සතියට දවස් තුනක් හතරක් පිට පළාත්වලිනුත් නන්නාදුනන අය කැඳවනවා. ගෙනල්ලා ඒ ගොල්ලෝ කරන්නේ එක්කෝ Drum set ගහනවා. එහෙම නැත්නම් හයියෙන් අපි අපේ භාෂාවෙන් කිව්වොත් මේ බජව් දානවා. ඉතින් ඕක දරාගෙන ඉන්න බෑ අල්ලපු ගෙදර මිනිහාට මොන විපාකයක්ද මේ කියලා . ඉතින් ඔන්න ළඟ ළඟ පවුල් ටික සංවිධානය වෙනවා. ඒ ගොල්ලන් ගිහිල්ලා මේ ගොල්ලො ඉස්සෙල්ලා විපරම් කරනවා කවුද ඔය . නෑ අපි අහවල් ආගමේ. එතකොට මේක ගිහිල්ලා පන්සලේ හාමුදුරුවන්ට කියනවා. හාමුදුරුවෝ බලනවා පණිවිඩයක් යවනවා ඒකත් care කරන්නේ නෑ. ගණන් ගන්නේ නෑ. ඒ පාර ගිහිල්ලා මිනිස්සු කියනවා මොකක්ද හාමුදුරුවනේ මේක ඔබ වහන්සේට තේරෙන්නේ නැද්ද කියලා. සාමාන්‍ය ගම්වල මිනිස්සුනේ මේ මිනිස්සු හාමුදුරුවොත් එක්ක යනවා අර ගේ කුලියට ගත්ත තැනට. අන්න ඒ පින්තූරේ යවනවා අර එන්ජියෝකාරයන්ට. ඒ ගොල්ලො මොකද කරන්නේ ගහගන්නවා පින්තූරේ. අන්න ජිනියා වලටද බටහිර ලෝකයට යුරෝපයට යනවා මෙන්න බෞද්ධයෝ Violent අපිට ආගම අදහන්න දෙන්නේ නෑ. ඒ චිත්‍රය හදනවා. ඊට පස්සේ පොලිසියට ගිහිල්ලා පැමිණිල්ලක් කරනවා මේක මොකක් හරි කරලා දෙන්න පොලිසියෙන් කියනවා හැමෝටම ආගම ඇදහීමේ අයිතිය තියෙනවා. ඒ ගොල්ලන්ට ඒ ගොල්ලන්ගේ ආගම පාඩුවේ කරගෙන යන්න දෙන්න. මොකද නීතියක් නෑ. අපි විරුද්ධ වෙන්නේ මැතිතුමනි ඕනෑම කෙනෙකුට ඕනෑම කෙනෙකුට මට උනත් මට මේ වැඩක් නෑ මේ බුද්ධාගම මේකේ මොකක් වත් නෑ කියලා ඕන්නම් ඉස්ලාම් ආගමට යන්න පුළුවන්. ඒ කියවලා තමන්ගේ දැනුම හදාගෙන මට ඒක Comfortable නම්

FAIR COMMENT BY JEZEEM

එතෙන්ට යන්න පුළුවන්. හැබැයි කවුරුහරි සිතීමේ නිදහසට බාධා කරලා වරප්‍රසාද දීලා සාදාචාර විරෝධීව ඒක කරනවා නම් අන්න ඒකට තමයි අපි විරුද්ධ වුණේ.

ප්‍ර : මම ස්වාමීන් වහන්සේගෙන් ඇහුවේ අන්‍යාගමික පනතට යෝජනාවලියක් ඔබ වහන්සේලා බොදුබල සේනාව මඟින් සකස් කරලා ඉදිරිපත් කළාද?

පි : බොදුබල සේනාව මඟින් නොවේ මැතිතුමනි ජාතික හෙළ උරුමය හැටියට අපි ඒ පනත සකස් කළා. පාර්ලිමේන්තුවටත් ගෙනාවා. නියාය පුස්තකයටත් දැම්මා. එතනින් පස්සේ අතුරුදහන්.

ප්‍ර : ඒ පිටපතක් ඔබ ගාව තියෙනවාද?

පි : පිටපතක් ඉදිරිපත් කරන්න පුළුවන්.

ප්‍ර : එය ඉදිරිපත් කරන්න පුළුවන් නම්.

පි : පුළුවන්.

ප්‍ර : ඊළඟ ප්‍රශ්නේ ඔබ වහන්සේලා 2016 වර්ෂයේදී කාදිනල්තුමා සමඟ ත්‍රස්තවාදය සම්බන්ධයෙන් කාදිනල් නිවසේදී සාකච්ඡාවක් පැවැත්වුවාද ඔබ වහන්සේ කලින් කිව්වා?

පි : ඔව් දිනේ මතක නෑ මැතිතුමනි ඒ ආසන්න වසරේ මේ ඔය කියන කාල සමයේ කාදිනල්තුමා මුණ ගැහිලා විශේෂයෙන්ම ඔය මීගමුව පෙරියමුල්ල ආදී ප්‍රදේශවල ගොඩ නැගෙමින් තියෙන තත්ත්වයත් ඔය සතකුප්පාදිය ගෙනල්ලා මට දහවල් කාලයේ අමතක වුණු ඔය කෑම රස කරන රසකාරකයක් සතකුප්ප කියලා කියන්නේ. ඒකෙන් අද විද්‍යාඥයෝ හොයා ගෙන තියෙනවා ආහාර සම්බන්ධයෙන් ගවේෂණය කරන සතගුප්ප පාවිච්චි කරපුවාම දරු උපත් නැතිවෙනවා කියලා. ඔය වදබෙහෙත් වද බෙහෙත් කියලා කතා කෙරුවේ සතගුප්ප සම්බන්ධයෙන් කතා කරපුවාම. ඉතින් මේ ගැන ටිකක් විපරම් කර බැලීම වැදගත් කියලා තමයි මේ කාදිනල්තුමා එක්ක කතා කළේ. අපි එතුමාගෙන් ඉල්ලුවා මම මට හලාවත ඉඳලා ජාඇල දක්වා ඉන්න කතෝලික පියවරු ටික මුණගස්සලා දෙන්න මේ ඉස්ලාම් අන්තවාදය කියන්නේ මොකක්ද මේ කවුද සෝමාලියාවෙන් එන්නේ කවුද මේ පකිස්ථානයෙන් ඇවිල්ලා ඉන්න කණ්ඩායම් මේ අහමදීයා මුස්ලිම් කට්ටියද කවුද කින්ද මන්ද කියලා අපි හොයා බැලිය යුතුයි කියලා

ප්‍ර : එහි ප්‍රතිඵලයක් ලැබුණාද?

පි : ඇත්ත වශයෙන්ම එතුමා බොහොම මං හරිම ගරු කරන ආගමික නායකයෙක් එතුමා පිළිගන්නවා මේක සිංහල බෞද්ධ රටක් කියලා සහ අපි සතුටු වෙනවා සිංහල මිනිහෙක් කාදිනල් වගේ තනතුරකට පත් වීම ගැන. එතුමා කිව්වා හාමුදුරුවනේ ඔව්

FAIR COMMENT BY JEZEEM

අනිවාර්යෙන්ම අපි ඒක කරමු කියලා එතුමා මට වෙන යෝජනාවක් කළා. මොකද අපි අර විපත්ති නවයක් ගැන කතා කරපු හින්දා ඔය වන්දාකරණය ගැන තමයි එතුමාගේ වැඩි අවධානය තිබුණේ ඒ වේලාවේ. එතකොට අර ප්‍රහාරය වෙලා තිබුණේ නැහැනේ. වන්දාකරණය සම්බන්ධයෙන් කතා කළා එතුමා. එතුමා අපිට CD පටයකුත් ලබා දීලා කිව්වා ඔබ වහන්සේලා මේ නීති විරෝධී ගබ්සාව සම්බන්ධයෙන් හාමුදුරුවනේ වැඩිපුර කතා කරන්න කියලා අපි ඒ වගේ සංවාදයක නියැලීලා ආවා. ඉතින් අපිට මුහුණ දෙන්න තිබුණු මුහුණු දෙන්න වුණු ඇතැම් අත්දැකීම් එක්ක ඊට පස්සේ ඒ සංවාදය ඉස්සරහාට ගෙනියන්න බැරි වුණා.

ප : ඔබ වහන්සේගෙන් ඊළඟට අහන ප්‍රශ්නය ඔබ වහන්සේගේ කථිකාවත ඇරඹුමේ 17 වෙනි පිටුවේ

පි : එහෙමයි.

ප : සඳහන් කරලා තියෙනවා නවුහිද් ජමාත් සංවිධානය පිටුපස්සේ ඉන්නෙත් රිෂාඩ් බදුර්දීන් කියලා 2014.04.24 වෙනිදා රිවිර පත්තරේ?

පි : ආ... ඔව්.

ප : දැන් කොමිෂන් සභාවට පැහැදිලි කරන්න විස්තරාත්මකව කොහොමද මේ සම්බන්ධය ඇති වුණේ මොකක්ද කියන එක මෙය ඉතා වැදගත් වෙනවා? ඔබ වහන්සේ මේ සම්බන්ධයෙන් සියළුම දේ දන්නවා ඇති කියලා මාධ්‍ය මඟිනුත් කියලා තියෙනවා?

පි : ඔව්.

ප : ඉතින් අපි ඒ නිසා බලාපොරොත්තු වෙනවා සියළු දේ කියන්න කියලා?

පි : දැන් මේ මැතිතුමනි ඇත්තටම මම මේ පත්තරවලට කරපු ප්‍රකාශ ඒ කාලේ. 2013, 2014, 2013 ආදී වශයෙන් 2012 මේ ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන්ම කතා කරපු කරුණු. එතකොට

ප : 2014.04.24 රිවිර?

පි : රිවිර දැන් අපේ මැතිතුමනි අපිට විශාල ගැටලුවක් තිබුණා සිංහල නායකයන්ට කියනවා මේ ගොල්ලො අහන්නේ නැහැ. නමුත් රිෂාඩ් බදුර්දීන් මහත්මයාගේ හැසිරීම ඔහු ඒ ගොල්ලන් ප්‍රසිද්ධියේ ඒවා කියන්නේ නෑ. ඒගොල්ලො ඉතින් හරි දේශපාලකයොනේ. ඒ ගොල්ලො මම අර ඉස්සෙල්ලා කිව්වා වගේ අල්ලාහ්ත් රවට්ටනවා. බුදුනුත් රවට්ටනවා ආදී වශයෙන්. ඔය මන්නාරමට ගියපුවාම එක ඇමතිවරයෙක්ගේ පුතෙක්. ශීත මාළු කල්තබා ගැනීමට ශීතාගාරයක් හදන්න ඔහුගේ චණ්ඩි

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ඇවිල්ලා ඒ එක්තරා ආගමික කොටසක් ඇවිල්ලා බෙල්ල කපා ගන්නේ නැතුව මෙහෙන් පලයන් කියලා තිබුණා. ඔය විදිහට මඩකලපුවේ, මන්නාරමේ, වව්නියාවේ, පුත්තලමේ විතරක් නෙවෙයි අම්පාරේ මේ ආදී ප්‍රදේශවල රීෂාඩ් බදුර්දීන්ගේ වත්කම් එක්ක බොහෝ තැන්වල ඔහු කඳවුරු නිර්මාණය කළා. අපි කියනවා cells හදනවා එයාගේ දේශපාලන ව්‍යාපෘතිය සඳහා. ඔහු නොනිල මට්ටමේ ත්‍රස්තවාදියෙක් කියන්න බෑ. හැබැයි ඒ ත්‍රස්තවාදී වැඩපිළිවෙලට නියමින් හෝ අනියමින් අනුබල දුන්න කෙනෙක්. දේශපාලන රැකවරණය ලබා දෙමින් ඒ වගේම මුදල් ආදීය ලබා දෙමින් ඔහු බරපතල විදිහට අපි විශ්වාස කරනවා ඔහුට නිවැරදි වෙන්න පුළුවන් අපි අපිට චෝදනා කරන්න පුළුවන් ඔහුට නිවැරදි වෙන්න පුළුවන් හැබැයි අපි බරපතල විදිහට විශ්වාස කරනවා කොහොමද රීෂාඩ් බදුර්දීන් මේ තරම් කෙටි කාලයක් ඇතුළේ මේ වගේ තත්වෙකට ආවේ. එහෙම කියන්න මට හේතු තියෙනවා මැතිතුමනි මොකද මුලින්ම විල්පත්තුවට කරපු සංහාරය මේ රටට හෙළි දරව් කළේ මම. මුලින්ම කිසිම මාධ්‍යයක් කිසිම පාලකයෙක් මොනම සංවිධානයක්වත් මේක කතා කළේ නෑ. මුලින්ම මේ විල්පත්තුවට කරන විනාශය අපි දැක්කට පස්සේ අපි වෙනම විඩියෝ කණ්ඩායමක් යවලා විඩියෝ ගත කර ගෙන ආවා. පැයකට අඩු කාලයකදී පැය එක හමාරක් වගේ කාලයකදී මදුරෙයි ඉඳලා කෙනෙකුට පීනා ගෙන එන්න පුළුවන් තරම් ඉතාම හොඳ ගැඹුරු රළ නැති මුහුදු තීරයක් තමයි විල්පත්තුව දක්වා තියෙන්නේ. ඔය කුවේණිය කපු කටපු ඇයගේ මාළිගාව තාම තියෙනවා විල්පත්තුව ඇතුලේ. ඒක ඓතිහාසික තැනක්. විල්ලු දහස් ගණනක් තියෙන කලාපයක්. එතකොට කිසිම ඒ කියන්නේ ඒ කාලේ ජාතික ආරක්ෂාව කොච්චර හොඳට තිබුණත් මොහු ඒ සියල්ලම වහලා ජාතික ආරක්ෂාවට බරපතල තර්ජනයක් මුහුදු තීරය කියලා කියන්නේ. ඕන වේලාවක අර බංගලිදේශයෙන් හෝ පකිස්ථානයෙන් හෝ ඉන්දියාවෙන් ටක් ගාලා බහින්න පුළුවන් ඕන තරම් කණ්ඩායමකට. අපි එතනින් තමයි මොහු ගැන සැක හිතන්න පටන් ගත්තේ. එතකොට ඒ ප්‍රේරණ කලාපය කියලා තිබුණු ඒ ඔක්කොම අක්කර ගාණක් දිගට කපලා ජාසිම් සිටි නමින් හදලා අඩි 20 පාරවල් අඩි 20 ක පාරක් ගෙවල් 40 ක් තියෙනවා පල්ලියක් තියෙනවා ආයේ අඩි 20 ක පළල පාරක්. ආයේ ගෙවල් 40 ක්. ඒකේ පල්ලියක්. ආයේ ගෙවල්. ආයේ අඩි 20 ක පාරක්. ඔය විදිහට බලපුවාහම එකම කලාපයක්. අපි හෙළිදරව් කළාම මොහු මොකද කළේ නීතිය තමයි ගේන්නේ. මට අපහාසයක් වුණා කියලා මට දැම්මා

FAIR COMMENT BY JEZEEM

මිලියන 500 ක නඩුවක්. මේ හෙළිදරව්ව ඔහුට අපහාසයක් වුණාලු කීර්ති නාමේට . එතකොට ඒ වෙනකොට ඒ පළාත්වල හිටපු අය මුස්ලිම් ජනතාව අහිංසක මුස්ලිම් මිනිස්සු ගෙනල්ලා දුන්නා මෙන්න අපේ දේපළ අල්ලා ගත්තා අක්කර 3000 ක ඔප්පු ගෙනල්ලා දුන්නා. ඔහු අල්ල. ඒ සල්ලි කොහෙන්ද. ඒ සල්ලි හම්බ වුණාම සල්ලිකාරයන්ට හා මේ ඇමතිකම හැමදාම මේක රසවිදින්න එපැයි. එතකොට ඔහු ඔහුගේ යාන්ත්‍රණය හරිම ශක්තිමක් විදිහට හැදුවා. ඔහු වහාබි කාරයෙක් කියලා ඔප්පු කරන්න පුළුවන් පින්තූරයක් මගේ ළඟ තියෙනවා. අරාබි වහාබි දර්ශනය තුළ ඉන්න කෙනෙක් කියන්න. ඔහු ඡන්දය පාවිච්චි කරන්න එන වේලාවේ ඔහු බිරිඳ ඡන්ද පොළට එක්කන් ආවේ කොහොමද. ගෑණියෙක්ද මිනිහෙක්ද තමන්ගේම බිරිඳගේ පුංචි අම්මාද කියලාත් හොයා ගන්න බෑ. සම්පුර්ණයෙන්ම මුහුණ වහලා ඔහුගේ බිරිඳ මට ඒ පින්තූරේ මෙතන තිබුණා. ඉතින් ඒ කරුණුත් ඔහුගේ සහෝදරයා අත්අඩංගුවටත් පත් වුණා පහුගිය කාලේ. ඔවුන් මේ සියළු දෙනා එක්ක යම් සබඳකම් පැවැත්වූ බවට තොරතුරු අනාවරණය වුණා. ඒවා ඉතින් අපි අනන්තවත් කියලා තියෙනවා පැමිණිලි දාලා තියෙනවා.

ප්‍ර : කවුරු එක්ක සම්බන්ධ වූ බවට?

පි : එකක් කියලා නෙවෙයි ඒ කියන්නේ මේ වහාබි සංවිධාන සමහර වේලාවට ජාත්‍යන්තර පාසල් වෙන්න පුළුවන්. ඉස්ලාම් Center වෙන්න පුළුවන්. සමාජ සේවා ආයතන හැටියට පවත්වාගෙන යන ඒවා වෙන්න පුළුවන්. මේ වහබි Movement එක කියන්නේ එහෙම එකක් මැතිතුමනි. ඒවා මද්‍රසා පාසල් වෙන වෙනත් නම් වලින් නොයෙක් නොයෙක් මේක හරි සංකීර්ණයි. එතකොට ව්‍යාපාරික ස්ථාන. ඉතින් මේ හැම එකක් පිටිපස්සේම නොවුනත් සෑහෙන මට්ටමකට දැන හෝ නොදැන ඒගොල්ලෝ දේශපාලන රැකවරණය දුන්නා මේවාට. මොකද මාළිගාවත්තේ පල්ලියක සිද්ධියක් ඇති වුණා ඔය බෝධීන් වහන්සේ නමක් කපන්න ඇවිල්ලා. ඉස්සෙල්ලාම මෙතෙන්ට බැස්සේ බදුර්දීන්. එහෙම වෙන්නේ කොහොමද. එතකොට ඔහු ප්‍රශ්න හොයා ගෙන ගිහිල්ලා මම තමයි මුස්ලිම් අයගේ නායකයා කියලා පෙනී ඉන්න උත්සාහ කළා. ඉතින් අපි විශ්වාස කරනවා ඔහු අශ්‍රොෆ්ගෙන් පස්සේ ඔහු තමයි මේ වැඩේ අතට ගත්ත මිනිහා කියලා. තුර්කි එක්ක සම්බන්ධකම් තිබුණා. මගේ පන්සල කිට්ටුවම ගොඩනැගිලි තියෙනවා අධි ආරක්ෂිත කලාප වගේ යන්න බෑ කාටවත්. ඉතින් ඒවාගෙන් මේවාගෙන් සැක හිතෙන දැන් සාමාන්‍යයෙන් එක මිනිහෙකුට බහුතර සමාජයක් ඇඟිල්ල දික්

FAIR COMMENT
BY JEZEEM

කරන්නේ නැනේ මැතිතුමනි කොතැන හෝ වරදක් නැත්නම්. ඉතින් ඒ ආණ්ඩුව තියෙන ප්‍රශ්නේ තමයි ඒ චෝදනා ලබලත් මේ මිනිස්සුන්ට නාම යෝජනා හම්බ වෙනවා. Deal දේශපාලනයක් ඇතුළේ මේවා එළියට එන්නේ නෑ. ඒක තමයි කතන්දරේ.

ප : ඔබ වහන්සේ කිව්වා නැගෙනහිර ප්‍රදේශයේ ඇමතිවරයෙක්ගේ පුතෙක් කියලා කවුද ඒ අර මාළු? ලියලා දෙන්න පුළුවන්ද?

පි : පුළුවන් මට මතක විදිහට නාවින් ඇමතිතුමාගේ පුතෙක් වෙන්න ඕනී. පුතෙක් හෝ ඥාති පුතෙක්. මට අර මේ අපි ඉස්සෙල්ලා දෙන්නම් කිව්වේ මොනවාද මේ අපි තොරතුරු වගයක් දෙන්නම් කිව්වේ . අර පනත ලබා දෙන දවසටම ඒ නමත් දෙන්නම් මැතිතුමනි.

ප : පනත ලබා දෙන දවසට?

පි : ඔව්.

ප : දැන් ඊළඟ ප්‍රශ්නය දැන් ඔබ වහන්සේලා මුස්ලිම් සමාජය ගිල ගන්න ආපු යක්ෂයෝ කියලා මතයක් හැදුවා කියලා මේ 2014 කියලා තියෙනවා. එහෙම මතයක් මොකක්ද ඒකෙන් අදහස් කළේ යක්ෂයෝ කියලා මතයක් හැදුවා කියලා ඔබ වහන්සේ කියලා තියෙනවා 2014 වර්ෂයේ?

පි : මුස්ලිම් සමාජය ගිල ගන්න ආපු යක්ෂයෝ?

ප : ඔව්.

පි : ඒ යක්ෂාවේෂයෙන් ඇවිල්ලා තියෙන්නේ මේ උන්මත්තක අන්තවාදය තමයි. හොඳින් හිටපු සාම්ප්‍රදායික මුස්ලිම් සමාජයක් අන්තවාදයට කැඳවලා තිබුණු සහෝදරත්වය බිඳ දාලා ඒ තරුණයන්ගේ අතට අවි අරගෙන මරාගෙන මැරීම දක්වා ඒ

ප : මෙයින් අදහස් වන්නේ මුස්ලිම් සමාජය ගිලින්න ආපු යක්ෂයෝ කියලා මතයක් ඒ කියන්නේ ඔබ වහන්සේලාට ඒ එහෙම යක්ෂයෝ කියලා ප්‍රකාශ කළායි කියලා වැටහීමක් වෙන්නේ බලන්න ඒක ස්වාමීන් වහන්සේ. 17 වෙනි පිටුවේ රිවිර. 14 වෙනිදා?

පි : දැන් අර සහරාන්ගේ විඩියෝ පටයක නම් තිබුණා

ප : ඒක තමයි ඇහුවේ ?

පි : ඥාණසාර නැමැති යක්ෂයා කියලා.

ප : ඒක නෙවෙයි. දැන් ඔබ වහන්සේලා ලියලා තියෙනවා එහෙම කියනවා කියලා ද මතයක් තියෙනවා කියලාද ?

පි : මැතිතුමනි කී වෙනි?

ප : 2014 , පිටුව 17 ?

පි : රිවිර පත්තරේමද

ප : පිටුව 17 අන්තිම 2014.04.24 වෙනිදා රිවිර.

FAIR COMMENT BY JEZEEM

පි : ආ.... හරි මේ තියෙන්නේ.

ප්‍ර : අන්තිම පේළි තුන .

පි : ඔව් අපි මුස්ලිම් සමාජය ගිලින්න ආපු යක්ෂයෝ කියලා මතයක් හැදුවේ මේ මුස්ලිම් නායකයෝ. ඒ කියන්නේ මේ දේශපාලනය තුළ ඉන්න මුස්ලිම් නායකයෝ මුස්ලිම් සමාජයට ඒත්තු ගැන්නුවා ඔය ඉස්සෙල්ලා කියපු සංවිධාන, මුස්ලිම් කවුන්සිලය, ඔය නම් කියපු ඉහ්වාන් මුස්ලිම් නායකයෝ, ජමාතේ ඉස්ලාම් අය ආදී වශයෙන් ඒ මාධ්‍යය මගින් මුස්ලිම් සමාජය භීතියට පත් කළා උඹලා භය වෙන්න එපා. මේ මුස්ලිම් සමාජයට තර්ජනයක් වෙන මේ හාමුදුරුවරු කියලා ඒ ගොල්ලො භීතියක් ඇති කළා මේ මුස්ලිම් සමාජයට. ඒකයි මම කිව්වේ අපිව යක්ෂයෝ විදිහට තමයි මුස්ලිම් සමාජයට පෙන්නුවේ.

ප්‍ර : දැන් ඒකට මුල් වෙලා තියෙන්නේ දේශපාලඥයෝ?

පි : අනිවාර්යෙන්ම.

ප්‍ර : කවුද ඒ දේශපාලඥයෝ?

පි : දැන් රවුල් හකීම් වගේ කෙනෙක් ගත්තොත් ඔහු කිව්වා කහ සිවුරු ත්‍රස්තවාදයක් තියෙනවා කියලා මේ රටේ ඔහුගේ ඔළුවිල් ප්‍රකාශය අපිට අමතක නෑ කවදාකවත්. ඔහු නැගෙනහිර වෙනම කලාපයක් ඉල්ලලා මේ මෑතක් වන තුරු වෙනම මුස්ලිම් කලාපයක් ඉල්ලනවා. ඊළඟට වෙනම කල්මුණේට වෙනම පරිපාලන ඒකකයක් ඉල්ලනවා. ඒ වගේ ඔහු බෙදුම්වාදී අදහස් එක්ක ඒ මැතිවරණ කාලයක් ළං වෙන කොට පොඩි වණ්ඩි පාට එකක් දානවා සිංහල සමාජයට බෞද්ධයන්ට. ඔවුන් තමයි ඇත්තටම මේ විස ගෙනාවේ. ඊළඟට එක වතාවක අසාද් සාලී මහත්මයා ඔහු නම් මම හිතන්නේ නෑ එහෙම බරපතල අන්තවාදීයෙක් කියලා ඒ ඉතින් ඔය ඉතින් කොහේ හරි පාර්ලිමේන්තුට යන්න දඟලන කෙනෙක් වෙන්න ඇති. කිව්වා ඥාණසාරව මරාගෙන මැරෙනවා කියලා එක වේලාවක. අපි ඒවා එච්චර .

ප්‍ර : කවුද කිව්වේ?

පි : ඒ අසාද් සාලී මහත්මයා වීඩියෝ පටත් තියෙනවා. ඉතින් අපි දකින්නේ නෑ ඒ ගොල්ලෝ මේ ලොකු මිනිස්සු හැටියට. ඒගොල්ලෝ නිකම් ඔහේ කියවනවා. උග්‍ර අන්තවාදීන් නෙවෙයි. ඒ අයත් එක වෙලාවක ඔය මහනුවර ප්‍රදේශයේ මධ්‍යම පළාතේ පළාත් සභා ඡන්දය වෙලාවේ ඡන්ද ටික ගත්තේ බොදුබල සේනාවේ අපේ ප්‍රකාශන මිනිස්සුන්ට ඉදිරිපත් කරලා. අපි ඇඟිල්ල දිගු කරන දිසාව බලලා දැන් අපි හඳ පෙන්නුවාම මුන් නියපොතුත් පෙන්න පෙන්න අර මිනිස්සු බය කළා. හඳ

LAIR COMMENT BY JEZEEM

පෙන්නුවේ නෑ. ඔය විදිහට රවුම් හකීම්, රිෂාඩ් බදුර්දීන්, අසාද් සාලී, මුජුබර් රහුමාන් මේ වගේ උදවිය තමයි දේශපාලනිකව විශේෂයෙන් මේ සිංහල සමාජයේ අනිත් අය ප්‍රසිද්ධියේ නම් වැඩිය එන්නේ නෑ ඔළුවට අපිට එහෙම මාධ්‍යවලත් අපි දැක්කේ නෑ. මේ අය තමයි ඇවිල්ලා කොච්චර හරි මේ සිංහල සමාජෙත් එක්ක හැප්පෙන්න ගැටෙන්න ආවේ. දැන් උදාහරණයක් මැතිතුමනි විල්පත්තුව සුද්ධ කරලා ඒකට ඇයි මෙහෙම වුණේ කියලා උත්තරයක් හොයනවා වෙනුවට ඔහුට අපහාස කළා කියලා නඩු දාන ගමන් අපට උත්තර දෙන්නේ නෑ රටට උත්තර දෙන්නේ නෑ. අපට උත්තර දෙන්න එච්චා අර වටරක විජිත කියලා සංඝයා වහන්සේ කෙනෙක්. අන්තිමට තමන්ගේම ලිංගේන්ද්‍රිය කපා ගෙන ඉස්පිරිතාලේ ගිහිල්ලා යන්තම් ඒ ප්‍රශ්නේ ඉවර කර ගත්තා. ඒ වගේ අර තමන් උත්තර දෙනවා වෙනුවට වෙන වෙන බලකඳවුරු හදලා ඒ ගොල්ලෝ ඉස්සරහාට දාලා වැඩ කළා.

ප : දැන් මම ඔබ වහන්සේගෙන් ඒ යක්ෂයෝ කියන ප්‍රශ්නය ඇහුවේ 2014 දී ඒ දේශපාලඥයන්ද මේ මූලධර්මවාදීන්ට බොදුබල සේනාව සම්බන්ධව මෙවැනි ආකල්පයක් ඇති කළේ කියන එක කියන්න පුළුවන්ද?

පි : නෑ මම මේක අන්තිමට කියනවා අපි විරුද්ධ වුණේ සාම්ප්‍රදායික මුස්ලිම්වරුන්ට නෙවෙයි. මුස්ලිම් සමාජෙත් නැති කරන මේ අන්තවාදී සංවිධාන වලට. එතකොට ඒ අන්තවාදී සංවිධාන ගැන තමයි අපි කිව්වේ. අන්තවාදී සංවිධාන ගැන කියන කොට මුස්ලිම් නායකයන්ට රිදුනේ ඇයි. ඒ ගොල්ලො ගිහින් මිනිස්සුන්ට කිව්වා මේක හොඳ දෙයක් නෙවෙයි අපිට විරුද්ධව ඒ මිනිස්සු පෙළඹෙව්වේ මුස්ලිම් නායකයෝ. ඒ ගොල්ලොන්ට තිබුණා සාවධානව මේ සංවිධානයක් ඇවිල්ලා තියෙනවා. මේ ගොල්ලො මොනවා හරි කියනවා මුස්ලිම් සමාජය ගැන. මේක පොඩ්ඩක් අපි අවධානවත් වෙමු. අවම තරමින් නිහතමානීවත් වුණේ නැහැ. මේ මිනිස්සු අපිත් එක්ක සාකච්ඡා කළා නමුත් මේ ගොල්ලොන්ට දිගින් දිගට දිගින් දිගට හතර වටින් වදින කොට මම මැතිතුමනි අවස්ථා තුනක් විතර ඔය ප්‍රකට නීතිඥ මහත්මයෙක් ඉන්නවා ෆයිස් මුස්තෆා මහත්මයා. එතුමාගේ ගෙදරට ගිහිල්ලා මම නිහතමානීව අපි කතා කළා. කතා කරලා මම එතුමාට කිව්වා කරුණාකරලා මේ තත්ත්වේ හොඳ නෑ. මේකට විසඳුමක් හැටියට ඕගොල්ලන් වගේ මධ්‍යස්ථව මේ රටේ නීතිය පසීඳලන තැන ඉන්න කාගේත් පිළිගැනීමක් තියෙන දෙවියෝ හැටියට ඔය ගොල්ලො මැදිහත් වෙන්න මේකට. මේ Society දෙක අතර තියෙන ආතතිය මැඩලන්න. ඒ අවස්ථාවේදී ඔය මුස්ලිම් සංවිධාන

FAIR COMMENT BY JEZEEM

නියෝජනය කරපු යම් යම් පිරිස් මට නම් වශයෙන් නම් මතක නෑ නම් ටික ඔක්කොම දෙන්න පුළුවන් ලියලා තියෙනවා. එතුමාගේ ගෙදර අපි රැස්වීම් කිහිපයක් කළා. දේශපාලකයෝ එක්ක නම් ලොකු ගනුදෙනුවක් කළේ නෑ.

ප : දැන් ඊළඟ ප්‍රශ්නය දැන් සහරාන් මෙම ප්‍රහාරය දැන් ඔබ වහන්සේලා පෙන්නු විඩියෝ පටවලිනුත් සහරාන්ගේ දේශන තමයි පෙන්වා සිටියේ. සහරාන් මෙම ප්‍රහාරය ඔහු විසින් තනිවu කළ ප්‍රහාරයක්ද නැත්නම් මෙය 2010 පමණ කාලයේ සිට සංවිධානය කරනු ලැබූ සැලැස්මක ප්‍රතිඵලයක් ලෙසද මේක තියෙන්නේ? නැත්නම් සහරාන්ගේ තනි ක්‍රියාවක් හැටියට සලකන්න පුළුවන්ද?

පි : මේක මැතිතුමනි නැහැ ඉතාම සංවිධානය කරලා මේ රට සඟරිස්ථානයක්. නසරිස්ථානයක් කරන්න ඕනේ කියලා තීන්දුව අරගෙන තියෙන්නේ එක් දහස් නවසිය තිස් ගණන්වල ඇතැම් නායකයෝ. දෙමළ සමාජයේ පනහට පනහ ඉල්ලන කොට ඒ කාලේ හිටපු ඇතැම් ජාතීවාදී මුස්ලිම් නායකයෝ ඒ කාලේම මේ විෂ පැළ කරලා තියෙනවා මේ සමාජයට. ඒ විතරකුත් නෙවෙයි 1988 මා සතුව තියෙනවා එක ලියවිල්ලක් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය විජය විමලසූරිය මහත්මයා 1988 වෙනකොට පාසල් පෙළ පොත් වල තිබුණු වැරදි පෙන්වලා එතුමා හදපු ලේඛනයක් ඒ කාලේ. මේක මේ අහම්බයක් නෙවෙයි. මේක අහම්බයක් නෙවෙයි. ඉතාම දීර්ඝ කාලීන වැඩපිළිවෙලක් සහරාන් ඉක්මන් වුණා කිව්වොත් නිවැරදි. අපි මැතිතුමනි බොදුබල සේනා සංවිධානය ඔය අලුත් බොදුබල සේනා සංවිධානයේ චෝදනාවට ලක් වුණු අලුත්ගම සිද්ධියෙන් පස්සේ මා දන්නේ නැහැ ඔහු දැන් ජීවතුන් අතර ඉන්නවාද කියලා නැත්නම් ඔහු වැන්නෙක් මේ කොමිෂමට ගෙන්වන්න පුළුවන් නම් ඉතාම වටිනවා. අපිට හොයලා බලන්න පුළුවන්. ඔහු ෂේක්වරයෙක්. මෙතන සාක්ෂි දරන අපේ හාමුදුරුවෝ නෑ දැන් මෙතන හිටපු අපේ සංවිධායක හාමුදුරුවෝයි මමයි ඒ මහත්මයා හම්බ වෙන්න ගියා දික්වැල්ලට. ඒ හමුව වුණේ ඇ 01 ට විතර. එයා බය වුණා ප්‍රසිද්ධියේ අපිව ඇවිල්ලා හම්බ වෙන්න . මොකද අපි ගොඩක් දන්නවා මිනිස්සු. ඔහු ඇවිල්ලා කිව්වා හාමුදුරුවනේ මගේ ගෙවල් මේ පේනමානමේ පන්සල ළඟ. මේ පන්සලට ඉඩම් පුජා කරලා තියෙන්නේ අපි. එතුමා කිව්වා අපි මේ ජීවත් වන දික්වැල්ල ප්‍රදේශයේ අපි තරුණ කාලේ මැදි වයසේ මේ දකින ප්‍රදේශය නෙවෙයි මේක වෙනස් වෙමින් පවතිනවා. මෙහේ ඇවිල්ලා ව්‍යාපාර කරනවා අපි නොදන්න හුහක් පිරිස් කාටවත්

FAIR COMMENT BY JEZEEM

ඔවුන් එක්ක තරඟ කරන්න බෑ. ඔවුන් අඩු මිලට බඩු දෙමින් මේ පළාතේ ඉන්න මුස්ලිම් මිනිස්සු ඒ ගොල්ලොන්ගේ මතයට නම්ම ගන්නවා. ඔහු මට එදා කියනවා මම මේ වගකීමෙන්මයි කියන්නේ ඔහුට අරාබි භාෂාව පුළුවන්. එක්තරා සාකච්ඡාවකට මොහුටත් එන්න කියනවා. එතෙන්දී අරාබි භාෂාවෙන් කියනවාලු ගම්මාන 500 කට ගහන්න ඕනේ එක රෑකට. මම මේ කියන්නේ ඔය අලුත්ගම සිද්ධිය වුණේ 2014 ඒ සිද්ධිය වෙලා දවස් තුනකට හෝ හතරකට පස්සේ. එහෙම වැඩ පිළිවෙලක් ගැන ආරංචි වුණා ඒක ඔබ වහන්සේට දැනුම් දෙන්නයි මේ එන්න කිව්වේ. වහාම මේවා මට නම් ටිකකුත් කිව්වා වහාම ගෝඨාභය මහත්මයාට කියන්න, මහින්ද රාජපක්ෂ මහත්මයාට කියන්න කියලා ඒ දවස්වල. අපි ඒවත් දැනුවත් කළා. ඉතින් එයින් අදහස් වෙනවා මේවා කොහේ කොහේ හරි යම් යම් කල්ලි මොකද මේ අපේ රටේ තියෙන අවිද්‍යාත්මක දේශපාලන ක්‍රමය නිසා ඕනෑම තක්කඩියෙකුට මෙහේ ඇවිල්ලා රිසි සේ වැඩෙන්න පුළුවන්. ඉතින් ඒ තක්කඩිකම් කරන අර අන්තවාදයට මිනිස්සු කැඳවීමට ඕන හැටියට මේකේ නිදහස තිබුණා. ඒ වගේම LTTE එක බිඳ වැටුණා. අපි කවුරුත් දන්නවා නැගෙනහිර පළාතේ ඔය ග්‍රාම ආරක්ෂක සේවයට හුඟක් බඳව ගත්තා මුස්ලිම් ප්‍රජාව තරුණයෝ. ඒ අය අතේ අවි තිබුණා. එක වාර්තාවක තියෙනවා 2006 ඒ කාලය වෙන කොට ආයුධ දරපු දෙදහස් ගණනක් මේ නැගෙනහිර හිටියා කියලා. ඉතා සුළු වෙලාවක් ඇතුළත ඕනෑම වේලාව ඒගොල්ලොන්ට 500 ක් රැස්වෙන්න පුළුවන් කියලා මේ වාර්තාවේ තියෙනවා. ඉතින් මැතිතුමනි මේක අහම්බයක් නෙවෙයි ඉතාම දීර්ඝ කාලීනව මේ රට ආක්‍රමණය කිරීමේ වැඩපිළිවෙලකම කොටසක්. ඒක රට වට කරලා තියෙන්නේ.

ප : ඒ කොටස ඒ ක්‍රියාත්මක කරන ඒ සංවිධානය මොකක්ද? ඒ කියන්නේ එය ක්‍රියාත්මක කළේ සහරාන්ගේ තනි සැලැසුම් අනුවද මෙවැනි ප්‍රහාරයක් කරලා තියෙන්නේ නැත්නම් වෙනත් සංවිධානයක් විසින් සැලසුම් කර ඇත්ද? ඔබ වහන්සේලා මේක අධ්‍යයනය කරලා තියෙනවානේ?

පි : මේ ගොල්ලන්ගේ දැන් අර දෙවෙනියට දාපු විඩියෝ පටයේ ඉතාම හොඳින් පැහැදිලි වෙනවා. ඒ ඔහු දෙමළ භාෂාවෙන් කියන්නේ මේ හමුදාවට බැඳෙන්න එපා. මොකටද හමුදාවට බැඳිලා. ඊළඟට මිනිස්සු රටකට ආදරය කිරීමෙන් පලක් නෑ. ඒ කියන්නේ ජාතිකවාදයටත් දේශප්‍රේමීත්වයටත් ඔහු බරපතල විදිහට පහර දෙනවා. ඒ කියන්නේ උඹලට වැඩක් නෑ මේවා මොකටද මුස්ලිම් අය හමුදාවට යන්නේ මේ රට අල්ලගන්නයි

FAIR COMMENT BY JEZEEM

ඒකටයි අපි ජීහාදය කරන්න ඕනී. ඒ මතය තුළ ඉඳගෙනයි ඔහු වැඩ කළේ. එතකොට අතීතෙත් මුලින්ම ලෝකයේ හැම රටකම වහබ්වාදීන් තමන්ගේ සන්නද්ධමය ක්‍රියාකාරකම් වලට ඇවිල්ලා තියෙන්නේ කොතැන හෝ තැනක තියෙන පිළිමයක් හෝ එවැනි දෙයක් විනාශ කරලා. සමහර තැන්වල සොහොන් කඩලා. සමහර තැන්වල දේවාල කඩලා. දැන් ලංකාවේ පටන් ගත්තේ බුදු පිළිමයකට ගහලා. බැලුවා sense එක කොහොමද අපේ අපිට උගන්වන්නේ නෑනේ මැතිතුමනි බුදුහාමුරුවන්ට අපහාස කරත් කාට මේවා කළත් අපි ලෙයට ලෙය ඉල්ලන්නේ නෑනේ අපි ගිහිල්ලා බෙල්ල ඉල්ලන්නේ නෑනේ. අපි ගිහිල්ලා පැමිණිල්ලක් දාලා අනේ අපොයි කිය කිය ඉන්නවා මිසක්. අපි ගිහිල්ලා හිංසා කරන්නේ නෑ. ඉතින් මේ උදවිය එහෙම නෙවෙයි. මේ ගොල්ලන්ගේ මතය. මේ පංචස්කන්ධ මන් වගේමනේ මැතිතුමනි. ඒ ගොල්ලන්ටත් ඇස් තියෙනවා සහරාන්ටත් ඇස් තියෙනවා මටත් ඇස් තියෙනවා එයාටත් මොළයක් තියෙනවා මටත් මොළයක් තියෙනවා උඟටත් බඩක් තියෙනවා මටත් බඩක් තියෙනවා අපි එකම විදිහයිනේ. මේ වෙනස් වෙන්නේ කොහොමද? teachings මේ මතවාදය ආගමික ඉගැන්වීම් . අන්න ඒ ආගමික ඉගැන්වීම් තුළින් සන්නද්ධ වෙච්ච මේ රට අල්ලාහ්ට කැප කරපු රටක්. දැන් මැතිතුමනි මේ රටේ මේ හැම ස්පීකර් එකකින්ම මොකක්ද ඇහෙන්නේ ලා ඉලාහ් ඉල්ලල්ලාහ් ඔබ නැමදුම් කළ යුත්තේ එකම දෙවිට පමණයි. සියල්ලෝම අල්ලාහ්ගේ අණට අවනත විය යුතුයි. කීකරු විය යුතුයි. ඒක තමයි අරාබි පාඨයේ තේරුම. ඉතින් ඒක ඇහෙන්න ඇහෙන්න ඇහෙන්න ඇහෙන්න දැන් තව උදාහරණයක් කියන්නම් මැතිතුමනි මම කිව්වේ අර අවිද්‍යාත්මක දේශපාලන ක්‍රමය කියලා. මහනුවර ඇහැලේපොළ කුමාරිහාමි මාවත තියෙනවා. ඇහැලේපොළ කුමාරිහාමි කියන්නේ අපේ සිංහල වංශ කතාවේ හරි අභිමානවත් කාන්තාවක්. ඇයගේ නමින් ඇහැලේපොළ කුමාරිහාමි මාවත තියෙනවා. මුස්ලිම් ප්‍රජාව වැඩි වුණා. ඇහැලේපොළ කුමාරිහාමි මාවත දැන් මුස්ලිම් පල්ලිය පාර වුණා. එතනින් කිලෝ මීටර් 30 ක් විතර පල්ලේහාට බහින කොට කිලෝ මීටර් 14 ක් මගේ මතකය මේ මාවනැල්ලට එන කොට අනගාරික ධර්මපාල මාවත දැන් එතන නෑ. දැන් එතන තියෙන්නේ හසන් මාවත. එතකොට එක පැත්තකින් මේ රට අල්ලාහ්ගේ රට කර ගන්න පුළුවන් කියලා විශ්වාසයක් හදනවා හිත්වල. පෙළපොත්වලින් හදීසයට direct කරනවා. ඉලන්දාරී හදීස් කියනවා. එතකොට මීට දැන් මේ වර්තමානයේ උපන්

FAIR COMMENT
BY JEZEEM

දරුවෝ ඇහැලේපොළ කුමාරිහාමි මාවත නොදැකපු දරුවෝ දකින්නේ පල්ලිය පාර අපේ. ධර්මපාල මාවත නොදැකපු දරුවෝ දකින්නේ හසන් මාවත අපේ. උන් හිතනවා මේක අල්ලගෙන තියෙන්නේ මේ බෞද්ධයෝ. උන් යක්ෂයෝ කාෆීර්වරුන්. මරපන් මුන්ව. එතෙන්ට මතය හදන විශාල ප්‍රමාණයක් ආගමික මතවාද මේ රටේ මුස්ලිම් දේශපාලකයන්ගේ පමණක් නෙවෙයි මේ සිංහල දේශපාලකයන්ගෙත් අධූර දර්ශී භාවයත් එක්ක ගොඩනැංවිලා ඉවරයි මේ වෙන කොට.

ප : ස්වාමීන් වහන්සේ ඔබ වහන්සේ කිව්වා බෞද්ධ පාසල්, කතෝලික පාසල් වගේ වෙනත් හින්දු පාසල් වශයෙන් වෙන් වෙන් වශයෙන් පාසල් තිබීම එය හොඳ නැති බවට. ඔබ වහන්සේට කියන්න පුළුවන්ද දැන් ඔබ වහන්සේ ඒ කියන කරුණු අනුව සමහර දේවල් ක්‍රියාත්මක කිරීම ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තුළ එයට අවහිරතා ඇති විය හැකිද කියන එක?

පි : මැතිතුමනි අපිට තියෙන්නේ දේව නීතියක් නෙවෙයි. අපේ රටේ තියෙන්නේ මිනිස්සු අත් උස්සලා ප්‍රජාතන්ත්‍රවාදීව තමන්ට ගැළපෙන විදිහට හදා ගත්තු නීති පද්ධතියක්. ඒකට තමයි 225 ක් පාර්ලිමේන්තුවට යවන්නේ. දැන් අපි සංශෝධන ගෙනල්ලා තියෙනවා 20 ක් දක්වා. ඇයි මේකට සංශෝධනයක් ගේන්න බැරි. අපි එදා දැකපු මුස්ලිම් සමාජය නෙවෙයි අද. එදා හිටපු 1% නෙවෙයි අද. ලොකු ප්‍රමාණයක් දැන් 10% ට ආසන්න වෙලා. එතකොට මේ ප්‍රශ්න කොහොමත් එන බව මේ පාලකයන්ට වැටහීමක් තිබුණේ නැද්ද? එතකොට එහෙනම් දැන් අපි තව දුරටත් අපේ අනන්‍යතාවයන් ආරක්ෂා කර ගෙන එක ජාතියක් විදිහට ඒ කියන්නේ සිංහලයෝ හැටියට හෝ ශ්‍රී ලාංකිකයන් හැටියට දැන් කතා කරන කොට කතා කරනවා අනේ මේක කොහොමද සිංහල බෞද්ධ කියන්නේ අපි ලාංකිකයෝ. එහෙනම් ලාංකිකයෝ නම් ඒ ලාංකික සංස්කෘතියක් ගොඩ නගන්න එපැයි. ලාංකික සමාජය තුළ හලාල් කියලා මොකද වෙනම වෙන් වෙන්නේ. ලාංකික සමාජය ගැන කතා කරලා ඇයි Islamic Bank බැංකුවලට යන්නේ. ලාංකික සමාජය ගැන කතා කරලා ඇයි මද්‍රාසාවලට යන්නේ. ලාංකික සමාජයක් ගැන කතා කරනවා. අපිට බෞද්ධ කතාව බෑ. බෞද්ධ බැංකු දාන්න එපා. Islamic banking පුළුවන්. මේක පුදුම වැඩක්නේ. ඒ නිසා මැතිතුමනි මේ ආගම මොකද මම අර එදත් කිව්වා වගේ දෙමළ ප්‍රශ්නය වගේ නෙවෙයි මේක දෙමළ ප්‍රශ්නය ජාතිකයි. මුස්ලිම් ප්‍රශ්නය ආගමිකයි. මොකද මුස්ලිම් මිනිසුන්ගේ ජීවිතය ආයේ වෙන දෙකක් නෑ. ඒගොල්ලොන්ගේ ජීවිතයම ආගම. මේක ජීවන

FAIR COMMENT BY JEZEEM

මාර්ගයක්. ඒ නිසා ඔවුන් විශ්වාස කරනවා ඒක පොඩි කාලේ ඉඳල දැනිලා දැනිලා දැනිලා දැනිලා බලන්න ඔවුන්ගේ දේවල් එකක්වත් පෙන්නන්නේ නෑ. ඔවුන්ගේ කිසිම දෙයක් උදුර ගන්න දෙන්නේ නෑ. හැබැයි ඔවුන් අපේ හැමදේම උදුර ගන්නවා. අපේ සංස්කෘතියට අභියෝග කරනවා. අපේ හැමදේටම අභියෝග කරනවා. ඉතින් එවැනි තත්ත්වයත් යටතේ මේක ගහගෙන විසඳ ගන්න බෑ කවදාකවත්. ඒ නිසා අපි විශ්වාස කරනවා ප්‍රජාතන්ත්‍රවාදී රටක මේ සමාජයේ වෙනස්වන සම්මුතිය දැකලා අධ්‍යාපනයෙන් තමයි මේක හදන්න පුළුවන්. ඒකට මේ රටේ දේශපාලනයයි ආගමයි පටලවා ගන්නේ නැතුව ආගම තියන්න ඕනේ තැන තියලා වහල් මානසිකත්වයකින් යුක්ත ආගමික පුජකයෝ ඉන්නවා ගොඩක් මේ රටේ. අපේ වැඩිහිටි ගොඩක් අය වුනත් එහෙම තමයි. ඒ අර අපි කියන හරිම ග්‍රාම්‍ය නිකම් ඒ දේශපාලනයන්ට එහෙයිකම් කරන ඉතින් ඒ ගොල්ලන් එක්ක මේ රට හදන්න බෑ. මේ පුජකායොත් එකයි පාලකයොත් එකයි. මේ ගොල්ලො ඔක්කොම මේ එකම වැඩ පිළිවෙලකට උදව් දෙනවා. ඉතින් ඒක හින්දා අපේ පරම්පරාවට පුළුවන්කම ලැබුණොත් මේක වෙනස් කර ගන්න මං හිතනවා අපි ඒකට වෑයම් කළ යුතුයි කියලා.

ප : තව එක ප්‍රශ්නයයි තියෙන්නේ ඔබ වහන්සේ පින්තූරයක් ඉදිරිපත් කළා හිටපු ජනාධිපතිවරයායි කටාර් විදේශ අමාත්‍යාංශයේ තානාපති කාර්යාලයේ තවත් මුස්ලිම් ජාතිකයෙකුයි. හිටපු ජනාධිපතිවරයායි තව ඉනාමුල්ලා කට්ටිය ඉන්න පින්තූරයක්. ඔබ වහන්සේ එය ඉදිරිපත් කිරීමෙන් මොකක්ද කොමිෂන් සභාවට බලාපොරොත්තු වුණේ මොකක් වටහා දෙන්නද මේ පින්තූරෙන් කොමිෂමට ගත හැකි මොකක්ද මේ වැටහීම?

පි : මැතිතුමනි ජනාධිපති සිරිසේන මැතිතුමා එක්ක පමණක් නෙවෙයි ඔහු රනිල් වික්‍රමසිංහත් එක්කත් පින්තූර අරන් තියෙනවා. මහින්ද රාජපක්ෂ මහත්මයාත් එක්කත් පින්තූර අරන් තියෙනවා. ඒ පින්තූරයෙන් පෙන්නන්න අදහස් කළේ මේ පුද්ගලයෝ මොන රාජ්‍ය නායකයා ආවාත් එතන ස්ථානගත වෙනවා. ඒකයි තියෙන ප්‍රශ්නේ. හැබැයි ඔවුන් තමයි අර අන්තවාදී විසෙන් ඔද වැඩි ගිය කරලාවිගේ නියෝජිතයා. එතකොට ඔහුට වැඩක් නෑ ආණ්ඩු. UNP ආණ්ඩුව ද ශ්‍රී ලංකා ආණ්ඩුවද ජනාධිපති මහින්ද ද ජනාධිපති සිරිසේනද ඒක වැඩක් නෑ. ඒ ගොල්ලෝ ඒ අදාළ තැන ස්ථාන ගත වෙනවා. ඒ නිසා ඔවුන් මේ ප්‍රශ්නයක් විසඳන්න යන කොට ආ ඉනාමුල්ලා එයා ප්‍රශ්නයක් නෑ. එයා අපේ එක්කෙනෙක්නේ. කවුරු ආවාත් එහෙම තමයි. ඉතින් කොහොමද මේ ප්‍රශ්න

FAIR COMMENT BY JEZEEM

විසඳන්නේ. මේ ප්‍රශ්න නිර්මාණය කිරීමට ideology එක දීපු මේ සහරාන්ලාව මුන් මරාගෙන මැරුණේ මෝඩයොනේ. මේ වැඩේට නිසි ලොකු කෙරුම්කාරයෝ ටික තාම අල්ල ගෙන නෑ මැතිතුමනි. මේ වගේ ප්‍රධාන මවුලවිවරු අල්ලගෙන නෑ කවුරුවක්වත්. සහරාන්ගේ duty ය කළා. නමුත් මේවාට මුල් ගල් තියපු, මේවාට විද්වතුන් හැටියට මේවාට ආවරණය සපයපු, දේශපාලනිකව රැකවරණය මේ ගොල්ලෝ හෙළිදරව් කර ගන්නේ නැතුව සහරාන් පස්සේ විතරක් ගිහිල්ලා වැඩක් නෑ.

ප්‍ර : බොදු බල සේනා සංවිධානයට තමන්ගේ ලබපු දැනුම අනුව අධ්‍යයනය අනුව එවැනි පුද්ගලයින් සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමේ හැකියාවක් තියෙනවාද දැන් කියන්න පුද්ගලයින් වශයෙන් හෝ?

පි : පුද්ගලයින් වශයෙන් කියන්න ගියොත් මැතිතුමනි මම පරාද වෙනවා. ඊට හේතුව කොයි එක්කෙනාද ඉහ්වාන් කොයි එක්කෙනාද වහාබි ඒ නිසා තමයි අපි කිව්වේ සාම්ප්‍රදායික ස්වදේශික මේ පාරම්පරික කතාව දන්නේ නෑ. උඹලා මුස්ලිම්. එකම දෙයියොනේ. දැන් මුස්ලිම් සමාජයටම අපි භාර දුන්නා ඕගොල්ලො කියන්න කවුද අපිට හිරිහැර කරන්නේ. මොකද අපි පල්ලියට යන්නේ නැනේ මැතිතුමනි. අපි දේශපාලන ධාරාවන් දිහා බලලා අරයා වැරදි ඇති මෙයා වැරදි ඇති ඒක එක පැත්තකින් අපි කරන වරදක්. අපට වඩා සැක හිතෙන පුද්ගලයෙකුට තමයි අපි නම් කිව්වේ. නමුත් මීට වඩා දැන් අර අපි කියන නලීම්වරු දැන් හෙට අනිද්දා වෙනකොට ප්‍රකාශ නිකුත් වෙයි අනේ නලීම්ලා අපි හරි හොඳයි එහෙම තමයි ඒ ගොල්ලො ඉන්නේ. මේකට ගැඹුරු විදිමත් අධ්‍යයනයක් දැන් අපේ ධර්මයේ නම් තියෙනවා පඤ්ඤපනා, පට්ටපනා, විවරණා, විභජනා කියලා කරුණු හතරක්. ඒක බලලා පරීක්ෂණය කරලා සම් පරීක්ෂණය කරලා අවසානයේදී මෙන්න මෙයා තමයි කියලා හඳුන ගන්න පුළුවන් විදිහට. එවැනි වැඩ පිළිවෙලක් අවශ්‍යයි මේ අන්තවාදය පෝෂණය කිරීමට උඩගෙඩි දෙන්නන් දේශපාලන වශයෙන්, මූල්‍ය වශයෙන්, ජාත්‍යන්තර වශයෙන්, කලාපීය වශයෙන්, රට ඇතුළේ අභ්‍යන්තරික වශයෙන්, කවුද මේවාට සහයෝගය දෙන්නේ කියලා හොයා ගන්න නම්.

ප්‍ර : බොදු බල සේවා සංවිධානය වශයෙන් ඔබ වහන්සේලා කියන්නේ තාමත් මෙයට මෙම ප්‍රහාරයට සම්බන්ධ වූ මුල් තවත් පුද්ගලයින් පරීක්ෂණවලදී සොයා ගෙන නැහැ කියලද?

පි : අනිවාර්යෙන්ම මැතිතුමනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : සොයා ගෙන නෑ. ඔබ වහන්සේලා මෙම මෙවැනි ප්‍රහාර වැළැක්වීම සඳහාත් මෙම පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම සඳහාත් රජයට යම් යෝජනා මාලාවක් හෝ යම් කිසි රජයට ඉදිරිපත් කළාද නැතහොත් එයට බලාපොරොත්තු වෙනවාද ?

පි : ඇත්ත වශයෙන්ම අපි මැතිතුමනි එවැනි යෝජනා මාලාවක් 2015 ම ඉදිරිපත් කළා.

ප්‍ර : නෑ දැන් නව රජයක්නේ තියෙන්නේ?

පි : නව රජයට තාම ඉදිරිපත් කළේ නෑ. මොකද අපිට පේනවා මොකද එතන ඉන්නේ සථතාභ්‍යාසයේ යෙදීච්චි අය. ඒ කියන්නේ මේවාගේ ඇති වෙන්න පුළුවන් භයානක විපාක දන්න පාලකයෙක් උඩ ඉන්න නිසා අපි වැඩිය දැඟලීමක් කරන්නේ නෑ. මොකද අපි ඒ කාලේ අත්දැකීම් අපි දැක්කා මොනවා හරි කිව්වාහම ඒක අහනවා ඒ වෙනුවෙන් විසඳුම් හොයනවා. ඉතින් අපි විශ්වාස කරනවා ඒ මනුස්සයා තමා ජනාධිපති වෙන්න ඇත්තේ කියලා. ඒ හින්දා ඔහු මේකට යම් කිසි සාධාරණයක් ඉෂ්ට කරයි කියන විශ්වාසය අපිට තියෙනවා.

ප්‍ර : නමුත් ඔබ වහන්සේලා යම් කිසි මේ ඉදිරියට මෙහෙම වැළැක්වීම සඳහාත් මෙවැනි කටයුතුවලට ප්‍රතිකර්මයක් වශයෙනුත් යම් කිසි යෝජනාවලියක් ඉදිරිපත් කරන්න?

පි : අලුතෙන් ඉදිරිපත් කරන්න අපි ඇත්තටම අපිට කොමිෂමට ඉදිරිපත් කරන්න පුළුවන්. දේශපාලකයන් පස්සේ ගිහිල්ලා නම් මේවා කියලා වැඩක් නැහැ. මොකද ඒවාට ඉඩකුත් නෑ.

ප්‍ර : එය පසුව කොමිෂමට ඉදිරිපත් කරන්න.

පි : හොඳමයි.

****

<u>ගරු විනිසුරු බන්දුල අතපත්තු මැතිතුමා</u>

ප්‍ර : ගරුතර ස්වාමීන් වහන්සේ මම ඔබ වහන්සේගෙන් අහන්නේ දැන් ලංකාවේ මුස්ලිම් අන්තවාදීන් අතර යම් කිසි තරහකාරී බවක් තියෙනවාද?

පි : අනිවාර්යෙන්ම.

ප්‍ර : ඒ කියන්නේ ඔවුන්ට මේ සාමාජිකයන් බඳවා ගැනීම සම්බන්ධයෙන් ද නැත්නම් ඔවුන්ගේ ?

පි : ඔවුන්ට සාමාජිකයන් බඳවා ගන්නා තරමට මුදල් එනවා. සමහර සංවිධාන තියෙනවා මැතිතුමනි දැන් අපි හිතමුකෝ ඔය අපි ගත්තොත් දැන් ජපානයට වගේ ගියපුවහාම ජපානයේ ඉන්නවා සජෝලා. ඒ කියන්නේ ලොකු ධනපතියෝ. කොරියාවට ගියාම ඉන්නවා සජානිම්ලා. ඒ ගොල්ලෝ එහේ ඉන්න ධනපතියෝ.

FAIR COMMENT BY JEZEEM

සිටුවරු වගේ ඉන්න. වගේ මැදපෙර දිගට රටට ගියාම එහේ ඉන්නේ සුල්තාන්ලා. ඒ සුල්තාන්ලාට සල්ලි තියෙනවා. දරුවෝ සමහර වේලාවට 15 ක් 20 ක් ඉන්නවා. ඒත් ඕනී තරම් ධනය තියෙනවා. මොකක් හරි සබඳතාවයකින් අපි හිතමුකෝ ලංකාවට එනවා. ඒ ගොල්ලන්ට ආසයි මේ රට දැක බලා ගන්න. දැක බලා ගෙන ගියාට පස්සේ මේ පරිසරයට හරි ආදරෙයි ආස හිතෙනවා ඒ ගොල්ලො බලලා හිතනවා මොකක් හරි මෙහේ කරන්න ඕනේ . ඉතින් සම්බන්ධයක් හදාගෙන මුදල් ගෙන්වා ගැනීම සඳහා එක්කෝ මද්‍රාසාවක් පටන් ගන්නවා. ඊළඟට මද්‍රාසා අතර තරඟයක්. අපි තමා වඩාම දෙවියන්ට ළං වෙන්න වැඩ කරන කට්ටිය කියලා අර වහබ්මත දරන කණ්ඩායම් වලට පෙන්නනවා. එතකොට ඉතින් අසීමාන්තිකව සල්ලි එනවා. අපි කෙළවරක් නැතුව ගිය ආණ්ඩුවලටත් මේ වර්තමාන ආණ්ඩුවට නෙවේ කලින් ආණ්ඩු දෙකටම අපි කිව්වා මේ මුදල් එන විදිහ විගණනය කරන්න මේ සංවිධානවලට. කොහෙන්ද මේ මුදල් එන්නේ. අර කන්තලේ කවුද ඒ දැරිය ගෙලවලලා මැරුවේ රිසානා. රිසානා කියල දැරියක් මැරුම් කෑවා සවුදියට ගිහිල්ලා අඩු වයසෙන් දරුවෙක් මැරිලා. හැබැයි එහෙම තියෙද්දී මිලියන 55 ක් විදයම් කරලා ආසියාවේ ලොකුම පල්ලිය හදනවා කන්තලේ. අර දුප්පත් මිනිස්සුන්ට උදව් කළා නම් හෙන ගහනවාද. ඉතින් අර දුප්පත් මිනිස්සුන්ගේ ද්‍රවිඩතාවය එහෙමයයි. සිංහල මිනිස්සු දුප්පත් වගේම දෙමළ මිනිස්සු දුප්පත් වගේම අන්ත දුප්පත් මුස්ලිම් මිනිස්සුත් මේකේ ඉන්නවා. ඒ ගොල්ලන්ට උදව් කරන්නේ නෑ. අර අන්තවාදයට තක්කයියන්ට කවුද නැඹුරු වෙන්නේ එතෙන්ට උදව් කරනවා මොකද සල්ලි යහමින් ලැබෙන හින්දා.

ප්‍ර : නමුත් අන්තවාදීන් සියළු දෙනාගේම අරමුණ එකයි නේද?

පි : ඔක්කොගේම ගෝල් ඒක එකයි. පාරවල් වෙනස්. පාරවල් වෙනස්. ඒකයි මම කිව්වේ එකම පාන් පිටි වලින් හදන බිස්කට්, පැටිස්, කේක් වගේ නම් විවිධ නම් තියෙනවා එකම පාන් පිටි. ප්‍රිමා පාන් පිටිවලින් තමයි ඔක්කොම හදන්නේ. ඒ වගේ තමයි එකම Ideology එක. වහබිගේ ideology එක. ඒක දැන් අර සලෆි, වහබි, ඉහ්වාන් මුස්ලිම්, ජමාතේ ඔන්න ඔහොම තබ්ලික් ජමාත් කිය කිය එක එක සංවිධානවලින් හැදෙනවා. ඒ වගේම ලෝකේ ත්‍රස්ත සංවිධානයත් එහෙම තමයි බිහි වෙලා තියෙන්නේ.

ප්‍ර : දැන් අද වෙන කොට ලංකාවේ අන්තවාදී සංවිධානවලින් වැඩිම සමාජිකයන් සංඛ්‍යාවක් ඉන්නේ කාටද?

පි : අපි හිතන්නේ මැතිතුමනි තවුහිද් ජමාත් සංවිධානයට.

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

තව ප්‍රශ්න තියෙනවා ස්වාමීන් වහන්සේ අපි කෙටි විරාමයක් අරන් නැවත රැස් වෙනවා. නැවත කොමිෂන් සභාව 09.50 ට රැස්වෙනවා.

දැන් වේලාව : ප.ව. 09.25 යි.

****

දැන් වේලාව : - ප.ව.10.10 යි.

තේ විවේකයෙන් පසු කොමිෂන් සභාව නැවත රැස් වේ.

සාක්ෂිකරු නැවත ප්‍රතිඥා දෙයි.

<u>ගරු විනිසුරු බන්දුල අතපත්තු මැතිතුමා</u>

පි : මට අපේ මැතිතුමා අහපු ප්‍රශ්නේට පොඩි නිදර්ශනයක් පෙන්වන්න විතරක් අවසර දෙන්න. අපේ මැතිතුමා ඇහුවා මේ සංවිධාන අතර තරඟයක් තියෙනවාද කියලා. ඇත්ත වශයෙන්ම තරඟයයක් තියෙනවාද කියලා ඉතින් ඒ තරඟෙට හොඳම උදාහරණය තමයි මේ තියෙන්නේ. මේ අල්කුර්ආන් අර්ථ සංග්‍රහය සමස්ත ලංකා ඉස්ලාම් ආගමික විද්වතුන්ගේ සංගමය. ඒ කියන්නේ ජමෙයිතුල් උලමාගේ ඒ ගොල්ලන් කරපු ප්‍රකාශය. ඊට පස්සේ මේ කුර්ආනය පාරිශුද්ධ වූ අල්කුර්ආනය. මූල ග්‍රන්ථය සිංහල පරිවර්තනය අර්ථ විවරණය විද්‍යාත්මක සාධකය ශ්‍රී ලංකා තවුහිද් ජමාත්. පාරිශුද්ධ වූ අල්කුර්ආනය. මේක එක්සත් අරාබි එමිර් රාජ්‍යයෙන් ගහන්නේ සිංහලට. ඊට පස්සේ මේක මේ ඉංග්‍රීසි කුර්ආනය. මේක අමානා Amana Corporation published by amana corporation ඒ අපිට තව හමු නොවුණු සංවිධානයක් මේ කුර්ආනය. එකම කුර්ආනය කීයකට පරිවර්තනය වෙලාද. ඊළඟට මේ කුර්ආනයේ අර්ථ අල්කුර්ආන් අර්ථ විවරණය. තවුහි අල්කුර්ආන් සිංහල පරිවර්තනය ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාම් ප්‍රකාශනය මේ කරුණු. ඉතින් මේවා එකකට එකක් බැලුවොත් සමහර ඒවාගේ සමාන කම් තියෙනවා සමහර ඒවාගේ තරඟෙට තමයි මේවා කරලා තියෙන්නේ. ඒ මතවාදී තරඟයක්.

ප්‍ර : නමුත් එකම අරමුණ නේද?

පි : එකම අරමුණ.

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු විනිසුරු අදිකාරි මහත්මිය</u>

ප්‍ර : ගරු ස්වාමීන් වහන්ස ඔබ වහන්සේ මෙම කොමිෂම හමුවේ කියා සිටියා Association of Muslim youth of sailani කියලා සංවිධානයක් තිබෙනවා එහි තාසීම් මවුලවි කියන අයෙක් තමයි ඒකේ එම සංවිධානයට නායකත්වය දෙන්නේ කියලා තාසිම් මවුලවි?

පි : ඔව්.

ප්‍ර : ඒ වගේම ඔබ වහන්සේ කිව්වා Association of Muslim Youth කියලා සංවිධානයක් තියෙනවා 1997 පටන් ගත්ත එකක් මහවිල උද්‍යානය, කොළඹ 09 කියන ලිපිනයේ. මෙම සංවිධානයට අර තාසීම් මවුලවි වගේ කිසියම් අයෙකු නායකත්වයක් දෙනවාද ස්වාමීන් වහන්ස මෙම සංවිධානයට?

පි : මැතිනිය ඇහුවේ මේ සෙයිලන් මුස්ලිම් තරුණ සංගමය

ප්‍ර : ඒ සංවිධානය ගැන ඔබ වහන්සේ කිව්වා තාසීම් මවුලවි තමයි ඒකට නායකත්වය දෙන්නේ කියලා. මම ඔබ වහන්සේගෙන් අහන්නේ ඔබ වහන්සේ WAMY ඒ කියන්නේ ඒ සංවිධානයක් ගැන කිව්වා.

පි : WAMY සංවිධානය.

ප්‍ර : ඔව්. ඔබ වහන්සේට ඒ සංවිධානයට අර තාසිම් මවුලවි වගේ මේකටත් කවුරුහරි මෙම සංවිධානයට නායකත්වය දෙන කිසියම් අයෙකු ඉන්නවාද කියලා ? ඒක හොයනකම් මම ඔබ වහන්සේට වෙන් ප්‍රශ්නයක් දෙන්නද ස්වාමීන් වහන්ස?

පි : හොඳමයි. WAMY එක.

ප්‍ර : WAMY එක.

පි : හරි හම්බ වුණා. මෙම සංවිධානයේ මැතිනියනි අධ්‍යක්ෂකවරයෙක් හැටියට මෙහේ කටයුතු කළා කියලා සූඩාන් ජාතිකයෙක් තමයි හඳුනා ගෙන තියෙන්නේ. ඉන් පස්සේ මේ සංවිධානයේ අධ්‍යාපන අංශය භාරව ඉඳලා තියෙන්නේ ඉෂාක් කියලා කෙනෙක්. ඔහු අවසානයේදී ISIS එකට සම්බන්ධ වෙලා තියෙනවා. ඊළඟට ඒ WAMY එකේම වැඩිදුර පුහුණු වීම් ලබපු ඒ කියන්නේ මතවාදී පුහුණුවීම් ලබපු කෙනෙක් තමයි නිලාම් කියන කෙනා. ඔහු සිරියාවේදී මරණයට පත් වෙනවා. ඊළඟට අනිත් උදවිය ඔය තාකීර් සහ තවුසි කියන දෙන්නා ඒත් සිරියාවේදී අර නිලාම්ගේ මරණයෙන් පස්සේ යනවා නමුත් එතනින් එහාට වර්තමාන නායකයා කවුරුන්ද, තාමත් මේක සක්‍රීයව ක්‍රියාත්මක වෙනවාද කියන එක ගැන අලුතෙන් අපිට ඇත්තටම තොරතුරු මොනවත් හොයා ගන්න බැරි වුණා. නමුත් ඊට පූර්වයෙන් මේ

FAIR COMMENT BY JEZEEM

නම් අමතරව මොකද ඒ අපට මේ සමහර තොරතුරු දෙන උදවියත් ඒගොල්ලන් කොච්චර මේ අන්තවාදයට විරුද්ධයි කිව්වත් සමහර නායකයෝ පාවලා දෙන්නේ නැහැ නම් කියන්නේ නැහැ. අපි ඒක ඉගෙන ගත්තා. අපි මේකේ අනතුරු දැක්කයි කියනවා මිසක . ඉතින් ඒක තමයි මට දෙන්න පුළුවන් උත්තරේ.

ප : ඔබ වහන්සේට එහෙම නම් කියන්න පුළුවන්ද මෙම සංවිධානය අර තවුහිද් ජමාත්, තබ්ලික් ජමාත්, ජමාතේ ඉස්ලාමීය හෝ අර ඉහ්වාන් කියන හතරෙන් එකකට වැටෙනවාද කියලා මෙම සංවිධානය?

පි : මේ සංවිධානයෙන් කරන්නේ උදාහරණයක් විදිහට හොඳ අපි දැන් ක්‍රිකට් ඇකඩමියක් වගේ මේක. හොඳට ක්‍රිකටස්ලා හඳුපුවාම එක්කෙනෙක් ගන්නවා Tamil union එකට. තව එක්කෙනෙක් අනිත් club එකට. හොඳ දුවන අශ්වයෝ ඒ ඒ club වලට ගන්නවා. WAMY එකෙන් කරන්නේ මේ වහබි දර්ශනයට අදාළ පුද්ගලයෝ ගොඩ නඟන එක. ඒ ගොඩනැගීමෙන් පස්සෙත් තමන්ට පහසු තැන්වල නතර වෙනවා WAMY එකේ ඉගෙන ගන්න අය. ඒ ගොල්ලන් අර මොකද වහබි දර්ශනයේම වහබි දර්ශනයම ඒ දර්ශනයටම ලොව ගොදුරු කර ගැනීම සඳහා එක එක wing එක එක අතු එක එක සංවිධාන නමින් ගොඩනගලා තියෙන්නේ. හැබැයි WAMY එක තමයි මේකේ භයානකම කණ්ඩායමක් වෙන්නේ. ඒ කියන්නේ මතවාදීව පුද්ගලයන්ගේ ඔළු ගෙඩි වෙනස් කරනවා. පාසල්වල සාමාන්‍ය පෙළින් පස්සේ උසස් පෙළ දක්වා ඒ උසස් පෙළ තෝරා ගැනීම එක්කෝ result එන කල් ඉන්න දරුවෝ ටික අල්ලගෙන WAMY ඒකෙන් ඔළු සුද්ධ කරනවා. ඒ WAMY එකට Muslim Word League එකෙන් සල්ලි එනවා. ඒ ගොල්ලොන්ට විවිධ කඳවුරු පවත්වනවා. ඉතින් ඒක හරියට JVP එකේ පන්ති පහ කරලා JVP කාරයෙක් ගොඩ නඟනවා වගේ තමයි.

ප : ඒ කියන්නේ ඔබ වහන්සේ දැන් මේ WAMY එකෙන් අර අ.පොස. සාමාන්‍ය පෙළ සමත් වුණාම ශිෂ්‍යයෝ අරගෙන වෙන තැන්වලට දාලා මේ ඒගොල්ලන්ව brainwash කරනවා වගේ ඔබ වහන්සේ ප්‍රකාශ කළේ. දැන් මේ ගොල්ලන්ට තියෙනවාද ඔය මාදම්පේ ඉස්ලාහියා වගේ අරාබි පාසල් සහ අරාබි මද්‍රාසා තියෙනවාද මේ ගොල්ලන් යන?

පි : WAMY එකේ ඔය ලිපිනය මහවිල උද්‍යානය. එතන තමයි මේ ගොල්ලොන්ගේ සම්බන්ධීකරණ හෝ ඒ මූලස්ථානය හෝ

FAIR COMMENT BY JEZEEM

තියෙන්නේ. අපට තොරතුරු දුන් මේ WAMY එකේ ඉගෙන ගත්ත අයම සඳහන් කළේ සමහර වේලාවට අර ඉස්කෝලේ වෙලාවෙන් පස්සේ තෝරා ගත්ත කණ්ඩායම් වලට ඉතින් ආගමික දේශනාවක් කරන්නනේ එන්නේ. මේ ධර්මය උගන්වන්න දරුවෝ යහමඟට ගැනීම ගැන ඕවා තමයි කතා කරන්නේ හැබැයි ideology එක අහන් ඉන්නේ නැනේ වෙන කවුරුත්. ඒ හිතවන්තකම් ඇති වුණාම සමහර විට ඉසේකාලේ ඇතුලේ තැනක් කියලා විශේෂ තැනක් මෙන්න මෙතන තමයි පුහුණු කඳවුර කියලා තැනක් නැහැ. සමහර වේලාවට හඳුන ගත්තොත් මේ ළමයා හොඳයි මේ වැඩේට කියලා ඔහු ඒ ගෙදරට ගිහිල්ලා ඒ තබ්ලික් ජමාතේ කරනවා. ගෙවල් ගානේ ගිහිල්ලා. ඉතින් ඒ WAMY එකේ ඒ හැඩය එහෙමයි.

ප්‍ර : ඔබ වහන්සේ අහලා තියෙනවාද ජමාතේ මිල්ලතතේ ඊබ්‍රහීම් ෆී සෙයිලානි කියලා සංවිධානයක් ගැන?

පි : එහෙමයි අහලා තියෙනවා.

ප්‍ර : ඒ සංවිධානයයි AMYS එකයි අතරේ සමාන සබඳතාවයක් තියෙනවාද සමානාත්වයක් ?

පි : මේ ගොල්ලො මතයෙන් ඔක්කොම එකයි.

ප්‍ර : මතය නෙවෙයි ක්‍රියාකාරීත්වය අතර?

පි : ක්‍රියාකාරීත්වය ඔව් ක්‍රියාකාරීත්වය දැන් අපිට දැන් හමු වෙලා තියෙන්නේ තවු අයගේ විතරයිනේ. මේ අය ඒ කියන්නේ අරමුණට යාම සඳහා දැන් යුද්ධෙකට යන කොට කොටසක් ආහාර සම්බන්ධයෙන් බලනවා. සමහරු කොටසක් ආර්ථිකය පැත්ත බලනවා. තව කොටසක් Suppliers ලා. ඒ ආදී වශයෙන් මේ එකම වැඩ පිළිවෙලක එකම වැඩපිළිවෙලට පරිවාර වැඩ පිළිවෙලවල්. ඉතින් මේක මේ හැඩය මොකක්ද කියලා කියන්න බෑ. මොකද මේ මතවාදය ඔවුන්ගේ මේ රට ආක්‍රමණය කර ගැනීම.

ප්‍ර : ජමාතේ මිල්ලති ඊබ්‍රහීම් ෆී සෙයිලානි කියන එක ගැන ඔබ වහන්සේට මොනවාද දැන ගන්න ලැබුණේ?

පි : මගේ ළඟ තියෙනවා ඒ පරණ ලියවිල්ලක් ඒක ඒ සංවිධානය ගැන වෙන්න ඕන. නෑ මේකේ පරණ එකේ තියෙනවා. මේක හරිම වැදගත්. මේ තියෙනවා මැඩම් හම්බ වුණා. ශ්‍රී ලංකා ජමාතේ

ප්‍ර : ජමාතේ මිල්ලති ඊබ්‍රහීම් ?

පි : ජමාතේ මිල්ලති ඊබ්‍රහීම්.

ප්‍ර : ඔබ වහන්සේට සොයා ගන්නට අපහසුයි නම් මම පසුව සොයා දීමට හැකිනම් මම වෙන ප්‍රශ්නෙකට ?

FAIR COMMENT BY JEZEEM

පි : හොඳමයි.

ප්‍ර : දැන් ඔබ වහන්සේට අසන්නට ලැබුණාද මෙම කොමිෂම හමුවේදී Expert Evidence විශේෂඥ සාක්ෂිවලදී දැන ගන්නට ලැබුණා මෙම කොමිෂමට IS සංවිධානය විසින් ශ්‍රී ලංකාවේ විලායත් අස් සෙයිලානි කියලා ඒ ගොල්ලොන්ගේ Province එකක් ප්‍රකාශයට පත් කිරීම පිළිබඳව කටයුතු කරමින් සිටිනා බව. ඔබ වහන්සේට අධ්‍යයනය කිරීමේදී එබඳු තොරතුරු සොයා ගන්නට හමු වුණාද?

පි : ඔව් අද ඊයේක නෙවෙයි. දැන් හැබැයි අන්තර්ජාලයෙන් නම් ඒවා හොයා ගන්න අමාරුයි. ඔය ISIS අයගේ ක්‍රියාකාරකම් ලොව පුරා බහුල වීමත් ඒ ISIS ක්‍රියාකාරීකයන්ගේ ඒ ක්‍රියාකාරකම් නිසා ලෝකයා භීතියට ඇලලී ගිය කාලවල අපි අවධානය යොමු කළා අර බෙලි කපන හැටි බලන්න. මොකක්ද මේ වෙන්නේ. නමුත් ඒ වෙද්දී මෙහේ සමහර මුස්ලිම් කොටස් ලංකාවේ සිතියම කොළ පාටින් ලකුණු කළා. දැන් ඒවා අවාසනාවට ගන්න විදිහක් නෑ. ඒවා මොනවා හරි මම හිතන්නේ delete කරලා. ආසියානු කලාපයේ පහසුවෙන්ම ඉස්ලාමීක රාජ්‍ය පිහිටු වන්නේ ලංකාවේ කියලා ඔවුන් සපත කරලා තිබුණා. ඉතින් ඒක තමයි අපි දැන ගෙන හිටියේ. ඒ කියන්නේ එහෙම දෙයක් ඒ ගොල්ලො එහෙම දෙයක් කියන්න පුළුවන් නමුත් කොළඹ කළු කොඩි උස්සනවා අපි ISIS කොඩිය ලංකා සිතියමේ ලෙල දෙනවයි කියලා ලෙල දෙවන්න බලාපොරොත්තු වෙනවා කියලා ඒ ගොල්ලො ප්‍රකාශන නිකුත් කරලා තිබුණා.

දැන් වේලාව : ප.ව. 10.25 යි.
මෙතැන් සිට ල/ලේ :- ධම්මික මිය.

President Secretariat
FAIR COMMENT BY JEZEEM

පෙර සටහන් කරන්නේ මුතුමාලී මෙනවිය විසින්ය.
වේලාව රාත්‍රී 10.25
මෙතැන් සිට ධම්මිකා පෙරේරා විසින්ය.

<u>ගරු අදිකාරී මැතිනිය.</u>

ප්‍ර : ඔබ වහන්සේට අදහසක් නැද්ද ඔය Province එක කොහේද declare කරන්නට හිතාගෙන හිටියේ එහෙම කියලා? දැන් Province එකක්නේ declare කරන්න හිටියේ?

පි : Province එකක් හැටියට ඔය අපි දැනුවත් වෙන කොටස Province එකක් නෙමෙයි ඇත්ත වශයෙන්. රටම. Province එකක් නෙමෙයි. සමහර විට ඔය මුස්ලිම්වරුන් හැටියට දෙසොහොයුරන්ගේ සහෝදරයෝ දෙන්නෙක් එකතු වෙලා අර හදා ගත්ත වැඩ පිළිවෙලක්. ඒගොල්ලන්ට භාර දුන්නද දන්නේ නැහැ ඒ කොටස.

ප්‍ර : කවුද සහෝදරයෝ දෙන්නා කියන්නේ ස්වාමීන් වහන්ස?

පි : ඒ කියන්නේ සහෝදරයෝ දෙන්නෙක්ගෙන්, ඊබ්‍රාහිම් ඒගොල්ලන් නියෝජනය වුණා මට මේ හොයා ගන්න බැරි වෙච්ච මැතිනිය මුලින් අහපු අර සංවිධානය. මොකද මැතිනියණි උදාහරණයක් විදියට දැන් මේවා පොඩි පොඩි කෑලි එකතු වෙනවා. ඒ කියන්නේ අපි හිතමුකෝ මුදල් ගෙන්න ගන්න එක බැංකුවකට අපි හිතමුකෝ ජමාතේ ඉස්ලාම් නමින් තියෙනවා, බැංකුවෙන් අහනවා ඇයි ඕගොල්ලන් මේකට මේ වුණේ කොහොමද, ඊලඟට තව එකකට ඉස්සරහට අල් ජමාතේ කියලා කෑල්ලක් දානවා ඉස්සරහාට. ඒ වගේ හොයන්න අමාරුයි. ඉතින් දැන් මෙතන මේ එකක් අපිට හම්බ වෙලා තියෙනවා ජමාතුල් මුස්ලිමීන් කියලා එකක්. ඉතින් ඒක මේවයේ ආවේ නැහැ, ජමාතුල් මුස්ලිමීන් කියන එක. ඒක 83 දශකයේ මුල් භාගයේ කල්පිටිය ඒත්තාලේ පදිංචි මොහොමඩ් උමර් සහ මොහොමඩ් නදීර් මවුලවි විසින් ජමාතුල් මුස්ලිමීන් ලෙස වෙනම කොටසක් ආරම්භ කරන ලදි. ඉතින් දැන් ඒ සමහර ඒවා ඒ පුද්ගලයොත් නැහැ. සමහර සංවිධාන අකර්මන්‍ය වෙච්ච ඒවත් තියෙනවා. ඉතින් ඒ ideology එක අරගෙන තව කෑල්ලක් ඉස්සරහාට දාලා මේක හැදුවා. දැන් හෙළ උරුමය පිවිතුරු හෙළඋරුමය වෙන්නේ ඒ වගේ.

ප්‍ර : ඔබ වහන්සේ තායිලන්තයට ගිය අවස්ථාවකදි

පි : මියෙන්මාරයට.

FAIR COMMENT BY JEZEEM

ප : මියෙන්මාරයට ඇමරිකන් ඩොලර්ස් බිලියන 47 කින් ශ්‍රී ලංකාවට ඩොලර් බිලියන 27 ක් ලබාදීම පිළිබඳව මේ කොමිෂම හමුවේදී ප්‍රකාශ කලා නේද ස්වාමීන් වහන්ස?

පි : ඔව්.

ප : ඔබ වහන්සේට වැඩිදුරටත් කරුණු දැන ගන්න ලැබුණද ශ්‍රී ලංකාවේ කිනම් මෙම සංවිධානවලින් කිනම් සංවිධානයකට මෙම මුදල් දීම සඳහා ද කටයුතු කරමින් ඉන්නේ කියලා?

පි : එය යම් පමණකට නිවැරදි විය යුතුයි. ඩොලර් බිලියන 46 ක්. ඉන් ඩොලර් බිලියන 26 ක් තමයි ලංකාවට. ඩොලර් බිලියනයක් කියන්නේ විශාල මුදලක්. ආණ්ඩුවක් පිටරටකින් ණය ගන්නෙත් බිලියන 5 කට අඩුවෙන්. ඒ අය අපට කිව්වේ පකිස්ථානයේ තමයි බුද්ධි මෙහෙවර සඳහා කණ්ඩායම් පුහුණු කරන්නේ. අපේ බුද්ධි අංශවලින් වුණත් යනවා පකිස්ථානයට ඒ පුහුණුව ලබා ගැනීමට. මියෙන්මාරේ ඊලඟට අසල්වැසි බංගලිදේශයේ ඒ අයගේ මුහුණු එක වගේ. මියෙන්මාරය කියලා කියන්නේ විශාල රටක්, ජනවර්ග 137 ක් ජීවත් වෙනවා ඒ රටේ. විවිධ භාෂාවල් කතා කරනවා. බුද්ධි අංශවලට පුද්ගලයෝ පුහුණු කිරීම සඳහා විශාල ප්‍රමාණයක් ඒ අයගෙත් පකිස්ථානයට එහෙම යනවා. එහේදී ඒ බුද්ධි අංශ අර මේගොල්ලන්ට ගොඩක් භාෂාවල් පුළුවන්, වෙනත් අය කතා කරපු දෙයක් හරියට ඒවා ගොනු කරගෙන තමයි මේ හෙළිදරව්ව කරන්නේ. ඉතින් මොන සංවිධානවලට එනවද දැන් උදාහරණයක් විදියට ඔය දැන් මම අද මෙතනට ගෙනල්ලත් තියෙනවා ඒක ඇදලා ගත්තොත් මහා කුණු බාල්දියක් වගේ. දැන් සාෆියේ අර කුරුණෑගල සිද්ධිය ගත්තොත් ඔහු වෛද්‍යවරයෙක්. ඔහු රස්සාවට යන කොට තියෙන්නේ රුපියල් ලක්ෂ 5 යි බැංකු පොතේ. හැබැයි මේ සිද්ධිය කාන්තාවන් වඳ කරනවා කියන කතාවට චෝදනාවට ලක් වෙන කොට කෝටි 74 ක් තියෙනවා Account එකේ. වෛද්‍යවරුන්ට එහෙම හම්බ කරන්න පුළුවන්ද. එතකොට ඒ ගැන කතාවක් නැහැ ඒ තියෙන අසාමාන්‍ය දේපල. එතකොට සමහරුන්ට මාධ්‍යය ආයතන තියෙනවා. දැන් කොහොමද රිෂාඩ් බදුර්දීන්ට මැක්ස් TV එක U TV කියලා ගන්න සල්ලි කොහෙන්ද මොනවා හරි රස්සාවක් කරනවා අහලා තියෙනවද කවුරු හරි කවදාවත්. එතකොට ඇමති කෙනෙකුට ලැබෙන පඩියක් තියෙනවා. අනික් සල්ලි කොහෙන්ද එන්නේ, දැන් චැනල් එකක් තියෙනවා. එතකොට සන්නිවේදන මාධ්‍යයක් කියන්නේ ප්‍රබල මාධ්‍යයක්. ඒ මතය මිනිස්සුන්ට ගෙනියන්න. ඔහුට මාධ්‍යයක් තියෙනවා. නාළිකා කොච්චර තියෙනවද. වෙබ් අඩවි කොච්චර තියෙනවද.

FAIR COMMENT
BY JEZEEM

මැතිනියණි මුස්ලිම් සමාජයට මුස්ලිම් ජනමාධ්‍යයවේදීන් ගොඩ නැංවීම සඳහා වෙනම ම තියෙනවා මහරගම ආයතනයක් පිහිටුවලා. ලංකාවේ කොහේ මුස්ලිම් දරුවෙක් ආවත් ජන මාධ්‍යය කරන්න එතන නොමිලේ උගන්වනව Accommodation, foods ඔක්කොම නොමිලේ. එහෙම වැඩ පිළිවෙලක ඉන්නේ. ඒ සල්ලි කොහෙන්ද එන්නේ කියලා අපි ආණ්ඩුවක් නෙමෙයි, ආණ්ඩුවක බුද්ධි අංශ හෝ නැත්නම් ඒ විශේෂයෙන් Immigration එක හරි නැත්නම් බැංකුවලින් හරි ඒවා අනාවරණය වෙන්නේ නැහැ. දැන් සමහර දේවල් අපි දන්නවා මැණික් ව්‍යාපාරය. එහෙම සමහර ව්‍යාපාර අත්පත් කරගෙන ඉන්නවා කාටවත් ඇතුලට යන්න බැරි. එතකොට රටේ මැණික් ව්‍යාපාරය හින්දා කෝටි 15 ක් lost අවුරුද්දකට. කවුරුත් කතා කරන්නේ නැහැ, ඉතින් මේ සල්ලි එන විදිය ගැන අපිටත් බරපතල ප්‍රශ්නයක් තියෙනවා. කොහොමද මේ ගොල්ලෝ සියළුම ව්‍යාපාරිකයන්ට වඩා අඩු මිළට බඩු දෙන්නේ කොහොමද. ඒක ප්‍රශ්නයක්. දැන් අපි දන්නවා සමහර ව්‍යාපාර ආයතනයක් තියෙනවා ඒක තායිලන්තයේ සමහර ගම් පිටින් අරගෙන තියෙනවා. ඒගොල්ලෝ තමයි අඩුවට ම ඇඳුම් දෙන්නේ ලංකාවේ. ඉතින් ඒ වගේ අපිට කියන්න බැහැ කොහොමද ඒ මුදල් එන්නේ කියලා මැතිනියණි.

ප : ඔබ වහන්සේගේ අධ්‍යයනයේදී තොරතුරු හෙළිවුණාද දැන් මේ කුර්ආනයේ තියනවානේ ස්වාමීන් වහන්ස සකාතේ කියලා ආදායමෙන් 2.5 ක් පල්ලියට ලබා දෙන්න ඕන බද්දක් හැටියට එම මුදල් තමයි පල්ලිය විසින් මුස්ලිම් ජනතාවගේ යම් යම් අවශ්‍යතාවයන් වෙනුවෙන් වියදම් කරන්නේ කියලා. ඒවගේම ඔබ වහන්සේ මේ පොතේ එක තැනක කියලා තියෙනවා කුඩු මුදලාලිලා 7 දෙනෙක් ලංකාවේ ඉන්නවා කියලා මේ මුස්ලිම් ඔබ වහන්සේට අධ්‍යයනයේදී තොරතුරු ලැබිලා තියෙනවද දැන් ඔය සකාතේ හැටියට දෙන මුදල් සහ මෙම කුඩු මුදලාලිලා වැනි අයගේ මුදල් මෙම ත්‍රස්තවාදී සංවිධානය සඳහා ලබාදීමක් සිදු වෙනවා කියා?

පි : එහෙම ත්‍රස්තවාදයට මුදල් දෙනවද දන්නේ නැහැ මැතිනියනි, මොකද මේ ඔය මිනිස්සු ඔය කියන තරම් ආගමට ආදරේ නැහැ, මේ සල්ලි. සල්ලි හොයන්නේ. එතකොට සමහර කණ්ඩායම් අපි දන්නවා නගරබඳ අපි ඔය කියන අඩු ආදායම් ලබන පැල්පත් අපිට විශාල ප්‍රමාණයක් අහිමි වෙලා තියෙනවා මේ මෑත කාලයේදී. අපි ඒ ගැන අධ්‍යයනයක් කළා. ඒ අධ්‍යයනය කරගෙන යන කොට තමයි අර පාතාල තර්ජනයක් අපිට එක් අවස්ථාවක එල්ල වුණාම

FAIR COMMENT BY JEZEEM

මට ඇත්තටම මේ මහන්සියත් එක්ක නම මතක වෙන්නේ නැහැ. ඒ පාතාල නායකයා බොහොම මුස්ලිම් නායකයෙක් පාතාලේ කාන්තාවක් විදියට තමයි හිටියේ. ආනමාලු ඉමිටියාස් නෙමෙයි. තව නමක් තියෙනවා. ඔහු එක දොරකින් ඇතුල් වුණාම පිට වෙන්නේ දෙමටගොඩ පැත්තෙන් ඒතරම් ඒක රාජධානියක්. ඉතින් මැතිනියනි මම කියන්න හැදුවේ ඔය කුඩු ජාවාරමේදී පැල්පත් වාසී මිනිස්සු දවසේ වෙහෙසිලා වැඩ කරන නගර සභාවේ වෙන්න පුළුවන් කාණු සුද්ධ කරන ඒ අහිංසක මිනිස්සු නූගත්. ඉස්සරවෙලා නොමිලේ දෙන්නේ. ඒකට පුරුදු කරනවා. දෙමාසයක් විතර යන කල් චුට්ට චුට්ට නොමිලේ දීලා වැඩ කරන්න පුරුදු කරනවා. තුන්වෙනි මාසේ යන කොට බැහැ, ටික ටික Addict වෙලා. ඊට පස්සේ සල්ලිවලට දෙනවා. දන්නෙම නැහැ අවුරුදු 1 ½ ක් 2 ක් යන කොට තියෙන්නේ පර්චස් 2 යි නැත්නම් 3 යි කුඩු බීලා ණයට. දැන් පලයන් යන්න කිව්වාම ගේ අතහැරලා ගියපු ඕන තරම් තියෙනවා මේවායේ තොරතුරු. විවිධ විදියට පාතාලය හදනවා. බිස්නස් මෑන්ලා හදනවා එක එක ඔය සකාතේ දෙන 2 යි දශම ගානෙන් මේ රටේ ඉන්න මුස්ලිම් ප්‍රජාව බෙදලා අරන් බැලුවාම කරන්න බැහැ. සහ මැතිනියනි හිතලා බලන්න අධ්‍යයනයක් කරලා තියෙනවද මේ රටේ පාලකයෝ මේ අළුතින් හදලා තියෙන නවීන පල්ලි ඔක්කොම අධි තාක්ෂණික පල්ලි. දැන් අපේ පන්සල්වල චන්ද්‍රිකා තාක්ෂණය නැහැනේ මැතිනියනි. අර මහ කෝප්ප ගහලා ඒගොල්ලෝ ඒ ඒ සංවිධනවල මුල් තැන් එක්ක තමයි යාච්ඤාව කරන්නේ, ඒ ආකෘති බලන්න මොන තරම් විශාල ධනස්කන්දයක්ද කියලා, ඒවා දුප්පත් මිනිස්සුන්ට, මුස්ලිම් මිනිස්සුන්ට දෙනවා නම් කොච්චර දෙයක්ද, ඒ කුර්ආනයේම කියලා තියෙනවානේ දුප්පත් අයට දෙන්න කියලා. ඒක නොකර ඇයි මේ ගොඩනැගිලි ගහන්නේ. ඒවා නවීන විදියට අධි තාක්ෂණික පල්ලි විදියට.

ප : ඒ සඳහා ඔබ වහන්සේ කිව්වනේ මෙම කොමිෂමට කිසියම් සංවිධානයකින් මුදල් ලැබෙනවා කියලා ඉස්ලාම් ජාත්‍යන්තර සංවිධානයක්?

පි : ඔව් ඒක තමයි මැතිනියනි දැන් අපිට හිතා ගන්න බැරි මුස්ලිම් වර්ල්ඩ් ලීගයට අර ඩොලර් බිලියන 26 සල්ලි ඇවිල්ලා ඒ හරහා ටික ටික එනවද මම වගකීමෙන් කියන්නේ ඔය මුස්ලිම් වර්ල්ඩ් ලීග් නායකයෝ එන කොට අපි විරුද්ධ වුණා. විරුද්ධ වුණාට වැඩක් නැහැ, ඔන්න මහා නායක හාමුදුරුවන්ටත් ගිහිල්ලා ආරාධනා කලා. මහානායක හාමුදුරුවන් වඩම්මන්න. මම කියන්නේ නැහැ අල්ලස් කියලා, ආධාර මුදල් නම් දීලා තිබුණා

FAIR COMMENT BY JEZEEM

ඔක්කෝටම. ඉතින් හරි හොඳයි සාමය හදන්න. ඉතින් කොහොමද අපි මේක උඩුගම් බලා පීනන්නේ පොඩි කණ්ඩායමකට. ඒ සල්ලිත් එක්ක හැරෙන්නවත් බැහැ. ඉතින් අරවගේ එක්කෝ තානාපති කාර්යාල හරහා ද අර සල්ලි එන්නේ. ඉතින් හරිම මෙන්න මේ පොත් පත් වගේ තමයි තේරුම් ගන්න බැහැ ක්‍රමය.

ප : ඔබ වහන්සේ කියන්නේ නීත්‍යානුකූල බැංකු ක්‍රමය හරහා නෙමෙයි වෙනත් මොකක් හරි නීති විරෝධී ක්‍රමයකින් මෙම මුදල් එනවා ඇති කියලද?

පි : ඔව් මැතිනියනි මට වෙලාව පොඩ්ඩක් ගියත් ඒක වැදගත් කියලා හිතෙනවා. මැතිනියනි මෙහේ පිහිටෙව්වා මේ අමානා, ඒකට කලින් මැතිනියනි මම කියලා ඉන්නම්, මැතිනියනි අපි මේක 2012 ඉදලා මුස්ලිම් අන්තවාදයක් ගැන තොරතුරු කියාගෙන එන කොට මේ බලන්න බොර දියේ මාළු බාන මිනිස්සු. මේ එක්කෙනෙක් හම්බ වුණා මෙතන තියෙනවා 81 ලක්ෂ 53705 ක් අපේ නීතිඥ මහත්තයා පොඩ්ඩක් කියවන්න මට ඇත්තටම මහන්සියි. මේ අපේ මතය විනාශ කිරීම සඳහා අපි මේ මතය ගේන කොට NGOS වෙනම develop වෙනවා. ඒවටත් සල්ලි එනවා. අපිව යටපත් කරන්න. මේ ඇත්ත මතුකරන්න නොදී. ඒක වුට්ටක් පෙන්නන්න. මේක කියවන්න නම් ටිකත්

ප : ඔබ වහන්සේගේ ඒ ලේඛනයේ නමුත් තියෙනවද පුද්ගලයන්ගේ.
(මේ අවස්ථාවේදී ස්වාමීන් වහන්සේගේ නීතිඥ මහත්මයා විසින් එම කොටස කියවයි.)
එම ලේඛනය මැතිනියනි Fixed Obligation Grant යනුවෙන් දක්වා තිබෙනවා. එම ලේඛනයේ The Annex 2 වශයෙන් දක්වා ඇති ලේඛනයෙහි පලමු ඡේදයේ සඳහන් එක් වගන්තියක් කියවයි.....(ඉංග්‍රීසියෙන් කියවයි)

පි : අපි කවදාවත් මුස්ලිම් ව්‍යාපාර වර්ජනය කරන්න කියලා කියලා නැහැ. එකම තැනකදී විතරක් අපි කිව්වා මේ විදියට ගියොත් අපට තියෙන ප්‍රජාතන්ත්‍රවාදී එකම ක්‍රමය අපි ආයුධ ගන්නේ නැහැ, අපිට එහෙම ඉගැන්වීමක් නැහැ අපේ ආගමේ. අපට තියෙන්නේ ඔගොල්ලන්ගේ ව්‍යාපාර වර්ජනය කරන එක. එහෙම වුනොත් ඕගොල්ලන්ට අබසරණයි. අබසරණයි කිව්වේ වේලෙනවා. ඒ හැරෙන්න කවදාවත් මුස්ලිම් ව්‍යාපාර නවත්වන්න කියලා අපි කියලා නැහැ කොහේවත්. නමුත් මේ රාජ්‍ය නොවන සංවිධාන මේ ඇමරිකානු අරමුදල් මේ සංවිධාන දෙකක්. එකක් NPC National Peace Council එඩ්රස් එකත් තියෙනවා ලැබිච්ච ගානත් තියෙනවා, බාලචන්ද්‍රන් ගෞතමන්. මෙගොල්ලන්ට

FAIR COMMENT BY JEZEEM

වෙනම හම්බ වෙලා තියෙනවා 8 මිලියන්. 2014.08.31. මෙයාට හම්බ වෙලා තියෙනවා 2013.08.05 බිටර් ෆෑන්ඩුට. ඒ දෙකම බොදු බලසේනා සම්බන්ධයෙන් වැරදි මත හදන්න. එතකොට අමානා බැංකුව සම්බන්ධයෙනුත් එතන ඉන්නේ අර අහපු නිසා.

ප : ඔබ වහන්සේට මම නැවතත් ඔබ වහන්සේ දැන් පෙන්නපු කොල දෙකෙන් චෝදනා කරන්නේ බොදුබල සේනාවට මෙම මුදල් ලැබුණා කියන එකද?

පි : නැහැ. බොදුබල සේනා සංවිධානය මුස්ලිම් අන්තවාදයක් පිළිබඳ හෙළිදරව් කරගෙන එන විට බොදුබල සේනා සංවිධානය යනු බෞද්ධ අන්තවාදී සංවිධානයක්, මේගොල්ලෝ කරන්නේ මුස්ලිම් අයගේ ව්‍යාපර වහන්න කියලා මතය හදන්න කියන එක යනාදි වශයෙන් මුස්ලිම් අයට support කරමින් අපගේ මතය ඉදිරිපත් කිරීම වලක්වාලීම සඳහා මේ රාජ්‍ය නොවන සංවිධාන

ප : සහ ඔවුන්ට මුදල් ආධාර ලැබෙනවා

පි : මුදල් ලැබෙන හැටි. මේක ඉතාම සත්‍ය ලියවිල්ලක්. මේක බලාගෙන ඉන්න බැරුව අපට කෙනෙක් ගෙනල්ලා දීපු ලියවිල්ලක්. ඕන තැනක ඔප්පු කරන්න පුළුවන්. ඒ වගේම මැතිනියනි ඒක අත්‍යාවශයෙන්ම සැලකිය යුතු කාරණාවක් සහරාන්ව පුපුරන්න කලින් අමානා තකෆුල් බැංකුවේ වැඩ කරන කණ්ඩායමක් ඒක President ලියලා තිබුණා හැමෝටම ලියලා තිබ්බා. ඒ ලියවිල්ල මට දැන් හොයා ගන්න අමාරුයි මෙතන. එහිදී කියලා තිබුණා ලෝකේ ඉස්ලාමීය ත්‍රස්ත කල්ලිවලට යොදවන මුදල් මේ බැංකුවට එනවා. අපට මේ සභාපතිවරයා ගැන විශාල සැකයක් තියෙනවා. එහි සේවකයෝ. අවශ්‍ය පාලකයන්ට කියලා බැරිම තැන අපට ගෙනල්ලා දුන්නා. අපට ඉතින් තියෙන්නේ මතක් කරපු අයට ආපහු මතක් කරලා වැඩක් නැහැනේ. මාධ්‍යය හමුවක් තියලා ඕකට සල්ලි දාන්න එපා කියන්න හරි මොනවා හරි දෙයක් කියනවා හැරෙන්නට අපිට විකල්පයක් නැහැ. ඉතින් අපි ඒ දැනුවත් කිරීම කරලා තියෙනවා. නමුත් ඔවුන්ටම ආවේණික බැංකු පද්ධතියත් හදා ගත්තා. අමානා තකෆුල්.

ප : එම ලියවිල්ල ඔබ වහන්සේට ඉදිරිපත් කරන්න පුළුවන්ද පස්සේවත්?

පි : අනිවාර්යයෙන් ඉදිරිපත් කරන්න පුළුවන් දැනුත් පුළුවන් වෙයි. මට දැන් පොඩ්ඩක් කලබලේට.

ප : ඔබ වහන්සේ 2013.03.26 රිවිර පත්තරේට කියලා තියෙනවා අද මේ වෙද්දි ලංකාවට හෙරොයින් මහා පරිමාණයෙන් ගෙනෙන මුදලාලිලා 11 දෙනාගෙන් 9 දෙනෙක්ම මේ අන්තවාදීන්, ඔබ

FAIR COMMENT BY JEZEEM

වහන්සේට මම හිතන්නේ නම් ප්‍රකාශ කිරීම, ඔබ වහන්සේගේ කතිකාවතක ඇරඹුම කියන එකේ 17 වන පිටුවේ මම ඔබ වහන්සේට කියන්නේ නැහැ ප්‍රසිද්ධියේම මේ කුඩු මුදලාලිලාගේ නම් කියන්න කියලා, ඔබ වහන්සේට පුළුවන් නම් ලියලා හරි මෙම කොමිෂමට දෙන්න, මොකද මේගොල්ලන් 9 දෙනෙක් ම අන්තවාදීන් කියන්නේ ඉස්ලාම් ආගමික අන්තවාදීන්ද ඔබ වහන්සේ අදහස් කරන්නේ?

පි : කුඩු ව්‍යාපාරවලට සම්බන්ධ අය අනියමින් මේ මතවාද මේ ඉස්ලාමීය අන්තවාදී මතවාද සපයන උදවියට පාතාලමය රැකවරණ ලබා දෙනවා. දැන් අපිට කිසිම Security එකක් නැහැ. අපි නිදහසේ සැරිසරන්නේ ඕන වෙලාවක අපි උණ්ඩයකට බිලිවෙන්න පුළුවන්. නමුත් ඔවුන් එහෙම නෙමෙයි. ඔවුන්ගේ කටයුතු සියල්ල රහසිගතව සිද්ධ වෙන්නේ. ඉතින් ඔය පාතාල එයට සම්බන්ධ පුද්ගලයන් නම් එවකට ඒ නම් 7 ක් ගැන අපි දුන්නා. මම හිතන්නේ දැන් නම් 2 ක් 3 දෙනෙක් මෙලොව නැහැ. මට ඒ නම් ටික දෙන්න පුළුවන්. ඉතුරු වෙලා ඉන්න අය බලලා.

ප්‍ර : ස්වාමීන් වහන්ස දැන් හාජ්ජියාර්වරුන් කිහිප දෙනෙකු සම්බන්ධයෙන් මෙම කොමිෂමට මීට ඉස්සෙල්ලා සාක්ෂිවලින් කරුණු ඉදිරිපත් වෙලා තිබෙනවා. ඔබ වහන්සේගේ අධ්‍යයනයන් වලදි හමු වෙලා තියෙනවද ශ්‍රී ලංකාවේ විශේෂයෙන් කොළඹ සහ ආසන්න ප්‍රදේශවල හාජ්ජියාර්වරුන් මෙම ඉස්ලාම් අන්තවාදී සංවිධානයත් සමඟ සම්බන්ධ වී කටයුතු කරන බවට?

පි : ඒක වෙන්නේ ඉතාම සූක්ෂමව. ගම්පලට ගියොත් ගම්පලටම සල්ලි බෙදන හාජ්ජියාර් කෙනෙක් ඉන්නවා. බලංගොඩට ගියොත් බලංගොඩ වෙනම හාජ්ජියාර් කෙනෙක් ඉන්නවා. ඔහු තමයි මුළු Society යම බලා ගන්නේ. ඔහු අන්තවාදීන්ට උදව් කරන්නේ නැහැ හැබැයි මද්‍රසාවකට වියදම් කරනවා. එහෙමනේ ඒක වෙන්නේ, ප්‍රසිද්ධියේ ගිහිල්ලා තවුහිද් එකට සල්ලි දෙන්නේ නැහැ. තවුහිද් එකේ සමාජ සේවා වැඩ ටික කර ගන්න සල්ලි දෙනවා. අහපුවාම කියන්නේ අනේ අපි දැනන් හිටියේ නැහැ අපි උදව් කලේ මේ වැඩ සටහනට නේ. මේ පොත් ටික අච්චු ගහන්නනේ. මේ ගොඩනැගිල්ල හදලා දෙන්නනේ. එහෙම තමයි ඒ සල්ලි පරිහරණය වෙන්නේ. වෙන වෙනත් ක්‍රමවලට. සෘජුව අර කාඑක්කවත් ඒගොල්ලෝ පෙනී ඉන්නේ නැහැ. එයා හාජ්ජියාර්. එයා පන්සලටත් පොඩි ගානක් දෙනවා. මෙහාට 95,000 ක් දෙන කොට මෙහාටත් 5000 ක් දෙනවා. ඉතින් හරි හොඳයි හාජ්ජියාර්. ඒවගේ තමයි ඔක්කොම නරකයි කියලා

FAIR COMMENT BY JEZEEM

කියනවා නෙමෙයි, නමුත් මේ මුදල් බෙදන්නේ අර විදියට විවිධ ව්‍යාපාති හරහා.

ප : ඔබ වහන්සේට අහන්න ලැබිලා තියෙනවද මල්වාන ප්‍රදේශයේ ඉස්මයිල් හාජ්ජියාර් කියලා පුද්ගලයෙක් ගැන?

පි : අහලා තියෙනවා.

ප : මොනවද ඔබ වහන්සේ ඉස්මයිල් හාජ්ජියාර් ගැන දන්නේ ඔබ වහන්සේ මොනවා හරි අධ්‍යයනය කරන්න ඇති මං හිතන්නේ මෙම ඉස්ලාම් අන්තවාදය ගැන සොයන කොට මොනවද ඔබ වහන්සේ?

පි : මැතිනියනි මල්වාන කියලා කියන්නෙත් ඉස්ලාම් ආගමික අන්තවාදීන්ගේ ඉතාම පහසු ගොදුරු බිමක්. මල්වාන කියන්නේ ඉතාම ඓතිහාසික තැනක් අපට. ඉස්සර පෘතුගීසින්ගේ කාලේ සටන් වැදිලා බේරා ගත්ත තැනක්. එතකොට අපි මේ ගැන ඒ ඉස්මයිල් හාජ්ජියාර් ඇතුළු හාජ්ජියාර්ලා ගැන වෙනම ලේඛනයක් සකස් කරලා දෙන්නම් මැතිනියනි.

ප : ලෆාර් හාජ්ජියාර් කියලා එක්කෙනෙක් ගැන ඔබ වහන්සේ අහලා තියෙනවද ලෆාර් හාජ්ජියාර් ?

පි : වැඩේ වෙලා තියෙන්නේ මේ නම් දැන් අබ්දුල් රහුමාන් නමින් කී දෙනෙක් ඉන්නවද, ඒ ඔහුමද කියලා අපි හරියටම කියන්න ඕනේ පුද්ගලයෙක් ගැන අහද්දි.

ප : ඔබ වහන්සේ එහෙම නම් පස්සේ එහෙම ලේඛනය ලබා දෙන්න?

පි : සමාවෙන්න මොකද ඔබ තුමියට වෙනත් පැත්තකින් අවධානය යොමු කරන්න පුළුවන්. දැන් ලංකාවට මම කලින් දවසකත් මම කිව්වා ගෙන්නනවා අල,ලූණු ගෙන්නන මුවාවෙන් සපත්තු කන්ටේනරයක්. උදාහරණයක්. එතකොට ඒ කන්ටේනරය ගේන දවසට තියෙන්නේ අංක 655, බ්ලූමැන්ඩල් රෝඩ්, කොළඹ 6 ද හෝ 7 දැම්මා ඉවරයි. බලන කොට ටැක්ස් ගෙවලත් නැහැ මුකුත් නැහැ, ආදායම් බදු එකෙන් ගිහිල්ලා බලන කොට එහෙම එඩ්රස් එකකුත් නැහැ, එහෙම නමකුත් නැහැ ආයේ බලන කොට පටන් ගන්නවා වැල්ලවත්ත දිහාවෙන්. මේක තමයි වැඩේ. ටක් ටක් ගාලා වෙනස් කරනවා. පුදුම සැලසුම් සහගත වැඩ පිළිවෙලක්.

ප : ඔබ වහන්සේ මෙම කොමිෂම හමුවේ කියා සිටියා සමස්ථ ලංකා ජමෙයිතුල් උලමාවරුන්ගේ සංවිධානය හෝ උලමාවරුන්ගේ සභාව කියන එක අතීතයේදි සාම්ප්‍රදායික මුස්ලිම්වරුන්ගේ බහුතරයකින් සැදුම්ලත් වුනත් වර්ථමානයේදී එය සම්පූර්ණයෙන්ම ඉස්ලාම් ආගමික අන්තවාදයට බර වූ ඉස්ලාම් මවුලවිවරුන්ගේ පාලනය යටතේ තියෙන එකක් කියලා, ඔබ වහන්සේ ඒ වගේම කිව්වා ආණ්ඩුව උපදෙස් ගන්නේ මේ

FAIR COMMENT BY JEZEEM

අන්තවාදී ආගමික නිකායන්වලට අයිති ජමෙයිතුල් උලමාවරුන්ගෙන් කියලා. දැන් ඔබ වහන්සේට අදහසක් තියෙනවද හෝ යෝජනාවක් කරන්නට රජයට උපදෙස් ලබා දිය යුතු කිසියම් හෝ විකල්පයක් මේ ජමෙයිතුල් උලමාවරුන්ගෙන් ගත්තා වුවත් ඔවුන්ගේ උපදෙස් පිළිබඳව තවදුරටත් කරුණු විමසා බැලීම සඳහා වෙනස් වූ උපදේශක මණ්ඩලයක් ඒ කියන්නේ සාම්ප්‍රදායික මුස්ලිම් විද්වතුන්ගෙන් සැදුම්ලත් ඔබ වහන්සේට මොකක්ද ඒ සම්බන්ධයෙන් කියන්න තියෙන්නේ, ඔබ වහන්සේ තුළ අදහසක් තියෙනවද?

පි : ඇත්ත වශයෙන්ම සහරාන්ට පිං සිදුවන්න වැටිලා, පෑගිලා, තැලිලා, පොඩිවෙලා, කොන්වෙලා මතයක් නැතුව අදහස කියා ගන්න බැරුව හිටපු සාම්ප්‍රදායික සූෆී මුස්ලිම් මිනිස්සු දැන් ටික ටික, ටික ටික වේදිකාවට එනවා. ඒ අයගේ බලපෑම දැන් දැඩි ලෙස උත්කර්ෂයට නංවමින් ඉන්නවා ඒගොල්ලෝ මේ ඇත්ත ප්‍රශ්නය කතා කරන්න. නමුත් ඒගොල්ලන්ට ආරක්ෂාව පිළිබඳ බියක් තියෙන නිසා දැන් මැතිනියනි ෂරියා නීතියට අනුව අටළුගම ප්‍රදේශයේ කාන්තාවකට දැඩි ලෙස හිංසා කළා. කොන්ඩෙන් ඇදගෙන පොලිසිය බලන් ඉන්දැද්දි ඇදගෙන ගියා. පොලිසිය බලන් ඉන්දැද්දි. ඔක්කොම හාජ්ජියාර්ලා. හේතුව සිංහල තරුණයෙකු සමඟ විවාහ වීම. අන්තිමට අපි ලඟට හොයාගෙන ආපුවාම අපි කිව්වා ඔයා ඇත්ත කියන්න රටට. ඔයාට නීතියෙන් සාධාරණයක් වෙන්නේ නැත්නම් ඒ පොලිසිය ක්‍රියාත්මක වෙන්නේ නැත්නම් ඔයා රටට කියන්න. කාරණාව කිව්වාම ඒක ඇවිල්ලා ගියා. අවසානේදී අපේ සිංහල බෞද්ධයෙක් කුලියාපිටිය ප්‍රදේශයේ මේ කාන්තාවට ඉන්න තැනක් නැහැ අපිට පන්සලේ තියා ගන්නත් බැහැ දරුවෝ දෙන්නෙක් එක්ක. පර්චස් 20 ක් අපිට කතා කරලා කිව්වා හාමුදුරුවනේ ඔබ වහන්සේ කලේ ලොකු දෙයක් මේ මනුස්සයාට මෙහෙම පිහිටවීම. අපිටත් ගැහැණු දරුවෝ ඉන්නවා, මෙහෙම දුක් විඳින. ඒ සිංහල මනුස්සයා පර්චස් 20 ක් දුන්නා. දැන් ඒ දරුවෝ 2 ත් එක්ක ඒ සිංහල තරුණයත් ඒ මුස්ලිම් කාන්තාවත් එහි ජීවත් වෙනවා. මම මේ කියන්නේ මේගොල්ලන්ට හඬක් නැහැ මොකද පිරිමින්ගේ ආධිපත්‍යයට මිරිකෙච්ච ස්ත්‍රී සමාජයක්. ඒ වගේම තමයි අර සූෆී අයත්. මොකද ඒගොල්ලන්ට ලොකු ප්‍රශ්නයක් තියෙනවා. මැරුණාම වැළලෙන්න දෙන්නේ නැහැ, අර මම කිව්වේ ඉස්සෙල්ලා වගේ තවුබා පාපොච්චාරණය නොකලොත් ඔවුන්ට සිද්ධ වෙන්නේ මැරෙන්න. මේ හදිස්වල එහෙම උගන්වනවා, ඒ නිසා ඒගොල්ලන් ප්‍රසිද්ධියට එන්නේ නැහැ මේක වැරදියි කියලා

FAIR COMMENT BY JEZEEM

කියන්න. මොකද අනික් අය කියනවා මේ උඹලා දෙවියන්ට විරුද්ධ වෙච්ච කෙනෙක්. හැබැයි දැන් සහරාන්ගේ ප්‍රහාරය නිසා භීතියට පත් වුණු මේ ප්‍රශ්නය කතා කරන්න උනන්දුවෙන් සහ උද්යෝගිමත්ව හිටපු අය දැන් අනුක්‍රමයෙන් මේ සමාජයට එනවා. ඒ නිසා අපේ වගකීම තමයි මේ සුෆී මුස්ලිම්වරුන්ගේ ඔවුන් ජීවත් වුණු ඒ සංස්කෘතිය දැන් මැතිනියනි සතියකට කලින් ගුවන් විදුලි සංස්ථාවේ මේ අළුත් ආණ්ඩුව යටතේ උදේ 8 ½ සිට 9 දක්වා, 9 සිට 9 ½ දක්වා ඉන්දියානු වාහාබි දේශයකයෙකුගේ දේශනයක් ප්‍රකාශයට පත් වුණා. ඊලඟට අගාර් මොහොමඩ් ඉහ්වාන් මතය තුළ ඉන්න ඔහුගේ දේශණයක්. හැමදාම ගුවන් විදුලියට කන්දීගෙන ඉන්න අර සුෆී ධර්මය අදහන කලාත්මක මුස්ලිම් මිනිස්සු ඒ මිනිස්සු සංගීතය ටිකක් අහනවා මේකට move වෙන්න පුළුවන් මිනිස්සු, වහාම අපිට කතා කරලා කිව්වා අන්න හාමුදුරුවනේ අර වැඩේ පටන් අරන්. අපි එසැනින් ඒක දැනුවත් කළාම ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිවරයා අපිව මුණගැහිලා හාමුදුරුවනේ කියලා මේක අපි කොහොමද නිවැරදි කරන්නේ කියලා කිව්වාම අපිට පුළුවන්කම ලැබුණා එතනට අදාලව සුෆී මුස්ලිම් කෙනෙක් යොදවන්න. මෙන්න මෙයාගෙන් උපදෙස් ගන්න. දැන් ඔවුන් ඒක කරගෙන යනවා. ඒ වගේ මේකට ඉඩ හදලා දුන්නොත් මොකද මේ ප්‍රශ්න හරියට ප්‍රශ්නේ හඳුනා ගත්තොත් හරි උත්තරය හොයා ගන්න පුළුවන්. ඒක රෝගය වගේ තමයි. ඉස්සෙල්ලා කරන්න ඕනේ හරියට ප්‍රශ්නය හඳුනා ගෙන වැරදියට ප්‍රශ්නෙ දුන්නොත් උත්තරෙත් වැරදි එකක්. ඒ නිසා අපි විශ්වාස කරනවා මේ ඉස්ලාම් ප්‍රශ්නෙට තියෙන එකම උත්තරය දැන් බුද්ධාගමේ නම් මැතිනියනි තියෙන්නේ ධම්මෝ විවට්ටෝ විරෝචති , ධර්මය විවෘත වන තරමට බබළනවා. මේකේ ඔක්කොම හංගනවා. ඉතින් අපේ දේශණා, අපේ හෙළිකිරීම් ඔක්කොම එළියේනේ. අපි කවදත් අපේ පන්සල වහගෙන ගේට්ටු දාගෙන ඉබි දාගෙන ඉන්නේ නැහැනේ. අපේ ඕනම කෙනෙකුට එන්න පුළුවන්. මුස්ලිම් කෙනාටත් එන්න පුළුවන්, ඕන කෙනෙකුට එන්න පුළුවන්. මුස්ලිම් පල්ලියේ එහෙම බැහැ මොකක්ද මේ හංගන් කරන්නේ. මේකේ හංගන්නේ නැතුව මේ teachings ඉගැන්වීම් මේවායේ ඉගැන්වීම් මේවායේ කෙලවර මොකක්ද කියලා තරමට සැක සංකා දියුණු කර ගන්න පුළුවන්. අපි ඇත්තටම වෑයම් කලේ සිවිඥානික ලෙස ඒ වේදිකාව තනන්න. අපි හිතනවා ඒ හරහා අවදිවත් වන අර සාම්ප්‍රදායික මුස්ලිම් මිනිස්සුන්ට රටේ තැනක් හැදෙයි කියලා ඉස්සරහාට. අන්න ඒ අය ඔය උපදේශක මට්ටම් වලට ආගමික වියතුන්ගේ

FAIR COMMENT
BY JEZEEM

සංගමයට යා යුතුයි. දැන් වර්තමානයේ ඉන්න මේ මුස්ලිම් නායකයෝ හිරේ විලංගුවේ යන්න කලින් ඒගොල්ලන් තීරණය කරන්න ඕනේ අපිට කොතන හෝ වැරදුනා මිනිස්සු ඒගොල්ලෝ. ඒගොල්ලෝ දෙවියන්ට භක්තිමත් ඇත්ත. යම් දුරක් නොමඟ ගියා නම් ආපහු ඒගොල්ලන්ට හැරෙන්න පුළුවන්. එහෙම හැරිච්ච මුස්ලිම් මිනිස්සුන්ගේ මෙහේ සංවිධානයකුත් තියෙනවා. ඉස්ලාමය අතහැර ගිය අයගේ සංවිධානය කියලා. ඒ අයත් ප්‍රකාශ නිකුත් කලා පහුගිය කාලේ.

ප : දැන් ඔබ වහන්සේ සම්මේලන 2 ක් පැවැත්තුවානේ, එකක් 2014 සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේ සහ එකක් මහරගම ප්‍රදේශයේ. එම සම්මේලනවලදී ඔබ වහන්සේ හඬක් නැඟුවා මේ සාම්ප්‍රදායික මුස්ලිම්වරුන්ට මේ අන්තවාදී කණ්ඩායමෙන් සිද්ධ වෙන අකටයුතු පිළිබඳව. ඒ වගේම ඔබ වහන්සේ සෑහෙන උත්සාහයක් දරන බවත් පෙනී ගියා මෙම කොමිෂම හමුවේදි සාම්ප්‍රදායික මුස්ලිම්වරුන්ට මෙන්ම ශ්‍රී ලංකාවේ සිටින කිතුනුවන්ටත් මෙම බෞද්ධයන්ටත් අන්‍යාගමිකයන්ටත් හින්දුවරුන්ටත් මෙම ඉස්ලාම් ආගමික අන්තවාදීන්ගෙන් සිදුවිය හැකි ව්‍යසනය පිළිබඳව ඔබ වහන්සේට අළුතෙන් උපායමාර්ගිකව සැලැස්මක් හෝ අදහසක් තිබෙනවාද මෙම සියළු දෙනා සමඟ එකට එකතු වී කිසියම් වෙනස් වූ ආකාරයකට දැන් ඔබ වහන්සේ ඉතාමත් ම විශ්වාසයකින් සිටිනා බව මෙම කොමිෂමට පෙනී ගියා වර්ථමාන ජනාධිපතිතුමා පිළිබඳව. එතනට හෝ ගොස් සුෆී මුස්ලිම්වරුන්ට ආර්ථික බලය, දේශපාලන බලය, සමාජ සංස්කෘතික බලය කිසිවක් නැති බව තමයි මෙම කොමිෂම හමුවේදි යම් යම් අයගෙන් දැන ගැනීමට ලැබුනේ. ඔබ වහන්සේ වේදිකාවල් වල හඬ නඟමින් ඒ කරපු මෙහෙවර වෙනස් ස්වරූපයකින් ඉදිරියට ගෙන යාමට ඔබ වහන්සේට කිසියම් අදහසක් තිබෙනවාද?

පි : ඔව්. ඒ වෙනුවෙන් අපි කතෝලික සමාජයේ අපි දන්න කියන මහත්වරුන් එක්ක තනා කරලා තියෙනවා. ඒ වගේම සුෆී මුස්ලිම් නායකයන් එක්ක මේ දක්වා ගණුදෙනු තියෙනවා, මෙහේ විතරක් නෙමෙයි කාත්තන්කුඩි නැගෙනහිර මඩකලපුවේ යනාදි වශයෙන් බොහෝ තැන්වල මුස්ලිම් මිනිස්සු. ඒ වගේම සිංහල සමාජයේ ඉන්න කැප කිරීම් කරන්න පුළුවන් කයිවාරු ගහන අය නෙමෙයි, කැප කිරීම් කරන්න පුළුවන් යම් උදවියත් එක්කත් අපි සාකච්ඡා කරනවා කොහොමද මේවට නීති අනපනත් සකස් කර ගන්නේ, මොන විදියටද මේ සංවාදය ගොඩ නඟන්නේ, ඒක කොහොමද අපි වර්තමාන ජනාධිපතිවරයා ලව්වා කරවා ගන්නේ, නමුත් ඉතින් අවාසනාවකට හරි අමාරුයි ඒක කරන්න මේ දේශපාලන

FAIR COMMENT BY JEZEEM

කලිකලාහයන් නිසා. මොකද දැන් අපි කැලේ ඊ පහරට ලක් වුණු ඇත්තු වගේ. දැන් ඉස්සරවෙලාම අවංකව වැඩ පිළිවෙලක් ගොඩ නඟපු නිසා අපේ image එකට ගහනවා. ඒකට මේ මාධ්‍යය ඔක්කොම ලෑස්තියි. දැන් මේ මොහොත වෙන කොට අපට අන්තර් ජාලයේ නමක්වත් අපේ සටහන් කරන්න බැහැ. ත්‍රස්තවාදියෝ අපි. ඒ වගේම සමහර විට මුද්‍රිත මාධ්‍යයක ඉඩක් නැහැ අදහසක් පල කරන්න. ඊලඟට මේ වැඩ කරන්න බැහැ අපට දේශපාලන පක්ෂ එක්ක සම්බන්ධ වෙලා. මොකද ඒ පක්ෂ ආකෘතිවලට එතකොට යටත් වෙන්න වෙනවා. එතකොට අපි මේක ස්වාධීනව කරන්නේ. ස්වාධීනව කරන් යන කොට දේශපාලඥයෝ කල්පනා කරනවා මේක අපට තර්ජනයක් වෙයි, ඒ නිසා ඒ දේශපාලඥයෝ එකතු වෙලා ගහනවා අපේ Economy එකට. කවුද අපිට උදව් කරන්නේ, ඒ Economy එකට ගහන කොට මේක නෝර්වේ කුමන්ත්‍රණයක්, මේක වෙන එකක් කියලා අරවා මේවා ගහන කොට අනේ කීයක් හරි දෙන එකෙක් රුපියල් 100 ක් දෙන එකෙක් ඒක දෙන්නෙක් නැහැ. ඊලඟට කොහේට හරි ගිහිල්ලා මේක දැනුවත් කරන්න දේශනාවකට යන කොට පොලිසියෙන් වට කරනවා හතර වටෙන්. බණ ටිකක් අහන්න මිනිස්සු එන්නේ නැහැ. ඉතින් ඔය වගේ සංකීර්ණයි මේක. ඒ වුනත් අපි උපන් බිමට ණය නැතුව මැරෙන්න ඕන නිසා ඒ වගේම භික්ෂූන් වහන්සේ නමක් හැටියට උපිපටිපන්නව සහ සත්‍යවාදීව අපේ ආත්ම භාවිතාව අපි ඉතුරු කරලා ඒක ආදර්ශයක් විදියට මැරෙන්න ඕන හින්දා අපි නිසරණ අභ්‍යාසයෙන් තවමත් කැප වෙන්න අධිෂ්ඨාන කරනවා හොඳ තැනකට මේ රට ගොඩ නඟා ගන්න ඒ වෙනුවෙන් කැප වෙන්න.

ප්‍ර : ඔබ වහන්සේ පැහැදිලි කරන්න මෙම කොමිෂමට මද්‍රසා පාසැල් සූෆී වරුන්ට අයිති සහ මේ ආගමික අන්තවාදී ඉස්ලාම් නිකායන්ට අයිති මද්‍රසා පාසැල් තිබෙන බවත්, ඔබ වහන්සේ ප්‍රකාශ කලා. ඒ වගේම ඔය ජුම්මා මස්ජිත් පල්ලි කියන ඒවා ස්වාමීන් වහන්ස තියෙනවද සූෆී මුස්ලිම්වරුන්ට අයිති සහ අනිකුත් අන්තවාදී ඉස්ලාම් ආගමික නිකායන්ට අයිති?

පි : ඔව් මම ලේඛනයකුත් ඉදිරිපත් කරලා තියෙනවා ලංකාවේ තියෙන ඒ පල්ලි සම්බන්ධයෙන් .

ප්‍ර : ඔබ වහන්සේට කියන්න පුළුවන්ද මේ ජුම්මා මස්ජිත් පල්ලිවල සිකුරාදා Friday ජුම්මා ප්‍රේයර්ස් කියන එක හා දේශණාවක් කියලා දෙකක් කරනවාද ස්වාමීන් වහන්සේ ජුම්මා මස්ජිත් පල්ලිවල?

පි : ඔව්.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : මම මේ විශේෂයෙන්ම අහන්නේ සාම්ප්‍රදායික මුස්ලිම්වරුන්ගේ තියෙන ජුම්මා මස්ජිත් පල්ලි ගැන නෙමෙයි, ඔබ වහන්සේ මෙම කොමිෂම හමුවේ ප්‍රකාශ කරන ලද තවුහිද් ජමාත්, තබ්ලික් ජමාත් සහ ජමාතේ ඉස්ලාමේ එවැනි ආගමික අන්තවාදී ඉස්ලාම් නිකායන්වල තියෙන ජුම්මා මස්ජිත් පල්ලිවල ඔය සිකුරාදා දේව මෙහෙයේ තියෙන වැදගත්කම මොකක්ද සහ සිකුරාදා දේව මෙහෙයෙන් පසු දේශණාවේදී ඔවුන් ආගමික අන්තවාදය පිළිබඳව යම් යම් දේශණා ඔය හදීස් වැනි දේවල්වල කරුණු අරන් දේශනා පවත්වනවද?

පි : ඒ ඒ අවස්ථාවලදී නම් සිකුරාදා දේව මෙහෙය අනිවාර්යය එකක්නේ. ඒගොල්ලෝ අනිවාර්යයෙන් සිකුරාදට පල්ලි යනවා. හැබැයි දේශණාවේදී අන්තවාදී දේශණා කළ බවට අපට එකම එක අවස්ථාවක් පමණක් දැන ගන්න ලැබුණා මහනුවර ප්‍රදේශයේ ජුම්මා පල්ලියක. එකම එක අවස්ථාවයි මා අහලා තියෙන්නේ. මොකද ඒවා විකාශය කරන්නේ වෙන වෙනත් ක්‍රම වලට. එතැනදී මේ ජුම්මා පල්ලිවල මේක කරන්නේ නැහැ. ජුම්මා පල්ලිවල අන්තවාදී දේශණ කරන්නේ නැහැ. හැබැයි දැන් අපිට තියෙන ගැටළුව ජුම්මා පල්ලි තියෙනවා, මස්ජිත් තියෙනවා, තක්කියා පල්ලි තියෙනවා,ෂාරියා පල්ලි තියෙනවා, ෂෙරීන් හා දර්ගා පල්ලි කියලා කොටසක් තියෙනවා, දර්ගා කියන්නේ සොහොන් තියෙන පල්ලි. මේවයින් බොහොම ස්වල්පයයි ඉතිරි වෙලා තියෙන්නේ සුෆි අයට. අනිත් ඔක්කොම තබ්ලික්, ජමාත් කට්ටිය තමයි දැන් මේවා හසුරුවන්නේ. එතකොට ඒ දේශණා බොහෝවිට අන්තවාදී අර තවුහිද් පන්නයේ දේශනා නොවුනත්, රජය ගන්නා වූ තීරණ සමාජයෙන් එන බලපෑමට රජයකට සිද්ධ වෙනවා යම් තින්දු ගන්න. අපි හිතමුකෝ මුහුණු වැසීම ගැන කියලා. ජුම්මා පල්ලි ඔක්කොම කතා කරන්නේ මුහුණ වැසීමට මොකද කරන්නේ කියලා. ඒ වගේ හරි ඒකමතියක් තියෙනවා ඒගොල්ලන්ගේ. ඉතින් එවැනි දේවල් අර ඒගොල්ලන්ගේ සංස්කෘතියට ඒගොල්ලන්ගේ නීතිවලට මොනවා හරි අභියෝගාත්මක දෙයක් වෙනවා නම් ඒවා සාමූහිකව කතා කරනවා වෙන්න පුළුවන්. අර අන්තවාදය සම්බන්ධයෙන් තියෙන කොටස් සාම්ප්‍රදායිකව බොහෝ විට දැන් අපි හොඳටම දන්නවානේ සමහරු දැන් අපි නම් උඉරුමස් කන්නේ නැහැ කිව්වට එළියේ මේ පොඩ්ඩක් ඉදලා අනිත් පැත්තෙන් වෙන තැනකින් අරගෙනත් යනවා බඩු. ඒ වගේම තමයි මේ වැඩ පිළිවෙලුත්.

FAIR COMMENT BY JEZEEM

ප : දැන් ඔබ වහන්සේට කියන්නට පුළුවන්ද මෙම කොමිෂමට දැන් ඔය ඔබ වහන්සේ මේ කොමිෂමේදී කරුණු ගොඩක් ඉදිරිපත් කලා ආගමික අන්තවාදයට කොහොමද තරුණ පිරිස් ඒකරාශී වෙන්නේ කියන එක. අන්තර් ජාලය හරහා Cyber space එකෙන් නොයෙකුත් ආගමික අන්තවාදී දේශකයන්ගෙන් මෙන්ම කුර්ආනය සහ හදිස් වලින්. දැන් මේ මද්‍රාසා පාසැල්වල ස්වාමීන් වහන්ස සූෆී මුස්ලිම්වරුන්ට අයත් නෙමෙයි අනිත් ඒවා වල අරාබි භාෂාව උගන්වමින් කුර්ආනය කට පාඩම් කිරීම සහ හදීස් කට පාඩම් කිරීම වැනි දේවල් ඉගැන්වීම තුලින් කිසියම් අයෙකුට කාගේවත් බලපෑමක් නැතුව තරුණ කෙනෙකුට ඉස්ලාම් ආගමික අන්තවාදී කෙනෙක් වෙලා ත්‍රස්තවාදයක් දක්වා යෑමට හැකියාවක් තියෙනවද?

පි : දැන් මැතිනියනි, අපි උදාහරණයක් විදියට කිව්වොත් අපේ එක අනුනායක හාමුදුරු කෙනෙක් අපේ මහණකම සම්බන්ධයෙන් කතා කරලා තියෙනවා. උපමාවක් විදියට මම මේ කියන්නේ. ඒ අපේ අපවත් වී වදාළ බද්දේගම විමලවංශ අනුනායක හාමුදුරුවෝ. උන් වහන්සේ කිව්වා ලොම් ගාණට මහන කරනවා අංගානට ඉතුරු වෙනවා කියලා. ඒ වගේ මේ මද්‍රසාවලට ගිහිල්ලා ඉගෙන ගන්න අය අර වාමි එකේ ඉගෙන ගන්න අය වෙන්න පුළුවන්. ඒ පෙන්නන අරමුණට 100 දෙනෙක් පන්තියට යන කොට සමහර විට ඉතුරු වෙන්නේ 20 ක් වෙන්න පුළුවන්. ඒක ඒ ජීවත් වෙන පරිසරය, දෙමාපියන්ගෙන් ඒ ගෙදර තියෙන බලපෑම ඒ වගේම නෑදෑයන්ගේ තියෙන සබඳකම්, සමාජ පන්තිය, පවුල් පරිසරය ඒ හැම දේම මේවට බලපානවා. ඉතින් මද්‍රසා තිබූ පමණින්ම ඔක්කොම අන්තවාදයට ගිහිල්ලා, ත්‍රස්තවාදියෝ වෙනවා කියලා කියන්න බැහැ. ඒක එහෙම කියනවා නම් ඒක වැරදි. හැබැයි අර දරු පැටව් නෙමෙයි වැරදියි, මේ වැඩේ කරන මහළුවුන් මේවට ඉඩදීලා තියෙන අයයි වැරදියි. දැන් අපි ලස්සන ලස්සන බඩු එල්ලලා තියෙනවා දිලිසෙනවා නොයෙක් නොයෙක් විලාසිතා අපි යනවා ඇරලා තියෙන කොට. කැමති කෙනාගෙන්, කැමති එකෙන් බඩු ගන්නවා ඒ වගේ තමයි. හැබැයි බලන්න ඕන ඒ සාප්පු දානකොට හරි මොනවා හරි වෙන කොට මේවා ගැලපෙන ඒවද නොගැලපෙන ඒවද, මේවා හරියනවද, මිළ වැඩිද, අඩුද මොකක්ද වෙන්නේ, මේ සල්ලි කොහෙටද යන්නේ එහෙම මොනවා හරි ක්‍රමවේදයක් තියෙනවා. ක්‍රමවේද හදන්න තමයි රටක පාලකයෝ ඉන්නේ. ඒ පාලකයෝ මේක ඔන්න ඔහේ ගලා ගෙන යන්න ඉඩ දීලා අවසානෙදි දැන් කොමිසම් පත් කරනවා, අරක කරනවා මේක කරනවා වෙන කාට හරි දැන් ඔබතුමාලා

FAIR COMMENT BY JEZEEM

දවස් ගානක් මාස ගානක් මේ නිදි මරාගෙන මොකක්ද මේ, ඔබතුමාලා කරන්න ඕන එකක්ද මේ නැහැ, ඒ ගොල්ලන්ගේ වැඩේ වෙන duty එකකට පැත්තකට දානවා.

ප්‍ර : ඔබ වහන්සේ කියන්නේ රජයේ කාර්ය භාරය තමයි මෙවැනි ආයතන නිසි පරිදි නියාමනය කිරීම?

පි : අනිවාර්යයෙන්. දැන් මැතිනියනි අධ්‍යාපන අමාත්‍යාංශයක් තියෙනවානේ, පළාත් සභා තියෙනවා, ඒ පළාත් සභාවට අයිති අධ්‍යාපන අමාත්‍යාංශයක් තියෙනවා, කොච්චර නම් තියෙනවද ප්‍රධාන අධ්‍යාපන අමාත්‍යාංශයක් තියෙද්දි පළාත් සභාවකුත් තියෙනවා, ඒකෙන් නියාමනය වන පාසැලුත් තියෙනවා. ඉතින් දෙයියනේ මේ අල්ලක් වගේ පුංචි රටේ මේකේ කෝටි 100 ක් නැහැනේ. මේ ඉන්න මේ පොඩි මුස්ලිම් ප්‍රමාණය සම්බන්ධයෙන් ඇයි මේක නියාමනය කරලා මේක කරන්න බැරි, මේ තනිකරම තත්කඩි දේශපාලනයක්. දේශපාලකයන්ට ලං වෙනවා අර මවුලවිලා ටිකක් ඒගොල්ලෝ ඒගොල්ලන්ගේ වැඩේ කරගෙන යනවා. කාලෙන් කාලෙට එක ආණ්ඩුවක් එන කොට වෙන මවුලවිලා සෙට් එකක් අර අපේ කට්ටියම වගේ තමයි.

ප්‍ර : ඔබ වහන්සේ මේ සඟරාවේ එක තැනක කියලා තියෙනවා පකිස්ථානයේ හිටපු ජනාධිපති පර්වේ මුෂාරප් එම රටේ තිබිච්ච අන්තවාදී නිකායන්ට අයත් මද්‍රසා පාසැල් සියල්ලම වසා දැමුවා කියලා?

පි : පාසැල් 20000 ක් මැතිනියනි.

ප්‍ර : 20000 හොඳයි, ඔබ වහන්සේට අදහසක් තියෙනවද අපේ ලංකාව වගේ රටක එවැනි දේවල් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් තීරණ රජයකට ගත හැකිද, එසේ ගත්තොත් මොකක්ද ඇති විය හැකි ප්‍රතිඵලය ?

පි : ඉතින් එහෙම තින්දු ගන්න බැරි නම් රජයක් වැඩක් නැහැනේ මැතිනියනි. අනිවාර්යයෙන් රටක නායකයා සහ රජය ඒ ජනතාවගේ අභිලාෂ ඉෂ්ඨ කරන්න ඕන. මේක ඉස්සෙල්ලා මේ රට මොකක්ද මේ බෞද්ධ සංස්කෘතියත් එක්ක වැඩුණු විවිධත්වය සහිත සංස්කෘතියක් මෙහේ තියෙනවා. හැබැයි ඒක හැදිලා තියෙන්නේ බෞද්ධ සංස්කෘතිය හෙවනේ. බෞද්ධ සංස්කෘතිය තමයි මේ මහා වෘක්ෂය. ඒකේ ඇතුලේ කාටවත් හිංසාවක් නැහැ. කාටවත් හිංසාවක් වෙලා නැහැ අද වෙන කල්.

ප්‍ර : ඒ ඔබ වහන්සේ අදහස් කරන්නේ පකිස්ථානය එසේ වසා දැමීමට හැකි වුණා නම් ලංකාවෙත් එවැනි අන්තවාදී මද්‍රසා වසා දැමීමට හැකියාවක් නොමැති විය නොහැකියි කියලද ඔබ වහන්සේ අදහස් කරන්නේ?

FAIR COMMENT BY JEZEEM

පි : මෙතුවක් කල් ඒක කරන්න බැරි වුණා. ඊට හේතුව වලිගය විසින්නේ බල්ලා නැටුවේ, මොකද ඒ සුළු ජාතිකයන්ගේ සහයෝගය නැතුව ආණ්ඩුවක් පිහිටුවා ගන්න බැරි වුණා. දැන් පාලකයෝ කියන්නේ ඒක උත්තරයට. හැබැයි ඒක කලහැකිව තිබුණා. දොලපිදේනි දෙදී, වරදාන්න දිදි කොච්චර කල් මෙහෙම රටකට යන්නද, අවසානයේදි රටම නැති වෙලා තමයි අපිට රට නැති වෙන කල් තමයි අපිට බලා ඉන්න වෙන්නේ. ඒ හින්දා අපි විශ්වාස කරනවා එක තත්පරයක්වත් නැර මොකද දේශපාලන බලය අත්‍යාවශ්‍යයි. ඒ දේශපාලන බලය අභ්‍යාස කිරීමේදි රටට එක නීතියක් කියන සංකල්පය ගෙනාවානම් ඒ වගේම 1 වෙනි වරද කරන කොටම නීතියෙන් දඬුවම් දුන්නා නම් දැන් හෙල්මට් නීතිය කියලා කියමු මැතිනියනි, ඒ හෙල්මට් නොදා කවුරු හරි ගියා නම් එයාට ඒ දඬුවම දුන්නා නම් දිගින් දිගට ඒ මුස්ලිම් ප්‍රදේශවල එහෙම කොහොමද නීති වෙනස් වෙන්නේ, මාර්ග නීති කාටත් එකයි නේ. එහෙම දළුලා වැඩෙන්න ඉඩ හැරලා දැන් කූරගල ප්‍රශ්නයක් ඒක අල්ල ගන්න ගියාම. එතකොට එතන්ට විරුද්ධව තියෙන පුරා විද්‍යා පනත ක්‍රියාත්මක නොකලේ ඇයි. ඉතින් ඒ වගේ තියෙන නීති ක්‍රියාත්මක නොවීම, ඒවා ක්‍රියාත්මක කරන්න යන කොට ඇති කරපු දේශපාලන බලපෑම් මේ ඔක්කොම උඩුදුවලා මේක තනිකර corrupted තැනක් බවට පත් වෙච්ච හින්දා මේක වැඩි දියුණු වෙලා තියෙනවා.

ප්‍ර : ස්වාමීන් වහන්ස අර අබ්දුල් රාසික් උද්ඝෝෂණයක් කළානේ ඔබ වහන්සේ අපිට වීඩියෝ එකකුත් පෙන්නුවානේ එම උද්ඝෝෂණයේදි නිතරම ඇහුණා අපේ නීතිය අපිට ඕනේ කියලා මහා හයියෙන් කෑ ගහනවා ඒ අබ්දුල් රාසික් මහතා, ඒ වගේම අර මුස්ලිම් ගැහැණු දරුවන්ගේ විවාහ වයස පිළිබඳව තමයි එතනදි වැඩියෙන් කතා කලේ. ඔබ වහන්සේගේ අධ්‍යයනයේදීත් ඔබ වහන්සේට තොරතුරු ලැබුණාද මෙම මුස්ලිම් ගැහැණු දරුවකුගේ විවාහ වීමේ වයස පිළිබඳව තීරණයක් කුර්ආනයේ හෝ හදීස්වල තිබෙනවද කියලා?

පි : තියෙනවා.

ප්‍ර : මොකේද තියෙන්නේ ස්වාමීන් වහන්ස?

පි : දැන් නබීතුමාම ඉතින් පරිහරණය කළානේ අර අයිෂා දැරිය අවුරුදු 7 න්. ලොක්කා මෙහෙම කරලා තියෙද්දි පොඩ්ඩෝ ගැන කවර කතාද.

ප්‍ර : නැහැ මම අහන්නේ ඔබ වහන්සේගෙන් මොන විදියටද තියෙන්නේ කියලයි, කුර්ආනයේ හරි හදීස්වල වගන්තියක් හරි ..?

FAIR COMMENT
BY JEZEEM

පි : ඒකේ තියෙන්නේ මල්වරවීම ස්ත්‍රීයකට තැනක් දීලම නැහැ කුර්ආනයේ. ස්ත්‍රී කියන්නේ නිකම් ලිංගික භාණ්ඩයක් විතරයි. තැනක් දීලම නැහැ, ඕන වෙලාවක ඊලඟ දිනයේදි ඒක පෙන්නන්න පුළුවන්.

ප්‍ර : අවසාන ප්‍රශ්නේ ස්වාමීන් වහන්ස, මේ කොමිෂම හමුවේදි....

පි : සමාවෙන්න මැතිනියනි අයේෂා මල්වර වෙන්නත් කලින් මේ කසාද බැන්දේ.

ප්‍ර : ඔබ වහන්සේට මම ඉදිරිපත් කරන අවසාන ප්‍රශ්නය මේ ප්‍රශ්නය පිළිබඳව මෙම කොමිෂම හමුවේදි ඉදිරිපත් වෙච්ච සාක්ෂියක් මත සහ එම කරුණු අපි පැහැදිලි කර ගැනීම සඳහා ඉස්ලාම් ආගමික අන්තවාදී සැකකරුවෙක් ගෙනුත් මේ ප්‍රශ්නය ඇහුවා, ඔබ වහන්සේ මේ ලබා දීපු මේ පොතේ සරන්ඩිප් කියන මේ පොතේ මේකේ පිටු අංකයක් නැහැ මෙන්න මේ පින්තූරය, ශ්‍රීපාදස්ථානයේ පින්තූරයේ මම එවන්නම් මේ පොත, බබා අදාම් මලායි Adam's peak කියලා තමයි තියෙන්නේ. ?

පි : මැතිනියනි මේ සම්බන්ධයෙන් තාමත් තියෙන්නේ

ප්‍ර : මම ඔබ වහන්සේගෙන් ප්‍රශ්නය අහන්නම් අපේ මෙම කොමිෂම හමුවේදි සාක්ෂි ඉදිරිපත් කරපු එක්තරා අයෙකු කියා සිටියා ශ්‍රී ලංකාවේ තිබෙන සිරිපතුල, සිරිපතුලේ අනික් පතුල තියෙන්නේ සෞදි අරාබියේ නිසා මක්කාවල විය හැකියි දන්නේ නැහැ හරියට ම මෙම සිරිපතුලත් ගලවාගෙන යෑමේ ප්‍රයත්නයක මුස්ලිම්වරුන් යම් පිරිසක් සිටිනවා කියන බවක් මෙම කොමිෂම හමුවේදි අපිට දැන ගැනීමට ලැබුණා. ඔබ වහන්සේට පුළුවන්ද මෙම කොමිසමට කියන්න මොනවාද මේ කතා කියලා සිරිපතුල පිළිබඳව?

පි : ශ්‍රීපාදය සම්බන්ධයෙන් කරපු වැරදි ඉගැන්වීමක් සම්බන්ධයෙන් 1988 මහාචාර්ය විමල විජේසුරිය මැතිතුමා ඒ නිවැරදි කිරීම් කරලා තිබුණේ ශ්‍රී පාදය සම්බන්ධයෙන් ඉදලා. ඉස්සෙල්ලාම ඒගොල්ලෝ ඒක බරපතල වැරැද්දක්, පෙළ පොත්වලට ඉදිරිපත් කරලා තිබුණා ශ්‍රී පාදය සොයා ගත්තේ ඇෆ්ගනිස්ථානයේ බෘහාන් නගරයෙන් පැමිණි ඉස්ලාමිය ජාතිකයෝ බව ඉබන් බතූතා ම සඳහන් කලා කියලා මේ ලේඛනය මැතිනියනි මේ තියෙන්නේ ශ්‍රී ලංකාවේ අරාබි ජනයා සහ ඉස්ලාම් සංස්කෘතිය. ඉංග්‍රීසියෙන් තිබෙන්නේ Arab in Sri Lanka and Islamic Culture කියලා, මහාචාර්ය විමසුරිය 1988 එතුමා ඒවා නිවැරදි කරලා මේ තියෙන්නේ ඉස්ලාම් මේ 88 මැතිනියනි, ඉස්ලාම් 9, 10 ශ්‍රේණි සඳහා වූ රජයේ මුස්ලිම් පාඩම් පොතේ 379, 392 පිටුවල ලංකා ඉතිහාසය විකෘති කල තැන් පිළිබඳ සත්‍යතාවය කියලා මේක

FAIR COMMENT BY JEZEEM

ටිකක් දිග වුනත් මේ අදාල කොටස විතරක් මම කියන්නම්, මෙහි කියනවා අපි මනාර් මණ්ඩලයට ගියෙමු. ඊට කලින් මැතිනියනි, ඉතාම මෑත කාලයක සිට මේ විදේශික අරාබි වෙළඳුන් කොළඹ වැනි ප්‍රධාන නැව් තොටුපලවල් අසල තාවකාලිකව වාඩි ගෙන විසූ බව යන්තමින් අනුමානය කළ හැකිය. ඉස්ලාම් ග්‍රන්ථය කියන අයුරු අරාබියේ මුහුදු කරේ ස්ථිර පදිංචිකාරයන් ව සිටි බවට කිසිම මූලාශ්‍රයක සඳහන් වී නැත. 1345 හෙවත් ගම්පල යුගයේ ලංකාවට ආව ඉබන්බතූතාටවත් මෙරට පදිංචි මුස්ලිම් හමු වී නැත කියලා මහාචාර්ය තුමා කියනවා. නමුත් වරද තමයි අපි මනාර් මණ්ඩලයට ගියෙමු. මේ නගරයේ මුස්ලිම්වරු නොවූහ. ඇෆ්ගනිස්ථානයේ. බ්‍රාහුන් ප්‍රදේශයෙන් පැමිණි එකම ඉස්ලාම් කාරයෙක් අපට හමු විය. එය පර්සියානු ජාතික ප්‍රථම මුස්ලිම් වන්දනාගාර ෂයික් අබ්දුල්ලා බිම්කාලී 1929 මුලින්ම ශ්‍රී පාදය සොයා ගිය තැනැත්තා යැයිද බතූතාම සඳහන් කොට ඇත. ඒක වැරදි ප්‍රකාශයක්. ඒක තමයි මහාචාර්ය තුමා මේ කියලා තියෙන්නේ. ඒ කියන්නේ ශ්‍රීපාදය සොයා ගත්තේ ඉබන්බතූතා කියලා දැන් ඒකට සාක්ෂියක් ඉදිරිපත් කරන්න පුළුවන් මෙන්න මේ වීඩියෝ පටයෙන්. තුර්කියේ ජීවත් වෙන මැතිතුමනි අපි මුලින් කියන කෝවේ අයියුබ් ඊලඟට ජේනුල් ආබ්දීන්ලා වගේ ඒ ගැන කියන කොට නමක් හම්බ වෙනවා මුස්ටිමෙන්ක්ස්. ඒ මුස්ටිමෙන්ක්ස් ලංකාවට ඇවිල්ලා වහබි දේශකයෙක්. ඔහු තුර්කියට ගිහිල්ලා ලංකාවේ ශ්‍රීපාදය ගැන කියන වීඩියෝ පටය. ඒක වීඩියෝ එක දාන කල් මැතිනියනි ඔබ තුමිය ඇහුවා වගේ ඉස්සරවෙලා අපේ පාළි පාඨයක් තියෙනවා ඒකාදාටා තිදසපුරේ ඒකා නාගපුරේ ඒ පාඨයට අමතරව යංසච්ච භද්ද ගිරිගේ සුමනාචලග්ගේ ඒ කියන්නේ එක ශ්‍රීපාදයක් යංසච්ච භද්ද ගිරිගේ දැන් සච්ච භද්දය හැටියට ඉන්දියාවට ගිහිල්ලා වදින්නේ කෝටි ගණන් සල්ලි වැටෙන දේවාලේ, කෝවිල තිරුපති. තිරුපති කෝවිලේ තියෙන්නේ මැතිනියනි බුදු හාමුදුරුවන්ගේ ශ්‍රී පතුල. යංසච්ච භද්ද ගිරිගේ සුමනාචලග්ගේ. දෙවෙනි ශ්‍රී පතුල පිහිටෙව්වේ ශ්‍රීපාදේ. යන්තත්ත යෝනකපුරේ මුනිනෝව පාදං. යෝනකපුරේ යම් තැනකද එතන ශ්‍රී පාදය තියෙනවා කියන එක මේ ගාථාවේ සඳහන් කරලා තියෙනවා. යෝනක පුරේ හැටියට හඳුනාගෙන තියෙන්නේ මක්කම. එතකොට මදීනා පිරියඩ් එකයි මැකා පිරියඩ් එකයි එක්ක බලන කොට අර අපුරුවට විස්තර කරලා තියෙනවා තවම මේ මුස්ලිම් ඕනම ලෝකේ විද්වතෙකුට අභියෝග කරන්න පුළුවන් තවම තියෙන්නේ මක්කම ගැන මැකා ටෙම්පල් කියලා. ඉංග්‍රීසි Version එකේ Original එකේ මැකා

FAIR COMMENT BY JEZEEM

ටෙම්පල් ඒක mosque කරන්න බැරිවෙලා මේගොල්ලන්ට. පල්ලිය නම් mosque නේ. මැකා ටෙම්පල්. ඒ ටෙම්පල් එක හින්දු අය වඳින්නත් ඇති ඒ කාලේ. හින්දු අයටත් දැඩි පහරදීමක් කලා මොවුන්. ඉතින් මේ වන්දනාවට මැකාවට යන ගැල් කොල්ල කාපුවා හොරකම් කරපුවා, ඒගොල්ලන්ට වතුර විකුණපුවා ඔක්කොම තියෙනවා මදීනා සිට මැක්කා පීරියඩ් එක ගන්න කොට. ඉතින් මේ බොරුව කොච්චර කල් අල්ලන් ඉන්නද කියලා බලන්න ඕන. මේ ශ්‍රී පාදය ගැන මේකෙන් බලන්න පුළුවන් ඒගොල්ලෝ කියලා තියෙන දේ.

ප : ඔබ වහන්සේ අර 1980, 9, 10 ශ්‍රේණිවල රජයේ මුස්ලිම් පාඩම් පොත්වල ඉතිහාසය විකෘති කිරීමක් දක්නට ඇත කියලා කියලා තියෙනවා, ලංකාවට විජය රජු පැමිණීමට ප්‍රථම මෙහි අරාබි ජනයා ජීවත් වූ බව?

පි : ඔව් මේ පොතේම තියෙනවා මැතිනියනි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ශි හේරත් මහත්මිය:</u>

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදි ස්වාමීන් වහන්සේ සඳහන් කරන්නට යෙදුන ඉතිහාසය විකෘර්ති කිරීම් කාරණාවන් ඇතුලත් වන ලේඛනයක් ලෙසට දැක්වෙන ශ්‍රී ලංකාවේ අරාබි ජනයා සහ ඉස්ලාම් සංස්කාතිය නමින් වන මහාචාර්ය විමල විජේසුරිය 1988 හිදි ලියන ලද ඉස්ලාම් 9,10 ශ්‍රේණි සඳහා වූ රජයේ මුස්ලිම් පාඩම් පොතේ 379 සිට 392 පිටු සම්බන්ධයෙන් ලියවී තිබෙන පොතෙහි පිටු 6 කින් යුත් ලේඛනය මේ අවස්ථාවේදී RGG 41 වශයෙන් සලකුණු කිරීම සඳහා ගෞරවයෙන් අවසර අයැද සිටිනවා.

එකී පිටු 6 අතරින් ස්වාමීන් වහන්සේ ශ්‍රීපාද ස්ථානය සම්බන්ධයෙන් සඳහන් වන කරුණු ඇතැයි දක්වන ලද පිටුව 4, RGG 41A වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි දැනට RGG 34 වශයෙන් සලකුණු කොට ඇති පොතෙහි ස්වාමීන් වහන්සේ විසින් ශ්‍රීපාද ස්ථානය සම්බන්ධයෙන් දැක්වෙන ඡායා රූපයක් ලෙසට දක්වා ඇති පිටුව එම පිටුවට අංකනය කිරීමක් නැහැ ගරු සභාපතිතුමනි එම පිටුව මේ අවස්ථාවේදි RGG 34A වශයෙන් සලකුණු කිරීම සඳහා අවසර අයැද සිටිනවා.

FAIR COMMENT BY JEZEEM

(මේ අවස්ථාවේ පෙර සඳහන් කරන ලද වීඩියෝ දර්ශනයක් තිරයේ දිස්වීමට සලස්වයි)

පි : මේ වීඩියෝ එක ඉදිරිපත් කෙරුවේ ගරු මැතිතුමනි ශ්‍රීපාද ස්ථානය සම්බන්ධයෙන් ඔවුන් වෙනම ප්‍රචාරයක් ගෙනියනවා අරාබිකරය පුරා. ඒ අතරතුරේදි තමයි මීට අවුරුදු 6,7 ට පෙරාතුව ශ්‍රීපාද ස්ථානය පාමුල ඔය ඉඩමක් සම්බන්ධයෙන් විශාල ගැටළුවක් ඇති වුණේ. ඩොලර් මිලියන 80 ක් වගේ මුදලක් සෞදි එම්බසිය වෙන් කලා කියලා ඒ දවස්වල අපිට දැන ගන්න ලැබුනා. එතකොට මේකෙන් අපි මේ ගැන වැඩි අවධානයකින් ඉන්නේ දැන් දළදා මාළිගාව වටකරලා ඉවරයි. දීඝවාපිය වට කරලා ඉවරයි. සෝමාවතිය වට කරලා ඉවරයි, අටමස්ථානය වටකරලා ඉවරයි, ඔය ආදී වශයෙන් ගත්තාම හදබිම්වල පිහිටි ඒ ඓතිහාසික සොලොස්මස්ථාන වලින් එකක් දෙකක් හැරුණු කොට සියල්ලම මේ උදවිය වටකරලා ඉවරයි. ඊට පස්සේ ඒ පුරාවස්තුවලට හානි කරනවා. ඒවත් එක්ක ගැටුම් හදා ගන්නවා. අවසානයේදි ඔවුගේ ඉතිහාසයක් ඇති බවට මෙහේ කටයුතු කරනවා. ඒවායේ පිටුපස ඉන්නේ ඇත්තටම අර අන්තවාදී ඉගැන්වීම් මත දරන උදවිය ඉතාම සැලසුම් සහගතව තමයි මේ කටයුතු මෙහෙයවන්නේ. මොකද අනාගතයේදි මේවා ගැටුම්. ඒගොල්ලන්ට ගැටුම් අවශයයි, පැවැත්ම තබා ගැනීමට. එය පෙන්වීම සඳහායි මේ වීඩියෝ එක ඉදිරිපත් කලේ. මේ පුද්ගලයාගේ නම මුෆ්ති ඉස්මයිල් මෙන්ක්. සාමාන්‍යයෙන් ලංකාවේ කට්ටිය දන්නේ මුස්ටිමෙන්ක්. අර තහනම් අයගේ නාම ලේඛනයේ මුස්ටිමෙන්ක්ගේ නම තියෙනවා.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදි ස්වාමීන් වහන්සේ විසින් ශ්‍රීපාද ස්ථානය සම්බන්ධයෙන් කරුණු දැක්වෙන වීඩියෝ පටයක් ඇතුලත් CD තැටියක් ගරු සභාවට ඉදිරිපත් කර සිටිනවා. එම CD තැටිය RGG 42 වශයෙන් සලකුණු කිරීම සඳහා අවසර අයැද සිටිනවා. එහි දර්ශනය වන කතාව පවත්වන පුද්ගලයා හැටියට ස්වාමීන් වහන්සේ සාක්ෂියක් ලබා දෙන්නේ මුස්ටිමෙන්ක් නැමැති පුද්ගලයෙක් බවට ගරු සභාවේ අවධානය යොමු කර සිටි බවට සටහනක් තබන මෙන් ගෞරවයෙන් අයැද සිටිනවා.

පි : මෙයාගේ නියම නම මුෆ්ති ඉස්මයිල් මෙන්ක්. නමුත් ලංකාවේදි මේක පාවිච්චි කර තියෙන්නේ මුස්ටිමෙන්ක් හැටියට.

FAIR COMMENT BY JEZEEM

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

මේ අවස්ථාවේදි කොමිෂන් සභාවේ කටයුතු හෙට දහවල් 12 පසුවී විනාඩි 30 තෙක් කල් තබනවා.

ගරු ස්වාමීන් වහන්සේගේ වැඩිදුර සාක්ෂි ජුනි මස 18 උදෑසන 10 ට පටන් ගන්නා බවට දන්වමි.

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරැදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදි.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය :- 2020.06.16 වේලාව :- ප.ව. 1.00

සටහන් කළේ :- කේ.එම්.වන්දිමා දිල්හානි

ගරු විනිසුරු මඩුල්ල :-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

පෙනී සිටීම:-

ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය,ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය,ජ්‍යෙෂ්ට රාජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, රජයේ අධි නීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය, රජයේ අධි නීතිඥ චතුරංග බණ්ඩාර මහතා , රජයේ අධිනීතිඥ දිලන්ත එස්. කළුදුරුවගේ මහතා සමඟ රජයේ අධි නීතිඥ අරින්ද්‍ර මහතා පෙනී සිටියි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අහරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලු මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතීඥ කෞෂී සෙල්වනායගම් මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සාක්ෂි අංකය	:-	595
සම්පූර්ණ නම	:-	ආරිය නන්ද වැලිඅංග
වයස	:-	60
ජාතිය	:-	සිංහල
ආගම	:-	බෞද්ධ
රැකියාව	:-	විශ්‍රාමික රජයේ රස පරීක්ෂක
ලිපිනය	:-	41/8 බී,සිවිලි උද්‍යානය,රජමහා විහාර මාවත, නාවින්න,මහරගම.

ප්‍රතිඥා පිට

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතීඥ නයනා සෙනවිරත්න මිය</u>

ප්‍ර: වැලිඅංග මහතාණෙනි ඔබ රජයේ සේවයෙන් විශ්‍රාම ලැබුවේ කවදාද?

පි: මෙම මාසයේ එනම් ජූනි මාසයේ පස්වෙනි දින ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ මීට දින 11 ට ආසන්න වගේ 11ට කාලයකට පෙර කියලා කිව්වොත් ඒක නිවැරදීද?

පි: එහෙමයි ස්වාමානි.

ප්‍ර: ඔබ විශ්‍රාමික යන විට දරණ ලද තනතුර කුමක්ද?

පි: රජයේ රස පරීක්ෂක තනතුර.

ප්‍ර: ඔබ රජයේ රස පරීක්ෂක වශයෙන් කොපමණ කාලයක් සේවය කලාද?

පි: රස පරීක්ෂක වශයෙන් අවුරුදු තුනයි මාස 05 ක් පමණ .

ප්‍ර: ඒ කියන්නේ ඔබ රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨතම නිලධාරි එහෙම නැත්නම් දෙපාර්තමේන්තු ප්‍රධානියා වශයෙන් සේවය කරලා තමයි විශ්‍රාම ගියේ කියලා ඒක නිවැරදීද ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර; ඔබ විශ්‍රාම යන අවස්ථාවේදී ඔබේ සේවා කාලය කොපමණද?

පි: වසර 30 මාස 07 ක් පමණ ස්වාමිනි.

ප්‍ර; ඔබ රජයේ රස පරීක්ෂක දේපාර්තමේන්තුවට මුල් පත්වීම ලැබුණේ කවර තනතුරකට ?

පි: සහකාර රස පරීක්ෂක තනතුරට.

ප්‍ර: ඉන් අනතුරුව ඔබ කෙටියෙන් පැහැදිලි කරන්න රජයේ රස පරීක්ෂක දූරය දක්වා මොන ආකාරයට එකී උසස්වීම් ලබා ගත්තේ කියලා?

පි: ඉන් වසර 10 ට පසු ජ්‍යෙෂ්ට සහකාර රස පරීක්ෂක වශයෙනුත් තවත් වසර 10 ට පසු නියෝජ්‍ය රස පරීක්ෂක වශයෙනුත් ඉන්පසු අතිරේක රස පරීක්ෂකවරයෙකු වශයෙනුත් අවසාන වශයෙන් ආණ්ඩුවේ රස පරීක්ෂක ලෙස පත්වුනා.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබ ඔබේ මුල්ම පත්වීම ලබන කොට සහකාර රජයේ රස පරීක්ෂක වශයෙන් එහි මූලික අධ්‍යාපන සුදුසු කම් මොනවාද?

පි; පෙරාදෙණිය විශ්ව විද්‍යාලයේ රසායනික විද්‍යාව පිළිබඳ විශේෂ උපාධි ස්වාමිනි.

ප්‍ර: ඉන් අනතුරුව ඔබ වැඩි දුර පශ්චාත් අධ්‍යාපන කටයුතු හදරලා තිබෙනවාද?

පි: ඔව් දෙපාර්තමේන්තුවේ විෂය පථයට අදාළව ස්කොට් ලන්තයේ අධිකරණ විධ්‍යා පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා ගත්තා ඊට අමතරව 2007 වසරේ කොළඹ විශ්ව විද්‍යාලයේ විශ්ලේෂණ රසායනික විද්‍යා පිළිබඳ පශ්චාත් උපාධිය ලබා ගත්තා.

ප්‍ර: රස පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විවිධ අංශ තිබෙනවා ද ඔබ ඒ කුමන අංශවලට අනුයක්තවද සේවය කලේ?

පි; ප්‍රධාන වශයෙන් මගේ විශේෂත්වතාවය තියෙන්නේ පුපුර ද්‍රව්‍ය සහ ගිනි විමර්ශනය සම්බන්ධයෙන්

ප්‍ර: ඔබ කිව්වා ප්‍රධාන වශයෙන් පුපුරන ද්‍රව්‍යය සහ ගිනි විමර්ශනය සම්බන්යෙනුයි ඔබේ සේවා කාලයෙන් වැඩිකාලයක් සේවය කරලා තියෙන්නේ කියලා?

පි: වැඩි කාලයක් එහෙමයි ස්වාමිනි.

ප්‍ර; ඒ කියන්නේ ආසන්න වශයෙන් කොපමණ සේවා කාලයක්ද?

පි; 19990 රසපරීක්ෂක දෙපාර්තමේන්තුවට සහකාර රසපරීක්ෂණයෙන් බැඳුනාට පසු වසර තුනකින් පස්සේ එහෙනම් 1993 පමණ විට මේ දක්වා ඇති විශ්‍රාම යනතුරුම මගේ විශේෂඥතාවටය තිබුණේ විශේෂඥතාවය තිබුණු එම අංශය වෙනුවෙන් තමයි එම අංශ වෙනුවෙන් තමයි මගේ සේවා දායකත්වය ලබා දුන්නේ. එනම් පුපුරන ද්‍රව්‍ය සහ ගිනි විමර්ශනය සම්බන්ධයෙන්.

ප්‍ර: ඔබේ දිර්ඝ සේවා කාලය තුල මේ ලංකාවේ විවිධ ප්‍රදේශවල විශේෂයෙන්ම 2009 වර්ෂයට කලින් සිද්ධවෙච්ච ඒ බෝම්බ පිපිරීම් ආදිය සම්බන්ධයෙන් ඔබේ අත්දැකීම් ඔබේ රාජකාරි පරාසය තුලදී සිදුකරන ලද ක්‍රියා සම්බන්ධයෙන් කෙටියෙන් පැහැදිලි කරන්න?

පි: විශේෂයෙන්ම 1993 වසරේ මම පුපුරන ද්‍රව්‍යවලට අනුයුක්ත කලාට පසුව මම හිත්නනේ ලංකාවේ සිදුවන සෑම විශේෂයෙන්ම ත්‍රස්තවාදී ක්‍රියා සම්බන්ධ ක්‍රියා සම්බන්ධ සිදු කරන ලද පිපිරීම් විමර්ශන හැම එකකට ම වගේ බොහෝ එවාට 95% ට වගේ සම්බන්ධ වුණා මොක ද ඒ වකවානුවේ ඒ හිටියේ එම අංශයේ ප්‍රධානියා ලෙස දැනට විශ්‍රාමික රස පරීක්ෂකවරයෙකු වන ඩබ්ලිව්.ඩී.ජී.එස් ගුණතිලක මහතා ඒ මහතා ගාවට ඊළඟට ජ්‍යෙෂ්ඨ නිලධාරිවරයා විදියට මම තමයි කටයුතු කලේ එම නිසා සෑම විමර්ශනයක් සඳහාම එක්කෝ එතුමා සමඟ නැතිව තනියම හරි එවැනි විමර්ශන සමූහයකට සහභාගී වුනා .

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එයින් කිහිපයක් පමණක් ඔබට නම් වශයෙන් සඳහන් කරන්න හැකියාවක් තිබෙනවාද?

පි: දිගම්පතන සිදුවන නේවි නාවික හමුදා නිලධාරීන් සමඟ සමුහයක් ඝාතනය කිරීම ඒ වගේම කැබතිගොල්ලෑව ඝාතනය ඒ වගේම මරාගෙන මැරෙන බෝම්බයක් පිපිරුනා මං හිතන්නේ මෙතන පොලිස් ස්ථානයෙ කොහේද මේ කොළඹ කොල්ලුපිටිය බෝම්බ පිපිරිම,මීට අමතරව දැනට වර්ථමාන ජනාධිපති ගෝඨාභ රාජපක්ෂ මැතිතුමාගේ එල්ල කර සිදුකරන ලද බෝම්බ ප්‍රහාරය ඒ වගේම හිටපු ආරක්ෂක හිටපු හමුදාපති සරත් පොන්සේකා මැතිතුමාගේ බෝම්බ පිපිරිම සම්බන්ධවත් අවසාන වශයෙන් තියෙන්නේ අවසා පිපිරිම සිදුවුනේ ත්‍රස්තවාදීන්ගේ දකුණු පළාතේ 2009 මුස්ලිම් පල්ලියක් ආශ්‍රිතව ලොකු බෝම්බයක් පිපිරුවා.අකුරැස්ස අන්න ඒ බෝම්බය පිපිරිම දක්වා මේ වනතුරු සියළුම විමර්ශන සිදුකළා.මෑතකදි සිදු කරනු ලැබූ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය සමුහයකටම මගේ දායකත්වය ලබා දුන්නා එම විමර්ශන සඳහා.

ප්‍ර: වැලි අංග මහතාණනි ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද පිපිරිමක් කියලා කියන්නේ මොකක්ද කියලා?

පි: පිපිරිමක් කෙටියෙන්ම කිව්වොත් ස්වාමීනි ක්ෂ්නිකව එහෙම නැත් නම් ඉතාම කෙටි කාලයකදී නිකුත්වන ශක්තිය නිදහස් කිරීමක් අපි ඒකට කියනවා Instant release energy ඒකට තමයි සාමන්‍යයෙන් පිපිරිමක් කියලා කියන්නෙ.

ප්‍ර: බෝම්බ පිපිරිමක් කියලා කියන්නේ මොකක්ද කියලා පැහැදිලි කරන්න?

පි: බෝම්බ පිපිරිමක්කියලා කියන්නේ පුපුරන ද්‍රව්‍ය කියන්නේ රසායනික ද්‍රව්‍යයක් ඒ රසායනික ද්‍රව්‍ය අධික සත්‍යයක් ගැබ්වෙලා තියෙනවා කියලා එවැනි අදික සත්‍යක් ගැබ්වෙලා තියෙන්නේ රසායනික ද්‍රව්‍ය භාවිතා කරලා නිපදවන උපක්‍රමයක් device එකක් තමයි බෝම්බයක් කියලා කියන්නේ.එතකොට හැම බෝම්බයකම මෙම රසායනික ද්‍රව්‍යත් තියෙන්න ඕනේ රසායනික ද්‍රව්‍ය අඩංගු කරලා තියෙන යම් කිසි උපක්‍රමයක් පුපුරා යන්න පුළුවන් නම් අපි ඒකට කියනවා බෝම්බයක් කියලා.

ප්‍ර: දැන් පුපුරන ද්‍රව්‍ය කියලා කියන්නේ මොකක්ද කියලා පැහැදිලි කරන්න පුළුවන්ද ඔබට?

පි; ඔය සෑම බෝම්බයකම පුපුරන ද්‍රව්‍ය අඩංගු වෙනවා සෑම බෝම්බයක් ගත්තාම යම් කිසි පුපුරන ද්‍රව්‍යය වර්ගයක් තියෙනවා. ඒ පුපුරන ද්‍රව්‍යය කියන්නේ රසායනික ද්‍රව්‍ය. කෙමිකල්ස්.ඒ රසායනික ද්‍රව්‍යවල විශේෂ ලක්ෂනය තමයි එම රසායනික ද්‍රව්‍ය වල තියෙනවා යම් කිසි ශක්තියක් ගැබ් වෙලා එතකොට ඒ ශක්තිය යම් කිසි නිදහස් කර ගන්න පුළුවන් විදියට තාක්ෂණය යොදවලා කරන උපක්‍රමයක් තමයි බෝම්බයක්

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කියලා කියන්නේ එතකොට පුපුරන ද්‍රව්‍ය කියන්නේ යම් කිසි රසායනික ද්‍රව්‍යයක් විවිධ රසායනික ද්‍රව්‍ය තියෙනවා.

ප්‍ර: කිහිපයක් ඔබට නම් කරන්න පුළුවන්ද?

පි: පහසුම එක අපි දන්න එක තමයි වෙඩි බෙහෙත් කළු වෙඩි බෙහෙත් ඒ කළු වෙඩි බෙහෙත් ගත්තොත් එහෙම ඒකේ තියෙන්නේ පොටෑසියම් නයිට්‍රේටුයි ගෙන්දගමුයි තව තියෙනවා කාබන් කියන එක එතකොට ඒකත් පුපුර ද්‍රව්‍යයක් ඊට අමතරව එතනින් එහාට අපි ගියොත් කියන්න පුළුවන් ඩයිනමයිට්,ජෙලිට්නයිට්,ඒකේ තියෙන්නේ නයිට්‍රෝ සෙලිලෝස් කියන එක එතකොට ඒකත් රසායනික ද්‍රව්‍යයක් ඊට අමතරව එතැනින් එහාට ගියොත් අපිට යන්න පුළුවන් ටි.එන්.ටි ට්‍රයි නයිට්‍රෝ ටොලීන් එහෙම නැත්නම් ආර්.ඩි.එස්. එහෙම නැත්නනම් C4 ප්ලාස්ටික් පුපුරන ද්‍රව්‍යය එවැනි දේවල් තමයි ඒවා රසායනික ද්‍රව්‍යය ඒවාට තමයි අපි කියන්නේ පුපුරන ද්‍රව්‍යය කියලා .

ප්‍ර: රසායනික ද්‍රව්‍ය එකතුකරලා යම් කිසි පිපිරිමක් සිද්ධ කරන්න පුළුවන්ද?

පි: දැන් අපි වෙඩිබෙත් ගත්තොත් එහෙම රසායනික කීපයක එකතුවක් ඒ කියෙන්නේ පොටෑසියම් නයට්‍රේට් ගෙන්දගම් සහ කාබන් ඒක රසායනික ද්‍රව්‍ය කීපයක එකතුවක් එකත් පුපුරන ද්‍රව්‍යයක කිහිපයක් එහෙම නැත්නම් පුළුවන් මොකක්ද මට මතකයි මෑතකදි සිදු වූ බෝම්බ පිපිරීම් මාලාවේම අපිට විමර්ශනවලදී අපි හොයා ගත්තා ඒකට භාවිතා කරලා තිබ්බේ මේ යූරියා නයිට්‍රේට් නැමැති අධි බල පුපුරන ද්‍රව්‍යයක් යුරියා නයිට්‍රේට් යූරියා නයිටේට් හදා ගන්නේ යූරියා කියන රසායනික ද්‍රව්‍යයි නයිට්‍රික් රසායනික අම්ලයයි රසායනික ද්‍රව්‍යයි එකිනෙක ප්‍රතික්‍රියා කරනවා ඒක හරි දැන් මම ඉස්සෙල්ලා කිව්වා දැන් මේ කළු වෙඩිබෙතුයි ගෙන්දගනුයි කාබන් කියන එක මිශ්‍ර කරනවා විතරයි නිකම් අඹරනවා ඒකට රතිඤ්ඤා හදන්නේ එහෙමයි. නමුත් මම කිව්ව මේ යූරියා නයිට්‍රේට් රසායනික ප්‍රතික්‍රියා කරලා හදනවා යූරියා නයිට්‍රේට් කියලා රසායනික ද්‍රව්‍යයක් ඒකත් මම හිතන්නේ රසායනික ද්‍රව්‍ය කීපයක් එකතු කරලා හදාගන්න පුළුවන් පුපුරන ද්‍රව්‍යයක්.

ප්‍ර: දැන් ඔබ ඔය මෑතකදී කියන එකෙන් අදහස් කරේ මොකක්ද?

පි: ගිය අවුරුද්දේ 2019.04.21 සිදු වූ බෝම්බ පිපිරීම් මාලාවක්.

ප්‍ර: ඔබට පැහැදිලි කරන්න දැන් ඔබ කලින් ඔය සඳහන් කරපු යූරියා සහ නයිට්‍රික් ඇසිඩ් කියන රසායනික ද්‍රව්‍ය දෙක මිශ්‍ර කිරීමෙන් පමණක් පිපිරිමක් ඇති කරන්න පුළුවන්ද එහෙම නැත්නම් ඒකෙන් යම්කිසි ඩෙටර් ඩෙටර් නේටර් පිපිරිම් උපක්‍රමයකුත් යොදන්න අවශ්‍යද කියලා?

පි; මොකද යූරියා කියන රසායනික ද්‍රව්‍යයි නයිට්‍රික් අම්ලය කියන රසායනික ද්‍රව්‍යයි ප්‍රතික්‍රියාවට ලක් කරන්න ඕනේ මේ ප්‍රතික්‍රියා කරනවා කියලා කියන්නේ ඒක විශේෂ අවස්ථාවක් විශේෂ තත්ත්වයක් ලබා දෙන්න ඕනේ ඒ ප්‍රතික්‍රියාවට අපිට අවශ්‍ය වෙනවා උෂ්ණත්වය පාලනය කරන්න ඒක නිසා මේක උෂ්ණත්වය කියා ගන්න ඕනේ සෙන්ටිග්‍රේඩ් අංශක 01,2

FAIR COMMENT BY JEZEEM

අතර ඒ කියන්නේ freezing Temperature තමයි ඒ දෙක ප්‍රතික්‍රියා කරලා අපිට හදා ගන්න පුළුවන් වෙන්නේ යුරියා නයිට්‍රේට් අම්ලය එහෙම නම් යුරියා නයිට්‍රේට් සංස්ලේෂණය කරන්න ඕනේ සින්තසයිස්. කරන්න ඕනේ. ප්‍රතික්‍රියා කරන්න වෙන්නේ යූරියා සමඟ නයිට්‍රික් අම්ලය සෙන්ට්‍රිග්‍රේටඩ් අංශක .0.1,2 වගේ එහෙම නැත්නම් freezing Temperature එකක තමයි ඒ නයිට්‍රික් අම්ලය යූරියා නයිට්‍රේට් හදා ගන්න වෙන්නේ යූරියා නයිට්‍රේට් කියන්නේ නිකම් සුදු පැහැති කැටවර්ගයක්. ද්‍රව්‍ය සදු පැහැති සීනි කැට වගේ පවුඩර් එකක් මේක අපි සලකන්නේ අධි බල පපුපුරන ද්‍රව්‍යක් හැටියටය.High Explosive එතකොට High Explosive කියනඒවා පුපුරන නම් අපිට අනිවාර්යෙන්ම අවශ්‍ය වෙනවා ඩෙටර්නේටර් නමැති උපක්‍රමයක්. High Explosive කියන එක ගින්දරින් පුපුරවන්න බැහැ. දැන් උදාහරණයක් වශයෙන් TNT එහෙම නැත්නම් ,C4 කියන High Explosive ගින්දරට දැම්මට පුපුරන්නේ නැහැ. ඒක නිකම් ගිනිගන්නවා විතරයි. ඒක පුපුරවන්න නම් ඩෙටර්නේටර නමැති උපක්‍රමය අවශ්‍ය වෙනවා ඩෙටර්නේටරයක් අවශ්‍යය වෙනවා ඕනෑම අධි බල පුපුරන ද්‍රව්‍යයක් එහෙම නැත්නම් High Explosive එකක් පුපුර වන්න එතකොට යූරියා නයිට්‍රේට් කියන කෙමිකල් එකත් පුපුරන ද්‍රව්‍යයක් High Explosive නිසා ඒක පුපුරවන්ත් අපිට අනිවාර්යෙන් ඕනවෙනවා ඩෙටර්නේටර් එකක් .

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා .</u>

ප්‍ර: දැන් සාක්ෂිකරු ඔබ කිව්ව හැටියට යූරියා වල ස්භාවය සුදු කැට කියලා කිව්වා?

පි; දැන් යුරියා නයිට්‍රේට් ස්වාමිනි.

ප්‍ර; ඔව් යුරියා නයිට්‍රේට් සුදු කැට වගේ කියලාද ඔබ කියන්නේ?

පි: යූරියා නයිට්‍රේට් තමයි සුදු කැට වගේ තියෙන්නේ.ඒක නයිට්‍රික් අම්ලය සමඟ ප්‍රතික්‍රියා කරලා හදන යුරියා නයිටට්‍රේට් නැමැති අධිබලැති පුපුර ද්‍රව්‍යත් සුදුපාට කැට.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතීඥ නයනා සෙනවිරත්න මිය</u>

මේ අවස්ථාවේදී ගරු කොමිෂන් සභාවේ අවධානය යොමු කර සිටිනවා දැනට මෙහෙයවා ඇති සාක්ෂි මත ඉදිරිපත් වී තිබෙනවා කරුණු වනාතවිල්ලුව ප්‍රදේශයේ ලැක්ටෝස්වත්තේ අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුව විසින් 2019 ජනවාරි 16 වන දින සොයා ගන්නා ලද නඩු භාන්ඩ අතර ස්වාමිනි ඉන්දියාවේ නිෂ්පාදිත ඩෙටර්නේටර් 99 යක් සහ නයිට්‍රික් අම්ලය යූරියා ඇතුළු රසායනික ද්‍රව්‍ය විශාල ප්‍රමාණ වලින් තිබී ඇති කාරණය අවධානය යොමු කර සිටිනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: වැළිඅංග මහතාණනි ඔබ ඔය සඳහන් කරපු යූරියා සහ නයිට්‍රේට් අසිඩ් කිව්වා මේ ඉතා අඩු උෂ්ණත්වයක්දී සෙන්ට්‍රිග්‍රේට් 1.0 වගේ උෂ්ණත්වයකදි තමයි මිශ්‍ර කිරීම සිදු කරලා මේ පිපිරිමක් හදන්න පුළුවන් කියලා මේ සම්බන්ධයෙන් ක්‍රියා කරන්න මෙහෙම නිශ්පාදනය කරන්න කෙනෙකුට දැනිමක් තිබිය යුතුයිද?

පි: ස්වාමිනි මෙයෙමයි මේ මෙම මම අන්තර්ජාලයත් මේක බැලුවා අන්තර් ජාලයේත් තියෙනවා මේක හදන ක්‍රමය ඒ කියන්නේ යූරියා සහ නයිට්‍රික් අම්ලය එකට කලවන් කරලා අයිස් දැම්මොත් එහෙම ශීතල කරොත් එහෙම මේ crystals හැදෙනවා.ඊට පස්සේ ඒක ෆිල්ටර් කරලා dry කරලා ගත්තාම වියලා ගත්තාම යූරියා නයිට්‍රේට් සාදා ගන්න පුළුවන්. සාමාන්‍යයෙන් ඉතින් පොඩි දැනුමක් තියෙනවා නම් ඒ අනුව අන්තර්ජාලය පරීශිලිනය කරලා මේක හදා ගන්න හැකියාවක් තියෙනවා.විශේෂයෙන්ම මෙම රසායනික ද්‍රව්‍ය අපි විද්‍යාගාරයකදි හැදුවා.විද්‍යාගාරයේ අපි යූරියා නයිට්‍රේට් සංස්ලේෂනය කරා synthesize මොකද මේ විමර්ශන සඳහා අවශ්‍ය නිසා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ඉල්ලීමක් කරනවා මේ විශේෂඥ සාක්ෂිකරු විසින් දැන් ප්‍රකාශ කරපු විදියට යූරියා නයිට්‍රේට් හදන්නේ කොහොමද කියන එක ප්‍රසිද්ධ කරන්න එපා.මොකද ඔබ දන්නා ඇයි ඒක ප්‍රසිද්ධ කරන්න හොද නැත්තේ කියන එක සාක්ෂි කරු කියන විදියට ඒක පහසුවෙන් හැදිය හැකිය බවට කිව්වාට කමක් නැහැ කරන ක්‍රමවේදය ප්‍රසිද්ධ කරන්න එපා.

පි: ස්වාමිනි මේක අන්තර්ජාලයේ තියෙන්නේ බැක් යාඩ් එක්පොලෝසි කියලා.

එකත් ලියන්න එපා.

****

<u>ජ්‍යෂ්ඨ රජයේ අධි නීතීඥ නයනා සෙනවිරත්න මිය</u>

ප්‍ර: ඔබ මොකක්ද සඳහන් කරේ මේ වියලිමකට භාජනය කරන්න ඕනේ කියලා?

පි: ස්වාමිනි යූරියා නයිට්‍රේට් කියනනේ දියරයක්නේ ඒකේ සාමාන්‍යයෙන් ජලයත් තියෙනවා එතකොට මේක හැදුවාට පස්සේ ඒක වියලිමට ලක් කරන්න ඕනේ නැත්නම් ඒක තෙතමනයත් එක්ක මම හිතන්නේ පිපිරිම වෙන්නේ බොහෝ වෙලාවට දැන් වියලිමට ලක් කරාට පස්සේ තමයි ඒක ඩ්‍රයිපෝම් එකෙන් තමයි අපිට පුළුවන් වෙන්නේ යම් කිසි

FAIR COMMENT BY JEZEEM

පිපිරීමේ උපක්‍රමයට භාවිතා කරන්න. යම් කිසි බෝම්බයක් නිෂ්පාදනය කිරීමේදී වියලි තත්ත්වයෙන් තමයි භාවිතා කරන්න සුදුසු වෙන්නේ.

ප්‍ර: වැළිඅංග මහතාණනි මේ අර කොන්ඩෙ වේලන්න පාවිච්චි කරන හෙයාඩ්‍රයිව් ඒ වගේ එකෙනුත් පාවිච්චි කරලා ඔය ඔබ තුමා කියපු ආකාරයට වියළිමක් ඇති කරන්න පුළුවන්ද?

පි: පුළුවන් ස්වාමිනි.හෙයාඩ්‍රයර් එකෙනුත් කරන්නේ වියලිම තමයි ඔන්නම් සුළු ප්‍රමාණයක් අපිට හෙයාඩ්‍රයරින් වුනත් අපි විද්‍යාගාරයේ උනත් ගොඩාක් වෙලාවට හෙයා ඩ්‍රයර් එකක් පාවිච්චි කරනවා වියළිමට සඳහා විද්‍යාගාරයේ බෝහෝවිට හෙයාඩ්‍රයර්ස් තියෙනවා.

මේ අවස්ථාවේදී ගෞරවයෙන් සැලකර සිටින්නේ මා කළින් සඳහන් කරපු දිනයේ ස්ථානයදීම එනම් වනාතවිල්ලුවේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් විසින් සොයා ගන්නා ලද භාණ්ඩ අතර හෙයාඩ්‍රයර් මේ වියලිමේ උපකරණයක් තිබී සොයගෙන ඇති බවට ගෞරවයෙන් අවධානයට යොමු කර සිටිනවා.

ප්‍ර: ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද බෝම්බ පිපිරිමකදී කුමක්ද සිදුවෙන ආචාරන කියලා ?

පි: බෝම්බයක් පිපිරීමේදී ප්‍රධන වශයෙන් ¾ තුනක් තියෙනවා. ඒ කියන්නේ තුවාල සිදුවීම් වෙනවා තුන් ආකාරයට එකක් තමයි අධික උෂ්නත්වය නිසා අධික උෂ්නත්වය නිසා පිලිස්සීමක් ඇතිවෙන්න පුළුවන් දෙවනුව ඇතිවෙන කම්පන තරංග කම්පන තරංග නිසා ඒ ළඟ තියෙන භාණ්ඩ හෝ ශරීර කොටස් සුළු විනිසු වෙලා යන්න පුළුවන් කැලී කැඩිලා බිදිලා යන්න පුළුවන්.විශේෂයෙන්ම අපි දන්නවා මරාගෙන මැරෙන බෝම්බයක් පිපිරීමේදී එහෙම මරාගෙන මැරෙන බෝම්බයේ තියෙන්නේ අපේ උරය තමයි ඇඳගෙන තියෙන්නේ ඒ උරය ඇඳගෙන එහෙම තිබ්බොත් මෙන්න මේ කෑල්ල ඔක්කෝම බෙල්ලෙන් ව පහල ඉන දක්වා සියළුම කොටස් විසුනු විනිසු වෙලා විකාදනය වෙලා නැතිවෙලා යන්න පුළුවන් ඒක සිදුවෙන්නේ මේ බලාස්ටි effect එක එහෙම නැත්නම් කම්පනය නිසා. වෙනත් අකාරයට කිව්වොත් මෙන්න මේසය උඩ බෝම්බයක් පිපිරුවොත් පොඩි එකක් මෙතන වළක් හැදෙනවා.crater. එකක් හැදෙනවා. ඒ crater.එක හැදෙන්නෙත් ඇතිවන කම්පනය නිසා මුලින්ම උෂ්නත්වය නිසා පිළිස්සුම් ඇතිවෙන්න පුළුවන්. ඊට අමතරව කම්පනය නිසා එතන සම්පූර්ණයෙන්ම සුනු විසුනු වෙලා යන්න පුළුවන් ඒ ඇවිල්ලා බ්ලාස්ට් effect එක නිසා. ඒ කම්පන තරංග නිසා ඊට අමතරව සමහරව උපක්‍රමවල එහෙම නැත්නම් බෝම්බවල තියෙනවා කැබලි දාලා ලෝහ ගෝල ,ලෝහ කැබලි ඒ ලෝහ කැබලි පියාඹගන යන්න පුළුවන් flyshapler පියාඹගන ගිහිල්ලා ඈත ඉන්න මිනිස්සුත් තුවාල කරන්නත් පුළුවන් මොකද ඒ ආයවරණ තුන තමයි වෙන්නේ ඩැමේජ් වෙන්න පුළුවන් එහෙම නැත්නම් තුවාල

FAIR COMMENT BY JEZEEM

වෙන්න පුළුන් පිලිස්සීම්වලින් තාපය දෙවනි එක බ්ලාස්ට් effect එහෙම නැත්නම් කම්පනය තුන්වෙනි එක කැබලි වැදීම.

****

ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා

ප්‍ර: බෙල්ල කිසිවෙක් වෙන්නේ නැද්ද?

පි; ස්වාමිනි මෙහෙමයි දැන් මේ explosive තියෙන්නේ මේ හරියේ මෙතන සොෆ්ට් තැනකින් ගලවලා යන එක මේ කම්පන තරංග මෙහෙම ආපුවාම මෙතනින් ගලවලා යනවා. එකයි වෙන්නේ සාමාන්‍යයෙන් බෙල්ලට ආසන්න තිබ්බා නම් එහෙම බෙල්ල වුනත් විසිවෙලා යන්න පුළුවන් ඒ අනුව ගොඩාක් වෙලාවට මේක තියෙනවා පපුව හරියට එන්න කම්පන තරංග මේ පැත්තට ගමන්න කරලා බෙල්ල මෙතැන්නි ගැලවිලා යනවා.

****

ජ්‍යෂ්ඨ රජයේ අධි නීතීඥ නයනා සෙනවිරත්න මිය

ප්‍ර; මේ පැත්තට කියන්නේ උඩටට කම්පන තරංග උඩටට?

පි: හැම පැත්තටම යනවා කම්පනතරංග ත්‍රිමාණව හැම පැත්තකටම යනවා. එතන උඩටට යන තරංගවලින් මේක ගැලවිලා යනවා.

ප්‍ර: වචන කියන්න ?

පි; ඒ කියන්නේ කම්පන තරංග ඕනම දිසාවකට ගමන් කරන් පුළුවන් එතකොට බෙල්ල තියෙන නැත මේක සොෆ්ට් තැනක් නිසා මෘදුයි මේ බෙල්ල හරිය ශරීරයේ අනිත් කොටස්වලට වඩා සොෆ්ට් නිසා ගැලවිලා විසික් වෙලා යනවා බෙල්ල තුවාල වෙන්නත් පුළුවන් මෙතනින් ගොඩාක් වෙලාවට ගැලවිලා විසික් වෙන්නත් පුළුවන්.

ප්‍ර; ඔබේ අත් දැකීම් අනුව ස්වයං ඝාතකයන්ගේ සෑම දෙනාම වාගේ බෙල්ල විසිවෙලා යනවා නේද?

පි: ස්වාමිනි ඒක රදා පවත්න්නේ ඒ ස්වයං ඝාතකයාගේ පිපුරු උපක්‍රමය එහෙම නැත්නම් බෝම්බය තියෙන මත බෝම්බය සාමාන්‍යයෙන් උරහිසේ මෙන්න මේ හරියේ තිබ්බොත් අනිවාර්යෙන්ම බෙල්ල ගැලවිලා ඉහලට යනවා. ගොඩාක් වෙලාවට වෙන්නේ එහෙම තමා සාමන්‍යයෙන්.

****

ගරු අදිකාරි මැතිණිය

ප්‍ර: වැලිඅංග මහත්මයා දැන් ඔබ පැහැදිලි කලේ බෝම්බයක් ඉදිරිපස ප්‍රදේශයේ බැඳගෙන හිටියොත් බෙල්ල මෙතැනින් ගැලවිලා යන ආකාරයනේ පිටිපස්සේ අප්‍රේල් 21 බෝම්බකරුවන් බැඳගෙන ආවේ පිටෙනේ. ඒ වගේ අවස්ථාවකදී කොහොමද බෙල්ල ගැලවිලා යන්නේ?

FAIR COMMENT — BY JEZEEM

පි: ඒ අවස්ථාවේදී වෙන්නේ මැඩම් මෙහෙමයි ස්වාමිනි බෙල්ල ගැලවිලා යනවා විශේෂයෙන් බලන්න පුළුවන් මේ තාප හානීය තියෙන්නේ ඉදිරියේද පිටිපස්සේ ද කියලා සාමාන්‍යයෙන් ඉදිරියේ බොම්පය තිබ්බොත් එහෙම මුහුණ ඔක්කෝම කළු වෙන්න පුවන්. කළුවෙලා පිලිස්සුම් ලකුණු මේ පැත්තේ වැඩිපුර තියෙන්න පුළුවන්. නමුත් මේ පිටිපස්සේ බෝම්බය තිබ්බොත් එහෙම බෙල්ල ගැලවිලා යනවා ඒත්.නමුත් මේ පිලිස්සුම් ලකුණු වැඩිපුර තියෙන්නේ පිටිපස්සට වෙන්න මුහුණේ ස්වභාය සාමාන්‍යයෙන් අදුර ගන්න පුළුවන් ස්වාමිනි ගොඩාක් දුරට. ඉදිරිපස බෝම්බය තිබුණොත් ස්වාමිනි මුහුණේ ස්වභාවය හදුනන්න බැහැ ස්වාමිනි.නමුත් පිටිපස බෝම්බය තිබ්බොත් මුහුණේ සවභායට හදුනා ගන්න පුළුවන් සාමාන්‍ය තත්ත්වයේ තියෙනවා.

****

<u>ජ්‍යෂ්ඨ රජයේ අධි නිතීඥ නයනා සෙනවිරත්න මිය</u>

ප්‍ර; දැන් ඔබ සඳහන් කරපු මේ . sharpnels ලෝහ කැබලි දාන්නේ ඒ බෝම්බයේ තුවාල සිදුවෙන එක වැඩිකරන්න කියලා කිව්වොත් හරිද? ඒක පැහැදිලි කරන්න පුළුවන්ද?

පි: ස්වාමිනි කැබලි එකතු කිරීමෙන් ඒ කැබලි බෝම්බය බෝම්බයෙන් සමඟ නිකුත් වෙන කම්පන තරංග සමඟ පියඹාගෙන යනවා එතකොට ඇත ඉන්න මිනිස්සුන්ට එහෙම නැත්නම් දේවල්වලට තුවාල සිදුවෙන්න පුළුවන් එතකොට කැබලි වැඩි කරන්නේ ඇත්තටම ගෙඩාක් ජන සමුහක් එක්වර ඝාතනය කරන්න අවශ්‍ය නම් කරන්න කැබලි දාන්නේ ඇත්තටම ජන සමුහක් එක්වර ඝාතනය කරන්න පුළුවන් කැබලි එකතු කිරීමෙන් කැබලි නැත්නම් ඔව්වර ජන සමුහයක් ඝාතනය කරන්න බැහැ. ඒ කම්පන තරංග සහ පිලිස්සුම් තියෙන්නේ ගොඩාක් වෙලාවට බෝම්බයට ආසන්නව නමුත් කැබලි ඇතිකිරීමෙන් මීටර් 20,30 ක් වුනත් ඈතට ගමන් කරලා පසාරු කරගෙන යන්න පුළුවන් හාඩ් මෙඩිල්එකක් වුනත් ගනකම් මේ ලෝහ පෘෂ්ඨියක් වුනත් පසාරු කරගෙන යන්න පුළුවන්මේ බෝම්බයේ තියෙන ප්‍රබලත්වය අනුව.

ප්‍ර; දැන් ඔබ සඳහන් කරා මේ කම්පන තරංග ඇතිවීමෙන් මේ ශරීරයේ කොටස් කඩලා යන්න පුළුවන් කියලා?

පි: කැබලිවලට පත්වෙලා සුනු විසුනු වෙලා.

ප්‍ර: බ්ලාස්ට් ඉන්ජිරිස් කියලා අපි වෛද්‍ය විද්‍යානුත්මක හදුන්වන්නේ ඒ තුවාල ඒ ආකාරයට කම්පනය තරංග වලින් ඇතිවන තත්ත්වයක් මත සිදුවිය හැකිද යනු?

පි: එය සාමාන්‍යයෙන් බ්ලාස්ට් ඉන්ජිරිස් කියලා කියන්නේ ස්වාමිනි කම්පන තරංඟ නිසා ඒ බෝම්බයට ආසන්නව බෝම්බයට ඉතා ආසන්නව ඇතිවෙන නිසා මේ තුවාල සිදුවිම්වල තමා කියන්නේ බ්ලාස්ට් ඉන්ජිරිස්

FAIR COMMENT BY JEZEEM

කියලා බ්ලාස්ට් ඉන්ජිරිස් බොහෝ වෙලාවට තියෙන්නේ බෝම්බයට ඉතා අසාන්නව .

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර; ස්වයං ඝාතකයාට ආසන්නයේ සිටි පුද්ගලකුගේ බෙල්ලත් ස්වයං ඝාතකයා වාගේම කැඩිලා විසිවෙන්න පුළුවන්ද?

පි: බොහෝ වෙලාවට එහෙම අවශ්‍ය වෙන්න ඉතාමත් අඩුයි ස්වාමිනි.එයා ඉතා ආසන්නයේ හිටියේ නැත්නම් දෙන්නා එක ලඟ හිටියොත් එහෙම උදාහරණයක් ලෙස කිව්වොත් එහෙම දෙන්නාගේ ඔලු දෙක එක ළඟ ආසන්නයේ හිටියොත් එහෙම ඔබට ඉතා ගෑවෙන මට්ටමක එහෙම තිබ්බොත් එහෙම ඒ හිස වුනත් ගැලවිලා යාමේ හැකියාවක් තියෙනවා.

ප්‍ර: ගෑවෙන මට්ටමක නැත්නම් ?

පි: නැත්නම් එහෙම වෙන්නේ නැහැ ස්වාමිනි.නැත්නම් වෙන්නේ නැහැ මොකද එතකොට කම්පන තරංගවලින් ඒ පුද්ගලයා විසිවෙලා යනවා. කම්පන තරංගවලින් එයා විසිවෙලා යන්න පුළුවන් වෙන දිසාවකට .

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතීඥ නයනා සෙනවිරත්න මිය</u>

ප්‍ර: වැලි අංග මහතාණනි දැන් ඔබ විස්තර කරේ මේ බෝම්බ පිපිරිමකදී සිදුවෙන අවරණ තුනක් සම්බන්ධයෙන් දැන් මම ඔබේ අවධානය යොමු කරනවා වෙනත් කරුණක් සම්බන්ධයෙන් ඔබට මේ ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්න පුළුවන්ද මේ ගෑස් සිලින්ඩයක් කියලා කියන්නේ මොකක්ද කියලා?

පි: යම් කිසි වායුවක් පිඩනයකට පත්කරලා අඩංගු කරලා තියෙන යම් කිසි සණකම් ලෝහමය භාජනයක් තමයි ගෑස් සිලින්ඩරයක් කියලා කියන්නේ.

ප්‍ර: දැන් සාමාන්‍යය තත්ත්වයක් යටතේ ගෑස් සිලින්ඩයක් පුපුරන්න පුළුවන්ද?

පි; ගෑස් සිලින්ඩර් කිව්වාම ස්වාමිනි ඕනම ගෑස් එකක්ත තියෙන්න පුළුවන් සාමාන්‍යයෙන් ඔක්සිජන් තියෙන්න පුළුවන්, හයිඩ්‍රජන්, නයිට්‍රජන්, හයිඩ්‍රජන්, එල්.පි ගෑස්, ඕනම ගෑස් සිලින්ඩරයක් ඒ ගෑස් සිලින්ඩරයේ තියෙනවා ගෑස් නිකුත් කරන වැල් එකක් ඒ වැල් එක වහලා තියෙද්දි ගෑස් සිලින්ඩරයේ නිකුත් වීමක් සිදුවෙන්නේ නැහැ. නමුත් උදාරහණයක් වශයෙන් අපේ නිවසට ගේන එල්.පි ගෑස් සිලින්ඩරය අපිට ගෙදර තියා ගන්න පුළුවන් ගෑස් නිකුත් වෙන්නේ නැහැ ඒකේ දී තියෙනා ගෑස් නිකුත් වෙන වැල් එකක් නමුත් හදිසියේ අපි සිතමු මේ ගෙදර ගින්නක් ඇතිවෙනවා ගින්නක් ඇතිවෙලා මේ ගෑස් සිලින්ඩරය රත්වීමකට ලක්වෙනවා. ඕනම ගෑස් සිලින්ඩරයක් රත්වීමකට ලක්වෙනවා ඇතිවුනා

FAIR COMMENT — BY JEZEEM —

ට පස්සේ ඕනෑම ගෑස් සිලින්ඩරයක් රත්වීමකට පත්වුනාට පස්සේ ඒ ඇතුලේ තියෙන වායුව ප්‍රශාරණයට ලක්වුනාට පස්සේ හැබැයි ඕනෑම අපි සම්මත ක්‍රමයකට නිෂ්පාදනය වෙන ඕනෑම ගෑස් සිලින්ඩරයක තියෙනවා ගෑස් නිකුත් කරන ආරක්ෂක වෑල් එකක් එවැනි පීඩන වැඩීවීමක් වුනොත් එහෙම ආරක්ෂක වෑල් එකෙන් ඒක නිදහස් වෙලා ගෑස් එක නිකුත් වෙනවා. නමුත් අර රත් වීම වේගවත් වුණොත් එහෙම ආරක්ෂක වෑල් එක ක්‍රියාත්මක කරන්න බැරි අවස්ථාවකදී ගෑස් සිලින්ඩරය පුපුරාගෙන යන්න පුළුවන්.

ප්‍ර; දැන් ඔබෙන් වඩා පැහැදිලි කරගැනිමකට නැවත ඇහුවොතින් ඒ කියන්නේ ගෑස් සිලින්ඩරයක් නැවත පුපුරන්න නම් පිටතින් උෂ්ණත්වයක් හෝ තාපයක් ලබා දිය යුතුයිද?

පි: එහෙම නැතිව ගෑස් සිලින්ඩරය පුපුරා යාමේ හැකියාවක් නැහැ.

ප්‍ර: ඔබේ දිර්ඝ සේවාකාලය තුල ඔබ අත්දැකලා තියෙනවාද මේ ගෑස් සිලින්ඩරයක් පුපුරපු අවස්ථාවක්?

පි: ස්වාමිනි සාමාන්‍යයෙන් අපිට නිතරම දක්නට ලැබෙන්නේ අපේ නිවාස වල භාවිතා කරන මුළු තැන් ගෙයි භාවිතා කරන එල්.පි ගෑස් වායුව සහිත සිලින්ඩර් නමුත් එවැනි කිසිම අවස්ථාවක් මම දැකලා නැහැ ගෑස් සිලින්ඩරයක් පුපුරා යනවා සිලින්ඩරයක් පුපුරා යනවා කිව්වොත් එහෙම සිලින්ඩරය කෑලි වලට කැඩෙන්න ඕනී ඒකනේ සිලින්ඩරය පුපුරා යනවා කියන්නේ.එහෙම දෙයක් අපි දැකලා නැහැ.නමුත් සමහර අවස්ථාවලදී මේ ගෑස් සිලින්ඩරයට සම්බන්ධ නලය මොකක් හරි කාන්දුවක් තිබ්බොත් එහෙම පිටතට කාන්දු වෙන්න පුළුවන් ඒ පිටතට කාන්දු වුන එල්.පි. වායුව ගිනි පුළුන් වගේ පුපුරා යන්න පුළුවන් එතනදි සිදුවෙන්නේ ගෑස් සිලින්ඩරය පුපුරා යාමක් නොවේ අර පිටත නිකුත් වෙච්ව ගෑස් වායුව පුපුරා යන්න පුළුවන් එතකොට ගෑස් සිලින්ඩරය පුපුරා යාම නෙවේ අපි වැඩිපුර අත්දැකලා තියෙන්නේ පිටතට නිකුත් වෙච්ව එල්.පි වායුව වාතාශ්‍රමගින් නිකුත් වෙලා ඒ වායු මිශ්‍රණය පුපුරා යාමක් තමයි දක්නට ලැබෙන්නේ එවැනි කිසිම අවස්ථාවක ගෑස් සිලින්ඩරය පුපුරලා කැඩිලා ගිහිල්ලා නැහැ.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: ඒ ගෑස් සිලින්ඩරය පිපිරිමට සලස්වන්න පුළුවන්ද?

පි: ස්වාමිනි .. ගෑස් සිලින්ඩරයේ රෙගුලේටරය අයින් කරලා සිලින්ඩරය රත් කරන්න ඕනේ රත් කරොත් ක්ෂ්නිකව රත්කරොත් එහෙම පුපුරා යන්න ඉඩ තියෙනවා?

පි: ඒ රත් කිරීමට උපක්‍රම මොකක් හරි මේ උපකරණයක් මගින් පුපුරා හරින්න පුළුවන්ද?

FAIR COMMENT
BY JEZEEM

පි: නැහැ ස්වාමිනි.අනිවාර්යෙන්ම රත් කිරීමට භාජනය කරොත් තමයි පුපුරා යන්න පුළුවන්.

ප්‍ර; රත්කිරීමකට භාජනය කරන්නේ කහොමද රත් කිරීම මගින් බෝම්බ පිපිරීම් කරන්න පුළුවන්ද?

පි; බැහැ ස්වාමිනි. ගෑස් සිලින්ඩරය මගින් බෝම්බ පිපිරික් කරන්න බැහැ ස්වාමිනි. නමුත් මෙහෙමයි බෝම්බයක් පුපුරන තැන ගෑස් තියලා තියන්න පුළුවන් ගෑස් සිලින්ඩරය උඩ බෝම්බයක් තියලා තිබ්බොත් බෝම්බ පිපිරිමත් සමඟ එහෙම ගෑස් සිලින්ඩරය කැඩිලා මෙකෙන් ගෑස් නිකුත් වෙලා ගිනි ගන්න පුළුවන්.මං හිතන්නේ එහෙ දෙයක් සිදුවෙලා තිබුණා මේ කොච්චි කඩේ පල්ලිය ඉස්සරහා වාහනයක් නතර කරලා තිබ්බා ඒ වාහනේ තුල ලොකු පිපිරුම් උපක්‍රමයක් බෝම්බයක් සමඟ ගෑස් සිලින්ඩර් කීහිපයක් එතන තියලා තිබ්බා.මමත් ඒ අපරාධ වූ ස්ථානය විමර්ශනය කළා. එතනදී වුනේ බෝම්බය පිපිරිමත් සමඟ ගෑස් සිලින්ඩරය පිපිරිමකට ලක් වුනා. ඒක හේතු වුනේ ද්විතිකව බෝම්බය පුපුරපු නිසා ළඟ තිබ්බ ගෑස් සිලින්ඩරය පුපුරා ගියා.

ප්‍ර: දැන් ඔය ගෑස් සිලින්ඩරයක් පිපිරිමක් වෙච්ච අවස්ථාවකදී ඔබ අර කලින් සඳහන් කරපු කම්පන තරංග ආවරණය බ්ලාස්ට් එකක ලක්ෂණ ඇතිවෙන්න පුළුවන්ද?

පි: පුළුවන් ස්වාමිනි.

පි; නැවත ප්‍රශ්නය ඇසීමට අවසර ඉල්ලා සිටිනවා.

ප්‍ර; දැන් ඔබෙන් අහන්නේ කම්පන තරංග ඇතිවෙනවා කියලා ඔබ සඳහන් කලානේ ?

පි: එහෙමයි

ප්‍ර; කම්පන තරංග ඇති වෙන්නේ බෝම්බ පිපිරිමකදී කියලා ඔබ සඳහන් කරා?

පි: බෝම්බ පිපිරිමකදී කම්පන තරංග ඇතිවෙනවා.ගෑස් පිපිරිමකින් කම්පන තරංග ඇතිවෙනවා නමුත් ඒ කම්පන තරංග ඒ ගෑස් පැතිරිලා තියෙන ඒ අවකාශ හැමතැනටම එක හා සමානව පැතිරෙනවා.එක තැනකට විතරක් නෙවේ.බෝම්බ පිපිරිමට එන තරංගයි බෝම්බය තියෙන තැන ඒ කෙන්ද්‍රයට අපි ඒකට කියන point Explosion කියලා නැත්නම් පිපුරුම් කෙන්ද්‍රය කම්පන තරංග ප්‍රධාන වශයෙන් තියෙන්නේ. නමුත් බෝම්බ පිපිරිමකදී ගෑස් එහෙම නැත්නම් වායුවක් පිපිරිමේදී එහෙම නැත්නම් ගිනි ගන්නා සුළු වෙනත් වායුවක පිපිරිමේදී එම වායුව පැතිරිලා තියෙන සෑම අවකාශය පුරාම ඒ කම්පන තරංග දක්නට ලැබෙනවා සුළුවශයෙන් නමුත් බෝම්බ පිපිරිමකදී විශේෂයෙන්ම අර.point of explosion . කියලා අපි කියනවා ඒ බෝම්බය තියෙනව තැන පමණයි ප්‍රධාන වශයෙන් කම්පන තරංග දක්නට ලැබෙන්නේ අනිත් තැන් වල කම්පන තරංග දක්නට අඩුයි.

LAW COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔබ කිව්වා ඔය කම්පන තරංග වලින් තමයි ඔය මේ බ්ලාස්ට් ඉන්ජිරි මේ ශරීරයේ කොටස් කැඩිලා යන අකාරයට සිද්ධ වෙන්න පුළුවන් කියලා?

පි: එහෙමයි.

ප්‍ර: ඒ ගැන පැහැදිලි කරන්න නැවතත්?

පි: බෝම්බයක් පිපිරිමේදී ඒ බෝම්බය තියෙන රසායනික ද්‍රව්‍යවලින් නිකුත් වෙනවා කම්පන තරංග ඒ කම්පන තරංග ගමන් කරනවා අවකාශයේ හැම දිසාවකටම අවකාශයේ හැම දිසාවකට ගමන් කරන කොට දුරට දුරට යන්න යන්න ඒ කම්පන තරංග ප්‍රභලත්වය අඩුවෙනවා. ඒ ප්‍රභලත්වය වැඩිවෙලා තියෙන්නේ ඒ බෝම්බය ආසන්නයේ නැත්නම් බෝම්භය ළඟ එතනින් ඈතට ඈතට යන්න කම්පන තරංගවල ප්‍රභලත්වය අඩුවෙනවා.

ප්‍ර; ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද මේ ඔක්සි අසිටලින් දැල්ල කියලා එකක් තියෙනවා ද ඒක ගැන පැහැදිලි කිරීමක් කරන්න තියෙනවා?

පි: ඔක්සි ඇසිටිලි සේලම් එකේ භාවිතා කරනවා මං දන්න හැටියට ස්වාමිනි. ලෝහ පෑස්සීම සඳහා වෙල්ඩින් කිරීම සඳහා ඔක්සි ඇසිලින් වායුව භාවිතා කරනවා.

ප්‍ර; මොකක්ද ඒ ඔක්ෂි ඇසිලින් කියලා කියන්නේ?

පි: ඒ කියන්නේ ඔක්ෂිජන් වායුව සහ ඇටිසිලින් කියන වායුව දෙක එකතු කරලා ඔක්ෂිජින් සිලින්ඩරයක් වෙනම තියනවා ඇසිටිලින් සිලින්ඩරය වෙනම තියෙනවා ඒ දෙකේ එනවා නල දෙකක් ඒ නල දෙක එකතු කරලා හදනවා ඒ දැල්ලක් ඒ දැල්ලට තමයි අපි කියන්නේ ඔක්ෂිජන් සහ ඇසිටිලන්ස් මිශ්‍රණය සහිත දැල්ල ඒයින් ලබා ගන්නා ගිනි දැල්ලට අපි කියනවා ඔක්ෂි ඇසිටිල් blame නැත්නම් ඔක්සි ඇසිලින් දැල්ල කියලා.

ප්‍ර; ඒ කියන්නේ ඒ සඳහා සිලින්ඩර් දෙකක් තිබිය යුතුයි.?

පි: සිලින්ඩර් දෙකක් අවශ්‍ය වෙනවා.ඒ කියන්නේ තනි සිලින්ඩරයේ ඔක්ෂි ඇසිලිටිතාවයක් තියෙන්නේ නැහැ. සිලින්ඩර් දෙකකින් වායුව එකතුකරලා ඔක්සිටි ඇසිලිටි දැල්ල ලබා ගන්නේ.

ප්‍ර: දැන් ඔබ සඳහන් කරා මේ ගෑස් සිලින්ඩරයක් පුපුරලා ගියා නම් ඒකේ ගෑස් ඒ වාතාවකාශයේ විහිදිලා තියෙන්න ඕනේ කියලා?

පි: ගෑස් සිලින්ඩරය පුපුරා ගියා නම් සිලින්ඩරය ඇතුලේ තමයි පුපුරා යන්නේ. සිලින්ඩරයේ ඇතුලේ පිපිරිම ඇතිවෙන කොට සිලින්ඩරය කැලි කැලී වලට කැඩිලා විසි වෙන්න පුළුවන්. නමුත් ගෑස් කාන්දු වෙලා පිපුරුවොත් එහෙම ඒ ගෑස් පැතිරිලා තියෙන ඒ වායුව පැරිලා තියෙන සම්පූර්ණ අවකාශය පුරාම අර මං කිව්ව ආචරණ දක්නට ලැබෙනවා. පිලිස්සීම් ලකුණු සමහරවිට කම්පන තරංග සුළු වශයෙන් තියෙන්න පුළුවන් ඒ වගේ දක්නට ලැබෙනවා අවකාශය පුරාම.

FAIR COMMENT BY JEZEEM

වැළි අංග මහතා ඔබට යම් කිසි පිංතූරයක් පෙන්නුවොත් පින්තූරයේ ඉන්න පුද්ගලයා ලබලා ඉන්න තුවාල වල ස්වභාවය මත ඔබට යම් කිසි පිපිරිම සම්බන්ධයෙන් මතයක් සඳහන් කරන්න හැකියාවක් තිබෙනවාද?

පි: ඒ පුද්ගලයාගේ තියෙන තුවාල සම්බන්ධයෙන් කම්පන තරංග වලින් තුවාල වෙලා තියෙනවා නම් පිලිස්සීම් ලකුණු තියෙනවා නම් ඒ අනුව යම් කිසි අවබෝධයක් ලබා ගන්න පුළුවන් මතයක් දෙන්න පුළුවන් මේ පිපිරිමක් සම්බන්ධ දෙයක්ද නැත්ද කියන එක.

මේ අවස්ථාවේදී දැනටමත් C 600 සහ C601 වශයෙන් ලකුණු කර ඇති ඡායාරූ දෙකක් සාක්ෂිකරුට පෙන්වීමට අවසර ඉල්ලා සිටිනවා.

පි; ස්වාමිනි මේ C601 සහ C 600 කියන ඡායාරූපය දෙකේ මේ පුද්ගලයාගේ දකුනු අතේ මාපට ඇගිල්ලේ හොදට පෙන්න තියෙනවා අනිත් ඇගිලි කැඩිලා ගිය ස්වභාවයක් තමයි පෙන්නේ නමුත් හරියට පැහැදිලි මදි.නමුත් අනිත් ඇගිලි කැඩිලා ගිය සවභාවයක් තියෙනවා ඊට අමතරව ඒ දකුණු අතේ සමේ වර්ණයත් වෙනස් වෙලා තිබ්බ බවත් දක්නට ලැබෙනවා මේ ඡායාරූපය හැටියට.එතකොට මෙවැනි අපරාධ ස්ථාන මෙවැනි බෝම්බ පිපිරිම්වලට ලක්වෙච්ච පුද්ගලයන් කිප අවස්ථාවක් මට අවස්ථාවම ලැබිලා තියෙනවා මට අවස්ථාව ලැබිලා තියෙනවා පරීක්ෂා කරන්න අපරාධ ස්ථානවලදී මොකද සමහරවිට අහලාත් ඇති අපේ දෙපාර්තමේන්තුවේත් අපේ කණ්ෂ්ඨ නිලධාරියෙක් බෝම්බයක් පිපිරිලා ගිහිල්ලා ජීවිතක්ෂයට පත්වුණා 2001 වර්ෂයේ ඒක නිසා මේ අතේ තියෙන තුවාලය හැටියට මතයක් ඉදිරිපත් කරන්න පුළුවන් මේවා අතේ යම් කිසි පුපුරන ද්‍රව්‍ය සහිත පිපුරු උපක්‍රමයක් පුපුරා යයි කියන මතය බැහැර කරන්න කියලා ස්වාමිනි.මේකේ හැටියට.ඒ මතය බැහැර කරන්න බැහැ අතේ පුපුරා ගියා වෙන්න පුළුවන්.ඒ එක්කම කියන්න ඕනේ ලොකු ප්‍රමාණයක් වෙන්න බැහැ. මොකද මම දැක්කා අපේ අර නිලධාරියාගේ අතේ බෝම්බයක් පුපුරා ගියාට පසු මම දැක්කා ඒ ඡායාරූප එයාගේ අතේ තිබ්බේ පුපුරන ද්‍රව්‍ය ග්‍රෑම් 60 යි අධි බල පුපුරන ද්‍රව්‍ය ඒ අත් බෝම්බයේ පුපුරන ද්‍රව්‍ය ගෑම් 80 යි තිබුණේ නමුත් එයාගේ සම්පූර්ණ අතදෙකම ගලවලා ගිහිල්ලා තිබ්බා.අත් දෙකම තිබුණ් නැහැ.ඉතින් මට කියන්න පුළුවන් යම් කිසි සුළු ප්‍රමාණයක් May be hick explosive වලින් ගත්තොත් එහෙම ටි.එන්.ටි එකට සාපේක්ෂව සාමාන්‍යයෙන් ග්‍රෑම් 10 ක් විතර වගේ ප්‍රමාණයක් වගේ මේ අතේ පුපුරලා තියෙන්නේ.ටි.එන්.ටි එකට සාපේක්ෂව පොඩි ප්‍රමාණයක් ඊට වැඩිය ප්‍රමාණයක් පුළුවන් ලොකු damage එකක් වෙන්න පුළුවන් මෙයාට

****

FAIR COMMENT
BY JEZEEM

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: ගෑස් සිලින්ඩරයක් පිපිරුවානම් පිළිස්සීම් තුවාල වැඩිවෙන්න ඕනේ?

පි: ගෑස් සිලින්ඩරයක් පිපිරුවා අර නම් මං කිව්වා වගේ ස්වාමිනි ගෑස් සිලින්ඩරය ඇතුලේනේ පිපිරුවේ එතකොට ගෑස් සිලින්ඩරය අතුලේ පිපිරීමක් සිද්ධ වුනා නම් ගෑස් සිලින්ඩරයේ කෑල්ලක් ඇවිල්ලා අගේ වදින්න පුළුවන්.ඊට අමතරව ඇතිවන ගින්නෙන් මුළු ඇඟේ හැම තැනම පිච්චෙන්න ඉඩ තියෙනවා. ඒ කියන්නේ හම expose වෙනවා හම හැම තැනම ලොකු පිලිස්සීම් තුවාල ඇතිවෙන්න පුළුවන්.

ප්‍ර: දැන් ඔය ඡායා රූපයේ තියෙන්නේ ඇසෙයි අතෙයි විතරයි ?

පි: ඔව් බලපුවාම මේ අතේ සාමාන්‍යයෙන් සුදු වෙලා තියෙනවා හැම ඒක නිසා ගොඩාක් වෙලාවට පිලිස්සීම් ලකුණු මේ concentrate වෙලා තියෙන්නේ මේ අතට ඒ අත තමයි ඇගිලි නැතිව තියෙන්නේ ඒ නිසා ගොඩාක් වෙලාවට බැහැර කරන්න බැහැ මේ මතය අතේ සාමාන්‍ය සුළු ප්‍රමාණයක් තියෙන පුපුරන ද්‍රව්‍ය සහිත පිපිරුම්ත් පුපුරා ගියා කියලා. හැබැයි ස්වාමිනි මේක හයි explosive නම් නම් අනිවාර්යෙන්ම මෙයා අතේ ඩෙටර්නේටරයක් එකකුත් තියෙන්න ඕනේ. මොකද High explosive නොවේ නම් මේවයේ ඇගිලි කඩලා යන්න විදියක් නැහැ ස්වාමිනි. ඇගිලි කඩලා ගියේ නම් කියන්න පුළුවන් බෝහෝ විට මේ අධි බල පුපුරන ද්‍රව්‍යයක් තමයි මේ අතේ පුපුරා ගිහින් තියෙන්නේ එහෙමනම් අයී බලති පුපුරන ද්‍රව්‍ය පුපුරන්න මෙයාට ඩෙටරනේටර් එකකුත් මේ අවස්ථාවේදී මේ පුපුර ද්‍රව්‍ය සමඟ සම්බන්ධ කරලා තියෙන්නෙ ඕනේ.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතීඥ නයනා සෙනවිරත්න මිය</u>

ප්‍ර; බෝම්බයක් අත්හදා බලනකොට ඒ වගේ අවස්ථාවකදී සිදුවන පිපිරමකදී මේ ආකාරයෙන් දෙයක් වෙන්න පුළුවන්ද?

පි: ඒ මතය බැහැර කරන්න බැහැ ස්වාමිනි.

ප්‍ර: දැන් ඔය තුවාල වල තිබෙන්නේ දක්නට ලැබෙන්නේ ඇගිලි කොටස් වෙන්වෙලා තියෙනවා කියලා ඒ ඔබ අර කලින් සඳහන් කරපු බෝම්බයක් සිදුවිමකදී සිදුවෙන ආවාරන වලින් ඔබ දෙවනියාට කරුණක් සඳහන් කරා මේ කම්පන තරංග වලින් බ්ලාස්ට් ඉන්ජිරිස් ඇති වෙන්න පුළුවන් කියලා ඒ ඔබ කලින් සඳහන් කල කරුණු සහ ඔබ දැන් දක්නට ලැබෙන මේ සම්බන්ධයෙන් යම් කිසි මතයක් ප්‍රකාශ කරන්න පුළුවන්ද?

පි: ඔව් ස්වාමිනි මං ඒ මතය බැහැර කරන්න බැහැ කියලා ප්‍රකාශ කලේ කම්පන තරංගවලින් තමයි ඇත. ඩැමේජ් වෙන්න පුළුවන් මෙහෙම කම්පන තරංගමගින් තමයි එවැනි ඇගිලි අත් කුඩුවෙලා යන්න

FAIR COMMENT BY JEZEEM

පුළුවන්.නැතිව පිලිස්සීම්වලින් නෙමේ. ඉන් කම්පන තරංග ඇතිවෙන්න නම් මේක බෝම්බ පිපිරිමකදී වෙන්න ඕනේ. ඒනිසා ඒ මතය බැහැර කරන්න බැහැ ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ කිව්වා මේ යුරියා සහ නියිට්‍රික් ඇසිඩ් මිශ්‍රකිරීමකින් යූරියා නයිට්‍රේට් හදලා ඒක පිපුරුට් ද්‍රව්‍යයත් අවියක් ලෙස භාවිතා කරන්න පුළුවන් කියලා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර; දැන් ඒ විදියට පිපිරුම් ද්‍රව්‍යයක් සෑදිම සඳහා භාවිතා කරන යූරියා වල යම් කිසි ජීව කාලයක් තිබිය යුතුද තිබිය යුතුනම් කොපමණ කාලයක් තිබිය යුතුද?

පි: ස්වාමිනි ඒක නම් මට නිශ්චිතව කියන්න බැහැ මොකද යූරියා කියන එක ඉතා ඉක්මනින් ජලයේ උරා ගන්නවා ජලය absorb කරලා එකේ අපි කියනවා. Deliquescent කියලා ජලය absorb කරන ස්වභාවයක් ඒකේ තියෙනවා ඒක නිසා සමහර විට කල් ගියොත් ඒක කරන්න බැරිවෙයි කියලා මට හිතෙනවා මොකද මේක මට හිතෙනවා මේ ගොඩාක් වෙලාවට යූරියා fresh තිබ්බොත් තමයි මේක හදන්න පුළුවන් කියලා.

ප්‍ර; ඔබ fresh කියන යන්නෙන් අදහස් කරන්නේ මොකක්ද කියලා විශේෂඥ මතයක් කියන්න ඔබට හැකියාවක් තියෙනවාද?

පි: එහෙම ස්වාමිනි නිශ්චිතව කියන්න බැහැ. මොකද ඒ සමහර අවස්ථාවලදී අපි දැකලා තියෙනවා යූරියා කල් තියා ගැනිමේදී මේකේ දියර බවට පත්වෙනවා. ඒක liquefy වෙනවා. ඉතින් liquefy නැතිව solid form සෝම් එකේ යූරියා තිබුණොත් මට හිතෙන විදියට මේ මොකද මේ යූරියා නයිට්‍රේට් කියන පුපුරන ද්‍රව්‍ය අපිට අලුත් ඇත්තටම මම ගොඩාක් මේක අධ්‍යයන කරන්න පටන් ගත්තේ මේ ගිය අවුරුද්දේ අප්‍රේල් 21 න් පස්සේ ස්වාමිනි. මම හිතනවා දියර බවට පත්වෙච්චි යූරියා වලින් මේක හදන්න බැහැ කියලා හිතේ මගේ තියෙන්නේ උතුමාණනි.

ප්‍ර: ඔබට යම් කිසි විශේෂඥ දැනුමක් තියෙනවාද යූරියා කොයි අවස්ථාවක දී කොයි උෂ්ණත්වයකදී දියර බවට පත්වෙනවාද කියලා?

පි: ස්වාමිනි සාමාන්‍යයෙන් කාමරයේ ගෙදර නිකම් තියා ගත්තත් මාස අවුරුද්දක් යනකොට යූරියා දියර බවට පත්වෙනවා. එහෙම නිශ්චිත කාලයක් කියන්න බැහැ. සමාන්‍ය උෂ්ණත්වයක් අවශ්‍ය වෙන්නේ නිකම් සාමාන්‍ය තත්තවය යටතේ උනත් ටික කාලයක් යන කොට ජලය

FAIR COMMENT BY JEZEEM

ඇබ්සෝබ් කරලා ජලය උරාගෙන මේක දියර බවට පත්වීමේ හැකියාව තියෙනවා.

ප්‍ර; දැන් ඔබ කිව්වා නයිට්‍රික් ඇසිටිත් මෙම ක්‍රියාවලියට භාවිතා කරනවා කියලා ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර; එවැනි ක්‍රියාවලියක නයිට්‍රික් ඇසිඩ් භාවිතා කිරීම සඳහා නයිට්‍රික් ඇසිඩ් තුල යම් කිසි ජීව කාලයක් තිබිය යුතුද?

පි: නැහැ නයිට්‍රික් ඇසිඩ් අම්ලයේ ආයුකාලයක් බොහෝ කාලයක් තියා ගන්න පුළුවන්. නයිට්‍රික් ඇසිටික් කියන එක.විද්‍යාගාරවල සමහරවිට අවුරුදු 10,15 පරණ නයිට්‍රික් අම්ලය තියෙනවා ස්වාමිනි.

ප්‍ර: එවැනි දිර්ඝ කාලයක් තබා ගැනීම සඳහා නයිට්‍රික් ඇසිඩ් යම් කිසි නිශ්චිත උෂ්ණත්වයක තබා ගත යුතුද නැත්නම් කාමර උෂ්ණත්වයක තියා ගන්න පුළුවන්ද?

පි: නයිට්‍රික් ඇසිඩ් අම්ලය කාමර උෂ්ණත්වයක තියා ගන්න පුළුවන්.

ප්‍ර; හරි ඊට පස්සේ ප්‍රශ්න අහන්නේ දැන් ඔබ කියපු පරිදි යූරියා සහ නයිට්‍රික් ඇසිඩ් අම්ලය භාවිතා කිරීමෙන් යූරියා නයිට්‍රේට් හැදුවායින් පස්සේ සම්බන්ධයෙන් යම් කිසි ප්‍රශ්න වගයක් ඒ විදියට යූරියා නයිට්‍රේට් සෑදීමෙන් පසු කොපමණ කාල සීමාවක් මෙහි ඒ විදියට තියා ගන්න පුළුවන්ද ඒ කියන්නේ පුපුරනද්‍රව්‍යයක් ලෙස භාවිතා කිරීම සඳහා කොපමණ කාලයක් තියා ගන්න පුළුවන්ද?

පි: ස්වාමිනි මට ඒක නිශ්චිතව කියන්න බැහැ නමුත් මම විශ්වාස කරනවා ඒ යූරියා නයිට්‍රේට් කියන එක හැදුවාට පස්සේ ඒක එච්චර ස්ථාවර සංයෝගයක් නෙමේ steady නෑ stable . නැහැ ඒ නිසා වැඩිකාලයක් තියා ගන්න බැහැ කියන මතය තමයි මම ඉන්නේ ස්වාමිනි. මොකද අපි දන්නවා ටි.එන්.ටි. ආර්.ඩි.එක්ස් ප්ලාස්ටික් වැනි පුපුරන ද්‍රව්‍ය ඒවා ඕන කාලයක් තියා ගන්න පුළුවන්.මොකද පොලව යට වලලා තියන්න පුළුවන් අවුරුදු ගාණක් නමුත් මේ යූරියා නයිට්‍රේට් කියන එක අපි දැකලා තියෙනවා බොහොම. fragile ඒ කියන්නේ වැඩි කාලයක් තියා ගන්න බැහැ කියන මතයේ තමයි මම ඉන්නේ ලොකු අත්දැකීම් නම් මට නැහැ මට හිතෙනවා ඒ සංයෝගය යූරියා නයිට්‍රේට් නැමැති නිෂ්පාදනය කළ සංයෝගය වැඩිකාලයක් තියා ගන්න බැහැ කියන මතය තමයි මම ඉන්නේ ස්වාමිනි. මට ඒක පිළිබඳ නිශ්චිතව විද්‍යාත්මක මතයක් ප්‍රකාශ කරන්න බැහැ. නමුත් මම හිතනවා ඒ සංයෝගයේ ස්වභාවය අනුව මොකද ඒක අපි හදන්නේ නිකම් යූරියා නයිට්‍රේට් කලවම් කිරීමෙන් විතරනේ ලොකු chemical Reaction එකක් කරන්නේ නැහැ. මේක නිකම් මේ දෙක මික්ස් කරලා සෙන්ග්‍රේට් අංශක බින්දුවේදී හැදුවාට පස්සේ ඒක එච්චර ස්ථාවරයි කියලා හිත්න් අමාරුයි. වැඩි කාලයක් තියා ගන්න පුළුවන් කියලා හිතා ගන්න අමාරුයි ස්වාමිනි. ඔන්නම් මාස කීපයක් වගේ තියේ කියලා හිතනවා මොකද මේ තෙතමනය උරා ගන්

FAIR COMMENT BY JEZEEM

නැති සීල් ටයිප් ස්ථානයක තිබ්බොත් එහෙම ප්‍රිජ් එකේ වගේ දාලා තිබ්බොත් එහෙම වැඩිකාලයක් තියා ගන්න පුළුවන් නැත්නම් මම හිතන් නෑ වැඩිකායලක් තියා ගන්න පුළුවන් කියලා.

ප්‍ර; එතකොට ඔබ කියන හැටියට ඒක යූරියා නයිට්‍රේට් හැදුවාම පස්සේ ශීතරකරණයක තිබ්බොත් තමා හුගක් කල් පාවිච්චි කරන්නේ?

පි: ශීතරකණයක නැතිව හුගක් කල් පාවිච්චි කරන්න පුළුවන් ස්වාමිනි.

ප්‍ර; ශීතරකණයක් නොමැතිව කාමරය උෂ්නත්වය කොපමණ කාලයක් තියේද කියලා ඔබ විශේෂඥ දැනුමක් නැද්ද?

පි: මං හිතන්නේ ස්වාමිනි අවුරද්දක් නම් දෙකක් නම් තියා ගන්න බැහැ ස්වාමිනි. මට හිතෙන විදියට.

ප්‍ර: නමුත් ඔබ කිව්වා Ice වල තිබ්බොත් වැඩි කාලයක් තියා ගන්න පුළුවන් කියලා?

පි: ස්වාමිනි Ice අවශ්‍ය වෙන්නේ එය නිෂ්පාදනය කර ගන්න.

ප්‍ර: නැහැ නිෂ්පාදනය කෙරුවායින් පස්සෙත් අයිස්වල තියා ගන්න පුළුවන්ද?

පි: සමහර විට තියා ගන්න පුළුවන් වෙයි.

ප්‍ර: දැන් ඔබ කිව්වා යූරියා නියට්‍රේට් නිෂ්පාදනය කෙරුවායින් පස්සේ ඔබ කිව්වා සුදු පාට කැට වගේ ද්‍රව්‍යයක් තමයි තියෙන්නේ කියලා? එම කැට සහිත ද්‍රව්‍යය ඔබ මීට කලිනුත් කිව්වා මට පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය ද ඒක ඔබ විස්තර කරපු හැටියට පිපිරුම් ද්‍රව්‍යයක් වශයෙන් සඳහන් වනනේ නැත්නම් යම් කිසි ඩෙටර්නේටර් වැනි යම් ක්‍රමවේදයක් භාවිතා කිරීමෙන් ද එය පුපුරන ද්‍රව්‍යක් බවට පත්වෙන්නේ?

පි: ස්වාමිනි යූරියා නයිට්‍රේට් කියන එක අපි සලකන්නේ අදි බල පුපුරන ද්‍රව්‍යයක් හැටියට explosive එතකොට ඕනෑම high explosive එකක් පුපුරවන්න ඩෙටර්නේටරයක් අවශ්‍ය වෙනවා.ඒ සමාන්‍යයෙන් අපි මේ පුපුරන ද්‍රව්‍ය ඇක්ටිවේට් කරන්නේ ශක්‍රිය කරන්නේ එක්කෝ ගින්දරින් එහෙම නැත්නම් ඩෙටර්නේටරින් එතකොට අදි බල පුපුරන ද්‍රව්‍යයක් වන යූරියා නයිට්‍රේට් අපිට ගින්දර වලින් පුපුරන්න බැහැ. ඒකට අපිට අවශ්‍ය වෙනවා ඩෙටර්නේටර්යක් ඩෙටනේටරයක් සම්බන්ධ කරලා ඩෙටර්නේටර්යට අවශ්‍ය බලය ලබා දීමෙන් ඩෙටර්නේටර් පුපුරා යනවා එතකොට ඒ ඩෙටර්නේටර්යට පුපුරා යාමෙන් ඇතිවන කම්පනය තමයි යූරියා නයිට්‍රේට් පුපුරා යන්නේ.

පි: දැන් ඔබ පැහැදිලි කරපු ඩෙටර්නේටර් පුපුරා යැවීමෙන් ක්‍රියාවලිය කොහොමද කරන්නේ ?

පි: ස්වාමිනි ඒකට ක්‍රමවේද දෙකක් තියෙනවා එකක් තමයි විදුලි ඩෙටර්නේටර් වර්ග දෙකක් තියෙනවා එකක් තමයි විදුලි ඩෙටර්නේටරය අපි ඒකට ඉලට්‍රික් ඩෙටර්නේටරය කියනවා සර් ඉලෙක්ට්‍රික් ඩෙටර්නේටරයකට ඒකට පුපුරන්න බැට්‍රියකින් විදුලි දාරාවක් සපයන්න ඕනේ.එතකොට එවැනි ඉලෙක්ට්‍රික් ඩෙටනේටරයක් භාවිතා කරොත් එතන අපිට අවශ්‍ය වෙනවා ඉලෙක්ට්‍රික් සර්කිට් එකක්

FAIR COMMENT BY JEZEEM

තියෙන්න ඕනේ ඉලෙක්ට්‍රික් සර්කිට් එකක් තියෙන්න ඕනේ එහෙම නැත්නම් බැටරියක් තියෙන්න ඕනේ ස්විචයක තියෙන්න ඕනේ.ඉලෙක්ට්‍රික් වයර් තියෙන්න ඕනේ. ඒ ඉලෙක්ට්‍රික් ඩෙටර්නේටරයක් නමුත් ඉලෙක්ට්‍රික් නොවන ඩෙටර්නේටර්ස් එකට කියනවා සරල ඩෙටර්නේටරින් නැත්නම් ප්ලේන් ඩෙටර්නේටර් ප්ලේන් ඩෙටර්නේටර් අපිට පුළුවන් ගින්දරින් පුපුරවන්න.ප්ලේන් ඩෙටර් නේටර් එකට අපිට පුළුවන් ගිනිකුරක් ගහලා පුපුරවන්න පුළුවන්.

ප්‍ර: දැන් ඔබ කියපු ක්‍රම දෙකෙන් ඉලෙක්ට්‍රික් ඩෙටර්නේටර් නිකම් ප්ලේන් ඩෙටර්නේටර් එකේ පලවෙනි ක්‍රමවේදය ගැන තමයි මම ඔබෙන් යම් ප්‍රශ්න වගයක් අහන්නේ ඒ ඉලෙක්ට්‍රික් ඩෙටනේටර් එකට ඔබ කිව්වා බැට්‍රි අවශයයි කියලා ?

පි: එහෙමයි එතකොට ඉලෙක්ට්‍රික් ඩෙටර්නෙටර් එකක් පාවිච්චි කරන්න පුළුවන් එකම ක්‍රමවේදය බැට්‍රි එකක් මගින්ද?

පි: අනිවාර්යෙන්ම.

ප්‍ර; වෙනත් ක්‍රම වේද නැහැ ?

පි; නැහැ ස්වාමිනි.

ප්‍ර; හරි එතකොට ඔබ කියපු ක්‍රමවේදය අනුව ඉලෙක්ට්‍රික් ඩෙටර්නේටර් එකක් ක්‍රියාත්මක කරන්නේ කොහොමද නැත්නම් වෙන යම් ක්‍රමවේදයකටද?

පි: ඉලෙක්ට්‍රික් ඩෙටර්නේටර්ය විද්‍යුත් පරිපථයකට සම්බන්ධ කරලා එතකොට ඒ පරිපථයේ ස්විචයක් තියෙනවා ස්විච් එක ඔන් කරලා පස්සේ තමයි පුපුරා යන්නේ .

ප්‍ර; හරි ස්විච් එකක් මාර්ගයෙන් තයමයි පුපුරා යන්නේ ස්විච් එකක් මාර්ගයෙන් තමයි ඩෙටර්නේටර් එකක් පුපුරා යන්නේ?

පි: ඒක තමයි සාමාන්‍ය ක්‍රමය ස්වාමිනි.

ප්‍ර; ඒක එකම ක්‍රමවේදය ඔබ දන්නා?

පි: ස්වාමිනි ස්විච් එකක් මාර්ගයෙන් පුපුරා ගන්න ස්වයං සාතක දැන් ස්විච් එක දැම්ම ගමන් පුපුරනවානේ එතකොට මගේ ගාව මේ ඩිවයිස් එක තියෙනවානේ මම ස්විච් එක දැම්මොත් එහෙම නම් ඒක එසැනින් පුපුරා යනවා එතකොට ඒක ස්වයං සතක වෙනවා.එහෙම නැතිව පුපුරවන්න නම් ඒ සර්කිට් එකට කාල ප්‍රමාදයක් දාන්න ඕනේ අපි කියනවා ටයිම් ඩිලර් එකක් ස්විච් එක දාලා යම් කිසි ටයිම් ඩිල එකකින් පුපුරන්නත් පුළුවන් එහෙම නැත්නම් පුළුවන් රිමෝට් කොන්ට්‍රෝල් එකකින් දුස්ථපාලකයකින් පුපුරන්නත් පුළුවන්. පිපිරූ උපක්‍රමය මෙතන තියලා එකේ ඩෙටර් නේටරය සම්බන්ධව පරිපථයට දුරස්ථ පාලකයේ කොටසක් සම්බන්ධ කරනවා ඉතුරු කොටස ඒක ක්‍රියාත්මක කරන කොටසේ දුර ඉඳන් මේක ක්‍රියාත්මක කරන්නත් පුළුවන්.

ප්‍ර: දැන් ඔබ කියපු විස්තර වලට අනුව මට පොඩ්ඩක් පැහැදිලි කරන්න යම් අවස්ථාවක අර ස්විච්ච එකක් මගින් අර ඩෙටර්නේටර් එකක් පිපිරිවිමේදී

FAIR COMMENT BY JEZEEM

එය අක්‍රිය වෙන්න නිවැරදිව ක්‍රියා නොකරන්න අවස්ථා කීයක් තියෙනවාද මොනවාද ඒ අවස්ථා?

පි: සමහර විට ඒ ඩෙටර්නේටර්ය හොඳ තත්ත්වයට හිටින්න පුළුවන් එහෙම වුනොත් පුපුරා යන්න ඉඩ තියෙනවා. එහෙම නැත්නම් ඒ පරිපථය දෝෂයන් වෙන්නත් පුළුවන් පරිපරථ දෝෂයක් එහෙම නැත්නම් ඒ විදුලි කෝෂය එහෙම නැත්නම් බැටරියේ කෙලවරවල් හරියට සම්බන්ධ වෙලා නැතිවෙන්නත් පුළුවන්.ඒ වගේම සමහරවිට ඒ ඩෙටර්නේටර්ය සහ පුපුරන ද්‍රව්‍යය දෙකම එකට සම්බන්ධා ඇතිවෙන්නත් පුළුවන් හැබැයි එතකොට ඩෙටර්නේටරය පමණක් පුපුරා යන්නත් පුළුවන් ඩෙටර් නේටරය විතරක් පුපුරා යන්නත් පුළුවන් . පුපුරා නොයන්නත් ඉඩ තියෙනවා එවැනි අවස්ථා කීපයක් තියෙන්න පුළුවන් ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබ කියන විදියට ඔය යූරියා නයිට්‍රේට් සෑදීමෙන් පසු මේ මං ප්‍රශ්නය අහන්නේ දැනටමත් කොමිෂන් සභාවේ ඉදිරියේ මෙහෙයවා ඇති සාක්ෂි පදනම් කර ගෙන කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි මෙහෙයවලා තබෙනවා යම් කිසි පුපුරන ද්‍රව්‍යයක් නැත් ද්‍රව්‍යයක් විය හැකි දෙයක් කොළඹ සිට මඩකලපුව වෙත මගී ප්‍රවාහන බස් රථයක බෑග් දමන ස්ථානයක දමා ගෙන ගියා කියන සාක්ෂියත් කොමිෂමට ඉදිරිපත් වෙලා තියෙනවා. ඔබගේ විශේෂඥ දැනුම අනුව යූරියා නයිට්‍රේට් ඒ විදියට මේ ප්‍රවාහනය කිරීමට හැකියාව තියෙනවා?

ප්‍ර: එවැනි ප්‍රවාහන කිරීමේදී පුපුරා යාමක් සිදුවෙන්නේ නැහැ ස්වාමිනි.

ප්‍ර; පුපුරා යාමක් සිදුවෙන්නේ නැහැ.

පි; සමහර ඩෙටර්නේටර් සම්බන්ධ කරලා තිබ්බත් එහෙම පුපුරා යාමේ හැකියාවක් නැහැ ස්වාමිනි.

ප්‍ර: යම් කිසි අවස්ථාවක ඩෙටනේටරයක් මගින් පුපුරා හැරීම සඳහා සකස් කරලා යූරියා නයිට්‍රේට් ප්‍රමාණය ස්වයං ඝාතකයාට අවශ්‍ය වූ වෙලාවට එය පුපුරන්නේ නැහැ. නමුත් ඊට පහු කාලයක පැය.04 ක් පහක් විතර ගියාට පස්සේ එය පිපිරිමක් වෙන්න පුළුවන්ද?

පි: වෙන්න පුළුවන් නම් එතකොට එයින් ඔබගේ විශේෂඥ දැනුම අනුව අර පළවෙනි අවස්ථාවේදී පුපුරා ගැනීමට නොහැකි වුනේ මොකක් හින්දද?

පි: ස්වාමිනි ගොඩාක් වෙලාවට වෙන්න පුළුවන් ඒ ඩෙටර්නේටර්යේ තත්ත්වය බාල වෙන්නත් පුළුවන්.එහෙම නැත්නම් ඒ පරිපථයේ දෝෂයක් වෙන්නත් පුළුවන් ඒ වගේම ඩෙටර් නේටරය අතර සමීප සම්බන්ධයක් නැතිවෙන්නත් පුළුවන්.දැන් එහෙම වුනාම ඩෙටර්නේටරය පුපුරා යන්න ඕනේ. දැන් ඔය විදියට ඩෙටරනේටරය පුපුරා ගියත් යම් කිසි ශබ්දයක් ඇහෙනවා.ඩෙටර්නේටරය පුපුරා ගියා නම් අනිවාර්යෙන්ම ඒ සමඟ අදි බල පුපුරන ද්‍රව්‍ය පුපුරා යනවා. මට හිතෙන විදියට බොහෝ වෙලාවට පරිපථයේ දෝෂයක් වෙන්න පුළුවන්.

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු විනිසුරු සුනිල් රාපක්ෂ මැතිතුමා</u>

ප්‍ර; බැටරියේ දෝෂයක් තිබ්බත් වෙන්න පුළුවන්ද?

පි: එහෙමයි ස්වාමිනි. එතකොට බැටරියේ කොහොමහරි මම පරිපථයකින් කියලා මම අදහස් කලේ පරිපථය සම්බන්ධ කර දෝෂයක් එහෙම නැත්නම් බැටරියේ හරියට සම්බන්ධ වෙලා නැත්නම් ඒ වගේ දෝෂයක් වෙන්න පුළුවන්.

ප්‍ර; ඔය වගේ අවස්ථාවක ඔය වගේ බ්‍රැට්‍රියක් ගෙනත්ලා සවිකරලා ඒකත් ක්‍රියාත්මක කරන්න පුළුවන්ද?

පි: සමහර විට පරිපථයට යථා තත්ත්වයට පත් කරලා එහෙම නැත්නම් ඒ බැටරිය ප්‍රමාණවත් විදියට එකේ බලය නැත්නම් වෙන බැට්‍රියක් දැමීමෙන් පුපුරා යාමේ හැකියාවක් තියෙනවා.

ප්‍ර: නැවත බැක්ට්‍රියක් දාලා ක්‍රියාත්මක කරන්න පුළුවන්?

පි: බැට්‍රියේ දෝෂයක් නම් ඒ විදියට කරන්න පුළුවන්.

ප්‍ර: කාමරයක් වගේ දුර ස්ථානයක පුද්ගලයෙක් ළඟ ඉන්න පුද්ගලයෙක් දුරස්ථ පාලකයකින් පිටත ඉදන් පිපිරීමේ හැකියාවක් තියෙනවාද?

පි; පුළුවන් ස්වාමිනි දුරස්ථ පාලකයක වර්ගය අනුව ඒ රේඩියෝ තරංග මගින් නම් මීටර් සියක් වුනත් ඈත ඉදන් පිපිරීමේ හැකියාව තියෙනවා.

ප්‍ර; දැන් බිත්තිවලින් අවාරණය වී ?

පි: නෑ රෙඩියෝ තරංග බිත්තිය හරහා පසාරු කරගෙන යනවා ස්වාමිනි.

ප්‍ර; පසාරු කරගෙන යනවා?

පි: ඔව් පසාරු කරගෙන යනවා. ඒකට රේඩියෝ තරංග සහිත ට්‍රාන්ස්මීටරයක් සහිත සහ රිසිවරයක් ට්‍රාන්ස්මීටරයක් සහ රිසිවරයක් ඒ මෙතන පුපුරපුන උපක්‍රමයට සවිකරලා තිබ්බොත් දුරස්ථපාලකයට පිපිරීමේ හැකියාව තියෙනවා.

ප්‍ර: ඒ කියන්නේ කාමරයක් තුල ඉන්න පුද්ගලයෙක් ලඟ ඉන්න තියෙන පුපුරන ද්‍රව්‍ය වුනත් දුරස්ථ පාලකයකින් ?

පි: පුළුවන් ස්වාමිනි.හැකියාව තියෙනවා ස්වාමිනි.

****

<u>ගරු විනිසුරු බන්දුල අතපත්තු මැතිතුමා</u>

ප්‍ර: වැලිඅංග මහත්මයා දැන් මේ බෝම්බයක් පුපුරපු අවස්ථාවේ දී එතන vacuum එකක් හට ගන්නවාද?

පි ස්වාමිනි මෙහෙමයි බෝම්බයක් පුපුරන ගමන් බෝම්බයකදී ඉතා කෙටිකාලය තුල අදික වායුප්‍රමාණයක් ඇතිවෙනවා. අදික වායු ප්‍රමාණයක් ඇතිවෙලා මේ මොකද්ද මේ ඇතිවෙන කම්පන තරංග සමඟ ඇතිවෙන වායු ප්‍රමාණය ක්ෂනිකව ඇත්වෙනවා ක්ෂනිකව ඇත් වුනාට පස්සේ ඒ බෝම්බ පුපුරපු පරීශ්‍රය වායුරහිත වෙනවා.

ප්‍ර; දැන් එතකොට සාමාන්‍යයෙන් පුද්ගලික මේ මස් කැබලි එහෙම ගැලවිලා යන්නේ ඒ අවස්ථාවේදීද?

FAIR COMMENT — BY JEZEEM

පි: මස් කැබලි ගැලවෙන්නේ කම්පන තරංගවලින් කම්පන තරංග වැදුනාට පස්සේ කම්පන තරංගවලට මේවා කැඩිලා යන්න පුළුවන්. ඒකොහොම හරි අර කම්පන තරංගවලින් තමයි අර සියළුම ශරීර කොටස් කැඩීම සිදුවන්නේ.පිළිස්සීම් ලකුණු ඇතිවෙනවා තාපය නිසා කම්පන තරංග වලින් ශරීර කොටස් කැඩිලා යනවා.ඊට අමතරව කැබලි කැඩිලා ශරීරය පාසරු කරගෙන යන්න පුළුවන් ඔය අවස්ථාවේදී තමයි ප්‍රධාන වශයෙන් තියෙන්නේ.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර; ස්වයං ඝාතක බෝම්බකරුවන් දෙදෙනෙක් එක ගොඩනැගිල්ලක සිටින අවස්ථාවක එක් බෝම්බයක් පිපිරූ අවස්ථාවකදී කොච්චර දුරින් ඊට අයත් දුර ප්‍රමාණයක් කිට්ටුව හිටියොත් ඔහුව අනිත් බෝම්බයත් පුපුරා යනවාද?

පි: එහෙම හැකියාවක් තිබෙනවා පුපුරන ද්‍රව්‍ය වර්ගය අනුව ස්වාමිනි.නමුත් ගොඩාක් ලඟ හිටියොත් තමා ඒක වෙන්නේ එකේම පළවෙනි පිපිරුම ඇතිවෙන කම්පන වලින් දෙවන බෝම්බය පුපුරා යාමට ඉඩක්තියෙනවා.ඒක රදා පවතිනවා ඒ පුපුරන ද්‍රව්‍ය රදා පවතින වර්ගය අනුවත් පළවෙනි බෝම්බය පිපිරීමේ ප්‍රභලත්වය අනුවත් එහෙම හරියටම නිශ්චිතව කියන්න බැහැ දුරක් ප්‍රමාණයක් නමුත් එහෙම හැකියාවක් තියෙනවා.

ප්‍ර: ඇතින් හිටියොත්?

පි: ගොඩාක් ඇතීන් හිටියොත් පුපුරා යාමේ හැකියාක් නැහැ ගොඩාක් වෙලාවට. ඒ පළවෙනි බෝම්බේ තියෙන කම්පනය තියෙන කම්පන තරංග අනුව අපි කියමු පළවෙනි බෝමබේ කිලෝ 100 ක් විතර පිපිරුවොත් එහෙම ටිකක් ඇතින් හිටියත් සමහර විට කම්පන තරංගවලින් අනිත් බෝම්බ පුපරා යාමේ හැකියාව තියෙනවා. ඒක රදා පවතිනවා පළවෙනි බෝම්බය පිපිරීමේදී ඒ පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණය මත. ඒ වගේම පුපුරන ද්‍රව්‍ය වර්ගය මත සමහර වෙලාවට මේ යූරියා නයිට්‍රේට් ගැන මම හරියටම කියන්න දන්නේ නැහැ ස්වාමිනි. තාම අලුත් පුපුරන ද්‍රව්‍යයක් නිසා ඒවා සාමාන්‍යයෙන් හරිම ස්ථායි සංයෝගය කියලා අපි කියන්නේ එහෙම ලේසියෙන් පුපුරන්නේ නැහැ. ඒවා ඇත්තටම.

****

<u>ගරු අදිකාරි මැතිණිය</u>

ප්‍ර: මිස්ටර් වැලිඅංග මෙතුමාගේ ප්‍රශ්නයේ කොටසක් ඒවගේ බෝම්බ දෙකක් පළවෙනි බෝම්බය පුපුරා යාමෙන් පසුව දෙවනි බෝම්බයත් පුපුරා යන්න පුළුන් අවස්ථාවක් තිබෙන බව ප්‍රකාශ කළානේ කොතරම් කාල පරාසයක් තුලද එවැනි බෝම්බයක් පුපුරා යා හැක්කේ ?

Parliament Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පි; ස්වාමිනි ඒ දෙකම එක වර පුපුරන්න ඕනේ ස්වාමිනි කාල පාරසයක් නැහැ ස්වාමිනි එතකොට කාලපාරසයක් ඇහෙන්නේ නැහැ අපිට තප්පරයකින් සමහර විට දාහෙන් එකක් වෙන්න පුළුවන් එතකොට අපිට ඇහෙන්නේ එක ශබ්දයක් වගේ නමුත් බෝම්බ පිපිරීම් දෙකක් වෙලා තියෙනවා.කාලයක් නැහැ ඒකට මොකද ඒ කම්පන තරංගවල වේගය තත්පරයකට මීටර් 800 ක් විතර වෙනවා. එතකොට අපිට තෙරෙන්නේ නැහැ ඒවායේ දෙකක් පිපිරුවා නම් මේ මේ බෝම්බ දෙකක් පිපිරුවා කියලා තේරේන්නේ අපරාධ ස්ථාන විමර්ශනයට පමණයි නැත්නම් අපිට පේන්නේ එක ශබ්දයයි ඇහෙන්නේ කාල පරාසයක් නැහැ එතකොට අපි ඒකට කියනවා Sympathetic Detonation ඉංග්‍රිසියෙන් කියන්නේ ඒ sympathetic Detonation.එකේදී කාල පරාශයක් නැහැ.

ප්‍ර: එහෙම කාලපාරාශයකදී එක ස්ථානයක තිබිච්ච ආසන්න ස්ථානයක තිබිච්ච බෝම්බ දෙකක් පුපුරා තිබෙනවා නම් ඔවුන් ඔබගේ නිරීක්ෂනය කුමකක්ද ඒ පිළිබඳව?

පි: එහෙම නම් මැඩම් ඒ දෙක අවස්ථා දෙකක දී තමා ඇක්ටිවේට් කරලා තියෙන්නේ .

ප්‍ර; වෙන වෙනම?

පි: වෙන වෙනම ක්‍රියාත්මක කරලා තියෙන්නේ.

දැන්වේලාව ප.ව.2.00

මෙතැන් සිට සටහන් ගැනීම ල/ලේ ඉන්ද්‍රානි මහත්මිය

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් කළේ චන්දිමා මෙය
දැන් වේලාව : ප.ව. 2.00 යි
මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා :

ප්‍ර : වැලිඇංග මහත්මයා, ඔබ අප්‍රේල් 21 වෙනිදා බෝම්බ පිපිරූ ස්ථාන නිරීක්ෂණය කරන්න ඇතිනේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබ ෂැන්ග්‍රිලා බෝම්බය බලන්න ගියා?

පි : එහෙමයි.

ප්‍ර : ඒ පුපුරපු ස්ථානය බලන්න ගියා නේද?

පි : ගියා ස්වාමීනි.

ප්‍ර : දැන් එතන ඔබ නිරීක්ෂණය කරපු ආකාරයට ඔබ නියැදි ලබා ගන්න ඇතිනේ?

පි : එහෙමයි.

ප්‍ර : ඔබට වැටහුණාද මේ යූරියා සහ වෙනත් රසායනික ද්‍රව්‍ය එතන තිබුණා කියලා?

පි : මොකද ස්වාමීනි අපි එතනින් බෝම්බයේ කොටස් සහ සුන් බුන් විද්‍යාගාරයට අරන් ගිහිල්ලා පරීක්ෂාවකට ලක් කරා. ඒවායින් තමයි අපිට තේරුණේ මෙතන තියෙනවා කියලා යූරියා නයිට්‍රේට්වල පුපුරා ගිය ශේෂ සොයා ගන්න පුළුවන් වුණා අපිට.

ප්‍ර : එතකොට ඒ ඇරෙන්න වෙනත් රසායන ද්‍රව්‍ය ඔබ සොයා ගත්ත දේවල් මොනවද තිබුණේ?

පි : විශේෂයෙන්ම බෝම්බයක් පුපුරා ගිය ස්ථානයකදී අපි විශ්ලේෂණය කරන්නේ පුපුරණ ද්‍රව්‍ය සඳහා තමයි. ඉතිං වෙනත් පුපුරණ ද්‍රව්‍යයක් අපිට එතනදී හමු වුණේ නැහැ ස්වාමීනි. යූරියා නයිට්‍රේට්වලට තමයි අපිට ප්‍රතිඵල ලැබුණේ.

ප්‍ර : ඔබ එතකොට අනිත් හෝටල්වලටත් ගියාද?

පි : සෑම ස්ථානයකින්ම එවැනි සාම්පල් අපි ලබාගෙන ආවා. හැම ස්ථානයකින්ම අපිට සොයා ගන්න ලැබුණේ යූරියා සහ නයිට්‍රේට් යොදාගෙන භාවිතා කරන ලද යූරියා නයිට්‍රේට්වල පිපිරුණු ශේෂ තමයි සොයා ගන්න පුළුවන් වුණේ අපිට.

ප්‍ර : දේවස්ථානවලත් එහෙමයි?

පි : දේවස්ථානවලත් එහෙමයි.

ප්‍ර : එතකොට ඔබට කියන්න පුළුවන්ද ඒ සොයා ගත්ත නියැදිවලින් මේ යූරියාවල හරි නැත්නම් ඒ පාවිච්චි කරලා තිබිච්ච රසායන

Parliament Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ද්‍රව්‍යවල වයස කොච්චරක් වෙයිද කියලා. ඒ කියන්නේ මේවා කොච්චර පරණ දේවල්ද කියන එක ඔබට මතයක් ප්‍රකාශ කරන්න පුළුවන්ද?

පි : එහෙම කියන්න අපහසුයි ස්වාමීනි. අපිට කියන්න පුළුවන් භාවිතා කරලා තියෙන පුපුරණ ද්‍රව්‍ය මොකද්ද කියන එක පමණයි.

බොහොම ස්තුතියි.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : මේ භාවිතා කරලා තිබ්බ සියළුම තැන්වල එක සමාන පුපුරණ ද්‍රව්‍ය විශේෂයක්ද?

පි : ප්‍රමාණය ගැන නම් කියන්න අමාරුයි ස්වාමීනි.

ප්‍ර : ප්‍රමාණය කියන්නේ එක සමාන ද්‍රව්‍යවලින් හදන ලද පුපුරණ ද්‍රව්‍යයද?

පි : යූරියා නයිට්‍රේට් කියලා තමයි ස්වාමීනි අපිට තොරතුරු ලැබුණේ. ඒ කියන්නේ අපේ විශ්ලේෂණ ප්‍රතිඵල අපට පෙන්නුම් කළේ යූරියා නයිට්‍රේට් භාවිතා කළා කියලා.

ප්‍ර : හැම එකේම. හැම පිපිරීමක් මගින්ම?

පි : හැබැයි මම හිතන්නේ අර අවසාන වශයෙන් පිපිරීමක් සිදු වුණා සයින්දමර්දුවල. එතනදී භාවිතා කරලා තිබ්බේ යූරියා නයිට්‍රේට් නෙමෙයි ස්වාමීනි. එතන වෙන පුපුරණ ද්‍රව්‍ය වර්ගයක්.

ප්‍ර : මොකද්ද ඒ?

පි : වෝටර් ජෙල්, වෝටර් ජෙල් කියන පුපුරණ ද්‍රව්‍ය තමයි එතන භාවිතා කරලා තිබුණේ.

ප්‍ර : ඒ වෙනස මොකද්ද?

පි : වෝටර් ජෙල් කියන එක සම්මත ගල් බෝර දැමීම සඳහා භාවිතා කරන දේශීය නිෂ්පාදනයට භාවිතා කරන පුපුරණ ද්‍රව්‍ය වර්ගයක්. ඒක තමයි භාවිතා කරලා තියෙන්නේ.

****

ගරු අදිකාරී මැතිණිය :

ප්‍ර : මිස්ට වැලිඅංග ඒ වෝටර් ජෙල් කියන එක තහනම් ධීවර කර්මාන්තය කරනකොටත් පුපුරණ ද්‍රව්‍යයක් හැටියට භාවිතා කරනවද?

පි : ගොඩක් වෙලාවට නීති විරෝධී ලෙස මසුන් මැරීම සඳහා ඒ වෝටර් ජෙල්, මොකද ඒක විශේෂයෙන්ම මේ ගල් බෝර දාන ස්ථානවල නිකුත් කරනවා. ඒ ගල් බෝර දාන ක්‍රියාවලිය සඳහා.

Present Speaker's Copy
FAIR COMMENT BY JEZEEM

ඒ වගේ තැන්වලින් සොරකම් කරගෙන හරි කොහොම හරි අරගෙන නීති විරෝධී ලෙස මත්ස්‍ය මැරීම සඳහා භාවිතා කරනවා. ඒකටත් අවශ්‍ය වෙනවා ඩෙටනේටරයක්.

ප : ධීවර කටයුතු කරන අය ළඟත් තියෙන්න පුළුවන් නේද?

පි : නීති විරෝධී ධීවර කටයුතු සඳහා තියෙන්න පුළුවන්.

****

ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා :

ප : යූරියා නයිට්‍රේට්වලට වඩා වෝටර් ජෙල් ප්‍රබලද?

පි : මම හිතන්නේ වෝටර් ජෙල් ඊට වඩා අඩුයි ප්‍රබලත්වය. මොකද වෝටර් ජෙල් කියන එක නිෂ්පාදනය කරලා තියා ගන්න පුළුවන්. ඔය යූරියා නයිට්‍රේට් මම හිතන්නේ වැඩි කාලයක් තියා ගන්න පුළුවන් කියලා. ඒවා ඇත්තටම ඒ වෙලාවේ හදන්න ඕන. තමන්ට අවශ්‍ය නම් තමන් හදා ගන්නවා. මේ වෝටර් ජෙල් කියන එක නිෂ්පාදනය කරලා මිනිස්සුන්ට නිකුත් කරනවා ඒ සංවර්ධන කටයුතු සඳහා.

****

ගරු සභාපතිතුමා :

ප : සාක්ෂිකරු, මිස්ට වැලිඅංග මේක බලන්න. හරියට පෙනුණේ නැද්ද මිස්ට වැලිඅංග?

පි : පිටේ බැඳගෙන ඉන්නේ.

ප : ඔව්?

පි : දැක්කා.

ප : එයා එතන මේසයේ වාඩි වෙලා කරපු දේ දැක්කද? ඒක ලැහැස්ති කරනකම් තව එක ප්‍රශ්නයක් තියෙනවා ඔබෙන් අහන්න. යූරියා සහ නයිට්‍රේට් ඇසිඩ් ලංකාව තුළ සුලබව මිලදී ගැනීමට හැකිද? එක කොටසක්. එම ද්‍රව්‍ය ලංකාවට ආනයනය කිරීම සඳහා බලපත්‍ර අවශ්‍යද? අර මම ඉස්සරලා අහපු ප්‍රශ්නයට ලංකාව තුළ සුලබව ගන්න පුළුවන් නම් කොයි වගේ ස්ථානවලද එය තියෙන්නේ? මේක මාධ්‍යයට කියනවා වාර්තා කරන්න එපා කියලා කොහෙන්ද ගන්නේ කියලා.

පි : ස්වාමීනි ඒ පිළිබඳව මට හරියටම නම් කියන්න බැහැ. නමුත් නයිට්‍රික් අම්ලය නම් සාමාන්‍යයෙන් රසායනික ද්‍රව්‍ය විකුණන වෙළඳසැල්වලින් ගන්න පුළුවන් අපිට. යූරියා කියන එකත් මම හිතන්නේ විශේෂයෙන්ම පොහොරක් ලෙස භාවිතා කරන නිසා යූරියා සුලභව ගන්න පුළුවන්. ඒක නිසා වෙන්න ඇති අර මම කලිනුත් කිව්වේ මේක Backyard explosive එකක් කියලා

FAIR COMMENT BY JEZEEM

කියන්නෙත් ඒක වෙන්න ඇති. ඕන කෙනෙකුට මේක අරගෙන නිෂ්පාදනය කරන්න පුළුවන්. ඒත් අර පිපිරීම සඳහා තාක්ෂණය අවශ්‍ය වෙනවා. ඩෙටනේටරයක් එහෙම නැත්නම් සමහරවිට අත් වැරදීමක් වෙලත් භයානක පිපිරීම් සිදුවෙන්න පුළුවන්. හරියට දන්නේ නැතුව කළොත් එහෙම. ඉතිං ඩෙටනේටරයක් අනිවාර්යයෙන්ම අවශ්‍ය වෙනවා. ඩෙටනේටරයක්, විදුලි පරිපථයක්. එහෙම නැතුව මේක මේ පිපිරීමක් ඇති කරන්න බැහැ.

ස්තුතියි.

****

ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා :

ප්‍ර : දැන් මහත්මයා නිරීක්ෂණය කළාද ඔතන පාවිච්චි කරලා තිබිච්ච ඩෙටනේටර් වර්ගය අර වනාතවිල්ලුවේ සොයා ගත්ත ඩෙටනේටර්මද කියලා කියන්න පුළුවන් සාධක?

පි : ස්වාමීනි ඒ පිපිරීමෙන් පස්සේ අපිට ඩෙටනේටර් කොටස් සම්පූර්ණයෙන් හොයා ගන්න හම්බ වෙන්නේ නැහැ සාමාන්‍යයෙන්. ඒ නිසා අපිට ඒ පිළිබඳ නිශ්චිත මතයක් ප්‍රකාශ කරන්න බැහැ.

ප්‍ර : ඔබ දැක්කද වනාතවිල්ලුවේ සොයා ගත්ත ඩෙටනේටර්?

පි : වාර්තාවක් ඇති ස්වාමීනි ඒකේ. මට මතක හැටියට ඒකේ තිබුණේ ගොඩක් වෙලාවට ඉලෙක්ට්‍රික් ඩෙටනේටර්ස් නෙමෙයි අනිත් ඒවා.

ප්‍ර : ආ Manual?

පි : ඉලෙක්ට්‍රික් නොවන ඩෙටනේටර්. එතකොට ඉලෙක්ට්‍රික් නොවන ඩෙටනේටර්ස් මේගොල්ලෝ ඉලෙක්ට්‍රික් බවට හරවලා තිබ්බා වෙන උපක්‍රමයක් භාවිතා කරලා.

ප්‍ර : ඒක කරන්නත් යම්කිසි දැනුමක් තියෙන්න ඕන?

පි : දැනුමක් තියෙන්න ඕන. ඒ කියන්නේ සාමාන්‍යයෙන් ඉලෙක්ට්‍රික් නොවන ඩෙටනේටරයක් පත්තු කිරීම සඳහා අපිට අවශ්‍ය වෙනවා සේවා නූලක්. සේවා නූලක් ඒ ඩෙටනේටරයට ඇතුල් කරලා සේවා නූල පත්තු කිරීමෙන් තමයි ඩෙටනේටරය පත්තු කරන්න ඕන. නමුත් මේගොල්ලෝ අපිට Evidence තියෙන්නේ, සාක්ෂි තියෙන්නේ ඒ සේවා නූල වෙනුවට විදුලි බල්බයක්, විදුලි බල්බයක් කියන්නේ කුඩා බල්බයක විදුලිය කඩලා අයින් කරලා ඒ විදුලි බල්බයේ කොටස අර ඩෙටනේටරය ඇතුළට ඇතුල් කරලා විදුලි බල්බයේ වයර් දෙක අරගෙන මේක පරිපථයට සම්බන්ධ කරනවා. එතකොට ස්විචය දැමීමේදී අර විදුලි බල්බයේ

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පිලමන්ට් එක දැල්වෙනවා. ඒ පිලමන්ට් එකෙන් අපිට පුළුවන් ඉලෙක්ට්‍රික් ඩෙටනේටර ක්‍රියාත්මක කරන්න. එහෙම තමයි දැනට Evidence තියෙන්නේ.

****

ගරු සභාපතිතුමා :

මාධ්‍යයෙන් ඒ විස්තර එහෙම දාන්න එපා. අහගෙන හිටියට කමක් නැහැ. ඒක ප්‍රසිද්ධ කරන්න එපා.

****

ගරු බන්දුල අතපත්තු මැතිතුමා :

ප්‍ර : දැන් වැලිඅංග මහත්මයා ඔක්සි අසිටලීන් කියලා සිලින්ඩර් පාවිච්චි කරන්නේ මොකටද?

පි : මගේ දැනුමේ හැටියට ස්වාමීනි, මම දන්න විදියට ලෝහ පෑස්සීම සහ වෙල්ඩින් සඳහා තමයි මම දන්න විදියට නම් පාවිච්චි කරන්නේ.

ප්‍ර : ඔබ කවදාවත් එවැනි සිලින්ඩරයක් පුපුරපු අවස්ථාවක් පරීක්ෂා කරන්න ගිහිල්ලා තියෙනවද?

පි : ඔක්සි ඇසිටලීන් එකක් නම් මම විමර්ශනය කරලා නැහැ ස්වාමීනි. නමුත් L.P. වායුව පිපිරීම් ස්ථාන කිහිපයක් බලලා තියෙනවා. එතනදී වෙලා තියෙන්නේ ඇත්තටම සිලින්ඩරය පුපුරා යාමක් නෙමෙයි. නමුත් මේ ගෑස්, L.P. ගෑස් වායුව පිටතට නිකුත් වෙලා. ඒ නිකුත් වෙච්ච වායුව පිපිරීමකට ලක් කිරීම තමයි පරීක්ෂා කරලා තියෙන්නේ.

****

ගරු අදිකාරී මැතිණිය :

ප්‍ර : වැලිඅංග මහත්මයා ඔක්සි ඇසිටලින් භාවිතා කරලා ස්වර්ණාභරන කර්මාන්තයේ කටයුතු කරන්න පුළුවන්ද? ස්වර්ණාභරන නිෂ්පාදනය කරනකොට?

පි : මම දැකලා තියෙනවා මැඩම් අන්තර්ජාලයේ ඔක්සි ඇසිටලින් වායුව භාවිතා කරලා තියෙනවා ස්වර්ණාභරන සඳහා. ඒක මම අත්දැකීමෙන් දැකලා තියෙනවා.

ප්‍ර : ස්වර්ණාභරන පෑස්සීම වගේ...?

පි : පෑස්සීම සහ උණු කිරීම සඳහා.

ප්‍ර : උණු කිරීම සඳහා?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : රත්තරන් උණු කිරීම සඳහා ඔක්සි ඇසිටලීන් වායුවෙන් ඇති කර ගන්නා ගිණි දැල්ල භාවිතා කරනවා අහලා තියෙනවා.

ප්‍ර : ඒ වගේ අවස්ථාවකදීත් මේ ටැංකිය පුපුරන්න පුළුවන්ද?

පි : සමහර අවස්ථාවලදී මේ ඔක්සි ඇසිටලීන් වායුව ඇති වෙන්න පුළුවන්. සමහර අවස්ථාවල අදාළ වන ආරක්ෂක උපාංග හරියට සවි කරලා තිබුණේ නැත්නම් ගෑස් සිලින්ඩරය පුපුරා යාමේ හැකියාවක් තියෙනවා. ඒවාට අපි කියනවා Flashback Arrestors කියලා. ඒ Flashback Arrestors තිබුණේ නැත්නම් සමහර අවස්ථාවල ඒක පාවිච්චි කරමින් සිටින අවස්ථාවලදී ගෑස් සිලින්ඩරය පුපුරා යාමේ හැකියාවක් තියෙනවා ඔක්සි ඇසිටලීන්.

ප්‍ර : සාමාන්‍යයෙන් මේ ස්වර්ණාභරන උණු කරන හෝ ඒ කර්මාන්තයේ නියැලී සිටින පුද්ගලයා සහ ඔක්සි ඇසිටලීන් සිලින්ඩරය අතර දුරස් ප්‍රමාණයක් තිබෙනවද?

පි : ඒකනම් මට කියන්න හරියටම නිශ්චිතව කියන්න අමාරුයි මැඩම්. නමුත් බොහෝ වෙලාවට ඒ සිලින්ඩරයෙන් ගන්න නලයකින් තමයි වායුව ලබා ගන්නේ. සමහරවිට මම දන්නේ නැහැ ඔය වෙල්ඩින් කරන්න ගන්න ඔක්සි ඇසිටලින් අර ලොකු සිලින්ඩර් භාවිතා කරන්නේ නැත්නම් ඊට වඩා කුඩා සිලින්ඩර් භාවිතා කරනවද. මොකද ස්වර්ණාභරන කියන්නේ ඉතාම සුළු ප්‍රමාණයක් නිසා සමහරවිට වෙනම යාන්ත්‍රණයක් භාවිතා කරනවද දන්නේ නැහැ අපි සාමාන්‍යයෙන් වෙල්ඩින් කරන්න භාවිතා කරන තරමේ අර අඩි පහේ සිලින්ඩර් භාවිතා කරනවද, එහෙම නැත්නම් ඉතා කුඩා ප්‍රමාණයේ සිලින්ඩර් භාවිතා කරනවද කියන්න පිළිබඳව මට දැනීමක් නැහැ මැඩම්.

ප්‍ර : එහෙම සිලින්ඩරය පුපුරා ගියා නම් එම කර්මාන්තයේ නියැලී සිටි පුද්ගලයා ළඟ, ආසන්නයක සිටියා වුණත් ඔහු අර සිලින්ඩරයේ කැබලිවල වැදිලා තුවාල වීමක් සිදුවිය යුතුයි නේද?

පි : තුවාල වෙන්නත් පුළුවන්. සමහරවිට ගිණි ගැනීමක් වුණත් ඇතිවීමට ඉඩ තියෙනවා.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : සාක්ෂිකරු ගෑස් සිලින්ඩරයක් පුපුරා ගියා නම්, ඒ ඔහුගේ ශරීරය දැවී පිච්චීමක් විද්‍යාමාන වෙනවා නේද මුළු ඇඟම පිච්චීමක් වගේ?

පි : ඔව්. මුළු ඇඟම පිච්චෙන්නත් පුළුවන්. ඒ වගේම සිලින්ඩරය පුපුරා ගියා නම් සිලින්ඩරයේ කැලි ඇගේ වදින්නත් පුළුවන්.

ප්‍ර : කැලි ඇගේ වදින්නත් පුළුවන්?

FAIR COMMENT BY JEZEEM

පි : වදින්නත් පුළුවන්. මොකද එතනදී ඇතිවන, තාපයෙන් ඇතිවන හානිය ඒ අවකාශය පුරාම බලපානවා.

****

ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා :

ප්‍ර : මහත්මයා ඔබට මතකද මහවිල උද්‍යානයේ බෝම්බය පිපිරූ තැන, නිවස?

පි : දෙමටගොඩ.

ප්‍ර : දෙමටගොඩ ඔව්?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔබ එතනට ගියා නේද?

පි : මමත් ගියා.

ප්‍ර : ඔබට මතකද එතන විශාල වළක් හැදිලා තිබුණා ඒ කොන්ක්‍රීට් එකේ?

පි : එහෙමයි.

ප්‍ර : එතකොට ඒ වළ දැක්කහම ඔබට හිතුණේ ඒ බෝම්බය බිමද පුපුරලා තිබුණේ?

පි : පොළොවට ආසන්නව. ගොඩක් වෙලාවට බිම වෙන්න ඕන ස්වාමීනි. පොළොව මතුපිට තමයි ඒ බෝම්බය තියෙන්න ඇත්තේ.

ප්‍ර : ඒ කාන්තාවගේ හිස ඔබ දැක්කද?

පි : හිසක් හරියට විශේෂයෙන්ම දකින්න තිබුණේ නැහැ අපි යන වෙලාවට නම්. නමුත් සුණු විසුණු වෙලා තිබ්බේ ශරීර කොටස්.

ප්‍ර : ඔබ දැක්කේ නැද්ද ඔය ඔළුව කැල්ල දැක්කේ නැද්ද ඔබ?

පි : ඔළුව කැල්ල මම හිතන්නේ මම අපරාධ ස්ථානයට යනවිට ඒක අයින් කරලා වෙන්න ඇති අධිකරණ වෛද්‍ය නිලධාරීතුමා.

ප්‍ර : මොකද ඒ ඔළුව කොටසේ තිබුණේ ඔළු කුහරය විතරයි ඉතුරු වෙලා තිබුණේ. එතකොට ඒ පිපිරීමේ ස්වභාවය අනුව ඒ කියන්නේ ශරීරය කඳ කොටස මොකුත්ම සොයා ගන්න, අඩුවෙන්ම සොයා ගන්න පුළුවන් විදියටයි. එතකොට මුහුණ කිට්ටුව පිපිරීමක් සිදු වෙච්ච බවක් තමයි හැඟුණේ. මොකද බෙල්ලෙන් උඩ කොටස සම්පූර්ණයෙන්ම මුළුමනින්ම විනාශ වෙලා තිබිච්ච නිසා. ඔබට ඒ සම්බන්ධයෙන් අදහසක් දෙන්න පුළුවන්ද ඒ තැනැත්තිය බෝම්බය පුපුරවා ගන්න ඇත්තේ කොයි ආකාරයෙන්ද කියලා?

පි : හැබැයි ස්වාමීනි අර පොළොවේ තිබ්බ බර සහ ඒ කාන්තාව විසින් පුපුරවා ගත්ත බෝම්බය කියන්නේ පිපරීම් දෙකක් එතන. එක

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පිපිරීමක් නෙමෙයි. පොළොවේ වල වෙන පිපිරීමක්. කාන්තාව විසින් පුපුරුවා ගත්ත බෝම්බය තවත් එකක්. සමහරවිට ඉතා ආසන්නයේ සාමාන්‍යයෙන් හිටගෙන ඉන්නැද්දී ඒක කියන්න අමාරුයි ඒක. එහෙම නැත්නම් ඒ පිපිරුම් ප්‍රමාණයේ, විශාල ප්‍රමාණයේ පිපිරුම් ද්‍රව්‍ය තිබුණද දන්නේ නැහැ ඒකේ. විශාල ප්‍රමාණයක් පුපුරණ ද්‍රව්‍ය අඩංගු කරලා ඒ බෝම්බය හදලා තිබ්බා නම් ශරීරයට ලොකු තුවාලයක් සිද්ධ වෙන්න පුළුවන්. සාමාන්‍යයෙන් අපි දැක්කේ අර හෝටල්වල සිදු වෙච්ච බෝම්බවලදී කඳ කොටසේ පිපිරුණ නිසා තමයි කකුල් දක්නට ලැබුණේ අපිට. කකුල් සහ බොහෝ වෙලාවට හිස දක්නට ලැබුණා. නමුත් අර කාන්තාවගේ එවැනි කොටස් දක්නට ලැබුණේ නැති නිසා සමහරවිට බිම ඉඳගෙන ඉදිද්දී, බිම ඉඳගෙන උකුලේ බෝම්බය තියාගෙන හිටියා වගේ යන මතය බැහැර කරන්න බැහැ ඒ වගේ අවස්ථාවල.

ප : එතකොට ඒ වගේ වෙලාවේදී ඒ කාමරයේම ටිකක් එහායින් අනෙක් බෝම්බය පිපිරුණේ නැත්තේ මොකද?

පි : සමහරවිට එහෙම අවස්ථාවක් වෙන්න පුළුවන්. පළවෙනි එකේදී මේ පිපිරීම නොවෙන්න ඉඩ තිබ්බා. එහෙම වෙන්න පුළුවන්. සමහරවිට පුපුරා යන්නත් පුළුවන්. නොවෙන්නත් පුළුවන්. ඒක හරියටම සියයට සීයක් කියන්න බැහැ මේ පිපිරීමෙන් අනෙක් බෝම්බය පුපුරනවාමද කියලා අපිට නිශ්චිතවම කියන්න බැහැ.

ප : එතකොට දෙවෙනි බෝම්බය කොයි ආකාරයට පිපිරෙන්න ඇත්ද? ඊට විනාඩි 12 කට විතර පස්සේ පුපුරලා තිබුණේ?

පි : ඒක සමහරවිට අපිට මත කිහිපයක් තියෙනවා බැහැර කරන්න බැරි. සමහරවිට දුරස්ථ පාලකයෙන් පුපුරවන්නත් පුළුවන් යම්කිසි කෙනෙක්. එහෙම නැත්නම් අර පළවෙනි බෝම්බයෙන් ඇති වෙච්ච ගිණි ජාලාව නිසා. ඒ රස්නය නිසා ඒ රත්වීමෙන් මේ බෝම්බය පුපුරා යන්නත් පුළුවන්. මොකද පළවෙනි බෝම්බය පිපිරීමත් සමඟ ගින්නත් ඇති වෙනවා. ඒ ගින්න නිසා රත්වීමේදී බෝම්බය පුපුරා යන්න පුළුවන් අධික උෂ්ණත්වයකදී.

බොහොම ස්තුතියි.

****

ජ්‍යෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා :

ප : C-510 සාක්ෂිකරු විසින් පරීක්ෂා කර බලන ලදී. මෙම C-510(j) හි බෑගයක් සමඟ වාඩි වී සිටින පුද්ගලයා යමක් කිරීමට උත්සාහ කරන බව ඔබ නිරීක්ෂණය කළාද?

පි : කළා ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබට ඒ ගැන මතයක් පළ කරන්න පුළුවන්ද වැලිඅංග මහත්මයා?

පි : පමණක් එතන දර්ශන නැහැ ස්වාමීනි. හරියටම මොකද්ද කළේ කියලා හරියටම නිශ්චිතවම කියන්න බැහැ. මට හිතෙනවා එයා පුපුරවා ගන්න යන්නේ නැහැ ඔතන. ඔතන පුපුරවා ගන්න ගියා නම් මොකද එයාට ඕන සමූහ ඝාතනයක් කරන්න නම් ඒ ජනතාව ඉන්න පැත්තට තමයි ඒ ලෝහ බෝල එල්ල කරන්න ඕන. ඉතිං එතන ඉඳගෙන කරානම් ගොඩක් වෙලාවට ඒවා යන්නේ බිමට. එහෙම නැත්නම් ලෝ ලෙවල් එකේ යන්නේ. අනිත් එක ලොකු ජනගහණයක් එතන හිටියෙත් නැති නිසා එතන පුපුරවා ගනියි කියලා හිතන්න අමාරුයි ගොඩක් වෙලාවට.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : ඔබ එතන කියලා සඳහන් කරන්නේ C පන්සිය....?

පි : අර ඉඳගෙන හිටපු තැන.

ප්‍ර : C-510(j) යන Video පටයේ එම තැනැත්තා මේසය ළඟ තියෙන පුටුවේ වාඩි වෙලා හිටියේ?

පි : වාඩිවෙලා හිටියේ.

ප්‍ර : ඒ අවස්ථාව ගැනයි ඔබ සඳහන් කරන්නේ?

පි : එහෙමයි ස්වාමීනි.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා :

ප්‍ර : යම් අවස්ථාවකදී ඔහු ඊට පෙර බෝම්බය පුපුරවා ගැනීමට උත්සාහ කර, එය ක්‍රියාත්මක නොවීම නිසා නැවත පරීක්ෂා කරන අවස්ථාවක් වුවද විය හැකිද එය?

පි : එහෙම නම් වෙන්න පුළුවන් ස්වාමීනි. නමුත් ඒක Detanation එකක් නෙමෙයි. පුපුරවා ගන්න මොහොත නෙමෙයි වෙන්න පුළුවන්.

ප්‍ර : පරීක්ෂා කිරීමක් විය හැකියි?

පි : ඔව්. මොකක් හරි පරීක්ෂා කිරීමක්.

ප්‍ර : ඔබතුමා මෙම සිද්ධීන්වලට අදාළව සාක්ෂි දෙනකොට කියා සිටියා මෙම ස්වයං ඝාතක බෝම්බකරුවන් බොහොමයකගේ හිස කඳෙන් වෙන් වෙලා තිබුණු බව?

පි : එහෙම වෙන්නේ ස්වාමීනි එම පිපිරුම් උපක්‍රමය හිසට පහළින් පපු පෙදෙසේ තිබුණොත් තමයි ඒ සිදුවීම සිදු වෙන්නේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබතුමා ට්‍රොපිකල් ඉන් කියන දෙහිවල ලැඟුම්හල පරීක්ෂා කරන්න ගියාද?

පි : එහෙමයි.

ප්‍ර : එම ස්ථානයේදී ඔබට පරීක්ෂා කිරීමට ලැබුණද නැත්නම් ඔබ නිරීක්ෂණය කරාද හිස් කබලක්?

පි : මම යනකොට ස්වාමීනි එවැනි ශරීර කොටස් අධිකරණ වෛද්‍ය නිලධාරිතුමා වෙත රැගෙන ගොස් තිබුණේ.

ප්‍ර : ඔබතුමාට මතයක් පළ කරන්න පුළුවන්ද එම බෝම්බය කොයි ආකාරයට පුපුරවා ගැනීමට වූ පිපිරීමක්ද කියලා?

පි : ඔය සියළුම පිපිරීම් මාලාව එකින් එක සංසන්දනය කිරීමේදී විශේෂයෙන්ම අනෙක් තැන්වල පැහැදිලිවම හිස කොටසක් තිබුණ නිසා ස්වාමීනි අපිට පුළුවන් වුණා මේක Suicide එහෙම නැත්නම් ස්වයං ඝාතක බෝම්බයක් කියලා කියන්න. නමුත් ට්‍රොපිකල් ඉන් එකේ හරියටම කියන්න බැහැ ස්වාමීනි කොහොමද කළේ කියලා. නමුත් එතනත් අධිබල පිපිරුමක් පුපුරලා ගිහින් තියෙන්නේ. නමුත් ගොඩක් වෙලාවට නිශ්චිතවම කියන්න බැහැ අර හිස කොටස ගැලවිලා වෙන් වුණොත් විතරයි අපිට කියන්න පුළුවන් ස්වයං ඝාතක බෝම්බයක් කියලා.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : තමන්ලා කොච්චිකඩෙත් තමන්ද පරීක්ෂා කළේ?

පි : එහෙමයි ස්වාමීනි. මමත් එතනට ගියා.

ප්‍ර : හිස් දෙකක් හම්බ වුණාද?

පි : එකයි. කොච්චිකඩේ එකයි ස්වාමීනි.

ප්‍ර : එකයිද හම්බ වුණේ?

පි : එකයි ස්වාමීනි. ෂැන්ග්‍රිල්ලා හෝටලයේ පමණක් හිස් දෙකක් තිබුණා.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා :

ප්‍ර : යම් අවස්ථාවකදී ස්වයං ඝාතක බෝම්බකරුගේ හිස සොයා ගැනීමට ඒ කියන්නේ එය විනාශ වෙලා තිබෙනවා නම් එසේ සිදු වන්න හැක්කේ කොයි වගේ අවස්ථාවකදිද? කාමරයක් තුළ පිපිරීමක් සිදු වෙනකොට ස්වයං ඝාතකයෙකු විසින් ඒ පිපිරීම සිදු වීමේදී අවසානයේදී ඒ ස්වයං ඝාතකයාගේ හිස සොයා ගැනීමට

FAIR COMMENT BY JEZEEM

නොමැති නම් ඒ කියන්නේ විනාශ වෙලා නම් ඒ කුමන වගේ අවස්ථාවකදීද එය වෙන්න පුළුවන්?

පි : ඒ ස්වයං සාතනය කරා නම් සමහරවිට හිස ගොඩක් වෙලාවට බෝම්බයට ආසන්නව තියෙන්න පුළුවන්. හිස මේ වගේ තැනක තිබ්බොත් එහෙම කම්පනතාවය කෙළින්ම හිසට වදින්න පුළුවන්. එහෙම වුණොත් එහෙම හිස ගැලවිලා යාමේ හැකියාවක් නැතුව ගොඩක් වෙලාවට හිස සුණු විසුණු වෙන්න පුළුවන් ස්වාමීනි. මොකද පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණය වැඩි නම් සමහරවිට හිස සොයා ගන්න බැරි වෙන්න පුළුවන්. අපි මේ සළකන්නේ ඒ පුපුරණ ද්‍රව්‍ය යම් ප්‍රමාණයක් තිබුණොත් එහෙම. ඊට වැඩිය වැඩි පුපුරණ ද්‍රව්‍ය තිබ්බොත් එහෙම හිස ගැලවිලා හිස සොයා ගන්න බැරි තත්ත්වයක් වෙන්නත් පුළුවන්.

ප්‍ර : ඔබතුමා පරීක්ෂා කළා C-510(j) කියන දර්ශන පටය?

පි : එහෙමයි.

ප්‍ර : එම අවස්ථාවේ, අදාළ පුද්ගලයා ඒ රැගෙන ආ ඒ පරීක්ෂා කරන බෑගයේ යම් පුපුරණ ද්‍රව්‍යයක් තිබිලා එය පුපුරා ගියා නම් ඒ අවස්ථාවේදී, එවැනි අවස්ථාවකදී ඔහුගේ හිස විනාශ වීමේ හැකියාව තියෙනවාද නැද්ද?

පි : මම හිතන්නේ ඒ ඡායාරූපයේ හැටියට පිපිරුණ බෝම්බය සහිත බෑගය ඔහුගේ දණහිස මත තිබුණේ.

ප්‍ර : ඔව් සහ ඔහු බිම නෙමෙයි බලාගෙන හිටියේ?

පි : ඔව්. ඒ අවස්ථාවේදී සමහරවිට හිස සම්පූර්ණයෙන් සුණු විසුණු වෙන්න ඉඩ තිබුණා ස්වාමීනි. ගොඩක් වෙලාවට අපි මෙම අවස්ථා දකින්නේ හිටගෙන. හිටගෙන ඉන්නැද්දී පපු ප්‍රදේශයේ හෝ පිට ප්‍රදේශයේ බෝම්බයක් තිබුණොත් තමයි ස්වාමීනි හිස ගැළවිලා උඩට විසි වෙලා යන්නේ. ගොඩක් අවස්ථාවල අපි එහෙම අවස්ථා තමයි දැකලා තියෙන්නේ.

එපමණයි උතුමාණෙනි.

****

ගරු අදිකාරී මැතිණිය :

ප්‍ර : වැලිඅංග මහත්මයා දැන් බෝම්බකරුවෙක්ගේ මුහුණ සහ හිස සම්පූර්ණයෙන්ම විනාශ වී හඳුනාගෙන යාමට බැරි වීමට එක හේතුවක් විය හැකිද ඔහු ආසන්නයේ සිටින පිරිස ඔහුට වඩා උසින් ඉතාමත්ම අඩු කුඩා ළමුන් වැනි පිරිසක් වූ අවස්ථාවකදී ඔහුගේ ඉලක්කය ඉටු කර ගැනීම සඳහා හිට ගැනීමෙන් නොමැති වූ වෙනත් ඉරියව්වකින් බාගෙට ඉඳගෙන වැනි දේකින් බෝම්බය

FAIR COMMENT BY JEZEEM

පුපුරවා ගත්තා නම් ඒ අවස්ථාවේදී ඔහුගේ හිස සම්පූර්ණයෙන්ම මුහුණත් සමඟ විනාශ විය හැකිද?

පි : මැඩම් දැන් ස්වයං ඝාතක බෝම්බයක් නිර්මාණය කරන්නේ ගොඩක් වෙලාවට ලෝහ බෝල විශාල ප්‍රමාණයක් අඩංගු කරලා. කුඩා ලෝහ බෝල. ඒ ලෝහ බෝල විශාල ප්‍රමාණයක් දාන්නේ එක මොහොතකින් මනුෂ්‍ය ඝාතන සමූහයක් කරන්න. එතකොට එයා දන්නවා ලෝහ බෝල කොතනද තියෙන්නේ කියලා. එතකොට එයා දන්නවා මේ බෝම්බය පිපිරුවොත් ලෝහ බෝල කොයි පැත්තටද යන්නේ කියලා. ඒ අනුව එයා තමන්ගේ ඉරියව්ව හදා ගන්න ඕන ඉන්න ජන සමූහයේ පපු පෙදෙසට, ඔළුව පෙදෙසට ලෝහ බෝල එල්ල වන විදියට. එතකොට එයා තමන් දැන ගන්න ඕන මගේ ඇගේ තියෙන ලෝහ බෝල තියෙන්නේ මෙන්න මේ Area එකේ. එතකොට මම මේ පැත්තට හැරුණොත් තමයි ජන සමූහය වෙතට මේ ලෝහ බෝල එල්ල වෙන්නේ. මේක අර පුපුරවා ගන්න පෙර අර අපි තුවක්කුවක් එල්ල කරනවා වගේ අපේ ඉලක්කයට. ඒ වගේ තමන් තමන්ගේ ඉලක්කය හදා ගන්න ඕන කොයි පැත්තටද කියන එක. දැන් අපි දන්නවා අර පපු ප්‍රදේශයේ ස්වයං ඝාතක බෝම්බය තිබ්බොත් එහෙම ඒගොල්ලෝ හැරෙන්නේ ඒ පුද්ගලයා දෙසට. හැරිලා තමයි පුපුරවා ගන්නේ. ගොඩක් වෙලාවට යම්කිසි එක පුද්ගලයෙක් ඉලක්ක කළොත් එහෙම ඒ පැත්තට හැරිලා තමයි ඒ බෝම්බය පුපුරවා ගන්නේ. ඉතිං ඒ අනුව එයා තීරණය කර ගන්න ඕන මේකේ ඉඳගෙනද ඉන්න ඕන, හිටගෙනද ඉන්න ඕන කියලා. තමන් ඉඳගෙන හිටියොත් අර මැඩම් කිව්ව විදියට සමහරවිට හිස නැති වෙලා යන්න ඉඩ තියෙනවා. හඳුනා ගන්න බැරි විදියට. ඉතිං සමහරවිට මෙවැනි අවස්ථාවලදී අපිට මතයක් විතරයි ඉදිරිපත් කරන්න පුළුවන්. නිශ්චිතවම හරියටම සියයට සීයක්ම මේකම කියලා කියන්න අමාරු වෙන අවස්ථා තියෙනවා. අපරාධ ස්ථානය විමර්ශනය කරලා, ඒ තියෙන අනිත් විශේෂ පළුදුවීම් සහ විනාශවීම් පරීක්ෂා කරලා බලපුවාම කියන්න පුළුවන් මේක ස්වයං ඝාතකද නැද්ද කියලා. ස්වයං ඝාතක යන්නෙන් අදහස් කරන්නේ ඒ පිපිරුම් උපක්‍රමය තමන් අතේ තියෙන්න ඕන. තමන් ළඟ තියාගෙන. තමන් ළඟ තියා ගත්තට පස්සේ ඒක පිපිරුවොත් තමයි තමන්ට Damage වෙන්නේ. ඒක තමයි අපි ස්වයං ඝාතක කියන එක අපේ ඒ මතයට අපි එළඹෙන්නේ ඒකයි. තමන්ගේ ඇඟ තුවාල වුණොත් එහෙම. ඇගේ කොටස් සම්පූර්ණයෙන් සුණු විසුණු වුණොත් අපි හිතනවා මෙයා අතේ තමයි මේක තිබ්බේ කියලා. එහෙම නම් මෙයා පුපුරවා ගත්තා කියලා. සමහරවිට

FAIR COMMENT BY JEZEEM

වෙනත් කාට හරි මතයක් ඉදිරිපත් කරන්න පුළුවන් මෙයා අතේ තියාගෙන ඉන්නැද්දී වෙන කවුරු හරි Remote Controll එකෙන් පිපිරුවා කියන්නත් පුළුවන්. ඉතිං අපිට ඒක නැහැ කියන්නත් බැහැ. එහෙමත් ඕන නම් කාට හරි මතයක් ඉදිරිපත් කරන්න පුළුවන්. නමුත් ඉතිං අනිත් තොරතුරුත් එක්ක බලනකොට අපිට පේනවා මේක තමන්ගේ අතේ තියෙද්දී තමුන්ම පුපුරවා ගත්තා කියලා.

****

ගරු සභාපතිතුමා :

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතීඥවරියට අසමි. නැත යනුවෙන් ප්‍රකාශ කරයි.

මේ අවස්ථාවේදී නීතිපති දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් ඉල්ලයි. අවසර ලබා දෙමි.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සුහර්ෂි හේරත් මහත්මිය :

ප්‍ර : වැලිඅංග මහත්මයා ඔබ ෂැන්ග්‍රිල්ලා හෝටලයේ සිදු වූ පිපිරීමට අදාළව එම ස්ථානය පරීක්ෂාවට ගියාද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එම ස්ථානයේ තිබී මහත්මයා මේ සභාවෙන් අහන්න ප්‍රශ්නවලට අනුව පිළිතුරු ලබා දුන්නා බෝම්බ කොටස් වශයෙන් පුපුරණ ද්‍රව්‍ය කුමක්ද කියලා හඳුනා ගැනීමේදී ඔබ කිව්වේ එය මොනවා හැටියටද?

පි : යූරියා නයිට්‍රේට්.

ප්‍ර : යූරියා නයිට්‍රේට් පාවිච්චි කරලා තිබුණු බව හඳුනා ගත්තා කියලා?

(මේ වනවිටත් මේ සභාවේ සළකුණු කර තිබෙන C-422(n) ඡායාරූපය සාක්ෂිකරුට පෙන්වා සිටීමට අවසර අයැද සිටිනවා ගරු සභාපතිතුමනි)

ප්‍ර : බලන්න මහත්මයා මේ ඡායාරූපය. මේ ඡායාරූපයේ තියෙන ඔය හිසෙහි හැටියට මෙය ස්වයං ඝාතකයෙකුගේ ගෙලෙන් වෙන් වූ හිසක් හැටියට ඔබට මතයක් ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : එහෙමයි ස්වාමීනි. මම හිතන්නේ මේක ස්වයං ඝාතක වෙන්න ඕන. ඒ වගේම මේ පිපිරුම් උපක්‍රමය තිබෙන්න ඕන ශරීරයේ පිටුපස පැත්තෙන්. ශරීරයේ පිටුපස පැත්තෙන් මේ තිබුණ විදියට තමයි මේ මුහුණ මේ වගේ පැහැදිලිවම දක්නට ලැබෙන්නේ

FAIR COMMENT BY JEZEEM

ඒකයි. නැත්නම් ගොඩක් වෙලාවට මුහුණ මේ හරියෙන් සම්පූර්ණයෙන්ම විනාශ වෙලා යන්න පුළුවන්. අනිත් එක මේක බලපුවාම ඡායාරූපයෙනුත් පේනවා පිටුපස පැත්තේ හිස් කබල තමයි වැඩිපුර Damage වෙලා තියෙන්නේ. යම්කිසි මේ මුහුණේ හඳුනා ගැනීමට පවා හැකියි. නමුත් අපි මීට පෙර දැකලා තියෙනවා පපු ප්‍රදේශයේ තිබුණ ස්වයං ඝාතක පිපිරීම්වලදී මුහුණ හඳුනා ගන්න අපහසුයි. ඒ මුහුණ පස්සේ අධිකරණ වෛද්‍ය නිලධාරීතුමා විසින් නැවත ප්‍රති නිර්මාණය කරාට පස්සේ තමයි මුහුණ හඳුනා ගත්තේ. නමුත් මේ අවස්ථාවේදී අපිට මුහුණ පැහැදිලිව හඳුනා ගන්න පුළුවන් නිසා අපි හිතනවා මේක ස්වයං ඝාතක වෙන්නත් ඕන. ඒ වගේම මෙය ශරීරයේ පිටුපස පිට ප්‍රදේශයේ තිබුණු පිපිරීමකට හා අනුරූප වෙනවා.

(ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී සාක්ෂිකරු එම මතය පළ කළේ C-422(n) ඡායාරූපය මේ අවස්ථාව වනවිට සාක්ෂි ලබා දී තිබෙනවා විමර්ශකයා විසින් එය සහරාන් නැමැති පුද්ගලයාගේ හිස් කබල බවට මේ වනවිට තහවුරු වී බවට. එය දෙස බලා මේ මතය ප්‍රකාශ කළ බවට ගෞරවයෙන් සටහනක් තබන මෙන් අයැද සිටිනවා)

ප්‍ර : ඒ වගේම මෙම ෂැන්ග්‍රිලා බෝම්බ පිපිරීම සිදු වූ ස්ථානය මහත්මයා නිරීක්ෂණය කරන්න ගිය අවස්ථාවේදී ඔබට නිරීක්ෂණය කිරීමට හැකියාවක් ලැබුණද බෝම්බ පිපිරුණ ස්ථාන එකකට වැඩි ප්‍රමාණයක් තිබුණු බවට?

පි : බෝම්බ පිපිරුණ ස්ථාන දෙකක් හඳුනා ගන්න පුළුවන් වුණා ස්වාමීනි.

ප්‍ර : ඔබට මතකයෙන් කීමට හැකියාවක් තිබෙනවාද මොන මොන තැන්වල පිපිරිලා තිබුණාද කියන කාරණාව සම්බන්ධයෙන්?

පි : ස්වාමීනි යම්කිසි Restourant එකක තැන් දෙකක. එකම තට්ටුවේ, එකම Floor එකේ ස්ථාන දෙකක තමයි තිබුණේ. එකක් මට මතකයි ගාලු මුහුද පැත්තට වෙන්න වීදුරුවක් ගාව ආසන්නයේ තිබුණු Restorant එකක තමයි එක පිපිරීමක් වෙලා තිබ්බේ. අනික ඊට පොඩ්ඩක් මැතින් තමයි දෙවන පිපිරීම වෙලා තිබුණේ.

ප්‍ර : දැන් මේ ෂැන්ග්‍රිලා හෝටලයේ සිදු වූ බෝම්බ පිපිරීමේ දෙවන ස්වයං ඝාතකයාගේ හිස් කබල මා මුල් අවස්ථාවේ පෙන්නුම් කළ ඡායාරූපයේ තිබෙන ආකාරයට සොයා ගැනීමට හැකියාවක් ලැබිලා නැහැ. එහි සුණු විසුණු වූ කොටස් අතරින් තමයි මේ වනවිට විමර්ශකයන් විසින් ඒ කොටස්වලින් DNA පරීක්ෂාවට ලක් කරලා ස්වයං ඝාතකයාගේ අනන්‍යතාවය තහවුරු කරගෙන

FAIR COMMENT BY JEZEEM

තිබෙන්නේ. ඒ සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් වෙලා තියෙනවා මේ වනවිටත් මේ සභාවට. එවැනි හිස කුඩා කැලිවලට වෙන් වෙලා හිස් කබල මේ 422(n) ඡායාරූපය වගේ ඉතුරු වෙන්නේ නැතුව තියෙන්න හේතුවක් ඔබට මතයක් හැටියට කියන්න පුළුවන්ද?

පි : සමහර අවස්ථාවලදී පිපිරුණු උපක්‍රමය එහෙම නැත්නම් බෝම්බය ශරීරයේ ස්ථානගත වෙලා තිබ්බ ස්ථානය වෙන්න පුළුවන්. සමහරවිට ඒක හිසට කිට්ටු වෙන්නත් පුළුවන්. ඊට අමතරව ඒ පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණය ඊට වඩා වැඩි වෙන්න පුළුවන්. පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණය Quantity එක පළවෙනි පිපිරීමට වඩා වැඩි ප්‍රමාණයක් වෙන්නත් පුළුවන්. එහෙම නැත්නම් සමහරවිට ඒකේ තිබ්බ Position එක තිබෙන ස්ථානය අනුවත් එවැනි පළුදුවීමක්, තුවාලවීමක් සිදු වෙන්න පුළුවන්.

ප්‍ර : දැන් ඒ වගේම මෙම ෂැන්ග්‍රිල්ලා හෝටලයේ බෝම්බ පිපිරීමෙන් මිය ගිය පුද්ගලයන් අතුරින් එක් පුද්ගලයෙකුගේ ස්වයං සාතකයන් නොවන පුද්ගලයෙකුගේ හිසක් වෙන් වී ගිය බවක් නිරීක්ෂණය වෙලා මුල් අවස්ථාවේ විමර්ශකයන් එම හිස පරීක්ෂාවට ලක් කිරීම සඳහා යොමු කිරීමකුත් කරලා තිබුණා. ඔබට මතයක් වශයෙන් කියන්න පුළුවන්ද ස්වයං සාතකයන් නොවන, මේ බෝම්බයෙන් අනතුරට පත් වුණ වෙනත් පුද්ගලයෙක්ගේ ඒ ආකාරයට හිස පමණක් ගැලවිලා යාමේ හැකියාවක් තිබෙනවාද සහ ඊට අදාළව හේතුසාධක මතයක් හැටියට?

පි : මගේ අත්දැකීම් අනුව ස්වයං සාතකයෙක් නොවන පුද්ගලයාගේ හිසක් ගැලවීමේ සම්භාවිතාව ඉතාම අඩුයි. නමුත් අර පුද්ගලයා සමඟ ස්වයං සාතකයා සමඟ ඉතා ආසන්නව, ඉතා ආසන්නව මම අහල් කිහිපයක් ඇතින් තිබුණා නම් සමහර වෙලාවට හිස ගැලවිලා යාමේ හැකියාවක් තිබෙනවා. මම හිතන්නේ ඒ පිළිබඳව වැඩිපුර මතයක් ප්‍රකාශ කරන්න පුළුවන් අධිකරණ වෛද්‍ය නිලධාරිතුමාට. එතුමා මම හිතන්නේ ඒ Blast Injuries බලලා හරියටම එතුමාට කියන්න පුළුවන් මොකක්ද මේ නියමිත තත්ත්වය කියලා.

ප්‍ර : ඒ වගේම වැලිඅංග මහත්මයා, ඔබ කිංස්බරි හෝටලයේ සිදු වූ බෝම්බ පිපිරීම සම්බන්ධයෙන් නිරීක්ෂණයකට එම ස්ථානයට ගියාද?

පි : එහෙමයි ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

(ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී ගෞරවයෙන් C-420(j) ඡායාරූපය සාක්ෂිකරුට පෙන්වා සිටීමට අවසර අයැද සිටිනවා)

ප්‍ර : බලන්න මහත්මයා මේ ඡායාරූපය. මේ ඡායාරූපයේ තිබෙන කරුණු නිරීක්ෂණය කරලා ඔබට යම්කිසි මතයක් කියන්න පුළුවන්ද මේ ඡායාරූපගත වෙලා තියෙන ස්ථානය සම්බන්ධයෙන්?

පි : මේ බිත්තියේ මේ වැදිලා තියෙන රතු පැහැති ඉතා කුඩා තිත් සහිත ලේ පැල්ලම්, ඒ කුඩා තිත් සමඟ තමයි ඒ ලේ පැල්ලම් වැදිලා තියෙන්නේ. මේක ඇති වෙන්නේ අධික වේගයෙන් රුධිරය තාපය මත ගැටීමෙන් ඇති කළ හැකි, රුධිරය තාපය මත ගැටීමෙන් තමයි මෙහෙම කුඩා තිත් සහිත පැල්ලම් සහිත මේ ලොකු විශාල පැල්ලම ඇති වෙලා තියෙන්නේ. ඒ කියන්නේ මෙතන පිපිරීමේදී නිකුත් වුණ ශරීරයේ රුධිරය සහිත මස් කැබලි සහිත කොටස් තමයි මේ බිත්තියේ තැන්පත් වෙලා තියෙන්නේ. සමහරවිට මේ උස බැලුවොත් එහෙම මේ උස බොහෝ වෙලාවට බෝම්බය ශරීරයේ තබාගෙන තිබ්බ උස විය හැකියි.

ප්‍ර : ඒ කියන්නේ සෙසු සාක්ෂි අනුව බොහෝවිට එය සළකා බැලීමේදී මෙය ස්වයං ඝාතකයා සිටි ස්ථානය විය හැකියි කියලා ඔබට කියන්න පුළුවන්ද?

පි : ස්වයං ඝාතකයා ඉතා ආසන්නව මෙම කුළුණට ඉතා ආසන්නව හිටියේ නැත්නම් මෙවැනි රුධිරය සහිත මස් කැබලි ඉතා වේගයෙන් ගිහිල්ලා මෙන්න මේ කුළුණේ වැදීමේ හැකියාවක් නැහැ. අනිවාර්යයෙන්ම මෙම රුධිරය සහිත මෙම පැල්ලම ස්වයං ඝාතකයාගේ ඇගෙන් නිකුත් වූ රුධිරය සහිත මස් කැබලි විය යුතුයි.

(ගරු සභාපතිතුමනි එම මතය පළ කරනු ලැබුවේ දැනටමත් මෙම සභාවට C-420(j) වශයෙන් සළකුණු කර ඇති ඡායාරූපය සම්බන්ධයෙන් බවට ගෞරවයෙන් සටහනක් තබන මෙන් අයැද සිටිනවා) ඒ වගේම ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී C-438 ඡායාරූපය සාක්ෂිකරුට පෙන්වා සිටීමට අවසර අයැද සිටිනවා)

ප්‍ර : බලන්න වැලිඅංග මහත්මයා මේ ඡායාරූපයේ තියෙන හිස් කබල සම්බන්ධයෙන් නිරීක්ෂණය කරලා ඔබට මතයක් පළ කරන්න පුළුවන්ද මෙය ස්වයං ඝාතකයෙක්ගේ වෙන් වූ හිස් කබලක් හැටියට?

පි : ස්වාමීනි මෙම ඡායාරූපයේ හැටියට මෙම පුද්ගලයාගේ මුහුණ ආසන්නයේ අධිබල පිපිරුම් උපක්‍රමයක් පුපුරා ගොස් තියෙනවා

FAIR COMMENT BY JEZEEM

කියලා මතයක් ඉදිරිපත් කරන්න පුළුවන්. එය ස්වයං සාතනයද නැද්ද කියන එක නිශ්චය කිරීම සඳහා මෙම පුද්ගලයාගේ ශරීරයේ ඉතුරු කොටස්ද පරීක්ෂා කිරීම සිදු වෙනවා ස්වාමීනි.

ප : ඔබ මින් පෙර පරීක්ෂාවට ලක් කරන ලද C-422(n) ඡායාරූපයෙහි එම පුද්ගලයාගේ මුහුණ ඔබ මේ අවස්ථාවේ පරීක්ෂාවට ලක් කරන C-438 ඡායාරූපයේ මුහුණත් යන මුහුණු දෙක පරීක්ෂා කිරීමෙන් ඔබට මතයක් පළ කරන්න පුළුවන්ද පිපිරීම සිදු වූ ආකාරය හෝ ඊට අදාළ යම්කිසි කාරණාවක් සම්බන්ධයෙන්?

පි : C-438 සම්බන්ධයෙන්ද.

ප : ඔව්. 438 සම්බන්ධයෙන්?

පි : මොකද මෙම අපරාධ ස්ථානයේ වෙනත් මුහුණ පමණක් ගැලවිලා ගොස් තියෙනවා නම් මෙම පුද්ගලයාගේ ශරීරයේ පිටුපස, මෙම ශරීරයේ පිටුපස පිපිරීමක් සිදු වූ බවට සම්පූර්ණයෙන් පිටුපසත් නෙමෙයි පොඩි කොටසකට එක පැත්තකට වෙන්න සිදු වූ පිපිරීමක් ලෙස මේ දෙක සංසන්දනය කිරීමෙන් යම් මතයක් ප්‍රකාශ කරන්න පුළුවන් ස්වාමීනි. සම්පූර්ණයෙන් පිටුපස නෙමෙයි, යම් පිටුපස සහ ඉදිරිය අතර. මොකද මේ පුද්ගලයාගේ බැලුවොත් එහෙම සම්පූර්ණයෙන් මුහුණ ප්‍රදේශය පැහැදිලිව හඳුනා ගත හැකියි. නමුත් මේ පුද්ගලයාගේ ශරීරයේ එක පැත්තයි හඳුනා ගන්න පුළුවන් මුහුණේ. ඒ නිසා අපිට සිදු වෙනවා අර වැඩියෙන්ම තුවාල සිදු වෙච්ච පැත්තට බරව ශරීරයේ පිටුපස ඒ පුද්ගලයාගේ පිපිරීම සිදු වන්න ඇතියි කියලා.

ප : පැත්තකට බරව තිබුණා ශරීරයේ පිටුපස ප්‍රදේශයේදී මෙම පිපිරුම් ද්‍රව්‍ය තිබුණු බවට, පිපිරීම සිදු වූ බවට ඔබට මතයක් පළ කිරීමට හැකියාව තිබෙනවා 438 ඡායාරූපය සම්බන්ධයෙන්?

පි : එහෙමයි. එතකොට මේකත් සමඟ සංසන්දනය කිරීමෙන් ස්වාමීනි. මේ ඡායාරූප දෙක සංසන්දනය කිරීමෙන් ඒ මතයට එන්න පුළුවන්.

****

රජයේ නීතීඥ චතුරංග බණ්ඩාර මහතා :

(ස්වාමිනි ඉතාමත් ගෞරවයෙන් දැනටමත් C-522 වශයෙන් මේ කොමිෂන් සභාව හමුවේ ලකුණු කර ඇති ඡායාරූපයක් සාක්ෂිකරුට පෙන්වීමට ගෞරවයෙන් අවසර පතනවා)

ප : වැලිඅංග මහත්මයා මෙම ඡායාරූපය පරීක්ෂා කරන්න. ඒ ඡායාරූපය පරීක්ෂා කරලා ඔබට මේ ගරු කොමිෂන් සභාවට

FAIR COMMENT BY JEZEEM

කියන්න පුළුවන්ද මෙය කුමන ආකාරයේ සිදුවීමකින් අනතුරුව ගත්ත ඡායාරූපයක්ද කියලා?

පි : මෙම පුද්ගලයාගේත් කලින් මම නිරීක්ෂණය කරපු ඡායාරූප දෙක සංසන්දනය කිරීමේදී මට පෙනී යන්නේ මෙම පුද්ගලයාගේද හිසට පිටුපස පිට පෙදෙසේ පිපිරුම් උපක්‍රමයක්, අධිබල පිපිරුම් උපක්‍රමයක් පිපිරීමෙන් ඇතිවන කම්පන තරංග මගින් ඔහුගේ හිස ගැලවී ගොස් පළුදු වී ඇති බව ස්වාමීනි.

ප්‍ර : ඒ කියන්නේ වැලිඅංග මහත්මයා මේ ස්වයං සාතක බෝම්බකරුගේ හිස කොටස විය හැකි වීමේ හැකියාවක් තිබෙනවද?

පි : බොහෝවිට.

ප්‍ර : ඔබ ඇයි සඳහන් කළේ මේ පිටුපස පිපිරුම් උපක්‍රමයක් සවි කරගෙන සිදු වෙච්ච පිපිරුමක් කියලා?

පි : මොකද ස්වාමීනි අපි මීට කලින් අපි අත්දැකලා තියෙනවා ශරීරයේ ඉදිරිපස පිපිරුම් උපක්‍රමයක් නැත්නම් ස්වයං සාතක බෝම්බය තිබ්බොත් එහෙම ඒ මුහුණ ප්‍රදේශය සම්පූර්ණයෙන්ම විනාශ වෙලා යනවා. එතකොට මේ මුහුණ හඳුනා ගැනීම සඳහා අපි දැකලා තියෙනවා අධිකරණ වෛද්‍ය නිලධාරියා විසින් මේ මුහුණ නැවත ප්‍රති නිර්මාණය කරනවා. Reconstruction කරනවා. නමුත් මේ අවස්ථාවේදී මේ මුහුණ මේ Reconstruction එහෙම නැත්නම් ප්‍රති නිර්මාණයක් අවශ්‍ය වෙන්නෙත් නැහැ. ඒ වගේම මේ පිටුපස පෙදෙසේ පැහැදිලි වන්නේ නැහැ. පිටුපසින් නම් වඩාත් හොඳයි. නමුත් මේ හිස පෙදෙසෙන් බෙල්ලෙන් ගැලවී ගොස් ඇති ස්වභාවය අනුව මේ හිසට පහතින් පිටුපස ප්‍රදේශයේ තබාගෙන ගිය පිපිරුම් උපක්‍රමයක් පිපිරීමෙන් වන බව තමයි විද්‍යාමාන වෙන්නේ ස්වාමීනි.

(ස්වාමීනි ඉතාමත් ගෞරවයෙන් C-522 ඡායාරූපය මේ වනවිටත් කොමිෂන් සභාව හමුවේ සාක්ෂිකරුවන් විසින් හඳුනාගෙන තියෙනවා සියෝන් දේවස්ථානයට අදාළව මරාගෙන මැරෙන ප්‍රහාරය එල්ල කළ මොහොමඩ් අසාඩ් යන අයගේ ඡායාරූපය බව. එය මෙම ගෞරවනීය කොමිෂන් සභාවේ අවධානයටයොමු කරන ලෙස අයැද සිටිනවා)

****

ජ්‍යෂ්ඨ රජයේ අධිනීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය :

ප්‍ර : වැලිඅංග මහත්මයා, ඔබ කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ 2019.04.21 වන දින සිදු වූ බෝම්බ ප්‍රහාරයට අදාළව ඒ ස්ථානය පරීක්ෂා කරනු ලැබුවද?

Digital Copy
FAIR COMMENT BY JEZEEM

පි : පරීක්ෂාවට ගියා ස්වාමීනි. නමුත් එදින නෙමෙයි. ඊට පසුදින මම එතනට ගියේ.

ප්‍ර : දැන් ඔබ මීට පෙර සාක්ෂි ලබා දෙමින් කිව්වා හිස කඳෙන් වෙන් වෙච්ච ස්වයං සාතක බෝම්බකරුවෙකුගේ හිස කඳෙන් වෙන් වෙච්ච අවස්ථාවකදී ඔබට ඒ පිටිපස කොටස ඡායාරූප දැක්කොත් ඔබට ඒ සම්බන්ධයෙන් වැඩිදුරටත් සාක්ෂි ලබා දෙන්න හැකියාවත් තිබෙනවා කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

(මේ අවස්ථාවේදී ඔබට කටුවාපිටිය දේවස්ථානයේ විමර්ශනවලට අදාළව SOCO නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද දැනටමත් මෙම ගරු කොමිෂන් සභාවේ C-347(b) වශයෙන් ලකුණු කර ඇති ඡායාරූපයක් පෙන්වා සිටිනවා. ඒ සඳහා අවසර ඉල්ලා සිටිනවා)

ප්‍ර : ඔබට මේ ඡායාරූපය පරීක්ෂා කරලා බලලා ඒ සම්බන්ධයෙන් යම්කිසි මතයක් ප්‍රකාශ කරන්න හැකියාවක් තියෙනවද?

පි : ස්වාමීනි මෙම හිසේ පැහැදිලි වෙන්නේ ඔහුගේ ශරීරයේ හිසට පහළින් ඔය පිපිරුම් උපක්‍රමය තබාගෙන පිපිරීම සිදුකර ඇති බව මුහුණ ප්‍රදේශයේ පැහැදිලිව තිබෙන බැවින්, බොහෝ විට ඉදිරිපසින් නෙමෙයි පිටුපසින් පිට පෙදෙසේ පිපිරුම් උපක්‍රමය පුපුරා ගොස් ඇති බව තමයි මගේ මතය වන්නේ.

ප්‍ර : මහත්මයා ඔබ 2019.04.21 වන දින දෙමටගොඩ මහවිල උද්‍යානයේ අංක 658/90 කියන ස්ථානයේ සිදු වෙච්ච බෝම්බ පිපිරීම අපරාධ ස්ථානයට ගියාද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ සම්බන්ධයෙන් විමර්ශන සිදු කළෙත් මහත්මයා විසින්ද?

පි : මා සහ මගේ කණ්ඩායම විසින්.

ප්‍ර : එහිදී ඔබ බෝම්බ පිපිරීම් දෙකක් සිදු වී ඇති බවට කරුණු අනාවරණය කර ගත්තාද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : පළවෙනි බෝම්බ පිපිරීම සිදු වී ආසන්න වශයෙන් විනාඩි 17 කට පසුව කාලයකදී අදාළ දෙවන පිපිරීම සිදු වී ඇති බවට දැනටමත් මේ ගරු කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි මගින් කරුණු අනාවරණය වෙලා තිබෙනවා. දැන් ඔබට පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්ද මේ ස්වයං සාතක බෝම්බකාරියක විසින් පළවෙනි බෝම්බය පුපුරවා ගත්තා නම් මේ දෙවෙනි පිපිරීම සිදු වීමට හැකියාවක් තිබෙන්නේ මොන ආකාරයටද කියලා?

FAIR COMMENT BY JEZEEM

පි : දෙවෙනි පිපිරීම යම්කිසි පුද්ගලයෙක් විසින් පුපුරා ඇරිය බවට මම හිතන්නේ සාක්ෂි නැහැ එතන. නමුත් පළවෙනි බෝම්බ පිපිරීමෙන් ඇති වෙච්ච ගිණි ගැනීම නිසා ඇති වෙච්ච තාපයෙන් දෙවෙනි එක බෝම්බ පුපුරා යාමේ මතය බැහැර කරන්න බැහැ ස්වාමීනි. ඊට අමතරව ...,

ප්‍ර : ඒක තවදුරටත් පැහැදිලි කරන්න පුළුවන්ද?

පි : මොකද ප්‍රථම පිපිරීමෙන් පසු ගින්නක් ඇති වෙලා තියෙනවා. ඒ ගින්නේ තාපය නිසා එවැනි බෝම්බයක් ගින්නේ තාපයෙන් පුපුරා යන්න බොහෝ විට ඉඩකඩ තියෙනවා. එතකොට පළවෙනි බෝම්බය නිසා එම නිවස තුළ තිබුණු ගිණි ගන්නා සුළු ද්‍රව්‍ය ගිණි ගැනීමෙන් ඇති වෙච්ච තාපය නිසා දෙවෙනි බෝම්බය පුපුරා යාමේ ඉඩකඩක් තියෙනවා. නමුත් නිශ්චිතවම අපිට ප්‍රමාණයක් සාධක නැති නිසා මෙය කොයි ආකාරයෙන් පිපිරුවාද කියලා නිශ්චිතවම ප්‍රකාශ කරන්න බැරි වුණත්, තාපය නිසා දෙවෙනි බෝම්බය පුපුරා යන්න ගියා කියන මතය බැහැර කරන්න බැහැ ස්වාමීනි.

****

ගරු සභාපතිතුමා :

කොමිසම ඉදිරියට පැමිණ සාක්ෂි ලබා දීමෙන් කොමිසමේ කාර්යභාරයට දැක් වූ දායකත්වය සම්බන්ධයෙන් සාක්ෂිකරුට කොමිෂන් සභාවේ ස්තුතිය පළ කරනවා.

සාක්ෂිකරුව මුදා හරිනවා.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බව පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

FAIR COMMENT BY JEZEEM

Presidential Commission of Inquiry to Investigate and Inquire into and Report or take necessary action on the Bomb Attacks on 21st April, 2019

Muhamad Zufyan Muhamad Zafras
Doctor
General Hospital Colombo

Date: 16.06.2020 **Time: 2.55 p.m. – 4.00 p.m.**
Notes taken by: Mrs. Sudakshina Berugoda

Panel of the Judges

01.	President	-	Judge of the Court of Appeal Hon. Janak de Silva Esquire
02.	Member	-	Judge of the Court of Appeal Hon. Nissanka Bandula Karunarathna Esquire
03.	Member	-	Former Judge of the Court of Appeal Hon. Nihal Sunil Rajapaksa Esquire
04.	Member	-	Former Judge of the High Court Hon. Atapattu Liyanage Bandula Kumara Atapattu Esquire
05.	Member	-	Former Secretary to the Ministry Mrs. W.M.M.R. Adikari

The learned President's Counsel herein on behalf of His Eminence Malcolm Cardinal Ranjith

- Mr. Shamil Perera
The President's Counsel
on behalf of His. Eminence Malcolm Cardinal Ranjith

Witness affirmed.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

Mrs. Nayana Seneviratne, Senior State Counsel

Q: Dr. Zafras did you receive summons from this Hon. Commission?

A: Yes I received.

Q: With the summons have you received and another attachment to the effect that if you want you can obtain a legal assistance that you canbe represented in this Commission?

A: Yes but I didn't want.

Q: Is it correct for me to say that you had given three statements to the Investigation Unit of this Commission?

A: Definitely.

Q: If I mention the dates that is on the 26th of May 2020 and 31st of May 2020 and on the 10th of June 2020?

A: You are referring to the Presidential Commission?

Q: Yes investigation here. In all these three statements you have given in Sinhala?

A: Yes.

Q: That means you are conversant in Sinhala as well?

A: Yes. I can. But it will be more professional if I speak in English that's why?

Q: But now you had informed this Commission that you can speak fluently you can express yourself more comfortably in English that's why you intend to give your evidence in English?

A: Yes.

Hon. Chairman Janak de Silva

That is why the Commission to be fair by you granted you that opportunity.

Witness

Thank you Sir.

Hon. Chairman Janak de Silva

Otherwisethe evidence before this Commission has been mainly led in Sinhalese. But due to your request we will allow you to testify in English.

Thank you Sir.

Hon. Sunil Rajapaksa

Q: But you have given your statements in Sinhala no?

A: Yes Sir.

Q: Why is that?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

A: Because whenever the investigators also I found it comfortable to communicate in Sinhala with the investigators so that and I was also able to understand what they are telling and whenever there was something that I couldn't understand I can ask and somehow made it clear. So I didn't have much problem to communicate with them in Sinhala.

Mrs. Nayana Seneviratne, Senior State Counsel

Q: Dr. Zafras where did you study? Your school education?

A: Yes I studied in Maruthamunai.

Q: Is that your hometown?

A: That is my hometown.

Q: In Batticaloa District?

A: In Kalmunai, It's Ampara District. That's where I was born. I studied in Almanar Central College up to my A/Levels. And I got selected to medicine. Initially I went to University of Jaffna. That's where I got selected.

Q: Thereafter did you get any transfer to another University?

A: Yes.

Q: To which University? When and why?

A: During that period the country was in a bit of a problem because it was war time. So we found it difficult to travel from there and here.

Q: We in the sense?

A: 25 students.

Q: 25 Muslim students?

A: 25 Muslim students yes. And then we came here because A-9 was closed time to time. So we came here requested University Grants Commission to give another University to study without any issues travelling issues. And then they have considered and they transferred us. So they divided us and posted to different differentUniversities. In that category I got Colombo University. But still my graduation was University of Jaffna even though I studied in University of Colombo.

Mrs. Nayana Seneviratne, Senior State Counsel

Q: What is your basic qualification as a Doctor?

A: MBBS.

Q: When did you obtain your MBBS Degree?

A: It was 2012 March.

Q: After obtaining your first Degree have you done any post-graduate studies?

A: Yes.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

Q: Can you briefly explain about your post-graduate qualifications?

A: I got my internshipin 2012 December. Then I started at Teaching Hospital, Batticaloa where I worked about one year and three months.And then I got my post-internship at Ashroff Memorial Hospitalwhich is in Kalmunai.

Q: Is it a Government Hospital?

A: Yes. It's a Government Hospital.So when I was working there I started to study post-graduate. That is MD surgery because I was interested in surgeries. So I started to study for that. And I worked hard and got through this exam in the first attempt. That was in 2015 I sat for that exam. That is MD Part one surgery. And then I was enrolled to the post-graduate studies by Colombo University for the surgery. So my post-graduate career started in 2015 August 01st at Teaching Hospital, Kandy where I did about one year General Surgery Training.And then I decided to get into the Orthopedic surgery and that's what I was interested and then I got into the Orthopedic surgery. My first appointment was at Peradeniya for six months. And then I got subsequent appointments at National Hospital, did 06 months Orthopedic, Vascular 02 months, plastic surgery 02 months, Rheumatology 02 months, Radiology 01 month. So likewise I had lot of small small appointments. And thenthe Part II exam came up after about 3½ years. That was on 2019 February. That was the MD Orthopedic exam. I sat for that that was 2019 February around 25thand I got through the exam and I got Gold Medal. And I was the first one in thelist in the country.

Q: Currently you are attached to Colombo General Hospital?

A: Yes.

Q: In which capacity?

A: So once we get through MD Orthopedic exam before that we are called as Registrars and then once we get through this post-graduate exam they call us Senior Registrar. So as a Senior Registrar I will have another two years of training in Sri Lanka.So now I have completed one year and two monthsof it. So another 08 months to go to complete this long journey which is about 18 years.

Q: What is your specialized area Doctor?

A: This is Orthopedic surgery. So that means bones and joints. We fix the fractured bones, we replace the joints things like that.

Q: What is plastic surgery? Is it connected to the Orthopedic area?

A: Yes when there is a fracture or when there is an injury, the soft tissues also can getdamaged. So the plastic team involves re-constructing the

FAIR COMMENT BY JEZEEM

tissues there. So plastic is also it is another specialty. It is not Orthopedic specialty. But Orthopedic surgeonsbasically should know little bit ofplastic. So during my training we have two months appointment of plastic surgery. So we have to just go in, learn few things about plastic surgery but it is not my specialty.

Q: When did you join the Colombo National Hospital?

A: Colombo National Hospital the first after the post MD I was first posted to Sri Jayawardena Pura Hospital. That was 20

Q: I am asking about Colombo National Hospital?

A: National Hospital. The first date. If you don't mind can I have my document. I have the exact date. So that it won't be. O.k. Thank you Sir. 2017 April 01st. That is the first date I am joining National Hospital.

Q: Is it correct for me to say you were attached to Colombo National Hospital in August 2018 as well?

A: August yes, yes I was there.

Q: Which Unit?

A: I was in the Plastic Unit.

Q: In which capacity you functioned there?

A: Sorry

Q: In which capacity you functioned there at that time?

A: I was a Registrar. So that means before the MD exam.

Q: If I show you a bed head ticket can you refer and give further evidence?

A: Yes sure.

Hon. Sunil Rajapaksa

Q: Witness can you explain the Registrar's duty?

A: Registrar's duty usually Sir we will be basically seeing we are the first people to see patients. Usually when they are coming to the hospital. So we see and then we make our judgments and we inform the Senior Registrars who are looking after us and the Senior Registrars will inform the Consultants and that's the hierarchy that works there.

Mrs. Nayana Seneviratne, Senior State Counsel

Chairman Sir may I be permitted to show a document which had been already marked as C598 to the witness? The original set of documents.

Q: Do you identify this as a bed head ticket?

A: Yes.

Q: Is it issued from Colombo General Hospital?

A: Yes.

Q: Is there a reference number for this bed head ticket?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

A: Yes.
Q: What is it?
A: S/022231/18.
Q: Can you tell the name of the patient as mentioned in the paper?
A: M.I. Shahid.
Q: And the guardian's name?
A: M.I. Sadiq.
Q: Now Doctor have you seen this bed head ticket before? and when?
A: This I cannot 100% say that I have seen this bed head ticket. But when I go through the bed head ticket now I have several clues to say that I have previously seen this bed head ticket.
Q: When was that and where?
A: Yesterday at National Hospital after I was issued this summon. I was permitted to see this bed head ticket at the record room.And I went through that the ticket and I can give the clues that support I have already seen this bed head ticket.But I cannot 100% say.
Q: On what basis you say that you have seen this bed head ticket previously?I mean before you you said that you got down this bed head ticket yesterday.
A: Yes.
Q: Before that you said that you might have seen this and when was that and how?
A: Yes. Now the clues that I got this is a gas cylinder blast. And the admission date was 2018 August 27th.Admission time was 11.42 a.m. The injury pattern it's mentioned here severe laceration of the face bilateral hand injury. So injury pattern matches. And this patient was there in Ward 79 neuro trauma ETU it's mentioned here and then again Ward 79. So with all these clues I almost suspect that this is the ticket I should have seen twice.
Q: When was that?
A: Once I have seen this at neuro trauma ETU and again I have seen this in Ward 79.

Hon. Chairman Janak de Silva

Q: Can you give us the dates on which you saw?
A: I cannot exactly remember the date when I have seen this ticket. But the patient was there at neuro trauma ETU for about 06 days that is from 2018 August 29 to 2018 September 05th. That is the period he was there at the ETU. So I should have seen this ticket during that period.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

Mrs. Nayana Seneviratne, Senior State Counsel

Q: Were you attached to Ward No. 79 on 27th August of 2018?

A: No.

Q: Then what made you to go there and examine this bed head ticket?

A: Yes so that is the starting point of the event. It is my friend called RilahI think Judges might be knowing or I don't know whether I have to introduce him.

Q: Rilah can you mention the full name of the person that you have referred?

A: Mohamed Alliar Marzook Rila. Is that right? I think that should be the name.

Q: How do you know him?

A: He was my classmate. We studied together in the same school. And we studied up to O/Level together. A/Level he selected Maths. I selected Bio. He was good friend of mine. We studied well even he has been at my home studying together. So that kind of a relationship. And whenever he comes whenever he needs any medical opinions he calls me and ask. Even his child was having some problems so he has contacted me I have given lot of helps for that.

Q: Is he a professional what is he?

A: He is an Engineer by profession.

Hon. Sunil Rajapaksa

Q: Full Name?

Mrs. Nayana Seneviratne, Senior State Counsel

A: Yes so Rilah makes me a phone call.

Q: When was that?

A: August 2018 August 27th.

Q: At what time?

A: It is around 1.30. Because I have gone through the call history. So that is why I

Q: 1.30?

A: 1.34 is it?

Q: No morning or?

A: a.m. I was after a busy day on call doing works at hospital tired sleeping.

Q: What is the number he can you mention the number that he called you? Is it a Sri Lankan number or a?

A: It's a foreign number. He was in Saudi Arabia. The time he made the call to me.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

Q: How do you know that he was in Saudi Arabia?
A: He said he was in Saudi and he called through his foreign number.
Q: Can you mention the telephone number?
A: I don't exactly remember the number.
Q: What is the phone numberthat you had used during that period?
A: Yes it is
Q: I am asking your number?
A: 0772276655. That is the number currently still I am using.

Hon. Chairman Janak de Silva

Q: Can you repeat it again?
A: 0772276655.

Mrs. Nayana Seneviratne, Senior State Counsel

Q: Is it the same number that you are still using?
A: Yes.
Q: From when you start using that number?
A: I started using long time back. I can't remember when I started using it.
Q: May be 5,10 years ago?
A: May be 5 years.
Q: How did that call come through? Is it a normal call or any other application?
A: Yes when you see my statement I would have given WhatsApp call or something because I could not exactly recall what call was.
But now after seeing the call history I came to know that this is a normal phone call.

Chairman Sir may I be permitted to show the telephone details of telephone no. 0772276699. May I be permitted to mention the telephone number again Sir 0772276655.

Q: Now I am showing the telephone details of the telephone number 0772276655 for the period of from 24th of August 2018to 15thSeptember 2018.Witness now I am showing you a telephone detail
A: Yes.
Q: Can you go through thatand show us the telephone call that you have mentioned that you received from the person called Rilah?
A: Right yes this one.
Q: Now can you tell us the exact time that you have received that call?
A: August 27 1.38 yes that one. O.k. fine?
Q: 1.38 a.m.?
A: Yes.
Q: Witness can you mention again the time?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

A: 1.38 a.m.

Q: That means 26th August in the night?

A: 27th early in the morning.

Q: 27th early in the morning? Once again can you mention the number that you have received that call?

A: +966566284470.

Q: What is the country code of Saudi Arabia?

A: +96. 0096.

Q: 966?

A: I said 966.

Hon. Chairman Janak de Silva

Q: Is it correct to state that what is stated in that report is 966566284470 is that correct?

A: That's right Sir.

Mrs. Nayana Seneviratne, Senior State Counsel

Q: What is the call duration?

A: That is 198 seconds.

Q: Now can you mention to this Hon. Commission what did you discuss with him?

A: Yes. He called. He said one of his known person got injured from gas cylinder blast. And is there any first aid that we can give for this sort of injury. Then I said o.k. Do you have any images to say what to do? Then he said o.k. I will make an arrangement and then get back to you. This is the summary I remember what he told. So he clearly mentioned that it's a gas cylinder blast and usually when somebody asked me I request an image to at least to direct them just what to do. So I just did that. That is the first contact with him.

Hon. Chairman Janak de Silva

Q: Witness this call has been there for three minutes and eighteen seconds.

A: Yes Sir.

Q: So the conversation must have been more involved than what you have summarized to the Commission? Did you ask him where this gas explosion took place?

A: No Sir. I didn't ask.

Q: You knew that he was in Saudi Arabia?

A: Yes.

Q: So have you been to Saud Arabia?

A: Yes I went to Umbra with my family.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

Q: How many times you have been to Saudi Arabia?
A: Only once.
Q: Did Rilah who called you?
A: Yes.
Q: Inform you that this explosion has taken place this gas explosion has taken place in Saudi?
A: No he told it's in Sri Lanka. He didn't mention the place.
Q: Is that all?
A: Yes. When you see the duration it's a bit more but he could have called and said Salam to me how are you and you know sorry to disturb in the middle of the night things like that which actually I don't exactly remember. Butthe summary of is he told that there is a known person got injured and he wants help that is in Sri Lanka. That's all I could recall what has happened.Because this statement or this incident has happened two years back now from this point. May be one year and ten months may be. And when I gave the first statement it was one year back. So how much we can recall when somebody talks in the middle of the night. But I remembered the important points that he talked to me. And that is what I want to tell because I don't want to create any stories here.
Q: So what are the important points that you are referring to? What are the important points that you are referring to?
A: One is that is a gas cylinder blast in Sri Lanka. He is known person injured anyfirst aid.

Hon. Madam Adikari

Q: Dr. Sufian at the outset you mentioned about you are giving first aid advice to patients whenever they call you on the phone and then you explain what is the process that you are following. As a Doctor who gives first aid advice to a patient who is not in the close vicinity of you, you normally don't ask where is this patient? As a Doctor you normally don't ask the person who calls you about this particular patient because you know by the time this is a cylinder gas cylinder blast and to give some kind of medical advice to do some first aid you should ask where is this patient at the moment? You did not ask that even your friend did not tell you but you did not ask?
A: Madam to give advice we just want to see the injury what has happened.Because it is in the middle of the night somebody disturbing me and we as specialist people we don't spend too much of time digging andasking things unless they tell. The more you dig the more trouble you get. Because they will the more responsibility to you get. So I just

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

wanted to make short and sweet. O.k. what has happened. And what is the solution? And that's all. So I also didn't ask. He also didn't tell me where it has happened.

Mrs. Nayana Seneviratne, Senior State Counsel

Q: But he only asked about the first aid?

A: Yes.

Q: Not about the hospital that he can be taken?

A: No.

Q: Then the person who had sustained injuries due to a gas cylinder blast asked about the first aid that can be given. So even at that time didn't you think over why has he asked only about the first aid that can be given?

A: Yes now burn injuries certainly sometimes you can give first aid. It can be even a small Patch which even does not need hospitalization or you know a normal water bath. It is the first aid that we advice for the burnt patient not cool water not hot water. Just wash him with the normal water before you take him to the hospital. So that kind of an advice you can still give to a patient who is to be taken to the hospital.

Q: You said you requested photographs some?

A: Images yes.

Q: Photos of the patient?

A: Yes.

Q: Didn't you ask who is the patient and what is the relationship with Rilah and why has he made inquires even at that time at the midnight?

A: Why should I? He was calling me in the midnight and asking. I just want to get away with these. So he is asking and I want to give a solution. And why I want to dig into this too much?

Q: Then why did you ask for photos?

A: Yes that is to just to give an advice.

Q: Advice in the sense?

A: In the sense what to do. You know what is the best for this patient.

Hon. Chairman Janak de Silva

Q: Witness by that date you have been at the National Hospital for about one year and five months.

A: O.k.

Q: Am I right?

A: I have been working in the National Hospital.

Q: Yes from the 01st of April 2017?

A: 2017 yes.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

Q: One year and five months. During that training period?
A: Yes Sir.
Q: You are attached to the Emergency Unit Accident ward also?
A: Not really. First six months Orthopedic appointment. And then Vascular appointment. So it's a bit of rotation. But time to time we see patients related to that specialty at the Accident Service.
Q: That is what I meant.
A: Yes.
Q: So even though you are not directly at the Accident Service throughout that one year and five months period?
A: Yes.
Q: You have been working at the Accident Unit at some stage of that work period of one year and five months?
A: Yes.
Q: During that period you would have been you would have seen patients with many injuries?
A: Yes Sir.
Q: You worked with Dr. Wasantha Perera?
A: He was retired when I started working.
Q: With whom were you working?
A: I was working with Dr. Dilshan Munidasa and Dr. Swarna Kumar.
Q: So during that period as you said you had seen patients with many injuries?
A: Yes.

Hon. Sunil Rajapaksa

Q: You worked with Ananda Perera?
A: Yes.

Hon. Chairman Janak de Silva

Q: Did you see patients with who were subjected to bomb explosions?
A: No Sir. Not a single patient.
Q: Road accidents?
A: Road accidents I have seen. Bomb in the sense I have seen trap gun injuries.
Q: You have seen trap gun injuries?
A: Trap gun injuries a lot. But not this the injury of this nature.
Q: No I didn't ask you for injury of this nature. I am only asking you about particular injuries. You have seen road accident injuries?
A: Yes Sir.
Q: Have you come across people who have fallen from trees?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

A: Yes.
Q: Have you seen people who have suffered shot gun injuries?
A: Yes.
Q: Have you seen people who have been burnt by fire?
A: Yes.
Q: You have seen people who have had different types of falls down staircases?
A: Yes.
Q: You have seen patientswho have suffered injuries by the use of blunt weapons?
A: Yes.
Q: You have seen people patients injured by the use of knife attacks?
A: Yes Sir.
Q: So during the one year and five months period you have seen many varieties of patients?
A: Yes Sir.
Q: And during that period you have seen people who had been subjected to gas explosions as well?
A: Not that I remember.
Q: You may not remember. But the fact is that it's a common injury in Sri Lanka isn't it?
A: May be I would have seen without my knowledge.
Q: No let me put that question this way. Isn't gas explosion injuries common in Sri Lanka?
A: Not really. Not really because may be the people who are in the BurnsUnit might be able to see a lot burn injuries. I was in the Orthopedic Unit. So I would have seen much of other trauma. Because when it comes to burn they go to the Burn Unit. It's plastic. I did plastic only for two months. So in my careerI wouldn't have seen much burn injuries.
Q: But in the Plastic Section for two months would have seen people with burn injuries.
A: Burn injuries yes. But you know when we get burn injuries sometimes when you are treating you wouldn't even know how the mechanism how it has actually happened.

Mrs. Nayana Seneviratne, Senior State Counsel

Q: Have you ever come across an incident of a have you seen or heard about an incident of gas cylinder blast in your career and you even as amedical student?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

A: No. I don't have to create any stories that's why I am telling. Not that I remember.

Chairman Sir May I be permitted to mark the document the telephone detailsbearing telephone number 0772276655 for the period of 24.08. 2018 to 15.09.2018. May I be permitted to mark it as C661?

Q: Now on your request have you received the photographs of the patient?

A: Yes I received the images through a local number. And I had a look at the images. When I saw I felt the patient is ill looking. Patient is a bit ill looking. It was all black. The face was black. Both hands were black. Dark so so I realized that patient's life is in danger. So that is the

Q: Why did you decide that the patient's life is in danger?

A: Because when you see him that all black patient is not opening his eyesnothing and also the position of the patient the way he was staying so look like I had a feeling like. Patient is suffering.

Q: What did you notice on his hands?

A: On the hands it was all dark like black.

Q: What do you mean by black?

A: Black means it is all burnt black in the sense the colour was black. So it's all burnt. That's what I noticed.

Hon. Chairman Janak de Silva

Q: So you were able to identify it as burn injury?

A: Yes.

Mrs. Nayana Seneviratne, Senior State Counsel

Q: Can you mention the telephone number that you have received the images?

A: I can't remember that number.

Q: Now we have been given your telephone details the document which had been already marked before this Commission as C661. By referring that document can you recall your memory and inform the Commission that the telephone number you have received those images of the patient?

A: I suspect I cannot confirm. I suspect this number 0778469250 should be the number I should have received but cannot 100% confirm.

Hon. Chairman Janak de Silva

Q: Can you repeat the number again?

A: 0778469250.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

Hon. Sunil Rajapaksa

Q: Is it international call or local call?

A: It should be a local call.

Mrs. Nayana Seneviratne, Senior State Counsel

Q: Witness you mentioned that you received a call from your friend Rilahon 27th August 2018 at 1.38 a.m. Is that correct?

A: Yes that's right.

Sir May I be permitted to mark that relevant entry.
May I mark it as C661A

Q: Dr. Safraz can you once again explain once you received the call from your friend thereafter you had received another call?

A: Yes according to this call history.

Q: Yes. That is at 1.53 a.m. through a number 0778469250.

A: Yes that's right.

Q: The images of the patient would have sent you through an application

A: I suspect

Q: another application through a viber or WhatsApp. In which media have you received those images?

A: It's WhatsApp.

Hon. Chairman Janak de Silva

Q: Witness is it your position that this call that is registered as at 1.53 a.m. on the 27th of August?

A: Yes.

Q: From telephone Number 0778469250 is the call by which these images of the patient were sent to you as claimed by you?

A: I cannot exactly say Sir because I don't remember but I suspect it should be the number.

Q: Let me ask you the question this way. After your friend's call that is Rilah's call at 1.38 a.m. on the 27th of August2018 did you receive a call from a local number that is from a Sri Lankan number?

A: Right. Now if you go through my statementsthree statements I would have told Rilah

Q: Don't refer to what you have told? Tell the Commission from your memory after Rilah's call did you get a call from a local number because this is a call that is made in the early morning?

A: Yes I don't remember these calls right. Rilah made me calls and then I remember like I received WhatsApp images and then I remember I am talking with Rilah. This is how I remembered all these while until I checked this call history. And when I checked this call history

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

surprisingly there were few calls in between Rilah's call. So I really don't remember what these calls are and what they talked with me. I suspect that this is related to that it looks bizzare but I don't want to make any sort of stories here. Because all this while I was telling Rilah's call, WhatsApp image, Rilah's call. But what are these calls? I don't really remember Sir. And that is the truth.You can do any amount of investigations I don't remember these calls. It could be I don't know I don't want to just guess anything. But honestly I don't remember.

Q: Witness you may answer the questions that we are posing you. You don't need to tell us where the investigations should be done and how it should be done.

A: Yes Sir, sorry.

Q: So we are asking you certain matters relating to certain factual situations and you can give us answers based on what you recall. If we ask you to explain then you can explain.

A: Yes Sir.

Q: As you recall how many calls did Rilahgive you on the 27th of August?

A: Two calls.

Q: That is all that you can recall?

A: Yes that I recall.

Q: In between those calls were there any local calls from Sri Lanka?

A: That I did not remember until I checked the call registry.

Q: Is it your position that in relation to this incident the only person that you spoketo is Rilah?

A: That midnight story I was thinking all thesewhileI only spoke with Rilah until I saw this call history.

Q: Witness when someone wakes you up in the middle of the night and early in the morning and then there are other calls made during that period let me finish the question don't those incidents stand out in the memory of a person?

A: Sir in my career I was disturbed so many nights. I usually receive lot of calls in the night. The on-call nights. And I wake up. Some time when I talk if it is not a very important thing it doesn't remain in the memory. So I don't know whether I did not give much weight to these calls. But what Rilah spoke I still can remember. But not these calls. I don't know why May be I didn't give any weight to these calls or somebody who is unknown to me.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

Mrs. Nayana Seneviratne, Senior State Counsel

Q: Witness may I draw your attention to the marked document C 661 you had received a call from the number 0778469250 at 1.53 a.m?

A: Yes.

Q: And that call had been last for 33 seconds?

A: Yes 35 no.

Q: 35 seconds.

Chairman Sir may I permitted to mark that the call entry as C661 B.

Q: Is it correct for me to say witness according to C hundred and sixty one C 661that you had received another call at 1.59 a.m. from the same number that is 0778469250 and that call had last for 270 seconds is that correct?

A: Yes that's correct.

Chairman Sir may I be permitted to mark that entry as C661C.

Q: Witness is it correct to say that you hadreceived another call from the same number?

A: Yes.

Q: That is from number 0778469250 at 2.05 a.m.and that call had last for 44 seconds?

A: Yes.

Chairman Sir may I be permitted to mark that call entry asC661D.

Q: Witness according to your telephone details you have received another callfrom the same number that is 0778469250 at 2.45 a.m?

A: Yes.

Q: And that has last for three minutes and five seconds?

A: Yes.

Chairman Sir may I be permitted to mark that call entry as C661E.

Q: Now witness can you explain this Hon. Commission what are those calls? From whom have you received those calls?

A: I already mentionedI don't remember. I couldn't recall these calls until I saw this call history. It was not in my memory. Otherwise in three statements I would have already told. I cannot say what I spoke if I can't even remember these calls.

Q: Witness do you know a person called Mr. Jeffry I.M. Jeffry?

A: No.

Q: Who is residing in Polonnaruwa, Kaduruwela area?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

A: No.

We have the Police Investigation Unit of this Commission had made inquiriesand had obtained a report from Dialog the subscriber of that number the person called Mr. I.M. Jeffry of 4/4, Manikkampitiya, Kaduruwelais the person who had the registered person for that number Sir. That is the very recent question that I posed that question to the witness.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

Time	-	4:00 p.m.
Stenography & Typed by	-	Nerupa De Silva

Senior State Counsel Ms. Nayana Seneviratne

Q: You said that after Rilahh's call that you had received some images?

A: Yes.

Q: Can you mention the number that you have received those images, through which number you have received those?

A: I don't remember.

Q: After Rilah's call and after you received those images did anyone contact you through a local number regarding the patient?

A: You mean in the morning time?

Q: During, whatever that day, whatever the time?

A: During the day time one local person contacted me.

Hon. Chairman

Q: Who was that person?

A: He introducedhimself..

Q: Who was that person?

A: Yes, he introduced himself as Rilah's friend calling regarding the patient Rilahspoke to you. That's how he introduced as I can remember he mentioned Muhammad but I actually told so many Muhammad are there I don't think that is his name.

So I will refer him as Rilah, Rilah's friend. That is how I remember Rilah's friend. The first call as I can remember could be Whatsapp call, yes Whatsapp call saying that they are taking this patient to the National Hospital. That is the following day I was at hospital working. And during that time I think I received that call saying that they are taking the patient tothe hospital.

Q: Witness normally you report to work around 8.00 clock in the morning?

A: Yes.

Q: So your first call about this patient comes around 1.30?

A: Yes.

Q: 1.34. And then you say that you get another call about him been taken to the hospital when you are at the hospital?

A: Yes.

Q: So it's a 7.00 hour period from the first call?

A: Yes.

President Secretariat's Copy

FAIR COMMENT BY JEZEEM

Q: So didn't you wonder why 7.00 hours has been taken to take the patient to the hospital?

A: Why should I, I was working. I was actually engage in hospital works a lot. And some body is telling that they are taking the patient here. They could have had some delay on the spot I don't know. Or I didn't even ask where this has happened. I didn't know where this has happened. But they are telling they are taking the patient to the National Hospital. So in my point of view I usually ok ask what is happening and the solution for that. So I gave the solution ok. Take the patient, get him to the accident service and admit. They will look after. They will do whatever that is necessary and that was the best advice I was able to give.

Q: You said that after you spoke to Rilah for the first time, you got certain pictures of the patient?

A: Yes Sir.

Q: You identified that the patient had burnt injuries?

A: Yes.

Q: What are the other injuries that you identified?

A: The hand injury was not much clear because it was all black and parts of the fingers were missing. So that was the one I noticed.

Q: What other injuries did you notice?

A: Facial injury.

Q: What was the facial injury that you noticed?

A: That was not very clear Sir in the image because it was all burnt and black. So in the image we could not identify exactly what is the injury.

Q: Was the whole face burnt?

A: Ah… most of the part of the face was black in the image yes.

Q: So that would have given you the indication that it was a serious injury?

A: Yes.

Q: A life threatening in injury?

A: Yes.

Q: And did you see any injuries in the eyes of the patient?

A: The eye area was black but I could not, cannot specify what could have been that.

Q: In which eye area was black? The right eye or the left eye.

A: In my memory it should have been the left side.

Q: So now by around 1.30 in the morning of the 27th of August 2018, you get this pictures which shows that the patient that your friend Rilah is speaking to you is with a life threatening condition? What was your advice?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

A: Take him to the hospital.
Q: To whom did you speak?
A: This message I am telling to Rilah asked them to take him to the hospital.
Q: So how many times did Rilah call you on the 27th of August?
A: Two times.
Q: So after having received the Whatsapp messages, did you call Rilah or did you wait till Rilah call you?
A: Rilah called me as I can remember. I think the call history also says.
Q: What time did Rilah call you?
A: Cannot recall the exact time ..

Senior State Counsel Ms. Nayana Seneviratne

Q: Witness according to the telephone details the documents which had been already marked as C-661, you had received you said that Rilah called you for the second time the same night?
A: Yes.
Q: According to the telephone details he had called you on 27th August 2018 at 2.25?
A: 2.25 yes.
Q: The call had been last 8 minutes and 26 seconds?
A: Yes.
Q: Can you mention the Rilah's number that you received the call from?
A: Yes, it is 966566284470.

May I be permitted to mark that telephone call entry as C- 661 F.

Hon. Chairman

Q: Are those only occasions on which Rilah called you on that day?
A: On that day yes.
Q: So according to your evidence by 2:25 a.m. on the 27th of August 2018 you have informed Rilah to admit the patient?
A: Yes I have told him to take the patient to the hospital and subsequently I am telling him this is a serious injury, which needs sophisticated treatment which might need sophisticated treatments. So and I am giving some examples like Batticaloa, Kandy or National Hospital. So these kind of hospitals only can handle facial and hand injuries. So that sort of information also I gave. So first I'm telling him that he has to take to the hospital but this need sophisticated treatment.
Q: Witness you wouldn't tell your friend to take him to any 3 hospitals without asking him where what is the closest hospital?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

A: Actually I did not ask. Thing is he is speaking from abroad and unless he tells I usually don't ask because I have already given a solution, take him to the hospital. So if I probe and ask a lot and that comes into my responsibility. So in my practice I usually give solution and once I have, I given the solution I don't go into too much detail and actually I did not ask and he also didn't tell.

Q: Is it your position that for a period of 8 minutes and 26 seconds that is all what you told Rilah?

A: Dear Sir this has happened, one year back. I remember the summary of what I actually talked. This is the message that I was able to recall what I talked with him actually. With very difficulty I recall after some time.

Q: Now you said earlier that Rilah was calling from Saudi Arabia?

A: Yes Sir.

Q: And then you told him to take the patient to Batticaloa, Kandy or Colombo hospitals because that is the, those are the hospitals that are equipped to treat the injuries ..

A: Sir,

Q: Can I finish the question and then you listen to the question and answer the question?

A: Yes Sir.

Q: Initially you said that you didn't know where the patient is. And that Rilah was speaking from Saudi Arabia. Then you are telling the Commission to told Rilah to take the patient to Batticaloa, Colombo or Kandy?

A: Sir,

Q: Let me finish the question, now if the patient was in Saudi Arabia you wouldn't be telling the patient to be taken to Colombo, Batticaloa or Kandy hospitals, am I correct? Am I correct? Will you answer the question first?

A: Yes Sir, yes.

Q: So when you told Rilah to take the patient to Batticaloa, Colombo or Kandy hospitals by that time you knew that the patient was in Sri Lanka?

A: Yes Sir, I know he is in Sri Lanka.

Q: How do you know that he is in Sri Lanka?

A: He told, Rilah

Q: So Rilah told you that the patient is in Sri Lanka?

A: Yes.

Q: So he wouldn't abrupt say that he is in Sri Lanka? He would have told you where the patient is?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

A: No Sir. He didn't tell where the patient was, I also didn't ask.
Q: Earlier you informed this Commission that you didn't ask where the patient was or you didn't know where the patient was?
A: Yes.
Q: But now you have admitted that you knew where the patient is?
A: No Sir. What I told I knew he is in Sri Lanka. But not the place Sir.
Q: That is when I asked you now, but earlier when we began asking you questions on about Rilah's call, you said that he was in Saudi Arabia and you didn't go to ask where the patient is? Isn't that what you say?
A: I said it's a patient from Sri Lanka Country.
Q: Your never said that. You when Rilah, when you were questioned very pointedly about Rilah's first call with you, you said that you didn't go in to details because as you in your own words I didn't want any trouble. And that you only told him to send some pictures?
A: Yes.
Q: Isn't that correct?
A: Yes.
Q: Now when we asked you about the 8 minutes 26 seconds call you appear to be saying that that time you knew that the patient was in Sri Lanka?
A: Yes.
Q: So the conversation between you and Rilah also touched on the location of the patient?
A: He told me that patient is in Sri Lanka. But not the place Sir.
Q: Right.
A: Yes.
Q: Let's keep it up at that point?
A: Yes Sir.
Q: Now what did Rilah tell you about the injuries of the patient?
A: He say it's a gas cylinder blast.
Q: But I thought you don't ask all these questions when look at the patient?
A: Sorry Sir.
Q: I thought that you don't ask too many questions when you are ..
A: But he said.
Q: He said?
A: He said yes.
Q: So when you saw the pictures of the patient?
A: Yes Sir.
Q: What were your observations?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

A: It was burn injury that I got to know. But I did not suspect any other injuries at that point honestly. The country was in a peaceful situation so I never thought that this sort of a thing he will bring to me. Secondly I trusted Rilah. He is very good friend of mine. Up to that point I have never suspected him. He is an Engineer by profession, he studied with me. I never thought that he will put me into trouble. Because I have helped him a lot he has helped him a lot. He has helped me a lot. So what make me to think at this point that Rilah will put me into trouble so I never thought?

Q: So we will take it that what you are saying is the truth, but you need to assist this Commission because a Commission has been appointed to carry out a certain mandate.

A: Yes Sir.

Q: And if you don't tell us exactly what happened you will not be helping in yourself?

A: I know.

Q: If you give the impression that you are hiding certain things from the Commission it's not good for your cause?

A: I know Sir.

Q: So now when I was questioning you just now you said that you never thought that Rilah would put you into trouble. Now do you know that you are in trouble?

A: That is why I am here.

Q: So tell us the true picture. We are not hunting against anyone, we want to know the truth. So this is the first opportunity and it may be the last opportunity. Where you can tell the truth?

A: Yes.

Q: So decide whether you want to grab the opportunity by telling us the truth?

A: Yes. Now Rilah calls me, tells that this is a cylinder blast and he tells it's a local person got injured. And then tells and then asked me what to do. Because I think I will be the best person for him to ask. So he asks me I trusted him. I did not query a lot. And then I asked the images. I received the images, and I am telling ok, this is a serious injury. Now this is Rilah's known person not Rilah or not very related to me. So I was also not very attached to this patient. So I didn't probe into this too much. And then I am telling ok, this patient needs hospitalization. You have to take him to the hospital as quickly as possible. As a friendly way I am telling him some examples of hospitals Batticaloa, Kandy, National Hospital, because those are the hospitals I worked and I know

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

in and outwhat facilities there, what's happening there? If they take this patient to a local hospital, some rural hospital this is a friendly advice not right medically. They will waste lot of time, transporting, ambulance, waiting time that and … so I am telling directly take to the hospital where the facilities available. And that was my advice, I still wonder why I didn't ask, he also didn't tell the place. And that is thetruth.

Q: When you get the call on the morning of 27th after you go to the hospital..

A: Yes Sir,

Q: You are told that the patient is still been transported to hospital?

A: On the morning next day at around 9.00 O'clock I am making a phone call. And that phone call could have been after the first call which I received from another number. Which is not the number in between Rilah's number. It's another number. A second number, I think first call should be a Whatsapp Call, saying that they are taking the patient to National Hospital next day morning. Or I don't know whether I have seen so many missed calls and called back, I really don't know. But I have called somebody the next day. Which the call history shows around 9.30 from another number, to another number. And asked what's happening, so the next day..

Q: Can I pause youthere Doctor? Now why would you call a number and an unknown number and ask what is happening. Because from what you told us earlier you wanted to have the least to do with situations like this because the more questions you ask according to your words the more trouble that you get to. So why would you call back again an unknown number?

A: Yes, maybe too many calls could be a doctor from hospital, because the next day I have to go there work so sometime another medical officer from another unit, could have been trying to contact me. They usually contact through hospital number but some time they can. That could have happen. The other thing is the first call other possibility is the first call could have been the Whatsapp call. So that I would know that number maybe.

Q: Doctor there is something that I can't understand. If another Doctor in the hospital want's to contact you, the natural thing to do would be to call on a normal line..

A: Yes Sir.

Q: Because taking a Whatsapp call is difficult because depending on thereception it's either you are able to through or you might not be able

President Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

to get through. But a call on a normal mobile service provider a will always be possible unless the other person is on a call. So why would a Doctor want to call you on a Whatsapp call?

A: Dear Judge, I told another number could have talked with me in Whatsapp, one possibility. Second possibility I would have seen missed calls from a normal local number, not the whatsapp calls. So either of this otherwise this number the second number is an unknown number. So I still don't know how I am calling for the first time to this number. So those are the two possibilities that I can think of in that particular day. Somehow I have got this number and I am calling. Either a normal missed calls which I should have seen. Or the first call could have been a whatsapp call. So that I have already got the number so I am calling maybe. I really can't recall how I got the number. But I am the first one to call that number. Which is again a surprisingly I have noted in the call history.

Q: Do you by now know the people that you have been interacting with?

A: No sir.

Q: You don't know?

A: No.

Q: Then why do you think that Rilah put you into trouble?

A: I don't know.

Q: No, you are saying that Rilah has put you in to trouble?

A: Yes.

Q: But you are also saying that you don't know the people with whom you have been interacting?

A: These people, the people, the patient we are actually coming to that later I think this patient is the one who is Zahran's brother the patient. So in that aspect only I am telling that I have been put into trouble.

Q: So when did you get to know that is it your position that the person about who's injuries you have been questioned by Rilah is Mohamed Zaharan's brother that you got to know about it?

A: Yes.

Q: When did you get to know about it?

A: After the incident Sir.

Q: After the incident when?

A: After the incident April 21st the blast and then subsequently images are coming up in the medias. And then I noticed Zafran and his brother's pictures are coming up. So that is the point I realized that the patient who was admitted in the hospital and the patient whom I have seen in the hospital are these people Saharan, Saharan's brother.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

Q: So you admit having seen Rilvan?
A: Rilvan yes.
Q: You say that, that is Saharan's brother?
A: Yes.
Q: You admit that Rilvan is the person about whom Rilah made inquiries about?
A: Yes.
Q: When did you meet Saharan for the first time?
A: Yes, he came to my home.
Q: When did he come to your home?
A: He came to my home on 2019 December. 2018 sorry. Sorry for that.
Q: Two thousand …
A: 2018 December.
Q: Where did he come? When did Saharan came to see you? Where?
A: Yes he came on 2018 December. He visited to my house with Rilah and 3 more people. I was intensively preparing for exam during that time. Because 2019 February my part II exam was there, so my only focus is to get through the exam. So I was working hard and then Rilah made me a phone call again. This is not from foreign number should be a local number. And he said I have come to the country I am here and he said he wants to meet me and also the patient who was admitted in the hospital is fine now getting better. Because I didn't not know what is happening to the patient. They didn't contact me after that. So he said they are fine. They wanted to know and ask few things. Like patient's medical issues and conditions. So I said I am preparing for exam bit busy. So I said ok, I will tell you a time. Then again I think another day he contacted me saying that we are in Colombo, we want to meet you, give us a time and the place. And I said ok, we will meet I am preparing for exam, in the discussions, our discussions usually finish around 9.30 in the night. Sorry around 9.00 in the night. So I said ok we will meet around 9.00 O'clock, 9.00 p.m. in the night at my house. I told him to come to my house. And he said ok. I will come there. Then at around 9.00 O' clock he called me ok, we are close to your house, I think I have shared location or something or send that address I can't remember now, they have arrived there and he made a call Rilah saying that they are around that region. I said,I have not finished yet I will be coming soon to house just wait hang around. I didn't want to send them to my house because my wife is there, usually Muslims ladies don't come out to the males. So she was there remaining wife and the kids. And I went there after about 15-20 minutes to house and then I gave a call to Rilah now I

Press Secretary's Copy

LAW COMMENT BY JEZEEM

am at house you can come. He came downstairs, made me a call, we have come. So because he was my good friend I went all the way down from my apartment on the road side. And I said ok you all come in. They came in a Van parked inside my house basement apartment and then people came out then Rilah introduced one fellow, one person he is Saharan Mawlavi. This is the first time I meeting him and I get to know he is Saharan Mawlavi. That is how he introduced. So in my view he was a Mawlavi but hereafter I will be referring he is Saharan, right? So Saharan got introduced to me. And I shook hand which I usually do and then I took them all the way to my apartment. That is in first floor I was also accompanying them and went in to our house. So we all sat, they all sat in the sofa, Rilah sat beside me I was sitting here and I asked then Rilah actually told he is Zaharan Mawlavi, his brother is the one who got treatment at National Hospital. And that is the point I know whoever whom I have seen at the hospital or whoever patient about him Rilah made the call is Saharan's brother. So Rilah told and then now I know who is Saharan. So they said and I asked how is your brother, is he fine? And he said yes, he is now recovering. Ok but still some wounds are there in the hand. Which is getting better. I can actually say what I remember right, in that incident. So said the woundsare there still it's getting better. Is there anything else that we have to do is there any medicine that we can put to heelit better quickly. Then I said ok don't think too much it will heel by itself, but if you have any problem you can meet either a plastic surgeon in private or else you can go to the plasticclinicat the National Hospital and they will do the necessary thing. I actually mentioned the consultant name also. Thushan Beneragama I said you can meet him and he will treat. And then he asked about the prosthesis for missing fingers. Is there any prosthesis available for missing fingers? Then I said not that I knowbecause I have not used in Sri Lanka. Prosthesis for missing fingers I have not seen. Still I have not seen. So I said I will ask and let you know. But I didn't ask anybody and I didn't even let him know. Because I forgot with the exam busy and everything and then he said his vision is still not very clear. So I asked what are you doing for the vision. Then he said they are being followed up at Eye Hospital. They are still going there. I said ok carryon that's the only thing I can say. That's not my specialty I cannot tell anything about that. And then he asked about the electronic prosthesis I think he has read through some internet finding out that electronic fingers are available. And he said is it true in India, it is available they say and I said not that I know I don't

FAIR COMMENT BY JEZEEM

know. Ok, so then in the meantime then again I talked with Rilah asking about the family things and things like that. The other three people they didn't talk much. They didn't introduced also. So I thought they are the relatives and my wife made tea and they brought lot of things like fruits and everything. And they said thanks for going and seeing this patient at the hospital. So then they had tea and ate some biscuits and went. So they stayedfor about 20-30 minutes maybe.So my wife I think she has also given the statement that she has seeing Rilah and Saharan at my house which I don't have to hide. And when I was asked the first time to at CID I told everything that I know. That's what I remember and I am repeatedly saying everything that I know I have told in this statement. Whatever that I could not recalled is the one remain I don't know. But I am telling the truth, everything that I know I have told. I want to make very very strong statement Sir. I did not influence any one regarding this patient's treatment at the hospital. I did not never influence anyone regarding this patient's treatment. I just saw and updated the condition of the patient to this relevant people. And that's what I did. That's what I should do at that point. I did not do any prescriptions to this patient, I didn't do any surgeries to this patient, I did not influence any doctors in the treatment of this person. This is a very strong statement. And on the same day when the patient was brought to the hospital I was operating in another theater. Which is I was doing a plastic surgery and I started that surgery around 9.55 a.m. It was a forearm cut. A multi-pletendon nerve everything was cut. The patient was transferred from Teaching Hospital Kandy. This news information I actually found out yesterday. Because I was wondering where I was on 27th August. And then I was looking the notes at each theater. The plastic theater. There are 3 plastic theaters in National Hospital. And two theaters I looked I was not there and then one theater I found that was there I was there I was operating. This surgery started 9.55 am it went on for about 6 hours.

Q: We will come to that point later, ok? Now you do admit having seeing Rilvan at the National Hospital when he was admitted on 2017 August. Sorry 2018 August. You didn't know the patient previously?

A: No Sir.

Q: The patient was in a grave situation if I may put it that way he had serious injuries?

A: Yes, I saw the patient at Neuro truma ETU.

Q: Yes.

A: ETU.

FAIR COMMENT BY JEZEEM

Q: And you see so many patients at the ETU at different places. When you saw a patient at the Trauma Unit of the ETU, how did you identify this person to be the person about whom Rilah spoke to you?

A: Right, before I saw the patient at Neuro truma ETU, the relevant Rilah's friend called me. Told that they were desperate to know what is happening to this patient.Because patient was in 79 and transferred to ETU. So they didn't know what is happening to this patient, so that's a usual scenario. So they started calling me please give us an update. And I asked where is this patient. They mentioned Neuro truma ETU and they mentioned the bed number also, which I don't remember now. So then I say ok, I will go there have a look and update you what is happening to this patient. And then I got a call anyway hospital call to see one patient in Neuro truma ETU. So I went and saw a patient the patient is not this patient. The patient which Rilah referring to. And then Neuro truma ETU doctor said there is another patient who is being looked after by plastic surgicalteam. Would you mind having look at that patient also and I said ok. We will see. And then I saw the patient the bed number was right and the injury pattern matches face and hand, gas cylinder blast so I identified ok, this is the patient Rilah spoke to me and his friend told me to see.

Q: How did you remember the bed number doctor?

A: He said, Rilah's friend.

Q: Yes, but what you said is that was a previous call..

A: Yes.

Q: But you went to the Neuro Unit ETU..

A: Yes.

Q: Because you were called to look at another patient..

A: Yes.

Q: So if you had not made a note of the, bed how did you recall that bed?

A: Sorry Sir, I didn't get the question.

Q: You said that you were informed by Rilah's friends?

A: Yes.

Q: That the patient is occupying a particular bed. Did you make a note of the bed?

A: I remembered the bed number ok. This Neuro trauma ETU this bed that patient is because usually very difficult to remember the names some time. So I asked the bed number in the ward what is the bed number and then I will go and see. I don't know whether they text me or whether Whatsapp may I don't remember. But I identified by bed number that information I remember.

President Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

Q: So how long after this call did you go and see Rilvan?

A: Ahh..that I don't exactly remember. But it is not so long from that call.

Q: Was there anyone near the bed when you went?

A: No. Patient was alone because it's ETU.

Q: Now when you met Saharan in 2018 December can you remember the date on which you met him?

A: No Sir, I can't remember the exact date when I met him.

Q: Can you remember the period that you met him?

A: That is 2018 December.

Q: It can be any date in December according to you?

A: Should be I think so.

Q: What was Saharan wearing?

A: He was wearing a Sarong and what you call that 'kameesa' or something a long dress and hat.

Q: The traditional Muslim hat?

A: Yes.

Q: Was his sporting a beard?

A: Yes.

Q: He was?

A: He was.

Q: Who were the other 3 people who were with him?

A: I don't know that because they didn't introduce. I can barely remember the picture but I don't exactly remember them. Because they did not speak. I was focusing talking with Saharan and Rilah.

Q: How many times have you met Saharan?

A: Only one.

Q: කොමිෂන් සභාවේ කටයුතු සවස 5.00 වන තෙක් කල් දමනවා සාක්ෂිකරු මෙම ශාලාවේ රැඳිය සිටිය යුතු අතර ඔහුට දුරකථනයක් භාවිතා කිරීමට අවසර නොදිය යුතුයි, ඔහුව මෙම කාමරයේ තබාගන්නා ලෙස නියෝගකරමි.

Continuing Ms. Sudhkshina…

President/Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM

Time: 5.00 p.m. – 6.00 p.m.
Date: 16.06.2020

Previous Notes taken by: Mrs. Nirupa de Silva
Notes taken by: Mrs. Sudakshina Berugoda

Commission commences after the break.

Witness affirmed

Hon. Chairman Janak de Silva

Q: Witness you said that you studied at Kalmunai?
A: Yes Sir.
Q: Can you refresh my memory by re-stating the school that you studied?
A: KM Al Manar Central College.
Q: KM Al Manar
A: KM means Kalmunai
Q: Kalmunai Al Manar Central College?
A: Yes.
Q: Right. Now Rilah was your contemporary from Grade 1 up to the A/Levels?
A: Yes Sir.
Q: And you studied together in the same class?
A: Most of the time yes in between sometimes we changed.
Q: So would it be correct to say that he was a very good friend of yours at school?
A: At school yes.
Q: You also said that you used to study with him or he used to come to your place to study?
A: Yes.
Q: Where did you live at that time?
A: We were living in Maruthamunai.
Q: Maruthamunai?
A: That is my hometown.
Q: And where was Rilah livingat that time?
A: Maruthamunai.
Q: Maruthamunai?
A: Yes.
Q: So you are from the same village as well?
A: Yes.

President's Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

Q: So you would have known him even before going to school?
A: Yes.
Q: Did you go to the same Madrasa?
A: No Sir. Different Madrasa.
Q: Different Madrasa? What is the Madrasa that you went to?
A: I went my grandfather was teaching. So there was a Madrasa with my grandfather's place.
Q: There was no name?
A: There was no name.
Q: Grandfather was conducting?
A: Yes.
Q: Where was he conducting?
A: It is close to my house which is situated in Makkamadi Road in our village.
Q: And Rilah used to go to another Madrasa?
A: I think so.
Q: What can you remember about Rilah's school days?
A: He was like everyone. I mean I didn't notice anything different. He studies a bit playful like not very serious guy. Having a lot of fun. He likes going trips and all. So that kind of a fellow.
Q: Was he from a rich family?
A: No.
Q: Middle class?
A: Middle class yes.
Q: And what were his parents doing?
A: His father was a Sinhala teacher. He teaches us Sinhala. His mother was a housewife.
Q: What do you mean when you say Rilah's father was a Sinhalese teacher?
A: He taught Sinhala at his house like he was not teaching in a school but he was conducting classes at house. At home.
Q: And that was his living?
A: Yes. That's what I remember in the childhood. I really don't know whether he had any other profession.
Q: So you described Rilah to be a playful kind of a person or sorry fun loving person?
A: Yes that's what I remember.
Q: Fun loving person who wanted to go out on trips?
A: Yes.
Q: Did he interact with people?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

A: Yes.
Q: Was your school a mix school or was it only Muslim boys and girls?
A: Boys and girls.
Q: Muslim boys and girls? What type of interaction did you have during your school days with children from other communities?
A: Other community in the sense we have Tamil students. No Sinhala students were there. So we had a good interaction with Tamil students even Rilah had.
Q: You mean to say that Tamil students used to attend the same School?
A: Yes.
Q: What did Rilah do for a living?
A: Sorry Sir?
Q: What did Rilah do for a living?
A: He was depending on his parents.
Q: Even after he got big?
A: After after you mean
Q: After A/Levels?
A: After A/Levels he was at the University and during that period he was depending on his parents.
Q: Which University did he?
A: He went to Peradeniya University.
Q: You mean to say that he did his Advanced Level examination and got entrance to the Peradeniya University?
A: Yes.
Q: In what language did he in what stream?
A: Maths.
Q: And around what point of time did you all enter the University?
A: It's around 2004, 2005.
Q: So that time you went to Jaffna and he went to Peradeniya?
A: He got through in the second shy I think so I was a bit earlier than him. Yes so may be 2005 or 2006.
Q: So once you all went to started to going to University did you all have further interaction?
A: Occasionally not like how we had interaction during school time. But occasionally he comes whenever he comes to village he visits me. When sometimes he comes to Colombo he visits to my quarters hostel that kind of a thing. Sometimes when I go to Peradeniya I might visit him.
Q: Did you at any point of time notice a change in Rilah's outlook?
A: Yes.
Q: When did you notice that?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

A: After he has gone abroad. That is exactly don't know remember when but soon after he finished his University he was working here for some time temporarily I think and then he went abroad.
Q: Which country?
A: Saudi Arabia.
Q: Around when?
A: I don't exactly remember Sir.
Q: Is it after 2010 or before 2010?
A: After 2010.
Q: After 2010?
A: Yes after 2010.
Q: And he was in Saudi Arabia for a long time?
A: May be three, four years.
Q: And during the period that he was in Saudi Arabia did he used to come down to Sri Lanka?
A: Yes.
Q: You interacted with him at that point of time?
A: Occasionally if he wants any medical help like his son got ill so because of that he interacted. But not that frequently.
Q: What is the change that you noticed in him?
A: Appearance he grew beard. And to me he was a bit religious, in the sense he what I saw during the school time was not the picture that I saw after that. So he was a bit religious. He prayed five times which he didn't do before as far as I can remember. So that kind of a change I noticed.
Q: And did you ask him about his change?
A: No actually I thought he is o.k. He is a bit religious. So that we sometimes we see in our people so I was initially bit happy o.k. He is kind of a coming into a responsible person rather than being playful.
Q: Is that the only change that you noticed in him?
A: Yes.
Q: Can you remember as to when he got married? You must have attended the ceremony?
A: No. I was a bit busy. I don't actually remember when but I didn't attend his wedding.
Q: But you were invited?
A: Sorry
Q: But you were invited?
A: Yes. I was invited.
Q: Where did the ceremony take place?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

A: Can't recall Sir.
Q: And where did he start living after getting married?
A: After getting married his house is there at Maruthamunai his wife's place which is close to my wife's house next house. But he did not live there for long because they went abroad they lived there. Time to time they come.
Q: So you must have known Rilah's wife also before she got married?
A: Same class she studied with me as well.
Q: All three of you studied together?
A: Yes.
Q: Did your wife also study with you?
A: No.
Q: So Rilah's wife that you knew from your school days what type of person was she?
A: She is just like normal like all other girls. She was also behaving normally. She was I would say normal.
Q: What's her name?
A: She is Fasia Banu.
Q: Fasia?
A: Banu.
Q: Banu. Was she an outgoing type of person when she was in school or was she an introvert or was she?
A: Yes. She is a kind of an outgoing girl. She was not a very isolated non-social she talks. She interacts with people.
Q: Did you change a notice in her after marrying Rilah?
A: No I did not notice anything.
Q: After they went to Saudi Arabia did you notice anything?
A: No after he went to Saudi Arabia if he comes we don't interact I don't interact with her after that. I mainly interact with him.
Q: But you must have seen her on few occasions after she came from Saudi Arabia?
A: Yes.
Q: Did she start wearing the Abaya?
A: Yes.
Q: She started wearing Abaya?
A: She was wearing but I don't know whether she started wearing after she has gone abroad or not.
Q: But you said that she was your schoolmate?
A: Yes.
Q: Was she doing at that point of time?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

A: No.

Q: No. As far as you can recall Rilah's wife was started wearing Abaya after she got married to Rilah?

A: Yes.

Q: What particular sect of the Muslim community do you belong to?

A: There is nothing like that. I don't particularly I can't say what group because I don't interact get into any groups.

Q: No you may have misunderstood what I asked. That's not I meant? What I meant is amongst the Muslim community there are different sects like Sufis, Sunnies?

A: So it's Sunni Muslim.

Q: You belong to the Sunni Muslim?

A: Yes.

Q: What about Rilah?

A: As far as I know I was also thinking that he is a Sunni Muslim.

Q: Now in addition to the traditional divisions of the Sunnis and the Shias in Sri Lanka there are different types of Muslim community. They also further divide themselves into different groups. To which group did Rilah get which group Rilah affiliated?

A: When I was here in Sri Lanka when he was here in Sri Lanka I did not see him affiliated to any such groups. But after he has gone abroad I really don't know whether he has affiliated with anything.

Q: But after he came down from Saudi Arabia you interacted with him?

A: Yes only few occasions.

Q: Only few occasions but he was your good friend from your school days?

A: Yes.

Q: Didn't he start talking about different sects in the Muslim community the way that you have to follow what you are told by the Quran or by the Hadees?

A: No Sir. Not to me because I was a bit busy also with studies for the postgraduate. We tend to meet very little. Once I have got into the postgraduate.

Q: So after Rilah came down from Saudi Arabia what type of dress was he wearing? Was there a change in it?

A: He used to wear even trousers, shirts he used to wear.

Q: As often as he did before going to Saudi Arabia?

A: Before he goes to Saudi Arabia I can remember he used to wear T-shirts and denims and things like that. But after that I didn't see that kind of wearing much.

Q: After he came back from Saudi?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

A: Yes.

Q: So would you say that Rilah changed quite a lot compared to the Rilah that you knew before he went to Saudi Arabia?

A: Yes.

Q: Are you quite certain that Rilah didn't talk about his religious understanding with you?

A: Yes.

Q: We are not asking about you?

A: Yes, yes I know, I know.

Q: We are not asking about you? So tell us recall and tell us what Rilah was after he came back from Saudi Arabia?

A: After he has come back from Saudi Arabia we didn't have such long meetings. So actually he we didn't have any sort of too many too much religious talks between us. I should be truthful so I don't want to create any stories.

Q: So don't worry about stories. Don't create stories you only need to tell us what you know. When you say what you know that's not a story. So that just a fact.

A: Yes Sir.

Q: What did Rilah think about non-Muslims?

A: I did not get any perceptions like he thinks about non-Muslim differently whenever I talk with him.

Q: When he was in school how did he think about non-Muslims?

A: When he was in school he was interacting with everyone. Even with Tamil students very well.

Q: So after he returned from Saudi Arabia did you see the same kind of interaction?

A: I did not notice. But to say that I was also involved in something so I cannot exactly say how much he was interacting.

Q: Aren't you aware that in the Muslim community in Sri Lanka there are groups like the Jamathe Islam?

A: Yes I am aware that there are groups like Jamathe Isami, Thawheed Jamath and Thablik Jamath those groups are there.

Q: What are the other groups?

A: Thawheed, Thablighi and Jamathe Islami these are the groups that I know.

Q: Are there a group called Salafis?

A: Salafis may be there. I am not much familiar with these groups. But these famous groups I know.

Q: A group called Ikhwan?

President Secretariat's Copy

FAIR COMMENT BY JEZEEM

A: Ikhwan?
Q: Yes.
A: I have heard the name.
Q: Are you aware that there are Muslim Mosques in the country dedicated to each group?
A: Yes in our areas there are few Thawheed Jamath Mosques that I know. Otherwise not much.
Q: Are your parents amongst the living?
A: My father passed away 2013. My mother is living. She is under my care.
Q: So when you were young you would have recalled what type of dress your mother was wearing? What did she use to wear?
A: Saree.
Q: Saree. In Kalmunai at that point of time how did the females dress there?
A: In my childhood they used to wear sarees most of the females. And young females they used to wear shalwari.
Q: When you say your childhood what is the time period?
A: O/Level, A/Level
Q: That's around 2005?
A: Yes before that.
Q: Before that up to 2000?
A: After that yes up to 2000 may be.
Q: Did it change after that?
A: Yes there was a bit of a change.
Q: What was the change?
A: Dresses people started wearing Abayas.
Q: What do you mean Abaya is that the dress where only the eyes can be seen?
A: No the face in my village they don't much cover the face. So the face was still visible.
Q: So when you say the Abaya it's where the head is covered and only the face?
A: Scarf and the Abaya but not the face.
Q: The full face can be seen?
A: Yes.
Q: But everything else is covered. That is what you mean by Abaya?
A: Yes.
Q: Can you tell us why this change took place?

President/Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

A: One thing is the religious meetings and activities also increased. Like people were emphasizing on not showing the body parts too much. In the sense the saree will show parts sometimes. So they started telling females can only show face and hands which is permitted which I believe yes it is permitted. So it is unnecessary to cover the face. That's my opinion.

Q: When you say that they started speaking whom are you referring to?

A: Like the groups may be the meetings Thawheed Jamath and may be even Thablik Jamath. The speeches in that religion emphasized on covering the body parts. So that doesn't mean that Abaya whatever the dress should cover the necessary things and then the trend was to start wearing Abaya.

Q: Any other reason why that trend changed in 2000?

A: Not that I can think of.

Q: Compared to your school days I am talking about pre 2000 and post 2000 what happened to the Mosques in the area? Was there a decrease? Was there an increase? And whatever is the answer what is the reason?

A: Yes there is an increase number of Mosques. The numbers have been increased. One possible reason is there were too many people started talking the religious activities. They might have they want to have sort of the religious places to themselves may be I don't know. But whatever it is the number of Mosques actually increased.

Q: From where did the funds to build those Mosques come? Was it local funding or was there foreign funding?

A: That I am not exactly sure. But from what the people talk you know the Thawheed Jamath could have got funds from abroad or Thablik could have got funds from abroad as well or even in our area they collect lot of money among the people. So that aspect is also there. Fund collection is there funds might be coming also.

Q: The way that you have been answering the questions you have given the impression that you don't belong to the Thablik or Thawheed?

A: Yes.

Q: Do you belong to the Jamathe Islam?

A: I have in my childhood I have attended few lectures held by Jamathi Islam. So once I have come into this University and my Postgraduate career with the busy thing and all I didn't have time to go and interact with them.

Q: You mean to say that you took part in the activities of the Students Movement of the Jamathe Islam?

A: Yes.

FAIR COMMENT BY JEZEEM

Q: Students' movement of the Jamathe Islam?
A: Yes.
Q: Generally the Students' Movements have workshops of two days three days five days or like that. Am I correct?
A: Yes, yes.
Q: What type of workshops did you take part? Five day workshops or ten day workshops?
A: As far as I can remember I have gone to sort of like trips with few people in our village. But apart from that I don't remember anything which I have attended.
Q: When you went on these trips with Jamathe Islam students' Movement there were people who came from other areas on these trips?
A: Yes.
Q: And these workshops that you refer to sometimes took place out of your home town also?
A: Yes.
Q: During that period were you able to interact with the people who came from outstations or it was just a case of you only knowing the people that you went with from that?
A: We were able to interact.
Q: Were you able to identify the other people who came from different areas?
A: Yes.
Q: Their names were shares and?
A: Yes, yes.
Q: Who were the lecturers at these workshops?
A: These workshops in our village there were few Maulawi. So in we were going from our region. So few Maulawi were there and they did some lectures.
Q: Who were the people who came from outside your area for these workshops, the leaders, the people who came and lectured?
A: Only once I have noticed this is not the trip Hajul Akbar he has visited to our Mosque and has conducted some programme one day programmes like that.
Q: When you refer to Hajjul Akbar he is the person who was the President of Jamathe Islam for 24 years?
A: President of Jamathe Islam yes.
Q: At these workshops what type of contents were there at the workshop? What were your lectures dawn on the workshops?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

A: They were emphasizing on how to be how we have to be like a good person that's what I remember from my childhood. And then when I have come back into my education stream I did not interact much so from the childhood memories what I would say is they actually directed into a good way that's what I remember. I don't know what others say. Because it may be the reason why I am not a drug addict. It may be the reason why I am not going behind the girls. It may be the reason why I want to help others. So in my opinion I was thinking that there should be something somebody guiding the people. That's the impression I got during that period. Right they are actually guiding the people for without doing wrong things. That should be the motto of these groups.

Q: You can't remember the contents of the workshops that you attended?

A: No Sir.

Q: At least the topics what are the areas? Was it on sports? Was it on leadership? Was it about education?

A: What I can remember that they were talking about purifying how pure you should be those kind of things. You have to be a pure person without harming to the others. So those are the important aspects that I actually remember I am actually practicing that in my patients. I never let down any of my patients.

Q: How long were you with the Jamathe Islam Students' Movement?

A: That was during my childhood on and off I was going there so that may be until I go to the University.

Q: And what is this school where you were or the place where the where you were exposed to the Jamathe Islami ideology?

A: It's our home town Maruthamunai.

Q: It's a large area there must have been a particular place School like thing or something?

A: Yes there is an office also for that.

Q: There is a Jamathe Islami office in Maradagamula?

A: Maruthamunai.

Q: Maradamulla and that's where you were exposed?

A: Yes.

Q: Now you were a good friend of Rilah's even at that point of time?

A: Yes.

Q: Didn't Rilah join you in this Jamathe Islami?

A: During those period he was not into this track like we were somehow going more towards praying and like that. And he was a bit more of fun type of guy. And that's what I remember in the childhood period.

Q: So he was not involved in Jamathe Islam activities?

President's Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

A: Not that I remember.
Q: Was he involved in Thablik Jamath activity?
A: No. But his father was a bit a more towards Thawheed Jamath that I recall a little bit.
Q: Rilah's father was more towards Thawheed Jamath? Was there a Thawheed Jamath Office in Maradamulla?
A: Yes, yes.
Q: Was there a Thablighi Jamahth office in Maradamulla.?
A: There was no. But they conduct everything in the Mosque.
Q: So the Thablighi Jamath Movement conducts everything in the Mosques?
A: Yes.
Q: Whereas the Thawheed Jamath Movement has offices outside the Mosques?
A: Yes.
Q: Do they have offices in Mosques as well?
A: Yes.
Q: Thawheed Jamath people?
A: Yes.
Q: So in Maradamulla were there Mosques that were established by the Thablighi Jamath group?
A: Not that I know of.
Q: Mosques that were established by the Thablighi Jamath?
A: No. But they have somehow got some of the Mosques under their custody that means their people they frequently go and they used to worship there. So they used to conduct their programmes in the Mosque.
Q: So who which group has got certain Mosques into their control?
A: Thablighi Jamath has. Thawheed Jamath has.
Q: Both Thawheed Jamath and?
A: Yes.
Q: From whom did they get control of the Mosques?
A: That I am not exactly sure.
Q: Doctor when you say you can be frank you have been quite frank so far so why don't you say when you say it has been taken over from somebody there must be somebody who was having power in that Mosque?
A: What do you mean Sir?
Q: You said that Thablighi Jamath and Thawheed Jamath people have taken control of certain Mosques in your area?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

A: Yes.
Q: So who were in control before that?
A: No, no. Thablighi Jamath were having some of the Mosques they were using which from the childhood I know they were using. So I really don't know from where they inherited. And Thawheed Jamath had some of the Mosques which actually they built it. So that's what I remember.
Q: Right. From where did they get the funds to build the Mosque?
A: That I am not sure.
Q: Are any of those Mosques named after foreign persons?
A: Not that I remember Sir.
Q: Are they named after Sri Lankan Muslims?
A: They those names I don't think those are referring to particular person.
Q: Now the Mosques that the Thablighi Jamath and the Thawheed Jamath people have do they have tombs of Saints?
A: Not in my area. But in if you go to Beruwala and those regions you we can see the tombs.
Q: But when you refer to Mosques in Beruwala having tombs are you saying that those Mosques with tombs belong either to the Thablighi Jamath or Thawheed Jamath?
A: No.
Q: To whom do they belong?
A: They we call Tharka. That's what we call. And they have the tombs and all and we don't most of our people don't agree with that.
Q: Having tombs?
A: Having tombs in the Mosques.
Q: When you say most of the people don't agree that means?
A: In our region.
Q: In your region. You also are of the same way?
A: Yes.
Q: Now with regard to the way in which the Muslim community in Sri Lanka takes decisions who decides for the Muslim community?
A: Community doesn't listen to anyone. That means I don't think anyone has the upper hand in the community. Now, now officially what do you call the Ulama Society All Ceylon Jamiyyathul Ulama yes they are the ones most of the time make certain decisions. But I don't know whether community agrees to all the things that is taken by All Ceylon Jamiyyathul Ulama. But they are the official body. So when it comes to festival, moon sighting those things the community depends on their decision. But when it comes to other political things some other people.

President Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM

When it comes to religious things some other people. So still there is no perfect unity in the community.

Q: But wouldn't it be correct to state that for a long time All Ceylon Jamiyyathul Ulama Organization was the organization that the Muslim community was looking up to?

A: Yes.

Q: in order to give them guidance?

A: Yes.

Q: According to you that changed at a particular point in time?

A: Yes may be the influence of different groups.

Q: Yes. What are the groups that influenced All Ceylon Jamiyyathul Ulama which made the Muslim community as a whole not rely on the All Ceylon Jamiyyathul Ulama for leadership?

A: All Ceylon Jamiyyathul Ulama also contained lot of leaders who are coming from different groups.

Q: Like what?

A: Like Thablighi Jamath

Q: And?

A: Thablighi Jamath.

Q: Thawheed Jamath. And you said that some Mosques were taken over by Thablighi Jamath and Thawheed Jamath?

A: Yes.

Q: Was the All Ceylon Jamiyyathul Ulama also at one point of time taken over by those two groups?

A: Jamiyyathul Ulama does not act like this group.

Q: No that's not what I meant. If I may clarify what I meant Jamiyyathul Ulama Organization has a particular number of members. So who holds the majority of the membership now? Is it that the traditional Muslims? Or is it Thablighi? And Thawheed Jamath taken together? Is it Jamathe Islam? Who holds the majority?

A: I am not sure about the members who are there in the

Q: No you may not be sure because of course you are a very busy person you have other better things to be involved in. But what does the Muslim community say as to who is in control?

A: Community doesn't point out to a particular person still, particular group who is in control. That is why I am telling that the community still doesn't have a leadership.

Q: Then why is it that according to you the Muslim community in Sri Lanka at one point of time look to the All Ceylon Jamithul Ulama for leadership but then later have stopped doing that? Why is that?

Registrar/Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

A: May be All Ceylon Jamiyyathul Ulama is not conducting too many things to guide the people. So that the other groups might have taken the opportunity.

Q: Are you saying that before this change you referred to All Ceylon Jamiyyathul Ulama was active and gave the leadership role to the Muslim community. But now that leadership is not there and groups like Thablighi Jamath and Thawheed Jamath have started to giving leadership?

A: No Sir no. I actually did not have an impression like All Ceylon Jamiyyathul Ulama was guiding in the particular religious matters like they were guiding in other decision making. But not the way how a human behaves. This is different. They were telling about how to pray and things like that. But as a human how to behave and that aspect Jamiyyathul Ulama my personal opinion did not look into too much. So that is where it's a mind thing. So Jamiyyathul Ulama would have told how to do what to do where to go what to go how many times to pray, went to pray things like that. But how a human should behave is the important thing that have to pointed out there. And that guidance I think is given by various groups.

Q: So the guidance that should be given to a human being when I say human being it's an obvious reference to the Muslim community. You say that the All Ceylon Jamiyyathul Ulama stopped giving that guidance at one particular point of time?

A: I wouldn't say stop. But their Agenda is less on that aspect.

Q: Now how a human being should behave as far as a Muslim community is concerned. Is set out in the Hadees Am I correct?

A: Yes.

Q: The Quran is not focusing on human behaviour per said?

A: What I believe is

Q: No not what you?

A: O.k. The religion should guide the behaviours of the human.

Q: No, no you know the question that I am asking you are wondering whether to answer it or not? The Hadees is very clear. That it is the way of life that a Muslim should follow. Am I not correct?

A: O.k. yes.

Q: When you say All Ceylon Jamiyyathul Ulama was not speaking to the Muslim community in the way that they should be behaving it means that the All Ceylon Jamiyyathul Ulama was not focusing on giving predominance to Hadees?

A: Yes.

FAIR COMMENT BY JEZEEM

Q: Yes whereas the Thablighi Jamath and Thawheed Jamath appears to be giving prominence to the Hadees?

A: Yes.

Q: You admit that?

A: Yes.

Q: O.k. thank you Doctor.

Hon. Chairman Janak de Silva

It has been a very long day. we have four other witnesses whom we have summoned. We will call you again on a very short date in the future. So your evidence is not concluded. So we will give you notice when you are being called again.

Thank you very much for coming.

Witness

Sir May I make a small note here? I am a surgeon. So my when I am working I have to concentrate and focus. Since this incident I am fighting against this. You can understand my feelings and the stresses that I am going through. The only hope that I have is the truths wins always. So please I request you that I should continue my career. And with the freedom of mind otherwise it is difficult to focus on any surgery and it is going to be a failure in my career. So as the respectful Judges I request that whatever the decision that is that should make me prison even if I am imprisoned doesn't matter. But if I am wondering here and there that is not right for my career. And not right for my patients. So I understand that you will understand that.

Hon. Chairman Janak de Silva

To put your mind in ease Doctor this Commission can't send anyone to prison by ourselves. So that is for your information. We have been appointed by the President to give recommendations on certain areas that he has identified. And once we finish sitting and leading evidence we will make the recommendations to His Excellency the President. Whether he makes it public or not it is a matter entirely within his control. We only make recommendations to the President. We can't send anyone to prison. Only based on the evidence that have been said. So we will ensure that your balance portion of the evidence is concluded as soon as possible.

President's Counsel's Copy

LAW COMMENT BY JEZEEM

Witness
O.k. Sir. Thank you very much.

Hon. Chairman Janak de Silva
Thank you very much.

****

I read and understood the above statement and accepted this statement as correct and signed it.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය: 2020.06.16 වේලාව: ප.ව.06.05 යි.
සටහන් කළේ ල/ලේ - මුතුමාලි

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා -සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

පෙනී සිටීම:-

* අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, චතුරංග බණ්ඩාර මහතා, දිලන්ත එස්.කළුදුරුවගේ මහතා සහ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලු මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සාක්ෂි අංකය	:	**803**
නම	:	**මාගලගේ සරත් පෙරේරා**
වයස	:	**අවුරුදු 58 යි.**
ආගම	:	**බෞද්ධ**
රැකියාව	:	**ප්‍රධාන පොලිස් පරීක්ෂක, ස්ථානාධිපති**
ලිපිනය	:	**සිවිල් ආරක්ෂක බලකාය**

සාක්ෂිකරු ප්‍රතිඥා දී කැඳවයි.

<u>රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය</u>

ප්‍ර : ඔබ 1986 මැයි මස 05 වෙනි දින ශ්‍රී ලංකා පොලිස් සේවයට ආධුනික උප පොලිස් පරීක්ෂකවරයෙකු වශයෙන් බැඳුනා කිව්වොත් නිවැරදිද?

පි : නිවැරදි ස්වාමිනි.

ප්‍ර : ඉන් අනතුරුව ඔබට පොලිස් පරීක්ෂක තනතුරට සහ ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරට උසස් වීම් ලැබුණේ කවදාද?

පි : ස්වාමිනි මම පොලිස් පරීක්ෂක තනතුරට 1996 ජනවාරි 01 වෙනිදත් 2006 ජනවාරි 01 වෙනිදා ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරටත් උසස් වීම් ලැබුණා ස්වාමිනි.

ප්‍ර : ඔබ ඔබගේ සේවා කාලය තුළ යම් අවස්ථාවකදී ස්ථානාධිපති පොලිස් ස්ථානය මරදාන යන තනතුරෙහි සේවය කරනු ලැබුවාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එසේ සේවය කළ කාලය ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්න?

පි : ස්වාමිනි 2014 ජූනි මාසේ 15 වෙනිදා සිට 2019 සැප්තැම්බර් මස 16 වෙනිදා.

ප්‍ර : ඔබ මීට අමතරව සේවා කරලා තිබෙන සේවා ස්ථාන සම්බන්ධයෙන් ඉතා කෙටියෙන් ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්න?

පි : ස්වාමිනි මම ස්ථානාධිපති දෙණියාය වශයෙන්, ස්ථානාධිපති කහතුඩුව වශයෙන්, ස්ථානාධිපති වංචා විමර්ශන කාර්යාංශයෙන් ඒ වගේම ස්ථානාධිපති දමන, මූලස්ථාන පොලිස් පරීක්ෂක කැබිදිගොල්ලෑව වශයෙන් ක්‍රියාත්මක කළා උතුමාණනි.

ප්‍ර : ඔබ 2019/09/16 වන දින මරදාන පොලිස් ස්ථානයෙන් ස්ථාන මාරුවීම ලබන්නේ කොහේටද?

පි : ස්වාමිනි මම ස්ථාන මාරුවීම ලබන්නේ ස්ථානාධිපති බස්නාහිර පළාත් බුද්ධි කොට්ඨාශයට.

ප්‍ර : එම සේවා ස්ථානයේ ඔබ කොපමණ කාලයක් සේවය කළාද? කවදා වෙනකම් ඔබ එහි සේවය කළාද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ස්වාමිනි මාස 04 ක විතර කාලයක් පමණයි.

ප්‍ර : 2020 ජනවාරි වන තෙක් ඔබ එම ස්ථානයේ සේවා කළා කිව්වොත් නිවැරදිද?

පි : නිවැරදි ස්වාමිනි.

ප්‍ර : දැන් ඔබ පොලිස් ස්ථානය මරදානේහි ස්ථානාධිපති වශයෙන් කටයුතු කිරීමේදී මරදාන පොලිස් ස්ථානයට අනුයුක්තව තිබූ යම් පොලිස් මුරපොළවල් තිබුණාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මොනවාද ඒ තිබුණු පොලිස් මුරපොළවල්?

පි : ස්වාමිනි කොළඹ ජාතික රෝහලේ පොලිස් මුරපොළක් තිබෙනවා ඒ වගේම මාළිගාකන්ද උසාවියේ පොලිස් මුරපොළක් තියෙනවා ස්වාමිනි.

ප්‍ර : කොළඹ ජාතික රෝහල තුළ තිබෙන්නේ එක් පොලිස් මුරපොළක් පමණයිද?

පි : අධිකරණ මෘත ශරීරාගාරයෙත් පොලිස් පොස්ට් එකක් විදිහට තියෙනවා නමුත් පාලනය වෙන්නේ පොලිස් මුරපොළ ජාතික රෝහලේ තියෙන මුරපොළෙන් ස්වාමිනි.

ප්‍ර : ඔබ ඔය මෘත ශරීරාගාරය අසළ තිබෙන පොලිස් මුරපොළ වශයෙන් අදහස් කරන්නේ අධිකරණ වෛද්‍ය නිලධාරී කාර්යාල පොලිස් මුරපොළද?

පි : නිවැරදි ස්වාමිනි.

ප්‍ර : එම මුරපොළත් ඔබ සඳහන් කරන ආකාරයට කොළඹ ජාතික රෝහලේ පොලිස් මුරපොළ විසින් පාලනය කරනු ලබන මුරපොළක්?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එයින් අදහස් වෙනවාද මෙම මුරපොළවල් දෙකටම අදාළව එකම නිලධාරී කණ්ඩායමක් සේවය කරන බවට?

පි : එහෙම අදහස් වෙන්නේ නෑ ස්වාමිනි.

ප්‍ර : එසේ නම් මරදාන පොලිස් ස්ථානයෙන් කොළඹ ජාතික රෝහලේ පොලිස් මුරපොළ වෙත වෙනම නිලධාරී කණ්ඩායමකුත් කොළඹ අධිකරණ වෛද්‍ය නිලධාරී කාර්යාල පොලිස් මුරපොළට වෙනත් නිලධාරී කණ්ඩායමකුත් යොමු කරනු ලබනවාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එම යොමු කිරීම සිදු කරනු ලබන්නේ කවුරුන් විසින්ද ?

පි : ස්වාමිනි ඒක ස්ථානාධිපති මරදාන විසින් තමයි ඒක යොමු කිරීම සිදු කරන්නේ.

ප්‍ර : යම් පදනමක් තියෙනවාද එලෙස යොමු කිරීම සඳහා?

FAIR COMMENT BY JEZEEM

පි : ඒක ස්වාමිනි විශේෂයෙන්ම ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කොළඹ මධ්‍යම තුමා විසින් තමයි ඒ ස්ථානාධිපති මුරපොළ නම් කිරීමක් සිදු කරනු ලබන්නේ ස්වාමිනි.

ප්‍ර : නෑ මහත්මයා මම ඇහුවේ දැන් ඔය කොළඹ ජාතික රෝහලේ පොලිස් මුරපොළට සහ අධිකරණ වෛද්‍ය නිලධාරී කාර්යාල පොලිස් මුරපොළ වෙත නිලධාරීන් යොමු කරන විට තෝරා ගන්නා ලබන නිලධාරීන් සම්බන්ධව යම් පදනමක් තියෙනවාද? යම් පදනමක් මතද එම යොමු කරනු ලබන නිලධාරීන් තෝර ගන්නේ?

පි : එහෙමයි ස්වාමිනි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් තමයි බොහෝ දුරට යොදා ගන්නේ.

ප්‍ර : ඒ අනුව මෙම මුරපොළවල් දෙකම තිබෙන්නේ ස්ථානාධිපති මරදාන යන නිලධාරියාගේ අධීක්ෂණය යටතේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : 2018 අගෝස්තු මාසේ වන විට එම අධීක්ෂණ තනතුර හෙබවුයේ ඔබ විසින්?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මහත්මයාට ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්න පුළුවන්ද කොළඹ ජාතික රෝහලේ පොලිස් මුරපොළට අදාළව ඔබ විසින් හෝ වෙනත් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු විසින් ඔවුන්ගේ රාජකාරී කටයුතු සිදු කර ගෙන යා යුතු ආකාරය සම්බන්ධයෙන් වක්‍ර ලේඛ හෝ ස්ථාවර නියෝග හෝ යම් ලේඛනමය උපදෙස් ලබා දී තිබෙනවාද?

පි : ලබා දී තිබෙනවා ස්වාමිනි.

ප්‍ර : මොනවාද ඒ ලබා දී තිබෙන උපදෙස්?

පි : ස්ථානාධිපති විදිහට ස්වාමිනි මා ස්ථාවර නියෝග ඉදිරිපත් කරලා තියෙනවා. ඊට අමතරව සහකාර පොලිස් අධිකාරි මධ්‍යම තුන යටතේ තමයි මරදාන පොලිසිය පාලනය වෙන්නේ. එතුමා විසිනුත් විශේෂ උපදෙස් පත්‍රිකා නිකුත් කරලා තියෙනවා. ඊට අමතරව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කොළඹ මධ්‍යමතුමා විසිනුත් මේ ස්ථාවර නියෝග ඉදිරිපත් කරලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර : ඔබගේ සේවා කාලය තුළ ඔබ විසින් කොළඹ ජාතික රෝහලේ පොලිස් මුරපොළ වෙත ස්ථාවර නියෝග කීයක් ලබා දී තිබෙනවාද?

පි : ස්වාමිනි මම ස්ථාවර නියෝග දෙකක් ඉදිරිපත් කරලා තියෙනවා.

ප්‍ර : එහි යම් යොමු අංක තිබෙනවාද?

පි : ඔව් ස්වාමිනි 2018 එකකුත් අංක 01 2018 වශයෙනුත් අංක 01 2017 වශයෙනුත් ස්ථාවර දෙකක් ඉදිරිපත් කරලා තියෙනවා ස්වාමිනි.

Registrar Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : අංක 02 පැහැදිලි නෑ නැවත සඳහන් කරන්න?

පි : අංක 01/2017 වශයෙන්.

ප්‍ර : අනිත් එක?

පි : අනිත් එක අංක 01 2018 වශයෙනුත් ස්වාමිනි.

ප්‍ර : 2017 සහ 2018?

පි : නිවැරදි ස්වාමිනි.

(ගරු මැතිතුමනි මේ අවස්ථාවේදී අදාළ ස්ථාවර නියෝග පිළිවෙලින් C 662 සහ 663 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා.)

ප්‍ර : දැන් මහත්මයා මෙම ස්ථාවර නියෝග මඟින් දක්වා තිබෙනවාද කොළඹ ජාතික රෝහලේ පිහිටුවා තිබෙන පොලිස් මුරපොළේ සිටින නිලධාරීන් විසින් ඔවුන්ගේ රාජකාරිය සිදු කළ යුතු ආකාරය සම්බන්ධයෙන්?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් මෙම ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්න එම නිලධාරීන්ට පැවරී තිබෙන රාජකාරී මොනවාද?

පි : ස්වාමිනි එම ස්ථානයේ විශේෂයෙන්ම අධිකරණ කටයුතු සඳහා අදාළ වෛද්‍ය වාර්තා ලබා ගැනීම, ඒ වගේම හදිසි මරණ පරීක්ෂණ සඳහා සහ පශ්චාත් මරණ පරීක්ෂණ සඳහා අවශ්‍ය කරන රෝහලට අවශ්‍ය කරන සහාය ලබා දීමත්, ඒ වගේම රෝහලේ ආරක්ෂාවත් ලබා දීමත්, ඒ වගේම අධිකරණ වෛද්‍ය පෝරමය ලබා ගැනීමේ කටයුතුත් වගේ දේවල් සිදු කෙරෙනවා ස්වාමිනි.

ප්‍ර : ඔබ සඳහන් කරන්නට යෙදුණු අධිකරණ වෛද්‍ය පෝරම නිකුත් කිරීම් යන කාර්යය සිදු වෙන්නේ මොන ආකාරයෙන්ද?

පි : ස්වාමිනි අපි කියමු රෝගියෙක් රෝහල් ගත වුණා කියලා හදිසි අනතුරු ඒකකයට. ඊට පස්සේ මේ රෝගීයා ඇදහිසපත් අංකය යටතේ ඇතුල් වුණාට පස්සේ මේ රෝගීයාගේ විස්තර වෛද්‍ය නිර්දේශ සමඟ පොලිස් මුරපොළ වෙත එවනවා. එවන්නේ ඒ අදාළ වාට්ටුවේ කාර්ය මණ්ඩලයේ එක්කෙනෙක් සහ ඊට අමතරව සමහර වේලාවට මේ රෝගීයාත් එන අවස්ථා තියෙනවා. සමහර වේලාවට මේ රෝගීයාගේ භාරකාරයා හෝ ඥාතීයෙක් පැමිණෙනවා මේ පොලිස් මුරපොළ වෙත.

ප්‍ර : දැන් ඔබ ආකාර තුනක් සඳහන් කළා රෝගියෙකුගේ ඇදහිසපත සමඟ පැමිණිය යුතු එනම් එකක් රෝහල් කාර්ය මණ්ඩල සේවකයෙකු පැමිණිය හැකියි?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එසේත් නැත්නම් රෝගියෙකු විසින්ම ඔහුගේ ඇදහිස පත රැගෙන පැමිණිය හැකියි?

පි : එහෙමයි ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එසේත් නැත්නම් රෝගියෙකුගේ භාරකරුවෙකු හෝ ඥාතියෙකු විසින් එම අදාළ ඇදහිසපත රැගෙන පැමිණිය හැකියි?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : රෝහල් කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකු විසින් රෝගියෙකුගේ ඇදහිස පතක් රැගෙන පොලිස් මුරපොළට ආවහොත් ඒ සම්බන්ධව අධිකරණ වෛද්‍ය පෝරම නිකුත් කිරීමේ ක්‍රමවේදය මොකක්ද?

පි : ස්වාමිනි සමහර දැන් රැගෙන ආවාට පස්සේ විශේෂයෙන්ම සාමාන්‍යයෙන් බරපතල ගණයේ තුවාල වලට අනිවාර්යෙන්ම රෝහල්පතක් වෛද්‍ය පෝරමයක් නිකුත් කරනවා. ඊට අමතරව සමහර දේවල් තියෙනවා නිවස තුළ වෙච්ච අපරාධයක් නොවන ඒවාත් එනවා. ඊට පස්සේ මේකේ රෝහල් පතේම දාලා තියෙනවා Refer to police post නැත්නම් පොලිස් රෝහල් පතේම සටහන් කරලා එවනවා මේ රෝහල් පොලිසියට.

ප්‍ර : වෛද්‍යවරයා විසින්?

පි : වෛද්‍යවරයා.

ප්‍ර : එම සටහන යොදන්නේ?

පි : යොදන්නේ.

ප්‍ර : දැන් රෝහල් කාර්ය මණ්ඩලයේ කවුරුන් හෝ නිලධාරියෙක් එම ඇදහිසපත රැගෙන ආවොත් ඒ සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍ය පෝරමයක් නිකුත් කරනවාද?

පි : ඔව් ඒක හුඟක් දුරට නිකුත් කරනවා. සමහර අවස්ථාවල තියෙනවා හඳුනා ගත් ඒ කියන්නේ අපරාධයක් , නඩුකරයක් පවත්වාගෙන යන්නේ නැති නිවස තුළ වෙච්ච සිදු වීමක් වගේ දෙයක් හඳුනා ගත්තොත් ඒ කියන්නේ සැකකරුවෙක් නොවන සැකකරුවෙක් සම්බන්ධයක් නැති එකක් වුනොත් ඒ වගේ වේලාවට අධිකරණ වෛද්‍ය පෝරමයක් නිකුත් කරන්නේ නෑ ස්වාමිනි.

ප්‍ර : දැන් සාක්ෂිකරු කොහොමද හඳුනා ගන්නේ රෝහල් කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකු රැගෙන ආවහාම යම් රෝගියෙකුගේ ඇදහිසපතක් එම රෝගියාට එම තුවාල සිදු වූ ආකාරය සම්බන්ධයෙන් ඒවා ඒ අවස්ථාවේදී කොහොමද හඳුනා ගැනීමක් කරන්නේ මේ නිවසේදී සිදු වූ දෙයක්ද එසේත් නැත්නම් මෙය අපරාධයක් නොවන සිදු වීමක් ද කියලා කොහොමද හඳුනා ගැනීම කරන්නේ?

පි : ස්වාමිනි හුඟක්ම මේ වෛද්‍ය නිර්දේශය මත තමයි ඒක පවතින්නේ. ඊට පස්සේ මේ රෝගියාට එන්න බැරි අවස්ථාවල් වලදී මේ අපේ නිලධාරියා යනවා අදාළ වාට්ටුවට. ගිහිල්ලා පරීක්ෂාවට ලක් කරනවා. එසේ වුණු තැන මේ රෝහල් කාර්ය

FAIR COMMENT BY JEZEEM

මණ්ඩලයත් සමඟ පැමිණෙන සමහර රෝගීයාගෙන් කෙළින්ම විස්තරය අහනවා මොකක්ද වුණේ මේ කියලා එහෙම නැත්නම් එයාගේ භාරකාරයාගෙන් හෝ ඥාතීයාගෙන් විස්තර දැන ගන්නවා මේක කොහොමද වුණේ ඊට පස්සේ ඒ ගොල්ලොන්ගෙන් විමසීමක් කරනවා චූදිතයෙක් නැති එකක් සැකකරුවෙක් නැති එකක් තියෙනවා නම් මේකට නඩු පැවරීමක් වැඩිදුර පරීක්ෂණයක් අවශ්‍යයද කියලා එයාගෙන්ම තමයි විමසලා දැන ගන්නේ ස්වාමිනි.

ප : ඒ කියන්නේ මහත්මයා දැන් රෝහල් කාර්ය මණ්ඩලයේ යම් නිලධාරීයෙකු ඇදහිසපත රැගෙන ආවහොත් එහි වෛද්‍ය නිර්දේශයක් තිබේ නම් එයට අධිකරණ වෛද්‍ය පෝරමයක් නිකුත් කරනු ලබනවා?

පි : එහෙමයි ස්වාමිනි.

ප : එසේත් නැත්නම් පොලිස් නිලධාරීයෙකු විසින් අදාළ රෝගීයා සිටින ස්ථානය වෙත ගමන් කර ඒ සම්බන්ධයෙන් සොයා බැලීමක් සිදු කරනු ලබනවා එහෙමද?

පි : එහෙමයි ස්වාමිනි.

ප : දැන් ඔබ සඳහන් කළ අනෙක් අවස්ථාවන් දෙක එනම් රෝගීයෙකු පැමිණ ඔහුගේම ඇදහිසපත ලබාදීම හෝ රෝගීයෙකුගේ ඥාතීයෙකු හෝ භාරකරු විසින් පැමිණ ඇදහිස පත පොලිස් මුරපොළට ඉදිරිපත් කිරීමේදී ?

පි : එහෙමයි ස්වාමිනි.

ප : අධිකරණ වෛද්‍ය පෝරමයක් නිකුත් කෙරෙන්නේ මොන ආකාරයෙන්ද?

පි : අදාළ වෛද්‍ය නිර්දේශයේ කියලා තිබුණොත් අධිකරණ වෛද්‍ය පෝරමයක් නිකුත් කරන්න කියලා ඒක නිකුත් කරනවා සමහර වේලාවට එසේ නොමැති අවස්ථාවක අර වගේ මම කලින් සඳහන් කළා වගේ මේක සාමාන්‍ය විදිහේ තුවාලයක් නැත්නම් නිවසක් තුළ වෙච්චි එකක් තියෙනවා නම් සැකකරුවෙක් නොමැති නම් ඒ වගේ අවස්ථාවක නිකුත් කිරීමක් වෙන්නේ නෑ ස්වාමිනි.

ප : ඒ කියන්නේ මහත්මයා වෛද්‍ය නිර්දේශයක් තිබේ නම් මෙම රෝගීයා සම්බන්ධව පොලිසියට දැනුම් දෙන්න කියලා එවැනි අවස්ථාවක අනිවාර්යෙන්ම අධිකරණ වෛද්‍ය පෝරමයක් නිකුත් වෙනවා එහෙමද?

පි : ඔව් නිකුත් වෙනවා ස්වාමිනි.

ප : දැනටමත් මෙම ගරු කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබා දී තිබෙන එවක 2018 අගොස්තු මස ස්ථානාධිපති ජාතික රෝහලේ පොලිස් මුරපොළෙහි ස්ථානාධිපති වශයෙන් කටයුතු කළ පො.ප.නානායක්කාර මහතා විසින් සඳහන් කර තිබෙනවා වෛද්‍ය

FAIR COMMENT BY JEZEEM

නිර්දේශයක් තිබුණත් පොලිසියට දැනුම් දෙන ලෙසට පැමිණෙන පුද්ගලයා විසින් ප්‍රකාශ කරනු ලැබුවහොත් ඒ කියන්නේ රෝගීයා හෝ ඔහුගේ භාරකරු විසින් ප්‍රකාශ කළහොත් අපට මේ සම්බන්ධයෙන් පොලිස් විමර්ශනයක් අවශ්‍ය නැහැයි කියලා එවැනි අවස්ථාවක අධිකරණ වෛද්‍ය පෝරමයක් නිකුත් නොකරන බවට ඒ සම්බන්ධයෙන් ඔබට මොකක්ද කියන්න තියෙන්නේ?

පි : ඔව් ස්වාමිනි දැන් මෙතෙන්දී රෝගීයා විශේෂයෙන්ම සැකකරුවෙකු නොමැති අවස්ථාවක විශේෂයෙන්ම පහර දීමක් අපි කිව්වොත් සැකකරුවෙක් නොමැති අවස්ථාවක එවැනි අවස්ථාවක නඩුකරයක් පවත්වාගෙන යාමට ක්‍රමවේදයක් නැත්නම් හරි අවශ්‍යතාවයක් නැත්නම් රෝගීයාගෙන් විමසලා එයාගේ අනුමැතිය අරගෙන ඒකේ සටහනක් දාලා අධිකරණ වෛද්‍ය පෝරමයක් නිකුත් කරන්නේ නෑ ස්වාමිනි.

ප්‍ර : ඒ ඔබ සඳහන් කරන්නේ රෝගීයාගෙන්ම විමසා කරන අවස්ථාවන්වල?

පි : ඔව් රෝගීයා හෝ රෝගීයා සමඟ ළඟ භාරකරු හෝ ඥාතියෙක් විමසීමක් .

ප්‍ර : ඒ කියන්නේ භාරකරුගෙන් විමසන අවස්ථාවන් තියෙනවා?

පි : තියෙනවා ස්වාමිනි.

ප්‍ර : මෙම වෛද්‍යවරයා විසින් නිර්දේශ කර තිබුණත් පොලිස් මුරපොළ වෙත දැනුම් දෙන්න කියලා භාරකරුගෙන් විමසනු ලබනවා විමර්ශනයක් අවශ්‍යද නැද්ද යන්න සම්බන්ධයෙන්?

පි : අවශ්‍යද නැද්ද කියන එක.

ප්‍ර : දැන් ප්‍රථමයෙන්ම සඳහන් කරන්න ඔබ විසින් හෝ දැන් ඔය ස්ථානාධිපති මරදාන විසින්නේ මෙම ජාතික රෝහලේ පොලිස් මුරපොළ අධීක්ෂණය කරනු ලබන්නේ ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : යම් නියෝග හෝ උපදෙස් ලබා දී තිබෙනවාද කොළඹ ජාතික රෝහලේ පොලිස් මුරපොළ වෙත පැමිණෙන පුද්ගලයා විශේෂයෙන්ම රෝගීයෙකු නොවන රෝගීයාගේ භාරකරු හෝ ඥාතියෙකු යැයි කියන පුද්ගලයාගේ අනන්‍යතාවය තහවුරු කර ගන්නා ආකාරය සම්බන්ධයෙන් උපදෙස් ලබා දීමක් සිදු කරලා තියෙනවාද?

පි : උපදෙස් ලබා දීලා තියෙනවා ස්වාමිනි මොකද මේ එසේ සැකයක් තියෙනවා නම් මේ වාට්ටුව වෙත ගිහිල්ලා අපේ නිලධාරියා කරුණු විමසීමෙන් අනතුරුව තමයි ඒ තත්ත්වය තහවුරු කර ගන්නේ.

ප්‍ර : නෑ ඔබ සඳහන් කරන්නේ සැකයක් උපදිනවා නම් කියලනේ?

Right to Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : මම අහන්නේ සාමාන්‍යයෙන් උපදෙසක් ලබා දී තිබෙනවාද රෝගීයෙකුගේ භාරකරුවෙකු යැයි කියා ගන්නා පුද්ගලයෙකු විසින් ඇදහිස පතක් රැගෙන පැමිණෙන විට එම පුද්ගලයා රෝගීයාගේ භාරකරුවෙකු හෝ ඥාතියෙකුද යන්න තහවුරු කර ගැනීම සම්බන්ධයෙන් යම් අනන්‍යතාවය හෙළිකර ගැනීමක් ඒ අවස්ථාවේදී සිද්ධ කරන්න කියන කාරණාවට උපදෙස් ලබා දී තිබෙනවාද?

පි : තියෙනවා ස්වාමිනි.

ප්‍ර : කොහේද ඒක තියෙන්නේ?

පි : ස්ථාවර නියෝගවල සඳහන් වෙලා නෑ නමුත් උපදෙස් ලබා දීලා තියෙනවා මෙහෙම ඒක හඳුනා ගැනීම අත්‍යවශ්‍ය බව දැනුම් දීලා තියෙනවා.

ප්‍ර : ලිඛිතවද උපදෙසක්ද ඔබ සඳහන් කරන්නේ වාචික උපදෙසක්ද?

පි : වාචික උපදෙසක් ස්වාමිනි.

ප්‍ර : වාචික උපදෙසක්?

පි : වාචික උපදෙසක්.

ප්‍ර : ඔබ විසින් ලබා දී තිබෙනවාද එවැනි වාචික උපදෙස්?

පි : ලබා දීලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර : කාටද ලබා දී තිබෙන්නේ?

පි : අදාළ ස්ථානාධිපතිවරයාට ලබා දීලා තියෙනවා.

ප්‍ර : දැන් එවැනි පුද්ගලයෙක් පැමිණ සඳහන් කළාම අපිට මේ යම් සිද්ධියකට පොලිස් විමර්ශන අවශ්‍ය නැහැයි කියලා ඇදහිසපතේ සඳහන් වී තිබෙනවා නම් වෛද්‍යවරයා විසින් නිර්දේශ කර තිබෙන බවට මෙම රෝගීයා සම්බන්ධව පොලිස් මුරපොළ වෙත දැනුම් දෙන්න කියලා එවැනි අවස්ථාවකදී කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් උපදෙස් ලබා දීමක් සිදු කරලා තියෙනවාද?

පි : ස්වාමිනි නැවත පැහැදිලි කිරීමක් කරන්න.

ප්‍ර : මගේ ප්‍රශ්නය වුණේ යම් රෝගීයාගේ භාරකරු හෝ ඥාතියෙකු යැයි පවසන පුද්ගලයෙකු විසින් පැමිණ?

පි : එහෙමයි.

ප්‍ර : අපිට මේ සම්බන්ධයෙන් පොලිස් විමර්ශනයක් අවශ්‍ය නැහැයි කියලා සඳහන් කරන අවස්ථාවකදී ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එහෙත් ඇදහිස පතෙහි වෛද්‍ය නිර්දේශයක් තිබෙනවා නම් පොලිසිය දැනුවත් කරන්න කියලා ඒ එවැනි අවස්ථාවකදී ක්‍රියා කළ යුතු ආකාරය සම්බන්ධයෙන් පොලිස් මුරපොළ වෙත උපදෙස් ලබා දී තිබෙනවාද?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ස්වාමිනි උපදෙස් ලබා දී තියෙනවා. හුඟක් දුරට Inform to Police කියලා මේ පොතේ සඳහන් කරලා තමයි එවන්නේ හැම එකක්ම වගේ. මොකද සාමාන්‍යයෙන් ඒ කියන්නේ අපරාධමය නඩුවක් හෝ සාමාන්‍යයෙන් වැටීමකින් හෝ වෙනත් නිවස තුළ වෙච්ච හදිසි අනතුරකින් හෝ ඒ වගේ දෙයක් හැම ඒකේම Inform to Police කියලා පොඩි Endorsement එකක් ගහලා එවනවා. ඒ එවන්නේ අපි ඒ අදාළ තත්ත්වය තහවුරු කර ගැනීමෙන් අනතුරුව තමයි වෛද්‍ය පෝරමයක් නිකුත් කරන්නේ.

ප්‍ර : කොහොමද එය තහවුරු කර ගන්නේ? දැන් රෝගීයාගේ භාරකරුවෙකු පැමිණ පැවසු විට එම සිදුවීම සම්බන්ධයෙන් තහවුරු කර ගැනීම කොහොමද සිද්ධ වෙන්නේ?

පි : එක්කෝ අදාළ රෝගීයාගෙන් දැන ගන්නවා. නැත්නම් භාරකරුගෙන් දැන ගන්නවා. නැත්නම් භාරකරු වෙනුවට එන ඒ ඥාතියෙක් හරි කාගෙන් හරි තොරතුරු අනාවරණය කර ගැනීමක් කරන්න ඕනී.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : සාක්ෂිකරු යම් කිසි පුද්ගලයෙක් හොරකමකට හෝ මංකොල්ලකෑමට ගොස් තුවාල වූ අවස්ථාවකදී රෝහලට ඇතුළත් වුනොත් එවැනි පුද්ගලයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කරන්නේ කොහොමද? දැන් යම් කිසි අපරාධයක් කරන්න ගිහිල්ලා යම් තුවාලවලට ලක්වෙලා සමහර පුද්ගලයින් රෝහලට ඇතුළත් වෙනවා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එවැනි අවස්ථාවකදී තමන්ලා ඔහු කිව්වොත් එහෙම මට අවශ්‍ය නැහැයි කියලා මේක ඉදිරි කටයුතු කිරීම?

පි : නෑ ස්වාමිනි ඒ වේලාවට අනිවාර්යෙන්ම වෛද්‍ය වාර්තාවක් අපි ලබා ගන්නවා. මොකද අපරාධමය නඩුවක් විවෘතව වෙන්න ඉඩ තියෙන නිසා

ප්‍ර : නෑ තමන්ලා දන්නේ නෑ තමන්ලා දන්නේ නෑ. කවුරු හරි තුවාල වෙලා අපරාධයක් කරන්න ගිහිල්ලා හොරකමක් කරන්න ගිහිල්ලා ඔහුට තුවාල ලැබිලා සමහර අවස්ථාවේදී දැකලා තියෙනවා පොලිස් වෙඩි පහරවල් ලැබිච්චි කට්ටියත් ආරෝග්‍ය ශාලාවට ඇතුල් වෙලා තියෙනවා හොරෙන් ගිහිල්ලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එවැනි අවස්ථාවක එම පුද්ගලයා කිව්වොත් නෑ මට මේකට මට පරීක්ෂණයක් අවශ්‍ය නෑ පොලිසියට යන්න ඕනේ නෑ කියලා එසේ වුවොත් කොහොමද නීතිය ක්‍රියාත්මක වෙන්නේ?

FAIR COMMENT BY JEZEEM

පි : ස්වාමිනි ඒ වගේ අවස්ථාවක අපි හොයා බලනවා. දැන් ඇත්ත වශයෙන්ම ස්වාමිනි.

ප්‍ර : හොයා බලන්න දැන් තමන් කිව්වේ මේ අවශ්‍ය නැහැයි කිව්වාම තමන් හොයා බලන්නේ නෑ යවනවා කියලා ගෙදර එකක් හරි?

පි : නෑ ස්වාමිනි සොයා බැලීමක් කරනවා අනිවාර්යෙන්ම සොයා බැලීමකින් තොරව එහෙම කරන්නේ නෑ.

ප්‍ර : ඒ කියන්නේ සොයා බැලීමක් කරනවා?

පි : අනිවාර්යෙන්ම.

ප්‍ර : සොයා බැලීමක් කරනවා?

පි : අනිවාර්යෙන් ස්වාමිනි.

****

<u>රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය</u>

ප්‍ර : මොන ආකාරයෙන්ද ඒ සොයා බැලීම කරන්නේ?

පි : ස්වාමිනි දැන් ඇත්ත වශයෙන්ම අපි කියමුකෝ දැන් මරදානේ පොලිස් වසමේ නම් මරදාන පොලිස් වසම තුළ සිදු වෙච්චි එකක් නම් අපිට පුළුවන් අපේ අපරාධ අංශය හෝ සුළු පැමිණිලි අංශය හෝ නැත්නම් අපි කියමුකෝ රියඇනතුරක් නම් රථ වාහන අංශයේ නිලධාරීන් යොදලා මේ පිළිබඳව අපි දැන ගන්නවා. පිට ස්ථානයක වෙලා නම් අපි අනිවාර්යෙන්ම දුරකථන පණිවිඩයක් මාර්ගයෙන් නැත්නම් අදාළ පොලිස් වසමේ OIC ට contact කරලා ඒ අදාළ විමර්ශන නිලධාරියාගෙන් මේ තොරතුරු දැන ගැනීම කරනවා.

ප්‍ර : ඒ කියන්නේ මහත්මයා දැන් යම් රෝගියෙකු හෝ ඔහුගේ භාරකරුවෙකු පැමිණ සඳහන් කළ හොත් පොලිස් විමර්ශන අවශ්‍ය නැහැයි කියලා ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීමට පෙර එම සිදු වීම සම්බන්ධයෙන් යම් සොයා බැලීමක් සිදු කරලා තමයි එලෙස ඔහුව මුදා හරිනවාද නැද්ද යන්න සම්බන්ධයෙන් තීරණයක් ගන්නේ. එහෙමද ඔබ මෙම ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්නේ?

පි : සැකයක් මතු වුනොත් අනිවාර්යෙන්ම ස්වාමිනි සොයා බැලීමක් කරනවා.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර : දැන් මහත්මයා මම ප්‍රශ්නයක් අහන්නම්.

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : සැකයක් මතු වෙච්ච අවස්ථාවක කවුද සැකය තියෙනවා කියන එක තීරණය කරන්නේ?

Supreme Court Copy
FAIR COMMENT BY JEZEEM

පි : එතන රෝහල් පොලිසියේ ස්ථානාධිපතිවරයෙක් පත් කරලා තියෙනවා. එයාට ඒ තීරණේ ගන්න බැයි නම් එයා මාව සම්බන්ධ කර ගන්න ඕනී. එහෙමත් නැත්නම් ස්වාමිනි මටත් ඒක අමාරු තත්ත්වයක් තිබ්බොත් හුහක් දුරට අපේ අධිකරණ වෛද්‍යතුමාට සම්බන්ධවෙලා මම ඒ පිළිබඳ එතුමාගෙන් විස්තර ලබා ගන්නවා. ඒ වගේ ක්‍රියාමාර්ගයක් අපි අනිවාර්යෙන් සිදු කරනවා.

ප්‍ර : දැන් පොලිසිය දැනුවත් කරන්න කියලා වෛද්‍යවරුන් සඳහන් කරලා තියෙද්දී

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එම පොලිස් රෝහල් ඒකකයේ කවුරුත්ම ඒ පිළිබඳව උනන්දුවක් දක්වලා සැලකිල්ලක් දක්වලා නැත්නම් එවැනි අවස්ථාවක වගකීම පැවරෙන්නේ කාටද ?

පි : ඔව් ස්වාමිනි රෝහල් පොලිසියේ ස්ථානාධිපති ඒ වගේම අපේ ස්ථාවරය නියෝගවලිනුත් දැනුම් දීලා තියෙනවා හුහක් දුරට එවැනි අවස්ථාවක් ආවොත් මේ මාවත් සම්බන්ධ කර ගෙන මගෙනුත් උපදෙස් ලබා ගන්නා අවස්ථා තියෙනවා.

ප්‍ර : එතකොට දැන් ඒ ස්ථානාධිපතිවරයා ඒ අනුව ක්‍රියා කළේ නැත්නම් එහි වගකීම කාටද දරන්න වෙන්නේ?

පි : ස්වාමිනි දැන් මේ සිද්ධියට අදාළව මෙතෙන්දී මට හිතෙන විදිහට මම ඒ නිලධාරියා ස්ථානාධිපතිවරයා ක්‍රියා කරලා තියෙන ආකාරය ගැන මම සෑහීමට පත් වෙන්නේ නෑ. නමුත් මෙතෙන්දී මේ වෛද්‍ය වාර්තාවේ සඳහන් වෙලා තියෙනවා Gas Cylinder Blast කියලා. එතකොට මේකේ සැකකරුවෙකුත් සඳහන් වෙලා නෑ. එතකොට මේ භාරකරුත් ගිහිල්ලා තියෙනවා මේක ගෑස් සිලින්ඩයක් පිපිරීමෙන් සිදු වෙච්චි දෙයක් නිසා සිදු වුණු දෙයක් බවත් ඒක නිසා ඒ වකවානුව වන විට සාමාන්‍යයෙන් මේ සාමකාමී වතාවරණයක් තිබ්බ නිසා මම හිතන්නේ ඒ තීරණය මත ඒ තීරණය ගන්න ඇතැයි කියලා මම ස්ථානාධිපති රෝහල් පොලිසිය විසින් ක්‍රියා කරලා තියෙන ආකාරය ඒක මට විමසීමක් කරන්න මට එයාට උපදෙසක් ලබා දෙන්න තිබුණා මේ සිද්ධියේදී ස්වාමිනි.

ප්‍ර : දැන් ස්ථානාධිපතිවරයා නිසි ලෙස ක්‍රියා මාර්ග අරන් ඔහුගේ රාජකාරිය නිසි ලෙස ඉටු කරලා නැත්නම් ඒ පිළිබඳ ඔබටත් වගකීමක් පැවරෙනවා නේද?

පි : එහෙමයි ස්වාමිනි.

****

FAIR COMMENT
BY JEZEEM

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : එතන රෝහල් පොලිසියේ ස්ථානාධිපතිවරයාට ඇඳහිසපතේ තියෙනවානේ මේක පිපිරීමකින් තුවාල කියලා ගෑස් සිලින්ඩර් කතාවක් කියලා තියෙනවානේ ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එම අවස්ථාවකදී ඔහුගේ ලිපිනය අරගෙන පොලිස් ස්ථානයෙන් පරීක්ෂා කර බලන්නේ නැද්ද මෙවැනි පිපිරීමක් මෙම ස්ථානයේ සිදු වෙලා තිබ්බද කියලා?

පි : ඔව් ස්වාමිනි මෙතෙන්දී මම හිතන්නේ මේ ස්ථානාධිපති හෝ එතන හිටපු ජ්‍යෙෂ්ඨ නිලධාරියා මම හිතන්නේ දැන් මේ වෛද්‍ය ඒ සටහනේ වෛද්‍යවරුන් කිහිප දෙනෙක් විසින් පරීක්ෂාවට ලක් කරලා තමයි ඒ තීරණය අරන් තියෙන්නේ ගෑස් සිලින්ඩර් බ්ලාස්ට් කියලා. එතකොට මේ වගේ නිවෙස් තුළ කුප්පි ලාම්පු පිපිරීම් ඒ වගේ දේවල් නිරන්තරයෙන් වාර්තා වෙනවා. එතකොට ඒ වගේ වේලාවක අපි රෝහල් පතක් නිකුත් කළොත් තමයි අදාළ ස්ථානයේ පොලිසියට සම්බන්ධ වෙලා දුරකථන පණිවිඩ දීලා

ප්‍ර : ඔව් ඉතින් තමන්ලට දැනුම් දීලි තියෙනවානේ ඩොක්ටර් දැනුම් දීලා තියෙනවානේ මේ පොලිසියට දැනුම් දෙන්න කියලා ?

පි : නෑ ඒ Inform to Police කියලා කියන්නේ මේ Post එකට ස්වාමිනි.

ප්‍ර : Post එකකින් ඒක පරීක්ෂා කරන්න ඕනීනේ මේකේ ඇත්ත නැත්තද කියලා ඔය සිද්ධිය?

පි : නෑ එතෙන්දී මේ Inform to Police කියලා හැම එකේම හුහක් දුරට එනවා.

ප්‍ර : ඉතින් පොලිසිය පරීක්ෂා කරන්න ඕනී මේක සත්‍යයක්ද නැද්ද කියලා?

පි : එතෙන්දී මොකද මේ සැකකරු මේ තුවාලකරු දින 21 කට ආසන්න කාලයක් රෝහල් ගත වෙලා ඉඳලා තියෙනවා. එතකොට මෙතෙන්දී මම විමසීමේදී මට පස්සේ තමයි මේ සිද්ධිය ආරංචි වුණේ එහිදී ඒ ගොල්ලො කියා සිටියා මේකේ සැකකරුවෙකු නොමැති නිසා මේ භාරකාරයත් සම්බන්ධයෙන්.

ප්‍ර : සැකකරුවෙක් ඕනේ නැනේ දැන් සමහරු බෝම්බ හදන්න ගිහිල්ලා අත කඩා ගන්න අවස්ථා තියෙනවා. එවැනි අවස්ථාවල ඔවුන් ඇවිල්ලා ඉස්පිරිතාලේ ඇවිල්ලා බෙහෙත් ගන්නවා. එවැනි අවස්ථාවක ඒ ගැන සොයන්න ඕනී නේ එවැනි අවස්ථාවල?

FAIR COMMENT BY JEZEEM

පි : එතන ස්වාමිනි අතන අඩුපාඩුවක් විදිහට අර පේනවා ස්ථානාධිපතිවරයා මීට වඩා මගෙන් විමසීමක් කළා නම් මොකද මම එහේ මෙහේ වුණා නම් මම අනිවාර්යෙන්ම.

ප්‍ර : අඩුපාඩුවක් තියෙනවා කියන්නේ තමන් එතන හරි හැටි ක්‍රියා කළේ නැති බව පිළිගත්තා නම් ඉවරයිනේ එහෙමනේ කියන්නේ පිළිගත්තා නම් ඉවරයි ?

පි : ස්වාමිනි මේක තනිකර යුක්තිය සම්බන්ධයෙන් නිකුත් කිරීම සහ සම්බන්ධයෙන් වගකීම තියෙන්නේ ස්ථානාධිපතිවරයාට. මම කිසිම ආකාරයක ඒ සම්බන්ධයෙන් සොයා බලන්නේ අපේ සහකාර පොලිස් අධිකාරිතුමා Inspection එකේදී මේවා පරීක්ෂා කරනවා ඇරෙන්න හැම එකක්ම GHT එකක් නිකුත් කිරීම සම්බන්ධයෙන් සුදුසු අධීක්ෂණයක් මාගෙන් වෙන්නේ නෑ. මම හුඟක් දුරට පරිපාලන කටයුතු සම්බන්ධයෙන් තමයි ස්වාමිනි සොයා බලන්නේ.

ප්‍ර : දැන් ඒ ස්ථානාධිපතිවරයා කවුද ඉන්නවාද ස්ථානාධිපතිවරයා?

පි : කලින් මේකේ සාක්ෂියක් ලබා දුන්නා.

ප්‍ර : ලබා දුන්නා.

පි : ස්වාමිනි.

ප්‍ර : ඔහු මියගිය එක්කෙනෙක්ද?

පි : පොලිස් පරීක්ෂක නානායක්කාර.

ප්‍ර : නානායක්කාර?

පි : එහෙමයි ස්වාමිනි.

****

<u>රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය</u>

ප්‍ර : දැන් ඔබ මෙම ගරු කොමිෂන් සභාවේ ගරු කොමසාරිස්තුමා විසින් ඇසූ ප්‍රශ්නෙකට පිළිතුරු ලබා දෙමින් කිව්වා යම් සිද්ධියක් සම්බන්ධයෙන් සැකයක් මතු වූ විට ඒ සම්බන්ධයෙන් තීරණය ලබා ගත යුත්තේ අදාළ ජාතික රෝහලේ පොලිස් මුරපොළට අනුයුක්ත කර තිබෙන ස්ථානාධිපතිවරයා වශයෙන් කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එවැනි උපදෙසක් කොයිම අවස්ථාවක හෝ ලිඛිතව හෝ වාචිකව ලබා දී තිබෙනවාද යම් ප්‍රශ්න ගත සිදු වීමක් තිබේ නම් ඒ සම්බන්ධයෙන් ස්ථානාධිපති විසින් තීරණය ලබා ගත යුතුයි. එසේත් නැත්නම් ඔහුගේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත දැනුම් දිය යුතුයි යන්න සම්බන්ධයෙන් ?

පි : ස්වාමිනි මා විසින් ඉදිරිපත් කරන ලද ස්ථාවර නියෝග 01/18 හි සඳහන් වෙලා තියෙනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබ සඳහන් කරන්නේ C 663 වශයෙන් දැනටමත් ලකුණු කර තිබෙන ලේඛනය එලෙස සඳහන් වන බවද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : කොහේද C 663 ලේඛනයේ එම කරුණ සඳහන් වෙන්නේ?

(ගරු මැතිතුමනි මේ අවස්ථාවේදී අද දින ලකුණු කර ඉදිරිපත් කරනු ලැබූ ස්ථාවර නියෝග අංක 01/2018 යන ලේඛනය දැනටමත් C 663 වශයෙන් ලකුණු කර තිබෙන ලේඛනය සාක්ෂිකරු වෙත පෙන්වා සිටීමට අවසර අයැද සිටිනවා.)

(ගරු මැතිතුමනි මේ අවස්ථාවේදී ගෞරවයෙන් සැල කර සිටින්නේ අද දින මෙම සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරනු ලැබූ ස්ථාවර නියෝග අංක 01/2017 දරන ලේඛනය C 662 වශයෙන්ද, මෙම සාක්ෂිකරු විසින් ඉදිරිපත් කිරීමට යෙදුණු ස්ථාවර නියෝග අංක 01/2018 ලේඛනය C 663 වශයෙන්ද ලකුණු කර ඉදිරිපත් කරන බවයි.)

ප්‍ර : දැන් මහත්මයා ඔබ සඳහන් කළේ දැනටමත් C 663 වශයෙන් ලකුණු කර තිබෙන ස්ථාවර නියෝග අංක 01/2018 දරන ලේඛනයේ සඳහන් වන බවට ඔබ විසින් ස්ථානාධිපති ජාතික රෝහල වෙත ලබා දුන් යම් උපදෙසක් සම්බන්ධයෙන් එනම් යම් ප්‍රශ්න ගත කරුණක් පැන නැගුණහොත් ඒ සම්බන්ධයෙන් තීරණය ගත යුත්තේ කවුරුන්ද සහ ඒ සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දැනුවත් කළ යුතුද එම කරුණ C 663 ලේඛනයේ කොහේද සඳහන් වෙන්නේ?

පි : ස්වාමිනි ඒකේ 2017 එකේ.

ප්‍ර : එසේ නම් ඔබ දැන් ගරු කොමිෂන් සභාවේ අවධානය යොමු කරන්නේ C 662 ලේඛනය වෙත?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එහි කෙහේද සඳහන් වෙන්නේ ඔබ ඔය සඳහන් කරපු උපදෙස?

පි : ස්වාමිනි දෙවෙනි ඡේදේ සඳහන් වෙනවා.

ප්‍ර : දෙවෙනි ඡේදයේ.

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එය මෙම ගරු කොමිෂන් සභාවට කියවන්න. කෙටියෙන් කියවන්න මොනවාද තියෙන්නේ කියලා?

පි : එදිනෙදා සිදු වන විශේෂ සිදුවීම්. (2011.05.23) දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2275/11 සහ අපරාධ චක්‍රලේඛ අංක 05/2011 අනුව. එනම් විශේෂිත පුද්ගලයින්, ප්‍රභූවරු, බන්ධනාගාර භාරයේ සිටින සැකකරුවන් සහ සැකකරුවන් ජාතික පොලිස් රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන අවස්ථාවන්වලදී ඒ හා සම්බන්ධව හා ජාතික රෝහලේ

FAIR COMMENT BY JEZEEM

වෛද්‍යවරුන් හෙදියන් ඇතුළු කාර්ය මණ්ඩලයේ විශේෂිත සිදුවීම් සහ සියළුම සංවේදී සිදුවීම් සම්බන්ධව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති බස්නාහිර පළාතතුමා, නියෝජ්‍ය පොලිස්පති කොළඹ දිසාවතුමා ,ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි මධ්‍යමතුමා, සහකාර පොලිස් අධිකාරි කොළඹ මධ්‍යමතුමා සහ මා එම අවස්ථාවන් වල දැනුවත් කිරීමට කටයුතු කළ යුතුයි. විශේෂ සිදුවීමක් නම් තොරතුර කාමරය අධ්‍යක්ෂක පොලිස් මාධ්‍ය කොට්ඨාශය වෙත එම අවස්ථාවලදී දැනුම් දීමට කටයුතු කළ යුතුය.

ප : දැන් ඔබ මෙම ගරු කොමිෂන් සභාවේ ලබා දෙන සාක්ෂිය අනුව C 662 ලේඛනයේ දෙවන ඡේදයෙන් එදිනෙදා සිදුවන විශේෂිත සිදුවීම් වාර්තා කරන්නැයි කියනු ලබන එම ඡේදයෙන් ඔබ සඳහන් කරන ආකාරයට උපදෙසක් ලබා දී තිබෙනවා යම් විශේෂිත සිදු වීමක් ඔබට දැනුම් දෙන ලෙසට?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එහි දක්වා තිබෙනවාද යම් උදාහරණ කිහිපයක්?

පි : උදාහරණ විදිහට දක්වලා නෑ ස්වාමිනි.

ප්‍ර : විශේෂිත පුද්ගලයින්, ප්‍රභූවරුන්, බන්ධනාගාර භාරයේ සිටින සිරකරුවන් සහ සැකකරුන් ජාතික රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබා ගැනීම කියලා එහෙම සඳහන් වෙනවා නේද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් මහත්මයාට මෙම ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්න පුළුවන්ද මීට අමතරව ඔබ විසින් ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට යෙදුණු ලේඛන දෙකට අමතරව වෙනත් උපදෙස් ලබා දීමක් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු විසින් සිදු කර තිබෙනවාද ජාතික රෝහලේ පිහිටුවා තිබෙන පොලිස් මුරපොළට අදාළව?

පි : එහෙමයි ස්වාමිනි. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කොළඹ මධ්‍යමතුමා විසින් ස්ථාවර නියෝගයක් 2018/05/10 වෙනි දින රෝහල් පොලිස් මුරපොළ සම්බන්ධයෙන් උපදෙස් පත්‍රිකාවක් නිකුත් කරලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර : එහි දිනය වශයෙන් සඳහන් වන්නේ 2018/05/10 දින?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ස්ථාවර නියෝගයේ අංකය කුමක්ද?

පි : කොට්ඨාශ ස්ථාවර නියෝග අංක 02/2018 වශයෙන් ස්වාමිනි.

(ගරු මැතිතුමනි මෙම අවස්ථාවේදී ගෞරවයෙන් සැලකර සිටින්නේ සාක්ෂිකරු විසින් සඳහන් කරන්නට යෙදෙන ලේඛනය දැනටමත් AST 01 වශයෙන් මෙම ගරු කොමිෂන් සභාව ඉදිරියේ ලකුණු කර තිබෙන බවයි.)

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් මහත්මයා මෙම AST 01 වශයෙන් ලකුණු කර තිබෙන ඔබ දැනටමත් මෙම ගරු කොමිෂන් සභාවට ඔබගේ සාක්ෂියේ සඳහන් කරන්නට යෙදුණු ලේඛනයේ ඔබ සඳහන් කළා පොලිස් මුරපොළේ රාජකාරී සම්බන්ධයෙන් උපදෙස් ලබා දීමක් සිදු කර තිබෙන බව?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මෙහි මොන ස්ථානයේද ඇතුළත් වන රෝගීන් සම්බන්ධව ක්‍රියා කළ යුතු ආකාරය දක්වා තිබෙන්නේ?

පි : ස්වාමිනි මේ ස්ථාවර නියෝගයේ 11 වෙනි කරුණට මා අවධානය යොමු කරනවා. ප්‍රතිකාර සඳහා පැමිණෙන හදිසි අනතුරට ලක් වූවන්, බරපතල පහරදීම් වලට ලක් වූවන්, වෙඩි වැදීම්, තුවාලකරුවන් සම්බන්ධ වහා අවධානය යොමු කර අදාළ විස්තර ලබා ගත යුතුයි. වහාම මා දැනුවත් කළ යුතුයි කියලා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිතුමා විසින් නිකුත් කරලා තියෙනවා.

ප්‍ර : එයින් සඳහන් වන්නේ හදිසි අනතුරුවලට ලක් වූවන් පැමිණි විට ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කර ඔහුව දැනුවත් කිරීමට කටයුතු කළ යුතු බවයි?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් මා ඔබට පෙන්වා සිටිනවා මෙම ගරු කොමිෂන් සභාව ඉදිරියේ දැනටමත් C 598 වශයෙන් ලකුණු වී තිබෙන ලේඛනය? එහි පළමුවෙනි පිටුව කෙරෙහි ඔබේ අවධානය යොමු කර සිටිනවා. එය මොකක්ද?

පි : ඇදහිස් පත් අංක S/022231/18 දරන පත්‍රිකාව ස්වාමිනි.

ප්‍ර : මා සඳහන් කළොත් නිවැරදිද එම ලේඛනය යටතේ ඉදිරිපත් වී තිබෙන රෝගීයා එම්.අයි. ෂාහීඩ් වශයෙන් සඳහන් වන බවට?

පි : නිවැරදි ස්වාමිනි.

ප්‍ර : එහි C 598 ලේඛනයේ පළවෙනි පිටුවට අනුව එම රෝගීයා සමඟ පැමිණි භාරකරුගේ නම වශයෙන් එම්.අයි.සාදීක් යන පුද්ගලයෙක් සම්බන්ධයෙන් සඳහන් වන බව කිව්වොත් නිවැරදිද?

පි : නිවැරදි ස්වාමිනි.

ප්‍ර : එමෙන්ම මෙම එම්.අයි.ෂාහීඩ් යන නම සඳහන් කරමින් ඇතුළත් වී තිබෙන රෝගීයා 2018 අගෝස්තු 27 වන දින පෙරවරු 11.42 ට රෝහල වෙත ඇතුළත් කර තිබෙන බව සඳහන් කළොත් නිවැරදිද?

පි : නිවැරදි ස්වාමිනි.

ප්‍ර : මෙම රෝගීයාට අදාළව ඔහුට සිදු වී තිබෙන තුවාල සම්බන්ධයෙන් වෛද්‍යවරයා විසින් ගෑස් සිලින්ඩර් බ්ලාස්ට් ඉන්ජරි යනුවෙන් සටහන් කර තියෙනවා කිව්වොත් හරිද?

FAIR COMMENT BY JEZEEM

පි : නිවැරදි ස්වාමිනි.

ප්‍ර : එමෙන්ම on last night යනුවෙන්ද සඳහන් කර තිබෙනවා ද එම ලේඛනයේම?

පි : තියෙනවා ස්වාමිනි.

ප්‍ර : එමෙන්ම ඔබට දර්ශනය වෙනවාද ගෑස් සිලින්ඩර් බ්ලාස්ට් ඉන්ජරි සහ on last night යන ස්ථාන දෙකට ඉදිරියෙන් ප්‍රශ්නාර්ථ ලකුණු දෙකක් යොදා තිබෙන බව?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මෙම ලේඛනයේ පහළින් Inform Police යනුවෙන් සඳහන් කර තිබෙන බව ඔබට නිරීක්ෂණය වෙනවාද?

පි : නිරීක්ෂණය වෙනවා ස්වාමිනි.

ප්‍ර : දැනටමත් මෙම ගරු කොමිෂන් සභාව ඉදිරියේ ඉදිරිපත් වී තිබෙන සාක්ෂි අනුව inform police යනුවෙන් සටහන් කර තිබෙන්නේ මෙම රෝගීයා පරීක්ෂා කරනු ලැබූ වෛද්‍යවරයා විසින්?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් මහත්මයාට ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්න පුළුවන්ද C 598 ලේඛනය දිහා බලලා මෙම රෝගීයාට අදාළව අධිකරණ වෛද්‍ය පෝරමයක් නිකුත් වී තිබෙනවාද?

පි : නිකුත් වෙලා නෑ ස්වාමිනි.

ප්‍ර : ඇයි එහෙම නිකුත් වෙලා නැත්තේ?

පි : මෙකේ ස්වාමිනි මම කලින් සඳහන් කරපු එක තමයි මේකේ කියන්න තියෙන්නේ මොකද මේකේ inform to police කියලා කියන්නේ මේ අපේ පොලිස් මුරපොළට. එතෙන්ට ගියාට පස්සේ තමයි මේ කරුණු විමසීම අදාළ රෝගීයාගේ පාර්ශවයෙන් විමසීමක් කරලා තියෙන්නේ. එතකොට ඒ අනුව තමයි මේ පොලිස් මුරපොළේ නිලධාරීන් තීරණය කර මේ විදිහට මේකේ සටහනක් යොදා ගෙන ඒ අදාළ භාරකරුගෙන් ඒ අවස්ථාවේදී රෝහල් වෛද්‍ය පෝරමයක් නිකුත් කරලා නෑ ස්වාමිනි.

ප්‍ර : මොන ආකාරයේ සටහනක්ද අරගෙන තියෙන්නේ භාරකරුගෙන්?

පි : මේකේ ද්‍රවිඩ භාෂාවෙන් තියෙන්නේ.

ප්‍ර : ඔබට දෙමළ භාෂාව කියවීමේ හැකියාවක් නෑ?

පි : හැකියාවක් නෑ.

ප්‍ර : මෙම ගරු කොමිෂන් සභාව ඉදිරියේ දැනටමත් සාක්ෂි ඉදිරිපත් වී තිබෙනවා දෙමළ භාෂාවෙන් සඳහන් කර තිබෙන්නේ පොලිස් විමර්ශන අවශ්‍ය නෑ යන කරුණ කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ අනුව ඔබට ඒ සම්බන්ධයෙන් මොකක්ද කියන්න තියෙන්නේ?

Registrar's Copy
FAIR COMMENT BY JEZEEM

පි : සාමාන්‍යයෙන් මේ විදිහට තමයි ස්වාමිනි මේ විමර්ශනයක් අවශ්‍ය නැත්නම් ඒ අදාළ පුද්ගලයා විසින් ඒ අත්සනක් ඇතිව සටහනක් මේ පත්‍රිකාවේ යොදා ගන්නවා.

ප්‍ර : දැන් ඔබ විසින් මෙම ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්නට යෙදුණු C 662, C 663 සහ ඔබ විසින් පරිශීලනය කරන්නට යෙදුණු AST 01 දරන ලේඛන තුනෙහිම සඳහන් වෙනවා විශේෂිත සිදු වීම් තිබේ නම් ජ්‍යෂ්ඨ නිලධාරීන් වෙත දැනුම් දිය යුතුයි සහ AST 01 ලේඛනයේ සඳහන් වෙනවා හදීසි අනතුරකදී ඇතුළත් කරනු ලබන රෝගීන් සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතුයි යන කරුණ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් මෙම C 598 ලේඛනයේ පළවෙනි පිටුවේ සඳහන් වන ආකාරයට වෛද්‍යවරයා විසින් සටහන් යොදන ස්ථානයේ ප්‍රශ්නාර්ථ ලකුණු දෙකක් යොදා තිබෙනවා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එමෙන්ම මෙය Gas Cylinder Blast Injury නමින් සටහන් යොදා තිබෙනවා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් මෙවැනි රෝගීයෙකු ඇතුළත් වුණාම ඔහු විශේෂිත දැන් ඔබ ඉදිරිපත් කරන්නට යෙදුණු උපදෙස් සහ ස්ථාවර නියෝග අනුව මෙම සිදුවීම විශේෂිත සිදුවීමක් නෙවෙයිද?

පි : ස්වාමිනි මේක මෙතන මේ Gas Cylinder Blast කියන එක තමයි මේ වගේ සාමාන්‍යනේ මේ වගේ කුප්පි ලාම්පු පිපිරුණායි කියලා ඒ වගේ නොයෙක් නොයෙක් ඒවා සඳහන් වීමත් එක්ක මම හිතන්නේ ඒ නිලධාරීන් රෝහල් පොලිසියේ නිලධාරීන් මේක තමයි මේගොල්ලො මේක තමයි තීරණය කරලා තියෙන්නේ මොකද මේක මෙතන ස්වාමිනි Bomb Blast කියලා තිබ්බේ නැතුව Explosion වලින් වෙච්චි අපරාධයක් කියලා තිබ්බා නම් මේක ඊට වඩා

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : ඕක කුප්පි ලාම්පුවක් කියලා ද තියෙන්නේ නැනේ?

පි : නෑ ස්වාමිනි. මම උදාහරණයක් කිව්වේ ස්වාමිනි එවැනි දේවල් මේකේ Gas Cylinder Blast Injury කියලා සඳහන් වෙච්චි හින්දයි මේ නිලධාරීන් සමහර වේලාවට මේක බරපතල සිතන්න නැතුව ඇති කියලා මම හිතනවා ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : කිව්ව පුද්ගලයාගේ හැඳුනුම්පත් අංකයවත් සටහන් කරලා තියෙනවාද මේ එපා කියලා ?

පි : මේ පොතේ සඳහන් වෙලා නෑ ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : සාක්ෂිකරු ඔය ගෑස් Explosion කියන එක ඉස්සරහා ප්‍රශ්නාර්ථයක් තියෙනවා නේද?

පි : ස්වාමිනි මේ ප්‍රශ්නාර්ථ ලකුණ තියෙන්නේ ඉදිරියෙන්.

ප්‍ර : ඔව් මොකක්ද ප්‍රශ්නාර්තේ තේරුම මොකක්ද?

පි : ස්වාමිනි මේක තේරුම් ගන්න බෑ. මේක වචනේ කෙළවරින් .

ප්‍ර : සාමාන්‍යයෙන් ප්‍රශ්නාර්ථයක් යොදන්නේ මොකක් සංකේතවත් කරන්නද?

පි : ප්‍රශ්නයක් ගැටලුවක් සම්බන්ධයෙන් තමයි ස්වාමිනි.

ප්‍ර : මම හිතුවා සාක්ෂි දෙන විදිහට ඒක තේරුම් නෑ කියලා? ප්‍රශ්නාර්ථයක් කියන්නේ ප්‍රශ්නයක් ගැන?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ගෑස් Explosion ඉස්සරහා ප්‍රශ්නය දැම්මාම එකේ තේරුම මොකක්ද?

පි : එහෙමයි ස්වාමිනි මේක ප්‍රශ්නයක් කියලා තේරුම් ගන්නවා. එහෙමයි ස්වාමිනි.

ප්‍ර : උත්තරේ මොකක්ද ගෑස් Explosion එක ඉස්සරහා ප්‍රශ්නාර්ථයක් දැම්මාම එකේ මොකක්ද අදහස් වෙන්නේ හැඟෙන්නේ?

පි : ගැටලුවක් ප්‍රශ්නයක් තියෙන බව.

ප්‍ර : මොකක් ගැන ප්‍රශ්නයක්ද?

පි : ගෑස් සිලින්ඩර් කියන එක.

ප්‍ර : ඒ කියන්නේ ගෑස් සිලින්ඩරයක් පිපිරීමෙන් සිදු වුණාද කියන එක ගැන ප්‍රශ්නයක් තියෙනවානේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒකයි නේද හැඟෙන්නේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට ඊට පල්ලෙහායින් තියෙන last night කියන එක ඉස්සරහාත් මොනාද තියෙන්නේ?

පි : ප්‍රශ්නාර්ථ ලකුණත් තියෙනවා ස්වාමිනි.

ප්‍ර : ඒකෙන් මොනාද හැඟෙන්නේ?

පි : ඒකත් පසුගිය රාත්‍රියේ සිදු වුණාද කියන එක.

ප්‍ර : එතකොට ඔය ප්‍රශ්නාර්ථ දෙකක් කවුද සාමාන්‍යයෙන් දාන්නේ ඔය විදිහට රෝගියාද දාන්නේ?

FAIR COMMENT BY JEZEEM

පි : නෑ වෛද්‍යවරයා ස්වාමිනි.

ප්‍ර : වෛද්‍යවරයා එහෙම දාන්නේ මොකක් පදනම් කර ගෙනද ?

පි : ඕක ගැටලු සහගත තත්ත්වයක් තියෙන බවක් හැඟෙන්නේ ස්වාමිනි.

ප්‍ර : නෑ ඒ විදිහට ප්‍රශ්නාර්ථයක් දාන්න වෛද්‍යවරයාට යම් විශේෂ සුදුසුකමක් තියෙනවාද?

පි : තියෙනවා ස්වාමිනි.

ප්‍ර : මොකක්ද ඒ සුදුසුකම?

පි : වෛද්‍ය වෘත්තිකයෙක් වන බැවින්.

ප්‍ර : ඔව් වෛද්‍ය වෘත්තිකයෙක් වන බැවින් මොකක්ද ඔවුන්ට කියන්න පුළුවන් විශේෂඥ දැනුම භාවිතා කිරීමෙන් මොකක්ද ඔවුන්ට කියන්න පුළුවන්?

පි : මතයක් ප්‍රකාශ කරන්න පුළුවන්.

ප්‍ර : ඔව් මොකක්ද ඔය අවස්ථාවේදී ඒ කියන්නේ ප්‍රකාශ කරලා තියෙන මතය?

පි : ගෑස් සිලින්ඩරයක් පිපිරුණාද කියන එක.

ප්‍ර : ඔව් ඒ කියන්නේ ඒ ගැන සැකයක් තියෙනවා කියන එක නේද ඔකෙන් කියන්නේ?

පි : එහෙමයි ස්වාමිනි.

****

<u>රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය</u>

ප්‍ර : දැන් ඔබ විසින් ඉදිරිපත් කරන්නට යෙදුණු උපදෙස් පත්‍රිකා උපදෙස් සහ ස්ථාවර නියෝග අනුව විශේෂිත සිදු වීමක් තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට ස්ථානාධිපති මරදාන සහ ඊට ඉහළ නිලධාරීන් දැනුවත් කිරීමක් සිදු කළ යුතුයි?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබට මෙම සිදුවීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් සිදු කර තිබුණාද?

පි : දැනුවත් කිරීමක් සිදු කරලා තිබ්බේ නෑ ස්වාමිනි.

ප්‍ර : ඔබගේ දැනීම අනුව වෙනත් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකුට මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් සිදු කර තිබුණාද?

පි : නෑ ස්වාමිනි.

ප්‍ර : එහෙත් ඔබ පිළිගන්නවා මේ විශේෂිත සිදුවීම කියන ඒ වචනය තුළට වැටෙන සිදුවීමක් බව?

පි : එහෙමයි ස්වාමිනි.

****

FAIR COMMENT — BY JEZEEM

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර : දැන් මහත්මයා මම ඔබගෙන් ඉස්සෙල්ලා ප්‍රශ්න අහන අවස්ථාවේදී

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබ තේරුම් ගත්තා මෙම අවස්ථාවේ සේවයේ යෙදී සිටි පොලිස් නිලධාරීන් හෝ සැරයන්වරයා හෝ ස්ථානාධිපතිවරයා හෝ මේ වෛද්‍යවරයා දීපු උපදෙස් අනුව ක්‍රියා කරලා නැති බව ඒක හරිද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට දැන් මෙවැනි උපදෙස් ලබා දුන්නේ එවකට ඔබ ස්ථානාධිපතිවරයා හැටියට සේවය කරන කාලේදී නේද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට මේ තත්ත්වයෙන් අවබෝධ වෙන්නේ එදා මේ පිළිබඳව හරිහැටි තේරුම් අරගෙන පොලිසිය විසින් ඒ ගැන අවධානය යොමු කරලා අධිකරණ වෛද්‍යවරයා වෙත යොමු කළා නම් මේ පිපිරුමේ ඇත්ත තත්ත්වය හොයා ගන්න පුළුවන් වෙනවා නේද ?

පි : ස්වාමිනි අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කරන්නේ වාට්ටුවෙන්මයි ස්වාමිනි පොලිසියෙන් නෙවෙයි.

ප්‍ර : ඔව් දැන් ඒක කරලා නැති එකනේ තියෙන්නේ? අධිකරණ වෛද්‍යවරයා වෙත යවන්න වාර්තාව නිකුත් කරන්නේ කොළේ දෙන්නේ කවුද?

පි : ස්වාමිනි අධිකරණ වෛද්‍යතුමා වෙත මේක ගියා නම් අධිකරණ වෛද්‍යතුමා මේ පෝරමය ඉල්ලනවා. නමුත් එහෙම දෙයක්වත් මේ දින 21 ඇතුළත මේ වාට්ටුවෙන් අධිකරණ වෛද්‍යවරයා වෙත රෝගීයා ඉදිරිපත් වෙලා නෑ.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : පොලිසියෙන් කියන්න එපැයි?

පි : නෑ ස්වාමිනි.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර : පොඩ්ඩක් ඉන්න මම ප්‍රශ්නේ හරියට අහලා ඉන්නම් ඔබ මේක හරියට තේරුම් ගන්න.

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : අධිකරණ වෛද්‍යවරයා වෙත දොස්තර මහත්මයාට නිකම්ම යවන්න බෑනේද?

පි : ස්වාමිනි අධිකරණ වෛද්‍යතුමා ඇවිල්ලා මේ විසිට් කරලා නිරීක්ෂණයක් යොදනවා ස්වාමිනි.

****

Presidential Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර : GHT එකක් දාන්න එපැයි?

පි : නෑ GHT එකක් ඒ අවස්ථාවේදී රෝහල් ඒ අධිකරණ වෛද්‍යතුමා ඇවිල්ලා විසිට් කරද්දී GHT එක දාලා නැත්නම් පොස්ට් එකට දැනුම් දෙනවා මේකට GHT එකක් එවන්න කියලා.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර : ඉතින් ඒක දාන්න නේද මේ පොලිසියට යන්න කියලා මේ පොලිසිය දැනුවත් කරන්න කියලා කියලා තියෙන්නේ ඔබට?

පි : ස්වාමිනි මේ

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : අධිකරණ වෛද්‍ය නිලධාරීවරයා හැමදාම එන්නේ නැනේ රෝහලට?

පි : ස්වාමිනි සමහර අවස්ථාවල

ප්‍ර : අධිකරණ වෛද්‍යවරයාට වෙන රාජකාරි තියෙනවානේ විශාල කාර්යාලයක් තියෙනවානේ?

පි : ස්වාමිනි සාමාන්‍යයෙන් හැමදාම එන්නේ නෑ නමුත් දවසක් හැර දවසක් හරි එතුමා ඇවිල්ලා මේ නිරීක්ෂණය කරනවා. ඒක යොමු වෙන්නේ වාට්ටුවෙන්මයි.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර : වාට්ටුවෙන් යොමු වෙන්නේ මහත්මයා පොලිසිය හරහා නේද?

පි : පොලිසිය හරහා නෙවෙයි ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔබ කියන්නේ පොලිස් මුරපොළ පිහිටවලා තියෙන්නේ එවැනි කාර්යයන් සඳහා සහයෝගය ලබා දෙන්න උදව් කරන්න නෙවෙයිද?

පි : ස්වාමිනි සමාවෙන්න මේ පොලිසියට එහෙම යොමු කිරීමක් කරන්න බෑ. ඒ රෝහල් වෛද්‍යවරයා විසින් අදාළ වාට්ටු භාර වෛද්‍යවරයා විසින් තීරණයක් ගන්න ඕනී මේක JMO ගේ Refer එනවාද නැද්ද කියන එක. ඒ අනුව

ප්‍ර : කොහේද එහෙම කියලා තියෙන්නේ?

පි : ස්වාමිනි

ප්‍ර : කොහේද එහෙම කියලා තියෙන්නේ වෛද්‍යවරයා විසින් JMO ට යොමු කරන්න ඕනී කියලා ?

FAIR COMMENT BY JEZEEM

පි : හුඟක් දුරට මේ වෛද්‍ය වාර්තාවේ ගහනවා Refer to JMO කියලා. නමුත් එහෙම එකක් මේකේ සටහනේ වැටිලා නෑ. දවස් 21 ක් ප්‍රතිකාර ලබමින් සිටියත් Refer to JMO කියලා ස්වාමිනි මේකේ සටහන් වෙලා නෑ.

ප්‍ර : දැන් මහත්මයා මෙතන සාක්ෂි දීපු අනිකුත් නිලධාරීන්

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔය පොලිස් මුරපොළේ වැඩ කරපු සියළුම නිලධාරීන් සාක්ෂි දීලා කිව්වේ පවත්වාගෙන ගිය ක්‍රමවේදය වෛද්‍යවරයා විසින් පොලිසිය දැනුවත් කරන්න කියලා ලිව්වාම පොලිස් නිලධාරීන් විසින් අදාළ පෝමය නිකුත් කරලා යවනවා කියලා JMO office එකට?

පි : නෑ.

ප්‍ර : එතකොට මහත්මයා ඒක දැනන් හිටියේ නැද්ද?

පි : ස්වාමිනි සාමාන්‍යය ක්‍රම විදිහ රෝහලෙන්ම හුඟක් වේලාවට පොලිස් Post එකට එන්නේ නෑ. නමුත් JMO මේවා කරාට පස්සේ වාට්ටුවෙන් inform කරලා JMO මේ එතුමා ඇවිල්ලා මේකේ වෛද්‍ය වාර්තාව සඳහන් කරලා යනවා. ඊට පස්සේ අපිට අවශ්‍ය අධිකරණ වෛද්‍ය පතක් අවශය වෙච්ච වේලාවට ඒක ඇතුළත් කරනවා මේ ගොනුවට.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : සාක්ෂිකරු වගකීමෙන් සාක්ෂි දෙන්න. තමන් කාවවත් බේරන්න යන්න ඕනී නෑ වගකීමෙන් සාක්ෂි දෙන්න නැත්නම් තමන් තමයි ඒකේ ප්‍රතිවිපාක ලබන්න වෙන්නේ.

පි : ස්වාමිනි හුඟක් දුරට රෝහලෙන්ම තමයි JMO වෛද්‍යවරයාට දැනුම් දීමක් කරන්නේ.

ප්‍ර : පොලිස් මුරපොළක් තියෙන්නේ මොකටද?

පි : පොලිස් මුරපොළ ස්වාමිනි පොලිස් මුරපොළෙන් මේක තීරණය කරන්නේ නෑ මේක JMO ට Refer කරන්න නමුත් මේ රෝගීයා රෝහලේ සිටිද්දී රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබමින් සිටියදී ඒ අදාළ වාර්තාව ලබා ගැනීමට කටයුතු කරන්නේ නෑ. ඒ රෝහලේ බලන ජ්‍යෙෂ්ඨම වෛද්‍යවරයා තමයි මේක JMO සර්ට සම්බන්ධ කරන්නේ.

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : රෝහල් පොලිස් මුරපොළේ JMO ආකෘති පත්‍රයක් තියෙනවාද?

පි : එහෙම ආකෘති පත්‍රයක් තියෙනවා පොලිස් මුරපොළේ.

ප්‍ර : ඒ පොලිස් මුරපොළේ JMO ආකෘති පත්‍රයක් තියෙන්නේ ඒකේ අනිත් පැත්තේ ඔබලාගේ සටහන් දාන්නද?

පි : ස්වාමිනි පොලිස් Post එකේ නෑ JMO ආකෘතියක්. JMO ආකෘති පත්‍රයක් තියෙන්නේ JMO office එකේ ස්වාමිනි.

ප්‍ර : මම නිවැරදි කරන්නම් Medico Legal Examination from එකක් තියෙනවා නේද?

පි : තියෙනවා ස්වාමිනි.

ප්‍ර : ඒක මොකටද භාවිතා කරන්නේ කවු සටහන් දාන්නද?

පි : ඔව් ඒක පොලිස් මුරපොළේ තමයි ස්වාමිනි තියෙන්නේ. ඒක සමහර වේලාවට වාට්ටුවෙන්ම ගේනවා මේකට රෝහල් පතක් එවන්න කියලා. නැත්නම් අපි රෝහලේ මේ ඇදහිසි පත් ආවාට පස්සේ ඒකට GHT එකක් නිකුත් කරනවා අධිකරණ වෛද්‍ය පෝරමයක්.

ප්‍ර : ඔබ කියන හැටියට අධිකරණ වෛද්‍ය පෝරම නිකුත් කරන්නේ වාට්ටුව හරහාද?

පි : එහෙමයි ස්වාමිනි. ඒක වාට්ටුව හරහා නිකුත් කරනවා. අපි කොහොමත් අධිකරණ වෛද්‍ය නිලධාරීතුමා

ප්‍ර : ඉතින් එහෙනම් ඒ ආකෘති පත්‍ර වාට්ටුවේ තියෙන්න එපැයි? පොලිස් මුරපොළට ඒ සම්බන්ධයෙන් කරන්න කිසිම ක්‍රියාවක් නැත්නම් එම ලේඛන ටික තියෙන්නේ වාට්ටුවේනේ? ඇයි ඔබගේ පොලිස් මුරපොළේ තියන්නේ?

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර : අපිට නම් හැඟෙන්නේ තමුන් මේ ක්‍රියාවලිය සිදු වන විදිහ හරියට දන්නේ නැතුව වැඩ කරලා තියෙන්නේ කියලා? මොකද මෙතන සාක්ෂි දීපු අනිත් නිලධාරී හැමකෙනෙක්ම පිළිගත්තා පොලිස් මුරපොළ හරහා තමයි අර ඒ form එක පුරවලා යවන්නේ කියලා. ඒකයි ක්‍රියා මාර්ගය කියලා. දැන් ඔබ ඊට පටහැනිවනේ කියන්නේ?

පි : නෑ ස්වාමිනි මම ඒ මම අදහස් කළේ මේ JMO වරයාට යොමු වීමක් වෙන්නේ වාට්ටුවෙන්මයි. වාට්ටුවෙන් මේක JMO වරයාට ඉදිරිපත් කරලා වෙන්නේ එහෙමයි. නමුත් GHT පොත තියෙන්නේ පොලිස් මුරපොළේ. ඒක තියෙන්නේ ඔය JMO වරයාට සටහන් කිරීමට යොමු කිරීම පමණයි. නමුත් මම

FAIR COMMENT BY JEZEEM

ගෞරවයෙන් අධිකරණයට කියා සිටින්නේ මේ JMO වරයාට ඉදිරිපත් කළ යුතුද නැද්ද කියන එක තීරණය වෙන්නේ වාට්ටුවේ භාර වෛද්‍යවරයා විසින්.

****

දැන් වේලාව : ප.ව. 07.05 යි.
මෙතැන් සිට ල/ලේ :- සවිනි මෙය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව: ප.ව. 07.05
පෙර සටහන්: මුතුමාලි මෙනවිය.
මෙතැන් සිට: සචිනි මෙනවිය.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: හරි එහෙනම් දැන් C 598 දරණ ලේඛනයේ වෛද්‍යවරයා මොකටද inform police කියලා දාලා තියෙන්නේ?

උ: ස්වාමිනි ඒ මේකේ police post එකට inform කරන්නේ නැහැ හැම සිද්ධියක්ම inform කරනවා.

ප්‍ර: නැහැ නැහැ මං අහන්නේ වෛද්‍යවරයා මොකටද C 598 දරණ ලේඛනයේ inform police කියලා දාන්නේ?

උ: ස්වාමිනි ඒ මේකේ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමේ බලාපොරොත්තුවෙන් තමයි ඒකේ inform police කියලා දාලා තියෙන්නේ.

ප්‍ර: මොන ඉදිරි ක්‍රියාමාර්ග ද?

උ: ඉදිරි විමර්ශන කටයුත්තක් කරනව නම් එහෙමයි නැත්නම් සාමාන්‍යය ආකාරයෙන් මේක අවසන් වෙනව නම් එහෙමයි ඒ අදාළ කර්තව්‍යය තමයි inform to police කියන්නේ.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර: සැකයක් තියෙන නිසා නේ මේ පොලීසියට ඉදිරිපත් කර විමර්ශනයක් කරන්න කියන්නේ. ඉදිරිපත් කරන්නේ නැත්නම් හැම අසනීපයකටම බෙහෙත් ගන්න කට්ටියට දෙන්නේ නැහැනේ ඔය forms ?

****

<u>ගරු විනිසුරු බන්දුල අතපත්තු මැතිතුමා.</u>

ප්‍ර: සරත් පෙරේරා මහත්මයා ඔය පොලිස් මුරපොළේ කොච්චර නිලධාරීන් ඉන්නව ද?

උ: ස්වාමීනි පොලිස් සැරයන් දෙදෙනෙකුත් පොලිස් කොස්තාපල්වරුන් 06 දෙදෙනෙකුත් යොදනවා. නමුත් ඒක මුර දෙකක් හෝ මුර තුනක් වශයෙන් වෙන්නත් පුළුවන්. සමහර කාර්ය බහුල අවස්ථාවක මුර දෙකකට තමයි රාජකාරියේ යෙදවෙන්නේ.

ප්‍ර: එක් වරකට කී දෙනෙක් ඉන්නවද නිලධාරීන් ?

උ: එක් වරකට ස්ථානාධිපතිවරයා ඇතුළුව පොලිස් සැරයන්වරයයි තව දුරකථන ක්‍රියාකරු විදියට පොලිස් කොස්තාපල්වරයෙකුත් උප සේවය භාර විදියට පොලිස් කොස්තාපල්වරයෙකුත් සිටිනවා.

ප්‍ර: දැන් ඔතන මේ මේ මොකක් හරි පොලිස් පරීක්ෂකන අවශ්‍ය නැහැ කියලා දීලා තිබුණොත් එහෙම ඒක අත්සන් කරන්නේ කවුද?

FAIR COMMENT BY JEZEEM

උ: ස්වාමිනි.

ප්‍ර: පොලිස් පරීක්ෂණයක් අවශ්‍ය නැතෙයි කියලා කවුරු හරි කිව්වොත් එහෙම ලෙඩාගේ කවුරුහරි භාරකාරයෙක් ඒක අත්සන් කරන්නේ කවුද?

උ: ඒක පොලිස් Post එකේ ස්ථානාධිපතිට ඒ වෙලාවේ ඉන්න ජ්‍යෙෂ්ඨ නිලධාරී අත්සන් කරන්නේ ස්වාමිනි.

ප්‍ර: දැන් මේ මෙතැන සාක්ෂියේ දී කියවුණා 06 දෙනෙක් ඉන්නවා 06 දෙනාගෙන් එක නිලධාරියෙක් 05 වැනියා ජ්‍යෙෂ්ඨත්වය අතින් එයා අත්සන් කරලා දීලා තියෙනවා?

උ: ඔව්.

ප්‍ර: දැන් ස්ථාවර නියෝග දෙනව නේද. ස්ථාවර නියෝග වලදී ඒ ස්ථාවර නියෝග වල තියනව ද එක එක නිලධාරීන් මේ මේ දේවල් කරන්න ඕන කියලා වෙන වෙනම සඳහන් කරලා තියෙනව ද ස්ථාවර නියෝග වලදී ?

උ: නැහැ ස්ථාවර නියෝග වල සඳහන් වෙලා නැහැ ස්වාමිනි. ඒක ඒ අවස්ථාවේ දී මුර පොළේ ස්ථානාධිපති තමයි දෙනිකව ඒ ටික සූදානම් කරන්නේ මුරපොළේ ස්ථානාධිපති.

ප්‍ර: එතකොට ජ්‍යෙෂ්ඨත්වයෙන් අඩු නිලධාරීන්ට සමහර විට අත්සන් කරන්න සිද්ධ වෙනවා?

උ: ඒක ස්වාමිනි අත්සන් කරනව නම් ස්ථානාධිපති මුරපොළ දැනගත යුතුයි.

ප්‍ර: නමුත් මෙතැන සිද්ධ කරලා නැහැනේ දැනීමක් කරලා නැහැනේ ?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එහෙම සිද්ධියක් වෙලා තියෙනවා?

උ: එහෙමයි ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: දැන් සාක්ෂිකරු ඔබ අධිකරණ වෛද්‍යය පෝරමයක් දැකලා තියෙනවනේ?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ අධිකරණ වෛද්‍යය පෝරමයේ මොනව ද තියෙන්නේ. අධිකරණ වෛද්‍යය පරීක්ෂණ පෝරමයේ මොනවාද තියෙන්නේ?

උ: ස්වාමිනි අනුක්‍රමික අංකයක් තියෙනවා. රෝගියාගේ සම්පූර්ණ නම සඳහන් කරන්නට එහි ලිපිනය සඳහන් කරන්නයි රෝගියාගේ වයස සටහන් කරන්නයි කොටු තියෙනවා. ඊට පස්සේ රෝගියා බීමත්ව සිටිනවා ද ඒ වගේ කරුණු විමසීමට ලක් කරන්නයි කොටු තියෙනවා. ඊට පස්සේ තුවාල වශයෙන් බරපතල තුවාල, සිරීම් තුවාල තාදිත ඒ වගේ තුවාල වර්ග හඳුනාගැනීමට සහ වෙනත් කිව යුතු කරුණු කියලා සඳහන් වෙනවා ස්වාමිනි.

President Secretary Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: හරි මේ අධිකරණ වෛද්‍යය පරීක්ෂණ පෝරමයේ කොටස් දෙකක් තියෙනවා කියලා කිව්වොත් හරිද? ඒ කියන්නේ එක කොටසක් ඉරලා වෙන් කරගන්න පුළුවන්.

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: දකුණු පැත්තේ කොටස තමා අධිකරණ වෛද්‍යය නිලධාරියා මේ පුරවන්නේ හරිද?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට අර ඉරලා ගන්න වම් පැත්ත කොටස පුරවන්නේ කවුද?

උ: පොලීසියට ගන්නවා.

ප්‍ර: මොන පොලිස් ඒකකයට ද?

උ: අදාළ පොලීසියට අපේ මරදාන පොලිස් Post එකේ රෝහල් පොලීසියේ Post එකෙන් ලබා ගන්නවා.

ප්‍ර: හරි රෝහල් පොලීසියේ රෝහලේ පොලිස් මුරපොළේ ඉන්න නිලධාරීන් තමයි මේ අධිකරණ වෛද්‍යය පරීක්ෂණ පෝරමයේ වම් කොටස පුරවන්න ඕන?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: අත්සන් කරන්න ඕන කවුද?

උ: නිලධාරියා.

ප්‍ර: ඒ වම් පැත්ත කොටස පිරෙව්වාම විතරයි නේද අධිකරණ වෛද්‍යය නිලධාරියාට එම රෝගියාව පරීක්ෂා කරන්න පුළුවන් වෙන්නේ?

උ: ස්වාමිනි අධිකරණ වෛද්‍යයවරයා විසින් පුරවන්න තව ෆෝම් එකක් තියෙනවා. ඒක අපේ ළඟ නැහැ.

ප්‍ර: අහන ප්‍රශ්නයට උත්තරේ දෙන්න. දැන් මම ඔබගේ අවධානය යොමු කරන්නේ අධිකරණ වෛද්‍යය පරීක්ෂණ පෝරමය ගැන ?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: වෙන ඒවා අමතක කරන්න. ඒ ඔබ පිළිගත්ත ඒ අධිකරණ වෛද්‍යය පරීක්ෂණ පෝරමයේ කොටස් දෙකක් තියෙනවා?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: වම් පැත්ත කුඩා තීරුවක් දකුණු පැත්ත ඊට වඩා විශාලයි. වම් පැත්ත තීරුව ඉරලා ගන්න පුළුවන්.

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: දකුණු පැත්ත තීරුව තමා අධිකරණ වෛද්‍යය නිලධාරියා පුරවන්නේ?

උ: පුරවන්නේ.

ප්‍ර: රෝගියාගේ තුවාල ලක්ෂණ ආදීය කොහොමද වුණේ කියන එක ඒ ඔක්කොම විස්තර තියෙන්නේ ඒ දකුණු පැත්තේ ?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: වම්පැත්ත කොටසේ තියෙනවා ස්ථානය, නිකුත් කර දිනය හා වේලාව IB Reference, මොකද්ද IB References කියන්නේ?

Document Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: තොරතුරු පොත් යොමුව.

ප්‍ර: එතකොට පරීක්ෂා කරන්නාගේ නම සහ ලිපිනය, හරිද?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: පරීක්ෂා කිරීමට හේතුව?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: නිකුත් කරන ලද්දේ කවුද කියන එක?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: නිකුත් කරන එක්කෙනාගේ නමයි නිලධාරියාගේ අංකයයි අත්සනයි?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට ඒ අනුව අධිකරණ වෛද්‍යය නිලධාරියෙකුට රෝගියෙකු පරීක්ෂා කරන්න පුළුවන් ද මේ අධිකරණ වෛද්‍යය පරීක්ෂණ පෝරමය නැතුව? පුළුවන් ද?

උ: අදාළ අපි දැන් ස්වාමිනි

ප්‍ර: පුළුවන් ද බැරිද?

උ: මෙහෙමයි ස්වාමිනි. ඔකේ

ප්‍ර: පුළුවන් ද බැරිද?

උ: බැහැ ස්වාමිනි.

ප්‍ර: ඔක කියන්න ඔච්චර වෙලා ගන්නේ මොකද, එතකොට ඔබ පිළිගන්නවා මේ අධිකරණ වෛද්‍යය පරීක්ෂණ පෝරමයක් නැතුව රෝගියාව අධිකරණ වෛද්‍යය නිලධාරියාට පරීක්ෂා කරන්න බැහැ කියන එක?

උ: ස්වාමිනි ඔක අධිකරණ වෛද්‍යයතුමාට යොමු කරාට පස්සේ එවන Post එකෙන් ගෙන්න ගන්නවා පෝරමයක්. පෝරමයක් ගෙන්න ගන්නවා ඒ වෙලාවේ පරීක්ෂා කරන්න. නමුත් මම සඳහන් කළේ එතැන මේ අධිකරණ වෛද්‍යයවරයාට පරීක්ෂා කරන්න කියලා අපිට කියන්න බැහැ. ඒක කියන්න ඕන රෝහලේ ප්‍රධානතම වෛද්‍යතුමා තමයි කියන්න ඕන මේ Refer කරන්න ඕන මේ අධිකරණ වෛද්‍යතුමාට.

ප්‍ර: ඇයි මං අහන ප්‍රශ්නෙට උත්තරේ දෙන්නෙ නැතුව ආයි තව දේවල් කියන්නේ?

උ: සමාවෙන්න ස්වාමිනි.

ප්‍ර: අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමයක් ඕනෙ ද නැද්ද රෝගියෙක් පරීක්ෂා කරන්න ඉස්සෙල්ලා ?

උ: ඔන ස්වාමිනි.

ප්‍ර: අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමය රෝහලක තියෙන්නේ කාගේ භාරයකද?

උ: police Post එක භාරයේ තියෙන්නේ.

ප්‍ර: එතකොට එම අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමයේ වම් කොටසක් තියෙනවා හිස් තීරුවක් දකුණු පැත්තේ තමා වෛද්‍යවරයා තොරතුරු සටහන් කරන්නේ. වම් පැත්තේ තියෙන හිස් තීරුවේ ඉල්ලා ඇති තොරතුරු කවුද ඇතුළත් කරන්නේ?

Presidential Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

ඌ: police Post එකෙන්.

ප්‍ර: රෝහලේ පොලිස් Post එකෙන්.

ඌ: ඔව් ස්වාමිනි.

ප්‍ර: එතකොට අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමයක් අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙතට යන්න අවස්ථාවක් නැහැ පොලිස් මුරපොළෙන් පරීක්ෂණ පෝරමේ පුරවන්නේ නැතුව?

ඌ: ස්වාමිනි සමාවෙන්න. ඔය පෝරමේ නැති වුණාට අධිකරණ වෛද්‍යතුමා ඇවිල්ලා එතුමාගේ තියනවා රූප සටහන් එක්කලා වෙනම Chart එකක් ඒකේ තමයි අධිකරණ වෛද්‍යතුමා mark කරන්නේ. ඒ පෝරමේ අපිට දෙන්නේ නැහැ. අපිට අවශ්‍ය වෙච්ච වෙලාවකට ඒ රෝගියා සම්බන්ධයෙන් විස්තර ලබා ගන්නවා. අපි අධිකරණ වෛද්‍ය පොරමය පස්සේ ගිහිල්ලා දෙනවා. එතකොට තමයි අධිකරණ වෛද්‍යතුමා තමයි ඒ අධිකරණයේ කටයුතු වලට අවශ්‍යය තොරතුරු ලබා දෙන්නේ ඔය පෝරමයෙන් ස්වාමිනි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර: ඒක ඒ දෙවැනි වරට ක්‍රියාත්මක වෙන එකනේ. ඉස්සෙල්ලා පරීක්ෂණ කරලා තමයි ඒ රූප සටහන් අනුව වෛද්‍යවරයා දාන්නේ ?

ඌ: එහෙමයි ස්වාමිනි නමුත් අධිකරණ වෛද්‍යතුමාට බලන්න පරීක්ෂා කරන්න අපි මේ මේ අධිකරණ වෛද්‍ය පෝරමය අවශ්‍ය නැහැ. ඒක අවශ්‍යතාවයක් නැහැයි කියන්නේ නැහැ ස්වාමිනි නමුත් අධිකරණ වෛද්‍යතුමා රෝහලේ දී වෙනම ඒකක ඒ විස්තර ඇතුළත් කර ගන්නවා ස්වාමිනි.

ප්‍ර: අධිකරණ වෛද්‍යය නිලධාරී කාර්යය නෙවෙයි තමන්ලයි පොලිස් මුර පොළේ තිබෙන කාර්යයි මේ කතා කරන්නේ?

ඌ: එහෙමයි ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: අධිකරණ වෛද්‍ය නිලධාරියා රෝහලට ආවාහම රෝහලේ ඉන්න සියළුම රෝගීන් පරීක්ෂා කරගෙන යනව ද?

ඌ: නැහැ ඒ අදාළ අධිකරණ වෛද්‍යතුමාට Refer කරලා තිබුණ ඒවා විතරයි පරීක්ෂා කරන්නේ.

ප්‍ර: අන්න ඒක තමා ඒ අධිකරණ වෛද්‍ය නිලධාරියාට Refer වෙන්නේ කොතන දී ද?

ඌ: ස්වාමීනි රෝහලේ ස්වාමීනි ඒක තීරණය කරන්නේ වාට්ටුවේ ප්‍රධාන වෛද්‍යතුමා.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර: ඉතිං ඔතන C 598 පෝරමයේ ගහලා තියෙනවා නේද ප්‍රශ්නාර්ථ දෙකකුයි Refer to police කියලා.

උ: ස්වාමිනි නමුත් මේකේ ඒකෙන් අදහස් වෙන්නේ නැහැ මේකේ IMO ට Water මේවා කරන්න කියලා පොලිස් Post එක දෙන නියෝගයක් නෙමෙයි ස්වාමිනි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර: එහෙනම් මොකද්ද කියලා තියෙන්නේ පොලීසිය?

උ: මේකේ Refer to කියලා තියෙන්නේ දැන් මේකේ දී ඉදිරි කටයුතු වලටත් මේක පොලීසියට එවනවා. Police Post එකට.

****

<u>ගරු අදිකාරී මැතිණිය.</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ ළඟ තියෙනව ද ඔය පාලිත පනාමල්දෙණිය කියන මහත්මයාගේ ස්ථාවර නියෝගයක් හරි

උ: තියෙනවා ස්වාමිනි.

ප්‍ර: එකේ 06 වැනි එකේ මොකද්ද කියන්නේ?

උ: මුරපොළ ස්ථානාධිපති රාජකාරියේ වාර්තා කළ වහාම දෛනික සිදුවීම් සම්බන්ධ පරික්ෂා කළ යුතු අතර රෝහල් ගතව සිටින ප්‍රභූවරුන්, පොලිස් නිලධාරීන් සහ ප්‍රතිකාර ලබන විශේෂ ගණයේ අපරාධකරුවන් සැකකරුවන් සම්බන්ධ පරීක්ෂා කර වාර්තාවක් මා වෙත ලබා දිය යුතුයි.

ප්‍ර: කවුද මා වෙත කියන්නේ කවුද ඒ?

උ: ස්වාමිනි මේකේ සඳහන් වෙන්නේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීතුමාට. මේ සම්බන්ධයෙන් වාර්තාවක් රෝහල් පොලීසියේ ස්ථානාධිපති විසින් ලිඛිතව හෝ වාචිකව හෝ උදේ ලබාදීමක් කරනවා ස්වාමිනි.

ප්‍ර: දැන් එතකොට රෝහල් පොලීසියේ ඉන්න ස්ථානාධිපතිවරයාගේ අධීක්ෂණ නිලධාරියා ඔබද? ඔබ නේද අධීක්ෂණය කරන්නේ? ඔබ යටතේනේ රෝහල් පොලීසිය ක්‍රියාත්මක වෙන්නේ නේද?

උ: ඔව්. එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔහු ඔබව දැනුවත් වෙනව ද, ඔබව සොයා බලනව ද මේ රෝහල් පොලීසියේ ස්ථානාධිපති මොනව ද කරන්නේ කියලා?

උ: ස්වාමිනි මේකෙන් අදහස් වෙන්නේ රෝහලේ ස්ථානාධිපතිවරයා විසින් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීතුමාට මේ සම්බන්ධයෙන් දැනුම් දිය යුතුයි. මම හරහා දැනුම් දෙන්න ඕනේ නැහැ. ඊටත් වඩා විශේෂ සිද්ධි තිබ්බොත් තමා වසම තුළ මම පොලිස් අධිකාරීතුමාට හෝ ජ්‍යෙෂ්ඨ නිලධාරියාට දැනුම් දෙන්නේ. රෝහලේ ඇතුළත වෙන සිද්ධි සම්බන්ධයෙන් සෘජුවම ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීතුමාටයි ස්ථානාධිපති දැනුම් දිය යුතුයි.

Judicial Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ කියන්නේ රාජකාරීමය වශයෙන් වගකියන්නේ ජ්‍යෙෂ්ඨ සහකාර පොලිස් අධිකාරීට ඔබට වග කියන්නේ මොනව සම්බන්ධයෙන් ද මේ රෝහල් පොලිසියේ ස්ථානාධිපති?

උ: මම වග කියන්නේ මේ පරිපාලන කටයුතු වලට පමණයි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකරු අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරම ඔබගේ පොලීසියට ලැබෙන්නේ කොහෙන් ද, පොලිස් මූලස්ථානය හරහා ද?

උ: නැහැ අපි ලබා ගන්නේ අපිට වෙනම ස්ටෝස් තියෙනවා ස්වාමිනි. ඒකෙන් තමයි අපි ලබා ගන්නේ.

ප්‍ර: ඒ කියන්නේ වෙනම ස්ටෝස් කියන්නේ පොලිස් ස්ටෝස් ?

උ: ඔව්. පොලිස් ස්ටෝස්.

ප්‍ර: එම ස්ටෝස් එකෙන් බඩු ගන්න පුළුවන් වෙන්නේ පොලීසියේ නිලධාරින්ට විතරයි නේද?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට එම ස්ටෝස එකෙන් ගන්නා බඩු පාවිච්චි කරන්න වෙන කාට හරි පුළුවන් ද?

උ: බැහැ ස්වාමිනි.

ප්‍ර: එතකොට අධිකරණ පරීක්ෂණ පෝරමය ගන්න පුළුවන් පොලිස් ස්ටෝස් එකෙන් පොලිස් නිලධාරීන්ට පාවිච්චි කරන්න විතරයි කියලා ඔබ පිළිගන්නවද?

උ: පිළිගන්නවා ස්වාමිනි.

****

<u>රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය.</u>

ප්‍ර: දැන් ඔබට අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමයක් පෙන්වා සිටියොහොත් එය හඳුනාගැනීමේ හැකියාවක් තියෙනව ද?

උ: තියෙනවා ස්වාමිනි.

සභාපතිතුමනි මේ අවස්ථාවේ දී ලේඛනයක් සාක්ෂිකරු වෙත පෙන්වා සිටී.

ප්‍ර: ඔබට මෙම ලේඛනය අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පිරිස්සන පෝරමයක් වශයෙන් හඳුනාගැනීමේ හැකියාවක් තියෙනව ද?

උ: තියෙනවා ස්වාමිනි.

ප්‍ර: ඔබ මෙම ගරු කොමිෂන් සභාවට සාක්ෂි ලබා දෙමින් සඳහන් කරන්නට යෙදුණු එම අධිකරණ වෛද්‍ය පිරික්සන පෝරමයකින් තිබෙනව ද ඇතුළත් වී ?

උ: ඇතුළත් වෙලා තියෙනවා ස්වාමිනි.

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේ දී එම ලේඛනය C 664 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටී.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

මෙම සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් අති උතුම් මැල්කන් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතීඥවරයාට අවශ්‍ය දැයි අසමි.

අවශ්‍ය නොමැති බව දන්වයි.

සාක්ෂිකරු මුදා හරී.

වේලාව: ප.ව. 07.20

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශයේ නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය: 2020.06.16 වේලාව: ප.ව. 07.20

සටහන් කළේ - සචිනි මදුෂිකා.

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා -සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

පෙනී සිටීම:-

* ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය , ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය,රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා, රජයේ අධිනීතිඥ දිලන්ත එස් කළුදුරුවගේ මහතා සහ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* රෝමානු කතෝලික දේවස්ථානය වෙනුවෙන් අද දින නීතිඥ ගිම්හානි ගමගේ මහත්මිය සමඟ ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා පෙනී සිටී.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සාක්ෂි අංකය	:	714
නම	:	**සමරසිංහ ආරච්චිගේ ඇන්ඩෘ ලාල් පෙරේරා.**
වයස	:	**අවු 59**
ජාතිය	:	**සිංහල**
ආගම	:	**රෝමානු කතෝලික**
දැනට දරණ තනතුර	:	**යුධ හමුදාවේ සේවය කරලා විශ්‍රාම ගිහින් දැනට රම්‍යා හෝල්ඩින් කියන ඇපරල් එකේ සේවය කරන්නේ.**

ප්‍රතිඥා දී කැඳවයි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර: මේජර් ජෙනරාල් පෙරේරා මහත්මයා ඔබ යුධ හමුදා සේවයට බැඳුණේ මොන වසරේදී ද?

උ: ස්වාමිනි මම 1980 යුධ හුමදාවට බැඳුණේ.

ප්‍ර: කවුරු විදියට ද?

උ: දෙවන ලුතිනන් වශයෙන්.

ප්‍ර: එවක් පටන් ඔබ යුධ හමුදාවේ ලබලා තියෙන උසස් වීම් මොනවද?

උ: 1980 මං දෙක, ලුතිනන් හැටියට පත් වුණායින් පස්සේ ලුතිනන් හැටියට 1981 ම පත් වෙනවා. ඊට පස්සේ කපිතාන් හැටියට 986 පත් වෙනවා. ඊට පස්සේ මේජර්වරයෙක් හැටියට 1990 පත් වෙනවා. ඒ කාලේ ඉන්දියන් හමුදාව තිබුණේ ත්‍රිකුණාමලයේ මං එහිදී උසස්වීම් ලබන්නේ. ඊළඟට ලුතිනන් කර්නල් හැටියට මං මන්නාරමේ සේවය කරන කොට පත් වෙනවා. එහි දී බලඇණියක් භාර ගන්නවා. ඊට පස්සේ Full කර්නල් හැටියට මං Promote වෙනවා. මට වසර මතක නැහැ සමාවෙන්න. ඊළඟට බ්‍රිගේඩියර් හැටියට මං උසස්වීම් ලබනවා. ඒක මං ත්‍රිකුණාමලයේ දී ආයිත් Promote වෙන්නේ. උසස්වීම් ලබන්නේ. ඊළඟට මං masters කරන්න පකිස්ථානයට යනවා. ඒකෙන් පස්සේ මං මේජර් ජෙනරාල් කෙනෙක් හැටියට 2010 උසස්වීම් ලබනවා.

ප්‍ර: උසස්වීම් ලැබුවා. එතකොට ඔබට මතක ද ඔබ මේජර් ජෙනරාල් විදියට නැගෙනහිර පළාතේ අඥාපතිවරයා විදියට පත්වීමක් ලබනවා?

උ: ඔව් ස්වාමිනි.

ප්‍ර: ඒ මොන වසරේදි ද?

උ: 2011.

ප්‍ර: ඔබ 2011 වසරේ එම තනතුරට පත් වුණාට පස්සේ කොපමණ කාලයක් ඒ තනතුරේ සේවය කෙරුව ද?

Presidential Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

උ: මගේ මතකයේ හැටියට අවුරුදු 04 යි මාස 05 කට කිට්ටු වෙන්න මං 2011 ජුලි මාසේ මං භාර ගෙන නැගෙනහිර අඥාපති හැටියට 2015 පෙබරවාරී මසේ භාර දෙනවා.

ප්‍ර: එතකොට මං ඇහුවොතින් කෑම්ප් කියක් තියෙනවා ද කියලා ඒක බුද්ධි තොරතුරක් නෙවෙයිනේ?

උ: නැහැ ස්වාමිනි.

ප්‍ර: ඔබට මේ ගරු කොමිෂන් සභාවට කියන්නට පුළුවන් ද ඔබ නැගෙනහිර පළාතේ අඥාපති විදියට සේවය කරන විට යුධ හමුදාවේ ඔබේ පාලනය යටතේ අනු කණ්ඩ කියක් විතර තිබුණ ද?

උ: ස්වාමිනි මට මතක හැටියට අනු කණ්ඩ වලින් 56 කට කිට්ටු වෙන්න තිබුණා. 56 මං ප්‍රධානයෙන් කියන්න ඕන මේජර් ජෙනරල් හැටියට අඥාපති හැටියට මං භාර ගන්න කොට සේනාංක 02 ක් තිබුණා. එක සේනාංකයක් 22 සේනාංකය . ඒක ත්‍රිකුණාමලේ භාරව දිස්ත්‍රික්කය. ඊළඟට 23 වැනි සේනාංකය කියලා සේනාංකයක් මඩකලපුවේ තිබුණා. මං පසුව දැන් වත්මන් ජනාධිපතිතුමා එවකට ආරක්ෂක ලේකම්තුමා හැටියට ඉන්න කොට ආරක්ෂක සමාලෝචනයේ දී මට හැගිච්ච දේ තමයි අම්පාර දිස්ත්‍රික්කය බලැනි වලින් අඩුයි. ඒ නිසා මං ඉල්ලුවාහම නව සේනාංකයක් නැවත ස්ථාපිත කරා මට මතක හැටියට 2012 දී. ඒ අනුව මගේ වකවුනුවේ දී සේනාංක 03 ක් දිස්ත්‍රික්ක 03 ට ස්ථාපිත වෙලා තිබුණා.

ප්‍ර: එතකොට ත්‍රිකුණාමලය, මඩකලපුව සහ අම්පාර කියන දිස්ත්‍රික්ක 03 ටම ඔබට අවශ්‍ය සේනාංක ලැබිලා තිබුණා?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එහෙම නම් ඔබට කියන්නට පුළුවන් ද ඔබ අඥාපතිවරයා විදියට නැගෙනහිර පළාතේ කටයුතු කරන විට පොලීසියේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා විදියට කටයුතු කෙරුවේ කවුද කියලා මතක ද?

උ: ස්වාමිනි මට මතක විදියට කිහිප දෙනෙක් හිටියා. මං මුල් කාලයේ ඉන්න කොට දමිළ Senior DIG මට මතක නම එන්නේ නැහැ. නමුත් DIG පූජිත Senior DIG විදියට හිටියා.

ප්‍ර: පූජිත ජයසුන්දර මහත්මයා?

උ: පූජිත ජයසුන්ර මහත්මයා. ඊළඟට

ප්‍ර: පසුව පොලිස්පතිතුමා වුණ කෙනා එතුමා?

උ: ඔව් . ඊට පස්සේ තව කෙනෙක් හිටියා අග භාගයේ දී

ප්‍ර: නන්දන මුණසිංහ මහත්මයා හිටිය ද?

උ: ඔබ හරි ස්වාමිනි.

ප්‍ර: නැගෙනහිර පළාතේ ඔබේ පාලනය යටතේ යුධ හමුදාවේ බුද්ධි කාණ්ඩ ක්‍රියාත්මක වුණා ද?

FAIR COMMENT BY JEZEEM

උ: එහෙමයි ස්වාමිනි. මං කෙටියෙන් කිව්වොත් මං භාර ගන්න කොට එක බුද්ධි බලකායයි තිබුණේ. මට බොහෝම ටික කාලයකින් එවකට සිටිය ආරක්ෂක ලේකම්තුමා ගෝඨාභය සර් මං එනකොටත් එතුමාට

ප්‍ර: ඒ කියන්නේ වත්මන් ජනාධිපති

උ: වත්මන් ජනාධිපතිතුමා. තවත් බලඇණියක් මට ලබා දුන්නා. මොකද බුද්ධි තොරතුරු කියන එකෙන් තමයි අපි ගොඩාක් අපේ සාර්ථක මෙහෙය වුණේ. ඉතිං බුද්ධි බලකා දෙකකින් තමයි මගේ වකවානුවේ අපි සම්පූර්ණ බුද්ධි තොරතුරු ලබාගත්තේ. ඒ අය ස්ථාපිත කරලා තිබුණා එක බලඇණියක් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට. අනිත් බලඇණියක් මඩකලපුවට සහ අම්පාර දිස්ත්‍රික්කයට.

ප්‍ර: එතකොට මඩකලුපවට හා අම්පාර කියන දිස්ත්‍රික්ක දෙකටම එක බුද්ධි බලඇණියක් හිටියේ?

උ: ඔව්.

ප්‍ර: දැන් ඔය බුද්ධි බලඇණි වල පාලනය කවුරු සතුව ද තිබ්බේ?

උ: ස්වාමිනි

ප්‍ර: ඔවුන් වාර්තා කළේ කාටද?

උ: ක්‍රියාන්විතයේ දී ඒ සියළුම බලඇණි එන්නේ ක්‍රියාන්විතයට පමණක් මගේ යටතේ. නමුත් ඒ අයගේ .

ප්‍ර: අපිට ඔබට තරම් හුරු නැනේ ඔබ කියන වාග් මාලාවන්. ඒක නිසා පොඩ්ඩක් පැහැදිලි කරන්න කරුණාකරලා. මොකද්ද මේ ක්‍රියාන්විතය කියන්නේ?

උ: ස්වාමිනි ක්‍රියාන්විතය කියන්නේ සාමාන්‍යයෙන් ස්වාමිනි In certain Operations when you are in the area ක්‍රියාන්විතය කියන්නේ Operations එකේ යම් යම් ක්‍රියාන්විත ඒ කාලේ යුද්ධයක් තිබුණේ නැහැ. යුද්ධයෙන් පස්සේ නමුත් ස්වභාවික විපත්වලදී ඒ කියන්නේ විශේෂයෙන් සෑම අවුරුද්දකම වතුර ගැලීම් සිද්ධ වෙනවා. නියඟයට සූදානම් වෙන්න සිද්ධ වෙනවා. ඉතිං ඒ වගේ තව පොලීසිය සහ STF එකට සහාය දෙන්න යම් යම් දේවල් වලදී අපිට සහයෝගය දෙන්න වෙනවා. ඒකේදි ඒ සේනාංක වලට අපි දිලා තියෙනවා සේනාංකාධිපති යටතේ සහ ඒ බලඇණි යටතේ ඒ කණ්ඩායම් වලින් ඒ ක්‍රියාන්විත ඒ Operation වලට සහාය දෙන්න.

ප්‍ර: ඒ සියළුම ක්‍රියාන්විතයන් වලට අදාළව ඔබට බලය තිබුණා ඔවුන් පාලනය කරන්න?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට මේ යුධ හමුදාවේ ඉන්නවා නේද බුද්ධි අංශයේ ප්‍රධානියෙක්?

උ: එහෙමයි.

ප්‍ර: කවුද ඒ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: බුද්ධි අංශය යන්නේ යුධ හමුදාවේ ඉන්නවා බුද්ධි අධ්‍යක්ෂක. ඔහුගේ යටතේ තමයි බුද්ධි බලකා වල සෑම දෙයක්ම පාලනය වන්නේ. එතකොට ක්‍රියාන්විතයට එන කොට ස්වාමිනි ඒ බුද්ධි බලකාය මගේ ඒ කියන්නේ නැගෙනහිර ඉන්න අය මට වාර්තා කරනවා immediately කරනවා වගේම ඒක උඩට යනවා ඒ Line එකෙන්ම බුද්ධි අධ්‍යක්ෂකට. එතකොට අපි මම ගොඩක් මගේ වකවානුවේ දී සාර්ථක වෙන්න තිබිච්ච හුඟක්ම දේ මේ බුද්ධි බලකා 02 ඇතුළු මුළු නැගෙනහිරම හිටපු හැම ත්‍රිවිධ හමුදාවේ ම හැම බුද්ධි අංශ, පොලීසියේත් STF එකෙත් හැම බුද්ධි අංශයේම නියෝජනය සමාලෝචනයක් සෑම මසකම තියෙනවා. ඒ සමාලෝචනය දී ප්‍රදේශයේ තියෙන සෑම තොරතුරක්ම අපි කතා කරනවා. එතකොට එතැනදි ම ස්වාමිනි අපිට හුඟක් දේවල් නිරාකරණය කරන්න පුළුවන්. ඒකම වත්මන් ජනාධිපතිතුමා ලේකම් හැටියට ඒ සමාලෝචනයම තියෙනවා හැම මාසෙකම බුද්ධි අධ්‍යක්ෂකත් එක්ක. ඒකේ ත්‍රිවිධ හමුදාපති ඉදිරිපිට. ඉතිං එතැනදි ලේසි වෙනවා මොකද අපි එතකොට කරලා ඉවරයි monitor කිරීමක් විතරයි ලේකම්තුමාගෙන් අපිට මට Calls එනවා. සර් ලාල් අර වැඩේම කරා ද කිව්ව ම මං හරි සර් ඔක්කොම monitor කරලා ඉවරයි කිව්වම ඒ වගේ බොහොම ස්වාමිනි සම්බන්ධතාවය Line එකක් තිබිච්ච කාලයක් තිබුණේ. එතකොට සෑම බුද්ධි අංශයකම ප්‍රධානියෙක් හැම දෙයක්ම භූමියේ දී සිදුවෙන දේවල් හැම වෙලාවේ ම මගේ හරහා කියලා එහෙමත් නැත්නම් අධ්‍යක්ෂකට යම් තොරතුරු වෙන පැත්තකින් ආවාත් මාව දැනුවත් කිරීම් කරනවා භූමියේ දී ඒ දේවල් සිද්ධ වෙනව ද කියලා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ ප්‍රකාශ කරන්නට යෙදුණු ඒ බුද්ධි අංශයේ ප්‍රධානියා DMI නැත්නම් Director Military Intelligence කිව්වොත් නිවැරදි ද?

උ: ඔබ හරි ස්වාමිනි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර: ඔබ දැන් මා අසන ලද ප්‍රශ්නයට පිළිතුරු දෙන ගමන් ඔබගේ පාලන කාලය තුළදී ඉතා හොඳින් එම නැගෙනහිර පළාතේ පාලනය සහ කටයුතු සිදු වුණු බව මේ බුද්ධි අංශ වල උදව්වෙන් එහෙම වුණාය කියන එක බොහෝම තෘප්තිමත් හැඟීමෙන් මේ ගරු කොමිෂන් සභාවට කිව්ව නේද?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: දැන් ඇයි පෙරේරා මහත්මයා ඒ වගේ නිසැකව නිශ්චිව ඔබට මේ ගරු කොමිෂන් සභාවට එහෙම කියන්නට හැතියාව ලැබෙන්නේ ? ඔබ මොන වගේ ක්‍රමෝපායන් ද පාවිච්චි කෙරුවේ ඔය තත්ත්වය ළඟා කර ගන්නට සාර්ථක භාවයක් ලබා ගන්නට?

උ: ස්වාමිනි මං ප්‍රථමයෙන් කියන්න ඕන මං භාර ගන්න කොට මේ තිබිච්ච තත්ත්වය ඒ ඉන්න දෙමළ මුස්ලිම් සහ සිංහල අය ත්‍රිවිධ හමුදාව සහ පොලිසියත් එක්ක හොඳ සුහදතාවයකින් නෙමෙයි මං භාර ගන්න 2011 දී තිබුණෙ. ඒකට හේතුව ග්‍රීස් යකා කියන සිදුවීමත් එක්ක ඒ අය බොහෝම කල කිරීමෙන් හිටියේ.

ප්‍ර: මොකක් එක්ක ද?

උ: ග්‍රීස් යකා කියන සිදුවීම මේ 2011 ශ්‍රීස් යකා කියන අර

ප්‍ර: අර ග්‍රීස් යකා?

උ: ඔව්. ඒ කාලයක් තිබුණා තැන් තැන් වල. ඒක නිසා ඒකත් එක්ක ඒ මිනිස්සුන්ගේ මම එනකොට සිවිල් ජනතාව මුස්ලිම් ළමයි මැරිලා තිබුණා. පොලීසි වලට ගහලා වට කරලා තිබුණා. ඒ මං භාර ගන්න කිට්ටුව. භාර ගත්තයින් පස්සේ මට ඒකත් එක්ක ආරක්ෂක සමාලෝචනය කරන කොට තේරුණා සිවිල් අයයි හමුදායි පොලීසියයි අතර ලොකු ගැප් එකක්. ඉතිං ඒක එකක්. ඊළඟට තොරතුරු ගලාගෙන ඒමේ අඩුවකුත් දැණුනා. ඉතිං අපි අර බුද්ධි සමාලෝචනයේ දී ඒක දියුණු කරගෙන යන කොට අපිට ගොඩාක් ඒවාට කිට්ටු වෙන්න පුළුවන් වුණා ඒ ප්‍රදේශයේ හිටපු ආගමික නායකයින් එක්ක සුහදව කතා කරලා ඒ අයව කිට්ටු කරගන්න පුළුවන් වුණා. ඒ අය මාර්ගයෙන් ප්‍රදේශයේ තොරතුරු හොයා ගන්න පුළුවන් වුණා තව.

ප්‍ර: මං යම් බාධාව කිරීමක් කරනවා ඒ අවස්ථාවේ දී. ඔබ මේ බුද්ධි අංශ සහ ඔබේ නිලධාරීන් යොදා ගෙන මේ ප්‍රදේශයේ තක්සේරුවක් කරාද, ඒ මන්ද නැගෙනහිර පළාත කියන කොට මා කිව්වොතින් නිවැරදිද, එහි ද්‍රවිඩ, මුස්ලිම් වගේම සිංහල ජන කොට්ඨාශත් ජීවත් වෙනවා කියලා. නැගෙනහිර පළාතේ?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට එහෙම නම් මේ ගොල්ලෝ විවිධ ආගමික පසුබිමකින් ඉන්න, විවිධ මතිමතාන්තර දරණ, විවිධ ගති සිරිත් තියෙන පුද්ගලයින් නේ?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට ඒ අයව ඔබ අද දින මේ ගරු කොමිෂන් සභාවට කියන ආකාරයට සාර්ථකව ඔබට පාලනය කරන්නට හැකියාව ලැබුණ නම් ඔබ 2011 දී නැගෙනහිර පළාත භාර ගන්නා අවස්ථාවේ දී ඒ තිබුණු තත්ත්වය පිළිබඳව යම් ආකාරයක Assessment එකක් නැත්නම් තක්සේරුවක් ලබා ගත්තද?

උ: එහෙමයි ස්වාමිනි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: කොහොමද ඒක කළේ?

උ: ඒ තක්සේරුව ලබා ගත්තේ මං ප්‍රථමයෙන්ම ඒ ප්‍රදේශයේ හිටපු හමුදා භාර නිලධාරීන් සියළු දෙනාටම කැඳෙවුවා. නාවික හමුදාව, Air force හැම ත්‍රිවිධ හමුදාවේම පොලීසියේ STF ඒ අයත් එක්ක සාකච්ඡා කරා ආරක්ෂක තක්සේරුවක් කරන්න. ඒ සාකච්ඡාවේ දී තමයි මට දැනුණේ ගොඩාක් ඒ ඒ තැනවල තිබෙන අඩුපාඩු ඒකෙන් තමයි දැණුනේ අම්පාර කියන ප්‍රදේශයට ආරක්ෂාව මදි කියලත්. ඒ කියන්නේ ඒකෙන් තමයි හට පිරිස් ඒකට වැඩිපුර යොදවන්න ඕනේ.

ප්‍ර: වැඩිපුර ඉල්ලා ගත්තේ ඒ අනුව?

උ: ඔව්. එතකොට ඒකේ දී බුද්ධි අංශ ප්‍රධානිනුත් සහභාගි වුණා. ඒ අයගෙනුත් තමයි මට තොරතුරු ලැබුණේ බුද්ධි අංශයේ ස්ථාපිත කිරීමේ දී මදි අඩුපාඩු. ඒවත් යන කොට සමාලෝචනයේ දී තමයි මම ඊළඟට පටන් ගත්තේ අපි හැම මාසෙම බුද්ධි සමාලෝචනය කළ යුතුයි. ඒකට සෑම එජන්සියක්ම එන්න ඕන. ඒකේ CID, NIB කියන හැම වර්ගයම ඔක්කෝම 70 ගාණක් විතර එකතු වෙනවා මගේ Office එකේ conference hall එකේ උදේ 09.00 ට පටන් ගත්තාම හවස 03.00 විතර වෙනකම් අපි කතා කරනවා. ඉතිං ඒක සාර්ථකත්වය කොතෙක් දුරද කිව්වොත් පොලීසිය පවා දැන ගන්නවා අපි කොයි තරම් දුරට ගිහිල්ලා ද කියලා.

ප්‍ර: මදක් බාධා කරනවා. ඒ කියන්නේ ඔබ ඔය 70 ක් පමණ එකතු වෙනවාය කියලා කිව්වේ නැගෙනහිර පළාතට අනුයුක්තව සේවය කරන නිලධාරීන් ද?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ ?

උ: ඔව්. සේවය කරනවා කියන්නේ ඒකේ බුද්ධි අංශයේ ඉන්න නියෝජනය කරන අය පමණයි.

ප්‍ර: ආ ඒ අය පමණයි?

උ: ඒ අය. ඒ කියන්නේ ඒ බුද්ධි අංශයේ නියෝජනය කරන අය ඒ ඒ ප්‍රදේශයේ ඒ ගොල්ලන් කරන රාජකාරී සමාලේචනය කරනවා.

ප්‍ර: එතකොට ඒ බුද්ධි අංශය කිව්වාහම ඒක යුධ හමුදාවේ අය විතරද නැත්නම් අනිත් ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ ඉන්න බුද්ධි අංශවල අයත් ඒ ඔබගේ සම්මන්ත්‍රණයට සහභාගි වුණා ද?

උ: ස්වාමිනි මං නිවැරදි කළ යුතුයි සෑම මාසෙකම කරන ඒ සමාලෝචනයට සියළුම නියෝජනය කරන ත්‍රිවිධ හමුදාව , පොලීසිය, STF ඒ හැමෝගේම Int අය බුද්ධි අංශයේ අය සහභාගි වෙනවා.

ප්‍ර: ඔක්කොමලා එතකොට, ඔබට හරස් කඩක් ලැබෙනවා නැගෙනහිර පළාතේ තත්ත්වය කොයි වගේ ද කියලා?

FAIR COMMENT BY JEZEEM

උ: මොකද විශේෂයෙන් ඒ ප්‍රදේශයේ සිටියා ස්වාමිනි පුනරුත්ථාපනය කරපු LTTE. එතකොට ඒකටම හරියන්න NGOS ලා ක්‍රමයකින් ඇවිල්ලා හිටියා. අපිට ඒ තොරතුරු ගලාගෙන ආවා. එතකොට අපිට තේරුණා හැම ඒජන්සියකම අපි කොටස් වලට අපේ හිටපු අයට තේරුම් කරලා දුන්නා ඔය ගොල්ලෝ කවර් කරන්න ඕන කොයි කොයි area එක ද කියලා. එතකොට හරි ලේසි වුණා එකක් විවෘත භාවයක් ආවා. තරහකාරීත්වයක් ඒ ගොල්ලෝ අතර නැති වුණා. මොකද common goal එකකට යන්නේ. ඒ ගොල්ලොන්ටම තේරුණා මේ සාකච්ඡා කරන එක තවත් හොඳයි මොකද ඒ ගොල්ලන්ගේ අධ්‍යක්ෂක හරහා වත්මන් ජනාධිපතිතුමා ගාවට යන්නේත් ඒ සමාලෝචනයමයි. ඉතිං අපි අන්තිමට වෙන්නේ Ground එකේ එහෙම නැත්නම් භූමියේ අපි කළ යුතු දේවල් තේරුම් අරගත්තා හරියට.

ප්‍ර: එතකොට ඒ වගේ තක්සේරුවක් කරලා ඔබ ලබා ගන්නා ලද ඒ අවබෝධය අනුව යම් වැඩපිළිවෙළවල් නැගෙනහිර පළාතේ ක්‍රියාත්මක කරාද?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: මොනවද ඒවා? කියක් විතර ක්‍රියාත්මක කරාද? දැන් එකක් තමයි ඔබ කිව්වා ඒ කරපු දේවල් වලින් ත්‍රිවිධ හමුදාවෙත් පොලීසියෙත් බුද්ධි අංශවල අය එක්රැස් කරලා සමාලෝචනය කිරීම් නිරන්තරයෙන් කෙරුවා ය කියලා. ඒ හැරෙන්නට වෙන මොනව ද කළේ?

උ: ස්වාමිනි තව මට කරන්න පුළුවන් වුණා මේ අපි එහි ඉන්න ආගමික නායකයෝ. ඒ අයවයි දේශපාලන Local politicians ඒ අයවත් ගෙන්වලා බොහෝම සුහද සාකච්ඡාවලින් අපි තොරතුරු ගත්තා. අපේ competence එක ඒ ගොල්ලොන්ට පෙන්නලා ඒ ගොල්ලන්ගේ තිබෙන ප්‍රශ්න පවා අපිට තේරුම් අරගෙන අපි පුළුවන් උපරිම Ground එකෙන් දෙන්න පුළුවන් උපරිම ඒ ගොල්ලොන්ට දුන්නා. ගොඩාක් අයට තියෙන්නේ අලි ඝට්ටනය. ඒවට අපි උපාය මාර්ග ඒ ගොල්ලොන්ට competence දෙන ඒවා එතැනින් වෙනින් ගියාම සමහර ද්‍රවිඩ අයට ඉතිං තියෙන පාරවල්වල ප්‍රශ්න පවා අපි ඒ අයට උදව් කරන්න ගත්තා. අපි ඒවා කිරීමේ දී සාකච්ඡා වලදී තව දෙයක් තමයි අපිට තොරතුරු දැන ගන්න හම්බ වුණා ඒ ප්‍රදේශයේ තියෙන නොයෙකුත් දේවල් එක්ක. Land Encroachment එක. ඒ කියන්නේ

ප්‍ර: ඉඩම් බලෙන් අත්පත් කිරීම

උ: ඉඩම් බලෙන් අත්පත් කිරීම වෙනවා. එතැනින් ගියාම මිනිස්සු පිටරට යන ජාවාරම්

ප්‍ර: මිනිස් ජාවාරම්

FAIR COMMENT
BY JEZEEM

උ: මිනිස් ජාවාරම් පවා අපිට හොයා ගන්න හම්බු වුණා. එතැනින් ගියාම අපිට නිදන් ඒ ප්‍රදේශවල මහා පරිමාණයෙන් නිදන් හැරීම පවා අපිට තොරතුරු ගලාගෙන එන්න ගත්තා. අපි ඒ හැම දේකටම පොලීසියත් එක්ක හුඟක් සුහදව පොලීසියේ සහාය තමයි මොකද Law and order වලට පොලීසිය තමයි ගෑවෙන්නේ. ඉතිං පොලීසියේ සහායත් එක්ක අපි හුඟාක් ඒ ක්‍රියාන්විත වලදී මැඩ පවත්වන්න පුළුවන් වුණා.

ප්‍ර: ඒ වගේම ඔබ කිව්වා අම්පාර ප්‍රදේශයේ ආශ්‍රිතව යුධ හමුදා භට පිරිස් ප්‍රමාණවත්ව නොසිටි නිසා, තවත් වැඩි පිරිසක් ලබා ගත්තාය කියලා. ඒකත් මේ ඔබ ඔය මේ ගත්ත පියවරයන් වලින් එකක් ද?

උ: එහෙමයි ස්වාමිනි. සේනාංකයක් ස්ථාපිත කරා. ඒක මල්වතු ඔය ඒකෙන් විශාල ප්‍රමාණයක් අපිට ඒ භූමි රජයේ තියෙන භූමි ප්‍රමාණවල් ආරක්ෂා කරන්න පුළුවන් වුණා.

ප්‍ර: එතකොට දැන් ඔහොම නිරන්තරයෙන් මේ බුද්ධි අංශ වෙතින් ඔබට තොරතුරු ලැබෙන කොට මේ ප්‍රදේශය ආශ්‍රිතව ජීවත් වන විවිධ ජන කොටස් පිළිබඳව රටේ ආරක්ෂාව ස්ථාපිත කිරීම සඳහා යම් යම් පියවර ගැනීමේ අවශ්‍යතාවයක් ඔබට පෙනුන ද?

උ: එහෙමයි ස්වාමිනි . සමහරක් තැන් වල ජාතික ආරක්ෂාවට තර්ජනයක් වෙයි කියන අවස්ථා වලදී යම් යම් පියවරවල් ගන්න සිද්ධ වුණා. පියවරවල් කියන්නේ එහෙම දේවල්වල තොරතුරුවලට විශේෂයෙන් ආවේ අපි අඳුරගත්තා යම් යම් කණ්ඩායම්. ඒ කියන්නේ Radical Groups. ඒ ප්‍රදේශයට ජාතික ආරක්ෂාවට තර්ජනයක් වෙයි කියලා දැන ගන්න අපිට ආරංචි වුණා ඒ බුද්ධි අංශ වලින් ඒකේ එක Group එකක් තමයි තවුහිද් ජමාත් කියන කණ්ඩායම. ඊට පස්සේ ඒ PNG People of Good Governance ඇත්තටම ඒ ගොල්ලන්ගේ ඒ ප්‍රදේශයේ බුද්ධි අංශ වලින් ආරංචි වෙච්ච එක ස්වාමිනි ඒ ගොල්ලෝ ගහන සඟරාවක් තියෙනවා ඒ ප්‍රදේශයට ඒ සඟරාවේ කියවන කොට තේරෙනවා සම්පූර්ණ බෞද්ධ ආගම විවේචනයට.

ප්‍ර: නම මොකද්ද සඟරාවේ ඔබට මතකද ?

උ: මට ස්වාමිනි මතක නැහැ.

ප්‍ර: ඒ සඟරාවේ පිටපතක් එහෙම තියෙනව ද?

උ: නැහැ ස්වාමිනි . ඒවා ඔක්කොම බුද්ධි අංශ වල කරන්නේ මට තියෙන්නේ නියෝග දෙන්න පමණයි. නමුත් ඒ Channel එකෙන් බුද්ධි අංශ වල සමහර විට ගොනු කරලා ඇති ඒ කාලේ. මොකද මං හිතන්නේ ඒ කාලේ දකුණේ බොදුබල සේනාවේ තිබිච්ච යම් යම් ක්‍රියාමාර්ග වල විකෘති දේවල් හැටියට ඒ කියන්නේ ස්වාමීන් වහන්සේලාගේ පින්තූර පවා ඒවා දාන්නේ විකෘතිව එතකොට අපිට තේරුම් ගියා

ප්‍ර: කවුද ඔයි සඟරාව ගැහුවේ?

FAIR COMMENT BY JEZEEM

උ: ඔය PMGG කියන Group එක.

ප්‍ර: එතකොට ඒ ගොල්ලෝ මොන දැන් ඔබ කිව්වනේ සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් කියන කට්ටිය ඒ වගේම බර්ගර් කට්ටියත් ඉන්න ඇතිනේ. බර්ගර් ජාතිකයනුත් ඉන්න ඇතිනේ?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට මේ හැම ජන කොට්ඨාශයක්ම නැගෙනහිර පළාතේ ජීවත් වෙනවායි කියලා. එතකොට ඔය PMGG කියන්නේ මොන ඔය කොට්ඨාශ වලින් මොන කොට්ඨාශයට අයිති එකක් ද?

උ: ඒ මුස්ලිම් කොටසක්.

ප්‍ර: ඒ අයත් මුස්ලිම්?

උ: මුස්ලිම්. ඒ වගේම ස්වාමිනි ඔය මාධ්‍යය ජාලා හුඟක් වැඩි වෙන්න ගත්තා. ඒ පැත්තේ. ඔය Twitter message වලින් ඔය web අඩවි ඒවා ඩිරෙට්,

ප්‍ර: ඒ කියන්නේ 2011 වගේත් Twitter වලින්

උ: Twitter වලින් තිබුණා ටිකෙන් ටික. මොකද අපි දැක්කා සමහර දේවල් හරි ඉක්මන්ට පිරටවල් වලට යනවා. ඒ බුද්ධි අංශ වල නඩත්තු කරගෙන අපිට තෝරා ගත්තා. අපි ඒ දේවල් හිටන් විශේෂයෙන් ඔය Batticaloa area එකේ තමා ගොඩක් තිබුණේ. ත්‍රිකුණාමලෙත් තිබුණා. ඒවා අඳුරගෙන හරියට මොනිටර් කරන්න ගත්ත බුද්ධි අංශ වල හරියටම අඳුරගත්තා. මේ මේ කොටස් කියලා ගොඩාක් තරුණ කොටස් අය තමයි ඒවා කර කර හිටියේ.

ප්‍ර: ඔබ එය නිරීක්ෂණය වුණේ තරුණ කොටස් තමයි මේ සම්බන්ධයෙන් නැඹුරුතාවයක් දැක්වුයේ කියලා?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට දැන් ඒ පළාතේ ඔයි ජන කොට්ඨාශ වලින් මේ ස්වදේශීක භාවය ඉක්මවා යමින් යම් ආකාරයකට ජීවත් වන්නට කවුරුහරි උත්සාහ කිරීමක් එහෙම ඔබ නිරීක්ෂණය කෙරුව ද? අපි ඔක්කොම ශ්‍රී ලාංකිකයිනේ

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: අපි මොන ජන කොට්ඨාශයට අයිති වුණත් අපි ශ්‍රී ලාංකිකයි. එතකොට අපිට අපේම අනන්‍යතාවයක් තියෙනවා නේ. ලංකාවේ කොහේ ගියත් ඒ ජාතික අනන්‍යතාවය තියෙනවා. නමුත් දැන් ඔය නැගෙනහිර පළාතේ යම් යම් ජන කොට්ඨාශ අතර ඔබ එහි වෙනසක් දැක්ක ද?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: මොකද්ද දැක්ක වෙනස?

උ: ස්වාමිනි මට තේරුම් ගියේ ස්වාමින් කියපු එක මට තේරුම් ගියා නිවැරදිද දන්නේ නැහැ. දැන් කාත්තන්කුඩි ප්‍රදේශයේ සහ කින්නියා යන ප්‍රදේශ වල අරාබිකරණය ඒ කියන්නේ මං මේ කියන්නේ අරාබිකරණය

FAIR COMMENT BY JEZEEM

කියන්නේ ස්වාමිනි සමහර මේ Board සහ මේව පටන් ගන්න පුවරු වල ඒවා අපිට නවත්වන්න නීතිමය බලතල තිබුණේ නැහැ. නමුත් ක්‍රම සහ විදි වලින් ඒ බුද්ධි අංශයේ තියෙන ශක්තිමත් එවකට ඒ කාලේ Control කරගෙන හිටියා. පටන් ගන්නේ නැතුව. නුමත් අපිට තේරුණා අරාබිකරණය පවා එක එක කොටස් වලින් පටන් ගන්නවා කියලා. ඒවා සමහර ඒවා දේශපාලන background එකක් තියෙද්දී ආපු ඒවත් තිබුණා. ඉතිං හැබැයි ඒ හැම දෙයක්ම ස්වාමිනි බුද්ධි අංශ හරි විදියට නඩත්තු කළා කියලා මට හරි විශ්වාසයි. මොකද ඒ අයගෙන් තමයි මට ගොඩාක් තොරතුරු ආවේ. මට තියෙන්නේ හරි තැන බලලා නියෝග දීම පමණයි. ඒ වගේම නිවැරදි තිරණ ගන්න පුළුවන් හැකියාව තිබුණා.

ප්‍ර: පෙරේරා මහත්මයා ඒකෙන් ඔබ අදහස් කරනව ද ඔබේ බුද්ධි අංශ සහ ඔබේ නිලධාරීන් මේ ඒ ප්‍රදේශයේ ජීවත් වුණ ජන කොට්ඨාශ සමඟ ඉතා සමගියෙන් කටයුතු කරයි කියලා ඔබේ පාලන කාලය තුළදී 2011 ඉඳන් 2015 වෙනතුරු?

උ: එහෙමයි ස්වාමිනි. මට බොහෝම ආඩම්බරයෙන් කියන්න පුළුවන් මෙතැන ඒ මගේ වකවානුවේ කිසිම සිදුවීමක් කිසිම ජාතික ප්‍රශ්න කිසි දෙයක් තිබුණේ නැහැ. අවසානයේ දී 2014 බේරුවල මුස්ලිම් සහ සිංහල කලහකාරී සිදුවීමක් සිදු වුණා.

ප්‍ර: ඔබ ඔය කියන්නේ දර්ගා නගරයේ අලුත්ගම දර්ගා නගරයේ සිදු වුණ මේ ගැටීම. සිංහල මුස්ලිම් ගැටීම?

උ: ඒ ගැටීම. ඒ ගැටීමේ දී නැගෙනහිර පළාතේ හිටපු මුස්ලිම් නායකයෝ විශේෂයෙන් මාත් එක්ක සම්බන්ධකම් තියෙන මට කථා කැලා කිව්වා සර් අපිට මොනව ද වෙන්නේ අපි බයයි කියලා. ඉතිං අපි ඒ වෙලවේ මට හිටපු හමුදා බුද්ධි අංශ හමුදාවේ හිටපු නිලධාරීනුත් කතා කරලා ඒ අයට අපි කිව්වා අපි ගැන විශ්වාසය තියන්න. කිසිම විටක මේ ඔය ගොල්ලො ලංකාවේ ඉන්න අනිත් ප්‍රදේශ සහ ලෝකෙට පෙන්වන්න හොඳම අවස්ථාවක් නැගෙනහිර ඉන්න මුස්ලිම් ජාතිය හැටියට කිසිම retaliate එකක් ඒ කියන්නේ ඒක ගැන කිසිම ආයි තව මේ පැත්තේ කලබල තියෙන්න එපැයි කිව්වහම ඒ වචනේ පරිසමාප්තය ඒ ගොල්ලෝ පිළිඅරගෙන මම එක යෝජනාවක් කරා එතුමන්ලට පුළුවන් නම් dry ration හරි මොනව හරි එකතු කරන්න අපේ Es cort කරලා දෙන්නම්. ඒක පවා ලොරි 05 කට වඩා වැඩි අපි බේරුවලට යැව්වා. Es cort එක්ක. ඒ අවස්ථාවේ දී තමයි ස්වාමිනි මට ඔය කියන වකවානුවේ මට දිනය මතක නැහැ ඔය තවුහිද් ජමාත් කියන එක එතකොට ස්වාමිනි මේ සහරාන් කියලා මේ පුද්ගලයෙක් මම දන්නෙත් නැහැ නමුත් තවුහිද් ජමාතේ කියන අය ටිකක් රැඩිකල්. ඒ අය ටිකක් අනිත් මුස්ලිම් ආගම් එක්ක සහ ගැවෙසෙනවා ටිකක් එක විදියක්. නිකන් අර අපි ගම් වල

FAIR COMMENT BY JEZEEM

බොහොම නිකන් කියන දේ අහන්නේ නැති එකේ සයිස් එකේ වගේ ස්වාමිනි ඒ හින්දා එතැනදී ඒ කණ්ඩායමේ කතාවක් ඇති වුණා රෑ අපි දර්ගා ටවුන් එකේ මේ කරා වගේ මේ පැත්තේ පන්සලකට හරි හාමුදුරුවෙක්ට හරි අපි මොනව හරි කරදරයක් කරමු කියලා.

ප්‍ර: ඔබ කොහොමද දැන ගත්තේ ඒ ගැන ?

උ: ඒ කියන්නේ ස්වාමිනි බුද්ධි අංශ කොච්චර දක්ෂ ද කිවුවොත් ඒ රාත්‍රියේ ම ඒ තොරතුර ආවා.

ප්‍ර: ඔබට ලැබුණා ඒ තොරතුර?

උ: ලැබුණා. බුද්ධි අංශයෙන් එතකොට තමයි මම නියෝග කරා මට වෙන ක්‍රමයක් නැහැ වෙන විකල්පයක් නැහැ. මොකද මට ඕන ඒ ප්‍රදේශයේ සාමය තියාගන්න. ගෙන්වන්න වහාම නියෝග කරා ගෙන්වන්න ඔක්කොම ටික කියලා. ඔය කියන කතා වෙච්ච මිනිස්සු මගේ භාෂාවෙන් කියලා. පහුවෙනිදා උදේ බුද්ධි අංශයෙන් ගෙන්නුවා Camp එකට.

ප්‍ර: ඔබේ Camp එකට ගෙන්නුවා?

උ: ඔව්.

ප්‍ර: ඔබේ කඳවුරට ගෙන්නුවා?

උ: ඔව්.

ප්‍ර: ඊට පස්සේ?

උ: ගෙන්නුවාම හත් අට දෙනෙක් ආවා ඒ අය හෝල් එකේ තියලා මං ඇවිල්ලා මං වචන 05 යි කතා කළේ මං හිතන්නේ වැඩි වෙලා නැහැ. මං බැන්නා.

ප්‍ර: මොන භාෂාවෙන්ද ඔබ කතා කළේ?

උ: ස්වාමිනි සමාවෙන්න මං කියන හරි භාෂාවෙන් නම් මං කිව්වේ තොපි කියලා කිව්වේ ඇත්තටම දැනගනියෝ මට මෙහෙම පණිවිඩය ආවා ඇත්ත ද කියලා ඇහුවම ඒ වෙලාවේ Reject කරා නැහැ කියලා. ඊට පස්සේ බුද්ධි අංශයේ කට්ටිය හිටියේ. මං කිව්වා නැහැ මෙහෙම කතා වෙලා තියෙනවා මෙහෙම ගිනි තියනවා කියලා හැබැයි මොනව හරි සිද්ධ වුණොත් හමුදාව ගෙන්වන්න එපා තමන්ගේ ගෙවල් වලට අනිවාර්යයෙන් තර්ජනාත්මකව මං ඒක කළේ. මගේ හිතේ තිබුණේ ඒක වෙන දෙයක් ඒ කියන්නේ භය කිරීමක් පමණයි. කියලා මං භාර දුන්නා බුද්ධි අංශයේ ඉන්න නිලධාරීන්ට මේ අයව හරියට බලා ගන්න කියලා. ඉතිං එතැන දී තමයි ස්වාමිනි ඒ වෙලාවේ දී ඒ අය Confess කරා පාපොච්ඡාරණය කළා ඔව් අපි සමාවෙන්න කියලා. ඉතිං ඒක මට නෙමේ කළේ බුද්ධි අංශයට. බුද්ධි අංශය ඒක කරපු ඒකෙදි මට තිබිච්ච intention එක තිබුණේ කිසි දෙයක් නොවෙන්න. එතකොටත් අපි දන්නේ නැහැ මේ මෙහෙම ලොකු කට්ටියක් කියලා. නමුත් අපි මගේ

FAIR COMMENT BY JEZEEM

වකවානුවේ දී ඒ බුද්ධි අංශය අඳුරගත්තා මේ ඒ Group එකක් රැඩිකල් කියන Group එකක් විදියට. ඉතිං එදා ඉඳලා.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර: තර්ජනාත්මක කිව්වා තව දුරටත් ඒ විදියට වැඩ කරොත් පල්ලි ඉදිරිපිට බන්කර් ගස්ස ගන්න එපා කියලා.

උ: ස්වාමිනි මට කියන්න සිද්ධ වුණා මොකද මං ඒක තර්ජනාත්මකව බය කරන්න කිව්වේ. නැතුව වෙන එකකට නෙවෙයි.

ප්‍ර: එහෙමයි තමා කිව්වේ නේ, බය කරන්න?

උ: ඔව්. මං එහෙම කිව්වේ අඳුරගන්නයි එහෙම ගෙන්න ගත්තේ මොකද පණිවිඩය ආපු නිසා. හැබැයි ඒ වගේම ස්වාමිනි කිසිම දෙයක් එතැනින් පස්සේ වුණේ නැහැ. ඒ අයත් එහෙම බය වෙලා ගියා. නමුත් බුද්ධි අංශයෙන් මොනිටර් කරගෙන හිටියා. මේකේ දී ඉතිං මට මම 2015 එතැනින් භාර දුන්නේ නමුත් ඒ වෙනකන් බුද්ධි අංශයෙන් හෝ අඳුරගත්ත Group එකක් ඔය තවුහිද් ජමාත් සහ PMGG සහ තවත් සිංහල movement එකකුත් තිබුණා. ඒක කන්තලේ. ඒ අයව Constantly monitor කරන සිස්ටම් එකක් තිබුණා බුද්ධි අංශයට. ඉතිං ඒ බුද්ධි අංශයේ ඒ හැම ක්‍රියාකාරකමක්ම ඒක කොළඹට ආවත් බුද්ධි අංශය දන්නවා. ඒ එක සාමාජිකයෙක් අසනීප වුණත් බුද්ධි අංශය දන්නවා ඒ තරම් දක්ෂ නිලධාරීන් ඒ පැත්තේ හිටියා. බුද්ධි අංශයේ ඒ වගේ informant ලා හිටියා ඒ ගොල්ලන්ට සහාය දෙන්න.

ප්‍ර: ජිහාඩ් සංවිධානයේ ක්‍රියාකාරකමුත් ඒ දවස් වල තිබ්බ ද?

උ: ස්වාමිනි. තිබුණා. ඒක හැබැයි මට දැනුවත්ව නම් ඒක ලොකුවටම තිබුණේ නැහැ. Prominent විදියට නම් තිබුණේ නැහැ ස්වාමිනි.

ප්‍ර: ලොකුවට තිබ්බෙ නැහැ?

උ: ස්වාමිනි මට Field Commander විදියට ඒ කියන්නේ ක්ෂේත්‍රයේ ඉන්න ප්‍රධානම නිලධාරියා විදියට මට බුද්ධි අංශය, Civil Affairs දේශපාලන තලය හැම එකක්ම මං Balance එකේ හරි කරත් යන්න ඕන . සාමය පවත්වා ගෙන යන හින්දා බුද්ධි අංශයේ එක කොටසක්. ඒ අය තමයි Live wire එකක් හැටියට මේක Control කරගෙන ඒ අයට pipe line එකක් තිබුණා මේ හැම දෙයක්ම movement එකක් අධ්‍යක්ෂක බුද්ධි දන්නවා. මොකද ඒක එතැනින් යනවා ගෝඨාභය සර්ට කෙළින්ම. යන කොට.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබ මීට ස්වල්ප වේලාවකට පෙර ගරු කොමිෂන් සභාවට සඳහන් කෙරුවා පෙරේරා මහත්මයාණනි අර 2014 වසරේ දී අලුත් ගම දර්ගා නගරයේ සිදු වුණ සිංහල මුස්ලිම් ගැටුමට පස්සේ නැගෙනහිර පළාතේ යම් කණ්ඩායමක් අතර සිදු වුණ සාකච්ඡාවක් පිළිබඳව ඔබට තොරතුරු ලැබුණාම ඒ අදාළ කණ්ඩායම යම් සාහසික ක්‍රියාවක් කිරීමට සැලසුම් කරන ලද කණ්ඩායම ගෙන්වලා ඔවුන්ට අවවාද කිරීමක් කළාය කියලා ?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට ඒ කණ්ඩායම තුළ ඔබට කවුරු හරි දැනගන්නට ලැබුණා ද හිටියාය කියලා 2019 අප්‍රේල් මාසයේ 21 වැනිදා සිදු කරන ලද බෝම්බ ප්‍රහාර වලට දායක වුණ. දැන් ඔබ දන්නව ද එතැන හිටියා ද කියලා?

උ: මම මේ සිදුවීම් පස්සේ දන්නේ සහරානුත් හිටියා කියලා. නමුත් එදා ඒ ආපු එකෙත් සහරාන් ඉඳලා තියෙනවා. මොකද මං මේ සිදුවීමෙන් පස්සේ බුද්ධි අංශ නිලධාරීන් කතා කරා එතකොටයි කිව්වේ සර් සර් ගෙන්නපු එකෙත් මේ මනුස්සයා හිටියා. නමුත් මට අඳුරගන්න බැහැ ඒ කවුද කියලා හිටියේ කියලා. මොකද මං දැනුවත්ව කාටවත් එක්කෙනෙක්ට මට මතක විදියට සිංහල කතා කරන්න පුළුවන් හැරෙන්න අනිත් කාටවත් සිංහල කතා කරන්න බෑ. එතකොට මම සිංහලෙන් දෙන පණිවිඩය Translate කෙනෙක් බුද්ධි අංශයේ Translator කෙනෙක් ට්‍රාන්ස්ලේටර් කරලා තමයි කියන්නේ.

ප්‍ර: ඔබ කිව්වා ඔබ ඒ ප්‍රාදේශීය දේශපාලනඥයින්වත් ගෙන්වලා යම් යම් අවස්ථාවන් වලදී ඔවුන් සමඟ සාකච්ඡා කළාය කියලා?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට ඒ අයගෙන් ඔබට හොඳ සහයෝගයක් ලැබුණ ද ඔය නැගෙනහිර පළාත පාලනය කරගෙන යන්නට නෛතික තත්ත්වය පවත්වාගෙන?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබ හිතනවද පෙරේරා මහත්මයා නැත්නම් අපේ විශ්‍රාමික මේජර් ජනරල්තුමනි ඔබ 2011 -2015 වසර වල නැගෙනහිර පළාතේ ඒ පාලනය කරගෙන ආපු ආකාරයට සියළු දෙනාගේම සහයෝගය අරගෙන ඒ පාලන තත්ත්වය දිගටම ගෙන ගියා නම් 2019 අප්‍රේල් මාසයේ 21 වැනිදා සිදු වුණ මේ අවාසනාවන්ත සිද්ධිය සිදු නොවන්නට ඉඩ තිබුණයි කියලා?

උ: ස්වාමිනි මං මගේ සේවා පරිණතය අනුව මං එක හෙළා කියනවා මම කරගෙන ගිය ඒ හිටපු දැන් වත්මන් ජනාධිපතිතුමාගේ දැක්ම අනුව ඒ කරගෙන ගිය විදියටම බුද්ධි තොරතුරු සහ බුද්ධි සමාලෝචනය සහ මේ අඳුරගත්ත Radical Groups monitor කරගෙන ගියා නම් බුද්ධි අංශයෙන් අනිවාර්යයෙන් පෙර දැනුම් දීමක් සිද්ධ වෙනවාමයි. ඊළඟට නැගෙනහිර ප්‍රදේශයේ බෝම්බ පිපිරුණා ගෙවල් වල ඒ පුපුරන කොටත් බුද්ධි අංශය

FAIR COMMENT BY JEZEEM

දන්නේ නැහැ කියන්නේ බුද්ධි අංශය සම්පූර්ණ අඩපණ වෙලා කියලා. මට විශ්වාසයක් තියෙනවා අපි කරගෙන ගිය ඒ කණ්ඩායමක් හැටියට මගේ තනි එකක් නෙවෙයි කණ්ඩායමක් හැටියට ඒජන්සි හැම එකක්ම උදව්වෙන් කරපු දේ ඉදිරියටම කරගෙන ගියා නම් අපිට මේ 2019 මේ බෙදවාචකයක් අපිට මුහුණ දෙන්න අවශ්‍ය වෙන්නේ නැහැ පෙර දැනුම් දීම් වලින් මුලින්ම අපිට ඒක අඳුරගෙන ඒක නැති කරන්න තිබ්බා. වළක්වන්න තිබ්බා.

ප්‍ර: ඒ කියන්නේ ඒ කණ්ඩායම්වල ප්‍රාදේශීය ක්‍රියාකාරීත්වය පිළිබඳව එහෙම නම් බුද්ධි අංශවලට ඔබ යටතේ ඒ කාලේ හිටපු ඒ තොරතුරු ලබා ගැනීමේ හැකියාව තිබුණා පහසුවෙන් ඔබ කියන්නේ?

උ: එහෙමයි ස්වාමිනි. මං දන්න විදියට මං විශ්‍රාම ගියත් සමහර බුද්ධි නිලධාරින් හෝ මාත් එක්ක රාජකාරී කරපු නිලධාරීන් මාත් එක්ක අදටත් කතා කරනවා. ඉතිං ඒ අයගේ තොරතුරු දැන ගැනීමන් මට කණගාටුවට කියන්න තියෙන එකම ප්‍රකාශය මේ උසාවියේ හුඟක් බුද්ධි නිලධාරීන්ව ඒ වකවානුවේ 2015 න් පස්සේ හිරගත වුණා. සමහර අය අයින් කරලා තිබුණා. ඉතිං ඒක එහෙම දෙයක් වුණාම ඒ බුද්ධි නිලධාරීන්ගේ යටතේ ඉන්න Local Team එහෙම නැත්නම් informants ලා ඒ අය පවා විනාශ වෙනවා. ඒ අය යන්නේ නැහැ ආයේ එන්නේ නෑ ඉදිරිපත් වෙන්නේ නැහැ කාටවත්. ඉතිං එහෙම වුණාම සම්පූර්ණ අඩපණ වීමක් එතැනින් වෙනවා කියලා මං දන්නවා අනිවාර්යයෙන්.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකරු ආමී මොහිදීන් කියලා එක්කෙනෙක් නැගෙනහිර පළාතේ බුද්ධි අංශ වලට සම්බන්ධව හෝ හමුදාවට සම්බන්ධව සේවය කරාද?

උ: ස්වාමිනි මට මතක නම් නැහැ.

ප්‍ර: දැනට දැන් පාස්කු ප්‍රහාරය සම්බන්ධව අත්අඩංගුවේ පසුවෙන ?

උ: මතක නැහැ ස්වාමිනි.

ප්‍ර: ජිහාඩ් සංවිධානය ක්‍රියාත්මක වෙලා තිබ්බ ද ඒ කාලේ ?

උ: මං දැනගෙන තියෙන විදියට මට මතක විදියට යම් මට්ටමකින් තිබුණා හැබැයි ලොකු මේව එකක තිබුණ ද කියලා මතක නැහැ.

ප්‍ර: ඔවුන් අතර හා සහරාන්ලාගේ අතර සම්බන්ධතාවයක් තියෙනවා කියලා තොරතුරු ලැබිලා තිබ්බ ද?

උ: මට මතක නම් නැහැ ස්වාමිනි. මොකද දැන් කාලෙත් පැන්නා.

ප්‍ර: ඒ කියන්නේ .

උ: ඒ කියන්නේ හරි Detail වලට මට එක පාර කියන්න අමාරුයි ස්වාමිනි.

ප්‍ර: සාක්ෂිකරු නැහැයි කිව්වේ නැහැනේ ඒක නිසා එහෙම සම්බන්ධතාවයක් තිබුණා වගේ ද නැද්ද?

FAIR COMMENT BY JEZEEM

උ: මතකයක් නම් නැහැ ස්වාමිනි හරියට Details වලට කියන්න.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකරු මේ ඔබගේ ඒ නැගෙනහිර පළාතේ ඔබ ආඥාපති වශයෙන් හිටපු ඒ කාලයේ දී මුස්ලිම් කණ්ඩායම් අතර යම් ගැටීම් ඇති වුණා ද නැද්ද කියන එක ඔබට වාර්තා වුණා ද?

උ: ස්වාමිනි මුස්ලිම් කණ්ඩායම් අතර ද කිව්වේ?

ප්‍ර: ඔව්,

උ: එහෙම ගැටීම් තිබුණා. ඔව් දැන් ගත්තොත් තවුහිද් ජමාත් කියන කණ්ඩායම අනිත් සාමාන්‍යයෙන් උලමා සභාව එක්ක එකතු නැහැ. ඒ අය වෙනම තියෙන්නේ. ඒ අය එක්ක පොඩි පොඩි ඝට්ටන ආරංචි වෙලා තියෙනවා ඒත් බුද්ධි මාර්ගයෙන්.

ප්‍ර: ඒ ඝට්ටන වලට හේතු මොකද්ද කියලා ඔබට මතකයක් තිබෙනව ද?

උ: ස්වාමිනි මං දැනුවත්ව නම් ඔය ආගම් වල ඒ ආගමේම මුස්ලිම් ආගමේ ම තියෙන වෙනස්වීම් වලින් තමයි තියෙන්නේ. විශේෂයෙන්.

ප්‍ර: ඒ කියන්නේ මතවාදී වෙනස?

උ: මතවාදී වෙනස තියෙන එක තියෙනවා.

ප්‍ර: එතකොට ඔබ ඒ සම්බන්ධයෙන් දැනට නම් කෙරුවා තවුහිද් ජමාත් කියන කණ්ඩායම ඔබට වෙනත් කණ්ඩායම් වල නම් ඒ අවස්ථාවේ දී ඔබගේ දැනුමට ආවද? නැත්නම් ඔබගේ අවධානයට යොමු වුණා ද?

උ: නැහැ තවුහිද් ජමාත් තමයි ගොඩාක් ස්වාමිනි අවධානයට ඒ කියන්නේ අපි focusකළේ අඳුරගත්තේ Radical එක හැටියට.

ප්‍ර: දැන් ඔබ නැගෙනහිර ආඥාපති වෙලා ඉන්න කාලයේ දී යුධ හමුදාව පොලීසිය සහ අනිත් ත්‍රිවිධ හමුදාව අතර යම්කිසි රැස්වීම් තිබ්බ ද මේ ආරක්ෂක තත්ත්වය පිළිබඳ සමාලෝචනය කිරීම නැත්නම් තොරතුරු හුවමාරු කරගැනීම?

උ: එහෙමයි ස්වාමිනි. විශේෂයෙන් බුද්ධි සමාලෝචනය කළේ සියළුම ත්‍රිවිධ හමුදාව සහ පොලීසියේ STF කියන හැමෝගෙම බුද්ධි නිලධාරීන්ව ගෙනැල්ල තමයි සමාලෝචනය කරන්නේ.

ප්‍ර: හරි ඒ ඔබ කියන්නේ ඔබ කලින් කොමිෂමට විස්තර කරපු මාසිකව තිබ්බ බුද්ධි සමාලෝචනය ?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒකට සහභාගි වුණේ බුද්ධි නිලධාරීන් විතරයි?

උ: බුද්ධි නිලධාරීන් විතරයි.

ප්‍ර: එවැනි මාසික සමාලෝචන වලදි ඔබ කොමිෂන් සභාවට කිව්වනේ මේ සහරාන් කියන පුද්ගලයාත් ඇතුළ 07 දෙනෙක් විතර කැඳවලා අවවාද කෙරුවා කියලා බෙරුවල දර්ගා නගරයේ සිද්ධියෙන් පස්සේ?

FAIR COMMENT BY JEZEEM

උ: ඔව්.

ප්‍ර: ඒ වුණ සිද්ධියත් ඔබට මතක ද ඒ ආරක්ෂක සමාලෝචන රැස්වීමක දී ඔබ දැනුවත් කෙරුවා කියලා අනිත් අය?

උ: නැහැ ස්වාමිනි මේක සමාලෝචනයට ගෑවුණේ නැහැ. සම්බන්ධ වුණේ නැහැ. මේක Suddenly එක රාත්‍රියක ඔය දර්ගා ටවුන් එකේ මේක සිදුවීමත් එක්ක රාත්‍රියක බුද්ධි ආරංචියකින් අපේම යුධ හමුදාවේ බුද්ධි නිලධාරීන්ගේ ආරංචියකින් පණිවිඩය ආවේ. සර් මෙහෙම එකක් කතා වෙලා තියෙනවා කියලා ඒ එහෙම තොරතුරු immediately ආවම තමයි මංම ආයි නැවත කල් දැම්මේ නැහැ ආයේ පොලීසියට භාර දුන්නේ නැහැ ඕක හොයන්න කරන්න. මොකද මට ප්‍රධානයෙන්ම තිබුණේ එහෙම සිදුවීමක් වුණොත් නැගෙනහිර Control කරන්න බැරි වෙනවා ස්වාමිනි. මොකද හාමුදුරු නමකට හෝ පන්සලකට විනාශයක් කරෝත් නැගෙනහිර ඔක්කොම ඇවිලෙනවා මොකද Control කරගන්න බැහැ. ඉතිං ඒ නිසා මං ඒ වේලේ ක්ෂණික ගත්ත තීරණයකට තමයි මං ගෙන්නන්න හිතා ගත්තේ.

ප්‍ර: නමුත් ඒ ඔබට ලැබුණු ඒ ක්ෂණික තොරතුරු ඔබ පසු අවස්ථාවක දී ඒ සමාලෝචන රැස්වීමක දී බෙදා ගත්ත බවක් ඔබට මතක නැද්ද?

උ: නැහැ ස්වාමිනි මං දැන් ඒකදී මං ගන්න කොටම බුද්ධි නිලධාරීන්ගේ හරහා ඒක වෙනම යනවා බුද්ධි අධ්‍යක්ෂකට. මං නැවත ඒක බුද්ධි අධ්‍යක්ෂක ඒක ආයි මං ගත්ත තොරුතුරු බුද්ධි නිලධාරී ඉදිරිපිටම දිපු අවවාද පවා ඒ පැත්තෙන් ඒක යනවා. ඒවා එක සිදුවීමක් විදියට තමයි එන්නේ සමහර තැන් වල අපි ගත්තොත් උදාහරණයක් ස්වාමිනි මට මේ දැන් ඔය අලි මිනිස් ගැටුම හරියට තියෙන තැනක් තමයි නැගෙනහිර. දැන් ඒ තැන් වලදී සමහර තැන් අලි මිනිස් ගැටුමේ දී කෙනෙක් මැරුණාහම සමහරු ඒක හදාගන්නවා වෙන පැතත්කට. එතකොට අපි බලන් ඉන්නවා මොනිටර් කරනවා බුද්ධි අංශ වලින් මොකද්ද මේ වෙන්නේ කියලා. සමහර වෙලාවට මොකද එහෙ අලි මිනිස් ගැටුමෙදි රු. 50000 ක් වගේ මුදලක් දෙනවා GAගේ හරහා. ඒ මරණ ගෙදරට. ඒක පවා ඒ දුප්පත් මිනිස්සු බලාගෙන ඉන්නවා ඒක එනකන් සමහර වෙලාවට GA කොළඹ හරි කොහේ හරි ඉන්නව නම් ඒක කොහොම හරි ගෙනැත් දෙනකන් බලාගෙන ඉන්න කොට තව ඉන්නවා තලයක් වෙනම මං මේ කියන්නේ පසුබිමක් බුද්ධි අංශ වලින් අපි ඒක පවා Cover කරනවා මේකේ මොනව හරි වෙන අස්සක් මොකද ඒක පවා සමහර වෙලාවට දේශපාලන වාසි ගන්න හරි වෙන විදියකට ඒ ගොල්ලො ඔය එක එක ඒවට Turn කරනවා. අපි ඒවයි තොරතුරු පවා බුද්ධි අංශ වලින් හොයලා උඩට යවනවා මෙන්න මෙහෙම දැන් සමහරු එනවා ඒක පවා අර උළුප්පලා අරගෙන මේවා කරගන්න යන ඒවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: නැහැ මගේ ප්‍රශ්නය වුණේ ඔබ ඒ කියපු අර සහරාන් සම්බන්ධව වුණ සිද්ධිය යුධ හමුදා බුද්ධි නිලධාරීන් අතර මේ හුවමාරුවක් ගැන නෙමෙයි මේ මං ඇහුවේ,

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: පොලීසිය නැත්නම් අනෙක් නාවික හුමදාව, යුධ හමුදාව වැනි ඒ අංශ සමඟත් බෙදා ගැනීමක් යම්කිසි අවස්ථාවක සිදු වුණා ද කියන එකයි?

උ: නැහැ ස්වාමිනි එහෙම වුණේ නැහැ ස්වාමිනි.

ප්‍ර: ඔබට මතකයක් තිබෙනව ද ඔබ නැගෙනහිර ආඥාපති වෙලා ඉන්න කාලේ දී ඔය පොලීසියේ ඉහළ නිලධාරීනුයි යම් යුධ හමුදාවේ ඒ නිලධාරීනුයි අතර යම් රැස්වීම් තිබ්බ ද මේ නැගෙනහිර පළාතේ තිබ්බ තත්ත්වය පිළිබඳව සමාලෝචනයක් නැත්නම් තොරතුරු බෙදා හැරීමක් සම්බන්ධයෙන් ?

උ: ස්වාමිනි ඒ දේවල් නම් අපි හුඟක් අවස්ථා වලදී බුද්ධි සමාලෝචනයෙන් පස්සේ හුඟක් අවස්ථා වලදී අපි නිලධාරීන් සහ සෙසු නිලධාරීන්ව අමතනවා. හමුදාවේ සහ අනිත් අය. ඒ අමතන කොට අපි සාකච්ඡා කරනවා බුද්ධි නිලධාරීන් ඇවිල්ලා බුද්ධි තොරතුරු කියන ගමන් අපි ආරක්ෂක සැලසුම් ඒ අනුව සාකච්ඡා කරනවා.

ප්‍ර: ඒ සාකච්ඡා වලට පොලීසියේ ඉහළ නිලධාරීන් සම්බන්ධ ද?

උ: නැහැ මගේ මට්ටමෙන් යන කොට මම සේනාංකාධිපතිලට අධිපතිට තමයි හුඟක් නියෝග දෙන්නේ. සේනාංකාධිපති ඒ තමන්ගේ යටතේ ඉන්න area එකේ ඉන්න අනිත් පොලිස් නිලධාරීන් එක්ක සාකච්ඡා කරලා මොකද ඒ ගොල්ලන්ට වෙනම රාජකාරී නමුත් ක්‍රියාන්විතය දැනුවත්වීම් කරනවා.

ප්‍ර: ඔබගේ මට්ටමෙන් පොලිසියේ හිටිය නිලධාරියා කවුද? ඔය නැගෙනහිර පළාතේ?

උ: මං සාමාන්‍යයෙන් ස්වාමිනි සම්බන්ධ වෙන්නේ DIG මහත්මයත් එක්ක.

ප්‍ර: DIG ද senior DIG ද ?

උ: senior DIG එක්ක. එහෙමත් නැත්නම් එහෙ ඉන්න DIG එක්කත් කතා කරනවා.

ප්‍ර: ඒ කියන්නේ ඔබ මීට කලින් සඳහන් කරන්නට යෙදුණ පුජිත් ජයසුන්දර මහත්මයා නැත්නම් නන්දන මුණසිංහ මහත්මයා ?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබට මතක ද එම නිලධාරීන් දෙදෙනා හෝ එක් නිලධාරියෙක් සමඟ ඔබ නැගෙනහිර ආඥාපති වෙලා ඉන්න කාලයේ දී මේ නැගෙනහිර පළාතේ ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන් යම්කිසි සාකච්ඡා සිදු වුණා ද නැද්ද?

උ: නැහැ එහෙම ඒ ගොල්ලොත් එක්ක නම් කතා කරන විශේෂයෙන් ආවේ නැහැ. නමුත් ස්වාමිනි ඒ අයගේ නියෝජනයත් එතැන්ට ඒ අය නෙවෙයි ඒ අය නියෝජනය කරන බුද්ධි නිලධාරීනුත් ඔයි සමාලෝචනයට එනවා.

FAIR COMMENT
BY JEZEEM

ඒ නිසා Direct අපි ඒ ගොල්ලත් දන්න මමත් දන්න අපි ආයේ නැවත කතා කරන්නේ නැහැ. මොකද එකම නිලධාරීන් සාකච්ඡා කරලා ඒ අය තමයි පණිවිඩ අරන් යන්නේ උඩහට. ඒ කියන්නේ DMI හරහා Secretary ගාවට.

ප්‍ර: දැන් ඔබ ඔය කියපු සහරාන්ගේ සිද්ධිය 2014 දි අර බේරුවල දර්ගා නගරයේ සිදු වූ සිද්ධියට ආසන්නව සිදුවුණු සිද්ධිය ඉන් පසුව ඔබට යම්කිසි වැටහීමක් ආවද නැත්නම් යම්කිසි ප්‍රශ්නයක් ඇති වුණා ද මේ විදියට ඉස්ලාම් අන්තවාදී සංවිධාන වලට යම් කිසි දේශපාලන පසුබිමක් තියෙන්න පුළුවන් කියන එක?

උ: මට නම් එහෙම ආවේ නැහැ ස්වාමිනි. එහෙම දෙයක් නම් නැහැ අපි වෙන angle එකකින් බැලුවේ මට එහෙම දැන් ඔය ස්වාමිනි ඔය අරාබිකරණය කියන එක ඇත්තම කිව්වොත් බෝඩ් වල ඔය ලියාගෙන ආපු ඒවා ඔය ලොකු තොරන් වගේ ගහන ඒවා පටන් ගන්න කොටම කින්නියාවල එහෙම අපි නැවැත්තුවා. ඒකේ දී යම් යම් දේශපාලන නම් කිව්වට මම නම් පොඩ්ඩක්වත් විශ්වාස කළේත් නැහැ ගනන් ගත්තේත් නැහැ ඇහුවෙත් නැහැ මට pressure කරන්න ආවේත් නැහැ ස්වාමිනි.

වේලාව: ප.ව. 08.05
මෙතැන් සිට: නිල්මිණි මෙනවිය.

President Secretariat Copy

FAIR COMMENT
BY JEZEEM

දැන් වේලාව: ප.ව.8.05
පෙර සටහන් ල/ලේ: සවිනි මෙනවිය
මෙතැන් සිට ල/ලේ: නිල්මිණි.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: ඒ කියපු දේශපාලන නම් මොකක් ද ඔබ ඒ කියන හැටියට අරාබිකරණය නැවැත්වීමට ඔබ යම්කිසි ක්‍රියාමාර්ග ගන්නා විට එයට එය නවත්වන්න ඔබට කියපු නම් මොනවද?

පි: ස්වාමීනි අපි දැන් ගත්තොත් දැන් ප්‍රධානයෙන්ම කාත්තන්කුඩි area එකේ ඉන්නවා දේශපාලන නායක කිහිපයක්. දැන් ගත්තොත් මට මතක එන්නේ නැහැ ඔළුව. ස්වාමීනි දැන් ඒ කාලේ එහෙම නම් වලින්ම ආවේත් නැහැ ස්වාමීනි. ඒ කියන්නේ ඔය ප්‍රදේශිය මට්ටමින් කතා කරයි කියලා කවුරුත් ඒ අයනම් මට කතා කරන්න ආවේ නැහැ. නවත්වන්න කියලාවත් ආවේ නැහැ. මොකද මම හුඟාක් GAලාත් එක්ක අපි හරි සම්බන්ධයි. GA ගෙන් උපදෙස් ගන්නවා. GA කියනවා අපිට එහෙම අනුමැතියක් තියෙනවා. මොකද ප්‍රාදේශිය ලේකම් මට්ටමේ ඉඳලා ඒ දේවල් අනුමැතියක් ගන්න ඕනි RDA එකෙන් ගන්න ඕනි. ඉතින් ඒ ප්‍රශ්න කරගෙන අපි යනවා. යනකොට සමහර තැන් වල දී අනුමැතිය දීලා අහුවෙලා තියෙනවා. ඉතින් ඒ තැන් වල දී අපි GAලාව දැනුවත් කරලා මොකද අපිට නීතිමය පියවර ගන්න එහෙම නඩු දාන්න එහෙම තත්ත්වයක් තිබුණේ නැහැ. නමුත් අපි යම් මට්ටමක Supervision එකක් , කන්ට්‍රෝල් එකක් තිබුණා කියන එක මට හොඳ විශ්වාසයි. මොකද මට හිටපු හට පිරිස් පවා ඒගොල්ලන්ටත් තේරුම් ගියා අපි ගියේ නැහැ මේ මුස්ලිම් අයට විරුද්ධව කියලා. නමුත් ඒ පොදුවේ ගත්තාම ඒක හොඳ

Presidential Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

නැහැ කියන තත්ත්වයේ හිටියේ. ඉතින් ඒ අයටත් පිළිගත්තා අපිට විරුද්ධව කවුරුත් නැඟී හිටියෙත් නැහැ.

ප්‍ර: ඔබගේ කාල සීමාව තුළ නැගෙනහිර ආඥාපති හැටියට එම පළාතේ තිබ්බ ඉස්ලාම් පල්ලි වල යම් කිසි වෙනස් වීමක් ඔබ දුටුවද? වෙනස් වීමක් දුටුවානම් මොකක්ද එය?

පි: මමනම් එහෙම විශේෂ වෙනස්කමක් දැක්කේ නැහැ ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ එම විශාල වශයෙන් යම්කිසි වැඩිවීමක් තිබ්බද පල්ලි වල?

පි: ස්වාමීනි තිබුණා. ඒ කියන්නේ සමහර තැන් වල දී අපි දැක්කා පොඩි පොඩි සැටලයිට් පල්ලි වගේ පටන් ගන්න ආපු කිහිපයක්. අපි ඒවා සමහර ඒවානම් ටක් ගාලා ඒ මොනිටර් කරපුවා එහෙම දැම්මා. මොකද ඒගොල්ලන් එතකොට පිළිගත්තා ඒවගේ දේවල් සිදු වුණා. මොකද අපි ඒවා ස්වාමීනි ඇත්තම කිව්වොත් එළිවෙනකොට අක්කර 100 ඩෝසර් කරපු කාලයක් තිබුණා මගේ වකවානුවේ. ඉතින් එතකොට Camps පවා අපි සැටලයිට් Camps දාලා නවත්වන්න සිද්ධ වුණා. දැන් මගේ කාලයේ මුහුදු මහ විහාරයට බලපෑම් එනකොට මට මතකයි Navy Camp එකක් මම දාන්න සිද්ධ වුණා ඒවලේම. ඊළඟට දීඝවාපී පන්සල Encroach කරගෙන එනකොටම නවත්වන්න සිද්ධ වුණා. පල්ලියකුත් ඒ හරියේ තිබුණා. මොකද ඒ මුස්ලිම් ජාතියේ ඉන්න අය ගමක මම හිතන්නේ ගෙවල් 10ක් 12කට පල්ලියක් වැටෙන විදිහට හදලා තිබුණා මම එනකොටම. ඉතින් ඒවා එන්න එන්න දියුණු කරන්න මොකද ඒගොල්ලන්ට funds එනවා පිටරටකින් මම දැනුවත්ව. අපි දන්න විදිහට සාමාන්‍යයෙන් හැමෝම වගේ දන්නවා.

ප්‍ර: මොන රටින් ද එන්නේ?

පි: ඒකනම් මම දන්නේ නැහැ ස්වාමීනි. මොකද අපිට බුද්ධි සමාලෝචනයේ දී මට ඇහිව්ව අපි දන්න ඒවගෙන් ඒ අය ඒක කියන විදිහට කියන්නේ. funds ගෙන්න ගන්න ක්‍රමයකට තමයි ඒගොල්ලන් එහෙම කරන තැනුත් අපිට ආරංචි වුණා හුඟාක් ඔය කාත්තන්කුඩි සහ මඩකලපුව එරාවූර් හරියේ.

ප්‍ර: ඔබ කියන පරිදි මුහුදු මහ විහාරය සහ දීඝවාපියට ඔබ කිව්වා යම් තර්ජන ඇති වුණා කියලා. කාගෙන් ද තර්ජන ඇති වුණේ? මොන විදිහකින් ද තර්ජන ඇති වුණේ? ඒ සඳහා දේශපාලන පසුබිමක් තියෙනවද?

පි: ස්වාමීනි මෙහෙමයි එහේ Land Encroachment එක ගොඩාක්ම වෙන්නේ මුස්ලිම් ජනතාවගෙන් විශේෂයෙන්. ඒක අපිට ඕනෑම කෙනෙක්ට ගියාම පේනවා. ඒ අය බොහොම සැලැසුම් සහිතව ඉඩම් අල්ලනවා. මොකද රක්ෂිතය කියන එක බලපාන්නේ එක්තරා තැනකට. ඒක එළි කරාට පස්සේ ප්‍රාදේශිය ලේකම්ට. එතකොට ඒක සැලසුම් ඇතිව එළිවෙනකොට කැලේ එළි කලොත් රක්ෂිතයට අයිති වෙන්නේ

LEAR COMMENT
BY JEZEEM

නැහැ ප්‍රාදේශිය ලේකම්ට අයිති වෙන්නේ. ඊට පස්සේ ප්‍රාදේශිය ලේකම් ඇවිල්ලා චූටි හට් එකක් ගහ ගන්නවා ටකරන් 3, 4කින්. එළවන්න බැහැ ඊට පස්සේ පොඩි පවුල් 2, 3ක් ඉන්නවා. ඉතින් එහෙම ඒවා දීඝවාපිය පාමුල්ලේ පටන් ගත්තා. අපිට පණිවිඩය බුද්ධි අංශ වලින් සහ ඒ හිටපු හට පිරිස් වලින් දැන ගත්ත ගමන්ම අපි කරපු වැඩේ ඒ එන මේක බලලා Camp 1, 2ක් දැම්මා මට මතක හැටියට ලොකු Camps එකක් දාන්න සිද්ධ වුණා. හැබැයි මම දන්නේ නැහැ ස්වාමීනි ඉතින්. මට විශ්‍රාම ගියාට පස්සේ ආරංචි වුණා සමහර Camp අයින් කරලා තිබුණා. ඉතින් මම ඒවාගේ තොරතුරු දන්නේ නැහැ කියන්න. නමුත් මට නිකමට දන්න නිලධාරින් නම් කිව්වා සර් කාලේ පටන් ගත්තේ ඔන්න ගලවගෙන ගලවගෙන ගියා කියලා. ඉතින් මම දන්නේ නැහැ ස්වාමීනි ඇයි හේතුව කියලා. එක්කෝ දේශපාලන හේතු නිසා හෝ මොකෙන් සමහර මේවා ගලවලා තිබුණා.

ප්‍ර: ඔබ අර විස්තර කරපු මුහුදු මහ විහාරයට හා දීඝවාපියට ඇති වූ තර්ජනය පිටුපස දේශපාලන පසුබිමක් තියෙනවද?

පි: මට ඒක ස්ථිරව කියන්න බැහැ ස්වාමීනි. මොකද මම බුද්ධි අංශයෙන් දන්න විදිහට නම් ඒ හිටපු Local Troops එතන ඉන්න ජනතාවගෙන් අර ඉඩම් අත්පත් කිරීමේ චේතනාවෙන් අල්ලගෙන යන මේකක් තිබුණේ. නමුත් කවුද පිටිපස්සේ ඉන්නේ කියන එක මට එක හෙළා කියන්න අමාරුයි.

ප්‍ර: ඒ වෙලාවේ බුද්ධි තොරතුරක් තිබුණේ නැද්ද?

පි: තිබ්බේ නැහැ ස්වාමීනි.

ප්‍ර: නමුත් ඔබ කියනවා ඒ කල සීමාව තුළ මේ මොන ඉඩම් ද අල්ල ගත්තේ රජයේ ඉඩම් ද?

පි: රජයේ ඉඩම්.

ප්‍ර: ඒ රජයේ ඉඩම් අල්ලා ගැනීම පිටුපස ඔබ කියන හැටියට මුස්ලිම් ආගමික පිරිස තමයි සිටියේ කියලා ඔබ කිව්වේ?

පි: මුස්ලිම් ජනතාව ස්වාමීනි.

ප්‍ර: ඒක නිවැරදියි ද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට රජයේ ඉඩම් වලට අමතරව පන්සල් ඉඩම් අල්ලා ගැනීම් එලෙස අල්ලා ගැනීමේ ක්‍රමවේදයක් තිබ්බ ද?

පි: මම දන්න විදිහට ස්වාමීනි දීඝවාපී මම දන්නේ හරියටම කොච්චර අක්කර ගාණක් ද කියලා දීඝවාපී පන්සලට අයිති භූමියත් අත්පත් කරගෙන තියෙනවා යම් ප්‍රමාණයක් මුස්ලිම් ජනතාව.

ප්‍ර: හරි දැන් සාමාන්‍යයෙන් නැගෙනහිර නැත්නම් රටේ වෙනත් තියෙන පළාතක ආඥාපති ධූරය වසර කීයක් පුද්ගලයෙකු විසින් දරනවද?

FAIR COMMENT BY JEZEEM

පි: ස්වාමීනි ඒක රඳා පවතින්නේ මම දැනුවත්ව එවකට හිටපු ආරක්ෂක ලේකම් තමයි තීරණය කරන්නේ මෙයා දිගටම ඉන්නවද නැද්ද කියන එක. දැන් මට මේ රාජකාරි මට්ටම අනුව මාව දිගටම තිබ්බා. 2011 භාර ගත්තාම මම තමයි දිගු කාලයක්ම හිටපු ආඥාපති ගත්තාම ඒ ප්‍රදේශයෙන්.

ප්‍ර: එතකොට ඔබ 2015 දී නැගෙනහිර ආඥාපති තනතුරෙන් මාරු වෙන්නේ කොයි තනතුරට ද?

පි: මම එතනින් මාරු වෙනවා. මොකද මට ඊට පස්සේ මාස 6ක් වගේ තියෙන්නේ විශ්‍රාම යන්න. මම ජනවාරි මාසේ භාර දීලා එනවා පනාගොඩ මට ආවේනිකව තියෙන කාලතුවක්කු රෙජිමේන්තුවේ බලකාධිපති හැටියට.

ප්‍ර: ඒ කියන්නේ ඔය මාරුවීම ඔබ කැමැත්තෙන්ම ලබා ගත්තු එකක් ද ඔබ ඉල්ලා ලබා ගත්ත එකක්ද ?

පි: නැහැ ස්වාමීනි. මට ඒක මගේ Period එක ඉවරයි. ඊට පස්සේ Election එකත් ඉවරයි. මට ඊට පස්සේ කෙළින්ම Transfer එක ආවාම මම බලකාධිපති හැටියට ඇවිල්ලා අවසානයේ දී අගෝස්තු විශ්‍රාම යනවා ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ 2015 අගෝස්තු ඔබ විශ්‍රාම යනවා?

පි: විශ්‍රාම යනවා.

ප්‍ර: නැගෙනහිර ආඥාපති භාර දෙන්නේ 2015 පෙබරවාරි ?

පි: පෙබරවාරි.

ප්‍ර: මට ඒකයි දැන ගන්න ඕනි වුණේ. 2015 පෙබරවාරි වල ඔබ නැගෙනහිර ආඥාපති තනතුරෙන් වෙනස් වෙන්නේ ඔබ විසින් කරන ලද ඉල්ලීමක් අනුවද?

පි: නැහැ ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ යම් ස්ථාන මාරුවක් තමා ලබා දීලා තියෙන්නේ කිව්වොත් හරිද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබ විසින් ඉල්ලපු ස්ථාන මාරුවක් නොවෙයි?

පි: නෙමෙයි ස්වාමීනි.

ප්‍ර: ඔබෙන් පසුව එම නැගෙනහිර ආඥාපති තනතුරට පත් වුණේ කවුද?

පි: මේ ජනරල් වල්ගම කියලා. එයා තමයි භාර ගන්නේ.

ප්‍ර: ඔබට මතක හැටියට ඔහු කොපමණ කාලයක් එම තනතුරේ ඉන්නවද?

පි: මට මතකයක් නැහැ ස්වාමීනි. මම අගෝස්තුවේ විශ්‍රාම යනකොටත් එතුමා හිටියා. ඊට පස්සේ තමයි මම හිතන හැටියට එයා යන්නේ UN Mission එකකට. මම දැනුවත්ව එහි ගියේ.

ප්‍ර: ඊට පස්සේ ඔහුට පස්සේ කවුද හිටියේ නැගෙනහිර ආඥාපති ඔබට මතකයක් තියෙනවද?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පි: මට මතකයක් නම් නැහැ ස්වාමීනි. දැන්නම් කිහිප දෙනෙක්ම හිටියා.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර: පෙරේරා මහත්මයා ඔබ වසර 4ක කාලයක් මේ නැගෙනහිර ආඥාපති විදිහට සේවය කළානේ ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔබ විසින් බුද්ධි අංශ වල තොරතුරු හොඳ හැටි අවබෝධ කරගෙන මේ මුස්ලිම් අන්තවාදීන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳව ඉතාම විමසිල්ලෙන් සිටිය බව පේනවා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ සඳහන් කළ ආකාරයට මේ 2014 වර්ෂයේ අලුත්ගම දර්ගා නගරයේ ඇති වූ ඒ කලබලකාරී තත්ත්වය ඇතිවෙනකොට නැගෙනහිර පළාතේ ඔය මුස්ලිම් අය යම් තර්ජනාත්මක ස්වරූපයකින් කටයුතු කරන්න උත්සාහ කරන බව ඔබට දැන ගන්න ලැබුණා කිව්වා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට ඒ තොරතුරේ කියලා තිබුණේ මඩකලපුව ප්‍රදේශයේ තියෙන විහාරස්ථානයකට පහර දීමක් සම්බන්ධයෙන් ද ?

පි: ස්වාමීනි ඔවුන් කතා වෙලා තිබුණේ, කතා කරලා තිබුණේ එක්කෝ පන්සලකට එහෙම නැත්නම් ස්වාමීන් වහන්සේ කෙනෙක්ට හිරිහැරයක් කරනවා කියන එක. ඔය කතාව තමයි බුද්ධි අංශයෙන්.

ප්‍ර: එතකොට ඒ තොරතුර ඔබට ලැබුණාම ඔබ මේ තොරතුරට සම්බන්ධ උදවිය ගෙන්වලා තර්ජනාත්මක ස්වරූපයෙන් කතා කළාම ඒ අය සම්පූර්ණයෙන්ම ඒ තර්ජනයෙන් මැඩපැවැත්වෙන බව වැටහුණා නේද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ ඒ වෙනාකොට දැනන් හිටියේ නැහැ මේ ආපු කොටසේ සහරානුත් හිටියායි කියලා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට සහරාන් සහ ඔහුගේ අනුගාමිකයන් ඔබ වැනි නිර්භීත බුද්ධි අංශයක් හොඳට හසුරවපු ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරියෙකුගේ බලපෑමට යටත් වුණා කියන එක වැටහෙනවා නේද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔව් එතකොට මෙවැනි වාතාවරණයක් යටතේ 2015 ජනවාරි මාසයේ ජන්දයෙන් පස්සේ ඔබව එක් වරම එම ප්‍රදේශයෙන් මුදවලා වෙන ප්‍රදේශයකට කොළඹ පළාතට මාරුවීම කරන්න යම් දේශපාලන බලපෑමක් තියෙන්න ඇතියි කියලා වැටහීමක් තියෙනවා නේද?

පි: මම නම් නැහැ කියලා කියන්නේ ස්වාමීනි. හේතුව අපේ ලැඩර් එකේ ඒ කියන්නේ ස්වාමීනි දැන් අපේ Service එකේ ලැඩර් එකේ අපි දන්නවා

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මගේ මේ tenure එකෙන් පස්සේ ඒ කියන්නේ මේකෙන් පස්සේ මට විශ්‍රාම යන්න තියෙන්නේ. ඉතින් මාස 6ත් එහේ ඉඳලා විශ්‍රාම යනවාට වඩා මම බොහොම සන්තෝෂයෙන් ආවා පනාගොඩ. මොකද අවසානයේ දී මගේම රෙජිමේන්තුවේ බලකාධිපති වෙන්නත් ඒක වාසනාවක්. ඉතින් මේජර් ජෙනරල් කෙනෙක් හැටියට ඒ බලකාධිපති හැටියට එන එකේ මට ඒ ප්‍රථමයෙන්ම ඒ Transfer එක ආවාම බොහොම ...

ප්‍ර: බොහොම සතුටින් ආවා. ඒක තේරෙනවා.

පි: සතුටින් ආවා. නමුත් මට ඒ වෙලාවේ කිසිම අවිශ්වාසයක් දැනුණෙත් නැහැ. මම එහෙම හිතන්නෙත් නැහැ. මොකද හමුදාපති ජෙනරල් දයා රත්නායක හිටියේ සර්. ඒ සර්ම තමයි කිව්වේ Lal You have done a good job. So you are going back to your own Regiment කියලා ඉතින් එයත් ඊට පස්සේ හමුදාව භාර දීලා වෙන හමුදා ජෙනරල් ක්‍රිෂාන්ත සිල්වා ආවා. මම ඒ වෙලාවේ කිසිම සැකයක් හිතුවේ නැහැ. අදත් සැක හිතෙන්නෙත් නැහැ. මොකද අපේ ස්වාමීනි tenure එකේ එහෙම බලපෑමක් මට ආවේ නැහැ. මම හිතන්නේ නැහැ එහෙම ආවාද කියලා.

ප්‍ර: දැන් ඔබ නිර්භීත විදිහට සහරාන් ගැන නොදැන හෝ ඒ විදිහට තර්ජනය කරලා ඔවුන්ව මර්ධනය කිරීමෙන් එදා ඇති වෙන්න ගිය මොනවා හරි කලබලකාරී තත්ත්වය සම්පූර්ණයෙන්ම මැඩපැවැත්වුවා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබට දැන් හිතනේනේ නැද්ද ඔබ වැනි නිර්භීත නිලධාරීන් ඇත්තටම හිටියානම් තව දුරටත් ඒ පළාතේ මේ සහරාන්ලට ඔළුව උස්සන්න හම්බවෙන්නේම නැහැ නේද?

පි: අනිවාර්යෙයන් ස්වාමීනි. මම නෙවෙයි ඇත්තටම මම නායකයෙක් හැටියට හැසුරුවා පමණයි. නමුත් ඒ හිටපු team එක බුද්ධි අංශය සහ Local Commandersලා ඒ හැමෝම සාමූහිකව කරපු තීරණය අනුව මම හිතනවා මම එදා සාර්ථක වුණා. 99%ක්ම මහජනතාවගෙන් සහායත් ලැබුණා සාමය පවත්වාගෙන යන්න. මොකද මම පොඩි කාලෙත් පොඩි නිලධාරි කෙනෙක් හැටියට ඉන්න කොට නැගෙනහිර ගිනි ගත්තා එක කාලයක්. කාටවත් දේශපාලනයට ඇවිල්ලාත් control කර ගන්න බැරිව ගියා. ඒ ගිනි ගත්ත කලබලකාරී. ඉතින් මමම ආරක්ෂක ආඥාපති හැටියට මට control කර ගන්න හම්බවෙච්ච එක මම හිතනවා මම කරපු ඒ tenure එකේ හිටපු කැපවීම හොඳ හින්දයි නිලධාරින්ගේ තියෙන කැපවීම අනුව තමයි එය සිද්ධ වුණේ කියලා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒක අපි අගය කරනවා. ඒ එක්කම ඔබ ඒ කාලේ ඒ ඉහළ තනතුර දරමින් සිටින අවධියේ දී ඒ කාලේ ඒ පැත්තේ හිටපු ප්‍රබලම මුස්ලිම් දේශපාලනඥයා කවුද?

පි: ස්වාමීනි දැන් කාත්තන්කුඩි ප්‍රදේශයේ මට නම එන්නේ නැහැ ස්වාමීනි. මේ අපේ අර University එකේ Involvement එකේ හිටපු ..

ප්‍ර: රවුෆ් හකීම්?

පි: නැහැ හිස්බුල්ලා. එයා කාත්තන්කුඩි. මට නම එන්නේ නැහැ සමාවෙන්න. ඊළඟට රවුෆ් හකීම් මහත්මයාගෙන් මට එක සැරයක් ඉල්ලීමක් ආවා මට මතක හැටියට. ඒක ඇත්තටම එතුමා ලේකම් තුමාට එවකට හිටපු ගෝඨාභය සර්ට ඉල්ලීමක් කරලා තිබුණේ අපි අත්පත් කරගෙන තිබිච්චි ඒ කඳවුරක් දාලා තිබිච්ච දීඝවාපී කඳවුර ගාවම ඒගොල්ලන්ගේ ඔය Encroach කරපු ගෙවල් 3ක් තිබුණා. ඒගොල්ලෝ දාලා ගියේ නැහැ. ඉතින් ඒගොල්ලෝ camp එක අයිනේම ඇතුලේ හිටියේ. ඉතින් ඒ නිසා ඒගොල්ලෝ claim කරනවා camp එක ඉවත් කරන්න කියලා. ඉතින් මට ගෝඨාභය සර් කතා කරලා ඇහුවා ලාල් මේකට .Do We have any alternative කියලා. ඉතින් මම හොඳ වෙලාවට ලෑස්ති වෙලා ගියේ. මොකද රවුෆ් හකීම් සහ එයාගේ Local team එක හිටපු නිසා නාවික හමුදාපතිත් හිටියා, හමුදාපතිත් හිටියා ලේකම්තුමාගේ කාර්යාලයේම මම ලැප්ටොප් එකෙන්ම පෙන්නුවා. කොහොමද සර් මේක දෙන්නේ මේක අයිති වෙන්නේ අපේ රජයේ භූමියක්. මේකේ විස්තර ඔක්කෝම තියෙනවා. ගෙවල් දාලා තියෙන්නේ පොඩි හට් ගහගෙන ඉන්නේ මැටි මේවාගෙන්. ඒ අයට ගෙවල් හදන්න අපි ඕනි වෙලාවක හදලා දෙන්නම් වෙන ස්ථානයක. අපි හදන්නත් පටන් ගත්තා. ඒ නිසා ඕනිනම් මම ඒ යෝජනාව කරන්නම් කඳවුර නම් ඉවත් කරන්න බැහැ ස්වාමීනි කියලා එවේලෙම මම ප්‍රතික්ෂේප කරා. ඉතින් ඒ වෙලාවේ හිටපු ජනාධිපති ලේකම් තුමාත් හිටියා එතන. ඒගොල්ලන් එක හෙළා මාව පිළිගත්තා. මට කිසිම දෙයක් මේවා කරේ නැහැ ලාල් හරි ඔයා යන්න කියලා ඇරියා. මම ඒ නැගෙනහිර ඉඳලාම ආවා මෙහාට කොළඹට ඒක explain කරන්න. ඒ ඇරෙන්න ඒක ඉල්ලීමක් විතරයි කරේ.

ප්‍ර: ඒ කරන ලද ඉල්ලීම ඔබේ නිර්භීත ප්‍රකාශය නිසා ප්‍රතික්ෂේප වුණා කිව්වොත් හරිද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔය අනිකුත් දේශපාලඥයන්ගෙන් ඔබට ඒ ආකාරයේ ඉල්ලීම් හෝ එහෙම නැත්නම් බලපෑම් හෝ වෙන යම් යම් දේවල් ඒ කාලේ සිද්ධ වුණාද?

FAIR COMMENT
BY JEZEEM

පි: නැහැ ස්වාමීනි. හැබැයි උදව්නම් ඉල්ලනවා. මොකද මේ අපේ ජල ගැලීම් අරහේම ආවාම අපි එහෙම දේශපාලන බලන්නේ නැහැ. හැම Community එකටම උදව් කරනවා. ඉතින් එහි දී අපි ගොඩාක් සහාය කරනවා ඒ අයත් එක්ක සම්බන්ධ වෙලා උදව් කරන්න.

ප්‍ර: දැන් ඔබ තේරුම් ගත්තානේ 2015 ජනවාරි මාසෙන් පස්සේ යම් යම් ආකාරයට බුද්ධි අංශය දුර්වල වුණා කියලා ඒ පළාත්වල?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔබ අගෝස්තු වෙනකනුත් හමුදාවේ ඉහළ නිලධාරියෙක් හැටියට කොළඹ සේවය කළා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට මේ බුද්ධි අංශ දුර්වල වීගෙන යන බව ඔබට වැටහෙන කොට ඔබට හිතුනේ නැද්ද ඒ කාලේ හිටපු යුධ හමුදාපතිවරයාට එහෙම නැත්නම් අගමැතිට, ජනාධිපතිට හෝ කාට හරි කියන්න මේ කරන දෙයින් මෙවැනි වරදක් ඒ කියන්නේ ඒක සුදුසු නැහැ එහෙම කරන එක දැනුවත් කරන්න ඔබට හිතුන් නැද්ද?

පි: ස්වාමීනි එහෙම කියන තත්ත්වයට ඒ කාලේ ඒ විදිහට එක පාරට ආවේ නැහැ. ඒක ටිකෙන් ටික ආවේ. මොකද සමහර නිලධාරීන්ව අත්අඩංගුවට ගත්තා. වෙන යම් සිද්ධීන් වලට. ඒ අත්අඩංගුවට ගත්ත නිලධාරින් එහේ සේවය කරපු අය. එතකොට මට, අපිට මොකුත් කියන්න බැහැ උසාවියට ඇවිල්ලා ඒ අය අත්අඩංගුවට දාලා ඒ අය හිර භාරයට ගන්නකොට මට හමුදා නිලධාරියෙක් හැටියට එහෙම ප්‍රකාශයක් හෝ කියන්න එහෙම තත්ත්වයක් තිබුන් නැහැ. හේතුව ඒක එයාව replace කරන්න කවුරුහරි ගිහිල්ලා ඇතියි කියලා හමුදාවේ එහෙමයි ස්වාමීනි වෙන්නේ. කවුරුහරි Casualty වෙලා ආවොත් එයාව replace කරන්න දෙවැනියෙක් ඉන්නවා. ඉතින් ඒක බුද්ධි අංශයේ replacement එකක් දැම්මට ස්වාමීනි ඒක ලේසි වෙන්නේ නැහැ. මොකද මම ගොඩනඟා ගත්ත Informantලා හා ඒ network එක මම කවදාහරි අයින් වුණොත් ඒක ලේසි නැහැ අනිත් එක්කෙනාට ගොඩදා ගන්න. විශේෂයෙන් හිර භාරයට ගත්තොත් හරි මොනවාහරි දෙයක් දෙයක් කළොත් අර Informantලා ඔක්කෝම බය වෙනවා. ඒ මිනිස්සු එන්නේම නැහැ කෙළින්ම නැති වෙලාම යනවා දාන්න. අපි දැනුවත්ව එහෙම වෙන්නේ. ගොඩාක් යුද්ධ කාලයෙත් එහෙම සිද්ධ වුණා. ඉතින් මම හිතන විදිහට මට එහෙම අවස්ථාවක් කියන්න තරම් ලොකුවට දැනුණේ නැහැ. මොකද ඒක ක්‍රමයෙන් ක්‍රමයෙන් සිද්ධ වුණේ ටික කාලයයි. එක පාරටම මෙහෙම මම අයින් වෙනවාත් එක්කම හිටපු නිලධාරින්ව අයින් කරා කියන එක නෙවෙයි ක්‍රමයෙන් කිහිප දෙනෙක් අයින් වුණා. ඊට පස්සේ Command Network එක අර සමහර ස්වාමීනි දැන් හැමෝම එකා වගේ නෙවෙයි. සමහර අය

FAIR COMMENT BY JEZEEM

ඉන්නවා හරි Command කරනකොට slow අය. එතකොට CO ලා පවා මාරුවුණා. ඒ කියන්නේ අණ දෙන නිලධාරීන්. එකේ අලුත් නිලධාරීන් ඒ එන වකවානුවේ දී ඒ අයට තව බලපෑමක් ආවා මම දැනුවත්ව හමුදා බුද්ධි අංශයට ඒක 2015 න් පස්සේ ගොඩාක් අයට ඔය මම කරගෙන අපි කරගෙන ගිය බුද්ධි තොරතුරු රැස් කරන්න තත්වයක් ආවේ නැහැ ඒ කාලේ.

ප්‍ර: ඒ මොකද?

පි: හේතුවක් තිබුණා. ඒක බුද්ධි අංශය මම හිතන්නේ දන්නවාත් ඇති ස්වාමීන් වහන්ස. මොකද ඒ අයට නිකන් තොරතුරු හොයනවා පමණයි. නමුත් එතනින් එහාට execute කරන්න කිසි දෙයක් Powers තිබිලා නැහැ ස්වාමීනි මම දැනුවත්ව. ඒක වෙනම කරන්නේ. එතකොට හමුදා බුද්ධි අංශයට මම දැනුවත්. ඒක මට එකහෙළා කියන්න බැහැ මගේ දැනුමේ හැටියට ඒ අය මම ඉන්න කාලයේ කරපු ක්‍රියා විදිහට කරන්න හම්බවෙලා නැහැ. මොකද ඒ අයට තියෙන්නේ නිකන් බුද්ධි තොරතුරු හම්බුණා ඒ ටික ගිහින් නිකන් උඩහාට ඇරියා එතනින් එහාට බලන් ඉන්න විතරයි.

ප්‍ර: ඒ කියන්නේ ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය ක්‍රමයෙන් අඩපණ වෙලා දුර්වල වෙලාම ගියා?

පි: ගියා.

ප්‍ර: එහෙම වෙච්ච නිසා ද සහරාන්ලා මෙච්චර ඉහළට ඔළුව උස්සව්වේ?

පි: අනිවාර්යයෙන් ස්වාමීනි. නැත්නම් ඔච්චර දුරක් ගිහිල්ලා රටවල් වලට ගිහිල්ලා ඔහොම suicide යන්න එහෙම එක පාරට කරන්න බැහැ. අනිත් එක ස්වාමීනි මේ වගේ ප්‍රදේශයක මේ තිබිච්චි බුද්ධි network එක අනුව මෙහේ blast වෙලා තව ටික වෙලාවකින් ගිහිල්ලා ඒ ගේ සයින්දමරුදු පැත්තේ blast වෙන්න තරමට බුද්ධිය අඩපණ වෙන්න බැහැ. එහෙම වෙනවානම් පෙර දැනුම් දීම් එනවා. දැන් මගේ කාලේ මට මතකයි මම පටන් ගත්තේ ඉස්සෙල්ලාම තොරතුරු ආවේ හැම ගෙදරකම weapon තියෙනවා කියලා. හොයාගෙන යනකොට හරි. ඇයි යුද්ධ කාලයේ දී මායිම් ගම් වලට weapon දුන්නා චොපර් වලින්. බුද්ධි අංශයෙන් තොරුතුරු ආපු ගමන් මම පොලිස්පතිට , ලේකම් තුමාගේ අවසර අරගෙන පොලිස්පතිට දැනුම් දීලා ඔය DIGලා මාර්ගයෙන් මාසයක කාලයක් ඇතුළත ඔක්කෝම weapon ටික භාරදෙන්න කියලා Announce කරා. ස්වාමීනි විශ්වාස කරන්න 7000කට වැඩිය weapon collect කරා. ඔක්කෝම 303 s, Shotgun, double බැරල් ඒවගේ.

ප්‍ර: ඒ කොයි කාලේ වගේද?

පි: ඒ 2011 මං ආවයින් පස්සේ. මම ඒක මේකට ඇතුල් කළේ නැහැ ස්වාමීනි. මම මේ කියන්නේ..

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔව් ඒවා වැදගත් තොරතුරු. ඒ කියන්නේ ඔබ මුස්ලිම් ඔය අන්තවාදී කොටස් සතුව තිබිච්චි අවිආයුධ තමයි ඔය විදිහට එකතු කර ගත්තේ?

පි: ස්වාමීනි මෙතන නිවැරදි කරන්න ඕනි. ඒගොල්ලන්ගේ විතරක් නෙවෙයි මේ මායිම් ගම් කිව්වාම සිංහල, කන්තලේ , මූතූර්වල, කල්ලාර්වල, සිංහල ගම් සහ අනිත් ඒ හැම ගම් ආරක්ෂා කරන්න ගම් වලට දීලා තිබ්බා. ඉතින් මේ මිනිස්සු යුද්ධය ඉවර වෙලාත් ඒගොල්ලෝ ගෙවල් වල ඒවා තියන් හිටියා. එතකොට ඒවායින් තමයි කලහාකරී වුණාම weapon එක අරන් වෙඩි තියලා තියෙන්නේ ගම් වල මිනිසුන්ට. එහෙම නැත්නම් සත්තු මරන්න අරගෙන තියෙන්නේ. ඉතින් ඒගොල්ලන්ට ලයිසන් මොකුත් නැහැ ඒක නිකන් තියන් ඉඳලා තියෙන්නේ යුද්ධ කාලේ දීපු තෑග්ගක් වගේ.

ප්‍ර: ඔබ එදා ඒ 7000ක් විතර තුවක්කු අවි ආයුධ එකතු කර ගත්තේ නැත්නම් ඊටත් වැඩිය ලොකු විනාශයක් වෙන්න තිබුණා නේද?

පි: එහෙමයි ස්වාමීනි ඇත්තටම. මොකද ගෝඨාභය සර් වෙනම විශේෂයෙන්ම මට කතා කරා ඒක ලාල් ඔයා කරපු ලොකු දෙයක්. අනිත් අයටත් ඒක කරන්න කියලා. මොකද ඒකම තිබුණා වවුනියාව ප්‍රදේශයෙත්. ඒකම අපි වවුනියාවටත් ඒක ඇරියා. වවුනියාවෙත් හම්බවුණා. මොකද අපි අර යුද්ධය ඉවර වුණාට පස්සේ අපිට අමතක වුණා අපේ ගම්වල මෙහෙම weapon දීලා තියෙනවා ද කියලා දන්නේ නැති නිසා ස්වාමීනි ඒක පටන් ගත්තේ. ඉතින් ඒක රැකුලක් වුණා, ඒක ආධාරයක් වුණා මොකද ඒ ටික clear කරාම පොලිසියට පවා law and order ලේසි කරන්න. මොකද එතකොට ගෙවල් වලට යන්න ප්‍රශ්නයක් නැහැ යන්න පුළුවන්. මොකද මිනිස්සු ළඟ අවි ආයුධ නැහැ ලයිසන් ඇතිව තිබිච්චි ඒවාත් නැතිව තිබිච්චි ඒවාත්.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ 2014 සහරාන් ගෙන්වලා ඔහු විසින් බෞද්ධ විහාරයකට හෝ භික්ෂූන්ට හිරිහැර කිරීම සම්බන්ධව අවවාද කරා කියලා කිව්වා. අවවාද කරා කියලා 2014 වර්ෂයේ Camp එකට ගෙන්වලා. එතකොට ඔබලා දන්නවා මේ සහරාන් සහ හිටිය කණ්ඩායම මේ යම් බෞද්ධ භික්ෂූන්ට, විහාර වලට පහර දෙන්න සූදානම් යම්කිසි ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරෙන පුද්ගලයින් බව. ඒ අනුව ඔබගේ බුද්ධි අංශ යොදලා යම්කිසි පහර දීමක් කරන්න සූදානම් වීමක් සම්බන්ධව තමන්ට තොරතුරු ලැබිලා තමන්ලා ගෙන්වලා ඔවුන්ට අවවාද කරා. ඒ අවවාද කරාම තමන්ලා දන්නවා මේ සහරාන් ඇතුළු යම් කණ්ඩායමක් ප්‍රචණ්ඩකාරීව ක්‍රියා කරන්න හැසිරෙන පුද්ගලයින් බව. එවැනි අවස්ථාවක තමන්ලාගේ බුද්ධි

LAW COMMENT BY JEZEEM

අංශ මඟින් මෙම පුද්ගලයින් පිළිබඳව දිගටම තොරතුරු සොයලා බැලුවේ නැද්ද ?

පි: ස්වාමීනි මම නිවැරදි කරන්න ඕනි. ඔය තවුහිද් ජමාත් කියන කණ්ඩායම ඒ මම ඉන්න වකවානුවේ ලොකු Prominent බොහොම ලොකු භයානක පුද්ගලයෝ නොවේ. ඒ නිකන් පොඩි ගණන්කාර කණ්ඩායම් වගේ පොඩි slots මේ අය කතා කරලා තියෙනවා පල්ලියක මේ සාකච්ඡා කරලා තියෙනවා අපිත් මොනවාහරි මේ පැත්තේ කරමු බං දන්නේ නැද්ද අර ගහනවා වගේ කතාවක්. ඕක තමයි පොඩියට ආවේ. ඒකේදී තමයි මං තමයි ගෙන්නලා මේවා කරේ පොඩි බයක් හින්දා.

ප්‍ර: ප්‍රභාකරන් වුණත් දැන් පටන් ගත්තේ මුලින් පොඩියටනේ. ඒ වගේ මෙම පුද්ගලයින් පිළිබඳවත් හමුදා බුද්ධි අංශ මඟින් මොවුන් සම්බන්ධව සොයා බැලීමට තොරතුරුකරුවන් යොදලා ඒ අධීක්ෂණයක් කරා ද කියලා අහන්නේ 2014 පස්සේ?

පි: මම නිවැරදි කළ යුතුයි. ඔබ හරි ස්වාමීනි. එදා ඉඳලා අපි හඳුන ගත්ත මේ රැඩිකල් groups හරියාකාරව මොනිටර් කරන system එකක් හැදුවා. මොකද අපිට නීතිමය කිසිවක් තිබුණේ නැහැ. ඒගොල්ලන්ව arrest කරන්නවත් කිසිම. නමුත් මොනිටර් කිරීම ඉතාම ශක්තිමත් කරා. මොකද අපේ ගාව තියෙනවා බුද්ධි අංශ වල Clandestine Operations තියෙනවා. Use කරන්න එතකොට නිකන් මොනිටර් කරන්න ගොඩාක් නොයෙකුත් ක්‍රම තියෙනවා. ඉතින් ඒවා ඒ ප්‍රදේශිය මට්ටමින් බුද්ධි අංශ වලින් මොනිටර් කරන්න systems තිබුණා. ඒ අය විතරක් නෙවෙයි ස්වාමීනි සමහර rehabilitate කරපු LTTE Hardcore ඒ අය පවා අපි මොනිටර් කරනවා system ඔස්සේ. ඉතින් ඒ හින්දා අපිට මේ තවුහිද් ජමාත් කියන අය හුඟාක් මොනිටර් කරා. මම කිව්වේ ඒ අර මොනිටර් කරන සිදුවීම දිගටම කරගෙන ගියානම් මම හිතන්නේ නැහැ 2019 මේ වගේ සිදුවීමකට මුහුණ දෙන්න.

ප්‍ර: ඒක නෙමෙයි මම ඇහුවේ. ඒ මොනිටර් කිරීම දිගටම බුද්ධි අංශ මඟින් කරගෙන ගියානම් මේ මොහුගේ ක්‍රියාකාරකම් සිදු වෙන ඒවා සොයාගන්න තිබ්බා?

පි: අනිවාර්යයෙන් ස්වාමීනි.

ප්‍ර: නමුත් ඔබ ඒ යම්කිසි ක්‍රමයක් ඒ සඳහා පටන් ගත්තාද අවවාද කරායින් පස්සේ ඔවුන් ගැන සොයන්න?

පි: අනිවාර්යයෙන් ස්වාමීනි. ක්‍රමවේදයක් කියන්නේ ඒ අය කොහොමත් මොනිටර් කරගෙන තිබුණේ. මම අර ගෙන්නුවේ මොකක් හරි ඉක්මන් වෙයි කියලා බයට මම ක්ෂණික ගත්තේ සාමය පවත්වා ගන්න. නමුත් බුද්ධි අංශ වලින් දිගටම ඒ Constantly මොනිටර් කිරීම කරා.

****

FAIR COMMENT
BY JEZEEM

<u>ගරු විනිසුරු බන්දුල අතපත්තු මැතිතුමා</u>

ප්‍ර: මේජර් ජනරාල්තුමනි දැන් මේ ඔබතුමා එහේ නැගෙනහිර ඉන්න කාලයේ මුස්ලිම් තරුණ කොටස් අතර ඔවුන්ගේ ක්‍රියාකාරකම්වල යම් කිසි වෙනසක් තිබුණාද සාමාන්‍යයෙන් ගතානුගතික මුස්ලිම් ජාතිකයන් සිකුරාදාට පල්ලි යනවා එන්න ඒ වගේ දේවල් ප්‍රතික්ෂේප කරලා තිබ්බද මේ තරුණ කොටස්?

පි: මුස්ලිම් විතරක් නෙවෙයි ස්වාමීනි. එහෙම බැලුවොත් අපිට ඔය Batticaloa මඩකලපුවේ ඉන්න ද්‍රවිඩ ජනතාවෙත් තරුණ අය හිටියා ප්‍රතික්ෂේප කරන කෝවිල් වලට යන්නේ නැහැ කිසිම කෙනෙක් වෙනම groups. ඒ අයට ඉතින් අර phones වලයි අර එක එක මේක තිබුණේ. අපි හඳුනා ගත්තා. ඉතින් අපි ඒ විදිහට අපේ තිබුණා සිමික් Activity. ඒ කියන්නේ Civil Military Activity හැටියට ඒ අයව යොදවනවා Sport Activity වලට. අපිත් එක්ක එක එක තරඟ වලට සහභාගී වෙන්න. ඒවගේ කරලා මුස්ලිම් අයත් අපි ගත්තා. ඔය මුස්ලිම් අය විශේෂයෙන් හොඳ Football Playersලා. ඉතින් තරුණ අය අපි හඳුනා ගත්තා ගොඩක් ඔය දෙමාපියන් කියන දේ අහන්නේ නැහැ. දෙමාපියෝ හුඟාක් අර ආවේණික මේ හොඳ මුස්ලිම් අය හිටියා. ඒ අය පරම්පරා ගත අයයි. ඒ අය හුඟාක් වෙළඳාමේ ඒ පැත්තේ ඉන්නේ. ඉතින් ඒ අයගෙන් පවා ඈත් වෙච්ච තරුණ කොටස් හිටියා කිහිප දෙනෙක්. ඕනතරම් ගත්තොත් ඉන්නවා. ඉතින් අපි ඉස්කෝලවල් tap කරලා අරගෙන ඒ ළමයි එක්ක පවා අපි groups හදලා මට මතකයි ඒ ප්‍රාදේශිය මට්ටමේ අපේ Local Commandersලා එහෙම ඒ අයට Sport Activity තිබ්බා. ගොඩක් Cricket Matches අරගේ සමහර අය Donation ගෙනල්ලා දුන්නා. මොකද සමහර අයට grounds නැහැ. එතකොට අපි Army Ground තමයි අපි තියෙන camps වල තියෙන grounds තමා ඒගොල්ලන්ට දෙන්නේ සෙල්ලම් කරන්න. ඒවගේ අපි අර සුහද මේක පවත්වාගෙන යෑම බොහොම මේකෙන් තිබ්බා මොකද ඒ අයට ඒ වගේ Involve වුණේ නැත්නම් වෙන්නේ ස්වාමීනි ඒ අය නිරායාසයෙන්ම වෙන වෙන දේවල් වලට යොමු වෙනවා. ඉතින් ඒ ඇරෙන්න මට විශේෂයෙන් හඳුනා ගන්න තිබුණේ නැහැ. ඒ අය වෙනම රැඩිකල් යන කට්ටියවත් තිබුණේ නැහැ මගේ කාලයේ.

ප්‍ර: දැන් අර සහරාන් ඇතුළු පිරිස මේ පන්සලකට නැත්නම් ස්වාමීන් වහන්සේ කෙනෙකුට හිරිහැර කරන්න බලාපොරොත්තුව හිටියා කිව්වානේ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔවුන්ව ගෙන්වුවා කිව්වානේ ඔබතුමා?

FAIR COMMENT BY JEZEEM

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ ගෙනාපු කට්ටිය සම්බන්ධයෙන් කළින් list එකක් වගේ දෙයක් ගත්තේ නැද්ද?

පි: ස්වාමීනි මම Field Commander කෙනෙක්. මම එහෙම නම් අරන් කියෙව්වේ නැහැ. ඒ Local හිටපු Int එකේ අය ගෙන්න ගත්තා. ඒ අය ගෙනල්ලා ඒ අය Details ගත්තා. ඒ පින්තූරු අරගෙන මොකද අපි සාමාන්‍යයෙන් මං Int එකට භාර දෙන්නේ මේ කට්ටිය හොයලා බලලා මේව කරන්න. මොනිටර් කරන්න කියලා . අනිවාර්යයෙන් ඒ අයගේ විස්තර ඒ Local Int එකේ ඉන්න අය ගාව තියෙන්න ඕනි. මොකද ඒ අයගේ විස්තර නඩත්තු කිරීම් බුද්ධි අංශය හරහා තමයි යන්නේ.

****

<u>ගරු විනිසුරු අදිකාරි මැතිනිය</u>

ප්‍ර: Retired මේජර් ජනරාල් ලාල් පෙරේරා මහත්මයා ඔබට කියන්න පුළුවන් ද ඔබ මෙම කොමිෂම හමුවේ දී යම් දෙයක් කිව්වා. Directorate of Military Intelligence වල නැගෙනහිර පළාතේ තිබුණු ඒකක ස්ථාපිත කරලා තිබුණේ කිනම් ප්‍රදේශ වල ද නම් වශයෙන්. දැන් ඔබ කිව්වා ත්‍රිකුණාමලයට අලුතින් එකක් දුන්නා කියලා. එතකොට තව මොනවද තිබුණේ ස්ථාන මොනවද ?

පි: ස්වාමීනි බුද්ධි බලකායේ 2ක් ස්ථාපිත කරා. එකක් මම එනකොට තිබුණා. අලුතින් එකක් ගෝඨාභය සර් approve කරලා දුන්නා. එක බලකායක් තිබුණේ මඩකලපුවේ ස්ථානගත වෙලා. මඩකලපුවෙන් තමයි මුලින්ම තිබුණේ ත්‍රිකුණාමයලට පොඩි කොටසකුයි අම්පාරේ. පස්සේ අලුත් බලකායක් ආවාම ඒක ස්ථාපිත කරා ත්‍රිකුණාමලයේ. සම්පූර්ණ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයම cover කරන්න. ඊළඟට හිටපු බලකාය මඩකලපුව සහ අම්පාර cover කරන්න.

ප්‍ර: ඒ කොතන ද ස්ටේෂන් වෙලා හිටියේ කොහේද ඒගොල්ලන්?

පි: ස්වාමීනි මට කියන්න පුළුවන් සෑම ඒ අය Local Area එකේ cover කරා.

ප්‍ර: මට අවශ්‍ය නැහැ. දැන් ඔබ 2011 සිට 2015 දක්වා නැගෙනහිර ආඥාපති හැටියට සේවය කරානේ ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබ සේවය කරන කාලය තුළ මේ සහරාන් කියන පුද්ගලයා පිළිබඳව පාර්ලිමේන්තු තේරීම්කාරක සභාවට යම් යම් සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් තොරතුරු වාර්තා කරලා තියෙනවා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ තොරතුරු වලින් ගත්ත සමහර දේවල් මම ඔබට ඉදිරිපත් කරන්නම්. සහරාන්ගේ ජාතික තවුහිද් ජමාත් කියන සංවිධානය ආරම්භ කරලා

FAIR COMMENT BY JEZEEM

තියෙන්නේ 2011 වර්ෂයේ දී. ඔබ දැන් බුද්ධි සියලුම ඒකකයන් සම්බන්ධීකරණය කරමින් මේ විශාල සේවයක් කරානේ. ඒ අවස්ථාවල දී වාර්තා වුණේ නැද්ද මෙහෙම ජාතික තවුහිද් ජමාත් කියලා සංවිධානයක් මේ සහරාන් කියන පුද්ගලයාගේ ප්‍රධානත්වයෙන් කාත්තන්කුඩි ප්‍රදේශයේ ආරම්භ කරලා තියෙනවා කියලා?

පි: ස්වාමිනි මට කියන්න පුළුවන් වර්ෂය නම් මට මතක නැහැ. නමුත් තවුහිද් ජමාත් කියලා ඊට ඉස්සෙල්ලා තිබිලා තියෙනවා. දාරුල් අදර් සංවිධානය කියලා කොටසක් තිබිලා තියෙනවා ස්වාමීනි ඒකේ. ඒක තමයි ඉස්සෙල්ලාම මේ..

ප්‍ර: ඒ 2005 විතරනේ ඒ දාරුල්?

පි: අන්න එහෙම මට වර්ෂයනම් දන්නේ නැහැ හරියටම. ඒකෙන් කැඩිලා තමයි තවුහිද් ජමාත් හැටියට organize කරලා තියෙන්නේ මට හරියටම දින වකවානුනම් දන්නේ නැහැ කියන්න.

ප්‍ර: මම විශේෂයෙන් අහන්නේ අර Intelligence වලට මේවා වාර්තා වෙලා තිබුණාද කියන එක?

පි: අනිවාර්යයෙන්.

ප්‍ර: වාර්තා වුණා නේද?

පි: ඔව්.

ප්‍ර: එතකොට සහරාන් 2013 දී එයා තවුහිද් කියලා daily newspaper එකකුයි තවුහිද් කියලා සඟරාවකුයි ප්‍රකාශයට පත් කරලා තියෙනවා. ඒ සඟරාව සහ newspaper එක ප්‍රධාන වශයෙන්ම සාම්ප්‍රදායික සුෆි මුස්ලිම්වරුන්ට එරෙහිව ඔවුන්ගේ ආගම ඇදහීමේ ක්‍රමය වැරදියි කුරානය කියලා තියෙන දේ නෙවෙයි මේ කරන්නේ නබිතුමා ජීවත් වෙච්ච විදිහට නෙවෙයි මේ ජීවත් වෙන්නේ කියමින් විශාල වශයෙන් අර සාම්ප්‍රදායික මුස්ලිම්වරුන්ව කරදරයට පත් කිරීමේ ව්‍යාපාරයක යෙදිලා තියෙනවා. ඒක වාර්තා වුණාද intelligence වලට?

පි: ඒවා කියනවා ස්වාමිනි.

ප්‍ර: intelligence වලට වාර්තා වුණා?

පි: ඒක commonly කියනවා. මොකද ඒ group එකේ එතන තමයි Turning point එක. මොකද ඒගොල්ලන් reject කරනවානේ. එතකොට අපි දැන ගත්තා ඔය කියන තවුහිද් ජමාත් තමයි රැඩිකල් අය කියලා. එතකොට තමයි Int එකෙන් බුද්ධි අංශයෙන් සම්පූර්ණ මොනිටර් කරන්න ගත්තේ.

ප්‍ර: එතකොට දැන් 2015 වසරේත් ඔබ හිටියානේ නැගෙනහිර ආඥාපති හැටියට 2015 මැතිවරණයට ඉස්සෙල්ලා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ යුගයේ දී ඔය ඔබත් නම සඳහන් කරපු මේ හිස්බුල්ලා කියන ඒ ප්‍රදේශිය සහ ජාතික දේශපාලනයේ ෆිගර් එකක් වූ පුද්ගලයා සහරාන්

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සමඟ පාර්ලිමේන්තු මැතිවරණයට පෙර ගිවිසුමක් අත්සන් කළ බවට තොරතුරු බුද්ධි තොරතුරු වාර්තා වුණා ද?

පි: නැහැ මට ඒ Detail නම් ආවේ නැහැ.

ප්‍ර: එතකොට මේකනම් සමහරවිට ඔබ දන්නවා නැතිව ඇති 2016 වසරේ මේ සහරාන් කියන පුද්ගලයා සියලුම ක්‍රිස්තියානුවරුන් මරාදැමිය යුතුයි කියලා ෆත්වා එකක් ප්‍රකාශයට පත් කරලා ඔහු මේ පිළිබඳව CD හදලා ඔහුගේ කටහඬින් ඔහු කියන දේ ෆත්වා එකක කියන දේ CD හදලා එම ප්‍රදේශයේ තියෙන සියලුම ක්‍රිස්තියානි පල්ලි වලට යවලා තියනවා. ඒ පිළිබඳව intelligence වලට වාර්තා වෙලා තියෙනවද?

පි: ඒක මම දන්නේ නැහැ ස්වාමිනි. මොකද මම 2015 පෙබරවාරි වලින් අයින් වුණාට පස්සේ ..

ප්‍ර: දැන් ඔබ අපි හිතමු ඔබ හිටියා කියලා ඒ මේක වෙනකොට. දැන් මේ ෆත්වා එකකින් සියලුම ක්‍රිස්තියානිවරුන් මරා දැමිය යුතුයි කියලා මේ සහරාන් කියන පුද්ගලයා කියලා තිබුණා නම් ඔබ නොහිටියත් intelligence වලට මෙම තොරතුරු ලැබිලා තිබුණානම් intelligence වැඩි අවධානයක් යොමු කරලා මොකද මේ මීනිමරන්න කියලානේ කියන්නේ මේ?

පි: එහෙමයි.

ප්‍ර: මිනිස්සු මරන්න කියලා. එතකොට intelligence වැඩි අවධානයක් යොමු කර මේ සහරාන්ගේ පසුබිම සහරාන් වගේ ම මෙහෙම කියන අය ලෝකයේ තව ඉන්නවද වෙනත් අන්තවාදීන් ඉස්ලාම් සංවිධාන. එතකොට ඒකේ බලපෑමක් මේ ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතට ඇති වෙමින් තියෙනවා ද කියන දේවල් සොයනවද ඔබ හිටියානම් 2016 වර්ෂයේ?

පි: අනිවාර්යයෙන් ස්වාමීනි බුද්ධි අංශය, ඔතන ස්වාමීනි පොඩි මේකක් තියෙනවා. දැන් මම ඉන්න කාලේ නෙමෙයි. මම ඉන්නකොට වත්මන් ජනාධිපතිතුමා ලේකම් ඉන්න කාලේ තිබිච්ච බුද්ධි තොරතුරු සහ ඒ යන ක්‍රමය අපි අයින් වෙලා Election එකෙන් පස්සේ ඊළඟ ආණ්ඩුවක් ආවාට පස්සේ ඒ තිබිච්චි system එක වෙනස් වෙලා තියෙනවා කියලා මට තේරෙනවා. හේතු නැත්නම් ඔය මොනිටර් කරන system ඒ බුද්ධි අංශයෙන් කරගෙන යන්න තිබුණා ප්‍රධානයෙන්. ඒකේ ඛේදවාචකය වුණේ ඒ මොනිටර් කරගෙන ආපු නිලධාරින් විශාල ප්‍රමාණයක් අයින් කරා. හිරබත් කෑවා.

ප්‍ර: 2016, 2015 මැතිවරණයට පෙර Directorate of Military Intelligence Eastern Province එකේ ඔය මඩකලපුවේ කාර්යාලයේ හරි ත්‍රිකුණාමලයේ හරි අම්පාරේ හරි කාර්යාලයට මේ සහරාන්ලා පිළිබඳව

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

බුද්ධි තොරතුරු තියෙනවාද ? තියෙනවා කියලා ඔබ දන්නවා ද සහරාන් පිළිබඳව?

පි: අනිවාර්යයෙන්ම.

ප්‍ර: එසේ තිබෙනවානම් ඒවා අනිවාර්යයෙන්ම Director Directorate of Military Intelligenceට යායුතුයි නේද?

පි: ස්වාමීනි ඔව්. ඔය අපි දැන් සාකච්ඡා කරපු ඔය රැඩිකල් කියන team අය ගැන මොනිටර් කිරීම ඒ පැත්තට යා යුතුයි. මොකද ඒගොල්ලෝ තමයි ඒකේ සම්පූර්ණ continue කරන්නේ මොනිටර් system එක.

ප්‍ර: ඔබගෙන් මෙම කොමිෂමේ සාමාජික මහත්මයෙක් ඇහුවා ආමි මොහිදීන් කියන පුද්ගලයෙක් ගැන. මෙම කොමිසම් සභාව හමුවේ තිබෙන පාර්ලිමේන්තු තේරීම්කාරක සභාවේ දී ඔබ දන්නවද ආරියබන්දු වෙදගෙදර කියන කාත්තන්කුඩියේ පොලිස් ස්ථානාධිපතිතුමා ගැන ඔබ අහලා තියෙනවද?

පි: නැහැ ස්වාමීනි. මට එච්චර පල්ලහට මතකයක් නම් නැහැ.

ප්‍ර: ඔබගේ කාලයේ එතුමා හිටියා 2014 ඉඳලා 2018 දක්වා කාත්තන්කුඩි පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ඔබට හම්බවෙලාම නැද්ද?

පි: හම්බවෙලා ඇති ස්වාමිනි. මොකද

ප්‍ර: මතකයක් නම් නැහැ?

පි: මතකනම් නැහැ ස්වාමිනි.

ප්‍ර: එතුමා කියලා තියෙනවා මේ පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවේ දී ආමි මොහිදීන් කියන්නේ ආමි එකේ තොරතුරුකරුවෙක් කියලා. ඔබට ඒ ගැන මොකක් ද කියන්න තියෙන්නේ?

පි: ස්වාමීනි මෙතන අපි තේරුම් ගන්න ඕනි යුද්ධ කාලයේ දී ඒ කියන්නේ LTTE යුද්ධ කාලයේ දී විශාල බුද්ධි අංශවලට සහායක් දීපු මුස්ලිම් ජාතිකයෝ විශාල පිරිසක් නැගෙනහිර හිටියා. ඉතින් ඒකේ ඒ අය බුද්ධි තොරතුරු ලබා දුන්නා ඒකේ දී. ඉතින් ඒකේ දී ඒ අයගේ සහාය එදා ඉඳලාම තිබුණා. ඒ කියන්නේ මම මේ කියන්නේ LTTE මේකෙ දී. එතකොට අපි කරුණාඅම්මාන් සටන් කරන කාලයේ දී පවා. එතකොට ඒ LTTE එක සම්බන්ධව තොරතුරු ලබා දීපු විශේෂ Informantලා තමයි මුස්ලිම් අය.

ප්‍ර: මෙයා ඔබ කියනවා ද එතකොට ආමී මොහිදීන් කියන්නේ Informant කෙනෙක් කියලා?

පි: මම විශ්වාස කරන්නේ ඒ අයගෙන් එක්කෙනෙක් තමයි ඔය. මම දන්නේ නැහැ අඳුනන්නේ නැහැ.

(C – 4 (C) ලේඛනය සාක්ෂිකරුට පෙන්වා සිටී)

පි: ස්වාමීනි මට මේකනම් ඉඳුරාම කියන්න මතකයක් නැහැ.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: ඔබට ඕක ආවේ 2019 අප්‍රේල් 4 වන දින ඉන්දියානු බුද්ධි තොරතුරු මඟින් 2019 අප්‍රේල් මාසයේ දී සිදුවිය හැකිබවට දක්වා තිබූ බුද්ධි තොරතුරු සමඟ?

පි: එහෙමයි.

ප්‍ර: ඔය දැන් ඔබ සිංහලෙන් කියවව්වානේ ආමී මොහදීන් තියන එක. ඒක සම්බන්ධයි ඕකේ තියනවා තව C – 4 A,B, කියලා 2ක්. CNI Report (C – 4 (A) ලේඛනය සාක්ෂිකරුට පෙන්වා සිටී.)

පි: මෙච්චර දුරට දන්නේ නැහැ මම.

ප්‍ර: ඔබ දන්නේ නැති බවට මම පිළිගන්නවා. නමුත් ඔය ආමී මොහිදීන් කියන පුද්ගලයා ගැන විස්තරයක් තියනවානේ. ඒකෙන් සනාථ වෙනවා නේද ඔහු මේ ඔය සහරාන්ලාගේ ඉස්ලාම් ආගමික අන්තවාදී ත්‍රස්තවාදී කණ්ඩායමේ හිටපු පුද්ගලයෙක් හැටියට?

පි: ස්වාමිනි මට එතන කියන්න එක පාර බැහැ. මං හිතන හැටියට බුද්ධි අංශයෙන්ම තමයි මේක සනාථ කළ යුතුයි. ස්වාමිනි මම යෝජනා කරනවා මේක හරියටම සනාථ කර ගත්ත හැකියි බුද්ධි අංශයකින්ම.

ප්‍ර: දැන් ඔබ ප්‍රකාශ කරා ඔය මුස්ලිම් දේවස්ථාන විශාල වශයෙන් හැදෙනවා කියලා නැගෙනහිර පළාතේ ගෙවල් 10කට එක පල්ලියක් වගේ. එම මුස්ලිම් දේවස්ථාන වල තියෙනවාද World Muslim League කියලා ලේබල් එකක් වගේ දෙයක් ගහලා. ඒකට ආධාර ලැබිච්චි එක පිළිබඳව World Muslim League ඔබට මතකයක් නැද්ද?

පි: මටනම් මතක නැහැ ස්වාමීනි.

ප්‍ර: ඔබලාගේ අර බුද්ධි තොරතුරු රැස් කරන ඔක්කෝම අයත් එක්ක තියෙන රැස්වීම් වලදී වාර්තා වුණේ නැද්ද මේ මුස්ලිම් පල්ලි විශාල වශයෙන් මෙහේ ඉදි වෙනවා.

පි: මට මතකයි ස්වාමීනි එහෙම වාර්තා කරා. නමුත් detail වලට ගිහින් නෙවෙයි. මෙහෙම ස්ථාපිත වෙනවා. මෙහෙම තියෙනවා කියලා. ඉතින් අපි ඒ වෙලාවේ දී ඒවා උසස් මූලස්ථානයට යවනවා වගේම මොනිටර් කිරීමක් කරනවා මොකද අපිට ගිහිල්ලා එක පාරටම විනාශ කරන්න අරවා මේවා කරන්න බැහැ.

ප්‍ර: ඔබ නැගෙනහිර පළාතේ ආඥාපති ලෙස සිටින කාලයේ දී අග්නිදිග විශ්ව විද්‍යාලයේ ඔළුවිල් විශ්ව විද්‍යාලයේ එම විශ්ව විද්‍යාලයේ මෙම කොමිෂම හමුවේදී ඔබගේ සමකාලීන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නන්දන මුණසිංහ මහත්මයා තමයි මෙම තොරතුර අපිට ඉදිරිපත් කළේ. ඔහු ප්‍රකාශ කරා මෙම ශ්‍රී ලංකාවේ කිසිදු විශ්ව විද්‍යාලයක නැති ආකාරයට අග්නිදිග විශ්ව විද්‍යාලයේ ඉස්ලාම් සංස්කෘතික ජාතික අනන්‍යතාවය පිළිඹිබු කරන ආකාරයේ කෞතුගාරයක් හදලා තියෙනවා කියලා. ඒ

FAIR COMMENT BY JEZEEM

පිළිබඳව වාර්තා වුණාද ඔබට හෝ ඔබගේ ඒ බුද්ධි තොරතුරු රැස් කරන අයට?

පි: ස්වාමීනි ඕක ඔළුවිල් වල ද එහෙම නැත්නම්

ප්‍ර: ඔළුවිල් ඔළුවිල් ?

පි: පූනානි ද

ප්‍ර: නැහැ නැහැ. ඔළුවිල් කියලා පැහැදිලිවම කිව්වා. අග්නිදිග විශ්ව විද්‍යාලය කියලා නැහැ ඔබට වාර්තා වුණේ නැහැ.

පි: නැහැ ස්වාමීනි.

ප්‍ර: ඒ වගේම ඔබට වාර්තා වුණාද මෙම කොමිෂම හමුවේ ඊයේ සාක්ෂි දුන්න ගලබොඩඅත්තේ ඥානසාර ස්වාමීන් වහන්සේ කිව්වා. මෙම විශ්ව විද්‍යාලය තුළ මෙම අග්නිදිග විශ්ව විද්‍යාලයේ බෞද්ධ සිසුන් වෙනුවෙන් ඔබට ඔබගේ බුද්ධි අංශ වලට තොරතුරු වාර්තා වුණාද මෙම විශ්ව විද්‍යාලයේම බෞද්ධ සිසුන් වෙනුවෙන් වන්දනා මාන කිරීම සඳහා බුද්ධ ප්‍රතිමා වහන්සේ කෙනෙක් ස්ථාපිත කිරීමට කිසියම් අරගලයක් කරන්නට සිද්ධ වුණාද කියලා? ඔළුවිල් විශ්ව විද්‍යාලයේ?

පි: ස්වාමීනි මෙහෙමයි මගේ වකවානුවේ දී ඔළුවිල් විශ්ව විද්‍යාලයේ මඩකලපු විශ්ව විද්‍යාලයෙයි යම් යම් සට්ටන තියෙනවා. එනවා. විශේෂයෙන් අපි ඇහැ ගහගෙන ඉන්නේ මේ සමහර වෙලාවට සිංහල Studentsලාට හිරහැර කරලා අරවා මේවා ප්‍රශ්න ආවොත්. නමුත් වැඩි හරියක් මට දැන ගන්න හම්බුණේ අපේ සිංහල අපේ කියන්නේ සිංහල Studentsලා ගිහිල්ලා ඒගොල්ලන් එක්ක සට්ටනය වෙච්ච තැන් වල ගොඩක් මම දැක්කේ. මට හම්බවෙච්චා මොකද අපේ බුද්ධි තොරතුරු සහ මොකද අපි මම දැනුවත්ව Int එකෙනුත් ඒ කාලේ ඒගොල්ලන්ගේ University ඇතුලෙත් බුද්ධි අංශය තිබුණා. ඒ අනුව තොරතුරු අනුව මමනම් මට දැන ගන්න හම්බුණේ ඒ වගේ ඒවා. නමුත් ඔය වගේ පොඩි පොඩි ඒවා තියෙන්න ඇති ස්වාමීනි.

ප්‍ර: ඒ විශ්ව විද්‍යාලයේ Vice Chancellor ඔහු ඉස්ලාම් ආගමික අන්තවාදය ප්‍රවර්ධනය කිරීමට විශ්ව විද්‍යාලය තුළ කටයුතු කරන බව ඔබට තොරතුරු ලැබුණේ නැද්ද?

පි: මට මතකයක් නම් නැහැ ස්වාමීනි.

ප්‍ර: සිංහල සිසුන් මුස්ලිම් අයට ඒවා කරනවා කියලා තමයි ඔබට වාර්තා වුණේ?

පි: ඔළුවිල් වල

ප්‍ර: ඔව් මේ ඔළුවිල් විශ්ව විද්‍යාලයේ. ඔබ දැන් මෙම කොමිසම හමුවේ කියා සිටියා යුද්ධය ඉවර වුණානේ 2009 වර්ෂයේ දී ?

පි: එහෙමයි ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔය නැගෙනහිර පළාතේ අම්පාර හැර මඩකලපුව ත්‍රිකුණාමලය අතහැරියොත් මඩකලපුව ප්‍රදේශයේ විශාල වශයෙන් හිටියානේ සිංහල ජනතාවක්?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒගොල්ලන් යුද්ධයෙන් අවතැන් වුණානේ ?

පි: එහෙමයි.

ප්‍ර: ඒ ගොල්ලන්ව යුද්ධයෙන් පසු නැවත පදිංචි කිරීම පිළිබඳව මොනවාහරි වැඩසටහන් ඔබ දුටුවාද ඔබ ඔය නැගෙනහිර ආඥාපති හැටියට සේවය කරන කාලයේ දී?

පි: ඔව්. ස්වාමීනි අපිට පුළුවන් වුණා මගේ වකවානුවේ දී පන්සලක් ස්ථාපිත කරන්න. නැති වෙච්ච පන්සලක් ඒක මඩකලපුවේ එරාවුර් කිට්ටුව. ඒකේ හාමුදුරුවෝ මං හිතන්නේ හිටියෙත් දිඹුලාගල ආසනයට අයිති පන්සලක් එහේ. ඊට පස්සේ අපි ස්ථාපිත කරා සිංහල කිහිපයක් මඩකලපුවට කිට්ටුව. පවුල් 12ක් විතර ස්ථාපිත කරා. ඒ වගේම දෙමළ අයත් ඒ ළඟන්ම ස්ථාපිත කරා. ඒකෙන් වාසියක් වුණා හේතුව දෙමළ ..

ප්‍ර: ඒ කොහේද?

පි: මඩකලපුව බවුන්ඩරි කියන පූනානි පැනලා මඩකලපුවට කිට්ටුවට යනකොට.

ප්‍ර: සාපේක්ෂව මම අහන්නේ දැන් සිංහල දෙමළ අය ඔක්කෝම අවතැන් වුණානේ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මුස්ලිම් අයව පදිංචි කිරීමේ වැඩසටහන සීඝ්‍ර ලෙස සිදු වුණාද අනිත් අයට සාපේක්ෂව නැවත පදිංචි කරවීම?

පි: ඒ පැත්තේ එහෙම ලොකුවට මේවා උනේ නැහැ ස්වාමීනි. නමුත් හරියට ඒ කියන්නේ අපි නොදැනුවත්ව Unofficially ඉඩම් අත්පත් කරගෙන රජයේ තියෙන තියෙන ඉඩම් වල පුළුවන් පුළුවන් විදිහට ස්ථාපනය කිරීමේ ලොකු ව්‍යාප්තියක් මේකක් අපි දැක්කා.

ප්‍ර: ඒ කියන්නේ මුස්ලිම්වරු තනියම?

පි: මුස්ලිම්වරු තනියම.

ප්‍ර: දේශපාලඥයන්ගේ සහාය ඇතුවද?

පි: සහායත් ඇතුව වෙන්න ඕනි. නමුත් අපි ඒවා Prevent කරන්න ගොඩාක් දේවල් කරා. මට පුළුවන් වුණා. Disaster Management කියලා දැන් මොකද හමුදාවෙන් Camps ගැහුවාම මිනිස්සු කලබල වෙනවා. ඉතින් මම කරපු වැඩේ Disaster Management Center කියලා ඒ හරියේ ප්‍රශ්න තියනවා. ගං වතුර වලට මුහුණ දෙන හින්දා. ඒවගේ Center එකක් දාලා හට පිරිස් යෙදෙව්වා. ඒවායින් Control කරගෙන හිටියා. එහෙම තමයි අපි මැඩපැවැත්වුවේ.

FAIR COMMENT BY JEZEEM

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් ගරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥවරයාට ලබා දෙමි. ප්‍රශ්න නොමැති බව දන්වයි.

කොමිසන් සභාවට පැමිණ සාක්ෂි ලබා දීමෙන් කොමිෂන් සභාවේ කටයුතු සම්බන්ධයෙන් දැක්වූ දායකත්වය සම්බන්ධයෙන් සාක්ෂිකරුට කොමිසන් සභාවේ ස්තුතිය පල කරනවා.

සාක්ෂිකරු මුදා හරිමි.

දැන් වේලාව: 8.55
ගරු කොමිසන් සභාව නැවත ප.ව. 9.15ට රැස් වෙනවා.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය :- 2020.06.16 වේලාව :- ප.ව. 09.35

සටහන් කළේ :- කේ.එම්.චන්දිමා දිල්හානි

ගරු විනිසුරු මඩුල්ල :-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

පෙනී සිටීම:-

ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය,ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතීඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ නීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය, රජයේ අධි නීතීඥ චතුරංග බණ්ඩාර මහතා , රජයේ අධිනීතීඥ දිලන්ත එස්. කළුදුරුවගේ මහතා පෙනී සිටියි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අහරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ජනාධිපති නීතීඥ ෂමිල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සාක්ෂි අංකය	:-	767
සම්පූර්ණ නම	:-	ආරිය බන්දු වෙදගෙදර
වයස	:-	49 යි
ජාතිය	:-	සිංහල
ආගම	:-	බෞද්ධ
රැකියාව	:-	ප්‍රධාන පොලිස් පරීක්ෂක
දැනට සේවා ස්ථානය	:-	මීගොඩ ආර්ථික මධ්‍යස්ථාන පොලිස් මුරපොලේ

ප්‍රතිඥා පිට,

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර; වෙදගෙදර මහත්මයා ඔබ පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය සඳහා බැඳුණේ කවදාද?

පි; 1991 හතරවෙනි මාසයේ 01 වෙනිදා.

ප්‍ර: කුමන තනතුරකටද?

පි: උප සේවා උප පොලිස් පරීක්ෂක වරයෙක් හැටියට මං බැඳුණා ස්වාමිනි.

ප්‍ර: එවක පටන් ඔබ මෙම දෙපාර්තමේන්තුවේ ලබා තිබෙන උසස් වීම් මොනවාද?

පි: මම 2006 .06.01 පොලිස් පරීක්ෂක තනතුරටත්, 2014 .04.13 ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරටත් පත්වුනා ස්වාමිනි

ප්‍ර; 1991 සිට මේ දක්වා ඔබ පොලිස් දෙපාර්තමේන්තුවට බැඳුණාට පස්සේ ලබලා තියෙන පුහුණු වීම් මොනවාද?

පි: මම අපරාධ විද්‍යාව පාඨමාලාව හදාරා තියෙනවා.

ප්‍ර; කොහේදීද?

පි: කොළඹ ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඊට අමරතව 2006 වර්ෂයේ Explosive Incident counter Measure කියන පුහුණු පාඨමාලාවට මම ඇමරිකාවට මාස එක හාමරකට ගිහිල්ලා පුහුණුව ලැබුවා.

ප්‍ර; දැන් ඔබ එහෙනම් බොහෝම අත්දැකීම් තියෙනවා නේද ජීවිතයේ?

පි: අත්දැකිම් තියනෙවා.

ප්‍ර: ඔබේ සේවා කාලය තුලදී. එතකොට එහෙමනි ඔබට කියන්න පුළුවන්ද 1991 අප්‍රේල් මාසේ පළවෙනිදා අධුනික උපසේවා උප පොලිස් පරීක්ෂක වරයෙක් විදියට සේවයට වාර්තා කලාට පස්සේ අද වනතුරු මොන මොන පොලිස් ස්ථාන වල ඔබ සේවය කරලා තියෙනවාද කියලා?

පි: මම පළමුවෙන් 1991 පුහුණුව ලැබීමෙන් පසු අම්පාර පොලිස් කොට්ඨාශයට ගියා පොතුවිල් පොලිස් ස්ථානයට අනුයුක්තව පානම පොලිස් මුරපොළේ රාජකාරි කළා ඉන් අනතුරුව ඉගිනියාගල පොලිස් ස්ථානය ඉන්පසු මඩකලපුව කොට්ඨාශයේ 1992 වර්ෂයේ මඩකලපුව

President's Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

කොට්ඨාශයට අනුයුක්තව වෙල්ලාවලි පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරි කළා. ඉන් අනතුරුව මඩකලපුව පොලිස් ස්ථානයට අනුයුත්කව රාජකාරි කළා.

ප්‍ර: ඒ මඩකලපුව පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරි කලේ මොන අවුරුද්දේද?

පි: 1992 වර්ෂයේ ඉදලා 1995 වර්ෂය දක්වා මම රාජකාරි කළා.

ප්‍ර: ඔබේ ඔය සේවා කාලය තුලදී කාත්තන්කුඩිය පොලිසියට අනුයුක්තව ඔබ සේවය කරලා තියෙනවාද?

පි: එම කාලය තුල කාත්තන්කුඩි පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරි කරේ නැහැ ස්වාමිනි නමුත් මඩකලපුව කොට්ඨාශයේ රාජකාරි කරන කාලය අතුරතුර යම් යම් රාජකාරි සඳහා කාත්තන්කුඩි පොලිස් ස්ථානයත් එක්ක රාජකාරි කළා.

ප්‍ර; ඔබේ සේවා කාලය තුලදි යම් අවස්ථාවකදී කාත්තන්කුඩිය පොලිසියේ ස්ථානාධිපතිවරයා විදියට ඔබ සේවය කරලා තියෙනවාද?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර: ඒ මොන කාල වකවානුවකද?

පි: 2014.08 වෙනි මාසේ 01 වෙනිදා මම කාත්තන්කුඩි පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ලෙස රාජාකාරි භාර ගත්තා 2017.07.26 දක්වා එම පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වශයෙන් රාජකාරි කටයුතු කළා ස්වාමිනි.

ප්‍ර: හොදයි දැන් ඔබ 2014 අවුරුද්දේ අගෝස්තු මාසේ 01 වෙනිදා කාත්තන්කුඩිය පොලීසියේ ස්ථානාධිපතිවරයා විදියට සේවය භාරගන්න කොට නැගෙනහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා විදියට රාජකාරි කලේ කවුද කියලා මතකද?

පි: ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමා හැටියට මම රාජකාරි භාර ගන්න කාල සීමාව තුල ස්වාමිනි නන්දන මුණසිංහ මහතා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නන්දන මුණසිංහ මහතා රාජකාරි කලා ස්වාමිනි.

ප්‍ර; ඔබට මතක නියෝජ්‍ය පොලිස්පති වරයා විදියට කවුද හිටියේ කියලා?

පි: ඉන්දු කරුණාරත්න මහත්මයා කරා කියලා ස්වාමිනි.

ප්‍ර; කාත්තන්කුඩිය පොලීසිය මඩකලපුව කොට්ඨාශයට නේද එන්නේ සහකාර පොලිස් අධිකාරිවරයාගේ?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර; එතකොට ඒ වකවානුවේදී මඩකලපුව කොට්ඨාශය භාර සහකාර පොලිස් අධිකාරිවරයා විදියට කටයුතු කලේ කවුද කියලා මතකද?

පි: 2014 වර්ෂයේ මම රාජකාරි භාර ගන්නා අවස්ථාවේදී අනුරුද්ධ හක්මනගේ මහතා සහකාර පොලිස් අධිකාරි ලෙස රාජකාරි කලා.

ප්‍ර; දැන් ඔබ දන්නවා නේද පොලිස් ස්ථාන ගත්තාම පොලිස් ස්ථාන තියෙනවා A 1 ශ්‍රේණිය, A 2 ශ්‍රේණිය , A 3 ශ්‍රේණිය, B, ශ්‍රේණිය C, ශ්‍රේණිය කියලා ?

FAIR COMMENT BY JEZEEM

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර; ඔය ආකාරයට පොලිස් ස්ථාන ශ්‍රේණිගත කරන්නේ මොන කරුණු පදනම් කරගෙනද?

පි: වාර්තාවන පැමිණිලි අපරාධ ජනගහනය වැනි කරුණු පදනම් කරගෙන ස්වාමිනි ශ්‍රේණි ගත කිරීම් සිදුකරනවා.

ප්‍ර; එතකොට A1 ශ්‍රේණියට ශ්‍රේණිගත කරන එකයි, C ශ්‍රේණියට ශ්‍රේණිගත කරන එකයි ගත අතර තියෙන වෙනස මොකද්ද?

පි; A1 ශ්‍රේණියට ශ්‍රේණිගත කරන පොලිස්ථාන වල වැඩ රාජකාරි අධිකයි ඒත් එක්කම වාර්තා වන අපරාධ විවිධ පැමිණිලි රථවාහන වැරදි සම්බන්ධව ගත්තාම ඒ ප්‍රදේශයේ තියෙන ඒ රථවාහන ජනගහනයත් එක්ක සාපේක්ෂව ගත්තාම ඒ රථවාහන වැරදි සම්බන්ධව ඒ ගත්තාම A 1 ශ්‍රේණියේ පොලිස් ස්ථානයක ඒ සම්බන්ධව ගොඩාක් මේ සංඛ්‍යාත්මක වශයෙන් වැඩිය තියෙනවා. C ශ්‍රේණියේ පොලිස් ස්ථානයක ඊට වඩා අඩු සංඛ්‍යාවක් තමයි ස්වාමිනි තියෙන්නේ .

ප්‍ර; ඔය සියළුම කටයුතු ගත්තාම ඒ දත්තයන් A 1 ශ්‍රේණියේ තියෙන දත්තයන්ට වඩා අඩු මට්ටමකින් තමයි තියෙන්නේ ඔබ කියන්නේ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර; ප්‍රධාන පොලිස් පරීක්ෂක වෙදගෙදර මහත්මයා ඔබට කියන්නට පුළුවන්ද 2014 අගෝස්තු මාසේ පළවෙනිදා ඔබ කාත්තන්කුඩිය පොලිසිය ඒ ස්ථානාධිපති ධුරය භාර ගන්නා අවස්ථාවේදී කාත්තන්කුඩිය පොලිසීය ඔය මා කලින් සඳහන් කරන ලද පොලිස් සේවයේ ශ්‍රේණිගත කිරීම් වලින් කුමන ශ්‍රේණියකට ද අයත් වුනේ කියලා ?

පි: A 2 ශ්‍රේණි ගත කරන ලද පොලිස් ස්ථානයක් ස්වාමිනි.

ප්‍ර; එතකොට ඒ A 2 කියන ශ්‍රේණිට ශ්‍රේණියේ ශ්‍රේණිගත වන්නට මොනවාද කාත්තන්කුඩිය පොලිසියට තිබුණු සුදුසුකම්?

පි; මා කලින් පැවසු කරුණුමයි ස්වාමිනි. ඒ ශ්‍රේණිගත කරන අවස්ථාවලදී ඒ ඔය මම කිව්ව කරුණු පාදක කරගෙන තමයි ශ්‍රේණිගත කිරීම් සිදු කරන්නේ ඒ කාත්තන්කුඩියත් එවැනි පැමිණිලි වැඩි ජනගහනය වැඩි පොලිසියක් ස්වාමිනි.

ප්‍ර; හොඳයි දැන් එහෙම නම් කියන්න පුළුවන්ද ඔබට ඔබ ස්ථානාධිපතිවරයා විදියට පත්වෙලා එනකොට කාත්තන්කුඩිය පොලිසියේ කොපමණ නිලධාරීන් සංඛ්‍යාවක් ඊට අනුයුක්තව කටයුතු කරාද කියලා ?

පි: 170 කට ආසන්න නිලධාරීන් සංඛ්‍යාවක් හිටියා ස්වාමිනි.

ප්‍ර; ඔය කාත්තන්කුඩිය පොලිසියේ ජනගහනය ගැන ඔබට මේ ගරු කොමිෂන් සභාවට යමක් කියන්න පුළුවන්ද සමාවෙන්න පොලිස් වසමේ?

පි: කත්තන්කුඩි පොලිස් වසමේ ස්වාමිනි ඒ කාලය තුල කාත්තන්කුඩි පොලිස් වසම වර්ග කිලෝමීටර් ආසන්න වශයෙන් 48 ක පමණ

FAIR COMMENT
BY JEZEEM

ප්‍රමාණයක පොලිස් Area එකක් එක් ලක්ෂ පන්දාහක්, පන්දහස් පන්සියක් පමණ ජනගහනයක් ඉන්නවා ඒ ජනගහනයෙන් වටේට ඉන්නේ ද්‍රවිඩ ජනතාව.

ප්‍ර: මොකේ වටේද ඉන්නේ?

පි: කාත්තන්කුඩි පොලිස් බල ප්‍රදේශයේ සීමා මායිම් ගත්තාම වටේට ඉන්නේ ද්‍රවිඩ ජනතාව.

ප්‍ර; දැන් ඔබ සීමා මායිම් කියන කොට එහෙම නම් කරුණා කරලා කියන්න පුළුවන්ද ප්‍රාදේශි ලේකම් කොට්ඨාශ මොනවාද අයත් වන්නේ ඔබේ පොලිස් වසමට කියලා?

පි: ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ තුනකට අයත් වෙනවා කාත්තන්කුඩි පොලිස් වසම

ප්‍ර; මොනවාද ඒ?

පි: ආරියම්පති ප්‍රාදේශිය ලේකම් කෝට්ඨාශය ඊට පස්සේ කාත්තන්කුඩි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය ඊට පස්සේ මඩකලපුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය.

ප්‍ර; එතකොට අර ආරියම්පති ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ සාමාන්‍යයෙන් ජීවත්වන ජනගහනය සිංහල, ද්‍රවිඩ, මුස්ලිම්,බර්ගර් කියන ජන කොට්ඨාශ ගත්තාම කුමන ජන කොට්ඨාශයෙන්ද සමන්විත වන්නේ?

පි; ආර්යම් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය ගත්තාම ද්‍රවිඩ ජනගහනය වැඩියි.

ප්‍ර; ඔව් ඔබ දැන් මගේ කලින් ප්‍රශ්නයකට පිළිතුරු දෙන ගමන් සඳහන් කරා කාත්තන්කුඩි පොලිස් වසම ගත්තාම ඔබේ වසම ගත්තාම ඒක වටේටම ඉන්නේ ද්‍රවිඩ ජනතාව කියලා ?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔය අරියම්පති එක එහෙම නම් ඔබේ වසමටනේ අයත් වෙන්නේ නේද?

පි: ඔව්.

ප්‍ර; දැන් මුස්ලිම් ජනගහනයක් වැඩියෙන් ජීවත් වෙන්නේ මොන ප්‍රදේශයේ ද ?

පි: කාත්තන්කුඩි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ වැඩි ජනගහනයක් ඉන්නවා ස්වාමිනි.

ප්‍ර; දැන් සාමාන්‍යයෙන් ග්‍රාම නිලධාරි වසම් කීයක්?

පි: වසම් 58 ක් තියෙනවා ස්වාමිනි

ප්‍ර; කාත්තන්කුඩිය ඔබ කිව්වා ඉන්නේ මුස්ලිම් ජන කොට්ඨාශයක් කියලා එතකොට එහෙනම් ඔවුන් ඉස්ලාම් ආගම අදහන අයනේ?

පි; ඔව් ස්වාමිනි.

ප්‍ර; ඔබේ අත්දැකීම අනුව ඔය කාත්තන්කුඩියේ ඉස්ලාම් ධර්මය ඒ ආගම අදහන අය එකම නිකායකට අයත් අය ද එහෙම නැත්නම් ඒ ආගම යටතේ යම් යම් නිකායන්ට ඔවුන්ගේ බෙදීමක් තිබුණාද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඒ යම් යම් නිකායන්ට අනුව ඒ ජීවත්වනු මුස්ලිම් ජනතාවගේ බෙදීමක් තිබුණා ස්වාමිනි.

ප්‍ර; ඇයි ඔබ එහෙම කියන්නේ?

පි: එක එක නිකායන් තිබුණා ඒ කාත්තන්කුඩි ඒ කොට්ඨාශය තුල.

ප්‍ර: මොනවා ද ඒ නිකායක් ඔබට දන්නව ද?

පි: සියල්ලම මතක නැහැ.

ප්‍ර: මතක විදියට කියන්නකෝ?

පි: මගේ මතකය නිවැරදි නම් නිකායන් 14 ක් විතර තිබුණා ස්වාමිනි.ඒ කාලය වෙනකොට දාරුලදර්, සුන්නත්වාර් ජමාත්,තවුහිද් ජමාත්,නැෂනල් තවුහිද් ජමාත්,තබ්ලික් ජමාත්,එවැනි නිකායන් තිබුණා ස්වාමිනි.

ප්‍ර: එතකොට දැන් ඔය නිකායන් අනුව ඔවුන් යන පල්ලි මුස්ලිම් පල්ලි වෙනස් වෙනවාද?

පි: නිකායන් අනුව යන පල්ලි වෙනස් වෙනවා ස්වාමිනි.

ප්‍ර; එහෙම නම් ඔබට කියන්න පුළුවන්ද ඔබේ පොලිස් වසම තුල 2014 සහ 2017 කියන කාලපරිච්ඡේදය තුලදී කොපමණ පමණ මුස්ලිම් පල්ලි තිබුණාද කියලා?

පි; මුස්ලිම් පල්ලි 72 ක් තිබුණා ස්වාමිනි.

ප්‍ර; 72 ක් තිබුණා?

පි: ඔව්.

ප්‍ර: ඔබගේ පෞද්ගලික තොරතුරු මම ඇහුවොතින් මා කිව්වොත් නිවැරදීද ඔබ විවාහ වෙලා?

පි: සමාවෙන්න මුස්ලිම් පල්ලි 78 ක් තිබුණා ස්වාමිනි.

ප්‍ර: වෙදගෙදර මහත්මයා දැන් මං ඔබේ පෞද්ගලික ජීවිතය ගැන පොඩ්ඩක් විමසන්නේ මා කිව්වොතින් නිවැරදිද ඔබ අර්සි මුරුගේසු කියන මහත්මිය සමඟ විවාහ වෙලා ඉන්නවා කියලා?

පි: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර; ඔබ විවාහ වුනේ කවදාද?

පි: 1996 ඔක්තෝම්බර් 18.

ප්‍ර; එතකොට ඒ විවාහයෙන් පස්සේ ඔබේ පදිංචිය වෙනස් වුනාද?

පි; ඔව් මං ඒවෙන කොට හිටියේ බණ්ඩාරවෙල.

ප්‍ර: බණ්ඩාරවෙල?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර: ඒ විවාහයෙන් පස්සේ ඔබේ පදිංචිය කොහේද ඔබ පදිංචියට තෝර ගත්තේ?

පි: මේ වෙනකොට මං පදිංචි වෙලා ඉන්නේ මඩකලපුවේ නමුත් ඒ කාලසීමාව තුල මම හිටියේ බණ්ඩාරවෙල.

ප්‍ර; ඔබ මඩකලපුවේ ජීවත් වෙන්න පටන් ගත්තේ කොයි කාලේ ඉදලාද?

President Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

පි: 2010 පස්සේ තමයි මම එහේ පදිංචි වුනේ.නමුත් ඊට ඉස්සෙල්ලා මගේ බිරිඳ එහෙම එහාට ගියා ස්වාමිනි.

ප්ර; ඒ කියන්නේ ඔබ 2014 ඔය කාත්තන්කුඩිය පොලීසියේ ස්ථානාධිපති වෙන්නට පෙර තමයි ඔබ මඩකලපුව ඔබේ පදිංචි ස්ථානය විදියට තෝරා ගත්තේ?

පි එහෙමයි ස්වාමිනි.

ප්‍ර; ඔබට ද්‍රවිඩ භාෂාව කථා කරන්න පුළුවන්ද?

පි: මම සාමාන්‍යයෙන් හැකියාවක් තියෙනවා ස්වාමිනි.

ප්‍ර; එතකොට එහෙම නම් ද්‍රවිඩ භාෂාවෙන් කතා කරන දේවල් ඔබට මැනවින් වැටහෙනවා ඇති.?

පි: බොහෝ දුරට වැටහෙනවා ස්වාමිනි.

ප්‍ර; ඔබට කියන්නට පුළුවන්ද ඔබ මඩකලපුව ප්‍රදේශයේ ජීවත් වෙන්නට පටන් ගත්තාට පස්සේ 2010 නේද කිව්වේ?

පි: 2010.

ප්‍ර; ඒ කාලයේදී ඔබ දැක්ක මඩකලපුවත් ඊට පස්සේ ඔබ කාත්තන්කුඩිය පොලිසියට ස්ථානාධිපතිවරයා වෙලා ගියාට පස්සේ ඔබ දැක්ක මඩකලපුවයි අතරේ යම් වෙනසක් තියනෙවාද?

පි: ඉදිකිරිම් අතින් ගත්තාම.

ප්‍ර: ඒ හැරෙන්නට තව මං ඔබේ අවධානයට යොමු කරනවා ඔබ කිව්වා ඔබ 1992 වසරේ දී වැල්ලවිටිද?

පි: වෙල්ලාවලි.

ප්‍ර: වෙල්ලාවලි සහ මඩකලපුවේ සේවය කෙරුවායි කියලා කිව්වානේ?

පි: ඔව්.

ප්‍ර; එහෙම නම් මගේ ප්‍රශ්නය මෙහෙම අහන්න නම් ඔබෙන් 1992 දී ඔබ මඩකලපුවේ සේවය කරන කොට දැක්ක මඩකලපුවයි ඒ වගේම 2014 දී ඔබ කාත්තන්කුඩියේ ස්ථානාධිපතිවරයා විදියට ගිහිල්ලා දැක්ක මඩකලපුවයි අතර සංසන්දනයක් කරොත් අපි ඒ එකම පසුබිමද එකම මනිමතාන්තරද එකම පාරිසරික තත්ත්වයක්ද තිබුණේ?

පි; නැහැ ස්වාමිනි විශාල වශයෙන් වෙනසක් තියෙනවා .

ප්‍ර; මොනවාද ඒ තිබ්බ වෙනස් කම්?

පි: ඉදිකිරිම් අතිනුත් වෙනස්කම් තියෙනවා,

ප්‍ර: මොන වගේද වෙනස්කම් ඉදිකිරිම් වලින් තිබ්බේ?

පි: එම කාලසීමාව තුල මිනිසුන් වැඩිපුර පදිංචිවෙලා හිටියේ නැහැ ස්වාමිනි.

ප්‍ර: එම කාල සීමාව කියන්නේ?

පි; යුධකාල සීමාව තුල 1992 දී ඒ කාල සීමාව තුලදි මිනිසුන් මේ පදිංචි වෙලා හිටියාට ඒවයේ ඉදිකිරිම් වෙලා තිබ්බේ නැහැ. නමුත් යුද්ධ කාලයෙන් පස්සේ මිනිස්සු ඇවිල්ලා තම තමන්ගේ ඉඩකඩම් වල ඒ ඉදිකිරිම් කටයුතු විශාල වශයෙන් කරලා මේ දැන් ලොකු වෙනසක් තියෙනවා ස්වාමිනි.

Counsel's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර; දැන් ටිකක් පැහැදිලි මදි මං හිතන්නේ ඔබ දුන්නු උත්තය තව ටිකක් විස්තර කරන්න ඕනේ?ඔබේ ඔලුවේ ඒක තිබුණාට තාම ගරු කොමසාරිස්වරුන්ට ඒ ගැන පැහැදිලි අවබෝධයක් නැහැ.

පි: 92 වර්ෂය වනවිට ඒ යුද්ධ තිබුණු කාල සීමාවලදී එම කාලය තුල ස්වාමිනි මිනිසුන්ගේ පදිංචි එම ප්‍රදේශවල තිබුණට ඉදිකිරිම් කටයුතු හෝ නිවාස ඉදිකිරිම් කටයුතු හෝ වෙළඳ කටයුතු හෝ කිසිදෙයක් ඒ කාලේ වෙනකොට සිද්ධ වුනේ නැහැ. මිනිසුස් බයට හිටියා. නමුත් මේ යුද කාල සීමාවෙන් පස්සේ මිනිස්සු ඒ කාල සීමාව තුල රට ගිහිල්ලාත් හිටියා ඒ මිනිස්සු සේරම එන්න පටන් ගත්තා. මේ යුධ කාල සීමාවෙන් පස්සේ ඇවිල්ලා තම තමන්ගේ ඉඩකඩන් ඒවා අරගෙන ඒ මිනිස්සු ව්‍යාපාරික ස්ථාන එතකොට තම තමන්ගේ නිවාස ඒවා ඉදිකරන්න පටන් ගත්තා මේ අලුත් ඉදිකිරිම් කටයුතුවෙලා ලොකු වෙනසක් පේන්න තියෙනවා ස්වාමිනි මේ කාල සීමාවේ.

ප්‍ර: ඔය අලුත් ඉදිකිරිම් කටයුතු කියලා ඔබ අදහස් කරේ මොනවාද?

පි: බිල්ඩින්.

ප්‍ර; ඒගොඩනැගිලිවල මොනවාද ඔබ කලින් නොදුටු දේවල් දැන් දකින්න තියෙන ලකුණු?

පි; ගොඩනැගිල්ලක්වත් තිබ්බේ නැති මුඩු ඉඩම්වල මේ වෙනකොට ස්වාමිනි ඉඩම් ඉදිවෙලා තියෙනවා.

ප්‍ර; දැන් ඔබ බණ්ඩාරවෙල නේ. කලින් පදිංචි වෙලා හිටියා කිව්වේ?

පි: ඔව්.

ප්‍ර; ඒ වගේම ඔබ කිව්වා පොලිස් සේවයට බැඳුනට පස්සේ ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වල සේවය කළා කියලා එහෙම නම් අපි අනිත් පළාත් එක්ක ගත්තාම උතුර, දකුණ, බස්නාහිර වගේ පළාත් ගත්තාම ඒ පළාතුයි නැගෙනහිර පළාතයි අතර සංසන්දනයක් කරෝත් ඔබට යම් වෙනස්කම් පැහැදිලි වෙනස්කම් දකින්නට තියෙනවාද?ගොඩනැගිලි වල ස්වභාවික ඔය ඔබ කිව්වා කාත්තන්කුඩියට ඔබ සේවයට වාර්තා කළා කියලා 2014 අගෝස්තු මාසේ 01 වෙනිදා?

පි; ඔව් ස්වාමිනි.

ප්‍ර: ඒ කාත්තන්කුඩිය නගරයට ප්‍රවිශ්ඨ වන ස්ථානයේදී එතන ආරුක්කුවක් ගොඩනගලා තියෙනවාද?

පි: ගොඩනගලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර; ඒක විශාල ආරුක්කුවක් නේද?

පි: විශාල ආරුක්කුවක් .

ප්‍ර; ඒ ආරක්කුව උඩින් යම් තහඩුවක් තියෙනවද? පිළිගනිමු නැත්නම් welcome කියලා?

පි: තියෙනවා ස්වාමිනි.

ප්‍ර; ඒ ඒ මොන මොන භාෂාවලින්ද තියෙන්නේ?

FAIR COMMENT BY JEZEEM

පි; අරබික් භාෂාවෙන් තියෙන වගේ මගේ මතකයේ. English වලින් තියෙනවා.

ප්‍ර: ඔව් එතකොට 1992 දී ඔබ මඩකලපුවේ ඉන්න කොට එවැනි පුවරු දකින්නට ලැබුණාද?

පි: එවැනි ඉදිකිරීම් දකින්නට තිබුණේ නැහැ ස්වාමිනි.

ප්‍ර; එතකොට අපි බලමුකෝ සාමාන්‍ය ගස් කොලන් ගස්කොලන් ගත්තාම ලංකාවේ දකුණේ බස්නාහිර ඒ වගේම උතුරේ වැඩිපුර දකින්නට නැති නමුත් සුලභ ගස් වර්ග ඔය නැගෙනහිර පලාතේ තියෙනවාද?

පි: තියෙනවා ස්වාමිනි.

ප්‍ර; ඒවා ස්වභාවික ඇවිල්ලා ද එහෙම නැත්නම් ඉන්දපු ඒවාද ?

පි නෑ ඒවා ඉන්දපු ඒවා.

ප්‍ර: මොනවාද ඒ ?

පි: රටඉඳි ගස්

මා ඔබේ අවධානයට ඡායාරූප වගයක් යොමු කරනවා .ස්වාමිනි C 592 ඡායාරූපය සාක්ෂිකරුගේ අවධානයට යොමු කරනවා.

ප්‍ර: ඔබ ඔය ස්ථානය දැකලා තියෙනවාද?

පි: දැකලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර: මොකක්ද ඔය ස්ථානය කියලා මේ ගරු කොමිෂන් සභාවට කියන්න? ඔය **C 592** දක්වන ස්ථානය මොන ස්ථානයද?

පි; කාත්තන්කුඩිය නගරයට ඇතුල්වෙන ස්ථානයක් ස්වාමිනි.

ප්‍ර; එතකොට එහි විශාල ආරුක්කුවක් තියෙනවා ඒ වගේම අර ඔබ කලින් සඳහන් කරපු ආකාරයට ඒ නගරයට ඇතුල්වන ස්ථානයේ ඉංග්‍රිසි අකුරුවලින් Warm welcome කියලා සඳහන් කරලා තියෙනවා?

පි: සඳහන් වෙලා තියෙනවා.

ප්‍ර; එතකොට අර අරාබි අකුරුවලිනුත් තිබෙනවාද?

පි: තිබෙනවා ස්වාමිනි.

ප්‍ර; තියෙනවා ?

පි; ඔව්.

ප්‍ර; ඊළඟට මම ඔබේ අවධානය යොමු කරනවා **C 593** වශයෙන් ලකුණු කරලා ඉදිරිපත් කරලා තියෙන ඡායාරූපය කෙරෙහි?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර; ඔය ඡායාරූපයේ රට ඉදි ගස් වගයක් දක්නට තියෙනවා නේද?

පි: තිබෙනවා ස්වාමිනි.

ප්‍ර: ඔබට මේ ප්‍රදේශයේ තියෙන අත්දැකීම් අනුව ගරු කොමිෂන් සභාවට කියන්නට පුළුවන්ද නැගෙනහිර පළාතේ කොයි හරියද කියලා ඔය?

පි; මේ කාත්තන්කුඩි නගරයේ කාත්තන්කුඩි නගරයේ මැදපාර බෙදන අයිලන්ඩ් එකේ මැද හදලා තියෙනවා රට ඉදි ගස් ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

වෙද ගෙදර මහත්මයා මීළඟට මා ඔබේ අවධානය C 594 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරලා තියෙන ඡායාරූපය කෙරෙහි යොමුකරනවා

ප්‍ර ඒ දැක්වෙන ඡායාරූපයෙන් දැක්වෙන ස්ථානය කුමක් ද කියලා මේ ගරු කොමිෂන් සභාවට කියන්න පුළුවන්ද?

පි: මේ දැක්වෙන ස්ථානය මඩකලපුවේ සිට අම්පාර දෙසට යනකොට කාත්තන්කුඩිය නගරය පටන් අරගෙන අවසන් වෙලා එලියට යන ආරියම්පති ප්‍රදේශයට යන ස්ථානය.

ප්‍ර; ඒ කියන්නේ අර ද්‍රවිඩ ජනතාව ජීවත් වන කොටසට යන ප්‍රදේශය යන ස්ථානය දැන් එතනත් එහෙම නම් භාෂා 4 කින් තියෙනවා සඳහන් කරලා යමක්?

පි; ඔව් ස්තුතියි නැවත එන්න කියලා.

ප්‍ර; නැවත එන්න කාත්තන්කුඩි කියන එක ද්‍රවිඩ භාෂාවෙන්, සිංහල භාෂාවෙන්,ඉංග්‍රිසි භාෂාවෙන් වගේම ?

පි: අරබික් භාෂාවෙන්.

ප්‍ර; අරාබි භාෂාවෙනුත් තියෙනවා කියලා ඔබ කියන්නේ? හොඳයි ඔබ දැන් ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයෙක්නේ ඔබට කියන්නට පුළුවන්ද ඔය මාර්ගවල කොළපාටින් සවිකරලා තියෙන පුවරු මාර්ග පුවරු කවුරු විසින් නඩත්තු කරන ඒවාද?

පි: මට පැහැදිලි වුන් නැහැ ස්වාමිනි.

ප්‍ර; මහාමාර්ග අධිකාරිය විසින් යම් පුවරු නඩත්තු කිරීමක් කරනවාද?

පි: කරනවා.

ප්‍ර; එතකොට ඔය නගරවලට ඇතුල්වන ස්ථානයේ ගහන කොළපාට පුවරු ඒ වගේම නගරවලින් පිටවන කොට දාන කොළපාට පුවරු ඒවා නඩත්තු කරන්නේත් මහා මාර්ග අධිකාරිය කියලා මා කිව්වොතින් නිවැරදීද?

පි: ඔව්.

ප්‍ර; එහෙම නම් දැන් මේ මා ඔබේ අවධානයට යොමු කරපු **C 592** තිබෙන පුවරුවත් ඒකත් කොළපාට ඒවගේම C 594 කියන ඡායාරූපයේ දැක්වෙන් කොළපාට පුවරුත් නඩත්තු කරන්නේ මහා මාර්ග අධිකාරියෙන්ද? sorry මාර්ග සංවර්ධන අධිකාරියෙන්ද?

පි: ඔව් මේ පුවරු නඩත්තු වන්නේ මගේ මතකයේ හැටියට ප්‍රාදේශිය සභාවෙන් වගේ මගේ මතකය හැටියට .

ප්‍ර; ප්‍රාදේශිය සභාවෙන්?

පි; ඔව්.

ප්‍ර; දැන් මං හැබැයි ඒ දෙකේම අර අරාබි අකුරු වලින් තියෙන සටහන් තියෙනවා දැන් ලංකාවේ වෙන ස්ථානවල ඔබ දැකලා තියෙනවාද ඒ වගේ අරාබි අකුරුවලින් තියෙනවා?

පි; නැහැ ස්වාමිනි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර; එහෙනම් කොයි ප්‍රදේශවලද ඔබ දැකලා තියෙන්නේ අරාබි අකුරෙන් ලියන ලද වැකි තියෙන ස්ථාන?

පි: කාත්තන්කුඩි වල තමයි.

ප්‍ර: කාත්තන්කුඩිවල තමයි ඔබ දැකලා තියෙන්නේ?

පි: ඔව් ස්වාමිනි

ඊළඟට මා ඔබේ අවධානය C 595 වශයෙන් ලකුණු කරලා ඉදිරිපත් කරලා තියෙන ඡායාරූප කෙරෙහි යොමු කරනවා.

ප්‍ර: ඒකෙත් විශාල ආරක්කු දෙකක් තියෙනවා නේ පාර දෙපැත්තේ පාරේ තීරු දෙකක් තියෙනවා ඒ එක තීරුවට එක ගානේ විශාල ආරක්කු දෙකක් තියෙනවා ඒ උඩිනුත් අර වගේ කොළ පාටට ලියපු බෝඩ් එකක් තියෙනවා තියෙනවාද?

පි: තියෙනවා ස්වාමීනි.

ප්‍ර; ඔබට කියන්නට පුළුවන්ද මේ C 595 ලෙස ලකුණු කරලා ඇති ඡායාරූපයෙන් දැක්වෙන්නේ මොකක්ද කියලා කුමන ස්ථානයක් ද?

පි: මට එය පැහැදිලිව එන්නේ නැහැ ස්වාමිනි කොහේද කියලා මතකයට එන්නේ නැහැ.

ප්‍ර: මතක නැහැ හැබැයි ඔය වගේ මා ඔය දැන් ඔබට පෙන්වන **C 595** අරාබි අකුරුවලින් ලියපු යම් වැකි තියෙනවාද?දකුණු හරියට වෙන්න බලන්න?

පි: තියෙනවා ස්වාමිනි.

ප්‍ර: ඔව් දැන් ඔබ මගේ ප්‍රශ්නයකට පිළිතුරු දෙන ගමන් සඳහන් කරා ඔබ මේ වගේ අරාබි වැකි දැකලා තියෙන්නේ කාත්තන්කුඩිය ප්‍රදේශයේ කියලා එහෙම නේද?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර: ඔය කාත්තන්කුඩිය ප්‍රදේශයේ ඔබ පොලිස් ප්‍රධාන පොලිස් පරීක්ෂක තුමනි ඔබ ස්ථානාධිපතිවරයා විදියට මේ A2 ශ්‍රේණියේ පොලිස් ස්ථානයේ සේවය කරන කොට ඔබේ වසමේ ඔබ යටතේ පාලනය වුන එහි පදිංචි කරුවන් මහාමාර්ග නීතිවලට අවනතව කටයුතු කරනවාද හැම තිස්සේ ඒ ගැන ඔබට අත්දැකීම් තිබෙනවාද?

පි: අවනතව කටයුතු කරනවා ස්වාමිනි.

ප්‍ර: අවනතව කටයුතු කරනවා?

පි: ඔව්.

ප්‍ර: දැන් හෙල්මටයන් පැළඳීම මේ යතුරු පැදිවල යනකොට ඒක මහාමාර්ග නීතිය යටතේ අවශ්‍යත කරුණක් නේද?

පි: අත්‍යවශය කරුණක් .

ප්‍ර; එතකොට කාත්තන්කුඩිය ප්‍රදේශයේ යතුරු පැදිවල යන ජනතාව යම් අවස්ථාවල්වලදී ඔය හෙල්මටයන් පළඳින් නැතුව යන අවස්ථාවල් තියෙනවාද?

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: එහෙම අවස්ථාවල්වලට ඉඩ තියලා නැහැ ස්වාමිනි. පොලිස් නිලධාරී හැටියට අපි රාජකාරි යෙදි සිටින අවස්ථාවක් ඕනෑම වෙලාවක හිස් වැසුම් නැතිව ඉදිරියට පැමිණියොත් ඒ සම්බන්ධව අවශ්‍ය නීතිමය කටයුතු කරනවා.

ප්‍ර ඒ නීතිමය කටයුතු කරන්න ඒ වැරැද්ද සිදුවෙන්න ඕනනේ නේද?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර: මං අහන්නේ ඒ වැරැද්ද සිද්ධ වෙනවාද කියලා?

පි: සිද්ධ වෙලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර; ඒ වගේ වැරදි හුගාක් දෙනාගෙන් සිද්ධවෙනවාද? එහෙම වෙනවා නම් ඒ සතියේ යම් දිනයක ද?

පි: එහෙම විශේෂිත වූ දිනයක් නැහැ ස්වාමිනි.

ප්‍ර; සිකුරාදා වල්වලට මොකද වෙන්නේ?

පි: සිකුරාදා දවසත් ඔය වෙන දවස් වගේ තමයි එදාට ඔය පල්ලි යන එන එක එම ජනතාවගේ වැඩියි .

ප්‍ර; ඒ දවස් වලට ඒ ගොල්ලෝ හෙල්මට් අඳිනවාද?

පි: හෙල්මට් අඳිනවා ස්වාමිනි එහෙම නැති පැතිත් තියෙනවා.අපිට රාජකාරි යෙදවිමට නොහැකි පැති තියෙනවා ගම් ඇතුලේ ප්‍රධාන මාර්ගයේ අනිවාර්යෙන් එදාට අපි රාජකාරි යොදවනවා ඊට අමතරව අතුරු මාර්ග තියෙනවා ප්‍රධාන අතුරු මාර්ග ඒවාගේ රාජකාරි යොදවනවා ඒ රාජකාරි යොදවන ස්ථානවලට අමතරව ගං ඇතුලේ තියෙන තැන් වල ස්වාමිනි හෙල්මට් නැතිව යනවා.

ප්‍ර; ඒ කියන්නේ ඔබ ඔය පිළිතුරෙන් පැහැදිලි කරන්න අදහස් කරන්නේ පොලිස් නිලධාරීන් රාජකාරියේ නියුක්ත වෙලා ඉන්නවා නම් ඒ පුද්ගලයින් හෙල්මට් ඇඳන් යනවා. එහෙම නැතිනම් ඒ ගොල්ලෝ හෙල්මට් නැතුව යනවා කියලානේ.

පි: සෑම අවස්ථාවකම නෙවෙයි ස්වාමිනි බොහෝ දුරට රාජකාරි යොදවලා ඉන්නවා ස්ථානවල යන්නේ නැහැ.

ප්‍ර: ඔව් ඒක තමයි දැන් මං කිව්වෙත් ඒකනේ ඒ වගේ ස්ථානවල ඔවුන් ඒ වැරැද්ද කරන්නේ නැහැ මොකද පොලීසිය රාජකාරි කරන නිසා ?

පි: ඔව්.

ප්‍ර; නමුත් ඉඩ ප්‍රස්තාව තියෙනවා නම් නිලධාරීන් සේවයේ නැත්නම් හෙල්මට් අඳින් නැතිව යන අවස්ථා තියෙනවා.

ප්‍ර; අඳින් නැතිව යන අවස්ථා තියෙනවා.

ප්‍ර; හොදයි ඔබ කිව්වානේ ඔය කාත්තන්කුඩිය ප්‍රදේශයේ ඉස්ලාම් ධර්මය අනුගමනය කරන මුස්ලිම් ජන කොට්ඨාශයේ යම් යම් නිකායන්ගේ බෙදීම් ගැන ඔබ දන්නවාය කියලා?

පි; ඔව් ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර; එකෙන් ඔබ කිව්වා 14 ක් විතර තියෙනවා කියලා ඔබට කියන්නට මතක නැති වුනාට. එතකොට ඔය පාර්ශවයන් අතර යම් යම් අවස්ථාවල් වලදි ගැටීම් එහෙම ඇති වුනාද?

පි: ගැටීම් ඇති වුනා ස්වාමිනි.

ප්‍ර: ගැටීම් ඇති වුනා ?

පි: ඔව්.

ප්‍ර: ඒ පිළිබඳව ඔබ දැනගෙන හිටියාද ස්ථානාධිපතිවරයා විදියට?

පි: දැනගෙන හිටියා ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබට එහෙනම් පැහැදිලි කරලා කියන්නට පුළුවන්ද අර 1992 අවුරුද්දෙ දී ඔබ සේවය කරානේ ඔය මඩකලපුවේ?

පි: ඔව්.

ප්‍ර: ඒ වකවානුවේ දී ඔබ දැන් පැහැදිලි කරපු ගෘහ නිර්මාණවල දකින්න තිබුණු වෙනස්කම් ඒ වගේම වෘක්ෂලතා වල දකින්න තිබුණු වෙනස්කම් සහ එකම ආගම අනුගමනය කරන පිලිපදින එකම ජන කොට්ඨාශයේ තියෙන නිකායන් අතර තියෙන ගැටුම් යන මේවා ඔය ආකාරයෙන්ම දකින්නට ලැබුණාද LTTE යුධ සමයේ දී?

පි: ස්වාමිනි ඒ යුධ සමයයි මම ස්ථානාධිපති වෙලා හිටපු කාල සීමාවයි ගත්තාම ගොඩනැගිලි ඉදිකිරීම් සහ ඔය අලංකරණය සඳහා යොදා ගෙන ඇති ක්‍රමවේද ගස් ඉදිකිරීම් ඒ සම්බන්ධව මට කීමේ හැකියාවක් දැනුමක් තියෙනවා නමුත් 1992 කාලයේ ඔය නිකාය සම්බන්ධව තිබුණු ඒ පරිසරය සම්බන්ධව ස්වාමිනි මට අත්දැකීමක් නැහැ එම කාල සීමාව තුල .

ප්‍ර: හොඳයි කමක් නැහැ දැන් එහෙනම් මම තව ටිකක් පස්සට යන්නම් කෝ ඒ 1992 නේ 2010 අවුරුද්දනේ ඔබ ඔබේ විවාහයෙන් පස්සේ මඩකලපුවේ පදිංචි 2010 අවුරුද්දනේ ඔය විවාහයෙන් පස්සේ මඩකලපුවේ පදිංචියට ආවේ එතකොට ඒ අවුරුද්ද වෙනකොට මං ඔය කිව්ව කරුණු තුන ගෘහ නිර්මාණ කරණය , වෘක්ෂලතාවල තිබෙන වෙනස්කම් සහ මුස්ලිම් ජන කොට්ඨාශයේ ඉස්ලාම් ආගමේ ඔවුන් විසින් ඇති කරගෙන තියෙන නිකායන් අතර වූ සටිටනය 2010 අවුරුද්දෙදී දකින්නට තිබුණාද?

පි: නැහැ ස්වාමිනි. 2010 වර්ෂයේත් මට ඒ සම්බන්ධව අත්දැකිමක් නැහැ. මම ස්ථානාධිපති හැටියට රාජකාරි භාර ගත්තාට පස්සේ තමයි මම ඒ සම්බන්ධව අධ්‍යයන කරේ.

ප්‍ර; ඒ කියන්නේ 2014 ට පස්සේ ඔබ කියන්නේ ?

පි: 2014

ප්‍ර: 2014 අගෝස්තු මාසේ පළවෙනිදානේ ඔබ ආවේ එතකොට ද ඔබ ඒ අධ්‍යයනය කරේ?

පි: ඔව්.

ප්‍ර; එතෙක් ඔබේ අවධානය යොමුවෙලා තිබුණ් නෑ ?

FAIR COMMENT BY JEZEEM

පි: නැහැ.

ප්‍ර: ඔය 2010 දී ඔබ පදිංචියට ගියාට පස්සේ නිතර ගෙදර යනවාද 2014 වෙනකම්?

පි: ගෙදර යනවා ස්වාමිනි.

ප්‍ර; එතකොට එහෙනම් ඒ කියන්නේ ඔබට ඒ අවට වෙන දේවල් පිළිබඳ අවබෝධයක් එහෙමනම් 2010 ඉඳන් 2014 වෙනකම් තිබුණු බවද ඔබ කියන්නේ ඔබ ඇත්තටම මඩකලපුවේ කොහේද පදිංචි වෙලා ඉන්නේ?

පි: මම උෆරනී කියන ප්‍රදේශයේ පදිංචි වෙලා ඉන්නේ මඩකලපුවේ නගරයේ ඉඳලා කිලෝමීටර් තුන හමාරක් ඇතුලට ත්‍රිකුණාමල පාරේ.

ප්‍ර: ත්‍රිකුණාමල පාරේ ඉතින් ඔබ නිතර යන කොට ඒ අවට ප්‍රදේශවල තියෙන වෙනස්කම් ඒ ඉන්න ජනතාව සමඟ ?

පි: භෞතිකව වෙනස්කම් සම්බන්ධයෙන් මට කියන්න පුළුවන් නමුත් අර නිකාය සම්බන්ධව මට ඒ සම්බන්ධව අවබෝධයක් තිබිලාම නැහැ.

ප්‍ර: ඔබ මේ ගරු කොමිෂන් සභාවට කියන්නේ ඒ නිකායන් අතර තිබෙන මුස්ලිම් ජාතිකයින්ගේ නිකායන් අතර තියෙන සටිටනය පිළිබඳව ඔබේ අවධානය යොමු වුනේ 2014 අගෝස්තු මාසේ පළවෙනිදා ඔබ කාත්තන්කුඩිය පොලිසියේ ස්ථානාධිපතිවරයා ලෙස පත්වීම ලැබ ආවාට පස්සේ කියලාද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එහෙනම් ඔබේ ඒ අත්දැකීම් අනුව ඔබට කියන්නට පුළුවන්ද සුන්නත් වල් ජමාල් සංවිධානය සහ ජාතික තවුහිද් ජමාත් සංවිධානය අතර යම් වෙනස්කම් තියෙනවාද කියලා තියෙනවා නම් මොනවාද ඒවා?

පි: පුළුවන් ස්වාමිනි. ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ කියන එක කුරානය හා සම්බන්ධව කුරානය පමණක් විශ්වාස කරගෙන කටයුතු කරනවා. එතකොට සුන්නත් වල් ජමාත් සංවිධානය නබිතුමාගෙන් පසු පැමිණි මවුලවිවරුන්ගේ විශ්වාසයන් කටයුතු කරනවා එම හේතුව නිසා නිතරම මේ දෙපාර්ශවය සටිටනය ඇති කරගන්නවා. තවුහිද් ජමාත් සංවිධානය උත්සව කටයුතු කරනවාට විරුද්ධයි එතකොට කාන්තාවන් ඇවිල්ලා ඒ පල්ලිවලට යා ගන්න ඇඳහිම් කරන යම් යම් දේවල්වලට ඒ ගෝල්ලෝ විරුද්ධයි. එතකොට දෑවැදී ගන්න එකට ඒ ගොල්ලෝ විරුද්ධයි. අන්න එවැනි දේවල් තියෙනවා. දානය දෙනවාට විරුද්ධයි. තවුහිද් ජමාත් සංවිධානය අය සුන්නත් වල් ජමාත් සංවිධානය අය ඒ දානේ දීම් කටයුතු කරනවා උත්සව කටයුතු පවත්වනවා එතකොට මළවුන් ඇඳහිම ඒ සම්බන්ධව ඒවා ක්‍රියාකරනවා අන්න ඒ වගේ කටයුතු නිසා?

පි: ඒ කියන්නේ සොහොන් කොත් වන්දනාව?

පි: සොහොන් කොත් වන්දනාව ඒක සිදු කරනවා එවැනි වෙනස් කම් තමයි තියෙන්නේ ඒ සංවිධාන දෙකේ.

ප්‍ර; ඔබට නිරීක්ෂනය කරන්නට ලැබුණේ?

පි; එහෙමයි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර; දැන් ඔය හැම සංවිධානයක්ම ක්‍රියාත්මක වෙන්න යම් නායකත්වයක් අවශ්‍ය වෙනවානේ එතකොට ඔබේ නිරීක්ෂණය අනුව සුන්නත් වල් ජමාත් සංවිධානය කාත්තන්කුඩියේ ක්‍රියාත්මක වෙනකොට කාගේ නායක්තවයෙන්ද ඒක ක්‍රියාත්මක වෙන්නේ ?

පි: රවුෆ් මවුලවි යන අයගෙ නායකත්වයෙන් තමයි ඒක ක්‍රියාත්මක වුනේ ස්වාමීනි.

ප්‍ර: එතකොට ජාතික තවුහිද් ජමාත් සංවිධානය ?

පි: ජාතික තවුහිද් ජමාත් සංවිධානය සහරාන් යන මවුලවී යන අයගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වුනා.

ප්‍ර: දැන් ඔය වගේ ආගමික සංවිධානයක්ම නිරතුරුව ජනතාව ඇමතීම තමන්ගේ අදහස් ජනතාව වෙත ප්‍රවේශ කරන්නට යම් රැස්වීම් පැවැත්වීම වගේ දේවල් කරනවා ඇතිනේ නේද?

පි: සිදු කරනවා ස්වාමිනි.

ප්‍ර: එතකොට දැන් මේ මම සඳහන් කරපු සුන්නත් වල් ජමාත් සංවිධානයත් ඒ වගේම ජාතික තවුහිද් ජමාත් සංවිධානයත් ඔය මා සඳහන් කරපු ආකාරයට ජනතාව අමතන රැස්වීම් පැවැත්වුවාද ඔබේ කාල සීමාව තුලදි?

පි: පැවැත්තුවා ස්වාමිනි.

ප්‍ර; එතකොට ඒ වගේ අවස්ථාවල් වලදී මේ දෙපාර්ශවය අතර ගැටීම් එහෙම ඇතිවෙන්න ගියාද?

පි: ගැටුම් කාරී තත්ත්වයක් ඇති වුනා ස්වාමිනි 2014 වර්ෂයේදී.

ප්‍ර; අපි ප්‍රධාන වශයෙන් ඒකට එන එක කරමු ඉස්සරවෙලා ඒ Background එක ගැන කිව්වාට පස්සේ?

පි: දැන් ඔය 2014 ගැන ඔබ කිව්වානේ?

පි: ඔව්

ප්‍ර; 2014 සිද්ධිය සිද්ධ වෙන්නට ඉස්සරවෙලා රැස්වීම් පැවැත්වීමට මේ පක්ෂ දෙකම නැත්නම් මේ නිකායන් දෙකම උත්සහ කරන්නට ඇතිනේ?

පි: ඔව්.

ප්‍ර; ඒ වගේ අවස්ථාවකදී රැස්වීමක් පවත්වන කොට ඔවුන් ශබ්ද විකාශන යන්ත්‍ර පාවිච්චි කරනවානේ ?

පි: පාවිච්චි කරනවා ස්වාමිනි.

ප්‍ර; ඒ සඳහා බලපත්‍ර ලබා ගන්නට ඕනනේ ?

පි: බලපත්‍ර ගන්නවා ස්වාමීනි .

ප්‍ර; ඒ බලපත්‍ර ලබා ගැනීම පොලිසියෙනුත් ගන්න ඕනේ නේද?

පි: පොලිසියෙන් තමයි ගන්න ඕනේ.

ප්‍ර; එතකොට පොලිසියෙන් ඒ වගේ අවස්ථාවල් වලදී මේ පක්ෂ දෙකම බලපත්‍ර ලබාගෙන තියෙනවාද?

පි: ලබා ගෙන තියෙනවා ස්වාමිනි.

ප්‍ර: එහෙම නම් ඔබට දැනුවත් භාවයක් ඇති වෙනවා මේ පක්ෂ දෙකෙන් කවුරු හරි දැන් ජනතාව අමතන්න රැස්වීමක් පවත්වනවා කියලා?

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර; ඒ වගේ අවස්ථාවල් වලදී ඊට ප්‍රතිපක්ෂය විසින් යම් ප්‍රශ්න ඇති කරලා අධිකරණයට ඔවුන් දෙපාර්ශවයම ගෙනියන්නට තරම් ඔබට කරුණු උදාවෙලා තිබුණාද යම් යම් අවස්ථාවල් වලදී?

පි: උදා වෙලා තිබුණා ස්වාමිනි.

ප්‍ර; එතකොට ඔබ මොකද කරේ?

පි: මම දෙපාර්ශවයම ගරු අධිකරණයට ඉදිරිපත් කරලා යම් යම් අවස්ථා හතරකදී එම රැස්වීම් තහනම් කිරීමට කටයුතු කරලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර: දැන් නීතිය සහ සාමය රැකීමටනේ පොලීසිය ඉන්නේ නේද ?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර; එතකොට පොදු ජනතාවගේ ආරක්ෂාව ඔබලා විසින් සලසන්නට ඕනේ එහෙම නම් යම් පාර්ශවයක් විසින් ඔය වගේ රැස්වීමක් පවත්වනවා නම් ඔවුන්ට ආරක්ෂාව ලබා දීමක් ඔබලා විසින් සිදු කරාද?

පි: සිදුකරා ස්වාමිනි.

ප්‍ර; ඔය 170 ක පිරිස් බලය තිබුණ කාත්තන්කුඩිය පොලිසිය?

පි: සිදු කරා ස්වාමිනි.

ප්‍ර; සාමාන්‍යයෙන් මේ රැස්වීම් පවත්වන්නේ සතියේ මොන වගේ දවස්වලට ද පවත්වන දවසේ දවසේ කොයි වගේ වෙලාවකටද?

පි: සිකුරාදා දවසට තමයි ඔය රැස්වීම් පවත්වන්නේ ස්වාමිනි එම රැස් වීම් පවත්වන වෙලාව කට්ටිය ප්‍රදේශයේ ජනතාව තමන්ගේ දෛනික වැඩකටයුතු අවසන් කරලා එන වේලාවන් තමයි හවස 7.30 න් 8.00 පස්සේ තමයි ස්වාමිනි එම රැස්වීම් පවත්වන්නේ.

ප්‍ර; ඔබ මගේ ප්‍රශ්නයකට පිළිතුරු දෙන ගමන් සඳහන් කෙරුවා ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ කාත්තන්කුඩියේ ප්‍රධානීයා විදියට කටයුතු කරාය කියලා සහරාන් කියන තැනැත්තාව?

පි; ඔව් ස්වාමිනි.

ප්‍ර; ඔහුගේ සම්පූර්ණ නම මොකක්ද?

පි: මොහොමඩ් සහරාන්

ප්‍ර; සහරාන් කිව්වාම හරි.ඔබේ කාල පිරිච්ඡේදය තුල දී ස්ථානාධිපතිවරයා විදියට කාත්තන්කුඩියේ ඔබ දැනගෙන හිටියාද මේ මොහොමඩ් සහරාන් කොහේද පදිංචි වෙලා හිටියේ කියලා?

පි: මොහිදින් පල්ලිය පාර කාත්තන්කුඩි තුන.

ප්‍ර; ඔහුගේ පවුලේ තව සහෝදර සහෝදරියෝ හිටියාද කියන එක ඔබ දන්නවාද?

පි; දන්නවා ස්වාමිනි.

ප්‍ර; සෙයිනි කියලා සහෝදරයෙක් හිටියා කියලා ඔබ දන්නවාද?

පි: දන්නවා.

ප්‍ර: රිල්වාන් කියලා සහෝදරයෙක් හිටිය කියලා ඔබ දන්නවා ද ?

FAIR COMMENT BY JEZEEM

පි: දන්නවා

ප්‍ර: ඒ අයව ඔබට මුණ ගැහිලා තියෙනවාද?

පි; රිල්වාන් නම් අය මට මුණ ගැහිලා තියෙනවා සෙයිනි යනඅය මුණ ගැහිලා නැහැ.

ප්‍ර ඔය සුන්නත් වල් ජමාත් සංවිධානයයි ජාතික තවුහිද් ජමාත් සංවිධානයයි සලකලා බලනකොට ඔවුන්ට හිටි පිරිස් බලය ගැන ඔබට අවබෝධයක් තියෙනවාද?

පි: තියෙනවා ස්වාමිනි.

ප්‍ර; වැඩිපුර පිරිස් බලයක් හිටියේ කාටද?

පි: වැඩි පිරිස් බලයක් හිටියේ සුන්නත් වල් ජමාත් සංවිධානයට

ප්‍ර: එතකොට ජාතික තවුහිද් ජමාත් සංවිධානය ?

පි: ජාතික තවුහිද් ජමාත් සංවිධානයට ඊට වඩා අඩු පිරිසක් හිටියේ.

ප්‍ර; එතකොට වෙදගේ මහත්මයා ඔබ මේ ගරු කොමිෂන් සභාවට ඔය කථාව කියන්නේ 2014 - 2017 කාලය තුල ?

පි: 2014 - 2017 කාලය තුල.

ප්‍ර; එහෙනම් මේ සහරාන් හසීන් නායකත්වය දුන්නු ජාතික තවුහිද් ජමාත් සංවිධානයට ඔබ කියන්නේ 2014 - 2017 කාලයේදී සුන්නත්වල් ජමාත් සංවිධානයට හිටපු සාමාජිකත්වය තරම්ම සමාජිකත්වයක් හිටියේ නැහැ කියලා?

පි: හිටියේ නැහැ ස්වාමිනි.

ප්‍ර; නමුත් ඔවුන් රැස්වීම් පැවැත්වීම් වගේ දේවල් කෙරුවා නේද?

පි: කෙරුවා ස්වාමිනි.

ප්‍ර; දැන් ඔබ සඳහන් කෙරුවා මගේ ප්‍රශ්නයකට පිළිතුරු දෙන ගමන් යම් සිද්ධියක් 2014 දී සිද්ධ වුනාය කියලා 2017 දී?

පි: 2017

ප්‍ර: දැන් ඊට ඉස්සරවෙලා රවුල් මවුලවිට අදාලව සිදුවන යම් සිද්ධියක් සම්බන්ධයෙන් ඔබ සහරාන්ට විරුද්ධව මහේස්ත්‍රාත් අධිකරණයක නඩුවක් පැවරුවාද?

පි: 2014 වර්ෂයේ මගේ මතකයේ හැටියට ස්වාමීනි නඩුවක් පැවරුවා.

ප්‍ර: මොකක්ද ඒ සිද්ධිය කියලා කෙටියෙන් පැහැදිලි කිරීමක් කරන්න?

පි: අපහාස කිරීමක් සම්බන්ධයෙන් ඒත් එවැනිම රැස්වීමක සිදු වූ සිද්ධියක් සම්බන්ධයෙන් කරන ලද පැමිණිල්කට අදාලව .

ප්‍ර; කොහාට ද ඔබ ඔය කරුණු වාර්තා කලේ?

පි: මඩකලපුව ගරු අධිකරණයට කරුණු වාර්තා කරා.

ප්‍ර; ඒ කියන්නේ කාත්තන්කුඩිය බල ප්‍රදේශයට අදාල වන අධිකරණය වෙන්නේ මඩකලපුව මහෙස්ත්‍රාත් අධිකරණය?

පි: ඔව් මහේස්ත්‍රාත් අධිකරණය

ප්‍ර; ඒ නිසා ඔබ කරුණු වාර්තා කරේ එම මහේස්ත්‍රාත් අධිකරණයට?

පි: ඔව්.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මොකක්ද ඒ නඩුවට වුනේ නඩු පැවරුවාද සහරාන්ට විරුද්ධව?

පි: නඩු පැවරීම් කටයුතු කරලා තිබ්බා ස්වාමිනි නඩුව කපා හැරලා තිබ්බා .

ප්‍ර; ඒ මොකද?

පි; ඔය සුන්නත් වල් ජමාත් සංවිධානයේ රවුම් මවුලවි යන අය මේ අසනීප වෙලා නොපැණීම හේතුවෙන් නඩුව කපා හැරලා තිබ්බා ගරු ස්වාමීනි අධිකරණය මගින්.

ප්‍ර; පැමිණිලි කරු නොපැමිණීම හේතුවෙන් ?

පි: ඒ පැමිණිලිකරු නෙවේ ස්වාමිනි.

ප්‍ර; එහෙනම් අනුගාමිකයින් තමයි පැමිණිල්ල දාලා තිබ්බේ?

පි: ඔව් පැමිණිල්ල දාලා තිබ්බේ. ඒ පැමිණිල්ලට අදාලව පුද්ගලයෙක් තමයි රවුම් මවුලවි එයා ආපු නැති නිසා ගරු අධිකරණය මගින් ඒ නඩුව කපා හැරලා තිබ්බා ස්වාමිනි.

ප්‍ර: හොඳයි එතකොට දැන් ඔය ඊළඟ අවස්ථාව ගැන ඒ කියන්නේ 2017 සිදුවුණු සිද්ධිය ගැන 2017 මොකක්ද ඔබ මේ කියන සිද්ධිය?

පි: 2017 වර්ෂයේ තුන්වෙනි මාසයේ 10 වෙනිදා සහරාන් හසීම් තවුහිද් ජමාත් සංවිධානයේ රැස්වීමක් පවත්වන්න සුදානම් කරලා තිබ්බා.

ප්‍ර: කොහේද?

පි; අලිගාර් හන්දියේ.අලිගාර් හන්දිය කියන තැන ඒ රැස්වීම් පවත්වන්න සුදානම් කරලා ඒකේ සුදානම් කරමින් ඉන්න වෙලාවේ සුන්නත් වල් ජමාත් සංවිධානයේ සමාජිකයින් පිරිසක් එම ස්ථානයට ගිය අවස්ථාවේ සිදු වූ බහින් බස් වීමක් හේතුකොට ගෙන දෙපාර්ශවය අතර ගැටුමක් ඇති වුණා ස්වාමිනි.

ප්‍ර: දැන් මගේ මූලික ප්‍රශ්නයකට පිළිතුරු දෙන ගමන් ඔබ කිව්වා මේ වගේ රැස්වීමක් පවත්වන කොට ශබ්ද විකාශන යන්ත්‍ර පාවිච්චි කරනවා, එතකොට ඒ සම්බන්ධයෙන් බලපත්‍ර ලබා දීම සිදු කරන්නේ පොලීසිය විසින් කියලා.

පි: ඔව්.

ප්‍ර: ඒ වගේම ඔබ සඳහන් කරනු ලැබුවා මේ වගේ රැස්වීම් වලට පොලිස් ආරක්ෂාවක් සපයනු ලැබුවා කියලා?

පි: සපයනවා ස්වාමිනි.

ප්‍ර; එහෙම නම් ඔබට මේ ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්නට පුළුවන්ද එය නම් ඔබේ ස්ථාවරය කොහොමද මේ 2017 මේ සිද්ධිය සිද්ධවුනේ කියලා එය සිද්ධ වුනේ 2017 මාර්තු මාසේ 10 වෙනිදා කියලා මා කිවොතින් නිවැරදිද?

පි; ඔව් නිවැරදි ස්වාමිනි.

ප්‍ර; එතකොට කොහොමද එහෙනම් ඔබ ආරක්ෂාවත් සපයනවා නම් කොහොම ද මේ සිද්ධිය සිද්ධ වුනේ ?

FAIR COMMENT BY JEZEEM

පි: ස්වාමිනි මෙම සිද්ධිය සිද්ධ වුනේ රැස්වීම පටන් ගන්න ගොඩාක් වෙලාවකට ඉස්සෙල්ලා සුදානම් කිරීම් කටයුතු සිදුකරමින් 5.15 ට විතර 5.15 ,5.30 වගේ වෙලාවක තමයි ස්වාමිනි මේ සිද්ධිය සිද්ධ වුනේ.

ප්‍ර: කියන්න කෝ?

පි: එතකොට රාජකාරි නිලධාරීන් එම ස්ථානයට ගොස් හිටියේ නැහැ එම අවස්ථාවේ තමයි .

ප්‍ර; රැස්වීම් පටන් ගන්න තිබුණේ කීයටද?

පි: රැස්වීම සාමාන්‍යයෙන් පටන් ගන්නේ සවස 7.00 ත් 7.30 න් පස්සේ ස්වාමිනි.

ප්‍ර; එතකොට ඔබ කියන්නේ මේ සිද්ධිය වුනේ 5.30 ට වගේ?

පි: සිද්ධිය වුනේ 5.30ට විතර.

ප්‍ර; හරි එතකොට කොහොමද මේක වෙලා තිබුණේ ?

පි: සුන්නත්ත වල් ජමාත් සංවිධානයේ .

ප්‍ර: නිකම්ම ගහන්නේත් නැහැනේ යම් ප්‍රකෝප කිරීමක් වෙන්න ඇතිනේ නේද?

පි: මට පැහැදිලි වුන් නැහැ.

ප්‍ර: නිකම් මිනිස්සු ගහ ගන්නෙත් නැහැනේ මොකක් හරි සිද්ධියක් වෙන්න ඇති?

පි: එම අවස්ථාවේ සුන්නත් වල් ජමාත් සංවිධානයේ පිරිසක් එම ස්ථානයට දෙදෙනෙක් ඇවිල්ලා තිබ්බා එතැන්ට ඒ ආපු අවස්ථාවේ මේ එම ස්ථානයේ ඉදලා තමයි බහින් බස්වීමක් සිදුවෙලා මේ එම ස්ථානයේ දී එම ගැටුම ඇතිවෙලා තියෙන්නේ මැතිණියනි.

ප්‍ර; බහින් බස්වීමක් සිද්ධ වෙලා?

පි; ඔව්.

ප්‍ර; කුමන කරුණක් උදෙසාද මේ බහින් බස්වීම සිද්ධවෙලා තියෙන්නේ කියලා විමර්ශනයේදී අනාවරණය වුනාද මතකයිද? දැන් ද්‍රවිඩ භාෂාවත් කියවන්න පුළුවන් හින්දා ඔබට මතකද ඔබ කරුණු වාර්තා කලා මේ සිද්ධියෙන් පස්සේ මඩකලපුව මහේස්ත්‍රාත් අධිකරණයට?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔබ B වාර්තාවකින් ද ඒ වාර්තා කිරීම කලේ?

පි: B වාර්තාවකින්.

ප්‍ර: ඔබ ද අත්සන් කරේ ස්ථානාධිපතිවරයා විදියට?

පි: ඔව්.

ප්‍ර: ඒක දැක්කොතින් ඔබට මතක් වෙයිද? ඒ වාර්තාව දැක්කොත්

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේදී B වාර්තාවේ පිටපත සාක්ෂිකරුට පෙන්වා සිටිනවා

****

FAIR COMMENT
BY JEZEEM

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ස්වාමිනි සාක්ෂිකරු විසින් B 276/2017 දරණ නඩු වාර්තාවේ සහතික පිටපත ඔහුට පෙන්නා සිටින ලද අවස්ථාවේදී එහි පළමු B වාර්ථාවේ අවසානයේ තිබෙන අත්සන ඔහුගේ කෙටි අත්සන බවට හඳුනා ගැනීමක් සිදු කලා. එම නිසා අවසර අයදිනවා ස්වාමිනි මඩකලපුව ම. ඌ නඩු අංක B 276/2017 දරණ නඩු වාර්තාවේ සහතික පිටපත C 665 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීම සඳහා.

ස්වාමිනි එම සහතික කරන ලද පිටපත පිටු 624 කින් සමන්විතයි. ස්වාමිනි එම නඩු වාර්තාවේ සාක්ෂිකරු විසින් ගොනු කරන ලද B වාර්ථාව C665 A වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීම සඳහාත් සාක්ෂිකරුගේ අත්සන ඇති ස්ථානය ඔහු විසින් හඳුනා ගනු ලැබුවා. එම ස්ථානය C 665 A (1) වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමටත් අවසර අයැදිනවා.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර; සාක්ෂිකරු ඒ B report එකේ දෙමළ භාෂාවෙන්ද තියෙන්නේ ?

පි: දෙමළ භාෂාවෙන් තියෙන්නේ ස්වාමිනි.

ප්‍ර තමන්ට ද්‍රවිඩ භාෂාව කියවන්න බැහැ?

පි: බැහැ ස්වාමිනි.

ප්‍ර; තමන්ගේ අත්සන තියෙනවා ?

පි: ඔව් ඒක මම හඳුන ගන්නවා.

ප්‍ර: අත්සන තියන්න කියවන්න එපැයි. මොනවාද තියෙන්නේ කියලා දන්නේ නැතිව අත්සන් කරේ වෙන එක්කෙනකුට කියලා කියවලා අත්සන් කරේ?

පි: මට තේරෙනවා ස්වාමිනි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: ඔබට දෙමළෙන් කථා කරන්න පුළුවන් ?

පි; පුළුවන්

ප්‍ර: නමුත් කියවන එක අමාරුයි?

පි: අමාරුයි.

ප්‍ර: දැන් ඔබේ අවධානයට යොමු කරන්නේ ඒ සහතික කරන ලද නඩු වාර්තාවේ ඒ කියන්නේ C 665 වශයෙන් ලකුණු කරලා ඉදිරිපත් කරන ලද නඩු වාර්තාවේ සිංහල පරිවර්ථනය ඒ සිංහල පරිවර්ථනයේ ඔබේ B වාර්තාව පරිවර්ථනය කරලා තියෙනවා ඔබේ මතකය අලුත් කරගන්නට පොඩ්ඩක් ඒක පරීක්ෂා කරලා බලන්න ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සාක්ෂිකරු ලේඛනය පරීක්ෂා කරයි.

ප්‍ර; වෙදගෙදර මහත්මයා සාමාන්‍යයෙන් කියව ගන්න ඇතිනේද ඒටික හොදයි එතකොට දැන් ඔය සිංහල පරිවර්ථනය බලලා ඔබේ මතකය අලුත් කරගෙන කියන්න පුළුවන්ද මේ සිද්ධිය සිදුවුන බවට B වාර්තාව මගින් ඔබ 10 වෙනිදා සිද්ධ වුනා කියලා කරුණු වාර්තා කරන්නේ කවද්ද?

පි: 11 වෙනිදා ස්වාමිනි.

ප්‍ර; එතකොට මොකක්ද සිදුවුනාය කියන සිද්ධිය ඔබ වාර්තා කරලා තියෙන්නේ ගරු මහේස්ත්‍රාත් තුමාගේ අවධානයට යොමු කරන්න?

පි: අලිගාර් හන්දියේ රැස්වීමක් පවත්වන අවස්ථාවේ කාත්තන්කුඩි පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වන ප්‍රධාන පොලිස් පරීක්ෂක වෙදගෙදර වන මා 2017 .03.10 වන දින අංක.63/18 අල්ආමීන් පාර, නව කාත්තන්කුඩි ලිපිනයේ පදිංචි අබුබකර් මොහොමදු මුනාෆර් යන අය නීති විරෝධී ලෙස එක්රැස් වී මහජනතාවට කඩුවෙන් කොටා පෙට්ට්‍රල් බෝම්බ ප්‍රහාර එල්ල කර දේපලවලට හානි සිදුකරල බවට පැමිණිල්ලක් කර ඇත.

ප්‍ර; එතකොට පැමිණිලිකාරයාගේ නම මොකක්ද?

පි: අබුබකර් මොහොමඩ් මුනාෆර්.

ප්‍ර; කවුද දරනි මේ සිද්ධියෙන් තුවාලකාරයෝ කී දෙනෙක් ඉඳලා තියෙනවද, පහරදීම් සිදු කරලා තියෙන්නේ කවුද?

පි: මෙම සිද්ධියේදී බරපතල තුවාල ලබා මඩකලපුව ශික්ෂණ රෝහලේ ප්‍රතිකාර ලබන අංක 63/18,අල්අමීන් පාර, කාත්තන්කුඩි 06, ලිපිනයෙහි පදිංචි අබුබකර් මොහොමදු මුනාබීර් .

ප්‍ර; එයා එක තුවාල කාරයෙක් එයා කවුද ?

පි: තුවාලකරු,පැමිණිලි කරු.

ප්‍ර: එයාට මොකක්ද සිදුවෙලා තියෙන හානිය ඔය විමර්ශනයේදී අනාවරණ වුනු මොනවගේ තුවාලයක්ද වෙලා තියෙන්නෙ?කවුද ඒ තුවාලය සිදු කරලා තියෙන්නේ?

පි: තමා ඉහත ලිපිනයෙහි දෙමාපියන් සමඟ පදිංචිව සිටින අතර රැකියාවක් වශයෙන් යාපනයේ කඩයක සේවය කරන බවත් සෑම සිකුරාදා දිනවල පමණක් පල්ලියට යෑම සඳහා කාත්තන්කුඩියට එන බවත් තමා එසේ 2017.03.10 වන දින මෙකේ දිනය වැරදියට සටහන් වී තිබෙන්නේ. දින නිවසට පැමිණි බවත් ඉන් අනතුරුව වැඩට නොගිය බවත් 2017.03.10 වන දින තමාගේම මස්සිනා කෙනෙකු වන ෆවුමි පස්වරු 5.30 පමණ යතුරු පැදියෙන් තමාගේ නිවස සිට කරවලා පාරේ අලියාර් හන්දියට පැමිණි අවස්ථාවේදී නූරානියා පල්ලිය දෙස සිට කරවලා දෙසට බොහෝ අය එක් රැස් වී ගමන් කරගෙන ආ බවත් ලඟට පැමිණි අවස්ථාවේදී සහරාන් මවුලවිගේ පිරිස වන මොවුන් 50 දෙනකුට වැඩි පිරිසක් පාරේ ගමන් කල අයවලුන්ට පහර දෙමින් තමන් සිටි ස්ථානය වෙත පැමිණි

FAIR COMMENT BY JEZEEM

බවත් එසේ පැමිණි සහරාන් මවුලවි පිහියක් අරගෙන තමාට පහර දීමට පැමිණි බවත් තමා එය වැළැක්වීමට උත්සහ කිරීමේදී තමාගේ බඩේ වම් පසේ ඇන්න බවත් ඉන්පසුව සහරාන් මවුලවිගේ මල්ලි වන රිල්වාන් වන අයත් නියාෂ් යන අයත් යකඩ කම්බිවලින් ඇන්න බවත් තවද අජ්වද් යන අය තමාට මතක බවත් ඉන් පසු තමාව සහ තමාගේ මස්සිනාව බිම දමා බොහෝ අය පෑගූ බවත් සහජාන් නැමැත්තා තමන්ගේ කකුලෙන් තමන්ට අල්ලාගෙන ඔහුගේ කකුලට පහර දුන් බවත් කියා සිටියා.

ප්‍ර; හොඳයි එතකොට අබුබකර් මොහොමඩ් මුනාබීර් යන අය ඔබේ විමර්ශනය අනුව හෙලි වුනේ සහරාන් මවුලවිගේ පහර දීමෙන් ඇතුම් තුවාල ලැබූ බව නේද?

පි: ලැබූ බව.

ප්‍ර; ඒ වගේම තවදුරටත් යකඩ කම්බි වලින් සහරාන් මවුලවිගේ මල්ලිවන රිල්වානුත් නියාස් කියන අයත් ඇන්න බව කියනවා?

පි; ඔව්.

ප්‍ර: ඒ හැරෙන්නට අජ්වත් කියන එක්කෙනාම ඔහුට මතක තිබ්බා ඒ වගේම මේ තුවාල කාරයාත් ඔහුගේ මස්සිනාවත් බිම දාලා ගොඩාක් ඒ ගොල්ලෝ පෑගුවා සහජාන් කියන එක්කෙනා අබුබකර් මොහොමදු මුනාබීර් කියන මේ තුවාලකරුගේ කකුලෙන් අල්ලගෙන ඔහුගේ ඒ කියන්නේ සහජාන්ගේ කකුලෙන් මේ අබුබකර්ට පහර දුන්නා කියලා තමයි ඔබේ විමර්ශනයේදී අනාවරණය වුනා කියලා ඔබ මේ වාර්තාව අනුව ගරු මහේස්ත්‍රාත්තුමාගේ අවධානයට යොමු කරන්නේ.

පි: ප්‍රකාශය අනුව.

දැන්වේලාව.ප.ව.10.35
මෙතැන් සිට.ල/ලේ ඉන්ද්‍රණි මිය.

President Secretariat's Copy

FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් කළේ චන්දිමා මෙය
දැන් වේලාව : ප.ව. 10.35 යි
මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

(ස්වාමීනි මෙම සිංහල පරිවර්තනය, අපට මේ නඩුව මෙහෙයවගෙන යනකොට අවශ්‍ය වන නිසා කරුණාකරලා අවසර පතනවා එම සිංහල පරිවර්තනය C-666 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරන්න)

(ඒ වගේම ස්වාමීනි අපට සහාය වෙමින් මේ සිංහල පරිවර්තනය අද දින ඉදිරිපත් කිරීමට අපට හැකි වුණේ කොමිෂන් සභාවට සිංහල භාෂාවට දෙමළ භාෂාව පරිවර්තනය කොට දෙන කන්දසාමි මහතාගේ මහපෙන්වීම අනුව ඔහු විසින්. ඒ බවත් ස්වාමීනි වාර්තා කරන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිනවා)

ප්‍ර : ඊළඟට මා ඔබේ අවධානය, දැන් මේ සිද්ධියේදී ෆාරුක් මොහොමදු හමීඩ් කියලා කෙනෙකුත් ප්‍රකාශයක් කරලා තියෙනවා නේද?

පි : ප්‍රකාශයක් කරලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : දැන් එම කරුණ, ඔහුගේ ප්‍රකාශය අනුව විමර්ශනයේදී මොනවද අනාවරණය වෙලා තියෙන්නේ?

පි : තමාගේ නිවස ඉදිරිපිට ඇති ගේට්ටුව ළඟ හිටගෙන සිටින අවස්ථාවේදී, එම ස්ථානයේදී රණ්ඩුවක් ඇති වූ බවත්, තමාගේ ජංගම දුරකථනය එය වීඩියෝ කරමින් සිටි බවත්, එම අවස්ථාවේදී කලින් හමුදාවේ සේවය කළ මොහිදීන් යන අය තමාගේ අතේ දිග කඩුවක් අරගෙන තවත් අයවළුන් සමඟ පැමිණි බවත්, එම අයවළුන්ගේ අතේ පොලු, කඩු හා ගල් තිබුණු බවත්, එම අවස්ථාවේදී මොහිදීන් යන අය තමා වීඩියෝ කරමින් සිටි තමාගේ ජංගම දුරකථනය උදුරාගෙන තමාගේ ඉඩම තුළට තමාව ඇදගෙන ගොස් බෙල්ලේ පිහියක් තබා අප සියළු දේට සූදානමින් තමයි ඇවිත් ඉන්නේ කියූ බවත්, එම පිරිස අතර සිටි උපැස් යුවලක් පැළඳ සිටි නම නොදන්නා අයෙකු තමාගේ මුහුණට පහර දුන් බවත්, තමා කෑ ගසා හැඩූ බවත්, එම අවස්ථාවේදී තමාගේ නංගී මොහොමඩ් ෆාරුක් කාසි ජෙමාල් යන අය දුවගෙන ආ බවත් කියා සිටියා.

ප්‍ර : එතකොට ඒ කථාව තහවුරු කරමින් ඔබලා විමර්ශනයේදී ෆාරුක් කාසි ජෙමාල් යන අයගෙන් ප්‍රකාශයක් අරන් තියෙනවද?

පි : ප්‍රකාශයක් ලබාගෙන තියෙනවා ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට දැන් තමන්ගේ සහෝදරයාගේ කථාව ඇය විසින් තහවුරු කරලා තියෙනවාද?

පි : තහවුරු කරලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : තහවුරු කරමින් ඇය මොකද්ද දැනුම් දීලා තියෙන්නේ?

පි : තමාගේ අයියා වන ෆමීල් කෑගසන ශබ්දයක් ඇසී තමා දුවගෙන ආ බවත්, එම අවස්ථාවේ කලින් හමුදාවේ සේවය කළ මොහිදීන් යන අය තමාගේ අයියාගේ බෙල්ල අල්ලාගෙන පිහියක් තබාගෙන සිටි බවත්, එහි සිටි අයවළුන්ගේ අතේ පොලු සහ කඩු තිබූ බවත්, එහි කණ්ණාඩියක් පැළඳ සිටි කෙනෙකු තමාගේ අයියාගේ මුහුණට පහර දුන් බවත්, පැමිණි සියළු දෙනාම තැඹිලි පාට සහ කහ පාට ටීෂර්ට් පැළඳ සිටි බවත් කියා සිටියා.

ප්‍ර : එතකොට ඒ හැරෙන්නට තව ප්‍රකාශයක් වාර්තා කරලා තියෙනවද මොහොමඩ් කාසීම් මොහොමඩ් සදාත් කියලා කෙනෙක්ගෙන්?

පි : සටහන් කරලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : මොනවද අනාවරණය වෙලා තියෙන්නේ ඔහුගේ ප්‍රකාශයෙන්?

පි : පස්වරු 5.00 ට පමණ කාත්තන්කුඩි අලියාර් පාරේ පිහිටි අලියාර් හන්දියේ ඇති තේ කඩයක් අසළ සිටගෙන සිටි එම අවස්ථාවේදී යම් කෙනෙකු එම ස්ථානයේ රතිඤ්ඤා පත්තු කර දැමූ බවත්, ඔහු කවුද යන්න තමා නොදන්න බවත්, එම අවස්ථාමේදී සහරාන් මවුලවී 50 දෙනෙකු පමණ පිරිසකුත් සමඟ ආයුධය ගේන්න කියා කෑ ගසමින් ආ බවත්, එම අවස්ථාවේදී කොළ පාට ත්‍රිරෝද රථයෙන් පැමිණි බවත්, එහි තිබී පිහි, යකඩ පොලු, කඩු යන ආදිය ඔවුන් ගත් බවත්, ඔවුන් එම පාරේ ගමන් කරමින් සිටි පිරිසකට පහර දුන් බවත්, එක් කොල්ලෙකුට සහරාන් මවුලවී යන අය ඔහුගේ අතේ තිබූ යකඩ පට්ටමින් ඇන්න බවත්, ඔහුගේ නම නොදන්න බවත් කියා සිටියා.

ප්‍ර : මේ කරන ලද විමර්ශනය අනුව, මොන වගේ වැරදි ඔවුන් විසින් සිදු කළ බවට ඔබේ විමර්ශනයේ අනාවරණය වෙනවද කියලා ඔබ ගරු මහේස්ත්‍රාත්වරයාව දැනුවත් කරලා තියෙනවද?

පි : දැනුවත් කරලා තියෙනවා ස්වාමීනි. ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ 140 වගන්තිය සමඟින් කියැවෙන 141, 145, 146, 148, 149, 314, 315, 316, 317, 410, 433, 436, 486 සහ පීඩාකාරී පුපුරණ ද්‍රව්‍ය ආඥා පනතේ වර්ෂ 1966 අංක 18 දරණ, අංක 04 වෙනි වගන්තිය යටතේ දඩුවම් කළ හැකි වැරදි.

ප්‍ර : වැරදි සිදු කරන ලද බවට අනාවරණය වුණාය කියලා ඔබ ගරු මහේස්ත්‍රාත්වරයා වෙත වාර්තා කරලා තියෙනවා නේද?

පි : වාර්තා කරලා තියෙනවා ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ වගේම මේ B වාර්තාව මගින් ගරු මහේස්ත්‍රාත්තුමාගේ අවධානයට යොමු කරලා තියෙනවද විමර්ශනය තුළදී මොන වගේ නඩු භාණ්ඩ විමර්ශකයින් විසින් ලබාගෙන තියෙනවද කියලා? සොයාගෙන තියෙනවද කියලා?

පි : පෙට්‍රල් බෝම්බ, යකඩ පොලු, කඩු සොයාගෙන ඇත. මේ ස්ථානයේ දේපළ නඩු භාණ්ඩ ලේඛනයේ ඇතුළත් කර, PR134/17 අහල් 4 ½ මිටක් සහිත අහල් 23 ක් දිගැති එහි මුහුණත අහල් 1 ½ ක් උල් ඇති කඩුවක් සහ PR135/2017 යටතේ අහල් 15 ක් දිග මිටක් සහිත, එහි ඉදිරිපස උල් සහිත කම්බියක් PR136/2017 යටතේ අහලක් පමණ වට ප්‍රමාණයෙන් යුත් අහල් 4 ක පමණ වට ප්‍රමාණයෙන් යුත් අහල් 37 ක් දිග යකඩ පයිප්ප 04 ක් අහල් 1 ½ ක් වට ප්‍රමාණයකින් යුත් අහල් 36 ක් දිග යකඩ පයිප්ප 02 ක් අහලක වට ප්‍රමාණයෙන් යුත් අහල් 35 ක් දිග ඇති යකඩ පයිප්පයක්, අහල් 1 ½ ක් වට ප්‍රමාණයෙන් යුත් අහල් 36 ක් දිග යකඩ පයිප්පයක්, අහල් 6 ක ලී මිටක් සහිත අහල් 24 ක් දිග අහලක් පළල උල් සහිත කම්බියක් සහ PR136/17 යටතේ මිලි ලීටර් 450 කින් යුත් රෙදි කොටසකින් ඔතන ලද පෙට්‍රල් අඩංගු පෙට්‍රල් බෝම්බයක්, සෝඩා මිලිලීටර් 400 ක ලේබල් සහිත බෝතලයක පෙට්‍රල් අඩංගු පෙට්‍රල් බෝම්බයක්, මෙන්ඩිස් මිලි ලීටර් 750 ක් ලේබල් සහිත පෙට්‍රල් අඩංගු රෙදි තිර සහිත පෙට්‍රල් බෝම්බයක්, දුඹුරු පාට පෙට්ර්ල් අඩංගු තිර සහිත පෙට්ර්ල් බෝම්බයක් ඇතුළත් කර ඇත.

ප්‍ර : ඒවා තමයි සොයාගෙන තියෙන්නේ නේද?

පි : ඔව් ස්වාමීනි.

(ස්වාමීනි C-666 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරන ලද මඩකලපුව මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක B276/2017 යන නඩු වාර්තාව ඉදිරිපත් කරනු ලැබුවා C-665 ලෙස. එහි සිංහල පරිවර්තනයේ අපි අනතුරුව ඉදිරිපත් කළා C-666 ලෙස. එහි B වාර්තාවේ සිංහල පරිවර්තනය C-666(a) වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීම සඳහා අවසර අයදිනවා)

ප්‍ර : ඔය අලියාර් හන්දියේ සිදු වුණ මේ ගැටුමේදී යම් පුද්ගලයින් එහෙම නම් තුවාල ලබා තිබෙනවා?

පි : තුවාල ලබා තිබෙනවා ස්වාමීනි.

ප්‍ර : ඒ වගේම C-666(a) වශයෙන් ලකුණු කරලා ඔබ ඉදිරිපත් කරපු මේ වාර්තාව අනුව, මේ සිද්ධියට අදාළව තුවාල සිදු කළහැකි ආකාරයේ යම් නඩු භාණ්ඩත් ඔබ විසින්, ඔබ කියන්නේ ඔබේ විමර්ශකයින් විසින් සොයාගෙන තිබෙනවා නේද?

FAIR COMMENT BY JEZEEM

පි : සොයාගෙන තිබෙනවා ස්වාමීනි.

ප්‍ර : දැන් මේ රැස්වීම පවත්වන්නට තිබුණේ, ඔබෙන් අවසර අරන් තිබ්බේ මොන වගේ රැස්වීමක් පවත්වන්නටද?

පි : ආගමික ප්‍රචාරක කටයුතු සම්බන්ධව රැස්වීමක්. ඊට අමතරව මත්ද්‍රව්‍යවලින් මිදීම සඳහා දේශනයක් සහිත රැස්වීමක් හැටියට.

ප්‍ර : එහෙමද පොලීසියට දැනුම් දුන්නේ?

පි : එහෙම දැනුම් දුන්නා ස්වාමීනි.

ප්‍ර : එහෙම දැනුම් දුන්නේ. නමුත් ඔබේ පොලීසියෙන් අවසර ගන්නකොට මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධයෙන් කථා කරන්නත්, ඒ වගේම ආගමික කටයුතු සම්බන්ධයෙන් ජනතාව අමතන්නත් තමයි අවසර ලබා ගන්නේ?

පි : අවසර ලබා ගන්නේ ස්වාමීනි.

ප්‍ර : ඒ වුණාට ඔබ මීට මොහොතකට පෙර ගරු අධිකරණයට සඳහන් කරන ලද නඩු භාණ්ඩ අනුව පුද්ගලයින්ට තුවාල සිදු කළහැකි ආකාරයේ ආයුධ සහ පීඩාකාරී ආයුධ අන්තර්ගත වුණාය කියලා ඔබ කිව්වා මේ ස්ථානයේ තිබිලා සොයාගෙන?

පි : ප්‍රකාශ කළා ස්වාමීනි.

ප්‍ර : දැන් ඔය, ඔබට මතකයිද ඔය අලියාර් හන්දියේ සිදු වුණ ගැටුම පිළිබඳව යම් වීඩියෝ පට තිබුණා?

පි : මට මතකයි ස්වාමීනි.

ප්‍ර : ඒ වීඩියෝ පටයක් දැක්කොතින් ඔබට කියන්නට පුළුවන්ද ඒ වීඩියෝ පටයේ අන්තර්ගත වෙන්නේ අලියාර් හන්දියට අදාළව ඇති වුණ සිද්ධියක්ද? නැත්නම් වෙන සිද්ධියක්ද කියලා?

පි : මට කියන්න පුළුවන්.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : සාක්ෂිකරු ගැටුමේදී පාර්ශව දෙකක්ම අධිකරණයට ඉදිරිපත් කළාද?

පි : පාර්ශව දෙකක් ඉදිරිපත් කළා ස්වාමීනි.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : ඒක මේ වාර්තාවේ තියේද?

පි : තියෙනවා ස්වාමීනි. සුන්නත්වල් ජමාත් සංවිධානයේ පුද්ගලයින් තුන් දෙනෙක් ඉදිරිපත් කරා. ඊට අමතරව තවුහිද් ජමාත් සංවිධානයේ පුද්ගලයින් ඉදිරිපත් කරා ස්වාමීනි.

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : ජමීල් කියලා පුද්ගලයෙකුත් රිමාන්ඩ් කරාද? ඒ පාර්ශව දෙකට B Report දෙකක් දැම්මද එකයිද? සොයාගන්න බැරිද?

පි : දෙමළෙන් සටහන් වෙලා තියෙන්නේ.

ප්‍ර : පසුව බලලා කියන්න?

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

(ස්වාමීනි C-435 වශයෙන් දැනටමත් ලකුණු කොට ඉදිරිපත් කොට තිබෙන වීඩියෝ පටය පෙන්වීම සඳහා අවසර අයදිනවා)

ප්‍ර : මිස්ට වෙදගේ මේක බලන්න?
(වීඩියෝ පටයක් ප්‍රදර්ශනය කරයි)

ප්‍ර : ඒ සිද්ධිය මතකයිද? මේ දකින රූප රාමුවේ තිබෙන?

පි : ඔව් ස්වාමීනි. මේ අලියාර් හන්දියේ සිදුවීම තමයි ඕක එක වීදියක.

ප්‍ර : ඒ කවුද ඒ තුවාල වෙලා බිම වාඩිවෙලා ඉන්නේ මතකයිද?

පි : එහෙම නමින් කියන්න මතකයක් නැහැ ස්වාමීනි.

ප්‍ර : මේ දැන් රූප රාමුවේ දකින පුද්ගලයා කවුද?

පි : මොහොමඩ් සහරාන්.

ප්‍ර : ඔබට මුණ ගැහිලා තියෙන්නේ මේ තැනැත්තා?

පි : මුණ ගැහිලා තියෙනවා.

ප්‍ර : අවස්ථා කීයකදී විතර ඔබට මුණගැහිලා තියෙනවද මොහොමඩ් සහරාන්?

පි : කිහිප අවස්ථාවක මුණ ගැහිලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : මම ඉදිරියට ප්‍රශ්න කරන්නේ ඉස්සරවෙලා මේ සිද්ධිය ගැන. ඔබට මම තව කැමතියි ඡායාරූපයක් පෙන්වන්න. මේකේ ඉන්නවද ඔය කියන තැනැත්තා? ඔබෙන් ගරු කොමසාරිස්තුමා ප්‍රශ්නයක් ඇහුවා. මේ සිද්ධියට අදාළව සුන්නත්වල් ජමාත් සංවිධානයේ සාමාජිකයනුත්, ඒ වගේම ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ සංවිධායකයනුත්, ඒ කියන්නේ ඒ සාමාජිකයනුත් ඔබේ අත් අඩංගුවට ගත්තද කියලා?

පි : අත් අඩංගුවට ගත්තා ස්වාමීනි.

ප්‍ර : එතකොට දැන් අපි අර ලකුණු කරලා ඉදිරිපත් කරානේ C-665 කියලා නඩු වාර්තාව නේද?

පි : ඔව් ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක B276/17 කියන නඩු වාර්තාව. එමගින් යම් සැකකරුවෙක් හෝ සැකකරුවන් ගරු අධිකරණයට ඉදිරිපත් කරලා තියෙනවද?

පි : සැකකරුවන් දෙදෙනෙකු ඉදිරිපත් කරලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : ඔබට මතකයක් තියෙනවද ඒ අය සුන්නත්වල් ජමාත් සංවිධානයේ අත් අඩංගුවට ගත්ත අයද නැත්නම් ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ...?

පි : ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ.

ප්‍ර : ඔය දෙන්නා?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : කවුද ඒ දෙන්නා?

පි : අහමඩ් මොහොමඩ් සෆ්රාන්, මොහොමඩ් රෆයිඩීන්.

ප්‍ර : ඒ අයගේ නම් සඳහන් වෙන්නේ ඔය C-665 එහෙම නැත්නම් C-666 කියලා සිංහලයට පරිවර්තනය කරලා තියෙන නඩු වාර්තාවේ කුමන ස්ථානයකද ප්‍රථමයෙන්ම සඳහන් වෙන්නේ? B වාර්තාවේ සඳහන් වෙනවනේ?

පි : ඔව්. මුල් B වාර්තාවේ අවසානයට සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර : ඔබ කියන්නේ ඔවුන් දෙදෙනාම ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ?

පි : ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ.

ප්‍ර : ඔබ කියනවා නම් සුන්නත්වල් ජමාත් සංවිධානයේ සාමාජිකයිනුත් මේ සිද්ධියට අදාළව අත් අඩංගුවට ගත්තා කියලා?

පි : අත් අඩංගුවට ගත්තා ස්වාමීනි.

ප්‍ර : ඔවුන්ව කොහොමද ගරු අධිකරණයට ඉදිරිපත් කළේ?

පි : ඔවුන්ව පසුව තමයි අත් අඩංගුවට ගත්තේ. මේ අවස්ථාවේදී නෙමෙයි. මේ B වාර්තාව ඉදිරිපත් කරන අවස්ථාවේදී නෙමෙයි.

ප්‍ර : ඒ කියන්නේ සිද්ධිය සිදුවුණ දවසෙම නෙමෙයි?

පි : සිදු වුණ දවසෙම නෙමෙයි ස්වාමීනි.

ප්‍ර : ඔවුන් පසු අවස්ථාවකදී?

පි : පසු අවස්ථාවේ.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : තවුහිද් ජමාත් සංවිධානයේ ජමීල් කියලා එක්කෙනෙකුත් අත් අඩංගුවට ගත්තාද?

පි : ජමීල් කියලා කෙනෙක් නැහැ ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : කොහොමත් තවුහිද් ජමාත් සංවිධානයේ දෙන්නයි, සේරම හතර දෙනයි?

පි : තව තවුහිද් ජමාත් සංවිධානයේ නම දෙනෙක් අත් අඩංගුවට ගත්තා.

ප්‍ර : පසුවද?

පි : පසුව ස්වාමීනි.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : දැන් ඔබට කියන්නට පුළුවන්ද ඔය මුල් අවස්ථාවේ ගත්ත දෙන්නට අමතරව 2017 මාර්තු මාසේ 12 වෙනිදා වෙනකොට තව සැකකරුවන් අත් අඩංගුවට ගැනීමක් සිදු වුණාද කියලා?

පි : සැකකරුවන් අත් අඩංගුවට ගැනීමක් සිදුවෙලා තියෙනවා ස්වාමීනි. සිදු වුණා.

ප්‍ර : අමතරව සැකකරුවෝ කී දෙනෙක් අත් අඩංගුවට අරන් තියෙනවද? ඔවුන්ගේ නම් මොනවද? ඔවුන් තවුහිද් ජමාත් සංවිධානයේ අයද? එහෙම නැත්නම් සුන්නත්වල් ජමාත් සංවිධානයේ අයද?

පි : ඊට අමතරව සැකකරුවන් හය දෙනෙක් අත් අඩංගුවට අරන් තියෙනවා ස්වාමීනි තවුහිද් ජමාත් සංවිධානයේ.

ප්‍ර : ඊට අමතරවද? නැහැ වැඩිපුර තව හතරක් ගත්තා. ඔක්කොම සංඛ්‍යාව හයයි. ඒකට අයිති වෙනවා මුලදින් ගත්ත දෙන්නත්. කියවලා බලන්න?

පි : පළමු අවස්ථාවේ අත් අඩංගුවට ගත් සැකකරුවන් දෙදෙනාට අමතරව තව සැකකරුවන් හය දෙනෙක් අත් අඩංගුවට අරන් තියෙනවා ස්වාමීනි.

ප්‍ර : ඒ කවදා වෙනකොටද?

පි : 2017.03.12 වෙනිදා වෙනකොට.

ප්‍ර : එතකොට ඔක්කොම එහෙනම් අට දෙනෙක් ඉන්නවා?

පි : අට දෙනෙක් අත් අඩංගුවට අරන් තියෙනවා ස්වාමීනි.

ප්‍ර : දැන් ඔය අට දෙනාගෙන් අර අමතරව ගත්ත හය දෙනා. පස්සේ ගත්ත හය දෙනා?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : ඒ හය දෙනා ඔය සංවිධාන දෙකෙන් මොන සංවිධානයටද අයිති?

පි : තවුහිද් ජමාත් සංවිධානයට.

ප්‍ර : ඔය සැකකරුවන්ගේ සංඛ්‍යාව නැවත යම් අවස්ථාවකදී තව වැඩි වුණාද? බලන්න අප්‍රේල් 06 වෙනිදා?

FAIR COMMENT BY JEZEEM

පි : 2017 අප්‍රේල් මාසේ 06 වෙනිදා වනවිට අත් අඩංගුවට ගත්ත සැකකරුවන් අට දෙනාට අමතරව තව සැකකරුවෙක් අත් අඩංගුවට ගෙන ඉදිරිපත් කරනවා ස්වාමිනි.

ප්‍ර : ඔහුගේ නම මොකක්ද?

පි : සැකකරුවෙකු ලෙසින් නම් කරනවා ස්වාමීනි.

ප්‍ර : ඔව්. කවුද එයාගේ නම? ඔහුව නම් කරලා තියෙනවා?

පි : නම් කරලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : ඒ නම් කරපු පුද්ගලයා කවුද?

පි : මොහොමඩ් කාසිම් මොහොමඩ් ෂයිනි.

ප්‍ර : මොන සංවිධානයෙන්ද ඔහු නම් කරලා තිබුණේ?

පි : තවුහිද් ජමාත් සංවිධානයෙන්.

ප්‍ර : ඔය සංඛ්‍යාව තව වැඩි වෙනවද පස්සේ? ජූනි මාසේ 30 වෙනිදා බලන්න?

පි : එම සැකකරුවන් නම දෙනාට අමතරව තවත් සැකකරුවන් තිදෙනෙකු නම් කරනවා ස්වාමීනි.

ප්‍ර : ඒ කවුරු කවුරුද?

පි : මොහොමඩ් කාසිම් මොහොම්මදු සහරාන්, මොහොම්මදු කාසීම් මොහොමදු රිල්වාන්, මොහොම්මදු මොහිදීන් නොහොත් ආමී මොහිදීන්.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : ඒ තිදෙනා සැකකරුවන් වශයෙන් නම් කළේ කවදද?

පි : 06.30 වෙනිදා ස්වාමීනි.

ප්‍ර : මුල් B වාර්තාව ඉදිරිපත් කළේ?

පි : 2017.03.11 වෙනිදා ස්වාමීනි.

ප්‍ර : එතකොට අර හය දෙනා ඇතුළත්, සහරාන් ඇතුළත් කළේ 06 වෙනි මාසේ? සහරානුයි, රිල්වානුයි, ආමී මොහිදිනුයි?

පි : 06 වෙනි මාසේ 30 වෙනි දින ස්වාමීනි.

ප්‍ර : ඇයි මාස 03 ක් ප්‍රමාද වුණේ එම සැකකරුවන් ඇතුළත් කිරීමට? ඇයි තමන්ලා හඳුනා ගන්න පුළුවන් හොඳට දන්න කට්ටියනේ? ඒ ප්‍රමාදය කියන්න?

පි : (පිළිතුරක් ලබා දුන්නේ නැත)

****

Present Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප : ප්‍රධාන පොලිස් පරීක්ෂක වෙදගෙදර මහත්මයා දැන් ඔබ අර පළවෙනි B වාර්තාවේ ඔබේ විමර්ශන තුළදී අනාවරණය වුණ කරුණු සංක්ෂිප්තව ගරු මහේස්ත්‍රාත්තුමාගේ අවධානයට යොමු කෙරුවනේ?

පි : යොමු කළා ස්වාමීනි.

ප : එතකොට ඔබ මීට ස්වල්ප වෙලාවකට පෙර මේ ගරු කොමිෂන් සභාවේ අවධානයට යොමු කෙරුවා එහෙම ඉදිරිපත් කරපු B වාර්තාවේ ඔබ දැනුම් දීලා තියෙනවා කියලා එමගින් අබුබකර් මොහොමදු මුනාබීර් කියන එක්කෙනා ඔහුගේ ප්‍රකාශය මගින් විමර්ශකයින්ට දැනුම් දුන්නයි කියලා ඔහුට පිහි ඇනුම සිදු කෙරුවේ මේ සහරාන් කියන තැනැත්තා කියලා?

පි : ඔව් ස්වාමීනි.

ප : එහෙම නම් ඔබේ විමර්ශකයින්ගේ දැනුම තුළ තිබුණා නේද 2017 මාර්තු මාසේ 11 වෙනිදා පළමුවන B වාර්තාව මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කරනකොට මේ තුවාලකරු එනම් අබුබකර් මොහොම්මදු මුනාබීර් කියන තැනැත්තාට තුවාල සිදු කරපු බවට වාර්තා වෙන්නේ ඔහු කියන ආකාරයට මේ සහරාන් විසින් කියලා?

පි : ඔව් ස්වාමීනි.

ප : ඒ වගේම ඔබ මගේ ප්‍රශ්නයකට පිළිතුරු දෙන ගමන් සඳහන් කෙරුවා මේ වාර්තාව මගින් ඔබ සඳහන් කරලා තියෙනවා කියලා එහි මෙම පාර්ශවයන් විසින් සිදු කරලා තියෙන වැරදි විදියට වැරදි ගොඩක් නේද? එමගින් ඔබ සඳහන් කරලා තියෙනවා නේද දණ්ඩ නීති සංග්‍රහයේ 315, 316, 317 කියන වැරදි?

පි : සඳහන් කරලා තියෙනවා ස්වාමීනි.

ප : එතකොට එහෙනම් මේ පිහි ඇනුමට අදාළව සිදු කරන ලද තුවාල ඔය කියන ලද වගන්තිවලින් යමකට වැටෙන්නට පුළුවන් නේද?

පි : ඔව්.

ප : එහෙම නම් ඇයි ප්‍රධාන පොලිස් පරීක්ෂකතුමනි සහරාන් පිළිබඳව ඔය B වාර්තාවේ සැකකරුවෙක් විදියට මුල් අවස්ථාවේදී ඔහුව නම් කරනු නොලැබුවේ? ඒ විතරක් නෙමෙයි. ස්වාමීනි උත්තරයක් නැහැ.

****

FAIR COMMENT BY JEZEEM

ගරු සභාපතිතුමා :

ප : උත්තරයක් නැහැ. ඒ අවස්ථාව වනවිට ඔහුටත් දේශපාලන පසුබිමක් තිබ්බද?

පි : එහෙම පසුබිමක් තිබ්බේ නැහැ ස්වාමීනි.

ප : කියන්න තියෙන එක මේ අවස්ථාවේදී කියන්න. පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව ඉස්සරහා දුන්න සාක්ෂි වගේ නෙමෙයි. මේ අවස්ථාවේදී දිවුරුම් පිට දෙන්නේ. මේ කොමිසමට යම්කිසි නිර්දේශ කරන්න පුළුවන් කියන එක මතක තියාගෙන ඇත්ත කියන්න.

පි : එහෙමයි ස්වාමීනි.

ප : ඇයි සහරාන්ව පළවෙනි අවස්ථාවේදීම සැකකරුවෙක් කෙරුවේ නැත්තේ සාක්ෂි තිබියදී?

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප : එය සුළු ප්‍රමාදයක් නෙමෙයි මාස තුනක ප්‍රමාදයක් තියෙන්නේ?

****

ගරු සභාපතිතුමා :

ප : උත්තරයක් දෙන්න?

පි : සමාවෙන්න ස්වාමීනි. මට දෙමළෙන් මේ තියෙන එක ටිකක් Translate කර ගන්න පුළුවන්ද දන්නේ නැහැ.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප : කොයි එකද ඕන?

පි : මේ මේක.

ප : ඒ වගේම කල්පනා කර ගන්න Arrest කරන්නේ නැතුව කෙනෙකු පුළුවන්ද කියලා නම දාන්න? සැකකරුවෙක් විදියට නම් කරන්න පුළුවන්ද විමර්ශනයේදී නම අනාවරණය වුණාට එයාට Arrest කරන්නේ නැතුව?

****

ගරු සභාපතිතුමා :

ප : දැන් ඔබ සහරාන්ව සැකකරුවෙක් වශයෙන් නම් කරන්නේ කවද්ද? 2017 ජූනි 30?

පි : ජූනි 30 ස්වාමීනි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට කාත්තන්කුඩි පොලිස් ස්ථානයෙන් ස්ථාන මාරුවක් ලැබෙන්නේ කවද්ද?

පි : 2017.07.26 ස්වාමීනි.

ප්‍ර : සහරාන්ව නම් කෙරුවහම මාසයක් ඇතුළත ඔබට ස්ථාන මාරුවක් හම්බ වෙනවා?

පි : ස්ථාන මාරුවක් හම්බ වුණා ස්වාමීනි.

ප්‍ර : ඉල්ලපු ස්ථාන මාරුවක්ද?

පි : ඉල්ලපු ස්ථාන මාරුවක් නෙමෙයි මට සාමාන්‍ය විදියට හම්බ වුණා ඒක.

ප්‍ර : මොකද්ද සාමාන්‍ය විදිය?

පි : මට ස්ථාන මාරුවක් ආවා ස්වාමීනි. ඒක ...,

ප්‍ර : වාර්ෂික ස්ථාන මාරුවක්ද?

පි : වාර්ෂික නෙමෙයි මම ඇවිල්ලා අවුරුදු තුන සම්පූර්ණයි. ඒත් එක්කම මේකේ දහසය දෙනෙක් අපේ ස්ථාන මාරුවීම් නියෝගයේ හිටියා ස්වාමීනි. විශේෂිත වූ හේතුවක් නැහැ ස්වාමීනි ඒකට.

ප්‍ර : ඉස්සරලා අර ප්‍රශ්නයට උත්තර දෙන්න. ඇයි සහරාන්ව සැකකරුවෙක් වශයෙන් නම් කරන්න මාස තුනක් ගියේ?

පි : අත් අඩංගුවට ගන්න හෙව්වා ස්වාමීනි ඒ වෙනකොට ස්ථාන කිහිපයකම.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : කොහේද හෙව්වේ?

පි : ඔහු ප්‍රදේශය මහහරිමින් ....,

ප්‍ර : එයා කිව්වනේ මගේ ඉස්සරලා අහපු ප්‍රශ්නයට උත්තර දෙන ගමන් කිව්වා එයා කාත්තන්කුඩිය 3 ප්‍රදේශයේ හිටියා කියලා පදිංචි වෙලා?

පි : ඔව්.

ප්‍ර : එතකොට එහෙමනම් කොහේද හෙව්වේ?

පි : ඔහුගේ නිවස, ඒ පල්ලිය, එතකොට ඒ ප්‍රදේශයේ තිබූ වෙනත් එයා යන එන තැන්. ඒ ස්ථානවල හෙව්වා ස්වාමීනි ඒ කාලසීමාව තුළ.

****

FAIR COMMENT BY JEZEEM

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප : මුල් B වාර්තාවේ තමන්ලා කිව්වාද මෙහෙම පැමිණිලිකාරයා මේ මේ කට්ටියගේ නම් කියලා තියෙනවා කියලා, කියලා තියෙනවද? අධිකරණයට ඉදිරිපත් වෙච්ච වාර්තාවේ තමන්ට පහර දුන් අයගේ පුද්ගලයින්ගේ නම්?

පි : කියලා තියෙනවා ස්වාමීනි.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප : එතකොට දැන් මේ මොහොමඩ් රිල්වානුත් පහර දුන්නයි ....?

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප : නැහැ නැහැ. එතකොට මාස තුනකට පස්සේ සැකකරුවෙකු වශයෙන් ඇතුළත් කළේ? එතකොටත් හොයාගෙන නැහැ නේද?

පි : හොයාගෙන නැහැ ස්වාමීනි. එතකොට ප්‍රදේශය මහහැරලා ගිහිල්ලා ඒගොල්ලෝ.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප : ඔබ ගරු කොමිෂන් සභාවට සඳහන් කරනු ලැබුවා මේ සහරාන් හෂීම්ව ඔබට අත් අඩංගුවට ගැනීම සඳහා විවිධ ස්ථානවල සොයා බැලුවයි කියලා?

පි : ඔව් ස්වාමීනි.

ප : දැන් කෙනෙක්ව ඒ වගේ අධිකරණය මහහරිනවා කියලා තේරෙනවා නම් එතකොට පොලීසිය විසින් යම් ඉල්ලීමක් කරනවද ගරු අධිකරණයට ඒ වගේ අවස්ථාවල?

පි : ඔව් ස්වාමීනි.

ප : මොකද්ද කරන්නේ කියලා ඉස්සරලා කියන්නකෝ. ඒක කියලා ඉවර වෙලා බලන්නකෝ ඕක. ඒ වගේ වෙලාවට මොකද කරන්නේ?

පි : විදේශගතවීම් වැළැක්වීම සඳහා ආගමන විගමන දෙපාර්තමේන්තුවට දැනුම් දීම, ඔහුගේ දුරකථන වාර්තා ලබා ගැනීමට ක්‍රියා කිරීම, ඔහුගේ හැඳුනුම්පත් අංකයට සිම්පත් ලබාගෙන ඇද්ද කියලා පරීක්ෂා කිරීම ඒ සම්බන්ධව ක්‍රියාකාරකම් කළා ස්වාමීනි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට දැන් සාමාන්‍යයෙන් පොලීසියට අධිකරණය විසින් පොලීසියේ ඉල්ලීම මත දින වරෙන්තු, විවෘත වරෙන්තු කියන දේවල් ලබා ගන්න පුළුවන් නේද?

පි : ලබා ගන්නවා ස්වාමීනි.

ප්‍ර : දින වරෙන්තු ලබා ගන්නේ මොන වගේ අවස්ථානුගත කරුණු යටතේද? මොකක්ද දින වරෙන්තුවක් කියන්නේ?

පි : එදින අත් අඩංගුවට ගැනීම සඳහා නිකුත් කරන වරෙන්තුවක්.

ප්‍ර : එතකොට එහෙමනම් ගරු අධිකරණය දින වරෙන්තුවක් නිකුත් කෙරුවොත්, ඒ කාලසීමාව සීමිතයි කියලා මා කිව්වොතින් නිවැරදිද?

පි : එය නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : ඒ නිශ්චිත දිනය පහු වුණාට පස්සේ එහෙම නම් පොලීසියට ඒ තැනැත්තාව අත් අඩංගුවට ගන්න බැහැ?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : ඒකට හේතුව වෙන්නේ ගරු අධිකරණය සඳහන් කරලා තියෙන කාලසීමාව තුළදී වෙන්න ඕන දින වරෙන්තුව යටතේ අත් අඩංගුවට ගන්න?

පි : ගැනීමට.

ප්‍ර : විවෘත වරෙන්තුව කියන්නේ මොකද්ද?

පි : එය ඕනෑම අවස්ථාවක අත් අඩංගුවට ගැනීම සඳහා නිකුත් කරන වරෙන්තුවක්.

ප්‍ර : විවෘත වරෙන්තුවක් නිකුත් කරහම ගරු අධිකරණයක් විසින් එය අපරාධ වාර්තා කොට්ඨාශයේ ලියාපදිංචි කිරීමක් කරනවද?

පි : ලියාපදිංචි කිරීමක් කරනවා ස්වාමීනි.

ප්‍ර : එතකොට ඒ වගේ ලියාපදිංචි කරනකොට ....?

පි : අපරාධ වාර්තා කොට්ඨාශයට දැනුම් දීමක් කරන්නේ නැහැ ස්වාමීනි. විවෘත වරෙන්තුවක් නිකුත් කරපුවාම අපරාධ වාර්තා කොට්ඨාශයට දැනුම් දීමක් කරන්නේ නැහැ ස්වාමීනි.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : ලියාපදිංචි අපරාධකරුවන් නිතර ....?

පි : ලියාපදිංචි අපරාධකරුවන් සම්බන්ධයෙන් දැනුම් දීමක් කරනවා. සොයා බැලීම සම්බන්ධවත්. විවෘත වරෙන්තුවක් සම්බන්ධයෙන් අපරාධ වාර්තා කොට්ඨාශයට දැනුම් දෙන්නේ නැහැ.

****

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : කෙරෙන්නේ නැහැ කියලා ඔබ කියන්නේ?

පි : ඔව්.

ප්‍ර : හොඳයි. කමක් නැහැ. නමුත් විවෘත වරෙන්තුවක් නිකුත් කරහම දිවයිනේ අනෙකුත් පොලිස් ස්ථානවලට ඒ විවෘත වරෙන්තුව බලපැවැත්වෙන බව අහවල් තැනැත්තාට විරුද්ධව විවෘත වරෙන්තුවක් මෙන්න මේ අධිකරණය විසින් නිකුත් කරලා තියෙනවයි කියලා දිවයිනේ තියෙන සියළුම පොලිස් ස්ථාන දැනුවත් කිරීමක් කරනවද? කාත්තන්කුඩිය පොලීසිය නැහැනේ ලංකාවේ හැමතැනම නේද? නමුත් සැකකරු හැමතැනම ඉන්න පුළුවන්?

පි : ඔහු, සැකකරුවෙක් අත් අඩංගුවට ගත්තට පස්සේ ඒ සම්බන්ධව අර පරිගණකයට ඇතුළත් කෙරුවට පස්සේ විවෘත වරෙන්තු නිකුත් වෙලා තියෙනවා නම්, පරිගණකය මගින් දැනුම් දීමක් කරනවා ස්වාමීනි ඒ සම්බන්ධව.

ප්‍ර : ඉතිං එතකොට එහෙම දැනුම් ....?

පි : ඒ විවෘත වරෙන්තුකරුවන් සම්බන්ධයෙන් නියාමනය කිරීමක් කරනවා.

ප්‍ර : ඉතිං ඔබේ ඔබ පිළිතුරම බලන්නකෝ. ඒ පිළිතුර අනිත් පැත්තට බැලුවොත් අනිත් පොලිස් ස්ථානවලට ඒ තැනැත්තාව අත් අඩංගුවට ගත්තාය කියලා කියන්නේ ඒ පිළිබඳව නොදැන හිටියොත් ඒ පොලිස් ස්ථාන ඒ තැනැත්තාව අත් අඩංගුවට ගන්න හින්දනේ? දැන් ඔබ කියන්නේ අනිත් පොලිස් ස්ථානවලට දැනුම් දෙනවා, විවෘත වරෙන්තුවක් නිකුත් කරලා තියෙන අවස්ථාවකදී ඒ තැනැත්තාව අත් අඩංගුවට අරන් තියෙනවා නම්?

පි : අනිත් පොලිස් ස්ථානවලට දැනුම් දීමක් කරන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර : දැන් ඉස්සරලා කිව්වේ?

පි : නැහැ. විවෘත වරෙන්තුකරුවන් සම්බන්ධයෙන් නියාමනය කිරීමක් සිද්ධ වෙනවා.

ප්‍ර : කොහොමද ඒක සිද්ධ වෙන්නේ?

පි : පරිගණකය හරහා.

ප්‍ර : කොහොමද පරිගණකය හරහා වෙන්නේ ඒක?

පි : විවෘත වරෙන්තුවක් නිකුත් වුණහම දැන් අපේ සැකපිට අත් අඩංගුවට ගැනීමක් සිදු කළොත් යම් පොලිස් ස්ථානයකින්. ඒක අපේ සැකකරුවන් නියාමනය කිරීම සම්බන්ධව ඒ Link එකට දැම්මහම ඔහුට විවෘත වරෙන්තු නිකුත් කරලා තියෙනවා නම් අපේ පොලිස් බල ප්‍රදේශයෙන් අපි ඒක කල් තියා නියාමනය

FAIR COMMENT BY JEZEEM

කරන පරිගණක දත්ත පද්ධතියට ඒක ඇතුල් කරලා තියෙනවා. එතකොට වෙනත් පොලිස් ස්ථානයකින් අත් අඩංගුවට ගැනීමක් කළොත් ස්වාමීනි ඔහුට ඒ අදාළ පොලිස් ස්ථානයේ විවෘත වරෙන්තුවක් තියෙනවා කියලා ඒකෙන් පෙන්නුම් කිරීමක් කරනවා.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : එතකොට ඒ පරිගණක පද්ධතියට විවෘත වරෙන්තුවක් තියෙනවා කියන එක ඇතුළත් කරන්නේ කවුද?

පි : ඇතුළත් කරන්නේ අදාළ පොලිස් ස්ථානයෙන් ස්වාමීනි.

ප්‍ර : ඒ කියන්නේ කාත්තන්කුඩි පොලිස් ස්ථානයේ ....?

පි : කාත්තන්කුඩි පොලිස් ස්ථානයේ නම් කාත්තන්කුඩි පොලිස් ස්ථානයෙන්. වෙනත් පොලිස් ස්ථානයෙන් නම් වෙනත් පොලිස් ස්ථානයකින්. අපේ VPN ක්‍රියාකරු හරහා ඒක සිද්ධ වෙනවා.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : ඉතිං එතකොට VPN එක හරහා හරි එහෙම දැනුම් දීමක් අනෙක් පොලිස් ස්ථානවලට කරනවනේ?

පි : කරනවා ස්වාමීනි.

ප්‍ර : එතකොට ඒ නිසා තමයි ඒ අය තැනැත්තාව අත් අඩංගුවට ගත්තහම එහෙම අත් අඩංගුවට ගත්ත බවක් අනෙක් පොලිස් ස්ථානවලට දැනුම් දෙන්නේ?

පි : නැහැ.

ප්‍ර : එහෙනම්?

පි : විවෘත වරෙන්තුවක් නිකුත් වුණහම අපි මෙවැනි පුද්ගලයෙකුට විවෘත වරෙන්තුවක් නිකුත් වුණා කියලා ඒ පුද්ගලයාගේ නම, හැඳුනුම්පත් අංකය අපි ඒ සියල්ල ඒ දත්ත පද්ධතියකට ඇතුළත් කරනවා ස්වාමීනි. ඒ ඇතුළත් කරහම දැන් වෙනත් පොලිස් ස්ථානයකින් සැක පිට අත් අඩංගුවට ගැනීමක් හෝ වෙනත් අත් අඩංගුවට ගැනීමක් සිදු කරපු අවස්ථාවක එම අත් අඩංගුවට ගත් පුද්ගලයාගේ නම සහ හැඳුනුම්පත් අංකය ඇතුළත් කළ වහාම අර පරිගණක දත්ත පද්ධතියෙන් පෙන්නුම් කිරීමක් කරනවා මෙම පුද්ගලයාට අහවල් පොලිස් ස්ථානයෙන් විවෘත වරෙන්තුවක් තියෙනවා කියලා. දැන් සැක පිට අත් අඩංගුවට ගැනීමක් සිදු වුණොත් ඒ විවෘත වරෙන්තුවත් පෙන්නුම් කරනවා. එතකොට ඒ

President Secretary's Copy
LAW COMMENT BY JEZEEM

පුද්ගලයා නිදහස් කරන්න ඉස්සරලා ඒ අදාළ පොලිස් ස්ථානයට ඒක දැනුම් දීමක් කරනවා.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : ඒ දත්ත ඇතුළත් කරන්නේ පොලිස් ස්ථානයේ පවත්වාගෙන යන දත්ත පද්ධතියකට නෙමෙයිනේ. ඒ කියන්නේ කාත්තන්කුඩි පොලීසියට වෙනම දත්ත පද්ධතියක් තියෙනවද?

පි : නැහැ ස්වාමීනි. ලංකාව පුරාම තියෙන දත්ත පද්ධතියක්.

ප්‍ර : එතකොට ඒක කවුද පවත්වාගෙන යන්නේ?

පි : ඒක පොලිස් මූලස්ථානය මගින් පවත්වාගෙන යන්නේ.

ප්‍ර : ඒ කියන්නේ ඒක අපරාධ වාර්තා කොට්ඨාශයේ?

පි : ඔව්.

ප්‍ර : ඒකට තමයි CRD එක කියන්නේ?

පි : CRD.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : හොඳයි. දැන් මම ඔබේ අවධානය යොමු කරන්නේ අර දින වරෙන්තු සහ විවෘත වරෙන්තුවලට නේද? එතකොට ඔබට මේ ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්නට පුළුවන්ද 2017.03.17 වෙනිදා යම් වරෙන්තුවක් ඉල්ලලා තියෙනවද කියලා සහරාන් හෂීම් සම්බන්ධයෙන්? මොහොමඩ් නැත්නම් මොහොමඩ් සහරාන් සම්බන්ධයෙන්? අර දිවයිනෙන් බැහැර වන්නට බැරි විදියේ වාරණ නියෝගයක් ලබා ගත්තේ?

පි : ඉල්ලලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : මොකද්ද ඉල්ලලා තියෙන්නේ. මොන වර්ගයේ වරෙන්තුවක්ද ඉල්ලලා තියෙන්නේ?

පි : සැකකරු විදේශගතවීම් වැළැක්වීම හා ගුවන් තොටුපලේදී අත් අඩංගුවට ගැනීම සඳහා පාලක, ආගමන විගමන දෙපාර්තමේන්තුවට නියෝගයක් හා වරෙන්තුවක් නිකුත් කරන ලෙස අයැද සිටිනවා.

ප්‍ර : එතකොට නිකුත් කරන්නේ මොන වගේ වරෙන්තුවක්ද?

පි : විවෘත වරෙන්තුවක් ස්වාමීනි.

ප්‍ර : විවෘත වරෙන්තුවට කාලසීමාවක් නැහැ?

පි : ඔව්.

Registrar's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඊළඟට එහෙම නම් දැන් ඒ ගැන දැනුම් දුන්නද ඔය VPN ජාලය හරහා ඔබේ දත්ත රැස් කරනු ලබන අපරාධ කොට්ඨාශයට මෙහෙම විවෘත වරෙන්තුවක් නිකුත් කරලා තියෙනවාය කියලා?

පි : විවෘත වරෙන්තුවක් නිකුත් කරන්න ඉල්ලීමක් කරලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : මිස්ට වෙදගෙදර මහන්සිද? දැන් ඔය දෙන හැම උත්තරයකින්ම තමන් යම් වැරැද්දක් කර ගත්තොත් තමන්ට තමයි ඒකේ වගකීම ගන්න වෙන්නේ. මට ඒකේ වගකීම ගන්න බැහැ. මොකද ඔය ලේඛන බලලනේ කියන්නේ. ඒ නිසා නිවැරදි දේ කියන්න?

පි : විවෘත වරෙන්තුවක් 2017.03.17 වෙනිදා ඉල්ලලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : කොහේද තියෙන්නේ?

පි : නමුත් නිකුත් කරලා නැහැ. මා විසින් 17 වෙනිදා මේ ඉල්ලීම කරාට පස්සේ චූදිත වරෙන්තුව ආගමන විගමන දෙපාර්තමේන්තුවට දැනුම් දෙන්න වරෙන්තුවක් නිකුත් කරලා තියෙනවා ස්වාමීනි දින වරෙන්තුවක්.

ප්‍ර : පොඩි ප්‍රශ්නයක් අහන්නද වෙදගෙර මහත්මයා. දැන් ඔය තියෙනවා නේද සංඥය වැරදි සහ සංඥය නොවන වැරදි කියලා. එතකොට සංඥය නොවන වැරදි, මම මතක තියා ගන්න විදිහටයි මම අහන්නේ. සංඥය නොවන වැරදි කියලා කියන්නේ වරෙන්තුවක් නොමැතිව අත් අඩංගුවට ගන්න බැරි ඒවා නේද?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : එතකොට සංඥය වැරදිවලට වරෙන්තුවක් ඕන නැහැ?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : ඔබ B වාර්තාවේ සඳහන් කරපු වැරදිවලින් කීයක් සංඥය වැරදි තියෙනවද?

පි : ස්වාමීනි මේක බලන්නේ නැතුව කියන්න අපහසුයි.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : ඉතිං බලන්න ඕක. ඔබ කියන්නේ අපරාධ නඩු විධාන සංග්‍රහය?

පි : සංග්‍රහය බලන්න ස්වාමීනි.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : අර සංඥය වැරදි තියෙනවා නම්, එතකොට ඔබට පුළුවන් නේද වරෙන්තුවක් නැතුව ඔහු අත් අඩංගුවට ගන්න?

Present Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : පුළුවන් ස්වාමීනි.

ප්‍ර : ඒ වගේ අවස්ථාවල්වලදී ගරු අධිකරණයක් ඔබ කොපමණ වරෙන්තු ඉල්ලුවත් ඒ විෂයෙහි වරෙන්තු නිකුත් කරන්නේ නැහැ නේද?

පි : නිකුත් කරන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර : දැන් එහෙම නම් ඔබ කියනවානේ 2017 මාර්තු මාසේ 17 වෙනිදා සහරාන් මොහොමඩ් සහරාන් සම්බන්ධයෙන් වරෙන්තුවක් ඉල්ලුවා කියලා?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : අධිකරණයෙන් නිකුත් කෙරුවද වරෙන්තුව?

පි : නිකුත් කළේ නැහැ එම අවස්ථාවේ.

ප්‍ර : නමුත් වාරණ නියෝගයක් දුන්නද විදේශ ගමන් තහනම් කරලා?

පි : දුන්නා ස්වාමීනි.

ප්‍ර : ඊළඟට ඔබ නැවත ඔබේ ධුර කාලය තුළදී කාත්තන්කුඩිය පොලීසියේ ස්ථානාධිපතිවරයා විදියට වරෙන්තුවක් ඉල්ලුවේ කොයි අවස්ථාවේද සහරාන් හෂීම් සම්බන්ධයෙන්

පි : 06 වෙනි මාසේ 30 වෙනිදා ඉල්ලලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : ගරු අධිකරණයෙන් නිකුත් කෙරුවද ඔබට ඒ වරෙන්තුව?

පි : නිකුත් කළේ නැහැ ස්වාමීනි.

ප්‍ර : එහෙම නම් ඒකට හේතුව ඔබ ගරු අධිකරණයට වාර්තා කරන ලද වැරදිවල සංඥය වැරදි සඳහන් වීම නෙමෙයිද? ඔබ හේතුවක් දන්නේ නැද්ද?

පි : සංඥය වැරදි සඳහන් වීම ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබ කිව්වා මුල් අවස්ථාවේදී උත්සාහ කෙරුවා කියලා මේ සහරාන් හෂීම්ව අත් අඩංගුවට ගන්න. නමුත් ඔහු සොයා ගන්නට බැරි වුණා කිව්වා. 2017.07.28 වෙනිදා ඔබට බිබිල පොලිස් ස්ථානයට ස්ථාන මාරුවක් ලැබුණා නේද?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : එහෙම නම් 2017 මාර්තු මාසේ 10 වෙනිදත්, ඒ කියන්නේ අලියාර් හන්දියේ මේ ගැටුම සිදු වුණ දවසේ ඒ සිදු වුණ දවසේ ඉඳලා 2017.07.28 වෙනිදා ඔබට ස්ථාන මාරුව ලැබෙනතුරු කොයි වෙලාවක හෝ ඔබට සහරාන් හෂීම් නැත්නම් මොහොමඩ් සහරාන් හෂීම්ව අත් අඩංගුවට ගැනීමට පුළුවන් වුණාද?

පි : නොහැකි වුණා ස්වාමීනි.

ප්‍ර : නොහැකි වුණා?

පි : ඔව්.

ප්‍ර : ඔබ උත්සාහයක්වත් දැරුවද ඔහුව අත් අඩංගුවට ගන්න?

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : මම උත්සාහයක් දැරුවා ස්වාමීනි.

ප්‍ර : කොයි ආකාරයටද ඒ උත්සාහය දැරුවේ කියලා මේ ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්න?

පි : මම තොරතුරුකරුවන් දැනුවත් කරා. ඊට අමතරව අනිකුත් ආගමික නිකායන්වල ඒ සාමාජිකයින් හම්බ වෙච්ච සෑම අවස්ථාවකම මම දැනුවත් කිරීම් කටයුතු කළා.

ප්‍ර : අනිකුත් ආගමික නිකායන් කියන්නේ?

පි : මම අර ඉහතින් සඳහන් කරපු අර නිකායන් 14 ක් මගේ මතකයේ හැටියට තියෙනවා කිව්වා. ඒ ආගමික වැඩ කටයුතු කරන අය, මම ඒ අයවළුන් දැනුවත් කරා.

ප්‍ර : රවුම් මවුලවීව දැනුවත් කරාද? ඒ කිව්වා නම් හම්බ වෙනවනේ?

පි : සුන්නත්වල් ජමාත් සංවිධානයේ රවුම් මවුලවී දැනුවත් කරා. එතනම ඉන්නවා සාමාජිකයින් 8000 ක් පමණ. ඒ අය ලංකාව පුරා විසිරිච්ච අය. මේ සහරාන් මවුලවී සම්බන්ධයෙන් තොරතුරු සොයන්න පුළුවන් හොඳම තොරතුරුකරුවන් ඒගොල්ලෝ, වින්දිත පාර්ශවයේ අය. ඒ සියළු දෙනා දැනුවත් කළා ස්වාමීනි.

ප්‍ර : නමුත් ප්‍රතිඵලයක් ලැබුණේ නැහැ කියලද කියන්නේ?

පි : අල්ලා ගැනීමට නොහැකි වුණා ස්වාමීනි.

ප්‍ර : දැන් ඒගොල්ලන්ට වැඩේ භාර දීලා ඔබ නිහඬව සිටියද? එහෙම නැත්නම් ඔබ අර ඊට වඩා තමන් ඉන්න තැනට වඩා ඉදිරියට ගිහිල්ලා මේ අවශ්‍ය වුණ කෙනෙකුට, පුද්ගලයින්ට තුවාල කරලා තියෙන මේ රැස්වීමක් නීත්‍යානුකූල නොවන ආකාරයට රැස්වීමක් පවත්වලා තියෙන ඒ තැනැත්තාව අත් අඩංගුවට ගන්නට සෑහෙන්න ප්‍රමාණවත් පියවර ගත්තද?

පි : හැකි උපරිම ශක්තිය යොදලා පියවර ගත්තා ස්වාමීනි.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : තමන්ලට ආමි මොහිදීනුයි, රිල්වානුයි අල්ල ගන්නට අමාරු වුණාද?

පි : අල්ල ගන්න අමාරු වුණා ස්වාමීනි.

****

ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා :

ප්‍ර : දැන් ඒ පිළිබඳව තමුන් තමුන්ගේ ඉහළ නිලධාරීන් දැනුවත් කළාද? ASP, SP, SSP, DIG, Senior DIG මේ කිසිවෙක් දැනුවත් කළාද මේ මනුස්සයට වරෙන්තු තියෙනවා. මේ මනුස්සයට වරෙන්තුවක් නිකුත් කරලා අල්ල ගන්නත් බැහැ, තොරතුරක්

FAIR COMMENT BY JEZEEM

නැහැ මොකද කරන්නේ කියලා දැනුවත් කරලා මොනවත් ඇහුවද උසස් නිලධාරීන්ගෙන්?

පි : නැහැ ඇහුවේ නැහැ.

ප්‍ර : ඇයි?

පි : මම සැකකරු අත් අඩංගුවට ගැනීමට උත්සාහ කළා ස්වාමීනි.

ප්‍ර : පෙට්‍රල් බෝම්බ ගහලා තියෙනවා, පීඩාකාරී ආයුධ තියාගෙන තියෙනවා, ඇපත් නැහැ. පීඩාකාරී ආයුධ පනත යටතේ ඇප දෙන්නත් බැහැ?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : එවැනි වැරදි සම්බන්ධයෙන් චෝදනා ලබලා තියෙද්දිත් අල්ල ගන්නත් බැරිනම්, සොයා ගන්නත් බැරිනම් තමුන්ට තිබුණා නේද තමුන්ගේ ඉහළ නිලධාරීන්ට පැමිණිලි කරන්න මෙහෙම තත්ත්වයක් තියෙනවයි කියලා?

පි : ස්වාමීනි මුල් අවස්ථාවේ දැනුවත් කිරීම් සිද්ධ කළා අත් අඩංගුවට ඔය සිද්ධිය සිදු වූ අවස්ථාවන්වලදී. ඊට පසුව ස්වාමීනි දැනුවත් කිරීම් සිදු කළේ නැහැ.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : කාවද දැනුවත් කරපු ඉහළ නිලධාරීන්?

පි : ස්වාමීනි අපේ උසස් නිලධාරීන්. සහකාර පොලිස් අධිකාරීතුමාගේ සිට ඉහළට.

ප්‍ර : නම් කරන්න?

පි : සහකාර පොලිස් අධිකාරී, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කොට්ඨාශ භාර.

ප්‍ර : නම් කරන්න. නම් මොනවද? දැනුවත් කරපු අයගේ නම් කියන්න අහවල් අහවල්?

පි : සහකාර පොලිස් අධිකාරී කුමාරසිරි මහත්මයා, එතකොට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සමන් යටවර මහත්මා, නියෝජ්‍ය පොලිස්පති ජාගොඩආරච්චි මහත්මා, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සුමිත් එදිරිසිංහ මහත්මා.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : ආමි මොහිදීන් ගැන තමන් කලින් ඉඳන් දැන හිටියද? ආමි මොහිදීන් ගැන?

Opposition Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ස්වාමීනි ඔව්. ආමි එකේ හිටිය පුද්ගලයෙක්. ඊට පෙර දැනගෙන හිටියා ස්වාමීනි.

ප්‍ර : ඔහු හා ආමි එක අතර තිබිච්ච සම්බන්ධය මොකද්ද?

පි : ස්වාමීනි ආමි එකේ ඉඳලා ආපු කෙනෙක්. ආමි එකේ ඔත්තුකාරයෙක් ඊට පස්සේ. ඒ නිසා මම දැනගෙන හිටියා ඔහු පළාත් සභා මන්ත්‍රීවරයෙක්ගේ ළඟ තමයි හිටියේ.

ප්‍ර : කවුද නම?

පි : සෙබ්ලි ෆාරුක්.

ප්‍ර : ඔහුගේ ළඟ කියන්නේ?

පි : එයාගේ ආවතේවකරුවෙක් විදියට තමයි හිටියේ.

****

ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා :

ප්‍ර : එතකොට සෙබ්ලි ෆාරුක් මහත්මයා කිව්වද මේ සහරාන්ව, ආමි මොහිදීන්ව අත් අඩංගුවට ගන්න එපා කියලා?

පි : නැහැ. කොයිම අවස්ථාවකවත් කියලා නැහැ ස්වාමීනි.

ප්‍ර : වෙන කවුරු හරි කිව්වද?

පි : නැහැ කියලා නැහැ. බලපෑමක් ඇවිල්ලා නැහැ.

****

දැන් වේලාව : ප.ව. 11.35 යි.
මෙතැන් සිට සටහන් කළේ මුතුමාලි මෙය

President Secretariat's Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව : ප.ව. 11.35 යි.
පෙර සටහන් ල/ලේ : ඉන්ද්‍රාණී මිය.
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : ඔවුන් ගැන විමසීමක් කෙරුවාද?
පි : නෑ ස්වාමිනි.
ප්‍ර : ඔහුට තිබ්බ බල ප්‍රදේශය මොකක්ද ඒ කියන්නේ ඔහු නැගෙනහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් නේද?
පි : ඔව්. කාත්තන්කුඩි ඉන්නේ නැගෙනහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක්.
ප්‍ර : ඒ කියන්නේ ඔහුගේ ප්‍රදේශය කාත්තන්කුඩි ?
පි : ප්‍රදේශය කාත්තන්කුඩි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මහතා</u>

ප්‍ර : හිස්බුල්ලා මහතා එක පාර්ශවයක් වෙනුවෙන් කතා කළාද අනිත් පාර්ශවය වෙනුවෙන් ?
පි : කතා කළේ නෑ ස්වාමිනි. කිසිම අවස්ථාවක බලපෑම් කරලා නෑ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : දැන් ඔබ අවුරුදු 03 ක් හිටියනේ කාත්තන්කුඩියේ?
පි : ඔව් ස්වාමිනි.
ප්‍ර : සහරාන්ගේ කණ්ඩායමට සම්බන්ධ නැත්නම් ඔවුන් අනුග්‍රහය ලබපු යම් කිසි දේශපාලඥයා හෝ දේශපාලන කණ්ඩායම මොකක්ද?
පි : මට පැහැදිලි වුණේ නෑ ස්වාමිනි.
ප්‍ර : ඔබ කිව්වනේ සහරාන්ට කණ්ඩායමක් තිබ්බා කියලා ජාතික තවුහිද් ජමාත් සංවිධානය?
පි : ඔව්.
ප්‍ර : එම කණ්ඩායමට අනුග්‍රහයක් දැක්වුවාද යම් දේශපාලඥයෙක් නැත්නම් දේශපාලන කණ්ඩායමක් කවුද ඒ?
පි : ඔව් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වැඩ කළා.
ප්‍ර : කොයි කාලේද?
පි : 2015 මැතිවරණ සමයේ.
ප්‍ර : ඒ කියන්නේ ජනාධිපති මැතිවරණය?
පි : ජනාධිපතිවරණ මැතිවරණ වේලාවේ.
ප්‍ර : ඒ කියන්නේ කොයි අපේක්ෂකවරයාට ද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : හිටපු ජනාධිපතිතුමා.

ප්‍ර : නම් කරන්න?

පි : මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ඒ පක්ෂයේ.

ප්‍ර : එතකොට ඒ වේදිකාවට ගොඩ වුණාද?

පි : වේදිකාවකට ගොඩවීමක් සිද්ධ වුණේ නෑ ස්වාමිනි.

ප්‍ර : එහෙනම් ඔබ මොනවද කියන්නේ වැඩ කෙරුවා කියලා?

පි : ඒ කාල සීමාවේ ඒ පක්ෂයට වැඩ කළා කියන්නේ එතකොට ඒ පිරිස මේ ගිවිසුමක් අත්සන් කළා. ඒ කාල සීමාවේ ඔය සහරාන් කියන පුද්ගලයා එතකොට අමාත්‍ය හිස්බුල්ලා මැතිතුමා එතකොට ඔය සිද්ධි පාරුක් PMGG පක්ෂයේ මිස්ටර් රහුමාන් ඒ ගොල්ලො ගිවිසුමක් අත්සන් කළා ස්වාමිනි සහරාන් යන අයට තියෙනවා ඡන්ද 2000 ක් 3000 කට ආසන්න ප්‍රමාණයක්. මැතිවරණයක් ආපුවාම ඒ දේශපාලන පක්ෂ ඒ ඡන්ද තියන අය නැඹුරු කර ගන්න ඒ අය හම්බ වෙන්න යනවා කතා කරනවා ඒ අවස්ථාවේදී මේ සහරාන් කියන පුද්ගලයා ඒ අත්සන් කරපු ගිවිසුම තමයි මේ ඒ මැතිවරණය පවත්වන කාල සීමාවේ ඒ ස්ටෙජ් වල රැස්වීම් තියන අවස්ථාවන් වල සිංදු දාන්න බෑ. එතකොට මේ එනවුස් කරන වේලාවට සිංදු කියන්න බෑ. එතකොට කාන්තාවන් ඒ meeting වලට කාන්තාවන් පිරිමි පාර්ශවය එකට ගෙන්වන්න බෑ. ඒ වගේ ඒ කරුණු කාරණාත් එක්ක මේ ගිවිසුමක් අත්සන් කළා ඒ සියළු දෙනා. ඉතින් ඔය හැම කෙනාම ඒකට ගියා. ඒ අවස්ථාවේ ඔය මේ හිස්බුල්ලා මහතාගේ ඒ පක්ෂේ ඒ කට්ටිය ඒ රැස්වීම පවත්වන අවස්ථාවක ඔය සිංදු දැම්මා කියලා ලොකු ප්‍රචාරණයක් අරන් ගියා ඒ කාල සීමාවේ ඡන්දේ දෙන්න එපා කියලා.

ප්‍ර : දැන් ඡන්ද පටලව ගන්න එපා.

පි : ඔව්.

ප්‍ර : 2015 මැතිවරණ කීයක් තිබ්බද?

පි : 01 යි.

ප්‍ර මොකක්ද? 2015 දී මැතිවරණ කීයක් තිබ්බද?

පි : මහ මැතිවරණයයි ජනාධිපතිවරණයයි ස්වාමිනි.

ප්‍ර : ඉස්සෙල්ලා තිබ්බේ මොකක්ද?

පි : මහ මැතිවරණය.

ප්‍ර : ඉස්සෙල්ලා ජනාධිපතිවරණය තිබ්බේ?

පි : ඔව්.

ප්‍ර : ඉස්සෙල්ලා ජනාධිපතිවරණයනේ තිබ්බේ? ඊට පස්සෙනේ මහ මැතිවරණය තිබ්බේ.

පි : මහ මැතිවරණය තිබ්බේ ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ජනාධිපතිවරණයේදී ඔබ කිව්වා සහරාන් කාට ද සහයෝගය දැක්වුයේ ?

පි : මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට.

ප්‍ර : ඔබ ඉස්සෙල්ලා කිව්වා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට කියලා ?

පි : ඔව්.

ප්‍ර : 2015 ජනවාරි මාසයේදී මෛත්‍රීපාල සිරිසේන මහතා ඡන්දය ඉල්ලුවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන්ද ?

පි : ඔව්.

ප්‍ර : පොඩ්ඩක් මතකය අවදි කරන්න. කවුද මෛත්‍රීපාල සිරිසේන මහත්මයාත් එක්ක ඉල්ලුවේ කවුද?

පි : මහින්ද රාජපක්ෂ මහත්මයා.

ප්‍ර : මහින්ද රාජපක්ෂ මහත්මයා ඉල්ලුවේ මොන පක්ෂයෙන්ද?

පි : පොදු ජන පෙරමුණෙන්.

ප්‍ර : පොදු ජන පෙරමුණත් තිබ්බේ නැනේ ඒ කාලේ?

පි : ඔව්.

ප්‍ර : කලබල වෙන්නේ නැතුව හොඳට මතක් කරලා කියන්න. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ඒ කාලේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලේකම් වෙලා හිටිපු බව ඇත්ත. නමුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් 2015 ජනාධිපතිවරණයට ඉල්ලුවේ කවුද? මහින්ද රාජපක්ෂ මහතා මොන පක්ෂයෙන්ද ඉල්ලුවේ? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් කියලා වෙනම අපේක්ෂකයෙක් හිටියාද?

පි : නෑ.

ප්‍ර : නෑ නේද?

පි : නෑ ස්වාමිනි.

ප්‍ර : එතකොට මෛත්‍රීපාල සිරිසේන මහත්මයා මොන පක්ෂයකින්ද නැත්නම් සන්ධානයකින්ද ඉල්ලුවේ?

පි : සන්ධානයකින් ඉල්ලුවේ.

ප්‍ර : එතකොට ඔබ අදහස් කරන්නේ මෛත්‍රීපාල සිරිසේන මහතාට සහයෝගය දැක්වුයේ සහරාන් ඒ සන්ධානයට ?

පි : සන්ධානයට

ප්‍ර : සන්ධානයට සහයෝගය දැක්වුවා?

පි : ඔව්.

ප්‍ර : කොයි විදිහටද ඒ සහයෝගය දැක්වුයේ?

පි : රැස්වීම් පැවැත්වුවා ස්වාමිනි මේ ගොල්ලො.

ප්‍ර : කවුද සහරාන්?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔහු ඔහුගේ කණ්ඩායමත් සමඟ රැස්වුණාද නැත්නම් ?

පි : ඔහුගේ කණ්ඩායමත් සමඟ

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ කියන්නේ ඔහු වෙනම රැස්වීම් මාලාවක් ගෙනිච්චද නැත්නම් අර සන්ධානයේ රැස්වීමේ වේදිකාවට නැංගාද?

පි : සන්ධානයේ වේදිකාවට නැංගා නෙවෙයි ස්වාමිනි. වෙනම රැස්වීම් මාලාවක් ගෙනිච්චා ඒ ගොල්ලො.

ප්‍ර : ගෙනියලා මොනවාද කිව්වේ මිනිසුන්ට?

පි : ඔය එතකොට හිස්බුල්ලා මහත්මයාට ඡන්දේ දෙන්න එපා කිව්වා.

ප්‍ර : 2015 ජනවාරි මාසයේ හිස්බුල්ලා මහත්මයා ජනාධිපතිවරණයට ඉල්ලුවාද?

පි : ඉල්ලුවේ නෑ.

ප්‍ර : එහෙනම් ජනවාරි හිස්බුල්ලා මහත්මයා ඡන්දේ දෙන්න එපා කියලා වැඩක් නැනේද?

පි : ඔව් එතකොට ඒ ප්‍රචාරණ කටයුතු කර ගෙන යන අවස්ථාවේදී ස්වාමිනි.

ප්‍ර : 2015 ජනවාරි මාසේ තිබ්බ ජනාධිපතිවරණයේ කවුද හිටපු අපේක්ෂකයන් මතකද?

පි : මහින්ද රාජපක්ෂ මහත්මයා හිටියේ.

ප්‍ර : අනිත් පැත්තට කවුද හිටියේ?

පි : මෛත්‍රීපාල සිරිසේන මහත්මයා.

ප්‍ර : එතකොට සහරාන්ගේ කණ්ඩායම කාට ඡන්දේ දෙන්න කියලාද කිව්වේ?

පි : මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට.

ප්‍ර : එතකොට ඔබ කියනවා ඒ රැස්වීම් තිබ්බේ සහරාන් තමන්ගේ කණ්ඩායමත් එක්ක කියලා?

පි : ඔව්.

ප්‍ර : මොකක්ද ඒ රැස්වීම් වල කිව්වේ?

පි : මේ ජනාධිපතිවරණයේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති කරන්න කියලා.

ප්‍ර : එතකොට ඊට පස්සෙනේ මහ මැතිවරණය එන්නේ?

පි : ඔව්.

ප්‍ර : මහ මැතිවරණයේදී සහරාන්ගේ කණ්ඩායම කාට හරි සහයෝගය දක්වනවාද?

පි : මට ඒක එච්චර මතකයක් අවදි වෙන්නේ නෑ ස්වාමිනි.

ප්‍ර : එතකොට දැන් ඔබ කිව්වනේ අර සහරාන්ගේ කණ්ඩායම දේශපාලඥයින් සමඟ ගිවිසුම් ගත වුණා කියලා?

පි : ඔව්.

ප්‍ර : ඒ ගිවිසුම් ගත වුණේ මොන මැතිවරණයටද? ජනාධිපතිවරණයටද නැත්නම් මහ මැතිවරණයටද?

පි : මහ මැතිවරණයට.

ප්‍ර : 2015 තිබ්බ මහ මැතිවරණයට?

Presidential Secretariat's Copy

FAIR COMMENT BY JEZEEM

පි : මහ මැතිවරණය.

ප්‍ර : එතකොට ඒ ගිවිසුම් ගත වුණේ මේ සහරාන්ගේ කණ්ඩායම මොන පක්ෂත් සමඟද නැත්නම් මොන දේශපාලඥයින් සමඟද?

පි : පී.එම්.ජී.ජී.රහුමාන් .

ප්‍ර : PMGG කියන්නේ මොකක්ද? NFGG National Front for Good Governance

පි : නෑ PMGG කියලා එකක් තියෙනවා ස්වාමිනි.

ප්‍ර : PMGG ?

පි : ඔව්.

ප්‍ර : ඒක මොකක්ද?

පි : ඒක මුස්ලිම් කොංග්‍රසය.

ප්‍ර : කවුද මුස්ලිම් කොංග්‍රසය රවුම් හකීම් සහරාන් එක්ක ගිවිසුමට අත්සන් කෙරුවද කවුරු හරි?

පි : ඔව් ඒ කාල සීමාව තුළ සිද්ධි ෆාරුක් ඒ කට්ටිය ඒ සියළු දෙනා ආවා ඒකට.

ප්‍ර : මොකටද ආවේ?

පි : ඒ ගිවිසුම අත්සන් කරන ඒ අවස්ථාවට.

ප්‍ර : වෙන කවුද ආවේ?

පි : හිස්බුල්ලා ඇමතිතුමා. එතකොට පී.එම්.ජී.ජී. මිස්ටර් රහුමාන්.

ප්‍ර : ජාතික දේශපාලඥයින් කවුද ආවේ ඒ කියන්නේ හිස්බුල්ලා මහත්මයා ඇරෙන්න වෙන කවුද ජාතික දේශපාලඥයින්?

පි : වෙන කෙනෙක් හිටියේ නෑ ස්වාමිනි එතන.

ප්‍ර : රවුම් හකීම් මහත්මයා හිටියාද?

පි : නෑ.

ප්‍ර : අනාවුල්ල මහත්මයා හිටියාද?

පි : නෑ. ඒ ප්‍රදේශයේ කට්ටිය විතරයි ස්වාමිනි.

ප්‍ර : එතකොට ඒ ගිවිසුමේ මොනවද තිබ්බේ කියලා දන්නවාද?

පි : ඔව් ඒ ගිවිසුම ඒ කාලේ මගේ දැනුමේ හැටියට ඔය ප්‍රචාරණය කිරීම් කටයුතු සිදු කරන අවස්ථාවල ඒ සිංදු ප්‍රචාරණය කිරීම තහනම්. එතකොට ඔය ඒ meeting වලට කාන්තාවන් සහභාගි කරවීම තහනම් කරලා අන්න ඒ වගේ දේවල් තමයි ස්වාමිනි දීලා තිබ්බේ.

ප්‍ර : එතකොට ඔබ ඒ කාත්තන්කුඩි ස්ථානාධිපතිවරයා වශයෙන් ඉන්න කොට නේද 2015 මහ මැතිවරණය තිබ්බේ?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : එතකොට මහ මැතිවරණයේදී පක්ෂයකට ඡන්දේ දීලා මනාපය පළ කරන්නත් ඕනීනේ?

පි : ඔව්.

Hansard Society's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට සහරාන්ගේ කණ්ඩායම කාටද සහයෝගය දැක්වුයේ?

පි : මට ඒ ගැන මතකයක් අවදි වෙන්නේ නෑ ස්වාමිනි.

ප්‍ර : හරි මහ මැතිවරණයෙන් පස්සේ යම් කිසි ගැටීමක් ඇති වුණාද?

පි : නෑ.

ප්‍ර : යම් කිසි පුද්ගලයෙකු ජාතික ලැයිස්තුවෙන් පත් කරන්න එපා කියලා යම් ගැටුමක් ඇති වුණාද?

පි : ඒ හිස්බුල්ලා මහත්මයා.

ප්‍ර : ඔව් මොකක්ද ඒ ගැටුම?

පි : නෑ එහෙම මතකයක් අවදි වෙන්නේ නෑ ස්වාමිනි.

ප්‍ර : දැන් සහරාන් හසීන්ගේ නම ඔබගේ අවධානයට යොමු වන්නේ 2017 මාර්තු 10 වෙනිදා වුණු සිද්ධිය සම්බන්ධයෙන් පමණද?

පි : නෑ. මේ මම ඒ පොලිස් සථානයට ගිය දවසේ ඉඳලාම ඒ නම මට ගැටෙනවා.

ප්‍ර : ඇයි ඒ?

පි : මේ meeting තියන්න තියෙන ඒ අවස්ථාත් එක්ක එතකොට මේ ඔහුගේ දේශන පවත්වන්න පවත්වලා ඔය වෙන ගැටීම් එක්ක මට ඒක වරින්වර ඒක එහෙම මට මුණ ගැහුණා ස්වාමිනි.

ප්‍ර : ඇයි ඔහුගේ දේශන පවත්වන කොට ගැටීම් ඇති වෙන්නේ?

පි : ඔහු අනිකුත් මේ ආගමික නිකායන්වල තියෙන වැරදි ප්‍රසිද්ධියේ විවේචනය කිරීම.

ප්‍ර : එතකොට ඒ කියන්නේ අනිකුත් ආගමික නිකායන් ඒ කියන්නේ මුස්ලිම් මතධාරීන් මුස්ලිම් ලබ්දිකයින් නෑ සමාවෙන්න ඉස්ලාම් ලබ්දිකයින් ඒ සහරාන්ට විරුද්ධ වුණාද?

පි : විරුද්ධ වුණා ස්වාමිනි.

ප්‍ර : මොන හේතුවක් මතද සහරාන් ඒ අනිත් ආගම් නිකායන්වලට විරුද්ධ වෙන්නේ?

පි : ඇහදිලි ක්‍රම සම්බන්ධව.

ප්‍ර : ඇදහිලි ක්‍රම සම්බන්ධව?

පි : ඇදහිලි ක්‍රම සම්බන්ධව. ඔය සොහොන් කොත් වන්දනාව එතකොට ඔය සංස්කෘතික වැඩසටහන් පැවැත්වීම, කාන්තාවන්ගේ මේ විවාහ මංගල කටයුතු වලදී දැවැදි ලබා ගැනීම අන්න ඒ වගේ දේවල් සම්බන්ධයෙන්.

ප්‍ර : එතකොට ඒ ගැටීම් වලදී සහරාන්ගේ නම ආවාම ඔහුව ඒ අවස්ථාවලදී අත්අඩංගුවට ගැනීමක් සිදු වන්නේ නැද්ද?

පි : අත්අඩංගුවට ගැනීමක් සිදු කරන්න තරම් එහෙම විශාල පැමිණිලි ලැබිලා නෑ ස්වාමිනි. මේ ඔය ආවේ රවුෆ් මවුලවිගේ පාර්ශවයෙන් ඔය අපහස කිරීමක් සම්බන්ධ පැමිණිලි තමයි මේ එහෙම meeting තියන අවස්ථාවල මේ ඒ අදාළ පාර්ශවලට අදාළ නිකායන්වලට තියෙන පල්ලි ආශ්‍රිතව ඒ වැඩි පිරිසක් ඉන්න

FAIR COMMENT BY JEZEEM

ප්‍රදේශයකට මේ අය ගිහිල්ලා රැස්වීමක් තියන්න ඉල්ලුවොත් ඒක වළක්වගන්න කටයුතු කළා.

ප්‍ර : එතකොට ඔබ කාත්තන්කුඩි පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වුණායින් පස්සේ එම ප්‍රදේශයේදී කලහාකාරී අවස්ථාවන් සිදු විය හැකි බොහෝ අවස්ථාවලට සම්බන්ධ විය හැකි පුද්ගලයෙක් වශයෙන් සහරාන් හසීන්ව ඔබ හඳුනා ගැනීමක් සිදු කළාද?

පි : නෑ ස්වාමිනි. පළවෙනි අවස්ථාව මේක තමයි ඔය 2017 තුන්වෙනි වෙනි මාසේ 10 වෙනිදා සිදුවීම.

ප්‍ර : නෑ මම කලහාකාරී කියන එකෙන් අදහස් කරන්නේ නෑ මේ එකිනෙකා ගහ ගැනීමක්. යම් කිසි කලබලයක් ඇති විය හැකි ස්ථානවල ඒක ඇති විය හැකි එක් පුද්ගලයෙක් සහරාන් හසීන් කියලා ඔබ හඳුනා ගන්නවාද?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : ඒ කියන්නේ 2014 ඉඳලා?

පි : ඔව් 2014 කාල සීමාව මගේ කාල සීමාව අවුරුදු තුනක කාලය තුළ.

ප්‍ර : එතකොට ඔබ සහරාන් හසීන් ගැන යම් කිසි අවස්ථාවකදී ඔබගේ ඉහළ නිලධාරීන් දැනුවත් කිරීමක් සිදු කරනවාද?

පි : නෑ ස්වාමිනි.

ප්‍ර : ඇයි නැත්තේ?

පි : එහෙම අවස්ථාවක් යෙදුණේ නෑ ස්වාමිනි එහෙම දැනුවත් කිරීමක් සිදු කරන්න.

ප්‍ර : අවශ්‍යතාවයක් තිබ්බේ නෑ?

පි : අවස්ථාවක් තිබුණේ නෑ එවැනි දෙයක් මට එහෙම හැඟීමක් ඇති වෙලා නෑ ස්වාමිනි.

****

<u>**ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා**</u>

ප්‍ර : මහත්මයා දැන් ඔය සහරාන් පිළිබඳව තොරතුරක් සොයා ගන්න බැරි වෙන කොට පොලිස් සේවයේ තියෙනවා නේද මේ පිළිබඳව පොලිස් අපරාධ බුද්ධි කොට්ඨාශයට දැනුම් දෙනවා එවැනි ක්‍රියාමාර්ගයක්වත් ගත්තාද?

පි : නෑ ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔය සහරාන් ඇත්ත වශයෙන්ම කාත්තන්කුඩි පළාතේවත් හිටියේ නැද්ද ඔබ කියන විදිහට?

පි : ඇත්ත වශයෙන්ම හිටියේ නෑ.

ප්‍ර : ආවේ ගියේ වත් නැද්ද?

පි : ආවේ ගියේ නෑ.

ප්‍ර : හොර රහසේවත්?

FAIR COMMENT BY JEZEEM

පි : හොර රහසේ කියන්නේ ස්වාමිනි එහෙම එනවා නම් මේ ඔය ඉන්න 60000 න් 40000 ක වත් ඇස් වහලා එන්න ඕනී. එහෙම නැත්නම් එන්න බෑ.

ප්‍ර : එතකොට ඔබ කියන්නේ ඔය කාත්තන්කුඩියේ හිටපු මිනිස්සු කිසිම කෙනෙක් මේ සහරාන් පිළිබඳ කිසිම තොරතුරක් දැන ගෙන හිටියේ නෑ කියලාද මේ මනුස්සයා කොහේද ඉන්නේ කියන එක?

පි : ස්වාමිනි දැන ගෙන හිටියා නම් තොරතුරක් අපිට ලැබෙන්න ඕනී. මේ අහවල් තැන ඉන්නවා කියලා මේ තොරතුරක් ලැබෙන්න ඕනී ස්වාමිනි.

ප්‍ර : ඔහුට හතුරෝ හිටියා නේද?

පි : සහරාන්ට හතුරෝ කියලා එහෙම විශේෂ පිරිසක් හිටියේ නෑ.

ප්‍ර : ඔහුට විරුද්ධ බලවේග තිබුණාද?

පි : විරුද්ධ බලවේග කියන්නේ ස්වාමිනි වෙනත් ආගමික නිකායන්වල ඒ සමාජිකයෝ තමයි.

ප්‍ර : ඔව් එතකොට අඩුම වශයෙන් ඒ අයවත් උනන්දු වුණේ නැද්ද මේ මිනිහා කොහේද ඉන්නේ කියන එක සොයලා දෙන්න ඔබලාට ?

පි : ස්වාමිනි බොහෝ අය උනන්දු වුණා සොයා ගන්න. මේ නමුත් එහෙම තොරතුරක්වත් හමු වුණේ නෑ ඒ කාල සීමාවේ.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මහතා</u>

ප්‍ර : සාක්ෂිකරු මේ 2017 අර සහරාන් සමඟ සිටි අය අතර මේ ස්වයං සාතනය සඳහා තවත් පුද්ගලයන් හිටියද ස්වයං සාතනයට සම්බන්ධ වී සිටි පුද්ගලයින් සිටිය බව තමුන් දන්නවාද?

පි : නෑ ස්වාමිනි.

ප්‍ර : 2017 දේපල පහර දීමක් වුණානේ?

පි : ඔව්.

ප්‍ර : එම ආරවුල වේලාවේ සිටි අය අතර තමුන්ට දැන ගන්න ලැබුණාද පසුව දැන් අප්‍රේල් 21 ප්‍රහාරයට සම්බන්ධව ස්වයං සාතනය කර ගනු ලැබූ පුද්ගලයින්?

පි : ඔව් රිල්වාන්.

ප්‍ර : කවුද ?

පි : රිල්වාන්.

ප්‍ර : රිල්වාන් විතරයිද?

පි : ඔව්.

ප්‍ර : සන්තුෂ් අසාද් තමන්ට මතක එක්කෙනයි?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : රිල්වාන් සහරානුයි, රිල්වාන්?

FAIR COMMENT BY JEZEEM

පි : ඔව්.

ප්‍ර : දැන් තමන් කිව්වා මොකක් හරි රැස්වීමක් තියෙන කොට පොලිසියේ ආරක්ෂාව ලබා දෙනවා කියලා?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : පොලිසියේ කීප දෙනෙකුත් දානවා කියල?

පි : ඔව්.

ප්‍ර : මේ 2017 සහරාන් රැස්වීමක් පවත්වන්න යන අවස්ථාවේදී ඇයි මේ මෙම සිද්ධිය සිදු වුණ අවස්ථාවේදී මේ නගරයේ විදීවල මේ තරම් ආරවුලක් වෙන වේලාවේදීත් පොලිසිය නොහිටියේ?

පි : ස්වාමිනි රැස්වීම පටන් ගන්න වේලාවට ඉස්සෙල්ලා මේ සිද්ධිව වුණේ රැස්වීම තියෙන වේලාවට නෙවෙයි. රැස්වීම පවත්වන්න එතන සංවිධානය කරන වේලාවේ.

ප්‍ර : සංවිධානය කරන වේලාවේ?

පි : ඔව්. පුටු අරගෙන ඇවිල්ලා පුටු දාලා ඒ එතන සුදානම් කරන අවස්ථාවේ.

ප්‍ර : තමන්ලාට පොලිසියේ ඉඳලා කොච්චර දුරද?

පි : පොලිසියේ ඉඳන් කිලෝ මීටර් එක හමාරක් වගේ තියෙන්නේ ස්වාමිනි.

ප්‍ර : තමන්ලාට මේ ආරවුල සිදු වන අවස්ථාවේදී පොලිසියට මෙම ස්ථානය පැමිණෙන්නට දැන ගත්තේ නැද්ද?

පි : දැන ගත්තා ස්වාමිනි. දැන ගත්ත අවස්ථාවේම ගියා අපි එතෙන්ට.

ප්‍ර : නමුත් අත්අඩංගුවට ගන්න බැරි වුණා?

පි : අත්අඩංගුවට ගන්න ස්වාමිනි එම අවස්ථාවේදී එතනින් දෙදෙනෙක් තමයි අත්අඩංගුවට අරන් තිබුණේ. මේ අනිත් අය අපි එතන විසුරුවා හරින්න තමයි මේ පූර්ණ උත්සාහයක යෙදුණේ පළවෙනි අවස්ථාවේ.

ප්‍ර : සහරාන් සමඟ තමන්ලාගේ පොලිසියට තමන් සමඟ නිතර පැමිණ කතා කරනවාද?

පි : නෑ ස්වාමිනි.

ප්‍ර : එක් අවස්ථාවක තමන් සම්බන්ධයෙන් රාජිත සේනාරත්න මහත්මයා චෝදනාවක් ගෙනාවා නේද සහරාන් සමඟ සම්බන්ධතාවයක් නිසා කියලා ඔහුව අත්අඩංගුවට ගැනීම වැළකුණේ? එහෙම චෝදනාවක් ගෙනාවාද තමන්ට දැන් මතක නෑ?

පි : නෑ නෑ ස්වාමිනි.

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු විනිසුරු අදිකාරි මහත්මිය</u>

ප්‍ර : වෙදගෙදර මහත්මයා ඔබගේ පොලිස් ස්ථානය යටතේ කොට්ඨාශ බුද්ධි ඒකකයක් ක්‍රියාත්මක වුණාද?

පි : බුද්ධි ඒකකයක් ක්‍රියාත්මක වුණා මැතිනියනි.

ප්‍ර : වෙන මොනවද තිබුණු බුද්ධි ඒකක පොලිස් ස්ථානයට අනුබද්ධව හෝ පොලිස් ස්ථානය විසින් සම්බන්ධීකරණයෙන් කටයුතු කරන ?

පි : කොට්ඨාශ බුද්ධි ඒකකයේ නිලධාරීන් විතරයි අපේ ඉන්නේ ගරු මැතිනියනි.

ප්‍ර : කී දෙනෙක් හිටියද?

පි : දෙදෙනයි.

ප්‍ර : දෙදෙනයි.

පි : ඔව්.

ප්‍ර : ඒ අය බුද්ධි තොරතුරු මේ සහරාන්ලා පිළිබඳව වාර්තා කරලා තිබුණාද ඔබට? බුද්ධි තොරතුරු ඔබගේ බුද්ධි නිලධාරීන් විසින් මේ විශේෂයෙන්ම සහරාන් ගැන හොයලා තිබුණාද?

පි : එහෙම විශේෂයෙන් හොයන්න අපට විශේෂිත වූ හේතුවක් තිබුණේ නෑ ස්වාමිනි මේ සහරාන් සම්බන්ධයෙන් ඒ කාල වකවානුව වන විට ඒ සම්බන්ධව තොරතුරක් සොයා ගත්තත් ඒක කොට්ඨාශ බුද්ධි ඒකකය හරහා උඩට දැනුම් දෙනවා මිසක් ඒක අපි හරහා දැනුම් දීමක් කරන්නේ නෑ.

ප්‍ර : කාටද දැනුම් දෙන්නේ?

පි : ඒක කොට්ඨාශ බුද්ධි ඒකකයේ OIC කෙනෙක් ඉන්නවා ස්වාමිනි වෙනම.

ප්‍ර : එයා කාටද වාර්තා කරන්නේ?

පි : එයා කොට්ඨාශ භාර නිලධාරීතුමාට.

ප්‍ර : පොලිස් ස්ථානාධිපතිතුමා කොට්ඨාශ බුද්ධි අංශයේ ප්‍රධානියාගෙන් අහන්නේ නැද්ද මෙම ඒකකයේ බුද්ධි තොරතුරු මොනවා හරි තියෙනවාද කියලා?

පි : ස්වාමිනි එහෙම තිබ්බොත් එහෙම විශේෂිත තොරතුරක් තිබ්බොත් කොට්ඨාශ බුද්ධි අංශයේ රැස්වීමක් තිබ්බ වේලාවක අපේ තියෙන OIC ලාට තියෙන මේ conference වලට ඒ කොට්ඨාශ බුද්ධි ඒකකයේ OIC ගෙන්වනවා. ගෙන්වලා එම ස්ථානයේ ඉඳන් ඒ තොරතුරු ලබා දෙනවා ස්වාමිනි.

ප්‍ර : දැන් නැගෙනහිර පළාතේ නැගෙනහිර ආඥා දායකයා ලෙස නැගෙනහිර හමුදාවේ මේජර් ජෙනරාල් කියන ලාල් පෙරේරා මහතාව ඔබ දන්නවාද ඔබ ඔය කාත්තකුඩියේ රාජකාරි කරපු කාලයේදී?

පි : මට හම්බ වෙලා නෑ ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : හම්බ වේලාම නෑ

පි : නෑ.

ප්‍ර : ඔබගේ බුද්ධි නිලධාරීන් ඔය මේජර් ජෙනරාල් ලාල් පෙරේරා මහතා විසින් පැවැත්වූ බුද්ධි තොරතුරු සමාලෝචන රැස්වීම් වලට සහභාගි වුණාද?

පි : මා දැනුවත්ව සහභාගි වීමක් සිදු වුණාද කියලා මම දන්නේ නෑ ස්වාමිනි එහෙම සහභාගි වෙනවා නම් කොටියාශ බුද්ධි ඒකකය හරහා තමයි ඒ සම්බන්ධ වීම සිද්ධ වෙන්නේ. පොලිස් ස්ථාන භාර ස්ථානාධිපතිවරුන් හරහා ඒ සිදු වීම සිද්ධ වෙන්නේ නෑ.

ප්‍ර : දැන් ඔබට කියලා යන්නේ නැද්ද යනකොට රැස්වීමකට?

පි : කොටියාශ බුද්ධි ඒකකයේ රැස්වීමක් තිබ්බොත් කියලා යනවා.

ප්‍ර : නෑ නෑ කොටියාශ බුද්ධි ඒකකයේ රැස්වීමක් නෙවෙයි දැන් ඔය නැගෙනහිර පළාතේ යුධ හමුදාවේ ප්‍රධානියෙකු ලෙස සේවය කරපු මේජර් ජෙනරාල් ලාල් පෙරේරා මහතා සියළුම බුද්ධි ඒකක සමඟ සම්බන්ධීකරණයෙන් බුද්ධි තොරතුරු සොයා බැලීමේ ප්‍රගතිය පිළිබඳව කටයුතු කරලා තිබෙනවා කියලා මෙම කොමිෂමට වාර්තා වෙලා තියෙනවා.

පි : ඔව් ගරු මැතිනියනි.

ප්‍ර : එතකොට ඔබගේ බුද්ධි නිලධාරීන් අර කොටියාශ බුද්ධි ඒකකයේ ප්‍රධානියා සහ හෝ කවුරුහරි ගියාද ඒ රැස්වීම් වලට?

පි : නෑ මා දැනුවත්ව ගිහිල්ලා නෑ ගරු මැතිනියනි.

ප්‍ර : යනවා නම් ඔබව දැනුවත් කරනවා නේද?

පි : යනවා නම් බොහෝ දුරට මාව දැනුවත් කරනවා.

ප්‍ර : ඒ කියන්නේ එහෙම රැස්වීමක්

පි : මා දැනුවත්ව

ප්‍ර : නැද්ද?

පි : ගිහිල්ලා නෑ ගරු මැතිනියනි.

ප්‍ර : ඔබට ඔබ අඳුරනවාද අබ්දුල් රාසීක් කියලා එක්කෙනෙක්ව?

පි : නෑ ගරු මැතිනියනි.

ප්‍ර : මේ සහරාන්ලාගේ සමකාලීකයෙක් ඔය ජාතික තවුහිද් ජමාත් සංවිධානයේම වෙනත් නමකින් තිබ්බ්ච කාත්තන්කුඩිය ප්‍රදේශයේ ක්‍රියාතමක වෙච්ච?

පි : නෑ ගරු මැතිතියනි දන්නේ නෑ.

ප්‍ර : ඔබ අබ්දුල් රාසීක් කියලා කෙනෙක් ගැන අහලම නැද්ද?

පි : අහලා තියෙනවා ගරු මැතිනියනි මේ අපේ ජනමාධ්‍ය හරහා. මේ බලනකොට තවුහිද් ජමාත් සංවිධානයේ ලේකම් හැටියට. ඊට අමතරව වෙනත් දැනුමක් නෑ.

ප්‍ර : කාත්නකුඩිය ප්‍රදේශයේදී ඔහු ඇවිල්ලා නැද්ද ඔබව හම්බ වෙන්න?

FAIR COMMENT BY JEZEEM

පි : නෑ ගරු මැතිනියනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනි සිටින උගත් ජනාධිපති නීතිඥවරයාට අවශ්‍ය දැයි විමසමි. අවශ්‍ය නොවන බව පවසයි.

සාක්ෂිකරුව මුදා හරමි.
දැන් වේලාව : මධ්‍යම රාත්‍රී 12.00 යි.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන් තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය: 2020.06.16 වේලාව: මධ්‍යම රාත්‍රී 12.00 යි.
සටහන් කළේ ල/ලේ - මුතුමාලි

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා -සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

පෙනී සිටීම:-

* අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, චතුරංග බණ්ඩාර මහතා, දිලන්ත එස්.කළුදුරුවගේ මහතා සහ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සාක්ෂි අංකය	:	276
නම	:	**ජයතිලකගේ සෝමසිරි ජයලත් ඉහළගම**
වයස	:	**අවුරුදු 39 යි.**
ආගම	:	**බෞද්ධ**
රැකියාව	:	**පොලිස් සැරයන්. 15468 ඉහළගම.**
ලිපිනය	:	**කාත්තන්කුඩි පොලිස් ස්ථානය.**

සාක්ෂිකරු ප්‍රතිඥා දී කැඳවයි.

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>

ප්‍ර : ඉහළගම මහත්මයා ?

පි : ඔව් සර්.

ප්‍ර : ඔබ ශ්‍රී ලංකා පොලිසිය සමඟ සම්බන්ධ වෙන්නේ කුමන වකවානුවේදීද?

පි : ස්වාමිනි මම 2000/11/19 වෙන දින පොලිස් සේවයට බැඳෙන්නේ.

ප්‍ර : ඔබ මූලික පුහුණුව ලබා ගැනීමෙන් අනතුරුව කුමන පොලිස් ස්ථානවලද වැඩ කරන්නේ?

පි : ස්වාමිනි මූලික පුහුණු වීම ලබන්නේ නිකවැරටිය පොලිස් අභ්‍යාස විද්‍යාලයේ. පසුව මා ප්‍රථමයෙන් වැලිකඩ පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරී කර මිරිහාන පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරී කර පසුව මඩකලපුව කොට්ඨාශයට ස්ථාන මාරු වීම් ලබා නැවත අගමැති ආරක්ෂක කොට්ඨාශයට ස්ථාන මාරුවීම් ලබා පැමිණ ජනාධිපති ආරක්ෂක අංශයට අනුයුක්තව රාජකාරී කර නැවත ත්‍රිකුණාමල කොට්ඨාශයට ස්ථාන මාරුවීම් ලබා පිටව යනවා. පසුව මා නැවත අනුරාධපුර කොට්ඨාශයට ස්ථාන මාරුවීම් ලබා පැමිණ නැවතත් ත්‍රිකුණාමල කොට්ඨාශයට ස්ථාන මාරුවීම් ලබා පැමිණියා අවසන් වශයෙන් මඩකලපුව කොට්ඨාශයේ කාත්තන්කුඩිය පොලිස් ස්ථානයට අනුයුක්තව දැනට රාජකාරී කරනවා.

ප්‍ර : ඔබ 2005 වර්ෂයේ මඩකලපුව පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරී කළාද?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : ඉන් අනතුරුව 2013 සිට මේ දක්වා වසර 07 කට ආසන්න කාලයක් දිගටම කාත්තන්කුඩිය පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරී කරනවා කිව්වොත් මම නිවැරදිද?

පි : එසේය ස්වාමිනි.

President's Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබ 2013 වර්ෂයේදී කාත්තන්කුඩිය පොලිස් ස්ථානයට අනුයුක්තව මුලින්ම ඔබට පැවරුණු රාජකාරී මොනවාද මහත්මයා?

පි : මුලින්ම ස්වාමිනි මම කාත්තන්කුඩිය පොලිස් ස්ථානයට 2013/07 වෙනි මාසේ 26 හෝ 28 ආසන්න දිනකදී මා ස්ථාන මාරුවීම් ලබා පැමිණෙනවා. පැමිණ මම සතියක් වැනි කාලයක් තුළ සාමාන්‍ය රාජකාරී කර එතැන් සිට කොට්ඨාශ බුද්ධි අංශයට අනුයුක්තව 2017 මැයි මාසේ දක්වා මම රාජකාරී කරනවා.

ප්‍ර : සරලව කිව්වොත් 2013 වර්ෂයේ මැද භාගයේ ඉඳලා 2017 වර්ෂයේ මැද භාගය විතර වෙනකල් ආසන්න වශයෙන් අවුරුදු 04 ක කාලයක් ඔබ කොට්ඨාශ බුද්ධි අංශයට අනුයුක්තව කාත්තන්කුඩිය පොලිස් ස්ථානයේ රාජකාරී කළා කිව්වොත් නිවැරදිද?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : මහත්මයා ඔබට සරලව පැහැදිලි කරන්න පුළුවන්ද මේ කොමිෂන් සභාවට මේ කොට්ඨාශ බුද්ධි අංශය කොහොමද සකස් වෙලා තියෙන්නේ කියලා?

පි : මම දන්න විදිහට ස්වාමිනි මෙම කොට්ඨාශ බුද්ධි අංශය ක්‍රියාත්මක වෙන්නේ කොට්ඨාශයේ සිටින කොට්ඨාශ භාර නිලධාරීයා .

ප්‍ර : කවුද මේ කොට්ඨාශ බුද්ධි අංශයේ ප්‍රධානීයා?

පි : කොට්ඨාශ බුද්ධි අංශයේ ප්‍රධානීයා වශයෙන් මම හිතන්නේ ස්වාමිනි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයෙකු හෝ කොට්ඨාශය භාරව සිටින පොලිස් අධිකාරිතුමා යටතේ තමා මෙම බුද්ධි අංශය ක්‍රියාත්මක වෙන්නේ.

ප්‍ර : ඔබ ඉන්න කාලේ කවුද ඒ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීතුමා?

පි : මම ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරුන් කීප දෙනෙක් යටතේ ඒ කාලය තුළ සේවය කළා. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ජයසිංහ මහත්මයා, කරුණානායක මහතමයා වගේ මහත්වරු යටතේ මම සේවය කළා මේ වෙනකල්.

ප්‍ර : ඒ කියන්නේ කොට්ඨාශ බුද්ධි අංශයේ ඉහළින්ම ඉන්නේ මේ කොට්ඨාශය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිතුමා? ඉන් පසුව ඔහුට යටින් පරිපාලන ව්‍යුහය දෙවෙනියට ඉන්නේ කවුද?

පි : දෙවෙනියට ස්වාමිනි කොට්ඨාශය බුද්ධි අංශයට ස්ථානාධිපතිවරයෙක් පත් කරනවා . මම සේවය කළේ උපපොලිස් පරීක්ෂක රහීම් මහතා යටතේ එතුමා තමයි කොට්ඨාශ බුද්ධි අංශයේ ස්ථානාධිපතිතුමා ලෙස එම කාලයේදි එතුමා යටතේ තමයි මම සේවය කළේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් මේ කොට්ඨාශ බුද්ධි අංශයේ ස්ථානාධිපතිවරයා යටතේ තව කවුද ඉන්නේ පොලිස් නිලධාරීන්?

පි : ස්වාමිනි කොට්ඨාශ බුද්ධි අංශයේ ස්ථානාධිපතිවරයා යටතේ එක පොලිස් ස්ථානයකට බුද්ධි අංශ නිලධාරීන් දෙදෙනෙක් බැගින් මම හිතන විදහට මඩකලපුව කොට්ඨාශය තුළ පොලිස් ස්ථාන 12 ක් තිබුණා එම 12 යේ බුද්ධි අංශ නිලධාරීන් දෙදෙනා බැගින් 24 ක් හා කාර්යාලයේ තව සේවය කළා බුද්ධි නිලධාරීන් දෙදෙනෙක්. 26 දෙනෙක් පමණ එම කොට්ඨාශයේ බුද්ධි අංශයට අනුයුක්තව මම සේවය කළ කාලයේ සේවය කළා.

ප්‍ර : දැන් මේ කොට්ඨාශ බුද්ධි අංශයට අනුයුක්තව ඔබලා රාජකාරී කරන කොට ඔබලාට පැවරීලා තියෙන Mandate එක නැත්නම් ඔබලාගේ කාර්ය භාරය මොකක්ද කියලා මේ ගරු කොමිෂන් සභාවට ප්‍රකාශ කරන්න පුළුවන්ද?

පි : ස්වාමිනි මම කොට්ඨාශයේ බුද්ධි අංශයට බැඳුනේ ස්ථානයේ සිටි ස්ථානාධිපතිවරයාගේ නියෝගයක් මත තමයි කොට්ඨාශ බුද්ධි අංශයට බැඳුනේ. එම කොට්ඨාශයේ බුද්ධි අංශයේ ස්ථානාධිපතිතුමා විසින් සෑම සතියක අග සෙනසුරාදා දින කොට්ඨාශ බුද්ධි අංශයේ රැස්වීමක් පවත්වනවා. එම රැස්වීම පවත්වන කාලය තුළ අපි ඒකට සහභාගි වෙනවා. එම සහභාගි වෙන අවස්ථාවේදී එතුමා විසින් අපට නියෝග ලබා දෙනවා. ඔබ පොලිස් වසමේ තියෙන පුනරුත්ථාපනය ලැබූ හෝ නොලැබූ LTTE සැකකරුවන් සම්බන්ධයෙන් පසු විපරම් කරන්න කියලා දැනුම් දෙනවා. තව ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් පැන නඟින ප්‍රශ්න සම්බන්ධයෙන් සොයා බලන්න කියලා දැනුම් දීමක් කරනවා. තව යම් කිසි සංවිධාන සාමය කඩ වෙන අයුරින් යම් කිසි ක්‍රියාත්මක වෙන සංවිධාන සම්බන්ධයෙන් තොරතුරු ලබා දීම මඟින් විශේෂ අපරාධ සම්බන්ධයෙන් තොරතුරු ලබා දෙන්න කියලා අපිට දැනුම් දීමක් කරනවා.

ප්‍ර : දැන් ඔබ පැහැදිලි කළා ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් . ප්‍රදේශයේ සාමය කඩවීම හා සම්බන්ධයෙන් වැනි තොරතුරු වැනි කාරණා ගැන ඔබලාට බුද්ධි තොරතුරු ලබා දීමට ඔබලාට නියෝග ලබා දෙනවා කියලා මේ කොට්ඨාශ බුද්ධි අංශයේ ස්ථානාධිපති?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : දැන් ඒ ලබා දෙන නියෝග ලබා දෙන්නේ ලිඛිතවද නැත්නම් වාචික නියෝගද ලබා දෙන්නේ කොහොමද මේ නියෝග ලබා දීම සිද්ධ වෙන්නේ?

පි : වාචිකවයි ස්වාමිනි නියෝග ලබා දෙන්නේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ අනුව ඔබලා කරන රාජකාරී සම්බන්ධයෙන් යම් කිසි ලිඛිත වාර්තාවක් ඔබලා සපයනවාද මේ කොට්ඨාශ බුද්ධි අංශයේ ස්ථානාධිපතිට?

පි : නැත ස්වාමිනි අදාළ අපි යම්කිසි තොරතුරක් අනාවරණය කර ගත්තොත් ඒ තොරතුර අපි කොට්ඨාශ බුද්ධි අංශයේ යතුරු ලියනය කරන අපේ එම නිලධාරීයා හට ලබා දෙනවා. එය ලිඛිතව ලබා දෙන්නේ නෑ ස්වාමිනි අදාළ තොරතුර පමණයි ලබා දෙන්නේ කොට්ඨාශ බුද්ධි අංශයේ එම පරිගණකය මඟින් තමා එම තොරතුර මුද්‍රණය කර කොට්ඨාශ භාර නිලධාරීතුමා වෙත යොමු කරන්නේ.

ප්‍ර : දැන් ඔබ කාත්තන්කුඩි පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරී කරන කොට ඔබ මේ බුද්ධි තොරතුරු ලබා ගැනීමට තොරතුරුකරුවන් Establish කළේ නැත්නම් තොරතුරුකරුවන් හඳුනා ගත්තේ කොයි ආකාරයටද?

පි : මම සාමාන්‍යයෙන් ස්වාමිනි කාත්තන්කුඩිය පොලිස් ස්ථානයේ ග්‍රාම සේවා වසම් 58 ක් පමණ ඒ දවස්වල තිබුණා. අපිට කොට්ඨාශ බුද්ධි අංශයේ ස්ථානාධිපති විසින් දැනුම් දුන්නා ඔබ මෙම ග්‍රාම නිලධාරී වසම් 58 න් එක එක තොරතුරු කාරයෝ බැගින් පත් කර ගන්නා ලෙසත් ඔවුන් මාර්ගයෙන් ඉහත අප හට දැනුම් දුන් තොරතුරු අනුව බුද්ධි තොරතුරු රැස් කර ගන්නා ලෙසත් උපදෙස් ලබා දී තිබෙනවා.

ප්‍ර : ඒ අනුව ඔබ මේ කොට්ඨාශ බුද්ධි අංශය තුළින් මේ ඇති කර ගන්නා වූ තොරතුරුකරුවන්ට ගෙවීම් එහෙම සිද්ධ කරන්න හැකියාවක් තියෙනවාද?

පි : එසේ කිසිම ගෙවීමක් කරන්නේ නෑ ස්වාමිනි.

ප්‍ර : ගෙවීමක් කරන්නේ නැහැ?

පි : නැත ස්වාමිනි.

ප්‍ර : ඒ කියන්නේ ඇඳුනුම්කමට තමයි තොරතුරු ලබා ගන්නවා කිව්වොත හරිද?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : මහත්මයා ඔබ දැන් කොට්ඨාශ බුද්ධි අංශයට අනුයුක්තව 2013 සිට 2017 දක්වා රාජකාරී කටයුතු කළානේ? එහිදී මේ කාත්තන්කුඩි ප්‍රදේශයේ සහරාන් යන පුද්ගලයා ගැන ඔබට මුලින්ම තොරතුරු අනාවරණය වෙන්නේ කොයි වකවානුවේද?

පි : ස්වාමිනි සහරාන් කියන තැනැත්තා මම එතන මට මතකය හැටියට 2016 අවුරුද්දේ තමයි මම ඔහුගේ ක්‍රියාකාරීත්වය මම සිටි කාලය තුළ ප්‍රධාන වශයෙන් ඔහුගේ පෙනුනේ. ඔහු සෑම සිකුරාදා දිනකම හවස් යාමයේ ඔහුගේ මතය ප්‍රකාශ කරමින්

FAIR COMMENT BY JEZEEM

මහජනතාව විශේෂ වශයෙන් ගැවසෙන ස්ථානවල රැස්වීම් පවත්වා ඔහු ඔහුගේ මතවාදය ප්‍රචාරය කළා.

ප්‍ර : හරි දැන් මේ සහරාන් යන පුද්ගලයා ඔබ කිව්වනේ රැස්වීම් පවත්වනවා කියලා ?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : මේ රැස්වීම් පවත්වන්නේ කොහේද?

පි : ස්වාමිනි මහජනයා විශාල වශයෙන් ගැවසෙන තැන්. උදාහරණයක් වශයෙන් කාත්තන්කුඩි පොලිස් වසමේ ගුඩ්ලින් හංදිය, හිස්බුල්ලා පොදු ජන ක්‍රීඩාංගණය.

ප්‍ර : ඒ කියන්නේ ඔහු ඒ කියන්නේ එම ස්ථානවල වේදිකා නිර්මාණය කරලා රැස්වීම් පවත්වන ඒවාත් තියෙනවාද?

පි : එසේය ස්වාමිනි. සියළුම රැස්වීම්වල ඔහු ගොඩක් දුරට වේදිකාවක් නිර්මාණයක කරලා තමයි ශබ්ද විකාශන යන්ත්‍ර යොදා ඔහු රැස්වීම් පවත්වන්නේ.

ප්‍ර : සාමාන්‍යයෙන් ඔය වගේ රැස්වීමකට පුද්ගලයෝ කීයක් වගේ සහභාගි වෙනවාද?

පි : ස්වාමිනි මෙම රැස්වීම් මුල් වශයෙන් පැවැති කාලයේ 200 ක් 300 ක් වගේ සහභාගී වී අවසන් මෙම අවස්ථාව වන විට කට්ටිය 1000 කට 1200 කට ආසන්න ප්‍රමාණයක් මොහුගේ රැස්වීම් වලට සාමාජිකයෝ සහභාගි වුණා.

ප්‍ර : දැන් ඔබ මුල් කාලයේ කියලා කිව්වේ මොන අවුරුද්දේ විතරද?

පි : මුල් කාලයේ කියන්නේ 2016 අවුරුද්දේ මුල් භාගයේදී.

ප්‍ර : 2016 වෙන කොට ඔබ කියන්නේ 200 ක් 300 ක් ආවා කියලා?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : ඊට පස්සේ 1000 බවට පත් වුණේ මොක වකවානුවේද?

පි : 1000 බවට පත් වුණේ ස්වාමිනි 2017 අවුරුද්දේ මුල් භාගය වන විට කාත්තන්කුඩිය අලියාර් හංදියේ ඔහුගේ යම් කිසි සිදුවීමක් සිදු වුණා. ඒ සිදු වීම වෙන දිනය තාක් ඔහුට අවසන් වශයෙන් 1200 කට 1000 කට ආසන්න පිරිසක් සහභාගි වුණා එම රැස්වීම් සඳහා.

ප්‍ර : ඔහුගේ විවිධ දේශන සඳහා?

පි : විවිධ දේශනා සඳහා.

ප්‍ර : දැන් ඔය දේශනවලට දේශකයෙක් විදිහට සහරාන්ට අමතරව තව කවුරුහරි මවුලවිලා සම්බන්ධ වෙනවාද?

පි : නැත ස්වාමිනි. ඔහු තනියෙන්ම තමයි දේශනය පවත්වන්නේ. ගොඩක් දුරට ඔහුගේ දේශනය මේ මුළු රැස්වීම පුරාම ඔහුගේ දේශනය තමයි ඔහු පවත්වන්නේ.

ප්‍ර : දැන් මේ සහරාන් දේශන පවත්වන්නේ කුමන භාෂාවකින්ද ?

පි : ස්වාමිනි එය දෙමළ භාෂාව හා අරාබි භාෂාව මුල් කර ගෙන තමයි ගොඩක් ඔහු දේශන පවත්වන්නේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් ඉහළගම මහත්මයා ඔබට දෙමළ භාෂාව කතා කිරීමට සහ තේරුම් ගැනීමට හැකියාවක් තියෙනවාද?

පි : මොහු රැස්වීම් පවත්වන මුල් අවදියේ

ප්‍ර : මම අහන්නේ ඔබට ?

පි : මට හැකියාවක් තියෙනවා දෙමළ භාෂාව කතා කරන්න හැකියාවක් තියෙනවා.

ප්‍ර : ඒ අනුව සහරාන් දෙන දේශන ඔබ අහන් ඉඳලා තියෙනවාද?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : ඔහු මොනවාද සාමාන්‍යයෙන් ඔහුගේ දේශනවල වැඩිපුරම මේ මහජනතාවට කියන්නේ ?

පි : ඔහු ප්‍රධාන වශයෙන් ස්වාමිනි මම රාජකාරී කළ අවදියේ ඉස්ලාම් ධර්මය ඔහු මේ ඔහුට විරුද්ධව පාර්ශවයක් කාත්තන්කුඩි ඔහුට විරුද්ධව නෙවෙයි ස්වාමිනි ඔහුගේ මතවාදයට පටහැනිව වෙනත් මතවාදයක් දරන පාර්ශවයක් සිටියා සුන්නත් වල් ජමාත් සංවිධානය. රවුෆ් මවුලවි නමින් එතුමාගේ ප්‍රමුඛත්වයෙන් සංවිධානයක් තිබුණා ස්වාමිනි. එම සංවිධානයට මෙතුමා විසින් එතුමාගේ මතවාදය මෙසේ ප්‍රතික්ෂේප කළා ස්වාමිනි. දානය පිරිනැමීම ඉස්ලාම් ආගමිකයෝ වශයෙන් දානය පිරිනැමීම ප්‍රතික්ෂේප කළා.

ප්‍ර : ඔබ කියන්නේ දැන් රවුෆ් මවුලවි පාර්ශවය සුන්නත් වල් ජමාත් විසින් දානය පිරිනැමීම හොඳයි කියලා කිව්වද?

පි : එසේය ස්වාමිනි. සුන්නත් වල් ජමාත් සංවිධානය දානය දීම ඒ ගොල්ලො ක්‍රියාත්මක කළා දානය දීම.

ප්‍ර : සහරාන් එය විවේචනය කිරීමක් කළා කියන එකද ඔබ කියන්නේ?

පි : ඔව් සහරාන් එය විවේචනය කළා.

ප්‍ර : ඒ තව මොනවද කළේ අන්න අපිට විස්තර කරලා පැහැදිලි කරලා දෙක වෙන් කරලා හරියට ගරු කොමිෂන් සභාවට කියන්නකෝ?

පි : තව ස්වාමිනි දැන් මුස්ලිම් තරුණියක් විවාහ කර ගැනීමේදී අපි දැවැද්ද වශයෙන් සාමාන්‍යයෙන් මම හිතන්නේ මුස්ලිම් ජාතිකයෝ ලබා ගන්නවා. ඔහු ඒ දැවැද්ද ලබා ගැනීම ප්‍රතික්ෂේප කළා. එතකොට ධාතු වන්දනාව වැනි දේවල් ඔහු ප්‍රතික්ෂේප කළා ධාතු වන්දනවා, පිළිම වන්දනාව, තව මළවුන් ඇදහීම, තව කාන්තාවන් සම්පූර්ණයෙන් ඇඳුමෙන් නිරාවරණය විය යුතු ආකාරය ඔහු ඒ දේශනාවලදී ප්‍රකාශ කළා.

ප්‍ර : ඒ දේශනාවලදී ඒවා ප්‍රචාරණය කරනවාට අමතරව කාට හරි බැන වැදීමක් එහෙම ඒ වගේ බැන වැදීම් ද්වේෂ සහගතව අපහාස කිරීම් වගේ ඒ දේවල් සිද්ධ වුණාද?

පි : අපහාස කිරීම් සිද්ධ වුණා ස්වාමිනි.

ප්‍ර : කාටද අපහාස කළේ?

FAIR COMMENT BY JEZEEM

පි : එහෙම මට නම් වශයෙන් නම් මෙම අවස්ථාවේ ස්වාමිනි මට මතක නැහැ. නමුත් ඔහු ඒ රවුම් මවුලවිට හා ඔහුගේ අනුගාමිකයන්ට ඔහු අපහාස වන අයුරින් එහෙම ප්‍රකාශ නිකුත් කරලා තවද ඔහු මත්ද්‍රව්‍ය පාවිච්චි කිරීමට විරුද්ධවත් ඔහු මෙම රැස්වීම්වලදී කතා කළා.

ප්‍ර : සහරාන් මත්ද්‍රව්‍ය පාවිච්චියට විරුද්ධව කතා කරපු කෙනෙක්?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : දැන් ඒ කියන්නේ මත්ද්‍රව්‍ය පාවිච්චි කරන ඔය ප්‍රධාන මවුලවිවරුත් ඉන්නවාද ඔය කාත්තන්කුඩි ප්‍රදේශයේ?

පි : එසේය ස්වාමිනි ඔහු ඒ දේශනවලදී කියලා තියෙනවා මම අසා තිබෙනවා නමුත් මම දැකලා නැහැ. එම එවැනි මවුලවිවරුන් සිටියා මත්ද්‍රව්‍ය පාවිච්චි කරන මවුලවිවරුන් හිටියා කාත්තන්කුඩිය ප්‍රදේශයේ.

ප්‍ර : ඔය රවුම් මවුලවිත් එහෙම ඒකට මත්ද්‍රව්‍ය පාවිච්චි කිරීම කමක් නෑ කියන ජාතියේ මවුලවිවරයෙක්ද?

පි : ඒක නම් මම දන්නේ නෑ ස්වාමිනි නමත් රවුම් මවුලවි මත්ද්‍රව්‍ය පාවිච්චි කරනවා කියලා මම ඇසට දැකලා නෑ මම අසා තිබෙනවා ඔහු මත්ද්‍රව්‍ය පාවිච්චි කරනවා කියලා.

ප්‍ර : දැන් ඔබ කිව්වා සහරාන් මේ දේශන පැවැත්වීම ගැන. ඔහු දේශන පවත්වන්න යොදා ගන්නේ කවදා දිනයද සාමාන්‍යයෙන්?

පි : සෑම සති අන්තයේ සිකුරාදා දිනයේ තමයි ඔහු යොදා ගන්නේ ස්වාමිනි.

ප්‍ර : මේ සිකුරාදා දිනය කාත්තන්කුඩි ප්‍රදේශයට හරි විශේෂ දිනයක්ද?

පි : සිකුරාදා දින ස්වාමිනි මෙම කාත්තන්කුඩි ප්‍රදේශයේ සියළුම වෙළෙඳ සැල් වසනවා. විවෘතව පවතින්නේ බෙහෙත් ශාලා ෆාමසි හා මේ හෝටෙල්ස් පමණයි. හෝටෙල්ස් දහවල් 12 න් පස්සේ එයත් වසනවා. එම සිකුරාදා දින සියළුම ගෙදර ඉන්න සාමාජිකයන් සමඟ ඔහු කාත්තන්කුඩි වෙරළ තීරයට ගොස් තම දරුවන් සමඟ විනෝදයෙන් කාලය ගත කරනවා සෑම සිකුරාදා දිනකම.

ප්‍ර : ඒ අනුව ඉරිදා දිනය ඔය වගේ ඒ ගොල්ලෝ විනෝද වෙන්න තමන්ගේ කඩ සාප්පු වහලා පවුලත් සමඟ ගත කරන්න භාවිතා කරන්නේ නැද්ද ඉරිදා දිනය?

පි : නැත ස්වාමිනි.

ප්‍ර : ඒ කියන්නේ මේ අනිත් දිස්ත්‍රික්කවලට සාපේක්ෂව මේ ගොල්ලෝ මේ කාත්තන්කුඩි ප්‍රදේශ වැසියන් ඉරිදා නිවාඩු දිනයක් බවට නොවෙයි සෞදි අරාබියා හා සමහාමීව සිකුරාදා නිවාඩු දිනයක් බවට පත් කර ගෙන කියලා කිව්වොත් එකඟ වෙන්න පුළුවන්ද?

පි : ඔබ හරි ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මහත්මයා දැන් මේ සහරාන් වේදීකා හදලා දේශන පැවැත්වීමට අමතරව ඔහු තමාගේ දර්ශනය අනුව පුද්ගලයින්ට යාඥා කරන්න උගන්වන්න පල්ලියක් හදලා තිබ්බද?

පි : කාත්තන්කුඩි ධීවර සංස්ථා පාර අපේ ඒ ස්ථානය දැනටත හඳුන්වන්නේ ඒත්තුකාල් කියා. එම ස්ථානයේදී ඔහු තහඩුවලින් වට කර පොඩි පල්ලියක් වැනි ස්ථානයක් සාදා තිබුණා ස්වාමිනි.

ප්‍ර : මේ සහරාන් මේ පල්ලිය හදන්නේ කොයි කාලේද?

පි : මට නිශ්චිතව දින වකවානු කියන්න බෑ ස්වාමිනි. ඔහු මම අහලා තියෙන දාරුත් අද රතවියා කියලා පල්ලියක් තිබුණා කාත්තන්කුඩි. ඔහු එම පල්ලියේ තිබුණු මතවාදයන්ට විරුද්ධව ඔහු විසින් වෙනත් මතවාදයන් දාරා ගොස් තමා මේ කල්ලිය හදාගෙන තියෙන්නේ. මම හිතන්නේ මුල් වශයෙන් ඔහුට 20 ක වගේ ප්‍රමාණයක් තමයි මෙම මුල් අවදියේ ඉඳලා තියෙන්නේ. එම කාලය තුළ තමයි ඔය පල්ලිය අර තහඩුවලින් නිර්මාණය කරලා පල්ලිය ඔහු සාදාගෙන ඔහුගේ මතවාදය එම ස්ථානය මූලිකව කේන්ද්‍ර කරගෙන ප්‍රචාරය කරමින් හිටියේ.

ප්‍ර : ඔහුගේ පල්ලිය තියෙන ස්ථානයත් සහරාන්ගේ නිවස තියෙන ස්ථානයත් වෙනස්ද එකම ස්ථානයකද ඉන්නේ?

පි : වෙනස් ස්වාමිනි දුරින් පිහිටා තියෙන්නේ.

ප්‍ර : වෙනස් ස්ථානයක තියෙන්නේ?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : සහරාන් කොහේද පදිංචි වෙලා හිටියේ?

පි : ඔහු පදිංචිව හිටියේ ස්වාමිනි කාත්තන්කුඩි වෙරළ පාර, මොහියිදින් පල්ලිය පාර, නව කාත්තන්කුඩි 03 යන ලිපිනයේ තමයි ඔහු පදිංචි වෙලා සිටියේ ස්වාමිනි.

ප්‍ර : ඒ පදිංචි වෙලා හිටියේ ඔහු තනියමද නැත්නම් ඔහුගේ පවුලේ සාමාජිකයෝ ඒ ගෙදර හිටියාද?

පි : නැත ඔහුගේ මල්ලි, ඔහුගේ මව, පියා, බිරිඳ සමඟ තමයි මේ ස්ථානයේ පදිංචි වෙලා හිටියේ.

ප්‍ර : මොන මල්ලිද මල්ලිගේ නම ඔබට කියන්න පුළුවන්ද?

පි : මොහොමඩ් කාසීම් මොහොමඩ් රිල්වාන්.

ප්‍ර : රිල්වානුත් ඔහුත් සමඟ තමයි හිටියේ?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : එතකොට ෂයිනි මවුලවි හිටියේ මේ සහරාන්ගේ ගෙදරද නැත්නම් වෙනත් ගෙදරකද?

පි : නැත ස්වාමිනි ෂයිනි මවුලවි විවාහ වී ඒ සහරාන් දැනට පල්ලිය පවත්වාගෙන යන ස්ථානයට ආසන්නයේ තැනක් තෝරා ගෙන පදිංචිව සිටියේ.

FAIR COMMENT
BY JEZEEM

ප : දැන් සහරාන්ගේ පවුලේ සාමාජිකයෝ කී දෙනෙක් ඉන්නවාද කියලා ඔබ දන්නවාද?

පි : මම දන්න විදිහට ස්වාමිනි ඔහුට සහෝදරයන් සහරාන් ඇතුළු පිරිමි 03 දෙනෙක් සහ ගැහැණු සහෝදරියන් 02 දෙදෙනෙක් සිටියා.

ප : සහරාන්ගේ පියා ජීවතුන් අතර ඉන්න කාලේ කුමක්ද කළේ රැකියාව වශයෙන්?

පි : ඔහු ස්වාමිනි ප්ලාස්ටික් භාණ්ඩ මම හිතන්නේ තොග වශයෙන් ඔහු ප්ලාස්ටික් භාණ්ඩ ලබා ගෙන එම නිවෙස් වලට ගොස් අලෙවි කරපු පුද්ගලයෙක්.

ප : ඊට අමතරව දැන් ඔබ සඳහන් කළා සහරාන් පල්ලියකුත් හෙමින් නිර්මාණය කර ගෙන ආවා කියලා?

පි : ඔව්.

ප : එතකොට සහරාන්ට ඒ සම්බන්ධයෙන් මුදල් එන්න රැකියාවක් තිබ්බද?

පි : ස්වාමිනි පල්ලිය පොඩි ඒ දවස්වල මම දකින දවස්වල පොඩි පල්ලියක්. නමුත් ඔහුගේ හිටපු සාමාජිකයන් විසින් ඔහුගේ අර සාමාජික මුදල් උපයෝගි කර ගෙන තමා මෙම කටයුතු පවත්වා ගෙන ගියේ ඒ දවස්වල කියලා තමා මම දන්නේ.

ප : සහරාන් කියන පුද්ගලයා ඔබ මුලින්ම දකින අවස්ථාවේදී ඔහු රැකියාවක් කළේ නෑ කියලා ඔබ කිව්වනේ?

පි : එසේය ස්වාමිනි.

ප : ඔහු යම් කිසි දේශපාලඥයෙකු සමඟ සම්බන්ධ වෙලා මුදල් එකතු කිරීම සිදු කරමින් සිටියාද?

පි : එම සිදුවීම් ස්වාමිනි මට අනාවරණය කර ගැනීමට හැකියාවක් ලැබුණේ නෑ ඒ දවස්වල.

ප : ඔහු ප්‍රබල පළාතේ ව්‍යාපාරිකයන් සමඟ සබඳතා පැවැත්වුවාද?

පි : එසේ නැත ස්වාමිනි.

ප : ඔබට අනාවරණය වෙලා නෑ?

පි : අනාවරණ වුණේ නෑ ස්වාමිනි මට.

ප : දැන් 2017 මාර්තු 10 වෙනි දින ආලියාර් හංදියේ යම් කිසි සිද්ධියක් වුණා නේද?

පි : එසේය ස්වාමිනි.

ප : මේ සිද්ධිය වන ස්ථානය සාමාන්‍යයෙන් මොන නිකායට අයත් පුද්ගලයන් ඉන්න ස්ථානයක්ද?

පි : මෙම ස්ථානය ස්වාමිනි ඔහු රැස්වීම් පවත්වපු ස්ථානය මම දන්නා විදිහට සුන්නතුල් වල් ජමාත් සංවිධානය රවුෆ් මවුලවිගේ පාර්ශවයේ සාමාජිකයන් වැඩිපුරම ගැවසුණු ස්ථානයක් කියලා මම දන්නවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට ඒ රවුම් මවුලවිගේ අනුගාමිකයන් වැඩිපුර ඉන්න ස්ථානයකද මේ සහරාන් ගිහිල්ලා දේශනය කරන්න සුදානම් කරලා තියෙන්නේ?

පි : මම එසේ අනුමාන කරනවා ස්වාමිනි එහෙම තමයි ඔහු එම ප්‍රදේශය තමයි තෝරගෙන මෙම රැස්වීම් පවත්වන්න ඇත්තේ කියලා.

ප්‍ර : ඒ අනුව යම් කිසි සිදුවීමක් සිද්ධ වුණානේ?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : ඒ අනුව සහරාන්ට යම් කිසි වරෙන්තුවක් නිකුත් වෙනවාද?

පි : ස්වාමිනි මෙම සිදුවීම 2017/03/10 වන දින තමයි මෙම සිදුවීම සිදු වුණේ. මෙම

ප්‍ර : කියන්න?

පි : ඔහුට මෙම සිදුවීම සම්බන්ධයෙන් වරෙන්තුවක් නිකුත් වෙනවා ස්වාමිනි.

ප්‍ර : දැන් ඔබ සඳහන් කළා ඔබ යම් කිසි අවුරුදු 4 ක කාල පරිච්ඡේදයක් බුද්ධි අංශයේ වැඩ කළා කියලා. ඉන් පසුව ඔබ ඔය කාත්තන්කුඩි පොලිස් ස්ථානයේ මොන අංශයටද ගියේ?

පි : මම ස්වාමිනි 2017 මැයි මස වෙනකම් බුද්ධි අංශයේ රාජකාරී කර ඊට පස්සේ වරෙන්තු භාර නිලධාරියා වශයෙන් මම ස්වාමිනි රාජකාරී කළා.

ප්‍ර : ඔබ වරෙන්තු භාර නිලධාරීවරයා වශයෙන් තමයි රාජකාරී ගත්තේ 2017 මැයි වලින් පස්සේ

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : දැන් ඔබ රාජකාරී වරෙන්තු නිලධාරියා විදිහට රාජකාරී භාර ගන්න කොට සහරාන්ට විරුද්ධව වරෙන්තුවක් නිකුත් වෙලා තිබ්බද නැත්නම් ඒ වෙන කොට වරෙන්තුවක් නිකුත් වෙලා නැද්ද?

පි : මම වරෙන්තු භාර ගන්න කොට සහරාන් වෙනුවෙන් වරෙන්තුවක් නිකුත් වෙලා තිබුණේ නෑ ස්වාමිනි.

ප්‍ර : හැබැයි මේ සිද්ධියට අදාළව ඔහුව අත්අඩංගුවට ගන්න ඔබලා උත්සාහ කළාද?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : ඔබලාට ඔහුව අත්අඩංගුව ගන්න බැරි වුණේ ඇයි?

පි : ස්වාමිනි මම වරෙන්තු භාර නිලධාරියා වශයෙන් රාජකාරී මම හිතන්නේ ස්වාමිනි මොහුට 2017/08 වෙනි මාසේ යම් දිනක තමා ඔහුට වරෙන්තුවක් නිකුත් වුණේ. එම වරෙන්තුව නිකුත් වූ පසු එය උසස් නිලධාරීන් මාර්ගයෙන් තමයි වරෙන්තුව නිකුත් වෙන්නෙ සහකාර පොලිස් අධිකාරිතුමා මාර්ගයෙන් හෝ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිතුමා මාර්ගයෙන් හෝ නියෝජ්‍ය පොලිස්පතිතුමා

Project Screen's Copy
FAIR COMMENT BY JEZEEM

මාර්ගයෙන් තමයි එම වරෙන්තුව අප හට නිකුත් කරලා තිබුණේ. එම වරෙන්තුව අප හට ගොනු කරන කොට ස්වාමිනි ගොනුවක් ආකාරයෙන් තමයි එම වරෙන්තුව අප හට ලබා දෙන්නේ. එම නිසා

ප්‍ර : මම ඔබෙන් අහන්නේ වරෙන්තුව ගැන නෙවෙයි වරෙන්තුවට එන්න කලින් මේ සිද්ධියට පස්සේ අත්අඩංගුවට ගන්න මේ පුද්ගලයාව බැරි වුණේ ඇයි මේ පුද්ගලයා මේ පළාතේ හිටියද ?

පි : එම පළාතේ වාසය කළේ නෑ ස්වාමිනි ඒ අවස්ථාවේදී ඔහු.

ප්‍ර : ඔබලා බුද්ධි අංශ විසින් ඔබ හොයලා බැලුවාද මේ පුද්ගලයා කොහේටද ගිහිල්ලා තියෙන්නේ කියලා?

පි : මම ස්වාමිනි මෙම බුද්ධි අංශයේ රාජකාරී සිදුවීම සිදු වුණු අවස්ථාවලදී ඔහු ගැන සොයා බැලුවා ඔහු ඒ අවස්ථාවේ සිටියේ නෑ. 2017/03/10 තමයි මෙය සිදු වුණේ. මම 2017 මැයි මාසේ තමයි වරෙන්තු භාර නිලධාරියා වශයෙන් බුද්ධි අංශයෙන් ඉවත් වී මෙම රාජකාරිය භාර ගත්තේ. එම කාලය තුළදී ඔහු වසමේ පදිංචිව සිටියේ නෑ.

ප්‍ර : දැන් ඔබ ඊට පස්සේ වරෙන්තු භාර නිලධාරියා විදිහට කාත්තන්කුඩි පොලිස් ස්ථානයේ වරෙන්තු භාර නිලධාරියා විදිහට රාජකාරි භාර ගන්නවානේ 2017 මැයි සිට?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : දැන් සාමාන්‍යයෙන් ඔය වරෙන්තු භාර නිලධාරියා විදිහට ඔබට පැවරිලා තියෙන රාජකාරී මොනවාද?

පි : වරෙන්තුකරුවන් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීම හෝ වරෙන්තුකරුවා අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කිරීමට නොහැකි වුනොත් ඒ සම්බන්ධ ඉදිරි නඩු දිනයේදී අධිකරණයට කරුණු වාර්තා කිරීමක් තමයි ස්වාමිනි මට පැවරී තිබුණේ.

ප්‍ර : සාමාන්‍යයෙන් මාසිකව ඔබට වරෙන්තු කීයක් විතර දින වරෙන්තු සහ විවෘත වරෙන්තු කීයක් විතර හම්බ වෙනවාද?

පි : මේ කාල වකවානුව තුළ ස්වාමිනි මට වරෙන්තු 150 ක් 200 ක් විතර දින වරෙන්තු හෝ එක මාසේකට වරෙන්තු 5 ක් 6 ක් විවෘත වරෙන්තු මා හට ලැබුණා.

ප්‍ර : දැන් ඔබට යම් කිසි වරෙන්තුවක් ලැබිලා ඒ පුද්ගලයා අල්ල ගන්නට බැරි නම් ඔබ ඊළඟට ගන්න සාමාන්‍ය ක්‍රියාපටිය මොකක්ද?

පි : වරෙන්තුවක් ලැබිලා මා හට ස්වාමිනි වරෙන්තුව අත්අඩංගුවට ගත හැකි නොහැකි වුනොත් මම ඔහු පදිංචිව සිටින ස්ථානයට ගොස් ඔහුගේ ඥාතීන්ගෙන් ප්‍රකාශ ලබා ගන්නවා. වසම් භාර ග්‍රාම නිලධාරීවරයාගෙන් ඔහු සම්බන්ධයෙන් සොයා බලා එම වාර්තා

FAIR COMMENT BY JEZEEM

ලබා ගෙන ගරු අධිකරණයට ඉදිරි නඩු දිනයේදී ඉදිරිපත් කරනවා ස්වාමිනි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : තමන් වරෙන්තුකරු වශයෙන් ක්‍රියා කරන කාලේ මේ වරෙන්තුකරුවන් අත්අඩංගුවට ගැනීමට මෙහෙයුම් මාසේකට වතාවක්වත් ක්‍රියාත්මක කරලා තියෙනවා ද කාත්තන්කුඩි පොලිසිය මඟින්?

පි : ක්‍රියාත්මක කරලා තියෙනවා ස්වාමිනි. මෙහෙයුම ලැබිලා තියෙනවා.

ප්‍ර : මෙහෙයුම් ලැබිලා තියෙනවා?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : රාත්‍රීද කරන්නේ?

පි : ඒක රාත්‍රියෙන් ලැබෙනවා ස්වාමිනි සවස් යාමේ වගෙත් ඒ දවස්වල සාමාන්‍යයෙන් මාසේකට මෙහෙයුම් දෙක තුන ලැබිලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර : කරලා තියෙනවා?

පි : එසේය ස්වාමිනි.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>

ප්‍ර : ඔබට දැන් ඒ පළාතේ ග්‍රාම සේවක මඟින් හෝ ඥාතීන් මඟින් හොයා ගන්න බැරි අවස්ථාවක ඔබ තවදුරටත් ගන්න ක්‍රියාමාර්ග මොනවද මේ වරෙන්තුකරුවන් සම්බන්ධයෙන්?

පි : ස්වාමිනි ඔහුගේ ඥාතීන් හා ග්‍රාම සේවක එම වසමේ පදිංචි නෑ කියලා දැනුම් දුන් පසු අප විශ්වාස කරන්නේ ඔහු වෙන පොලිස් වසමක හෝ දිවයිනේ වෙනත් ප්‍රදේශයක පදිංචි වී සිටිනවාද කියලා ඒ සම්බන්ධව ඔහු පදිංචි ස්ථානය සොයා බැලීමට කටයුතු කරනවා. එසේ කටයුතු කරන්නේ මම ඒ වරෙන්තු කරන කාලය තුළ අධිකරණ නියෝගයක් ඔහුගේ ජාතික හැඳුනුම්පත අංකය අධිකරණයට කරුණු වාර්තා කර ඒ සම්බන්ධව මම ජංගම දුරකථන සේවා සපයන ස්ථාන පහකින් එම ඔහුගේ හැඳුනුම්පත් අංකය උපයෝගී කර ගෙන සිම් පත් ලබා ගෙන තිබෙනවා දැයි පරීක්ෂා කිරීමට මම ක්‍රියා කළා එදා.

ප්‍ර : දැන් මේ 2017/03/10 සිද්ධියට අදාළව නිකුත් වූ වරෙන්තු කිහිපයක් ඔබ අතට පත් වෙන්නේ කොයි කාලේද?

President's Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : 2017/08 වෙනි මාසේ සිට ස්වාමිනි 2018 වර්ෂයේ අග භාගය දක්වා ඔහුට වරින් වර වරෙන්තු 7 ක් 8 ක් වගේ ප්‍රමාණයක් මා හට ලැබුණා ස්වාමිනි .

ප්‍ර : ඔබට ලැබුණා?

පි : එසේය.

ප්‍ර : ඔබ ඒ ලැබුණු වරෙන්තුවලින් වරෙන්තු කිහිපයක් මේ ගරු කොමිෂන් සභාවට ප්‍රකාශයක් දෙමින් ඉදිරිපත් කළා කිව්වොත් නිවැරදිද?

පි : එසේය ස්වාමිනි.

(ස්වාමිනි සාක්ෂිකරු ඔහුගේ ප්‍රකාශය මඟින් ලබා දුන් වරෙන්තු කිහිපයක් ඔහුට පෙන්වා සිටීමට අවසර පතනවා.)

(සාක්ෂිකරුට ලේඛනයක් පෙන්වා සිටිනවා.)

ප්‍ර : මහත්මයා මේ ලේඛනය පරීක්ෂා කරන්න. මේ ලේඛනය මොකක්ද?

පි : මම විසින් 2017/10/09 වන දින මෙම ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කළ වරෙන්තුව මෙහි තියෙනවා ස්වාමිනි.

ප්‍ර : මේ මොකක්ද මේ ලේඛනය?

පි : මෙම මොහොමඩ් කාසීම් මොහොමඩ් සහරාන් මඟින් මොහොමඩ් සහරාන්ට නිකුත් කරන වරෙන්තුවක් ස්වාමිනි මෙය.

ප්‍ර : ඔබට එය හඳුනා ගන්න පුළුවන්ද?

පි : එසේය ස්වාමිනි. මාගේ අත්සන යොදා මම දිනය සටහන් කර තිබෙනවා.

ප්‍ර : පිටසන් කිරීමක් කරලා තිබෙනවාද?

පි : එසේය ස්වාමිනි.

(ස්වාමිනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද මොහොමඩ් කාසීම් මොහොමඩ් සහරාන් යන අයට බී/276/17 යන නඩුවට අදාළව නිකුත් කරන ලද 2017/10/09 දිනැතිව නිකුත් කරන ලද දින වරෙන්තුව C 667 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.)

ප්‍ර : මේ C 667 පරීක්ෂා කරන්න මහත්මයා. ඒ ලේඛනයට අනුව ඒ වරෙන්තුව යොමු කරලා තියෙන්නේ කාටද?

පි : වරෙන්තු යොමු කරලා තියෙන්නේ ස්වාමිනි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිතුමා මඩකලපුව වෙත වරෙන්තු යොමු කරලා තියෙනවා.

ප්‍ර : ඒ කියන්නේ අධිකරණයෙන් කෙළින්ම මේ වරෙන්තුව Direct කරලා තියෙන්නේ නැත්නම් යොමු කරලා තියෙන්නේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි

පි : තුමා වෙත.

ප්‍ර : ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි මඩකලපුව වෙත කිව්වොත් නිවැරදිද?

Prisoner Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : ඒ අනුව ඔබට ලැබෙන්නේ මේ වරෙන්තුව කාගෙන්ද?

පි : මට ස්වාමිනි ලැබෙන්නේ මෙය ගොනුවක් මාර්ගයෙන් අපේ ඒ පොලිස් ස්ථානයේ පාලන අංශයට මෙම ගොනුව ලැබෙනවා. පාලන අංශය මඟින් තමයි ස්වාමිනි මා හට මෙම වරෙන්තුව ලබා දෙන්නේ. පාලන අංශයේ ස්ථානාධිපතිතුමාගේ නියෝග මත පාලන අංශය මට මේ වරෙන්තුව ලබා දෙනවා ස්වාමිනි.

ප්‍ර : එසේ ලැබුණායින් පස්සේ ද ඔබ මේ වරෙන්තුව ක්‍රියාත්මක කිරීමට අදාළ පියවර ගන්නේ?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : දැන් මේ ආකාරයටම ඔය නඩුවට අදාළව තවත් වරෙන්තු කිහිපයක් ඔබට ලැබුණා කිව්වොත් නිවැරදිද ?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : ඒ වරෙන්තුවල පිටපත් ඔබ මෙම කොමිෂන් සභාවට ප්‍රකාශයක් මඟින් ලබා දුන්නා කිව්වොත් හරිනේ?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : ඒවා නැවත දැක්කොත් ඔබට හඳුනා ගැනීමේ හැකියාවක් තියෙනවාද?

පි : එසේය ස්වාමිනි.

(ස්වාමිනි සාක්ෂිකරුට තවත් ලේඛනයක් පෙන්වීමට ගෞරවයෙන් අවසර පතනවා.)

ප්‍ර : මේ ලේඛණය පරීක්ෂා කරන්න.

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : මේ ලේඛනය ඔබට හඳුනා ගන්න පුළුවන්ද ? ඔබට කුමක් වශයෙන්ද හඳුනා ගන්න පුළුවන් නම් හඳුනා ගන්න පුළුවන්?

පි : ස්වාමිනි මගේ අත්සන යොදා එම දිනය යොදා පිටසන් කරලා තියෙනවා මෙම වරෙන්තුවේ.

ප්‍ර : මෙය කාට විරුද්ධව තියෙන වරෙන්තුවක්ද?

පි : මොහොමඩ් කාසීම් රිල්වාන්ට විරුද්ධව තිබෙන වරෙන්තුවක් ස්වාමිනි මෙය.

ප්‍ර : ඔබගේ අත්සනත් තිබෙනවා?

පි : එසේය ස්වාමිනි.

(ස්වාමිනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද බී/276/17 දරන නඩුවට අදාළව 2017/10/09 දිනැතිව මොහොමඩ් කාසිම් රිල්වාන් යන අයට එදිරිව නිකුත් කරන ලද දින වරෙන්තුව C 667 (A) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.)

ප්‍ර : දැන් මෙම අපි C 667 සහ C 667 (A) වශයෙන් වරෙන්තු දෙකක් ඔබට පෙන්වලා මේ ගරු කොමිෂන් සභාව ඉදිරියේ ලකුණු කළා

Project Secretary Copy
FAIR COMMENT BY JEZEEM

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : දැන් ඒ වරෙන්තු දෙක ඔබට ලැබුණාට පස්සේ ඔබ ගත්ත ක්‍රියාමාර්ග මොනවාද වරෙන්තු ක්‍රියාත්මක කරන නිලධාරීයා වශයෙන්?

පි : ස්වාමිනි මම මීට පෙරත් පැවසුවා මෙම වරෙන්තුව මගේ වරෙන්තු ලේඛනයට මම ඇතුළත් කරනවා. ඇතුළත් කර පසුව ස්වාමිනි මොහු සම්බන්ධව මා පසුවිපරම් කරනවා මොහු සමඟ මා පිටවීමේ සටහන් යොදා ඔහු පදිංචිව සිටින නිවස හෝ ඔහුගේ නෑදෑයන් සිටින නිවෙස් පරීක්ෂා කරනවා. එසේම එම නිවෙස්වල සිටියේ නැත්නම් ඒ සම්බන්ධව මා ප්‍රකාශ ලබා ගෙන තිබෙනවා.

ප්‍ර : ඔබ ඒ අනුව සහරාන්ගේ ගෙදරට ගිහින් බැලුවාද?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : ඒ ගෙදර කවුද හිටියේ?

පි : එම මම අවස්ථා කිහිපයකදී ඔහු පදිංචි නිවසට ගොස් පරීක්ෂා කරලා තියෙනවා. එම අවස්ථාවේදි ඔහුගේ මව එම නිවසේ මව පමණයි ස්වාමිනි ඒ අවස්ථාවේ සිටියේ.

ප්‍ර : දැන් සහරාන් කසාද බැඳපු පුද්ගලයෙක්නේ? ඔහුගේ බිරිඳ සහ දරුවන්වත් එම නිවසේ සිටියේ නැද්ද?

පි : නැත ස්වාමිනි මම වරෙන්තුව නිකුත් වූ පසු ඔහුගේ බිරිඳ දරුවන් එම නිවසේ වාසය කළේ නෑ ස්වාමිනි.

ප්‍ර : දැන් සහරාන්ගේ තවත් සහෝදරයෝ ඉන්නවා ෂයිනි මවුලවි ඔහුගෙන්වත් විමසීමක් කරලා බැලුවද මේ පුද්ගලයා කොහේද කියලා

පි : එම අවස්ථාවේදී ස්වාමිනි ෂයිනි අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර ගතව සිටියේ .

ප්‍ර : ඒ වෙන කොට?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : ඔබ ඉන් අනතුරුව මේ සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරීන්ගෙන් ප්‍රකාශ එහෙම සටහන් කර ගත්තාද?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : කවදා කවදා විතර ප්‍රකාශ සටහන් කරගෙන තියෙනවාද?

පි : ස්වාමිනි ලේඛනය. ස්වාමිනි 2017/10/10 වන දින අංක 167 C, නව කාත්තන්කුඩි දකුණ සමාවෙන්න ස්වාමිනි 10/19 වන දින අංක 167 C , නව කාත්තන්කුඩි දකුණ එම්.ඒ.එන්.එම්. නිරෝසා කීයාස් මහත්මියගෙන් වාර්තාවක් ලබා ගෙන තියෙනවා මේ සම්බන්ධව.

ප්‍ර : ඒ අනුව සහරාන් එම ප්‍රදේශයේ ඉඳලා තියෙනවාද?

පි : සහරාන් මෙම ලිපිනයේ පදිංචි නොමැත කියා මෙම දෙමළෙන් සටහන් කර මෙම ලේඛනය ලබා දී තිබෙනවා ස්වාමිනි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් ඊට අමතරව ඔබ සහරාන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය යොමු කරලා ඔහුගේ දුරකථන විස්තර වාර්තා ලබා ගෙන ඔහුගේ ඔහු සිටින ප්‍රදේශය හොයා ගැනීමට උත්සාහ කිරීමක් කළාද?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : ඒ උත්සාහ කිරීම කළේ අධිකරණය මාර්ගයෙන්ද?

පි : අධිකරණයේ නියෝග ලබා ගෙනයි සිදු කළේ ස්වාමිනි.

ප්‍ර : ඒ අනුව ඔහුගේ දුරකථන විස්තර වාර්තාවක් ඔබට ලැබුණාද?

පි : එසේය ස්වාමිනි. දුරකථන සමාගම් පහෙන්ම ඔහු සම්බන්ධයෙන් වාර්තා ලැබුණා ස්වාමිනි.

ප්‍ර : ඔබට එම දුරකථන විස්තර වාර්තාවක පිටපතක් දැක්කොත් නැවත හඳුනා ගැනීමේ හැකියාවක් තියෙනවාද ?

පි : එසේය ස්වාමිනි මා පිටසන් කර තිබෙනවා එම දුරකථන විස්තර වාර්තා.

(ස්වාමිනි C 665 වශයෙන් දැනටමත් ලකුණු කර ඇති මඩකලපුව මහේස්ත්‍රාත් මඩකලපුව නඩු වාර්තාවේ සහතික පිටපතක යම් පිටුවක් සාක්ෂිකරුට පෙන්වීමට ගෞරවයෙන් අවසර පතනවා.)

ප්‍ර : මේ මොකක්ද මහත්මයා මේ ලේඛනය?

පි : මෙය ස්වාමිනි මොහොමඩ් කාසීම් මොහොමඩ් ජහරාන් නමින් ඩයලොග් ජංගම දුරකථන ආයතනය මඟින් ඔහුගේ ජාතික හැඳුනුම්පත් අංකය වෙත නිකුත් කරන ලද සිම්පත් හයක වාර්තාවක් ස්වාමිනි ලබා දී තිබෙනවා.

ප්‍ර : ඔබට එය හඳුනා ගැනීමේ හැකියාවක් තිබෙනවාද?

පි : එසේය ස්වාමිනි.

(ස්වාමිනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද එම්.එච්.ජහරාන් යන අය විසින් 862014685 v යන ජාතික හැඳුනුම්පත් අංකය යටතේ ලබා ගෙන ඇති සියළුම දුරකථන සම්බන්ධයෙන් වන දුරකථන විස්තර වාර්තාව මෙම C 665 ගොනුවේ 438 පිටුවේ දැක්වෙනවා ස්වාමිනි. එම ලේඛනය C 665 (B) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.)

****

දැන් වේලාව : පෙ.ව.12.35 යි.
මෙතැන් සිට ල/ලේ :- සවිනි මෙය.

FAIR COMMENT
BY JEZEEM

වේලාව: අළුයම 12.35
පෙර සටහන් : මුතු මෙනවිය.
මෙතැන් සිට: සචිනි මෙනවිය.

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා.</u>

ප්‍ර: දැන් මේ C 665 B ලේඛනය පරීක්ෂා කරලා බලන කොට ඒ පරීක්ෂා කරලා බලන අවස්ථාව දැක්වෙන දිනය දැක්වෙනවද ලේඛනයේ?

උ: එසේ ස්වාමිනි 2018.02.16 වන දින.

ප්‍ර: 2018.02.16 වන දින වෙන කොට ගත්ත වර්තාවට අනුව සහරාන්ගේ ජාතික හැඳුනුම්පතට අදාළව නිකුත් වෙච්ච දුරකථන අංක කියක් තියෙනව ද?

උ: දුරකථන අංක ස්වාමිනි 06 ක් තිබෙනවා.

ප්‍ර: 06 ක් තිබෙනවා?

උ: එසේ.

ප්‍ර: ඒ හයෙන් Disconnect නැත්නම් භාවිතයට නොගන්නා දුරකථන අංක කියක් තිබෙනව ද?

උ: භාවිතයට නොගන්නා දුරකථන අංක ස්වාමිනි දුරකථන අංක 04 ක් තිබුණා ස්වාමිනි.

ප්‍ර: ඒ අනුව භාවිතා කරන භාවිතාවට යන නැත්නම් connected තත්ත්වයේ තිබෙන දුරකථන අංක කියක් තියෙනවා ද?

උ: ක්‍රියාකාරී තත්ත්වයේ ස්වාමිනි දුරකථන අංක 02 ක් තියෙනවා.

ප්‍ර: එතකොට ඒ දුරකථන අංක දෙක ඔබට කියන්න පුළුවන් ද මේ ගරු කොමිෂම් සභාවට?

උ: එසේය ස්වාමිනි.

ප්‍ර: මොකද්ද?

උ: එකක්. 0770439777

ප්‍ර: ඒ එක් දුරකථන අංකයක්?

උ: එසේය.

ප්‍ර: අනිත් එක?

උ: 0770284874

ප්‍ර: දැන් ඔය දුරකථන අංක දෙකට අදාළව ඔබ details bill එකක් නැත්නම් දුරකථන විස්තර වාර්තාවක් ලබා ගැනීමට ඔබට පුළුවන් වුණා?

උ: නැත ස්වාමිනි එම දුරකථන අංක දෙක ස්වාමිනි එම අවස්ථාවේ දී ක්‍රියාකාරී තත්ත්වයේ තිබුණා. රෙකොඩ් කිසිවක් නැත ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ සරලවම කිව්වොත් ඔබ වාර්තාවක් ලබා ගත්තා නමුත් එම ක්‍රියාකාරී දුරකථන වලින් කිසිම ඇමතුමක් ලබා ගෙන හෝ ලැබිලා නැතෙයි කිව්වොත් හරිද?

උ: එසේ ස්වාමිනි.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: Call records not available කියලා තමයි ඇවිල්ලා තියෙන්නේ?

උ: එසේ ස්වාමිනි.

ප්‍ර: ඊට අදාළ ලේඛන ඔබට මේ ගොනුවෙන් පෙන්වා සිටින්න පුළුවන් ද?

උ: එසේ ස්වාමිනි . 436 පිටුව හා 437 පිටුවේ.

ප්‍ර: 436 පිටුවේ තිබෙන්නේ මොකද්ද? මොන අංකය ගැනද?

උ: 436 ස්වාමිනි තිබෙන්නේ 0770284774 අංකය.

ප්‍ර: මොකද්ද මෙතැන යටින් දැක්වෙන්නේ?

උ: no records found ලෙස.

ස්වාමීනි සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද 2017 නොවැම්බර් 01 සිට 2018 ජනවාරි 20 දක්වා 0770284874 යන අංකයට අදාළව ලබා ගන්නා ලද දුරකථන විස්තර වාර්තාව C 665 (C) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.

ප්‍ර: 437 පිටුව පරීක්ෂා කරන්න මහත්මයා. මේ කුමන ලේඛනයක් ද දැක්වෙන්නේ?

උ: 437 පිටුවේ 0770439774 දරණ දුරකථන අංකය සඳහන් වෙලා තිබෙනවා.

ප්‍ර: එහි යම්කිසි දුරකථන විස්තර සම්බන්ධයෙන් වාර්තාවක් තියෙනව ද?

උ: නැත ස්වාමිනි . එහිත් no record found නමින් සඳහන් වෙලා තිබෙනවා.

ස්වාමිනි Dialog ආයතනය විසින් 2017 නොවැම්බර් 01 දින සිට 2018 ජනවාරි 20 දක්වා 0770439777 යන දුරකථන අංකයට අදාළව නිකුත් කරන ලද දුරකථන විස්තර වාර්තාව C 665 D වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.

ප්‍ර: දැන් මෙසේ දිගින් දිගටම ඔබට සහරාන් හෝ රිල්වාන් යන පුද්ගලයින්ට නිකුත් වී ඇති වරෙන්තුව ක්‍රියාත්මක කර ගත නොහැකි වුණා නේ?

උ: එසේ ස්වාමිනි.

ප්‍ර: ඉතින් ඊට අදාළව ඔබ විවෘත වරෙන්තුවක් ලබා ගැනීමටවත් උත්සාහයක් ගත්තේ නැද්ද?

උ: විවෘත වරෙන්තුවක් ස්වාමිනි දිනක මට මතක නැහැ මම අධිකරණයේ වරෙන්තු වාර්තා ලබාදෙන කොට විමසීමක් කරා මහේස්ත්‍රාත්තුමගෙන් මහේස්ත්‍රාත්තුමා ප්‍රකාශ කරා එහිදී සැකකරු අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කරලා තමා ඔහු අධිකරණයට ඉදිරිපත් නොවුණොත් තමා ඔහුට විරුද්ධව අධිකරණ වරෙන්තුවක් නිකුත් කරන්න පුළුවන් කියලා දැනුම් දීමක් කරා ඒ අවස්ථාවේ.

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකරු දැන් සහරාන්ට විරුද්ධව වරෙන්තුවක් නිකුත් කරලා තියෙන කාලයේ දී එම ප්‍රදේශයේ සහරාන්ගේ පල්ලියක් ගොඩනැගෙමින් තිබ්බ ද?

උ: එසේ ස්වාමිනි.

ප්‍ර: කොතනද ඒ පල්ලිය තිබ්බේ?

උ: ස්වාමිනි මම පෙර සඳහන් කළ ධීවර සංස්ථාව පාර ඒතුකල් ප්‍රදේශයේ. නව කාත්තන්කුඩි 03 යන ස්ථානයේ තමා පල්ලිය ඉදිවෙමින් තිබුණේ.

ප්‍ර: එතකොට සහරාන්ට වරෙන්තුවක් නිකුත් කරලා තිබ්බ කාලයේදීත් එම පල්ලියේ ඉදි කිරීම් කටයුතු ඒ විදියටම ගෙන ගියා කියලා ඔබ නිරීක්ෂණය කෙරුව ද?

උ: එසේ ස්වාමිනි.

ප්‍ර: ඔබ ඒ සම්බන්ධයෙන් සොයා බැලුව ද ඇයි මේ සහරාන්ට විරුද්ධව වරෙන්තුවක් නිකුත් කරලා තිබෙනවා ඒත් පල්ලියක් දිගටම ගොඩනැගෙනවා කවුද ඒක කරන්නේ කියලා ඔබ සොයා බැලුව ද?

උ: ඒ සම්බන්ධව මම විමසීමක් කළේ නැහැ ස්වාමිනි. මම සහරාන් කොහේද සිටින්නේ පමණයි එතැන සේවය කරපු පුද්ගලයෙකුගෙන් මම විමසා සිටියේ ස්වාමිනි.

ප්‍ර: නමුත් ඔබ දැක්කා මේ පල්ලිය ඉදිවෙමින් පැවතියා කියලා?

උ: එසේ ස්වාමිනි.

ප්‍ර: ඒ ඉදිවෙමින් පැවතියා සම්බන්ධයෙන් ඔබට පුද්ගලික තොරතුරුකරුවන්ගේ යම් කිසි තොරතුරක් ලැබුණ ද?

උ: නැත ස්වාමිනි. මට ලැබුණේ නැහැ ස්වාමිනි තොරතුරු.

ප්‍ර: ඔබ මෙම කොමිෂන් සභාවේ පොලිස් ඒකකයට ප්‍රකාශයක් කෙරුවා නේද?

උ: එසේය ස්වාමිනි.

ප්‍ර: එම ප්‍රකාශය කියවලා බලල නේද අත්සන් කෙරුවේ?

උ: එසේය ස්වාමිනි.

ප්‍ර: එම ලේඛනයේ තියෙන සියළු දේ සත්‍යය ද?

උ: එසේය ස්වාමිනි.

සාක්ෂිකරු විසින් මෙම කොමිෂන් සභාවේ පොලිස් ඒකකයට කරන ලද 2019.12.23 වන දින දරණ ප්‍රකාශයේ 04 වැනි පිටුව කෙරෙහි සාක්ෂිකරුගේ අවධානය යොමු කරයි.

ප්‍ර: 04 වන පිටුවේ යට ඔබේ අත්සන තිබෙනවා නේද?

උ: එසේ ස්වාමිනි .

ප්‍ර: එම 04 වැනි පිටුවේ දී ඔබගෙන් අසන ලද ප්‍රශ්නයකට ඔබ මොන පැහැදිලි කර දීමද කරලා තියෙන්නේ. සහරාන්ගේ පල්ලි සම්බන්ධයෙන්? ඉහළ ඉඳලා දෙවැනි පිළිතුර.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

උ: එතනින් මම ප්‍රකාශ කරලා තියෙනවා ස්වාමිනි මේ සම්බන්ධයෙන් හිටපු පළාත් සභා මන්ත්‍රී ශිබ්ලි ෆාරූක් මහතා මෙයට සම්බන්ධව සිටියා.

ප්‍ර: මොකට සම්බන්ධයෙන් ද සිටියේ කියලා ?

උ: මෙම පල්ලිය ගොඩනැගීමට උදව් උපකාර කරා කියලා එහි සිටින පුද්ගලයෝ මට කියා සිටියා උතුමාණනි.

ප්‍ර: එතකොට මං අද දින කොමිෂන් සභාවේ දී ඔබගෙන් ඒ ප්‍රශ්නයට පිළිතුරුක් ඇහුවහා ඇයි ඒ පිළිතුර ලබා දුන්නේ නැත්තේ?

උ: මට කලින් මතක් වුණේ නැහැ ස්වාමිනි. සමාවෙන්න.

ප්‍ර: එතකොට ඔබ මේ ඔබගේ ප්‍රකාශයේ කියලා තියෙන දේ හරිද?

උ: මම ප්‍රකාශ කරල තියෙන දේ හරි ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ සහරාන්ට විරුද්ධව වරෙන්තුවක් නිකුත් කරලා තිබෙන අවස්ථාවක දී ඔහු විසින් ගොඩ නගන ලද පල්ලියේ ඉදිකිරීම් කටයුතු ඒ විදියටම පැවතියා. ඒ සම්බන්ධයෙන් ඔබ හොයලා බලන කොට ඔබට දැනගන්න ලැබුණ දකාත්තන්කුඩියේ ප්‍රදේශයේ සිටින පළාත් සභා මන්ත්‍රී ශිබ්ලි ෆාරූක් යන අය සහරාන්ගේ පල්ලියේ ඉදිකිරීම් සම්බන්ධයෙන් සොයා බලා යන බව?

උ: එසේ ස්වාමිනි. පැමිණි ඒ නිරීක්ෂණය කළ පිටව යනවා කියලා එතැන වැඩ කරන පුද්ගලයෝ මට දැනුම් දුන්නා.

ප්‍ර: ඔහු කුමන පක්ෂයක පළාත් සභා මන්ත්‍රී වශයෙන් ද කටයුතු කළේ?

උ: මම හිතන්නේ ස්වාමිනි මුස්ලිම් ක්‍රොංග්රසයේ.

ප්‍ර: ඔබට ඒ තොරතුරු ලැබුණායින් පස්සේ ඔහුගෙන් ප්‍රකාශයක් සටහන් කරගත්තේ නැද්ද?

උ: නැත ස්වාමිනි.

ප්‍ර: ඇයි නැත්තේ

උ: වරෙන්තුවට අදාළ නොවන නිසා ස්වාමිනි මං ඒ සම්බන්ධව සොයලා බැලුවේ නැහැ.

ප්‍ර: වරෙන්තුවට අදාළ නොවෙන්නේ කොහොමද දැන් පල්ලියක් ගොඩනගන්න පුළුවන් ද මේ ඒ ගොඩනැගීම් වලට සල්ලි යොදවන්නේ නැතුව?

උ: ඔව් මං හිතන විදියට ස්වාමීනි ඒ සහරාන්ගේම ප්‍රදේශයෙන් පලා ගොස් සිටි පසු එම ක්‍රියාමාර්ග ඔහුගේ අනිත් සාමාජිකයන් විසින් තමා කරගෙන ගියේ තමා මම විශ්වාස කරේ.

ප්‍ර: ඒ කියන්නේ ඔබගේ පිළිතුර හැටියට ඒ ශිබ්ලි ෆාරූක් යන සහරාන්ගේ කණ්ඩායම එක්ක සාමාජිකයෙකු හැටියට ඔබ ඒ වෙලාවේ හඳුනා ගත්ත ද?

උ: සහරාන්ට යම්කිසි උදව් උපකාර කළ පුද්ගලයෙකු විසින් මම හිතුවා ස්වාමිනි. ඒ ඔහු පල්ලිය නරඹලා එන කොට ඒ සම්බන්ධයක් ඇති කියලා මට හිතුණා ස්වාමිනි.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඊට පෙර අවස්ථාවල දී සහරාන් සමඟ මේ සිද්ධි ෆාරුක් යන අය විවිධ ස්ථාන වලට පෙනී හිටියයි කියලා ඔබගේ අවධානයට යොමු වුණාද?

උ: එහෙම විශේෂ අවස්ථාවක් ස්වාමීනි මට මතක නැහැ. මට රැස්වීමකදී ද කොහෙද මට එකපාරක් පැමිණ හෝ පිටව ගියා කියලා මතකයක් තියෙනවා ස්වාමිනි.

ප්‍ර: කාගේ රැස්වීමකට ද ඇවිල්ලා තිබ්බේ?

උ: සහරාන් විසින් පවත්වන ලද දේශනයක් තිබූ ස්ථානයකට.

ප්‍ර: කවුද ආවේ?

උ: ශිබ්ලි ෆාරුක් මන්ත්‍රීතුමා පැමිණ ගියා.

ප්‍ර: ඒ සහරාන්ගේ රැස්වීමක් කියන්නේ ඔබ කලින් ප්‍රකාශ කරපු සිකුරාදා දින සවස කරන රැස්වීමක්?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: කොහේද ඒ රැස්වීම තිබ්බේ?

උ: ගුඩ්වින් හන්දියේ ස්වාමිනි.

ප්‍ර: සහරාන් හැමදාම රැස්වීම් තියන්නේ ගුඩ්වින් හන්දියේ ද?

උ: නැත ස්වාමීනි ගුඩ්වින් හන්දිය, හිස්බුල්ලා පොදු ජන ක්‍රීඩාංගනය.

ප්‍ර: එතකොට ගුඩ්වින් හන්දියේ තිබ්බේ සහරාන්ගේ එක් රැස්වීමක් ?

උ: නැත ස්වාමීනි. එතැන රැස්වීම් ගණනාවක් තිබ්බා.

ප්‍ර: නැහැ හරි. ඔබ කියන රැස්වීම එක රැස්වීමක්?

උ: එසේ ස්වාමිනි.

ප්‍ර: මොකද්ද වකවානුව ඔය රැස්වීම තිබ්බ?

උ: 2016 අවුරුද්දේ ස්වාමීනි මට මාසය දිනයන් හරියට මතක නැහැ.

ප්‍ර: 2016 වර්ෂයේ?

උ: 2016 වර්ෂය.

ප්‍ර: ඔබ විසින් පුද්ගලිකව නිරීක්ෂණය කෙරුව ද ශිබ්ලි ෆාරුක් කියන අය රැස්වීමට ඇවිල්ලා යනවා?

උ: ඇවිත් පැමිණ පිටව ගියා ස්වාමිනි. එතැන ඇවිත් ඔහු දේශන මොනවත් පැවසුවේ නැහැ. එතැනින් පිටව ගියා.

ප්‍ර: ඒක ඔබ පුද්ගලිකව නිරීක්ෂණය කෙරුවා?

උ: එසේ ස්වාමිනි.

ප්‍ර: ඊට අමතරව ඔබ 2015 දී මඩකලපුව මෙම ස්ථානයේම ද සේවය කෙරුවේ?

උ: එසේ ස්වාමිනි.

ප්‍ර: 2015 දී මහමැතිවරණයට පසුව යම් කලහකාරී තත්ත්වයක් ඇති වුණා නේද සහරාන්ගේ කණ්ඩායම සහ වෙනත් දේශපාලඥයින්ගේ කණ්ඩායම අතර?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: සාමාන්‍යයෙන් ස්වාමීනි ඒ සිදු වීම සිදු වුණේ ශිබ්ලි ෆාරුක් මන්ත්‍රීතුමාගේ කණ්ඩායම හා වෙනත් අනිත් දේශපාලන හිස්බුල්ලා එතුමාගේ දේශපාලන කණ්ඩායම අතර.

ප්‍ර: ඒ කවද්ද, 2015 මහ මැතිවරණයෙන් පස්සේනේ.

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: එම ගැටුමේ යම්කිසි පුද්ගලයෙක්ට තුවාල සිදු වුණානේ?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: සමහරක් තැනැත්තන් මහ රෝහලටත් ඇතුළත් කරානේ?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: එක් තැනැත්තෙක් සහරාන්ගේ සහෝදරයා රිල්වාන් කියලා කිව්වොත් නිවැරදි ද?

උ: එසේය ස්වාමීනි.

ප්‍ර: එතකොට ඒ අවස්ථාවේ දී රිල්වාන් බැලීමට දේශපානඥයින් ගියා නේද?

උ: මම ස්වාමීනි සමාජ මාධ්‍යය හරහා මම දැක්කා එම අවස්ථාවේ දී මෙම දේශපාලනඥයින් දෙදෙනෙක් එතැන ස්ථානයේ සිටිනවා මම දකිනවා. මම මගේ ඇසින් දැක්කේ නැහැ.

ප්‍ර: ඇසින් දැක්කේ නැහැ සමාජ මාධ්‍යය ජාලා හරහා තමා ඔබ දැක්කේ?

උ: එසේ ස්වාමීනි.

****

<u>**ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා.**</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබට මතකද ඔබ බුද්ධි කොට්ඨාශයේ සේවය කරපු කාල සීමාව?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: සහරාන්ට අදාළ ඔය සිද්ධිය අර ගැටුම්කාරී සිද්ධිය ඇති වුණේ 2017 මාර්තු මාදේ 10 වැනිදා බව ඔබට මතකයි ද?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: ඔබ වරෙන්තු ක්‍රියාත්මක කිරීම සඳහා යොමු වුණේ 2017 මැයි 17 කිව්වා?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: එතකොට මාර්තු 10 ඉඳලා මැයි 17 ඉඳලා ඔබ තව දුරටත් බුද්ධි කොට්ඨාශයේම තමයි සේවය කරලා තිබුණේ ඒ කාලේ?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: මාස 02 ක් පමණ?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ බුද්ධි කොට්ඨාශයේ ඉන්දැද්දී ඔය මාස දෙක ඇතුළත ඔබ කරපු බුද්ධි නිරීක්ෂණ මොනව ද සහරාන් පිළිබඳව?

උ: ස්වාමීනි එම අවස්ථාවේ සහරාන් විශේෂ පුද්ගලයෙක් වෙලා හිටියේ නැහැ ස්වාමීනි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඇයි ඔබ එහෙම කියන්නේ. මාර්තු 10 සිද්ධියට ඔහු සම්බන්ධ බවට තිබුණා නේද කරුණු එළිවෙලා?

උ: ස්වාමිනි මෙවැනි සිදුවීම් ගණනාවක් ඒ වෙන සිදුවීම් මේක ස්වාමීනි මා යකඩ කුරකින් පහර දී තුවාල සිදු කිරීමක් සම්බන්ධයෙන් තිබූ වරෙන්තුවක් නිසා ස්වාමිනි මොහු සම්බන්ධයෙන් සොයන්න කියලා මාහට විශේෂ උසස් නිලධාරියෙක් හා නියෝගයක් මොනවත් එහෙම ලබා දීලා තිබුණේ නැහැ ස්වාමිනි.

ප්‍ර: ඔහු ප්‍රෙටල් බෝම්බ ගහලා පීඩාකාරී ආයුධ තියාගත්ත කියලා උසාවියට කරුණු වාර්තා කරලා ඔහු බරපතල තුවාල සිදු කරා කියලා එවැනි කරුණු සහිතව බී වාර්තාවක් මඩකලපුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරල තිබුණු බව ඔබ දැනන් හිටිය නේද?

උ: එසේ ස්වාමිනි.

ප්‍ර: එතකොට එවැනි බරපතල ගණයේ වැරදි තියෙන පුද්ගලයෙක් පිළිබඳව ඔබ මේ මාස 02 ක ඇතුළත බුද්ධි අංශයේ සේවය කරන කාලයේ නිලධාරීයෙක් හැටියට තොරුතුර සොයා බැලුවේ නැහැ කියල ද?

උ: නැත ස්වාමීනි මම සොයා බැලුවා නමුත් ඔහු පිළිබඳ විශේෂයක් යොමු කර මම සොයා බැලුවේ නැහැ ස්වාමිනි.

ප්‍ර: ඒ මාස 02 ඇතුළත සහරාන් කාත්තන්කුඩි ප්‍රදේශයට වරින්වර ඇවිල්ලා ගිහිල්ලා තිබුණා නේද?

උ: මම දැනන් හිටියේ නැහැ ස්වාමිනි.

ප්‍ර: ඉතින් ඔබ බුද්ධි කියලා මොනව ද ඔබ කළේ එතකොට ඒ කාලේ?

උ: ස්වාමීනි විවිධ රාජකාරී අපිට පවරා දෙනවා ඒ සම්බන්ධව

ප්‍ර: කියන්න බලන්න මොන වගේ රාජකාරී ද බුද්ධි අංශයේ ඉන්දැද්දී පවරපුවා?

උ: ස්වාමිනි විශේෂයෙන් සෑම මසකම අප පුනරුත්තාපනය වූ හෝ පුනරුත්තාපනය නොවූ LTTE සැකකරුවන් සම්බන්ධ ඔහුගේ ක්‍රියාකාරිත්වයන් හා ඔවුන් වසමෙන් පිටව සිටින ස්ථානයෙන් සම්බන්ධයෙන් අපි සොයා බලා දැනුම් දීමක් කරන්න ඕන. ඔහුගේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් අපි දැනුම් දීමක් කරන්න ඕන ස්වාමීනි. ඒ වගේම ස්වාමිනි රාජ්‍යය නොවන සංවිධාන සම්බන්ධයෙන් වෙන ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් අපි දැනුම් දීමක් කරන්න කියලා අපිට දැනුම් දෙනවා අපේ ස්ථානාධිපතිතුමා. තව ස්වාමිනි විවිධ සංවිධාන මගින් සිදු වෙන මහජන සාමය කඩකිරීම් සම්බන්ධයෙන් තොරුතුරු ලබා දෙන්න කියලා එවැනි දේවල් දැනුම්දීලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර: දැන් මේ කාලේ ඇතුළත ඔබ ස්ථානාධිපතිතුමා දැනුම් දුන්නේ නැද්ද මුස්ලිම් අන්තවාදී ක්‍රියා සම්බන්ධයෙන් මූලිකත්වය ගෙන කටයුතු කරන සහරාන් පිළබඳව සොයා බලන්න කියලා ?

උ: නැත ස්වාමීනි.

ප්‍ර: ඒකට විශේෂ හේතුවක් තිබුණ ද ඒවා හොයන්න එපා කිව්ව ද?

FAIR COMMENT BY JEZEEM

උ: නැත ස්වාමීනි. ඒ කාලේ එතරම් ප්‍රසිද්ධියක් ඉසුලුවේ නැහැ ස්වාමිනි.

ප්‍ර: සහරාන්ගේ කටයුතු සම්බන්ධයෙන් ඒ ප්‍රදේශයේ ජනතාව සතුටෙන් ද හිටියේ?

උ: බහුතරයක් සතුටෙන් හිටියේ නැහැ ස්වාමිනි.

ප්‍ර: එවැනි වාතාවරණයක් යටතේවත් ඔබට යුතුකමක් සහ වගකීමක් තිබුණා නේද සහරාන් පිළිබඳව බුද්ධි කොට්ඨාශයේ නිලධාරියෙක් හැටියට තොරතුරු සොයා බලන්න?

උ: මම ස්වාමීනි තොරතුරු සොයා බැලුවා ස්වාමීනි. එම කාලය තුළ ඔහු කාත්තන්කුඩි ප්‍රදේශයේ සිටියේ නැහැ ස්වාමිනි.

ප්‍ර: හොඳයි දැන් සහරාන් නැහැනේ?

උ: එසේ ස්වාමිනි.

ප්‍ර: දැන් ඒ මිනිසුන්ගේ තියෙන හැඟීම මොකද්ද මේ සහරාන් පිළිබඳව?

උ: දැනට ස්වාමීනි මුස්ලිම් ජනතාව ඔහු සම්බන්ධයෙන් ප්‍රශංසාත්මකව කතා කරන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර: දැන් එහි ඉන්න මිනිස්සු දැන් තමුන් තවමත් කාත්තන්කුඩි පොලිසියෙනෙ වැඩ කරන්නේ?

උ: ඔව් ස්වාමිනි.

ප්‍ර: එහේ ඉන්න මිනිසස්සු මේ සහරාන් පිළිබඳව මොනව ද දැන් කතා කරන්නේ?

උ: ඔහු ස්වාමිනි ඔහුගේ මූලික කාත්තන්කුඩි බහුතරයක් මුස්ලිම් ජනතාව සිටියේ ව්‍යාපාර කටයුතු වල ඔහු ලංකාවේ සෑම ප්‍රදේශක්ම පාහේ ව්‍යාපාර කටයුතු සිදු කරමින් සිටියා. මෙම සහරාන් සිදු විමක් සමඟම ඔවුන්ගේ ඒ ව්‍යාපාර කටයුතු අඩාල වූ බවටත් ඒ සම්බන්ධයෙන් ඔහු ගොඩක් චෝදනා කරනවා සහරාන්ට ස්වාමිනි.

ප්‍ර: එතකොට දැන් සහරාන්ගේ අනුගාමිකයෝ තවමත් එවැනි අන්තවාදී දේශන එහෙම පවත්වමින් වරින් වර ඔය තැන් තැන්වල රැස්වීම් තියනවා නේද?

උ: නැත ස්වාමිනි.

ප්‍ර: කිසිම කෙනෙක් ?

උ: නැත ස්වාමිනි.

ප්‍ර: ඔබ ඒ පිළිබඳව සොයා බැලුව ද?

උ: එසේ ස්වාමීනි. ස්ථීර කරන්න පුළුවන් සහරාන්ගේ අනුගාමිකයන් කිසිම කෙනෙක් පවත්වන්නේ නැහැ.

ප්‍ර: සහරාන්ගේ අනුගාමිකයන් නොවන නමුත් ඒ හා සමාන අන්තවාදී අදහස් තියෙන අය රැස්වීම් පවත්වනවා නේද තවමත්?

උ: දැනට ස්වාමිනි මම බුද්ධි අංශයේ නෙමෙයි රාජකාරී කරන්නේ. මම දන්න විදියට එහෙම රැස්වීම් පවත්වන්නේ නැහැ ස්වාමීනි. මම දන්න විදියට.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ කියන්නේ දැන් සහරාන් මිය ගියාට පස්සේ ඔබ මේ අපි මේ කොමිෂමට දැනුම් දෙන හදන්නේ මේ අන්තවාදී අදහස් තියෙන ඔක්කොම මුස්ලිම් මිනිස්සු නිහඬ වෙලා ඉන්නවා කියලද?

උ: නැත ස්වාමිනි ඔහු රහසිගතව මෙම ක්‍රියාත්මක වෙනව ද කියලා මම නම් දන්නේ නැහැ.

ප්‍ර: සොයා බලන්න උත්සාහ කළෙත් නැහැ?

උ: ස්වාමීනි මට ස්ථාන පොතක් ලබා දෙන රාජකාරියේ පමණයි මම ස්වාමිනි කරන්නේ ඊට අමතරව මම ඒ සම්බන්ධයෙන් සොයා බැලීමක් කරන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර: ඔබ දන්නව ද ඔය පළාතේ සිංහල මිනිස්සු කොච්චර ඉන්නව ද කියලා?

උ: කාත්තන්කුඩි පොලිස් බල ප්‍රදේශය තුළ පමණක් සිංහල 17 ක් හෝ 12 ක් පමණ ප්‍රමාණයක් තමයි ඉන්නේ.

ප්‍ර: ඒ 17 මොනව ද කරන්නේ?

උ: එයින් බහුතරයක් ස්වාමීනි ධීවර වෘත්තියේ යෙදිලා ඉන්න කට්ටිය තමයි.

ප්‍ර: ඒ අයට දැන් අනිත් මුස්ලිම් අයගෙන් යම් යම් පීඩාවල් හිරිහැර කරදර බාධක එහෙම බලපෑම් නැද්ද?

උ: නැත ස්වාමීනි ඔහු ගොඩක් බහුතරයක් සිටින සිංහල ජනතාව, දෙමළ ජනතාව සිටින ප්‍රදේශ වල තමා වාසය කරන්නේ.

ප්‍ර: ඒ අය සහයෝගයකින් ඉන්නවා සහජීවනයෙන් ඉන්නවා ?

උ: ඉන්නවා ස්වාමිනි. ඒසේ ස්වාමිනි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර සාක්ෂිකරු කිව්වා කාත්තන්කුඩි ප්‍රදේශයේ සිකුරාදට කඩ වහලා එදාට වහන්නේ කියලා කඩ සාප්පු?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: ඉරිදා නිවාඩු දිනයක් නෙමේයි කියලා?

උ: නැත ස්වාමිනි.

ප්‍ර: සිකුරාදා දිනයේ දී රජයේ බැංකු සහ පෞද්ගලික බැංකු ආදීයත් වහනව ද?

උ: එම ස්වාමීනි පෞද්ගලික බැංකු රජයේ බැංකු වහන්නේ නැහැ ස්වාමීනි. නමුත් එම ජනතාව බහුතරයක් ගැවසෙන්නේ නැහැ එම ස්ථාන වල ස්වාමිනි එදිනට.

ප්‍ර: ඒවා වහන්නේ නැහැනේ?

උ: වහන්නේ නැහැ ස්වාමිනි.

****

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු අදිකාරී මැතිණිය.</u>

ප්‍ර: ඔබ බුද්ධි නිලධාරියෙකු ලෙස රාජකාරී කරන කාලයේ දී සහරාන් සමඟ ඔහුගේ මතවාදය හා යමින් සමගාමීව කටයුතු කරපු වෙනත් සංවිධාන තිබුණ ද?

උ: ඔහුගේ මතවාදයට සම්බන්ධව වෙනත් කටයුතු කල සංවිධාන තිබුණේ නැහැ ස්වාමිනි. වෙනස් මතවාද දරපු සංවිධාන තමයි තිබුණේ.

ප්‍ර: සූෆි මුස්ලිම්වරුන් ද ඔබ වෙනස් මත දරණ සංවිධානය කියන්නේ. සුන්නත් වල් ජමාත් කියන.

උ: එසේ ස්වාමීනි. මම පෙර සඳහන් කර පරිදි සුන්නතුන් වල් ජමාත් සංවිධානයේ ඔවුන් සෑම වර්ෂයක් පාසාම මහජනතාව විසින් දානය කටයුතු සූදානම් කර පිරිනමනවා. යම් කිසි ධාතු වන්දනවා වැනි ඒ වන්දනාවන් බෞද්ධ ආගමේ පරිදි ධාතු ප්‍රදර්ශනය කිරීම වැනි වැඩ කටයුතු කරනවා සෑම අවුරුද්දක්ම පාසාම ඔවුන් ඒ දේ සිදු කරනවා ස්වාමිනි.

ප්‍ර: ශ්‍රී ලංකා තවුහිද් ජමාත් කියලා සංවිධානයක් තිබුණේ නැද්ද කාත්තන්කුඩිය ප්‍රදේශයේ ක්‍රියාත්මක වන?

උ: දැනටත් තිබෙනවා ස්වාමිනි.

ප්‍ර: කවුද ඒකේ නායකයා?

උ: ඒකේ නායකයා ස්වාමිනි මුලින් මිහිලාර් කියලා පුද්ගලයෙක් තමයි එහි සිටියේ. නමුත් ඔහු දැන් වෙනස් වෙලා මාරු වෙලා .

ප්‍ර: ඒ සංවිධානයයි සහරාන්ගේ සංවිධානයයි අතර තිබුණේ කොහොම සම්බන්ධතාවයක් ද?

උ: ඔවුන් මුලදී ස්වාමිනි මම දන්න විදියට එම සංවිධාන දෙකම එකට සිටපු සංවිධානයක් සුළු සුළු මතවාදයන් නිසා දැනට වෙන් වී සිටිනවා.

ප්‍ර: ඔවුනුත් විශ්වාස කළේ අර එක ආගමක් පමණයි තිබිය යුත්තේ කියලා ඉස්ලාම් ධර්මය කියන එකම විතර ද සහරාන් වගේ?

උ: එසේ සහරාන් වගේ ඒ විදියට හිතුවේ නැහැ. ඔවුන් ඊට වඩා ලිහිල් ප්‍රතිපත්තියක් තමයි අනුගමනය කළේ. ශ්‍රී ලංකා තවුහිද් ජමාත් සංවිධානය ස්වාමිනි.

ප්‍ර: දැන් ඔය සිකුරාදා පල්ලියේ පූජාවෙන් පස්සේ තමයි මේ සහරාන් ඔහුගේ අනිත් ආගම දේශනා කිරීමේ තැන් තැන් වල රැස්වීම් කරනවා කිව්වනේ ¢

උ: එසේ ස්වාමිනි.

ප්‍ර: ඔය සිකුරාදා ජුම්මා මස්ජීඩ් පල්ලියක් තියෙනව ද ඔය සහරාන් දේශනා පවත්වන?

උ: ස්වාමීනි සිකුරාදා දින ඔහු පල්ලියේ දේශනා පවත්වන්නේ නැහැ. පොදු ස්ථානයක් තෝරාගෙන තමයි ඔහු දේශනා පැවැත්තුවේ.

ප්‍ර: පල්ලියේ දේශන පවත්වලා නෙවෙයි ද ඔහු එළියට ගිහිල්ලා ඊට පස්සේ අර විවිධ දේශනාවල් කළේ මිනිස්සුන්ට?

FAIR COMMENT BY JEZEEM

උ: නැත ස්වාමීනි. පල්ලියේ ෂයිනි මවුලවී ඔහුගේ සහෝදරයා තමා පල්ලියේ මූලික දුරටත් දේශනා පැවැත්තුවේ. මං හිතන්නේ සහරාන් මවුලවීත් කරපු අවස්ථා තියෙනවා. නමුත් ප්‍රධාන වශයෙන් සිකුරාදා දින සහරාන් මවුලවී ප්‍රධානත්වයෙන් මහජනතාව ගැවසෙන ප්‍රසිද්ධ ස්ථානයක තමයි දේශනා පැවැත්තුවේ.

ප්‍ර: දැන් ඔබ ප්‍රකාශ කරලා තිබෙනවා බුද්ධි තොරතුරු ඔබ සතියකට වරක් එම ප්‍රදේශයේ භාර පොලිස් අධිකාරී කොට්ඨාශ භාර පොලිස් අධිකාරීතුමා වෙත යවනවා කියලා.

උ: එසේ ස්වාමිනි.

ප්‍ර: ඔබ කෙළින්ම දෙනව ද එහෙම නැත්නම් කොහොම ද ඒක කොට්ඨාශ භාර පොලිස් අධිකාරිතුමා වෙතඑම තොරතුරු යන්නේ?

උ: ස්වාමිනි සෑම ගොඩාක් අවස්ථා සිකුරාදා දින ඔවුන් පත්‍රිකා නිකුත් කරනවා. මෙම ද්‍රවිඩ භාෂාවෙන් නිකුත් කරනවා. එම පත්‍රිකා වල එම පත්‍රිකා ද්‍රවිඩ භාෂාවෙන් නිකුත් කර පසු එය සිංහලට පරිවර්තනය කර කොට්ඨාශ බුද්ධි අංශයට ලබ දිමක් කරනවා. කොට්ඨාශ බුද්ධි අංශයෙන් තමයි එය ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිතුමා වෙත යොමු කරන්නේ.

ප්‍ර: කෙළින්ම යවනව ද පොලිස් ස්ථානාධිපතිතුමාට දෙන්නේ නැද්ද එම තොරතුරු?

උ: විශේෂ දෙයක් තිබුණොත් සාමය කඩ කිරීමක් වගේ යම්කිසි දෙයක් එම පත්‍රිකාවේ තිබුණොත් එහෙම ස්ථානාධිපතිට දැනුම් දෙනවා. නැති වුණොත් ඔහුගේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් තමා අප කොට්ඨාශ බුද්ධි අංශය ස්ථානාධිපතිවරයාට දැනුම්දීමක් කරන්නේ.

ප්‍ර: ඉතිං සාමය කඩවෙන ඒවා නේද මේ සහරාන් හැමදාම කරලා තියෙන්නෙ. මිනිසුන් එක්ක දේශන පවත්වමින් මිනිසුන් එක්ක රණ්ඩු කරමින් ආරවුල් ඇති කර ගනිමින් ඔක්කොම කරලා තියෙන්නේ සාමය කඩ වෙන ඒවනේ. එතකොට ස්ථානාධිපතිවරයාට ඔය ගොල්ලා බුද්ධි නිලධාරීන් ලෙස වාර්තා කරන්නේ නැද්ද මෙහෙම මෙහෙම?

උ: එම දැනුම් දෙනවා ස්වාමිනි. එම හැම රැස්වීමකටම අඩුම වශයෙන් පොලිස් නිලධාරීන් 20 ක් 30 වගේ රාජකාරී යෙදෙව්වා මොහු රැස්වීම් පවත්වන අවස්ථාවන් වලදී. ස්ථානාධිපතිවරයා දැනුම්දීමෙන් පසු තමයි එම නිලධාරීන් යෙදෙව්වේ රාජකාරී සඳහා.

ප්‍ර: දැන් ඔබ පරිවර්තනය කරනවා කිව්වේ ඔහුගේ අන්තවාදී කතා ද සිංහල භාෂාවට පරිවර්තනය කරනවනේ ඔහුගේ දෙමළ ඒවා. ඔහුගේ දේශනාවන්?

උ: එහි සඳහන් වෙන්නේ ගොඩාක් මත්ද්‍රව්‍ය භාවිතා කරන ආකාරය ඒ වගේ මම පෙර ඔහුගේ මතවාදය සම්බන්ධයෙන් දැනුම් දුන් තොරතුරු තමයි පත්‍රිකා වල මහජනතාව දැන ගැනිම සඳහා මොහු යොමු කරලා තිබුණේ.

ප්‍ර: දැන් ඔබ හිටියනේ බෝම්බ ප්‍රහාරයට පෙර සහ බෝම්බ ප්‍රහාරයෙන් පසුවත් ඔය කාත්තන්කුඩි පොලිස් ස්ථානයේ බුද්ධි නිලධාරියෙක් ලෙස?

FAIR COMMENT BY JEZEEM

උ: නැත ස්වාමීනි. බෝම්බ ප්‍රහාරය වෙන අවස්ථාවේ දී මම කුණ්ඩසාල පොලිස් අභ්‍යාස විද්‍යාලයේ ඉංග්‍රීසි ඩිප්ලෝමාලාවේ.

ප්‍ර: ඒ කෙටි කාලයේ ඒවානේ . ඔබතුමා අඛණ්ඩව හිටියේ ඔය කාත්තන්කුඩි පොලිස් ස්ථානයේ නේද?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔය සහරාන් කියන පුද්ගලයා මේ අන්තර්ජාලය සහ සයිබර් අවකාශය භාවිතා කරමින් ඔහුගේ අන්තවාදී දේශනා ප්‍රචාරය කරමින් CD තැටි ඒවා බුද්ධි නිලධාරීන් ලෙස ඔබලාගේ දැනුමට අසුවුණේ නැද්ද?

උ: ඔහු NTJ MEDIA UNIT නමින් සමාජ මාධ්‍ය ජාලා බොහෝ පවත්වාගෙන ගියා ස්වාමීනි. ඒ සම්බන්ධයෙන් මම හිතන්නේ අප ගොඩක් පොලිස් රාජ්‍යය බුද්ධි සේවාවත් සමඟ වැඩ කරා. අපත් ඒ සම්බන්දව මේ වගේ තොරතුරු ඔහුගේ MEDIA UNIT එකේ පළ වෙනවා කියලා අපි දැනුම් දීලා තියෙනවා. අපි කොට්ඨාශ බුද්ධි අංශයේ ස්ථානාධිපතිතුමාට. ඊට අමතරව මම සිටි කාලය තුළ රාජ්‍යය බුද්ධි අංශයන් එම විඩියෝ පට ලබාගෙන ඒ අදාළ නිලධාරින්ට දැනුම්දීලා තියෙනවා ඒ දවස් වල ස්වාමීනි.

ප්‍ර: කාටද දැනුම් දීලා තියෙන්නේ?

උ: රාජ්‍යය බුද්ධි අංශයේ නම් මම දන්නේ නැහැ කාට භාරදුන්න ද කියා. මම අපේ ස්ථානාධිපතිතුමාට දැනුම් දීලා තියෙනවා MEDIA UNIT එකේ මේ වගේ දේශන යනවා කියලා. අපේ කොට්ඨාශයේ බුද්ධි අංශයේ ස්ථානාධිපතිතුමාට.

ප්‍ර: එතකොට කොට්ඨාශ බුද්ධි අංශයේ ස්ථානාධිපතිතුමා නීතිය හා සාමය කඩවෙන අවස්ථාවල්නේ මේවා. පොලිස් ස්ථානාධිපතිට දන්වලා නැද්ද?

උ: එම හේතුවකට තමා ස්වාමීනි ගොඩක් අවස්ථා ඔහු සම්බන්ධයෙන් විවිධ පැමිණිලි පොලිසියට ලැබිලා තිබුණා ඒ සම්බන්ධයෙන් අපහස කිරීම් වගේ දේවල් සම්බන්ධයෙන් ඒ සම්බන්ධයෙන් ස්ථානාධිපතිතුමා නිලධාරී රාජකාරියේ යෙදෙවුවා හැම රැස්වීමක පාහේ රාජකාරියේ යෙදෙව්වා ස්වාමීනි රැස්වීම් අවලංගු කරන්නත් ස්ථානාධිපතිතුමා කටයුතු කරා. අධිකරණ නියෝග ලබා ගෙන ස්වාමිනි.

****

<u>**ගරු විනිසුරු බන්දුල අතපත්තු මැතිතුමා.**</u>

ප්‍ර: මහත්මයා දැන් ඔය ප්‍රදේශයේ ඔබගේ පොලිස් area එකේ සාමාන්‍යයෙන් මොන විදියේ අපරාධද සිද්ධ වෙන්නේ?

උ: වැඩියක් ස්වාමිනි බාල වයස් දරුවන් බාල වයස් දැරියන් අපහරණය ඒ වගේ අපරාධ සිද්ධි තමා වැඩි පොලිස් වසම area එක තුළ.

ප්‍ර: බාල?

උ: බාල වයස් දැරියන් හා බාල වයස් දරුවන් අපහරණය

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: අපහරණය

උ: එසේ ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ මුස්ලිම් දරුවන් ද?

උ: ඔව්. ගොඩක් මුස්ලිම් දරුවන් තමයි ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ මුස්ලිම් පුද්ගලයෝ විසින් අපහරණය කිරීම ද?

උ: ඔව්. මුස්ලිම් පුද්ගලයෝ විසින් බාල වයස්කාර දැරියන් වයස අඩු දැරියනුයි වයස අඩු පිරිමි ළමුන්වයි අපහරණය කිරීම සිදු වෙනවා. ගොඩාක් වාර්තා වීම් සිදු වෙලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර: එතකොට මත්ද්‍රව්‍යය සම්බන්ධව වැරදි සිද්ධ වෙන්නේ නැද්ද?

උ: මත්ද්‍රව්‍යය සම්බන්ධව වැරදි ගොඩාක් තිබෙනවා ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ දැන් හෙරොයින් වගේ දේවල් ?

උ: දැනටත් හෙරොයින් භාවිතා කරනවා. ගොඩාක් කාත්තන්කුඩිවල ස්වාමීනි.

ප්‍ර: ඒවා සම්පූර්ණයෙන් සහරාන් විරුද්ධ වුණාට තව පුද්ගලයෝ ඉන්නව ද ඒවා කරන කට්ටිය?

උ: සංවිධාන වශයෙන් ස්වාමීනි එම මත්ද්‍රව්‍යය සම්බන්ධව කට්ටිය ක්‍රියාත්මක වෙලා නැහැ. නමුත් මත්ද්‍රව්‍යය සම්බන්ධව වෙනම පුද්ගලයෝ ජවාරම්කරන විකුණන පුද්ගලයෝ කාත්තන්කුඩියේ දැනටත් ඉන්නවා ස්වාමිනි.

ප්‍ර: දැන් එතකොට විදේශ වලින් දැන් ඔය කේරලා ගංජා වගේ ඒවා ගේන අය වගේ අයත් ඉන්නව ද?

උ: කේරලා ගංජා මන්නාරම ප්‍රදේශයේ වගේ මුලතිව් ප්‍රදේශය වගේ එහෙම ප්‍රදේශ වලින් කාත්තන්කුඩි පොලිසිය රැගෙන ඒමේ දී අපි අත්අඩංගුවට ගෙන තිබෙනවා ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකරු ශිබ්ලි ෆාරුක් යන දේශපානඥයට අමතරව සහරාන් සහ ඔහුගේ කණ්ඩායම් සමඟ සම්බන්ධතා පැවැත්තූ දේශපාලනඥයින් කවුද?

උ: මම එසේ නම් දන්නේ නැහැ ස්වාමීනි. මම අහලා තිබෙනවා මොහු හිස්බුල්ලා මන්ත්‍රීතුමා සමඟ හා TMGG පක්ෂයේ රහුමාන් මහතා සමඟ ඔහු ගිවිසුමක් එළඹුණයි කියලා මැතිවරණ සම්බන්ධයෙන් ගිවිසුමක් එළඹුණයි කියලා මම අහලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් මම මොනවත්ම දන්නේ නැහැ.

****

FAIR COMMENT BY JEZEEM

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා.</u>

ප්‍ර: ඉහළගම් මහත්මයා ඔබ මේ රිල්වාන් යන අයව මුහුණට මුහුණ හමුවෙලා තියෙනව ද?

උ: එසේ ස්වාමිනි.

ප්‍ර: මේ රිල්වාන් යන අය මොනවද කාත්තන්කුඩි පළාතේ 2017 මාර්තු 10ට පෙර රැකියා වශයෙන් කෙරේ?

උ: ඔහු රන් භාණ්ඩ නිෂ්පාදනය කිරීම වශයෙන් ඔය පොඩි වෙළඳසැලක් පවත්වාගෙන ගියා ස්වාමිනි.

ප්‍ර: ඒ ඔහුගේම වෙළඳසැලක් ද වෙනත් අයෙකුගේ වෙළඳසැලක ඔහු අත් උදව්වට වැඩ කරපු පුද්ගලයෙක් ද?

උ: ඔහුයි තව සාමාජිකයෙකුයි ස්වාමිනි එම වෙළඳසැල පවත්වාගෙන ගියා. මමත් යම් කිසි සිදුවීමක් ඒ සම්බන්ධයෙන් කරුණු විමසලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර: ඔබ මොන අවස්ථාවේ දී ද ඔය ඒ ස්ථානයට ගියේ. මොකක් සම්බන්ධයෙන් ද විමසා සිටියේ?

උ: ස්වාමිනි අපේ නිවසක් බිඳ දේපළ සොරා ගැනීමක් සම්බන්ධයෙන් රන් භාණ්ඩ මේ වගේ තැන් බොහෝමයකට මම ගිහිල්ලා කියලා තියෙනවා. මෙම සලකුණු සහිත රන් භාණ්ඩ ඔබ ස්ථානයට ලැබුණොත් මට දැනුම් දෙන්න කියලා. එවැනි අවස්ථාවක දී එම හොරකම් කරන ලද රන් භාණ්ඩ මොහු රිල්වාන් වැඩ කරන ස්ථානයට ලැබුණු පසු ඔහු මට දැනුම් දුන්නා. එවැනි භාණ්ඩ මං ගාවට පැමිණිලා තියෙනවා කියලා ඔහු මට තොරතුරු ලබා දුන්නා. අත්ඩංගුවට ගැනීමක් සිදු කරලා තියෙනවා රාජකාරී කරන අවස්ථාවේ ස්වාමීනි.

ප්‍ර: දැන් මේ සොරකම් කරන ලද රණ් භාණ්ඩ ගැන ඔබට ඒ තොරතුරු දැනුම් දුන්නේ කවුද?

උ: රිල්වාන් දැනුම් දුන්නේ ස්වාමිනි.

ප්‍ර: කොහොමද ඔබට දැනුම් දුන්නේ?

උ: රිල්වාන් දැනුම් දීලා තියෙනවා ස්වාමිනි පැමිණිලිකරු වෙත. රිල්වාන්ට මම දැනුම් දුන්නයි පස්සේ එම පැමිණිලිකරු වෙත දැනුම් දීලා එම පැමිණිලිකරු මා හට දැනුම් දුන්නා අහවල් රිල්වාන් වැඩ කරන ස්ථානයේ තිබ්බ භාණ්ඩ උණු කිරීම සඳහා එම සොරා විසින් ලබා දීලා තිබෙනවා.

ප්‍ර: ඒ අනුව එම රන් භාණ්ඩ ඒ අදාළ පුද්ගලයාට භාර දීමක් සිද්ධ වුණා ද?

උ: එසේ ස්වාමිනි.අධිකරණයට භාර දිලා ඔහුට භාරදීමක් සිදු වුණා.

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: එම ගනුදෙනුව සිදුවුණේ රිල්වාන් ඔබට කතා කිරීමෙන් ද?

උ: නැත ස්වාමිනි . පැමිණිලිකරුට මම ඔහුට ප්‍රකාශ කරාට පස්සේ ඔහු පැමිණිලිකරුට ඒ සම්බන්ධ දැනුම්දීලා පැමිණිලිකරු මා හට දැනුම් දුන්නා.

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අවශ්‍යද යන්න අති උතුම් මැල්කල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥවරයාගෙන් අසමි. අවශ්‍ය නොවන බව ප්‍රකාශ කරයි.

සාක්ෂිකරු මුදා හරී.
වේලාව: අළුයම 01.10

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය: 2020.06.17 වේලාව: අළුයම 01.10

සටහන් කළේ - සචිනි මදුෂිකා.

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා -සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

පෙනී සිටීම:-

* ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය , ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය,රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා, රජයේ අධිනීතිඥ දිලන්ත එස් කළුදුරුවගේ මහතා සහ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* රෝමානු කතෝලික දේවස්ථානය වෙනුවෙන් අද දින නීතිඥ චමත් ප්‍රනාන්දු මහතා සමඟ ජනාධිපති නීතිඥ ශ්‍රමිල් පෙරේරා මහතා පෙනී සිටී.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

නම	:	**රොබට් රූබන්.**
වයස	:	**අවු 30**
ජාතිය	:	**ද්‍රවිඩ**
ආගම	:	**ක්‍රිස්තියනි.**
දැනට දරණ තනතුර	:	**පොලිස් කොස්තාපල්.**
දැනට සේවා ස්ථානය:		**කාත්තන්කුඩි පොලීසිය.**

සාක්ෂිකරු ද්‍රවිඩ භාෂාවෙන් ප්‍රතිඥා ලබා දෙයි.

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා.</u>

ප්‍ර: මහත්මයා ඔබට සිංහල භාෂාව තේරුම් ගැනීමට හා කතා කිරීමේ හැකියාවක් තියෙනව ද?

උ: ස්වාමිනි කතා කරන්න පුළුවන්.

ප්‍ර: අහන ප්‍රශ්න තේරුම්ගෙන උත්තර දීමේ හැකියාවක් තියෙනවා නේද?

උ: ඔව්.

ප්‍ර: ඔබ උපත ලබා පාසල් ගියේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කිව්වොත් නිවැරදිද?

උ: ත්‍රිකුණාමලයේ දිස්ත්‍රික්කයට තමයි ගියේ.

ප්‍ර: සෙල්වනායගම් හින්දු පාසලට ගියා කිව්වොත් නිවැරදිද?

උ: සේලවනායගම් හින්දු මහා විද්‍යාලයට.

ප්‍ර: ශ්‍රී ලංකා පොලීසිය සමඟ මුලින්ම ඔබ සම්බන්ධ වෙන්නේ කොයි කාලේ ද?

උ: 2012.10.01 වැනිදා.

ප්‍ර: ඔබ 2012 ශ්‍රී ලංකා පොලීසිය හා සමඟ සම්බන්ධ වෙලා ඉන්පසු ඔබට මුලින්ම පත්වීම හම්බ වුණේ කාත්තන්කුඩි පොලීස් ස්ථානයේ කිව්වොත් නිවැරදි ද?

උ: PTS ඉඳලා අවුට් වෙලා පළවැනි පොලිසිය කාත්තන්කුඩි තමා.

ප්‍ර: ඒ අනුව 2013.12.22 ඉඳලා ඔබ කාත්තන්කුඩි පොලිස් ස්ථානයට අනුයුක්තව එහි සියළුම අංශ වල පුහුණුවක් ලබා ගත්තා කිව්වොත් නිවැරදිද?

උ: සියළුම අංශ වල මං වැඩ කරලා තියෙනවා.

ප්‍ර: කාත්තන්කුඩි පොලිස් ස්ථානයේ බුද්ධි අංශයට ඔබ මුලින්ම අනුයුක්ත වෙන්නේ කොයි කාලෙද?

උ: 2017.03 වැනි මාසේ 29 වැනිදා.

ප්‍ර: 2017.03 වැනි මාසේ 29 වැනිදා සිට මේ දක්වා ඔබ කාත්තන්කුඩි පොලිස් ස්ථානයට අනුයුක්ත කොට්ඨාශ බුද්ධි ඒකකයට වැටෙන නිලධාරීයෙක් කිව්වොත් මං නිවැරදි ද?

උ: කොට්ඨාශ බුද්ධි අංශ යටතේ තමයි අපි වැඩ.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔබ කොට්ඨාශ බුද්ධි අංශයට එකතු වුණාට පස්සේ ඔබට දැන ගන්න ලැබුණ ද මේ සහරාන් හෂීම් කියන පුද්ගලයෙක් සම්බන්ධයෙන්?

උ: අපි කාත්තන්කුඩියේ පොලීසියේ වැඩ කරපු කාලේ මං සහරාන් සම්බන්ධයෙන් දන්නවා. සාමාන්‍යයෙන් 2017 අලියාර් සන්ධි Case එකේ එතැන ගැටුම් ඉඳලා ඒක දන්නවා එයින් පස්සේ අපි සහරාන් සම්බන්ධයෙන් හොයලා තිබ්බා. වොරන්ට් තිබ්බා සහරාන්ට. අපේ වොරන්ට් නිලධාරී එක්ක මෙයාව හොයන්න ගිහිල්ලා ආවා.

ප්‍ර: දැන් 2017.03.29 පස්සේ ඔබලා සහරාන් ගැන මොනවද වැඩිදුරටත් බුද්ධි අංශ නිලධාරීන් විදියට මොනවද තව දුරටත් ඔබලා හොයා ගත්තේ?

උ: සහරාන් සම්බන්ධයෙන් අපි දැන් වොරන්ට් තිබ්බා. ඒ නිසා එයාට විරුද්ධව උසාවියේ නඩු තිබ්බා. ඒ කාලයට දැන් warrant එක සමහර වෙලාවට division මහත්මයා හරහා එනවා. ඒ නිසා අපි වොරන්ට් නිලධාරීන් එක්ක warrant තිබ්බ නිසා එයත් එක්ක ගිහිල්ලා හොයලා තියෙනවා.

ප්‍ර: එතකොට මේ කාත්තන්කුඩි ප්‍රදේශයේ මේ සහරාන් හෂීම් හිටිය ද?

උ: 2017 අලියාර් සන්ධියේ case එකෙන් පස්සේ කාත්තන්කුඩි ප්‍රදේශයේ මේ අය ඉඳලා නැහැ.

ප්‍ර: දැන් සහරාන් හෂීම් කියන පුද්ගලයා හිටියේ නැති වුණත් ඔහුගේ පල්ලිය තිබුණා නේද මහත්මයා?

උ: පල්ලිය තියෙනවා.

ප්‍ර: එතකොට ඒ පල්ලියේ සාමාන්‍යයෙන් යාඥා පැවතුණා ද?

උ: සහරාන් ගියායින් පස්සේ සහරාන්ගේ මල්ලි හිටියා මෙයිනි කියලා. අනිත් එක පල්ලියේ දැන් මං බුද්ධි අංශ අවොත් පස්සේ පල්ලිය තවුහිත් කියලා මවුලවී කෙනෙක් හිටියා. එයාගේ යටතේ ඒ පල්ලියේ වැඩ කටයුතු යනවා.

ප්‍ර: ඒ කියන්නේ සාමාන්‍ය යාඥා කිරීම ජුම්මා prayers කළේ මේ සහරාන් වෙනුවට වෙන මවුලවී කෙනෙක් ද?

උ: වෙන මවුලවි කෙනෙක් හිටියා.

ප්‍ර: කවුද කළේ?

උ: තවුහිත් කියලා.

ප්‍ර: තවුහිත් මවුලවී කියලා. මේ තවුහිත් මවුලවී කියන්නේ කවුද? සහරාන්ගේ ඥාතියෙක් ද නැත්නම් කවුද?

උ: මෙයා ඇවිල්ලා NTJ තවුහිද් පවුලේ මෙයා සම්බන්ධ වෙච්ච කෙනෙක්.

ප්‍ර: ඔහුත් තවුහිද් මතවාදය දරණ පුද්ගලයෙක් කිව්වොත් නිවැරදි?

උ: ඒ කාලයට එයානම් සහරාන් හිටපු විදියට නම් ඉඳලා නැහැ. සාමාන්‍යයෙන් ඒ පල්ලි වලට පස්සේ වදින වෙලාවල් තියෙනවා. ඒකයි මවුලවී වලට සභාපතිවලට හිටියා එයා පල්ලියේ.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් සහරාන් ප්‍රදේශයෙන් පලා ගියාට පස්සෙත් මේ සහරාන්ගේ පල්ලිය ඉතාමත් හොඳින් වැඩි දියුණු වුණා ඔබලා නිරික්ෂණය කරාද බුද්ධි අංශ විසින් භෞතිකව ගොඩනැගිලි එහෙම දියුණු වුණා නිරික්ෂණය කරාද?

උ: අපි කරලා බැලුවා ඉතිං ඒ කාලේ සහරාන් ගියායින් පස්සේ තවුහීක් මවුලවී ආවම පස්සේ තමයි මේ පල්ලිය ලොකුවට හදාගෙන හිටියා.

ප්‍ර: දැන් ඔබලා පරික්ෂා කරලා බැලුව ද මේ සහරානුත් නැහැ මේ සහරාන්ගේ පල්ලිය කොහොමද මෙතරම් විශාලයට ගොඩනැගෙන්නේ කියන එක?

උ: දැන් සහරාන් ගියායින් පස්සේ සභාපති දී කියලා මවුලවී කෙනෙක් ආවා. තවුහීක් මවුලවී. අනිත් එක එයත් එක්ක ගමේ තව පිරිසක් ඉන්නවා සහරාන් පල්ලිත් එක්ක සම්බන්ධ වෙච්ච කට්ටිය. ඒ සම්බන්ධ වෙච්ච කට්ටියත් එක්ක සල්ලි අරන් තමයි මේක හැදුවා කියලා අපිට තොරතුරු.

ප්‍ර: ඒ කියන්නේ මේකට මුදල් දෙන විශේෂ පුද්ගලයෙක් හෝ යම් කිසි විදේශ රටක් සම්බන්ධයෙන් ඔබලට හොයා ගැනීමට හැකියාවක් ලැබුණ ද?

උ: ඒ විදියට කිසිවක් අපි හොයලා බැලුවේ නැහැ.

ප්‍ර: නැත්නම් සහරාන් යම් කිසි ආකාරයකින් මේ පල්ලියට මුදල් පොම්ප කරනවා ද කියන එක සම්බන්ධයෙන් ඔබලට හොයාගන්න හැකියාවක් ලැබුණ ද?

උ: ඒ විදියට කිසිම තොරතුරක් නැහැ. සහරාන් සල්ලි දුන්නා කියලා.

ප්‍ර: 2019 අප්‍රේල් 21 වැනි දිනට කලින් සහරාන් හෝ රිල්වාන් මේ කාත්තන්කුඩි පළාතට ඇවිල්ලා ගියපු බවට තොරතුරක් ඔබට තියෙනව ද? ඔබගේ තොරතුරුකරුවන් මාර්ගයෙන් ලබා ගත්ත?

උ: ඒ විදියට කිසිම තොරතුරු ඇවිල්ලා නැහැ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: දැන් ඔබ කිව්වා සහරාන්ගේ පල්ලිය ගොඩනැගීම සම්බන්ධයෙන් මුදල් ලැබුණේ කොහෙන් ද කියලා ඒ වේලාවේ වෙන කොට ඔබ දැනගෙන හිටියේ නැහැ කියලා?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: පාස්කු දින ප්‍රහාරයෙන් පසුව ඔබට දැන ගන්න ලැබුණ ද ඒ පල්ලියට කොහෙන්ද ආධාර ලැබුණේ කියලා?

උ: ඒ පාස්කු ප්‍රහාරයෙන් පස්සේ අපි ගිහිල්ලා පල්ලියේ සභාපති හම්බ වුණා. ඒ අපි කාත්තන්කුඩි පොලීසියේ OIC මහත්තයා හරහා තමයි මේ සභාපති arrest කරලා තියෙන්නේ. ඒ සභාපතිගේ කට්ටියත් එක්ක දී සහරාන් පල්ලියේ මෙයා තමයි පවත්වා ගෙන යනවා කියලා. පස්සේ මේ පොලීසියේCrime branch එක හරහා inquiry කරලා තිබ්බා. Inquiry කරන වෙලාවට මෙයා කියලා තියෙන්නේ මේ පල්ලියේ සල්ලිය මිනිසුන්ගෙන් එකතු කරපු සල්ලි වලින් තමයි ඒ පල්ලිය හැදුවේ කියලා.

FAIR COMMENT
BY JEZEEM

ඒ කාලෙට සභාපති විදියට හිටපු මවුලවීට 25,000 ක් මාසෙට පඩි දෙනවා. ඒ මිනිස්සු තමයි.

ප්‍ර: නමුත් ඒක පස්සේ ඒක ඇත්ත ද නැද්ද කියලා අරංචි වුණා ද? මේ ඔබ දැන් මවුලවී වශයෙන් සඳහන් කෙරුවේ තවුෆික් මවුලවී?

උ: තවුෆික් මවුලවී.

ප්‍ර: එයා කියපු දේ ඇත්ත ද නැද්ද කියන එක පස්සේ තේරුණා ද?

උ: මේ අපේ inquiry මහත්වරුන් කරලා තිබ්බා ස්වාමිනි. ඒක බැලුවම්පස්සේ ඒ විදියට තමයි සල්ලි එකතු වුණා කියලා අපිට තොරතුරු හම්බ වුණේ.

ප්‍ර: එතකොට ඒ සම්බන්ධයෙන් ඔබ දන්නව ද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පරීක්ෂණයක් කෙරුවා කියලා. CID එකෙන්?

උ: ඔව්.

ප්‍ර: පරීක්ෂණයක් කෙරුවා කියලා දන්නව ද?

උ: දන්නවා ස්වාමීනි.

ප්‍ර: එතකොට CID පරීක්ෂණයෙන් මොකද්ද අනාවරණය වුණේ මොකද්ද දැනගත්තේ කියන එක ඔබ පස්සේ දැනගන්න පුළුවන් වුණා ද?

උ: නැහැ ස්වාමීනි. සමාවෙන්න ඕන, ස්වාමීනි Account පරීක්ෂා කරන කොට අපි Crime branch එකේ Account මෙයාගේ සභාපතිගේ ID Number එක්ක Account බැලුවා . ඉස්සර මේ Account එකේ තියාගෙන හිටියා සහරාන් මවුලවී. එයා ගියායින් පස්සේ මේ සම්පූර්ණ නම ඒ Account එකේ තියාගෙන හිටියේ ඒ සල්ලි මුදල් සම්බන්ධව ඔක්කොම එකතු කරලා ඒ බිල් එකෙන් අපිට පෙන්නලා තිබ්බා සමහර රටවල් වල ඉඳලා මෙයාට සල්ලි ඇවිල්ලා තිබ්බා.

ප්‍ර: මොන රටවල් වලින් ද ඇවිල්ලා තිබ්බේ?

උ: සවුදි අරාබියා, කටාර් .

ප්‍ර: එතකොට ඒ සල්ලි ඇවිල්ලා තිබ්බේ සහරාන්ගේ පල්ලිය හදන්න ද?

උ: ඔව්. පල්ලිය හදන්න.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා.</u>

ප්‍ර: ඔබ ගිණුම් පරීක්ෂා කළෙත් තවුෆික් මවුලවීගේ ගිණුමෙන් ද?

උ: තවුෆික් මවුලවීගේ.

ප්‍ර: ඔබ පරීක්ෂා කරාද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ද පරීක්ෂා කළේ?

උ: CID එකෙන් තමා පරීක්ෂා කළේ. අපි කිසිම පරීක්ෂාවක් කළේ නැහැ.

ප්‍ර: ඔබට දැනගන්න ලැබිච්ච ආකාරය?

උ: දැන ගන්න ලැබුණා.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර: 2019 අප්‍රේල් 21 ට කලින් මේ කාත්තන්කුඩි ප්‍රදේශය තුළ ඔබගේ ඉන්න තොරතුරුකරුවන්ගෙන් ඔබට යම් කිසි තොරුතුරක් දැනගන්න ලැබුණ ද මේ වගේ විශාල ගණයක මහා පරිමාණයේ ප්‍රහාරයක් දියත් කිරීමට සැලසුම් කරන බවක් සම්බන්ධයෙන් ඔබට තොරතුරු දැනගැනීමට ලැබුණ ද?

උ: ඒ වගේ කිසිම තොරතුරක් අපිට ඇවිල්ලා නැහැ.

ප්‍ර: දැන් ඔය අවසාන කාලයේ 2019 අප්‍රේල් වෙන කොට සහරාන්ගේ අම්මා, තාත්තා, ෂයිනි මවුලවී ඒගොල්ලොවත් අඩුම ගානේ දැන් ඒගොල්ලොන්ට වරෙන්තු නැහැනේ ඒගොල්ලෝවත් ඒ ප්‍රදේශයේ හිටිය ද?

උ: සහරාන් මවුලවීගේ තාත්තා හිටියා. අම්මා හිටියා. ෂයිනි මවුලවී හිටියා. ෂයිනි මවුලවී සහරාන්ගේ තාත්තා හෂීම් හැම මාසෙම අන්තිමට ඇවිල්ලා අත්සන් කරලා යනවා උසාවියේ නඩුව තිබ්බ නිසා.

ප්‍ර: ඒ කියන්නේ පොලීසිය ඇවිල්ලා ඇප කොන්දේසි වලට අත්සන් කරනවා ද ඒ පුද්ගලයින්?

උ: ඔව්.

ප්‍ර: නිතරම ඇවිල්ලා අත්සන් කරනවා ?

උ: අත්සන් කරලා යනවා.

ප්‍ර: දැන් 2019.04.21 ප්‍රහාරයෙන් පස්සේ අනාවරණය කර ගත්තා සහරාන් විසින් පවත්වාගෙන ගිය ඔල්ලිකුලම් ප්‍රදේශයේ තියෙන පුහුණු කඳවුරක් ගැන. ඒ පුහුණු කඳවුරෙන් Explosives සහ Bullets. ඒ කියන්නේ පුපුරන ද්‍රව්‍ය සහ වෙඩි පතොරම් අනාවරණය කර ගැනීමක් සිද්ධ කරලා තියෙනවා. මේ සම්බන්ධයෙන් ඔබට ඊට ප්‍රථම බුද්ධි තොරතුරු මාර්ගයෙන් ඔබට මේ පුහුණු කඳවුරක් ගැන ඔබලාට දැනුවත් වීමක් තිබුණ ද?

උ: ඒ විදියට නම් ඉස්සර කිසිම තොරතුරක් ඇවිල්ලා නැහැ ස්වාමීනි. CID එක මිල්හාන් කියලා පුද්ගලයෙක් arrest කරලා තිබ්බා. එයාගේ කට උත්තරය මත මං දන්න විදියට නම් එයාගේ ඉඩම් තමයි අර ඔල්ලිකුලම් Camp කියපු තැන මිල්හාන් අරන් ඇවිල්ලා තමයි ඒ කියපු බෝම්බ තිබ්බා Explosives ඔක්කොම හොයලා ගත්තේ.

ප්‍ර: ඔබ කියන්නේ මේ මිල්හාන් යන අයද?

උ: මිල්හාන්.

ප්‍ර: එයාගේ නිවස ද ඔය ඔල්ලිකුලම් ප්‍රදේශයේ ?

උ: ඔල්ලිකුලම් ප්‍රදේශයේ මුල් අයිතිකාරයා ඇවිල්ලා රවුම් කියන එක්කෙනා. එයා අක්කරයක ඉඩමක කොටස් දෙකකට බෙදලා භාගයක් මෙයා තියාගෙන අනිත් කොටස විකුණලා තිබ්බා මිල්හාන්ට . මිල්හාන් ඒ භාග ඉඩමක කොටස් 05 ට බෙදලා එක කොටසක් මෙයාගේ නමට

FAIR COMMENT BY JEZEEM

අනිත් කොටස් තව 04 දෙනෙකුට විකුණලා තිබ්බා. මෙයාගේ නමට තියෙන කොටසේ තමා මේ බඩු තිබ්බේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: මෙයා කියන්න එපා නම කියන්න?

උ: මිල්හාන්.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා.</u>

ප්‍ර: මේ මිල්හාන් යන අයත් කාත්තන්කුඩි ප්‍රදේශයේම වාසය කරපු පුද්ගලයෙක් ද?

උ: මිල්හාන් කාත්තන්කුඩි මොහින්දීන් පල්ලිය පාරේ තමයි හිටියේ. ගෙදරක පදිංචි වෙලා හිටියේ.

ප්‍ර: ඒ කියන්නේ 2019 අප්‍රේල් මාසේ වන කොටත් ඔහු ඔය කාත්තන්කුඩියේ පදිංචි වෙච්ච පුද්ගලයෙක් ද?

උ: කාත්තන්කුඩියේ තමයි පදිංචි වෙලා හිටියේ.

ප්‍ර: ඔහු රැකියාව විදියට මොකද්ද කළේ මිල්හාන්? ඔබට දැනුමක් තියෙනව නම් දන්නවා කියන්න නැත්නම්?

උ: රැකියාව සම්බන්ධව දැනුමක් නැහැ.

ප්‍ර: 2019.04.21 ට දින කිහිපයකට ප්‍රථම 04/16 වන දින කාත්තන්කුඩි පාලමුනෙයි ප්‍රදේශයේ යම් කිසි යතුරු පැදියක බෝම්බයක් සම්බන්ධයෙන් තොරතුරක් ඔබලට වාර්තා වුණා ද?

උ: ඉස්සර නම් වාර්තා වෙලා නැහැ. 2019 .04 වැනි මාසේ 17 වැනිදා හවස අපිට ඉඩම් අයිතිකාර එක්කෙනෙක් ඇවිල්ලා පැමිණිලි කරලා තිබ්බා පොලීසියට මගේ ඉඩම් එකේ තිබුණා අක්කර 47 වගේ ඉඩම් එකේ තිබුණා මේක වට කර ගන්නේ නෑ මගේ ඉඩම් එකේ බයික් එකක් ගිනි තිබ්බ විදියට යනවා තහඩු ටිකක් පුච්චලා තියෙන්නේ. මොනව වුණා කියලා දන්නේ නැහැ කියලා පොලීසියට පැමිණිලි කරා. ඒ වෙලාවට කාත්තන්කුඩි OIC මහත්මයත් එක්ක Crime branch OIC මහත්වරුත් එක්ක මම ගිහිල්ලා බැලුවා. පස්සේ මේකේ ඒ පැමිණිල්ල ඇවිල්ලා තිබ්බා සවස 07.30 වගේ රෑ ඉන්පස්සේ උදේ තමයි ඒ Soco කියලා ඒ inquiry පටන් ගත්ත එක Soco ඇවිල්ලා තමයි මේකේ බයිසිකල් බෝම්බ blast කියලා Soco වාර්තාව තමයි මේක.

ප්‍ර: දැන් 2019.04.21 ට කලින් ඔබට ඔබගේ තොරතුරුකරුවන් හරි යම්කිසි පුද්ගලයින් යොදවලා හොයා ගැනීමට හැකියාවක් හම්බ වුණා ද මේ යතුරු පැදි බෝම්බය පුපුරුවා හැරීමට කවුද සම්බන්ධ කියන එක. 04/21 ට කලින් ?

FAIR COMMENT BY JEZEEM

උ: ඒ විදියට කිසිවක් අපිට හොයන්න බැරි වුණා. ස්වාමීනි අපේ Soco හරහා බයික් එකේ වැසි Number එක තිබ්බා. ඒ වැසි නම්බර් එක අරන් තමයි බයික් නම්බර් එක හොයලා ගත්තේ. එක ඒ Soco හරහා තමයි අපේ පොලීසියට හඳලා OIC මහත්තයා හරහා දැනුම් දුන්නේ.

ප්‍ර: ඔබ ඒ කියන්නේ විමර්ශනයක් මිස තොරතුරුකරුවන් මාර්ගයෙන් මේ සම්බන්ධයෙන් කවුද කළේ කියන එක සම්බන්ධයෙන් ඔබට ලැබුණේ නැහැ කිව්වොත් හරිද?

උ: හරි ස්වාමිනි. කිසිම තොරතුරක් ලැබුණේ නැහැ.

ප්‍ර: දැන් සහරාන් එම ප්‍රදේශය අතඇරලා ගියාට පස්සේ ඔය සහරාන්ගේ නැෂනල් තවුහිද් ජමාත් පල්ලිය ක්‍රියාත්මක වුණා ද?

උ: සාමාන්‍යයෙන් පල්ලියේ පස් පාරක් වදින කට්ටිය ඉන්නවා. ඒ නිසා සාමාන්‍යයෙන් වාංගු කියලා පස් පාරක් වදිනවා. ඉස්සර සහරාන් ඉන්න කාලයට තිබ්බ විදියට රැස්වීම් කිසිවක් ඒ පල්ලියේ තිබිලා නැහැ.

ප්‍ර: ඒ කියන්නේ දැන් මේ වන කොටත් ඔය නැෂනල් තවුහිද් ජමාත් හෝ තවුහිද් ජමාත් පුද්ගලයින් ඔය කාත්තන්කුඩි ප්‍රදේශයේ ජීවත් වෙනව ද, ඒ නිකායට අයිති පුද්ගලයින්?

උ: නිකායට අයිති පුද්ගලයෙක් කියලා කියන්න. බැහැ ස්වාමීනි පල්ලියට ගොඩාක් කට්ටිය යනවා. දැන් සාමාන්‍යයෙන් අපිටත් තොරතුරු ඇවිල්ලා තියෙනවා පල්ලි ළඟ නිසා සහරාන්ගේ පල්ලිය සමඟර පල්ලි කාත්තන්කුඩියේ තිබෙන මාසයකට එක තමයි ඔය සිකුරාදා දවසේ ජුම්මා තියෙන්නේ. සහරාන්ගේ පල්ලිය ඕන වේලාවට ජුම්ම තියෙනවා. ඒ නිසා ළඟ ඉන්න කට්ටිය මුහුදු side එකේ පල්ලිය තිබෙන නිසා මුහුදු යන කට්ටිය ඔක්කොම ඒ පල්ලියට යනවා.

ප්‍ර: ඒ කියන්නේ සහරාන් ගියාට පස්සේත් තිබ්බා හැබැයි මේ වෙනකොට ඔය පල්ලියට කවුරුත් යන්නේ නැහැනේ?

උ: ඔව් දැනට පල්ලිය සීල් කරලා තියෙන්නේ. යතුරු ඔක්කොම පොලීසිය සීල් කරලා උසාවි මාර්ගයෙන් භාර දීලා තියෙනවා.

ප්‍ර: දැන් ඔය තවුහිද් ජමාත් මතවාදය අදහන සහරාන්ගේ පල්ලි වලට ගියපු තවත් පුද්ගලයින් රැසක් මේ කාත්තන්කුඩි ප්‍රදේශයේ නිදැල්ලේ ඉන්නව ද මේ වෙන කොට?

උ: තවුහිද් ජමාත් වගේ නැහැ වෙනම පල්ලිය සම්බන්ධව කණ්ඩායම් ඉන්නවා. දැන් සුන්නත් තවුහිද් ඒ වගේ වෙනම ඉන්නවා. ෆයිල්වාන් පල්ලිය කියලා වෙනම සෙට් එකක් ඉන්නවා. දැන් ඒ අදහස් එක්ක සහරාන් වගේ නැහැ.

වේලාව: අළුයම 01.30
මෙතැන් සිට: නිල්මිණි මෙනවිය.

FAIR COMMENT
BY JEZEEM

දැන් වේලාව: අලුයම 1.30
පෙර සටහන් : සචිනි මෙනවිය.
මෙතැන් සිට : නිල්මිණි

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>

ප්‍ර: දැන් සහරාන් හා සමානව ඔය සහරාන්ගේ මතවාදයේ තියෙන දේවල්ම කියන. තවත් මවුලවිවරු ඔය කාත්තන්කුඩි ප්‍රදේශයේ මේ වෙන කොට නැඟීගෙන එනවද?

පි: සහරාන්ගේ මතය නම් මේ වෙන කොට අපිට තොරතුරු ඇවිල්ලා නැහැ. සහරාන් වගේ කිසිවක් වැඩ කරන තව පල්ලි තියෙනවා. සහරාන් ඉන්න කාලයට සහරාන් එක්ක අනිත් පල්ලි එක්ක තරහා තිබ්බා. අර තන්දුරි දෙනවා කියලා ස්වාමීනි. තන්දුරි නෙවෙයි කෑම දෙනවා. උයලා ඒක සුන්නත් පල්ලියේ තියෙනවා. ඒක කොඩි උස්සලා උත්සවය ගන්නවා. ඒ උත්සවයට 5000 වගේ මිනිස්සු එකතු කරලා මිනිස්සුන්ට කෑම දෙනවා උයලා. තව ෆයිල්වාන් පල්ලිය තියෙනවා. ඒ පල්ලිය අර උයන කෑම හාල් සීනි ඒවගේ බඩුවල් දෙනවා. ඒ පල්ලි වලට සහරාන්ට තිබ්බ එක ඒවගේ කරන්ට බැහැ කියලා තමයි මතයේ තිබ්බා. වෙන කිසිම තොරතුරු ඇවිල්ලා නැහැ. සහරාන් වගේ මවුලවිලා ඉන්නවා ස්වාමීනි.

ප්‍ර: සහරාන් වගේ ජීවිත හානියක් නැතුව නමුත් සහරාන්ගේ මූලධර්ම ඒ කියන්නේ සොහොන් අදහන්න එපා. මේ සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් වැරදියි. දැවැදි දෙන්න එපා. මොහොමඩ් නබිතුමා අදහන්න එපා. දෙවියන් පමණක් අදහන්න.එවැනි මූලධර්ම දේශනා කරන මවුලවිවරුන් ඔය කාත්තන්කුඩි ප්‍රදේශයේ මේ වෙනකොට ඔබගේ බුද්ධි තොරතුරු අනුව ඉන්නවද?

පි: ඒ විදිහට නම් කිසිවක් නැහැ ස්වාමීනි. කාත්තන්කුඩි කියන පල්ලි දෙකම තියෙනවා සොහොන් පල්ලිය ඇතුලේ තියෙනවා සොහොන්. ඒක ගිහිල්ලා වදිනවා. ෆයිල්වාන් පල්ලියේ තියෙනවා භාවනා මධ්‍යස්ථාන වගේ. ඒ පල්ලියේ ගිහිල්ලා ගෑණු කට්ටියත් යනවා පිරිමි කට්ටියත් යනවා. ඒකේ ගැටුම් නැහැ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: ඔබ සහරාන් හෂිම්ව හම්බවෙලා තියෙනවද?

පි: නැහැ ස්වාමීනි.

ප්‍ර: දැකලා තියෙනවද?

පි: දැකලා තියෙනවා.

ප්‍ර: කොයි කාලේද ඉස්සෙල්ලාම දැක්කේ?

පි: දැක්කේ 2017 කාලේ දී.

ප්‍ර: දැන් සිකුරාදා දින වල සහරාන් හෂිම් රැස්වීම් තියෙනවා නේද?

FAIR COMMENT
BY JEZEEM

පි: තියෙනවා ස්වාමීනි.

ප්‍ර: ඒ රැස්වීම් වලට කවුද එන්නේ සාමාන්‍යයෙන්?

පි: සහරාන්ගේ රැස්වීම් නම් තනිකර පිරිමි තමා එනවා රැස්වීමට.

ප්‍ර: පිරිමි?

පි: පිරිමි.

ප්‍ර: ඒකට ආපු politicians ලා කවුද? දේශපාලනඥයින් කවුද?

පි: දේශපාලඥයින් කියලා කවුරුත් මම දන්න විදිහට ඇවිල්ලා නැහැ ස්වාමීනි. සහරාන්ගේ රැස්වීමට යනවනම් වෙනම සහරාන්ගේ කණ්ඩායම තිබ්බා. ඒ රැස්වීම ලැස්ති කරන්න NTJ කියලා ටී-ෂර්ට් දාගෙන පුටුව set කරන්නයි, බයික් park හදන්නයි ඒ විදිහට ලස්සනට ඒ රැස්වීම කරන්න කට්ටිය ඉන්නවා. දේශපාලඥයෝ කියලා කවුරුත් ඇවිල්ලා නැහැ.

ප්‍ර: නැගෙනහිර පළාතේ ඉන්න හිටපු මන්ත්‍රී කෙනෙක් සිබ්ලි ෆාරුක් දන්නවද?

පි: දන්නවා ස්වාමීනි.

ප්‍ර: එතකොට ඒ සිබ්ලි ෆාරුක් සහ සහරාන් හෂිම් එකට හිටියද?

පි: මම වැඩියෙන් කියලා දැන ගත්තේ සහරාන් කියලා 2017න් පස්සේ තමයි ස්වාමීනි. ඒ කාලේ සහරාන් ඉඳලා නැහැ. ඉස්සර තිබ්බ වැඩියෙන්ම මම දන්න තරමින් නැහැ ස්වාමීනි.

ප්‍ර: ඔව් ඔබ කාත්තන්කුඩි පොලිසියේ නේද 2014 ටත් ඉස්සෙල්ලා හිටියේ?

පි: කාත්තන්කුඩි පොලිසියේ තමයි වැඩකලේ.

ප්‍ර: කවදා ඉඳලා කාත්තන්කුඩි පොලිසියේ හිටියද?

පි: 2013.12 මාසේ ඉඳලා ස්වාමීනි.

ප්‍ර: ඉතින් 2013ට පස්සේ ඔබ සහරාන් හෂිම් ගැන දැනගෙන හිටියේ නැද්ද?

පි: ඒ කාලයට වැඩිපුර සහරාන් ප්‍රසිද්ධියේ ඇවිල්ලා හිටියේ නැහැ. සහරාන් normal පුද්ගලයෙකු වගේ ඒ අයට පල්ලි තිබුණා. පල්ලියේ සභාපති වගේ කටයුතු කරගෙන හිටියා.

ප්‍ර: හරි ඒක තමයි මම අහන්නේ. ඒ කියන්නේ 2013 ඉඳලා ඔබ සහරාන් හෂිම් කියලා එක් කෙනෙක් ඉන්නවා කියලා දැනගෙන හිටියා නේද?

පි: නම විසින් දන්නවා ස්වාමීනි සහරාන්ගේ.

ප්‍ර: දැකලා නැහැ?

පි: වැඩියෙන් දැකලා නැහැ.

ප්‍ර: වැඩියෙන් දැකලා නැහැ කියන්නේ දැකලා තියෙනවානේ ?

පි: දැකලා නැහැ ස්වාමීනි. එයාගේ රැස්වීමට මම කිසිම duty වලට ගිහිල්ලා නැහැ ස්වාමීනි.

ප්‍ර: නැහැ නැහැ මම අහන්නේ දැකලා තියෙනවද කියලා 2013ට පස්සේ?

පි: 2013 පස්සේ නම් එක පාරක් දැකලා තියෙනවා. ඒ අර රැස්වීම වෙලාවට පාරේ හුඩ්රීක් හන්දියේ දී එක පාරක් රැස්වීමක් තිබ්බා.

ප්‍ර: අන්න හරි මොන හන්දියේ ද?

FAIR COMMENT BY JEZEEM

පි: හුඩ්රීන් හන්දියේ.

ප්‍ර: හුඩ්රීන් හන්දියේ කවුද රැස්වීමට ආවේ ඒ වේලාවේ?

පි: ඒගොල්ලන්ට අර රැස්වීම් තියන්නේ ගොඩාක් පාරවල් තමයි මේ වගේ රැස්වීම් වල ඉඳලා තියෙනවා. පල්ලි වල නම් කිසිවක් නැහැ. හරියට දිනය මතක නැහැ ස්වාමීනි.

ප්‍ර: 2016 විතර කියලා කිව්වොත් හරිද?

පි: හරියට දිනය මතක නැහැ ස්වාමීනි.

ප්‍ර: එතකොට ඒ රැස්වීම බලාගෙන හිටියේ ඔයා විතර ද නැත්නම් පොලිසියේ තව කවුරුහරි හිටියද එතන?

පි: මේ පොලිසියේ රාජකාරියට ගොඩාක් කට්ටිය ගිහිල්ලා තිබුණා. මම ඒ පාරේ යනකම් එයාගේ රැස්වීම් ගිහිල්ලා නිකන් බලාගෙන ගියපු එක තමයි මට මතක.

ප්‍ර: එතෙන්ට කවුරුහරි politicians ලා ආවාද රැස්වීම බලන්න?

පි: එහෙම මම දන්නේ තරමින් දන්නේ නැහැ ස්වාමිනි.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු තමුන්ට මතක ද අප්‍රේල් 20 වෙනිදා 2019 අප්‍රේල් 20 ඒ කියන්නේ බෝම්බ පුපුරපු දවසට ඉස්සෙල්ලා දවසේ උතුරු පළාතේ මහ ඇමති විග්නේෂ්වරන් මහත්මයා එන්න තිබුණද ඔය කාත්තන්කුඩි පැත්තේ?

පි: ඔව් ස්වාමීනි. එතන ලොකු පෙළපාලි ලෑස්ති කරලා තිබ්බා.

ප්‍ර: කවුද ලෑස්ති කළේ?

පි: ඒක වියාලේන්ද්‍රන් කියලා හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ලෑස්ති කරලා තිබ්බා. උතුරේ හිටපු C.M තමයි. එයා 21 වෙනිදා උදේ 7.30 ,8 විතර තමයි මෙයා ඇවිල්ලා හිටියා. ඒවෙලාවට මෙයාගේ පෙළපාලියේ කරොත් දෙමළ මුස්ලිම් කියලා ප්‍රශ්න එනවා කියලා අපි උසාවි නියෝගය ගත්තා මේක කාත්තන්කුඩි පොලිස් වසමේ පෙළපාලිය කරන එක නතර කරන්න. ඒ විදිහට අපි තොරුතුරු දීලා Division මහත්මයා හරහා අපි පොලිසියේ සියලුම පොලිසි වලින් නියෝග ගත්තා පෙළපාලිය නතර කරන්න. ඒ විදිහට අපි කාත්තන්කුඩියේ නතර කරපු වෙලාවට හිටපු මන්ත්‍රී විග්නේෂ්වරත්‍රන් වියාලේන්ද්‍රන් කොක්කඩිවෝලේ ගියා පෙළපාලියක් පටන් ගන්න අම්පාරට පයින් පා ගමනක් යන්න. ඒ වෙලාවට අපි Division මහත්මයාට අපි යන්න කිව්වා කොක්කඩිවෝලයට. ඒ වෙලාවට 21 වෙනිදා උදේ තමයි කොක්කඩිවෝලයට රැස්වීම පටන් ගන්න වෙලාවට තමයි අර බෝම්බ බ්ලාස්ට් එක.

ප්‍ර: දැන් ඔබ කිව්වා නේද උසාවියෙන් තහනම් නියෝගයක් ගත්තා කියලා පෙළපාලි යන්න එපා කියලා?

FAIR COMMENT BY JEZEEM

පි: ඔව් ස්වාමීනි.

ප්‍ර: දැන් ඒ කියන්නේ ඔය පළාතේ මුස්ලිම් අය දෙමළ අය අතර ටිකක් තියෙනවද මේ ආරවුල්?

පි: ඒ කාලේ වෙනකම් ඉඳලාත් නැහැ. දැන් ඒගොල්ලන් අම්පාර දිස්ත්‍රික්කයේ අර DS Office එකේ පොඩි කේස් එකක් තිබ්බා. අර A1, A2 කියලා grade කරන්න. ඒක මුස්ලිම් කට්ටියට වෙනමයි. දෙමළ කට්ටියට වෙනමයි කියලා කොටස් 2 කට බෙදන්න විදියට. ඒකට දැන් අපේ පළාතේ නැති උතුරු පළාතේ ඉඳලා ඇවිල්ලා මොනවා හරි මේ වෙනකම් හොඳට හිටපු දෙමළ මුස්ලිම් කට්ටියට ඒ පෙළපාලි නිසා මොනවා හරි වෙන්න පුළුවන් කියලා තමයි මේක තහනම් කරලා තිබ්බේ.

ප්‍ර: උසාවි නියෝගයකින් තහනම් කරා?

පි: උසාවි නියෝගයකින්.

ප්‍ර: ඒ වුණාට කොක්කඩිචෝලේ පැත්තේ ගියා?

පි: කොක්කඩිචෝලේ පැත්තේ ගියා.

ප්‍ර: ඒ පෙළපාලිය යන්න පුළුවන් වුණාද දිගටම?

පි: එතන කොක්කඩිචෝලයට පොලිසිය ඉඳලා උසාවි නියෝග ඇවිල්ලා මේ පෙළපාලි නතර වෙලා අපි උසාවි නියෝග කියවනකොට එතන බෝම්බ බ්ලාස්ට් වුණා කියලා අපිට ඉස්සර බෝම්බ බ්ලාස්ට් වුණා කියලා තොරතුර ඇවිල්ලා නැහැ එතන සිලින්ඩර් බ්ලාස්ට් පල්ලිය ඇතුලේ සිලින්ඩර් ගිනි තිබ්බා කියලා Case එක ආවාම පස්සේ ඉන්න කට්ටිය ආයේ පල්ලිය පැත්තේ යන්න කිව්වා. අපි ඒ පල්ලිය පැත්තේ ගියා.

ප්‍ර: දැන් තමුන් වැඩ කරේ බුද්ධි අංශයේනේ?

පි: ඔව් ස්වාමීනි.

ප්‍ර: එතකොට තමුන්ලාට තිබිච්චි රාජකාරිය මොකක් ද බුද්ධි අංශයේ වැඩි හරියක්?

පි: අපිට සාමාන්‍යයෙන් අපේ කාත්තන්කුඩි පොලිස් වසමේ තියෙන රජයට විරෝධී හරි පෙළපාලි හරි උද්ඝෝෂණ මොනවාහරි තිබ්බත් අපේ කොට්ඨාශ Division මහත්මයාට දැනුම් දෙන්න ඕනි. කොට්ඨාශ බුද්ධි අංශ OIC මහත්මයෙක් ඉන්නවා. එයාට දැනුම් දීලා එයා හරහා Division මහත්මයාට කියලා ඒ අපේ වසමකින් මොනවාහරි තිබ්බොත් Division මහත්මයා හරහා පොලිස් ස්ථානාධිපතිට දැනුම් දෙනවා.

ප්‍ර: ඒ වගේ වැඩ තමයි කළේ . නැතුව මේ සහරාන් ගැන හොයන්න ගියේ නැහැ බුද්ධි අංශයේ අය?

පි: ඒ කාලේ නම් ස්වාමීනි සහරාන් 2017 GCR Case එක තිබ්බා අලියාර් හන්දියේ ගැටුම් ආවා. ඊට පස්සේ සහරාන් එතන ඉඳලා නැහැ. පස්සේ අපිට සහරාන් ඒ කාලේට ලොකුවට, ලොකු Caseඑකකුත් නැහැ.GCR Case එක. ඒක Accuse විතරයි ඒ කාලේට තිබ්බා කාත්තන්කුඩි වසමේ.

President Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර: තමන්ලා හෙව්ව ද මේ සහරාන් ගැන ඒ කාලයේ 2017 මාර්තු මාසේ විතර ?

පි: 2017 ඒ කාලේට ගියා අපේ පොලිස් නිලධාරීන් ටිකෙන් ගියා. Warrant ආපු වෙලාවට ගෙවල් වලින් ගිහිල්ලා check කරලා තියෙනවා. අනිත් Warrant නිලධාරින් එක්ක. මම තනියම කිසිම දෙයක් නැහැ. ඒ Warrant තිබ්බ නිසා Warrant කාරයොත් එක්ක යන්න ඕනි. ඒ කට්ටියත් එක්ක ගිහිල්ලා හොයලා තියෙනවා.

ප්‍ර: තාමත් තමුන් කාත්තන්කුඩියෙනේ වැඩ කරන්නේ?

පි: කාත්තන්කුඩියේ.

ප්‍ර: දැන් සහරාන් නැති නිසා දැන් එහේ ඉන්න මිනිස්සු මොනවද කියන්නේ?

පි: සමහර කට්ටිය සහරාන් නැති වෙච්චි එක හොඳයි කියලා තමයි කියනවා. දැන් නිදහසෙන් ඉන්නවා කියලා. නිදහස නම් ඉස්සරහ නම් කාත්තන්කුඩියේ තිබ්බා හැම සිකුරාදාම කාත්තන්කුඩි එක සමහර කට්ටිය ඉන්නවා අර වෙඩින් මහුල් ගෙදර කරනවා නම් ගෑණුන්ගේ සල්ලි රත්තරං ගෙවල් වලින් ගන්න කට්ටිය ඉන්නවා. ඒක සහරාන්ගේ කණ්ඩායමට ඒක කැමැති නැහැ. ගන්නවා නම් ගෑණු විතරයි ගන්නවා තමන් ඒ කට්ටිය තමයි තවුහිද් ජමාත් එකේ ඉන්න කට්ටිය කුලියට තමයි ගෙවල් අරන් ඒ විදිහට තමයි ඉන්නේ. ඒ නිසා දැන් අනිත් කට්ටිය සල්ලි ගන්න කට්ටිය පොඩි සතුටෙන් ඉන්නවා.

ප්‍ර: දැන් ඔය සහරාන්ගේ කට්ටිය නැති වුණාට සහරාන්ට කැමැති අය තාමත් හොර රහසේ එහේ නොයෙක් විදියේ ඒ වගේ අන්තවාදී extreme දේවල් කරනවා නේද තාම?

පි: මේ වෙනකම් නම් ඒ විදියට නම් තොරතුරු ඇවිල්ලා නැහැ. අපිත් සොයලා බලනවා සහරාන් Case එකෙන් පස්සේ. මොනවා හරි තියෙනවා කියලා නිතරම තිබ්බත් අපේ බුද්ධි අංශ OIC මහත්මයා හරහා Division මහත්තයාලට දැනුම් දෙනවා. මේ වෙනකම් අපිට තොරුතුරු ඇවිල්ලා නැහැ. සහරාන්ගේ කට්ටිය මේ විදිහට කරනවා කියලා.

****

<u>**ගරු විනිසුරු බන්දුල අතපත්තු මැතිතුමා**</u>

ප්‍ර: දැන් මහත්මයා මේ සහරාන් ඒ ප්‍රදේශයේ නිකන් චන්ඩියෙක් වගේ ද හැසිරුණේ?

පි: චන්ඩියෙක් වගේ නැහැ ස්වාමීනි. සහරාන් කෙළින් කතා කරනවා. සහරාන්ගේ දේශන ඕනි මිනිසුන්ට කැමති වෙනවා සහරාන්ගේ දේශනය අහන්න. එයා දේශන තියන කොට නිකන් යන මිනිසුන්ට මම වෙන ආගමේ වුවත් එයා කියපු කතාවට ආස වෙනවා. අහගෙන ඉන්න ඕනි කියලා. චණ්ඩි වගේ ඒ විදිහට කිසිම තොරතුරු ඇවිල්ලා නැහැ. ඒ

FAIR COMMENT BY JEZEEM

විදිහට කිසිම පැමිණිලිත් ඇවිල්ලා නැහැ. කාටවත් කරදයක් වෙලා කියලා.

****

<u>ගරු විනිසුරු අදිකාරි මැතිනිය</u>

ප්‍ර: දැන් ඔබ කිව්වා නේ මේ සහරාන්ගේ කතාවල් වලට අහගෙන ඉන්න මිනිස්සුන් හරි ආසා වුණා කියලා. ඔබත් අහගෙන හිටියා ද සහරාන් කතා කරන ඒවා කවදා හෝ?

පි: එක පාරක් මම යනකොට සහරාන්ගේ රැස්වීමක් තිබ්බා. වැඩියෙන් හිටියේ නැහැ. ඒ කියන කොට දැන් මුස්ලිම් ආගමෙන් ක්‍රිස්තියානි පොඩි වෙනස් තමයි තියෙන්නේ.

ප්‍ර: මොකක්ද ?

පි: මුස්ලිම් ආගමයි ක්‍රිස්තියානි ආගමයි පොඩි වෙනස් තමයි.

ප්‍ර: ක්‍රිස්තියානි ආගමයි?

පි: ක්‍රිස්තියානි ආගමයි.

ප්‍ර: මොනවද තියෙන පොඩි වෙනස මුස්ලිම් ආගමෙන්?

පි: ක්‍රිස්තියානි ආගමේ ක්‍රිස්තුත් වහන්සේ මේ ගොල්ලෝ ජේසුස් නබි කියලා මේ ගොල්ලෝ විශ්වාස කරනවා.

ප්‍ර: කවුද විශ්වාස කරන්නේ?

පි: මුස්ලිම් කට්ටිය.

ප්‍ර: ජේසුතුමා නබිවරයෙක් කියලා?

පි: ඔව්.

ප්‍ර: ඔබ ක්‍රිස්තියානි නේද?

පි: මම ක්‍රිස්තියානි.

ප්‍ර: ඔබත් ඒක විශ්වාස කරනවද?

පි: අපේ ඉතින් මුස්ලිම් කට්ටිය තමයි විශ්වාස කරන්නේ. ඒ අර බයිබල් හරහා ක්‍රිස්තියානි ආගමේ ජේසුන් නබි කියලා. දැන් අපේ ආගමේ විශ්වාස කරන්නේ ජේසු කියලා.

ප්‍ර: දැන් එතකොට දැන් ඔය ප්‍රදේශ වල ක්‍රිස්තියානි ආගම අදහන මිනිස්සු නැද්ද ඔය සහරාන්ගේ ඔය දේශන මේ ජේසුස් වහන්සේ නබිවරයෙක් කියලා සහරාන් කියන ඒවා ක්‍රිස්තියානි අයට ඇහෙනවද ඔය කියන ඒවා. ඒ පැත්තේ ක්‍රිස්තියානි අය ඉන්නවද?

පි: ක්‍රිස්තියානි කට්ටිය ඉන්නවා. දැන් කාත්තන්කුඩි කියලාත් තැලි ප්‍රදේශයේ ඇතුලේ. ඒ වටේන් තමයි ඉන්නේ ක්‍රිස්තියන් කට්ටිය, හින්දු කට්ටිය ඉන්නවා. ඒ කට්ටියට කාත්තන්කුඩි කියලා ප්‍රධාන පාරේ central කොහේ හරි රැස්වීම තිබ්බොත් දෙමළ මිනිස්සුන්ට ඒ sound එක එන්නේ නැහැ.

ප්‍ර: එතකොට දැන් ඔය සහරාන්ගේ කතා රසවත් නිසා මිනිස්සු අහනවා කිව්වානේ. ඔය සහරාන් එහෙම කතා කරනකොට කියනවද මේ අපි

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මුස්ලිම් රාජ්‍යයක් බිහි කරන්නයි හදන්නේ මුස්ලිම්වරුන්ට වෙනමම රටක් හදන්නයි යන්නේ ඒ වගේ කතා කියනවද සහරාන්. මුස්ලිම් ආගම විතරයි අදහන්න ඕනි මිනිස්සු කියලා?

පි: සහරාන්ගේ රැස්වීමට වැඩිපුර යන්නේ අරාබි භාෂාවෙන් තමයි. ඒ මිනිස්සුන්ගේ සමහර මුස්ලිම් කට්ටිය අරාබි භාෂාව දන්නවා. අපිට ඒක මොනවා කියනව ද කියලා මට අරාබි භාෂාවෙන් දන්නේ නැහැ. දැන් ඒක තේරුම් කරන්න බැහැ.

ප්‍ර: ඇයි ඔය කාත්තන්කුඩියේ පැත්තේ ඉන්න මිනිස්සු කතා කරන්නේ දෙමළ භාෂාවනේ අරාබි භාෂාව නෙවෙයිනේ?

පි: හැබැයි රැස්වීම තියන කොට සම්පූර්ණයෙන්ම වැඩියෙන් කතා කරන්නේ අරාබි භාෂාවෙන් තමයි. ඒ ආගම සම්බන්ධයෙන් කතා කරපු නිසා.

ප්‍ර: හැබැයි අපි මෙම කොමිෂම හමුවේ නම් සහරාන්ගේ අන්තර්ජාලයේ කතා හුඟාක් දැක්කා. එයා දෙමළ භාෂාවෙන් තමයි කතා කරන්නේ. අරාබි භාෂාවෙන් කතා කරන ඒවා අපි දැක්කේ නැහැ.

පි: මම දැනුවත්ව එක පාරයි තමයි එයාගේ රැස්වීම ගිහිල්ලා තියෙන්නේ. ඒ විදිහට කතා කරපු එකෙන් මම අහගත්ත එක අරාබි භාෂාවෙන් කියපු එක තමයි.

ප්‍ර: දැන් ඔබ බුද්ධි නිලධාරියෙක්නේ අරාබි භාෂාවෙන් ඔය සහරාන් මොනවද කියන්නේ කියලා කවුරුහරි දන්න Informant කෙනෙක්ව වගේ කෙනෙක්ව තියාගෙන අහගත්තේ නැද්ද සහරාන් මොනවද ඔය අරාබි භාෂාවෙන් කියන්නේ කියලා ?

පි: අපිට කියපු එකෙන් සහරාන් කියපු එක දැන් මුස්ලිම් කියන එක්කෙනෙක් ගංජා බොන්න බැහැ. අරක්කු බොන්න බැහැ. සල්ලි ගන්න බැහැ. තව ගෑණු ගත්තොත් තමන් තමයි කට්ටියට කන්න දෙන්න ඕනි කියලා. ඒ වගේ තමයි ගොඩාක් කතා කරනවා අනිත් ඒ නිසා තමයි සහරාන් එක්ක අනිත් පිරිසත් එක්ක ගැටුම් පටන් ගත්තේ එකේ අනිත් කට්ටිය වැරදි කරනවා කියලා මේගොල්ලෝ මුණට කියනවා කියලා තමයි තොරතුරු ඇවිල්ලා තිබ්බේ.

ප්‍ර: හැබැයි මෙම කොමිෂමට සහරාන් පිළිබඳව කරපු දේශනාවල් වල ඔබලා ඔය කියන දේවල් කිසිවක් අහන්න ලැබුණේ නැහැ. අපිට ඔය ගංජා බොන්න එපා. ගෑණු ගත්තාම ඒගොල්ලන්ව බලාගන්න ඕනි කියන ඒවා සහරාන් කියන බවක් මේ කොමිෂම ඉදිරියේ දී සහරාන්ගේ දේශන දෙමළ ඒවා සිංහලටත් පරිවර්තනය කරලා අපි අධ්‍යයනය කරා. ඔබලා මේ සහරාන්ව බේරීම සඳහා මේ කොමිෂම හමුවට ඇවිල්ලා ඔය වගේ දේවල් කියනවද මේ සහරාන් පිලිබඳව මේ මුළු සමස්ත ශ්‍රී ලංකාවේ ජනතාවත් දන්නවා සහරාන් කියලා තියෙන දේවල් ඔය අන්තර්ජාලය හරහා ඔහුගේ දේශනාවල්. නමුත් ඔබලා බුද්ධි නිලධාරීන් ලෙස මේවා නොදන්නා එක පිළිබඳව ඔබට මොකක්ද කියන්න තියෙන්නේ සත්‍ය තොරතුරු නොදන්නා එක ගැන. සහරාන් කතා කරපු දේවල් වල?

FAIR COMMENT BY JEZEEM

පි: හරියට සහරාන් ගොඩක් කියලා තියෙන්නේ සහරාන් මේ අපේ පොලිස් වසමක ගියාම පස්සේනේ කියලා තියෙන්නේ අන්තර්ජාලයේ ඉතින්.

ප්‍ර: නැහැ ඉතින් ඔබ බුද්ධි නිලධාරියෙක්නේ. දැන් ඔබ කිව්වානේ ඉස්ලාම් භාෂාවෙනුත් සහරාන් දේශනා තියනවා කියලා ඉතින්. බුද්ධි නිලධාරීන් වුණාම හොයන්න ඕනිනේ මේ අන්තර්ජාලයේ ගිහිල්ලා මොනව ද කියන්නේ සහරාන්. පොලිසිය ළඟට ඇවිල්ලා සහරාන් මොනවද කියන්නේ. එහෙම කියලා හොයන්නේ නැද්ද බුද්ධි නිලධාරින් හැටියට?

පි: අපි ඒ කාලේට නම් සහරාන් ලොකුවට Case එක නැතිව නිසා වැඩියෙන් සහරාන් හොයලා නැහැ. අපි Warrant එකේ විතරයි හොයලා හිටියේ.

ප්‍ර: ලොකුවට Case නැහැ කියන්නේ. සහරාන් අර 2017 අලීයාර් හන්දියේ එකේ දී මිනිස්සුන්ව කපලත් තියෙන්නේ කඩු අරගෙන ගිහිල්ලා. බෝම්බත් ගහලා තියෙන්නේ. ඉතින් සහරාන් ඒ කියන්නේ මේ නීති විරෝධි අපරාධකාරයෙක් වගේනේ සහරාන් හැසිරිලා තියෙන්නේ?

පි: අලීයාර් හන්දියේ Case එක බෝම්බ ගැහුවා කියලා කිසිම තොරතුරු ඇවිල්ලා නැහැනේ.

ප්‍ර: ඇයි තියෙනවා ප්‍රෙට්ල් බෝම්බ ද එහෙම ගැහුවා කියලා.

පි: ඒ අන්තිමට.

ප්‍ර: ඔබගේ පොලිස් ස්ථානාධිපතිතුමා වාර්තා කරලා තියෙනවා Government රජයේ රස පරීක්ෂක Government analystට ඒවා පිළිබඳව වාර්තාවක් ලබා දෙන්න කියලා?

පි: ෂොපින් එකේ අර බෝතලයකට ප්‍රෙට්ල් දාලා ගිනි තිබ්බා කියලා තියෙන්නේ. බෝම්බ කියලා ඒ තොරතුරු ඇවිල්ලා නැහැ.

ප්‍ර: ඔබ දැන් හරියටම දන්නවද ඔය බෝතලයකට දාලා දාපු එකයි ඒ ප්‍රෙට්ල් වලින් හදන බෝම්බයෙයි තියෙන වෙනස?

පි: මම ඒ ගැන දැනුවත් නැහැ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥවරයාට අවශ්‍ය ද අසමි. අවශ්‍ය බව පවසයි.

****

<u>ජනාධිපති නීතිඥ ශ්‍රීමල් පෙරේරා මහතා</u>

ප්‍ර: ඔබතුමා මේ සහරාන්ගේ දේශනා වලට ගිහිල්ලා තියෙනවද?

පි: දේශන වලට කියලා මම මේ වෙනකම් ගිහිල්ලා නැහැ.

ප්‍ර: දැන් ඔබතුමා ක්‍රිස්තියානි කිව්වා නේද?

පි: ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ක්‍රිස්තියානි කිව්වාම මොකක්ද ක්‍රිස්තියානි කතෝලික ද?

පි: රෝමානු කතෝලික.

ප්‍ර: එතකොට ඔබතුමා කිව්වේ මේ එච්චරම වෙනසක් නැහැ කියලා මුස්ලිම් ධර්මයයි, ක්‍රිස්තියානි ධර්මයයි එක තමා වගකීමකින්ද කිව්වේ?

පි: වෙනසකට කියනවා නම් ස්වාමීනි බයිබලයේ කොටස් 2ක් තියෙනවා. පරණ එකයි, අලුත් එකයි කියලා. අලුත් එකේ තියෙන්නේ දැනට 2020 ජේසු වහන්සේගේ පස්සේ තමයි මෙයාගේ ක්‍රිස්ටීන් තමයි තියෙන්නේ අලුත් එක. පරණ එක තියෙනවා නබිතුමා කියවපු එකේ අපේ බයිබල් එකෙන් තියෙනවා. ඒගොල්ලෝ විශ්වාස කරපු ඔක්කෝම ක්‍රිස්තියානි ආගම එකෙන් තියෙනවා.

ප්‍ර: ඒ කියන්නේ මුස්ලිම් ධර්මය ක්‍රිස්තියානි පරණ ගිවිසුමේ තියෙනවා කියලා ද ඔබතුමා කියන්නේ?

පි: මුස්ලිම් ධර්මය කියලා මම කිව්වේ නැහැ. දැන් සමහරු කියනවා දැන් ඒගොල්ලෝ අර පොඩි කාලේ ඉඳලා එක එක නබිතුමන් එනවා කියපු එක තියෙනවා. එක එක නබි එක එක කාලේට එනවා කියලා. ඒ වගේ ජේසු නබි කියලා එක්කෙනෙක් එනවා කියලා ඒ බයිබල් එකෙන්, අපේ බයිබල් එකෙන් කියලා තියෙනවා. ඒ විදියට කුරාන් එකෙන් කියලා තියෙනවා කියලා තමයි මම කියන්නේ.

ප්‍ර: කුරාන් එක කියවලා තියෙනවද?

පි: ජේසු කුරාන් කියලා එක්කෙනෙක් එනවා කියලා

ප්‍ර: කුරාන් එක කියලා තියෙනවද ඔබතුමා?

පි: කුරාන් එකේ කියලා නැහැ. දැන් අපි ඉගෙන ගත්ත කාලයට අපේ Subject එකෙන් තියෙනවා කුරාන් සම්බන්ධයෙන් පොඩි පොඩි දේවල් තියෙනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

සාක්ෂිකරුගෙන් වෙනත් ප්‍රශ්න නොමැති බව දන්වයි.

සාක්ෂිකරු මුදා හරිමි.

නැවත කොමිෂන් සභාව අද දින (2020.06.17) පස්වරු 12.30ට රැස් වේ.

දැන් වෙලාව: අලුයම 1.30

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය: **2020.06.17** වෙලාව:- ප ව. **1.00**

සටහන් කළේ:- ධම්මිකා පෙරේරා විසිනි

ගරු විනිසුරු මඩුල්ල:-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික -

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

<u>පෙනී සිටීම:</u>

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතිඥතුමිය සමඟ ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස්, චතුරංග බණ්ඩාර, දිලන්ත එස්.කළුදුරුවගේ සහ අරින්ද්‍ර ජයසිංහ යන මහත්ම මහත්මීන් පෙනී සිටි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අහරදගරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ජනාධිපති නීතිඥ ෂමිල් පෙරේරා මහතා සමඟ කෘෂි දේවනායගම් මහත්මිය කොමිසමේ සාක්ෂි විමසීමේදි පෙනී සිටීමට අවසර දෙන ලදි.

<u>සාක්ෂි අංක 228 සාක්ෂියට කැඳවයි.</u>

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සම්පූර්ණ නම : කලීලු රහුමාන් මොහමදු සහිලාන්
වයස : අවුරුදු 40 යි,
ජාතිය : මුස්ලිම්,
ආගම : ඉස්ලාම්,
තනතුර : සංවර්ධන නිලධාරී, ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, කාත්තන්කුඩි,
පදිංචිය : අබ්දුල් ජවාත් ආලිම් මාවත, කාත්තන්කුඩි 6. අල්හාජ් අබ්දුල් ජවාත් ආලිම් වලිඋල්ලා ට්‍රස්ට් කාත්තන්කුඩි යන ආයතනයේ ලේකම්.

මා කියන සාක්ෂිය සත්‍යක් බවක්, සත්‍යයෙන් මිස බොරුවක් නොකියන බවටත් ප්‍රතිඥා දී කැඳවයි. (ද්‍රවිඩ භාෂාවෙන් ප්‍රතිඥා දෙනු ලබයි)

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා:</u>

ප්‍ර : සහිලාන් මහත්මයා ඔබ උපත ලැබූ ගම් පලාත කොහේද?
පි : කාත්තන්කුඩි.
ප්‍ර : ඔබ පාසැල් ගියේ කුමන පාසැලකටද?
පි : කාත්තන්කුඩි මධ්‍ය මහා විද්‍යාලය සහ ජාතික පාසැල. කාත්තන්කුඩි.
ප්‍ර : කාත්තන්කුඩි මධ්‍ය මහා විද්‍යාලයේම ඔබ උසස් පෙළ දක්වා ඉගෙන ගත්තද?
පි : වසර 1 සිට 7 දක්වා කාත්තන්කුඩි මෙත්ත පල්ලියේ විදුහලේ ඉගෙනුම ලැබුවා. වසර 8 ඉදලා උසස් පෙළ දක්වා කාත්තන්කුඩි මධ්‍යම මහා විද්‍යාලයේ ඉගෙනුම ලැබුවා.
ප්‍ර : උසස් පෙළ සමත් වීමෙන් අනතුරුව සහිලාන් මහත්මයා ඔබ යම්කිසි විශ්ව විද්‍යාලයකට ඇතුල් වෙනවද?
පි : ඔව්.
ප්‍ර : කුමක්ද ඒ විශ්ව විද්‍යාලය?
පි : අග්නිදිග විශ්ව විද්‍යාලය, ඔලුවිල්.
ප්‍ර : මේ ඔලුවිල් අග්නිදිග විශ්ව විද්‍යාලයේ ඔබ කුමන අංශයද ඔබගේ උපාධිය සඳහා හදාරන්නේ?
පි : කළමනාකරණ පීඨයේ අධ්‍යාපනය ලැබුවා.
ප්‍ර : එතකොට ඔබ ව්‍යාපාර කළමනාකරණ උපාධිය ලබාගෙන විශ්ව විද්‍යාලයෙන් පිටවෙන්නේ කුමන අවුරුද්දේ ද?
පි : 2004 දී.
ප්‍ර : ඔබ උපාධිධාරියක් විදියට පිටවෙලා යම්කිසි රැකියාවක් තෝරා ගන්නවද?
පි : ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මොකක්ද ඒ රැකියාව?

පි : ගුරුවරයෙක් වශයෙන් ටික කාලයක් සේවය කලා.

ප්‍ර : ඉන් අනතුරුව ඔබ කුමක්ද කරන්නේ?

පි : ඉන්පසු ව්‍යාපාර කටයුතුවල යෙදුනා.

ප්‍ර : ඒ ව්‍යාපාරවලින් අනතුරුව ඔබ යම්කිසි රාජ්‍ය ආයතනයක් හා සම්බන්ධ වෙනවද?

පි : ඊට පස්සේ **2013** සිට සංවර්ධන නිලධාරී වශයෙන් කටයුතු කරනවා.

ප්‍ර : කුමන රාජ්‍ය ආයතනයකද ඔබ වැඩ කරන්නේ සංවර්ධන නිලධාරී වශයෙන්?

පි : කාත්තන්කුඩියේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ.

ප්‍ර : කාත්තන්කුඩි ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරිවරයෙක් විදියට ඔබ මුලින්ම බැඳුනේ කවද්ද?

පි : **2013.07.02** වෙනිදා.

ප්‍ර : එතකොට **2013** ඉදලා මේ දක්වාම ඔබ කාත්තන්කුඩි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්තව සංවර්ධන නිලධාරියෙක් විදියට රාජකාරි කරනවා කියලා කිව්වොත් නිවැරදි ද?

පි : ඔව්.

ප්‍ර : දැන් ඔබගේ ඔය රැකියාවට අමතරව ඔබ ඉස්ලාම් ආගමක යම්කිසි භාරයක යම්කිසි තනතුරක් හොබවනවද?

පි : මම වැඩ කරන්නේ නැහැ නමුත් ඉස්ලාම් ධර්මයේ මවුලවිවරයෙක් වශයෙන් කටයුතු කිරීමට පුහුණුව ලබා තිබෙනවා.

ප්‍ර : ඔබ මවුලවිවරයෙක් වශයෙන් කටයුතු කරන්න පුහුණුව ලැබුවේ කොහේද?

පි : කාත්තන්කුඩි අල්ජාමියතුල් රබානියා අරාබි පාසැලේ තමයි සුදුසුකම ලබා තිබෙන්නේ.

ප්‍ර : ඔබ වසර කීයක් ඉගෙනීම ලැබුවද?

පි : අවුරුදු **10** ක් පමණ.

ප්‍ර : අවුරුදු **10** ක් පමණ අධ්‍යයනයකින් පසුවද ඔබ මවුලවි තනතුරට පත් වුනේ?

පි : ඔව්, මම මාගේ පාසැලේ අධ්‍යාපන කටයුතුත් කරගෙන මවුලවිවරයෙක්ගේ පාඨමාලාවත් හැදෑරූ නිසා මට අවුරුදු **10** ක් පමණ කාලයක් ගත වුණා.

ප්‍ර : ඔබ මවුලවිවරයෙක් වශයෙන් අදාල සහතික පත්‍රය ලබා ගැනීමෙන් පස්සේ යම්කිසි කාත්තන්කුඩි ප්‍රදේශයේම තියෙන ඉස්ලාම් ආගමට සම්බන්ධ යම්කිසි භාරයක තනතුරක් ලබා ගත්තද?

පි : අල්හාජ් අබ්දුල් ජවාත් ආලිම් වලිඋල්ලා භාරකාර පදනමේ **2009** වර්ෂයේ සිට ලේකම් වශයෙන් කටයුතු කරනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : අල්හාජ් අබ්දුල් ජවාත් ආලිම් වලිඋල්ලා Trust කියන භාරයේ ඔබ ලේකම්වරයෙක් වශයෙන් සහ මවුලවිවරයෙක් වශයෙන් කටයුතු කරනවා කිව්වොත් හරිද?

පි : එම ආයතනයේ මම ලේකම් වශයෙන් කටයුතු කලා. මවුලවි යන සුදුසුකම ලබා තිබුණා ඒකට ගෙවීමක් කරන්නේ නැත.

ප්‍ර : දැන් ඔබ සඳහන් කලා අල්හාජ් අබ්දුල් ජවාත් ආලිම් වලිඋල්ලා කියන භාරය ගැන. මේ භාරය පිහිටුවලා තියෙන්නේ යම්කිසි පාර්ලිමේන්තුවේ පනතකින් කියලා කිව්වොත් නිවැරදි ද?

පි : ඔව්.

ප්‍ර : ඒ පනතේ පිටපතක් දුන්නොත් ඔබට පරීක්ෂා කරලා බලලා හදුනා ගැනීමේ හැකියාවක් තියෙනවද?

පි : ඔව්.

ස්වාමිණී සාක්ෂිකරුට යම්කිසි ලේඛනයක් පෙන්වීමට ඉතාමත් ගෞරවයෙන් අවසර පතනවා.

ප්‍ර : පරීක්ෂා කර බලන්න?

පි : ඔව් මම හදුනා ගන්නවා.

ප්‍ර : ඔබ මේ ලේඛනය කුමක් හැටියටද හදුනා ගන්නේ?

පි : මෙය පනතක් වශයෙන් අපේ ආයතනයේ හදුනා ගන්නවා.

ප්‍ර : මෙහෙම කිව්වොත්, මෙය ඔබගේ භාරය පිහිටුවන ලද පාර්ලිමේන්තුවේ පනත වශයෙන් ඔබට හදුනා ගන්න හැකියාවක් තියෙනවද?

පි : ඔව්.

ස්වාමිණී සාක්ෂිකරු විසින් හදුනා ගන්නා ලද **2009** අංක **46** දරණ අල්හාජ් අබ්දුල් ජවාත් ආලිම් වලිඋල්ලා භාරය සංස්ථාගත කිරීමේ පනත **C668** වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.

ස්වාමිණී **C668** වශයෙන් ලකුණු කරපු පනතේ 3 වන වගන්තිය කෙරෙහි සාක්ෂිකරුගේ අවධානය යොමු කරනවා.

ප්‍ර : දැන් ඒ පනතේ 3 වන වගන්තියට අනුව ඔබ මේ ලේකම් වශයෙන් කටයුතු කරන භාරයේ පරමාර්ථ සඳහන් වෙනවා කිව්වොත් නිවැරදි ද?

පි : අපේ ආයතනයේ ක්‍රියාකාරකම් පිළිබඳව, ඒ පරමාර්ථය පිළිබඳ සඳහන් වෙනවා.

ප්‍ර : මේ පරමාර්ථ යටතේ 3(අ) වශයෙන් තියෙනවා සංස්ථාවේ දේපල වන්නාවු මුස්ලිම් පල්ලි, කුර්ආන් මද්‍රසාවන් සහ දර්ෂාවන් යනාදිය නඩත්තු කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම සහ අවශ්‍ය විටෙක නව මද්‍රසාවන් ආරම්භ කිරීම ඔබලාගේ මේ භාරයේ එක් අරමුණක්

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

විදියට. එහෙම කිව්වොත් ඒ ප්‍රකාශයට ඔබට නිවැරදියි කියලා කියන්න පුළුවන්ද?

පි : ඔව්.

ප්‍ර : ඒ කියන්නේ ඔබලාගේ මේ භාරය යටතේ මුස්ලිම් පල්ලි තිබෙනවද?

පි : ඔව්.

ප්‍ර : පල්ලි කීයක් විතර තියෙනවද?

පි : පල්ලි 3 ක් තියෙනවා.

ප්‍ර : ඒ පල්ලි 3 කොහේද පිහිටලා තියෙන්නේ?

පි : කාත්තන්කුඩියේම පිහිටා තිබෙනවා.

ප්‍ර : ඊට අමතරව ඔබලගේ මේ භාරය යටතේ කුර්ආන් මද්‍රසාවන් තියෙනවද?

පි : ඔව්.

ප්‍ර : කීයක් විතර තියෙනවද?

පි : 4 ක් තියෙනවා.

ප්‍ර : සහ මෙහි ඔබලාගේ පරමාර්ථය යටතේ තියෙනවා දර්ෂාවන් යනාදිය නඩත්තු කිරීම කියලා. මේ දර්ෂාවන් කියන්නේ මොනවාද?

පි : සූෆි ඉස්ලාම් ධර්මයේ ප්‍රභූවරුන්ව ඔවුන්ගේ මෘතදේහ වළදමා තිබෙන සොහොන් කොත්වලට තමා දර්ෂා කියන්නේ.

ප්‍ර : එතකොට ඒ සොහොන් අඩංගු ඒ ස්ථාන නඩත්තු කිරීමත් ඔබලාගේ භාරය මගින් සිද්ධ කරනවද?

පි : ඔව්.

ප්‍ර : සහ ඔබලගේ භාරයේ තවත් පරමාර්ථයක් විදියට තියෙනවා ජාමියාතුල් රබානියා අරාබි අධ්‍යයන ආයතන පාලනය කිරීම හා නඩත්තු කිරීම.
මේ ජාමියාතුල් රබානියා අරාබි අධ්‍යයන ආයතන කියන්නේ මොනවද?

පි : සූෆි ඉස්ලාම් ධර්මය ප්‍රචාරය නැත්නම් ඉගැන්වීම් කරනු ලබන අරාබි පාසැල.

ප්‍ර : දැන් ඔය ඒ අරාබි පාසැල් සහ කුර්ආන් මද්‍රසාවන් අතර වෙනසක් තියෙනවද මහත්මයා?

පි : කුර්ආන් මද්‍රසාවල කුර්ආනය කියවීම සඳහා පමණක් උගන්වනු ලැබේ. සූෆි මුස්ලිම්වරුන්ගේ පාඨශාලාවල කුර්ආනය නිර්වචනය කිරීම, අරාබි භාෂාව, සූෆි ඉස්ලාම් ධර්මයේ ප්‍රචාරයන් උගන්වනු ලැබේ.

ප්‍ර : නැවත ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද ජාමියාතුල් රබානියා අරාබි අධ්‍යයන ආයතනවලින් සිදු කෙරෙන කාර්යය භාරය කුමක්ද කියලා?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පි : 1. කුර්ආනයේ අර්ථය නිර්වචනය කරනු ලබනවා.
2. අරාබි භාෂාව උගන්වනු ලබනවා.
3. සූෆී ඉස්ලාමීය ඉගැන්වීම් එහෙම නැත්නම් දර්ශන උගන්වනු ලැබේ.

ප්‍ර : දැන් මෙහිදී රබානියා අරාබි අධ්‍යයන ආයතනවල හදීෂ් ගැන ඉගැන්වීමක් කෙරෙන්නේ නැද්ද, කුර්ආනය පමණද උගන්වන්නේ?

පි : හදීෂ් ගැනත් උගන්වනු ලබනවා.

ප්‍ර : දැන් මෙවැනි අධ්‍යයන ආයතන කීයක් විතර ඔබලාගේ භාරය යටතේ තියෙනවද?

පි : මේ වගේ එක පාසැලක් පමණක් තියෙනවා.

ප්‍ර : දැන් ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද මහත්මයා ඔබ කිව්වා මේ පාසැල්වල උගන්වනවා සූෆී දහම කියලා, මොකක්ද මේ උගන්වන සූෆී දහම කියලා?

පි : සාමය කෙරෙහි මිනිස්සුන්ව යොමු කිරීම. අධ්‍යාත්මික හිත සම්බන්ධයෙන් වූ ඉගැන්වීම. අධියාත්මික ක්‍රමවල්. හිත පිරිසිදු කර දෙවියන්ව හඳුනා ගැනීම, ඔහුට වන්දනා කිරීමේ ක්‍රමයක් මෙවැනි කටයුතු කිරීම තමයි සූෆී මුස්ලිම් ධර්මයේ සඳහන් වෙන්නේ. හිතේ ඇති වෙන ක්‍රෝධය, කෝපය, ඊර්ෂ්‍යාව, ජනතාව අතර ඇති වන භේදය යනාදිය තුරන්කර හිත පිරිසිදුව තබා ගැනීම යන්න සූෆී දහමෙන් ඉගැන්වෙනවා.

ප්‍ර : දැන් මේ සූෆී දහම උගන්වන ඔබලා පාවිච්චි කරන අන්තර් ජාතික වශයෙන් භාවිතා වන ප්‍රධාන විද්වතුන්ලගේ තියෙන පොත් ඔබලා භාවිතා කරනවද?

පි : ඔව්.

ප්‍ර : මෙනවද ඒ පොත්?

පි : ඉමාම් රසාලි රහිමලුල්ලා යන අය විසින් රචනා කරන ලද ඉහියාහු ඔලුමුදීන් ග්‍රන්ථය ලියා ඇත.

ප්‍ර : ඒ පොතද ප්‍රධාන වශයෙන් ඔබලාගේ සූෆී දහම ඉගැන්වීම සඳහා ඔබලා භාවිතා කරන්නේ?

පි : මෙය ප්‍රධාන කොට තවත් පොත් කිහිපයක්, ග්‍රන්ථ කිහිපයක් තියෙනවා.

ප්‍ර : දැන් ඔබ පැහැදිලි කලා ඔබලාගේ සූෆී දහම කොහොමද ඔබලාගේ අරාබි අධ්‍යයන ආයතන තුලින් ඔබලගේ ශිෂ්‍යයන්ට උගන්වන්නේ කියලා. දැන් ඊට අමතරව මේ ගරු කොමිෂන් සභාවට ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද මේ භාරයේ ඔබ ලේකම් වශයෙන් ඔබට පැවරිලා තියෙන රාජකාරී මොනවද කියලා?

පි : මෙම ආයතනයේ රැස්වීම් මා විසින් කැඳවනු ලබනවා. ඒ සම්බන්ධයෙන් වූ minutes එහෙම මා විසින් ලියනු ලබනවා.

President's Copy
FAIR COMMENT BY JEZEEM

මෙම ආයතනය යටතේ පැවතෙන අනෙකුත් අරාබි මද්‍රසා වැනි ආයතනවලට අප විසින් ගනු ලබන රැස්වීමේදී ගනු ලබන තීරණය දැනුම්දීම සිද්ධ කරනවා.

ප්‍ර : දැන් ඔබලගේ භාරය යටතේ මුස්ලිම් පල්ලි මද්‍රසාවන් සහ අරාබි අධ්‍යයන ආයතන තියෙනවා කිව්වා, දැන් මේවා නඩත්තු කරගෙන යන්නට ඔබලාගේ භාරයට මුදල් ලැබෙන්නේ කොයි ආකාරයෙන්ද?

පි : මහජනතාව විසින් පිරිනමනු ලබන පරිත්‍යාගයන්.

ප්‍ර : ඒ මහජනතාව විසින් පිරිනමනු ලබන පරිත්‍යාගයන් මත පමණයිද ඔබලාගේ භාරය ක්‍රියාත්මක වන්නේ?

පි : ඊට අමතරව අපේ පල්ලිවල සිදු කරනු ලබන දන්සැල්, කන්තූරිවලට ලැබෙන පඩුරුවලින් අපි ඒ මුදල ලබා ගන්නවා.

ප්‍ර : ඊට අමතරව මැදපෙරදිග රටවල්වලින් හෝ අනෙකුත් ඉස්ලාමීය රටවල්වලින් ඔබලාට ආධාර එහෙම ලැබෙනවද?

පි : එසේ කිසිවක් ලැබෙන්නේ නැත.

ප්‍ර : දැන් කාත්තන්කුඩි ප්‍රදේශයේ ඔබ ඉපදිලා පාසැල් ගිහිල්ලා, රැකියාවත් කරනවා ඔබ ඉපදිච්ච දා සිටම, ඔබට කියන්න පුළුවන්ද මේ කාත්තන්කුඩි ප්‍රදේශයේ සූෆී දහමට අමතරව තවත් නිකායන් මොනවද තියෙන්නේ ඉස්ලාම් ජනතාව අදහන?

පි : ඔව් තියෙනවා.

ප්‍ර : සූෆී කියන ඉගැන්වීම ඉස්ලාම් ආගමේ තියෙන එක්තරා වාදයක්ද, නැත්නම් ඒක දහමද?

පි : ඒක තනි ආගමක් නෙමෙයි ඉස්ලාම් ධර්මයේම තියෙන සූෆී වාදය.

ප්‍ර : ඒ කියන්නේ ඉස්ලාම් ධර්මයේ තියෙන සූෆී වාදයට අනුකූලව තමයි ඔබලාගේ මේ පල්ලි ක්‍රියාත්මක වෙන්නේ කිව්වොත් නිවැරදි ද?

පි : ඔව්.

ප්‍ර : දැන් ඔය සූෆී දර්ශණයට අමතරව තවත් ඉස්ලාම් ආගම තුල තවත් තියෙන දර්ශණ මොනවද?

පි : ඔව් තියෙනවා. වහබිසම්

ප්‍ර : තව මොනවද තියෙන්නේ?

පි : මේ ඇතුලත තබ්ලික් ජමාත්, තවුහිද් ජමාත් යන ජමාතේ ඉස්ලාම් වැනි නිකායන් පැවතෙනවා. තවුහිද් ජමාතේ නමින් නොයෙකුත් ජමාතයන් තිබෙනවා.

ප්‍ර : ඔබ කියන්නේ මේ වහබිසම් කියන දර්ශනය තුළ තියෙන නිකායන් කියලද ඔය දැන් සඳහන් කරපු නිකායන්?

පි : ඔව්.

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : Is it the position that Jamathe Islam, Thablik Jamath and Thawheed Jamath are organizations within Wahhabism or is it that Thablik Jamath, Thowheed Jamath and Jamathe Islam are organizations consisting of people who practice Islam but those people who are now practicing what is called as Wahhabism ?

පි : වහබිසම් තමයි තබ්ලික් ජමාත්, තවුහිද් ජමාත්, ජමාතේ ඉස්ලාම් යන සංවිධාන follow කරන්නේ. නමුත් ඒවායෙහි ඔවුන් සීමාවන් පනවාගෙන තිබෙනවා ටිකක් වහබිසම්, ඊටත් වඩා අන්තවාදිවත් ඔවුන් අනුගමනය කරනු ලබනවා.

ප්‍ර : තවුහිත් ජමාත්, තබ්ලික් ජමාත්, ජමාතේ ඉස්ලාම් යන සංවිධානවල ඉන්නේ ඉස්ලාම් ලබ්දිකයින්ද නැද්ද?

පි : ඔවුන් මුස්ලිම්වරුන්.

ප්‍ර : එතකොට නමුත් ඒ මුස්ලිම්වරුන් ඔවුන් අනුගමනය කරන්නේ වහබිසම් කියන මතවාදයද?

පි : ඔව්.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා:</u>

ප්‍ර : ඔබ දැන් පැහැදිලි කලා සූෆිසම් සහ වහබිසම් ගැන, ඊට අමතරව තවත් එවැනි මතවාද තිබෙනවද මේ කාත්තන්කුඩි ප්‍රදේශයේ මුස්ලිම් ජනතාව අදහන?

පි : මෙම වහබිසම්වලට අයිති නොවන පොදුවේ ඉස්ලාම්වරුන් යයි තමුන්ව හඳුන්වනු ලබන පිරිසකුත් ඉන්නවා.

ප්‍ර : ඒ කියන්නේ ඔවුන් ඔය ශ්‍රී ලංකාවේ හිටිය සාම්ප්‍රදායික මුස්ලිම් ජනතාවද ඔය දෙකටම අයිති නැති කට්ටිය කියන්නේ සූෆිසමුත් නොවන වහබිසමුත් නොවන කට්ටිය කියන්නේ ලංකාවේ හිටපු සාම්ප්‍රදායික මුස්ලිම් ජනතාවද?

පි : නැත. සූෆී වාදය අනුගමනය කරන්නවුන් තමයි පාරම්පරික මුස්ලිම්වරු.

ප්‍ර : එතකොට ඔබ දැන් පැහැදිලි කලානේ සූෆිසමුත් නොවන වහබිසම්නුත් නොවන පිරිසක් ඉන්නවා කියලා, ඔවුන් කවුද ? ඔවුන් මොනවද ඔබලා දෙගොල්ලොන්ගෙන් වෙනස් වෙන්නේ කොහොමද?

පි : ඔවුන්ට සූෆිවත් දන්නේ නැහැ, වහබිසම්වල අන්තවාදීනුත් නෙමෙයි, නමුත් ඔවුන් සාමාන්‍යයෙන් පල්ලිවලට ගොස් වන්දනාමාන යාච්ඤා කරලා තමන්ගේ නිවෙස්වල ඉන්න පිරිසක්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් කාත්තන්කුඩි ප්‍රදේශයේ මේ සූෆිසම් නැත්නම් සූෆී දර්ශනවාදය විශ්වාස කරන්නවුන්ගේ පල්ලි කීයක් විතර තියෙනවද?

පි : පල්ලි 3 ක් තිබෙනවා.

ප්‍ර : ඒ කියන්නේ මේ ඔබලගේ භාරය යටතේ තියෙන පල්ලි විතරද සූෆී දහම අදහන්නේ?

පි : ඔව්.

ප්‍ර : සාමාන්‍යයෙන් ඔය සූෆි දහම අදහන ඔබලගේ පල්ලිවලට එන කාත්තන්කුඩි ප්‍රදේශයේ ජනතාව කොච්චර විතර ඉන්නවද?

පි : 10000 ක් පමණ.

ප්‍ර : සූෆී දහමට අයිති නොවන පල්ලි කොච්චර විතර තියෙනවද මේ කාත්තන්කුඩි ප්‍රදේශයේ?

පි : 45 යි 50 අතර ඉන්නවා සාමාන්‍යයෙන්.

ප්‍ර : ඒකෙන් වහබි දර්ශනය Practice කරන වහබි දර්ශනය පිළිබඳව අදහන පල්ලි කොච්චර විතර තියෙනවද?

පි : 10 සිට 15 ක් පමණ පල්ලි ඇත.

ප්‍ර : සාමාන්‍යයෙන් කාත්තන්කුඩි ප්‍රදේශයේ කෙතරම් ජනගහනයක් මේ වහබි දර්ශනය අදහන පල්ලි සමඟ එකතු වෙලා කටයුතු කරනවද?

පි : 15000 ක් පමණ පිරිස ඉන්නවා.

ප්‍ර : මේ වහබි දර්ශනය Practice කරන පල්ලිවලට මුදල් ගලා එන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් ඔබට අවබෝධයක් තියෙනවද?

පි : මට එය ලැබෙන්නේ කොහෙන්ද කියලා සාක්ෂිවලින් ඔප්පු කරන්න බැහැ නමුත් සාමාජිකත්ව දායකත්වය සහ පිටරටවලින් මොවුන්ට මුදල් ලැබෙනවා ඇති.

ප්‍ර : කියලා ඔබ විශ්වාස කරනවා?

පි : ඔව් එය එසේ විය හැකිය. පරිත්‍යාග මගිනුත් ඔවුන්ට මුදල් ලැබෙනවා.

ප්‍ර : ඔවුන් ඔය වහබි දර්ශන වාදය අදහන පල්ලිවලට විදේශිය මවුලවිවරුන් ඇවිල්ලා යාච්ඤා පවත්වනවා ඔබ දැක තියෙනවද?

පි : පල්ලිවල කියනවා නෙමෙයි නමුත් ඒ වගේ රැස්වීම් පැවැත්වීම සඳහා ඉන්දියාවේ සිට මවුලවිවරු පැමිණ තිබෙනවා.

ප්‍ර : ඔබ ඒ ආපු මවුලවිවරුන් එහෙම නමින් හඳුනනවද?

පි : ඉන්දියාවේ සිට පැමිණි P.ජේයිනු ලාබ්දීන්.

ප්‍ර : ජෙයිනු ලාබ්දීන් කාත්තන්කුඩි ප්‍රදේශයට ආවද?

පි : ඔව්.

ප්‍ර : කොයි කාලේ විතරද ආවේ?

පි : මට වර්ෂය හරියට මතක නැත.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දළ වශයෙන් කොයි කාලේ විතරද?

පි : 2000 සිට 2005 ඇතුලත කාලයේදි ඔහු එසේ පැමිණෙන්න ඇත.

ප්‍ර : ඔහු කී වරක් විතර ඇවිල්ලා තියෙනවද?

පි : කාත්තන්කුඩියට එක සැරයයි පැමිණියේ.

ප්‍ර : ඊට අමතරව ඔබ දැනුවත්ද ලංකාවේ වෙන තැන්වලට මේ ජෙයිනු ලාබ්දීන් කියන පුද්ගලයා ආපු බවට?

පි : කොළඹට ඇවිත් ගිය බව නම් මම දන්නවා.

ප්‍ර : ඔබ මේ ජෙයිනු ලාබ්දීන් කියන පුද්ගලයා ඉන්දියානු නැෂනල් තවුහිද් ජමාත් යන සංවිධානයේ නායකයා බව දන්නවද?

පි : එයා තමිල්නාඩු තවුහිද් ජමාත් එකේ නායකයා බව මම දන්නවා. TNTj

ප්‍ර : ඔබ සඳහන් කලා ජෙයිනු ලාබ්දීන් 2000, 2005 අතරේදි කාත්තන්කුඩියටත් ඉන්පසුව කොළඹටත් ආවා කියලා. මේ ජෙයිනු ලාබ්දීන් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සඳහා මුල් වුනේ කවුද කියන්න ඔබ දන්නවද?

පි : නිශ්චිත වශයෙන් මම දන්නේ නැහැ.

ප්‍ර : ඔබ සඳහන් කලා ජෙයිනු ලාබ්දීන් එක් වතාවක් කාත්තන්කුඩියට ආවා ඔබට හොඳට මතකයි කියලා, ඒ කාත්තන්කුඩියට ජෙයිනු ලාබ්දීන්ව ගෙන්වා ගන්න මූලිකව කටයුතු කලේ කවුද කියලා ඔබට මතකද?

පි : මට හරියටම ඒ ගැන දන්නේ නැහැ. නිශ්චිතව දන්නේ නැහැ.

ප්‍ර : ඇවිල්ලා ඔහු දවස් කීයක් විතර හිටියද, මොන වගේ දේශණාද පැවැත්තුවේ කියන එකට ඔබට යම්කිසි මතකයක් තියෙනවද?

පි : එක් දවසක් මහා රැස්වීමක් පැවැත්වූ බව නම් මට මතකයි. මම එම රැස්වීමට ගියේ නැහැ. මම නිවසේ ඉන්න අවස්ථාවේදී ලොකු ශබ්ද විකාශන යන්ත්‍ර මගින් ඔහුගේ දේශණය මට අහගන්න පුළුවන් වුණා. ඔහු වහබිසම් සම්බන්ධයෙන් කතා කලා. සූෆි මුස්ලිම්වරුන්ගේ පාරම්පරික වන්දනා ක්‍රමවලට විරුද්ධව කතා කලා.

ප්‍ර : දැන් ඔබ සඳහන් කලා Loudspeaker දාලා විශාල සෙනඟක් ගෙනාවා කියලා ඔබ සඳහන් කලානේ, ඒ අනුව මේ Loudspeaker දාගෙන ඒ කියපු දේශනාව ඔබ යම්තාක් දුරකට අහගෙන හිටියද?

පි : සම්පූර්ණ කතාවම ඇහුවේ නැහැ මම කොටස් කොටස් වශයෙන් මම අහගෙන හිටියා.

ප්‍ර : දැන් ඔබට ඒ ඇහිච්ච ටික අනුව ඔහු මොන වගේ ප්‍රධාන කාරණා ගැනද මේ දේශනාවෙදී ලංකාවට ඇවිල්ලා සඳහන් කලේ?

පි : සූෆි මුස්ලිම්වරුන්ගේ පාරම්පරික යාච්ඤා වන්දනා ක්‍රමවලට විරුද්ධව තමයි ඔහු කතා කලේ. නිදසුනක් වශයෙන් සූෆි මුස්ලිම්වරුන්ගේ ප්‍රභූවරුන්ගේ වන්දනා කරන සොහොන් කොත

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

වන්දනා කිරීම පාරම්පරික ක්‍රමවේදයක්. ඔහු එම වන්දනාවට විරුද්ධව කතා කලා. මීලාදුනබී උත්සවය සැමරීම සූෆී මුස්ලිම්වරුන්ගේ සම්ප්‍රදායකි. එයට විරුද්ධව ඔහු කතා කලා.

ප : මීලාදුනබී උත්සවය කියන්නේ මොකක්ද මහත්මයා?

පි : මොහම්මදු නබී සල්ලල්ලාහු තුමා උපත ලැබූ දිනය තමයි එම දිනයෙන් සමරන්නේ.

ප : කවද්ද ඒ දිනය?

පි : ඉස්ලාම් වර්ෂයේ රබියුල්අවුවල් මාසේ 12 වෙනි දින එය සිහි කරනු ලබනවා.

ප : දැන් ඔබලා එම දින සිහිකරලා සැමරුවට මේ කාත්තන්කුඩි ප්‍රදේශයේ ඉන්න විශාල ප්‍රමාණයක් එම දින සිහි කරලා උත්සව පවත්වන්නේ නැද්ද?

පි : අවුරුදු 20 ක් 25 ට කලින් සියළුම මුස්ලිම්වරුන් විසින් එම උත්සවය සමරනු ලැබුවා. නමුත් කාත්තන්කුඩි දැනට සූෆී මුස්ලිම්වරුන් පමණයි මීලාත් නබී උත්සවය සමරනු ලබන්නේ.

ප : ඒ කියන්නේ වහබ් දර්ශනය අදහන කිසිවෙක් මේ උත්සවය සමරන්නේ නැහැ කිව්වොත් නිවැරදි ද?

පි : ඔව්.

ප : දැන් ඔබ සඳහන් කරමින් සිටියේ මේ ජෙයිනු ලාබ්දීන්ගේ දේශනය ගැන. එම දේශනයේදි ඔහු සඳහන් කලාද ඉස්ලාම් රාජ්‍යයක් බිහි කිරීම ගැන හෝ කලීපාතයක් බිහි කිරීම ගැන හෝ නැත්නම් ජිහාද් ගැන හෝ ඔහු සඳහන් කිරීමක් සිද්ධ කලාද?

පි : නැත.

ප : ඔය ජෙයිනු ලාබ්දීන් ලංකාවට ගෙන්නලා කාත්තන්කුඩි දේශනය පවත්වන්නට යම්කිසි දේශපාලනික පුද්ගලයෙක් ප්‍රධානත්වයක් ගෙන වැඩ කලාද?

පි : ඒ සම්බන්ධයෙන් මා දන්නේ නැහැ.

ප : දැන් ඔබ කිව්වනේ ජෙයිනු ලාබ්දීන් දෙවන වරට ඔබ දන්නා ආකාරයට කොළඹට ආවා කියලා, කොළඹට ආවේ කොයි කාලේදී වගේද කියලා ඔබට මතකද?

පි : 2005 ට පසුව තමයි ඔහු කොළඹට පැමිණෙන්න ඇති.

ප : දළ වශයෙන් අවුරුද්ද මතකද? යුද්ධය අවසන් වෙන්නට කලින්ද, යුද්ධය තියෙන කාලේ වගේද?

පි : මම හිතන පරිදි යුද්ධය පවතින කාලේදී තමයි ඔහු එන්න ඇති, ඒක හරියට මතක නැහැ.

ප : ජෙයිනු ලාබ්දීන්ට අමතරව ඔබ දන්නවද ඔය කාත්තන්කුඩි ප්‍රදේශයට පැමිණෙන විදේශීය මවුලවිවරුන් කවුරුන්ද කියලා?

පි : කෝවෙයි අයියුබ් යන පුද්ගලයෙක් පැමිණ ප්‍රචාරක කටයුතුවල යෙදුනා මට මතකයි.

FAIR COMMENT BY JEZEEM

ප : ඔහුත් මේ වහබි දර්ශනය පිළිබඳ ප්‍රචාරණය කරපු පුද්ගලයෙක්ද?

පි : ඔව්.

ප : මේ කෝවේයි අයියුබ් කියන පුද්ගලයා කොයි වකවානුවේද ආවේ?

පි : ඔහු පැමිණි අවුරුද්ද මට මතක නැහැ. නමුත් ඔහු ආපු වගනම් මට හොඳටම මතකයි.

ප : ඔහුත් සඳහන් කලේ අර ජෙයිනු ලාබ්දීන් වගේ සූෆී දහමට විරුද්ධ දේවල්ද?

පි : ඔව්.

ප : ඔබ සඳහන් කළා මේ වහබි දර්ශනය ගැන මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් යන පුද්ගලයා සූෆී දර්ශනය අදහන පුද්ගලයෙක්ද, වහබි දර්ශනය අදහන පුද්ගලයෙක් හැටියටද ඔබ හඳුනාගෙන තියෙන්නේ?

පි : වහබිසම්ව අනුගමනය කලා.

ප : ඔබ මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන්ව හම්බ වෙලා කතා කරලා එහෙම තියෙනවද?

පි : පාරේදි මම ඔහුව හම්බ වෙලා තියෙනවා. ඒ වගේම උසාවියේ දි හා පොලිසියේදි මම ඔහුව හමු වෙලා තියෙනවා.

ප : ඔබ ඔහු ගැන ඔහුගේ පසුබිම ගැන යම්කිසි තොරතුරු හොයා බැලීමක් සිද්ධ කරලා තියෙනවද?

පි : ඔහුගේ මුල් කාලය කාත්තන්කුඩියේදි ඔහුගේ අන්තවාදී කටයුතු යනාදිය පිළිබඳව මට පැහැදිලිව කිව හැකිය.

ප : මොහොමඩ් සහරාන් මේ වහබි දර්ශනය සම්බන්ධයෙන් ඉගෙනුම ලැබුවේ මොන පාසැලේදිද කියලා ඔබ දන්නවද?

පි : ඔහු 2001 වර්ෂයේදි ඉස්ලාම් ධර්මය පිළිබඳව ඉගෙනීමට පටන් ගත්තා.

ප : කොහෙන්ද මොන පාසැලෙන්ද ඉගෙන ගන්න පටන් ගත්තේ?

පි : කාත්තන්කුඩියේ පිහිටි ජාමියතුල් ෆලා අරාබි පාසැලේ.

ප : දැන් මේ අරාබි පාසැල සූෆී දහම අදහන සූෆී දර්ශනය අදහන ඉස්ලාම්වරුන්ගේ පාසැලක්ද, නැත්නම් වහබි දර්ශනය අනුගමනය කරන ඉස්ලාම්වරුන්ගේ පාසැලක්ද?

පි : එම පාසැල මුල් හරියේදි සූෆීසම් වාදය තමයි අනුගමනය කලේ. පසුකාලයේදි ඔවුන් වහබිසමය අනුගමනය කරන්නවුන්ට බයේ සූෆීසම් බිසම් වලින් ඉවත් වී වහබිසම් ප්‍රතිපත්ති අනුගමනය කරන්න පටන් ගත්තා.

ප : පසු කාලෙක කියන්නේ කොයි කාලෙද? මහත්මයා ඔබට සඳහන් කරන්න පුළුවන්ද මේ ඔබලගේ කාත්තන්කුඩිවල ඉන්න සූෆී දර්ශනය අදහන පුද්ගලයින්ගේ යම්කිසි නායකයෙක් ඉන්නවද?

පි : ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : කවුද ඒ පුද්ගලයා?
පි : මවුලවි අබ්දුල් රවුෆ් මිස්බාහි බහුජී.

දැන් වේලාව : ප.ව. 2.00 යි
මෙතැන් සිට ල/ලේ :- යමුනා දසනායක මිය විසින් සටහන් කරන ලදි.

President Secretary's Copy

වේලාව 2.00
පෙර සටහන් - ධම්මිකා මිය
මෙතැන් සිට - යමුනා දසනායක

FAIR COMMENT BY JEZEEM

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනිතිඥ චතුරංග බංඩාර මහතා.

උ එම පාඇැල මුල් හරියේදි සුෆිසම් වාදය තමයි අනුගමනය කලේ .

උ පසු කාලයේදි ඔවුන් වහාබිසම් අනුගමනය කරන බයෙන් සුෆිසම් ගෙන් ඉවත්වී වායුසම් ප්‍රතිපත්තිය අනුව අනුගමනය කරන්න පටන් ගත්තා.

ප්‍ර පසු කාලයේ කියන්නේ කොයි කාලෙද ? මහත්මයා ඔබට සදහන් කරන්න පුළුවන්ද මේ ඔබලාගේ කාතන්කුඩි වල ඉන්න සුෆි දර්ශණය අදහන පුද්ගලයින්ගේ යම්කිසි නායකයෙක් ඉන්නවාද ?

උ ඔව්.

ප්‍ර කවිද ඒ පුද්ගලයා ?

උ මවුලවි අබ්දුල් රවුෆ් මිස්බාහි බහුජී.

ප්‍ර අබ්දුල් රවුෆ් මිස්බාහි බහුජී .

****

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා

ප්‍ර එම මවුලවි තුමාට අශේක් මවුලවි අල්හාජ් අබ්දුල් රහුෆ් මිස්බා මවුලවි කියලත් කියනවා ?

උ ඔව්. අශේක් මවුලවි අබ්දුල් රහුෆ් මිස්බා මවුලවි බහුජී

ප්‍ර ඒ විදියට අශේක් මවුලවි කියලා සාමාන්‍යයෙන් භාවිතා කරන්නේ බේරුවල නලිමියා අරාබි පාඇැලෙන් සමත්වන මවුලවි වරුන්ට නේද ?

උ එය අවුරුදු 20 ක් 25ක් ගිය කාලය ඇතුලත තමයි බේරුවලින් පිටවන මවුලවි වරුන්ට අල්ෂේක් කියන නමින් හැදින්වීමට පටන් ගත්තේ.

****

ගරු සභාපති විනිසුරු ජනක් දසිල්වා මැතිතුමා .

ප්‍ර අශේක් නෙමේ අශේක් ?

උ අශේක්.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනිතිඥ චතුරංග බංඩාර මහතා.

උ ඊට පෙර සුෆි තරික්කාවල නායකවුන ප්‍රභූ වරුන්ව අශේක් යන නමින් හදුන්වනු ලැබුවා
අල්ෂේක් නෙවේ අශේක් .

උ අශේක්.
ඒ පදනම මත තමයි අබ්දුල් රහිම් මිස්බා බහුජී යන අය කාදිරියා සුෆි තරික්කාවිල් නූතන නායකයා දැනට ඉන්න නායකයාඒ පදනම මත තමයි ඔහු අශේක් යනුවෙන් හදුන්වනු ලබන්නේ .

ප්‍ර ලංකාවේ සුෆි දර්ශණය අදහන පුද්ගලයන් කාතන්කුඩි වල විතරද ඉන්නේ ලංකාව වටේටම ඉන්නවාද ?

උ ලංකාව පුරාම ඉන්නවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර දැන් මේ ලංකාව පුරාම ඉන්න සුෆි දර්ශණය විශ්වාශ කරන බැතිමතුන්ගේ නායකයා කව්ද ?

උ ඒකට වෙනම නායකයෙක් නැත.එක් එක් සුෆි තරික්කාල් වලට වෙන වෙනම නායකවරු සිටිති .

****

<u>ගරු විනිසුරු අදිකාරි මහත්මිය</u>.

ප්‍ර සයිලාන් මහත්මයා මේ තරිකාවක් කියන්නේ මොකක්ද?
සුෆි තරික්කාවක් කියන්නේ ?

උ නබි සල්ලාහ තුමාගේ කාලයේ සිට මේ වන තුරු සුෆි මතවාදය ප්‍රකාශ කරමින් පැවති ස්ථානය තමයි ඔය තරික්කාව කියන්නේ .

ප්‍ර ලංකාවේ ඔය තරිකා කියක් විතර තියනවාද ?

උ හතරක් පහක් පමන තිබෙනවා .

ප්‍ර එතකොට ඔබ ඔය කිව්ව අශේක් අබ්දුල් රහිම් නිශ්කාන් බල්ජී තුමා මේ එක තරිකාවක පමණක් නායකයෙක්ද නැත්නම් මේ ලංකාවේ තියන තරිකා හතරටම සුෆි අදහන නායකයාද ?

උ කානත්කුඩියේ පිහිටි තරික්කාවලට ඔහු නායකයා.

ප්‍ර එතකොට ඔබ දන්නවාද ලංකාවේ ඉන්න අනික් සුෆි තරික්කා වල ඉන්න නායකයෝ කව්ද කියලා සුෆි තරික්කා වල නායකයෝ කව්ද කියලා?

ප්‍ර ඔයාලගෙන් අහන්න මේ කාදිලියා කියන එකේමෙයා කිව්වා කාදිලියා සුෆි තරික්කාව තමයි හබි ගේ මධ්‍යස්ථානය කියලා කාතන්කුඩියේ ඒ කාදිලියා කියන්නේ මොකක්ද කියලා අහන්න meaning ?

උ මොහිදීන් අබ්දුල් කාදර් ජීලානි යන අයගේ පැවත එන තරික්කාවරු ඔහුගේ නම අබ්දුල් කාදර් නිසා එය කාදිලියා යන නමින් හඳුන්වනු ලබනවා . ඔහු නබි සල්ලහාලාහු තුමාගේ පරම්පරාවේ එන කෙනෙක් .

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනිතිඥ චතුරංග බංඩාර මහතා.</u>

ප්‍ර ඔබ සදහන්කලා ලංකාව ඇතුලේ සුෆි තරික්කාවන් හතරක් විතර තියනවා කියලා ඔබට කියන්න පුළුවන්ද ඔබට සුෆි තරික්කාවන් කියන ලංකාවේ ප්‍රදේශ මොනවාද කියලා ?

උ කොළඹ එකක් තියනවා . ගාලේල් එකක් තියනවා බේරුවල ප්‍රදේශයේ එකක් තියනවා . ඒ වගේ තවත් ගම්වල සුෆි තරික්කාර් තිබෙනවා .

FAIR COMMENT BY JEZEEM

ප්‍ර එතකොට ඔය කොළඹ,ගාල්ල බේරුවල වගේ ප්‍රදේශවල සුෆි තරික්කාර් වන් වලට වෙන වෙනම නායකයෝ ඉන්නවා කිව්වොත් නිවැරදිද ?

උ ගාල්ල ප්‍රදේශයට වශයෙන් නෙවෙයි ඒ තරික්කාර් වලට නායකයෙක් වශයෙන් ඉන්නවා .

ප්‍ර මහත්මයා ඔබ මුලින්ම සඳහන් කලා මේ සහරාන් ගැන තමයි අපි කථා කරමින් හිටියේ සහරාන් ඔය 2001දි ඇතුළු වෙච්ච පාසැල මුලින්ම සුෆි මුස්ලිම් අන්තවාදය උගන්වමින් ඉදලා පසුව වහාබිවාදය අන්තවාදය උගන්වන්න ගත්තා කියලා ?

උ සුෆිවාදය තමයි කලින් ඉගැන්වුයේ නමුත් වහබ්වාදින්ට බයෙන් වහබිසම් දැන් උගන්වනු ලබනවා .

ප්‍ර සහරාන් මේ 2001 ඇතුලත් වෙච්ච පාසැලෙන් ඔහු එම පාසැල මාරු කරනවාද ?

උ 2005 දි එයින් අස්වී ඔහු කුරුණෑගල පිහිටි ඉබුණු මස්රුද් යන පාසැලට ඇතුලත් වෙනවා .

ප්‍ර දැන් මෙම සහරාන්ව මෙම අරාබි විද්‍යාලයෙන් ඉවත් කිරීමට යම්කිසි හේතුවක් තියනවාද ?

උ මා දන්නා පරිදි ඔහු වහාබිසම් මතයේ සිටි නිසා තමයි එම පාසැලෙන් ඔහුව ඉවත් කරනු ලැබුවේ .

ප්‍ර ඒ කියන්නේ මේ සහරාන් ශිෂ්‍යයෙක් කාලයෙත් වහාබි මතවාදයෙන්ද ඉදලා තියෙන්නේ ?

උ ඔව් ඔහු අධ්‍යාපනය ලබන කාලයේදිත් ඔහු මේ වහාබිසම් මතය පිළිගෙන තිබෙනවා . කුරුණෑගල ඉබුණු මස්ජුඩ් පාසැලේ ඔහු වහාබිසම් ගැන තමයි ඉගෙන ගෙන තියෙන්නේ .

ප්‍ර දැන් මේ සහරාන්ව කුරුණෑගල ඉබුණු මස්ජුඩ් කියන අරාබි විද්‍යාලයට මාරු කරන්නේ කවුරු විසින්ද ?

උ නව්ෆර් මවුලවි යනුවෙන් හඳුන්වනු ලබන ඔහුගේ හිතවෙතක් මිත්රයෙක්.

ප්‍ර නව්ෆර් මවුලවි කියන්නේ කව්ද ඔබ හම්බ වෙලා තියනවාද ?

උ සාමාන්‍යයෙන් මම ඔහු අඳුරනවා .

ප්‍ර කොයි පළාතේ පුද්ගලයෙක්ද ?

උ ඔහු කාන්ත්කුඩියේම කෙනෙක්.

ප්‍ර මේ නව්ෆර් මවුලවි කියන පුද්ගලයා කොහේද ඉන්නේ දැන් මේ වෙනකොට?

උ අත් අඩංගුවට ගෙන ඉන්නවා කියලා මම මේ ප්‍රවෘත්ති වලින් දැන ගත්තා.

ප්‍ර නව්ෆර් මවුලවි කියන තැනැත්තා යම්කිසි රැකියාවක් කලාද කාතන්කුඩි ප්‍රදේශයේ ඔබ දන්නවාද දන්නේ නැත්නම් දන්නේ නැහැ කියන්න ?

උ මම දන්නේ නැහැ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර නව්ෆර් මවුලවි කියන පුද්ගලයා සහරාන්ට යම්කිසි ඥාති කමක් දක්වනවාද නැත්නම් කොහොමදමේ නව්ෆර් මවුලවි සහරාන් සමග හිතවත් වුනේ ?

උ ඔවුන් ඥාතිවරුන් නෙමෙයි නමුත් ඔවුන් දෙදෙනාම අධ්‍යාපනය ලැබුවේ කාත්තන්කුඩි ප්‍රදේශයේ පිහිටි ජාමේතුල් පලා අරාබි විද්‍යාලය .

ප්‍ර ඒ කියන්නේ නව්ෆර් මවුලවි සහ සහරාන් සම වයස් පුද්ගලයන් ද නැත්නම් නව්ෆර් මවුලවි සහරාන්ට වැඩිය වැඩිමහල් වයස්ගත පුද්ගලයන්ද ?

උ නව්ෆර් මවුලවි ටිකක් වැඩිමහල්.

ප්‍ර වැඩිමහල් පුද්ගලයෙක්

ප්‍ර සහරාන් කුරුණෑගල ඉබ්නු මස්ජුල් පාසැලෙන් සම්පූර්ණම අධ්‍යාපනය ලබලා මවුලවි කෙනෙක් විදියට පත් වෙනවාද ?

උ ඔව්.

ප්‍ර එසේ ඔහු මවුලවි වරයෙක් විදියට පත් වුනායින් පස්සේ නැවත ඔහු කාතන්කුඩි ප්‍රදේශයට පැමිණෙනවාද ?

උ ඔව්.

ප්‍ර කාතන්කුඩි ප්‍රදේශයට ආවාට පස්සේ කාතන්කුඩි ප්‍රදේශයට එන්නේ කොයි වකවානුවේද?

උ 2007 දි හෝ 2008 දි ඔහු නැවත කාතන්කුඩියට පැමිණෙනවා.

ප්‍ර 2005 වගේ ආසන්න වශයෙන් 2005 වගේ කියලා පිලිගන්න පුළුවන්ද?

උ නැත එසේ පැමිණීමට නොහැකිය. ඔහු 2005 දක්වා කුරුණෑගලදි අධ්‍යාපනය ලැබුවේ ඉන්පස්සේ ඔහු 2007 දි හෝ 2008 දි තමයි කාතන්කුඩියට පැමිනෙන්න ඇති යැයි මම හිතනවා.

****

<u>ගරු විනිසුරු අදිකාරි මහත්මිය</u>

ප්‍ර දැන් මෙම කොමිසමට ඉදිරිපත් වෙච්ච කරුණු අනුව මවුලවි වරයෙක් වීම සඳහා ඔය අරාබි පාසැලක වසර 07ක් ඉගෙන ගන්න ඕනේ කියලා තමයි වාර්තාවුනේ දැන් මේ සහරාන් කියන පුද්ගලයා කුරුණෑගල ප්‍රදේශයේ අරාබි පාසැලේ අවුරුදු කියක් ඉගෙන ගෙනද ආපහු කාත්තන්කුඩියට ආවේ ?

උ ඔහු කාත්තන්කුඩියේදි 2001 සිට 2005 දක්වා මවුලවි අධ්‍යාපනය ලබමින් සිටියා පසුව කුරුණෑගලට 2005 දි ගොස් 2007 දි හෝ 2008 දි ඔහු නැවත මවුලවි වරයෙක් වශයෙන් කාත්තන්කුඩියට පැමිණියා.

ප්‍ර සහරාන් මවුලවි වරයෙක් වශයෙන් අධ්‍යාපනය ලබලා කාත්තන්කුඩියට පැමිණීමෙන් පසුව ඔහු කුමක්ද සිද්ධ කලේ ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ ඉස්ලාමික් සෙන්ටර් නමින් හඳුන්වනු ලබන වාහාබිසම් වාදය උගන්වනු ලබන ආයතනයක එකතු වී කටයුතු කලා .

ප්‍ර මේ ඉස්ලාමික් සෙන්ටර් කියන එක කවුරු විසින් පිහිටුවනු ලබන ආයතනයක්ද ?

උ දොස්තර යූ. එල්. එම් අස්රොෆ් යන අය විසින් ආරම්භ කරලා තියනවා .

ප්‍ර ඔහු විසින් කොයි කාලේ විතර පිහිටපු ආයතනයක්ද ?

උ 2003 වර්ෂයේදි ආරම්භ කරන ලද ආයතනයක්.

ප්‍ර දැන් මේ ඉස්ලාමික් සෙන්ටර් කියන ආයතනයේ සහරාන් සම්බන්ධ වෙලා ඔහු කුමක්ද කරේ ?

උ වහාබිසම් අන්තවාදය පිළිබඳව ප්‍රචාරය කටයුතු වල නිරත වුනා.

ප්‍ර ප්‍රසිද්ධ වේදිකාවල දේශණ පැවැත්තුවාද නැත්නම් පල්ලි වල දේශණ පවත්වමින් ඒ අකාරයෙන්ද ප්‍රචාරණය කලේ ?

උ පල්ලි වල තමයි ඔහු ප්‍රචාරණ කටයුතු වල යෙදුනේ.

ප්‍ර ඒ කියන්නේ ඉස්ලාමික් සෙන්ටර් කියන ආයතනයට අනුබද්ධ පල්ලි වල ද මේ ප්‍රචාරණ කටයුතු සිද්ධ කලේ ?

උ ඔව්.

ප්‍ර දැන් ඔහු මේ ඉස්ලාමික් සෙන්ටර් වලට අනුබද්ධ පල්ලිවල දිගටම හිටියාද නැත්නම් ඔහු එයින් යම් වකවානුවක ඉවත් වුනාද ?

උ ටික කාලයකට පසු එයින් ඉවත් වුනා.

ප්‍ර කොයි කාලෙට පස්සේද ඉවත් වුනේ ?

උ 2008 මුල් භාගයේදි පමණ ඔහු එම සංවිධානයෙන් ඉවත් වුනා .

ප්‍ර ඔහු එම සංවිධානයෙන් ඉවත් වෙලා මොකක්ද කලේ ?

උ ඔහු දාරුල් අදර් අද්දාවියා යන වහාබ්වාදයේ ආයතනයක් සංවිධානයක් ස්ථාපිත කලා.

ප්‍ර ඒ සංවිධානය ආරම්භ කලේ සහරාන් විසින්ද නැත්නම් එය කවුරු හරි විසින් ආරම්භ කරපු සංවිධානයකට සහරාන් සම්බන්ධ වුනාද ?

උ මොහු සහමොහුගේ මිත්‍රවරුන් එකතුවී තමයි මෙම සංවිධානය ආරම්භ කලේ

ප්‍ර කවිද මොහුගේ මිත්‍රයෝ ?

උ ඔහුගේ මිත්‍රවරුන් දැනටත් වර්තමානයේ දාරුල් අදර් අද්දාවියා යන සංවිධානය පවත්වමින් සිටිනවා.

ප්‍ර කවිද ඒ මිත්‍රවරුන් ගේ නම් කිපයක් කියන්න ?

උ අස්වර් මවුලවි, යන අය දැනට එහි ප්‍රචාරකකරු වශයෙන් කටයුතු කරනවා .

ප්‍ර දැන් මේ දාරුල් අදර් අදාවියා යන සංවිධානය මගින් පල්ලි පිහිටවීමක් සිද්ධ කලා ද ?

උ ඒක පල්ලියක් ඒ අයවරුන්ට තියෙනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර ඔබගේ දැනුම පරිදි සහරාන් මවුලවී තමන්ගේ දේශණ පටන් ගත් මුල් වකවානුවෙන් **2008** වකවානුවේ විතර ඔහු ඒ කාලයේ ඉදන්ම මේ ඉස්මත් කැලෑට එකක් ගැන සහ ජිහාඩ් වල තියෙන අවශ්‍යතාවය ගැන දේශණ පැවැත්තුවාද ?

උ මුල් කාලයේදි ඔහු එසේ කලේ නැත.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක්ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර කවද්ද ඒක පටන් ගත්තේ ?

උ **2016** දි තමයි ඔහු පටන් ගත්තේ.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනිතිඥ චතුරංග බංඩාර මහතා.</u>

ප්‍ර මේ දාරුල් අදර් ආද්දාවියා කියන සංවිධානය යටතේ තියන පල්ලිය තාමත් එම ප්‍රදේශයේ ක්‍රියාත්මක වෙනවා නේද ?

උ ඔව්.

ප්‍ර සහරාන් මෙම දාරුල් අදර් අද්දාවියා පල්ලියේ යම්කිසි හේතුවක් නිසා ඉවත් වෙනවාද ?

උ ඔව්.

ප්‍ර ඇයි මොකක්ද ඒ හේතුව ?

උ ඔවුන් අතර ප්‍රශ්ණයක් ඇතිවුනා යැයි මා දැන ගත්තා.

ප්‍ර ඒ අනුව සහරාන් විතරද ඉවත් වෙන්නේ ?

උ සහරාන් සමග තවත් කිහිප දෙනෙක් එයින් ඉවත් වෙන්න ඇති නමුත් ඔවුන්ගේ නම් මම දන්නේ නැහැ . ඉන්පසුව ඔවුන් ජාතික තව්හිද් ජමාද් කියන සංවිධානය එන් ටි. ජේ කියන සංවිධානය ආරම්භ කලා.

ප්‍ර ඊට ප්‍රථම සහරාන් යම්කිසි විදේශගතවීමක් සිද්ධ වෙනවාද සහරාන් ගේ ?

උ **2009** දි ඔහු ජපානයට ගිය බව මම දැන ගත්තා.

ප්‍ර කොයි කාලෙද ලංකාවට ආවේ ?

උ මාස කිපයක් එහි නැවති සිට ඔහු නැවත පැමිණියා .

ප්‍ර ඔහු ජපානයට යන්න යම්කිසි හේතුවක් ඔබට හොයා ගන්න පුළුවන් වුනාද ?

උ මා දන්නේ නැහැ

ප්‍ර ඔහු ජපානයේ ඉදන් ඇවිල්ලා කොයි කාලේ විතරද මේ ඔබ කලින් සදහන් කරපු නැෂනල් තව්හිද් ජමාත් කියන සංවිධානය පිහිටුවා ගන්නේ ?

උ **2011** දි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර නැෂනල් තව්හිද් ජමාද් සංවිධානය කව්ද මුලින්ම පිහිටුවන්නේ සහරාන්ද නැත්නම් තවත් යාළුවෝ කිපයක් එකතු වෙලා පිහිටුවා ගන්නා වූ සංවිධානයක්ද ?

උ ඔහුගේ මිතුරන් සමග එක්ව තමයි මෙය පිහිටුවා ගත්තේ.

ප්‍ර කවුද මේ නැෂනල් තව්හිද් ජමාත් සංවිධානයේ සහරාන් සමග ආරම්භක සාමාජිකයෝ ?

උ ඔහුගේ සහෝදරයෙක් වන ෂෙයිනි නැමැත්තා , තව්හික් යන අය , ෆයිරුස් යන තැනැත්තා , ෆෙරනාස් යන අය යන අයවළුන් සමග තවත් කිප දෙනෙක් එකතු ව මෙම සංවිධානය පිහිටුවා ගත්තා.

ප්‍ර දැන් මෙම සංවිධානය පිහිටුවීමට යම්කිසි දේශපාලනික සංවිධානයක් හෝ දේශපාලනඥයෙක් උදව් කලාද මේ සහරාන් නැමැත්තාට?

උ ඒ ගැන මම දන්නේ නැහැ

ප්‍ර නැෂනල් තව්හිද් ජමාත් සංවිධානයේ ආරම්භක නායකයා කව්ද ?

උ සහරාන් තමයි ඒකේ නායකයා වශයෙන් කටයුතු කලේ.

ප්‍ර මේ එම්. ටී. ජේ සංවිධානයට අදාලව කාත්තන්කුඩි ප්‍රදේශයේ පල්ලි තිබුනාද ?

උ එක් පල්ලියක් තිබුනා.

ප්‍ර පල්ලිය කොහේද තිබුනේ ?

උ කාත්තන්කුඩියේ තිබුනා.

ප්‍ර ඔබට ඒ පල්ලිය තිබෙන තැන නිවැරදි ලිපිනය කියන්න පුළුවන්ද මේ කොමිෂන් සභාවට ?

උ අංක **296,** නවකාත්තන්කුඩිය , **03** යන ලිපිනයේ පිහිටා තිබෙනවා.

ප්‍ර දැන් ඔබ සදහන් කරලා තියනවා ඔබමේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ වැඩ කරන්නේ කියලා ?

උ ඔව්.

ප්‍ර සාමාන්‍යයෙන් මෙවැනි සංවිධානයක් පිහිටුවලා පල්ලියක් ආරම්භ කරනකොට මේ ප්‍රාදේශිය ලේකම්කාර්යාලයේ හෝ රෙජිස්ටර් වීමක් නැත්නම් ලියා පදිංචි වීමක් සිද්ධ කරන්න ඕනේද ?

උ මෙම පල්ලිය පිහිටා තිබෙන්නේ මම වැඩ කරන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ සීමාවේ නොවේ . නමුත් පල්ලියක් ආරම්භ කිරීමට එසේ ලියා පදිංචි කල යුතු යැයි මා දන්නේ නැත. ඒක අවශ්‍යතාවයක් තිබෙන බව මා දන්නේ නැහැ.

ප්‍ර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නැති වුනත් ලංකාවේ මුස්ලිම් කටයුතු දෙපාර්තමේන්තුවේ වත් යම්කිසි පල්ලියක් හෝ මෙවැනි සංවිධානයක් ආරම්භ කරන කොට ලියා පදිංචිවීමක් සිද්ධ කරන්න ඕනේද ?

උ මුස්ලිම් සංස්කෘතික අමාත්‍යාංශය යටතේ පල්ලිවල් ලියා පදිංචි කිරීමට අවශ්‍ය විධි විධාන තිබෙනවා. නමුත් සියළුම පල්ලි එසේ ලියා පදිංචි වී නොමැති බව තමයි මා කියන්නේ .

FAIR COMMENT BY JEZEEM

ප්‍ර ඒ කියන්නේ නිත්‍යානුකූලව ලියා පදිංචි කිරීමේ අවශ්‍යතාවයක් තිබුනත් ප්‍රායෝගිකව පුද්ගලයින් ලියා පදිංචි වීමකින් තොරව පල්ලිය ආරම්භ කරනවා කිව්වොත් නිවැරදිද ?

උ ඔව්.

ප්‍ර මේ නැෂනල් තව්හිද් ජමාත් කියන පල්ලිය එසේ ලංකාවේ පිලිගත් පල්ලියක් පිලිගත් සංවිධානයක් විදියට ලියා පදිංචි වෙලා තියනවාද ?

උ පල්ලියක් වශයෙන් ලියා පදිංචි කර නැත සමාජ සේවා ආයතනයක් වශයෙන් ලියා පදිංචිවි ඇත.

ප්‍ර කොයි කාලෙද සමාජ සේවා ආයතනයක් විදියට ලියා පදිංචි වුනේ ?

උ 2015 වර්ෂයේදි.

ප්‍ර දැන් සහිලාන් මහත්මයා මෙම සහරාන් යන පුද්ගලයා මවුලවි කෙනෙක් විදියට වහාබි මතවාදය සමග දේශණ පවත්වමින් සාම්ප්‍රදායික මුස්ලිම් සුෆි ජනතාව විවේචනය කරමින් ඔබලාට අභියෝගයක් වෙන්න පටන් ගත්තේ කොයි කාලේ ඉදලාද ?

උ 2013 වර්ෂයේදි ඔහු ආරම්භ කලේ.

ප්‍ර 2013 වර්ෂයේ මොන වගේ තර්ජනයක්ද ඔබලාට සහරාන් ගෙන් ඇතිවුනේ ඔබලාට පැහැදිලි කරන්න පුළුවන්ද මේ ගරු කොමිෂන් සභාවට ?

උ කාතන්කුඩි වල සිටින සුෆි මුස්ලිම් වරුන් ගේ වන්දනා ක්‍රමයන්ව විවේචනය කරමින් ඔහු ඊට විරුද්ධව ප්‍රචාරක කටයුතු වල නියැලුනා . කන්තුරේ එනම් දන්සැලවලදි ලබා දෙන ආහාරය අනුබව නොකලයුතු යැයි ඔහු ප්‍රචාරය කලා.

ප්‍ර ඔහු මේ ප්‍රචාරය කිරීමට වාචික දේශනාද යොදා ගත්තේ නැත්නම් යම්කිසි සගරාත් ඔහු පබ්ලිෂ් කලාද ඒ කියන්නේ ?

උ ඔහු වාචිකවත් ඒක ප්‍රචාරය කලා. තව්හික් යන නමින් මාසික සගරාවෙනුත් මේ පිළිබඳව විවේචනයක් කරන්න පටන් ගත්තා.

ප්‍ර තව්හිද් කියන සගරාව කාගේ සගරාවක්ද?

උ ජාතික තව්හිද් ජමාත් කියන සහරාන් ගේ සංවිධානය මගින් තමයි එය ප්‍රකාශ කරන්න පටන් ගත්තේ .

ප්‍ර කොයි කාලෙද මේ තව්හිද් සගරාව ආරම්භ වෙන්නේ ?

උ 2013 දි පමණ.

ප්‍ර ඔබ මෙම කොමිෂන් සභාවේ විමර්ෂණ ඒකකයට ප්‍රකාශයක් ලබා දෙමින් මේ තව්හිද් සගරාවේ යම් යම් කොටස් අපේ විමර්ෂණ ඒකකයට ලබා දුන්නා කිව්වොත් නිවැරදිද ?

උ ඔව්.

ස්වාමිනි සාක්ෂිකරුට යම්කිසි ලේඛණයක් පෙන්වීමට අවසර පතමි.

ප්‍ර මේ ලේඛණය කුමක්ද මහත්මයා ?

FAIR COMMENT BY JEZEEM

උ කලින් ආණ්ඩුකාර වරයා වශයෙන් කටයුතු කල අලෙවි මවුලානා යන පුද්ගලයෙකු සම්බන්ධව තව්හිද් සගරාවේ විවේචනය කරමින් එල කරන ලද ලිපියක්.

ප මෙය ඔබ විසින් කොමිෂන් සභා විමර්ෂණ ඒකකයට ලබා දුන් ලිපියක් කිව්වොත් නිවැරදිද ?

උ ඔව්.

ප මෙම තව්හිද් සගරාවේ එලවූ ලිපිය කවද්ද එලවෙලා තියෙන්නේ ?

උ 2013 මාර්තු මාසේ ප්‍රකාශණයක්.

ඒ අනුව ස්වාමිනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද 2013 මාර්තු මස තව්හිද් සගරාවෙන් උපුටා ගන්නා ලද මෙම මවුලානා කොහේද යන්නේ යන මාතෘකාව යටතේ ඇති එම සගරාවේ 24.25.26 යන පිටු ඇතුලත් ලිපිය C 669 ලෙස ලකුණු කිරීමට ගෞරවෙන් අවසර පතනවා මේ මවුලානා කොහේද යන්නේ කියන ලිපියෙන් මොකක්ද මේ තව්හිද් ජමාද් සංවිධානය තමන්ගේ පාඨකයින්ට කියන්න උත්සාහ කරලා තියෙන්නේ සරලව?

උ නැගෙනහිර පළාතේ ආයුධ සන්නද්ධ කන්ඩායමක් තිබෙන බව අලෙවි මවුලානා සඳහන් කර තිබෙනවා . එම සංවිධානය සුෆි මුස්ලිම් වරුන්ව බිය ගන්වනවා යනුවෙන් ඔහු සඳහන් කර තිබෙනවා . ඔහු විසින් ප්‍රකාශ කරන ලද දේ එම ප්‍රකාශ කරන එකට විරුද්ධව විවේචන ඉදිරිපත් කරමින් තමයි මෙම ලිපිය ඔහු එල කර ඇත්තේ.

ප දැන් අලෙවි මවුලානා විසින් කරපු යම්කිසි සංවාදයක් හෝ යම්කිසි ස්ටේට්මන්ට් එකක් ප්‍රකාශයක් විවේචනය කරමින් ලියපු තව්හිද් සගරාවේ ලියපු ලිපියක් කිව්වොත් මේක නිවැරදිද ?

උ හරි

ප ඊට පාදක වූ අලෙවි මවුලානා මහත්මයා කරපු ප්‍රකාශය දැක්වෙන ලිපියකුත් ඔබ මේ කොමිසම් සභාවට ඉදිරිපත් කලානේ ?

උ ඔව්.

ප ඔබට එය නැවත දැක්කොත් අදුනාගන්න පුළුවන්ද ?

සාක්ෂිකරුට ලේඛණයක් පෙන්වා සිටිනවා මෙම ලේඛණය ඔබට කුමක් හැටියටද හඳුනාගන්න පුළුවන්?

උ ශ්‍රී ලංකා බ්‍රිෆ් යන පුවත්පතේ ආම්ස් ගෘප් යන ශිර්ෂය යටතේ එලවූ ලිපියක්

ප ඔබට ඒ අනුව මේ ලේඛණය අලෙවි මවුලානා ගේ ප්‍රකාශ ය අඩංගු ලේඛණය විදියට හඳුනා ගන්න පුළුවන්ද ?

උ හරි

ස්වාමිනි ඒ අනුව සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලදුව 2011/12/21 දින ශ්‍රී ලංකා බ්‍රිෆ් නැමති වෙබ් අඩවියෙන් එල කරනලද එස්. අයි. එස් ඇලටඩ් ඔන්

FAIR COMMENT BY JEZEEM

ආම් ගෘප් ඇන්ඩ් ඊස්ට් යන මාතෘකාව යටතේ එල කර ඇති අන්තර්ජාල ලිපිය සි **C. 670** වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.

ස්වාමිනි ඒත් සමගම **C.669** ලේඛණය සම්පූර්ණයෙන්ම දමිළ භාෂාවෙන් ඇති ලේඛණයක් එම ලේඛණය සිංහලයට පරිවර්තනය කලා කොමිෂන් සභාවේ භාෂා පරිවර්තක කන්දසාමි මහත්මයා එම පරිවර්තනය කරන ලද එම **C 669** පරිවර්තනය දැක්වෙන ලේඛණය සි. **669** ඒ වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.

සාක්ෂිකරුට C **670** පෙන්වා සිටිනවා ස්වාමිනි.

ප්‍ර C **670** ලේඛණයේ මවුලානා මහත්මයා විසින් කියපු ප්‍රකාශය ඇතුලේ දැක්වෙනවා ඒය කොමිෂන් සභාවට කියවන්න පුළුවන්ද ? (කියවයි)
එය අලෙවි මවුලානා විසින් මෙම වෙබ් අඩවියට කරපු ප්‍රකාශය කිව්වොත් හරිද ?

උ ඔව්.

ප්‍ර ඊට අමතරව මෙම ලේකණයේම දැක්වෙනවා මෙම Ceylon to Day පුවත්පතෙත් මෙම ප්‍රකාශයම වාර්තා වී තිබෙන බවට?

උ ඔව්.

ප්‍ර එම ලේඛණයේ තවත් වාක්‍යයක් සාක්ෂිකරුට පෙන්වා සිටිනවා ?
දැන් මේ ලිපිය එල වෙන කොට දිනය කවද්ද ?

උ **2011/12/21** වෙනිදා .

ප්‍ර දැන් මෙය විවේචනය කරමින්මේ අලෙවි මවුලානා ගේ ප්‍රකාශය විවේචනය කරමින් තව්හිද් සගරාවේ සහරාන් ඇතුළු පිරිස C **669** ලේඛණයේ මොකක්ද කියලා තියෙන්නේ ?

උ නැගෙනහිර පළාතේ එවැනි ආයුධ සන්නද්ධ කණ්ඩායමක් ක්‍රියාත්මක වන්නේ නැහැ මවුලානා එසේ කිම වැරදියි . එසේ ආයුධ සන්නද්ධ කණ්ඩායමක් හිටියානම් රජයේ බුද්ධි අංශය විසින් ඔවුන්ව අත් අඩංගුවට ගෙන යන්නට හැකියාවක් තිබුනා .අලෙවි මවුලානා යන අය සුෆි මුස්ලිම් කෙනෙක් . ඔහු අනෙකුත් ආගම් සමග සහජීවනයෙන් කටයුතු කරනවා ඒ බවට සදහන් කරමින් එල කර ඉන් අනතුරුව මහත්මවා සහරාන් සුෆි දර්ශණය අදහන ප්‍රධාන මවුලවි වරුන් ඉලක්ක කරලා අපහාස කරන්නට පටන් ගත්තේ කොයි වකවානුවේද ?

ප්‍ර තිබුනා.

උ **2013/ 2014/ 2015** යන වර්ෂවලදි එක දිගට සුෆි මුස්ලිම් අවමන් කිරිමෙන් විවේචනය කරමින් විවේචනය කරන්න පටන් ගත්තා.

ප්‍ර මොන වගේ ඒවා කියලාද සුෆි මුස්ලිම් වරුන් විවේචනය කරන්න පටන් ගත්තේ ?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

උ සුෆි මුස්ලිම්වරු වනාහි ඉස්ලාම් ධර්මය අතහැර ගිය අයවලුන්ය යනුවෙන් ඔහු අවමානය කලා. සුෆි මුස්ලිම් වරුන්ගේ දානය එනම් කන්තුරිය කෑමඌරු මස් කෑම වැනි යැයි ඔවුන් ප්‍රකාශ කරන්නට පටන් ගත්තා.

ප්‍ර එතකොට මේ සුෆි මුස්ලිම් වරුන් දෙන දානය කියන්නේ මොකක්ද මේ කවදා දෙන දානයක්ද ?

උ සුෆි මුස්ලිම්වරුන්ගේ ප්‍රභූ වරුන් මියගිය දිනය සමරමින් ඔවුන් ගේ මතයන් ප්‍රකාශ කරමින් ඔවුන්ට මා යාඥා වන්දනා මාන කිරීමෙන් ආහාර පිස දුප්පත් ජනතාවට බෙදා දීම කන්තුරි වශයෙන් හදුන්වනු ලබනවා .

ප්‍ර දැන් මේ කන්තුරි වශයෙන් හදුන්වනු ලබන දානය අනුභවකිරීම ඌරු මස් කෑමකට සමානයි කියලා කවිද අපහාස කරන්න කිව්ව එක මුලින්ම ?

උ සහරාන් එසේ කියාසිටියා.

ප්‍ර ඔහු වාචිකව කිමට අමතරව යම්කිසි සගරා මගිනුත් ඔය සම්බන්ධයෙන් වැඩිදුරටත් විස්තර කරමින් සිටියාද ?

උ තව්හිද් යන ඔහුගේ සගරාවදි ඒ පිළිබඳව ඔහු ප්‍රකාශයක් නිකුත් කර සිටියා එල කර තිබුනා .

ප්‍ර ඒ ප්‍රකාශය එල කරපු ඒ සුෆි පල්ලි වල දෙන දානය වැලදීම ඌරු මස් කැමකට සමානයි කියලා කරන ප්‍රකාශය කරපු තව්හිද් සගරාව ඔබ මේ කොමිෂන් සභාවේ විමර්ෂණ ඒකකයට ලබා දුන්නා කිව්වොත් නිවැරදිද?

උ ඔව්.

ප්‍ර ඔබට එය නැවත දැක්කොත් අදුනාගන්න පුළුවන්ද ?

උ ස්වාමිනි සාක්ෂිකරුට ලේඛණයක් පෙන්වා සිටිනවා මේ ලේඛණය කුමක්ද?

උ තව්හිද් යන මාසික සගරාව මෙය 2013 පෙබරවාරි මාසයේ නිකුත් කරන ලද ප්‍ර කාශයට පත් කරන ලද එකක්

ඒ අනුව ස්වාමිනි සාක්ෂිකරු විසින් හදුනා ගන්නා ලද තව්හිද් එකම දෙවියන් එකම දේව ප්‍රතිපත්ති මාසික සගරාව 2013 පෙබරවාරි කතෘ එම්. සි. එම්. සහරාන් සහ කන්තුරි ආහාරය හරාම් ද යන මාතෘකාව යටතේ ඇති තව්හිද් සගරාවේ පිටු අංක 32.33 යන පිටුවල ඇතුලත් පිටුවල ඇතුලත් ලිපිය C. 671 ලෙසත් එහි කන්දසාමි මහතා විසින් කරපු සිංහල පරිවර්තනය C. 671 A වශයෙනුත් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා .

දැන් මෙසේ සහරාන් මවුලවිගේ තව්හිද් ජමාත් සංවිධානය සහ ඔහුගේ තව්හිද් සගරාව මගිනුත් සුෆි සාම්ප්‍රදායික ජනතාවට දිගින් දිගටම ප්‍රහාර එල්ල කරමින් ඉන්නකොට ඔබලා මේ සම්බන්ධයෙන් යම්කිසි

FAIR COMMENT BY JEZEEM

නීතිය බලාත්මක කිරීමේ ආයතනයකට පොලිසියකට හෝ යුද මේ සම්බන්ධයෙන් ඔබ පැමිණිලි කලාද ?

උ ඔව්.

ප්‍ර කොයි කාලේ විතරද ඔබලා පැමිණිලි කලේ ?

උ පලමුව 2013 සිට 2014 දක්වා වූ කාල පරිච්ඡේදයේදිත් පසුව 2015 සිට 2017 අපි අවස්ථා කිපයකදිත් අපි ඔවුන්ට විරුද්ධව පැමිණිලි කර තිබෙනවා.

ප්‍ර ඔබ 2013 ඉදලා 2014 ඉදලා ඔවුන්ට විරුද්ධව කරපු පැමිණිලි වල ලදු පත් සහ පැමිණිලි වල අංක දැක්වෙන ලේඛණයක් කොමිෂන් සභාවේ විමර්ෂණ ඒකකයට ලබා දුන්නාද ?

උ ඔව්.

ප්‍ර ඔබට එම ලේඛණය නැවත දැක්කොත් හඳුනාගැනීමේ හැකියාවක් තිබෙනවාද ?

උ ඔව්.

ප්‍ර සාක්ෂිකරුට ලේඛණයක් පෙන්වා සිටිනවා ස්වාමිනි මෙම ලේඛණය පරික්ෂා කරලා බලන්න සාක්ෂිකරු මෙම ලේඛණය ඔබට හඳුනාගන්න පුළුවන්ද ? හඳුනා ගන්න පුළුවන් නම් කුමක් වශයෙන්ද හඳුනාගන්නේ ?

මෙතැන් පටන් සාක්ෂි ගැනිම ල/ ලේ වන්දිමා.

President Secretariat's Copy

FAIR COMMENT BY JEZEEM

වේලාව:ප.ව.3.00
පෙර සටහන්:ල/ලේ යමුනා දසනායක මහත්මිය.
මෙතැන් සිට:ල/ලේ චන්දිමා දිල්හානි.

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>

ප්‍ර: මේ ලේඛණය ඔබට හඳුනා ගන්න පුළුවන්ද? හඳුනා ගන්න පුළුවන් නම් කුමක් වශයෙන්ද ඔබ හඳුනා ගන්නේ?

පි: අප විසින් පොලීසියට කරන ලද පැමිණිල්ලට ඔවුන් විසින් ලබා දුන් ලදු පත (ඉංග්‍රීසියෙන් කියයි)Acknowledgement of complaint කියලා

ප්‍ර: ලදු පත් පැමිණිලි 11 ක් ලදු පත් තියෙනවා කිව්වොත් හරිද?

පි; ලැයිස්තු 9 ක් තිබෙනවා නමුත් පැමිණිලි 11ක් ගැන සඳහන් වෙනවා.

ස්වාමිනි ඒ අනුව සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද පැමිණිලි 2013 සිට 2015 දක්වා ඔහු කරන ලද පැමිණිලිවල සාරංශය දැක්වෙන ලේඛණය C 672 ලෙස ලකුණු කරනවා.

C 672 සාක්ෂිකරුට පෙන්වා සිටිනවා.

ප්‍ර: මහත්මයා මේ අනුව 2013 පැමිණිල්ල කරලා තියෙන්නේ කවද්ද?

පි; 2013 පෙබරවාරි මාසයේ 26 වෙනිදා.

ප්‍ර: ඉන් අනතුරුව ඉතුරු පැමිණි 10 ම කරලා තියෙන්නේ 2014 වර්ෂයේදී කිව්වොත් නිවැරදීද?

පි: හරි.

ප්‍ර; මේ පැමිණිලි සියල්ලම ඔබ දැන් මේ ලේඛණයක් ඉදිරිපත් කරමින් සඳහන් කරපු පැමිණිලි සියල්ලම සම්බන්ධ වෙන්නේ යම් අපහාසයක් සම්බන්ධයෙන්ද?

පි සූෆී මුස්ලිම්වරුන්ගේ වන්දනා මාන ක්‍රමයන් පිළිබඳව අවමන් කරමින් සිදු කිරීම සම්බන්ධයෙන් කරන ලද පැමිණිලි

ප්‍ර: ඒ පැමිණිලි වලින් ලදු පත් කිහිපයක් මේ කොමිෂන් සභාවට ලබා දුන්නා කිව්වොත් නිවැරදීද?

පි: ඔව්.

Presented by Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ස්වාමිනි ඒ අනුව සාක්ෂිකරු විසින් කොමිෂන් සභාවට ලබා දුන් පැමිණිලි ලදු පත් 09 ක් දැක්වෙන ලේඛණය C 672 A වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර අයැද සිටිනවා.පිටු නමයකින් යුත් ලේඛණය ස්වාමිනි

ප්‍ර: දැන් මේ දිගින් දිගටම මේ ඔබලාගේ සූෆි දර්ශනයට සිදුවන අපහාසයන් අවමන් ගැන පැමිණිලි කරාට මේ සම්බන්ධයෙන් යම් කිසි ආකාරයට නීතිය ක්‍රියාත්මක වීමක් සිද්ධ වුනාද?

පි: 2014 දී අප විසින් කරන ලද පැමිණිල්ල හේතුකොට ගෙන නීති කටයුත්තක් ආරම්භ කරන්න යෙදුනා.

ප්‍ර: ඒ නීති කටයුත්තට කුමක්ද සිදුවුනේ?

පි; ඒ සම්බන්ධයෙන් පවත්වනු ලබන නඩුව අතරමගදී නවත්වනු ලැබුවා.

ප්‍ර: ඇයි නවත්වලා දැම්මේ? ඔබ දන්නවාද නවත්වන්න හේතුව?

පි; සහරාන් අධිකරණයට ඉදිරිපත් වී ඔහු සම්බන්ධයෙන් වූ කරුණු දැක්වුවා කුමන හේතුවක් නිසා එම අධිකරණ කටයුතු නැවැත්තුවාද යන්න මම දන්නේ නෑ නමුත් සූෆි මුස්ලිම් වරුන්ගේ නායකයාගේ කටඋත්තරයක් ගත යුතුව තිබෙනවා යැයි පවසා තිබුණා.එම අවස්ථාවේදී එම නායකයා අසනීප වී කොළඹ ඇවිත් සිටියා. පොලිසිය ඔහුගේ කටඋත්තරය නැත්නම් ප්‍රකාශ ගැනීමට කොළඹට පැමිණියේ නැත.ඊට පස්සේ ඒ නඩුව අතර වාරයේදී නතර කරන්න යෙදුනා.ඉදිරි කටයුතු නතුර කරන්න යෙදුනා.

ප්‍ර; දැන් ඔබලා කිව්වානේ මේ පොලීසියට කරපු පැමිණිල්ලකට අදාලව යම්කිසි නඩු කටයුත්තක් ඉදිරියට ගියා කියලා එහි නඩු අංකය ඔබට කියන්න පුළුවන්? කුමන අධිකරණයද? එහි නඩු අංකය කුමක්ද?

පි; මඩකලපු මහේස්ත්‍රාත් අධිකරණයේ ,B897/14 යටතේ නඩුවක් පවරන්න යෙදුනා.

ප්‍ර: දැන් මේ නඩුව පවරලා මේ නඩුව ඉදිරියට යන්නේ නැතිව නැවතුනේ කොයි වකවානුවේදීද කියලා ඔබට මතකද?

පි: 2017 දෙසැම්බර් මාසේදී මෙම නඩු කටයුතු අවසන් කරන්න යෙදුනා.

ප්‍ර; ඔබ ඉන් අනතුරුව මේ සම්බන්ධයෙන් නැගෙනහිර පළාත භාර ආඥාපති මහත්මයාට පැමිණිලි කිරීමට ඔබලාගේ සූෆි මුස්ලිම්වරු යොමු වුනාද?

පි: ඔව්.

ප්‍ර; කවුද හිටපු නැගෙනහිර ආඥාපති ඒ වෙනකොට?

පි: මේජර් ජෙනරාල් ලාල් පෙරේරා මහතා.

ප්‍ර: දැන් මේජර් ජෙනරාල් ලාල් පෙරේරා මහත්මයාට පැමිණිලි කිරීමෙන් පස්සේ හරි ඔබලාට යම් කිසි සාධාරණයක් ඉෂ්ඨ වුනාද?

පි: ලාල් පෙරේරා මහතා මොවුන් සහරාන් සහ ඇතුලු කණ්ඩයම කැඳවා මින් ඉදිරියට සූෆි මුස්ලිම්වරුන්ට විරුද්ධව අවමන් කිරීමේ කටයුතුවල යෙදෙන්න එපා කියලා අවවාද කර තිබුණා. නමුත් සහරාන් සූෆි

FAIR COMMENT BY JEZEEM

මුස්ලිම්වරුන්ට විරුද්ධව අවමන් කිරීමේ කටයුතු දිගටම පවත්වාගෙන ගියා.

ස්වාමිනි ප්‍රශ්න කිරීමේ වෙනත් අංශයකට යොමුවීමට ප්‍රථම **C 672 , C 672A** වශයෙන් ලකුණු කරන ලද ලේඛණවල කන්දසාමි මහතා විසින් සිදු කරන ලද සිංහල පරිවර්ථනය **C 672 A B** වශයෙන් ලකුණු කිරීමට අවසර ඉල්ලා සිටිනවා.

ප්‍ර: දැන් සහිලාන් මහත්මයා **2015** වසර විතර වෙනකොට මේ සහරාන් මවුලවිට කෙතරම් අනුගාමිකයින් පිරිසක් ගොඩනැගිලා තිබුණාද?

පි: දාහක් පමණ.

ප්‍ර: ඒ අනුව ඔහු යම් යම් ප්‍රාදේශිය දේශපාලනඥයින් සමඟ යම් යම් එකඟතාවයන් වලට පැමිණීමට ක්‍රියා කලාද ඒ වකවානුව වෙන කොට **2015** වෙදී?

පි; ඔව් දේශපාලන ගිවිසුම් ඇති කර ගත්තා.

ප්‍ර; කවුරුන් එක්කද ඇති කරගත්තේ කොයි වකවානුවේදීද?

පි; **2015** දී පාර්ලිමේන්තු මැතිවරණයට තරඟ කල දේශපාලනඥයින් සමඟ ඔහු ගිවිසුම් ඇති කර ගත්තා .

ප්‍ර; **2015** පාර්ලිමේන්තු මැතිවරණයනේ ඊට ප්‍රථම ජනාධිපතිවරණයේදී **2015** ජනවාරි **08** තිබ්බ ජනාධිපතිවරණයේදී සහරාන් මවුලවි තුමා සහයෝගය දුන්නේ මොන පක්ෂයට ද කියලා ඔබ දන්නවාද?

පි: අති ගරු ජනාතිධිපති මෛත්‍රිපාල සිරිසේන මහතා තරඟ කල ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට තමයි සහයෝගය දුන්නේ.

ප්‍ර: ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියලා ඔබ කිව්වානේ ඒ කියන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු ලේකම් වන මෛත්‍රිපාල සිරිසේන ජනාධිපතිතුමාද නැත්නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තවත් එක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පෙරටු කරගෙන පිහිටවූ සන්ධානයේ නායකයා වන මහින්ද රාජපක්ෂ මැතිතුමාට මොහු සහයෝගය දුන්නේ?

පි: මෛත්‍රිපාල සිරිසේන මහතාගෙන් යුත් ඒ කණ්ඩායමට තමයි ඔහු ආධාර කලේ.

ප්‍ර; **2015** වසරේ ජනාධිපතිවරණයට මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා ඉල්ලුවේ මොන පක්ෂයෙන්ද කියලා ඔබට මතකද? නැත්නම් ලකුණවත්?

පි; මට මතක නෑ නමුත් මෛත්‍රිපාල සිරිසේන මහත්මයා තරඟ කල පක්ෂයට සහයෝගය දුන් බව මට මතකයි.

ප්‍ර: දැන් **2015** මං මේ ජනාධිපතිවරණය ගැන අහන්නේ ජනාධිපතිවරනයේදී සහරාන් **Actively campaign** කරාද මෛත්‍රිපාල සිරිසේන මහතිමයාව ඒ කියන්නේ සක්‍රියව මේ දේශපාලඥයා වෙනුවෙන් ඡන්දය ඉල්ලමින් තැනින් තැනට ගියාද?

FAIR COMMENT BY JEZEEM

පි; ඔහු ස්ථීර වශයෙන් ප්‍රචාර කටයුතු වල යෙදුනේ නෑ. නමුත් සහරාන් සහ ඔහුගේ පිරිස මෛත්‍රිපාල සිරිසේන මහතාට සහාය දක්වමින් තමයි කටයුතු කලේ.

ප්‍ර: ඒ කියන්නේ කාත්තන්කුඩි ප්‍රදේශයේ මෛත්‍රිපාල සිරිසේන මහත්මයාගේ දේශපාලන රැස්වීම් තියෙන කොට සහරාන් ඒ දේශපලාන වේදිකාවලට නැගලා මෛත්‍රිපාල ජනාධිපති අපේක්ෂකයාට ඡන්දය ඉල්ලමින් එහෙම පැවැත්වුවාද?

පි; එසේ මා දැන ගත්තේ නෑ.

ප්‍ර; ඔබ දැකලා නෑ එහෙම?

පි; නෑ.

ප්‍ර: දැන් මම ඔබේ අවධානය යොමු කරන්නේ **2015** අගෝස්තු මස තිබ්බ මහමැතිවරණය නැත්නම් පාර්ලිමේන්තුව මැතිවරණය සම්බන්ධයෙන් ඒ පාර්ලිමේන්තු මැතිවරණයේදී සහරාන් කුමන දේශපාලඥයාටද සහයෝගය දැක්වුයේ?

පි; ඔහු ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසයටද සහයෝගය පලකරමින් සිටියා.මම සිතන පරිදි ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය.

ප්‍ර; ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසයටද නැත්නම් හිස්බුල්ලා මහතා නියෝජනය කරපු පක්ෂයටද සහයෝගය දැක් වූයේ? කල්පනා කරලා බලලා හිමිට කියන්නකෝ

පි; හිස්බුල්ලාගේ පක්ෂයට ඔහු සහයෝගය දැක්වූයේ නැත.

ප්‍ර; ඔහු අවසාන වශයෙන් සහයෝගය දැක්වුයේ ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසයට කියලා තමයි ඔබ කියන්නේ?

පි; ඔව්.

ප්‍ර; දැන් ඊට ප්‍රථම ඔහු හිස්බුල්ලා මහතා සමඟ යම් කිසි ගිවිසුමකට එළඹීමට කටයුතු කලාද?

පි; හිස්බුල්ලා මහතා සමඟ පමණක් නොව එම අවස්ථාවේ තරඟ කල අනෙකුත් අපේක්ෂකයින් සමඟ ද ඔහු ගිවිසුම ඇති කරගෙන තිබුණා.

ප්‍ර; හිස්බුල්ලා ආණ්ඩුකාරතුමාට අමතරව තව කවුද දේශපලානඥයෝ මොහු ඒ ගිවිසුම් ඇති කරගන්නට උත්සාහ කරපු?

පි; එම අවස්ථාවේ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය වෙනුවෙන්,එම්.එස්.සාෆිසාලි මහතා සමඟ ගිවිසුම් ඇති කරගත්තා,තවද ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය වෙනුවෙන් ශිබ්ලික් ෆාරුක් මහතා සමඟ ද ගිවිසුම් ඇති කර ගත්තා UPFA පක්ෂය වෙනුවෙන් හිස්බුල්ලා මහතා සමඟ ගිවිසුම් ඇති කරගත්තා.UNP පක්ෂය වෙනුවෙන් රූබී මහතා සමඟ ගිවිසුමක් ඇතිකරගත්තා,NFGG පක්ෂය වෙනුවෙන් අබ්දුල් රහුමාන් යන අය සමඟ ගිවිසුමක් අත්සන් කලා.

ප්‍ර: දැන් ඔබ කිව්වානේ සහරාන් ගිවිසුම් ඇති කරගත්තා කියලා සත්‍ය වශයෙන්ම ඔහු දෙපාර්ශවය ගෙනත්ලා හම්බවෙලා ගිවිසුම් අත්සන්

LEAK COMMENT BY JEZEEM

නැත්නම් සහරාන් විසින් තමාගේ ප්‍රතිපත්ති මලාව මේ දේශපලඥයින්ට ඉදිරිපත් කිරීමක් සිද්ධවුනේ?

පි; කොන්දේසිය අඩංගු ලේඛණය ඔවුන්ට ඉදිරිපත් කර ඔවුන් සමඟ ගිවිසුම් අත්සන් කරා.

ප්‍ර; බැනේ ඔබ ඒ අනුව සහරාන් සහ හිස්බුල්ලා මැතිතුමා අතර ඇති වූ යම් කිසි ගිවිසුමක පිටපතක් මේ ගරු කොමිෂන් සභාවේ විමර්ශනය අංශයට ලබා දීමක් සිදු කරාද?

පි; ඔව් එම ගිවිසුමේ සහරාන් විසින් ලබා දෙන කොන්දේසි අඩංගු ලේඛණය මා භාර දී තිබෙනවා.

ප්‍ර; ඔබට එය නැවත දැක්කොත් හඳුනා ගැනීමට පුළුවන්ද?

පි; ඔව්.

ස්වාමිනි සාක්ෂිකරුට ලේඛණයක් පෙන්වා සිටියි.

එය පිටු **10** කින් යුත් ලේඛණයකි.

එහි දාතමය වශයෙන් **2015.07.30** වෙනි දින සඳහන් වෙනවා.

ස්වාමිනි සාක්ෂිකරුට ලේඛණයක් පෙන්වා සිටියි.

ප්‍ර: මේ ලේඛණය පරීක්ෂා කරලා බලන්න මේ ලේඛණය කුමක්ද?

පි: මේ වනාහි දේශපාලන ගිවිසුමට ඇතුලුවීමට එන ලෙස හිස්බුල්ලා මහතාට ලියන ලද ලිපියක්.ජාතික තවුහිද් ජමාත් ශීර්ෂය යටතේ ලේටර් හෙඩ් එකකින් යවා තිබෙනවා.

ප්‍ර: කවුද යාව තිබේන්නේ මේ ලේඛණය?

පි; ජාතික තවිහිද් ජමාත්,ලේකම්.

ප්‍ර; එය දෙපැත්තේ අත්සන් කරලා තිබෙන්නේ කවුද?

පි: ඒ නම නෑ නමුත් තනතුරු වශයෙන් සභාපති ,ලේකම් වශයෙන් තමයි සඳහන් වෙන්නේ.

ප්‍ර; කුමන ආයතනයේ President, secretary ද මේ ලිපිය අත්සන් කරලා තියෙන්නේ?

පි; ජාතික තවුහිද් ජමාත් සංවිධානය.

ප්‍ර; ඔවුන් අත්සන් කරලා මේ ලිපියේ යවන්නේ කාටද කාව ආමන්ත්‍රණය කරලාද මේ ලිපිය ලියලා තියෙන්නේ?

පි: එම්.එල්.ඒ.එම් හිස්බුල්ලා මහතාට Authorised agent candidate of UPFA Baticaloa District

ප්‍ර: මෙහි මාතෘකාව කියවන්න මහත්මයා?

පි; ජාතික තවුහිද් ජමාත් සංවිධානය ඔබ සමඟ ඇති කරන්න නියමිත ගිවිසුම් සම්බන්ධයෙන්.

ස්වාමිනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද **2015.07.30** දිනැති එම්.එල්.ඒ.එම් හිස්බුල්ලා ආමන්ත්‍රණය කරමින් ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ සභාපති සහ ලේකම් ගේ අත්සනින් යුතුව

FAIR COMMENT BY JEZEEM

ජාතික තවුහිද් ජමාත් ලිපි ශීර්ෂයක ඇති ලේඛණය **C 673** වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.

C 673 ලේඛණය නැවතත් සාක්ෂිකරුට පෙන්වා සිටිනවා.

ප්‍ර: මේ C 673 පරීක්ෂා කරලා බලලා මහත්මයා කියන්න බලන්න මේ ලේඛණයෙන් හිස්බුල්ලා මහතාගෙන් නැෂනල් තවුහිද් ජමාත් සංවිධානයේ සභාපති සහ ලේකම් කුමක්ද ඉල්ලන්නේ කියලා?

පි; මෙම ලිපිය සමඟ ගිවිසුම සම්බන්ධයෙන් වූ කොන්දේසි අඩංගු ලේඛණ මේ සමඟ ඉදිරිපත් කර ඇති බව සඳහන් කර ඇත.මෙම කොන්දේසි ඔබ පිළිගන්නේ නම් ජාතික තවුහිද් ජමාත් සංවිධානය ඔබට සහයෝගය දක්වන බවටත් එහි සඳහන් වී ඇත.මෙම ඡන්දයට ඉදිරිපත් වන සියළුම මුස්ලිම් දේශපාලඥයන්ට මෙම කොන්දේසි අප විසින් යවා ඇති බවටත් එහි සඳහන් වී ඇත.මෙම කොන්දේසි පිළිගන්නා යමෙකු වේ නම් ඔහුට ජාතික තවුහිද් ජමාත් සංවිධානය තමන්ගේ සහයෝගය පුද කරන බවත් එහි සඳහන් වී ඇත.එසේම මෙම කොන්දේසී නොපිළිගන්නා යම් දේශපාලනයෙක් හෝ සංවිධානයට විරුද්ධව අපි ප්‍රචාරක කටයුතු වල යෙදෙන බවට සඳහන් වී ඇත.මෙම කොන්දේසීවලට පටහැනිව ක්‍රියා කරන දේශපාලඥයන් සමඟ අපි කිසිදා ගිවිසුමකට ඇතුලත් නොවන බවත් එහි සඳහන් කර ඇත.

ස්වාමීනි **C 673** වශයෙන් ලකුණු කරන ලද ලේඛණයේ කන්දසාමි මහතා විසින් කරන ලද සිංහල පරිවර්ථනය දැක්වෙන ලේඛණය **C 673 A** වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.

තවත් ලේඛණයක් සාක්ෂිකරුට පෙන්වා සිටීමට අවසර පතනවා.

ප්‍ර: මේ ලේඛණය පරික්ෂා කරලා බලන්න මහත්මයා.

පි මේ කොන්දේසි පිළිබඳ ජාතික තවුහිද් ජමාත් සංවිධානය ලෙටර් හෙඩ් එකේ කොන්දේසි පිළිබඳව සඳහන්.

ප්‍ර; C 673 ලෙස අපි ලකුණු කරපු ලේඛනය සමඟ යවපු කොන්දේසි අඩංගු ලේඛණ්ය කියලා ඔය ඔබ අතේ තියෙන ලේඛනය කිව්වොත් නිවැරදිද?

පි; ඔව්.

සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද **C 673** ලේඛණය සමඟ යවන ලද කොන්දේසී අඩංගු ලේඛණය **C 673 (1)** වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.

ප්‍ර: මේ **C 673** (1) පිටු කියකින් යුත් ලේඛණයක් ද මහතා?

FAIR COMMENT BY JEZEEM

පි; 5 ක්.

ප්‍ර; කාගේ අත්සන්වලින් යුතුව ද මේ ලේඛණය යවලා තියෙන්නේ ?

පි: ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ ලේකම් ගේ සහ සභාපතිගේ.

ප්‍ර; දැන් මේ **C 673 (1)** ලේඛණයේ තියෙන කොන්දේසි මොනවාද කියලා එකින් එක ගරු කොමිෂන් සභාවට ඔබට කියන්න පුළුවන්ද? මුල්ම කොන්දේසිය කුමක්ද?

පි: දේශපාලනය වෙනුවෙන් ආගම අමතක කර කටයුතු නොකල යුතුයි.ඒකෙන් පළවෙනි එක තමන් රතිඤ්ඤා සංස්කෘතිය සිදු නොකල යුතුයි. රතිඤ්ඤා පත්තු නොකල යුතුයි.

ප්‍ර; ඔය තියෙන සහරාන් විසින් ඔහුගේ **C 673** දරණ ලේඛනයත් එක්ක ඉදිරිපත් කරපු කොන්දේසි මාලාව තමයි ඔබ දැන් කියන්නේ ඒ කොන්දේසි ටික කියවන්නකෝ ප්‍රධාන කොන්දේසි කිපයක් මේ ගරු කොමිෂන් සභාවේ අවධානය යොමු කරන්න?

පි; ඉස්ලාම් ධර්මය අතහැර දමා පිටවී ගිය ශියාවරුන්ට, කබරු වන්දනා කරන්න වුන්ට කිසිදු වන්දනාවන්ට ඔබ කිසිදු මුල්‍ය ආධාර නොකල යුතුයි.
ස්වාමිනි **C 673 (1)** වශයෙන් ලකුණු කරන ලද කොන්දේසි අඩංගු ලේඛනයේ සිංහල පරිවර්තනය **C 673A (1)** වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.

ප්‍ර: දැන් අපි ඔබට පෙන්නුවා **C 673** සහ **C 673 (1)** වශයෙන් ලකුණු කරන ලද ලේඛන දැන් මේ ලේඛන හිස්බුල්ලා මහත්මයාට පමණක් ගියපු ලේඛණද නැත් නම් මේක ඔබ අර කලින් සඳහන් කරපු දේශපාලඥයින් සියල්ලටම නැෂනල් තවුහිද් ජමාත් සංවිධානය විසින් යවපු ලේඛණ කට්ටලයක්ද?

පි: සියළු දෙනාටම ලබා කොන්දේසි.

ප්‍ර; ඒ අනුව ඔබ දැනුවත්ද මේ කොන්දේසි බලලා ඒ කොන්දේසිවලට එකඟත්වය පලකරපු දේශපාලඥෝ කවුද කියලා?

පි: මා ඉහත සඳහන් කල සියළුම අයවලුන් මොහු සමඟ ගිවිසුමකට එළඹුවුනා.

ප්‍ර: ඔබගේ පෞද්ගලිකව ඔබ දැන් දන්නවාද ඔබ ඔය නම් කරපු සියළුම දේශපාලඥයින් සහරාන් සමඟ මේ කොන්දේසි කියවලා ඒ කොන්දේසි පිළිගෙන අත්සන් කරපු බව ඔබ දන්නවාද?

පි: ඔහු එසේ අත්සන් ලබා ගත් බවට එක් පත්‍රිකාවක් මගින් අත් පත්‍රිකාවක් මගින් ප්‍රචාරය කරන්න යෙදුනා ඒකත් මම භාර දීලා තියෙනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබ කියන්නේ සහරාන් විසින්ම නිකුත් කරපු අත්පත්‍රිකාවක් මගින්ද?

පි; ජාතික තවුහිද් ජමාත් සංවිධානය විසින්ම නිකුත් කරන ලද Hand Bill අත්පත්‍රිකාවලින් ඒ බව සඳහන් වෙනවා.
සාක්ෂිකරුට ලේඛණයක් පෙන්වා සිටියි.

ප්‍ර: සාක්ෂිකරු මේ ලේඛණය කුමක්ද?

පි; ජාතික තවුහිද් ජමාත් සංවිධානය විසින් නිකුත් කරන ලද අත් පත්‍රිකාවක්.

ප්‍ර; එය කුමක් හැටියටද ඔබට හඳුනා ගන්න පුළුවන්?

පි; දේශපාලනඥයන් සමඟ ඇති කර ගත් ගිවිසුම සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීමෙන් කරන ලද අත් පත්‍රිකාව මහජනතාව දැනුවත් කරනවා.

ප්‍ර; ඔය අත්පත්‍රිකාව කවුරු විසින් ද නිකුත් කරලා තියෙන්නේ?

පි; ජාතික තවුහිද් ජමාත් සංවිධානය.

ස්වාමිනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද **C 674** වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.

ප්‍ර: මහත්මයා මේ C 674 ලේඛනයේ කුමක්ද සඳහන් වෙන්නේ?

පි: ජාතික තවුහිද් ජමාත් විසින් ප්‍රකාශයට පත් කරන ලද කොන්දේසි සහ එය පිළිගත් අයවලුන් පිළිබඳ විස්තරත් මෙහි සඳහන් වෙනවා.ඒ කොන්දේසිවල ශීර්ෂපාඨයන් මෙහි දක්වා තිබෙනවා.

ප්‍ර: දැන් ඔබ කිව්වානේ ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ කොන්දේසි පිළිගත් අයවලුන්ගේ නම් දැක්වෙනවා කියලා කවුද දැක්වෙන්නේ ඒ නාම ලේඛනයේ?

පි: ශාෆි සාලි,සුබ්ලි ෆාරුක්ු, හිස්බුල්ලා,රූබි ,අබ්දුල් රහුමාන්,

ප්‍ර; එය නම් ටික පමණයි ද දැක්වෙන්නේ?

පි: ඔව් ඒ නම් විතරයි.

ප්‍ර: ඊට අමතරව ඔය ලේඛනයේ කුමක්ද පාඨකයාට කියලා තියෙන්නේ?

පි; මෙම කොන්දේසි සියල්ල යමෙක් පිළිපදින්නේ නම් ඔහුට අපි සහයෝගය දක්වනවා කියලා

ප්‍ර: ඕකේ තියෙන්නේ අර පුද්ගලයින් කොන්දේසි පිළිගෙන තියෙනවා ඒ හින්දා අපි ඔවුන්ට සහයෝගය දක්වනවා කියන එකද නැත්නම් කොන්දේසි පිලිගන්න ඕනෑම කෙනෙක්ට තවදුරටත් අපි සහයෝගය දක්වනවා කියන එකද?

පි: සියළු දෙනාම කොන්දේසි පිලිගෙන ඇත. නමුත් කොන්දේසි පිළිපදින්නන්ට පමණක් අපි සහයෝගය දක්වනවා කියලා යනුවෙන් සඳහන් කරලා තියෙනවා.

ප්‍ර; මහත්මයා දැන් ඕකේ තියෙනවානේ පුද්ගලයින් 06 දෙනෙක්ගේ විතර නම් ඔබ කිව්වා ඔවුන් ජාතික තවුහිද් ජමාත් සංවිධානය ප්‍රතිපත්ති හා

FAIR COMMENT BY JEZEEM

එකඟ වී ඇති බවට ඕකේ තියෙනවා කිව්වා ඒ පුද්ගලයින් ද එකඟ වෙලා තියෙන්නේ ඔය ජාතික තවුහිද් ජමාත් ප්‍රතිපත්ති සමඟ නැත්නම් ඒ පුද්ගලයින් නියෝජනය කරන පක්ෂයද මේ NTJ ප්‍රතිපත්ති සමඟ එකඟ වෙලා තියෙන්නේ හෝ පක්ෂය වෙනුවෙන්ද මේ පුද්ගලයින් අත්සන් කිරීමක් හෝ පිළි ගැනීමක් කරලා තියෙන්නේ?

පි: පක්ෂය වෙනුවෙන් ඔවුන් අත්සන් කල බවටයි මෙම පත්‍රිකාවේ සඳහන් වන්නේ.

ප්‍ර; දැන් ඔබ සඳහන් කරානේ පක්ෂය වෙනුවෙන් තමයි අත්සන් කරලා තියෙන්නේ කියලා දැන් ඔබට මේ කොමිෂන් සභාවට කියන්න පුළුවන්ද ඔය අත්සන් කරපු පුද්ගලයින් එකින් එක අත්සන් කරලා තියෙන්නේ කුමන දේශපාලන පක්ෂ වෙනුවෙන්ද කියලා?

පි: ප්‍රජාතන්ත්‍රවාදි පක්ෂය වෙනුවෙන් M.S සාෆිශාලි යන ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය වෙනුවෙන් එම්.එෆ්.එම් ශිබ්ලි ෆාරුක්,UPFA පක්ෂය වෙනුවෙන් එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් ඒ.එල්.එම් රූබි , NFGG වෙනුවෙන් M.M අබ්දුල් රහුමාන් යන අයවලුන් ගිවිසුම පිළිඅරගෙන අත්සන් කර තිබෙනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේදී **C 674** වශයෙන් ලකුණු කරන ලද ලේඛණයේ සිංහල පරිවර්ථනයක් සකස් කර කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට කොමිෂන්

සභාවේ භාෂා පරිවර්ථකට නියම කරන අතර එය එසේ ඉදිරිපත් කර පසු එය **C674 A** වශයෙන් ලකුණු කරන බව සටහන් කර තබමි.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>

ප්‍ර: සහිලාන් මහත්මයා මේ ලියුම් හුවමාරු සහ මේ හැන්ඩ් බිල් නිකුත් වීමෙන් අනතුරුව සත්‍ය වශයෙන්ම මහමැතිවරණය පැවැත්වුණානේ. ඒ මහ මැතිවරණය පැවැත්වෙන කොට සහරාන් ඔය ඔබ සඳහන් කළ දේශපාලන පක්ෂ වලින් සත්‍ය වශයෙන්ම කුමන පක්ෂයට පක්ෂපාතිවද දේශපාලන ප්‍රචාරය සිදු කෙරේ?

පි: ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය වෙනුවෙන් ඔහු ප්‍රචාරක කටයුතුවල යෙදුනා.

ප්‍ර: ඒ කියන්නේ මේ **2015** අගෝස්තු තිබුණු මහ මැතිවරණයේන් නේද?

පි: ඔව්.

FAIR COMMENT BY JEZEEM

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේදී කොමිෂන් සභාවේ කටයුතු සවස 4 පසු වී විනාඩි 15 වන තෙක් නවත්වනු ලැබේ.

දැන්වේලාව.ප.ව.3.55
මෙතැන් සිට:ල/ලේ මුතුමාලි

President Secretary's Copy

වේලාව : ප.ව.04.25 යි.
පෙර සටහන් ල/ලේ : චන්දිමා මෙය.
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි.

විවේකයෙන් කොමිෂන් සභාවේ වැඩ කටයුතු නැවත ආරම්භ කරන ලදී.
සාක්ෂිකරු දමිළ භාෂාවෙන් ප්‍රතිඥා දෙයි.

(මම මේ කියන සාක්ෂිය, සැබෑය, සම්පූර්ණ සැබෑය, සැබෑවක් මිස අන් කිසිවක් නොකියන බවට ප්‍රතිඥා දී ප්‍රකාශ කරමි.)

FAIR COMMENT BY JEZEEM

කොමිෂන් සභාවේ භාෂා පරිවර්තක වන ජෝන් කන්දසාමි මහතා විසින් සාක්ෂිකරු විසින් දෙමළ භාෂාවෙන් ලබා දෙන ලද සාක්ෂිය සිංහලයට පරිවර්තනය කරන ලදී.

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>

ප : සාක්ෂිකරු 2015 වර්ෂයේ අග භාගයේ ඔක්තෝබර් මාසේ වගේ සූෆි පල්ලි ආශ්‍රිතව සූෆිවරුන්ව විවේචනය කරමින් සහරාන් දේශන මාලාවක් පැවැත්වුවාද?

පි : ඔව්.

ප : ඔබට කියන්න පුළුවන්ද ඒ ප්‍රදේශය කොහේද කියලා?

පි : කාත්තන්කුඩි

ප : කාත්තන්කුඩිවල කොහේද?

පි : කාත්තන්කුඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පාරේදී ඒක පැවැත්වුවා.

ප : ඊට අදාළව සූෆී මුස්ලිම් ජනතාව විදිහට ඔබලා පොලිසියට පැමිණිල්ලක් කළාද මේ සම්බන්ධයෙන්?

පි : ඔව්.

ප : ඒ අනුව අධිකරණ නියෝගයකුත් පොලිසිය විසින් ලබා ගත්තාද මේක එසේ සූෆි ප්‍රදේශයේ කරන්න එපා කියලා නියෝගයක් ලබා ගත්තද නැත්නම් කුමන ආකාරයේ නියෝගයක්ද පොලිසිය විසින් ලබා ගත්තේ?

පි : සූෆි මුස්ලිම්වරු ජීවත් වන ප්‍රදේශයේ මෙවැනි රැස්වීම් පැවැත්වුවහොත් සූෆි මුස්ලිම්වරුන්ට අවමන් කරමින් ප්‍රචාරක කටයුතුවල යෙදුණොත් එම ප්‍රදේශයේ කලබලකාරී තත්ත්වයක් ඇති විය හැකි යැයි අපි පොලිසියට පැමිණිලි කළා.

ප : ඒ අනුව අන්තිමට කුමක්ද සිද්ධ වුණේ?

පි : නමුත් එම රැස්වීම පැවැත්වුවා. කලින් රැස්වීම පැවැත්වීමට තීරණය කර තිබූ ස්ථානයේ සිට මීටර් 50 ක පමණ දුරින් එම රැස්වීම පැවැත්වීමට නියෝග ලැබුණා.

ප : හැබැයි ඔය 2015 වකවානුව වන විට මේ සහරාන් ඇතුළු කණ්ඩායම් මේ රැස්වීම්වලදී violence නැත්නම් ප්‍රචණ්ඩකාරීව හැසිරීමක් සිද්ධ වුණේ නෑ කිව්වොත් නිවැරදිද?

පි : කාත්තන්කුඩියේ නොයෙකුත් ප්‍රදේශවල සූෆි මුස්ලිම්වරුන්ට විරුද්ධව ඔවුන් විවේචනය කරමින් ඉතා තීව්‍රත්වයෙන් යුක්තව රැස්වීම් පැවැත්වුවා. CD තැටිවල කරුණු අඩංගු කර ඒවා මහජනතාවට බෙදා හැරියා. එලෙසම ඔවුන් සූෆී මුස්ලිම්වරුන්ට බැන වැදීම සඳහා මෙම රැස්වීම පැවැත්වීමට කටයුතු කළා. මහජනතාව අතර කැළඹීමක් ඇතිවිය යන චේතනාව වැළැක්වීම

Press Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

සඳහා අපි පොලිසියට ගොස් මේ සම්බන්ධයෙන් පැමිණිලි කළා. නමුත් එම රැස්වීම පැවැත්වීමට අධිකරණයේ අවසරය ලැබුණා. එම රැස්වීමේදී ඔහු ෂූෆි මුස්ලිම්වරුන්ගේ වන්දනා යාච්ඤා ක්‍රමය විවේචනය කරමින් කතා පැවැත්වුවා. නමුත් කලබල කිසිවක් සිදු වුණේ නෑ.

ප්‍ර : ඒ කියන්නේ සිදු වුණේ වාචික විවේචනයක් පමණයි violence නැත්නම් ප්‍රචණ්ඩකාරීව හැසිරීමක් සිදු වුණේ නෑ ඔය **2015** ඔක්තෝබර් මාසේ දී කිව්වොත් නිවැරදිද?

පි : ඔව්.

ප්‍ර : සහරාන් හෂීම් කියන පුද්ගලයා මේ නැෂනල් තවුහිද් ජමාත් කියන සංවිධානය සහ එහි facebook ගිණුම්, youtube ගිණුම් පාවිච්චි කරමින් ශ්‍රී ලංකා ආණ්ඩුවට විරුද්ධවත් ISIS මතවාදයට පක්ෂපාතීවත් විවිධ දේශනා පැවැත්වුවා කිව්වොත් නිවැරදිද?

පි : youtube සහ අන්තර්ජාලය පමණක් නොව ඔහු පුද්ගලිකවත් එවැනි ප්‍රචාරක කටයුතුවල යෙදුණා.

ප්‍ර : දැන් youtube සහ අන්තර්ජාලය මගින් කරපු දේශනා එකතු කරලා අඩංගු CD තැටි කිහිපයක් ඔබ මේ කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයට ලබා දුන්නා කිව්වොත් නිවැරදිද?

පි : ඔව්.

ප්‍ර : එම CD තැටිවල අඩංගු දර්ශන ඔබට නැවත දැක්කොත් හඳුනා ගැනීමේ හැකියාවක් තියෙනවාද?

පි : ඔව්.

(ස්වාමිනි **CD** තැටියක ඇති දර්ශනයක් සාක්ෂිකරුට පෙන්වීමට ගෞරවයෙන් අවසර පතනවා.**)**

ප්‍ර : සාක්ෂිකරු මෙම තිරයේ දැක්වෙන විඩියෝ පටය පරීක්ෂා කරන්න. එය ඔබට හඳුනා ගන්න පුළුවන්ද?

පි : ඔව්.

ප්‍ර : කුමක් හැටියටද ඔබ හඳුනා ගන්නේ?

පි : ඉස්ලාම් සාමය සඳහා වූ ආගමක් නොවේ යන කරුණු දක්වමින් වගේ ඔහු කතා පවත්වනවා. ඒ සමඟම

ප්‍ර : ඔබ විසින් මේ කොමිෂන් සභාවට ලබා දීපු දර්ශන තැටියක් කිව්වොත් නිවැරදිද ?

පි : ඔව්. තවද මෙහිදී දේශ ප්‍රේමීත්වයට විරුද්ධව කරුණු දැක්වීමකුත් තිබෙනවා.

ස්වාමිනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද විඩියෝ දර්ශනය අඩංගු **CD** තැටිය **C 675** ලෙස ලකුණු කිරීමට ඉතාමත් ගෞරවයෙන් අවසර පතනවා.

President Secretariat COPY
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් මේ C 675 ට අඩංගු විනාඩි 18 ක් දිග විඩියෝ පටයේ කුමක්ද අන්තර්ගත වෙලා තියෙන්නේ කියලා සාක්ෂිකරුට දළ වශයෙන් කියන්න පුළුවන්ද?

පි : නබිතුමා ඉස්ලාමීය රාජ්‍යය කෙසේ බිහි කළාද. නබි සල් මැතිතුමා ඔහුගේ ඉස්ලාමීය රාජ්‍යය කෙසේ බිහි කළාද? නබි සල් නබිතුමා ඉස්ලාමීය රාජ්‍යය කෙසේ බිහි කළාද යන ශීර්ෂය යටතේ ඔහු මෙම තැටියේ කතා පවත්වනවා. නබි සල් තුමන් ඉස්ලාම් රාජ්‍යය කෙසේ බිහි කළාද යනුවෙන් තමයි එහි සඳහන් වෙන්නේ. නබිතුමා කඩුව අතට ගෙන යුද්ධ කරලා අනිත් අයව මරලා තමයි ඉස්ලාමීය රාජ්‍යය නබිතුමා බිහි කළා යනුවෙන් තමයි ඔහුගේ කතාවේදී ඔහු සඳහන් කරන්නේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේදී **C 675** වශයෙන් ලකුණු කරන ලද **CD** තැටියේ මොහොමඩ් සහරාන් විසින් කරන කතාවේ සම්පූර්ණ කොටස සිංහලයට පරිවර්තනය කර ඉදිරිපත් කරන ලෙසට කොමිෂන් සභාවේ භාෂා පරිවර්තක වෙත නියෝග කරන අතර එය එසේ ඉදිරිපත් කළ පසු **C 675 (A)** වශයෙන් ලකුණු කරන බව සටහන් කර තබමි.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>

ප්‍ර : සාක්ෂිකරු දැන් අපි C 675 ලෙස ලකුණු කරපු CD තැටියේ ඇති සහරාන් හෂීම්ගේ දේශනා අඩංගු විඩියෝ පටයක් නිරීක්ෂණය කළා. ඔබට මේ ගරු කොමිෂන් සභාවට කියන්න පුළුවන්ද මෙම දේශනය සහරාන් හෂීම් නැමැත්තා විසින් පවත්වන ලද්දේ කවදාද සහ කොතැනදීද කියන කාරණාව?

පි : මම සිතන පරිදි එම CD තැටියේ දින දෙකක් තුළදී පවත්වපු කතා තිබෙනවා. මා විසින් **2016** දෙසැම්බර් **09** වෙනිදා දින පවත්වපු කතාව අඩංගු CD තැටියකුත් සහ **2017** පෙබරවාරි **03** වෙනිදා පවත්වපු කතා දෙකම අඩංගු CD තැටියක් භාරදීලා තිබුණා. මෙය **2016** දෙසැම්බර් මාසේ **09** වෙනිදා දින කාත්තන්කුඩියේ තිබෙන ඔහුගේ ජාතික තවුහිද් ජමාත් පල්ලියේ තමයි මෙම දේශනාව පැවැත්වුණේ.

ස්වාමිනි සාක්ෂිකරුට තවත් **CD** තැටියක ඇති දර්ශනයක් පෙන්වා සිටීමට ගෞරවයෙන් අවසර පතනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මහත්මයා මේ තිරයේ දිස් වූ දර්ශන පටය ඔබට හඳුනා ගන්න පුළුවන්ද? එය හඳුනා ගන්නවා නම් කුමක් හැටියටද ඔබ හඳුනා ගන්නේ?

පි : මේක හඳුනා ගැනීමට හැකිය. ජීහාත් යන යුද්ධය සම්බන්ධයෙන් සහරාන් මෙහි කරුණු දක්වනවා. කතාව පවත්වනවා.

ප්‍ර : මෙය ඔබ විසින් කොමිෂන් සභාවට ලබා දුන් එක් දර්ශන තැටියක් කිව්වොත් නිවැරදිද මේ විඩියෝ අඩංගු CD තැටිය?

පි : ඔව්.

ස්වාමිනි සාක්ෂිකරු විසින් හඳුනා ගත් දර්ශනය අඩංගු **CD** තැටිය **C 676** වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.

ප්‍ර : මහත්මයා මේ C 676 දර්ශනයේ යම් කිසි කොටසක් ඔබ නැරඹුවා. ඒ අනුව ඔබට කියන්න පුළුවන්ද සහරාන් හෂීම් මේ දේශනයේදී කුමක්ද සඳහන් කරන්නේ කියලා?

පි : මුස්ලිම්වරුන් යුද්ධ කළ යුතුයි යන තේමාවෙන් ඔහු කතාව පවත්වනවා. තවද මමත් එසේ යුද්ධ කර මරණයට පත්විය යුතුයි. මම මරණයට භය නෑ යනුවෙන් ඔහු සඳහන් කරනවා.

ප්‍ර : ඔබට කියන්න පුළුවන්ද මහත්මයා සහරාන් හෂීම් මෙම දේශනය සිද්ධ කළේ කවද්ද සහ කොතැනද කියලා?

පි : **2017** පෙබරවාරි මාසේ **17** වෙනි දින කාත්තන්කුඩි හිස්බුල්ලා සංස්කෘතික ශාලාවේ පවත්වන ලද ජාතික තවුහිද් ජමාත් රැස්වීමකදී මොහු මෙම කතාව පවත්වා ඇත.

ස්වාමිනි ඒ අනුව කොමිෂන් සභාවේ භාෂා පරිවර්තකට **C 676 CD** තැටිය සිංහලයට පරිවර්තනය කරන ලෙසට නියෝගයක් කරන මෙන් ගෞරවයෙන් අයැද සිටිනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

C 676 වශයෙන් ලකුණු කරන ලද **CD** ඇති මොහොමඩ් සහරාන් විසින් කරනු ලබන ප්‍රකාශයේ සිංහල පරිවර්තනයක් සකස් කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට භාෂා පරිවර්තකට නියම කරන අතර එසේ ඉදිරිපත් කළ පසු එය **C 676 (A)** වශයෙන් ලකුණු කරන බව සටහන් කර තබමි.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>

ස්වාමිනි සාක්ෂිකරුට තවත් **CD** තැටියක ඇති දර්ශනයක් පෙන්වීමට ගෞරවයෙන් අවසර පතමි.

FAIR COMMENT BY JEZEEM

ප : මහත්මයා ඔබ දැන් මේ දර්ශන තිරයේ නිරීක්ෂණය කරපු විඩියෝ පටය ඔබට හඳුනා ගන්න පුළුවන්ද? හඳුනා ගන්න පුළුවන් නම් කුමක් හැටියටද ඔබ හඳුනා ගන්නේ?

පි : හඳුනා ගැනීමට හැකිය.

ප : හඳුනා ගන්න පුළුවන් කියලා කිව්වනේ?

පි : ඔව්.

ප : ඔබ කොමිෂන් සභාවට ලබා දුන් CD තැටියක අඩංගු දර්ශන කියලා මා කිව්වොත් එය නිවැරදිද?

පි : ඔව්.

ස්වාමිනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද දර්ශන අඩංගු එම **CD** තැටිය **C 677** වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතමි.

ප : මහත්මයා මේ C 677 ට අදාළ දර්ශනය දැන් ඔබ සම්පූර්ණයෙන්ම නිරීක්ෂණය කළා මේ කොමිෂන් සභාවේදී. ඔබට කියන්න පුළුවන්ද මෙහිදී සහරාන් මොකක්ද කුමන කාරණයක් ගැනද සඳහන් කරන්නේ කියලා?

පි : ක්‍රිස්තියානිවරුන් ජේසුස්ගේ උපන් දිනය දෙසැම්බර් 25 ලෙස සමරති. නමුත් බයිබලයේ එවැනි ජේසුස් ගේ උපත ලැබූ දිනය පිළිබඳ සඳහන් වෙන්නේ නැති බව ඔහු කියා සිටි. තවද මුල් කාලයේදී ක්‍රිස්තියානිවරුන් මෙසේ කිස්තු වහන්සේගේ උපත සැමරුම් කළේ නැති බවත් එය ඔවුන්ගේ Encyclopedia of catholic යන ග්‍රන්ථයේ එසේ සඳහන් වන බවත් ඔහු කියා සිටියි.

ප : ඒ කියන්නේ සහරාන් සඳහන් කරලා තියෙන්නේ මේ නත්තල් උත්සවය පැවැත්වීම නොකළ යුතුයි කියලාද?

පි : ඔව්.

ප : මේ දේශනය සහරාන් කළේ කවද්ද කොතැනකදීද?

පි : මෙම කතාව පැවැත්වුයේ කවදාද යන්න මට නිශ්චිත වශයෙන් මතක නැත. නමුත් 2016 හෝ 2017 වර්ෂයේදී ඔහු මෙම කතාව ඔහුගේ තවුහිද් ජමාත් පල්ලියේ පැවැත්වුවා. මේ සම්බන්ධ වූ CD තැටිය ඔහු එම ප්‍රදේශයේ පල්ලිවල ක්‍රිස්තියානි දේවස්ථානවලට පුජකතුමන්ලාට බෙදා හැරියා.

ප : ඊට අමතරව 2017 වර්ෂයේ සහරාන් හෂීම් යන පුද්ගලයා ඔහුගේ මුහුණ පොත එහෙම නැත්නම් facebook account එක භාවිතා කරමින් මේ ජීහාත් නැත්නම් ශුද්ධ යුද්ධයේ තියෙන අනිවාර්ය බව ගැන යම් කිසි සටහන් දමා තිබුණාද?

පි : ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ සම්බන්ධයෙන් සහරාන් හෂීම්ගේ facebook ගිණුමේ පල කරපු ඒ post එකේ සටහනක් ඔබ මේ ගරු කොමිෂන් සභාවේ විමර්ශන අංශයට ඉදිරිපත් කළා කිව්වොත් නිවැරදිද?

පි : ඔව්.

ප්‍ර : එය ඔබට නැවත පෙන්වා සිටියොත් හඳුනා ගැනීමට හැකියාවක් තියෙනවාද?

පි : ඔව්.

(සාක්ෂිකරුට යම්කිසි ලේඛනයක් පෙන්වීමට අවසර පතනවා)

ප්‍ර : සාක්ෂිකරු මේ ලේඛනය පරීක්ෂා කරලා බලන්න.

පි : ඔව්.

ප්‍ර : මේ කුමක්ද ? කුමක් වශයෙන්ද ඔබ හඳුනා ගන්නේ?

පි : සහරාන් හෂීම් විසින් ඔහුගේ මුහුණු පොතේ මුස්ලිම්වරුනි ජීහාතය ඔබට අනිවාර්ය කර ඇත යනුවෙන් කරන ලද සටහන් ලිපියේ කොටසකි.

ස්වාමිනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද සහරාන් හෂීම්ගේ Facebook ගිණුමේ 2017 මාර්තු 02 වෙනිදා පල කළ ජීහාත් යුද්ධය මුස්ලිම්වරුන් ජීහාත් කිරීම ඔබට අනිවාර්ය කර්තව්‍යයක් කර ඇත යන මාතෘකාව යටතේ පල කළ සටහන අඩංගු ලේඛනය C 678 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා. එමෙන්ම එහි සිංහල පරිවර්තනය කන්දසාමි මහතා විසින් සිදු කරපු සිංහල පරිවර්තනය C 678 (A) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

C 677 වශයෙන් කොමිෂන් සභාව ඉදිරියේ ලකුණු කරන ලද **CD** තැටියේ අන්තර්ගත මොහොමඩ් සහරාන්ගේ දෙමළින් සිදු කරන කතාව සිංහලයට පරිවර්තනය කර කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට භාෂා පරිවර්තකට නියෝග කරන අතර එසේ කළ පසු එය **C 677 (A)** වශයෙන් ලකුණු කරන බව සටහන් කර තබමි.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>

ප්‍ර : මහත්මයා ඔබට සඳහන් කරන්න පුළුවන්ද **2017** මාර්තු මස **10** වෙනිදා කාත්තන්කුඩියේ අලියාර් හංදිය අසල යම්කිසි සිද්ධියක් වුණාද කියලා?

පි : ඔව්.

ප්‍ර : මොකක්ද ඒ ඇති වෙච්චි සිද්ධිය ඔබට සරලව කියන්න පුළුවන්ද මේ ගරු කොමිෂන් සභාවට ?

FAIR COMMENT BY JEZEEM

පි : එම ස්ථානය සූෆි මුස්ලිම්වරුන් අධික වශයෙන් බහුලව ජීවත් වන ප්‍රදේශයකි. එම ප්‍රදේශයේදී සූෆිවරුන් බහුලව ජීවත් වන එම ප්‍රදේශයේ ඔවුන්ට විරුද්ධව ප්‍රචාරය කිරීමට ඔහු එම රැස්වීම පැවැත්වීමට කටයුතු සංවිධානය කර තිබුණා. එම රැස්වීම පැවැත්වෙන දිනය පිළිබඳව ඔහු අත් පත්‍රිකාවක් බෙදා හැර තිබුණා.

ප්‍ර : ඒ අත් පත්‍රිකාවේ පිටපතක් ඔබ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කළාද?

පි : ඔව්.

ප්‍ර : එය ඔබට නැවත දැක්කොත් හඳුනා ගැනීමට හැකියාව තියෙනවාද?

පි : ඔව්.

ස්වාමිනි ඒ අනුව සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද **2010** මාර්තු මස **10** වන දින අලියාර් හංදියේ සහරාන් විසින් පවත්වන්නට ගිය රැස්වීමට මිනිසුන්ට එන්න කියලා ආරාධනා කරමින් බෙදා හැරපු අත් පත්‍රිකාව **C 679** වශයෙන් ද එහි සිංහල පරිවර්තනය **C 679 (A)** වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.

ප්‍ර : ඔය C 679 ලේඛනයට අනුව මොකක්ද ඒකේ සරලව කියලා තියෙන්නේ?

පි : මෙහි විෂය වස්තුව වී ඇත්තේ අපි අත්වයිදිවරුන්ව ඉස්ලාම් ධර්මය හැර ගිය අය සේ පවසන්නේ මොන කරුණක් හේතු කොට ගෙනද. ඔහු මෙහිදී අත්වයිදිවරුන් යැයි පවසන්නේ සූෆි මුස්ලිම්වරුන්ව. එබැවින් ඔහු සූෆි මුස්ලිම්වරුන්ව ආගම අතහැර ගිය අය සේ පැවසීම සඳහා මෙම රැස්වීම සංවිධානය කළ බවට පෙනී යනවා.

ප්‍ර : ඉන් අනතුරුව ඔබට තවදුරටත් පැහැදිලි කරන්න පුළුවන්ද මේ අත් පත්‍රිකාව බෙදීමෙන් අනතුරුව මේ අලියාර් හංදියේ ඇති වෙච්චි සිද්ධිය මොකක්ද කියලා?

පි : එම ප්‍රදේශයේ බහුලව ජීවත් වන සූෆි මුස්ලිම්වරුන් තවුහිද් ජමාත් අය වෙත ගොස් මෙම ප්‍රදේශයේ බහුලව සූෆි මුස්ලිම්වරුන් ජීවත් වෙනවා. ඔබ ඔවුන්ව ඉස්ලාමීය අතහැර සේ අත්වයිදිකල් යනුවෙන් පවසා රැස්වීමක් පවත්වන්න යනවා. මේ පැවැත්වීමෙන් මේ ප්‍රදේශයේ කලබලයක් ඇති විය හැකියි. ඒ නිසා මේක පවත්වන්න එපා කියලා. ආගම අතහැර ගිය අයවලුන් සේ පැවසීමෙන් කලබල ඇති විය හැකි බවට අපි කියා සිටියා. නමුත් එම අයවලුන් නෑ අපි මෙම ස්ථානයේ මෙම රැස්වීම පවත්වනවාමයි කියපු නිසා එම අවස්ථාවේ දී ස්ථානයේදී කලබලයක ස්වරූපයක් ගත්තා. එය කලබලයක් බවට පත් වූ

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

අවස්ථාවේදී තවුහිද් ජමාත් සංවිධානයේ සාමාජිකයන් සූෆි මුස්ලිම්වරුන්ගෙන් කෙනෙකුට කඩුවෙන් කපලා තවත් එක්කෙනෙකුට තුවාල සිදු කරනු ලැබුවා.

ප : දැන් ඔවුන් මෙසේ ඔබලාට පහර දෙන කොට ඔවුන් යම් කිසි දෙයක් ප්‍රකාශ කළාද ඔවුන් යම් කිසි වාක්‍යයක් කිය කියද මේ ප්‍රහාරය එල්ල කළේ?

පි : මම ඒ ස්ථානයට ගිහින් තිබුණේ නෑ. නමුත් එම ස්ථානයේ එම සිද්ධිය සිදු වෙන අවස්ථාවේදී හිටි අයවලුන් කියපු දේ තමයි මම මේ පවසන්නේ.

ප : දැන් මේ 2017 මාර්තු මස 10 වෙනි දින ඇති වූ සිද්ධියෙන් පස්සේ ඔබලා විසින් සූෆි මුස්ලිම් පුද්ගලයින් විසින් යම් කිසි උද්ඝෝෂණයක් උද්ඝෝෂණ ව්‍යාපාරයක් සංවිධානය කළාද?

පි : ඔව්.

ප : ඒ උද්ඝෝෂණ තිබ්බේ කවද්ද?

පි : 2017 මාර්තු මාසේ 13 වෙනි දින පැවැත්වුවා

ප : මේ උද්ඝෝෂණය පැවැත්වුයේ කොහේදීද?

පි : කාත්තන්කුඩිය ප්‍රධාන පාරේදී මෙම උද්ඝෝෂණය පැවැත්වුවා.

ප : ඔබ ඒ උද්ඝෝෂණයේදී මොකක්ද ඔබලා ඉල්ලා සිටියේ?

පි : සූෆි මුස්ලිම්වරුන්ට කඩුවෙන් කපා තුවාල සිදු කළ ජාතික තවුහිද් ජමාතේ නායකයා වන සහරාන් හසීම්ව වහාම අත්අඩංගුවට ගත යුතු බවත්, මහජනතාව බහුල වශයෙන් ජීවත් වන ප්‍රදේශවල මොහුට ආගමික ප්‍රචාරක කටයුතු රැස්වීම් පැවැත්වීමට ඉඩ නොදිය යුතුය යන්නත්, ආගම මුල් කර ගෙන ප්‍රචණ්ඩත්වයේ යෙදෙන ජාතික තවුහිද් ජමාත් සංවිධානය තහනම් කළ යුතු බවත්, මහජනතාවගේ ආරක්ෂාව තහවුරු කළ යුතු යැයි අපි ඉල්ලා සිටියා.

ප : ඔබ ඒ උද්ඝෝෂණය කරපු අවස්ථාවේදී ඒ උද්ඝෝෂකයන්ගේ ස්වභාවය දැක්වෙන ඡායාරූප ඇතුළත් යම් ලේඛනයක් මේ ගරු කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයට ඉදිරිපත් කළා කිව්වොත් නිවැරදිද ?

පි : ඔව්.

ප : එය ඔබට නැවත දැක්කොත් හඳුනා ගන්න පුළුවන්ද?

පි : හඳුනා ගන්නවා.

(සාක්ෂිකරුට ලේඛනයක් පෙන්වා සිටිනවා)

ප : මෙය කුමක් හැටියටද හඳුනා ගන්නේ?

පි : මෙය සූෆි මුස්ලිම්වරුන් විසින් ජාතික තවුහිද් ජමාත් සංවිධානය විසින් පවත්වනු ලබන සහරාන් යන අය විසින් පවත්වනු ලබන ප්‍රචණ්ඩකාරීත්වය නතර කළ යුතුයි. ඔහුව අත්අඩංගුවට ගත යුතුයි යනුවෙන් පවත්වපු උද්ඝෝෂණ ව්‍යාපාරයක්.

FAIR COMMENT BY JEZEEM

ස්වාමිනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද ඡායා රූප දෙකක් ඇතුළත් **protest demonstration against national Thowheeth Jamath by Kaththankudi Muslims on 2017 march 13** මාතෘකාව යටතේ ඇති ලේඛනය **C 680** වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.

ප : දැන් මේ අනුව ඔබලාට සිදු වූ අසාධාරණය ගැන ඔබලා මෙයින් නතර නොවී ලංකාවේ ජනාධිපතිතුමාටත් පැමිණිල්ලක් කළාද?

පි : ඔව්.

ප : ඔබලා ඒ අනුව ලංකාවේ විධායක ජනාධිපතිතුමාගේ කාර්යාලටත් මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් පැමිණිලි කළාද සංවිධානයක් විදිහට?

පි : ඔව්. අපි කෙළින්ම භාර දුන්නා.

ප : අතින් භාර දුන්නා?

පි : ජනාධිපතිතුමාව මුණ ගැසුණේ නෑ. ඔහුගේ කාර්යාලයට ගොස් අපි භාර දුන්නා.

ප : ඒ අනුව ඔබලා භාර දුන් පැමිණිල්ල ලැබුණා යැයි Acknowledge කරමින් නැත්නම් පිළිගනිමින් ජනාධිපති කාර්යාලය විසින් ඔබලාට යම් කිසි ලිපියකුත් එව්වා කිව්වොත් නිවැරදිද?

පි : උද්ඝෝෂණය පවත්වා අප විසින් කාත්තන්කුඩිය ප්‍රදේශයේ ලේකම්ට භාර දුන් ලිපියට පිළිතුරක් වශයෙන් තමයි එම ලිපිය ලැබුණේ.

ප : ඒ අනුව ඔබලාගේ පැමිණිල්ල ජනාධිපති කාර්යාලයට ලැබුණු බවට තහවුරු කරමින් ඔබලාට ලේඛනයක් ලැබුණා කිව්වොත් නිවැරදිද?

පි : ඔව්.

ප : එම ලේඛනය ඔබට දැක්කොත් හඳුනා ගන්න පුළුවන්ද?

පි : ඔව්.

ස්වාමිනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද ජනාධිපති කාර්යාලයේ ලිපි ශීර්ෂයක එවන ලද **2017/05/24** දිනැති ලේඛනය **C 681** වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා. එමෙන්ම එහි සිංහල පරිවර්තනය **C 681 (A)** වශයෙන් ලකුණු කිරීමටත් ගෞරවයෙන් අවසර අයැද සිටිනවා.

ප : දැන් ඔබලා **2017** මාර්තු **13** වෙනි දා මේ පවත්වපු උද්ඝෝෂණය ගැන නියාස් යන පුද්ගලයෙක් අසතුටට පත් වෙලා මුහුණු පොතේ යම් කිසි ප්‍රකාශයක් කරලා තිබ්බද?

පි : ඔව් ඔහු ඔහුගේ මුහුණු පොතේ එහෙම සටහනක් යොදා තිබ්බා.

ප : මොනවගේ සටහනක් ද ඔහු යොදලා තිබ්බේ?

FAIR COMMENT BY JEZEEM

පි : අලියාර් හංදීයේ සිදු වුයේ කුමක්ද යන මැයෙන් ඔහුගේ මුහුණු පොතේ 2017 මාර්තු 11 වෙනිදා ඔහු සටහනක් යොදා තිබුණා.

ප්‍ර : එහි කුමක්ද දැක්වුණේ?

පි : සූෆි මුස්ලිම්වරුන්ව ඔවුන් ඉස්ලාම් ධර්මය අතහැර ගිය අයවලුන් සේ හඳුන්වා තිබුණා. තවද ඔවුන් මුස්ලිම් ධර්මය හැර ගිය අයවලුන් සේ සමස්ත ලංකා ජමෙයිතුල් උලමා සංවිධානය විසින් නියෝගයක් ෆත්වාවක් නිකුත් කර තිබූ බවත් ඔහුගේ සටහනේ සඳහන් වුණා.

ප්‍ර : දැන් නියාස් යන අය දමපු ඒ අදාළ Facebook සටහන ඔබ මේ ගරු කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයට ලබා දුන්නාද?

පි : ඔව්.

ප්‍ර : ඔබට එය නැවත දැක්කොත් හඳුනා ගන්න පුළුවන්ද? එය පෙන්වයි. එය මෙයද?

පි : ඔව්.

ස්වාමිනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද නියාස් යන අය විසින් මුහුණු පොතට ඇතුළත් කළ සටහන අඩංගු ලේඛනය **C 682** වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.

එහි පිටු තුනක් තිබෙනවා. මුල් පිටු දෙකේ එහි අඩංගු සම්පූර්ණ සටහනත් එම තුන්වෙනි පිටුවේ එය **Facebook** ඔස්සේ ලබා ගත්තා යැයි තහවුරු කිරීමට ගත් **screen shot** එකකුත් අන්තර්ගත වෙනවා.

ස්වාමිනි ඊට අදාළ සිංහල පරිවර්තනය **C 682 (A)** වශයෙන් ලකුණු කිරීමටත් ගෞරවයෙන් අවසර අයැද සිටිනවා.

****

දැන් වේලාව : ප.ව.05.25 යි.

මෙතැන් සිට ල/ලේ :- සවිනි මෙය.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වේලාව: ප.ව. 05.25
පෙර සටහන්: මුතුමාලි මෙනවිය.
මෙතැන් සිට: සචිනි මෙනවිය.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

සාක්ෂිකරුට **C 681 A** දරණ ලේඛනය පෙන්වයි.

ප්‍ර: ඔය ලේඛනය ඔබට එවලා තියෙන්නේ ජනාධිපති කාර්යාලයෙන් ?

උ: ඔව්.

ප්‍ර: ඒ එවලා තියෙන්නේ ඔබ විසින් අර **2017** මාර්තු මාසයේ **10** වැනිදා සිද්ධ වූ පහර දීම සම්බන්ධයෙන් කරන ලද පැමිණිල්ලට අදාළව නේද?

උ: ඔව්.

ප්‍ර: ඔබ පැමිණිල්ල ඉදිරිපත් කෙරුවේ ජනාධිපති කාර්යාලයට නේද?

උ: එය වෙනත් පැමිණිල්ලක්. තවත් පැමිණිල්ලක් අපි එහි කරා.

ප්‍ර: දැන් එතකොට C **681** A කියන ලේඛනයේ සඳහන් කරලා තියෙන පැමිණිල්ල මොකද්ද?

උ: ජාතික තවුහිද් ජමාත් සංවිධානය ප්‍රචණ්ඩ ක්‍රියාවල යෙදෙනවා. සහරාන් මවුලවීව අත්අඩංගුවට ගත යුතුයැයි සඳහන් කරමින් අපි පැමිණිල්ලක් භාර දුන්නා.

ප්‍ර: ඒකට ලැබුණු උත්තරය?

උ: ඔව්.

ප්‍ර: එතකොට මේ C **681** A දරණ ලේඛනයට අනුව ඒ ජාතික තවුහිද් ජමාත් සංවිධානය හා සහරාන් හෂිම්ව අත්අඩංගුවට ගන්න ඕන කියලා ඔබ ජනාධිපති කාර්යාලයට යවලා තිබ්බ පැමිණිල්ල කොහේට ද යොමු කරලා තියෙන්නේ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: මහජනතාව උද්ඝෝෂණ කළ අවස්ථාවේ දී භාර දෙන ලද පැමිණිල්ල කාත්තන්කුඩි ප්‍රාදේශීය ලේකම් හරහා ජනාධිපතිතුමා වෙත යවා ඇත.

ප්‍ර: C 681 A දරණ ලේඛණය කියන්නේ කරන ලද පැමිණිල්ලක් සම්බන්ධයෙන් ගත්තු ක්‍රියා මාර්ගය ගැන නේද ?

උ: ඔව්.

ප්‍ර: ඒ පැමිණිල්ල ඔබ කියන හැටියට ජාතික තවුහිද් ජමාත් සංවිධානයට විරුද්ධව සහ සහරාන් හෂිම් අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් කරන ලද පැමිණිල්ලක් නේද?

උ: ඔව්.

ප්‍ර: එතකොට මේ C 681 A දරණ ලේඛනයට අනුව ඒ ජනාධිපති කාර්යාලයට ඉදිරිපත් කරපු ඒ පැමිණිල්ල කොහේට ද යොමු කරලා තියෙන්නේ?

උ: එම ලිපිය ප්‍රකාරව එම පැමිණිල්ල තැපැල් සේවා සහ මුස්ලිම් ආගමික සම්බන්ධ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයට යොමු කර ඇති බව සඳහන් වෙනවා.

ප්‍ර: දැන් 2017 මැයි වන විට තැපැල් සහ තැපැල් සේවා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යවරයා කවුද කියලා?

උ: කවුද කියා මා දන්නේ නැහැ.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා.</u>

ස්වාමිනි සාක්ෂිකරුට යම්කිසි ලේඛනයක් පෙන්වීමට අවසර පතමි.

උ: මෙය මට හඳුනාගැනීමට හැකිය.

ප්‍ර: මෙම ලේඛනය කුමක් ද?

උ: මෙම ලිපිය හිටපු අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට යොමු කරන ලද ලිපියක්.

ප්‍ර: මෙය කවුරුන් විසින් යොමු කරන ලද ලිපියක් ද?

උ: අල්හාජ් අබ්දුල් ජවාත් ආලිම් වලිඋල්ලා ට්‍රස්ට් පදනමේ ලේකම් වන මා විසින් අත්සන් යොදා යවන ලද ලිපියක්.

ප්‍ර: පිටු කීයකින් යුතු ලිපියක් ද?

උ: පිටු 06 යි. ඒ සමඟ සිංහල පරිවර්තනය ද අමුණා තිබෙනවා.

ප්‍ර: 06 වන පිටුවේ යම් පුද්ගලයෙක් අත්සන් කරලා තියෙනවා ඒ අත්සන කාගේ ද?

උ: මමයි අත්සන් කළේ.

ස්වාමිනි 2017 මාර්තු 27 දිනැතිව එවකට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා අමතමින් සාක්ෂිකරුගේ අත්සනින් යොමු කරන ලද පිටු 06 කින් යුත් පැමිණිල්ල අඩංගු ලිපිය C 683 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතමි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මහත්මයා මේ C 683 ලිපිය ඔබ අතිගරු ජනපති මෛත්‍රීපාල සිරිසේන මහතාට අතින් ලබා දුන්න ද නැත්නම් රාජ්‍ය නියෝජිතයා මගින් යැවීමට සැලැස්සුව ද කොහොම ද මේ ලිපිය ජනාධිපතිතුමාට ලැබෙන්නට සැලැස්සුවේ?

උ: මෙම ලිපිය භාර දීමට අපේ සංවිධානයේ සාමාජිකයන් කිහිපදෙනෙක් ජනාධිපති කාර්යාලයට ගොස් තිබුණා නමුත් සියළු දෙනාටම ඇතුල් වීමට ඉඩ දුන්නේ නැහැ. අපේ පදනමේ සාමාජික සිමාක් සින්නලෙබ්බේ යන අයට පමණක් අවසර ලැබුණා. ඔහු එම කාර්යාලය ඇතුළට ගොස් ඔහුගේ අතින්ම මේක භාර දුන්නා. පිළිගැනීමේ කවුන්ටරයට භාර දුන්නා.

ප්‍ර: මෙම ලිපියේ සඳහන් වෙනවා නේද මොහොමඩ් සහරාන්ගේ නම සහ ඔහු තවුහිද් ජමාත් සංවිධානයේ සාමාජිකයෙක් බවත් ඔහු ඉස්ලාමීය මූලධර්මවාදය Practice කරන බවත්, එයින් වන සියළුම හානි ගැන අතිගරු ජනාධිපතිතුමාව ඔබ මේ ලිපිය තුළින් 2017 මාර්තු 27 දිනැති ලිපිය තුළින් දැනුවත් කරලා තියෙනවා කිව්වොත් නිවැරදි ද?

උ: ඔව්.

ප්‍ර: මෙසේ දැනුවත් වීමක් කරලාත් ජනාධිපතිතුමාට මේ සම්බන්ධයෙන් එවකට සිටි රජය විසින් යම් කිසි active measure එකක් නැත්නම් ක්‍රියාකාරී පියවරක් ගත්ත ද?

උ: කිසිදු පියවරක් ගත් බව මා හට දැන ගැනීමට ලැබුණේ නැත. තවද ජනාධිපතිතුමා කාර්යාලයේ සිට අපිට කිසිදු පිළිතුරක් ලැබුණේ නැත.

ප්‍ර: දැන් ඔබ සාක්ෂි දෙමින් කලින් සඳහන් කරා නියාස් යන අය මුහුණු පොතේ පළ කරපු Post එක ගැන. අපි දැන් ඒක ගැන ලේඛන ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරා කිව්වොත් නිවැරදි නේද?

උ: ඔව්.

ප්‍ර: ඒ නියාස් යන පුද්ගලයාගේ facebook සටහන මත පදනම්ව ඔබ ඉ පොලිසියටත් පැමිණිල්ලක් කරාද?

උ: ඔව්.

ප්‍ර: ඒ අනුව පොලීසිය විසින් මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කිරීමකුත් කර තිබෙනවා ද?

උ: ඔව්.

ප්‍ර: ඔබට කියන්න පුළුවන් ද කුමන මහේස්ත්‍රාත් අධිකරණයේ කුමන නඩු අංකයක් යටතේ ද මේ සම්බන්ධයෙන් කරුණු වාර්තා කරලා තියෙන්නේ කියලා?

උ: මඩකලපුව මහේස්ත්‍රාත් අධිකරණයේ B/295/ 2017 යටතේ නඩුවක් පවරනු ලැබුවා.

ප්‍ර: ඔබට සඳහන් කරන්න පුළුවන් ද මේ නඩුවක් පැවරීමට හේතු වූ කාරණාව සම්බන්ධයෙන් ඔබලා පොලීසියේ පැමිණිල්ල දැම්මේ කවද්ද කියලා?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ඌ: 2017 මාර්තු 15 වැනිදා.

ප්‍ර: ඔබ දැන් සඳහන් කරපු 2017 මාර්තු මාසේ 15 වැනිදා කාත්තන්කුඩි පොලිස්ථානයට ඉදිරිපත් කළ පැමිණිල්ලේ ලදුපත ඔබට නැවත දැක්කොත් හඳුනාගැනීමේ හැකියාවක් තියෙනව ද?

ඌ: ඔව්.

සාක්ෂිකරුට යම්කිසි ලේඛනයක් පෙන්වා සිටිනවා.

ඌ: හඳුනාගැනීමට පුළුවන්.

සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද CIB 137/166 යටතේ කාත්තන්කුඩි පොලිස්ථානයට 2017/03/15 වැනි දින සිදු කරන ලද පැමිණිල්ලේ ලදුපත C 684 ලෙසත් එහි සිංහල පරිවර්තනය C 684 A ලෙසත් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතමි.

ප්‍ර: ඔබ මෙහි සඳහන් කරපු නියාස්ගේ facebook සටහනේ යම් කිසි ෆත්වා එකක් ගැන සඳහන් වෙනව ද?

ඌ: ඔව්.

ප්‍ර: මොකද්ද මේ ෆත්වා එක නියාස් විසින් සඳහන් කරන මේ ෆත්වා එක මොකද්ද?

ඌ: මෙය 1979 සමස්ත ලංකා ජමෙයිතුල් උලමා විසින් ප්‍රකාශයට පත් කරන ලද ෆත්වාවක්. එම නියෝගයේ කාත්තන්කුඩි සූෆි මුස්ලිම්වරුන්ගේ නායකයා වන මවුලවී අබ්දුල් රවුෆ් මිශ්බාහි යන අය සහ ඔහුගේ මතය පිළිගත් සූෆි මුස්ලිම්වරු එනම් ආගම හැර ගිය අයවලුන් සේ එහි සඳහන් වී ඇත.

ප්‍ර: දැන් ඔබ ඔය විස්තර කරපු ෆත්වා එක අඩංගු ලේඛනයක් මේ ගරු කොමිෂන් සභාවේ විමර්ශන අංශයට ඔබ ලබා දුන්න කිව්වොත් නිවැරදි ද?

ඌ: ඔව්.

ප්‍ර: ඔබට එය නැවත දැක්කොත් හඳුනාගන්න පුළුවන් ද?

ඌ: ඔව්.

සාක්ෂිකරුට ලේඛනයක් පෙන්වා සිටී.

ප්‍ර: ඔය ලේඛනය පරීක්ෂා කරන්න එය කුමක් ද?

ඌ: මෙය 1979 සමස්ත ලංකා ජමෙයිතුල් උලමා සභාව විසින් කාත්තන්කුඩියේ පදිංචි මවුලවී අබ්දුල් රවුෆ් මිෂ්බාහි යන අයත් ඔහුගේ මතය පිළිගත් අයවලුන් ඉස්ලාම් ධර්මය හැර ගියා අයවලුන් සේ සලකා නිකුත් කරන ලද නියෝගයකි. එයට මුරුතත් යන වචනය ආරාබි වචනය යොදා ඇත. මෙසේ යම් කෙනෙකු ඉස්ලාම් ධර්මය හැර ගියානම් ඔහු ඉස්ලාමිය නීතිය අනුව මරා දැමිය යුතුයැයි මෙම නියෝග පොතේ සටහන් වී තිබෙනවා. මෙය පදනම් කරගෙන තමයි

ප්‍ර: මහත්මයා ඔය නියෝග පොත කියන්නේ ෆත්වා අඩංගු නියෝග පොතක් ද?

ඌ: ඔව්.

ප්‍ර: කවුරු විසින් ද ඔය පොත නිකුත් කරලා තියෙන්නේ?

උ: සමස්ත ලංකා ජමෙයිතුල් උලමා සභාව විසින් මෙය ප්‍රකාශයට පත් කර ඇත.

ප්‍ර: කොයි වකවානුවෙ ද ප්‍රකාශයට පත් කරලා තියෙන්නේ ඔය පොත?

උ: 1979 වර්ෂයේ
ස්වාමිනි ඒ අනවු සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද සමස්ත ලංකා ජමෙයිතුල් උලමා සභාව විසින් මුද්‍රණය කරන ලද 1979 ප්‍රකාශයට පත් කරන ලද ෆත්වා නැමැති නියෝග අඩංගු පිටු 28 කින් යුත් පොත C 685 වශයෙන් ලකුණු කිරීමට අවසර පතමි.

උ: 1979 අප්‍රේල් මාසේ 01 වැනිදා ඉඳන්.

ප්‍ර: දැන් C 685 ලේඛනය පරික්ෂා කරලා ඔබට කියන්න පුළුවන් ද ඔබ දැන් ඔය කියපු සූෆි මුස්ලිම්වරුන් ආගමෙන් නෙරපූ අය ලෙස සැලකිය යුතු යැයි සඳහන් කොටස තියෙන්නේ කී වෙනි පිටුවේ ද කියලා?

උ: 16 වන පිටුවේ එසේ සඳහන් කර ඇත.

ප්‍ර: ස්වාමිනි ඒ අනුව මෙම C 685 ලේඛනයේ 16 වන පිටුව C 685 A වශයෙන් ලකුණු කිරීමට අවසර පතමි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකරු සමස්ත ලංකා ජමෙයිතුල් උලමා සභාවලංකාවේ දී ඉස්සෙල්ලම හැදුවේ 1920 ගණන් වල නේද?

උ: 1924 දී ස්ථාපිත වුණා.

ප්‍ර: හරි එතකොට 1924 දී ස්ථාපිත කරපු සමස්ත ලංකා ජමෙයිතුල් උලමා සභාවේ බහුතරයක් නැත්නම් බලය තිබ්බේ සාම්ප්‍රදායික මුස්ලිම් ජනාතවට නේද?

උ: ඔව්.

ප්‍ර: ඒ කියන්නේ සූෆි මුස්ලිම්වරුන්ට නේද?

උ: ඔව්.

ප්‍ර: එතකොට 1979 වන විට ඒ සමස්ත ලංකා ජමෙයිතු උලමා සභාවෙන් ෆත්වා එකක් නිකුත් කරනවා සූෆි ජන කොට්ඨාශයට විරුද්ධව ?

උ: ඔව්.

ප්‍ර: එතකොට 1979 වන විට සමස්ත ලංකා ජමෙයිතුල් උලමා සභාවේ බලය තිබ්බේ කාටද?

උ: එම අවස්ථාවේ දී වාහබ්වරුන්ගේ බලය වර්ධනය වෙමින් තිබුණා.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා.</u>

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: C 685 ලේඛණය පරීක්ෂා කරලා බලලා කියන්න මට සාක්ෂිකරු එහි තිබෙනව ද එම ෆත්වා එකේ තියෙනව ද ඉස්ලාම් ධර්මයෙන් වෙන්වී ගිය අය ඉස්ලාම් නීතිය අනුව සාතනය කළ යුතුයි කියන එක?

උ: ඔව්.

ප්‍ර: කුමන පිටුවේ ද තියෙන්නේ?

උ: පිටු අංක 20 දි ඒ බව සඳහන් වෙනවා.

ප්‍ර: ස්වාමිනි C 685 ලේඛනයේ 20 වන පිටුව C 685 B වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතමි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

මේ අවස්ථාවේ දී **C 685** වශයෙන් ලකුණු කරන ලද ලේඛනය සිංහල භාෂාවට පරිවර්තනය කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙස කොමිෂන් සභාවේ භාෂා පරිවර්තකට නියෝග කරන අතර එය එසේ ඉදිරිපත් කර පසු **C 685C** වශයෙන් ලකුණු කරන බව සටහන් කර තබමි.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා.</u>

ප්‍ර: දැන් මහත්මයා මේ ෆත්වා එක ගැන සඳහන් කරමින් face book සටහනක් දාපු නියාස් කියන කෙනාට කුමක්ද වුණේ කියලා ඔබට සඳහන් කරන්න පුළුවන් ද?

උ: සයින්දමර්දු ප්‍රදේශයේ සිදු වූ ප්‍රහාරයේ දී ඔවුන් මිය ගිය ගොස් ඇති බව මා දැනගත්තා.

ප්‍ර: මේ නියාස් යන පුද්ගලයා ශ්‍රී ලංකා යුධ හමුදාවත් එක්ක යම්කිසි සබඳතාවයක් පැවැත්වූ බවට ඔබට තොරතුරක් හෝ ආරංචියක් ලැබිලා තිබුණ ද? සේවය කරපු බවට.

උ: ඒ ගැන මම දැන්නේ නැහැ.

ප්‍ර: දැන් ඔබ C 685 කියලා 1979 දි නිකුත් කර ෆත්වා එකක් මේ ගරු කොමිෂන් සභාවේ ලකුණු කරානේ? ඒ තීන්දුව මත පදනම් කරගෙන එයින් අනතුරුව වහාබ් වාදයට විරුද්ධව කටයුතු කරපු සූෆි නායකයින් මර්ධනය කිරීමේ ප්‍රවණතාවයක් බිහිවුණාද?

උ: එම ෆත්වා එකේ එනම් නියෝගය පදනම් කරගෙන තමයි සහරාන් සහ එම සංවිධානයේ නියාස් යන අයවලුන් සූෆි මුස්ලිම්වරුන්ට විරුද්ධව ක්‍රියාකාරකම් කටයුතු කළේ.

ප්‍ර: දැන් ඔයි සහරාන් ඒමට ප්‍රථම 1998 විතර ඉදන්ම මේ ෆත්වාව යොදාගෙන සූෆි නායකයන්ව මර්ධනය කිරීමට ක්‍රියාකාරකම් සිද්ධ වෙලා තියෙනවා කිව්වොත් නිවැරදි ද?

උ: ඔව්.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබට කියන්න පුළුවන් ද එසේ මේ ෆත්වාව පදනම් කරගෙන ඝාතනයට ලක් වූ මවුලවීවරු මවුලවීවරයෙක් කවුරු හරි ප්‍රසිද්ධ මවුලවීවරයෙක්ගේ නම?

උ: ඔව්. මවුලවී M.S.M. ෆාරුක් යන අය 1998 දී මරා දමා තිබුණා.

ප්‍ර: මවුලවී ෆාරුක් යන අය මරා දමා තිබුණේ කොහේ දි ද?

උ: කාත්තන්කුඩියේ පිහිටි ඔහුගේ නිවසේ දී ඔහුව ඝාතනයට ලක් කර තිබුණා.

ප්‍ර: කවද්ද ඒ ඝාතනයට ලක් වුණේ ?

උ: දිනය මතක නැහැ. 1998 මැයි මාසේ 29 වැනිදා.

ප්‍ර: ඊට අදාළව ඔබ යම්කිසි ඡායා රූපයක් M.S.M. ෆාරුක් මවුලවීතුමාගේ ඡායාරූපයක් මේ කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයට ඉදිරිපත් කරාද?

උ: ඔව්.

ප්‍ර: එය ඔබට නැවත දැක්කොත් හඳුනාගන්න පුළුවන් ද?
සාක්ෂිකරුට ලේඛනයක් පෙන්වා සිටී.

උ: ඔව්.
සාක්ෂිකරු හඳුනාගනී.

ස්වාමිනි සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද මවුලවී එම් .එස් පාරුක් යන අයගේ ඡායා රූපයේ අඩංගු ලේඛනය **C 686** ලෙස ලකුණු කිරීමට අවසර පතමි.

ප්‍ර: දැන් ඒ අපි කතා කරේ 1998 වකවානුව කාලයේනේ. ඉන් අනතුරුව 2004 සහ 2006 අතර කාලය තුළත් මේ වහාබ් වාදය පිළිගන්න කියලා සූෆි මුස්ලිම්වරුන්ට යම්කිසි බලපෑමක් තිබ්බ ද?

උ: ඔව්.

ප්‍ර: කාගෙන් ද මේ බලපෑම තිබ්බේ?

උ: කාත්තන්කුඩියේ පිහිටුවා තිබෙන වාහබිසම් සංවිධානවල ඒකාබද්ධ සභාව විසින් තමයි මෙම බලපෑම ඇති කළේ.

ප්‍ර: ඒ කියන්නේ නීත්‍යානුකූලව සභාවක් වශයෙන් පිහිටවලා තිබ්බ ද නැත්නම් පුද්ගලයින්ගේ unofficial gathering එකක් ඒ කියන්නේ නීත්‍යානුකූල නොවන නමුත් සමූහයක් ද?

උ: ඔවුන් සංවිධානය වශයෙන් ඒකාබද්ධ වී සිටියේ නැහැ. නමුත් පුද්ගලයින් වශයෙන් ඒකාබද්ධ වී මෙම බලපෑම සිදු කරා.

ප්‍ර: ඒ අනුව ඔවුන් බලපෑම තීව්‍ර ලෙස සිදු කරමින් සූෆි මුස්ලිම් අදහන පුද්ගලයින්ගේ පෞද්ගලික දේපළ වලට හෝ සොහොන් වලට අලාභ හානි සිද්ධ කරාද?

උ: ඔව්. ඔවුන් සූෆි මුස්ලිම්වරුන්ගේ පල්ලි වලට වන්දනා ස්ථානවලට හානි සිදු කරා. මෙම කටයුතු වලට කාත්තන්කුඩියේ පිහිටි ජමෙයිතුල් උලමා

FAIR COMMENT BY JEZEEM

සභාව සහ කාත්තන්කුඩි පල්ලි අසල තිබෙන මුස්ලිම් පල්ලිවල ඒකාබද්ධ සභාව Federation වලිනුත් බලපෑම් සිදු කරනු ලැබුවා.

ප්‍ර: බලපෑම් සිදුකරපු 02 ක් කිව්වා නේද? ඊට ටික ආයි කියන්න.

උ: කාත්තන්කුඩි ජමෙයිතු උලමා සභාව. Federation Of Kaththankudi Mosques and Muslim Institutions.

ප්‍ර: මේ කාත්තන්කුඩි ජමෙයිතුල් උලමා Federation කියන සභාව All Ceylon Jammeythul Ulama සංවිධානයේ ශාඛාවක් ද?

උ: ඔව්. සම්බන්ධ එකක් තියෙනවා.

ප්‍ර: ඒ අනුව ඔවුන්ගේ අනු දැනුම ඇතිව ද 2004 සිට 2006 දක්වා සූෆි මුස්ලිම්වරුන්ට පහර දීම් ඇතුළු හිරිහැර සිද්ධ වුණේ?

උ: සමස්ත ලංකා ජමෙයිතුල් උලමා සභාවෙන් අනුග්‍රහය ලැබුණ ද කියන එක දන්නේ නැහැ. නමුත් මම ඉහත සඳහන් කළ ආයතන දෙකම කාත්තන්කුඩියේ සිදු වූ සිදුවීම් වලට බලපෑම් සිදු කරනු ලැබුවා.

ප්‍ර: ඔබ විසින් කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයට යම්කිසි ලේඛනයක් ලබා දුන්නද 2004 වර්ෂයේ දී මේ සූෆි මුස්ලිම්වරුන්ට වාහාබි මූලධර්මවාදීන් විසින් සිදු කරපු පහරදීම් වලදී ඒ ඇති වූ දේපළ හානි දැක්වෙන ඡායා රූප ප්‍රමාණයක්?

උ: ඔව්.

ප්‍ර: එම ලේඛනය ඔබට නැවත දැක්කොත් හඳුනාගන්න පුළුවන් ද?

උ: ස්වාමිනි සාක්ෂිකරුට යම් කිසි ලේඛනයක් පෙන්වීමට අවසර පතමි.

ප්‍ර: මේ පිටු 03 කින් යුත් ලේඛනයේ කුමක් ද දැක්වෙන්නේ?

උ: පළමුවෙන් සූෆි මුස්ලිම්වරුන්ගේ පල්ලියක් විනාශ කරලා තියෙනවා. දෙවැනි ඡායා රූපයෙන් සූෆි මුස්ලිම්වරුන්ගේ ප්‍රභූ කෙනෙකුගේ සොහොන් කොතක් විනාශ කර තිබෙනවා. ඡායා 3 සහ 4 ත් සූෆි මුස්ලිමවරුන්ගේ ප්‍රභූවරුන්ගේ සොහොන් එසේ විනාශ කළ තිබූ ඡායා රූප තමයි. අනිත් ඡායා රූප දෙකේ සූෆි මුස්ලිම්වරුන්ගේ පොදු ජනතා දෙදෙනෙකුගේ නිවෙස් විනාශ කරදමා ඇති අයුරු දැක්වෙනවා.
ස්වාමිනි සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද 2004 වර්ෂයේ දී සූෆි මුස්ලිම්වරුන්ගේ පාසල් සොහොන් කොත් සහ නිවාස වලට වහාබි මූලධර්මවාදීන් විසින් කරපු හානිය දැක්වෙන ඡායා රූප අඩංගු පිටු 03 කින් යුත් ලේඛනය C 687 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතමි.

ප්‍ර: මහත්මයා ඊට අමතරව 2006 වර්ෂයේ දී සූෆි මුස්ලිම්වරුන්ගේ නායකයාව ඝාතනය කිරීමට යම්කිසි තැනක් එකක් ගත්ත ද මේ අන්තවාදී වහාබින් විසින් ?

උ: ඔව්.

ප්‍ර: කවද්ද ඒ සිදු වීම සිද්ධ වුණේ?

FAIR COMMENT BY JEZEEM

ඌ: 2006 නොවැම්බර් මාසේ 07 වැනිදා.

ප්‍ර: කොහේදිද මේ සිදු වීම සිදු වුණේ?

ඌ: කාත්තන්කුඩියේ පිහිටි සූෆි මුස්ලිමිනම් නායකයාගේ කාර්යාලයේ.

ප්‍ර: ඒ සූෆි මුස්ලිම් නායකයාගේ නම සම්පූර්ණයෙන් කියන්න කොමිෂන් සභාවට?

ඌ: මවුලවී අබ්දුල් රවුෆ් මිස්බාහි බාජී.

ප්‍ර: ඊට අදාළව ඔබ මේ කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයට ඡායා රූප ඇතුළත් ලේඛනයක් ඉදිරිපත් කරා කිව්වොත් නිවැරදි ද?

ඌ: ඔව්.

ප්‍ර: එය ඔබට නැවත දැක්කොත් හඳුනා ගන්න පුළුවන් ද?

ඌ: ඔව්.

සාක්ෂිකරුට ලේඛනයක් පෙන්වා සිටිනවා.

ඔහු හඳුනාගනී.

ප්‍ර: එය කුමක් වශයෙන් ද ඔබ හඳුනා ගන්නේ?

ඌ: එය සූෆි මුස්ලිම් නායකතුමාගේ කාර්යාලයේ දී ඔහුව මිනීමැරීමට තැත් කිරීමේ අවස්ථාවේ දී ගනු ලැබූ ඡායා රූප. තුවක්කුවෙන් වෙඩි තැබීමේ සලකුණු එහි දක්නට තිබෙනවා.

ඒ අනුව ස්වාමිනි සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද එම ඡායා රූප දෙක අඩංගු ලේඛනය **C 688** වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතමි.

ප්‍ර: දැන් මහත්මයා මේ වෙනකොට මේ සූෆි මුස්ලිම්වරුන්ට තමන්ගේ ආගමික නිදහස අනුගමනය කරමින් තමන්ගේ ජීවිතය සාමකාමීව පවත්වාගෙන යාමට මේ අන්තවාදී වහාබ්වාදින්ගේ කාත්තන්කුඩි ප්‍රදේශයේ දී තවමත් බලපෑම් එල්ල වෙනව ද?

ඌ: 2019 අප්‍රේල් 21 වැනිදා සිදු වූ සහරාන්ගේ ප්‍රහාරය දක්වා නොයෙකුත් බලපෑම් පැවැතුණා. නමුත් ඉන්පසු රජය විසින් යම්කිසි ක්‍රියාමාර්ගයක් අරගෙන තිබෙන නිසා ඔවුන් ඔවුන්ගේ කටයුතු අඩුකර රහසිගතව ක්‍රියාත්මක වෙනවා.

ප්‍ර: ඒ කියන්නේ ඔබ කියන්නේ තවමත් මේ වහාබ්වාදී අන්තවාදීන්ට විදේශීය මුදල් අධාර ලැබෙමින් පවතිනවා කියලද?

ඌ: ඔවුන්ට ලැබෙනවායි ඔප්පු කිරීමට මං ළඟ කිසිදු සාක්ෂියක් නැත. නමුත් මම හිතනවා ඔවුන්ට ඒක තවමත් ලැබෙමින් තිබෙන බව.

ප්‍ර: සහිලාන් මහත්මයා මේ වහබ්වාදීන්ගේ ඒ අන්තවාදී ක්‍රියාකාරකම් තවමත් කාත්තන්කුඩි ප්‍රදේශයේ ක්‍රියාත්මක වෙමින් පවතිනව ද?

ඌ: දැනුත් තිබෙනවා. ඔවුන්ගේ අන්තවාදී කටයුතු.

ප්‍ර: ඒ කියන්නේ මධ්‍යස්ථ සාම්ප්‍රදායික සූෆි ජනතාව තවමත් වහාබ් අන්තවාදීන්ට බිය වී වහාබ් වාදයට හැරීමක් සිද්ධ වෙනව ද?

ඌ: ඔව් තිබෙනවා.

FAIR COMMENT BY JEZEEM

****

<u>ගරු අදිකාරී මැතිණිය.</u>

ප්‍ර: සාක්ෂිකරු දැන් 2019 අප්‍රේල් 21 නැෂනල් තවුහිද් ජමාත් දෙකේ සහරාන්ගේ සහ ඔවුන්ගේ කණ්ඩායම් නැතුව ගියානේ.

උ: ඔව්.

ප්‍ර: නමුත් සහරාන්ගේ නැෂනල් තවුහිද් ජමාත් එක පටන් ගන්න ඉස්සෙල්ලා කාත්තන්කුඩි ප්‍රදේශයේ තිබුණා නේද වහාබ්වාදය කියන ආගමික අන්තවාදය සමඟ සම්බන්ධ වෙච්ච SLTJ, CTJ, ACTJ, යුනයිටඩ් තවුහිද් ජමාත් කියන සංවිධාන වගයක්? තවුහිද් ජමාත් සංවිධාන ගොඩක් තිබුණා නේද?

උ: ඔව්.

ප්‍ර: දැන් සහරාන් නැතුව ගියාට පස්සේ ඒ ගොල්ලෝ එළියට ඇවිල්ලා රහසිගතව ඒ ගොල්ලෝ ක්‍රියාත්මක වෙමින් තියෙනව ද?

උ: රහසිගතව නොවේ. ප්‍රසිද්ධියේ ඔවුන්ගේ කාර්යයන් ඉටුවෙමින් තියෙනවා.

ප්‍ර: එතකොට ඒ එක්කෙනෙක් ද SLTJ එකේ අබ්දුල් රාසික් කියන්නේ ඒ එක්කෙනෙක් ද? ශ්‍රී ලංකා තවුහිද් ජමාත් එකේ අබ්දුල් රාසික් කියන්නේ දැන් ඔබ ප්‍රකාශ කර පරිදි රහසිගතව නෙවෙයි ප්‍රසිද්ධියේම ඇවිල්ලා ත්‍රස්තවාදීන් විදියට හැසිරෙන කෙනෙක් ද, කණ්ඩායමක් ද?

උ: ඔහු කාත්තන්කුඩියේ පදිංචි නැත. නමුත් SLTJ සංවිධානයේ ශාඛාවක් කාත්තන්කුඩියේ පවත්වනවා. SLTJ ගේ ශාඛාව තවමත් කාත්තන්කුඩියේ ක්‍රියාත්මක වෙමින් තිබෙනවා.

ප්‍ර: ඒ කියන්නේ සාම්ප්‍රදායික මුස්ලිම්වරුන්ට කාත්තන්කුඩියේ තවමත් මේ මම නම් සඳහන් කරපු විවිධ තවුහිද් ජමාත් කණ්ඩායම් වලින් කරදර තිබෙනවා?

උ: තවමත් පැවැත්වෙමින් තියෙනවා. තවුහිද් ජමාත් නමින් නෙවෙයි වෙනත් වෙනත් නම් වලින් වහාබිසම් ප්‍රචාරය කරන සංවිධාන කාත්තන්කුඩියේ තවම පැවැත්වෙනවා.

ප්‍ර: ඔබට කියන්න පුළුවන් ද ඒ වෙනත් වෙනත් සංවිධානවල නම් ?

උ: දාරුල් අදර් අද්දාවියා, මෙය සහරාන් විසින් ජාතික තවුහිද් ජමාත් සංවිධානය ආරම්භ කිරීමට ඔහු සාමාජිකයෙකු ලෙස කටයුතු කළ සංවිධානය මෙය තවමත් පවතිනවා.

ප්‍ර: එය වහාබ්වාදී සංවිධානයක් නේද?

උ: ඔව්. ඒ වගේම Islamic Center.

ප්‍ර: ඊට පස්සේ?

උ: Center for Islamic Guidance.

ප්‍ර: ඊට පස්සේ?

FAIR COMMENT BY JEZEEM

උ: කුබාමොස්ක්.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා.</u>

ප්‍ර: සහිලාන් මහත්මයා දැන් මේ වෙන කොටත් ඔය කාත්තන්කුඩි ප්‍රදේශයේ තියෙන මුස්ලිම් ඉස්ලාම් මද්‍රසාවල සහ අරාබි විද්‍යාල වල තවමත් මේ වහාබි දර්ශනය ඉගැන් වෙනව ද ළමයින්ට?

උ: මා ඉහත සඳහන් කළ සංවිධාන යටතේ පවතින මද්‍රසා සහ අරාබි පාසල් වල ඔවුන් එය උගන්වනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ කිව්වා මීට කලින් මුස්ලිම් පල්ලි ඉදිකිරීමේ දී ඒක මුස්ලිම් ආගමික සංස්කෘතික අමාත්‍යාංශය මගින් ලියා පදිංචි කළ යුතුයි කියලා?

උ: ඔව්.

ප්‍ර: ඒ වුණත් ඔබ කියන පරිදි මේ වහාබ්වාදී අන්තවාදී අදහස් හා සම්බන්ධ මුස්ලිම් පල්ලි මේ රට තුළ තියෙනවා?

උ: ඔව්.

ප්‍ර: දැන් ඒ ප්‍රශ්නේ මගහරවා ගන්න ඔබට හිතෙන විදියට මේ හොඳම ක්‍රමය මොකද්ද?

උ: පල්ලි ඇති කිරීමේ දී එය ලියාපිදංචි කළ යුතු යැයි නීතියෙන් කියා තිබුණ ද සියළුම පල්ලි ලියා පදිංචි කරන්නේ නැත. ඒ නිසා ලියා පදිංචිය අනිවාර්ය කළ යුතුයි. ඒ සමඟම තවද වහාබිසම් පල්ලි ලියා පදිංචි කර තිබෙනවා. සමහර පල්ලි . සමහර ආයතන පාර්ලිමේන්තු පනත් මගිනුත් අනුමත කරලා තිබෙනවා. එබැවින් වහාබිසම්ම හඳුනාගත්ත අයගේ මණ්ඩලයක් පිහිටුවා මෙවැනි පල්ලි ලියාපදිංචි කිරීම තහනම් කළ යුතුයි.

ප්‍ර: ඒ තහනම් කිරීම් පාර්ලිමේන්තු පනතක් මගින් ද කරන්න ඕන. ඔබගේ අදහස අනුව?

උ: ඔව් පාර්ලිමේන්තු පනතක් මගින් වහාබිසම් වාහාබ් වාදය මුළු ශ්‍රී ලංකාවෙන්ම තුරන් කළ යුතුයි. ලෝකයේ විවිධ රටවල් වලිනුත් වහාබ් වාදය තහනම් කර තිබෙනවා දැනටමත්. ඊජිප්තුවේ තහනම් කර තිබෙනවා.

ප්‍ර: රටවල් වල නම් කියන්න ඔක්කොම?

උ: ඊජිප්තුව, ටියුනීසියාව, චෙච්නියාව, මැලේසියාවේ තහනම් කර තිබෙනවා. සිරියාවේ තහනම් කර තිබෙනවා.

ප්‍ර: එච්චරද?

උ: එච්චරයි.

Project Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔබ යෝජනා කරන පරිදි වහාබ්වාදය තහනම් කිරීම සහ වහාබ් වාදයට අදාළ පල්ලි ලියාපදිංචි කිරීම තහනම් කරන ඒ ක්‍රමවේදයට ඇතුළත් විය යුතු පුද්ගලයින් කොහොමද හොයාගන්නේ?

උ: ශ්‍රී ලංකාව පුරාම සූෆි මුස්ලිම්වරුන් වාසය කරනවා. සූෆි මුස්ලිම්ගේ ඉස්ලාම් ධර්මය පිළිබඳ දන්නා විද්වතුන් ඉන්නවා. ඔවුන්ට වහාබිසම් වහාබ් වාදය පිළිබඳ ඔවුන්ගේ අන්තවාදී කටයුතු පිළිබඳවත් හොඳ දැනීමක් තිබෙනවා. මා සතුව දැන් තිබෙන්නේ වාහාබ් වාදයට එරෙහිව අපි විසින් ප්‍රකාශයට පත්කළ ග්‍රන්ථයක්.

ප්‍ර: එතකොට ලංකාව තුළ තිබෙන මද්‍රසා වල වහාබ් වාදය උගන්වන මද්‍රාසා තියෙනව ද?

උ: ඔව් තිබෙනවා.

ප්‍ර: එතකොට ලංකාව තුළ තියෙන මද්‍රසා වල වහාබ් වාදය පැතිරෙන එක නවත්වන්න ඔබ යෝජනා කරන ක්‍රමවේදයන් මොකද්ද ?

උ: මද්‍රසා වල උගන්වනු ලබන පාඨමාලාව සම්බන්ධයෙන් පරිශීලනය කර වහාබ්වාදයට තුඩු දෙන පාඨමාලාවන් තහනම් කළ යුතුයි. තවද විදේශ රටවලින් වහබ්වාදය පැතිරවීමට තුඩු දෙන ග්‍රන්ථයන් ලංකාවට ගෙන්වනු ලබනවා. ඒවත් තහනම් කළ යුතුයි.

ප්‍ර: ඔබ යෝජනා කරනව ද මද්‍රසා ආයතනත් ලියාපදිංචි කිරීම අනිවාර්ය කිරීමක්?

උ: ලියාපදිංචි කළ යුතුයි ඒ වගේම පාරම්පරික සූෆි ආගම් දැක්වෙන පාඨමාලා තමයි උගන්නන්න ඕන වහබ්වාදය උගන්වන පාඨමාලාවන් තහනම් කළ යුතුයි.

ප්‍ර: දැන් මද්‍රසා පාසල් වලට යන ළමයි සතියේ මුළු දවස් පහක්ම යන්නේ ඒ මද්‍රසා පාසල් වලට ද යන්නේ?

උ: උදේ වරුවේ සාමාන්‍ය ඉස්කෝලේට එකට යනවා. හවසවරුවේ තමයි මද්‍රසා පාසල් වලට යන්නේ. නමුත් සමහර මද්‍රසා වල 6 සහ 7 දක්වා රජයේ පාසල් වල ඉගෙනුම ලබලා ඔවුන් මද්‍රසා පාසල් වලට පමණක් යනවා. රජයේ පාසල් වලට යන්නේ නැත.

දැන් වේලාව පස්වරු **06.30** ට ආසන්න හින්දා සාක්ෂිකරුට ගිහිල්ලා ඔහුගේ ආගමික වතාවත් කරන්න අපි ඔහුව තාවකාලිකව මුදා හරිනවා.

නැවත කොමිෂන් සභාව පස්වරු **6.45** රැස්වෙනවා.

වේලාව:ප.ව. **.6.30**
මෙතැන් සිට: නිල්මිණි මෙනවිය.

FAIR COMMENT
BY JEZEEM

දැන් වේලාව: ප.ව.6.55
පෙර සටහන් ල/ලේ: සචිනි මෙනවිය
මෙතැන් සිට ල/ලේ: නිල්මිණි.

සාක්ෂිකරු දමිළ බසින් ප්‍රතිඥා දෙයි.
මම කියන සාක්ෂිය සැබෑ ය. සම්පූර්ණ සැබෑ ය. බොරුවක් නොකියන බවට ප්‍රතිඥා දෙමි.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: සාක්ෂිකරු ඔබ දන්නවාද මොහොමඩ් සහරාන් අයිති නැත්තම් ඔහු විසින් කාත්තන්කුඩියේ පල්ලියක් හැදුවා කියලා?

පි: ඔව්.

ප්‍ර: ඒ ඉස්සෙල්ලා කුඩා ස්ථානයක් වශයෙන් නේද තිබ්බේ?

පි: ඔව්. මුල් අවධියේ දී පැලක්

ප්‍ර: ඒක ලොකුවට හදන්න පටන් ගත්තේ කොයි කාලේ ද?

පි: 2014 වර්ෂයේ 2015

ප්‍ර: දැන් 2017 මාර්තු 17 වෙනිදා අලිගාර් හන්දියේ සිබ්ලියෙන් පස්සේ සහරාන් හිටියේ නැහැ නේද ඒ ප්‍රදේශයේ?

පි: ප්‍රසිබ්ලියේ සිටියේ නැහැ.

ප්‍ර: ඒ වුණත් ඒ පල්ලිය ගොඩනැඟීමේ කටයුතු ඉදිකිරීමේ කටයුතු දිගටම ගියා නේද?

පි: ඔව්.

ප්‍ර: එතකොට ඒ අවස්ථාවේ දී ඒ පල්ලියේ ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් කවුද බැලුවේ?

පි: තවුහි කියලා ඔහුගේ මිත්‍රයෙක් හිටියා. සෙයිනි කියලා ඔහුගේ සහෝදයෙක් හිටියා. ඔවුන් එම කටයුතු වල නිරත වුණා.

ප්‍ර: දැන් ඔබ කියන හැටියට මොහොමඩ් සහරාන් කියන අය දේශපාලඥයින් සමඟ යම්කිසි කටයුතු කෙරුවා?

පි: ඔව්.

ප්‍ර: ඒ විදිහට සහරාන් කටයුතු කරපු දේශපාලඥයින් අතරින් සහරාන් වඩාත්ම ළඟින් කටයුතු කෙරුවේ කවුද?

පි: ළඟින්ම එක්කෙනෙක් ඇසුරු කළා යැයි කියන්න බැහැ. නමුත් පොදුවේ හැම දේශපාලඥයෙක් සමඟම ඔහු කටයුතු කළා.

ප්‍ර: දැන් සාක්ෂිකරු අපිට කිව්වා 2015 අගෝස්තු මාසයේ තියෙන මහා මැතිවරණයේ දී කාත් එක්කද කටයුතු කෙරුවේ කියලා?

පි: ඔව්

ප්‍ර: එතකොට කිව්වා සාක්ෂිකාරයා මහා මැතිවරණයට කළින් පුද්ගලයන් කිහිප දෙනෙක් එක්ක ගිවිසුම් ගත වුණත් මහා මැතිවරණයේ දී සහරාන් සහ ඔහුගේ කණ්ඩායම වැඩ කෙරුවේ එක්තරා දේශපාලන පක්ෂයකට කියලා ?

පි: ඔව්.

ප්‍ර: සාක්ෂිකරු තව දුරටත් කිව්වා ඒ දේශපාලන පක්ෂය ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය මුස්ලිම් කොංග්‍රසය වෙනුවෙන් සහරාන් සමඟ ගිවිසුම්ගත වුණේ සාක්ෂිකරු හැටියට ශිබ්ලි ෆාරුක් කියලා?

පි: ඔව් එම ඡන්දයේ දී එසේ තමයි පැවතුණේ.

ප්‍ර: එතකොට ඒ ශිබ්ලි ෆාරුක් සහ සහරාන් අතර සම්බන්ධතාවය කොපමණ කලක පෙර සිටද තිබ්බේ?

Private & Confidential Copy

FAIR COMMENT BY JEZEEM

පි: මැතිවරණ සමයේ දී තමයි ඔවුන් දෙදෙනාගේ කටයුතු ප්‍රසිබ්ලියේ දැක ගැනීමට ලැබුණේ. ඊට පෙර තිබුණා ද කියලා මා දන්නේ නැහැ.

ප්‍ර: ඊට පසුව?

පි: ඊට පසුව මැතිවරණ කටයුතු නොතිබුණු නිසා ඔහුගේ පල්ලියට මෙම පුද්ගලයා ශිබ්ලිෆාරුක් යන තැනැත්තා ඒ පල්ලියට යනවාද එනවාද කියලා ඒ පිළිබඳව මා දන්නේ නැහැ.

ප්‍ර: මැතිවරණයට ඉස්සෙල්ලා ශිබ්ලිෆාරුක් ඒ පල්ලියට යනවා එනවා වගේ දැක්කාද?

පි: එසේ මම දැකලා නැහැ. නමුත් ඔහු සමඟ ගිවිසුම් ඇතිකර ගත් බව මා දන්නවා.

මේ අවස්ථාවේදී සාක්ෂිකරුට ඡායාරූපයක් පෙන්වයි.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>

ප්‍ර: මෙහි සිටින පුද්ගලයින් හඳුනා ගත හැකිද?

පි: ඔව්.

ප්‍ර: මෙම ඡායාරූපයේ දකුණුපස කොනේම ඉන්න පුද්ගලයා කවුද?

පි: ශිබ්ලි ෆාරුක්

ප්‍ර: ශිබ්ලි ෆාරුක්ගේ වම්අත පැත්තෙන් ඒ කියන්නේ ඡායාරූපයේ දකුණු පස අග්‍රයේ සිට එනකොට දෙවැනියාට ඉන්න පුද්ගලයා ඒ කවුරු දැයි ඔබට හඳුනා ගන්න පුළුවන්ද?

පි: මුස්ලිම් කොංග්‍රසයේ නායක රවුෆ් හකීම්.

ප්‍ර: රවුෆ් හකීම්ට වම්අත පැත්තෙන් ඉන්න පුද්ගලයාව ඔබට හඳුනා ගැනීමේ හැකියාවක් තියෙනවාද?

පි: බැහැ.

ප්‍ර: මේ ඇඳක වාඩි වී හිසේ වේලුම් පටි සහ අතේ වේළුම් පටි යොදාගෙන උඩු කයට කිසිවක් ඇඳගෙන නැතිව ඉන්න පුද්ගලයා ඔබට හඳුනා ගන්න පුළුවන්ද?

පි: හඳුනා ගැනීමට පුළුවන්.

ප්‍ර: කවුද ඒ?

පි: ඔහු රිල්වාන් නැමැත්තායය.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: රිල්වාන් කියන්නේ සහරාන්ගේ සහෝදරයාද?

පි: ඔව්.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔබ රිල්වාන් ලෙස හඳුනා ගත් පුද්ගලයාට වම්පසින් ඉන්නේ කවුද එම පුද්ගලයා ඔබට හඳුනා ගන්න පුළුවන්ද?

පි: ඔහුව මට හඳුනා ගැනීමට නොහැකිය.

ස්වාමිනි ඒ අනුව මෙම සාක්ෂිකරුට පෙන්වූ ඡායාරූපය **C-689**වශයෙන් ලකුණු කිරීමට අවසර අයැද සිටිනවා. එමෙන්ම එම සාක්ෂිකරු විසින් ශිබ්ලිෆාරුක්, රවුෆ් හකීම් සහ රිල්වාන් යන අය හඳුනා ගත් බවට සටහන් කරන මෙන් ගෞරවයෙන් අයැද සිටිනවා.

වීඩියෝවක් දර්ශනය කරයි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: දැන් සාක්ෂිකරු ඔබ කිව්වා නේද ඔබගේ සංවිධානයේ භාරයේ නම අල්හාජ් අබ්දුල් ජමාද් ආලිම් වලිඋල්ලා කියලා?

පි: ඔව්. අල්හාජ් අබ්දුල් ජමාද් ආලිම් වලිඋල්ලා ට්‍රස්ට්.

ප්‍ර: ඒක නේද?

පි: ඔව්.

ප්‍ර: දැන් ඒකේ නම කාගේ නම ද?

පි: දැනට කාත්තන්කුඩියේ සිටින සුෆි මුස්ලිම් නායකයාගේ පියාගේ නමින් තමයි එය පිහිටුවා තිබෙන්නේ.

ප්‍ර: මම ඒ ප්‍රශ්නය ඇහුවේ නැගෙනහිර පළාතේ තියෙනවාද විදේශ රටවල් වල පුද්ගලයන්ගේ නම් වලට ඇරපු ආයතන සහ පල්ලි?

පි: මා දන්න තරමින් නැත.

ප්‍ර: කාත්තන්කුඩියේ පාරවල් වලනම් අරාබි භාෂාවෙන් තියෙනවා නේද?

පි: එසේ කලින් ලියා තිබුණා. සමහර ඒවා දැන් ඒවා වෙනස් කරලා තියෙන්නේ. ඒ නාම පුවරු.

ප්‍ර: නමුත් තාමත් අරාබි භාෂාවෙන් තියෙනවා නේද නාම පුවරු?

පි: දැනට එසේ තිබෙනවාද කියලා මම දන්නේ නැහැ. නමුත් කලින් එසේ සඳහන් අරාබි භාෂාවෙන් සඳහන් වුණු නාම පුවරු තිබුණා.

ප්‍ර: දැන් ඔබ කාත්තන්කුඩි ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරි නේද?

පි: ඔව්.

ප්‍ර: ඉතින් ඒ ප්‍රදේශය ඔබ හැමදාම ඉන්න ප්‍රදේශයක් නේද?

පි: ඔව්.

ප්‍ර: එතකොට ඔය ඉන්න ප්‍රදේශයේ දැක්කේ නැද්ද නාම පුවරු මේ වෙනකොටත් අරාබි භාෂාවෙන් තියෙනවාද නැද්ද කියන එක?

පි: ටික දවසකට කළින් අරාබි භාෂාවෙන්, දෙමළ භාෂාවෙන්සිංහල භාෂාවෙන් ලියැවිලා තිබුණා. ඊට පස්සේ ඒවා වෙනස් කරලා තිබ්බා. මම ඒ ගැන වැඩිය උන්නදුවෙන් අවධානය යොමු කළේ නැහැ ළඟදී.

President's Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: අරාබි භාෂාවෙන් නාම පුවරු තියෙන්න පටන් ගත්තේ කොයි කාලේද?

පි: වර්ෂ 2011ට පසුව තමයි එසේ අරාබි භාෂාවෙන් නාම පුවරු ලිවීමට පටන් ගත්තේ.

ප්‍ර: 2011න් පස්සේ?

පි: 2011ට පස්සේ.

ප්‍ර: ඔබ හිතන විදිහට ඒ විදිහට අරාබි භාෂාවෙන් නම් ප්‍රදර්ශනය කළ යුතුද?

පි: අවශ්‍යතාවයක් නැත.

ප්‍ර: ඒ 2011 දී අරාබි භාෂාවෙන් ඒ නාම පුවරු හදන්න පටන් ගත්තේ කවුද?

පි: කාත්තන්කුඩි නගර සභාව විසින් තමයි මෙම නාම පුවරු පරිපාලනය කරනු ලබන්නේ. ඒ නිසා කාත්තන්කුඩි නගර සභාවේ අනුමැතිය ඇතිව තමයි මේ සිදුවී ඇත්තේ.

ප්‍ර: කවුද ඒ කාලේ කාත්තන්කුඩි නගර සභාවේ සභාපති?

පි: 2011 සිට අද දක්වා ආණ්ඩු 2 කාලවකවානු වල දී අස්වර් නැමැති අය තමයි සභාපති වශයෙන් කටයුතු කළේ.

ප්‍ර: ඒ බලය තිබෙන්නේ කාටද?

පි: UPFA පක්ෂයට තමයි බලය තියෙන්නේ.

ප්‍ර: ඒ අස්වර් කියන පුද්ගලයා සූෆි මුස්ලිම්වරයෙක්ද නැත්තම් වෙනත් නිකායට අයිතිද?

පි: ඔහු සූෆි මුස්ලිම්වරයෙක් නොවේ.

ප්‍ර: මොකක්ද නිකාය?

පි: ඔහු වහබ්වාදයට ඇතුළත් වෙන පුද්ගලයෙක් තමයි.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබට මතක ද 2017 මාර්තු මාසේ 13 වෙනිදා මුස්ලිම් ජනතාව කාත්තන්කුඩියේ උද්ඝෝෂණ ව්‍යාපාරයක් පැවැත්වුවා?

පි: ඔව්.

ප්‍ර: ඒ අය ඉල්ලුවේ මොනවද ඒ උද්ඝෝෂණය පවත්වලා?

පි: සහරාන් නැමැත්තා සූෆි මුස්ලිම් කෙනෙක්ව කඩුවෙන් කොටා සැඟවුණා. තවත් පුද්ගලයෙක්ව ඔහුගේ කණ්ඩායම විසින් තුවාල කරන්නට යෙදුණා. එබැවින් ඔහුව අත්අඩංගුවට ගෙන නීතිය ඉදිරියේ පමුණුවන ලෙස ඉල්ලා තමයි එම උද්ඝෝෂණ ව්‍යාපාරය පැවැත් වුවේ.

ප්‍ර: දැන් ඔබ හැමදාම කාත්තන්කුඩියේ හිටපු කෙනෙක් නේද?

පි: ඔව්.

ප්‍ර: ඔය සිබ්ලිය වුණ දවසෙන් පස්සේ සහරාන් ඔය පළාතේවත් හිටියේ නැහැ කියලා මේ කොමිෂන් සභාවේ සාක්ෂි දුන්නු පොලිසියේ නිලධාරින් පවසලා තියෙනවා. ඒ කතාව ඇත්තද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඔහු ස්ථිර වශයෙන් පදිංචි වී සිටියේ නැත ප්‍රසිබ්ලියේ. නමුත් ඔහු රහසිගතව අවස්ථා කිහිපයක කාත්තන්කුඩියට ඇවිල්ලා ගිහින් තිබෙන බව කාත්තන්කුඩි මහජනතාව සැක කරනවා.

ප්‍ර: දැකපු අය ඉන්නවාද?

පි: දැකපු කෙනෙකු නැත.

ප්‍ර: දැන් එතකොට ඔහු ඒ කාලේ කාත්තන්කුඩියට ආවේ නැත්තම් පේන්න කිසිම කෙනෙකුට ආවේ නැත්තම් ඔහු කොහොමද මේ අන්තවාදී කටයුතු එහේ ඔච්චර ඉක්මනට කිසිම කරදරයකින් තොරව මේ පවත්වාගෙන ගියේ?

පි: දුරකතන මඟින් හෝ වෙනත් යම් ක්‍රමයකින් ඔහුගේ කණ්ඩායම සමඟ ඔහු සම්බන්ධ වී එම කටයුතු පවත්වාගෙන යන්න ඇති.

ප්‍ර: ඔබට ඒ පිළිබඳ තොරතුරු ලැබුණාද ඒ කාලේ ?

පි: ඔහු ඇවිත් ගිය බව ඔප්පු කිරීමට සාක්ෂි කිසිවක් ලැබුණේ නැහැ.

ප්‍ර: ඔබ දන්නවාද මේ කාත්තන්කුඩි ප්‍රදේශයේ මුස්ලිම් අය සාමාන්‍යයෙන් ජනග්‍රහණය 65000ක් විතර ඉන්නවා කියලා?

පි: සාමාන්‍යයෙන් 50000ක් පමණ ජනතාවක් ජීවත් වෙන්නේ.

ප්‍ර: හොඳයි. අපිට වාර්තා 65000ක් ඉන්නවා කියලා ඒකයි ඇහුවේ. හොඳයි 50,000ක් ඉන්නවා කියමුකෝ. තමුන් දන්නා විදිහට මේ 50000න් ඔය සූෆි මුස්ලිම් අය සූෆි විදිහට කටයුතු කරන ගතානුගතික මුස්ලිම් අය කොමපණ විතර ප්‍රමාණයක් ඉන්නවාද?

පි: දළ වශයෙන් 10000ක් පමණ.

ප්‍ර: ඒ කියන්නේ ඉතුරු 40,000 සහරාන්ගේ අනුගාමිකයෝ වගේ අන්තවාදී අදහස් දරණ අයද?

පි: එසේත් නොවේ.

ප්‍ර: එහෙනම් දෙපැත්තටම නැති උදවියත් ඉන්නවාද?

පි: ඔව්. එවැනි අයවලුත් සිටිනවා.

ප්‍ර: එතකොට වැඩිපුර ඉන්නේ ඒ දෙපැත්තටම සම්බන්ධයක් නැති අයද?

පි: සාමාන්‍යයෙන් ජනගහනයෙන් භාගයක් දෙපැත්තට මේ කටයුතු වල නොයෙදෙන අය තමයි ඉන්නේ. දෙපැත්තටම නැති අය භාගෙට.

ප්‍ර: ඒ බයටද එහෙම කොයි පැත්තටවත් සහයෝගයක් නොදී ඉන්නේ ඔබ හිතන විදිහට?

පි: අවුරුදු 30කට පෙර කාත්තන්කුඩියේ වෙසෙන සියලුම මුස්ලිම්වරුන් සූෆි මුස්ලිම්වරුන් වශයෙන් තමයි ජීවත් වුණේ.1979 දී සමස්තලංකා උලමා සභාව විසින් ප්‍රකාශයට පත් කරන්නට යෙදුණා වූ ෆතුවාව හේතු කොට ගෙන අනික් මුස්ලිම්වරුන් සූෆි මුස්ලිම්වරුන් සමඟ එකතු වීමට කටයුතු කිරීමට මැලිකමක් දැක්වුවා. එසේ සිටින විට 1990 වන විට වහාබිසම් පිළිබඳව අන්තවාදය නෙවේ මූලික මතයන් ප්‍රකාශ කිරීම එය ප්‍රචාරය කිරීම ආරම්භ වෙමින් තිබුණා 90.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබ හිතන විදිහට ඒ ආකාරයට ඔබලාගේ 1979 දී ඇති වෙච්ච මිනිස්සුන්ගේ වෙනස හිත්වල පරිවර්තනයක් ඇති කරන්න හේතු වුණාද?

පි: ඔව්. එසේ හිත් තුළ වෙනස්කම් ඇති වුණා. සූෆි පිළිවෙත අනුගමනය කිරීමට බොහෝ අයවලුන් බය වුණා.

ප්‍ර: දැන් ඔබ හිතන විදිහට දැනට කාත්තන්කුඩි පැත්තේ ඉන්න මුස්ලිම් ජනතාව සූෆි ක්‍රමයට නැඹුරුවට වැඩිය අන්තවාදී ක්‍රමයට වැඩි නැඹුරුවක් තියෙන බවක් පේනවා නේද?

පි: බොහෝ අය බය නිසා වහබ්වාදය පිළිගන්නා අයවලුන් සේ ඉන්නවා. නමුත් කොටසක් ඉන්නවා වහබ්වාදය අනුගමනය කරන.

ප්‍ර: ඔබ හිතෙන විදිහට සහරාන් සහ ඔහුගේ ළඟමහිටපු අනුගාමිකයෝ මේ 2015 දී ඒ කාලේ ඔය ජනාධිපති හැටියට හිටපු මෛත්‍රීපාල සිරිසේන ඒ මැතිතුමාගේ පැත්තට උදව් කරන්න හේතු වුණේ මොකක්ද ඔබ දකින විදිහට?

පි: මා දන්නා තරමින් දැනට අගමැතිව සිටින මහින්ද රාජපක්ෂ මැතිතුමාව බොහෝ මුස්ලිම් අයගේ සහයෝගය ලැබුණේ නැහැ ඔහුට. ඒ නිසාම ඔහු සහරානුත් මහින්ද රාජපක්ෂ මැතිතුමාට විරුද්ධව කටයුතු කර ඇතැයි මම සිතනවා.

ප්‍ර: ඒක ඔබේ අදහස නේද?

පි: ඔව්.

ප්‍ර: දැන් ඔබට කියන්න පුළුවන්ද දැන් කාත්තන්කුඩියේ ඉන්න මිනිස්සු ඒ කියන්නේ මුස්ලිම් ජනතාව සහරාන් නැති නිසා ඔවුන් සහරාන් නැති වෙච්ච එක ගැන සතුටක් තිබෙනවාද?

පි: සූෆි මුස්ලිම්වරුන් සන්තෝෂයෙන්තමයි සිටින්නේ. ප්‍රචණ්ඩත්වය ප්‍රිය නොකරන මිනිස්සු සතුටින් ඉන්නවා. නමුත් සහරාන්ගේ අනුගාමිකයන් 1000ක් පමණ දෙනා නොසතුටෙන් ඉන්නවා.

ප්‍ර: ඒ අය තවමත් ක්‍රියාකාරීව ඉන්නවා කියලා ඔබ සාක්ෂි දෙමින් කිව්වානේ ඉස්සෙල්ලා?

පි: ඔව්. ඔවුන් තවමත් වහාබිසම් මතය අනුගමනය කරමින් තමයි සිටින්නේ.

ප්‍ර: ඒ අය ඉදිරියේ දී අනාගතයේ දී මේ රටට තර්ජනයක් කියලා ඔබ දකිනවාද?

පි: ඔව්. එසේ ඇතිවීමට හැකිය.

ප්‍ර: එහෙනම් එය වහාම නතර කරන්න නැත්තම් සම්පූර්ණයෙන්ම විනාශ කරලා දාන්න ඔබ කොයි ආකාරයේ යම් දෙයක් යෝජනා කරනවාද මේ කොමිෂන් සභාවට? මම ඒ ප්‍රශ්නය අහන්නේ ලංකාවේ මිනිස්සුන්ට ආරක්ෂිතව සුරක්ෂිතව ඉන්න පුළුවන් වෙන විදිහේ පරිසරයක් නිර්මාණය කිරීමේ බලාපොරොත්තුවෙන්.

පි: මම යෝජනා සහිත පොතක් ගෙනල්ලා තියෙනවා. ශ්‍රී ලංකාවේ සිට වහාබ්වාදය තුරන් කිරීමට ගත යුතු පියවර පිළිබඳව අපගේ සංවිධානය විසින් මෙහි යෝජනා ඇතුළත් කරලා තියෙනවා. මෙම පොතේ යෝජනා

FAIR COMMENT BY JEZEEM

25ක් එසේ නිර්දේශ කර තිබෙනවා. මෙම ගරු කොමිෂන් සභාව කැමැත්තක් දක්වනවා නම් මම ඒක භාර දෙන්න පුළුවන්.

ප්‍ර: ඒ 25 ඉස්සෙල්ලාම කෙටියෙන් කියාගෙන යන්න මේවායි කියලා. එතකොට වාර්තා වෙනවානේ . කරුණු හැටියට කෙටියෙන් කියන්න 25 මොනවද කියලා

පි: 1. සමස්ත ලංකා උලමා සභාව විසින් ජමෙයිතුල් උලමා සභාව විසින් 1979 ප්‍රකාශයට පත් කරන ලද ෆත්වාව අවලංගු කළ යුතුයි. තවද මෙවැනි ඉස්ලාම් ධර්මය පිළිබඳව ෆත්වා ප්‍රකාශ කිරීමේ බලය තවදුරටත්ඔවුන් සතුව නොතිබිය යුතුයි.

2. අරාබි පාසල් වල තියෙන පාඨමාලාව සූෆිවරුන්ගේ මතයට අනුගමනය කරන මතයකින් යුක්ත විය යුතුයි.

3. අරාබි පාසල් වල ඉගෙනුම ලබන ළමයි අනිවාර්යෙන්ම රජයේ පාසල් වල වසර 1 සිට 13 දක්වා අනිවාර්ය අධ්‍යාපනය ලබා දිය යුතුයි.

4. විදේශ රටවල සිට වහාබ්වාදය යුතුව සංවිධාන වලට ලැබෙන මූල්‍ය ආධාරය පිළිබඳව විමර්ශනය කර එය නතර කළ යුතුයි.

6. සියලුම මුස්ලිම් පල්ලි ලේඛනගත කළ යුතුයි. ඒ වගේම සූෆි මුස්ලිම්වරුන්ගේ ඇදහීමේ යාච්ඤා ක්‍රමය තමයි පල්ලි වල දී සිදු කළ යුතුයි.

7. මුස්ලිම් සංස්කෘතික අමාත්‍යාංශයට පත්කරනු ලබන උසස් නිලධාරින් සූෆි මුස්ලිම්වරුන්ගේ මතය අනුගමනය කරන අයවලුන් විය යුතුයි.

8. ශ්‍රී ලංකාව තුළ වහාබ්වාදය මුළුමනින්ම, සංවිධාන පමණක් නොවෙයි වහාබ්වාදය සම්පූර්ණයෙන් මුළුමනින්ම තහනම් කළ යුතුයි. එයට ඇතුළත්ව වහාබ්වාදය සම්බන්ධයෙන් ප්‍රකාශයට පත්කරලා ඇති ග්‍රන්ථයන් මෙම රටින් තහනම් කළ යුතුයි. ඉවත් කළ යුතුයි.

9. පාසල් පොත් වල අන්තවාදී මතය දරණ විෂයන් කුමක් ද කියා සොයා බලා ඒවා ඉවත් කළ යුතුයි.

10. විශ්වවිද්‍යාල වල අරාබි භාෂාව සම්බන්ධයෙන් උගන්වන ලබන පාඨමාලාවන්, Islamic Studies , Arabic Language (අරාබි භාෂාව) යන සියලුම විෂයන්සූෆි මතය දරණ පාඨමාලාවන් විය යුතුයි.

11. මවුලවි පදවිය පට්ටම ලැබූ අයට විදේශ රටවල නොයෙකුත් ශිෂ්‍යත්ව ලබා දෙනවා.විශේෂයෙන් සෞදි අරාබියේ තිබෙන විශ්ව විද්‍යාල වලට උසස් අධ්‍යාපනය සඳහා ඔවුන් යොමු කරවනු ලබනවා. ඔවුන් එහේ වහාබ්වාදය පිළිබඳව වැඩිදුර අධ්‍යාපනය ලබමින් මෙම රටතුළට පැමිණ එය මෙම රට තුළ ප්‍රචාරය කිරීමේ කටයුතු වල නිරත වෙනවා. මෙසේ වහාබ්වාදය ප්‍රචාරය කරන පිටරට විශ්ව විද්‍යාල වලට ශිෂ්‍යත්වය ලබා දී යන ක්‍රමයි අහෝසි කළ යුතුයි.ඉස්ලාම් ආගමේ පමණක් නොව අනිත් ආගම්වලත් මෙසේ අන්තවාදී ලෙස කටයුතු කරන සංවිධාන තියෙනවා. ඒ සියලු සංවිධාන ද මේ රටින් තහනම් කළ යුතුය.

ප්‍ර: එපමණයිද හරි බොහොම ස්තුතියි.

****

<u>ගරු විනිසුරු අදිකාරි මැතිනිය</u>

ප්‍ර: සාක්ෂිකරු මම ඔබගෙන් ඉස්සෙල්ලාම අරාබි භාෂාව පිළිබඳව ප්‍රශ්නයක් අහන්න කැමැතියි මෙම කොමිෂමට ඉදිරිපත් වෙච්ච කරුණු මත පදනම්ව මීට පෙර. ඔබ දැන් කාත්තන්කුඩි ප්‍රදේශයේ වසර 40ක් පමණ ජීවත් වෙන නිසා ඔබට ඉතා හොඳින් අරාබි භාෂාව කතා කිරීමට හා තේරුම් ගන්න පුළුවන්ද?

පි: මම අරාබි පාසලක ඉගෙන ගෙන මවුලවි පට්ටම පදවිය තනතුර ලබා තිබෙන නිසා බොහෝ දුරට අරාබි භාෂාව පිළිබඳ දැනීමක්, තේරුම් ගැනීමේ හැකියාවක් තිබෙනවා.

ප්‍ර: එතකොට කාත්තන්කුඩි ප්‍රදේශයේ මුස්ලිම් ජනතාව 50,000ක් විතර ඉන්නවා කියලා ඔබ කිව්වානේ?

පි: ඔව්.

ප්‍ර: එතකොට කාත්තන්කුඩි ප්‍රදේශයේ මුස්ලිම් ජනතාවගේ කතා කරන භාෂාවක් ද අරාබි භාෂාව?

පි: නැත දෙමළ භාෂාව.

ප්‍ර: එතකොට සහරාන් කියන පුද්ගලයා අර බෝම්බකරුවා ඔහුගේ අන්තවාදී දේශන කාත්තන්කුඩි ප්‍රදේශයේ අරාබි භාෂාවෙන් ද කළේ?

පි: නැහැ. දෙමළ භාෂාවෙන් තමයි පැවැත්වුණේ.

ප්‍ර: මොකක්ද මේ දාවූර් අදර් අස්ලාවියා කියන්නේ අරාබි වචනයක්ද?

පි: ඔව්.

ප්‍ර: තේරුම මොකක්ද ඒ වචනයේ?

පි: කෙළින්ම නබිතුමා විසින් ප්‍රකාශ කළ මතය පිළිපදිමින් අනුගමනය කරමින් කටයුතු කරන සංවිධානය.

ප්‍ර: National Front for Good Governanceකියන්නෙත් People's Movement for Good Governanceකියන්නේ එකක්ද?

පි: මේ මුල් අවස්ථාවේ දී PMGGකියලා තිබ්බා. ඊට පස්සේ NFGGවශයෙන් නම වෙනස් කරලා තියෙනවා.

ප්‍ර: මෙම සංවිධානය ඉක්වාන් මුස්ලිම් කියන සංවිධානය හා සම්බන්ධයි ද?

පි: ඒ පිළිබඳව මා දන්නේ නැහැ.

ප්‍ර: ජමාතේ ඉස්ලාම් කියන එකට සම්බන්ධයිද?

පි: ඒ ගැන මම දන්නේ නැහැ. ඔවුන් දේශාපලන කටයුතු වල තමයි යෙදෙන්නේ.

ප්‍ර: එහෙමනම් කවුද මෙම සංවිධානයට දේශපාලන නායකත්වයක් දෙන්නේ?

පි: අබ්දුල් රහුමාන් යන පුද්ගලයා.

ප්‍ර: එයා කොහේද ඉන්නේ?

පි: ඔහු කාත්තන්කුඩියේ පදිංචි පුද්ගලයෙක්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: කුමන දේශපාලන පක්ෂයක් එක්කද ඔහු ඉන්නේ?

පි: NFGG යන....

ප්‍ර: නැහැ. දැන් ලංකාවේ තියෙනවානේ දේශපාලන පක්ෂ ඒවායින් කාත් එක්කද මෙයා සම්බන්ධ වෙලා ඉන්නේ?

පි: විටින් විට කාලයෙන් කාලයට අනිකුත් ජාතික දේශපාලන පක්ෂ සමඟ එක්වී කටයුතු කරනවා.

ප්‍ර: 2015 දී ජනාධිපතිවරණයේ දී සහ 2015 මහාමැතිවරණයේ දී මේ පක්ෂය කාට ද උදව් කළේ?

පි: පාර්ලිමේන්තු මැතිවරණයේ දී ඔවුන් තනිවම තරඟ කරා. ජනාධිපති මැතිවරණයේ දී හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ පක්ෂයට ඔහුට සහාය දක්වමින් කටයුතු කළා.

ප්‍ර: ඔබ සහරාන් දේශනා පවත්වපු හිස්බුල්ලා ශාලාව එකක් ගැන කිව්වානේ ඒක ආණ්ඩුවේ ගොඩනැඟිල්ලක් ද?

පි: ඔව් රජයට අයිති.

ප්‍ර: මේ නම හිස්බුල්ලා කියලා දාලා තියෙන්නේ අර හිස්බුල්ලා කියන politicianගේ නම ද?

පි: ඔව් හිස්බුල්ලා කියන දේශපාලඥයාගේ නම.

ප්‍ර: හිස්බුල්ලාද ඒක හදන්න සල්ලි වියදම් කරලා තියෙන්නේ?

පි: ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රී වශයෙන් කටයුතු කළ අවස්ථාවේ දී එය නිර්මාණය කිරීම සඳහා ඔහු ප්‍රතිපාදන වෙන් කරනවා.

ප්‍ර: ඔබ මෙම කොමිෂ මේ පොලිස් ඒකකයට ලබා දීපු ප්‍රකාශයේ තියෙනවා 2009, 2010 වසර වලින් එකක දී සහරාන් ජපානයට ගිය බව. ඔබ මෙම ප්‍රකාශය කරන්නේ එය සනාථ කිරීමට කරුණු ඇතුවද එහෙම නැත්තම් නිකන්ද?

පි: සාක්ෂි කිසිවක් නැහැ ඔප්පු කිරීමට. නමුත් මට දැන ගන්නට ලැබුණු කරුණක්.

ප්‍ර: ඔබ නැගෙනහිර අග්නිදිග විශ්ව විද්‍යාලයේ ඔලුවිල් විශ්ව විද්‍යාලයේ ඉගෙන ගත්තා නේද?

පි: ඔව්.

ප්‍ර: එම විශ්ව විද්‍යාලයේ ඉස්ලාම් ආගමික අන්තවාදී ශිෂ්‍ය ව්‍යාපාරයක් තිබුණාද ඔබ ඉගෙන ගන්න කාලේදී?

පි: සංවිධානාත්මකව තිබුණේ නැහැ.

ප්‍ර: කොහොමද තිබුණේ?

පි: මුස්ලිම්වරුන්ගෙන් වහාබ්වාදය අනුගමනය කරන ශිෂ්‍යයන් අනිකුත් විශ්ව විද්‍යාල වල සිටිනවා වගේ අග්නිදිග විශ්ව විද්‍යාලයෙත් හිටියා.

ප්‍ර: දැන් අග්නිදිග විශ්ව විශ්වවිද්‍යාලයේ මුස්ලිම් ශිෂ්‍යන්ගෙන් කොච්චර percentageඑකක් සිටිය ද වහාබිසම් අනුගමනය කරන?

පි: ප්‍රතිශතය මට කියන්න බැහැ. නමුත් සැලකිය යුතු පිරිසක් වහාබ්වාදය අනුගමනය කරා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔය කාත්තන්කුඩි ප්‍රදේශයේ ගොඩාක් ගොඩනැඟිලි මුස්ලිම් දේවස්ථාන හදලා තියෙනවා කිව්වානේ ඔබ අලුතින් එම ගොඩනැඟිලි වල නාම පුවරුවල තියෙනවාද World Muslim League කියලා නමක් ගහලා?

පි: World Muslim Leagueයන නමින් කිසිදු පල්ලියක් නැත.

ප්‍ර: ඔබ සූෆි මුස්ලිම්වරයෙක් නේද?

පි: ඔව්.

ප්‍ර: සූෆි මුස්ලිම්වරුන් අල්කුරානය, හදිස් ඔය වහබ්වාදින් ප්‍රකාශ කරන ආකාරයට ඒ වගේ තියෙන විදිහටම අනුගමනය කරනවාද නැද්ද?

පි: ඔව් අපි පිළිගන්නවා. නමුත් ෂියා ප්‍රභූවරුන් විසින් ඒ සම්බන්ධයෙන් හාදීස් අල්කුරානය සම්බන්ධයෙන් කියා තිබෙන නියම වලට යටත්ව තමයි අපි අනුගමනය කරන්නේ.

ප්‍ර: එහෙමනම් ඔබ සූෆිවරුන් ජිහාත් කියන එක පිළිගන්නවාද?

පි: නැත.

ප්‍ර: ඉස්ලාම් රාජ්‍යය කියන එක ගැන පිළිගන්නවාද?

පි: නැත.

ප්‍ර: ඉස්ලාම් නීතිය හෝ ෂරියා නීතිය ගැන ඔබලා පිළිගන්නවාද?

පි: ෂරියා නීතිය වනාහි ඉස්ලාම් ධර්මය වන්දනාමාන කිරීම සඳහා වූ නීතියක්. යාච්ඤාව කෙසේ කළ යුතු දැයි ෂරියා නීතියක්තිබෙනවා. විවාහයක් සිදු කිරීමට ෂරියා නීතියක් තිබෙනවා. මෙසේ ආගමට අනුකූලව ෂරියා නීතිය අපි පිළිපදිනවා.

ප්‍ර: එසේ නැතුව වෙනත් වහබ්වාදින් විදිහට අන්තවාදී කටයුතු කරන්න ෂරියා නීතිය අවශ්‍ය යැයි කියලා කියන්නේ නැද්ද සූෆිවරුන්?

පි: එසේ අපි කියන්නේ නැත.

ප්‍ර: ඔබ අදහන සූෆි මුස්ලිම් ආගමික මතවාදය අනුව මුස්ලිම් කාන්තාවන් හිසේ සිට දෙපතුල දක්වා වැසෙන ආකාරයට ඇඳුම් ඇදිය යුතුද?

පි: සම්පූර්ණයෙන් හිසේ සිට පාදය දක්වා වැසිය යුතු නැහැ. මුහුණ සහ අත පේන ලෙස ඇඳුම් ඇදිය හැකිය.

ප්‍ර: ඔබගේ ප්‍රදේශයේ දැනට ඔබ කිව්වා වහබ්වාදය අවුරුදු 30ට - 40ට ඉස්සෙල්ලා තමයි ව්‍යාප්ත වෙන්න ආරම්භ වුණේ කියලා. එතකොට ඔබගේ ප්‍රදේශයේ මුස්ලිම් කාන්තාවන් ඇඳුම් ඇන්දේ ඔබ දැන් කියන ආකාරයටද ඉස්සර?

පි: සාරියක් ඇන්දා කළින්. දැනුත් අදිනවා. හබායත් අදින්න පුළුවන් නමුත් මුහුණයි අතයි වැසියන ආකාරයේ ඇඳුම් ඇදිය යුතු නැහැ.

ප්‍ර: එතකොට දැන් ඔබ දකින්නේ කොහොමද කාත්තන්කුඩියේ ඉන්න කාන්තාවන් මොකක්ද අඳින්නේ සාරිය අදිනවාද, හබාය අඳිනවාද එහෙම නැත්නම් අර ඇස් දෙක විතරක් පේන ලෙස දිග කළුපාට ගවුම අඳිනවාද?

පි: තබ්ලික් ජමාද් අනුගමනය කරන අය සියලු කොටස් වැසියන සේ ඇඳුම් අඳිනවා ශරීරයේ සියලුම කොටස් වැසී යන සේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: තවුහිද් ජමාද්?

පි: තවුහිද් ජමාතේ අය මුහුණ සහ අත එළියට පේන පරිදි හබායත් අඳිනවා. මුස්ලිම් කාන්තාව මුහුණයි අතයි පේන සේ සාරිය අඳිනවා, හබාය අඳිනවා, සල්වාරුත් අඳිනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: නැහැ නැහැ මුස්ලිම් කාන්තාව නෙවෙයි සූෆි මුස්ලිම් ?

පි: සූෆි මුස්ලිම්වරුන් මුස්ලිම් කාන්තාව මුහුණයි අතයි පෙනෙන සේ සාරිය අඳිනවා. හබාය අඳිනවා, සල්වාර් අඳිනවා.

****

<u>ගරු විනිසුරු අදිකාරි මැතිනිය</u>

ප්‍ර: ඔබ අබ්දුල් රාසික් යන අයගේ ලියපු කුරානය කියවලා තියෙනවාද?

පි: නැහැ.

ප්‍ර: ඇයි කියවලා නැත්තේ ඔබගේ ප්‍රදේශයේ තියෙන පක්ෂයකින් ලියපු කුරානයක් ඇයි ඔබ කියෙව්වේ නැත්තේ ඒ කුරානය?

පි: ඔහු කාත්තන්කුඩි ප්‍රදේශයේ නැත. ඔහු කොළඹ ප්‍රදේශයේ ජීවත් වෙන පුද්ගලයෙක්. ඔහුගේ ඒ වගේ පොතක් තියෙන බව මම දන්නවා. නමුත් මට අවශ්‍යතාවයක් තිබුණේ නැහැ ඒක කියවන්න.

****

දැන් වේලාව: ප.ව.7.55

මෙතැන් සිට ල/ලේ: ධම්මිකා මිය

පෙර සටහන් කරන්නේ නිල්මිණි මෙනවිය විසින්ය.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

වේලාව ප.ව.7.55
මෙතැන් සිට ධම්මිකා පෙරේරා විසින්ය.

<u>ගරු අදිකාරී මැතිනිය</u>:

ප : ඔබට මා යෝජනා කරොත් ඒ කුර්ආනයේ 472 සඳහන් කරලා තියෙනවා කියලා කාන්තාවන්ට මුහුණ ආවරණය කිරීම තහනම් කියා ඔබ මොකක්ද ඒක ගැන කියන්නේ? ඔබට ඒ ගැන මොකක්ද කියන්න තියෙන්නේ, මම ඔබට යෝජනා කළා අබ්දුල් රාසික්ගේ කුර්ආනයේ 472 සඳහන් කර තිබෙනවා නම් කාන්තාවන්ට මුහුණ ආවරණය කිරීම තහනම් කියා, ඔබ ඒ ගැන මොකක්ද කියන්නේ?

පි : මුහුණ සහ අත වැසිය නොයුතු යැයි තමයි කුර්ආනයේදී සඳහන් වී තිබෙන්නේ.

ප : මේ මගේ අවසාන ප්‍රශ්නය ඔබට, දැන් වහබ් වාදය ගැන ඔබ ගොඩාක් විස්තර මෙම කොමිෂම හමුවේ ඉදිරිපත් කලා, ශ්‍රී ලංකාව කියන්නේ බහු ජනවර්ගයක් සහ ආගමික විවිධත්වයක් තියෙන රටක්, එහෙම තියෙන රටක ජනවාර්ගික සමඟිය සහ ආගමික සංහිදියාව සඳහා මෙම ඉස්ලාම් ආගමික අන්තවාදයට හේතු වෙච්ච වහබ්වාදය විශාල තර්ජනයක්ද?

පි : ජාතීන්ගේ එකමුතුවට මේ වහබ්වාදය බාධකයක් වෙලා තිබෙනවා.

ප : ජාතීන්ගේ සමඟියටයි, ආගමික සංහිදියාවටයි?

පි : ඔව්.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා:</u>

ස්වාමිණී **C689** වශයෙන් දැනටමත් සලකුණු කර ඇති ලේඛනය සාක්ෂිකරුට පෙන්වීමට අවසර පතනවා.

ප : මෙහි දකුණුපස කොණේ ඉන්න පුද්ගලයා කවුද?

පි : ශිබ්ලි ෆාරුක්.

ස්වාමිණී සාක්ෂිකරු ශිබ්ලි ෆාරුක් යැයි හඳුනා ගත් පුද්ගලයා ඉන්න ස්ථානය **C689A** වශයෙන් සලකුණු කිරීමට අවසර පතනවා.

ප : ශිබ්ලි ෆාරුක් යැයි ඔබ හඳුනා ගත්ත පුද්ගලයාට දකුණුපසින් ඉන්න පුද්ගලයා කවුද?

පි : රවුෆ් හකීම්.

FAIR COMMENT BY JEZEEM

ස්වාමිණි සාක්ෂිකරු රවුල් හකීම් යැයි හඳුනා ගත් පුද්ගලයා ඉන්න එම ස්ථානය **C689B** වශයෙන් සලකුණු කිරීමට අවසර පතනවා.

ප්‍ර : මේ පිංතූරය මැද උඩුකය නිරුවත් සහ හිස් වෙළුම්පටි සහ අත් වෙළුම්පටි සහිතව ඉන්න පුද්ගලයා කවුද කියලා ඔබට හඳුනා ගන්න පුළුවන්ද?

පි : මෙම ඡායාරූපයේදී එය අපැහැදිලිව තිබෙනවා. නමුත් කලින් පෙන්නපු පිංතූරයේදි ඔහු සහරාන්ගේ සහෝදරයෙක් වන රිල්වාන්.

ස්වාමිණි සාක්ෂිකරු රිල්වාන් යැයි හඳුනා ගත් පුද්ගලයා සිටින ස්ථානය **C689C** වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් අවශ්‍යද යන්න අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥවරයාගෙන් අසමි. අවශ්‍ය බව ප්‍රකාශ කරයි.

****

<u>ජනාධිපති නීතිඥ ෂමිල් පෙරේරා මහතා:</u>

ප්‍ර : සාක්ෂිකරු <u>C677</u> කියලා Video පටයක් තමා ඉදිරිපත් කෙරුවා. ඒ Video පටයේ තිබුණේ සහරාන් කිතුණු ජනතාවට විරුද්ධව යම් දේශනයක් පැවැත්වීම?

පි : ඔව්.

ප්‍ර : නත්තල් උත්සවය සම්බන්ධයෙන්?

පි : ඔව්.

ප්‍ර : දැන් මේ දේශනාවට අමතරව සහරාන් වෙනයම් දේශනා කරලා තිබෙනවද ඔබ දන්න තරමින් කිතුණු ජනතාවට විරුද්ධව?

පි : මා දන්නා තරමින් නැත.

ප්‍ර : දැන් තමා <u>C685</u> වශයෙන් ෆත්වා පොතක් ලකුණු කර තිබෙනවා?

පි : ඔව්.

ප්‍ර : එම පොතෙහි කිතුණු ජනතාවට විරුද්ධව යම් යම් ෆත්වා තිබෙනවාද?

පි : නැත.

ප්‍ර : තමා කිව්වා දැන් වර්ථමානයේදීත් මේ අන්තවාදී දේශනා පවත්වනවා කියලා?

FAIR COMMENT BY JEZEEM

පි : මා අන්තවාදී ප්‍රචාර කියලා කිව්වේ නැහැ, නමුත් වහබ්වාදය පදනම් වූ කරුණු තවම ප්‍රචාරය කරමින් තිබෙනවා කියලා තමයි කිව්වේ.

ප්‍ර : ඒ වහබ්වාදය සම්බන්ධයෙන් දේශනා වලට කිසියම් දේශපාලකයෝ අයත් වෙනවද?

පි : එය ඔප්පු කිරීමට සාක්ෂි මම ලඟ නැත. සාක්ෂි නැහැ ඒ බවට.

ප්‍ර : ඒ කියන්නේ තමන් ඒ අන්දමට දේශනා අහලා නැද්ද?

පි : නැවත ඒ ප්‍රශ්නය අහන්න.

ප්‍ර : ඒ කියන්නේ තමා කිව්වානේ මේ වහබ්වාදය සම්බන්ධයෙන් දේශනා තවමත් පවත්වාගෙන යනවා කියලා?

පි : ඔව්.

ප්‍ර : ඒකට දේශපාලඥයෝ සම්බන්ධද?

පි : මා දන්නා තරමින් එසේ නැත.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

සාක්ෂිකරුගෙන් වෙනත් ප්‍රශ්න නොමැති බව දන්වයි. කොමිෂන් සභාව ඉදිරියට පැමිණ සාක්ෂි ලබා දීමෙන් කොමිෂන් සභාවේ කටයුතුවලට දැක් වූ දායකත්වය සම්බන්ධයෙන් සාක්ෂිකරුට කොමිෂන් සභාවේ ස්තුතිය පළ කරනවා. සාක්ෂිකරු මුදා හරිමි.

මේ අවස්ථාවේදි සාක්ෂිකරු විසින් ලබාදුන් සාක්ෂි හේතුවෙන් සාක්ෂිකරුට ඇති වියහැකි යම් බලපෑමක් හෝ අනතුරක් සම්බන්ධයෙන් ඔහුට හිමිවිය යුතු අයිතීන් සහ වරප්‍රසාද සාක්ෂිකරුවන් හා වින්දිතයන් හට ආරක්ෂාව ලබාදීමේ ජාතික අධිකාරී පනත එනම් **2015** අංක **4** දරන පනතේ **25(4)** උප වගන්තිය ප්‍රකාරව ඔහුට හිමිවිය යුතු සියළුම අයිතීන් හා වරප්‍රසාදයන් ලබා දෙන ලෙසට සාක්ෂිකරුවන් හා වින්දිතයන් ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය වෙත නියෝග කරමි.

ඊට අමතරව සාක්ෂිකරු කාත්තන්කුඩියේ සිට කොමිෂමට සාක්ෂි ලබා දීමට පැමිණ ඇති බව අනාවරණය වන හෙයින්, නීතියට අනුව ඔහුට හිමිවිය යුතු දීමනාව ඔහුට ලබා දෙන ලෙස කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරමි.

සාක්ෂිකරු මුදා හරිමි.

Registrar's Copy

FAIR COMMENT BY JEZEEM

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරැදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදි.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය: 2020.06.18 වේලාව: ප.ව. 01.35

සටහන් කළේ - සචිනි මදුෂිකා.

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා -සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

පෙනී සිටීම:-

* ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය , ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය,රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා, රජයේ අධිනීතිඥ දිලන්ත එස් කළුදුරුවගේ මහතා සහ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* රෝමානු කතෝලික දේවස්ථානය වෙනුවෙන් අද දින නීතිඥ චමත් ප්‍රනාන්දු මහතා සමඟ ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා පෙනී සිටී.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

වැඩිදුර සාක්ෂි විමසීම.
සාක්ෂිකරුගේ නම: **පූජ්‍ය ගලගොඩඅත්තේ ඥානසාර හිමි.**

ප්‍රතිඥා දී කැඳවයි.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය.</u>

ප්‍ර: හාමුදුරුවනේ අපි පෙර දිනයේ දී ඔබ වහන්සේගෙන් කරුණු විමසා සිටියා ශ්‍රී ලංකාව තුළ අන්තවාදය වශයෙන් හැඳින් විය හැකි විවිධ නිකායන් එහෙම නැත්නම් විවිධ කොටස් යටතේ ඉස්ලාම් ධර්මය ප්‍රචාරය කිරීමට, එයට හරවා ගැනීමට පිහිටුවා තිබෙන සංවිධාන ප්‍රචාරය කෙරෙන පත පොත සහ එය සූක්ෂම ආකාරයට සිදුව තිබෙන ආකාරය සම්බන්ධයෙන් විවිධ කෝණ වලින් ඔබ වහන්සේගෙන් සාක්ෂි ලබා ගැනීමක් සිද්ධ කරා. එහෙමනේ හාමුදුරුවනේ?

උ: ඔව්.

ප්‍ර: දැන් ඔබ වහන්සේ ඒ පිළිතුරු අතරේ කියන්නට යෙදුණා ඔබ වහන්සේ මේ සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීමක් විටින් විට සිද්ධ කරා කියන කාරණාව.

උ: ඔව්.

ප්‍ර: ඔබ වහන්සේ මේ ගරු සභාවේ අවධානය දැනටමත් යොමු කරලා තිබෙනවා 2013 පෙබරවාරි 17 වැනි දින මහරගම පැවති බොදුබල සේනා සංවිධානයේ මහා සමුළුවක දී ඔබ වහන්සේ කියන්නට යෙදුණු කාරණා සම්බන්ධයෙන්. දැන් ඒ වගේ ම විවිධ ප්‍රශ්න උද්ගත වුණා යැයි සැලකෙන අවස්ථා වලදී මහජනතාව දැනුවත් කිරීමට ඔබ වහන්සේ ක්‍රියා කරා කියන කාරණාවත් ඔබ වහන්සේ ගේ සාක්ෂිවල කියවුණානේ හාමුදුරුවනේ.

උ: ඔව්.

ප්‍ර: ඔබ වහන්සේට මතකයක් තිබෙනවාද නිපෝන් හෝටලයේ පැවති මාධ්‍යය හමුවක ඔබ වහන්සේ කරන ලද කාරණාවක ඒ සිද්ධීන් සම්බන්ධයෙන් මතකයක් තිබෙනවා ද?

උ: ඔව්.

ප්‍ර: ඒ නිපෝන් හෝටලයේ පැවතියේ මාධ්‍ය හමුවක් ද නැත්නම් සමුළුවක් ද?

උ: ඇත්ත වශයෙන්ම අපි එතැනට සම්බන්ධ වුණේ අහඹු ලෙස හේතුව තමයි නිපෝන් හෝටලයේ ඔය සිද්ධියට දින 04 කට හෝ 05 කට උඩදී ලංකාවේ විද්‍යුත් මුද්‍රිත මාධ්‍ය වල නියෝජිතයන් එකතු කරගෙන අපේ වියදමින් බස් එකක් අරගෙන විල්පත්තුව තුළ සිදු කරනු ලැබූ ඒ වන විනාශය හා ජනපදකරණය පිළිබඳව පෙන්වීම සඳහා අපි ඒ සියළු දෙනා එක්කරගෙන ගියා. එක්කරගෙන ගිහිල්ලා ඊට පහුවදා ඒ මාධ්‍යවේදීන් ඒ නියෝජිතයන් මේ රිෂාඩ් බදුර්දීන් ඇමතිවරයා විසින් එවක ආණ්ඩුවේ ද

FAIR COMMENT — BY JEZEEM

උදව් ඇතිව කරපු වන විනාශයත් ජාසිම් සිටි නමින් ගොඩනගලා තිබුණු මුස්ලිම් ජනපදත් වඩා මැනවින් හොඳින් මාධ්‍යය වලින් ප්‍රචාරය කරනු ලැබුවා. ඊටත් පසු දින බදුර්දීන් ඇමතිවරයා මේ හෙළිදරව්ව මගින් තමාගේ දේශපාලන ජීවිතයට විශාල හානියක් වුණා කියලා මිලියන 500 ක් වන්දි ඉල්ලලා අප වෙත එවලා තිබුණා එන්තරවාසියක්. ඉන් අනතුරුව ඒ කාලේ රටේ කවුරුත් කතා කරපු වටරැක විජිත නැමැති භික්ෂුවක් සහ තවත් අපි නමින් නොදන්නා භික්ෂූන් වහන්සේලා කිහිප නමකුත් නිපෝන් හෝටලයට ගෙන්වා මුස්ලිම් මවුලවීවරු කිහිපදෙනෙකුත් එක්ක රිෂාඩ් බදුර්දීන්ගේ මෙහෙයවීමෙන් මාධ්‍ය හමුවක් පවත්වන බව තමයි අපිට දැනගන්න ලැබුණේ.

ප්‍ර: ඒ කියන්නේ මේ නිපෝන් හෝටලයේ පැවති මාධ්‍යය හමුව කැඳවීම බොදුබල සේනාවෙන් සිදු වූවක් නෙවෙයි.

උ: නැහැ. ඒක ඇත්ත වශයෙන්ම ඒ ගොල්ලන් තමයි ඒ කටයුත්ත සංවිධානය කරලා තිබුණේ. ඉතින් මෙතැන කවුරුන් හෝ මාධ්‍යවේදියෙක් අපේ සංවිධානයේ කාර්යාලයට කතා කරලා මෙන්න මේ වගේ දෙයක් වෙනවයි කියන එක දැනුවත් කරාට පස්සේ සංවිධානයේ හාමුදුරුවරු කීපනමක් සහ නියෝජිතයින් කිහිපදෙනෙක් මේ ස්ථානයට ගිහිල්ලා තිබුණා මොකද අපි දැනගෙන හිටියා මුස්ලිම් අය ඇතැම් මුස්ලිම් දේශපාලකයෝ මොකද ඔය වටරැක විජිත කියන සංඝයා වහන්සේ කිව්වා එයාගේ දේශන තියෙනවා ඒ තාම හඬ පටත් අහන්න පුළුවන් මම ඒ කාලේ ඒ කියන්නේ අෂ්රෝෆ් මහත්තයත් එක්ක දේශපාලනය කරාය. අෂ්රෝෆ් මහත්තයා මුත්‍රා කරන්න වාහනයෙන් බැහැල යන කොට මම තමයි හෝද ගන්න වතුර බෝතලය ගිහිල්ලා දුන්නේ කියලා. ඒ කියන්නේ ඇතැම් මුස්ලිම් ඒ දේශපාලන නායකයෝ පලිහක් විදියට මේ සිවුර පාවිච්චි කරා. එතකොට මෙතැනදි ආරංචි වුණේ විල්පත්තුවේ අනේ මෙහෙම කිසිම දෙයක් වෙලා නැහැ මේ හාමුදුරුවෝ කියන්නේ බොරුයි කියන එක බදුර්දීන් වෙන කණ්ඩායමක් දාලා එයා ශුද්ධ වන්තයෙක් වීමට තමයි සූදානම් කරලා තිබුණේ. ඉතින් මේ හාමුදුරුවරුන්ගේ ප්‍රමාදය මොකද කියලා බලන්න මම එතැනට යන කොට දෙපිරිස අතර සංවාදයක්. එතකොට මාධ්‍යය සාකච්ඡාව එතැන නෙමේ තිබුණේ ඇත්තටම මාධ්‍ය සාකච්ඡාව නිපෝන් හෝටලයේ දෙවැනි තට්ටුවේ. ඔය සිද්ධිය ඇති වුණේ පහළ මහලයේ. මාධ්‍ය හමුවට යන්න කලින් උදාහරණයක් විදියට මාධ්‍යය හමුව තියෙන්නේ 10.30 ට නම් ඒ සිද්ධිය වුණේ 09.30 ට විතර වගේ.

****

FAIR COMMENT
BY JEZEEM

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර: ස්වාමීන් වහන්සේ කිව්වා ඇතැම් දේශපානලඥයෝ කියලා. ඔබ වහන්සේට කියන්න පුළුවන් ද කොමිෂන් සභාවට ඇතැම් දේශපාලනඥයෝ කියන්නේ කවුද කියලා?

උ: ඒ කියන්නේ මැතිතුමණි ඇත්ත වශයෙන්ම ඔය ඉන්න සියළුම නැහැ සියළුම කිව්වොත් වැරදි ඒ මුස්ලිම් දේශපාලනඥයෝ උදාහරණයක් විදියට හලීම් මහත්මයා. ඔහු වහාබ්වාදයට සම්බන්ධයි. ඔහුත් හාමුදුරුවො පළියක් විදියට පාවිච්චි කරනවා. රවුෆ් හකීම් ඔහුගේ ලේකම්ධුරයකුත් දැරුවා එක්තරා හාමුදුරුවෝ කෙනෙක් මහනුවර ප්‍රදේශයේ. ඊළඟට බදුර්දීන් තවම මැතිතුමනි මන්නාරම ආදී ප්‍රදේශ වල විශේෂයෙන් ඔය යුධ සමයේ කාලයේ නිතරම කියවුණු වැලි ඔය ප්‍රදේශයේ ඔහුගේ නියෝජිතයෝ හැටියට සංඝයා වහන්සේලා 04, 05 දෙනෙක් තියාගෙන ඉන්නවා. ඔවුන්ට මාසෙට ගාණක් දීලා මොනව හරි මෙහෙන් ඔහුට කැලෑ කපනවා කියලා චෝදනා කරොත් නැහැ නැහැ අපේ ඇමතිතුමා එහෙම කරන්නේ නැහැ කියලා සංඝයා වහන්සේලා ලවා තමා බෞද්ධ සමාජයට ආමන්ත්‍රණය කරන්නේ. ඒ වගේ කෙනෙක් තමයි ඔය වටරැක විජිත. එතකොට බදුර්දීන් ඒ වැරැද්ද කරනවා. ඊළඟට තව මම දන්න මට මතක විදියට ඔය නම් කිහිපය තමයි. ඒ කියන්නේ නිල වශයෙන්ම හාමුදුරුවරු මුදල් ගෙවලා තමන්ගේ දේශපාලන වැඩ වලට ඒ හාමුදුරුවරු සම්බන්ධ කරගෙන තියෙනවා.

****

<u>ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය.</u>

ප්‍ර: දැන් හාමුදුරුවනේ ඔබ වහන්සේ ප්‍රකාශ කරන්නට යෙදුණා දැන් මේ නිපෝන් හෝටලයේ තිබුණු මාධ්‍ය සාකච්ඡාවට දින කිහිපයකට පෙර ඔබ වහන්සේ ඇතුළු බොදුබල සේනා සංවිධානයෙන් විල්පත්තු ප්‍රදේශයේ සංචාරයක නියළුනා කියලා. ඒක හරි ද හාමුදුරුවනේ?

උ: ඔව්.

ප්‍ර: ඒ සංචාරයට කවුද සම්බන්ධ වුණේ?

උ: සියළුම මාධ්‍යවල ඒ කියන්නේ සියළුම විද්‍යුත් මුද්‍රිත මාධ්‍ය වලින් නියෝජිතයා හෝ දෙදෙනා බැගින් මං හිතන්නේ 40 ක 45 ක විතර ප්‍රමාණයක් සහභාගී වුණා. ඊට අමතරව අපි හාමුදුරුවරු තිස් හතලිස් නමක් මං හිතන්නෙ වාහනම යන්න ඇති වාහන 20 ක් 25 ක් විතර.

ප්‍ර: කොහාටද ගියේ හාමුදුරුවනේ?

උ: අපි ඔය සිද්ධිය ඇති වුණු විල්පත්තුව ප්‍රදේශයේ මට ඇත්තටම දැන් නම මතකයට එන්නේ නැහැ ඒ හරියට කියන්නේ මේ ඔය විල්පත්තුවේ වන සංහාරය කරපු ප්‍රදේශය තියෙනව නම් මතකයට එන්නේ නැහැ මැතිතුමණි ඒ නගරයේ නම මං පසුව කියන්නම්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔබ වහන්සේ මේ ගමන යන්න තීරණය කරන අවස්ථාව වන විට ඔබ වහන්සේ දැනන් හිටිය ද විල්පත්තු ජාතික වන උද්‍යානය හරහා කැපුණු පාරකට අදාළව සහ එහි මිනිසුන් පදිංචි කරවීමට අදාළව අධිකරණයේ පවතින නඩුවක් තිබුණයි කියලා?

උ: අපි එහෙට යන විට ද මැතිණියනි?

ප්‍ර: එහෙමයි හාමුදුරුවනේ.

උ: නැහැ නැහැ. ඒ කියන්නේ අපි දැනගත්තේ ඇත්ත වශයෙන්ම මේකේ සත්‍ය සිද්ධිය නම් අපි දැනන් හිටියේ නැහැ විල්පත්තුව මෙහෙම වන සංහාරයක් කරනවා කියලා මුල් අවස්ථාවේ. මමත් අපි තවත් හාමුදුරුවරු 4, 5 නමක් වන්දනා කටයුත්තක් සඳහා අනුරාධපුරයට ගිහිල්ලා එතැනින් අපිට දහවල් දානය වැළඳවීම සඳහා ආරාධනාව ලැබුණා තන්තිරිමලේ රජ මහා විහාරස්ථානයේ. දහවල් දානය අරගෙන හවස් වෙනකන් එතැන ඉඳලා එහෙ තියෙන පුරා වස්තු සියල්ලම බලලා ඒ නායක හාමුදුරුවෝ කිව්වා ස්ථිවිරයෝ ඔය ගොල්ලෝ ආපු පාර ගොඩක් දුරයි. ඔය ගොල්ලන්ට ඉතාම ඉක්මනින්ම පුත්තලමට දාලා යන්න පුළුවන් පාරක් තියෙනවා කියලා උන්වහන්සේ පොඩි ඇඳලා දුන්නා map එකක් මෙතැනින් ගිහිල්ලා වමට හැරෙන්න දකුණට හැරෙන්න ආදී වශයෙන්. ඉතින් අපි මඩු පල්ලියත් පහු කරගෙන ටිකක් දුර ගිහිපුවාහම කොහොම හෝ අත්වැරැද්දකින් නිකන් කාපට් පාරක් නෙවෙයි නිකන් පාළුවට ගිය පාරක් නමුත් ලොකුවට තිබුණා පාර අපි ඔය පාරේ ගියා. ටිකක් සාමාන්‍යයෙන් කිලෝමීටර 10 ක් 12 ක් වගේ යන කොට එක පාරට කාපට් පාරකට වැටුණා. ඒ කාපට් පාර දිගේ කිලෝමීටර් ඒත් 10 ක් විතර එන කොට තමයි අපි දැක්කේ අර අඩි 20 පාරක් මුහුද පැත්තට කපලා තියෙනවා. ගෙවල් 40 ක් තියෙනවා . ආයි පාරක් තියෙනවා. ඒ හැම ගෙවල් 40 කටම එක පල්ලියක් තියෙනවා. කැලේ පැත්තට තව අඩි 20 පාර කපලා තියෙනවා. ඒ මහා රූස්ස ගස් පෙරළිලා. සත්තු මැරිලා වැටිලා. අපේ හද කම්පනයට පත් වුණා. කවුද මේ අපරාධය කරන්නේ කියලා. අපි කොහොම හරි ඒ පාරේන් ඉස්සරහට ආවා එතකොට අපිට එන්න බැහැ. ඒ කියන්නේ අපිට ඉදිරියට යන්න බැහැ. එතැනින් එහාට පේන්නේ නැහැ වගේ මොකද මේකේ අස්සේ කාටවත් නොපෙනෙන ආකාරයට තමයි හදලා තිබුණේ. ඊට පස්සේ අපි ආපහු හරවගෙන එන කොට පාර අසා දැනගත්තේ මට ඇත්ත වශයෙන්ම නම් මතක නැහැ හොඳ තුන්මන් හන්දියක පොලිස් මුර පොළක් තිබුණා. ඒ පොලිස් මුර පොළෙන් තමයි අපි නැවත පාර නිවැරදි කරගෙන හරි පාරට ආවේ. එතැනදී ඒ පොලිස් නිලධාරීන් කිව්වා හාමුදුරුවනේ ඔබ වහන්සේලා ඔය ගිහිල්ලා තියෙන්නේ යුද්ධ කාලේ හමුදාව ආයුධ උතුරට ගෙන යාම සඳහා කපලා තිබ්බිච්ච පාරක් ඒක තමයි දැන් ඔය සංවර්ධනය කරලා තියෙන්නේ කියලා. එතකොට තමයි අපි මේ සිද්ධිය දැන ගත්තේ. ඉතින්

FAIR COMMENT BY JEZEEM

නඩුවක් තිබුණු බවක් ඇත්ත වශයෙන්ම එහෙම දැනගෙන තිබුණෙ නැහැ. අපි තමයි මුලින්ම විල්පත්තුව සම්බන්ධයෙන් මේ හෙළිදරව්ව කළේ. එතකන් පරිසර සංවිධානයක්වත් ආණ්ඩුවේවත් කාගෙවත් හාහුවක් තිබුණේ නැහැ. මේක මාධ්‍යයටවත් කාටවත් නිරාවරණය නොවී ඉතාම හොර රහසේ කරගෙන ගිය වැඩ පිළිවෙළක්.

ප්‍ර: හාමුදුරුවනේ මං ඔබ වහන්සේට යෝජනා කරනවා ඔබ වහන්සේ දැනටමත් දන්නෙ නැහැ කියලා ප්‍රකාශ කරා මේ විල්පත්තුව හරහා පැවති මාර්ගයකට අදාළව මූලික අයිතිවාසිකම් නඩුවක් 2011 වර්ෂයේ සිට ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවැතෙමින් තිබුණා එහි පෙත්සම්කරුවන් ලෙස සිටියේ රාජ්‍ය නොවන සංවිධානයක් ඒ කියන්නේ පරිසර ආරක්ෂා කිරීමට අවශ්‍ය අදාළ වන ආකාරයෙන් පවත්වාගෙන ගිය රාජ්‍ය නොවන සංවිධානයක් කියන කාරණාව ඔබ වහන්සේ එවකටත් දැනගෙන හිටියා කියලා. හාමුදුරුවනේ ඔබ වහන්සේට මොකද්ද ඒකට කියන්න තියෙන කාරණාව?

උ: මට එහෙම මතකයක් නැහැ. නඩුවක් දාලා තියෙන්න ඇති. එහෙම සිද්ධියක් ගැන දැන ගන්න ලැබුණෙ නැහැ. අපි යන අවස්ථාව වන කොට පාර තියෙන්න ඇති නමුත් ඔය ජනපදය නම් තියෙන්න විදියක් නැහැ ඒ කාලේ.

ප්‍ර: දැන් හාමුදුරුවෝ ප්‍රකාශ කළ ආකාරයට මාධ්‍ය ආයතන ගණනාවකින් මාධ්‍යකරුවන් සමඟ තමයි ඔබ වහනේස් වැඩම කරන්නේ මේ ස්ථානයට පරීක්ෂාවක් කරන්න හෝ කුමන හෝ කාරණාවකට. එහෙම නේ හාමුදුරුවනේ?

උ: ඔව්. මොකද මැතිණියනි අපි මාධ්‍යය එක්ක යන්න කලින් අපි මාධ්‍යය හමුවක් පැවැත්තුවා. මේ ගැන වහාම සොයා බලන්න කියලා. එතකොට ඒවයින් මාධ්‍යය වලින් ඉහළ ප්‍රතිචාරයක් ලැබුණා. ඊට පස්සේ මම යෝජනා කරා ඒ අපිත් එක්ක ඒ මාධ්‍ය වලට එන නියෝජිතයින්ට ඔය ගොල්ලන්ම ගිහිල්ලා මේක ඇස් දෙකෙන් දකින්න බලන්න එතකොට ඔය ගොල්ලන්ට හොඳට පෙන්වන්න පුළුවන් මේක හොඳට බලන්න කියලා පත්තර වල ලියන්න පුළුවන් මේක ජාතික ප්‍රශ්නයක් කියලා. ඒ අනුව තමයි ඒ ගොල්ලෝ ගමනට සූදානම් කරගෙන එක්කරගෙන ගියේ. ඔවුන්ගේ දෑසටම මේක පෙන්වන්න ඕන නිසා.

ප්‍ර: ඒ කියන්නේ හාමුදුරුවනේ දැන් හාමුදුරුවන්ගේ ග්‍රහණයට ප්‍රශ්නයක් තියෙනවයි කියලා යම්කිසි දැනුනාම ඔබ වහන්සේ තීරණය කරාය මාධ්‍යය මඟින් හොඳින් ලියන්න පුළුවන් වන ආකාරයට මිනිසුන් දැනුවත් කරන එක තමයි ඊළඟට කළ යුතු වන්නේ කියලා. හරි ද හාමුදුරුවනේ?

උ: ඒක එක කාරණාවක්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එයින් ඔබ වහන්සේ මේ ප්‍රශ්නය කියලා ඔබ වහන්සේ හිතන කාරණාවට විසඳුම හැටියට තීරණය කළේ මාධ්‍යය මගින් එය විශාල වශයෙන් ප්‍රචාරයකට පත්කිරීම කියන කාරණාවද හාමුදුරුවනේ?

උ: ඇත්ත වශයෙන්ම මේ රටේ පාලකයින්ට මේවා කියලා වැඩක් නැහැ කියන විශ්වාසය අපිට තියෙනවනේ. මොකද මේ ගොල්ලෝ ඔක්කොම එකටනේ මේ හොරකම කරන්නේ. ඉතින් ඒ හින්දා අපිට වුවමනා කරන්නේ සත්‍ය දේ පෙන්වලා ජනතාව තුළ මතයක් ඇති කරවීමෙන් ඒ කියන්නේ ජන මතය තමයි වැදගත් ඉතිං ඒ ජන මතය හැදීම තමයි අපේ අරමුණ වුණේ. සමාජ ව්‍යාපාර බිහි වෙන්නෙත් එහෙම තමයි. ඒ කියන්නේ පවත්නා පාලකයෝ වැරදි දේ කරනව නම් ඊට එරෙහිව දේශපාලන ව්‍යාපාර, සමාජ ව්‍යාපාර, ජාතික ව්‍යාපාර නොයෙක් දේවල් බිහිවෙනවා. ඉතින් අපිත් එහෙම ජාතික ව්‍යාපාරයක්.

ප්‍ර: හාමුදුරුවනේ පවත්නා ක්‍රමවේදය පටිපාටියට එරෙහිව යන්න ජනතාව පෙළගැස්වීමට ඔබ වහන්සේ මූලිකත්වය ගත්තයි කිව්වොත් හරිද?

උ: සම්පූර්ණයෙන් වැරදි.

ප්‍ර: දැන් ඔබ වහන්සේගේ පිළිතුරෙහි ගැබ් වුණා පාලකයන්ට කිව්වට වැඩක් නැහැ ඒ නිසා මහජනතාව පෙළගැස්වීමක් කළ යුතුයි කියලා.

උ: මහජනතාව දැනුවත් කළ යුතුයි. මහජනතාව දැනුවත් කළ යුතුයි. ඔවුන්ගේ ඒ දැනුවත් වීම ඇතුළෙ ඇත්ත වශයෙන්ම සත්‍ය වෙනුවෙන් මිනිස්සු පෙළ ගැහෙනවනේ. එතකොට ඒ සත්‍යය අපි මොනවද ඒකට කියන්නේ අරගා බලන්න වෙන්නේ මැතිවරණයක් වගේ අවස්ථාවක. ඉතින් අපි බහුතර ජනතාවට මේ වෙමින් තියෙන දේවල් වන විනාශය වෙන්න පුළුවන්, පරිසර සංහාරය වෙන්න පුළුවන්, වෙන වෙනත් මේ සංස්කෘතික ඝාතක කල්ලි ගැන වෙන්න පුළුවන් ඒවාට අඩු වැඩි වශයෙන් නිල නොනිල මට්ටමෙන් උදව් උපකාර කරන්නේ මොන දේශපාලකයන්ද ඔවුන් පරාජයට පත් කරන්න ඊළඟට වඩා ජාතිකවාදීව දේශවාත්සල්‍යයෙක් යුත් මිනිස්සු කවුද ඒ ගොල්ලන් ඔසවා තබන්න කියන පණිවිඩයනේ අපි දෙන්නේ.

ප්‍ර: ඔබ වහන්සේ මේ චාරිකාවේ නිරත වෙන කාලය වන විට මැතිවරණයක් ප්‍රකාශයට පත් කරලා තිබුණ ද?

උ: නැහැ නැහැ.

ප්‍ර: මැතිවරණ කාලයක දී කරන ලද ක්‍රියාවක් නෙවෙයි මේක ?

උ: නෑ ඒ කාලේ නම් සාමාන්‍යයෙන් පළාත් සභා මැතිවරණ තිබුණේ එක් කාලයක මේ මාසයක තියෙනවා ආයි මාස කිහිපයකින් තව එකක තියෙනවා ඒ මැතිවරණ කාල සමයක් තමයි ඒ කාලේ. මට නිශ්චිතවම කියන්න දැන් මතකයක් නැහැ. ඔය විල්පත්තු සිද්ධිය ගැන කතා කරන කොට මැතිවරණයක් තිබුණ ද කියලා.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: එහෙම නම් හාමුදුරුවනේ යමෙක් කිව්වොත් පාලකයන් මාරු කරන්න උදෙසා හිතාගෙන මේ හෙළිදරව් කිරීමක් නෙවෙයි මහ ජනතාව පාලන තන්ත්‍රයට එරෙහිව උසි ගැන්වීමේ ක්‍රමවේදයක් කරන්න ඔබ වහන්සේ අනුබල දීමක් කරයි කියලා ඔබ වහන්සේට මොකද්ද කියන්න තියෙන්නේ?

උ: ඒක සම්පූර්ණ වැරදි. එහෙම අදහසක් අපේ නැහැ. මේ පාලකයෝ අද වන කොට මේ රට ගෙනැල්ල තියෙන තැන අපිට පේනවනේ. උදාහරණයක් විදියට ඒ ආණ්ඩු එක් අවුරුදු පහෙන් පහට එනවා. එක කට්ටියක් එක ප්‍රතිපත්තියක් ගන්නවා තව කොටසක් වෙන ප්‍රතිපත්තියක් ගන්නවා. අවසාන විග්‍රහයේ දී අර ඉස්ලාමික කණ්ඩායම් ඔවුන්ගේ අරමුණට වෙන වටයකින් ළඟා වෙලා තියෙනවා. සරලව කිව්වොත් ඒ ඒ කාලේ ඉඳලා අද දක්වාම බලපුවහාම මේ හැම පාලකයෙක්ම දැන හෝ නොදැන ඔවුන්ගේ අරමුණු සඵල කරවා ගැනීම සඳහා ඒ ගොල්ලෝ දේශපාලන ක්‍රමය පාවිච්චි කරලා තියෙනවා.

ප්‍ර: දැන් ඔබ වහන්සේ සඳහන් කළ ආකාරයට ඔය චාරිකාවෙන් පස්සේ ඔබ වහන්සේගේ විග්‍රහයට අනුව ඒ හා සමගාමී වන කරුණු අරඹයා වෙනත් පාර්ශවයකින් මාධ්‍යය හමුවක් නිපෝන් හෝටලයේ තියන්නට මූලිකත්වය ගත්තයි කියලා තමයි ඔබ වහන්සේ අද දිනයේ සාක්ෂියේ කිව්වේ. ඒක හරිද?

උ: ඔව්.

ප්‍ර: ඒ ස්ථානයට ඔබ වහන්සේ යනවා. ඒ දිනයේ දී ඒ ගිය අවස්ථාවේ ඔබ වහන්සේ කළ කතාව මාධ්‍යය මඟින් ප්‍රචාරයට පත් වුණා. එහෙමනේ හාමුදුරුවනේ?

උ: ඔව්.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේ දී එම දිනයේ දී නිපෝන් හෝටලයේ දී ස්වාමීන් වහන්සේ විසින් මාධ්‍යය ඉදිරියේ අදහස් පළ කිරීමක් සිදු වුණා. ඊට අදාළ වන වීඩියෝ පටයක් ගරු සභාව ඉදිරියේ ඉදිරිපත් කිරීමට අවසර අයැද සිටිනවා.

උ: ඇත්ත වශයෙන් මම ඔය ස්ථානයට එන්නේ අපේ ඔය පිරිස එතැන්ට ගිහිල්ලා විනාඩි 45 කටත් විතර පස්සේ .

වීඩියෝ පටයක් ගරු සභාවට පෙන්වා සිටී.

ප්‍ර: හාමුදුරුවනේ මේ සිදුවීම 2014 අප්‍රේල් මාසේ 09 වැනි දින සිදු වූ සිදුවීමක් හැටියට ඔබ වහන්සේට මතකයක් තියෙනව ද?

උ: ඔව්.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ කියන්නේ හාමුදුරුවනේ බොදුබල සේනාව පිහිටුවීමෙන් වසර දෙකකට පමණ කාලයකට පසුව කිව්වොත් හරි ද හාමුදුරුවනේ?

උ: ඔව්.

වේලාව: ප.ව. 02.05
මෙතැන් සිට: නිල්මිණි මෙනවිය.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

දැන් වේලාව: ප.ව.2.05
පෙර සටහන් ල/ලේ: සවිනි මෙනවිය
මෙතැන් සිට ල/ලේ: නිල්මිණි.

ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් ජයවීර මහත්මිය

ප්‍ර: එතකොට ඔබ වහන්සේගේ මහරගම පැවැති විශාල බොදුබල සේනා සමුළුව පැවැත්වීමෙනුත් පසු අවස්ථාවක් මෙය කියලා කිව්වොත් හරිද හාමුදුරුවනේ?

පි: ඔව්.

ප්‍ර: එතකොට ඔබ වහන්සේට අවබෝධයක් තිබුණා ඔබ වහන්සේගේ මතවාදය අනුගාමිකයන් වශයෙන් පිළිගන්නා පිරිස් විශාල ප්‍රමාණයක් මේ අවදිය වන විට හිටියා කිව්වොත් හරිද හාමුදුරුවනේ බොදුබල සේනාව වටා එක්රොක් වුණු බෞද්ධ ජනතාවක් සහ කුමන හෝ ආගමක ජනතාවක් හිටියා කිව්වොත් හරිද හාමුදුරුවනේ?

පි: ඔව්.

ප්‍ර: දැන් එවැනි අනුගාමිකයන් එහෙම නැත්තම් ඔබ අනුව ගමනය කරන්නන් අනුගාමිකයන් එවැනි අයනේ. රැසක් දහස් ගණනින් සිටින අවස්ථාවක බොදු බල සේනාවේ නායකයෙකු වශයෙන් මාධ්‍ය ඉදිරියේ ස්ථාවරය මෙවැනි ආකාරයට ප්‍රචාරය කිරීමෙන් ප්‍රචණ්ඩත්වයට යම්කිසි මඟපැදීමක් වෙනවා කියලා කිව්වොත් හාමුදුරුවනේ ඔබ වහන්සේට කියන්න තියෙන්නේ මොකක්ද?

පි: මාධ්‍ය ඉතින් අපේ නෙවෙයිනේ. අපි යන තැන මාධ්‍ය අරගෙන මේක ප්‍රචාරය කරයි කියලා අදහසකින් නෙවෙයිනේ. අපිට උවමනාව තියෙන්නේ එකක් අමතක කරන්න හොඳ නැහැ අපේ පදනම. මේක අපේ රට. අපි ඒක නිතරම කල්පනා කරනවා. දැන් මේ ඔක්කෝම ප්‍රශ්න ඇති කරලා තියෙන්නේ අපිද? අපි නෙවෙයි. මේ රට ඓතිහාසිකට ගොඩනඟපු ජාතියක් ඉන්නවා. ඒ ජාතිය විසින් විශ්වාස කරන පිළිපදින ආගමික දර්ශනයක් තියෙනවා. ඒ ආගමික දර්ශනය මත ගොඩනැඟුණු සංස්කෘතියක් තියෙනවා. ඒක අවුරුදු දෙදහස් ගණනක උරුමයක්. ඉතින් ඒ උරුමය වෙනුවෙන් අපි හැම වේලාවකම පෙනී ඉන්නවා. අපේ ධර්මය තුළ හඬනගා යම් කරුණක් ප්‍රකාශ කිරීම හැරුණු කොට කිසිම මිලේච්ඡත්වයක් හෝ ප්‍රචණ්ඩත්වයක් අපේ ධර්මය තුළ නැහැ. ඒ ඒ අවස්ථාවල කතා කළ යුතු රිද්මයන් තියෙනවා. ඒ රිද්මය තමයි ඒ වෙලාවට පාවිච්චි කරන්නේ. බණ කියන වෙලාවට බණ කියනවා. පිරිත් කියන වෙලාවට පිරිත් කියනවා. බෝධි පූජාව තියෙන වෙලාවට කෑගහන්නේ නැහැනේ ඒක බොහොම ලයාන්විතව කරනවා. මෙවැනි සිද්ධියක දී මේ රටේ මහා වනාන්තරයක් වෙච්ච විල්ලු දහස් ගණනක්

FAIR COMMENT BY JEZEEM

තියෙන විල්පත්තුව කපලා ඒක එහෙම නෙවෙයි කියලා කියන්න සංඝයා වහන්සේලා පාවිච්චි කරනකොට අපි කොහොමද නිහඬව ඉන්නේ. මේක මේ මොකද මේ අපේ පරම්පරාවේ ප්‍රශ්නයක්වත් මගේ පෞද්ගලික ප්‍රශ්නයක්වත් දායක සභාවේ ප්‍රශ්නකයක්වත් නෙවෙයි. අපි මේ කතා කරන්නේ සහ පෙනී ඉන්නේ, හඬ නඟන්නේ මුළු මහත් ජාතියක් වෙනුවෙන්. එහෙම නැතුව මේක මේ එක කුටුම්භයකට කොටු කරන එක වැරදියි.

ප්‍ර: හාමුදුරුවනේ දැන් ඔබ වහන්සේ ඒ අවස්ථාවට සහභාගී වෙනවට ඔබ වහන්සේ ඒ මොහොතේ අවබෝධයක් තියෙනවානේ මෙය මාධ්‍ය මඟින් පටිගත කිරීමක් සිදුවෙනවා කියන එක. මාධ්‍ය හමුවකට නේ ඔබ වහන්සේ මේ යන්නේ?

පි: මාධ්‍ය හමුව තිබුණේ නැහැ. මාධ්‍ය හමුව තියෙන්නේ උඩනේ. මේ ඉස්සර වෙලා සම්මුඛ වෙන තැන.

ප්‍ර: ඒ සම්මුඛ වෙන තැන වීඩියෝ දර්ශනයේ දර්ශනය වුණ ආකාරයට පටිගත කිරීම් වටේම සිදු වෙන බව ඔබ වහන්සේට පෙනීමක් තිබුණා කිව්වොත් ඔබ වහන්සේ ඒක පිළිගන්නවානේ හාමුදුරුවනේ. වීඩියෝ කරනවා පේනවානේ හාමුදුරුවන්ට?

පි: සාමාන්‍යයෙන් ඉතින් බහින් බස්වීම් මේ රටේ තියෙන හැටියට හැම තැනම කැමරා ගැහුවොත් ඔය වගේ තමයි හැම තැනම. නමුත් ඉතින් මෙතන මාධ්‍යවේදීන් හිටියා. මොකද මාධ්‍යවේදීන් එනවා මාධ්‍ය සාකච්ඡාවට සහභාගී වෙන්න. ඒගොල්ලන්ට සද්දයක් ඇහෙනවා මොකක්ද මේ කලබලය කියලා ඒ අනුව ඒගොල්ලන් පටිගත කරන්න ඇති.

ප්‍ර: එහෙමයි හාමුදුරුවනේ. දැන් ඔබ වහන්සේ ඒකයි මගේ මුල් ප්‍රශ්නෙත් වුණේ. ඔබ වහන්සේ මේ මොහොතට සහභාගී වෙන අවස්ථාව වන විට බොදු බල සේනා නැමැති අනුගාමිකයන් රැසක් ඉන්න එය සංවිධානයක් වශයෙන් ගොනු ගත කරලා තිබිච්චි සංවිධානයක නායකයෙක් හැටියට තමයි ඒ අවස්ථාව වෙන කොට සමාජය තුල පිළිගැනීමක් හැටියට තිබුණේ කිව්වොත් හරිද හාමුදුරුවනේ?

පි: ඔව්. ඉතින් බොදුබල සේනා සංවිධානයේ ලේකම් හාමුදුරුවෝනේ.

ප්‍ර: එතකොට එවැනි ස්වාමීන් වහන්සේ කෙනෙක් වශයෙන් මාධ්‍ය ඉදිරියේ හැසිරීමේදී ශ්‍රී ලංකාව තුළ පවතින ක්‍රමවේදය, රාමුව තුළ හැසිරීමක් සිදු විය යුතුයි කියලා යමෙක් කියනවානම් ඔබ වහන්සේට කුමක්ද ඒ ගැන කියන්න තියෙන්නේ?

පි: ඝණ්ඨාරයක් එල්ලලා තියෙන්නේ ඇයි පන්සල් වල පල්ලි වල. ඝණ්ඨාරය හයියෙන්ම නාද වෙන්නේ කොයි වෙලාවට ද? මොකක් හරි ගමේ කරදරයක් නම් හයියෙන් පල්ලියේ හරි පන්සලේ හරි ඝණ්ඨාරය ගහනවා. ඒ වෙලාවට බලන්නේ නැහැනේ ඝණ්ඨාරය රීදි ද රත්තරං

FAIR COMMENT BY JEZEEM

උලලා ද එහෙම නැත්තම් ලණුව නයිලෝන් ද කියලා. ඒවගේම තමයි මේ රටේ සම්ප්‍රදායක් තියෙනවා ඓතිහාසික සම්ප්‍රදායක්. ඒක මිහිඳු හාමුදුරුවන්ගේ ඉඳලා එන සම්ප්‍රදායක්. ඒ සම්ප්‍රදාය තමයි රටට දැයට සමයට විපතක් වෙනකොට එක හඬගාලා කෑගහලා කියනවා. අපිට අනන්‍ය භාෂාවක් තියෙනවා. ඉතින් අනිත් අයට සිංහල නොතේරුණාට අපිට කරන්න දෙයක් නැහැ. එතකොට ඒ සිද්ධියයි වැදගත්. වැදගත් වෙන්නේ සිද්ධිය. වරදක් කරලා ඒ වරද නිවැරදි කර ගැනීම සඳහා සිවුරක් පාවිච්චි කරලා ඒ තක්කඩි වැඩේ කරනකොට අපිට ඒ ස්වරයෙන් කතා කරන්න වෙනවා. ඒක නරක දෙයක් නෙවෙයි. කවුරුහරි ඒක නරකයි කියලා කියනවානම් ඒක වැරදියි. ඒක අපි බලන්න ඕනි ඒ සංඥාවෙන් දෙන පණිවිඩය මොකක් ද කියලා. සඟ්යාරය වගේ තමයි. අර සඟ්යාරය එක වෙලාවකට බොහොම රිද්මයානුකූලව, දැන් ඒ වගේම සහතික වශයෙන් අවධානය යොමු කරන කොට ඒ වීඩියෝ පටිය බලනකොට පේනවා ඒ සංඝයා වහන්සේ සමස්ත බෞද්ධයන්ගෙන්, හාමුදුරුවරුන්ගෙන් ඔක්කෝගෙන්ම සමාව අරගෙන මම පාවාදීමක් තමයි කරන්නේ කියලා ඒ ප්‍රශ්නය එතනින් ඉවරයි. එතනින් එහාට ඒක ගැටුමක් දක්වාවත් දැන් අපි උදාහරණයක් විදිහට ගත්තොත් අපි ලංකාවේ බොදු සමුළු පවත්වලා තියෙනවා 30-40ක්. මාවනැල්ල නගරයෙත් බොදු සමුළුවක් තිබ්බා. මුස්ලිම් මිනිස්සු මැද. හැබැයි අපි කවදාකවත් සමුළුවෙන් පස්සේ කිසිම කෙනෙක් ගල් කැටයක් අරගෙන ගහලා නැහැ. ඒවගේ විශාල සමුළු පවත්වලා තියෙනවා. කවදාකවත් ගිහිල්ලා වීරෝධතා පළ කරලා නැහැ. බොහොම සමකාමීව මිනිස්සු විසිර ගිහිල්ලා තියෙනවා මේ ඇති වෙලා තියෙන තත්ත්වයන් තේරුම් අරගෙන.

****

<u>**ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා**</u>

ප්‍ර: ගරු ස්වාමීන් වහන්ස මෙම කැලෑ කැපීම සම්බන්ධව ස්වාමීන් වහන්සේ කතා කළේ?

පි: ඔව්.

ප්‍ර: ඒකට මූලිකත්වය ගෙන ක්‍රියා කළ අමාත්‍යවරු කවුද?

පි: රිෂාඩ් බදුර්දීන් අමාත්‍යවරයා.

ප්‍ර: ඒ අමාත්‍යවරුන්ට විරුද්ධව ගිහිල්ලා ඔබ වහන්සේ මේ විදිහට විරුද්ධත්වය පළ කිරීම ..?

පි: මැතිතුමනි ඒවා සියල්ල අපි දැනුවත් කරලා තියෙනවා. ඒ කාලේ . ඉතින් සමහරක් දේවල් අපිට ඒ ලැබුණු පිළිතුරු අපිට මෙතන කියන්න අමාරුයි. ඒ කියන්නේ එවකට හිටපු ආණ්ඩුවේ පාලකයන්ට අපි කිව්වා. වැඩිය තබා එවක ජනාධිපතිවරයාට මේක කිව්වා. ජනාධිපතිතුමා

FAIR COMMENT BY JEZEEM

මොකක්ද කිව්වේ අපිටත් පාලනයක් නැහැ හාමුදුරුවනේ මේක හෙළිදරව් කරන්න කිව්වා. ඉතින් කොහොමද තත්ත්වේ. ඉතින් ඒ දැනුවත් කරාම ලැබුණු පිළිතුරු මේ. ඉතින් මේක මේ සරලව කිව්වොත් මේ අවිද්‍යාත්මක දේශපාලන ක්‍රමයේම ප්‍රතිඵල තමයි. අපි හඬනඟන්න , කෑගහන්න , වැලපෙන්න ඕනි නැහැනේ මැතිතුමනි හරියට ඒ නීතිය ක්‍රියාත්මක වෙනවානම්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේ දී නීතිපති දෙපාර්තමේන්තුවේ උගත් ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥවරියටත් ගෞරවනීය ස්වාමීන් වහන්සේටත් ප්‍රකාශ කරන්නේ දැනටමත් විල්පත්තු කැළෑ කැපීම සම්බන්ධයෙන් නඩු තීන්දුවක් ලබා දීමට නියමිතව තිබෙනවා. ඒක හින්දා කරුණාකරලා ඒ සම්බන්ධයෙන් කතා කරන්න එපා. මොකද ඒ නඩු තීන්දුවට සම්බන්ධ වන විනිශ්චයකාරවරුන් දෙදනෙක් මෙතන සිටින නිසා. එහි අවශ්‍ය ප්‍රමාණයට පමණක් ඒ සිද්ධියට සඳහනක් කරන්න. නැත්තම් ඒකට සම්බන්ධ කවුද , කවුද වැරදි, කවුද නිවැරදි කියන එකට සම්බන්ධයෙන් කතා නොකරන ලෙසට සියලු පාර්ශවයන්ට දන්වනවා.

පි: මට කෙටියෙන් කියන්න තියන්නේ මැතිතුමනි ඔය දිගින් දිගටම ඔය වීඩියෝ පටය ගැන නෙවෙයි ඇත්ත වශයෙන්ම වැදගත්. අපිට තියෙන ලොකුම ගැටලුව වුණේ මේ විනාශය ඔය කියන්නා වූ ප්‍රදේශයේ විනාශය අපි බැලුවේ ජාතික ආරක්ෂාවට තර්ජනයක්, වනයේ වන සතුන්ට ප්‍රශ්නයක්, එකම කණ්ඩායමක් එකම කලාපයක් විදිහට පදිංචි කරවීම ඒක තවත් ප්‍රශ්නයකට මුල පිරීමක්. මෙන්න මේ කාරණා සියල්ලම සැලකිල්ලට අරගෙන තමයි මේ ප්‍රශ්නයට අපි මැදිහත් වුණේ. ඉතින් ඒගොල්ලෝ ඒක එහෙම නෙවෙයි කියන්න උත්සාහ කරනවා. අපේ පැත්තෙන් අපි කියනවා නැහැ ඒක එහෙම තමයි කියලා. ඉතින් ඒ ඇති වෙච්ච සංවාදයේ යම් යම් අවස්ථා පමණයි ඔය.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් ජයවීර මහත්මිය</u>

ප්‍ර: එහෙමයි හාමුදුරුවනේ. ඔබ වහන්සේ හොඳ තැනකට ඒ පිළිතුර අවසාන කරා. මම මේ වීඩියෝ පටය ඉදිරිපත් කිරීමෙන් ඔබ වහන්සේගෙන් ප්‍රශ්නය අහන්න බලාපොරොත්තු වුණෙත් යමෙකු මතවාදයක් මාධ්‍ය සාකච්ඡාවකින් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවානම් ඊට විරුද්ධ මතයක් දරන පුද්ගලයෙක්ට ඒ මාධ්‍යය හමුව මැද්දට ගිහිල්ලා මාධ්‍ය ඉදිරියේ එයට විරෝධය පෑමට වඩා වඩාත් සුදුසු වන්නේ ඔබ වහන්සේට වෙනත් මතවාදයක් තිබෙනවානම් ඒ සම්බන්ධයෙන් වෙනත්

FAIR COMMENT BY JEZEEM

මාධ්‍ය හමුවක් කැඳවලා හෝ වෙනත් මුද්‍රිත මාධ්‍යයකට ප්‍රකාශයක් නිකුත් කරලා හෝ ඔබේ මතය ඉදිරිපත් කළ යුතුයි කියන කාරණාව සමාජ සම්මුතිය තුළ තිබෙනවානම් ඒ සමාජ සම්මුතියට එරෙහි වීමක් නේද ඔබ වහන්සේ මේ ක්‍රියා කළ ආකාරය කියලා කිව්වොත් හරිද?

පි: ප්‍රශ්නය වැරදි තැනින් අල්ල ගත්තොත් දෙන්න වෙන්නේ වැරදි උත්තර. පළවෙනි දේ අපි මාධ්‍ය සාකච්ඡාවකට ගියේ නැහැ. මාධ්‍ය සාකච්ඡාව තිබුණු වෙලාවට කළින් වෙච්ච සිද්ධියක් මේ. අපට ආරංචියක් ලැබුණා ඔය අදාළ සිද්ධිය සම්බන්ධයෙන් අර ඇමැතිවරයාගේ මුත්‍ර කරාම මොකක්ද එක හෝදන්න වතුර අරන් ගියපු සංඝයා වහන්සේ මෙන්න අහවල් ඇමැති එක්කත් එකතු වෙලා බෞද්ධයන්ට එරෙහිව කතා කරන්න යනවා කියලා කිව්වාම අපිට ඕනි වුණා ඒක නතර කරන්න. නැතුව අපි මාධ්‍ය හමුවට කඩාගෙන පැන්නේ නැහැ. අපේ කණ්ඩායමක් ගිහිල්ලා මේක විමසා බලන අතර වාරයේ දී මේක ප්‍රමාද වෙනවා. ඒ අනුව තමයි මම ගිහිල්ලා බැලුවේ මොකක්ද මේ ප්‍රමාදය මෙතන ගහගන්නවාද මොකක් හරි වෙන කලබලයක් වෙලාද ඒ අනුව තමයි මම ඒ එතෙන්ට යන්නේ. එතෙන්ට යනකොට තමයි දැක්කේ අර පාකිස්තානු වර්ගයේ ඒ කියන්නේ පාකිස්ථානයේ ඇතැම් මවුලිවිලා පලඳින ඔළුවට දාන ජටාව වැනි එවැනි ඇඳුම් ඇඳ ගත්ත ඒ පිරිස ඉන්නවා. ඒ අනුව ප්‍රශ්න කිරීම් කරා. ඒක කරන්න ඕනි. නැත්තම් මේක මේ හොර රහසේ වෙන දේ කොහොමද හෙළිදරව් කර ගන්නේ. ඒ නිසා ඒ වීඩියෝ පටයේ තියෙන පරිදි මාධ්‍ය සාකච්ඡාවකට ගිහිල්ලා බාධා කරානම් ඒක වැරදියි. ඒක සදාචාර විරෝධියි. ඒක නීති විරෝධියි. අපි මාධ්‍ය හමුවකට ගියේ නැහැ. මාධ්‍ය හමුව තිබුණේ උඩ තට්ටුවේ. ඒක තියෙන්නේ පස්සේ. අපි මේ ගියේ මාධ්‍ය හමුව පවත්වන්න ආවායැයි කියපු අය රැස් වෙච්ච තැනටයි මේ ගියේ. සිද්ධි දෙකක් ඒක හරියට අර අලුත්ගම සිද්ධිය වගේ. අලුත්ගම තමයි රැස්වීම පවත්වන්නේ හැබැයි ගහගන්නේ දර්ගා නගරයේ. හැබැයි ලෝකේට යන්නේ අලුත්ගම සිද්ධිය කියලා. අලුත්ගම ගහගැනීමක් වුණේ නැහැ. ඒ වගේ තමයි මේකත්.

ප්‍ර: මේ සභාව ඉදිරියේ ඉදිරිපත් වුණු ඇතැම් සාක්ෂි මඟින් ඔබ වහන්සේගේ ඇතැම් ක්‍රියාකලාප මුස්ලිම් ජනතාවගේ සිත් රිදවීමට හේතු කාරක වුණාය කියන සාක්ෂි ඉදිරිපත් කරලා තියෙනවානම් මේ දැනට ඉදිරිපත් කළ වීඩියෝ පටයේ ඔබ වහන්සේගේ හැසිරීම් ක්‍රමවේදයේ එවැනි සිත් රිදවීමකට හේතු කාරණා වුණා කියලා යමෙක් කියනවානම් ඔබ වහන්සේට ඒ සම්බන්ධයෙන් කියන්න තියෙන්නේ මොකක්ද ?

පි: ඒකටනේ ඉතින් මුස්ලිම් කියන්නේ. මුස්ලිම් කියන්නේ ඒකට තමයි. සහරාන් ගැහුවාට පස්සේ ඔක්කෝම එකට හිට ගත්තේ. පක්ෂ, විපක්ෂ, සම්ප්‍රදායික, ස්වදේශික , මධ්‍යස්ථ, Moderate ඔය ඔක්කෝම එකට හිට ගත්තේ. ඒක තමයි මුස්ලිම් කියන්නේ. ඒගොල්ලන්ට වරදක් පෙන්වලා

FAIR COMMENT BY JEZEEM

දෙන්න බැහැ ඒගොල්ලෝ වැරදි පිළිගන්න ජාතියක් නෙවෙයිනේ. ඒගොල්ලෝ වගකියන්නේ Only One God එක දෙවියන්ටයි වගකියන්නේ. ඒගොල්ලෝ කැළෑ කපද්දී අපි කියනවානම් ආනේ හරි හොඳයි කපා ගන්න කියලා. හරි හොඳයි ඒක. ඒක පෙන්වලා දෙන එක. අපි යක්ෂයෝ වැරදිකාරයෝ. ඉස්සර වෙලාම අපි තේරුම් ගන්න ඕනි මොකක් ද මේ මුස්ලිම් කියන්නේ කියලා. ඉස්ලාම් කියන්නේ මොකක්ද මුස්ලිම් කියන්නේ මොකක්ද, කුරාන් කියන්නේ මොකක්ද හදීස් කියන්නේ මොකක්ද කියලා මේ Teachings වලින් සන්නද්ධ වෙච්ච පංචස්කන්ධ කරන මේ කාරණාව හේතු ඵලවාදීව නොදැක මේ සිද්ධින් එක්කලා කවදාකවත් මේ ප්‍රශ්නය හරියට හඳුනා ගන්න බැහැ. ඒක හඳුනා ගන්නතාක් කල් මේ ප්‍රශ්න වලට උත්තරත් නැහැ.

ගරු සභාපති තුමනි මේ අවස්ථාවේ දී ගරු සභාවේ අවධානයට යොමු කරන ලද වීඩියෝ පටයෙහි තියෙන එක්තරා අවස්ථාවක් නිශ්චිත ඡායාරූපයක් හැටියට දැනටමත් C – 649 වශයෙන් සළකුණු කොට තිබෙන බැවින් මෙම CD තැටිය C -649 (A) වශයෙන් සළකුණු කිරීම සඳහා අවසර අයැද සිටිනවා.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේ දී තවත් වීඩියෝ පටයකට ගරු සභාවේ අවධානය යොමු කිරීමට අවසර අයැද සිටිනවා.
මේ අවස්ථාවේ දී වීඩියෝ පටයක් ප්‍රදර්ශනය කරයි.

ප්‍ර: හාමුදුරුවනේ ඔබ වහන්සේට මතකයක් තිබෙනවාද මේ වීඩියෝ පටයෙන් දර්ශනය වුණ අවස්ථාව කොහේද කියලා?

පි: ඕක වැරදියිනේ. ඔය ප්‍රශ්නය මගෙන් අහන එක වැරදියි. ඔය සම්පූර්ණ වීඩියෝ එක බලන්න ඕනි. මේ අතන තියෙන එක වචනයක් අල්ල ගන්න බැහැ. කතාවක් කරනකොට ඒකේ ගලපා ගැනීමක් තිබෙනවා. ගලාගෙන එනවා. කතාවේ මුල ඉඳලා දාන්න. මුල ඉඳලා දාලා අඛසරණ දක්වාම දාන්න අන්න එතකොට තේරෙයි මේ මොකක්ද මේ කියන්නේ කියලා. එක වචනයක් අල්ලගෙන. දැන් ඔය BBC එකෙන්නේ ඔය දාලා තියෙන්නේ ඔය කෑල්ලත්. ඔය ඉතින් අසාම් අමීන්නේ. අමීන්ගේ මුස්ලිම් කවුන්සලයේ සභාපතිගේ පුතානේ. ඔය කාලේ ඕවා වාර්තා කරේ. ඒ හින්දා සම්පූර්ණ වීඩියෝ පටය බලන්න මැතිතුමනි ඒක පොඩි වෙලාවක් ගියත් එතකොට මේක තේරෙනවා මොන හේතුවෙන් ද මේ උද්වේගයෙන් කතා කළේ. මොකක්ද හේතුව අපේද වරද. රටේ පාලකයන්ගේ ද වරද. නීතිය ද වරද කියන එක මැතිතුමනි බලා ගන්න පුළුවන්. නැත්නම් මේ පොඩි clip එකක් දාලා කොහොම ද මේ සමස්ත කතාව තේරුම් ගන්නේ.

ප්‍ර: එහෙමයි හාමුදුරුවනේ මම ඇහුවේ මේ අවස්ථාව කෙහේ කොයි කාලේ සිදු වුණ එකක් ද ?

FAIR COMMENT BY JEZEEM

පි: අලුත්ගම සිද්ධිය.

ප්‍ර: එහෙමයි හාමුදුරුවනේ. ඔබ වහන්සේ සතුව පූර්ණ වීඩියෝව මේ අවස්ථාවේ දී තියෙනවාද හාමුදුරුවනේ?

පි: ඒක පොඩි වෙලාවක් තියෙන්නේ . ඒ මුල් කොටස ඇහුවත් ඇයි මෙවැනි දෙයක් කරන්නේ මැතිතුමනි මට ඒක සාරාංශ ගත කරලා හොයලා දෙනකම් ඉන්න. මැතිතුමනි ඇත්තම සිද්ධිය තමයි ඒක අපි අදත් ඉල්ලනවා මේකට කොමිෂමක් පත් කරන්න කියලා. හැමදාම මේ මුස්ලිම් පාර්ශවයන් කරන්නේ ඕක තමයි. මැතුතිමනි අපි බලන්න ඕනි මේ අලුත් ගම රැස්වීම පවත්වපු එක නෙවෙයි. ඒ රැස්වීමක් පැවැත්වීම දක්වා මුස්ලිම් අය කරපු අපරාධ ටික. දැන් මැතිතුමනි ඔය රැළිය පවත්වන්න පෙරාතුව සිද්ධීන් 4ක් වුණා. ඒ සිද්ධීන් 4 අනුවේදිනීය සිද්ධි 4ක්. එකක් තමයි අලුත්ගම තියෙනවා දර්ගා නගරය. ඒ දර්ගා නගරය මැතිතුමනි මීට අවුරුදු 25කට විතර කළින් එහි නම හාදිය වත්ත. හාදිය වත්ත ගාඩිය වත්ත වුණා. දැන් කාදිය වත්තත් නැහැ ගාදිය වත්තතත් නැහැ. දැන් ඒක දර්ගා ටවුන්. ඇයි මුස්ලිම් අය බහුතරයක් වුණා. ඒ නම් වෙනස් වුණා දැන් සිංහල නම් නැහැ. එතකොට ඒ නගරයේ ආසන්නයේ තියෙනවා විහාරස්ථාන 2ක්. එක පන්සලක් කුරුඳුවත්ත බෝධිරාජාරාම විහාරාස්ථානය. සිංහල පවුල් 60යි ඉන්නේ මැතිතුමනි. අනිත් ඔක්කෝම මුස්ලිම්. කිසිම සංඝයා වහන්සේ නමකට මේ විහාරස්ථානයේ මාස 4කට 5කට වඩා රැදෙන්න දෙන්නේ නැහැ මුස්ලිම් අයගේ අඩන්තේට්ටම්. නමුත් 2011 වගේ කාලයේ ඉඳලා තරුණ හාමුදුරු කෙනෙක් අවුරුදු තිස් ගණනක්. අයගම සමිත කියලා ඒ හාමුදුරුවෝ ඇවිල්ලා මුස්ලිම් අයත් එක්කත් බොහොම හොඳින් අර සාම්ප්‍රදායක මුස්ලිම් මිනිස්සු එක්කත් බොහොම හොඳින් ගනුදෙනු කරමින් පන්සල ටික ටික ටික ටික දියුණු කරගෙන ආවා. දියුණු කරන් එන අතරතුරේදී එක දවසක් උදේ පාන්දර අපි සිරිතක් විදිහට උදේට නැඟිටලා මිදුල් අමදිනවා. බෝධි මළුව අමදිනවා. අමදිනවා කියන්නේ අතුපතු ගානවා. පොඩි උන්වහන්සේලා 4 දෙනෙක් ඉන්නවා. මේ පන්සලේ විහාරාධිපති හාමුදුරුවෝ ඉඳලාත් අරගෙන බෝධිය අමදිනවා. මේ පාර අයිනේමයි තියෙන්නේ. බෝධිය අමදිනකොට මුස්ලිම් තරුණයෝ 4දෙනෙක් ඇවිල්ලා කිසිම හේතුවක් නැතිව නිල් පාට වතුර පුරවපු බාල්දියක් මේ හාමුදුරුවන්ගේ ඇඟට හලනවා. පළවෙනි සිද්ධිය මැතිතුමනි. ඊට දවස් 2කට පස්සේ හරකෙකුගේ බෙල්ල කපලා අඩු 4ත් එක්ක ලේ බේරී බේරී පන්සල ඉස්සරහා දොරටුව ඉස්සරහ ගෙනල්ලා දාලා. හාමුදුරුවෝ නැඟිටිනකොට බොහොම කම්පනයට පත්වෙලා මොකක්ද මේ අපි ලේ දකින්න කැමැති ජාතියක් නෙවෙයිනේ. පොලිසියට කතා කරාම පොලිසියෙන් ඇවිල්ලා මේ හරක් ඔළුවයි, අඩු 4යි අරගෙන යනවා. හාමුදුරුවෝ මොකද කරන්නේ ගමේ ඉන්න වැඩිහිටි මුස්ලිම් කෙනෙකුට

FAIR COMMENT BY JEZEEM

කතා කරලා කියනවා මොකක් ද මේ කළින් දවසේ මට වතුර වලින් ගැහුවා. දැන් මේ හරකෙකුගේ බෙලි කපලා කවුද මේවා කරන්නේ. මේවා බෞද්ධයෝ අපේ දායකයෝ දැන ගත්තොත් මෙතන ගැටුමක් ඇතිවෙනවා. කරුණාකරලා මේකට ඉඩ දෙන්න එපා. හාමුදුරුවෝ ඒ අවවාදය කරනවා. මැතිතුමනි තවත් දවස් 3කට පස්සේ ඒ පන්සලේ පොඩි හාමුදුරුවෝ 4නම පිරිවෙනට යන්නේ කළුවාමෝදර පිරිවෙනට. පන්සලේ ඉඳලා මීටර දෙතුන් සීයක් යන්න ඕනි බස් එක ගන්න. බස් එක ගන්න යන පාර දෙපැත්තේ තියෙන්නේ මුස්ලිම් කඩවල්. මුස්ලිම් ප්‍රදේශයක්නේ. මේ පොඩි හාමුදුරුවෝ 4දෙනා පිරිවෙන් යනවා. දානය වළඳලා පාගමනින් යනකොට සංවිධානාත්මකව කටේ කෙළ පුරවගෙන කටේ කෙළ පුරවගෙන හිටපු මුස්ලිම් තරුණයෝ කිහිප දෙනෙක් ටුක් ගාලා හාමුදුරුවන්ගේ සිවුරට කෙළ ගහනවා. ටුක් ගාලා හාමුදුරුවන්ගේ සිවුරට කෙළ ගහනවා. මේ හාමුදුරුවෝ පොඩි හාමුදුරුවෝ අඬඅඬා ආපහු ඇවිත් කියනවා ආපහු අපිට මේ පාරේ යන්න බැහැ. දෙනමක් යනවා යන්න පන්සලෙන්. ඊට පස්සේ මේ හාමුදුරුවෝ තීරණය කරනවා පයින් යවන්න බැහැ. මේක ප්‍රශ්නයක් කියලා . ත්‍රීවිල් එකක පිරිවෙනට යවන්න තීරණය කරනවා. සංවේදීම සිද්ධිය හරියටම පොසොන් පෝය දවසේ මේ අයගම සමිත හාමුදුරුවෝ එතින් 1 ½ km ක් එහා තියෙන අනිත් පන්සලට ධර්ම දේශානවකට වඩිනවා. හරියටම පොසොන් පෝය දවසේ මැතිතුමනි. එහා පන්සලට බණට වඩිනකොට මුස්ලිම් තරුණයෝ දෙන්නෙක් මෝටර් සයිකලය නවත්වලා තියෙනවා පාර මැද්දේ. හෝන් එක ගහනවා රියදුරා. හාමුදුරුවන්ගේ මල්ලී වාහනය එළවගෙන යන්නේ. මුස්ලිම් තරුණයෝ කිහිප දෙනෙක් ඇවිල්ලා කියනවා මෙහේ හෝන් ගහන්න බැහැ. මේවා අපේ ප්‍රදේශ. හාමුදුරුවෝ කියනවා ඕගොල්ලන්ගේ ප්‍රදේශ වෙන්න පුළුවන් මල්ලී පාර පොදුයිනේ. අද මේ පෝය දවසේ මං අර පන්සලේ බණට යන්නේ. එහෙම කිව්වාට පස්සේ බයිසිකලය අයින් කර ගන්නවා හාමුදුරුවෝ යනවා. මේ බයිසිකල්කාරයෝ මොකද කරන්නේ තව බයිසිකලයක් එක්ක එකතු වෙලා ආයේ අර වෑන් එක over take කරලා හරස් කරලා නවත්වලා හාමුදුරුවන්ට දෙකක් ගහලා කාණුවට තල්ලු කරනවා. Driverටත් ගහලා පාරට තල්ලු කරනවා. මේ පොසොන් පෝය දවසේ. මැතිතුමනි මම එදා ධර්ම දේශනාවකට ගිහිල්ලා ගම්පොළ හිටියේ. දැන් ඒ ප්‍රදේශයේ හාමුදුරුවෝ කිහිප නමක් කතා කරලා මටත් කිව්වා මෙහෙම සිද්ධියක් හාමුදුරුවනේ. මෙහෙම පොසොන් දවසේ සමිත කියලා හාමුදුරු කෙනෙකුට ගහලා. එතකොට මේ උන්වහන්සේ අපි අඳුරන්නේ නැහැ. හාමුදුරු කෙනෙකුට ගහලා මේක මහා ඇවිලීමක් වෙන්න යන්නේ. තමා අත්අඩංගුවට අරගෙනත් නැහැ මේ ගහපු කට්ටිය කියලා. ඒ අනුව මම වහාම කතා කරලා කිව්වා අපේ ජාතික සංවිධානයක හාමුදුරුවන්ට.

FAIR COMMENT BY JEZEEM

හාමුදුරුවන්ගේ මම ඉන්නේ ගම්පොළ. මට එන්න වෙලා යනවා. ඔබ වහන්සේ ගිහිල්ලා මෙතන ප්‍රශ්නයක් ඇති වෙන්න දෙන්න එපා. ඒ වෙනකොට සාක්ෂි දරන්න පුළුවන් නම් අත්අඩංගුවට ගත්තේ නැහැ මේ හාමුදුරුවන්ට ගහපු පිරිස අත්අඩංගුවට ගත්තේ නැහැ කියලා කිව්වාට පස්සේ අපි කවුරුත් දන්නවා පොසොන් පෝය දවසට මිනිස්සු හැම පන්සලකම රැස් වෙලා ඉන්නේ. මිනිස්සු සීය දෙසීය, තුන්සීය හැම පන්සලකම රැස් වෙලා ඉන්නේ. ඕන කෙනෙක් ආයේ අමුතුවෙන් රැස් කරන්න ඕනි නැහැ. මිනිස්සු දෙතුන් දාහක් රැස් වෙලා. පොලිසිය ළඟ උද්ඝෝෂණ. ගහන්න හදන්නේ ටවුන් එකට. අපේ සංවිධානයේ ජාතික සංවිධානයක හාමුදුරුවෝ ගිහිල්ලා තමයි ගැටුමක් හදාගන්න එපා ඉන්න අපි පොලිසියට බලකරලා අත්අඩංගුවට ගමු මේගොල්ලන් කියලා හවස 6.30 වෙනකොට මැතිතුමනි මේකොල්ලෝ කොහොම හරි අත්අඩංගුවට ගන්නේ. ඒ කරලා පිරිස විසුරුවා හරින්නෙත් අපේ සංවිධානයේ ජාතික සංවිධායක හාමුදුරුවෝ අපි කතා කරලා. ඒ දවස් වල හිටපු අමාත්‍ය කුමාර වෙල්ගම ආවා. කොල්ලෝ හූ කියලා එලෙව්වා. රෝහිත අබේගුණවර්ධන ආවා ඒගෝල්ලෝ කළුතර නිසා. හූ කියලා එලෙව්වා. ඊට හේතුව ඒ කාලය වෙනකොට කිසිදු සිංහල හෝ මුස්ලිම් කිසිම ඇමතිවරයෙකුට මන්ත්‍රීවරයෙකුට ඒහේ වැඩ කරන්න බැරි තත්ත්වයක් උදාවෙලා තිබුණා. විශේෂයෙන් ඒ කාලේ රාජිත සේනාරත්න මහත්මයාගේ නොහික්මුණු ක්‍රියාකලාපයන් නිසා. මොකද නීතිය හරියට ක්‍රියාත්මක කරන්න දුන්නේ නැහැ පොලිසියට. ඔක්කෝම ඉස්ලාම් අයගේ ප්‍රශ්න විශාල තැලීමක හිටියා. අන්තිමට මැතිතුමනි ලැව් ගින්නක් වගේ අපි කවුරුත් දන්නවා මට මේක විනාඩියක් මොකද මෙවැනි තැනකවත් මේක කියන්න ඕනි නිවැරදි කර ගන්න ඕනි. මැතිතුමනි පොසොන් කාලෙට එහේ තියෙනවා පොසොන් මේලා කියලා. ඔය අලුත්ගම, බේරුවල ඒ දිගටම පොසොන් මේලා. වටේ පළාතේම මිනිස්සු තොරණ් සාමාන්‍යයෙන් 10ක් 12ක් තියෙනවා. ඔය ප්ලාස්ටික් බඩු විකුණනවා. රස කැවිලි විකුණනවා. ඉතින් ඔය කානිවල් එක එක සෙනඟ දහස් ගණනක් ඉන්න කාලයක් ඔය. ලැව් ගින්නක් වගේ මේක ප්‍රචාරය වුණා. කවුරුත් ප්‍රචාරය කරලා නෙවෙයි. හාමුදුරු කෙනෙකුට මෙන්න මුස්ලිම් අය ගහලා මෙන්න මෙහෙමයි දැන් ඒ ප්‍රදේශයේ ඉන්න තරුණ පිරිස මොකද කළේ ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ලේකම් හාමුදුරුවෝ හම්බවෙලා කිව්වා හාමුදුරුවනේ ඔබ වහන්සේලා දැන්වත් ක්‍රියාමාර්ගයක් නොහත්තොත් අපිට හැමදාම මෙහෙම ගුටි කන්න බැහැ. එක්කෝ නීතියෙන්වත් අපිට පිළිසරණක් නැහැ. ඔබ වහන්සේලා මොකක් හරි මේකට ක්‍රියාමාර්ගයක් ගන්න. එක්කෝ ජනාධිපති දැනුවත් කරන්න. ඔය ආදී වශයෙන් සාකච්ඡාවක් ඇති වෙනකොට එහි ඉන්න ලේකම් හාමුදුරුවෝ බුද්ධසිරි විහාරයේ ලේකම් හාමුදුරුවෝ මට කතා

FAIR COMMENT
BY JEZEEM

කරලා කිව්වා අනේ ඥානසාර හාමුදුරුවෝ මෙහෙම ප්‍රශ්නයක් අපිට ඉන්න හම්බුවෙන්නේ නැහැ පන්සල් වල. ඉලන්දාරි ආවේගයට පත්වෙලා පොඩ්ඩක් වඩින්න මේක කොහොමහරි විසඳගන්න. හොඳයි කියලා අපි මට මතක විදිහට බදාදා දවසක්. මම ගියා. ගිහිල්ලා ඔක්කෝම මේ හාමුදුරුවරුන් විස්තර ටික ඇහුවා. හාමුදුරුවරු 40ක් විතර ඇවිල්ලා තිබුණා. ඔය පළාතේ බුද්ධ සිරි විහාරයට. මම කියපු සිද්ධි 4 විතරක් නෙවෙයි. ඊට මාසයකට පෙරාතුව නගරයට ආපු රූමත් තරුණියක් සල්ලි තියෙන ව්‍යාපාරික මහතෙකු විසින් තමන්ගේ ජීප් එකේ දාගෙන ගිහින් අතවර කරලා ගෙනල්ලා දැම්මා බේරුවල ටවුන් එකේ. කෙල්ල අඩා අඩා ගියා. පොලිසිය මොකක් ද කළේ ලක්ෂ 2ක් දෙන්න ඔය පවුලට. ඔතනින් යට කරලා ඉවර කරලා දාන්න. ඔහොමයි නීතිය ක්‍රියාත්මක වුණේ. තව සිද්ධියක් වුණා. එතකොට පොඩි දරුවෙක් මැතිතුමනි අවුරුදු 9යි. අහුංගල්ලේ ඉඳලා එනවා අලුත්ගම රෙදි කඩේකට රෙදි ගන්න. අම්මා දැන් රෙදි තෝරනවා. කඩේ මුදලාලි මොකද කරන්නේ. මේ පොඩි දරුවා අරගෙන යනවා ඇතුළට. එන්න දරුවෝ කියලා අරගෙන ගිහිල්ලා ඒ පොඩි දරුවාගේ පුරුෂ ලිංගය මෙහෙම මිරිකනවා. සිහිසුන්ව ඉස්පිරිතාලේ හිටියා. මේවා කතා කරන්න ගත්තා මිනිස්සු. පොලිසිය ක්‍රියාත්මක වුණේ නැහැ. අන්තිමට මේ සිද්ධිය කියනවා මෙහෙම එකක් වුණා මෙහෙම එකක් වුණා. මම කිව්වා ඔබ වහන්සේලා පැමිණිලි කරාද. පැමිණිලි කරනවා වැඩක් නැහැ. අහවල් අහවල් අය කියලා නම් කියලා මැති ඇමැතිවරුන්ට බණිනවා ආදී වශයෙන් එහෙනම් දැන් මේ පොසොන් පෝය දවසේ වෙච්ච සිද්ධිය වැරදි විදිහට යන හින්දා එළියට ඔබ වහන්සේලා අපි මැදිහත් වෙන්නේ නැහැ. ඔබ වහන්සේලා දැන් කිවයුතුයි පොලිස්පතිට කතා කරලා කියලා. නියෝජ්‍ය පොලිස්පතිට කියලා. රජයේ මැතිඇමැතිවරුන්ට කියලා. මේගොල්ලන්ට සාධාරණයක් ඉටු නොවන තැන දැන් මේ කම්පනයට පත්වෙලා මේ හාමුදුරුවෝ අනික ඉලන්දාරියෝ ඇවිල්ලා කියනවා අන්න අපි දැක්කා අහවල් පල්ලිය ඉස්සරහ ගෙදර කඩු මදිනවා දැක්කා. දැන් ඕවා ඉතින් කෙන්ද කන්ද වෙලා ඔහොම යනවානේ. හාමුදුරුවනේ ඔබ වහන්සේලා මේකට නායකත්වය ගන්න. අපි මේකට මැදිහත් වුණොත් කියයි අපි ජාතිවාදය ඇවිස්සුවා කියලා. ඒ නිසා ඔබ වහන්සේලා අදාළ වගකිව යුත්තේ දැනුවත් කළානම් ඒවගත් කියලා ඇත්ත සිද්ධිය මාධ්‍යයට කියන්න. උන්වහන්සේලා පැයකින් විතර පස්සේ මාධ්‍යය ආවා. හාමුදුරුවරු මේක කිව්වා. අපි වාඩි වුනේ නැහැ. නමුත් මේ සිද්ධිය ගැන මේ බෞද්ධයන්ට වුණ සිද්ධිය ගැන එක මාධ්‍යයක තප්පර 10ක්වත් පළ වුණේ නැහැ. හාමුදුරුවරු තීරණය කරා මේක හරියන්නේ නැහැ. එහෙනම් අපි මේක මේ අවධානය යොමු කරලා මේ නීතිය ක්‍රියාත්මක නොවීම සිංහලයන්ට එක නීතියක් , මුස්ලිම් අයට නීතිය

FAIR COMMENT BY JEZEEM

ක්‍රියාත්මක නොවීම ගැන මොකක්හරි කරන්න ඕනි කියලා මේ හාමුදුරුවරු යොදා ගත්තා සිකුරාදා හෝ ඒ ආසන්න දවසක ලොකු රැස්වීමක්. ඒ රැස්වීමට මට ආරාධනාවක් ලැබෙනවා. ඒ ආරාධනාවට යනකොට මම highway එකෙන් දාලා ඔය දර්ගා නගරය මැද්දෙන් එන්න ඕනි අලුත්ගමට එනකොට මහා විශාල ඔක්කොම හමුදා මේව්වා දාලා, බැරියර් දාලා , ඒ කියන්නේ අඩියෙන් අඩියට පොලිසියෙන් හිටවලා හරි මොකක් ද මේ. රැස්වීම් භූමියට ගියාම මේ හාමුදුරුවරු කොහොම හරි කතාකර කර හිටියා. මට තමයි ප්‍රධාන දේශනය තිබුණේ. මම තේරුම් ගත්තා Body language එකෙන් කියන්න පුළුවන්නේ මිනිස්සු ලෑස්ති වෙලා ඉන්නේ මොකටද කියලා. මම තේරුම් ගත්තා මේ මිනිස්සු ඉන්නේ පුදුම ආවේගයකින්. ඒ වේලාවට බණ කියලා හරියන්නේ නැහැ. විෂ නසන්න ඕනි විසෙන්. මිනිස්සුන්ට කියා ගන්න බැරි පොලිසියට තියෙන වීරෝධය, දේශපාලකයන්ට තියෙන වීරෝධය, ඒක අරගෙන මම ආවේශ වෙලා මේක මම කියන්න ඕනි. එතකොට මේ මිනිස්සුන්ගේ ආවේගය තුනී වෙනවා. මම ඒකයි කිව්වේ මේ වීඩියෝ පටයේ විනාඩි දෙකතුනක් හරි බලන්න කියලා මැතිතුමනි. මම ඒ ආවේගයෙන් පොලිසියට දොස් කියනවා රටේ නායකයන්ට දොස් කියනවා. ඉස්ලාම් අය අපට කරන වැරදි ටික කිව්වාම මේ මිනිස්සු අර ගල් මුල් අතේ තිබුණු මිනිස්සු අත්පුඩි ගහනවා. විසිල් ගහනවා. දැන් කේන්තිය නැහැ. දැන් ඒගොල්ලෝන්ගේ අවධානය මගේ කතාවට. මම අන්තිමට කියනවා කතාවේ දී කවදාකවත් එක ගල් කැටයක් අතට ගන්න එපා. ඒ කෑලි නැනේ මෙව්වයේ එක ගලක් ගහන එක අපේ ක්‍රමය නෙවෙයි. අපේ ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදය. අපිට උගන්වපු ක්‍රමයක් තියෙනවා. තව දුරටත් දිගින් දිගට මේවා අහලාත් මුස්ලිම් මිනිස්සු හැදෙන්නේ නැත්තම් අපිට තියෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය අනුව ඒගොල්ලන්ගේ ව්‍යාපාර කඩවල් වලට නොයා ඉන්න. මොකද 10%ක් වන මේ මුස්ලිම් ප්‍රජාව නඩත්තු කරන්නේ, පොහොසත් කරන්නේ, ව්‍යාපාරික වශයෙන් ශක්තිමත් කරන්නේ 90%ක් මුස්ලිම් නොවන අපි. අපි උඹලගේ කඩේකට නාවොත් මොකද වෙන්නේ උඹලාට කන්නත් නැති වෙනවා. අපි අන්න ඒ ක්‍රියාමාර්ගයට යනවා තව දුරටත් මේ වගේ කෙනෙහිලිකම් කරනවානම්. ඕක තමයි මේ කතාවේ ඇත්ත දේ. අවසානයේ දී මම කිව්වා එහෙම වුණොත් මේ අලුත්ගම, බේරුවල මේ ඔක්කෝම කඩවල් වලට අබ සරණයි. අබ සරණයි කියන්නේ අපේ පැරණි කතාවක්. ඒ කියන්නේ හිස් වෙනවා කියන එකයි. අබ සරණ කියලා කියනවානේ මේ මොනවද අබ වැපුරුවා කියලා රුවන්වැලියේ. ඒ කියන්නේ මොකක්වත් නැති වෙනවා. හිස් භූමියක්. මිනිස්සු එන්නේ නැතිනම් එතන පාළු වෙනවානේ. මේ ව්‍යාපාරික වශයෙන් ඔයගොල්ලන්ට අපි සහාය දෙන්නේ නැහැ මින් පස්සේ කියන එක

FAIR COMMENT
BY JEZEEM

තමයි මේ කතාවේ ඇත්ත කතාව. ඉතින් අර පොඩි කොටසක් දාපුවම මේක ඇත්තටම වැරදි අදහසක් තමයි යන්නේ. මුළු කතාවම ඇහුවාම තෙරෙනවා මොකක් ද මේ කියන්නේ. මොකක් ද මේ කරලා තියෙන්නේ. ඒ කරලා මැතිතුමනි ඒ කොටස නැහැ ඔය කොටසේ. අන්තිමට භාවනා කරලා මෙත් වඩලා තමයි අපි විසිරෙන්න කියන්නේ. එහෙම විසිරෙන මිනිස්සුන්ට තමයි පල්ලියක් උඩ ඉඳලා ගල් ගහන්නේ. ඒ කොටසත් නැහැ මේකේ. ඒ ගල් ගහලා හාමුදුරු කෙනෙක් පල්ලි යට අරන් ගිහිල්ලා ඇතුලේ කපලායි කියලා මොකක් හරි රාවයකින් තමයි ඔය ගැටුමට මුල පුරන්නේ ඕන තමයි කතාව. අවාසනාවකට මේ ඇත්ත කියා ගන්න අපිට තැනක් තිබුණේ නැහැ අද දක්වා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

උගත් ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥතුමිය ඔබ ගරු ස්වාමීන් වහන්සේගෙන් අසමින් සිටි CD පටය C අක්ෂරයක් යොදා ලකුණු කරන්න. ඒ සම්පූර්ණ CD පටය කොමිෂමට දකින්නට සලස්වන්න. ඉන්පසු ගරු ස්වාමීන් වහන්සේ විසින් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන CD තැටිය RGG වශයෙන් ලකුණු කොට එයත් සම්පූර්ණයෙන් කොමිසමට ඇසෙන ලෙස වාදනය කරන්න.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් ජයවීර මහත්මිය</u>

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේ දී ගරු සභාවේ අවධානයට සහ ස්වාමීන් වහන්සේගේ අවධානයට යොමු කරමින් ප්‍රශ්න අසන ලද වීඩියෝ පටය ඇතුලත් CD තැටිය C- 698 වශයෙන් සළකුණු කිරීම සඳහා අවසර අයැද සිටිනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: ගරු ස්වාමීන් වහන්සේ කොමිෂන් සභාව විසින් මේ දකින ලද CD තැටියට අදාළව ඔබ වහන්සේ විසින් කරනලද කතාව කොයි කාල සීමාවක දී කෙරුවාද කියලා ඔබ වහන්සේට යම්කිසි මතකයක් තිබෙනවාද?

පි: ඒ මැතිතුමනි අලුත්ගම 2014 ජුනි 14

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් ජයවීර මහත්මිය</u>

ප්‍ර: 2014 ජුනි මාසේ 14 වෙනිදා කිව්වොත් පිළිගන්නවාද හාමුදුරුවනේ?

පි: ස්ථිරවම ඒක ද කියන්න බැහැ. ඒ ආසන්න දිනයක්

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: පොසොන් පෝයෙන් පස්සේ හාමුදුරුවනේ?

පි: පොසොන් පෝයෙන් පස්සේ.

ප්‍ර: ඔය පොසොන් පෝය 2014 වර්ෂයේ තිබිලා තියෙන්නේ ජුනි 12 වෙනිදා කිව්වොත් ඔබ වහන්සේ පිළිගන්නවාද?

පි: මතක නැහැ.

ගරු සභාපති තුමනි මේ අවස්ථාවේ දී පරීක්ෂාවකට ලක්කරා 2014 දින දර්ශනය. ඒ අනුව 2014 වර්ෂයේ පොසොන් පෝය ජුනි මස 12 වෙනි බ්‍රහස්පතින්දා තිබුණු බවට සඳහනක් තිබෙනවා. ඒ බවට ගරු සභාවේ අවධානය යොමු කර සිටිනවා. අන්තර්ජාලයේ මෙම වීඩියෝ පටය සඳහන් වන්නේ 2014 ජුනි මස 14 වන දින කරන ලද ප්‍රකාශයක් හැටියට බවද ඒ සම්බන්ධයෙන් ගරු සභාවේ අවධානය යොමු කර සිටිනවා.

වීඩියෝ පටයක් කොමිෂන් සභාව ඉදිරියේ විකාශනය කරයි.

ඒ වගේම ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේ දී ස්වාමීන් වහන්සේ විසින් මෙම C – 698 වීඩියෝ පටයේ ඇතුලත්ව තිබෙන උන්වහන්සේගේ ප්‍රකාශය සම්පූර්ණ වශයෙන් ඇතුලත්ව තිබෙන්නේ යැයි ගරු සභාවට CD පටයේ ඉදිරිපත් කර තිබෙනවා. එම CD පටයක් ඇතුළත් වීඩියෝ දර්ශන මේ අවස්ථාවේ දී සභාවේ අවධානයට යොමු කිරීමට අවසර අයැද සිටිනවා.

වීඩියෝ පටයක් ප්‍රදර්ශනය කරයි.

පි: ඔයිට වඩා දිගයි ඔය වීඩියෝ එක. You Tube එකේ තියෙනවා නමුත් අද ගෙනල්ලා නැහැ.

ප්‍ර: හාමුදුරුවනේ මේ ගෞරවනීය සභාවට ඔබ වහන්සේගේ සම්පූර්ණ කතාව ශ්‍රවණය කිරීමට සැලැස්වීමට ඔබ වහන්සේට අවශ්‍ය යැයි කියලා හිතෙනවාද හාමුදුරුවනේ?

පි: ඇත්තට මට උවමනා වුනේ අර වගේ පුංචි කොටසක් ගන්නේ නැතුව සම්පූර්ණයෙන්ම මේ වීඩියෝ පටයම නිරීක්ෂණය කරානම් හොඳයි කියලා. අපිට මෙතන කාලය මිඩංගු කරනවාට වඩා මං කියන්නේ මුළු කතාවම කොමිෂමේ අවධානයට යොමු කෙරෙව්වොත් ඒ නීතිය ක්‍රියාත්මක නොවුණු හැටි, ඒ පොලිසි වල තත්ත්වය මැති ඇමැතිවරු හැසිරිව්ව හැටි ඒ ඔක්කොම මේකේ දිගට කියනවා. අවසානයේදී මොකක්ද කරන්නේ කියලා මිනිස්සුන්ටත් නැත්තම් අර කුඩා වීඩියෝ පොඩි කොටසින් තේරෙන්නේ ඇත්තට ඒ මිනිසුන්ට ගහන්න කිව්වා වගේනේ. ඒ නිසා මෙතන සම්පූර්ණ විකාශය නොවුණත් ඒ සම්පූර්ණ කතාව කොමිෂමට ලබා ගන්න පුළුවන් නම් හොඳයි.

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ගරු සභාපති තුමනි මේ අවස්ථාවේදී ස්වාමීන් වහන්සේ විසින් උන්වහන්සේ 2014.06 මාසේ 15 වන දින කරන ලද ප්‍රකාශයෙහි සම්පූර්ණ ප්‍රකාශය ඇතුළත් වීඩියෝ පටය ගරු සභාවේ අවධානයට යොමු කිරීම සුදුසු බවට ප්‍රකාශ කරන බැවින් ඒ සම්බන්ධයෙන් අන්තර්ජාලය හරහා එම සම්පූර්ණ ප්‍රකාශය ඇතුලත් වන වීඩියෝ පටය සභාවට ඉදිරිපත් කිරීමට පියවර ගන්නවා සභාපතිතුමනි. ඒ සම්බන්ධයෙන් මොහොතක් ලබා දෙන මෙන් ගෞරවයෙන් අයැද සිටිනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

තව දුරටත් ප්‍රශ්න කරන ලෙසට නියෝග කරනවා. එකී CD තැටිය කොමිෂන් සභාව විසින් කටයුතු අද දින මේ යම් අවස්ථාවක නැවැත් වූ පසු ආරම්භ කරන අවස්ථාවේ දී නැවත ලකුණු කළ හැකි බව සටහන් කර තබමි.

****

දැන් වේලාව: ප.ව. 3.05
මෙතැන් සිට ල/ලේ: ධම්මිකා මිය

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පෙර සටහන් කරන්නේ නිල්මිණි මෙනවිය විසින්ය.
වේලාව ප.ව.3.05 යි
මෙතැන් සිට ධම්මිකා පෙරේරා විසින්ය.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : ඔබ වහන්සේට මට ප්‍රශ්න 2 ක් යොමු කරන්න සිදු වෙනවා, පසුගිය දිනයේදී ඔබ වහන්සේ සාක්ෂි ලබා දෙමින් ප්‍රකාශ කෙරුවා 2013 ට පස්සේ ඔබ එවකට ආරක්ෂක ලේකම්ව හිටි ගෝඨාභය රාජපක්ෂ මහතාට ලංකාවේ ඉස්ලාම් අන්තවාදය පැතිරීමක් පිළිබඳව දැනුවත් කිරීමක් කෙරුවා කියලා?

පි : ඔව්.

ප්‍ර : ඒක නිවැරදි ද ස්වාමීණි වහන්ස?

පි : ඔව් මැතිතුමනි.

ප්‍ර : ඉන් පස්සේ ඔබ වහන්සේ කිව්වා එවැනි දැනුවත් කිරීමෙන් පසු ඒ සම්බන්ධයෙන් යම්කිසි ඉදිරි ක්‍රියාමාර්ග ගත්තා කියලා ඔබ වහන්සේ දන්නවා කියලා?

පි : ඔව්.

ජ්ර : එතකොට මගේ පළවෙනි ප්‍රශ්නේ ගරු ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේ මේ කියන නීතිය ක්‍රියාත්මක නොකිරීම මේ සිංහල බෞද්ධයින්ට විරුද්ධව සිදු කරන මේ ක්‍රියා කාරකම් සම්බන්ධයෙන් ඔබ එවකට ආරක්ෂක ලේකම්ව සිටි ගෝඨාභය රාජපක්ෂ මහතාට දැනුම් දුන්නද?

පි : ඔව් මැතිතුමනි, මෙහෙමයි එතුමා කිව්වේ හාමුදුරුවනේ මේක LTTE වගේ නෙමෙයි අපි දැන් හොයාගෙන යනවා. ඒ වගේම දැනට අපි රටින් පිටුවහල් කරලා තියෙනවා මෙච්චර පිරිසක්, ඒ වගේම බුද්ධි අංශ වෙනම යොදවලා තියෙන්නේ කියලා. ඉතින් ඒක සත්‍යයක් වෙන්න පුළුවන් මැතිතුමනි දැන් උදාහරණයක් විදියට අපි මම ඊයේ පෙරේදා මේකේ සාක්ෂි දීලා ගිහිල්ලා තවත් වැඩිමනක් තොරතුරු හොයන කොට තවත් සංවිධාන අහු වෙනවා ගෙනල්ලා තියෙනවා මට අවස්ථාවක් ලැබෙන්න ඕන හෙළිදරව් කරන්න ඒ අවස්ථාවලදි අපි ඒ දැනුවත් කිරීම් කළා. එතකොට ඇත්ත වශයෙන්ම එදා ආරක්ෂක ලේකම්තුමා කිව්වා හාමුදුරුවනේ අපිට ටිකක් හුස්ම ගන්න දෙන්න මොකද LTTE ප්‍රශ්නය ඉවර වෙච්ච ගමන්මනේ මේ එතකොට අපි කිව්වා මැතිතුමනි ඇත්ත ඔබතුමාලLTTE සංවිධානය සන්නද්ධමය වශයෙන් නන්දිකඩාල්වලදී ඉවර කරපු නිසා තමයි අපිට මේ වැහිලා තිබුණු මේ අන්තවාදය දැක්කේ කියලා. ඒ කියන්නේ

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

එතකල් අපි මේක දැක්කේ නැහැ. නමුත් අපි අවධානයෙන් හිටියත් මේ මුස්ලිම් සමාජයේම ඇතැම් නායකයෝ මේක හෙළිදරව් කරලා තියෙනවා. මේක ඉතාම හොර රහසේ දළු ලා වැඩෙන එකක්. මේකට අවධානය යොමු කරන්න කියන ඉල්ලීම අපි කළා. ඉතින් ඊට පසු අවස්ථාවේ සාකච්ඡා වලදී ඒගොල්ලෝ යම් යම් තීරණ අරගෙන තිබුණා මට හොඳට මතකයි අන්තිමට හම්බ වෙච්ච සාකච්ඡාවේදි කියවුණා හාමුදුරුවනේ මේක අවුරුදු 2, 3 ක් යන වැඩක්. මේක ලේසි වැඩක් නෙමෙයි මේක හරියටම හඳුනා ගන්න ඕනේ මේ පුද්ගලයෝ, මේගොල්ලන්ගේ සබඳකම්, මේක ලේසි වැඩක් නෙමෙයි කියන එක තමයි එතුමා ඒ කාලේ අවධාරණය කෙරුවේ.

ප : එතකොට ඒ අවස්ථාවේදී ඔබ වහන්සේට යම් වැටහීමක් ආවද රජයේ පරිපාලන පද්ධතියේ ඔබ වහන්සේ කියනමේ අකටයුතුකම් සම්බන්ධයෙන් ඇහුම්කන් දෙන පුද්ගලයෙක් ඉන්නවා කියන එක?

පි : ඒ කියන්නේ මැතිතුමනි, ඇත්තටම දේශපාලකයොත් එක්ක කතා කලාටමේගොල්ලෝ ඔළුවට ගත්තේ නැහැ. නමුත් රජයේ නිලධාරියෙක් හැටියට ආරක්ෂක ලේකම්තුමා මේක ටිකක් ගැඹුරින් තේරුම් ගත්ත බව අපේ රැස්වීම්වලට ගියාම එතුමා කතා කරන විදියෙන්, ඒ තොරතුරු ප්‍රකාශ කරන විදියෙන් අපි තේරුම් ගත්තා මෙතුමාට මේ ගැන යම්කිසි අවබෝධයක් ලැබිලා තියෙනවා සහ මොකක් හරි ක්‍රියාමාර්ගයක් ගනීයි කියලා විශ්වාසයක් අප හිත් තුල තිබුණා.

ප : එහෙම නම් ගරු ස්වාමීන් වහන්ස දැන් ඔබ වහන්සේ මේ කොමිෂන් සභාවට ප්‍රදර්ශනය කරන්නට යෙදුනු ඔබ වහන්සේගේ කතාවේදි කියවුණු අර දර්ගා නගරයේ සිදු වූ සිදුවීම පොසොන් දිනයට පෙර අයගම සමිත හාමුදුරුවන් සම්බන්ධයෙන් ඔබ වහන්සේ විස්තර කරපු ඒ සිද්ධිමය ක්‍රියාදාමය ඔබ එවකට ආරක්ෂක ලේකම්ව හිටපු ගරු ගෝඨාභය රාජපක්ෂ මහතාගේ අවධානයට යොමු කෙරුවද?

පි : මේ සිදුවීමෙන් පස්සේ තමයි අපි ඒ අයගම හාමුදුරුවෝ මේ ඔක්කොමල ගෙනල්ලා මං හිතන්නේ ආරක්ෂක අමාත්‍යාංශයට වැඩැම්මුවා හාමුදුරුවරුන්. එතකොට තමයි තේරුම් ගත්තේ මොකක්ද මේ වෙලා තියෙන්නේ කියා. සිද්ධිය වෙලා පහුවෙනිදා වෙන කොට සම්පූර්ණයෙන්ම චෝදනාව එල්ල වුණේ අපිට. නමුත් මැතිතුමනි වාසනාවට ඒ රැස්වීම සහ ඒ පරිසරය ආවරණය කරන්න යොදවලා හිටපු බුද්ධි නිලධාරියෙක් ඇත්ත වශයෙන් ම උඩ තට්ටුවේ මේ රැස්වීම ඉවර වෙලා සාමකාමීව විසිර යන පිරිසට

FAIR COMMENT BY JEZEEM

තට්ටු 3 ක් හෝ 4 ක් උඩ ඉඳලා ගල් ප්‍රහාර එල්ල කරනවා. මේ නිකම් සාමාන්‍යයෙන් උපාසක අම්මලා. ඒගොල්ලෝ දර්ගා ටවුන් එකෙන් අර පන්සලට යන මිනිස්සු. වැඩිය තියා මැතිතුමනි ඒ ගම්වැසියෝ තීරණය කරලා තිබුණා වටේ හාමුදුරුවරු අර අයගම සමිත හාමුදුරුවන්ට කරපු පහරදීම නිසා උන් වහන්සේ හිටියේ ඉස්පිරිතාලේ. නාගොඩ ඉස්පිරිතාලේ. කට්ටිය සුදානම් කරලා තිබුණේ මේ රැස්වීම ඉවර වෙලා පෙරහැරකින් හාමුදුරුවෝ පන්සලට එක්ක යන්න. පහරක් ගහලානේ යන්නේආගමිකයෙක්. ඇත්ත වශයෙන් මැතිතුමනි මම මැදිහත් වෙලා තමයි කිව්වේ නැහැ මේ මිනිස්සු දැන් මුස්ලිම් මිනිස්සු එතන භීතියෙන් ඉන්නේ. පෙරහැරවල් යන එක හොඳ නැහැ. ඕගොල්ලෝ කිහිප දෙනෙක් ගිහිල්ලා හාමුදුරුවන්ව පන්සලට එක්කරගෙන යන්න. දැන් අපි මෙතන රැස්වීම තිබ්බානේ, නැති ප්‍රශ්න හදා ගන්න එපා. ඒ යන්න හදපු පෙරහැර පවා වැලැක්කුවේ මමයි. කියන්නේ ගැටුමක් ඇති වේදෝ කියන සැකයට. ඉතින් මිනිස්සු සාමකාමීව මේ පිරිස විසිර ගියා. ඒ සමිත හාමුදුරුවෝ ඒ සියළු දෙනා ආරක්ෂක අමාත්‍යාංශයට කැඳවලා මේ වෙච්ච සිදුවීම් විතරක් නෙමෙයි ඒ පළාතේම සිංහල මිනිස්සුන්ට වෙලා තිබුණු අතවර, හිරිහැර, නීතිය ක්‍රියාත්මක නොවීම දැන් උදාහරණයක් ගත්තොත් අපේ ඉලන්දාරියෙක් හෙල්මට් එක නැතුව ගියොත් ඒ වෙලාවේ හරි තදට නීතිය ක්‍රියාත්මක වෙනවා. ඒගොල්ලෝ ප්‍රසිද්ධියේ හෙල්මට් දාන්නේ නැහැ. ඉතින් එතකොට වෛරයක් ඇති වෙන එක සාධාරණයිනේ. මේ එක ප්‍රශ්නයක් නෙමෙයි ටික ටික මෝදු වෙලා ඒක පුපුරායාමක්. ඉතින් අර සාමකාමීව මිනිස්සුන්ගේ ආවේගය මම නිව්වා කතා කරලා. ඒක මිනිස්සුන්ට කියා ගන්න බැහැ, ඒගොල්ලන්ට රාජ්‍ය නායකයින්ට බනින්න බැහැ, අපි දොස් කියනවා බනිනවා එතකොට මිනිස්සු අනේ තමන්ගේ හදවතේ තියෙන එක හාමුදුරුවෝ කියනවානේ කියලා නිවුණා. ඒ නිවිලා ගෙවල්වල යන මිනිස්සුන්ට තමයි මේ අය ගැහුවේ. ඉතින් හඬ පටය ඒ වීඩියෝ පටය ඒ බුද්ධි අංශ නිලධාරීන් විසින් අමාත්‍යාංශයට දුන්නා ට පස්සේ සම්පූර්ණයෙන්ම ඒක වෙනස් වුණා. ඒගොල්ලෝ දැන ගත්තා කවුද මේ පළවෙනි ගල් පාර ගහලා තියෙන්නේ කියලා.

ප : මගේ ප්‍රශ්නය වුනේ ස්වාමීන් වහන්ස ඊට වඩා කුඩා ප්‍රදේශයකට අදාලවයි. මම ඒ ප්‍රශ්නයම නැවතත් ඔබ වහන්සේගෙන් අහන්නම්, දැන් ඔය දර්ගා නගරයේ සිදු වුණු අයගම සමිත හාමුදුරුවන්ට සිදු වූ සිද්ධීන් හා සම්බන්ධ සිදුවීම් ක්‍රියාදාමය ඔබ වහන්සේව දැනුවත් වෙනවානේ එක අවස්ථාවකදි

FAIR COMMENT BY JEZEEM

පි : ඔව්.

ප්‍ර : ඊට පස්සේ නේද ඔය රැස්වීම් එහෙම තියෙන්නේ?

පි : ඔව්. මැතිතුමනි ඔය සිද්ධිය වෙන කොට ඇත්ත වශයෙන් ආරක්ෂක ලේකම්තුමාත්, ජනාධිපතිතුමාත් රටේ හිටියේ නැහැ. සිද්ධිය වෙලත් මං හිතන්නේ දවස් 2 ට හෝ 3 ට පස්සේ තමයි ලංකාවට ආවේ. නමුත් මම ඔය අවස්ථාවට යන කොටත් අදාල ආරක්ෂක අංශ ප්‍රධානීන් දැනුවත් කරලා ගියේ. අපි මේ වගේ රැස්වීමකට යනවා කරුණාකරලා ඒ ආරක්ෂාව යොදවන්න, ගැටුමක් වෙන්න ඉඩ තියාගන්න එපා. මොකද මේ සිංහල මිනිස්සු කුපිත වෙලා ඉන්නේ, මේ සිංහල මිනිස්සු බැරි වෙලාවත් මේ කුපිත වීමෙන් පහර දීමක් කලොත් ඒක නතර කරන්න ඕනේ අපි කොහොම හරි කියලා ඒවගේ අධිෂ්ඨානයක් තමයි තිබුනේ. ඊට පස්සේ තමයි අපි දැනුවත් කලේ.

ප්‍ර : මගේ අවසාන ප්‍රශ්නය ඔබ වහන්සේගේ කතාවේදී එක් අවස්ථාවකදි ඔබ වහන්සේම හඳුනා ගන්නවා ඔබ වහන්සේ ජාතිවාදී කියලා. ඔබ වහන්සේට විස්තර කරන්න පුළුවන්ද එයින් ඔබ වහන්සේ මොකක්ද අදහස් කරන්නේ කියලා?

පි : ඇත්ත වශයෙන්ම මැතිතුමනි ඒ අර කිව්වේ ඒ මිනිස්සුන්ගේ හැඟීමක් ඒ කියන්නේ අපිට කියනවානේ ජාතීවාදී, ආගම් දැන් අපිනේ දන්නේ මේ ප්‍රශ්න නිරාකරණය කරන්න කරන කැප කිරීම්. එහෙම කියද්දිත් දේශපාලඥයින්, මේ සිංහල දේශපාලඥයින්ට මුවා වෙලා වැඩ කරන මුස්ලිම් දේශපාලඥයෝ සමහර විට මුස්ලිම් දේශපාලඥයෝඑහෙම නොකිව්වත් සිංහල මෝඩ දේශපාලඥයෝ මේක අපිට කියනවා. ඉතින් ඒකට පොඩි ආවේගයකට තමයි කිව්වේ ඔව් අපි ජාතිවාදී, ඔව් අපි ආගම්වාදී කියලා. මොකද ඒගොල්ලොන් ජාතිවාදීනේ. ඒක සඵත හැටියට අපි ජාතිවාදි නැහැ කවදාවත්, අපි ජාතික වාදී මිසක්. ජාතිවාදී නම් අපි හිතනවානේ මේකේ ජාතිවාදය කියලා කියන්නේ සිංහලයෝ විතරයි මේකේ ඉන්න ඕනේ, බෞද්ධ නම් බෞද්ධ ආගමට විතරයි එහෙම එකක් නැහැනේ අපි මැතිතුමනි. අපි ජාතිවාදී නැහැ කවදාවත්.

ප්‍ර : දැන් ඔබ වහන්සේ අවසාන වශයෙන් ප්‍රකාශ කරන්නට යෙදුන කාරණාව මං පස්සේ වෙලාවක ඔබ වහන්සේගෙන් ඒ ප්‍රශ්නේ අහන්න හිටියේ නමුත් ඔබ වහන්සේ එතනට ඇවිල්ලා තියෙන හින්දා ඒ ප්‍රශ්නය අහන්නම්, ඔබ වහන්සේට අනුව මේ රටේ විවිධ ජන කොටස් විවිධ ආගම් අදහන පුද්ගලයින් සිටිනවා ඔවුන් සියළු දෙනාටම මේ රටේ සාමයෙන් තමන්ගේ ආගම අදහමින් ජීවත් විය හැකිද?

FAIR COMMENT BY JEZEEM

පි : අනිවාර්යයෙන්ම. ඒ කියන්නේ මැතිතුමනි මේ රට මම හිතන්නේ ලෝකේ කිසිම රටක නැති ආගමික නිදහසක් මේ රටේ මිනිස්සුන්ට තියෙනවා. ඒ නිදහස ලැබිලා තියෙන්නේම මේ බෞද්ධ දර්ශනය මත පදනම් වූ මහා සංස්කෘතියක් නිසා. ඒ මහා සංස්කෘතික සෙවන කුඩයක් නම් ඒ කුඩේ යට මේ ඔක්කොටම ඉන්න පුළුවන්. ඉතින් අපි කවදාකවත් දැන් මැතිතුමනි අපිට අද වෙන කල් චෝදනාවක් නැහැනේ කවදාකවත් මධ්‍යම පළාතට ගිහිල්ලා අර තේ දළු නෙලන ඒගොල්ලන් ඉන්න තැනකට ගිහිල්ලා දෙමළ මිනිස්සු බෞද්ධ කරලවත්, සිංහල කරලවත් එහෙම නැත්නම් ඉස්ලාම් මිනිස්සුන්ට කවදාකවත් බලකරලා නැනේ උඹලා සිංහල වෙන්න ඕන, උඹලා බෞද්ධ වෙන්න ඕන කියලා. අපි එහෙම කවදාවත්, ඒක තමයි ජාතිවාදී එහෙම කරනවා නම්, කවදාවත් එහෙම කරලා නැහැ, නැත්නම් මැතිතුමනි අපි දළදා වහන්සේට අයිති ඉඩම්, විහාර දේවාලගම්වලට අයිති ඉඩම්, මුස්ලිම් පල්ලි හදා ගන්න, කතෝලික පල්ලි හදන්න එහෙම කිසිම බාධාවක් වෙලා නැහැනේ මැතිතුමනි. දැන් මේ ප්‍රශ්නේ තියෙන්නේ දැන් මේ ප්‍රශ්නේ ඇති කරන්නේ අපිද ඇත්ත වශයෙන්. දැන් සාමාන්‍ය සම්ප්‍රදායික බෞද්ධකමත් තියෙනවා ගෙයක් කුළියට අරන් ආගමික මධ්‍යස්ථාන දාලා ප්‍රශ්න නිර්මාණය කරන්නේ අපි නෙමෙයි ඒගොල්ලොමයි. ඒ වගේ තමයි මේ ඉස්ලාම් ප්‍රශ්නය. දැන් ඒගොල්ලෝ මෙහේ ඇවිත් ව්‍යාපාර කරගෙන බොහොම කුඩා කණ්ඩායමක් හැටියට හිටියා. හැබැයි මේ කුඩා කණ්ඩායම ප්‍රසාරණය වෙන්න වෙන්න ඒගොල්ලන්ට ඕන වෙනවා ඒගොල්ලන්ගේ නීති, ඒගොල්ලන්ගේ සංස්කෘතිය ඒක තමයි හරි, ඒගොල්ලන්ගේ නීතිය තමයි හරි, ඒගොල්ලන්ගේ රයිට්ස් ඕන, ඉතින් මැතිතුමනි ඒත් අපි ඉඩ දීලා තියෙනවානේ, අපි ඒගොල්ලන්ට ප්‍රහාර එල්ල කරලා නැහැනේ කොහේවත්. නමුත් අපිට බයක් තියෙනවා මේගොල්ලෝ තවත් මේක පුළුල් වෙලා ගියොත් මොකද මේ මට ඇත්ත වශයෙන්ම මේ කොමිෂමට ඒමේදි මම දෘඩතර අධිෂ්ඨානයක් ඇති කර ගත්තේ මේ වෙන වෙනත් සිද්ධිමය කාරණාවලට වඩා මේ සිද්ධි ඇති වෙන්න හේතු ගැන මේ කොමිෂමේ අවධානය යොමු කරවීම තමයි ඇත්ත වශයෙන් මගේ උවමනාව තිබුණේ. ඊට හේතුව මැතිතුමනි අපේ රටේ නැහැ තවම දැන් ඉන්දියාව වගේ රටවල්වල, ඉන්දියාව කියන්නේ කෝටි 30 ට වැඩිය මුස්ලිම් මිනිස්සු ඉන්න රටක්. බලන්න කොච්චර ලස්සනට, කොච්චර ගැටුම් තිබුණත් ඒවා නිරාකරණය කර ගැනීම සඳහා හොඳ ආයතන පිහිටුවලා තියෙනවා. දැන් අවම තරමින් මේ අපි ස්වේච්ඡාවෙන්නේ

FAIR COMMENT BY JEZEEM

මැතිතුමනි මේක කරන්නේ. ස්වේච්ඡාවෙන්. එතකොට ඒක මොකක් හරි සංසාර පුරුද්දක් වෙන්න ඇති. එතකොට ඇත්ත වශයෙන්ම අපිට උවමනයි මෙන්න මේ ග්‍රන්ථවල මේ තියෙන දැන් ඔබතුමා ඇහුවොත් මේ ප්‍රශ්න කිරීමට එන සැක කටයුතු මුස්ලිම් කෙනෙක්ගෙන් හරි එන ඕනම ජාතියක මුස්ලිම් කෙනෙක්ගෙන් ඔබතුමා අහන්න ඕගොල්ලෝ හදීස් පිළිගන්නවද කියලා, ඔව් ඒ තමයි අපේ හදවත කියලා කියනවා. එතකොට හදීස්වල තියෙන හැටියට තමයි ඔය කරන ඔක්කොම මේ නරක වැඩ ටික කරන්නේ. ඒ හින්දා මෙන්න මේ ඉගැන්වීම හරියට විවෘත කර ගන්නේ නැති තාක්කල් මැතිතුමනි මේ ගැටුම් සිද්ධ වෙන්න නියමිතයි.

ප : ගරු ස්වාමීන් වහන්ස ඔබ වහන්සේට ප්‍රථම මෙම කොමිෂන් සභාවට පැමිණ වෙනත් බොහෝ සාක්ෂිකරුවන් සාක්ෂි ලබා දී තිබෙනවා, ඔය ඔබ වහන්සේ සඳහන් කරපු කාරණා සම්බන්ධයෙනුත් කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබාදීලා තියෙනවා. ඔබ වහන්සේට ඒ සම්බන්ධයෙන් සම්පූර්ණ සාක්ෂි ලබාදීම කොමිෂන් සභාවට අවශ්‍ය අවකාශය කොමිෂන් සභාව ඔබ වහන්සේට සලසා දෙනවා ඒකයි අපි 3 වන දවසටත් ඔබ වහන්සේට එන්න කියලා කිව්වේ, අද දින බැරි වුනොත් වෙනත් අවස්ථාවක් ඔබ වහන්සේට දෙන්නම්, ඒ ඔබ වහන්සේට කියන්න තියෙන අවශ්‍ය කාරණා සම්බන්ධයෙන් සම්පූර්ණයෙන් කොමිෂන් සභාව දැනුවත් කරන්න?

පි : හොඳමයි.

ප : ඒ වගේම බොදුබල සේනාව සහ එහි ක්‍රියාකාරකම් සම්බන්ධයෙනුත් අපිට පැමිණිලි ලැබිලා තියෙනවා.

පි : හොඳමයි

ප : එය මෙම කොමිෂන් සභාවේ එක් කාර්යය භාරයක් විතරක්, ඒක හින්දා අපි සියළු පාර්ශවයන්ට සවන්දීලා සියළු පාර්ශවයන් ට ඔවුන්ට කියන්න තියෙන දේ සම්පූර්ණයෙන් කියන්න අවස්ථාවක් ලබා දීලා තමයි අපිට ලබා දීලා තියෙන ඒ කටයුත්ත අපි ඉටු කරන්නේ. ඒක හින්දා අපිට ඔබ වහන්සේ දන්නවා කතාවක් තියෙනවානේ දෙපැත්තටම සවන් දිය යුතුයි කියලා. ඒක හින්දා ඔබ වහන්සේ කියන කතාවත් අපි අහනවා. ඔබ වහන්සේට සහ ඔබ වහන්සේගේ කණ්ඩායමට විරුද්ධව තියෙන පැමිණිලි සම්බන්ධයෙනුත් අපිට අහන්න වෙනවා. ඒක තමා අපි අද කරන්නේ. ඔබ වහන්සේගෙන් දවස් 2 කින් අර ඔබ වහන්සේ ලබා දුන්න පැමිණිලි සම්බන්ධයෙන් අපි ඇහුවා තවත් ඔබ

President's Copy
FAIR COMMENT BY JEZEEM

වහන්සේට අවස්ථාවක් ඕන නම් අපි ඒ අවස්ථාවත් සලසා දෙන්නම්. කෙටි කිරීමක් නැහැ, ඔබ වහන්සේට අවශ්‍ය පරිදි...?

පි : එහෙමයි. අපිට සඟවන්න කිසිම න්‍යාය පත්‍රයක් නැහැ මැතිතුමනි. මොකද Hidden Agenda එකක් නැහැ. ඒ නිසා අපෙන් ඕනෑම ප්‍රශ්නයක් ඕනෑම තැනක කරපු ප්‍රකාශයක්, ඕනම දෙයක් ගැන විමසන්න පුළුවන් ඒගැන කිසිම පැකිලීමකින් තොරව අපි පිළිතුරු ලබා දෙන්නත් පුළුවන්.

ප්‍ර : එසේම යම්කිසි අවස්ථාවක ඔබ වහන්සේටයි, ඔබ වහන්සේගේ කණ්ඩායමටයි විරුද්ධව මෙම කොමිෂමේ සාක්ෂි ලබා දීලා තියෙන කණ්ඩායමක් නැත්නම් පුද්ගලයින් ඉන්නවා නම් අපි ඔබ වහන්සේට ඔබ වහන්සේගේ නීතිඥවරයා හරහා ඔවුන්ගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් සලසා දෙන්නම්.

පි : හොඳමයි.

ප්‍ර : ඒක හින්දාදැනට අපි කරන්නේ අපේ කාර්යය භාරයේ තියෙනවා යම් කොටසක් අපි ඒ සම්පූර්ණ කොටස අපි කොමිෂන් සභාවේ අවධානය යොමු කරන්න ඕනේ.

පි : හොඳමයි.

ප්‍ර : ඔබ වහන්සේ ඒක අවබෝධ කර ගනියි කියලා මම හිතනවා.

පි : හොඳමයි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ශී හේරත් මහත්මිය</u>

ප්‍ර : හාමුදුරුවනේ ඔබ වහන්සේගේ මතකය අවදි කොලොත් 2017 වර්ෂයේ මැයි 13 පොලොන්නරුව සින්නවෙලදි ඔබ වහන්සේ ප්‍රකාශයක් කිරීමක් සිදු වුණා කියලා ඔබ වහන්සේට මතකයක් තියෙනවද?

පි : පොළොන්නරුව ඕනෑගමදි වෙන්න ඕන. ආයි කියන්න මැතිනියනි ඒ ගම?

ප්‍ර : සින්නවෙල යනුවෙන් තමයි මා සතුව තිබෙන ලේඛනයේ තිබෙන්නේ. පොළොන්නරුව ප්‍රදේශයේ?

පි : පොළොන්නරුවේ ඕනෑගම කියන ප්‍රදේශයේ වෙන්න ඕන. සින්නවෙල නෙමෙයි.

ප්‍ර : ඒ ප්‍රදේශයේ හාමුදුරුවෝ ප්‍රකාශයක් කිරීමට හෝ එවැනි කතාවක් කිරීමට හේතු පාදක වුණේ මොකක්ද?

පි : මම පෙර දවසකත් මෙතනදී කිව්වා මැතිනියනි ඒ ගැන. පොළොන්නරුව ප්‍රදේශයේ ජීවත් වෙන හාමුදුරුනමක් ඕනෑගම වන්දිම කියලා.ඒ ස්වාමීන් වහන්ස විශාල කැප කිරීමක් කරමින් ඉන්නවා දැනටත්, ඒ ඕනෑගම තියෙනවා රක්ෂිතයක්. ඒ

FAIR COMMENT BY JEZEEM

රක්ෂිතයේ නම ජාතික ජල ගැලුම් නිම්න රක්ෂිතය. ඒ ජාතික ජල ගැලුම් නිම්න රක්ෂිතයේම තමයි පිහිටලා තියෙන්නේ සෝමාවතිය රක්ෂිතය. සෝමාවතී චෛත්‍ය පිහිටලා තියෙන්නෙත් ඒ රක්ෂිතයේමයි. එතකොට ඒ සෝමාවති චෛත්‍යයට සම්බන්ධ පරිවාර චෛත්‍ය 21 ක් තියෙනවා. ඒ තියෙන්නේ මේ ජාතික ජල ගැලුම් නිම්නයේ. ඒ ප්‍රදේශයට කියන්නේ වෙහෙරගොඩයාය කියලා. පරණ නම. ඒ වෙහෙරගොඩයායට ආසන්නවම ගමක් තියෙනවා තඹලෑව කියලා. ඒ තඹලෑව ප්‍රදේශයේම සම්පූර්ණයෙන්ම මුස්ලිම්. ඒ මුස්ලිම් අය මොකද කරන්නේ මේ රක්ෂිතයට ඇතුල් වෙනවා ලංකාවේ තියෙන දුර්ලභම ලංකාවේ කුඹුක් වර්ග තියෙනවා 12 ක් හෝ 14 ක් ඒ අතිශය දුර්ලභම වූ කුඹුක් වර්ග හැදෙන්නෙත් මේ ජාතික ජල ගැලුම් නිම්නයේ. අද ඔවුන් ඒ සියල්ලම විනාශ කරලා ඉවරයි. චෛත්‍ය 21 න් 15 ක් බිමට සමතලා කරලා. ගිය සතියෙත් මම දැක්කා පත්තර වාර්තාවක් තියෙනවා. තවත් චෛත්‍යයක් කුඩු කරලා කියලා. ඒවා නටඹුන් වී ගිය දාගැබ්. චෛත්‍යය 21 න් 15 ක්ම කුඩු කරලා. මේ හාමුදුරුවෝ අදාල හැම තැනටම කිව්වා නැහැ මේ ගැන හොයන්නෙත් නැහැ නවත්වන්නෙත් නැහැ. සමහර අවස්ථාවල පොලිසියමලු ඔත්තුව දෙන්නේ ඔන්න කට්ටියක් එනවා උඹලා අයින් වෙයල්ලා කියලා. ඒ තැනට එහේ පත් වෙලා තිබුණා. ඉතින් මේක බලන්න තමයි අපි ගියේ. යන කොට මෙය පුරා විද්‍යා රක්ෂිතය කියලා සාමාන්‍යයෙන් හැම තැනම පුවරුව ගහලා තියෙනවා, කොන්ක්‍රීට් වලින්. ඒ පුවරු කඩලා දාලා. සඳකඩ පහන් කෑලි හැම තැනම. චෛත්‍යය සමතලා කරපුවා අඩි 1 ½ ක් විතර උසයි. ඒ චෛත්‍යය මැටි ගොඩවල්නේ. පරණ නටඹුන් වී ගිය නිසා. ඒගොල්ලන් සමතලා කරලා ඒවා අරගෙන තියෙනවා හරක් මඩු හදන්න. අපි යනකොටත් හරකුන් ගැට ගහලා තිබුණා. හක් මඩු හදලා. චෛත්‍යය 15 උඩින් හරක් මඩු හදනවා කිව්වාම. අර උස් පස් බිම නිසා ඒ කියන්නේ චෛත්‍යය සමතලා කලාම උසයිනේ. මේකේ වතුර ගලන හින්දා චෛත්‍යය උඩ තමයි හරක් මඩු හදලා තියෙන්නේ. ඒක දැහින් බලන්න තමයි අපි ගියේ. යන කොට පොලිසියෙනුත් ආවා. ඒ ප්‍රදේශයේ ප්‍රාදේශිය මාධ්‍යවේදීනුත් ආවා. ඔය අපරාධය කරන ඒවාට සම්බන්ධ මුස්ලිම් මිනිස්සුත් එහේ හිටියා. ඉතින් අපි කම්පනයට පත් වුණා මේ චෛත්‍ය කොහොමද හරක් මඩු බවට පත් වුණේ. ඇයි මේ පුරා විද්‍යා නටඹුන් විනාශ කරලා තියෙන්නේ. කවුද මේගොල්ලන්ට එහෙම බලයක් දීලා තියෙන්නේ, ඒ ගැන ප්‍රශ්න කරන්න තමයි අපි ගියේ. බලන්න ගියේ. එතනදි මම කතාවක්

FAIR COMMENT BY JEZEEM

කිව්වා. ඒ කතාව තමයි වෙහෙරගොඩයාය දැන් පල්ලිය ගොඩැල්ල වුනේ කොහොමද. චෛත්‍ය ටික බිමට සමතලා කරලා වෙහෙරගොඩ යායවෙලා තිබුණ දැන් වෙහෙරගොඩයාය කිව්වාම තේරෙනවා මේ තියෙන්නේ වෙහෙරවල් තිබූ ආරාම සංකීර්ණයක්. දැන් ඒක පල්ලිය ගොඩැල්ල වෙලා. මම කිව්වා මෙහෙම කරන්නේ කොහොමද මොන තරම් අපරාධයක්ද මේ ඉතිහාසය වළ දැමීමක්. මේකේ ඇති කියලා අර වචනයක් කිව්වා. ඒ ගැන වෙන්න ඇති මැතිනිය අහන්නේ.

ප : ඔබ වහන්සේ මුස්ලිම් ප්‍රජාව සිටින ප්‍රදේශයක මෙන්න මේ වගේ වචන, ඔබ වහන්සේ මේ වචන පෙර දිනයේදීත් කිව්වා, ඔබ වහන්සේ සඳහන් කල බවට,

අල්ලාහ් දෙවියන්ගේ ලබ්බක් තියෙනවාලු එතන අල්ලාහ් කියලා එකෙක් ඇත්තෙත් නැහැ, හැබැයි ඔහුගේ ලබ්බක් තියෙනවාලු එතන, ඒක නිසා අපි මේ මිත්‍යාවට වැට බැඳිය යුතුයි අපිත් නීති අතට අරගෙන ඔබ වහන්සේලාත් මේ කොල්ලොත් ඇවිල්ලා මේක අල්ල ගන්න මේක අපේ, මේක අපේ කියලා අල්ල ගන්න එතකොට එයි නැද්ද නීතිය ක්‍රියාත්මක කරන්න.

එවැනි ආකාරයේ වචනයෙන් මුස්ලිම් ප්‍රජාව ඉදිරියේදී ඒ ගම්මානයක් ආසන්නයේ දී ප්‍රකාශයක් කලා කියලා ඔබ වහන්සේට මතකයක් තියෙනවද?

පි : ඇත්ත වශයෙන් මෙතන ගම්මානයක් නැහැ. ඒ ආසන්නයේ තමයි ගම්මානය තියෙන්නේ කිලෝ මීටර් 2 ක්. ඔය කෑල්ල කොහෙන් හොයා ගත්තද දන්නේ නැහැ, මැතිනියනි ඒ රක්ෂිතය ලඟම ගමක් නැහැ ඊට එහායින් තියෙන සිංහල ගම් අතර තියෙන එක ගමක් තඹලෑව. පුද්ගලයෝ ඕන නම් ඉන්න ඇති ඉලංදාරී 6,7 දෙනෙක්. මුස්ලිම් තරුණයෝ ඒගොල්ලෝ මේ සිද්ධිය ලඟට ආවෙත් නැහැ, මම ඔය එතන රැස්වෙලා හිටපු අයට කිව්වේ මේක දරා ගන්න බැරුව කොහොමද මේ වෙහෙරගොඩ යාය පල්ලිය ගොඩැල්ල වෙන්නේ. මේකේ අල්ලාහ්ගේ ඇති ලබ්බක් නැහැ ඔව්වරයි කිව්වේ. ඒ කියන්නේ මේක හිස් දෙයක්. ඉතින් අල්ලාහ් කියලා කෙනෙකුත් ඇත්තේ නැහැනේ. අපේ විශ්වාසය අනුව ඒගොල්ලන්ට පුළුවන් නම් අපේ ත්‍රිපිටකය හොයලා බණ දහම් අහලා ඒවා දොස් කරන්න. මොකද අපිට බැරිද අනික් ඒවා ගැන විමසන්න. දැන් ඒගොල්ලන්ගේ තවුහිද් කියන අනේ ඒගොල්ලන්ගේ දෙවියෝ ගැන අපිට කතා කරන්න බැහැ, ඒගොල්ලන්ගේ ඉගැන්වීම් ගැන කතා කරන්න බැහැ අපිට. අපි අවනත වෙන්න ඕන ඒගොල්ලන්ට, මේ මොන එකක්ද මේ. එහෙම පුළුවන් කමක් නැහැනේ. ඉතින් ඒක හිතේ තියෙනවා

FAIR COMMENT BY JEZEEM

අපේ. අපි මොකටද කාගෙන්වත් ගුටි කන්නේ. ඒගොල්ලෝ කොහොමද අපේ පුරා වස්තු වනසන්නේ. ඉතින් ඒක තමයි වහබිසම් කියන්නේ. නබීවරුන්ගේම සොහොන් කඩලා පටන් ගෙන මේගොල්ලෝ දැනටම ඇයි මේ පුරා වස්තු ලංකාවේ තියෙන සියළුම ඓතිහාසික මරමස්ථාන වට කරගෙන මේගොල්ලන් කරන්නේ මේ සංහාරය තමයි. ඉතින් ඒවා අපි දැකලා, දැකලා දැකලා කියලා කියලා මේ පාලකයෝ මේවට වැඩ පිළිවෙලක් නොයොදන තැන අපි ආවේගයට පත් වෙන එක සාධාරණයි. ස්වභාවිකයි. මුස්ලිම් සමාජයක් ඉලක්ක කරලා කරන කතාවක් නෙමෙයි. ඒක අවස්ථානෝචිතව සිද්ධ වෙන දේවල්.

ප : මේ මං දැන් කලින් කියන්නට යෙදුන ප්‍රකාශයට අදාලව ඔබ වහන්සේට නඩු පැවරීමක් හෝ ඔබ වහන්සේගෙන් ප්‍රකාශ සටහන් කරලා විමර්ශනයක් ආරම්භ වුණාද හාමුදුරුවනේ?

පි : මැතිතුමා කිව්වා ඒ ගැන කතා කරන්න එපා කියලා නඩුවක් තියෙනවා ඒ සම්බන්ධයෙන්.

ප : දැන් හාමුදුරුවනේ ඔබ වහන්සේට දැන් මා පෙර සඳහන් කරපු සිද්ධිය 2017 මැයි මාසේ සිදු වූ සිදුවීමක්. ඔබ වහන්සේට මතකයක් තිබෙනවාද දිගන ප්‍රදේශයේ වර්ගවාදී කෝලාහල ඇති වුණ කාල වකවානුව පිළිබඳව මතකයක් තිබෙනවාද?

පි : දින වකවානු මතක නැහැ.

ප : 2018 වර්ෂයේ මාර්තු මාසය ?

පි : මාර්තු මාසේ 04 වෙනිදා.

ප : එහෙමයි හාමුදුරුවනේ.

පි : 4 හෝ 5හෝ 6 හෝ 7, 8 වගේ.

ප : ඔබ වහන්සේ 2018 මාර්තු මාසේ 9 වෙනිදා වන විට මේ දිගන ප්‍රදේශයේ ව්‍යාප්ත වෙමින් තිබුණු වර්ගවාදී කෝලාහල ප්‍රස්තූත කර ගනිමින් ප්‍රකාශයක් කලාද?

පි : එය ඒ ඇති වුණු ගැටුම සමනය කර ගැනීම සඳහා මැදිහත් වුණා.

ප : කොහේදී ද ඒ මැදිහත්වීම කළේ?

පි : එකක් ඔය සිද්ධිය වෙච්ච දිනට හෝ පසුදින මළ ගෙදරකට මම සහභාගි වුණා එක්තරා රාත්‍රියක. ඒ මිනිස්සුත් එක්කත් කතා කරලා මේ සිද්ධියත් මම මේ සහාවේම කිව්වා. ඒ විපතට පත් වෙච්ච ගෙදරට ගිහිල්ලා ඒ ප්‍රදේශයේ නායක හාමුදුරුවෝ මුණ ගැහිලා උන් වහන්සේ එක්ක ඒ මළ ගෙදර වැඩලා කොහොමද හාමුදුරුවනේ මේක අපි ගැටුමකින් තොරව මේ මිනිස්සු ගහ ගන්නවා දැන් මේ ආවේගයට. එවැනි තැනකට පත් වෙන්න නොදී අපි කොහොමද මේක විසඳා ගන්නේ කියලා සාකච්ඡා

FAIR COMMENT BY JEZEEM

කරලා අපි දන්න කියන හිතවත් මුස්ලිම් ව්‍යාපාරිකයන් කිහිප දෙනෙකුටත් කතා කරලා මිලියන 5 ක් 6 ක් මේ මිනිස්සුන්ට දෙමු මේ ආබාධිත දරුවෙකුත් ඉන්නවා, ඒ ඔක්කොම එකඟ වෙලා අපි කොළඹට ආවා. ඉතින් එතන ඉදලා මම හිතන්නේ දවස් 2, 3 කට පසුවනේ ඔය ගැටුම ඇති වුනේ. ඒ ගැටුම කවුරු ඇති කලාද කොහොම වුණාද ඒවා ගැන අපිට කිසිම සම්බන්ධයකුත් නැහැ අපි දන්නෙත් නැහැ. නමුත් ගැටුම ඇති වුණාට පස්සේ මම හිතන්නේ දිගින් දිගටම දිගින් දිගටම මේ ජාතික රූපවාහිනිය, ආදී මාධ්‍යය වලින් අපේ ප්‍රකාශ ගහ ගන්න එපා සමගියෙන් වැඩ ටික කරන්න කියලා ආදී වශයෙන් ඒ ප්‍රශ්න නිවීමට මම හිතන්නේ මම විශාල දායකත්වයක් දුන්නා ඒ වෙලාවේ. ඒ කියන්නේ අපේ අයට සන්සුන් වෙන්න කියලා රට පුරාම මේක ඇවිලෙන්න පටන් ගත්තොත් ඒක නිවාගන්න බැරි වෙනවා ලොකු සිද්ධියක් නිසා රටේ මිනිස්සුන්ට කතා කරලා කිව්වා මෙන්න මේකයි වෙලා තියෙන්නේ කරුණාකරලා කලබලයට පත් වෙන්න එපා කියලා.

ප : ඔබ වහන්සේ මේ සභාවට සඳහන් කරන්නට යෙදෙන්නේ ඔබ වහන්සේ කලබල සිදු කිරීමක් නොකරන්න කියලා ආයාචනය කරමින් ප්‍රකාශ කලා කියන කාරණාවනේ හාමුදුරුවනේ?

පි : ඔව්.

ප : ඒ හා අනුගත වෙච්ච ඔබ වහන්සේ ඔය සඳහන් කරන කරුණු ඇතුලත් වීඩියෝ පටයක් ඔබ වහන්සේ සතුව තියෙනවද හාමුදුරුවනේ?

පි : නැහැ, ඒක ගන්න පුළුවන් ජාතික රූපවාහිනියෙන්. ඒ පත්තර වාර්තා ඒ එක්කොම ගන්න පුළුවන්. ඒ කියන්නේ ඔය සිද්ධිය පමණක් නෙමෙයි කලින් දවසේ මම මතක් කෙරුවා සිද්ධි ගණනාවක් නිවා දමන්න අපි මැදිහත් වුණා.

ප : මේ වීඩියෝ පටය ඔබ වහන්සේ විසින් මේ සභාවට ඉදිරිපත් කරන ලද වීඩියෝ පටයක්. කවදා දිනයේ කරන ලද කාරණාවකට අදාල වීඩියෝ පටයක්ද හාමුදුරුවනේ?

පි : මේක අර දිගන සිද්ධිය සම්බන්ධයෙන්.

ප : දිනයක් වශයෙන් ඔබ වහන්සේට දිනයක් කියන්න පුළුවන්ද හාමුදුරුවනේ? ඔබ වහන්සේ මේ වැඩම කරලා ඉන්නේ කොහේද කියලා කියන්න පුළුවන්ද?

පි : කාර්යාලයේ.

ප : බොදුබල සේනා සංවිධාන කාර්යාලයේ මාධ්‍ය ප්‍රකාශයක්?

පි : ඔව්.

ප : දිනයක් වශයෙන් කියන්න පුළුවන්ද හාමුදුරුවනේ? 2018 මාර්තු මාසේ 7 වෙනිදා කිව්වොත් ?

FAIR COMMENT BY JEZEEM

පි : ඔව්.

ස්වාමීන් වහන්සේ විසින් ඉදිරිපත් කරනු ලබන දිගන සිද්ධියට අදාලව උන් වහන්සේ විසින් කළා යැයි සඳහන් කෙරෙන බොදුබල සේනා සංවිධාන මූලස්ථානයේ කරන ලද මාධ්‍යය ප්‍රකාශයක වීඩියෝ පටයක් මේ අවස්ථාවේදි සභාවේ අවධානයට යොමු කර සිටිනවා. එය ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර අයැද සිටිනවා.

(අදාල වීඩියෝ පටය කොමිෂන් සභාවේ අවධානයට ප්‍රදර්ශනය කරයි)

<u>ස්වාමීන් වහන්සේ විසින් දිගන සිද්ධියට අදාලව උන් වහන්සේ මාධ්‍යය ඉදිරියේ කරන්නට යෙදුන ප්‍රකාශයක් වශයෙන් අද දින සභාවට ඉදිරිපත් කරන ලද මෙම වීඩියෝ පටය ඇතුලත් ප්‍රකාශය CD තැටියක් ලෙසට RGG 43 වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා.</u>

ප්‍ර : හාමුදුරුවනේ ඔබ වහන්සේට මතකයක් තිබෙනවාද ඔබ වහන්සේ බොදුබල සේනාව ආරම්භක අවස්ථාවේ ඒ මුල් අවදියේ දීම වගේ 2012 වර්ෂයේ නොවැම්බර් මාසේ ආසන්න දිනයක නැගෙනහිර පළාතේ පුරා වස්තු සම්බන්ධයෙන් ප්‍රශ්නයකට මැදිහත් වීමක් සිදු වුණා?

පි : ඔව්.

ප්‍ර : ඒ සම්බන්ධ සිදුවීම මොකක්ද කියලා මේ ගරු සභාවට පැහැදිලි කරන්න?

පි : මට ඒ කාල වකවානු නම් මතකයක් නැහැ, 2012 වගේ මතකයි.

ප්‍ර : 2012 බොදුබල සේනාව පිහිටුවීමෙන් පසුව කියලා කිව්වොත් හරිනේ හාමුදුරුවනේ?

පි : නැගෙනහිර පළාතේ සාගම කියලා ප්‍රදේශයක් තියෙනවා. ඒ සාගම දාගැබ, සාගම කියන ප්‍රදේශයේ පිහිටි දාගැබ සම්පූර්ණයෙන්ම දාගැබ මැදින් බැකෝ යන්ත්‍රයක් දාලා දෙපළු කරලා තිබුණා. මොට්ටයාගල. සාගම සෑය, ඒ සම්බන්ධයෙන් තමයි ඔබතුමිය මගෙන් ඇහුවේ. ඊට අපි මැදිහත් වෙලා ඒ පුරා විද්‍යාවේ අවධානය යොමු කෙරෙව්වා. අපේ මැදිහත් වීමෙන් එතනට ආපු ආරක්ෂක අංශය යෙදෙව්වා. ඒ තියෙන ටික හරි රැක ගන්න.

ප්‍ර : ඒ සම්බන්ධයෙන් ඔබ වහන්සේ ඒ ප්‍රදේශයට වැඩම කළාද?

පි : ඔව්.

ප්‍ර : වැඩම කලේ කොහේටද? පන්සලකටද හාමුදුරුවනේ?

FAIR COMMENT BY JEZEEM

පි : අපි අම්පාරට ගිහිල්ලා අම්පාරේ මට ඒ පිරිවෙනේ නම මතක නැහැ දැන්. ඒ පළාතේ, නැගෙනහිර පළාතේ සංඝනායක හාමුදුරුවෝ කිරිඳිවැල සෝමරතන නායක හාමුදුරුවන් ලඟට ගිහිල්ලා උන් වහන්සේගේ මඟ පෙන්වීම ඇතුව තමයි අපි ඔය ස්ථානයට ගියේ.

ප්‍ර : මොකක්ද ඒ ස්ථානය හාමුදුරුවනේ?

පි : ස්ථානය මොට්ටයාගල සාගම සෑය.

ප්‍ර : එහි සිදු වෙලා තිබිච්ච සිදුවීම මොකක්ද හාමුදුරුවනේ?

පි : සිදුවීම වෙල්යායක් මැද, රමණීය වෙල්යායක් ඒ වෙල්යාය මැද තිබුණු චෛත්‍යය සම්පූර්ණයෙන් ඒ චෛත්‍යය මැදින් බැකෝ යන්ත්‍රයක් දාලා චෛත්‍යය දෙපැත්තට ගිහිල්ලා. මැදින් සම්පූර්ණයෙන්ම හාරලා. ඉතින් ඒක බලන්න තමයි අපි ගියේ.

ප්‍ර : ඒ ගිය අවස්ථාවේ ඔබ වහන්සේ නිරීක්ෂණය කලාද මේ සිදුවීම සිදු වී තිබෙන්නේ කා අතින්ද, මොකක් හේතුවෙන්ද කියන කාරණාව?

පි : ඔව්.

ප්‍ර : පැහැදිලි කරන්න ගරු සභාවට හාමුදුරුවනේ?

පි : ඒ අවස්ථාව වෙන කොට මේ මගේ අතේ තියෙන්නේ ඒ පිංතූරයත් තියෙනවා චෛත්‍යය දෙපළු වෙච්ච හැටි.

(පින්තූරයක් පෙන්වයි)

මේ තියෙන්නේ දෙපළු කරලා තියෙන විදිය. ඒ නායක හාමුදුරුවන්ගේ ප්‍රකාශයත් මෙතන තියෙනවා. අන්තවාදීන්ගේ සාහසික අපරාධයක්, ජාතික සමඟියට මහා තර්ජනයක් කියලා. සාගම ඩෝසර් කිරීමේ සිද්ධිය. විශේෂ යමක් කියලා නැහැ ඉතින් කවුරුන් හෝ අපි හිතනවා ඒ මුස්ලිම් සහ දමිළ කෙනෙකුමම හිතන්නේ ඉදිරිපත් වෙලා තිබුණා. පස්සේ එයාව අත්අඩංගුවට ගත්තා.

ප්‍ර : මේ ස්ථානයේදී ඔබ වහන්සේ ප්‍රකාශයක් කළාද මාධ්‍යය ඉදිරියේ හෝ මේ ස්ථානයේදී හෝ මේ සිදුවීම් අලෙලා ප්‍රකාශයක් කලාද මේ දාගැබට හානි වීමට අදාලව?

පි : එහෙම සිද්ධිය මතක නැහැ කියපු දේ මතක් කලොත් මතක් වෙයි. මොකක්ද කිව්වේ කියලා නම් මතකයක් නැහැ දැන් හුඟක් කලින් නිසා.

ප්‍ර : ඒ වගේම ඔබ වහන්සේට මතකයක් තිබෙනවාද 2013 වර්ෂයේ ඒ කියන්නේ අපි දැන් මොහොතකට පෙර මේ විනාඩි කිහිපයකට පෙර බැලුවා අළුත්ගම දර්ගා නගරයේ ඇති වූ සිදුවීම් හා සම්බන්ධව බොදුබල සේනාවේ එම ස්ථානයට යෑම සහ ඔබ වහන්සේගේ ප්‍රකාශයන් පිළිබඳ වීඩියෝ පටයක්. ඊට පෙර 2013

FAIR COMMENT BY JEZEEM

වර්ෂයේ ජනවාරි මාසයේදි බේරුවල ප්‍රදේශයේ යම්කිසි අන්තවාදී ගැටුමක් හට ගත්ත කාලයක් ඔබ වහන්සේට මතකයක් තියෙනවද?

පි : බේරුවලද?

ප්‍ර : බේරුවල ප්‍රදේශයේ. 2013 වර්ෂයේදී.

පි : පොඩි සිද්ධියක් ඇති වෙන්න ගිහිං ඒක වැළකුනා කියලා තමයි දන්නේ.

ප්‍ර : ඒ සිද්ධියක් ඇති වුණ අවස්ථාවට බොදුබල සේනාව වශයෙන් ඔබ වහන්සේ එම ප්‍රදේශයට වැඩමවීමක් කලාද?

පි : නැහැ.

ප්‍ර : ඒ සිද්ධිය අලෙලා බොදුබල සේනාව නියෝජනය කරමින් ඔබ වහන්සේ මාධ්‍යයට ප්‍රකාශයක් කලාද?

පි : මතක නැහැ අවුරුදු ගානකට කලින්නේ.

ප්‍ර : දැන් හාමුදුරුවනේ මේ දක්වා දැනට අපි නිරීක්ෂණය කරපු වීඩියෝ පටවල තියෙන අන්තර්ගත කරුණු සැළකීමේදී මුස්ලිම් ප්‍රජාව වෙනුවෙන් ඇතමෙක් ඔබ වහන්සේට චෝදනාවක් කරනවා නම් ඔබ වහන්සේගේ ඇතැම් අවස්ථාවල්වලදී කෙරෙන ප්‍රකාශයන් හේතුවෙන් ඒ අයට සිත් රිදවීමක් ආගමික වශයෙන් සිදු වෙලා තිබෙනවාය කියලා ඔවුන්ගේ ආගමික නායකයන්ට අපහාසයක් සිදු වී තිබෙනවාය කියලා ඒ කාරණාව සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් හැටියට ඔබ වහන්සේට කියන්න තියෙන්නේ මොකක්ද?

පි : මට කෙටියෙන්ම කියන්න තියෙන්නේ මේ කථාව ඒගොල්ලෝ කියනවා. ඒක සාමාන්‍ය දෙයක්. ඒගොල්ලෝ ඇවිල්ලා චෝදනා කරයි බොදුබල සේනා සංවිධානය හැදුවා ඒකේදී මේ නොයෙක් නොයෙක් ප්‍රකාශ කරනවා, hate speech වෙරී සහගත ප්‍රකාශ ඒකනේ අර පනතකුත් ගෙනත් දා ගත්තේ ඒගොල්ලන්. ICCPR පනත. අපිට කතා කරන්න බැහැ. ඒ Hate teachingsඋගන්වන්න පුළුවන් ඒගොල්ලන්ට හොරෙන් හොරෙන්. ඒවා හෙළිදරව් කරන්න බැහැ. පුදුම වැඩක් මේක. දැන් බලන්න අපි ඔක්කොම්පඔ ගාලකදාලා තියෙන හැටි මේගොල්ලෝ. අපිට අපේ නිදහස අපේ භාෂණයේ නිදහස, අපිට ඕනම තැනක ඒ අවස්ථාව තියෙනවා. එකක් මේක අපේ රට. අපි ගිහිල්ලා අරාබියේවත් වෙන කොහේවත් මෙයාලගේ දෙයක් උදුරාගෙන නැහැනේ. අපි කියන්නේ අපිට නිදහසේ ඉන්න දෙන්න. ඒගොල්ලන්නේ මේ හැම ප්‍රශ්නයක්ම ඇති කරලා තියෙන්නේ, අපිද? ඒගොල්ලෝ කුඩා කණ්ඩායමක්ව ඉන්න කල් පුස් පැටව් වගේ ඉන්නවා. ඒගොල්ලෝ ඊට පස්සේ සම්පූර්ණයෙන්ම

LEAR COMMENT BY JEZEEM

ඒගොල්ලන්ට අදාල පද්ධති ගොඩ නඟා ගෙන දේශපාලනිකව හැම අතින්ම ශක්තිය හදා ගත්තාට පස්සේ අනික් කාටවත් ඔළුව උස්සන්න දෙන්නේ නැහැ. ඉතින් ඒ මහා විනාශය වෙන්න කලින් තමයි කෑ ගහලා කියන්නේ මිනිසුනේ ඇස් ඇරලා බලාපල්ලා කියලා. ඉතින් ඔය චෝදනාව ඔය විදියට කරන බව දන්නවා. ඒ නිසා මම කිසි ලෙසකින්වත් පිළිගන්නේ නැහැ අපේ ප්‍රකාශ වලින් මේමුස්ලිම් අන්තවාදීන් බිහි වුණා කියලා. සමහර අන්තවාදීන් බිහි වෙලා තියෙන්නේ මම ඉපදුනේ 75. මේ සංවිධාන පටන් අරන් තියෙන්නේ 41, 47, 50 ගණන් වල. ඉතින් එතකොට එහෙමනම් කවුද ඒවා කරලා තියෙන්නේ. ඒගොල්ලෝ කියයි මේගොල්ලන් නිසා තමයි මේ ප්‍රකාශය හින්දා අනේ අම්මේ අපේ හිත රිදුනා.ගිහිල්ලා පැමිණිල්ලක් දාන්න පුළුවන්නේ හිත රිදුනා නම්.

(ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදි මෙම කොමිෂම ඉදිරියේ මේ වන විටත් සලකුණු කොට තිබෙන C512 CD තැටිය නැවත ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර අයැද සිටිනවා. එය ස්වාමීන් වහන්සේගේ අවධානයට යොමු කර ඉන් අනතුරුව ප්‍රශ්න ඇසීමේ පහසුව සඳහා)

(අදාල CD තැටිය වාදය කිරීමට සලස්වයි)

ප : හාමුදුරුවනේ ඔබ වහන්සේ දැන් නිරීක්ෂණය කරපු දැනටමත්C512 වශයෙන් මේ සභාවට සලකුණු කරනු ලැබූ මේ වීඩියෝ පටයේ ඔබ වහන්සේට හඳුනා ගන්නට පුළුවන්ද මේ අය කවුද කියලා, කතා කරපු කෙනා පිළිබඳ අවබෝධයක් තියෙනවද හාමුදුරුවනේ?

පි : සහරාන් හෂීම්.

ප : සෙසු අය සම්බන්ධයෙන් අවබෝධයක් තියෙනවද හාමුදුරුවනේ?

පි : නැහැ.

ප : ඔබ වහන්සේ මේ වීඩියෝ පටය මින්පෙර අද දිනට පෙර අවස්ථාවක දැකලා තිබුණද හාමුදුරුවනේ?

පි : සම්පූර්ණ වීඩියෝ පටය දැකලා තිබුනේ නැහැ, ඔයිට වඩා වෙනස් සමහර දේවල් දැකලා තියෙනවා. අපි සතුවත් තියෙනවා ඔහු හදිස් ගැන කියන වීඩියෝ පටයක් එහිදී දැක්කා.

ප : මේ කතාවෙහි එහි පරිවර්ථනයක් හැටියට ලබා දී තිබෙන ඒ ලිඛිත ලේඛනයට අනුව සහරාන් හෂීම් නැමැති ඔය කතා කරපු පුද්ගලයා ඔබ වහන්සේ සම්බන්ධයෙන් මෙන්න මේ ආකාරයෙන් ඒ කතාවේ සඳහන් කෙරෙන බව ගරු සභාව ඉදිරියේ මේ වන විට සාක්ෂි ඉදිරිපත් වී තිබෙනවා. එහි සඳහන්ව තිබෙන්නේ

FAIR COMMENT BY JEZEEM

"ඥාණසාර නමැති යක්ෂයා විසින් අල්ලාහ්දෙවියන් වහන්සේට නැවත පුනරුප්පත්තියක් ඇති බවට ව්‍යාජ ප්‍රකාශයක් සිදු කිරීම. ඒ වගේම ජමෙයිතුල් උලමා සංවිධානය නේපාලයේ සිටින කාෆිර්ලාට සහයෝගය ලබා දෙන අතර, මියන්මාරයේ මුස්ලිම්වරු මරා දමන විට ඥාණසාර යක්ෂයා නිදහසේ සිටින විට ඉස්ලාම් ආගම වෙනුවෙන් බන්ධනාගාර ගත කළ ඊබ්‍රාහිම් මවුලවි වෙනුවෙන් ද නිශ්ශබ්දව සිටිනවා ඔවුන් කිසිවක් කරන්නේ නැහැ උලමාවරුන් විශ්වාස කර අනාගතය අඳුරු කරගන්න එපා." වශයෙන් ඔබ වහන්සේ සම්බන්ධයෙන් මේ කරුණු ඉදිරිපත් කරමින් කරන ලද මේ කතාව සම්බන්ධයෙන් ඔබ වහන්සේට කියන්න තියෙන්නේ මොකක්ද?

පි : ඇත්ත වශයෙන්ම මේක තමයි වහබිසම්වල ස්වරූපය. විශේෂයෙන් අල්ලාහ් දෙවියන් වහන්සේ සම්බන්ධයෙන් ඒගොල්ලන්ගේ ජීවිතයත් හරි අල්ලාහ් දෙවියොත් හරි. මොනම හේතුවක් නිසාවත් ඔවුන්ගේ ඉගැන්වීම් ගැන, ඔවුන්ගේ ජීවන දර්ශනය ගැන, ප්‍රශ්න කරන්න අනික් අයට තහනම්. ඔවුන් කල්පනා කරනවා ඔවුන් අල්ලාහ් දෙවියන් විසින් මේ ලෝකෙට එවලා තියෙන්නේ ඒ අල්ලාහ්ගේ පණිවිඩය ලෝකයේ ක්‍රියාත්මක කරන්න. එතකොට දැන් අපි අල්ලාහ් දෙවියන්ගේ ගෝලයෝ නෙමෙයි නේ. ඒක මම කොහේවත් කියලා නැහැ අල්ලා දෙවියෝ ආපහු පුනරුප්පත්තියක් ගැන. මම දන්නේ නැහැ එයා මොනව හරි වැරදි අවබෝධයක් ඇතුව කරපු දෙයක් වෙන්න ඕනේ. අපි පුනරුප්පත්තිය විශ්වාස කරන්නේ නැහැනේ. අපි විශ්වාස කරන්නේ පුනර්භවය. ඒක මම දන්නේ නැහැ මොන පදනමකින් ට්‍රාන්ස්ලේෂන් එකේ දෝශයක්ද මොකක්ද එහෙම අල්ලාහ් දෙවියෝ ඉපදෙන කතාවක් එහෙම උපදින්න ඉතින් එහෙම දෙවියෙක් ඉන්න එපැය. නබීතුමා දැප=කපු නැති දෙවියෙක්නේ මේ. ඉතින් ඒ දෙවියන් ගැන කතා කිරීම, ඒගොල්ලන්ගේ හදීස් ගැන, සුන්නාව ගැන ඒවා ගැන කතා කරන්න අන්‍ය අයට බැහැ. ඒගොල්ලන් ඉස්ලාමිය හතුරෝ, අපි කාෆිර්වරු. කාෆිර්වරු මරා දමන්න කියලා සිය ගණන් ඔය ජිහාද් කියන වචනය කුර්ආනයේ පමණක් 41 ක් වතාවක් සටහන් කරලා තියෙනවා. ජිහාද් කියන වචනය. ඉතින් මේක නිකම්ම නිකම් අහඹුවක් නෙමෙයි. මේ teachings. සහරාන්ලා Practice කලේ ඒ ඉස්ලාමීය අන්තවාදී teachings. මේකේ උලමා සභාවත් ඉන්නවා. මේගොල්ලෝ එක පැත්තකින් පෙන්නනවා අපි උලමාට විරුද්ධයි. අද අපි විශේෂයෙන් හෙළිදරව් කිරීම් 2 ක් කරන්නත් බලාපොරොත්තු වෙනවාමැතිතුමනි. මේක කොහොම කෙලවරක්

LAW COMMENT BY JEZEEM

කර ගන්නද කියලා අපිට හිතා ගන්නවත් මේකේ මුල මැද අඟ හොයාගන්න බැහැ. ඒ කියන්නේ මේ ඔක්කොම එකට හරියට මේක හොඳ සුප් එකක් වගේ. සුප් එකේ වෙනම අහවල් එක හොයන්න එහෙම හොයන්න බැහැනේ ඔක්කොම මික්ස් වෙලා තියෙන්නේ. ඉතින් මේ ප්‍රකාශය සම්බන්ධයෙන් අපිට එහෙම කලබලයට පත් වෙන්න දෙයක් නැහැ මොකද මේක තමයි ඒගොල්ලන්ගේ ස්වභාවය. ඒගොල්ලන්ට ඕන දෙයක් කියන්න පුළුවන්. හැබැයි අපට ඉස්ලාම් ගැන කතා කරන්න බැහැ. ඒක තමයි මේ කාරණාවෙනුත් අවබෝධ කර ගන්න තියෙන දේ.

දැන් වේලාව : ප.ව. 4.05 යි
මෙතැන් සිට ල/ලේ :-යමුණා දසනායක මිය

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

වෙලාව ප.ව. 4.05.
පෙර සටහන් ගැනීම ල/ලේ දම්මිකා මිය.
සටහන් ගැනීම ල/ලේ යමුනා දසනායක විසිනි.

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මිය

ප්‍ර මෙම වීඩියෝ පටයට අදාළව සිදු කර තිබෙන පරිවර්තනයට අනුව ශ්‍රී ලංකාව තුල මරාගෙන මැරෙන ප්‍රහාරයන් සිදු කිරීමට හේතු කාරණා වශයෙන් සහරාන් හෂීම් හේතු කාරණා මේ වීඩියෝ පටයේ ඔහුගේ කථාව තුල සඳහන් කරන බව ඇතුලත්ව තිබෙනවා මේ පරිවර්තනයේ ඒ හේතු කාරණා අතරට මා පෙර ඔබ වහන්සේගේ අවධානයට ලක් කර කාරණා දෙක සෙසු කරුණු අතරේ තිබෙන බව මේ කථාවේ අන්තර්ගත බවට පරිවර්තනය වී තිබෙනවා . ඒ කියන්නේ විශේෂයෙන්ම ඥාණසාර නැමති යක්ෂයා විසින් අල්ලාහ් හ් දෙවියන් වහන්සේට නැවත පුනරුත්පත්තියක් ඇති බවට ව්‍යාජ ප්‍රකාශයක් සිදු කිරීම . ඒ වගේම ඥාණසාර යක්ෂයා නිදහසේ සිටින අවස්ථාවේදි ඉස්ලාම් ආගම වෙනුවෙන් බන්ධනාගාර ගත කල ඊබ්‍රාහිම් මවුලවි සම්බන්ධයෙන් සෙසු අය නිශ්ශබ්දව සිටිනවා කියන කාරණාව ආදි වශයෙන් ඔබ වහන්සේගේ නම සඳහන් කරමින් මේ කරුණු අතර ඔවුන්ගේ මරාගෙන මැරෙන ප්‍රහාරයට හේතු කරුණු අතර ඔබ වහන්සේගේ නම සඳහන් කරමින්ම කරුණු කීපයක් ඉදිරිපත්ව තිබෙනවාය කියන ඒ කාරණාව සම්බන්ධයෙන් ඔබ වහන්සේට කියන්න තියෙන්නේ මොකක්ද?

උ ඒ කථාව සම්බන්ධයෙන් කියන්න තියෙන්නේ ඉස්ලාමිය අන්තවාදය පිළිබඳ භය නැතිව අත දිගහැරලා හෙළිදරව් කලේ මම. ඉතින් ඒ ගොල්ලන්ගේ යක්ෂයා වෙන එක සාධාරණයි . මට තියෙන්නේ මම මැව්වේ කවුද කියලා. ඒ ගොල්ලන්ගේ අල්ලාහ් දෙවියන් නම් මේ ඔක්කෝම මවලා තියෙන්නේ ඒ ගොල්ලන්ට ප්‍රශ්නයක් ඇති මේ ඥාණසාර මැව්වේ කවුද කියලා . ඉතින් මෑත කාලයේ මම තමයි මේ අන්තවාදය පිළිබඳව මුල මැද අග ඇතිව මේවා කොහොමද වෙන්නේ කින්ද මන්ද කියලා හෙළිදරව් කලේ. ඉතින් හෙළදරව් කරන කොට මම ඒ ගොල්ලන්ගේ පොදු හතුරා බවට පත්වුනා.ඉතින් මට පුදුමයි තවම ජීවත් වෙන එක ගැනත් අපි. ඒ ගොල්ලන්ගේ සැලසුම් වලට අනුව. ඉතින් ඒ නිසා තමයි ඒ ප්‍රකාශය ඔහු කරන්න ඇත්තේ.මොකද මේකේ තියෙන පුදුමය නම් මේ ප්‍රහාරය එල්ල කරන්නේ මේ අහවල්ලු නිසා ඒක මොන මොන ප්‍රාථමික කථාවක්ද ? මොකද මේ ගොල්ලෝ ගොඩනැගිලා තියෙන විදිය දැන් මේ සංවිධාන හදලා තියෙන්නේ කොයි කාලෙද අපි බොදු බල සේනා හදන්න කලින් . එතකොට ඒ ගොල්ලන්ගේ අරමුණු තිබුනේ කොයි කාලෙද ? එතකොට ඒවත් එක්ක සංසන්දනය කරලා බලනකොට ඔහුගේ ගැලවීම සඳහා අර අපේ

FAIR COMMENT BY JEZEEM

පැත්තටත් බෝලයක් පාස් කරන්න ඕනේ හින්දා සිංහළ සමාජය ඒක හින්දා තමයි මෙහෙම වෙන්න ඇත්තේ කියලා ඉතින් ඔකට කියන්නේ අල්ටකියාව. එහෙම කරන්න කියලා ඒ ගොල්ලන්ට උගන්වලා තියෙනවා හදීස්වල කුරානයේ . අනිත් අයවත් මුලාවට පත්කරලා අවුලෙන් අවුලට පත් කරන්න කියලා මේකේ තියනවා . මොකද අල්ලාහ් ගේ සැලසුම් දන්නේ ඔහුම විතරයිලුනේ. එයයි එයාගේ ගෝලයොයි මට සමාව දෙන්න මොකද මෙතන කියවිච්ච නිසා මට පොඩි වාක්‍ය කීපයක් සහ මෙන්න මේ ඉක්මනින්ම මැතිතුමනි මේකේ තියෙන පොඩි පුංචි පිටුවක් දෙකක් තියෙන්නේ මේකටම ගොනු කරන්න පුළුවන් නම් ඉතාම හොඳයි. ඒ වාක්‍යයත් එක්කම.

****

<u>**ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා**</u>

ප්‍ර ඔබ වහන්සේ යම්කිසි ග්‍රන්ථයකින් කොටසක් ස්වාමීන් වහන්ස අපි ඔක්කොම ඒ ග්‍රන්ථ ටික එකට ලකුණු කරමුද පස්සේ වෙලාවක මේ කොටස ඉවර කෙරුවයින් පස්සේ ?

උ හොඳමයි. මොකද මැතිතුමනි මන් දැන් අරහෙම කිව්වේ අල් ජිහාද් කියන වචනය පාවිච්චි කලා. උදාහරණයක් විදියට මේ සිංහලෙව් එව්ව පොත්පත් වල දැන් එකම එකක් ගත්තොත් ප්‍රශ්ණයක් අහනවා අල්ලාහ් ගේ මාර්ගයේ ජිහාද් යනු කුමක්ද? උත්තරය මොකක්ද මැතිතුමනි කෙනෙකුගේ වස්තුව, ජීවිතය සහ දිවි කැප කරමින් ජිහාදයේ යෙදීම අනිවාර්ය වේ. ඉතින් ඒ වගේ අර හදීස් ටික අනිවාර්යයෙන්ම අපිට මේ සභාගත කරන්න උවමනයි.

ප්‍ර ඔබ වහන්සේට ඒ අවස්ථාව ලබා දෙන්නම්. දැනටමත් ඒ සම්බන්ධයෙන් ගැන අපේ අවධානය යොමු කරලා තියෙන්නේ මේ කොටස ඉවර වුනායින් පස්සේ ඒ අවස්ථාව ලබා දෙන්නම් .

උ හොඳමයි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මිය</u>.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී අවසර අයැද සිටිනවා අන්තර්ජාලය හරහා ලබා ගන්නා ලද ඡායාරූපයක පිටපතක් ස්වාමීන් වහන්සේට පෙන්වා සිටීම සඳහා

ප්‍ර හාමුදුරුවනේ ඔබ වහන්සේ මේ අවස්ථාවේ මේ දුටුව පින්තූරය සිදුවුන අවස්ථාවක් හෝ ප්‍රදේශයක් හෝ ඒ පින්තූරය ගැන තොරතුරක් ඔබ වහන්සේ දන්නවාද ?

උ මම හිතන්නේ මේ ගැන පැමිණිලි කලෙත් මන්මයි කාලයේ. ඒ කියන්නේ අපි ඉස්ලාම් අන්තවාදය ගැන කරුණු කියාගෙන එනකොට

FAIR COMMENT BY JEZEEM

දැන් ඔබතුමියට බාධාවක් නෙමෙයි පොඩි ඌණ පූරණයක්. මේ දිනවල පාස්කු කොමිසම ඉස්සරහ සාක්ෂි දෙනකොට මාධ්‍ය වල පල වෙනවා . පොඩි පොඩි කල්ලි ගණනක් ෆයිල් ටිකක් අරන් යනවා මුලස්ථානයට යනවා එහෙට යනවා මෙහේට යනවා . ඒ ගොල්ලෝ අඟවනවා අපිත් මේ ප්‍රශ්ණය දන්නවා කියලා . ඒ වගේ අදත් අපි මේ ඉස්ලාම් ප්‍රශ්ණය ගැන හරිම අවස්ථාවෝචිතව මෙවා ඉදිරිපත් කරන විට යම් යම් ඒක සංවිධානගතව නෙමේ එක එක පුද්ගලයෝ හිතුමනාපයට නොයෙක් නොයෙක් දේවල් කලා . මේ ස්වාමීන් වහන්සේට කියන්නේ මාතලේ වෙද හාමුදුරුවෝ කියලා. ඉතින් මේ හාමුදුරුවෝ කුලියාපිටිය පැත්තේ උද්ඝෝෂණයක් කරනවා කියලා කියන කොට මම තමයි ඇත්ත වශයෙන්ම ඒකට මැදිහත් වෙලා ඒක නැවැත්තුවේ මේ වගේ මෝඩ වැඩ කරන්න එපා පිස්සෝ කියලා. ඔය වචනවලින්මයි මම ඇමතුවේ. එහේ පොලිසියටත් කථා කරලා ඒ වෙනකොටත් ටික දුරක් ඇවිල්ලා ඉවරයි. අපේ කිසිම සම්බන්ධයක්වත් අපේ සාමාජිකයෙක් වත් කවුරුවත් නෙමෙයි. ඉතින් මේවගේ යම් යම් හුදකලා සිද්ධින් හැම තැනම සිද්ධ වුනා. මොකද ඒ හාමුදුරුවෝ මාතලේ වීමත් මාතලේ ඒ මුස්ලිම් ප්‍රජාවගෙන් ඇති වෙලා තිබුණු ඒ බලපෑමෙන් හාමුදුරුවන්ට මොනවාහරි පීඩනයක් තියෙන්න ඇති ඒ පීඩනය පිට කරපු විදිය තමයි ඔය ප්‍රශ්ණය තියෙන්නේ ඔය පින්තූරය ගැන කථා කරනවා හැබැයි මාතලේ මේ හාමුදුරුවෝ සහ මාතලේ ඒ අවට ජීවත් වන අයට මුස්ලිම් අය විසින් මුදා හැරලා තියෙන පීඩනය ගැන කථා කරන් නැහැ. ඉතින් මේ තමන්ට පුළුවන් හැටියට පීඩනය පිට කරගත්ත අවස්ථාවක් හැටියට තමයි අපි මේක දැක්කේ . කුලියාපිටිය ප්‍රදේශයේ කියලා තමයි අපිට ඒ දවස් වල වාර්තා වුනේ.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මිය</u>

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී ස්වාමීන් වහන්සේගේ අවධානයට යොමු කරන ලද අන්තර්ජාලයෙන් ලබා ගන්නා ලද ,එම ඡායාරූපය මෙම සභාවට C 699 වශයෙන් සළකුණු කිරීමට අවසර අයැද සිටිනවා.

ප්‍ර අපේ හාමුදුරුවනේ මේ පින්තූරය ඔබ වහන්සේ ස්වාමීන් වහන්සේ ගේ කෙනෙක් ගේ නමක් සදහන් කලා මට පෙන්වද්දිම ?

උ එක හාමුදුරු කෙනයි මෙතන ඉන්නේ . ඒ හාමුදුරුවන් ගේ නම නම් මම දන්නේ නැහැ. මාතලේ වෙද හාමුදුරුවෝ හැටියට තමයි මෙයා අපි හඳුනාගත්තේ . මාතලේ වෙද හාමුදුරුවෝ කියලා තමයි හඳුනාගත්තේ ඒ සිද්ධියෙන් පස්සේ හැබැයි අද වෙනකල් අපි දැක්කෙත් නැහැ හමුවුනෙත් නැහැ.

FAIR COMMENT — BY JEZEEM

ගරු සභාපති තුමනි මෙම C 699 ඡායාරූපයෙහි දක්නට ලැබෙන ස්වාමීන් වහන්සේ කෙනකුගේ එම රූපය සහිත කොටස මාතලේ වෙද හාමුදුරුවෝ වශයෙන් මේ අවස්ථාවේදි ගරුතර ස්වාමීන් වහන්සේ හඳුනාගනු ලැබූ බැවින් එම ස්ථානය C 699 A වශයෙන් මාතලේ වෙද හාමුදුරුවෝ වශයෙන් සලකුණු කිරීම සඳහා අවසර අයැද සිටිනවා.

උ අපේ කාර්යාලයටත් මට මතක විදියට වතාවක් හෝ දෙවතාවක් ඇවිල්ලා තියෙනවා . යම් යම් මුස්ලිම් ප්‍රශ්ණ ගැන කථා කරන්න. නමුත් නමින් මට මතකයක් නැහැ . වෙද හාමුදුරුවෝ කියන එක මතකයි.

ප්‍ර ඒ කියන්නේ හාමුදුරුවනේ මේ ඡායාරූපයේ ඔබ වහන්සේ දැන් මාතලේ වෙද හාමුදුරුවෝ වශයෙන් සිටින පුද්ගලයා හැටියට හඳුනා ගත් ස්වාමීන් වහන්සේ ඔබ වහන්සේව හැබැහින් බැහැ දැකීමට පැමිණිලා තිබෙනවාද යම් අවස්ථාවක හෝ?

උ ඔව් මට මතකයි අවස්ථාවක් හෝ දෙකක් අපි තේරුම් ගත්තා එයාට පොඩි සයිකෝ ප්‍රශ්ණයක් තියෙනවාදත් කියලා අපි සාකච්ඡා කලා . ඊට පස්සේ අපි වැඩිය එන්න දුන්නේ නැහැ.

ප්‍ර මේ ඡායාරූපය හාමුදුරුවනේ ඔබ වහන්සේට මේ අවස්ථාවේ නිරීක්ෂණය කරන්න පුළුවන්ද එහෙම නැත්නම් දැනීමක් තියෙනවාද ඌරෙකුගේ රූපයක් ඇඳලා යම්කිසි කාරණාවක් ලියවිලා තියෙන බවක් ඔබ වහන්සේ මේ ඡායාරූපයෙන් ඔබ වහන්සේට පේනවාද එහෙම නැත්නම් මීට පෙර අද දිනට පෙර මේ සම්බන්ධයෙන් ඔබ වහන්සේ දන්නවාද ඒ කියන්නේ ?

උ ඔය පාගමන ආරම්භ වෙන කොටම අපිට කථා කරලා කිව්වා එහේ පොලිසියේ නිළධාරි මහත්මයෙක් හාමුදුරුවනේ මෙන්න මෙහෙම පෙළපාලියක් යන්න හදනවා මේ හත් අට දෙනයි ඉන්නේ . ඌරෙක් ඇඳලා රෙද්දක ඊට උඩින් අල්ලාහ් කියලා ලියලා . අපි කිව්වා ඕක යන්න දෙන්න එපා වහාම මේ අත් අඩංගුවට ගන්න මහත්තයෝ ඔය වගේ දේවල් කරන්න දෙන්න එපා කියලා එය නැවැත්තුවා ඇත්ත වශයෙන්ම. වැඩිදුරක් යන්න හම්බ වුන් නැහැ.

ප්‍ර ඔබ වහන්සේ එවැනි ප්‍රකාශයක් කලේ කාටද හාමුදුරුවනේ ?

උ ඒ පොලිස් නිළධාරි මට කථා කරපු මහත්මයාට අපේ කිසිම සම්බන්ධයක් නැහැ මේක කවුද කරන්නේ කියලා බලන්න ඒ මහත්මයා තමයි මට කිව්වේ මෙහෙම රෙද්දක ඇඳලා තියෙනවා මේ ඌරෙක් ගේ වගේ රූපයක් උඩ මෙහෙම ගහලා තියෙනවා. ඒවගේ පහත් තැනට වැටෙන්න ඕනේ නැහැ එවැනි දේවල් කරන්න දෙන්න එපා කියලා අපි ඒ කථා කරපු මහත්මයට දැනුම් දුන්නා.

ප්‍ර ඒ කොයි ප්‍රදේශයේ පොලිසියේ මහත්මයෙක්ද?

උ කුලියාපිටියේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර ස්ථානාධිපතිවරයාද හාමුදුරුවනේ එවකට ?

උ මට මතක නැහැ ඒ.එස්. පි. මහත්තයද ඕ. අයි. සි. මහත්මයාද කියලා මට මතක නැහැ. ගොඩක් කල් නිසා මතක නැහැ.

ප්‍ර ඔබ වහන්සේ සඳහන් කරන්නට යෙදුණු ඔබ වහන්සේට දැන ගන්නට ලැබුනාය කියන ඌරෙකු ගේ රූපය ඇතුලත් ඒ කොටස මේ ඡායාරූපයේ පේනවාද හාමුදුරුවනේ තැන පෙන්නුම් කරන්න ගෞරවයෙන් හාමුදුරුවනේ ?

උ ඒකේ කතිරයක් නම් පේනවා . හලාල් ලාංඡනය , මේකේ ඌරෙක් නම් පේන්නේ නැහැ . මේ මොන ඌරෙක්ද මේ . ඇත්තටම මට අඳුනාගන්න අමාරුයි. මේ මෙහෙමද. දැන් මේ කතිරයක් වගේ පේන්න තියෙනවා මම හිතන්නේ හලාල් එපා කියන එක වෙන්න ඕනේ කියන එකයි මගේ නම් අදහස ඌරෙක් වගේ එකක් . උඩ ලොකු පින්තූරයක් තමයි අපි දැක්කේ මේ වගේ එකක් නෙමේ .ඒ අපිට පස්සේ දැන ගත්තා අපි අන්තර්ජාලයේ තිබුනා එතකොට තිබුනේ මීටරයක් මීටර් එක හමාරක් දෙකක් විතර ලොකු මේ වගේ පොඩි එකක් නෙමේ.

ප්‍ර නමුත් ඔබ වහන්සේට දැනීමක් තියෙනවා ඔය වෙද හාමුදුරුවෝ එවැනි කුලියාපිටිය ප්‍රදේශයේ ඌරෙකුගේ රූපයක් මත අල්ලාහ් ගැන සඳහන් කිරීමක් කරමින් පාගමනක නියැලුනා කියන කාරණාව ඔබ වහන්සේට දැනීමක් තියෙනවා ? මේ ඡායාරූපය ඔබ වහන්සේ දුටුවයි කියන කොටස මේ වෙලාවේ ඔබ වහන්සේට නිරීක්ෂණය වෙන්නේ නැහැ?

උ නැහැ.

ප්‍ර නමුත් ඔබ වහන්සේ එවැනි ඡායාරූපයක් දැකලා තියෙනවා ?

උ දැක්කා දැක්කා.

ප්‍ර මීට පෙර ?

උ ඒක ඔයිට වඩා ටිකක් ලොකුයි මීටර් එක හමාරක් විතර අර මෙහෙම අල්ලන්න පුළුවන් සයිස් එකේ .

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේදි කොමිෂන් සභාවේ කටයුතු ප.ව. 4.45 වන තෙක් අත්හිටුවමි.

****

FAIR COMMENT
BY JEZEEM

දැන් වේලාව ප.ව. 5.05
තේ විවේකයෙන් පසුව කොමිෂන් සභාව නැවත රැස් වෙයි.
සාක්ෂිකරු නැවත ප්‍රතිඥා දෙයි.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මිය</u>

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී මෙම විවේකයට ප්‍රථමයෙන් ගරුතර ස්වාමීන් වහන්සේ විසින් ගරු සභාවේ අවධානයට ලක් කරනු ලැබුවා 2014 ජුනි මසේ 14 හෝ 15 දිනදී අළුත්ගම නගරයේදී උන් වහන්සේ කරන ලද ප්‍රකාශයේ සම්පූර්ණ ප්‍රකාශය ඇතුලත් වීඩියෝ පටය ගරු සභාවේ අවධානයට යොමු කිරීමට උන් වහන්සේට අවශ්‍ය බවට. ඒ අනුව එම සම්පූර්ණ වීඩියෝ පටය මේ අවස්ථාවේදි සුදානම් කර තිබෙනවා. එය ගරු සභාවේ අවධානයට යොමු කිරීම සඳහා අවසර අයැද සිටිනවා .

උ මේක මැතිණියනි මං හිතන්නේ ලොකු වේලාවක් නිසා සම්පූර්ණ වීඩියෝ පටය නිරීක්ෂණය කරන්න මෙතන විකාශනය කරන්න ගොඩක් වෙලාව යයි . මං හිතන්නේ පැයකටත් වැඩි කාලයක් තියෙනවා අපරාදේ කාලය . ඒ නිසා මම අදහස් කලේ මැතිතුමනි, කොටසක් ගන්නේ නැතුව මේක ඔබතුමාල හරි ඒක නිරීක්ෂණය කරන්න වීඩියෝ පට බලලා .

ඒ වගේම තව නිවැරදි කිරීමක් කර ගන්න උවමනායි අර සහරාන් හෂීම් ගේ ඒ ප්‍රකාශයට අදාලව ඔහු කියනවා ඊබ්‍රාහිම් නාන ඇතුලේ හාමුදුරුවෝ එළියේ කියලා . මම මට සිර දඩුවමක් ලැබෙනවා 2018/08/08 වෙනිදා . එතකොට මේ ප්‍රකාශය කරන කොට මම හිරේ. සහරාන් ඒකවත් දැනන් ඉඳලා නැහැ ඌ ත්‍රස්තවාදියෙක් නේ. ත්‍රස්තවාදියෝ කව්ද ඇත්ත කියන්නේ. ඒකත් බොරුවක් ඔහු ඒ ප්‍රකාශය කරන කොට මං ඇතුලේ. පාස්කු ප්‍රහාරය වෙන කොටත් මම සිර ගේ ඇතුලේ . ඉතින් ඇරත් මම කියන ප්‍රකාශයකට මොකටද කතෝලික පල්ලි වලට ගිහිල්ලා බෝම්බ ගහන්නේ අපිට ගහන්න එපායැ. මගේ පන්සලට බෝම්බයක් ගැහුවා නම් සාධාරණයි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

මේ අනුව සාක්ෂිකරුගේ ඉල්ලීම අනුව අදාල CD තැටිය ලකුණු කිරීම සිදු කරන අතර එය පසු අවස්ථාවකදී කොමිසමේ අවධානය යොමු කරන බව සටහන් කර තබමි.

****

FAIR COMMENT BY JEZEEM

එම වීඩියෝ පටය ඇතුලත් සීඩී තැටිය මෙම සභාවට RGG 44 වශයෙන් සලකුණු කිරීම සඳහා ගෞරවයෙන් අවසර අයැද සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි මෙම විවේකයට පෙර උන්වහන්සේගේ සාක්ෂියේදීත් කියවුනා උන් වහන්සේ ප්‍රකාශයක් කළ බව එතරම් මතකයක් නොමැති බව මේ 2017 වර්ෂයේ මැයි මාසයේදී ඇතිවූ පුරාවස්තු කඩා දැමීමකට අදාල වන කාරණාවක් අරඹයා. ඒ කාරණාව අරඹයා එම කාලවකවානුව තුල උන් වහන්සේ කරන ලදැයි සැලකිය හැකි ප්‍රකාශයක් ඇතුලත් අන්තර්ජාලයෙන් බා ගත කර ගන්නා ලද ප්‍රකාශයක් මේ අවස්ථාවේදී උන්වහන්සේ ඉදිරියේ සහ ගරු සභාවේ අවධානයට ඉදිරිපත් කිරීම සඳහා අවසර අයැද සිටිනවා. මෙය ඉතාම කෙටි ප්‍රකාශයක් සභාපතිතුමනි මිනිත්තු 05 ක ප්‍රකාශයක් . එය නිරීක්ෂණයට මේ අවස්ථාවේදී ප්‍රදර්ශණය කිරීමට අවසර අයැද සිටිනවා.

කොමිෂන් සභාව ඉදිරියේ වීඩියෝ පටයක් ප්‍රදර්ශනය කරයි.

ප්‍ර ඔබ වහන්සේට මේ කරන ලද ප්‍රකාශය සම්බන්ධයෙන් මතකයක් තියෙනවාද හාමුදුරුවනේ .?

උ ඔව් මහනුවර මල්වතු මහා විහාරයේදී මහානායක හාමුදුරුවෝ දැනුවත් කරන්න ගිය අවස්ථාවක මහා නායක හාමුදුරුවෝ බැහැ දැකලා එලියට ඇවිල්ලා කරපු ප්‍රකාශයක් .

ප්‍ර මොන වකවානුවක මේ සිද්ධියක් අලලා උන්වහන්සේව දැනුවත් කරන්න ගියා කියලා ඔබ වහන්සේට මතකයක් තියෙනවාද ?

උ ඔය පොළොන්නරුව ඕනෑගම සිද්ධිය ඇතුළු කොට පුරාවස්තු සම්බන්ධයෙන් දැනුවත් කරන්න ගිය අවස්ථාව. මගේ මතකයේ හැටියට. ඒවාගේම අපි දිගින් දිගටම ගිහිල්ලා පොලිස්පති වරයාට පැමිණිල්ලක් කලා මොකද එක කලාවකට වගේ මොන වචනයක් කථා කරන කොට මොනවා හරි දෙයක් පෙන්වා දෙන කොට මුස්ලිම් මිනිස්සු පුරුද්දකට වගේ පොළඹවන්න ගත්තා. අපි දන්නේ නැහැ කවිද පොළඹවන්නේ කියලා ගිහිල්ලා පැමිණිලි දානවා පැමිණිලි දානවා මෙනවාත් කථා කරන්න බැහැ පැමිණිලි දානවා.ඉතින් අපි කිව්වා මේ නීතිය පුදුම නීතියක් නේ මේ ප්‍රශ්ණ හොයලා බලලා කථා කරන අයට නීතිය ක්‍රියාත්මක කරනවා . ප්‍රශ්ණ හදන මිනිස්සුන්ට නීතිය ක්‍රියාත්මක කරන්නේ නැහැ . ඒකයි අපි ඔතෙනදීත් කිව්වේ කරුණාකරලා මේ නම් සඳහන් කල පුද්ගලයන්ට ඉස්සෙල්ලා නීතිය ඒ ගොල්ලන්ට ක්‍රියාත්මක කරලා එන්න අපිට නීතිය ක්‍රියාත්මක කරන්න කියලා ඒක තමයි අවධාරණය කලේ.

ප්‍ර ඔබ වහන්සේට අවස්ථාවක් ඉදිරිපත් කරන්න හෝ එහෙම නැත්නම් මතයක් හෝ තිබෙනවාද හාමුදුරුවනේ ඔබ වහන්සේ සඳහන් කරන

FAIR COMMENT BY JEZEEM

මුස්ලිම් අන්තවාදය ප්‍රසිද්ධ මාධ්‍ය හරහා ඔබ වහන්සේ දැන් ප්‍රකාශ කරන්නේ ප්‍රසිද්ධ මාධ්‍යවලට ප්‍රසිද්ධ මාධ්‍ය හරහා මහජනතාවට දැනුවත් කිරීමක් කරන අන්තවාදී ප්‍රකාශ ප්‍රසිද්ධ මාධ්‍යවල ගිය බවට ඔබ වහන්සේට දැනුවත් භාවයක් තියෙනවාද ?

උ ඔව්. ගුවන්විදුලි සංස්ථාවේ සෑහෙන කාලයක් තිස්සේ , ඒ වගේම නවමිණ පුවත්පත හරහා දිගින් දිගටම ඒ ගොල්ලන්ගේ ඒ අන්තවාදී අදහස් ජනගත කළා. ඒ විතරක් නෙවේ විවිධ පොත් පත් බෙදා හරිමින් ඒ වගේම ඔය දවා කියන දවා කරනවා කියන ඒ ගොල්ලන්ගේ රහසිගත වැඩ පිළිවෙල යටතේ ඒ අන්තවාදය ප්‍රචාරය කළා.

ප භාමුදුරුවනේ යමෙක් කිව්වොත් ඔවුන්ගේ මතවාදය මුස්ලිම් සමාජය තුල ජනගත කිරීමක් ඔබ වහන්සේගේ මතවාදය පොදුවේ ප්‍රධාන මාධ්‍ය හරහා ජනගත කිරීමක් වෙනවායි කියන කාරණාව. ඒ කාරණාව තුලින් මුස්ලිම් සමාජයේ අයට ඔබ වහන්සේගේ එම ක්‍රියා කලාපය තුලින් හිත් රිදවීමක් සිදුවිමට අවකාශයක් ඇති වෙනවාය කිව්වොත් ඒ සම්බන්ධයෙන් ඔබ වහන්සේට කියන්න තියෙන්නේ කුමක්ද ?

උ මෙහෙමනේ හොරකම හොරකම් කරන්නේ නැහැනේ පේන්න. ජුම්මා දේශනා ඇතුලේ හැම සිකුරාදාම රැස්වෙලා ඒ ගොල්ලෝ මේක අල්ලන්න හදනවා මේ රට . අපි නිවන් දැකීම සඳහා ඒ ගොල්ලෝ අල්ලගන්න දේශණ තියෙනවා අපි නිවන් දකින්න අත හරින්න කියනවා . ඉතින් මේක අන්ත දෙකක් ඇත්ත වශයෙන්ම අපි මේ කෑගහලා මේක දැන් මාධ්‍ය නැතිව කියන්න මොකද තීන්දු ගන්න ආණ්ඩුවක් නොවේනේ අපි. ආණ්ඩු වල ඉන්න මහා මිනිස්සු කරනවා නම් අපි කෑගහන්න ඕනේ නැහැනේ අපි ධර්ම මාර්ගය අපි මහණ වෙච්ච අරමුණින් අපි මහණ වුනේ සබ්බ දුඛක නිස්සරණ නිබ්බාණ සජ්ජ කරණත්ථාය.අපි නිවන් උදෙසා අපි මේ පැවිද්දට ආවේ. දැන් ඒක කරගන්න හම්බ වෙලා නැහැනේ අපට . නමුත් නිවනින් මෙපිට තමන් උපන් ජාතිය වෙනුවෙන් පවතින්න ඕනේ කරුණු බුදුහාමුදුරුවෝ කියලා තියෙනවා . ඒ පලවෙනි කාරණාව තමයි බුදුහාමුදුරුවෝ පෙන්වනවා අපිට මහණෙනි මේ ලෝකේ මිත්‍යාදෘෂ්ඨිය තරම් භයානක පාපයක් නැහැ. මේ මිත්‍යාදෘෂ්ඨියට එරෙහිව, මිත්‍යාදෘෂ්ඨියට එරෙහිවව් කියලා තියෙන්නේ . දිට්ඨියේ සම්ප මද්ධානි කියලා කියන්නේ. මිත්‍යාදෘෂ්ඨිකයා දුටු තැන මේ ගහලා මරන්න කියලා නෙමේ ඔහුව නිරුවත් කරන්න. බුද්ධිමය සංවාදයකින්.එතකොට මේ මිත්‍යාදෘෂ්ඨිය ගැන බුදුහාමුදුරුවෝ හරි අපූරුවට අංගුත්තර නිකායේ ඒක ධම්ම පාලියේ උපමාවකින් පෙන්වලා තියෙනවා . දැන් නවසීලන්තයේ මුස්ලිම් මිනිස්සු ඉන්නේ කොයි රටේද ඒ හැම රටකම ප්‍රශ්ණනේ. ඒ ප්‍රශ්ණ හැදුවේ අපිද බෞද්ධයෝද, නැහැ. අද යුරෝපීය ජාතිකයන්

FAIR COMMENT — BY JEZEEM —

මුහුණදෙන ගැටළුව අපි ලංකාවේ අපිත් මුහුණ දෙනවා ඒ මුස්ලිම් සමාජයේ වැඩ වලින් එතකොට බුදුහාමුදුරුවෝ මේක අපිට ඒක ධම්මපාලියේදි කියනවා. මොකක්ද කියන්නේ මහණෙනි තිත්ත වැටකොළු ඇටයක් ලෝකයේ ඕනෑම කලාපයක හිටෙව්වොත් ඒ කලාපය කොහේද කියලා වැදගත් නැහැ එලයත් තිත්ත වැටකොළුම තමයි වැටකොළු ඇටේ. ඒ වගේ මේ මිත්‍යාදෘෂ්ටියට අදාල බිමක් නැහැ. ඒක කොතන හරි රෝපනය වුනානම් ඒ මිත්‍යාදෘෂ්ඨිය ඔඩු දුවනවා. එතකොට අපි මේ හඬ නැගීමෙන් කරන්නේ මාධ්‍ය වලින් ඒ ලැබෙන අවස්ථාව මොකක්ද ලැබෙන අවස්ථාව ප්‍රයෝජනයට අරන් අපි කරන්නේ මේ මහා මිත්‍යාදෘෂ්ඨිය දළුලා වැඩෙනවා හොර රහසේ අඳුරු සෙවනැලි වගේ. අපි මිනිස්සු අවදියෙන් තියනවා . ඒ විතරක් නෙවෙයි මම අභියෝගයක් ඔය අපට ප්‍රශ්ණ කරන නැත්නම් ප්‍රශ්ණ නඟන අයගෙන් අපි අහන්නේ දැන් උදාහරණයක් විදියට ගත්තොත් දැන් බුදුහාමුදුරුවෝ මිනි මස් කෑවයි කියලා කිව්වා . කොයි කාලේද ඒක කිව්වේ . අපි ගිහිල්ලා මිනී මස් කෑවායි කියලා ත්‍රිවිධ රත්නය මැණික් ගල් තුනක් කියපු එකාගේ බෙල්ල ඉල්ලුවේ නැනේ. අපි ගිහිල්ලා ඔහුගේ කාර්යාලයට ගලක් ගැහුවේ නැහැනේ . ඒක තමයි බෞද්ධ ශික්ෂණය . හැබැයි මේ ඉස්ලාම් ගැන මේ මිත්‍යාදෘෂ්ඨිය ගැන නොදන්නා අහිංසක සමාජය නොදැනීම ඒකට බිලි වෙනවා නම් ඒක මොන තරම් පාපයක්ද? ඒ අපරාධයෙන් පාපයෙන් මුදවා ගැනීම සඳහා තමයි අපේ කැපවීම. අපේ භාවිතාව ,ඒක අතීතෙත් කරලා තියෙනවා දැන් ඉතින් දැන් අද වර්තමානයේ හැටියට ගත්තොත් ධර්මපාල තුමාට ගල් ගහන්න කියයි. ඒනිසා ඒ අපි ඒ අතීත විරුවන්ගේ මහ යමින් ඒ අතීත පාඩම් ඉගෙන ගෙන අපි වෑයම් කරනවා මැරෙන්න කලින් අපිටත් යුතුකමක් තියෙනවා .අපි උපන්බිම වෙනුවෙන් අපේ රාජකාරිය කරන්න කියලා ඒ මෛත්‍රී චිත්තයෙන් විතරයි මේක කරන්නේ . එතකොට දැන් අපි ගත්තොත් අපේ ත්‍රිපිටකය 84000 ක් ධර්මස්කන්ධය තුළ අවම තරමින් එක එක හිංසාව සම්බන්ධයෙන් එක වදනක් නැහැ බුදුහාමුදුරුවෝ සමහර අවස්ථාවල කථා කරලා තියෙන තදම වචනය තමයි ඒ මෝඩ පුරුෂ , එම්බා මෝඩ පුරුෂ, ඉතින් මිත්‍යාදෘෂ්ඨිය සම්බන්ධයෙන් එහෙම කථා කරලා තියෙනවා .අපිත් ඒකම තමයි මේ කරන්නේ. හැබැයි නිර්විත්දනය වෙච්ච, හැඟීමක් නැති , දැන් ප්‍රභාකරන්ම කිව්වානේ සති දෙකෙන් උඹලට අමතකයි කියලා සිංහළයන්ට එතකොට හරි ඉක්මනට අමතක කරන ජාතියකට සද්දෙට කථා නොකර බැහැ. ඒනිසා තමයි අපි සද්දෙට ඒ අදාල අවස්ථා ලැබුනහම මේ දැනුවත් කිරීම කරන්නේ එහෙම නැතුව වෙන කාගේවත් හිත් රිදවන්න එහෙම අදහසක් අපේ නැහැ. එහෙම

FAIR COMMENT BY JEZEEM

ජාතියක් කියලා කරන වැඩක් නෙමෙයි අපි පොදුවේ ඉස්ලාම් කියන්නේ මුස්ලිම්නේ ඉතින් මුස්ලිම් සමාජය දෙසට තමයි ඇඟිල්ල දික් කරන්නේ .මුස්ලිම් සමාජය දැන ගන්න ඕනේ තමන්ගේ සමාජය තුලින් ඉස්මතු වෙනවා නම් සර්ප පැටව් ඒක තලා දාලා ඒක ශුද්ධ කර ගන්න දැන් අපේ Extremism එකක් නැහැනේ. දැන් අපේ මැතිතුමනි දැන් අපේ අමරපුර නිකාය ගත්තොත් අපේ නිකාය තියෙනවා 22 ක් . ඒ එකම නිකායකවත් නැහැනේ අන්තවාදයක් .අපේ උපරිම අන්තවාදය කියලා කියන්නේ කළකිරීම,මොකක්හරි වුනොත් පන්සල දාලා ගිහිල්ලා වන ගත වෙයි ගල්ගුහාවකට යයි. එතනින් එහාට අපේ අන්තවාද නැහැ අපි මේ කථා කරන්නේ අවිහිංසාවාදී ධර්මයක් අවුරුදු දෙදාස් ගණනක් තිස්සේ ආරක්ෂා කරගෙන ආපු ඒ ජාතිය හිංසාකාරී ඉගැන්වීම මතින් සන්නද්ධ වෙන පව්කාර උන්මත්තකයින් ගෙන් බේරා ගැනීම සඳහා විතරයි අපේ මේ කෑගැසීම.

ප්‍ර අපේ හාමුදුරුවනේ දැන් ඔබ වහන්සේ සඳහන් කරන්නට යෙදුනා විනයකින් යුක්තව ශික්ෂාවකින් යුක්තව මෙය මහජනතාව අතරට කීම තමයි ඔබ වහන්සේගේ අභිප්‍රාය කියන කාරණාව. පිළිතුරේ ඒ වචන ගැබ් වෙලා තිබුනා.හාමුදුරුවනේ ඔබ වහන්සේගේ ඔය කාරණාවට බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ මතයක් ඉදිරිපත් වෙනවා නම් භික්ෂුවකට භික්ෂුවකගේ විනය නීති එහෙම නැත්නම් ඕවාද හා ඔබ වහන්සේ දන්නවා ආනා දේශනාවල ඒ සඳහන් වෙන අනුන්ට ගැරහීමෙන් කිපිලා තරහෙන් අතපය උස්සා කථා බහ කිරීම දුබ්බත ජාතක දුර්වචන කථා කිරීම භික්ෂූන් වහන්සේකට තරම් නොවේය එවැන්නක් කිරීමෙන් භික්ෂු ශාසනයට තරම් නොවන ක්‍රියාවල නියැලෙනවාය එයින් බුද්ධ ධර්මයකට පවා අගෞරවයන් සිදුවිය හැකියි කියන කාරණාව යමෙක් කියනවා නම් ඔබ වහන්සේට ඒ සම්බන්ධයෙන් කියන්න තියෙන කාරණාව කුමක්ද ?

උ කෙනෙකුට ඉතින් ඕනේ දෙයක් කියන්න පුළුවන් අපිනේ දන්නේ අපේ දර්ශණය. අපි මේ වැඩ කරන්නේ දර්ශණයක් ඇතිව. ඒ දර්ශණය තුල පිහිටි මනුෂ්‍යයා තමයි තමන්ගේ චින්තාව දන්නේ. ඒ නිසා මගේ සිතිවිල්ල මෛත්‍රී චින්තාවක් . කිසිවෙකුට හානියක් නොවී කිසිවෙක් ලේ හලා ගන්නේ නැතුව අර අපේ ජාතික ගීයේ තියෙනවා වගේ එක මවකගේ දරු කැල බැවිනා විදියට මේ ඔක්කොම හිතනවා නම් මේ ප්‍රශ්ණ මුකුත් නැනේ. ඉතින් ඔය ආනා දේශණා හෝ විනය සම්බන්ධයෙන් කථා කරද්දි හොඳ හාමුදුරු නමක් ඉන්නවා මහ රහතන් වහන්සේ කෙනෙක් පිළින්දවච්ච කියලා ඒ පිළින්දවච්ච හාමුදුරුවෝ මහ රහතන් වහන්සේ කෙනෙක් හැබැයි කථා කරනකොට ටිකක් සැරයි . ඉතින් මාත් ඒ පරම්පරාවේ වෙන්න ඇති. සංසාරෙන් අපිට තියෙනවානේ එක එක්කෙනා සමහරු ලස්සනට දැන් ඔය

FAIR COMMENT — BY JEZEEM

සංගීතේ බලන්නකෝ මැතිණිය. අමරදේව ගේ සින්දු එක විදියක් තව හිපොප් කියලා තියෙනවා හයියෙන් කියන ඒවා තියනවා එක එක තාලෙට එක එක තාල වෙනස් .

ප්‍ර දැන් හාමුදුරුවනේ ඔබ වහන්සේ සඳහන් කරන්නට යෙදුනා සම්පූර්ණ දේකට අවධානය යොමු කරන් නැතිව එක් කාරණාවක් කෙරෙහි ඒ කියන්නේ වචනයක් දෙකක් කෙරෙහි පමණක් අවධානය යොමු කරමින් උලුප්පා දක්වමින් එය සම්බන්ධයෙන් කථා බහ කිරීමට අදාලව ඔබ වහන්සේ පිළිතුරු ලබා දුන්නා මේ මොහොත දක්වා . ඔබ වහන්සේට යමෙක් යෝජනා කළොත් බුද්ධ ධර්මයට අනුව ධාර්මිකව ඔබ වහන්සේ සඳහන් කරලා තියෙන මිත්‍යාදෘෂ්ඨිකයෝ කියන වචනය සම්බන්ධයෙන් ධර්මානුකූලව ධර්ම දේශණා බෞද්ධයන්ගේ අවධානයට යොමු කිරීම තමයි තරම් වන්නේ භික්ෂුවක් වශයෙන් ඔබ වහන්සේට කියලා කිව්වොත් ඒ සම්බන්ධයෙන් එවැනි ක්‍රියා මාර්ගයක තමයි නියැලෙන්න ඕනේ කියලා අදහසක් දැක්වුවොත් ඔබ වහන්සේට මොකක්ද කියන්න තියෙන්නේ ඔබ වහන්සේ මේ අරන් තියෙන ක්‍රියා මාර්ගය සම්බන්ධයෙන්.?

උ මම භික්ෂුවක් . උපසම්පදා ලබපු භික්ෂුවක්. එතකොට මගේ නායකයා බුදු හාමුදුරුවොනේ ,මගේ චින්තකයත් බුදුහාමුදුරුවෝ , මගේ දාර්ශනිකයත් බුදුහාමුදුරුවෝ , මගේ ගුරුවරයාත් , කල්‍යාණ මිත්‍රයාත් බුදුහාමුදුරුවෝ ,බුදුහාමුදුරුවන් ගේ චර්යාව තමයි යථාවාදී තථාකාරී යමක් කියනවාද ඒකම කරනවා . කියන දේ කියනවා කරන දේ කියනවා. මුසා කියන්නේ නැහැ. බොරු කියන්නේ නැහැ මං භික්ෂුවක් හැටියට අවම තරමින් මෙම කොරෝනා වසංගතය ඇතිවන අවස්ථාව දක්වා අවම තරමින් මාසෙකට බණ 15 ක් වත් කියනවා. ඒ බණක් අහන්න ඔය සමහර වෙලාවට දෙතුන්දාහක් සෙනඟ එනවා . ඒ බණේදි අතපය දිග් කරලා කෑ ගහන්නේ නැහැ.හැබැයි අළුත්ගම ගිහිල්ලා කථා පවත්වන්න බැහැනේ වටාත්තක් අරන් එහෙනම් මට ගල් ගහනවා .අපි තේරුම් ගන්න එපායැ සිද්ධිය. සිද්ධිමය අවස්ථා .ඒ සිද්ධියේ හැටියට ඒ තැනට උචිත පරිදි තමයි අපේ හැසිරීම. චෛත්‍යයක් දෙබෑ කරලා තියෙන තැනක පුරාවස්තු නටඹුන් තියෙන තැනකට ගිහිල්ලා අනේ අනිච්චයි සියල්ල දුකයි කියලා ඒ අනිත්‍ය සංඥාව වඩන්න බැහැ එතන. මේ නිදිගත් පාලකයන්ගේ දෑස් ඇරවීම සඳහා අවශ්‍ය ස්වරයෙන් අමතන්න වෙනවා. ඒක තමයි මේ කරන්නේ බණ කියන වෙලාවට බණ කියනවා . මං ඔබ තුමියට මැතිණියනි මම අවධාරණය කරනවා වෙලාවක මගේ බණ ටිකක් අහන්න. හේතුව ලංකාවේ මැතිතුමනි ,අදටත් මේ සියළු නාලිකා වල වැඩිපුරම ප්‍රචාරය වෙන්නේ මගේ බුදුගුණ මං කියන බුදුගුණ වැඩිපුරම . මට ආඩම්බරයක්

FAIR COMMENT BY JEZEEM

තියෙනවා මං ගැන ඔය ඉන්න ඔක්කෝටම වඩා හොඳට මට බුදු ගුණ කියන්න පුළුවන් . මගේ එක පිරිතක් තියෙනවා අහලා තියෙනවා මිලියන 15 ක් ලක්ෂ එකසිය පනහක් . ඔය පිළිකා රෝහලේ අහන්නෙත් මගේ බුද්ධානෝස්ස වැඩ සටහන. හැබැයි මං ඒ මගේ හැකියාවන් පැත්තකින් තියලා ජාතික අනතුරක් දැකලා මං ඒ ජාතික අනතුරෙන් මේ රට මුදවා ගැනීම සඳහා නින්දා අපවාද ගොඩක් විඳගෙන ඉතාම සැපපහසු මාර්ගයක් තියෙද්දි කටු කොහොළින් පිරුනු තැනක් හොයා ගත්තා මේ ජාතික අවදානම දැකලා . ජාතියට තියෙන අවදානම දැකලා. බණ කියනවා ඕනේ තරම්. බණෙන් තමයි ජීවත් වෙන්නේ.

මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමනි , ස්වාමීන් වහන්සේ විසින් පුරාවස්තු වලට අලාභහානි කිරීම කියන කාරණාව ප්‍රස්තූත කර ගනිමින් උන් වහන්සේ මල්වතු විහාරය අභියසදී කරන ලදැයි සැලකෙන අන්තර්ජාලයෙන් බා ගත කරන ලද වීඩියෝ පටයක් ඇතුලත් CD තැටිය C 700 වශයෙන් සලකුණු කිරීම සඳහා අවසර අයැද සිටිනවා.

මට සමාවෙන්න මැතිතුමනි, අපේ මැතිතුමනි , පුළුවන් කමක් තියෙනවා නම් පුරාවස්තු කියන වචනය ඇදිලා ආපු නිසා , දැන් හිතනවනේ මුස්ලිම් මිනිස්සු හිත් පාරන් නෑ .එවකට පුරා විද්‍යාව බාරව හිටපු ඇමතිවරයා මෙහෙම ඉදිරිපිට තියාගෙන මං පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ගිහිල්ලා කරපු කථාවකුත් තියෙනවා. ඒකත් මෙතෙන්ට එකතු කරන්න කියලා පුළුවන් නම් අරගෙන දෙන්න. You tube . ටියුබ් එකෙන් .ඒක තියෙනවා පුරාවිද්‍යාවට ගියපු එක. පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වරයා ඒ අදාල ඇමතිවරයා ඔක්කොම ඉදිරිපිටත් ඔය තද බසින්ම තමයි අමතන්නේ.

ප්‍ර අපේ හාමුදුරුවනේ මා මෙතුවක් ඉදිරිපත් කිරීමට උත්සාහ කලේ මහජනතාව අරඹයා මාධ්‍ය හරහා ඔබ වහන්සේගේ මාධ්‍ය භාවිතය සහ වාග් භාවිතය කියන කාරණාව ප්‍රස්තූත කරගෙන ?

උ මට පෙන්වන්නත් ඕන මහජනතාව අරඹයා ඒ මාධ්‍යයට කියන කථා වගේම ඒ උද්වේගයෙන්ම අදාල බලධරයන්ටත් මේක කියලා තියෙනවා නැත්නම් මේක අදහස් කරන්න මට තේරෙනවානේ කථාව කොහේටද මේ ගලපන්න හදන්නේ කියලා. මේ කියන්න උත්සාහ කරනවා වගකිව යුත්තන්ට නොකියා ඇයි මේ මාධ්‍යයට කියන්නේ ඇයි මේ මහජනතාවට කියන්නේ කටෝර කියන කොට අනේ මේ මිනිසුන්ගේ හිත් රිදිලා මේ ගොල්ලෝ සන්නද්ධ වෙන්න ඇති ඒ වගේ දෙයක් නේ මේකෙන් මේ අදහස් වෙන්නේ ඒක නිසා මාධ්‍යයට කියනවා වගේම ඊටත් වඩා තදට සැරට අමු අමුවටම අර

FAIR COMMENT BY JEZEEM

පාලකයන්ටත් කියලා තියෙනවා ඒ ගොල්ලන් ගේ ඉදිරිපිටම ඒ ගොල්ලන්ගේ ස්ථානයටම ගිහිල්ලා ඒකත් දැම්මොත් වඩා ලේසි වෙනවා මේක ගලපගන්න .

ප්‍ර හාමුදුරුවනේ ඒ වීඩියෝ පටය ඔබ වහන්සේට මේ සභාගත කරන්න හැකියාවක් තියෙනවාද මතු අවස්ථාවක.

උ මිනිත්තුවක් දුන්නොත් පුළුවන්. You tube එකෙන් දැනුත් ගන්න පුළුවන්. මැතිණියනි.

ප්‍ර අපි ඔබ වහන්සේ ඉදිරිපත් කරන තුරු මගේ ප්‍රශ්ණවලට අපි ඉදිරියට යමු හාමුදුරුවනේ .

ප්‍ර. දැන් ඔබ වහන්සේ දීර්ඝ වශයෙන් ලබා දෙන පිළිතුරු වල සඳහන් වුනා අන්තවාදී මුස්ලිම් ක්‍රියාකරකම් නැත්නම් ඉස්ලාම් ධර්මයේ අන්තවාදීන්ගේ ක්‍රියාකාරකම් එහෙම තමයි ඔබ වහන්සේ මිත්‍යාදෘෂ්ඨිකයන් වශයෙන් ඔවුන්ව හඳුන්වමින් බුදුදහමට අනුකූලවත් ඒ සම්බන්ධයෙන් ඔවුන්ව අරඹයා තමයි මේ කරුණු යම් අවස්ථාවල ආවේගශීලිත්වය භාවිතා කරමින් වුවත් කියන්නට හේතු කාරණා වෙන්නේ කියලා. හාමුදුරුවනේ අපි මේ වන විට මේ ගරු සභාව ඉදිරියේ පරීක්ෂාවට ප්‍රදර්ශණයට ලක් කරලා තියෙන කථාවන් ඇසුරෙන් අළුත්ගමදී සිදු කරන ලද කථාවෙහි පූර්ණ කථාවත් ඔබ වහන්සේ ඉදිරිපත් කලා මේ ගරු සභාවට . එහි මේ ඉස්ලාම් අන්තවාදීන් හැරුණු කොට රටේ පාලන තන්ත්‍රය එහෙම නැත්නම් රටක පවතින යම්කිසි ක්‍රමවේදය දැඩි විවේචනයට ලක් කරමින් එහි එළඹෙන්නට නීති රාමුවට ඇතුලත් වෙන්න එපා තනි තනියෙන් පොලිසිය තමන් , තමන්ම මේ කටයුතු කරගන්න පාලකයන් ගෙන් නිසි ක්‍රියාවලියක් ඉටු වෙන්නේ නැහැ කියන තැනට මහජනතාව සිතීමට පෙළඹෙන ආකාරයට කථා කෙරෙනවා කියන කාරණාව. එය ඉස්ලාම් ධර්මයේ අන්තවාදයට ඔබ්බට ගිය කාරණාවක් නේ ඒ සම්බන්ධයෙන් මහජනතාව පෙළගැස්වීමට කරුණු කියනවාය කියන කාරණාව යමකු කියනවා නම් එවැන්නකට ඔබ වහන්සේ ගේ ප්‍රතිචාරය මොකක්ද ?

උ මැතිණියනි අපි ළමයෙක් හයියෙන් අඬන්නේ ඇයි ? ළමයෙක් හයියෙන් විලාප තියලා අඬනවා ඇයි ඒ ? සමහර විට අවධානය යොමු කර ගන්න . අපි නොයෙක් දේවල් කියනවා අපි ප්‍රසිද්ධියේ පොලිසිය ඉන්දැද්දි බය නැතුව කියනවා මේ රටේ මිනිස්සු නිල නොවන පොලිස් කාරයෝ වෙන්න ඕනේ . ඒක මම හෙටත් කියනවා . මේ සභාවෙත් කියනවා හේතුව මොකක්ද හැමෝම මේ සිද්ධියේදි අවධානයෙන් ඉන්න ඕනේ කියන එකයි අපේ අදහස . වෙන අය එක එක විදියට අර්ථකථනය කරගත්තට අපිට කරන්න දෙයක් නැහැ . අපේ අදහස ඒක ,මොකද දැන් මේ පොලිසියක් පොලිසි තියනවා මේ රටේ මහජන බදු

FAIR COMMENT BY JEZEEM

මුදලින් ඒ ගොල්ලන් පඩි ලබා ගන්නේ ආරක්ෂක අංශ තියෙනවා .ඉතින් මේ තියෙද්දිනේ මේ ඔක්කොම සිද්ධ වෙන්නේ . එහෙම වෙන්නේ කොහොමද අපි කෑගහලා කිව්වා පාලකයන්ට පරිපාලකයන්ට කරුණාකරලා ආපසු හැරිලා බලන්න මොකක්ද මේ වෙන්නේ. අවසානයේදි අපට අපේ දේ නැති වෙන්නේ. දැන් ඒකට උදාහරණයක් මට කියන්න පුළුවන් මේ බලන්න රසවත් කථාවක් මට ඔය ඉස්ලාම් අන්තවාදය ඇතුලේ මුස්ලිම් සමස්ත මුස්ලිම් අයට කියන්න තියෙන්නේ එක වෙලාවක් අම්බට්ටා කියලා බ්‍රාහ්මණයෙක් එනවා එන්නේ කොහේටද කපිලවස්තුවේ සන්තාගාරයට , කපිලවස්තුවේ මිනිස්සු රැස්වෙන ස්ථානයට එනවා අම්බට්ටා කියලා බ්‍රාහ්මණයෙක් ඉතින් මේ සන්තාගාරයට අම්බට්ටා ඇතුල් වුනාම එතන හිටපු ශාක්‍යයෝ කපිල වස්තුවේ ඉන්නේ ශාඛ්‍ය වංශිකයෝ ශාක්‍ය වංශිකයෝ මොකද කරන්නේ අම්බට්ටා දැකලා අම්බට්ටාට උසුළු විසුළු කරනවා . ආ ඒ ගොල්ලෝ උස් ආසන වල ඉන්නේ. අන්තිමේදි අම්බට්ටා බමුණට කියනවා ඔයා මෙතනින් ඇවිල්ල වාඩි වෙන්න. එයාට සුදුසු තැන පෙන්වනවා .ඊට පස්සේ අම්බට්ටා කියනවා බොහෝම උරණවෙලා ආපෝ මේ ශාක්‍යයන්ට නින්දා කරන අදහසින් කියනවා මේ ශාක්‍යයෝ හරිම චණ්ඩයි . ශාක්‍ය ජාතිය හරිම චණ්ඩයි. මේ හරිම පරුෂයි ශාක්‍ය ජාතිය හැල්ලුයි . ශාක්‍ය ජාතිය දොඩමළුයි. බමුණන්ට සත්කාර කරන්නේ නැහැ. දැන් අම්බට්ටා බමුණා හිතාගෙන ඉන්නවා එයා බමුණෙක් වීම නිසා ශාක්‍යයෝ හිස් මුදුණෙන් පිළි අරගෙන එහෙම කරන්න ඕනේ කියලා නෑ එහෙම එකක් නැහැ . එහෙම නොකර නිසා අම්බට්ටා බමුණා කියනවා මේ ශාක්‍ය ජාතිය පරුෂයි, චණ්ඩයි කියලා. දැන් දිගින් දිගටම මේ බමුණන්ට සත්කාර කරන්නේ නැහැ ඒක හොඳ මදියි කියලා . මේක බුදුහාමුදුරුවෝ ලඟටත් මේ සිද්ධිය ගියාම මොකද බුදුහාමුදුරුවෝ දෙන උත්තරය ලටුකිකාපිකෝ අම්බට්ට සකුනිකා සකේකුලාවකේ කාමලාපිහියෝ සකන්කෝ පන්තන් අම්බට්ටන් සක්‍යානන් කියලා අර උපමාවක් කියනවා . කියනවා අම්බට්ටය කැටකිරිල්ලට පවා ඇගේ කැදැල්ලේදි ඇගේ කැමති පරිදි හඬලන්නට නිදහස තියෙනවා . කැටකිරිල්ලකට වුනත් ඇගේ කූඩුවේදී එයාට ඕනේ හැටියට හඬලන්න පුළුවන්. ඉතින් කිඹුල්වත්පුරය නමින් හඳුන්වන යමක් තියෙනවා නම් එය ශාක්‍යයන්ගේ නගරය . එහි ගිය උඹ සුළු කරුණින් ශාක්‍යයන් කෙරෙහි වෛර බැඳීම කිසිසේත් කරන්න එපා කියලා බුදුහාමුදුරුවෝ අම්බට්ටට කියනවා . ඒවගේ මේ සිංහළයන්ගේ රටේ අපි හඬ නගන්නේ නැතිව අපි වෙන කොහේ ගිහිල්ලා හඬ නගන්නද ? අපිට ඕනේ හැටියට මේකේ හඬ නගන්න පුළුවන්. මේක අපේනේ. අනිත් අය ඒක තේරුම් ගන්න ඕනේ. ඒ කියන්නේ අපි සරලව කිව්වොත්

FAIR COMMENT
BY JEZEEM

වවුලාගේ ගෙදර ගියා නම් ඉන්න ඕනේ ඒ විදියට. ඉතින් ඉක්මවා ගියොත් වැඩේ අවුල් තමයි.

ප්‍ර අපේ හාමුදුරුවනේ මගේ ධර්ම දැනුම ඔබ වහන්සේ තරම් නැහැ මා ගිහියෙක්. කෙසේ වෙතත් ඔබ වහන්සේ අවධානය යොමු කලා දීඝ නිකායේ මුහ්මජ්ජාල සූත්‍රයට මං හිතනවා ඔබ වහන්සේ දන්නවා මා නොදන්නවා මේ කාරණාව එහිදී බුදුරජානන් වහන්සේ විශේෂයෙන්ම සඳහන් කරායැයි මා විශ්වාස කරනවා ධර්මයට සංඝයාට යමකු දොස් කියනවා නම් ඒ තැන්හිදී තොප විසින් කෝප උපදවිය නොවිය යුතුයි. නොසතුට නොමැපදවිය යුතුයි. හිත අමනාප නොකොට ගත යුතුයි මහණෙනි මට දොස් කියතොත් ධර්මයට හෝ වෙකෙකුට දොස් කියතහොත් සංඝයාට දොස් කියතහොත් ඒ දොස් කීමෙන් තොප කිපෙන්නේ නම් නොසතුටු වන්නේ නම් එයින් තොපටම අන්තරාය වන්නේය කියා.

දැන් මේ බුදුබණ ඔබ වහන්සේ මේ මොහොතේ සඳහන් කර ලටුකිකෝප සූත්‍රයේ ඔය උලුප්පා දක්වන ලද කාරණාවට වඩා ප්‍රබල ලෙසට බ්‍රහ්මජාල සූත්‍රයේ අපේ ආගමේ තියන අවිහිංසාවාදී භාවය පෙන්වා දෙන ක්‍රමවේදයක් නේ එහෙම අවස්ථාවක් තියෙද්දී ඔබ වහන්සේ මේ සඳහන් කරනවා නම් වවුලාගේ ගෙදර ගියාම ඒ විදියට ඉන්න ඕනේ කියන ආකාරයට ආවේගශීලිව යමක් කිව්වාම අපේ ආගමත් අන්තවාදී පැත්තට යනවාය කියලා යමෙකුට කියන්න පුළුවන් නේද අපේ හාමුදුරුවනේ?

උ මම කිව්වේ උපමාවක් අර කැට කිරිල්ලගේ කථාවට උපමාවක් ඒ කිව්වේ මොකද ධර්මය හුඟක් තේරෙන්නේ නැහැනේ ඒක සරලව තේරුම් කරන්න ඕන හින්දයි වචනය පාවිච්චි කලේ බ්‍රහ්මජාල සූත්‍රයේ ඔය ගැන කියවෙනවා ඊලඟට දීඝ නිකායේ තව සූත්‍රවල අපිට යන්න පුළුවන්. වාසාදික සූත්‍රයේ කොහොමද මිත්‍යාදෘෂ්ඨිය ගැන කථා කරලා තියෙන්නේ මජ්ජිම නිකායේ තියෙන අනෙක් සූත්‍ර වාසෙට්ට වගේ අනිත් සූත්‍ර වල කොහොමද ආමන්ත්‍රණය කරලා තියෙන්නේ. මෙතන වඩ වඩාත් මම නැවත නැවතත් සිහිපත් කරන්නේ මේ වදන් සැඩ වෙන්න පුළුවන් පරුෂ නැහැ සැඩ වදන් .ඇයි ඒ සැඩ දැන් මට කියන්නකෝ ගඟක පීනන්න පුළුවන්ද උඩුගංබලා පීනන්න පුළුවන්ද වරල හයියෙන් ගහන්නැතුව .මේ කරන්නේ උඩුගංබලා යනවා වගේ වැඩක් . මේ රටේ නායකයොයි. ආගමික නායකයොයි, ඔය එකී මෙකී නොකි සියළුම අය ගඟගෙන යනවා ගඟේ පල්ලහාට අපිට පේනවා යන්නේ පල්ලහාට. අපි වෑයම් කරනවා මේ ගඟේ උඩට පීනන්න මේ සත්‍ය දැකලා සත්‍ය අවබෝධ කර ගන්න . ඉතින් ගඟේ උඩට පීනනකොට හරි වෙහෙසයි ජබ්බං ශබ්දය වැඩියි . ඒක අශෝභනයි තමයි බලන් ඉන්න කෙනකුට ,මොකද අර හාමුදුරුවන්ට පිස්සුද අර ගඟේ උඩට පීනන්න හදන්නේ කියලා ඉතින් මේ වදන් සැඩ වුනාට අපේ ධර්මයේම කියනවා නේ චේතනාවයි වැදගත් කියලා. චේතනාහම් භික්කවේ කම්මං

LEARN COMMENT BY JEZEEM

වදාමි .චේතනාවයි වැදගත් මගේ චේතනාවක් නැහැනේ අවි අරගෙන මුන්ට ගහන්න ඕනේ, මරන්න ඕනේ, කපන්න ඕනේ කොටන්න ඕනේ ගිනි තියන්න ඕනේ , එලවන්න . එහෙම අදහසක් නැහැනේ .අපි කියන්නේ කරුණාකරලා මේ රට මොකක්ද මේ සංස්කෘතිය මොකක්ද , මේ රටේ බහුතර ජනතාව කවුද , පුරාවස්තු ටික මොනවාද , ඒවා වනසන්න එපා අපට ආතතියක් ගෙන නොදෙන පරිදි මේකේ ජීවත් වෙයල්ලා කියන එකනේ මේ කියන්නේ එතකොට ඔය යම් යම් තැන්වල අපි ගිහිල්ලා කථා කරනවා ඒ ඇති වෙච්ච සිද්ධි ඕවායෙන් අදහස් වෙන්නේ ඒ තරමට මේ රටේ සිද්ධි , සිද්ධි, සිද්ධි හැම තැනම සිද්ධි. ඒවා ගැන පාලකයෝ නොබලන කොට අනික් උදවිය ඒකට අදාල තීන්දු තීරණ නොගන්න කොට ජාතිය කෙරෙහි වාත්සල්‍යයෙන් කථා කරන කොට කවුරුහරි ඉන්නවා නම් අපිට ඇවිල්ලා කියනවා මේ යුගයේමං විශ්වාස කරනවා මිනිස්සු අතර ඔක්කෝම අපේ මතය පිලිගන්න එකක් නැහැ හැබැයි සාතිශය බහුතරයක් සිංහල මිනිස්සු අපිට ආදරෙයි අනේ මේ ජාතිය වෙනුවෙන් මේ හාමුදුරුවෝ කථා කරනවා නේද කියලා ඒ නිසා කොහේ හරි සිද්ධියක් වුනාම අපිට ගෙනල්ලා බාර දෙනවා මේක . ඉතින් අපි යනවා බලන්න එවැනි තැන් වලට ගියාට පස්සේ අපි ඔව් අපි සැඩ විදියට කථා කරනවා ඒක පිළිගන්නවා . හැබැයි ඒකෙන් අදහස් වෙන්නේ නැහැ කිසිම හේතුවකින් අපිට එහෙම චෝදනාවක් කරලාත් නැහැ. කොහේවත් . පැමිණිල්ලක් දාලාත් නැහැ කවදාකවත් තුන් හිතකින් එහෙම කරන්නෙත් නැහැ. ඒක අපේ ක්‍රමය නොවන නිසා හැබැයි අපි වදන් වලින් අදාල තැනට අවශ්‍ය කරන මඟ පාදනවා. ඒවාගේම මුස්ලිම් සමාජයටත් ඒ මැසේජ් එක අපි යවනවා මොකද ඒ සමාජය දැන් මේක පුදුම ප්‍රශ්නයක්නේ. මුස්ලිම් සමාජය ඇතුලේ තාත්තයි පුතයි එක ගේ ගහගන්නවා ඇතුලේ ගහගන්නවා තමන්ගේ එකම දෙයියාට. ඊලඟට සංවිධාන හදාගෙන උන් උන් ගහගන්නවා. ඊලඟට උන් උන් ගහගෙන දැන් අපිටත් ගහනවා .මොකක්ද ,මේකේ තේරුම ඒ නිසා මෙන්න මේ යථාර්ථය අනාගතේ අපේ ඔළු ගෙඩි මත හෙන පුපුරන්න නියමිතයි .අපිට තියෙනවා දුරදක්නා නුවණක් ඒ නුවණට අනුව ඒ ඒ අවස්ථාවෝචිතව අපි අපේ කරුණු දැක්වීම කරනවා . ඒක කරන්නේ හරිම කරුණාවෙන්. දැන් ගෙදර දරුවෙකුට ඉස්සර වෙලා ආදරෙන් කියනවා .බොහොම කරුණාවෙන් කියනවා. ඊලඟට ටිකක් සැරෙන් කියනවා. ඒත් උගේ බෙල්ල කපන්නේ නැහැනේ. අපිත් බොහොම කරුණාවෙන් කියනවා අදාළ තැන්වලට දැනුම් දෙනවා ජාතික වශයෙන් ගත්තහම. එතනිනුත් විසඳුමක් නැත්නම් අපි ටිකක් මේක සැරට සද්දයට කියනවා අවධානය යොමු කරගෙන අදාල ප්‍රශ්නවලට උත්තරයක් ලබා ගන්න එච්චරයි .එතනින් එහාට කිසිම චේතනාවක් නැහැ නරකකට නපුරකට සමාජය යොමු කරන්න . එහෙම කරන්න බැහැ අපි අතීතේ දැකලා තියෙනවානේ අපි උපදිනකොටත් 70, 71 මේ රට ලේ විලක්

FAIR COMMENT
BY JEZEEM

. 88, 89 අපි දැක්කා අවුරුදු 30 ක් යුද්ධෙන් බැට කාපු හැටි අපි දැක්කා. ඉතින් තවදුරටත් මේ රටේ එහෙම ලේ හලන තත්වයට පත්වෙන්න අපි අපේ ජීවිත කාලය තුල අපි කැමති නැහැ. මේ බුද්ධ භූමියේ තවත් ලේ හලන්න ඕනේ නැහැ. අපි කියන්නේ මේ අන්තවාද නැතුව සාමාන්‍ය විදියට ඒ තම තමන්ගේ ආගම් අදහාගෙන අපට හිසරදයක් නොවී ඉන්න. අපේ දේවල් කොල්ලකන්නේ නැතුව මොකද අපි කවදාකවත් අන්‍ය ජාතිකයන්ගේ අන්‍ය ආගමිකයන්ගේ දේවල් උදුරාගෙන නැහැ. ඒ මතය තමයි මේ හැම අවස්ථාවකම ජනගත කිරීමට මහන්සි ගන්නේ.

ප්‍ර හාමුදුරුවනේ දැන් ඔබ වහන්සේ ගේ මේ මොහොතකට පෙර ලබා දුන් දීර්ඝ පිළිතුරේ තැනක කියවුනා ඔබ වහන්සේට චෝදනාවක් ඇතිවි නොමැති බව ඔබ වහන්සේගේ මේ ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන්. නමුත් මේ ඔබ වහන්සේ කරන ඇතැම් ප්‍රකාශණයන් සම්බන්ධයෙන් විමර්ෂණයන් ආරම්භ වෙලා තියෙනවා නේද හාමුදුරුවනේ පොලිසියෙන් ?

උ නෑ නෑ ප්‍රකාශයන් ගැන නෙමේ මං කිව්වේ . සාමාන්‍යයෙන් ගැටුම් හදන්න ඒ කියන්නේ සංවිධානාත්මක කල්ලි හදන්න හරි පහර දෙන්න හරි එවැනි දේවල් සම්බන්ධයෙන් කියන දේවල් ගැන නම් ඕන තරම් විමර්ෂණ තියෙනවා . පැමිණිලි දානවා .ඒක සාමාන්‍ය දෙයක්නේ.

මින් පසු සටහන් ගැනීම ල/ලේ ඉන්ද්‍රාණි

President Secretariat (Pvt) Ltd.

FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් කළේ යමුනා මිය
දැන් වේලාව : ප.ව. 5.50 යි
මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සුහර්ෂි හේරත් මහත්මිය :

ප්‍ර : ඒ පැමිණිලි සහ ඒ චෝදනාවන් එල්ල වෙන්නේ රටේ පවතින නීති රාමුව තුළ නීති පද්ධතිය ක්‍රියාත්මක කිරීමේදී කියන කාරණාවට ඔබ වහන්සේට කියන්න තියෙන ප්‍රතිචාරය මොකද්ද හාමුදුරුවනේ?

පි : සහරාන්ලා බිහි වෙලා තියෙන්නෙත් ඔය නීති තියෙද්දිමනේ.

ප්‍ර : ඒ අනුව හාමුදුරුවනේ මා ඔබ වහන්සේට කලිනුත් කිව්වා හාමුදුරුවනේ මගේ ධර්ම ඥාණය ඔබ වහන්සේ තරම් නැහැ. සමාවෙලා හාමුදුරුවනේ මා පෙර අවධානයට ලක් කරන ලද බ්‍රහ්මජාල සූත්‍රයේම සඳහන් වෙනවා බුදු බණ හාමුදුරුවනේ. බුදු වදනින් කියනවා නම් ඒ දොස් කීමෙහි තෙප කිපෙන්නෙහු නම්, නොසතුටුවන්නේහු නම් එයින් තොපටම අන්තරාය වන්නේය. ඔබ වහන්සේ මේ කිපෙමින් කරන ප්‍රකාශවලින් ඔබ වහන්සේටම අන්තරායක්. මේ රටේ නීති පද්ධතිය තුළ කොටුවීමකට සිදු වෙනවාය කියන කාරණාව ඔබ වහන්සේට පසක් වෙනවද හාමුදුරුවනේ?

පි : ඔය බ්‍රහ්මජාල සූත්‍රය පටලවගෙනනේ ඉන්නේ මැතිණිය. ඔය අර අම්බට්ටා වගේම ප්‍රශ්නයක් අහන කෙනෙකුට දෙන උත්තරයනේ ඔය. දැන් මම සරළ උදාහරණයක් කියන්නම්. ඔබතුමිය බ්‍රහ්මජාල වගේම බරු ජාතකයත් කියවන්න. සටහන් කර ගත්තොත් ඉතා වැදගත් බරු ජාතකය. දැන් ඔබ බ්‍රහ්මජාල සූත්‍රයේ අදාළ පුද්ගලයෙකුට කියන කථාව. ඒක අපට ආදේශ කර ගන්න අදාළ නැහැ. එතකොට බරු ජාතකයේ මොකද්ද කියන්නේ. බරු ජාතකය තමයි අදට ගැළපෙන නියම දේශනාව. බුදු හාමුදුරුවෝ ජේතවනාරාමයේ වැඩ ඉන්නවා. ජේතවනාරාමයේ වැඩ ඉන්නකොට බුදු හාමුදුරුවන්ට විශාල සද්දයක් ඇහෙනවා. ගිහිල්ලා කියනවා ආනන්ද මොකද්ද මේ සද්දය. බලනකොට පන්සීයක් විතර නිගණ්ඨයෝ ඇවිල්ලා. බුදු හාමුදුරුවෝ අහනවා ඇයි මේ නිගණ්ඨයෝ මෙතනට ඇවිල්ලා තියෙන්නේ. බුදු හාමුදුරුවනේ ආරාමයක් හදන්න. බුදු හාමුදුරුවෝ කියනවා එහෙම කරන්න දෙන්න බැහැනේ. ඊළඟට සැරියුත් හාමුදුරුවන්ට කථා කරලා කියනවා බුදු හාමුදුරුවෝ සැරියුත් ඔයා යන්න කොසොල් රජ්ජුරුවෝ හම්බ වෙන්න.

FAIR COMMENT BY JEZEEM

කොසොල් රජ්ජුරුවෝ හම්බ වෙන්න සාරිපුත්ත හාමුදුරුවෝ යවලා, ආනන්ද හාමුදුරුවන්ට කියනවා ආනන්ද ඕගොල්ලොත් පන්සියයක් විතර එතනට යන්න. ඇයි මේ. අන්න බලයට බලය යෙදෙව්වා. බෙල්ල කපන්න එනකොට සුවපත් වේවා, අනිත්‍යයි, අපි අවිහිංසාවාදීනේ කියලා එහෙම ධර්මයක් නැහැ. එතකොට බලය යොදපු අවස්ථාවන් අන්න තියෙනවා බරු ජාතකයේ. පන්සියක් විතරද ඉන්නේ. හා ඕගොල්ලොත් පන්සීයක් විතර යන්න. ගහ ගන්න කිව්වේ නැහැ. හදිස්සියේ කඩාගෙන ආවොත්. එහෙම කියලා බලනකොට අද අපේ රජවරු වගේම තමයි එදා බලනකොට කොසොල් රජ්ජුරුවොත් අල්ලස් අරගෙන නිගණ්ඨයන්ගෙන්. ජේතවනාරාමය ගාව නිගණ්ඨ ආශ්‍රමයක් හදන්න. බුදු හාමුදුරුවෝ ඒක නැවැත්තුවා. ඇයි ඒ. ආගමික ගැටුම් ඇතිවන නිසා. බ්‍රහ්මජාල ඒක පටලවගන්න එපා. ඔය ප්‍රකාශය වෙන කථාවක්. අපි දන්නවා වාචසික සංවරය වැදගත්. වචන තමයි මදු පිෂ්ඨ දිව්‍යාද්ධය කියලා කියන්නේ. වෙඩි උණ්ඩයට වඩා සැරයි වචන. අපි ඒක දන්නවා. හැබැයි අපි වචන පාවිච්චි කරන්නේ අවස්ථාවෝචිතව. මොනවා හරි කාරණාවක් වඩා තීව්‍ර ලෙස මිනිස්සුන්ට අවබෝධ කරවීම සඳහා, පාලකයන්ට අවබෝධ කරවීම සඳහා අපි හඬ නගනකොට ආරක්ෂක අංශ හැරිලා බලනවා මොකද්ද මේ හාමුදුරුවෝ කියන්නේ. ඒගොල්ලොන්ගෙන් අතපසු වෙලා තියෙනවා නම් මොනවා හරි ක්‍රියාමාර්ගයක් ගන්න. ඒගොල්ලෝ ක්‍රියාමාර්ග ගන්නවා. ඊළඟට පාලන තන්ත්‍රය බලනවා මේ කෑගැහිල්ලෙන් අපිට ඡන්ද නැති වෙයිද ඒගොල්ලෝ බලනවා මොකක් හරි විසඳුමක් දෙන්න. අපි බලන්න ඕන චේතනාව. අපේ චේතනාව නරක චේතනාවක් නෙමෙයි. ඒක තමයි මට නැවත නැවත කියන්න තියෙන්නේ. බ්‍රහ්මජාල සූත්‍රය සම්බන්ධයෙනුත් එච්චරම තමයි.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : ගරු ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේ මේ කොමිසමට කිහිප අවස්ථාවකදී දැන් කියන්නට යෙදුණා මේ ඔබ වහන්සේගේ මේ ක්‍රියා කලාපය සහ බොදු බල සේනාවේ ක්‍රියා කලාපයට හේතු වුණේ ඔබ වහන්සේ කියන හැටියට මේ නීතිය ක්‍රියාත්මක නොවුණ හින්දයි කියලා. ඒක එහෙමද?

පි : නීතිය ක්‍රියාත්මක නොවීමත් මැතිතුමණි, නීතිය ක්‍රියාත්මක කරවා ගැනීමට බල කිරීම.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ ක්‍රියාත්මක කරවා ගැනීමට බල කිරීමක් කියන එකෙන් අදහස් වෙන්නේ ඒ නීතිය ක්‍රියාත්මක වුණේ නැහැ කියන එකනේ ස්වාමීන් වහන්ස ඒ අවස්ථාවේ?

පි : ඔව්.

ප්‍ර : දැන් ඔබ වහන්සේ කියන ඒ කාරණාව නිවැරදි කාරණාව නම් අනාගතයේදී එවැනි පැහැර හැරීමක්, නොකර හැරීමක් වළක්වා ගැනීමට සිදු කළ යුත්තේ මොකද්ද කියලද ඔබ වහන්සේ යෝජනා කරන්නේ?

පි : මැතිතුමණි ලිච්ඡවී රාජ ධර්මවල පවා සඳහන් වෙනවා මේ නීති අළුත් කරන්න ඕන. නැති නීති පනවන්න ඕන. ඒකට තමයි පාලකයෝ ඉන්නේ. අපි යටත් විජිතයක්ව හිටියා අවුරුදු 498 ක්. තවම අපේ නීති පද්ධතිය අපට ගැළපෙන නීති පද්ධතියක් නෙමෙයි. අපි ඒක බරපතල විදියට, දැන් උදාහරණයක් විදියට මැතිතුමණි පුරා වස්තු කියන්නේ අපේ මුතුන් මිත්තෝ හදපුවානේ. හැබැයි පුරා වස්තු සම්බන්ධයෙන් නීතිය හැදුවේ සුද්දෝ. පුරා විද්‍යා පනත 1932. අපි නිදහස ලබාගෙනත් නැහැ. ඉතිං අපි ඒකයි කියන්නේ යල් පැන ගිය නීති කියලා දැන් ඔය සමාජය කථා කරන්නේ ඒකයි. ඉතිං දැන් ඒ තියෙන නීතිවත් ක්‍රියාත්මක වෙන්නේ නැති එකයි ගැටළුව. ඒවායින් අනවශ්‍ය, ගොඩාක් අනවශ්‍ය ගැටළු ඇති වෙලා තියෙනවා මේ Society එක අතර, සමාජය අතර. ඉතිං අනාගතයේදී මේ වගේ ගැටළු නොවෙන්න නම්, මතු නොවෙන්න නම් ඇත්ත වශයෙන්ම මේ නීති පද්ධතිය සංස්කරණය කරලා, අපට අදට ගැළපෙන නීති සකස් කරගෙන, ගෝලීය තත්ත්වය තේරුම් අරගෙන, ඒවාට මුහුණ දෙන්න පුළුවන් ආකාරයට මේ නීති ක්‍රම සකස් විය යුතුයි කියලා තමයි අපි විශ්වාස කරන්නේ.

ප්‍ර : දැන් ඔබ වහන්සේ කිහිප අවස්ථාවක් කිව්වා මේ පුරා විද්‍යා වස්තූන් ආරක්ෂා නොවීම සම්බන්ධයෙන් කාරණාව. දැන් අනාගතයේදී පුරා විද්‍යා වස්තූන් මීට වඩා හොඳ ක්‍රමයකට ආරක්ෂා වීමට නම් ඔබ වහන්සේගේ අදහසට අනුව මොනවද වෙන්න ඕන?

පි : මැතිතුමණි, අපේ ඉතිහාසය ගලේ කොටපු එකක්. ඒ වගේම පොතේ ලියපු එකක්. මෙහෙම ලිඛිත ඉතිහාසයක් ඇති ජාතියක් ලෝකයේ කොහේවත් නැහැ. ඒ අපි විතරයි. මැතිතුමණි 1970 ගණන්වල සිරිල් මැතිව් කියලා මහත්මයෙක් ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ ආණ්ඩුව කාලයේ එතුමා පත් කළා මේ පුරා වස්තු සංරක්ෂණය සම්බන්ධයෙන්. ඒ කාලයේ තමයි මැලේසියාවේ

FAIR COMMENT BY JEZEEM

මැලේවරු ගැන, ද මැලේ ඩයලම්මා කියලා පොතක් ලියැවුණේ. ඒගොල්ලන්ගේ භූමි පුත්‍ර සංකල්පය ගෙනාවේ ඒ කාලයේ. කටාර් රාජ්‍යයේ ඒ භූමි පුත්‍ර සංකල්පයෙන් ඒගොල්ලන් කොහොමද නැගිට්ටේ. ඒගොල්ලන්ගේ ඉඩ කඩම් කොහොමද ඒගොල්ලන්ගේ පෞරාණික දේ කොහොමද රැක ගත්තේ කියන එකට ඒ ලියවිලි එන කාලයේම සිරිල් මැතිව් මැතිතුමා මොකද කළේ සිංහලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමට අපේ උරුමයන් ලියා ඇති, අපේ උරුමයන් පිළිබඳ සටහන් තබා ඇති පුරා විද්‍යා ස්මාරක හොයාගෙන ගියා. මැතිතුමණි 276 ක් මේ කොළඹ, බස්නාහිර, දකුණ මේ කොහේවත් අපේ උරුමය ගැන සටහන් නැහැ. තියෙන්නේ උතුරු නැගෙනහිර. උතුරු නැගෙනහිර දෙපළාතේ පුරා විද්‍යා ස්මාරක 276 ක් තියෙනවා මැතිතුමණි. 276 ක්. එතකොට ඒ පුරා විද්‍යා ස්මාරක 276 ක් තියෙනවා. වල්ලිපුරම් රන් සන්නස පවා තවම තියෙනවා. මැතිතුමණි අපි ඇත්ත වශයෙන්ම මේ සියළු ආණ්ඩුවලට කිව්වා. වර්තමාන ජනාධිපතිවරයාට තවම ඒ සම්බන්ධයෙන් කථා කළේ නැහැ. අපි කිව්වා උතුරු සහ නැගෙනහිර දෙපළාතේ අවාසනාවට වැඩිමනත් ලෙස ජීවත් වෙන්නේ දමිළ හා මුස්ලිම් මිනිස්සු. දමිළ අය හුඟක් ඇත්ත වශයෙන්ම නොකරන තරම්, ඒ කියන්නේ පුරා වස්තුවලට හානි කරන්නේ නැහැ. විශේෂයෙන්ම නැගෙනහිර පළාතේ පුරා වස්තුවලින් 60% ක් විතර දැන් ඉවරයි. විනාශ කරලා. අපි යෝජනාවක් කළා මැතිතුමණි මේ මුස්ලිම් දරුවෝ අරාබි ඉතිහාසය ඉගෙන ගන්නවා. මේ දරුවෝ සිංහල ඉතිහාසය ඉගෙන ගන්නේ නැහැ. ඒගොල්ලෝ අරාබියේ නීතිය ඉගෙන ගන්නවා. අපේ නීතිය ඉගෙන ගන්නේ නැහැ. මේ දරුවෝ දන්නේ නැහැ සඳකඩ පහනක කථාව. මේ දරුවෝ දන්නේ නැහැ මුර ගලක කථාව. ඒකනිසා දෙමළ භාෂාවෙන් අවම තරමින් පෙළ පොත්වලට දාන එක ප්‍රශ්නයක් නම් මොකද මේගොල්ලන්ගේ අන්තවාදය වැඩියිනේ. ඒ නිසා අවම තරමින් පත්‍රිකා ටිකක් බෙදලා දෙමළ භාෂාවෙන් ඒගොල්ලන්ට තේරෙන භාෂාවෙන් මේ පුරා වස්තුවල තියෙන වටිනාකම කියන්න කියලා අපි ඉල්ලුවා. ඒක හෙටටත් වලංගුයි. එතකොට ඒ දරුවන්ට කිව්වොත් මේ කොරවක් ගල, මේ සඳකඩ පහන, මේ ගරා වැටුණු චෛත්‍යය මේක උඹලාගේම උරුමයක් කියලා ඒක පැහැදුවොත්, මේක රැකුණොත් මේක බලන්න මිනිස්සු එයි. උඹලට බුලත් විටක් හරි විකුණගන්න පුළුවන්. මේ තරම් සරළව අපි කිව්වා. අනාගතයේදී මැතිතුමණි මේක ආරක්ෂා කර ගන්න නම් ඒ පුරා විද්‍යා ස්මාරක ටික නැවත ගැසට් කරන්න ඕන. අපි ඒ යෝජනාවත් කරලා

FAIR COMMENT BY JEZEEM

තියෙනවා. ඒ වගේම ඒ පුරා විද්‍යා ස්මාරක තියෙන දැන් මඩකලපුව ගත්තොත් මැතිතුමණි මඩකලපුවේ තියෙනවා 1080 ක් පුරා විද්‍යා ස්මාරක. පොඩි ප්‍රමාණයක් නෙමෙයි 1080 ක්. ඉතිං ඒ ස්ථාන දැන්වීම් පුවරු දාන්න භාෂා තුනෙන්ම. ඊළඟට ඒ ප්‍රදේශවල ජීවත් වන ඒ ජනතාවටම දෙන්න මේක ආරක්ෂා කර ගන්න ඒවායේ වටිනාකම කියලා දෙන්න කියලා. ඉතිං ඒ වගේ යෝජනාවලියක් අපිට ඉදිරිපත් කරන්න පුළුවන්. ඇත්ත වශයෙන්ම නීතිය තමයි ප්‍රධානම ගැටළුව. නීතිය රටේ ජනතාවට එක එක ආකාරයට ක්‍රියාත්මක වීම.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සුහර්ෂි හේරත් මහත්මිය :

ප්‍ර : හාමුදුරුවනේ මා වෙනත්ම පැත්තක ප්‍රශ්නයක් අහන්න අවසරයි හාමුදුරුවනේ. ඔබ වහන්සේ සතුව විදේශ ගමන් බලපත්‍රයක් තිබෙනවද හාමුදුරුවනේ?

පි : ඔව්.

ප්‍ර : එයින් ඔබ වහන්සේ විදේශගතවීම් වෙලා තියෙනවද ශ්‍රී ලංකාවෙන් පිටතට?

පි : අවස්ථා ගණනාවක්.

ප්‍ර : මොන මොන රටවල්වලටද හාමුදුරුවනේ ඔබ වහන්සේ ගිහිල්ලා තියෙන්නේ?

පි : රටවල් මම හිතන්නේ එක දහයකට පහලොවකට. කියන්න පුළුවන් ඇමෙරිකාවට ගිහිල්ලා තියෙනවා. අපේ මේ කලාපයේ මියන්මාරය, වියට්නාමය, තායිලන්තය, ජපානය, කොරියාව. යුරෝපය පැත්තෙන් ගත්තොත් ප්‍රංශය, ජර්මනිය, ඉතාලිය, ස්විට්සර්ලන්තය, ස්ලෝවැකියාව, ඕස්ට්‍රියාව, නෝර්වේ මේ වගේ රටවල්වලට ගිහිල්ලා තියෙනවා. ඉන්දියාව.

ප්‍ර : හාමුදුරුවනේ ඒවා මේ බොදු බල සේනා සංවිධානය අරඹයා කරන ලද විදේශ ගමන්ද? එහෙම නැත්නම් ඔබ වහන්සේගේ පෞද්ගලික ගමන්ද? ඔබ වහන්සේට කරන ලද ආරාධනාවන් මත ධර්ම ප්‍රචාරයට අදාළව කරන ලද ගමන්ද කියලා පොඩි පැහැදිලි කිරීමක් මේ සභාවට කළොත්?

පි : සියළුම රටවල්වලට ගියේ ඇත්තටම ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා අපේ සිංහල අයගේ ආරාධනාවෙන්. සමහර අවස්ථාවල ගිහිල්ලා තියෙනවා දැන් තායිලන්තය වගේ රටවල්වලට සමහර සමුළුවලට. මියන්මාරයේත් ඒ වගේ රැස්වීම්වලට. ඉන්දියාවේ නම් දඹදිව

FAIR COMMENT BY JEZEEM

වන්දනා ආදී කටයුතුවලට. අනෙක් රටවල්වල නම් ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා.

ප්‍ර : මේ ගරු සභාවේ ඔබ වහන්සේ මීට පෙර ලබා දුන් සාක්ෂි අතරේ ඔබ වහන්සේගේම සාක්ෂියක කියැවුණා ඔබ වහන්සේගේ නෝර්වේ ගමන සම්බන්ධයෙන් ඇතැම් මාධ්‍යවල සහ පුද්ගලයන් අතර විවිධ අර්ථකථන ලබා දෙනවා කියලා. ඒ අනුව අපේ හාමුදුරුවනේ ඒක පැහැදිලි කරන්න ඔබ වහන්සේ නෝර්වේ රටට වැඩියේ මොන කාරණාවටද කියලා?

පි : මැතිතුමණි, අපි අර එදා මුල්ම දවසේ මෙතනදී මම සාක්ෂි දෙනකොට ජාතික සංඝ සම්මේලනය ගැන කිව්වා. ජාතික සංඝ සම්මේලනයේ ලේකම්වරයා හැටියට කටයුතු කරලා, ජාතික හෙළ උරුමයත් ගොඩ නගලා, අවසානයේදී අර අන්‍යාගමික කරන පනත ගේන්න බැරි වුණාට පස්සේ මම ඒ නායකකාර ආදී භික්ෂූන් වහන්සේලාට කිව්වා තවදුරටත් ඔබ වහන්සේලාත් එක්ක ගමනක් නැහැ. මොකද ඕගොල්ලෝ යථාවාදී නැහැ. තථාකාරී නැහැ. ඕගොල්ලන් පනත ගේනවා කියලයි පාර්ලිමේන්තුවට ආවේ. මිනිස්සු ඒක තදින් විශ්වාස කළා. බෞද්ධයෝ ගිහිල්ලා ඡන්දය දැම්මේ නැහැ ඡන්දය පූජා කළා. ඒ නිසා ඕගොල්ලෝ මේකට වග කියන්න ඕන. තවදුරටත් ඕගොල්ලොත් එක්ක ගමනක් නැහැ. ඕගොල්ලෝ මේ බල දේශපාලනය ඇතුළේ දිය වෙනවයි කියලා ඒ වැඩ පිළිවෙලට ආයුබෝවන් කියලා මම පැත්තකට වුණා. පැත්තකට වෙලා මැතිතුමණි මම අවුරුදු එක හමාරක් සේවය කළා ස්වේච්ඡාවෙන් ආබාධිත කාන්තා ආයතනයක. විශේෂයෙන් උතුරු මැද පළාතේ. ඊට පස්සේ මම කල්පනා කළා මගේ සහෝදර හාමුදුරු කෙනෙක් ඉන්නවා ඇමෙරිකාවේ ඉන්දියානා ප්‍රාන්තයේ පන්සලක් තියෙනවා අපේ කෝට්ටේ රජ මහා විහාරයට සම්බන්ධ. මම කල්පනා කළා මේ රටේ තවත් ඉඳලා වැඩක් නැහැ. යුද්ධය ඉවර වුණහම යන්න ඕන ඇමෙරිකාවට කියලා. යුද්ධය යන කාලයේ මම ප්‍රංශය, ඉතාලිය වගේ රටවල්වලට ගිහිල්ලා එවකට ඒ ඇතැම් හමුදා ප්‍රධාන හමුදා නිලධාරීන්ගේ ඉල්ලීම පරිදි බෝධි පූජා ආදිය පවත්වලා, ආගමික කටයුතු කරලා වැලිඔය ඉස්පිරිතාලයට අවශ්‍ය කරන සියළු පහසුකම් සැපයුවේ මම ඒ සල්ලි එකතු කරගෙන ඇවිල්ලා. මම හිතන්නේ මිලියන හත අටක්. ඒ දවස්වල හැටියට. වැලිඔය ඉස්පිරිතාලේ Fridge එකක්වත් තිබුණේ නැහැ ලේ ටික තියා ගන්න. මමයි ඒවා අරන් දුන්නේ. ඉතිං මේ කටයුතු ඔක්කෝම ඉවර කරලා, යුධ ජයග්‍රහණයෙන් පස්සේ ඇමෙරිකාවටවත් ගිහිල්ලා ජීවත් වෙනවා හොඳට බණ දහම් ටිකක් හදාරගෙන

FAIR COMMENT BY JEZEEM

කියලා ඉන්නකොට මට හම්බ වුණා අපේ හාමුදුරුවරු. මාව හම්බ වෙන්න හාමුදුරුවරු කිහිප නමක් ඇවිල්ලා කිව්වා ඥාණසාර හාමුදුරුවෝ මේ යන විදිය හොඳ නැහැ මොකක් හරි අපි කරන්න ඕන. ඊට පස්සේ ආපහු මගේ මනස වෙනස් වෙලා, ඔව් අපි එහෙනම් මොනවා හරි කරමු කියලා වැඩ පිළිවෙලක් ගැන හිතුවා. ඒ වැඩ පිළිවෙල තමයි මැතිතුමණි උතුරු පළාතේ විශේෂයෙන් මේ යුද්ධයෙන් පස්සේ දෙමළ ජනතාව විශාල කම්පනයක හිටියා. දැන් කොහොමත් එහෙමනේ. දිනන මිනිස්සු සතුටු වෙනවා. පැරදෙන මිනිස්සු දුක් වෙනවා. අපි බරපතල විදියට විශ්වාස කෙරුවා අපේ හාමුදුරුවෝ කණ්ඩායම අපි කථා කළා දැන් මේ මිනිස්සුන්ගේ හිත නොහදා පාලම් හැදුවට වැඩක් නැහැ. කොච්චර Highway හැදුවත් වැඩක් නැහැ මේ මිනිස්සුන්ගේ හිත් හදන්නේ නැතුව. ඒ නිසා මේ මිනිස්සුන්ගේ හිත් හදන්න ඕන. ඒකට අපි වැඩපිළිවෙලක් ගොඩ නගමු කියලා අපේ ඔය ඩොක්ට දිලන්ත විතානගේ සහ අපි තව හාමුදුරුවෝ කිහිප දෙනෙක් එකතු වෙලා ඇත්ත වශයෙන්ම දිලන්ත විතානගේ මහත්මයා, අපේ ප්‍රධාන විධායක නිලධාරීවරයා හැටියට කටයුතු කරපු එතුමා අපිට යෝජනාවක් කළා ඒක එතුමාගේ යෝජනාවක්. හාමුදුරුවනේ හොඳ වැඩසටහනක් තියෙනවා අපි මේක කරමු. මේක ඇත්ත වශයෙන්ම උතුරේ මොකද දෙමළ බෙදුම්වාදී විෂ නැති කර ගන්න බැහැ මේ මිනිස්සුන්ගේ හිත්වලට ළං වෙන්නේ නැතුව. ඒක හාමුදුරුවරුන්ට තමයි කරන්න පුළුවන්. මොකද මේ දක්වා සිංහලයන්ගෙන් උතුරේ දමිළ ජනතාව වැඩිමනත් ලෙස ඈත් වෙන්න හේතුව මේ ක්‍රිස්තියානි මූලධර්මවාදය. ඒ නිසා අපි දෙමළ මනුස්සයා ළඟට ළං වෙලා අපි වැඩ පිළිවෙලක් හදමු දෙමළ මිනිස්සු දිනා ගන්න. ඒකට වැඩ පිළිවෙලක් හැදුවා මැතිතුමණි. ඒ ව්‍යාපෘතියේ නම "සිතමු". මේක දිලන්තගේ අදහසක්. සිතමු. සියන්නෙන් සිංහල, තයන්නෙන් තමිල්, මුයන්නෙන් මුස්ලිම්. සිතමු. එක්ව රට හදමු. ඕක තමයි සංකල්පය. ඉතිං බැලූ බැල්මට හරි ලස්සනයි. Concept එක හරි ෂෝක්. ඉතිං මේක හරි හොඳයිනේ. මේක අපි කරමු කියලා. මැතිතුමණි මම එවක ආරක්ෂක ලේකම්වරයා හම්බ වුණා. හම්බ වෙලා අපේ අදහස කිව්වා. මැතිතුමණි මොකක් හරි උත්සව අවස්ථාවකදී කිව්වේ. පොතක් එළි දක්වන එකක් හෝ මෙකක් හරි අවස්ථාවක. තව නායකයෝ කිහිප දෙනෙකුටත් අපි මතක් කළා මෙන්න මේ වගේ වැඩක් අපි කරන්න ඕන කියලා. ලේකම්තුමාට කිව්වා මේ පාලම්, බෝක්කු හදන්න නැත්නම් ඒ කාලයේ කිව්වේ මේ උතුර සංවර්ධන වැඩ පිළිවෙල කියලනේ ගියේ. උතුරු වසන්තය. ඉතිං ඒ

FAIR COMMENT BY JEZEEM

මේ මිනිස්සුන්ගේ ජීවිතවලට වසන්තය ගේන්න නම් මෙන්න මේ වගේ Project එකක් තමයි කරන්න ඕන මේ මිනිස්සුන්ගේ හිත් දිනා ගන්න. අපිට ඒක කරන්න පුළුවන්. ආදරයෙන් මේ මිනිස්සුන්ට ගිහිල්ලා කථා කරලා අනේ හාමුදුරුවනේ බොහොම හොඳ දෙයක් ඒක කරන්න, ඉක්මණට ඒක කරන්න කිව්වා. ඒ අනුව ඉතිං එතනින් කථාව ඉවරයි. ඒවට පහසුකමක්වත්, කොහොමද කෙරෙන්නේ මොකක්වත් කථා කෙරුවේ නැහැ. අපි කිව්වා මෙහෙම දෙයක් අපේ ඔළුවේ අදහසක් තියෙනවා. පස්සේ මම දිලන්ත මහත්මයාට දැන් මේකත් කථා කළාට දැන් මේක ක්‍රියාත්මක කර ගන්න විදියක් නැහැ. මාස හය හතක් ඇවෑමෙන් මම කිව්වා මහත්මයෝ මේකට මොකක් හරි ක්‍රමවේදයක් හදන්න. එතකොට එතුමා කිව්වා හාමුදුරුවනේ මම දන්න නෝර්වේ ජාතිකයෙක් ඉන්නවා. ඔහු අවුරුදු 40 ක් මේ රටේ ඉන්න කෙනෙක්. වයසයි. එතුමාට කියලා පොඩි වැඩසටහනක් හදන්න පුළුවන්. මම කිව්වා හදන්න. ඒ හදන්න කිව්වාට පස්සේ ඔන්න යෝජනාවක් හදලා ගෙනාවා. යුරෝපය තුළ ඉන්න L.T.T.E. නොවන තවමත් ඉන්නවා අපි ඒ හමු වෙච්ච මහාචාර්ය ශන් මගේ මතකයේ විදියට ශාන්, මහාචාර්ය ශාන් කියලා ඔස්ලෝ විශ්ව විද්‍යාලයේ. L.T.T.E. නොවන, නමුත් යුරෝපය තුළ යමක් කළහැකි විවිධ වෘත්තීන්හි, ලොකු ලොකු තනතුරු දරන නොයෙක් අය ඉන්නවා. හැබැයි ඒගොල්ලෝ L.T.T.E. නෙමෙයි. ඒකට විරුද්ධයි. නමුත් ඒගොල්ලන් එන්නේ නැහැ ලංකාවට. ඒ අය උපයෝගී කරගෙන L.T.T.E. නොවන ඩයස් පෝරාවක් ඉන්නවා. ඒගොල්ලොත් එකතු කරගෙන අපි ඒගොල්ලන්ට යෝජනාවක් දීලා අපි ඒ දෙමළ මිනිස්සුන්ට උදව් කරමු. ඒකට තමයි මේ මහත්මයා වැඩසටහන හදලා දුන්නේ. දවස් දෙකයි අපි, දවස් තුනයි නෝර්වේ හිටියේ. එතනදී කිව්වේ ඒ පැත්තෙන් හය දෙනෙක් එනවා. අපේ පැත්තෙන් හය දෙනෙක් යනවා. මේක සාකච්ඡා කරනවා. ඒ අනුව අපි හත් දෙනෙක් නෝර්වේ රටට ගියා. මම විතරයක් නෙමෙයි. වවුනියාවේ දෙමළ හොඳට කථා කරන්න පුළුවන් නායක හාමුදුරු කෙනෙක් ගියා අඹගස්වැවේ විමලසාර නායක හාමුදුරුවෝ. අපේ සංවිධානයේ මූල්‍ය ලේකම් හාමුදුරුවෝ හපුතලේ පඤ්ඤාරාම හාමුදුරුවෝ, විතාරන්දෙණියේ නන්ද හාමුදුරුවෝ, ප්‍රසිද්ධ ඉංග්‍රීසි දේශකයෙක් වන පූජිත විජේසිංහ, දිලන්ත විතානගේ මහත්මයා මේ අපි කණ්ඩායම ගිහිල්ලා ඒ පැත්තෙන් හය දෙනයි, අපේ පැත්තෙන් හය දෙනයි ඉතිං කොහොමද මේ දෙමළ සමාජය දිනා ගන්නා වූ වැඩ පිළිවෙල

FAIR COMMENT BY JEZEEM

ගැන අපි කථා කළා. කථා කරලා ආවා. එච්චරයි. ඕක තමයි නෝර්වේ කතන්දරය. එතනින් එහාට Project එකක්වත්, මොකක්වත් කිසිම දෙයක් කරන්න අවස්ථාවක් හම්බ වෙන්නේ නැහැ. ඊට වඩා සංකීර්ණ ලෙස මේ ඉස්ලාම් ආදී ප්‍රශ්නවලට අපට මැදිහත් වෙන්න සිද්ධ වුණා. ඒ ව්‍යාපෘතිය කරන්න හම්බ වුණේ නැහැ කථා කළාට. එතනින් නෝර්වේ අපි දවස් තුනක් හිටියා. දවස් තුනක් සාකච්ඡාව තිබුණා. පළවෙනි දවසෙම සාකච්ඡාව ඉවරයි. මොකද අපට ගළපගන්න බැරි දෙයක් තිබුණේ නැහැ. අවසානයේදී එහේ ඉන්න ඔස්ලෝවල ඉන්න ඉංජිනේරු මහත්වරු, දොස්තරු මහත්වරු අපිව ඒ ගෙවල්වලට එක්කගෙන ගිහිල්ලා ඔය ඉන්දීය කෑම අරවා මේවා හදලා දීලා, වළඳවලා අපි එතනින් ඊට පස්සේ ප්‍රංශයට ගියා. ඒ චාරිකාව ගිහිල්ලා ආවා. ඕකට තමයි ඔය නෝර්වේ කුමන්ත්‍රණය කියන්නේ.

ප්‍ර : ඔය කොයි කාල වකවානුවකද හාමුදුරුවනේ ඔබ වහන්සේ නෝර්වේ වැඩියේ? අවුරුද්දක් වශයෙන් මතකද ඔබ වහන්සේට?

පි : 2010 විතර. මට මතක නැහැ ඇත්ත වශයෙන්ම මතක නැහැ කාලය 2009 හෝ 2010.

ප්‍ර : ඒ කියන්නේ හාමුදුරුවනේ මේ බොදු බල සේනාව ආරම්භ කරන්න පෙර?

පි : පෙර පෙර.

ප්‍ර : බොදු බල සේනා සංවිධානය පිහිටවීමට පෙර?

පි : පෙර. නමුත් බොදු බල සේනා සංවිධානය ඔය ප්‍රසිද්ධියේ පිහිටවූයේ අපි 2012 මැයි මාසේ 07 වෙනිදා වුණාට 2002, 2003 ඒ කාලවලදිත් අපි බොදු බල සේනාව නමින් වැඩ කරලා තියෙනවා. ඒ කාලයේ. ඒ කාලයේ එච්චර ප්‍රසිද්ධ නැහැ. මොකද මම හදපු නමක් ඒ කාලයේම. පස්සේ මේ සියළු සංවිධානවලින් පැත්තකට වෙලා බොදු බල සේනාව ආපහු 2012 සක්‍රීය කරලා ගත්තා.

පි : ඒ නෝර්වේ සංචාරය සම්බන්ධයෙන් දේශපාලනික වශයෙන් අපිට විවේචන එල්ල කරපු හැමෝටම කිව්වා කරුණාකරලා මේක හෙළිදරව් කරන්න. එහෙම දෙයක් තියෙනවා නම් පෙන්වන්න. එක යුරෝ එකක් හරි හම්බ වුණානම්. නැහැ ඉතිං මොකුත් නැහැ. ඒවා ප්‍රසිද්ධියේ කියලා දානවා. එච්චරයි. ඉවරයි. අපිට වෙන හානිය මොකුත් ගැන ඒවා ගැන හිතන්නේ නැහැ.

ප්‍ර : අපේ හාමුදුරුවනේ ඔබ වහන්සේ සඳහන් කරන්නට යෙදුණා මේ නෝර්වේ ගමන සම්බන්ධයෙන් යම් ආන්දෝලනාත්මක තත්ත්වයක් උද්ගතවීම මත ඔබ වහන්සේ කරුණු පැහැදිලි

FAIR COMMENT BY JEZEEM

කිරීමක් සිද්ධ කළා කියලා. ඒ කරුණු පැහැදිලි කිරීම මාධ්‍යයට ඔබ වහන්සේ සිද්ධ කළාද?

පි : අවස්ථා ගණනාවක.

ප්‍ර : ඒ හා සබැඳිව ලිඛිත මුද්‍රිත මාධ්‍යයේත් කරුණු පළ වුණාද ඔබ වහන්සේගේ මාධ්‍ය හමු සහ එහි සඳහන් වූ කරුණු කාරණා සම්බන්ධයෙන්?

පි : ඔව්. ඒක ඒ දවස්වල ප්‍රසිද්ධ මාතෘකාවක් වුණා. විශාල ඉඩකුත් මාධ්‍යවල හම්බ වුණා.

ප්‍ර : හාමුදුරුවනේ ලංකාදීප සිංහල පුවත්පත, 2014 අගෝස්තු මස 13 වෙනි දින තිබෙන ලිපියක් ඔබ වහන්සේට මා පෙන්වා සිටිනවා මෙහි තිබෙන කාරණාවන් ඔබ වහන්සේ විසින් කියන්නට යෙදුණු කාරණාද කියන කරුණත්, මෙහි මේ ඡායාරූපයේ පෙනී සිටින්නේ ඔබ වහන්සේද කියන කරුණත් තහවුරු කරන්න හාමුදුරුවනේ?

පි : ඔව් මැනිණියනි. මේ මැද ඉන්නේ මම. වම් පසින් සිටින්නේ දිලන්ත විතානගේ මහත්මයා. ඒකේ අන්තර්ගතය තමයි ඔය නගන චෝදනාවට, ඒ කියන්නේ අපිට චෝදනා කළේම එවකට මේ මුස්ලිම් ප්‍රශ්නය ගැන, අන්තවාදී ප්‍රශ්නය ගැන කථා කරගෙන එනකොට එක අමාත්‍යවරයෙක් කිව්වා මේක මේගොල්ලෝ නෝර්වේ ගියා. නෝර්වේ ගිහිල්ලා ඇවිල්ලා තමයි මේක පටන් ගත්තේ කියලා. ඒක අනවශ්‍ය කථාවක්. ඉතිං ඒක නිකම් ඔහේ ඔක්කොම කියන්න ගත්තා. ඒගොල්ලන් කිව්වේ අපිට අරමුදල් හම්බ වෙනවයි කියලා. ඉතිං එහෙම කිසිම දෙයක් දැන හෝ නොදැන හෝ එහෙම ලැබිලත් නැහැ. ලබාගෙනත් නැහැ. එහෙම උත්සාහ කරලත් නැහැ අපි. ඒ ගැන තමයි ඔය තියෙන්නේ. ශත පහක්වත් එහෙම ලැබිලා නැහැ කියලා.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී ස්වාමීන් වහන්ස විසින් ඔහුගේ නෝර්වේ ගමන සම්බන්ධයෙන් පවත්වන්ට යෙදුණු මාධ්‍ය සාකච්ඡාවකදී කියවූ කරුණු ඇතුළත් පුවත්පත් වාර්තාවක් 2014 අගෝස්තු මස 13 වෙනි දින ලංකාදීප පුවත්පතෙහි තිබුණු පුවත්පත් වාර්තාව මෙම සභාවට C-701 වශයෙන් සළකුණු කොට

ඉදිරිපත් කිරීමට අවසර අයැද සිටිනවා

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : ස්වාමීන් වහන්ස ඔය ඔබ වහන්සේගෙන් අසන්නට යෙදුණු නෝර්වේ රාජ්‍යයේ සිදු වූ සංචාරය සම්බන්ධයෙන් ගුවන් ටිකට්පත් සහ අදාළ වියදම් දැරුවේ කවුද?

FAIR COMMENT BY JEZEEM

පි : ඒවා ඔක්කෝම සංවිධානය කෙරුවේ දිලන්ත මහත්මයා. ඒ ඔක්කොම අපි හාමුදුරුවරු හය දෙනයි, තව ගිහි මහත්වරු තුන් දෙනෙක් වගේ මතකයේ විදියට. පූජිත. තව කතෝලික මහත්මයෙක් ගියා. දිලන්ත ගියා. හාමුදුරුවරු පස් නමක් හෝ හය නමක්. ඒ සියල්ල සම්බන්ධීකරණය කරලා ඒ කටයුතු කළේ දිලන්ත මහත්මයා.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සුහර්ෂි හේරත් මහත්මිය :

ප්‍ර : හාමුදුරුවනේ දැන් මේ නෝර්වේ රටට ගියපු කාරණාව සම්බන්ධයෙන් මේ මොහොතේ ඔබ වහන්සේ සාක්ෂි ලබා දෙනවා. ඔබ වහන්සේ සතුව විදේශ ගමන් බලපත්‍රයක් තියෙනවාද කියන කාරණාව මම මුලින්ම ඇහුවා. ඔබ වහන්සේට මතකයක් තියෙනවද ඒ විදේශ ගමන් බලපත්‍රයේ අංකය?

පි : එහෙම මතක නැහැ.

ප්‍ර : දැන් ඔබ වහන්සේ සතුව තිබෙන විදේශ ගමන් බලපත්‍රය ලෙසට අංක N2269151 කියන අංකයට අදාළව තොරතුරු විශ්ලේෂණය කිරීමේදී ඔබ වහන්සේගේ ඒ තියෙන කාල පරිච්ඡේදයට ඒ කියන්නේ මේ විදේශ ගමන් බලපත්‍රය වලංගුව පැවතියා වූ 2009 පෙබරවාරී 21 සිට 2016 අගෝස්තු 14 දක්වා ලබාගෙන තිබෙන කාල වකවානුවටත්, ඉන් අනතුරුව එහි දිගුවක් ලෙසට ලබා ගන්නා ලද 2020 ජනවාරී 23 දක්වා වූ සම්පූර්ණ කාල පරාසය මේ කාල වකවානුව තුළ මේ අංකය යටතේ අපේ හාමුදුරුවනේ නෝර්වේ රටට ගියපු බවක් මේ විශ්ලේෂණයේදී පෙන්නුම් කරන්නේ නැහැ. ඔබ වහන්සේ මොන ආකාරයටද නෝර්වේ රටට ගියේ හාමුදුරුවනේ.

පි : Passport තුනක් තියෙනවා. ඒ කියන්නේ එකම අර මුලින්ම Passport එක අර මොනවද කියන්නේ දින, Passport තුනක් තියෙනවා. ඒ කියන්නේ අර Expire වුණහම දැන් ඔය තියෙන්නේ අන්තිම Passport එක. මැද එකේ තමයි ඔය නෝර්වේ ගමන. ඒ තියෙනවා සීල් එකත් ගහලා. Passport එක මට පෙන්වන්න පුළුවන්. අද ගෙනල්ලා නැහැ. Passport තුනක් තියෙනවා.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : ස්වාමීන් වහන්ස Passport තුනක් කියන්නේ....?

පි : ඒ කියන්නේ අර Expire වුණහම.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එකම අංකය දීර්ඝ කිරීම?

පි : දීර්ඝ කිරීම.

ප්‍ර : අංකය වෙනස් වීමක් නැහැනේ ස්වාමීනි.

පි : අංකය වෙනස් වුණාද කියලා මම දන්නේ නැහැ මැතිතුමණි. දැන් අර සමහර ඒවායේ සීල් ගහලා ඉවර වුණහම Passport එක කොළ මදි වුණහම තව Passport එකක් දෙනවා.

ප්‍ර : ඔබ වහන්සේ ගාව දැනට භාවිතා කරන Passport එක කවදා ගත්තද කියලා ඔබ වහන්සේට මතකද?

පි : ඒක දැන් ඔය මැතිණිය කිව්වේ ඒ දැන් තියෙන Passport එක. අන්තිමට 151 එන්නේ ඒක. ඒක 2022 වෙනකම් තියෙනවා කාලය.

ප්‍ර : ඒක තමයි 2009 ඉඳලා අපි ගාව වාර්තා තියෙන්නේ. ඔබ වහන්සේ කොමිසමට ප්‍රකාශ කරපු හැටියට නෝර්වේ රාජ්‍යයට ගියේ .....?

පි : අවුරුදු දහයකටනේ දෙන්නේ මැතිතුමණි.

ප්‍ර : ඔව්.

පි : කලින් තිබුණේ පහෙන් පහට එහෙම එකක්.

ප්‍ර : ඔව්. හරි?

පි : ඉතිං ඒ මැද Passport එකේ තමයි. එහෙනම් මෙතන අඩංගු වෙලා නැහැ.

ප්‍ර : අපිට ලැබිලා තියෙන්නේ 2009 ඉඳලා?

පි : අරක ලබා දෙන්න පුළුවන්. මොකද නෝර්වේ Embassyයට ගිහිල්ලා අපි Visa ගත්තේ. ඒක මතකයි.

ප්‍ර : එතකොට ස්වාමීන් වහන්ස දැන් ඒ අහපු ප්‍රශ්නයට පිළිතුර වන්නේ ඔබ වහන්සේ නෝර්වේ රාජ්‍යයට ගියේ ලංකාවේ ඉඳලා කෙළින්මද නැත්නම්?

පි : කෙළින්ම. කෙළින්ම අපි ගියේ ඔව් ඉස්සරලම නෝර්වේට ගියේ.

ප්‍ර : නැත්නම් වෙන රටකට....?

පි : ඔව් ඔව්. නෝර්වේට කොහොම හරි ගියේ. මට මතක නැහැ දැන්. එක්කෝ තායිලන්තයට ගිහිල්ලා බැහැලා එහෙම තමයි යන්න ඇත්තේ. මෙහෙන් කෙළින්ම ඔස්ලෝවලට Flight නැහැනේ. තව රටක බැහැලා. එහෙම තමයි ගියේ.

ප්‍ර : ඒක තමයි පැහැදිලි කරගන්න?

පි : සමාවෙන්න. එහෙම තමයි මට මතක නැහැ දැන්.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී මෙම කොමිෂන් සභාවේ විමර්ශන අංශය විසින් ගරුතර ස්වාමීන් වහන්සේගේ N2269151 දරන විදේශ ගමන් බලපත්‍රයට අදාළව ලබාගෙන ඇති විදේශ ගමන් තොරතුරු ඇතුළත් වාර්තාව සභාව වෙත C-702 වශයෙන් සළකුණු කිරීමට අවසර අයැද සිටිනවා. මෙම වාර්තාවෙහි 2009 පෙබරවාරි 21 දින සිට 2016 අගෝස්තු 14 දින දක්වා කරුණු ඇතුළත් වනවා සභාපතිතුමනි

ඒ වගේම වැඩිදුරටත් මෙම විමර්ශන අංශය විසින් භාරයට ගෙන තිබෙනවා තවත් විදේශ ගමන් බලපත්‍රයක වාර්තාවක්. එම විදේශ ගමන් බලපත්‍රයේ අංකය N6831128 වශයෙන් සඳහන් වෙනවා. එම විදේශ ගමන් බලපත්‍රය යටතේ 2016 නොවැම්බර් 02 වෙනි දින සිට 2020 පෙබරවාරි 04 දින දක්වා කාලයට අදාළ ගුවන් ගමන්වලට අදාළ තොරතුරු ඇතුළත් වෙනවා. ඒ අනුව එම දෙවනුවට සඳහන් කරන්නට යෙදුණු N6831128 දරන විදේශ ගමන් බලපත්‍රයට අදාළ ගුවන් ගමන් වාර්තා සටහන C-703 වශයෙන් සළකුණු කිරීමට අවසර අයැද සිටිනවා

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : ගරු ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේ කලින් ප්‍රකාශ කෙරුවා ඔබ වහන්සේට තව කරුණු ඉදිරිපත් කරන්න තියෙනවා කියලා කොමිෂන් සභාවට. ඊට පෙර අපට යම් ප්‍රශ්න වගයක් තියෙනවා. ඊට පස්සේ ඔබ වහන්සේගේ නීතීඥවරයාට අවස්ථාව ලබා දෙන්නම් ඔබ වහන්සේගේ සාක්ෂි මගින් ඒ කරුණු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න?

පි : හොඳමයි.

****

ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා :

ප්‍ර : ගරු ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේගෙන් ප්‍රශ්න කරන අවස්ථාවේදී හෙළිදරව් වුණා දැන් යම් ආකාරයක අන්තවාදී අදහස් දරන මුස්ලිම් පුද්ගලයන් විසින් ඒ අයගේ අභිමතාර්ථයන් මුදුන්පත් කර ගැනීම සඳහා ඒ ගෙන ගිය සටනේදී ඔවුන් යම් යම් අවස්ථාවල සිංහල මිනිස්සුන්ට එරෙහිව, සිංහල අපේ බෞද්ධ සංඝයාට එරෙහිව යම් යම් ප්‍රචාර ගෙනිහිල්ලා තිබුණා?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒ ප්‍රචාරවලින් යම් මතයක් සිංහල සමාජය තුළ හෝ එහෙම නැත්නම් ද්‍රවිඩ සමාජය තුළ හෝ එහෙමත් නැත්නම් ඉස්ලාම් සමාජය තුළ ගොඩ නැගුණා නම් සිංහල මිනිස්සුත්

FAIR COMMENT BY JEZEEM

අන්තවාදී විදියට හැසිරෙනවා කියලා ඔබ වහන්සේට ඒ සම්බන්ධයෙන් මොකද්ද කියන්න තියෙන්නේ?

පි : සිංහල මිනිස්සු හෝ මේ රටේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා කවදාකවත් අන්තවාදීව හැසිරිලා නැහැ. මේ වචනය කොහෙම ආවද කියන එකයි ප්‍රශ්නය. ඒ කියන්නේ අපි තුළ අන්තවාදයක් නෙමෙයි තියෙන්නේ. අපිට විඳින්නට වෙන හිරිහැර අපි වේදනාවෙන් කෑ ගහලා කියනවා. ඒක තමයි මේ අන්තවාදය හැටියට දකින්නේ. ඉතිං ඒ අයගේ වැඩ පිළිවෙල මේ රට ඇතුළු කොට ඒ මුස්ලිම් කලීෆාතයක් බිහිකර ගැනීම. ඒ වෙනුවෙන් ඒගොල්ලෝ Strategically හැම තැන්හිම ස්ථානගත වෙලා තියෙනවා. මේවා ගවේෂණය කරනකොටයි ඒවා තේරෙන්නේ. ඉතිං ඒ නිසා අපි අර මතුපිටින් අපිට වේදනාකාරී අත්දැකීම්වලට අපේ මිනිස්සු මුහුණ දෙනවිට මිනිස්සුන්ට ඒවා කියා ගන්න තැනක් නැති වුණහම පොඩි පොඩියට පොඩි පොඩියට මිනිස්සු සංවිධානගත වෙනවා. ඉතිං ඒ සංවිධාන ගතවීම තමයි මේගොල්ලෝ හුඟාක් අය මේ අන්තවාදී වැඩ පිළිවෙලක්ය, සිංහලයෝ ජාතිවාදී යන ආදී වශයෙන් මේ හංවඩුව ගසන්නේ.

ප්‍ර : දැන් ස්වාමීන් වහන්ස සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් සහ බර්ගර් මේ සියළු ජාතීන්ට අයත් පුද්ගලයෝ ලංකාවේ වාසය කරනවා?

පි : එහෙමයි.

ප්‍ර : එතකොට අපි දීර්ඝ කාලයක් තිස්සේ විවිධ කාල වකවානුවල විවිධ හැල හැප්පීම්වලට භාජනය වෙමින් මේ ආපු ගමනේදී ජාතීන් අතර කිසියම් අසමඟිතාවයක් හෝ ඔවුන් ඔවුන් කෙරෙහි කිසියම් වූ අවිනිශ්චිතභාවයක් හෝ වෛරයක් ඇති වුණා නම් එම තත්ත්වය ඉදිරි කාලයේදී ඇති නොවීම සඳහා ඔබ වහන්සේ දෙන පණිවිඩය මොකද්ද?

පි : ඇත්ත වශයෙන්ම මැතිතුමණි, දැන් ඒකට උත්තරයක් කීමට පෙරාතුව දැන් උතුරේ අපට ඔය කියන සහජීවනය තිබෙනවාද. උතුරේ අපට පදිංචි වෙන්න බැරිනම්, සිංහල ගම්මානයක් හදා ගන්න බැරිනම්, පන්සලක් හදනකොට ඒක ජනපදකරණය හැටියට සළකනවා නම්, ඒගොල්ලෝ ඒ විරෝධතා දක්වන උදවියත් ජීවත් වන්නේ අපිත් එක්ක කොළඹ. හැබැයි අපි කවදාකවත් ඔවුන්ට මෙහෙන් පිටවෙලා යන්න කියලා කෑ ගහන්නේ නැහැ. මෙහේ කෝවිල් හදනවා, අපි සහයෝගය දෙනවා. දැන් ඒ සහයෝගය කෝ උතුරේ. ඒ වගේම නැගෙනහිර. ඒ නිසා දැන් දෙමළ මිනිස්සු වෙනම කලාපයක් ඉල්ලලා සටන් කළා. දැන් මුස්ලිම් මිනිස්සු ඔළුවිල් ප්‍රකාශය

FAIR COMMENT BY JEZEEM

හරහා ඒගොල්ලන්ට වෙනම කලාප ඉල්ලනවා. දැන් ඊයේ පෙරේදාත් ප්‍රශ්නයක් ඇති වුණා සයින්දමර්දු ඒගොල්ලන්ට වෙනම කලාපයක් ඕනලු. කල්මුණේ ඒගොල්ලන්ට වෙනම පරිපාලන ඒකකයක් ඕනලු. වැඩිය තියා මැතිතුමණි බදුල්ලෙත් ඉල්ලනවා ඒගොල්ලන්ට වෙනම පරිපාලන කලාපයක් ඕන කියලා මුස්ලිම් අය. එතකොට මැතිතුමණි මොකද්ද මේ. එහෙනම් දැන් සිංහලයෝ අපි බහුතරයක් ජීවත් වන ප්‍රදේශවල සිංහලයෝ අපි ඉල්ලලා නැහැනේ අපිට වෙනම කලාපයක් දෙන්න කියලා. අපිට වෙනම ඒකකයක් දෙන්න කියලා. එතකොට මේ ඓතිහාසික මේ ජාතිවාදී හා මේ බෙදුම්වාදී චින්තනයන් සහිත මේ වැඩ පිළිවෙල නතර කර ගැනීමට නම් රටට එක් ජාතික ප්‍රතිපත්තියක් අවශ්‍යයි. ඒ වගේම රටට එක නීතියක් අවශ්‍යයි. මේ රටේ මිනිස්සුන්ට අපි ඔක්කොම ශ්‍රී ලාංකිකයෝ කියලා නම් දැන් ලෝකයට යන්නේ අපි ශ්‍රී ලංකන් කියලා. ඒ ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ගොඩ නගා ගැනීම වෙනුවෙන් වූ යම්කිසි විවෘත සංවාදයක් මේ රට තුළ ගොඩ නැගෙන්න ඕන. එහෙම නැතුව දැන් උදාහරණයක් විදියට මැතිතුමණි ලංකාවයි, පකිස්ථානයයි Match එකක් ගහනකොට ඇයි මාළිගාවත්තේ ඉන්න ඉස්ලාම් අය පකිස්ථාන් කොඩිය ඔසවන්නේ. ඒකෙන් කියැවෙන්නේ මොකද්ද. ඒ වැරදි අපිද නැහැ ඔවුන්ගේ චින්තනය. එහෙනම් අධ්‍යාපනය තුළින් මේ දරුවන්ට, ඒ කියන්නේ විශේෂයෙන් සිංහල, දෙමළ, මුස්ලිම් දැන් මැතිතුමණි අපි කවදාකවත් අපේ දහම් පාසලක් ඇතුළේවත් අපි අපේ අන්තවාදයක් කියලා දෙයක් උගන්වන්නේ නැහැනේ. අනුන්ගේ දෙයක් ගන්න එපා, හොරකම් කරන්න එපා, බොරු කියන්න එපා එවැනි දෙයක් අපි, ඒ කියන්නේ රහසින්වත් පව් නොකරපු උත්තමයෙක්නේ අපේ ශාස්තෘවරයා. රහසින්වත් පව් නොකරපු උත්තමයෙක්. ඉතිං ඒ උත්තමයාගේ දර්ශනය ජීවිතවලට ගළපා ගනිමින් අවිහිංසාවාදීව ජීවත්වන අපේ ජන සමූහයට මේ අන්තරායකර ඉගැන්වීම් සහිත ඒ මූලධර්මවාදීන්ගේ වැඩ පිළිවෙලවල් නිසා තමයි මේ අනවශ්‍ය ප්‍රශ්න ඇති වෙලා තියෙන්නේ. ඒක නිසා පුළුවන් තරම් ගෝලීයව ඇති වෙලා තියෙන මේ තත්ත්වයන් පාලනය කර ගැනීමට නව නීති පනවමින්, විශේෂයෙන් මේ අධ්‍යාපන ක්‍රමය ඇතුළේ මිනිස්සුන්ට එක රටක, එක ජාතියක් විදියට හිතන්න පුළුවන් විදියේ වැඩ පිළිවෙලකට යා යුතුමයි. මේ තියෙන මේ ප්‍රශ්න හඟවන්නේ නැතුව විවෘතව සාකච්ඡා කරලා දැන් මුස්ලිම් සමාජය අතර වුණත් ඒ විවෘත සංවාදය අපි ගොඩ නගා ගත යුතුයි. එහෙම නොවන තාක්කල් මේවා ගැටුම්වලට තමයි පත් වෙන්නේ. ඉතිං අපි

FAIR COMMENT BY JEZEEM

විශ්වාස කරනවා විවෘත සංවාදයක් අවශ්‍යයි රටේ දිසාව අනාගත දිසානතිය තීරණය කර ගැනීමට. නැති වුණොත් අනාගතයේදී අපි මේ දැන් යන විදියට නම් අනිවාර්යයෙන් මැතිතුමණි අපේ මිනිස්සු ඉඩම්වලට ගහ ගනියි. මොකද මැතිතුමණි දැන් මේ භූමිය සීමිතයි. මේ ලෝකය ගත්තොත්, මුළු විශ්වයේම හතරෙන් තුනක්ම වතුර. අපිට ජීවත් වෙන්න තියෙන්නේ හතරෙන් එකයි. එතකොට මේ භූමි භාගයට ඔරොත්තු දෙන්න පුළුවන් ප්‍රමාණයක් ඉන්නවා. මේ ශාලාව ගත්තොත් මේ ශාලාවට 2000 ක් දාන්න බැහැ. ඒ වගේ රටකට ඔරොත්තු දෙන ප්‍රමාණයක් තියෙනවා. එතකොට මේ Sustainable Development එක කොහොමද වෙන්න ඕන. අනාගතයේ අපිට වතුර කොච්චර තියෙනවද. අපේ වන සම්පත කොච්චරද. ඔක්සිජන් කොච්චර ඕනද මේ මිනිස්සුන්ට. මේවා පිළිබඳ යම්කිසි කියවීමක් එක්ක ජනගහණය පාලනය කිරීමක්, සියළු ජනතාවට අවම තරමින් මුස්ලිම්, දෙමළ, සිංහල කියලා භේදයක් නැතුව ඔක්කොටම දරුවෝ තුනයි. ඒ වගේ වැඩ පිළිවෙලකට අපි යා යුතුයි. එහෙම නොවුණොත් එහෙම වෙන්නේ සිංහල, දෙමළ, මුස්ලිම්ද කියලා නෙමෙයි මිනිස්සුන්ට වතුර ටිකට මරා ගන්න වෙනවා මේකේ. ඊළඟට ජීවත් වෙන බිම් අඟලට මරා ගන්න වෙනවා. ඉතිං අනාගතයේදී එවැනි තත්ත්වයන් ඇති වෙන්න පුළුවන්. ඉතිං ඒ නිසා අනාගතයේ සිදු වියහැකි දේ දැන්ම කල් තියා බලලා, මේ තියෙන ස්වාභාවික සම්පත්, අපිට තියෙන වන සම්පත සීමිතයි. භූමිය සීමිතයි. ඉතිං ඒකට ගළපා ගතහැකි විදියට දැන්මම වැඩ පිළිවෙලක් සාකච්ඡා විය යුතුයි කියලා තමයි අපි යෝජනා කරන්නේ.

ප : හාමුදුරුවනේ මම දැන් ඔබ වහන්සේගෙන් අහන්න යන ප්‍රශ්නය ඔබ වහන්සේ මාව වැරදියට තේරුම් ගන්න එපා. මම 1988 ඉඳලා මහේස්ත්‍රාත්වරයෙක් හැටියට බැඳිලා මේ තාක් අධිකරණ සේවයේ ඉන්න කෙනෙක්. මේ අවුරුදු 32 ක කාලය ඇතුළත උසාවියේ නඩු අහනකොට අපේ ක්‍රමය තමයි අර දෙපැත්තටම කන් දෙන න්‍යාය. ඉතිං සමතුලිතතාවයක් ඇතුව මෙම කොමිසමෙත් වැඩ කරගෙන යන්නයි අපි මේ විදියට ප්‍රශ්න අහන්නේ හාමුදුරුවනේ. මම ඔබ වහන්සේගෙන් දැන ගන්න කැමතියි ඔබ වහන්සේගේ සාක්ෂිවලදී එක් තැනකදී අනාවරණය වුණා සිංහල අපටත් ප්‍රශ්න නැතුව නෙමෙයි කියලා. ඔබ වහන්සේ ඒකෙන් අදහස් කළේ මොකද්ද?

පි : ඒ කියන්නේ එකක් අපට සිංහලයන් හැටියට මැතිතුමණි ජාතිය පවතින්නේ නැහැ ඒ ජාතිය සතු සංස්කෘතිය බිඳ වැටුණොත්. ජාතියක් පවතින්නේ සංස්කෘතියත් එක්ක. ඒක හරියට ගහයි

FAIR COMMENT BY JEZEEM

පොත්තයි වගේ. පොත්තයි ගහයි, ගහයි පොත්තයි වගේ. දැන් මේ ඇටය රැකෙන්නේ නැහැ ඇතුළේ මේ හම රැකුණේ නැත්නම්. ධර්මයත් එහෙමයි. මේ ජාතියත් එහෙමයි. එතකොට අපි ඇත්ත වශයෙන්ම මේ කෑ කෝ ගහලා වේදනාවෙන් අර සැඩ වදන්වලින් සමහර අවස්ථාවලදී පරුෂ වෙන්නත් පුළුවන්. එවැනි දෙයින් අපිට යම් යම් තැන්වල ආමන්ත්‍රණය කරන්න සිද්ධ වුණේම අන් කිසිවක් නිසා නෙමෙයි මේ ඔරොත්තු නොදෙන මේ සංස්කෘතික ඝාතක කල්ලි අප්‍රමාණ විදියට මේක ඇතුළේ ගොඩ නැගිලා අපිට තර්ජනයක් වෙන තරමට. ඉතිං ඒක පාලකයෝ ඒවා හැටියට ගන්නේ නැහැ. මොකද හේතුව පාලකයන්ගේ පවුල් බැලුවොත් ඒගොල්ලන්ගේ පවුල් කොහොමත් Multi Cultural. මොකද ඒගොල්ලෝ හිතනවා ගෙදර තියෙන සමඟිය වගේ ඇති අනිත් ඒවාත් කියලා. ගෙදර පුරුෂයා බෞද්ධ, අනිත් එක්කෙනා කතෝලික, පුතා බැඳලා ඉන්නේ මැලේ. ඉතිං ගෙදර හරි Multi Cultural. ඒගොල්ලෝ තමයි රටට ප්‍රතිපත්ති හදන්නේ. හැබැයි ඒ බහුතර සමාජයේ සිතැඟි තේරුම් ගන්නේ නැතුව. එහෙම වෙන එක හොඳයි. එහෙම අපිට මේ අපිම විතරක් එහෙම එකක් නැහැ. මේක බද්ද වෙලා මේ විවිධත්වය තේරුම් අරගෙන එහෙම යනවා නම් මේ ප්‍රශ්නවලටත් උත්තරයක් තියෙනවා. නමුත් ප්‍රශ්න හරියට හඳුනා නොගෙන, මේ සිංහල බෞද්ධයාගේ හඬට කන් නොදී මේ ගෙන ආපු පාලන තන්ත්‍රය නිසා සිංහලයන් හැටියට අපිටත් ප්‍රශ්න තියෙනවා කියන එක අපි විතරක් නෙමෙයි අපේ මැතිතුමා මහා නායක හාමුදුරුවරුන්ගෙන් ඇහුවත් ඔය මම කියන කථාව ඔය විදියටම කියනවා. දැන් මහා නායක හාමුදුරුවෝ අපි බැහැ දකින්න ගියහම අපි දැන් සමහර වෙලාවට අපේ ආවේගයට මහා නායක හාමුදුරුවන්ටත් අපි බණිනවා. අපි කලින් දැනුම් දීමක් කරනවා මහා නායක හාමුදුරුවනේ අපි එනවා මේ වෙලාවට කිව්වහම හොඳයි ස්ථිරවම කියලා මැතිතුමණි ඔබතුමා පිළිගනියිද දන්නේ නැහැ අපි යනකොට උන් වහන්සේ File මිටි මිටි මිටි ගෙනල්ලා තියෙලා තියෙනවා බිම. කථා කරන්න කලින් පෙන්වනවා ඔයා ඊයේ මට දොස් කිව්වනේ. මෙන්න බලන්න මේ ලිපිගොනු. මේවා ඔක්කොම ලියලා, කරලා, යවලා තියෙන්නේ වැඩක් නැහැ ස්ථවිරයෝ. ඒ වගේ මහා කඩා වැටීමක අපේක්ෂා භංගත්වයක ඉන්නේ බෞද්ධ නායකයෝ. මෙතුවක් කල් හිටියේ එහෙමයි. ඉතිං ඒ නිසා තමයි අපි කියන්නේ සිංහල අපිට ප්‍රශ්න නැතුවා නෙමෙයි ප්‍රශ්න තියෙනවා කියලා.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : එතකොට ඔබ වහන්සේ සාක්ෂි දෙන අතරතුර එක් වතාවකදී කිව්වා ඔබ වහන්සේගේ අරමුණ ගිණි අවුලවන්න නෙමෙයි මේ ගිණි නිවන්නයි මේ උත්සාහ කරන්නේ කියලා. ඒ වුණත් හාමුදුරුවනේ ගිණි නිවන්න දරන උත්සාහය බාහිර පාර්ශවයන් වැරදියට දකින්න හේතුව මොකද්ද ඔබ වහන්සේට පේන විදියට?

පි : එකක් ඒ අයගේ සැළසුම් හෙළිදරව් වීම. ඒගොල්ලන් ඉතාම ඉක්මණින් ඉලක්කයට යන්න තියෙනවා අපේ කෑ ගැසීම් හෝ හෙළිදරව් කිරීම් නිසා ඉලක්කය ඈතට යනවා. අපේම සමාජයේ අයට වුණත් මේක තේරෙන්නේ නැහැ. දැන උගත් සමාජයේ ඒගොල්ලන්ට මේක එච්චර නුහුරුයි. අපිත් ඒක හොඳටම දන්නවා. ඉතිං සරළව කියන්න තියෙන්නේ මේ විදුලි බුබුලක් වගේ තමයි අපේ භාවිතාවත්. ලයිට් එක තියෙනකම් වටිනාකමක් නැහැ. ලයිට් එක පිච්චුණාට පස්සේ තමයි අපරාදේ ලයිට් එක මෙතන නැහැනේ කියලා දැනෙන්නේ. ඒ වගේ තමයි ඉතිං.

ප්‍ර : හාමුදුරුවනේ මගේ අවසාන ප්‍රශ්නය ඔබ වහන්සේගෙන්. මීට අවුරුදු හය හතකට පෙර ඔබ වහන්සේ අපේ ජාතියට මම අදහස් කරන්නේ ශ්‍රී ලාංකිකයන්ට වෙන්න යන විපත ඔබ වහන්සේ දැක්කා. දැකලා මේ මුස්ලිම් අන්තවාදීන්ගේ ක්‍රියා කලාපය පිළිබඳව ඒ කාලයේ ඔබ වහන්සේ අනතුරු ඇඟවීමක් කළා. එහි ප්‍රතිඵල ගණන් ගත්තේ නැතුව හිටපු නිසා කියලා මම හිතනවා භුක්ති වින්දා හැමෝම 2019 අප්‍රේල් 21 වෙනිදා. දැන් මෙතැන් පටන් ඉදිරියට ඔබ වහන්සේට පේන විදියට, ඔබ වහන්සේ දකින විදියට තිබෙන ජාතික අවදානම කොයි වගේම?

පි : මැතිතුමණි දැන් මේක භයානක තත්ත්වයක්. හෙට දියසෙන් කුමාරයා ආවත් මේක ඉවර කරන්න බැහැ. මේ ඉස්ලාම් ආගමික ප්‍රශ්නය යම්තාක් කල් මේ ඉගැන්වීම් තියෙනවද, ඒ තාක්කල් මේ එදිරිවාදිකම්වලට මුහුණ දෙන්න අපට නියමිතයි. මොකද ඔවුන්ට අනුව Cause of Allah දෙවියන්ගේ මාර්ගයට අනුව Fight for the Cause of Allah කියලා කියන්නේ. ඒක අනිවාර්ය අංගයක් ජීවිතයේ. මේ ඉගැන්වීම් තියෙන තාක්කල් අපිට සරළව කිව්වොත් මේ ගැහැට විඳින්න නියමිතයි. ඉතිං හෙට දියසෙන් ආවත් මේකට උත්තරයක් නැහැ. මේක ඉවර කරන්න බැහැ. නමුත් මේක පාලනය කිරීමක් පමණයි කළ හැක්කේ බුද්ධි අංශවලින් යන ආදී වශයෙන් ආරක්ෂක අංශවල දැඩි අවධානය යොමු කිරීමෙන් පාලනය කිරීමක් පමණයි කරන්න පුළුවන්. මොකද මේක පිළිකාවක් බදු වැඩ පිළිවෙලක් නිසා. ඇත්ත වශයෙන්ම එය මම ප්‍රසිද්ධියේ කියනවා. මොකද සත්‍යවාදී විය

FAIR COMMENT BY JEZEEM

යුතුයි මිනිස්සු. සත්‍යය කථා කළ යුතුයි. කොච්චර ගොරහැඩි වුණත්, අකමැති වුණත් සත්‍ය සත්‍යයමයි. සත්‍යය කථා කරන්නා ගරහාවට ලක් වෙනවා මිසක් ප්‍රශංසාවට ලක් වෙන්නේ නැහැ. ඉතිං මම සත්‍ය වශයෙන් කියනවා මේක Cancer එකක්. Islam is Cancer ඒක මම බය නැතුව කියනවා. ඒකට අදාළව Cancer එකක් වැළඳුනෝතින් අපිට තියෙන්නේ වෛද්‍යවරයෙක් ළඟට ගිහිල්ලා Cancer එකක්ද නැද්ද කියලා දැන ගන්න එක. වෛද්‍යවරයා කියනවා ඔබට Cancer එකක්. පුළුවන්ද මැතිතුමණි මේක සුවබපත් කරන්න. බැහැ මේක දැන් ප්‍රසාරණය වෙලා ඉවරයි. එහෙම නැත්නම් ඔව්. පුළුවන්. මේ අහවල් තැන මේක තියෙන්නේ. මේක ව්‍යාප්ත වෙන්න නොදී මෙන්න මේ ප්‍රතිකර්ම ටික කරන්න. නිතර Check කර ගන්න. අන්න ඒ වගේ නිතර Check කර කර සදාකල්ම ඉන්න වෙන තත්ත්වයක් තමයි අපට දැන් උදා වෙලා තියෙන්නේ.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : ස්වාමීන් වහන්සේ ඔබ වහන්සේ කිව්වා සාක්ෂි දෙන අවස්ථාවේදී ඔබ වහන්සේ විසින් කරන ලද ක්‍රියා පටිපාටිය නිසා සහරාන් ඇතුළු කණ්ඩායම ඔබ වහන්සේට හා පන්සල්වලට පහර දෙන්න තිබුණා. නැතහොත් එසේ තිබුණත් ඔවුන් පහර දුන්නේ වෙනත් ස්ථානවලට කියලා. ඒ කියන්නේ කතෝලික දේවස්ථානවලට, හෝටල්වලට. ඔබ වහන්සේට කියන්න පුළුවන්ද කතෝලික දේවස්ථානවලට සහරාන් ඇතුළු යම් කණ්ඩායමක් ප්‍රහාර එල්ල කිරීමට හේතු වූයේ කුමක්ද කියලා?

පි : මැතිතුමණි ඒගොල්ලන්ගේ අපි ඒවාට කියනවා චින්තන ජීහාදය. ඒක හරිම ශක්තිමත්. ඒ විතරක් නෙමෙයි PSY Op කියන එක. PSY Operation මානසිකව කරන මෙහෙයුම්. ඒගොල්ලෝ කොහේ මොන වගේ Attack එකක් දුන්නත් ඒක කොයි රටද, පල්ලියද, පන්සලද ඒවා නෙමෙයි. ඒවාට ඒගොල්ලෝ හේතු හදා ගන්නවා. දැන් ආසන්න වශයෙන් අපිට මේක හිත වුණා මේ නවසීලන්ත පල්ලියට, මුස්ලිම් අය යාඥා කරනකොට කතෝලික එක්කෙනෙක් ඇවිල්ලා වෙඩි තියපු නිසා, ක්‍රිස්තියානි එක්කෙනෙක් ඇවිල්ලා වෙඩි තියපු නිසා ඒකේ පළිය ගන්න කියලා. නමුත් මම නම් එය විශ්වාස කරන්නේ නැහැ අපිට තියෙන දැනුමේ හැටියට. ඒ උදවිය මැතිතුමණි මේක ආගමක් නෙමෙයි. මේක ලෝකයේ සංස්කෘතීන් කඩා බිඳ දමන ශිෂ්ඨ

FAIR COMMENT BY JEZEEM

සමාජය අනුමත නොකරන Fascist වෙනම ව්‍යාපාරයක්. ඒක තමයි ජීවන දර්ශනය කරගෙන තියෙන්නේ. ඒකයි මම දැන් අර ඔබතුමන්ලාගේ මෙතන අවධානය යොමු කරවන්න උත්සාහ කළේ පීටර් හාමන්ගේ ස්ලේවරි මට මතකයට එන්නේ නැහැ. ඒ ග්‍රන්ථයේ ජර්මන් ජාතිකයෙකු ලියා තියෙන. හරිම ලස්සනට පැහැදිලි කරලා තියෙනවා. සියයට එකක් දෙකක්ව ඉන්නකොට ඒගොල්ලෝ ඉන්න විදිය, සියයට පහක් වෙනකොට හැසිරෙන විදිය, සියයට හත ඉක්මවපුවාම ඒගොල්ලන්ගේ සංස්කෘතික ආක්‍රමණයට එන විදිය. දැන් මැතිතුමණි අවුරුදු දාහක් මේගොල්ලෝ ජීවත් වුණා අපි. ඇයි එක පාරට ගෙනල්ලා මේ හලාල් කියලා එකක් අතහැරියේ. එතනින් තමයි මේ සමාජයේ බෙදුම්වාදය පටන් ගත්තේ. ඒකට කථා කරනකොට ඒක අපේ අයිතිය. ඔක්කෝම ඒගොල්ලන්ගේ Rights නීතිය ඇතුළෙම නීතිය. අපි දන්නේ නැහැ. ඒ කියන්නේ System එක ඇතුළෙම ඔක්කොම හදාගෙන හදාගෙන ඇවිල්ලා. නීතිපති එකෙත් ඉන්නවා කට්ටිය එහෙම. ඒ වගේ හැම තැනකම නීති හදන තැන්වල, අපේ උතුම් විනිසුරු ආසනවලත් ඉන්නවා. හැම තැනකටම ගොඩ නගලා තියෙන්නේ. ඉතිං මැතිතුමණි අපේ මැතිතුමා අහන ප්‍රශ්නයට මට උත්තරය දෙන්න වෙන්නේ ඇත්තටම මේ කරුණු මත පිහිටා ඉඳගෙන. ඒගොල්ලන් කියන කරුණු පිළිගන්න බැහැ. මොකද ඒක ඒගොල්ලන්ගේ වැඩ පිළිවෙලක්. එකක් ඔය කවුරුත් සතුටු වෙනවා ඔය ප්‍රහාරය ගැන. මොකද මේක අපේ රටේ විතරක් තියෙන ආදර්ශය නෙමෙයි. ඉන්දියාවේ මුජිහිදීන්ලාගේ ඒ ව්‍යාපාරය, ලක්ෂානි ටොයිබා ව්‍යාපාරය ඒ ඔක්කොම භීතියට පත් කරලා. අද පැරීසිය පාලනය කරන්නේ කවුද මැතිතුමණි. සියයට පනස් එකක් පැරීසිය මුස්ලිම්. අද ඒගොල්ලන්ගේ යාන්ත්‍රණය. එක තැනක බෝම්බයක් තිබ්බොත් මුළු පැරීසියම කඩන් වැටෙනවා. මොකද ඔක්කොම තනලා තියෙන්නේ පොළොව යට. භීතියට පත් කරන් ඉන්නේ. එක නීතියක් සම්මත කර ගන්න දෙන්නේ නැහැ මුස්ලිම් අයට එරෙහිව. ඒ වගේ ලන්ඩනයේ තත්ත්වය, ඕස්ට්‍රේලියාවේ තත්ත්වය, බෙල්ජියමේ තත්ත්වය ඉතාම භයානකයි. ඉතිං අපේ රටෙත් මැතිතුමණි දැන් ඒ ආක්‍රමණය පටන් ගත්තා. ඒ කියන්නේ දෙවියන් වෙනුවෙන් මරාගෙන මැරෙන මිනිස්සු අපි තුළත් ඉන්නවා. දැන් බලන්නකෝ භීතියක් ඇති කළානේ. අම්මෝ කථා කරන්න හොඳ නැහැ. ඒවා තමයි සයියෝ, චින්තන ජිහාදය කියන්නේ ඒක. අපට මේ ගැන හිතන්නවත් බැරි කරනවා. පාලකයොත් බය කරනවා. මේක මෙහෙම ගියොත් බෝම්බ

FAIR COMMENT BY JEZEEM

පුපුරුවා ගනියි. ඉතිං ඒගොල්ලෝ ඊට පස්සේ ඒගොල්ලෝ කල්පනා කරන්නේ මේක නතර කරන්න නෙමෙයි. රටේ Economy එක ගෙනියන්න. ඕවා තමයි ඊට පස්සේ කල්පනා කරන්නේ.

ප : ස්වාමීන් වහන්ස දැන් සහරාන්ගේ ප්‍රහාරය සම්බන්ධව තොරතුරු ලැබී තිබියදීත් එය වළක්වා ගැනීමට ක්‍රියා නොකිරීම සම්බන්ධයෙන් ඔබ වහන්සේට කියන්න පුළුවන්ද වගකිව යුත්තේ කවුද කියලා?

පි : මැතිතුමණි බුදු වදනක් තියෙනවා අනායකා විනස්සන්ති නස්සන්ති බහු නායකා කියලා. නායකයෙක් නැති වුණත් විනාශයි. නායකයෝ ගොඩක් හිටියත් විනාශයි. මේ පාස්කු ප්‍රහාරය වෙනකොට රටේ තිබුණේ නායකයෙක් නැති පාලනයක්. ඒ කියන්නේ නායකයෝ ගොඩයි. අගමැති එකක් කියනවා. ජනාධිපති එකක් කියනවා. පොලිස්පති තව එකක් කියනවා. ඔක්කොම නායකයෝ. නස්සන්ති බහු නායකා. කවුද දැන් කවුරුත් වගකීමක් නැහැ. කවුද නායකයා, හිටපු නායකයෙක් නැහැ. ඒගොල්ලන්ගේ ප්‍රකාශවලින් අපිට පේනවා. කවුද වග කියන්නේ කියලා අරයට ඇඟිල්ල දික් කරනවා නැහැ මම දන්නේ නැහැ මම දන්නේ නැහැ. ඉතිං ඒ නායකත්වයක් නොමැති පාලන කාලයක මේ වගේ දේවල් බලාපොරොත්තු වෙන්න සිද්ධ වෙනවා.

ප : දැන් ඔබ වහන්සේට කියන්න පුළුවන්ද මෙම අන්තවාදී කටයුතු සම්බන්ධයෙන් මෙම අපේ කිසියම් රජයකින් ඔවුන්ට ආධාර ලැබී තිබෙනවාද?

පි : මැතිතුමණි එය අපිට තේරෙන්නේ නැහැ ඒක කොහොමද කියන්නේ කියලා. මේ සියළු මුදල් අන්තවාදය පෝෂණය කිරීම උදෙසා මට ඊළඟ වතාවේදී පෙන්වන්න පුළුවන් සාක්ෂි එක්ක. අසාමාන්‍ය මුදල් කන්දරාවක් මේ සියළු සංවිධානවලට ලැබිලා තියෙනවා. ඉතිං ඒ මුදල් රටට ගෙන ආවේ කොහොමද. දැන් එදා දවසේ අර මතක් කළ පරිදි අපි අමානා බැංකුව ගැන අපි කථා කළා. ඒගොල්ලන්ගේ ඒ මුදල් එන්න පටන් ගන්නකොට ඒගොල්ලන්ම බැංකු පද්ධතියක් හදා ගන්නවා. තියෙන බැංකු ෂරියා බෑන්කින් කියලා වෙනම Unit බවට පත් කර ගන්නවා. මේක මැතිතුමණි වැඩ පිළිවෙලවල් කිහිපයක්. එකක් මේ අල්ලාහ් දෙවියන්ටම ආදරයට කරන එකක් නෙමෙයි. එකක් ඒගොල්ලන්ගේ කලීෆාතය ඔළුවේ වැඩ කරනවා. මොකද ඉස්ලාම් කියන්නේ ඒක නිසා. අනෙක් එක තමයි සල්ලි. දැන් මේ

FAIR COMMENT BY JEZEEM

උලමලා කරන වැඩ. මුස්ලිම් බැංකුවක් ඕන වෙනවා. බැංකුවක් ඕන වුණහම උපදේශක මණ්ඩලයක් ඕන. ඉතිං උලමලා තමයි උපදේශක මණ්ඩලයට යන්නේ. වේතනයක් හම්බ වෙනවා. වාහනයක් හම්බ වෙනවා. ඒක වෙනම කථාවක්. ඒක ඇත්ත. ඒගොල්ලන්ට තව ඊට පස්සේ පල්ලි හදන එක. දැන් මැතිතුමණි මට සමාවෙන්න දැන් ඔබතුමා ඇහුවා මගේ ළඟ තියෙනවා මම ඒක පෙන්වන එක හොඳයි. මට එදා මුලින් සාක්ෂියේදී ඇත්ත වශයෙන්ම ඒක ඉදිරිපත් කළ යුතුව තිබුණා. නමුත් අතපසුවීමකින් එය පෙන්වන්න නොහැකි වුණා. මේ තියෙන්නේ. මේක ඇත්තටම කලින් සාක්ෂියටයි මේක දෙන්න ඕනකම තිබුණේ. මෙන්න මැතිතුමණි A Saudi citizen is funding to build a mosque in Mulathiv, Puthukudiiruppu. It is a කොච්චරද මේ තියෙන්නේ 2200 Sq. ft. fit building. Now the building work is started. The arrangements of the building works organized by Nawfer Mawlavi.

ප්‍ර : ඒ කොහේද?

පි : Mulathiv සහ Puthukudiiruppu. පල්ලිය හදන්න නවුෆර් මවුලවී, නිදාහුල් කහීර් Organization. A NGO is running by Saudi fund, Dematagoda, Colombo 09. The contractor of the building M.A.M. Akram Arafa Construction and Engineering, School Road, Galagedara, Padukka. මේ ඔක්කොම මේ ලංකාවේ වහාබි පල්ලි හදන Construction ආයතනය. මෙන්න මේක සටහන් කර ගන්න වෙනවා. මොකද එදා සාක්ෂියේදී මට දෙන්න බැරි වුණා. ඊළඟට .....,

දැන් වේලාව : ප.ව. 6.55 යි.
මෙතැන් සිට සටහන් කළේ මුතුමාලි මෙය.

President's Secretariat Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව : ප.ව.06.50 යි
පෙර සටහන් ල/ලේ :
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි.

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : වර්තාවේ දිනය?

පි : දිනය මැතිතුමනි අර මම සංවිධාන ගැන අපි ඒ කියන්නේ මේවා ඔක්කොම 2014 ත් කිව්වා. අර මේ රාජ්‍ය නොවන සංවිධාන හා ආගමික දේශයෝ ආපු කාල වකවානුත් එක්කම අර අපේ සාම්ප්‍රදායික මුස්ලිම් මිනිස්සු ටික අපිට ගෙනත් දුන්නු තොරතුරු මේ. ඒ ගොල්ලොත් එක්ක සාකච්ඡා කරලා ඒ ගොල්ලො හදපු වාර්තා එක්ක අපි ගනුදෙනු කළා. මේකේ කියනවා අපේ මැතිතුමනි මේකේ වැදගත්ම දේ තමයි Saudi government funding salafi Wahhabi Muslim NGOS systematically planning and implementing in order to hurt the Buddhist people in Sri Lanka. Also to build mosques in Sri Lanka under these NGOS. එතකොට කියනවා In the month of Hadj the Saudi government helps Sri Lanka Muslim around 30 billion rupees. Money coming from Saudi Arabia to slaughter cows for Hadj festival. This money transaction to Sri Lanka through illegal funding system. There are many Muslim organizations involved to convert Non-Muslim. The clear sermons in regard broadcasting through SLBC Muslim service. ඒ ආදී වශයෙන් මේ ලේඛනය ඉදිරිපත් කරන්න පුළුවන්. මේකේ සම්පූර්ණයෙන්ම මැතිතුමනි මේ කියන කාරණාවලට තවත් පැහැදිලි කර ගැනීම සඳහා මම අර නම් එදා නම් ලියලා දුන්නු නම් ටික මෙතන කැඳෙව්වාම ඒ ඔක්කොම ටික තව වැඩිදුරටත් සාක්ෂි මේවා කර ගන්න පුළුවන්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : ඔබ වහන්සේ පසුගිය දින කොමිෂන් සභාවේ සාක්ෂි දීමෙන් පසු එම තැනැත්තන් සමඟ සම්බන්ධතාවයක් ඇති කර ගත්තාද නැවත?

පි : ඔව්.

ප්‍ර : ඔවුන් කැමැති වුණාද?

FAIR COMMENT BY JEZEEM

පි : මම ඒ ගොල්ලොන්ට දැනුම් දුන්නා තවත් අද එක පුද්ගලයෙක්ගේ නමක් දීමට නියමිතයි මැතිතුමනි අද මේ තොරතුරු ටිකක් තියෙනවා මැතිතුමනි ඒ හෙළිදරව්වත් එක්ක ඒ සියළුම දෙනා ඒ ගොල්ලන් කැමැත්තෙන් ඉන්නවා කොමිෂමට සාක්ෂි දෙන්න සහ අපි මේ කියන තොරතුරුත් සමහර විට අපිට වරදින්න පුළුවන් මොකද අපි අපේ ආගම නෙවෙයි මේ. එහෙම වරදක් වුනොත් ඒක අපරාධයක් කාට හෝ තවත් පැහැදිලි කර ගැනීම සඳහා ඒ ගොල්ලොන්ගේ සහය අනිවාර්යෙන්ම අපි ලබා දීමට කටයුතු කරනවා.

ප්‍ර : හරි ඔබ වහන්සේගේ සාක්ෂිය අද දින ලබා දීමෙන් පසු ඔබ වහන්සේ ගිය දිනයේදී දුන්නු නම් එක නමයි තියෙන්නේ ඒ හින්දා හඳුනා ගන්නයි ඔවුන් සමඟ සම්බන්ධ වීමේ අපහසුතාවයක් තියෙනවා

පි : නම් තුනක් දුන්නා මැතිතුමනි.

ප්‍ර : නම් තුනක් දුන්නා නමුත් එක නමයි කොහොමද සම්බන්ධ වෙන්නේ ඒ කිසිම තොරතුරක් නෑ. ඔබ වහන්සේ අද සාක්ෂි ලබා දීමෙන් පසු අපේ පොලිස් ඒකකය භාරව ඉන්න ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වැලිකන්න මහතාට පසු ගිය දිනයේ දුන්නු තුන්දෙනාගේ සම්පූර්ණ නමුයි සම්බන්ධ කර ගත හැකි තොරතුරුයි ඔබ වහන්සේ අද නම් කරන්න යන පුද්ගලයාත් සම්බන්ධ කරලා ඒ සියළු නම් ටිකයි තොරතුරු ටිකයි ලබා දෙන්න අපේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිට.

පි : හොඳමයි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය</u>

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී ගරුතර ස්වාමීන් වහන්සේ විසින් සභාවට ඉදිරිපත් කරන ලද එම ලේඛනයට අනුව පෙනි යන්නේ www.dawahcorner.org වශයෙන් වන අන්තර්ජාල වෙබ් අඩවියකින් බා ගත කරන ලද බවයි. එහි ඇතුළත් වන තොරතුරු සම්බන්ධයෙන් උන් වහන්සේ සාක්ෂි ලබා දුන්නා. එම තොරතුරු ඇතුළත් පිටු දෙකකින් යුත් ලේඛනය RGG 45 වශයෙන් සළකුණු කිරීමට අවසර අයැද සිටිනවා.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : ස්වාමීන් වහන්ස ඔබ වහන්සේට බුර්කා සහ නිකාබ් පැළඳීම සම්බන්ධව කිව හැක්කේ කුමක්ද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : මැතිතුමනි අපට තියෙන ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් තමයි තමන්ගේ ඉස්සරහා ඉන්නේ ගෑණු කෙනෙක්ද පිරිමි කෙනෙක්ද කියලා දැන ගන්න එක. එකක් අපි අවුරුදු 30 ක් යුද්ධයක් නිසා බැට කෑවා. ඊළඟට අපේ රට මේ කලාපේම මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ හබ් එක බවට පත් වෙලා තියෙනවා. මානව හිමිකම් කියලා එකක් ගෙනල්ලා දාලා තියෙනවා ඉස්සරහට. මගේ ඉස්සරහා ඉන්න කෙනා කවුද කියලා හඳුන ගන්න මේක උස්සලා බලන්න බෑ. එතකොට ප්‍රශ්නයක්. අතවර කරන්න හැදුවා කියලා කියයි. ඇත්ත වශයෙන්ම නිකාබය සහ බුර්කාව කුර්ආනයවත් අනුමත කරපු එකක් නෙවෙයි. මේ ආක්‍රමණයේම කොටසක්. ආක්‍රමණිකයාගේ කොටසක්. දැන් උදාහරණයක් විදිහට මේ කලාව තිබුණේ නැනේ යුධ සමයට කලින් දැන් මැතිතුමනි සිංහල කාන්තාවක් convert වෙනවා ඉස්ලාම් වලට. සාමාන්‍යයෙන් තවම අපේ බහුතරය නිසා අපේ මිනිස්සු සාමාන්‍යයෙන් අපි කියන්නේ මදි පුංචිකම් කරනවා. ගම්වලත් එහෙම තියෙනවානේ. ආ..... මේ අර මුස්ලිම් එකත් එක්ක ගිය ගෑණි කියලා හරි ඔහොම කියනවා ඇති නේ. මුහුණ වැහුවාම ඒක කරන්න බෑ. හොයා ගන්න බෑනේ. මේ ඉන්නේ වසන්තිද වසන්තගේ පුංචි අම්මාද කියලා හොයා ගන්න බෑ. ඉතින් ඒක බරපතල ප්‍රශ්නයක්. එය අනිවාර්යෙන්ම නීතිගත කරලා නතර කළ යුතු ප්‍රශ්නයක්. හිජාබය සඳහා ඒ ගොල්ලො අවසර අරගෙන තියෙනවා. ඒකත් ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ කාලේ ප්‍රේමදාස මහත්මයාගේ මැදිහත් වීමෙන් ඒක අධ්‍යාපන අමාත්‍යාංශයේ ගැසට් එකකින් අනුමත කරලා තියෙනවා මුස්ලිම් කාන්තාවකට සුදුසු ඇඳුම ලෙස මේ හිජාබය අපි හිජාබයට විරුද්ධ නෑ. හැබැයි නිකාබය සහ බුර්කාව අනිවාර්යයෙන්ම තහනම් කළ යුතුයි අපේ වගේ රටක මොකද පහසුවෙන් නොයෙක් අක්‍රමිකතාවයන්ට මේක යොදා ගන්න පුළුවන් නිසා.

ප්‍ර : හිජාබය මැලේසියාව වගේ රටවල් වල භාවිතා කරන්නේ හිජාබය නේද?

පි : හිජාබය ඒ හිජාබය මැතිතුමනි මෙහි ඇත්තටම අනුමත කරලා තියෙනවා නීතියෙන්ම අනුමත කරලා තියෙනවා. ප්‍රේමදාස මහත්මයාගේ කාලේ ඒක මගේ ළඟ ඒ ගැසට් එකක් තියෙනවා. හිජාබය අනුමත කරලා තියෙනවා මුස්ලිම් කාන්තාවන් විශේෂයෙන් පාසල් දරු දැරියන්ට එක අනුමතයි කියලා. දැන් මැතිතුමනි උදාහරණයක් විදිහට දැන් මේක ගත්තොත් සම්පූර්ණයෙන් මුණ වහගෙන කළුම කළු පාටට ඇඳගෙන යනකොට මැතිතුමනි භය වෙනවානේ. බල්ලෝ උඩු බුරනවා.

FAIR COMMENT BY JEZEEM

ඌටත් මේක අවුලක්. බල්ලාට හොඳට ඉව තියෙනවානේ. ඉතින් දැන් අපි ළඟ පින්තූර තියෙනවා පුත්තලමේ පැත්තේ වෛද්‍යවරියන්,හෙදියන් දැන් හෙද ඇඳුම මැතිතුමනි ෆ්ලොරන්ස් නයිටින්ගේල් ගේ එකම එකක්නේ. අපි ලෝකේ කොහේ ගියත් ඒ හෙදියෝ මේ හෙදියක් කියලා හඳුන ගන්න පුළුවන්. දැන් අපි ළඟ මේ සමහර පින්තූර තියෙනවා හෙදියෝ අඳුර ගන්න බෑ. හෙදියෝ බුර්කාව දාලා. ප්‍රෂර් එක එහෙම තියෙන එක්කෙනෙක් ආවොත් අනිවාර්යෙන්ම හාට් ඇටැක් එකක් හැදෙනවා. ඉතින් ඒ ඇඳුම කොහොමද එහෙම වෙනස් වෙන්නේ. දැන් ඒ විදිහට හමුදා ඇඳුමට මුස්ලිම් කට්ටිය ආවොත් ඒගොල්ලො එතකොට ඒක වෙනස් කරනවාද. ඒකයි අපි කියන්නේ මැතිතුමනි එක රටක තියෙන්න ඕනී එක නීතියයි කියලා. හිජාබය සම්පුර්ණයෙන්ම හිජාබයට අපි විරුද්ධව අපි මත පල කරලා තියෙනවා. නිකාබයට. නිකාබය සහ බුර්කාවට විරුද්ධව. මගේ ළඟ තියෙනවා ඒ පින්තූර. මම එදා මැතිතුමනි අර සාක්ෂි දෙන කොට අපේ මැතිතුමාට ඉදිරිපත් කළා මේ බදුර්දීන්ගේ අර වහබි නෝනා මුහුණ වහගෙන ඉන්න ඒක මේ තියෙන්නේ ඒක. රිෂාඩ්ගේ බිරිඳ බුර්කාව වහගෙන එන එක.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : ස්වාමීන් වහන්සේ ඔබ වහන්සේ ගාව එම පින්තූරය තියෙනවා නම් මේ අවස්ථාවේදී කරුණාකරලා කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න.

පි : මේ තියෙන්නේ මැතිතුමනි බුර්කාව වෛද්‍යවරියන් ලංකාවේ කියලා ඒ ගත්තු පින්තූරේ.

ප්‍ර : අවසරයි ස්වාමීන් වහන්සේ අර ඉස්සෙල්ලා අර අමාත්‍යවරයා රිෂාඩ් බදුර්දීන්.

පි : මේ තියෙන්නේ ඒ පින්තූරේ. ඔය පුත්තලම ප්‍රදේශයේ.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය</u>

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී ස්වාමීන් වහන්සේ විසින් රිෂාඩ් බදුර්දීන් අමාත්‍යවරයාගේ බිරිඳ ලෙසට හඳුන්වමින් බුර්කාව පැළඳ සිටින පුද්ගලයෙක් සිටින ඡායාරූපයක් ඇතුළත් මෙම ඡායා රූපය මෙම සභාවට RGG 46 වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා. ඒ වගේම උන් වහන්සේ සාක්ෂියේ ඉදිරිපත් කරන්නට යෙදුණා වෛද්‍යවරුන් හෙදියන් ගේ සාමාන්‍ය ඇඳුමෙන්

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ඔබ්බට ගිහිල්ලා බුර්කා ඇඳීමක් සිදු වෙන බව. එය තහවුරු කිරීම සඳහා ඊට අදාළ වන ඡායා රූපයක් උන්වහන්සේ ඉදිරිපත් කරනවා. එය RGG 47 වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : ස්වාමීන් වහන්සේ එම ඡායාරූපය කොහේ ගත්තු එකක්ද?

පි : මන්නාරමේ මේ මේ ඔය බුර්කාව සම්බන්ධයෙන් ඒවා පුත්තලමේදී මැතිතුමනි.

ප්‍ර : පුත්තලමේ?

පි : පුත්තලමේ මට දිවයින පත්තරේ මාධ්‍යවේදීයෙක් තමයි ඒක එව්වේ.

ප්‍ර : ඒ ස්ථානය සඳහන් වෙලා නැද්ද?

පි : ස්ථානය මට අහලා කියන්න පුළුවන් මැතිතුමනි වෙන මොහොතක හරි ඒක සත්‍යම පින්තූරයක්. මේ dubbing කරපු මොකුත් නෙවෙයි. ඔව් ඒක නිව්ස්වලත් ගියා ඒ දවස්වල ප්‍රවෘත්තිවලත්.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය</u>

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී ස්වාමීන් වහන්සේ විසින් මුස්ලිම් කාන්තාවන්ගේ ඇඳුම සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් වන බැවින් සෙරන්ඩිබ් වශයෙන් මෙම සභාවට උන් වහන්සේ විසින් ආසීෆ් හුසේන් විසින් රචිත පොතක් ඉදිරිපත් කරනු ලැබුවා පෙර දින සාක්ෂියේදී. එම පොතෙහි දැනටමත් 618 යනාදි වශයෙන් පිටු සළකුණු කිරීමක් තමයි සිදුව තිබෙන්නේ. එම පොතෙහි අග පවතින ඡායාරූප පෙළක් අතුරින් එක් ඡායාරූපයක් පින්තූර සඳහන් පිටුවලින් අග සිට දෙවන පිටුවෙහි තිබෙන අවසාන පින්තූරය ලෙසට එක් ඡායාරූපයක් තිබෙනවා. එය පෙන්වා සිටීමට අවසර අයැද සිටිනවා.

පි : මේ තියෙන්නේ සාම්ප්‍රදායික ඒ කියන්නේ හිජාබය එන්නත් කලින් ඔය සාම්ප්‍රදායික කාන්තාවක්. ඒ කියන්නේ සාරි පොටෙන් අපේ මැතිතුමනි අපේ සංස්කෘතිය ඉන්දියාවෙන් එන්නේ මුස්ලිම් අයගේ. ඒ ඉන්දියාවේ තවමත් වැඩි හරියක් මෙහෙම සාරි පොටෙන් තමයි ඔළුවට දාගන්නේ. ඒක තමයි ටිකක් වැඩි දියුණු වෙලා ඇවිල්ලා හිජාබය හැටියට අලංකාරවත් විදිහට අපේ රටේ අවසරය ලැබෙන්නේ ඔය තමයි සාම්ප්‍රදායිකම ක්‍රමය.

FAIR COMMENT BY JEZEEM

ගරු සභාපතිතුමනි ස්වාමීන් වහන්සේ විසින් එම පැහැදිලි කිරීම කරන ලද ඡායාරූපය ඇතුළත් පිටුව එය මෙම පොතෙහි අග සිට පින්තූර ඇතුළත් කොටසෙහි දෙවන පිටුවේ පහළ ඡායාරූපය හැටියටයි පවතින්නේ. එම ඡායාරූපය ඇතුළත් එම පිටුව RGG 34 (B) වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා.

එහි ඇතුළත් ඡායාරූපය සම්බන්ධයෙන් උන් වහන්සේ සඳහන් කරන්නට යෙදුණේ එය සාම්ප්‍රදායික මුස්ලිම් කාන්තාවකගේ ඇඳුම් නිරූපණය වන ආකාරයේ ඡායාරූපයක් වන බවයි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : ස්වාමීන් වහන්ස ඔබ වහන්සේට කියන්න පුළුවන්ද දැන් මුස්ලිම් මෙම නොයෙකුත් පල්ලි තවුහිද්, ජමාත් වගේ පල්ලි ගොඩාක් එක් ගම්වල විශාල වශයෙන් ගොඩනැගුණේ ඔය මාවනැල්ල, කාත්තන්කුඩි ඒ වගේ ප්‍රදේශවලයි. මා හට පෙනී ගියා දකුණු පළාතේ එවැනි පල්ලි ගොඩනැගීමක් සිද්ධ වුණේ නෑ. ප්‍රමාණයක් ගොඩනැගෙන්න කරුණු ඉදිරිපත් වෙන්නේ නෑ. එයට හේතුව කුමක්ද?

පි : දකුණු පළාතේ සම්බන්ධයෙන් මැතිතුමනි අද මට ඉදිරිපත් කරන්න පුළුවන්. මොකද වැලිගම මේ වගේ සිද්ධි ඇති වුණා මීට පෙරාතුව. දික්වැල්ලේ ඇති වෙලා තියෙනවා. මිලිදුව කියන ප්‍රදේශයේ ඇති වෙලා තියෙනවා.

ප්‍ර : නෑ සිද්ධි නෙවේ මම අහන්නේ පල්ලි?

පි : පල්ලි තියෙනවා මැතිතුමනි .

ප්‍ර : ඒක ඉදිරිපත් කළේ නෑ මම හිතන්නේ?

පි : ඒක දැන් ඇත්තටම ඊයේ තමයි දැන් මේ තොරතුරු මේ කොමිෂමේ ඇත්තටම එක හොඳ කාරණයක් අපි දකින්නේ මේ මිනිස්සු මේවා දකින කොට තොරතුරු දී ගන්න බැරුව ඉන්න මිනිස්සු දැන් තොරතුරු ගෙනල්ලා දෙනවා. අර අපි කිව්වේ ගේන්න.

ප්‍ර : ඒ මොනවාද තොරතුරු ?

පි : ඒ තොරතුරු මැතිතුමනි මට අවස්ථාව දෙනවා නම් මෙහෙම කියන්න ලේසියි.

පි : එතකොට මැතිතුමනි මට මේ තොරතුරු ලබා දීපු පුද්ගලයාත් මේ කොමිෂමට කැඳවන්න ඒ කියන්නේ මම නම ලබා දෙන්නම් නියෝජ්‍ය පොලිස්පතිතුමාට. දැන් 1980 දශකයේ ඉඳලා දික්වැල්ල ප්‍රදේශයේ වහබ් වාදය සහ ජීහාද් ප්‍රචාර ගෙන ගිහිල්ලා

Translated Copy
FAIR COMMENT BY JEZEEM

තියෙනවා M.H.M.සම්ස් කියලා දෙමළ මාධ්‍යවේදීයෙක්. ඒ වගේම එම්.එච්.එම්.අලී කියලා එක්කෙනෙකුත් එක්ක එකතු වෙලා ඔමරිමුක්තාර් සිදු කරපු ජීහාද් යුද්ධය පිළිබඳව දික්වැල්ලේ චිත්‍රපටි පෙන්වලා තියෙනවා. අනතුරු ඔමාර්මුක්තාර් නමින් පදනමක් පිහිටුවලා තියෙනවා. ලිබියාවේ රැකියා සඳහා මිනිස්සු පිටත් කරලා යවලා තියෙනවා. ඊළඟට මසාහීර් කියලා පුද්ගලයෙක් ඔහුගේ පියා තමයි එම්.එච්. එම්.අලීගේ පියා හයල් ලෙබ්බේ කියන මනුෂ්‍යයා 1960 දශකයේදී යම් ප්‍රමාණයකට දික්වැල්ලට මූලධර්මය ගෙනාවා කියලා ඔහු අපිට සඳහන් කළා. දැන් ඔය මොහොමඩ් මසාහීර් කියන පුද්ගලයා බේරුවල ජාමියා නලීමියා විදුහලේ අධ්‍යාපනය ලබලා තියෙනවා. ඊළඟට දික්වැල්ලේ තියෙන මින්හාත් ජාතික පාසලට 1996 ඇවිල්ලා තියෙනවා. ඒ විදුහලේ විදුහල්පති හැටියට පත් වෙලා තියෙනවා. එදා ඉඳලා ඔහු වහබ් වාදය ප්‍රචාරය කරනවා මේ දික්වැල්ල ප්‍රදේශයේ. ඊට අමතරව තාම ජීවත් වෙනවා මුබාරක් මවුලවි. කොළඹ පොලිස් මූ ලස්ථානය අසල ගපූර් බිල්ඩින් අධිපති අබ්දුල් ගපූර් මහතාගේ පරිත්‍යාගයෙන් සාම්ප්‍රදායික මුස්ලිම් මිනිස්සු පටන් ගනිපු ගපූරියා මද්‍රසා පාසල තියෙන්නේ මහරගම. ඒ පාසලේ වර්තමාන විදුහල්පති ජමෙයිතුල් උලමා සංවිධානයේ වර්තමාන ලේකම් අල් ෂෙයික් එම්.එම්.ඒ.මුබාරක් අල් මදනී සවුදි අරාබියාවේ ආධාර ඇතිව වහබ්වාදයට මේ දරුවෝ ඉතාම දරුණු විදිහට වහබ් වාදය උගන්වමින් සිටිනවා කියලා ඒ අය අපිට දැන් දැනුම් දෙනවා. මේ අලුතෙන්ම එකතු වෙන නම්. ඊළඟට වැලිගම ප්‍රදේශයේ මැතිතුමනි ගාල්ල ඉබුනු අබ්බාස් මද්‍රාසාවේ සහ වැලිගම අරාබි කාන්තා විදුහලේ අධ්‍යක්ෂක ලෙස කටයුතු කරන ෆතහුල් රහුමාන් විසින් සාම්ප්‍රදායික මුස්ලිම්වරු පිරුණු වැලිගම ප්‍රදේශයේ වහබ්වාදයට ගොදුරු කිරීම සඳහා අවුරුදු 30 ක් තිස්සේ දේශනා පවත්වමින් කටයුතු කරනවා. වැලිගම ප්‍රදේශයේ වහබ්වාදය ප්‍රවර්ධනය කිරීමේ ප්‍රධාන මූලිකයා ඔහු. ෆතහුල් රහුමාන් තාම ජීවත් වෙනවා. ඊළඟට ඩීනුල් හසන් කියලා පුද්ගලයෙක් ඔහු තමයි ගාල්ල ඉඹුණු අබ්බාස් මද්‍රාසාවේ විදුහල්පති. වහබ් දේශකයෙක්. මවුලවි අතාවුල්ලා. දැන් මොහු එක වතාවක් අත්අඩංගුවට ගත්තා දැන් නිදහස් කරලා ඉන්නවා. ඔහු තමයි මවුලවි අතාවුල්ලා තමයි සූෆි මුස්ලිම් ජනතාව වැඩියෙන්ම ඉන්න ගාල්ල සහ අවට ප්‍රදේශවල වහබ්වාදය ප්‍රචලිත කළේ. මවුලවි අතාවුල්ලා නැමැති පුද්ගලයා ඉඹුණු අබ්බාස් මද්‍රාසාවේ විදුහල්පතිවරයෙක් වගේම ඔය පාස්කු ප්‍රහාරයට පස්සේ ඔහු අත්අඩංගුවට ගත්තා නැවත නිදහස් කළා. ඒ වගේම ඩොක්ටර්

FAIR COMMENT
BY JEZEEM

කාදර් තවම සුපුරුදු පරිදි වැඩ ටික කරගෙන ඉන්නවා. ඔහුගේ පුතෙකුත් ඇරෙස්ට් කළා මේ පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන්. අනෙක් පුතා ඉන්නේ පිටරට. ඒ ඩොක්ටර් කාදර් නැමැති වෛද්‍ය කාදර් නැමැති පුද්ගලයා ගාල්ල අවට ප්‍රදේශයේ වහබ්වාදය ප්‍රචාරය කරමින් දැනටත් බොහොම සුවසේ කටයුතු කරනවා. ඊළඟට මවුලවි ලුත්ස්ති. ඉන්දියාවේ ඉගෙන ගෙන ඇවිල්ලා ඉන්න පුද්ගලයෙක් ඔහු ඉන්දියාවේ නිතරම කතා බහට ලක් වෙන මේ ආයතනයක් තමයි දේව් බන්ද්. හින්දි භාෂාවෙන් දෙවියන්ට බන්ධනේ කියන වචනේ අදහස දෙව් බන්ද් මද්‍රාසාවේ ඉගෙන ගත්ත කෙනෙක්. ඔහු දැනට ජමෙයිතුල් උලමා සංවිධානයේ වැඩ කරනවා උලමා සභාවේ ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන්නේ ඔහුයි. තබ්ලික් ජමාත් එක්ක එකතු වෙලා ගාල්ල ප්‍රදේශයේ වහබ්වාදය ප්‍රචාරය කරනවා කටුගොඩ දෙවට ගාල්ල කියන ප්‍රදේශවල. ඒ වගේම ජවුෆර් රහුමානි ඇත්ත වශයෙන්ම මේ නම් හෙළි කරන්නේ මැතිතුමනි මේ මිනිස්සුන්ට මේ වගේ අනාගතයේ විය හැකි බිය දක්වලා මේ මිනිස්සු ආපසු හෝ හරව ගන්න පුළුවන් කියන පරමාර්ථයෙන් මිසක් මේ සමාජයක් මේ නැත්නම් මේ පුද්ගලයෝ අපහසුතාවයට පත් කරන්න නෙවෙයි. නමුත් මේ ගොල්ලො වැරදි මහකයි යන්නේ. ජවුෆර් රහුමානි ඉතාම භයානක පුද්ගලයෙක් හැටියට දක්වනවා. ඉතිහාදුල් මදාරිස් නැමැති සංවිධානයේ අධ්‍යක්ෂක. දැන් අර මේ නම් මැතිතුමනි මගේ නම් ගවේෂණය කරපු මුල් නම් හතළිස් තුනට අහු වුණේ නෑ. එතකොට අර පනස් ගාණක් කියපු ගාණට දැන් තව එක්කෙනෙක් එකතු වුණා. ඉතිහාදුල් මදාරීස්. Association of Arabic Madrasa නැමැති සංවිධානයේ අධ්‍යක්ෂ. සමස්ත ලංකා ජමෙයිතුල් උලමා සංවිධානය යටතේ පාලනය වෙන සවුදි රාජ්‍යයේ ක්‍රියාත්මක වන අල්සාමීල් සංවිධානයේ මුදල් මත මොහු ක්‍රියාත්මක වෙනවා. මොහු තමයි බරීරා අරාබි කාන්තා විදුහලේ අධ්‍යක්ෂ. ඊළඟට මවුලවි අබ්දුල්ලා. වහබ් වාදය පතුරුවන පුත්තලමේ කාසිමියා අරාබි විදුහලේ විදුහල්පති. ඔහු තමයි මවුලවි අබ්දුල්ලා. තාම ජීවතුන් අතර ඉන්නවා. වහබ්වාදය පතුරුවන පුද්ගලයෙක්. ඒ ප්‍රදේශවල අවුල් හදන්නේ මේ ඇත්තො. රම්සී මවුලවි මාදම්පේ ඉස්ලාහියා අරාබි විදුහලේ විදුහල්පති. ඒ විද්‍යාලය තුළ වහබ්වාදය වෙනුවෙන් පෙනී ඉන්නවා. අබුබාකර් සිද්ධික් අබුබාකර් කියලා කියන්නේ මොහොමඩ් නබිතුමාගෙන් පස්සේ නායකත්වයට පත් වෙච්චි පුද්ගලයෙක්. ඒ නම්වලින්මයි මේ නම් දාලාත් තියෙන්නේ. අබු බක්කර් සිද්ධික්. පරගහදෙණිය දාරුල් අරාබි විද්‍යාලයේ

FAIR COMMENT BY JEZEEM

ගුරුවරයෙක්. ඒ ඉස්කොලේ වහබ්වාදය පතුරවමින් ඉන්නවා. ඊළඟට එස්.එච්.එස්.ෆලීල් බේරුවල ජාමියා නලීමියා විද්‍යාලයේ අධ්‍යක්ෂ. ඒ වගේම ජමිල් ඒත් නලිමිවරයෙක්. මර්සි ලංකා නමින් පුත්තලමේ අනාථ නිවාසයක් පවත්වා ගෙන යනවා ළමුන් 800 ක් විතර ඉන්නවා වහබ්වාදය පතුරුවනවා. මේ සමහර අබ්දුල් හමීඩ් සරාහි අක්කරෙයිපත්තුව ප්‍රදේශයේ පුද්ගලයෙක් වන අතර ඔහු තැනින් තැනට ගිහිල්ලා ඒ වහබි දේශන පවත්වන කෙනෙක්. අපි ඉතාම වගකීමෙන් කියනවා මේ කොමිෂම හමුවේ යුෂුෆ් මුෆ්ති මොහු සමස්ත ලංකා ජමෙයිතුල් උලමා සංවිධානයේ ප්‍රධානියෙක් වගේම තබ්ලික් ජමාත් ප්‍රධාන දේශකයා තමයි මොහු. තබ්ලික් ජමාත් සංවිධානයේ ප්‍රධාන දේශකයා. මහනුවර ගෙළිඔය ප්‍රදේශයේ ක්‍රියාත්මක වන හක්කාරී මද්‍රාසාවේ ප්‍රධානීයා. මැද පෙර දිගින් ආධාර ලබන සම් සම් කියන පදනමේ ප්‍රධානියාත් මොහුයි. සම් සම් පදනම. එතකොට ඒකේ ප්‍රධානියා තමයි යුෂුෆ් මුෆ්ති මොහු හරිම කපටි පුද්ගලයෙක්. සරලව කිව්වොත් දැන් වෙන කොට අපට ආරංචියි ජනාධිපති මන්දිරේ වටේ කැරකෙනවා. මේකටත් කට්ට ගහන්න වගේ තමයි ලෑස්තිය. හසන් ෆරීඩ් මවුලවි නිඩා foundation හි දැනට Islamic Institute එක පවත්වාගෙන යනවා. ඒ නිඩා පදනම ගැන කලින් දැනුම් දුන්නා සහ පින්තූරත් ඉදිරිපත් කළා. ඒ වගේම හාසීම් සූරී කල්මුණේ ප්‍රදේශයේ සවුහා අරාබි විදුහලේ විදුහල්පති හැටියට කටයුතු කරනවා. වහබ්වාදය පතුරුවනවා. ඒ වගේම තව අපිට අලුතෙන් එකක් හම්බ වුණා. අල් ඉමාම් අබ්දුල් අසීස් බින්බාස් Institute for Girls මල්වානේ. හේනලන්ද වත්ත, උල්හිටිවල, මල්වාන. අපේ මැතිතුමා ඇහුව ප්‍රශ්නේට උත්තරෙත් එක්ක වැඩිදුරත් කිව්වේ මේ විශේෂයෙන් දකුණු පළාතෙත් මැතිතුමනි වහබ්වාදය සම්බන්ධයෙන් ඒ පල්ලි හදලා තියෙනවා අර ලියුම දුන්නා නම් පෙන්වන්න පුළුවන් අපිට නේද අර ලියුම.

ප : හම්බන්තොටත් තියෙනවාද හම්බන්තොට?

පි : හම්බන්තොට විශේෂයක් කියලා අපිට ලැබුණේ නෑ. නමුත් හම්බන්තොට බදගිරිය ප්‍රදේශයේ යම් යම් සිද්ධි වාර්තා වෙලා තියෙනවා. මොකද මැතිතුමනි ඒ ගොල්ලො ශක්තිමත් නොවන තැනට එක පාරට යන්නේ නෑ. ඒ ගොල්ලොන්ගේ පිරිස වැඩි වෙන්නත් ඕනී මේක කර ගෙන යන්න. ඒ ගොල්ලොන්ගේ පිරිස වැඩි වෙන කොට තමයි ඒ කල්ලි ගිහිල්ලා ඔයා මේකට එන්න ඔයා මේකට එන්න ඔයා මේකට එන්න ආදී වශයෙන් කියලා වෙන් කර ගන්නේ. මේ ලේඛනය භාර දෙන්න පුළුවන් මැතිතුමනි. දැන් අපේ මැතිතුමා ඇහුවා මේ ගාල්ල ප්‍රදේශයේ

FAIR COMMENT BY JEZEEM

මෙහෙම නැද්ද කියලා ගාල්ලේ. අපේ මැතිතුමා අහපු ප්‍රශ්නේට උත්තරයක් විදිහට මේ ගාල්ලේ මිලිදුවේ මුහුයාදීන් තකියා. පල්ලියට මුස්ලිම් අන්තවාදී පහර දෙයි කියලා මැතිතුමනි මේ පාස්කු ප්‍රහාරයෙන් පස්සේ විස්සයි විස්සේ ජනවාරි වෙනකොටත් ආපහු එම පල්ලියටම ඒගොල්ලො පහර දුන්නා මේ මිලිදුවේ. දැන් හොඳම දේ තියෙන්නේ මේ 2019 ප්‍රහාරයනේ. දැන් අපි මේ ගැන හෙළිදරව් කළාම මෙහෙම ප්‍රහාරයක් වුණා කියලා 2019/03/26 වෙනිදා UTJ එකෙන් United තවුහිද් ජමාත් සංවිධානය මැතිතුමනි මෙන්න බලන්න අන්තාවදය මේ වැඩිකල් නෑ 2019/03/26 වෙනිදා මේ ලියුම. වෙබ් අඩවියක් තියෙනවා Colombo Today කියලා. ඒ Colombo Today වෙබ් අඩවියේ මේක පල කළා. මේ පල්ලියට පහර දුන්නයි කියලා. තවුහිද් ජමාත් සංවිධානයෙන් එවනවා 2009 මාර්තු මස 16 වෙනි ඉරු දින ඉහත පල්ලියේ වාර්ෂික දානමය මංගල්‍යය කන්දුරී පවත්වා ඇති බව සත්‍යයකි. ඔබ සඳහන් කළ පරිදි ඔවුන් විසින් පවත්වන ලද එවැනි මංගල්‍යය පල්ලියේ පැවැත්වීම කුර්ආනයට පමණක් නොව නබිනායක සල්තුමානන්ගේ මඟ පෙන්වීමටද පටහැනි ක්‍රියාවක් බවද අපි පිළිගනිමු කියලා අත්සන් කරලා එවන්නේ මේ ප්‍රධාන ලේකම් ඒ.එල්.එම්. මන්සූර් කියලා දැන් කියනවා මේ මේක සම්පුර්ණයෙන්ම මේ නමුත් ඔබ කියන පරිදි (ලේඛනයෙන් කොටසක් කියවයි.) වැඩි දුරටත් සඳහන් කර සිටිමි. ඉස්සෙල්ලා කියනවා අපි එහෙම නෑ කියලා පස්සේ කියනවා අපෙත් එකක් තියනවාලු ඒ ළඟ කියලා. දැන් පල්ලි දෙක අතර ගැටුමක්. මේවාට තමයි මැතිතුමනි ඩිරාර් පල්ලි කියලා කියන්නේ. ඩිරාර් පල්ලි කියන ඒවා නබිතුමාගේ කාලයේත් නබිතුමා කිව්වා ඩිරාර් පල්ලි විනාශ කරලා දාන්න. පල්ලියක් ළඟ තව පල්ලියක් හදන්න එපා ළඟ ළඟ . ඒ ඩිරාර් පල්ලි කියලා කියන්නේ මේ ගැටුම් නිර්මාණය කර ගැනීම සඳහා ඒගොල්ලෝ උපායක් විදිහට හදන පල්ලි. මේ ලියුමත් හරිම වැදගත් මොකද මේ ගොල්ලන් මේ තවුහිද් ජමාත් එක. UTJ United Thawheed Jamath ඒ ගොල්ලො කියනවා මේක නබිනායකතුමාටත් විරුද්ධයි කියලා. ඒ කියන්නේ මේ සූෆි මුස්ලිම් මිනිසුන්ට තමයි හිරිහැර කරන්නේ. වැලිගම මිලිදුවේ.

****

FAIR COMMENT
BY JEZEEM

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය</u>

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී ස්වාමීන් වහන්සේ විසින් දීර්ඝ වශයෙන් කරුණු පැහැදිලි කිරීමක් කරනු ලැබුවා විවිධ අධ්‍යාපන ආයතන වල සිටින අන්තවාදී පුද්ගලයන් නම් වශයෙන් කරුණු ඉදිරිපත් කරමින් එකී නම් සහ එම අධ්‍යාපන ආයතන ඇතුළත් ලේඛනයක් උන් වහන්සේ සභාවට ඉදිරිපත් කරනු ලැබුවා. එහි මූලාශ්‍රයක් සම්බන්ධයෙන් හොයා ගැනීමට නැහැ. උන් වහන්සේ සඳහන් කරන්නට යෙදුණු නම්ම තමයි මෙහි සඳහන්ව තිබෙන්නේ. එම ලේඛනය මෙම සභාවට RGG 48 වශයෙන් සලකුණු කිරීම සඳහා අවසර අයැද සිටිනවා. ඒ වගේම උන්වහන්සේගේ සාක්ෂියෙහි Colombo Today නැමැති සඟරාවකට එහි කර්තෘට ප්‍රධාන ලේකම් United Thowheed Jamath එක්සත් තවුහිද් ජමාත් සංවිධානයේ A.L.M.මන්සූර් විසින් ලියන ලද ලේඛනයක් 2019 මාර්තු 26 දිනැතිව ලියන ලද ලේඛනයකට අවධානය යොමු කරමින් සාක්ෂි ලබා දුන්නා. එකී ලේඛනය මෙම සභාවට RGG 49 වශයෙන් සලකුණු කොට ඉදිරිපත් කිරීම සඳහා අවසර අයැද සිටිනවා.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : ස්වාමීන් වහන්ස ඔබ වහන්සේට කොමිෂන් සභාවට කියන්න පුළුවන්ද දැනට හලාල් ක්‍රමය ක්‍රියාත්මක වන ආකාරය සම්බන්ධව?

පි : දැනට මැතිතුමනි අපි මේ දිගින් දිගට විරෝධතා ගෙනාවට පස්සේ ඒ ගොල්ලො එවක ආරක්ෂක ලේකම්වරයාට පොරොන්දු වුණා නිකම්ම නෙවෙයි රටේ පිළිගත් ඒ වේලාවේ මුලාසනය ගත්තේ අපවත් වී වදාළ බෙල්ලන්විල විමලරතන නායක හාමුදුරුවෝ. උන් වහන්සේ ඇතුළු කොට වගකිව යුතු ශාසන භාරධාරී හාමුදුරුවරු මේ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේම එක්තරා පරිශ්‍රයකට වඩම්මලා අනික් පැත්තෙන් උලමාවරුත් ඇවිල්ලා කිව්වා දැන් මෙතනින් එහාට අපි හලාල් ප්‍රශ්නේ කතා කරන්නේ නෑ. හලාල් ප්‍රශ්නේ ඉවරයි දැන්. ලංකාව තුළ පාරිභෝගික භාණ්ඩවලට අපි හලාල් ලාංඡනය එකතු කරන්නේ නෑ කියලා පොරොන්දුවක් දුන්නා. ඒ අනුව ඒ නායක හාමුදුරුවරු මාධ්‍යයට ඇවිල්ලා දැන් හලාල් ප්‍රශ්නේ ඉවරයි. මෙතනින් ඉස්සරහාට මේක ගෙනියන්න එපා කියලා අවවාද කළා. දැන් විසඳුනානේ . අපිට ලියුමුත් එව්වා. ආරක්ෂක ලේකම්තුමාටත් ඒක යැව්වා. ඉන් අනතුරුව අපි

ප්‍ර : ඒ මොන වර්ෂයේද?

FAIR COMMENT BY JEZEEM

පි : 2013 මැතිතුමනි. ඊට පස්සේ අපි මේ පණිවිඩයත් අරගෙන ඓතිහාසික මහනුවර දළදා මාළිගාවට ගිහිල්ලා මල්වතු අස්ගිරි මහානායක හාමුදුරුවරු බැහැ දැකලා දැන් හාමුදුරුවනේ අපේ අවිහිංසාවාදීව අපි ගෙන ගිය සටන ජයග්‍රහණය කෙරුවා. එක ගල් කැටයක් ගහන්නේ නැතුව මේ ගෙනාපු සමාජ බෙදුම් වාදය පරද්දන්න අපට පුළුවන්කම ලැබුණා කියලා නුවර ඉතිහාසයේ පවත්වපු විශාලතම බොදු සමුළුව අපි පැවැත්වුවා. තිස් දහසකට අධික ජනකායක් එක්ක. මේ හලාල් අපි ජයග්‍රහණය කළා. මේක ඉවරයි මෙතනින් කියලා. නමුත් මැතිතුමනි මාස තුනක් යන්න කලින් ආපහු වැඩේ පටන් ගත්තා. දැන් ඒ කියන්නේ Halal Accreditation කියලා වෙනත් විදිහකට ඒ මංකොල්ලකෑම ඒ විදිහටම කර ගෙන යනවා.

ප්‍ර : ඒ හලාල් සහතිකය සඳහා මුදල් ලබා ගන්නේ කවුද දැන්?

පි : උලමාවරු.

ප්‍ර : කලින් උලමාවරු ගත්තේ ඒක වෙනස් වුණා නේද?

පි : ඒ අරගත්තාට ඒ ගොල්ලන්ම පාලනය කරන වෙන සභාවකින් දැන් ඒක කරගෙන යනවා.

ප්‍ර : දැන් හලාල් ක්‍රමය යටතේ දැන් මස් මාංශ පමණයි නේද දැන් ලංකාවේ විකුණන්නේ?

පි : හැම එකක්ම තියෙනවා. ඒ ගොල්ලන් එහෙම කිව්වට අයින් කර ගත්තේ නෑ. වෙනත් විදිහකට වෙනත් සළකුණකින් දැන් එනවා.

ප්‍ර : වෙනස් සලකුණකින්?

පි : වෙනස් සලකුණකින් එනවා.

ප්‍ර : වතුරත් තියෙනවාද?

පි : වතුර නම් අපිට හම්බ වුණේ නෑ. සමහර ඒවායේ තියෙන්න පුළුවන්. වතුර බෝතල්වලට දීලා තියෙනවා.

ප්‍ර : තියෙනවා?

පි : ඔව්. මේ තියෙන්නේ. මේ මෑතකදී අපිට ඒ වතුර බෝතල් හම්බ වුණා. වෙබ් අඩවියෙත් තියෙනවා ඒ කම්පැණි LIST එක.

ප්‍ර : දැන් ඔබ වහන්සේලා ඒ 2013 න් පස්සේ මේ දැන් හලාල් ක්‍රමය ඒ සම්බන්ධයෙන් විරෝධතා දක්වලා සටන් වලට යෙදුන් නැද්ද?

පි : ඉතින් කියලා වැඩක් නෑනේ මැතිතුමනි. අපට එතනින් එහාට යන්න තැනක් නෑනේ මොකද අපිට ආයුධ ගන්නද අපි. පාලයකයන්ට කිව්වා වැඩිහිටි නායක හාමුදුරුවොන්ට කිව්වා මේකේ අවදානම පෙන්වලා දුන්නා. ව්‍යාපාරික ප්‍රජාවට පුළුවන් හැටියට දැනුවත් කළා. එතනින් එහාට ඊට පස්සේ එකම දෙයක් ගැන අපිට කතා කර කර යන්න බෑනේ.

LEAR COMMENT — BY JEZEEM

ප්‍ර : පාලකයින් මේ සම්බන්ධයෙන් උනන්දු නොවෙන්නේ ආර්ථික කරුණු සලකාද?

පි : මැතිතුමනි මේක තේරුම් ගන්න නම් ඉස්ලාමය කියවන්න ඕනී. ඒ අය ඒ අදාළ නායකයන් ළඟ බොහොම ලස්සනට උපදේශකයෝ හැටියට, මිත්‍රයෝ හැටියට, උපකාර කරන මිනිස්සු විදිහට, බොහොම හොඳ කල්‍යාණ මිත්‍රයන් හැටියට ස්ථාන ගත වුණාම ඒ ගොල්ලො හිතනවා නෑ මෙයාලගේ එහෙම ප්‍රශ්නයක් නැනේ මේ හාමුදුරුවරු කෑ ගැහුවාට කියලා. ඒ ගොල්ලො ලොකු උනන්දුවක් ගන්නේ නෑ. ඇවිල්ලා තමන්ට අර බාබු වගේ පුපුරවගත් දවසට තමයි තේරෙන්නේ මොකක්ද වෙන්නේ කියලා. ඉතින් ඒ හින්දා අපිට ඊට වඩා යමක් කියන්න අමාරුයි මැතිතුමනි මොකද මේ ගොල්ලො මේ හැමතැනකම ඒ කියන්නේ මේක නිකම් හුළඟ වගේ නැති තැනක් නෑ.

ප්‍ර : දැන් ඔබ වහන්සේගෙන් තව ප්‍රශ්න දෙකක් වගේ අහන්න තියෙනවා. ඔබ වහන්සේ දිගටම කිව්වේ පාලකයින් සලකන්නේ නැහැ කියලා. දැන් ඔබ වහන්සේ මෙම අන්තවාදය සම්බන්ධයෙනුත් පුරා විද්‍යාව සම්බන්ධයෙනුත් දිගටම සටනක් කරගෙන ගියා. ඒ කටයුතු වලට විරුද්ධව . ඔබ වහන්සේ පාලකයින් කියනවා ඉතින් කොමිෂන් සභාවට කියන්න පුළුවන්ද සෘජුව ඇයි මේ කවුද ඔබ වහන්සේ ගිහිල්ලා ඒ සම්බන්ධව කිව්වා පාලකයින් මේ සම්බන්ධයෙන් ඔබ වහන්සේලාට දෙන පිළිතුර මොකක්ද?

පි : බලමු. අපි උත්සාහ කරනවා. සාකච්ඡා කර ගෙන යනවා. අර මීට කලින් තිබුණු කොමිෂන් වගේම තමයි. ඒ කියන්නේ මොනා හරි සිද්ධියක් වුණාම කොමිෂමක් දානවා කමිටුවක් පත් කරනවා වාර්තාවක් ගෙන්වලා එළි දැක්වුවා කියනවා එච්චරයි එතනින් එහාට කිසිම ක්‍රියාත්මක වැඩ පිළිවෙලක් තිබුණේ නෑ. ඒවා මම දන්නේ නෑ මොකද එහෙම වෙන්න හේතුව කියලා. දැන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව තියෙනවා මැතිතුමනි අටසිය ගාණක් බඳවා ගන්න තියෙනවා බඳවා ගන්නේ නෑ. මොන මොන හේතුන්ද කියන්න අපි දන්නේ නෑ. නමුත් ඒක ලොකු ගැටලුවක්.

ප්‍ර : ඔබ වහන්සේලාට මේ සම්බන්ධයෙන් මහජන මතයක් ගොඩනගන්න හැකි වුවාද?

පි : මහජන මතය ගොඩ නගා ගෙන එන කොට නිස්සරණාධ්‍යාසයෙන් දේශපාලකයෝ බලනවා අපේ හයියක් නැතුව කොහොමද මේ ගොල්ලො වැඩ කරන්නේ. එතකොට අපිට ඔළුව උස්සන්න දෙන්නෙත් නෑ. ඒ ගොල්ලො ඒ ගොල්ලොන්ට තර්ජනයක් විදිහට මේක දකිනවා. මේ ගොල්ලො

FAIR COMMENT BY JEZEEM

ජනප්‍රිය වෙලා ඇවිල්ලා ඡන්දේ ඉල්ලයිද එතකොට අපේ ආසනේ නැති වෙයිද කවුද මේ ගොල්ලන්ට එන්න කියලා පළවෙනි අදියරේදීම මේක කුමන්ත්‍රණයක් කියලා ගහලා දානවා. ඒක තමයි මේ ලංකාවේ තුන්වෙනි පන්තියේ අවිද්‍යාත්මික දේශපාලන ක්‍රමය. කාටවත් ඔළුව උස්සන්න දුන්නේ නෑ. දැන් ගංගොඩවිල සෝම හාමුදුරුවෝ අපේ යුගයේ අපි බොහොම ආදරය කරපු අපි ගුරු හරුකම් ලබා ගත්තු උත්තම ස්වාමීන් වහන්සේ නමක්. ඉතින් උන් වහන්සේ අපවත් වීම දක්වා උන් වහන්සේ මේ පණිවිඩය කතා කර ගෙන ආවා. අඳුරෙන් එළියට වැඩ සටහන කළා ITN එකේ. දේශපාලන කාරණා වලට එනකොට පාලකයෝ මේවා කරන්නේ නෑ කියන කොට වැඩසටහන නැවැත්තුවා. ඊට පස්සේ උන්වහන්සේට TNL එක තමයි දුන්නේ. අවසානයේදී උන් වහන්සේත් අපවත් වුණා. හිතේ වේදනාවෙන්. ඉන්නවත් තැනක් තිබුණේ නෑ අන්තිමට ඇත්තම කතාව. ඔය ඉන්න ආවාසයක් හදා ගන්න කීයක් හරි දාන පතියෙක් දෙනවා කියලා ඒක ලබා ගන්න තමයි රුසියාවට වැඩියේ. ඒත් ජීවිතේම කැප කළා උන් වහන්සේ. ලක්ෂ 68 ක් තිබුණා. අන්තිමට අපවත් වෙන කොට ජන විජය පදනමේන්. ඒකෙන් ඉඩම් කෑල්ලක් ගත්තා මහරගමින්. ආවාසයක් හදා ගන්න. ඔබතුමාට කියන්න ලැජ්ජා නෑ මේ දේශපාලනය කොච්චර සාහසිකද කිව්වොත් එවකට උන් වහන්සේගේ මතය මේ පවත්නා සාම්ප්‍රදායික දේශපාලකයන්ට තර්ජනයක් වන හින්දා ඒ ඒ සභාවල උදවිය යොදවලා උන් වහන්සේට අදාළ ධර්මායතනයේ අනිත් තැන්වල ඉන්න හිටින්න බැරි තැනට වැඩ කළා. වේදනාවෙන් අපවත් වුණේ ඇත්ත වශයෙන්. ඒක තමයි මේකේ ඇත්ත. එදත් උන් වහන්සේට ඒක කියා ගෙන ඒ කියන්නේ උන් වහන්සේ බොහොම අපි වගේ රළු විදිහට නෙවෙයි. බොහොම මෘදු විදිහට අහන් ඉන්න පුළුවන් ලස්සනට කිව්වා. හැබැයි අපි අපේ යුගයට එන කොට එදා උන්වහන්සේ දැක්කාට වඩා පරිසරය හාත්පසින්ම වෙනස්. අපිට මෘදු බසින් අමත අමත ඉන්න හුරතල් කරන්න වෙලාවක් නෑ. ඒ නිසා තමයි කෑ ගහලා අපිට කියන්න සිද්ධ වෙන්නේ. අපෙන් පස්සේ එන හාමුදුරුවරු සමහර වේලාවට ඉතින් වෙන ක්‍රියාමාර්ග වලට යයි. ඒක අපි කියන්න දන්නේ නෑ.

ප්‍ර : මගේ අවසාන ප්‍රශ්නය ස්වාමීන් වහන්ස ඔබ වහන්සේලා මෙම දැනට සිදු වන අකටයුතුකම් සම්බන්ධයෙන් කිව්වා මේ සම්බන්ධයෙන් රජයන් යම් කිසි පියවරයන් ගන්නේ නැහැ කියලා කිව්වා. ඔබ වහන්සේලාට මේ සම්බන්ධයෙන් ඉදිරියට යම් පියවරක් ගැනීමට හැකියාවක් තියෙනවාද?

FAIR COMMENT BY JEZEEM

පි : අපි විශ්වාස කරනවා දේශපාලනිකව විතරයි මේකට උත්තරයක් හොයන්න පුළුවන්. මොකද නීති සම්පාදනය කරන්නේ පාර්ලිමේන්තුවේ. ඉතින් දැන් යම් පමණකට අපට විශ්වාසයක් තැබිය හැකියි සිංහල බෞද්ධ මතය ජයග්‍රහණය කරලා තියෙනවා රටේ ජනාධිපතිවරයා තුළින්. ඔහු රුවන්වැලි මහා සෑය ළඟ ඒක ලෝබකමක් නැතුව කිව්වා. ඔහුට ඔහුගේ දර්ශනයට අනුව මේ කටයුතු ටික සම්පූර්ණ කර ගැනීමට පිරිවරක් පාර්ලිමේන්තුව තුළ ගොනු වුනොත් අපි හිතනවා යම් පමණකට හෝ අපට මේවාට උත්තරයක් සාදා ගැනීම සඳහා ඒ කියන්නේ අනාගත අපේ දරුවෝ ගැටුම් වලින් තොරව නෛතික රාමුවක් ඇතුළේ ආරක්ෂා කර ගැනීමට වැඩ පිළිවෙලක් යොදා ගන්න මොනවා හරි කරන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. ඒ හොඳ මිනිස්සු ටිකක් පාර්ලිමේන්තුවට ගියොත්.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය</u>

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී පෙර RGG 49 වශයෙන් සලකුණු කරනු ලැබූ ලේඛනයට අමුණා ඡායාරූප තුනක් එකී ලේඛනයට පාදක වූ සිද්ධීන්ට අදාළ වන ආකාරයේ වන ඡායාරූප තුනක් Colombo Today සඟරාවෙන් උපුටා ගන්නා ලද බවට පෙනී යන ආකාරයේ ඡායාරූප තුනක් ස්වාමීන් වහන්සේ විසින් ගරු සභාවට ඉදිරිපත් කරනු ලැබුවා. ඒ අනුව එම ඡායාරූප තුන RGG 49 (A),RGG 49 (B) සහ RGG 49 (C) වශයෙන් සලකුණු කිරීම සඳහා ගෞරවයෙන් අවසර අයැද සිටිනවා.

****

<u>ගරු විනිසුරු අදිකාරි මහත්මිය</u>

ප්‍ර : ස්වාමීන් වහන්ස මටත් ප්‍රශ්න ටිකක් තියෙනවා මම ඔබ වහන්සේ මෙම කොමිෂම හමුවේ කියපු කුර්ආනය සහ හදීස් ගැන පුංචි ප්‍රශ්න ටිකක් ඉස්සෙල්ලාම අහලා ඊට පස්සේ තිරසාර ලෙස අපේ රටට සාමය සංහිඳියාව ගෙන ආ හැක්කේ කෙසේද කියලා ප්‍රශ්නයක් අහන්නත් අදහස් කරනවා. ඔබ වහන්සේ මෙම කොමිෂම හමුවේ දැන් දින ගණනාවක් ඉදිරිපත් කරන ලද කරුණු අනුව නිරීක්ෂණය වුණා ඔබ වහන්සේ ඉතා හොඳින් මෙම ශුද්ධ වූ කුර්ආනය සහ හදීස්, සුන්නා වැනි මොහොමඩ් නබිතුමාගේ සහ අල්ලාහ් දෙවියන් විසින් උන් වහන්සේට ලබා දුන්න ලියවිලි පිළිබඳ හොඳින් අධ්‍යයනය කරලා තිබෙන බව. ඔබ වහන්සේට කියන්නට පුළුවන්ද මේ ඉස්ලාම් රාජ්‍යය කියන එක හෝ කැලිෆට්

FAIR COMMENT — BY JEZEEM —

එක මේ ශුද්ධ වූ කුර්ආනයේ හෝ හදීස්වල කිසියම් තැනක තියෙනවා නම් එම තැන මොකක්ද කියලා?

පි : පුළුවන්. බොහෝ තැන්වල තියෙනවා. මැතිනියනි ඉස්සර වෙලාම ඒ ප්‍රශ්නේට උත්තරෙත් එක්ක මේ ඉස්ලාම් සහ මුස්ලිම් කියන්නේ මොකක්ද කියලා තේරුම් ගත්තොත් අපිට මේ ඉතිරි ඔය මැතිනිය අහන ප්‍රශ්න දීමත් තේරුම් ගැනීමත් පහසු වෙනවා. දැන් මේ අපි කියන ඒවා නෙවේනේ මැතිනියනි ඒ ගොල්ලන්ගේම පොත් ඉස්ලාම් හැඳින්වීමක්. ඒකේ ඉස්ලාම් සහ මුස්ලිම් කියලා තියෙන්නේ. ඉස්ලාම් යනු අරාබි පදයකි. සාමය, අවනත වීම හා කීකරු වීම යනු එහි අදහසයි. අල්ලාහ් ස්වකීය නබි මොහොම්මදු රසරුල්ලාහ් තුමා මාර්ගයෙන් හෙළිදරව් කළා වූ ධර්මානුශාසනා සහ මාර්ග උපදේශයන් ඉදුරා පිළිගැනීම ඉස්ලාම් වේ. ඒ කියන්නේ කුර්ආනීය ඉගැන්වීම්වලට තමයි ඉස්ලාම් කියන්නේ. අල්ලාහ් දෙවියන් විසින් නබිතුමාට කිව්වා යැයි කියන පණිවිඩ සහ නියෝග තමයි ඉස්ලාම්. අල්ලාහ්ට ගැති වෙමින් ඔහුගේ මඟ පෙන්වීම හා රසරුල්ලාහ් සල් තුමාගේ දේශනාවන් ඒ කියන්නේ නබිනායක තුමාගේ දේශනා. ඒවාට තමයි හදීස්. හදීස් අනුව ස්වකීය ජීවිතය මුළුමනින්ම හැඩ ගස්වා ගන්නේ මුස්ලිම් වේ. එකී පදනම යටතේ මානව සමාජය ගොඩ නැගීම සඳහා ඔහු ක්‍රියාකරයි. ඉස්ලාමය හඳුන්වනු පිණිස මහමත් ආගම යනුවෙන් යෙදීම වරදක් වේ. එමඟින් ඉස්ලාම් හරයට ද පහරක් එල්ල වේ. ඉස්ලාම් කියන්නේ කුර්ආනයේ ඉගැන්වීම් හදීස් කියලා කියන්නේ නබිනායක තුමාගේ. එතකොට මුස්ලිම් කාරයෙක් වෙන්නේ මුස්ලිම් භක්තිකයෙන් වෙන්නේ මේ නබිනායකතුමාගේ ජීවන දර්ශනය නැත්නම් හදීස් අනුව ගොඩ නැගුණු ජීවිතවලට. එතකොට මැතිනිය අහපු ප්‍රශ්නේට උත්තර ටික මේ පොත් ටිකේ තියෙනවා. ඔවුන් ඔවුන්ගේ කලීපාතය ගොඩනැඟීම සඳහා ඔවුන් කතා කරන හරි අපූරු වචනයක් පාවිච්චි කරලා තියෙනවා. ඒ වචනය දැන් මැතිනියනි මම මේ එහෙන් මෙහෙන් කියන්නේ වැදගත්ම වචන ටික නිසා. මේ හදීස් කියවා ගෙන යන කොට එක වචනයක් අපිට හම්බ වෙනවා අකීදාව කියලා. අකීදා කියන වචනයේ තේරුම තමයි මොකද වරද්දන්න බෑ මේ සාක්ෂියක් හින්දා හරියට කියන්න ඕනී. අකීදා අකීදාව කියන්නේ මැතිනියනි යම් දෙයක් කිසිම සැකයකින් තොරව තරයේ විශ්වාස කිරීම. ඒ කියන්නේ මූලධර්ම. මේකේ වරහන් ඇතුළේ දාලා තියෙනවා මූලධර්මය කියලා. හැබැයි මේ අකීදාව ගැන කවුරුත් කතා කරන්නේ නෑ. ඔක්කොම ජීහාද් ගැන කතා කරනවා තවුහිද් ගැන කතා කරනවා. අකීදාව ගැන කතා කරන්නේ නෑ. එතකොට මේ

FAIR COMMENT BY JEZEEM

තියෙනවා මැතිනියනි සැමට ඉස්ලාම් අ.පො.ස.උසස් පෙළ අභ්දීයා සහ ධර්මාචාර්ය කොටස දෙක කියන පොතේ ඒ ගොල්ලො ලියපුවානේ. මවුලවියා එම්.අයි.එස්.සුහාරා ලියන පොතේ අකීදාවේ අන්තර්ගතය. බලන්න මැතිනියනි මේ හංගලා මේ ක්‍රියාවලිය තියෙන්නේ. එක් මුස්ලිම්වරයෙකු ඉමාන් කළ යුතු අංග සියල්ලම අකීදාවේ අන්තර්ගත වේ. අකීදාව ඉස්ලාමිය විද්වතුන් විසින් කොටස් හතරකට බෙදා ඇත. අකීදාව බෙදා ඇති අංශ හතරෙන් වැදගත්ම අංශය මෙය වේ. මෙහි ඉතාම වැදගත් කරුණ වන්නේ තවුහිදය විස්තර කර තිබීමය. අල්ලාහ් ඒ.කේ. ඔව් එතකොට කොටස් හතරකට බෙදලා තියෙනවා. දැන් මැතිනියනි මෙන්න මේ කලීපාතය ගොඩ නඟා ගැනීම සඳහා ඒගොල්ලොන්ගේ එක උපායක් පළමුවරට ඉස්ලාම් අකීදාව හඳුන්වා දෙනු ලැබුවේ ඒ කියන්නේ මේ මරාගෙන මැරෙන සංකල්පය කොහොමද ගෙනාවේ කියන එකයි මේ නොකියා කියන්නේ මේකට යොදා ගන්න ඕනී කණ්ඩායම් සහරාන්ලා බිහි වෙන්නේ මෙන්න මෙතනින්. පළමු වරට ඉස්ලාම් අකීදාව හඳුන්වා දෙනු ලැබුවේ කාන්තාරයේ ඔටුවන් රැක බලා ජීවත් වූ එතරම් උගත් නොවූ ජන සමූහයකට. එම නිසා ඔවුන්ට තේරුම් ගැනීමට පහසු ආකාරයෙන් ඉස්ලාමයේ මූලිකාංග හා උපදෙස් සැකසී තිබූ හෙයින් ඒවා පහසුවෙන් පිළිගෙන විශ්වාස කළහ. ඔවුන් අතර කිසිදු ප්‍රතිවිරුද්ධ අදහසක් දක්නට නොලැබුණු නිසා අකීදාවේ පිවිතුරු භාවය ආරක්ෂා විය. නැති බැරි දුප්පත් මිනිස්සු තමයි මේ ගොල්ලොන්ගේ එක ඉලක්කයක්. එහෙත් පසු කාලීන්ව මෙම තත්ත්වය වෙනස් වී කොමියුනිස්ට් වාදය වැනි විවිධ සංකල්පයන් චින්තනයන් ආශ්‍රයෙන් අකීදාවට එරෙහිව විවිධාත්මක විවිදාත්මක තර්ක ඉදිරිපත් විය. දැන් මට පෙන්වන්න වුවමනාව තියෙන්නේ මැතිනියනි මෙන්න බලන්න අකීදාවෙහි කොටස් වෙන් වී ගිය පිරිස්. ඒකට කියන්නේ මේ වල්ජමාත් කියලා කියන්නේ. ඒගොල්ලොන්ගේ භාෂාවෙන්. අහ්ලුක් සුන්නා වල් ජමාත් කියලා අන්තර්ගත වෙන පිරිස් කියලා අල් අස් අයිරියා අල් මාතුර්දියා අල් තවුහිද් ඔය තවුහිද් වාදය. ඔය තවුහිද් තවුහිද් නමින් ඉන්නේ ඔය සංවිධාන. තබ්ලික් අහ් තබ්ලික් තබ්ලික් ජමාත් කියන්නේ ඒක. ඉහ්වාන් මුස්ලිමින්. ජමාතුල් ඉස්ලාම්. ජමාතුල් මුස්ලිමින්. මේ ගොල්ලොන්ගේ මේ සංවිධානනේ මේ ලෝකේ බිහි කරලානේ තියෙන්නේ. අර ප්‍රධාන කණ්ඩායම් වලට අමතරව අකීදාවට ගිහිල්ලා බෙදෙනවා. එතකොට මැතිනිය අහපු

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : ඔබ වහන්සේ ඔය කියවන්නේ හදීස් එකේ තියෙන එකක්ද ස්වාමීන් වහන්ස?

පි : ඔව් මැතිනියනි. ඒ හදීස්වල මේ කියපු ක්‍රියාමාර්ග. හදීස් මැතිනියනි හදීස් කොච්චර තියෙනවාද

ප්‍ර : නෑ ඔබ වහන්සේ වෙළුම් හයක් තියෙනවා කියලා කිව්වනේ.

පි : ඔව් මම ඒවා පෙන්නන්නම් මැතිනියනි. ඒවා ඔක්කොම මෙතන තියෙනවා.

ප්‍ර : ඔය පොත මොකක්ද ස්වාමීන් වහන්ස?

පි : මේ පොත මැතිනියනි සැමට ඉස්ලාම් .

ප්‍ර : ඔය ඉස්කෝලේ පොතක්ද ?

පි : සැමට ඉස්ලාම් අ.පො.ස.උසස් පෙළ සහ ධර්මාචාර්ය සඳහා කොටස් තුනක් අපිට හම්බ වෙලා තියෙනවා. මේ දෙවෙනි කොටස.

ප්‍ර : ඕන කවුද Publisher?

පි : මවුලවියා එම්.අයි.එස්.සුහාරා ඉස්ලාම් බී.ඒ. කියලා දාලා තියෙනවා. IBH publication දැන් මට මැතිනියනි මද්‍රසාවල උගන්වන්නේ. මම මේ කියන්නේ මැතිනියනි දැන් අපි කියනවානේ දැන් මේ පරිවර්තන බොරු කියයි. මේක වැරදි වෙන්න පුළුවන්. Printing mistake එකක් කියයි. ඉංග්‍රීසි වචන නෙවේ සිංහලට පරිවර්තන තියෙන්නේ. ඕගොල්ලො තේරුම් ගන්න විදිහ වැරදි කියලානේ මේ හදීස් ගැන කියන්නේ. දැන් මේවා තේරුම් ගන්න පුළුවන් දේවල්නේ අපිට. මේ අපේ සිංහල භාෂාවෙන් අපේ රට ඇතුළේ උගන්වන ඒවානේ. ඒ නිසයි මෙතෙන්ට වැඩි අවධානයක් යොමු කළේ මැතිනියනි. මේක වටපිටාව කියන්නේ නැතුව මේ කලීපාතයට එන්න බෑ ඒක නිසා. දැන් මෙතන කියනවා මැතිනියනි ඔන්න දැන් ඔබතුමිය ඇහුවානේ කොහොමද මේ කලිෆාතයක් බිහි කරන්නේ කියලා මෙන්න කියනවා 98 වෙනි පිටුවේ. කිලාෆත් නම් දේශපාලනය අරමුණු කොට ගත් සාමූහික සැලැස්මත් ජමාත් නම් සමූහය අරමුණු කොට ගත් සාමූහික සැලැස්මත් සැම විටම එකිනෙකට බැඳී ක්‍රියාත්මක වේ. මොහොම්මත් සල්ලල්ලාහු අලෙයිවසම් තුමාගේ මෙන්ම කුලඅ උරර්රාෂිවරුන්ගේ පාලන සමයේදීද කිලාෆත් හා ජමාත් එකට බැඳී ක්‍රියාත්මක වූ බව හඳුනා ගත හැකිය. ජමාත් නම් සාමූහික සැලැස්ම නුඹළා හොඳින් ග්‍රහණය කර ගන්න. නුඹලා වෙන් වී යෑමට විරුද්ධව මම තරයේ අවවාද කරමි. ජමාත් නම් සාමූහික සැලැස්මෙන් වියතක ප්‍රමාණයක් වෙන් වී දුරස්ව යාම ඉස්ලාම් නම් වටයෙන් සම්පූර්ණයෙන්ම වෙන් වී දුරස් වී යෑමට සමාන වේ. අබුදාවුත්. යටත් වීමක් නොමැතිව නායකත්වයක්

FAIR COMMENT BY JEZEEM

නොමැත. නායකත්වයක් නොමැතිව සාමුහයක් නොමැත. සමුහයක් නොමැතිව ඉස්ලාම් නොමැත. ඒ නිසා තමයි අපි කොහේ බැලුවත් මේ ගොල්ලෝ සමුහ වශයෙන් ඉන්නේ. වෙනම කලාප වෙනම සමුහ. ඒ තැන් වල තමයි ඉස්ලාම් තියෙන්නේ. ඇයි වෙන ආගම් නෑ. වෙන ජාතිකයෝ නෑ. වෙන සංස්කෘතීන් නෑ. ඒ ගොල්ලොන්ට ප්‍රශ්නයක් නෑ. මොකක්වත් නෑ. එතකොට ඒ කලීෆාතය සම්බන්ධයෙන් මේ තියෙන මේ අපි කතා කරපු හදීස් වල හදීස් හයෙන් හතරක් තියෙනවා. ඒවාගේ සම්පුර්ණයෙන්ම තියෙන්නේ හොඳ ඒවාත් තියෙනවා. 29716 ක් තියෙනවා හදීස් වැකි. 29716 ක්. කුර්ආනයේ තියෙනවා වගන්ති 6666 ක්. ඒවාගේ හොඳ ඒවාත් තියෙනවා. ඉතාම හොඳ දේවලුත් තියෙනවා. නමුත් සමස්තයක් විදියට ගත්තාම අවසාන විග්‍රහයේදී තියෙන්නේ මේ රටවල් අල්ලන වට්ටන ක්‍රම. දැන් මැතිනියනි මෙතන ගත්තොත් මෙන්න බලන්න

ප්‍රශ්නය:- මේත් පොතක් K.උසද් අබ්දුදු කියලා අල්කුර්ආනය සහ සම්මත හදීසයන් ඇසුරෙන් නිගමනවලට බසින්න. සම්පාදනය සහ සැකැස්ම මදීරා අල් මුකර් අමාහි දාරුල් හදීස් ආයතනය. විශ්වාස නොකරන්න වුන් කාෆිර්වරු අපි . විශ්වාස නොකරන්න වුන් සමඟ මිතුදම් පැවැත්වීම සහ ඔවුන් සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කිරීම ඉස්ලාමය අනුමත කරන්නේද ?

උත්තරය :- නැත.

සමහර හදීස් වලට ගියාම තියෙනවා හදවතින් සිනා නොවන්න. එය පවා තියෙනවා. ඒවා කියන්න ගියොත් ලොකු මේවා එකක් වෙනවා. මෙන්න අල්කුර්ආන් 5/501 සුරාව. යාළුවෝ ගැන කියන්නේ. එහෙයින් තොපගෙන් යම් කෙනෙක් ඔවුන් යහළුවන් ලෙස පිළිගන්නේද ඔහුද ඔවුන් අතරෙන්ය කියලා හදීසයේ කියනවා කුර්ආනයේ කියනවා වෙන එකක් ඒකටම direct කරලා හදීසය බලන්න කියනවා ටක්ගාලා. හදීසය මොකක්ද කියන්නේ අසවල් අසවල් ගෝත්‍රයේ අය අපේ මිතුරෝ නොවෙති.

ප්‍ර : මොන ගෝත්‍රයේද ස්වාමීන් වහන්ස ඔය කියන්නේ මොන ගෝත්‍රද ඔය කියන්නේ?

පි : නෑ ඒක කෙටියෙන් කියන්නේ වෙන කවුරුවත් උඹලාගේ යාළුවෝ නොවෙයි. මේ සටනට යද්දී. ඒ ගොල්ලන්ගේ මේ ආක්‍රමණ වැඩපිළිවෙල ගෙනියන විදිහ මේ. ඉතින් මේවා වැඩිදුර අධ්‍යයනය සඳහා යන්න ඕනී. ඉතින් ඉස්ලාම් දරුවෙක් මේක කියෙව්වොත් යන්න ඕනී මද්‍රසාවක එහෙම නැත්නම් අර උලමා ළඟට තමයි. ඒ ගොල්ලො වහබිසම් නම් උගන්වන්නේ ඒ ගොල්ලෝ මේ හොඳ දේ නෙවේ කතා කරන්නේ. ඔවා හිතවත්

FAIR COMMENT BY JEZEEM

වෙලා හිටපන් අපේ වැඩේ කර ගන්නකම් කියලා එහෙම වැඩක් තමයි මේ.

ප : ස්වාමීන් වහන්ස මට තව ප්‍රශ්නයක් පැහැදිලි කර ගන්න දැන් ඔය ශුද්ධ වූ කුර්ආනය නබිතුමන්ට අල්ලාහ් දෙවියන් දීපු සහ නබිතුමන්ට අල්ලාහ් දෙවියන් කියපුවා ලියවුණානේ නබිතුමන් ජීවත්ව සිටින කාලයේදී නමුත් මේ හදීස් ගැන තියෙනවානේ මතයක් මේ නබිතුමන් මිය ගියාට වසර දෙතුන්සීයයකට පසුව ඔහුගේ අනුගාමිකයින් විසින් ලියන ලද දේවල් කියලා මේ හදීස්වල තියෙන්නේ. ඔබ වහන්සේට ඒ පිළිබඳව මොකක්ද කියන්න තියෙන්නේ එම හදීස් එතකොට ?

පි : නෑ මැතිනියනි දැන් මම මේ පොතෙන් මේක කියන්නකෝ ඉස්ලාම් හැඳින්වීමක්. දැන් අපේ මතය නෙවෙයිනේ වැදගත් මෙන්න මැතිනියනි දැන් ඒ ගොල්ලො ලියපු එකම බලමුකෝ. අල්කුර්ආන් සහ අල්හදීස්. අල්ලාහ්ගේන් පරිසමාප්තව පහළ වුණේ අල්කුර්ආනයයි. එය ඉස්ලාම් දේශනා හා අන පනත්වල මූලසාරය වේ. ආගම, සදාචාරය, මානව ඉතිහාසය, වතාවත්, ඥාණය, ප්‍රඥාණය අල්ලාහ් මිනිසාගේ අන්තර් සම්බන්ධය ඇතුළුව සමාජ යුක්තිය ආර්ථිකය දේශපාලනය ව්‍යවස්ථා අධිකරණය නීතිය ජාත්‍යන්තර සම්බන්ධය සඳහා ඉවහල් වන අර්ථාන්විත ඉගැන්වීම යනාදිය අල්කුර්ආනයේ අඩංගු වැදගත් කරුණු වේ. ඊළඟට කියනෙවා හදීස්. මොහොම්මත් රසරුල්ලාහ් සල්තුමා අකුරු නොදත්ත. එයා අකුරු දන්නේ නෑ. කියවීමට හෝ ලිවීමට නුපුළුවන. එහෙත් නබි අනුගාමිකයන් සහබාවරුන් විසින් රසරුල්ලාහ් තුමාගේ උපදෙස් පරිදි උපදෙස් යටතේ අල්කුර්ආනය කට පාඩම් කිරීමත් ලේඛන ගත කිරීමත් සිදු විය. මේ අනුව අල්කුර්ආනය පහළ වූ ප්‍රකාරයෙන්ම පහළ වූ ප්‍රකෘති භාෂාවෙන්ම ඕනෑම කෙනෙකුට ලබා ගත හැක. එහි අරුත් සඳහන් පරිවර්තන ග්‍රන්ථ දෙක භාෂා රැසකින් පහළ වී ඇත. අල්හදීස් යනු රසරුල්ලාහ් තුමාගේ දේශනා, අදහස් සහ ක්‍රියාවන්ය. ඉතාම පැහැදිලිව මේ හැම එකකම පෙන්වන්නේ කුර්ආනයට පස්සේ උතුම්ම හැදෑරීම හැටියට හදීස් සලකන්න කියලා තමයි මේ සියළුම ඉගැන්වීම් වල ඇත්ත වශයෙන්ම කියන්නේ. දැන් මෙන්න මැතිනියනි අර කලිපාතය සම්බන්ධයෙන් අහපු ප්‍රශ්නේට උත්තරේ 18 වෙනි පිටුවේ. සාමාන්‍ය විග්‍රහයට අනුව මම මුස්ලිම් අයෙකු නොවෙමි. නමුත් අල්ලාහ්ට අවනත වූවෙකු වශයෙන් මමද මුස්ලිම් වෙමි. කුර්ආනය හා ඉස්ලාම් සෙසු විෂයන් හීදී දිව්‍යමය ශක්ති රාශියක් අඩංගුව පවත්නා බව මම දනිමි. ඒවායෙන් මා ද සෙසු බටහිර ජාතීන්ද උගත යුතු දේ තවත්

FAIR COMMENT BY JEZEEM

අනන්තවත් ඇත. අනාගතයේ එකම ආගමක් පිණිස වූ අවශ්‍ය සෑම අංගයක්ම, තොරතුරක්ම ඉස්ලාම්හි අන්තර්ගතව ඇත. එකම ආගමයි. ඒක තමයි තවුහිද්. ඒක දේවවාදය. ඒකට තමයි අර කියපු කලීදාවෙන් එක එක විදිහට කණ්ඩායම් හදලා දැන් කට්ටිය එනවා කල්ලි කල්ලි නෑ අපි නෑ වෙන කල්ලියක්. නෑ අරමුණට වෙන පාරවල් ගොඩක්. අතු ගංහා ගොඩක් හදනවා. දැන් මැතිනියනි හැම එකකම බලන්න මේ තවුහිද් ඒක දේවවාදය. හැම එකකම මේ. ඒවායෙන් කියන්නේ අල්ලාහ්ට විතරයි අවනත වෙන්න පුළුවන්. වෙන කාටවත් අවනත වෙන්න බෑ. මේ තියෙන්නේ. ප්‍රාථමික අවදියේ සිටින මුස්ලිම්වරුන්ට සළාතේ මඟ පෙන්වීම සඳහා පොත. ඇත්තේ එකම දෙවි අල්ලාහ් පමණය. එකම මිනිස් සමාජයක් එම නිසා මුළු මිනිස් සංහතියම අවනත විය යුත්තේ එකම දෙවියන් වූ අල්ලාහ්ට පමණක්ය. අල් ඉස්ලාමීය ඉගැන්වීම මෙයයි. තව මැතිනියනි කාලේ ගියත් මේ චුට්ටිත්තක්

ප්‍ර : ස්වාමින් වහන්සේ දැන් එකම දෙවි කෙනෙක් අදහනවයි කියන එකෙන් අදහස් වෙනවාද ඉස්ලාම් රාජ්‍යයක් තමයි ඒකෙන් දක්වන්නේ කියන එක එකම දෙවි කෙනෙක්?

පි : ඒ කියන්නේ මැතිනියනි අර කිව්වේ ලෝකයේ එකම ආගමක් වෙනකම් සියළුම සැලසුම් හදලා තියෙන්නේ කියලා ඉස්ලාමීන්. අනිත් ආගම් තියෙන්න බෑ.

ප්‍ර : ඒක කොහේද තියෙන්නේ හාමුදුරුවනේ?

පි : දැන් මේ කිව්වේ මැතිනියනි මේ . මේ තියෙන්නේ . අනාගතයේ එකම ආගමක් පිණිස වූ අවශ්‍ය වූ සෑම අංගයක්ම තොරතුරක්ම ඉස්ලාම්හි අන්තර්ගතව ඇත. එතකොට මේ පොතේ ඉස්ලාම් ආගම හඳුනා ගනිමු. සෑම මුස්ලිම්වරයෙක්ම තවුහිද්වාදියෙක් විය යුතුයි. එනම් අල්ලාහ් පමණක් විශ්වාස කළ යුතුයි. නැමඳුමට සුදුසු දෙවියා අල්ලාහ් පමණයි. නැමදීමට සුදුස්සා ඔහු හැර වෙන කිසිවෙකු නොමැත. ඔහුට කිසිවක් සම නොකළ යුතුයි වගේ ඔක්කෝම තියෙන්නේ තවුහිද්, ජීහාත්.

ප්‍ර : ස්වාමින් වහන්ස දැන් ඔය මම ඔබ වහන්සේට මීට පෙරත් සඳහන් කරන ලද පරිදි ලෝකයේම විද්වතුන් අතර කථිකාවතක් මේ හදීස් පිළිබඳව තිබෙනවා ඔය තවුහිද් සහ ඔය ඉස්ලාම් රාජ්‍යය පිළිබඳව කතා කරන පොත් පත් වල තියෙන දේට වඩා වෙනස් ආකාරයකට මේවා පසුකාලීනව ලියවුණු ලියවිලි කියලා අවුරුදු දෙතුන් සීයකට පසුව. ඒ වගේම මම ඔබ වහන්සේගෙන් දැන ගන්නට කැමති ඔබ වහන්සේට අවස්ථාවක් ලැබුණාද ඔය නබිතුමන් ජීවතුන් අතර සිටි යුගයේ සහ එතුමන් මක්කම සිට මදීනාවට ගොස් යුද්ධය කරපු සමයේ තිබුණු ලියවිල්ලක් Madina

FAIR COMMENT BY JEZEEM

Charter හෝ Madina Declaration කියලා. ඔබ වහන්සේට ඒක ගැන කිසියම් අධ්‍යයනයක් කරන්නට ලැබුණාද?

පි : ඉස්ලාම් ගැන හොඳම කතාව එතනින් කියවෙනවානේ මැතිනියනි. ඔහු මක්කාවේ ඉන්න කොට හැමදාම රණ්ඩු. මිනිස්සු ගහනවා. ඉන්න දුන්නේ නෑ. මක්කම ඉඳලා මදීනාවට පලා ගියා. මදීනාවට පලා ගියාම මදීනාවේ හිටියේ යුදෙව්වෝ ආදී තව ටිකක් සාමයට ලැඳී කට්ටිය හිටියා. ඒ ගොල්ලොත් එක්ක මෙයා ගිවිසුමක් ගැහුවා. සාමයෙන් ඉන්නවා කියලා. අනේ අර මිනිස්සු එක පිළි ගත්තා . පිළි අරගෙන අවුරුදු 10 ක් ගියේ නෑ මදීනා Period එක. මොකද කළේ ගිවිසුම ගහපු උන්දැලාට කට උත්තර නැති වෙන්නම කරන්න ඕන සියළු සංහාරය කරලා ඔහු බලය ඇල්ලුවා. ඒ ගැන ඔය මදීනා මේවා එක ගැන කතා කරන්නෙත් නෑ දැන්. හදීස් තමයි ප්‍රමුඛතාවය හැටියට දෙන්නේ. ඔහු මක්කාවේ ඉඳලා මදීනාවට ගිහිල්ලා හොඳින් ඉන්නම් මට ඉන්න විදිහක් නෑ කියලා අනේ ඉතින් ඉන්න දුන්නා. ඉන්න දුන්නට පස්සේ ඔක්කොටම ගහලා මුන් මේක අල්ලා ගත්තා.

****

දැන් වේලාව : ප.ව.07.50 යි.
මෙතැන් සිට ල/ලේ :- සවිනි මෙය.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වේලාව:ප.ව.07.50
පෙර සටහන්: මුතුමාලි මෙනවිය.
මෙතැන් සිට: සචිනි මෙනවිය.

<u>ගරු අදිකාරී මැතිණිය.</u>

ප්‍ර: ඊට පස්සේ ඒක නැතිවුණාද අර ගිවිසුම?

උ: ගිවිසුම ක්‍රියාත්මක වෙන්න මිනිස්සු ඉන්න එපැයි මැතිණියනි. අර ඉන්න හිටින්න දුන්නවුන් මරලා දැම්මා ඔක්කෝම. පර්සියාවට ගිහිල්ලා පර්සියාවේ මිනිස්සු ටික මරලා එක රැයින් ගෑනු ටික ඇල්ලුවා.ඒකේ තියෙන ඒවා දැක්කොත් මේ මිනිහා කියනවානේ ස්ත්‍රීයක්ගේ සමහර දේවල් දිහා බලන්න එපා ඇස් අන්ධ වෙනවා කියලා.එතන ඉඳලා ඒ මේවා එළියට දාන්න එපැයි. අපි අද විඩියෝ පටියකුත් කොහොමත් ඉදිරිපත් කරනවා. මැතිණියනි ඒ වාගේ ඒක ලොකු එකක් නෙවෙයි. ඔහු ඇත්තටම නබිතුමාව තේරුම් ගන්න පුළුවන් එයාගේ දර්ශනය මදීනා එකෙන් තමයි.

ප්‍ර: ඒක උපායශීලි ලෙස කරපු එකක්?

උ: නැහැ බලය හම්බ වුණාට පස්සේ පිස්සු හැදෙන්න ඇති.හොඳට හිටියා කට්ටියත් එක්ක සහයෝගයෙන් ගිවිසුමක් ගැහුවා සහයෝගයෙන් ඉන්නවා කියලා උඹලා උඹලාගේ මේකේ කියනවා අල්වරා අල්බරා කියල එකක් තියෙනවා. මේගොල්ලන්ගේ ඔබට ඔබේ ආගමය අපට අපේ ආගමය තොපට තොපේ ආගමය. නෑ නෑ ඔය ගොල්ලොත් ඉන්න අපිත් ඉන්නම් අපිට ඉන්න දෙන්න.

ප්‍ර: ඒක කොහේද තියෙන්නේ ස්වාමින් වහන්ස?

උ: අල්වරා අල්බරා. ඒවා තියෙන්නෙත් හදීස්වලම තමයි.

ප්‍ර: එහෙම තිබුණාම ඊට පස්සේ මොකද වෙන්නේ අල්වරා අල්බරා කියලා හදීස් වල තියෙනව නම්?

උ: ඒ අල්වරා වල්බරා කියලා තමයි අර වැඩේ කරේ ගිහිල්ලා. මම මගේ එක අදහන් ඉන්නම් උඹලා උඹලාගේ එක අදහන් ඉදපල්ලා කරදරයක් නැනේ කියලා මෙයාගේ පිරිස ලොකුවෙච්ච ගමන්ම දීලා ඇද්දා ඔක්කෝටම ඊට පස්සේ ගිවිසුම් නෑ.

ප්‍ර; දැන් ස්වාමින් වහන්ස මම මේ උත්සාහ කරන්නේ දැන් මට ටිකක් මේ හිතට වැදුණා ඔබ වහන්සේ කිව්වාම මේ මේකට විසඳුමක් තියෙන බවක්පේන්නේ නැහැ. මේ කුරානය සහ හදීස් වැනි අන්තවාදී ලියවිලි ඉස්ලාම් ජනතාව විසින් භාවිතා කිරීම තුළින් කියලා. ඔබ වහන්සේට මේ හිතෙන්නේම නැද්ද මේකට විසඳුමක් තියෙන්නට පුළුවන් කියලා බුදුන්වහන්සේගේ දේශනාවෙවත් නැද්ද ස්වාමින් වහන්ස මේ හැම ප්‍රශ්නයකටම විසඳුමක් තියෙනවානේ. ඉතින් මෙවැනි ප්‍රශ්නවලටත් විසඳුම් තියෙනවා කියන ?

FAIR COMMENT — BY JEZEEM —

උ: මැතිණියනි, බුදුහාමුදුරුවෝ දීඝ නිකායේ මට සුත්‍රය මතකයට එන්නේ නැහැ චක්කවත්තිසීහ නාද සුත්‍රයේදී බුදු හාමුදුරුවන්ගෙන් අහනවා රාජ්‍යයේ පැවැත්ම කෙසේ වියයුතු ද? බුදුහාමුදුරුවෝ පෙන්වනවා චක්‍රවර්ති රාජ්‍යයක තියෙන්න ඕන ආකෘතිය. බුදු හාමුදුරුවෝ ගියේ නැහැ දේශපාලනයට අතගහන්න. එයා කියනවා රටේ නායකත්වය ගැන කියන ගමන් රටට ඉන්න ඕනේ ප්‍රබල හමුදාවක්. ඒ කියන්නේ ඉතාම ශක්තිමත් ආරක්ෂික විධි උත්තරය ඒක ඇතුලේ තියෙනවා. දැන් මේවා පාලනය කරන්න දැන් එදා වගේ නෙවේ අද. අද ගෝලීය තත්ත්වයන් වෙනස් ඒවාත් එක්ක දැන් අන්තර්ජාලය හරහා මේවා ගොඩනැගැන්නේ දැන් මේ පොත් ඒවා මේවා පැත්තකට විසිකරත් මැතිණියනි මේවා Google එකට ගිහිල්ලා ගහලා ගන්න පුළුවන්නේ. ඒ සයිබර් අවකාශය කොහොමද පාලනය කරන්නේ. මේක අපි හිතන මේ thinking pattern මේ අපේ රටේ මුස්ලිම් මිනිස්සු අපිට බැහැ ලෝකය හදන්න යන්න හැබැයි අපි වෑයම් කරන්න ඕනේ අපේ රටේ මුස්ලිම් මිනිස්සු අර උග්‍ර අන්තවාදයට තල්ලු කරගන්නේ ඒ අයත් එයත් එක්ක සාකච්ඡාවකට යන්න. ඒ කියන්නේ මේ හදීස් මේක විවෘතව කතා කරන එක තමයි ධර්ම මාර්ගය. ඒ කියන්නේ අපිට තියන එකම දේ ඒක. බුදුහාමුදුරුවෝ පෙන්නලා තියෙනව දර්ශනය හැටියට තියෙන්නේ දැන් අපි අපේ ධර්මය බබළනවා විවෘතවෙන තරමට. හැබැයි මේ ගොල්ලෝ මේක විවෘත වෙන්න දෙන්නේ නැහැ. නොයෙක් බොරු ලියනවා. නොයෙක් බොරු ලියනවා. කිසිම කෙනෙක් සත්‍ය ප්‍රකාශ කරන්න එකක් නැහැ ඔය උලමා කෙනෙක් මෙතෙන්ට ආවොත්. මොකදඑහෙම කියන්න තහනම් ඒ ගොල්ලන්ට. ඒත් එහෙම කළොත් දවස් තුනයි ගිහිල්ලා ආපහු තවුබා කරන්න ඕනේ ඒ කියන්නේ පාපෝච්චාරනය කරන්න ඕනේ මං පොඩි පාවා දීමක් කලා කියලා. සොහොන් පිටියවත් දෙන්න එපා කියලා කියන්නේ. ඉතින් මේක ඉතින් මේ දෙවියන්ගේ සැලැස්ම. ඒ මේගොල්ලන්ට වෙලා තියෙන්නේ උපතේ ඉඳලම පුදුම ප්‍රශ්නයක් මුළු ජීවිතයම ආගම එකයි තියන ප්‍රශ්නය. නමුත් උත්තරයක් හොයා ගන්න බැරි වෙන්න. බලමු මැතිණියනි පොඩි උදාහරණයක් දැන් අපි පිළිගත් මේ ශිෂ්ට සමාජයේ සාමාන්‍යයෙන් අවුරුදු 7,8,10,12 ළමයින් කසාදය කියන එක පිළිකුල් කරනවානේ අද අපි. ඒවා ළමා හිංසනය හැටියටනේ ගනන් ගන්නේ. බරපතල වරදක්. දැන් මේ බලන්න මැතිණියනි නබිතුමානෝ පෙන්වා දුන් විවාහ ජීවිතය මම නෙමේ කියන්නේ.

ප්‍ර: ඒක කවුද ලියලා තියෙන්නේ හාමුදුරුවනේ?

උ: සංස්කාරක මවුලවි ඉල්හාස් රසාදි කියලා එක්කෙනෙක්,සංස්කාර මවුලවි ඉල්හාස් රසාදි කතිකාචාර්ය රසාද් අරාබි විදුහල කොළඹ. දැන් මැතිණියනි මේකට අදාළව

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ස්වාමීන් වහන්ස ඕවා මද්‍රසා පාසැල්වල තියෙන පොත්ද?

උ: ඔව් මද්‍රසා මේ පොදුවේ මැතිණියනි ඕනකෙනෙකුට ගිහිල්ලා මිලදී ගන්න පුළුවන්. දැන් මැතිණිය මේ මැතිණිය අහපු ප්‍රශ්නයට උත්තරය මෙන්න මේ වීඩියෝ පටයේ තියෙවනවා. අයිෂාand මොහොමඩ් කියන එකේ. මේක කෙටි වාර්තා චිත්‍රපටයක් විනාඩි 40ක් තියෙනවා. මේක ප්‍රසිද්ධියේ බලන්න බැහැ. නමුත් ඒ අදාළ කුරානයේ තැන් හදීස් ඔක්කෝම quote කරලා තමයි බොහෝම විචිත්‍රවත් විදියට මේක හදලා තියෙන්නේ. මිනිස්සුන්ට තේරුම් ගන්න අයිෂා and මෙහොමඩ් මේ චිත්‍රපටිය .

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

අවසරයි ස්වාමීන් වහන්ස මේ කොමිෂමට ලැබිලා තියෙන කාර්ය භාර්ය පැහැදිලිව දක්වලා තියෙනවා අපිට ලබා දිලා තියෙන බලතල වලට අනුව. එයින් ප්‍රධාන වශයෙන් අපේ අවධානය යොමු කරන්නේ පාස්කු දින ප්‍රහාරය සම්බන්ධවයි. ඊට පසුව ඊට හේතු පාදක වුණු කරුණු මොන සංවිධාන ද මොන පුද්ගලයින් ද සම්බන්ධයෙන් තමා අපිට හොයන්න බලන්න තියෙන්නේ. ඊට අමතරව පාස්කු දින ප්‍රහාරයෙන් පස්සේ යම්කිසි ස්ථානවල සිදු වූ කටයුතු සම්බන්ධයෙන් ඒ කියන්නේ ආගමික සංහිඳියාවට ඇති වූ බලපෑම් සම්බන්ධයෙන් සෙවීමක් කරන්න ඕනේ මේ කොමිෂම. ආගමක් තුළ ඒ ආගමේ වැරදි බව නිවැරදි බව සම්බන්ධයෙන් සලකා බැලීමක් කිරීම අපිට ලැබිලා තියෙන බලතල ඇතුළට වැටෙන් නැති කාර්යක් ගරු ස්වාමීන් වහන්ස. ඒක හින්දා ඒ එක් එක් ආගම සම්බන්ධයෙන් බෞද්ධ හෝ හින්දු හෝ ඉස්ලාම් හෝ කතෝලික හෝ වේවා ඒ ඒ ආගම තුළ තියෙන දේ හරිද වැරදි ද කියන එක මං හිතන්නේ අපිට මේ කොමිෂම ඉදිරියේ තර්කානුකූලතාවයක් ඇති කරගන්න බැහැ. ඒ හින්දා පාස්කු ප්‍රහාරයට සම්බන්ධව ඊට හේතු පාදක වුණු කරුණු ගැන පමණක් සාක්ෂි ලබා දෙන ලෙසට ගෞරවයෙන් ඉල්ලනවා.

උ: මැතිතුමණි ඇත්තටම හරි හොඳමයි ඒක මම පිළිගන්නවා. මම මේ කියන්න උත්සාහ කරේ දැන් ඔය අපි මේ කතා කරන සියළු සංවිධාන මැතිතුමණි නිකම්ම ගොඩනැගෙන්නේ නැහැ. ඒකට ideology එකක් ඕනේ. දැන් මේ සංවිධාන අපි තහනම් කලොත් වෙන වටයකින් තව සංවිධාන ටිකක් හැදෙයි. මං මේ පෙන්වන්න උත්සාහ කළේ අන් කිසිවක් නෙවේ ඒ කියන්නේ මේ ප්‍රශ්න දැන් මෙච්චර ගැටුම් වෙලා පාස්කු ප්‍රහාරයකුත් වෙලා තියෙද්දිත් දැන් පහු ගිය දවස් වල ඔය විවාහ නීතිය සම්බන්ධයෙන්, බුර්කාව

FAIR COMMENT BY JEZEEM

සම්බන්ධයෙන් ඒ නීති පැනවීම ගැන කතා කරන්න එනකොට මුළු Society ම විරුද්ධයි. ඒ කියන්නේ ඒ ගොල්ලෝ කියන්නේ අල්ලාහ් දෙවියෝ පනවපු ඒවා වෙනස් කරන්න බැහැ. ඒව මිනිස්සුන්ට වෙනස් කරන්න බැහැ. එතකොට අපි කොහොමද මේ ප්‍රශ්නයට උත්තරයක් හොයාගන්නේ. දැන් මං මේ පෙන්වන්න උත්සාහ කළේ ඇත්ත වශයෙන්ම මේ අපහාස කිරීමක්වත් එහෙම අදහසකින් නෙමේ දැන් විවෘතවම දැන් මට තප්පරයක් දෙන්න මැනිතුමනි උදාහරණයක් විදියට දැන් මේ සිදුවීම බලන්න අපිට මේක ගත්තොත් ඒ සමාජයේ දරුවෝ රටේ නීතියක් තිබුණාට ඒ දරුවෝ ඒ නීතියට අනුගත නොවී අපි හිතමු බාල විවාහ වලට ගියා කියලා . මාතලේ එහෙම සිද්ධියක් වුණා. ගැටුමක් එතකොට මේ ideology එක පැහැදිලි කර ගැනීම සඳහයි මේ යම් යම් කොටස් පෙන්නුවේ. දැන් ඊයේ පෙරේදා මං පෙන්නුව විඩියෝ පටය අබ්දුල් රාසික් කියන පුද්ගලයා කියනවා තවුහිද් ජමාතේඅපේ මුස්ලිම් විවාහය ගැන කොහොමද අනික් කට්ටිය තීන්දු ගන්නේ කරලා බලමු. එහෙම අභියෝග කල හැකිද රටේ ව්‍යවස්ථාවට නීතියට. අපේ රටේ නීතිය අපේ ව්‍යවස්ථාවේ කොටසක් නෙමේ එහෙම තියෙද්දි. එතකොට මම කියන්න උත්සාහ කළේ දැන් ඒ ආගමික කතෘවරයාගේ ආගමික නායකයාගේ ජීවන දර්ශනයෙන් ප්‍රකට කරන සිද්ධියක්.

ප්‍ර: ඒ කාරණා සම්බන්ධයෙන් මිට කලින් වතාවකුත් කොමිෂමේ අවධානය යොමු කිරීමට යම් සාක්ෂිකරුවන් ප්‍රයත්න දැරුවා. අපි ඒ අවස්ථාවේදීත් ඒකට අවකාශ ලබා දුන්නේ නැහැ, ස්වාමින් වහන්ස. මොකද ඒක අපේ බලතල ඇතුළට වැටෙන කාරණයක් නොවන හින්දා. ඒ හින්දා ගෞරවයෙන් ඔබ වහන්සේට කියන්න තියෙන වෙනත් කරුණු ඉදිරිපත් කරන ලෙසට ඉල්ලනවා.

උ: ඔව් මොකද විවාහ සම්බන්ධව කියපු නිසා මේක කියන්නම වෙනවා මොකද මං පොරොන්දු වුණා මේක කියනවා කියලා.

ප්‍ර: අවසරයි ස්වාමින් වහන්ස ගෞරවයෙන්

****

<u>ගරු අදිකාරි මැතිණිය</u>

ප්‍ර: ස්වාමින් වහන්ස මගේ අවසාන ප්‍රශ්නය මට අහන්න ඉඩ දෙන්නකෝ. දැන් මේ කොමිසමට බලතල තියෙනවා අතිගරු ජනාධිපතිතුමන් වෙත ඉදිරිපත් කරන කතාවට නිර්දේශ ලබා දෙන්නට පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව ශ්‍රී ලංකාවේ යම් යම් පළාත්වල ඇතිවුණානේ ජාතිවාදී වැනි ස්වරූපයේ ගැටුම් එවැනි ගැටුම් නැවත ඇතිවීම වැළැක්වීම් සඳහා ගත යුතු ක්‍රියාමාර්ග

FAIR COMMENT BY JEZEEM

මොනවාද කියන එක සහ ඊට අමතරව තිරසාර ලෙසම මේ රටේ සිංහල දෘවිඩ මුස්ලිම් කතෝලික ඉස්ලාම් හින්දු බෞද්ධ සියලුම ජන කොට්ඨාශ සාමකාමීව ජීවත් වීම මේක තිරසාර ලෙස මේ අද මොකක් හරි පැච්වර්ක් එකක් දාලා නතර කරලා ආයි මිනිස්සු ගහමරාගන්න එකක් නෙමේ. තිරසාර ලෙස මේක ඇතිකිරීම සඳහා සාමකාමී සහ ජීවනය ඔබ වහන්සේට මොකක් හරි යෝජනාවක් කරන්න තිබෙනවානම් එම යෝජනාව කරන්න කියලා මං ඔබ වහන්සේ ගෙන් ඉල්ලනවා.

උ: ඉස්ලාම් කියන්නේ සාමය නම් ඒ සාමය තුළ ජීවත් වෙන්න ඕන කරන ඉගැන්වීම් අදාළ කර නොගන්න තාක්කල් අපිට මේ ප්‍රශ්නයට උත්තරයක් නැහැ. ඒකයි අපි මේ කියන්නේ මේවාට දේශපාලන උත්තර නැහැ කියලා. ඉස්සර වෙලා මේ තියෙන ideology එක පරාජය කරගන්න ඕනේ. එක්කෝ ඒගොල්ලොත් එක්ක කතා කරලා මේක ලොකු ගැටලුවක් මේක විශේෂයෙන් අපි වගේ රටවල්. ඒ අදහස පෙන්වීම මම මැතිතුමනි වරදක් නෙමේ මේක පැත්තකින් තියමුකෝ. ඉස්ලාම් යනු කුමක්ද ඒ ගොල්ලන් මේ සමාජය තුළ බෙදා හරින පොත්පත්. දැන් ඒකෙන් මොකක්ද මේ ජමාතේ ඉස්ලාම් දැන් මේ ගොල්ලෝනේ මේ මරාගෙන මැරෙන මිනිස්සු හැදුවේ. එතකොට ඒකේ අපි කොහොමද අපි තිරසාර සාමය හරි ඔය මැතිණිය කියන අපි අපේක්ෂා කරන සාමකාමී රට අපි කවුරුත් කැමතියි ලස්සනට මේ රටේ ජීවත් වෙන්න අපි විවිධත්වයට කැමතියි. කොහොමද කරන්නේ. ඉස්ලාමය සමස්ථ ලෝක ව්‍යාප්ත කිරීමේ අරමුණින් යුක්ත වූ ධර්මයකි. ඉතින් මේක ඒ දරුවන්ගේ ඔලුවට ගියාම උන් කල්පනා කරනවා කොහොමද මේක කරන්න පුළුවන් කියලා. එතනයි තියෙන ප්‍රශ්නය. ඒ හේතුව හොයන්නේ නැතිව බල්ලෙකුට ගලක් ගහපුවාම බල්ලා ගල හපා කනවා. සිංහයෙකුට ගලක් ගහපුවාම සිංහයා බලනවා ගල එන්නේ කොහෙන්ද කියලා. බුදුහාමුදුරුවෝ අපිට උගන්වලා තියෙන්නේ ඒ සිංහ සෙයියාවෙන් බලන්න. ඒක තමයි හේතුඵලවාදී න්‍යාය.එතකොට දැන් මේගොල්ලෝ කියනවා නම් ඒගොල්ලන්ගේ ඉස්ලාමය සමස්ථ ලෝක ව්‍යාප්ත කිරීමේ අරමුණින් වූ ධර්මයකි. එය වත්මන් ලොවට මෙන් අනාගත ලොවටත් මහ පෙන්වන්නකි. මැවුම් කරුවාගේ ඒකී භාවය විස්වාසයෙන් යුතුව පිළිගෙන ඔහුගේ අභිමතයට අවනතව ක්‍රියා කිරීම පදනම් කරගත්තකි. සියල්ල ආරම්භ වන්නේ එකම දෙවියන්ගෙනි.ඊළඟට මෙතන කියනවා මේ පොතේම මේ

FAIR COMMENT
BY JEZEEM

ඉස්ලාම් යනු හුදු අධ්‍යාත්ම විද්‍යාමය ධර්මයක් නොවේ. ඉතින් මැතිතුමණි මේ අපිද ලියලා තියෙන්නේ.

ප්‍ර: පොත්පත්වල තියෙන දේවල් මේ කොමිසම හමුවේ බොහෝ අවස්ථාවලදී ඉදිරිපත් වුණා ස්වාමීන් වහන්ස. අපිටත් ඕනේ මේ කොමිෂම නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා මේ පොත්වල මෙහෙම කියනවා මෙහෙම කියනවා මෙම ගැටලුවට අපි විසඳුමක් ලබාදීමක් සිද්ධ වෙන්නේ නැහැ. ඔබ වහන්සේ දැන් විශාල දැනුමක් තිබෙන නිසා සරලව ඔබ වහන්සේ කියන්න දැන් මේ මූලධර්මවාදී අදහස් මේ විවිධ පොත් පත් වල තියෙනවා. එහෙම නම් එය නැති කිරීම සඳහා මොකක්ද කළයුත්තේ, එවැනි පිළිතුරු ඔබ වහන්සේට දෙන්න පුළුවන් නම්?

උ: දැන් මැතිණියනි මේ කොමිෂමට සාක්ෂි දෙන්න ඇවිල්ලා ඇවිල්ලා ඒ තොරතුරු මාධ්‍යවල පළවුණාම ඊජිප්තු Embassy එවනවා. අපේ කරුණු දැක්වීම ගැන ලිපියක් ඒ ලියුමේ මොකක්ද කියන්නේ අපි මේ තියෙන්නේ මැතිණියනි Egupt and Sri Lanka on the same page.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: ගරු ස්වාමීන් වහන්ස ඊජිප්තු තානාපති කාර්යාලය විසින් නිකුත් කරන ලද මාධ්‍ය නිවේදනය කර්දාවි සම්බන්ධයෙන් නිකුත් කරන මාධ්‍ය නිවේදනය නේද?

උ: ඔව්.

ප්‍ර: අපි ඒ සම්බන්ධයෙන් දැනුවත් වෙලයි තියෙන්නේ.

උ: හොඳමයි. දැන් මැතිණියනි අපි මෙහෙම හිතමුකෝ ඇත්ත වශයෙන්ම අපිට ඕන දැන් ඒ මිනිස්සුත් එක්ක ගහගන්න බෑනේ. මේ මුස්ලිම් මිනිස්සු කපලා කපලා මුහුදට දාන්න ද නැහැ. මොකක් හරි මේකට විසඳුමක් අවශ්‍යයි. එතකොට මැතිණියණි මං මේ පෙන්නන්න උත්සාහ කළේ පොත් පත් පෙන්නුවේ අන් කිසිවකට නෙමේ මේ පොත් පත් වල ලියලා තියෙන්නේ මේ යුසුප් අල් කර්දාවිලාගේ මතවාදය. එතකොට ඒ ගොල්ලන්ගේ නම් එක්ක මේ පොත් වලට ලිව්වාහම ඒ ගොල්ලෝ සංවිධාන හදලා තියෙනවා. ඒ සංවිධාන වලට ආධාර දෙන Muslim World League එක තියෙනවා. එතකොට ඉස්සරවෙලාම කරන්න ඕන මෙන්න මේ දැන් මේ ඊජිප්තු Embassy එවපු ලිවුමෙම තියෙනවානේ ඔය ගොල්ලොන්ගේ රටයි අපේ රටයි දෙකම එකම threat එකකට මුහුණ දෙනවා. Same Enemy සමාන හතුරෙක්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ගරු ස්වාමීන් වහන්ස ඔය ලිවුම ඔබ වහන්සේට ලැබුණ ද නැත්නම් මේ ඔබ වහන්සේටම පුද්ගලිකවම ලැබුණු ලේඛනයක් ද?

උ: මාධ්‍යය මගින් මොකද මගේ නමත් සටහන් කරලා තියෙනවා මේකේ.

ප්‍ර: අපි ඒ සම්බන්ධයෙන් දැනටමත් අවධානය යොමු කරලා තියෙන්නේ. අපි

උ: මැතිතුමණි මට මේ මැතිණිය අහපු එකට, කියන්න උත්සාහ කළේ මේ පොත් පත් මේ ඔක්කොම අරන් ආවේ අපේ පාණ්ඩිත්‍ය පෙන්වන්න නෙවෙයි. මේ සෑම පුස්තකයකම දැන් මේ ප්‍රබෝධය සඟරාව ජමාතේ ඉස්ලාම්, තබ්ලික් ජමාත්. දැන් ඔය ප්‍රහාරයට සම්බන්ධ මේ අන්තවාදී වහබ් වාදී සංවිධාන කියන ඒවා නිකන් පෝෂණය වෙන්නේ නැහැ මැතිතුමණි. මේ මේවායේ තිබෙන හදීසයන් හරහා මේ සාමාන්‍ය පොත් පත් ලිවීමෙන් මේ මතවාද ජනගත වීමෙන් තමයි අර හොඳින් ඉන්න සාමාන්‍ය සාම්ප්‍රදායික මුස්ලිම් දරුවෝ මේ අන්තවාදී අදහස් වලට යන්නේ. එතකොට අපිට අධ්‍යාපන අමාත්‍යාංශය තුළ විශාල කාර්ය භාරයක් තියෙනවා. මේ මැතිණිය අහපු ප්‍රශ්නයට උත්තර විදියට මේක හදන්න පුළුවන් අධ්‍යාපනයෙන්. Attitudes. එතකොට මේ ආකල්ප වෙනස් කරලීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සම්පූර්ණයෙන්ම මේ මුස්ලිම් කටයුතු අංශය මේ පෙළ පොත් සකස් කරන අංශය සම්පූර්ණයෙන්ම සංස්කරණයකට යටත් කළ විය යුතුයි. ඒවට සාම්ප්‍රදායික මුස්ලිම්වරු දාලා කොයි විෂය පථය ද උගන්වන්න ඕන. කොයි කුරානය ද උගන්වන්න ඕන. මේ රටේ සාතිශ්‍ය බහුතරයක් සාම්ප්‍රදායික මුස්ලිම් මිනිස්සු එක්දාස් නමසිය පනස් ගණන් වල ලියවුණු ඒ වික්‍රමසිංහ මහත්තයෙක් පරිවර්තනය කරපු කුරානය තමයි පිළිගන්නේ. හැබැයි ඒ අන්තවාදී කොටස් ආවට පස්සේ දැන් ඒ කුරානය නැහැ. යෝනක ඉස්ලාමීය සංවිධානය ඒ ගොල්ලෝ හදපු. එතකොට පළවෙනිම රාජකාරිය තියෙන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයේ. මොකද මේ පෙළපොත් සහ මේ ග්‍රන්ථ ප්‍රකාශනය සම්බන්ධයෙන් මේවා නියාමනය සම්බන්ධයෙන් අපි පනතක් ගේන්න කියලා කියන්නේ මැතිතුමණි මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුවේ ඉඳලා. ග්‍රන්ථ ප්‍රකාශන නියාමන පනත අද වෙනකන් නැහැ. 2012 ඉඳලා මේ 20 වෙනකන් අපි ඉල්ලලා තියෙනවා ග්‍රන්ථ ප්‍රකාශන නියාමන පනත. අපිට ගිහිල්ලා කියන්න පුළුවන් මේකේ අන්තවාදී අදහසක් තියෙනවා මේකේ ඒක වෙන්නේ නැහැ. ඒක හින්දා අධ්‍යාපනය තුළින් තමයි මේක වෙනස් කරන්න පුළුවන්. ඒ

FAIR COMMENT BY JEZEEM

අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් දැන් මට තව එකක් පෙන්නන්න ඕන ඒ ගමන්ම දැන් මේ අපි ඊයේ වෙන කොට තව සංවිධානයක් හොයා ගත්තා. IIRF. ඉස්සර තිබුණේ IIRO ඒකත් තියෙනවා. IIRF මේ බය නැතුව Islamic Information and Research foundation මේක තියෙන්නේ 162/03, මැල්වත්ත, ඉලුක්වෙල, වැලඩ, කුරුණෑගල. මේ ගොල්ලෝ මේ බලන්න මැතිතුමණි මහ පාරේ ඉස්ලාම් ආගමට හරවන වැඩ සටහන් කරගෙන යනවා. සංහිදියාව හදන්න පුළුවන් ද. දවා මේ. Beginner Level purpose Dawa Training Galle, Purpose Dawa Training Puttalam ඊළඟට අනිත් එක කොළඹ. මේ ඔක්කෝම ස්ථාන දක්වලා තියෙනවා වරකුඹුර, ස්ථාන 11 ක් විතර. මේ වැඩි කාලෙක නෙවෙයි. මේ ඊයේ පෙරේදා.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනිතිඥ සුහර්ෂි හේරත් මහත්මිය.</u>

ගරු සභාපතිතුමනි ස්වාමීන් වහන්සේ විසින් ඉදිරිපත් කරන සාක්ෂිය පැහැදිලි කරන ලේඛනයක් ලෙසට Islamic Information and Research foundation official web site යන වෙබ් අඩවියෙන් බාගත කරන ලද ලේඛනයක් ලෙසට ඉදිරිපත් කරන මෙම ලේඛනය පිටු 4 කින් සමන්විතයි. එකී ලේඛනය RGG 50 ලෙස සලකුණු කිරීම සඳහා අවසර අයැද සිටිනවා.

ඌ: දැන් මැතිතුමණි මේ බලන්න මේ සහරාන්ලා වගේම තමයි. තවුහිද් මේ පින්තූරයේ ඉන්නවා 07 දෙනෙක් . ඒ 07 දෙනාම මහ පාරේ ඇගිල්ල හරියට කෙළින් කරගෙන මේ දවා කරනවා මහා පාරේ. මේ ආගමික පොත් පත් කුරාන් බෙදා දෙනවා ළමයින්ට. එතකොට මේ තියෙන්නේ පින්තූරත් එක්ක ඒවා.

****

<u>ගරු අදිකාරි මැතිණිය.</u>

ප්‍ර: ස්වාමීන් වහන්ස මොකද්ද ඔය දවා කරනවා කියලා ඔබ වහන්සේ කියන්නේ?

ඌ: දවා කරනවා කියලා බස්ලාම් නොවන අය ඉස්ලාම් ආගමට හැරවීම ඒක සංවිධානාත්මක ව්‍යාපාරයක් විදියට ගෙනියනවා. එතකොට දැන් අපි ද බලන්න ආගමික ගැටුම් ඇති කරන්නේ කියන්නේ ක්‍රිස්තියානි මිනිස්සුන්ට කොච්චර හිත රිදෙනවා ඇද්ද Jesus was a Muslim. ඉතිං මේ ගොල්ලොන්ට අනුව ජේසුතුමත් මුස්ලිම් එක්කෙනෙක්. එතකොට ක්‍රිස්තියානි අයගේ හිත

FAIR COMMENT BY JEZEEM

රිදෙන්නේ නැද්ද, මේ ඉතිං ඒ සමාජයත් ඉලක්ක කරල තියෙනවා. ජේසුතුමත් මුස්ලිම්. මේ ලේඛන ටික අපිට ඉදිරිපත් කරන්න පුළුවන්. අවශ්‍ය නම් මේ පින්තූර මේ දවා කිරීම මොකද අපි මේක නතර කරන්නේ කොහොමද කියලා අහනවා. දවා කිරීම Muslim world League එකේ අංක 01. ඉස්ලාමයට මිනිස්සු මොකද ඒ ගොල්ලන්ට ඕන මුස්ලිම් රාජ්‍යයක් ගොඩනැගීම නම් ඒ ගොල්ලෝ විවිධ ක්‍රම පාවිච්චි කරනවා. අද අප්‍රිකාව වැනි රටවල තත්ත්වය මොකද්ද,

ප්‍ර: ඔබ වහන්සේට ඔය දවා කිරීම පිළිබඳව ස්වාමීන් වහන්ස තියෙනව ද ගොඩාක් සංඛ්‍යාලේඛනාත්මක වශයෙන් තොරතුරු?

උ: මං කලින් අවස්ථාවක ඒ ඔක්කොම ඉදිරිපත් කරා සංඛ්‍යා එක්කම.

ප්‍ර: ලංකාවේ කොයි ප්‍රදේශ වලද ස්වාමීන් වහන්ස ඔය දවා කිරීම බහුල වශයෙන් සිද්ධ වෙන්නේ?

උ: ලංකාව පුරාම. සිංහල සමාජය වගේම විශේෂයෙන් දෙමළ සමාජය.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: ඔබතුමා ඉදිරිපත් කරපු අර ඡායාරූපය කොහේද ගත්තේ කියලා?

උ: ඒ ගොල්ලොන්ගේ වෙබ් අඩවියේ තිබෙනවා.

ප්‍ර: ඒ කියන්නේ IIRF

උ: IIRF

ප්‍ර: වෙබ් අඩවියෙන් ගත්ත පින්තූරයක් ද?

උ: මැතිතුමණි,

ප්‍ර: IIRF වෙබ් අඩවියෙන් ගත්ත පින්තූරයක් ද ඔබ වහන්සේ මේ දවා කරනවා කියලා පෙන්නුවේ?

උ: ඔව් ඒ ගොල්ලෝ අලුත් වැඩපිළිවෙළක් විදියට මේ දවා කිරීම ආරම්භ කරලා තියෙනවා.

ප්‍ර: එක ඇඟිල්ල උස්සගෙන ඉන්න

උ: ඔව්. ඔව්. මේ IIRO නෙවෙයි. IIRF වෙනම එකක්. මේ CD පටයෙත් සම්පූර්ණයෙන් තියෙනවා ඒ ගොල්ලෝ කොහොමද දවා කරන්නේ කියලා.

****

FAIR COMMENT
BY JEZEEM

ගරු අදිකාරි මැතිණිය.

ප්‍ර: ස්වාමීන් වහන්ස IIRF කියන්නේ මොකද්ද? අකුරු 4 න් කියන්නේ,

උ: කිව්වා මං දැන්.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනිතිඥ සුහර්ෂි හේරත් මහත්මිය.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේ දී ස්වාමීන් වහන්සේගේ සාක්ෂියේ සඳහන් කරන්නට යෙදුණු දවා කිරීම යන කාරණාව පැහැදිලි කිරීම සඳහා ඊට අදාළ වන ඡායාරූපයක් සභාවට ඉදිරිපත් කර තිබෙනවා. එම ඡායා රූපය IIRF වෙබ් අඩවියෙහි දක්නට ලැබෙන ඡායාරූපයක් ලෙසට ස්වාමීන් වහන්සේ සාක්ෂියක් ලබා දෙනවා. ඒ අනුව එම වෙබ් අඩවියෙන් බාගත කරන ලද ඡායා රූපයක් බවට උන් වහන්සේ සඳහන් කරන මෙම ඡායාරූපය මෙම සභාවට RGG 51 වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා.

උ: ඒ වගේම ඒ ගොල්ලෝ බෙදන පොතක තව එකක් දෙන්න අවශ්‍යයි. එදා අපේ මැතිතුමා ඇහුවා මේ සකාතේ ගැන.

ප්‍ර: මොහොතක් සමාවෙන්න ඕන, මේ නිදහස් චතුරස්‍රය ද?

උ: ඒ කොළඹ අවට කොතන හරි කියලා හරියට , CD එකෙත් තියෙනවා. ඒකේ පින්තූර Coloure පින්තූර ගන්න පුළුවන්.

****

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.

ප්‍ර: ඔය CD තැටියේ මොකද්ද අඩංගු වෙන්නේ?

උ: ඒ ගොල්ලෝ දවා කරන ක්‍රමය.

CD තැටියක් ධාවනය කරනු ලබයි.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනිතිඥ සුහර්ෂි හේරත් මහත්මිය.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේ දී ස්වාමීන් වහන්ස විසින් සභාවේ අවධානයට ඉදිරිපත් කරන ලද විඩියෝ පටය ඇතුළත් එම CD තැටිය RGG 52 වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා.

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: ස්වාමීන් වහන්ස කෙටියෙන් විස්තර කරන්න පුළුවන් ද ඒ CD මොනව ද තියෙන්නේ කියලා?

උ: ඒ කියන්නේ මැතිතුමනි ඒක අලුත් ක්‍රමයක්. ඔය දවා කිරීම කියන එක ඒ ගොල්ලොන්ගේ ප්‍රධානම අංගයක්. ඉස්ලාම් නොවන අය ඉස්ලාම් ආගමට හරවා ගැනීම. ඒකේ අරමුණ තමයි වඩා ඉක්මනින් දේශපාලන බලය ලබා ගැනීම. ඒකට තමයි අර බහු විවාහය කියලා සලඟිසම්වල එකේම කොටසක් මේ. තබ්ලික් ජමාතේ කියන්නේත් ඕකට තමයි. විදි සංචාරය කරමින් Street දවා. මහ මගදී හමු වන්නන්ට ඉස්ලාමයේ පණිවිඩය කියා දීම. දැන් මේ ගොල්ලෝ අලුත් ක්‍රමයක් පටන් අරන් තියෙනවා කනට අර ෆෝන් එක දාලා අහන්න දෙනවා. මේක පොඩ්ඩක් අහන්න කියලා. කියනවා හරි ෂෝක් ලස්සන මියුසික් එක. ඊට පස්සේ සම්බන්ධකම් ඇති කරනවා. පොත් පත් බෙදා දෙනෝ. ඊට පස්සේ කෑම්ප් එකකට එන්න කියනවා. ඒ වගේ ගැහැණු ළමයින් නම් පුළුවන් නම් යාළු කරගෙන කසාද බඳිනවා. ඉතිං නානා ප්‍රකාර ක්‍රම වලින් ඒ ගොල්ලන්ට මොකද දවා කිරීම ඒක හරි පැහැදිලිව දක්වලා තියෙනවා ඒක අපේ බුද්ධාගමේ අපි උගන්වන්නේ මේ පරලොව දී මේ මහ මේඝ පලදනාවක් හරි වස්තු ලබන්න අටපිරිකරක් පූජා කරන්න කියලා. ඒ ඉස්ලාමයේ ඉස්ලාමිකයින්ගේ ප්‍රධානම අංගයක් තමයි දවා කිරීම. ඉස්ලාම් නොවන කෙනෙකු ඉස්ලාමයට ගොදුරු කර ගැනීම දෙවියන් සතුටු වන්නා වූ කාරණාවක් කියලා ලියලා තියෙනවා. ඒක නිසා ඒ ගොල්ලොන්ගේ ජීවිතයේ එක අංගයක් විදියට ඒ ගොල්ලෝ පවත්වා ගෙන යනවා.

****

<u>ගරු අදිකාරි මැතිණිය.</u>

ප්‍ර: ස්වාමීන් වහන්ස දැන් මේක අලුත්ම වැඩ සටහනක්නේ මේ ඉස්ලාම් ආගමික මූලධර්ම වාදය ව්‍යාප්ත කිරීම. දැන් ඔබ වහන්සේ මෙම කොමිසම හමුවේ තවුහිද් ජමාත්, තබ්ලික් ජමාත්, ජමාතේ ඉස්ලාම් එහෙම ඉහ්වාන් කියලා. ඒ ගොල්ලොන්ගෙන් කාත් එක්කද මේ ගොල්ලන්ගේ සම්බන්ධතාවය තියෙන්නේ ස්වාමීන් වහන්ස ඒ කණ්ඩායම් වලින්?

උ: කෙටියෙන් කීවොත් මේ ඔක්කෝම වහාබි. ඔය වහාබිසම් එක ඇතුළේ ඒ වහාබි වාදය ගොඩනැගීම සඳහා එක එක පෙරමුණු.

ප්‍ර: එහෙම නැතුව ඔබ වහන්සේ දන්නේ නැහැ නේද පැහැදිලිවම මේ ගොල්ලෝ ජමාතේ ඉස්ලාම් තමයි සම්බන්ධ,

FAIR COMMENT BY JEZEEM

උ: ඒකනේ මැඩම් අර, ඒ ගොල්ලෝ IIRF හැටියට තවත් සංවිධානයක් හදනවා. අර මතවාදයටම තවත් සංවිධානයක් වෙන පැතිකඩක්. කොටසක් මද්‍රසා කරනවා කොටසක් මහ පාරේ වැඩ කරනවා. කොටසක් තමන්ගේ රැකියාවට එන මිනිස්සු ගොදුරු කර ගන්නවා. නා නා විද වැඩ සටහන්. දැන් මේ මේ ගොල්ලොන්ගේම IIRF සභරාවේ ඒ ගොල්ලෝ කියලා තියෙනවා මැතිණිය ඇහුවා එදා සකාතේ ගැන. මේ කියන්නේ සකාතේ කරුණු 08 ක් තියෙනවා. ඒකේ එක කරුණක් හැටියට කියනවා අල්ලාහගේ මගෙහි සටන් වදින්නන්ටත් සකාතේ ගෙවන්න ඕන කියලා. ලේඛනයත් ඉදිරිපත් කරන්න පුළුවන්. මොකද මේ අලුත්ම එකක් නිසා. මේ ඉතා පැහැදිලිව දක්වලා තියෙනවා මේ සකාතේ අර ඉස්ලාමයේ බද්ද අර සටන් කරන අයටත් දෙන්න කියලා.

ප්‍ර: ඔය මොකේද තියෙන්නේ ස්වාමීන් වහන්ස?

උ: ඔය IIRF සභරාවේ.

ප්‍ර: ඒ සභරාවේ?

උ: සභරාවේ. ඒ ගොල්ලෝ එක එක හදීසයන් follow කරනවනේ. දැන් මේ

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනිතිඥ සුහර්ෂි හේරත් මහත්මිය.</u>

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේ දී ස්වාමීන් වහන්සේ ඉදිරිපත් කරන ලද සාක්ෂි තහවුරු කිරීම සඳහා අරමුණ www. Purpose.lk නැමැති වෙබ් අඩවිය තුළින් භාගත කරන ලද ස්වාමීන් වහන්සේ පැහැදිලි කරන ආකාරයට එය IIRF නැමැති සංවිධානයට අදාළ වෙබ් අඩවියක් හැටියටයි හඳුන්වා දෙනු ලැබුවේ. මෙම ලේඛනයෙහි උන්වහන්සේ විශේෂයෙන්ම 32 වන පිටුවෙහි අදාළ වන කොටස සඳහන් වන බව කියා සිටින බැවින් මෙම සම්පූර්ණ ලේඛනය පිටු 48 කින් සමන්විත බව පෙනී යනවා. එකී පිටු 48 කින් යුත් ලේඛනය RGG 53 වශයෙන් සලකුණු කිරීමටත් ස්වාමීන් වහන්සේ විසින් අවධානය යොමු කරන ලද 32 වැනි පිටුව RGG 53 A වශයෙන් සලකුණු කිරීමටත් අවසර අයැද සිටිනවා.

****

FAIR COMMENT
BY JEZEEM

<u>ගරු අදිකාරි මැතිණිය.</u>

ප්‍ර: ස්වාමීන් වහන්ස ඔබ වහන්සේ මෙම කොමිෂම හමුවේ ප්‍රකාශ කරා ඔළුවිල් ප්‍රකාශනය කියලා එකක් ගැන. ඒ මොකද්ද ස්වාමීන් වහන්ස ඔළුවිල් ප්‍රකාශනය කියන්නේ?

උ: ඒ අශ්‍රොෆ් මැතිතුමා ඉන්න කාලේ මුස්ලිම් සමඟි පෙරමුණ හදලා ඒ ගොල්ලෝ නැගෙනහිර පළාත පාලනය කිරීම සඳහා වෙනම කලාපයක් ඉල්ලුවා. ඒ සම්බන්ධයෙන් ඒ ගොල්ලෝ ඔළුවිල් වලදි කරපු සාකච්ඡාවක් තමයි ඔළුවිල් ප්‍රකාශය. ඉතිං ඒ ඔළුවිල් ප්‍රකාශයෙන් උතුර දෙමළ අයට දෙනව නම් අපිට නැගෙනහිර ඕන කිව්වා. ඒ බෙදුම් වාදයම තමයි .

ප්‍ර: එහෙම මොකක් හරි ලියවිල්ලක් තියෙනව ද මේ රටේ?

උ: ඔළුවිල් ප්‍රකාශය බොහෝම පැරණි එකක්. අද මං ගෙනාවේ නැහැ. ඉදිරිපත් කරන්න පුළුවන්. ඒකේ තියෙන කරුණු.

ප්‍ර: ඒක ස්වාමීන් වහන්ස ආගමික මුහුණුවරකින් ද එහෙම නැත්නම් දේශපාලන මුහුණු වරකින් ද ආවේ?

උ: ඒ ගොල්ලොන්ගේ ඔක්කොම ආගමනේ. ඒ කියන්නේ ඒක ආගමික මුහුණුවරකින්. ඒ ගොල්ලොන්ගේ ආගමයි දේශපාලනයයි කියලා කතන්දරයක් නැහැ. දෙකම ඔක්කොම මුළු ජීවිතයම ආගමනේ.

ප්‍ර: දැන් ඒ ඔළුවිල් ප්‍රකාශනය වර්තමානයේ දී ඉදිරියට ගෙන යාම සඳහා කවුද ඉදිරිපත් වෙලා තියෙන්නේ ස්වාමීන් වනහන්ස?

උ: දැන් මේ ගැන වැඩිපුර කතා බහ කරන්නේ නැහැ. නමුත් ඒ කාලේ ඒ බෙදුම් වාදය සම්බන්ධයෙන් අපට උතුර නැගෙනහිර වෙනම කලාපයක් වෙනම පරිපාලන ඒකකයක් ඕන කියලා ඒ ගොල්ලෝ දැඩි ලෙස ඉල්ලිම් කරා. අඩු වැඩි වශයෙන් ඒ ගොල්ලෝ ඒ ඉලක්කවලටත් ගිහිල්ලා තියෙනවා.

ප්‍ර: ඒ ඔළුවිල් ප්‍රකාශනයේ තියෙනව ද ස්වාමීන් වහන්ස ඔය දැන් නැගෙනහිර පළාතේ විශේෂයෙන්ම ඔය කාත්තන්කුඩිය ඒ වගේ ප්‍රදේශ වල ඔය අරාබි රටක සංස්කෘතියකට පරිදි දේවල් සිදු වීම පිළිබඳව දේවලුත් ඇතුල් වෙනව ද?

උ: ඒකේ තියෙන්නේ පරිපාලන කාරණා.

ප්‍ර: මගේ අවසාන ප්‍රශ්නය ස්වාමීන් වහන්ස ඔබ වහන්සේ සිතමු කියලා නව සංකල්පයක් යටතේ වැඩ සටහනක් ආරම්භ කර ඒ සඳහා කටයුතු කරත් එය ක්‍රියාත්මක කිරීම ආරම්භයක් ගැනීමට නොහැකි වූ බව සඳහන් කරා. මෙම කොමිෂම හමුවේ ඔබ වහන්සේ ඉදිරිපත් කළ කරුණු අනුව පෙනී ගියා ඔබ වහන්සේ ශ්‍රී ලාංකිය ජාතිකත්වය වෙනුවෙන් කටයුතු කිරීම සඳහා නොයෙක් දේවල් කර තිබෙනවා කියලා. ඔබ වහන්සේ එම සංකල්පය

FAIR COMMENT BY JEZEEM

නැවත ඉදිරියට ගෙන යාම සඳහා අදහසක් නැද්ද ඒ සිතමු කියලා වැඩ සටහන?

උ: අපි දැනටත් ඒ වචනයෙන් ඒ ඒ ටික පාවිච්චි නොකලත් ඒ කටයුතු කරගෙන යනවා. අපිට ඕන වුණේ සිතමු.ඒ සිතමු කියන සංකල්පය ඇත්තටම ගොඩාක් උඩට දියුණු කරන්න. කියවමු නැගිටිමු. සිටුවමු නැගිටමු. ඒ වගේ සංකල්ප ගෙනැල්ලා අර අපිට ජාතින් අතර ජන වර්ග අතර තිබෙන දුරස්ථ භාවය දුරු කරගෙන අපි කියන්නේ මේ සමාජ ඒකාබද්ධතාවය ගොඩනගන්න පුළුවන් හොඳ වැඩ සටහනක් දැන් පැළ හිටවන කොට දැන් ඔක්සිජන් කාටත් ඕන කොයි දෙයියද කොයි බුදුන්ගෙ ද ඒවා අදාළ නැහැ. හුස්ම ගන්න එපැයි කවුරුත් . එතකොට මේ ගොල්ලෝ එකතු කරන්න ලේසි. දැන් සිතමු එක යටතේ ඇත්තටම අපි හිතුවා සිටුවමු නැගිටමු. ඉතිහාසය නම් කියවමු ඒ වගේ කියවමු නැගිටමු. ඒ වගේ සංකල්ප අපි ඉතිං ඒ කාලේ දේශපාලන යෝධයොත් එක්ක මේවා කරන්න හරි අමාරුයි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ගරු ස්වාමීන් වහන්සේගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අවශ්‍යද යන්න අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනි සිටින උගත් ජනාධිපති නීතිඥවරයාගෙන් අසමි.

****

<u>ජනාධිපති නීතිඥ ශාමිල් පෙරේරා මහතා.</u>

ප්‍ර: ගරු ස්වාමීන් වහන්සේ මෙම ගරු කොමිෂන් සභාව විසින් ආගමික සංහිඳියාව ගැන නොයෙක් ප්‍රශ්න ඔබ වහන්සේගෙන් ඇසුවා. දැන් මගේ ප්‍රථම ප්‍රශ්නය තමයි ඔබ වහන්සේ කිව්වා කිතු බල සේනාවක් සම්බන්ධයෙන්. දැන් මම ඒකට විකල්ප යෝජනාවක් ඔබ වහන්සේට ඉදිරිපත් කෙරුවොත් ඔබ වහන්සේ දන්නව ද අපේ ශ්‍රී ලංකාවේ 1970 පාර්ලිමේන්තු පනතක් තිබෙනවා ආගමික සම්මන්ත්‍රණ සභා පනත කියලා. Congress of Religions Act. ඒක සම්බන්ධයෙන් ඔබ වහන්සේ දන්නව ද?

උ: නැහැ.

ප්‍ර: දැන් එම පනත යටතේ ආගමික සමුළුවක් තිබෙනවා ඒ සමුළුවේ දැන් සාමාජිකයන් වන්නේ ආචාර්ය ඉත්තෑපාන ධම්මාලංකාර අනුනායක හිමි මහ ලේකම්. අතිගරු මැල්කම් කාදිනල් රංජිත්, එතකොට සිවාසි කැරුක්කාල් හින්දු බැතිමතුන් වෙනුවෙන්, මවුලවි M.S.M තාසිම් ජමෙයිතුල් උලමා සංවිධානයෙන් සහ

FAIR COMMENT BY JEZEEM

එබනිසා ජෝසප් මෙතෝදිස්ත සමාගමෙන් සහ වෙනත් ගිහියන් රාශියක් ඉන්නවා. දැන් මෙම ආගමික සමුළුව යම් යම් විශේෂ අවස්ථා වලදී එනම් විශේෂයෙන්ම මේ පාස්කු ප්‍රහාරයට පසුව එතකොට 2015 එවකට සිටි ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍රවිනිශ්චයකාරවරයාව බවත් කරන්න ගත් විධි විධාන යටතේ මෙම සමාජයෙන් යම් යම් යෝජනා ඉදිරිපත් කරලා තිබුණා. දැන් මම තමාට කිව්වොත් ගෞරවයෙන් මෙම පනත සංශෝධනය කර මෙම පනතට විශේෂ බලතල දී මෙම පනත ශක්තිමත් කිරීමෙන් සියළුම ආගමික බැතිමතුන් අතර ඒ මාර්ගයෙන් සංහිඳියාවක් ගොඩනගන්න පුළුවන් කමක් තිබෙනවා නේද?

උ: උත්සාහ කරලා බලන එක වටිනවා.

ප්‍ර: මොකද්ද ඒ සම්බන්ධයෙන් ඔබ වහන්සේගේ අදහස්?

උ: මෙහෙමයි අපිට නොයෙක් විදියේ දැන් අපේ තිබෙනවා බුද්ධශාසන කාර්ය සාධක බලකාය. බුද්ධශාසන කාර්ය සාධක කමිටුවක්. යම් යම් ප්‍රශ්න ඇති වුණාම ඔය වගේ ආගමික කණ්ඩායම් එකතු කරලා සර්වගාමික සංකල්පය යටතේ යම් යම් කමිටු, සංවිධාන හදලා තියෙනවා. අපි යෝජනා කරන්නේ ඇත්ත වශයෙන්ම මේ ප්‍රශ්නය මේ ආගමික සහජීවනය ගොඩනැංවීම සඳහා දැන් කාදිනල්තුමා ඉතා ඍජුව පිළිගන්නවා සහ එතුමා ප්‍රකාශ කරනවා මේක සිංහල බහුතරයක් ඉන්න බෞද්ධ දර්ශනයෙන් පෝෂණය වුණු රට. ඒක අවිවාදයෙන් පිළිගන්න ඕනෙයි කියලා එතුමා කියනවා. දැන් අපි හම්බ වෙච්ච වෙලාවේ දී එතුමා ඒක කිව්වා. එතුමා කියනවා යුරෝපයට වෙලා තියෙන දේ. පල්ලියෙන් මිනිස්සු ඈත් වීම නිසා ඒ කියන්නේ කතෝලික පල්ලියෙන් මිනිස්සු ඈත් වීම නිසා අනාගමික රාජ්‍යයන් බිහි වීමෙන් අද සිය දිවි නසා ගැනීම් ඇතුළු ඒ වෙච්ච විනාශ. එතකොට කාදිනල්තුමා ඉන්නවා. මේ පැත්තෙන් අපේ නිකායික නායක මට්ටම් වල හාමුදුරුවරු ඉන්නවා. එවැනි ආගමික සංවාදයක් ගොඩ නැංවීම සඳහා බල සහිත කමිටුවක් පත් කර ගන්න එක ප්‍රයෝජනවත්. ඒ ඒ දැන් උදාහරණයක් විදියට අපි දැන් මේ කතා කරන්නේ ඉස්ලාම් ගැන විතරයිනේ. දැන් අපි ගත්තොත් ක්‍රිස්තියානි මූලධර්මවාදීන් ගත්තොත් ඔබතුමාලට අදාළව ඒ කතෝලික මහ සභාවට ලොකු ප්‍රශ්නයක්. දැන් බලන්නකෝ මූලධර්ම එක ගැන මොකද්ද, ක්‍රිස්තියානි මූලධර්මවාදීන් බෙහෙත් ප්‍රතික්ෂේප කරලා උන් මැරෙනවා. බෙහෙත් නොබී. මුන් දෙවියන් වෙනුවෙන් මැරෙනවා. මූලධර්මවාදයේ අතර කිසි වෙනසක් නැහැ. අපි එහෙම මැරෙන්නේ නැහැනේ බෞද්ධයෝ. ඒ නිසා

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: සමාවෙන්න ගරු ස්වාමීන් වහන්සේ. දැන් ඒ සම්බන්ධයෙනුත් ඒ කියන්නේ මේ ක්‍රිස්තියානි මූලධර්ම සම්බන්ධයෙනුත් මෙම සමුළුව විසින් ප්‍රකාශන කරලා තිබෙනවා.

උ: ඔව්. මැතිතුමණිමං මේ කියන්නේ පොදුවේ අරගෙන. මේ ඇත්තටම අන්තවාදය කියන්නේ මොකද්ද, ආගමික අන්තවාදයන් ඇත්තේ කොහේද, ඒවායේ මුල කොහේද, ඒවා විකාශනය වුණේ කොහේද, ඒවා රට ඇතුළට ආවේ කොහොමද, දැන් කොයි කොයි අය අතේද මේක තියෙන්නේ. කින්ද මන්ද කියලා මේවා විමර්ශනය කරලා යම් කිසි හෙළිදරව්වක් සාමුහික වශයෙන් කරගත්තොත් සාක්ෂි කැඳවීමක් කරලා අර කලින් ජනාධිපති කොමිෂම වගේම මං හිතනවා ප්‍රබුද්ධ මිනිස්සුන්ට දැන උගත් මිනිස්සුන්ට නිති හදන ආයතන වලට ඉතාම යහපතක් වෙයි ඉක්මනින් මොනව හරි පියවරක් ගන්න. එතකොට අපටත් තැන් තැන් වල හඬ නගන්න වුවමනා කරන්නේ නැහැ. නමුත් අවාසනාවට ඒ ප්‍රශ්න සාකච්ඡා කිරීමට එකතු වෙන්නේ ඒ ප්‍රශ්න ගැන හරි හමන් විදියට අපි කියන මේ ග්‍රාමීය මට්ටමේ ඒ ඇති වන ගැටළු ප්‍රත්‍යක්ෂව දැකපු අය නෙවෙයිනේ. එතනයි මෙතැන තියෙන ගැටළුව. ඒ අපේ මහා නායක හාමුදුරුවෝ ඔය ඉත්තෑපානේ අපේ මහ නායක හාමුදුරුවෝ දැන් අවුරුදු 90 ට කිට්ටුයි. ඉතිං උන්වහන්සේලා කොහොමද ප්‍රශ්න වලට උත්තර සොයන්නේ. ප්‍රශ්න කතා කරන මිනිස්සුන්ට කෝ වේදිකාවක් මේ රටේ. ඒ නිසා ඔබතුමලා යෝජනා කරන්න මේ ප්‍රශ්න එක්ක හැප්පෙන ඇත්ත වශයෙන්ම මේ ප්‍රශ්න ග්‍රහණය කරගෙන ඒවා බෞද්ධ ද ඉස්ලාම් ද ඕන කෙනෙක් ඔක්කොම එකට වාඩිවෙලා කතා කරන්න පුළුවන් ආයතනයක් අපි පිහිටුවා ගමු.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනිතිඥ සුහර්ෂි හේරත් මහත්මිය.</u>

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේ දී ස්වාමීන් වහන්සේගේ පිළිතුරේ කොමිෂන් සභාවක ඉදිරිපත් වූ සාක්ෂි සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළේ ඒ මීට පෙර RGG 02 වශයෙන් සලකුණු කරන්නට යෙදුණු ශ්‍රී ලංකාවේ බෞද්ධයින් සදාචාර විරෝධී හා කූට උපක්‍රම මගින් අන්‍යාගම් වලට හරවා ගැනීම පිළිබඳව පරීක්ෂා කර බලා වර්තා කිරීම සඳහා පත් කරනු ලැබූ කොමිෂන් සභා වාර්තාව විය යුතුයි හාමුදුරුවනේ මං හිතන විදියට. ඔබ වහන්සේ දැන් කරුණු ඉදිරිපත් කරන්නට යෙදුණේ. එකී වාර්තාවේ ඉංග්‍රීසි පරිවර්තනය මේ කොමිෂන් සභාව වෙත ලැබී තිබෙනවා ගරු සභාපතිතුමනි. ඒ අනුව එම ඉංග්‍රීසි පරිවර්තනය ද මෙම සභාවට

FAIR COMMENT BY JEZEEM

ලේඛනයක් හැටියට RGG02 A වශයෙන් සලකුණු කිරීමට ගෞරවයෙන් අවසර අයැද සිටිමි.

****

<u>ජනාධිපති නීතිඥ ශමීල් පෙරේරා මහතා.</u>

ප්‍ර: ඔබ වහන්සේගෙන් ප්‍රශ්න ඇසීමේ දී ඔබ වහන්සේ කිව්වා ඔබ වහන්සේගේ දැනුම අනුව මාලදිවයින, ඉන්දුනීසියාව හා මැලේසියාව වැනි රටවල් පෙර බෞද්ධ රටවල් ලෙස සැලකිය හැකිය කියලා. ඔබ වහන්සේ කිව්වා?

උ: ඔව්.

ප්‍ර: දැන් මෙම රටවල් දැන් මුස්ලිම් රටවල් වලට පත් වෙලා තිබෙනවා.

උ: ඔව්.

ප්‍ර: දැන් ස්වාමීන් වහන්සේ ගරු ස්වාමීන් වහන්සේ මෙම සංසිද්ධිය මඟින්ම ශ්‍රී ලංකාව ඉදිරියට මුස්ලිම් අන්තවාදය මගින් ඇති අනතුරු ගැන ඉඟියක් ලබා ගැනීමට හැකියාවක් ඇති බව ඔබ වහන්සේ විශ්වාස කරනව ද?

උ: අනිවාර්යයෙන්ම.

ප්‍ර: ගරු ස්වාමීන් වහන්සේ ඔබ වහන්සේ සාක්ෂි ලබා දී ප්‍රකාශ කර සිටියා වර්තමානයේ දේශපාලන පක්ෂ වල මුස්ලිම් අන්තවාදය ගැන අවදිවීමක් සිදු වී ඇති බවට.

උ: ඔව්.

ප්‍ර: දැන් එවැනි අවදිවීමක් සිදු වුයේ පාස්කු ප්‍රහාරයෙන් පසුව බවට ද ඔබ වහන්සේ ප්‍රකාශ කරා?

උ: පාස්කු ප්‍රහාරයෙන් පසුවත් ඊට පෙරාතුවත්. දැනටත් ජමාතේ ඉස්ලාම් නැමැති සංවිධානය මේ පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් ඇත්ත වශයෙන්ම සිර ගත කොට ප්‍රශ්න කළ යුතු මහ මොළකරු එළියේ. හජ්ජුල් අක්බාර්. ජමාතේ ඉස්ලාම් සංවිධානය අවුරුදු 25 ක් ඔහුගේ යටතේ. දැන් ඒ සංවිධානයේ ලේකම්වරයා නීතිඥ ෆාරිස්. ඒ ගොල්ලෝ කවුරුවත් ප්‍රශ්න කරලා නැහැ. එතකොට දැන් ඒ ගොල්ලන් දේශපාලනය කරනවා ජනතා විමුක්ති පෙරමුණත් එක්ක. ඉතිං කොහෙන්ද මේක නතර වෙන්නේ. දේශපාලනික වශයෙනුත් ඒ ගොල්ලෝ කොතන හරි ගිහිල්ලා Plant වෙනවා. සියළු පින්තූරත් එක්ක තියෙනවා අපි ළඟ තොරතුරු.

ප්‍ර: දැන් ගරු ස්වාමීන් වහන්සේ ගරු කොමිෂන් සභාවෙන් ඔබ වහන්සේගෙන් ප්‍රශ්නයක් ඇසුවා පාස්කු ප්‍රහාරය කිතු ජනතාව ඉලක්ක කරගෙන සිදු කරන ප්‍රහාරයක් සම්බන්ධයෙන්. දැන් ඔබ

Registrar's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

වහන්සේ ඒකට උත්තරයක් දුන්නා. ඔබ වහන්සේට හිතෙන්නේ නැද්ද මේ ඒක විශේෂයෙන්ම කතෝලික ජනතාව ඉලක්ක කරගෙන සිදු කරන ලද ප්‍රහාරයක් කියලා?

උ: කතෝලික ජනතාව පමණක් නෙමේ. එකක් කතෝලික ජනතාව. අනිත් පැත්තෙන් මේ රටේ සංචාරක කර්මාන්තය. ඒ කියන්නේ රට ආර්ථිකමය වශයෙන් අගාදයකට ඇද දාන්නත් මේකත් මේ බෝම්බ පුපුරන රටක් කියලා පණිවිඩය ගෙනයාම. එතකොට අපේ රටට වැඩිපුරම බටහිර යුරෝපයේ සංචාරකයෝ එන්නේ. ඒ ගොල්ලන් ලැහුම් ගන්නා ප්‍රධාන හෝටල්. එතකොට කතෝලික පල්ලියක සාමාන්‍යයෙන් කොච්චර මේච්චයිද. මේ වන්දනා කරන වෙලාවක අහිංසක මිනිසුන්ගේ ප්‍රාර්ථනා එක්ක. ඒක මොනම විදියටවත් අනුමත කරන්න පුළුවන් එකක් නෙවෙයිනේ. කොයි ත්‍රස්තයෙක් වුණත්. අනික කෑම ටිකක් කන මිනිහෙක් මරලා දාන සිරිතක් නැහැනේ ලෝකේ කොහේ වුණත්. ඉතාම සැලසුම් සහගතව ඒ ගොල්ලෝ දුර දක්නා නුවනකින් ඒ ගොල්ලෝ මේක සිද්ධ කළේ. අරමුණු දෙකක් තියෙනවා. එම ප්‍රහාර වල. එකක් යම් රටක එවැනි ප්‍රහාර. සුඩානයට වුණේ මොකද, සිරියාවට වෙලා තියෙන්නේ මොකද, ඒ බය නැති කරගන්නවා ඉස්සර වෙලා. ඒ බය නැති කරගත්තට පස්සේ බෝම්බ පුපුරුවා ගන්නවා. ඊට පස්සේ රට අකර්මන්න වෙනවා. සංචාරකයෝ එන්නේ නැහැ. ඒ ගොල්ලන් ඊට පස්සේ අනිත් පැත්තෙන් යෝජනා කරනවා සංචාරකයෝ ගේන්න ඕනද, හා ගේනවනම් අපි මැද පෙරදිගෙන් ගේමු. හා එහෙනම් හලාල් Process එකට යන්න වෙනවා. හෝටල් ටික හලාල් කරන්න වෙනවා. දැන්ටම එහෙම ඉල්ලීම් කරලා තියෙනවා. ඒ ගොල්ලන්ගේම කෑම ජාලයක් හදා ගන්නවා. ඊළඟට මිනිස්සුන්ට බිස්නස් නැහැ. අරහෙන් එවලා තියෙනවා ප්‍රකෝටි ගණන් ධනය. දේපළ Properties ඔක්කොම ගන්නවා. මේක ලොකු කතාවක්.

ප්‍ර: ඔබ වහන්සේ Muslim world League ගැන සඳහන් කෙරුවා. ඒ Muslim world League එකේ නායකයා පාස්කු ප්‍රහාරයට පසුව ලංකාවට පැමිණි බව ඔබ වහන්සේ දන්නව ද?

උ: ඔව් අපේ කාදිනල්තුමා ඔක්කොමලා හිටියා ගිහිල්ලා.

ප්‍ර: ඔව් කාදිනල්තුමා ගියේ නැහැ.

උ: ගියේ නැහැ.

ප්‍ර: ඔබ වහන්සේ ගියාද දන්නේ නැහැ.

උ: නැහැ මටත් ආරාධනාවක් ආවා. ආරාධනාවක් ගෙනැල්ලා දුන්නා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එම අවස්ථාවේ එම Muslim world League ඒ නායකයා මිලියන ගාණක් ලංකාවට පොරොන්දු වුණා දෙන්න. ලොකු වෙක් පතක මේ අනුරුවකුත් ප්‍රදර්ශනය කෙරුවා. නමුත් තාම ඒ මුදල ලංකාවට ලැබිලා නැහැ. ඒක ගැන ඔබ වහන්සේ දන්නව ද?

උ: ඔව්. අපි දන්නවා බොහෝ විට ඔක වෙන්නෙත් නැහැ කියලා මොකද ඕකත් අල්ටකියාවක්.

වේලාව: ප.ව. 08.50
මෙතැන් සිට: නිල්මිණි මෙනවිය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

දැන් වේලාව: ප.ව.8.50
පෙර සටහන් ල/ලේ: සවිනි මෙනවිය
මෙතැන් සිට ල/ලේ: නිල්මිණි.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ගරු ස්වාමීන් වහන්සේ ඔබ වහන්සේ විසින් මෙතෙක් ලබා දුන් සාක්ෂි වලට අමතරව යමක් ඉදිරිපත් කරන්න අවශ්‍ය නම් ඔබගේ නීතිඥ මහත්මයා මඟින් ඉදිරිපත් කරන්න පුළුවන්.

****

<u>නීතිඥ ඉරේෂ් සෙනවිරත්න මහතා</u>

ප්‍ර: ගරු ස්වාමීන් වහන්සේ මෙම ගරු කොමිෂන් සභාව හමුවේ සහරාන් හෂිම් විසින් කරන ලද ප්‍රකාශයක් ඔබ වහන්සේ හමුවේ ගෙන හැර පෑවා?

පි: ඔව්.

ප්‍ර: එකී ප්‍රකාශයේ ස්වාමීන් වහන්ස ඔබ වහන්සේ මෙම පාස්කු ප්‍රහාරය සිදු කිරීමට හේතු වූ එක් ප්‍රධාන සාධකයක් වශයෙන් දක්වා තිබෙනවා?

පි: ඔව්.

ප්‍ර: ඒ ප්‍රකාශයේ සිංහල පරිවර්තනයට මා ඔබ වහන්සේගේ අවධානය යොමු කර සිටිනවා. ස්වාමීන් වහන්ස මෙහි පුද්ගල නාමයක් විදිහට තියෙන්නේ ඔබ වහන්සේගේ නාමය සහ ඊබ්‍රහිම් මවුලවි යන අයගේ නාමයන් කිව්වොත් නිවැරදි ද?

පි: ඔව්.

ප්‍ර: දැන් ස්වාමීන් වහන්ස මේ 2001 අවුරුද්දෙන් පස්සේ නූතන ලෝකයේ සිද්ධ වෙච්ච බරපතලම ත්‍රස්ත ප්‍රහාරයකට ඔබ වහන්සේගේ නාමය ඇදී තිබෙනවා.

පි: ඔව්.

ප්‍ර: ඒ ප්‍රහාරය සිදු කළ පුද්ගලයාට අනුව. එම ප්‍රකාශයේම ස්වාමීන් වහන්ස තවත් හේතූන් දක්වා තිබෙනවා?

පි: ඔව්.

ප්‍ර: අල්ලාහ් දෙවියන් වහන්සේට බැන වැදීම සහ අවමන් කිරීම, මස්ජීද් පල්ලි කඩා බිම දැමීම ආදී වශයෙන් දක්වා තිබෙනවා. මෙහි යම් නියායික පදනමකුත් දක්වා තිබෙනවා?

පි: ඔව්

ප්‍ර: මා එයින් එකකට ඔබ වහන්සේගේ අවධානය යොමු කරනවා. බලන්න ස්වාමීන් වහන්ස.

පි: ඔව්. නුඹලාට අපේ අනුකම්පාව අවශ්‍යනම් ඉස්ලාම් ආගමට පැමිණීම හෝ බදු ගෙවීම සිදු කළ යුතුයි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ ආකාරයට දක්වා තිබෙනවා. එමෙන්ම තවත් එවන් හේතුවක් දක්වා තිබෙනවා. හේතු ගණනාවක් තිබෙනවා ස්වාමීන් වහන්ස ඔය දෙකට පමණක් අවධානය යොමු කරන්න.

පි: අල්ලාහ් දෙවියන් වහන්සේ විසින් ජීවිත පරිත්‍යාග කිරීම. ගෞරවයක් ජයග්‍රහණයක් මෙන්ම පරාදීසය වෙත සෘජුව ගමන් කිරීමේ ක්‍රමයක් වේ. මෙම ප්‍රහාරය තුළින් ශ්‍රී ලංකාවේ ISIS සංවිධානය අනුගමනය කරන මුස්ලිම්වරු වර්ධනය වේ.

ප්‍ර: දැන් ස්වාමීන් වහන්ස ඔබ වහන්සේ විශ්වාස කරනවා මේ දැන් ඔබ වහන්සේගේ නමත් මෙයට ඇඳී තිබෙන නිසා මෙයට හේතුවූ යම් නියාක පදනමක් තිබේනම් එය ඉස්ලාමීය මූල ග්‍රන්ථයන් ඔස්සේ කෙටියෙන් දක්වා සිටීමට. මූල ග්‍රන්ථයන්ම ඔස්සේ?

පි: පුළුවනි. ඔව්.

ප්‍ර: පළමුවෙන්ම ස්වාමීන් වහන්ස ඔබ වහන්සේගේ අවධානයට ISIS සංවිධානය මේ ප්‍රහාරය සිදු කළා යැයි සැළකෙන සහරාන් හෂීම්ගේ මවු සංවිධානයේ නිල සඟරාව වන, නිල සඟරාව යැයි සැළකෙන දාබික් සඟරාවේ 4වන කලාපයට අවධානය යොමු කර සිටිනවා. එය අන්තර්ජාලය ඔස්සේ භාගත කරන ලද ලේඛනයක්. එහි ඉස්ලාමීය කැලැන්ඩර් ක්‍රමයයි භාවිතා වන්නේ. එය දුල් හිජ්ජා 1435 වශයෙන් දැක්වෙන බවත් කොමිෂමේ අවධානයට යොමු කරනවා. එහි කවරයටත් ගරු කොමිෂන් සභාවේ අවධානය යොමු කළ යුතු යැයි ඔබ වහන්සේ සිතනවා. එහි දැක්වෙන්නේ වතිකානුවේ ඔසවා ඇති කළු ඉස්ලාමීය ධජය බව අවධානය යොමු කරනවා. ස්වාමීන් වහන්ස එහි 14වන පිටුවට ස්වාමීන් වහන්සේගේ අවධානය යොමු කරනවා. එය දැක්වෙන්නේ The Revival of Slavery before the Hour. වශයෙන්. ඔබ වහන්සේගේ පසුවටත් කොමිෂන් සභාවේ පහසුවටත් මා විසින් එය කියවනවා. (ඉංග්‍රීසි බසින් ඇති ලේඛනයක් නීතිඥ මහතා විසින් කියවනු ලැබේ). ගෞරවනීය ස්වාමීන් වහන්ස මෙය ශුද්ධ වූ කුරානයේ යම් සුප්‍රකට පද්‍යකට යොමු වෙනවා. කුමක් ද ඒ පද්‍ය ස්වාමීන් වහන්ස?

පි: 9.5 වගන්තිය.

ප්‍ර: RGG – 54 වශයෙන් එකී ලේඛනය ලකුණු කිරීමට ගරු කොමිෂන් සභාවේ අවසරය පතනවා. එහි 14 වන පිටුව RGG – 54 (A) වශයෙන් ලකුණු කිරීමට ගරු කොමිෂන් සභාවේ අවසරය පතනවා. මෙම කොමිෂන් සභාව හමුවේ දැනටමත් C – 138 වශයෙන් ලකුණු කර ඇති සමස්ථ ලංකා ඉස්ලාම් ආගමික වියතුන්ගේ සංගමය විසින් ප්‍රකාශයට පත් කරන ලද අල් කුරාන් අර්ථ සංග්‍රහයේ 382 වන පිට කෙරෙහි ඔබ වහන්සේගේ අවධානය යොමු කරනවා. ස්වාමීන් වහන්සේ කියවීම අවශ්‍ය නැහැ. පෙර කියවූ හෙයින්. එම Islamic State සඟරාවේ මීට පෙර

FAIR COMMENT BY JEZEEM

ලකුණු කොට ඇති ප්‍රකාශය මෙම ශුද්ධ වූ කුරානයේ 382 වන පිටුවෙහි සඳහන් වෙනවා කිව්වොත් නිවැරදි ද?

පි: ඔව්.

ප්‍ර: දැන් ස්වාමින් වහන්ස මේ 9.5 වගන්තිය සුප්‍රකටයි?

පි: ඔව්.

ප්‍ර: ඊට අමතරව එය හුදකලා වගන්තියක් ද ස්වාමීන් වහන්ස මේ ශුද්ධ වූ කුරානයේ පවතින?

පි: නැහැ.

ප්‍ර: තවත් එවන් වගන්ති තිබෙනවාද?

පි: තවත් එවන් වගන්ති ගණනාවක් තිබෙනවා.

ප්‍ර: එයින් 2කට පමණක් අවධානය යොමු කරනවා. මෙම අවස්ථාවේ පෙර C – 138 වශයෙන් ලකුණු කරන ලද ශුද්ධ වූ කුරානයෙහි 84 පිටුවෙහි පවත්නා වැකිය දෙසට කොමිෂන් සභාවේ අවධානය ඔබ වහන්සේ යොමු කරනවා. “නුඹලා අල්ලාහ්ගේ මාර්ගයේ සටන්කරව්. තවද අල්ලාහ් සර්වශ්‍රවකයෝ සර්වඥයැයි දැන ගනු.” එමෙන්ම එම ලේඛනයේම 856, වන පිට කෙරෙහි ඔබ වහන්සේ කොමිෂන් සභාවේ අවධානය යොමු කරනවා. “නබිවරය නුඹගේ භාර්යාවන්ට ද නුඹගේ දියණියන්ට ද විශ්වාසිකයින්ගේ කාන්තාවන්ට ද ඔවුන්ගේ ජිල්බාබයන් ඔවුන් මත හිසේ සිට එල්ලන්නට සලස්වන මෙන් පවසව්.” එමෙන්ම එම ලේඛනයේම 1041 වන පිටට අවධානය යොමු කර සිටිනවා. එහි දැක්වෙන්නේ යුද්ධයෙන් වස්තු කොල්ලෑකෑම් සම්බන්ධයෙන්. “තවද අල්ලාහ් අති බල සම්පන්න සහ සර්ව ප්‍රඥාවන්තය. යුධ බිමේ දී සතුරන්ගෙන් අත්පත් කර ගත් වස්තූන් අධික වශයෙන් අල්ලාහ් නුඹලාට ප්‍රතිඥා දී තිබුණි. නුඹලා ඒවා ලබා ගන්නෝය. මේ නුඹලාට ඔහු ඉක්මන් කෙරුවෝය”. ආදී වශයෙන් දක්වා තිබෙනවා. එමෙන්ම එම ලේඛනයේම 140 වන පිට කෙරෙහි කොමිෂන් සභාවේ අවධානය ඔබ වහන්සේ යොමු කරනවා. “කවර දෙයක් සඳහා ඔහු අල්ලාහ් බලයක් පාවිච්චි නොකරේද එම මිත්‍යා දේවත්වය ප්‍රතික්ෂේප ඔවුන් අල්ලාහ්ට ආදේශ කර හේතුවෙන් ප්‍රතික්ෂේප කළ වුන්ගේ හදවත් තුළ අපි බිය උපදවන්නෙමු. තවද ඔවුන්ගේ ලැගුම් ගන්නා ස්ථානය නිරාගින්නය. අපරාධකාරයන්ගේ නවාතැන නපුරුය” වශයෙන් දක්වා තිබෙනවා. දැන් ගෞරවනීය ස්වාමීන් වහන්ස දැන් ඒ ශුද්ධ වූ කුරානයේ මේ ප්‍රහාරයට අදාළ යැයි ඔබ වහන්සේ විශ්වාස කරන කොටස්?

පි: ඔව්.

ප්‍ර: තවත් මෙවැනි කොටස් තිබෙනවාද?

පි: බොහෝ ප්‍රමාණයක්.

Presidential Commission Copy

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඊළඟට ස්වාමීන් වහන්ස ඉස්ලාමීය සාහිත්‍යයෙහි ශුද්ධ වූ කුරානයට අනතුරුව වැදගත්ම ලේඛනය විදිහට දක්වන්නේ කුමක්ද ලේඛන සංග්‍රහයන් විදිහට?

පි: ලේඛන සංග්‍රහයන් විදිහට සළකන්නේ කුරානයට පසු දෙවන ශ්‍රේෂ්ඨතම ග්‍රන්ථාවලිය හැටියට ලේඛනය හැටියට හදීස් සංග්‍රහය. ඒ හදීස් දේශනා ගැන තමයි මේ සහරාන් කතා කරන්නේ.

ප්‍ර: ඒ සම්බන්ධ වීඩියෝ පටයක් පවා මාධ්‍යයට නිකුත් වුණා. ප්‍රහාරය සිදු වීමෙන් අනතුරුවම වාගේ.

පි: ඔව්.

ප්‍ර: ඒ වගේම මෙම ඔබ වහන්සේ හමුවේ පෙන්වනු ලැබූ වීඩියෝ පටයන්හි ද ඒ බවට දක්වා තිබෙනවා?

පි: ඔව්.

ප්‍ර: අපිට හදීස් සම්බන්ධයෙන් විශාල එය කුමක් ද යන්න දැනටමත් ඔබ වහන්සේ සාක්ෂි ලබා දී තිබෙන්නේ. එකී හදීස් අතරින් වැදගත්ම හදීස් සංග්‍රහය වශයෙන් දැක්වෙන්නේ කුමක් ද ස්වාමීන් වහන්ස?

පි: සහීහුල් බුහාරිත් ඒ වගේම 4 වන එක සහීවුල් මුස්ලිමින්.

ප්‍ර: එකී සහීවුල් බුහාරි ග්‍රන්ථයේ සිංහල පරිවර්තනයේ පරිවර්තනයන් කිහිපයක් ඔබ වහන්සේ මෙම කොමිෂන් සභාවට ගිය දිනයේ ලබා දුන්නා. මාතෘකා පමණක් කියවන්න ස්වාමීන් වහන්ස. ඉන්න අනතුරුව කුඩා නිදර්ශන කිහිපයක් දැක්වුවාම ප්‍රමාණවත්.

මෙම අවස්ථාවේ දී යෝනක ඉස්ලාමීය සංස්කෘතික නිකේතනය විසින් 2014 වර්ෂයේ දී පළ කරන ලද සයිවුල් බුහාරි අරාබි සිංහල ග්‍රන්ථයේ 4 වන වෙළුම කෙරෙහි මෙම කොමිෂන් සභාවේ අවධානය ඔබ වහන්සේ යොමු කරනවා. C – 660 D ස්වාමීනි. ස්වාමින් වහන්ස එහි රෝම ඉලක්කම් v පිටුවෙහි මෙම ලේඛනයෙහි වැදගත්කම එක් වැකියකින් දක්වා තිබෙනවා. එය කියන්න ස්වාමීන් වහන්ස. රෝම ඉලක්කම් v. ඔබ වහන්සේගේ පහසුව සහ කොමිෂන් සභාවේ පහසුව සඳහා මා එය කියන්නම්. මුළු මහත් හදීස් සාහිත්‍ය එක්ව ගෙන බලන කළ ඉමාම් බුහාරීගේ කෘතිය අන් සියල්ලටම වඩා සත්‍යවාදී වූවකයි අවිවාදයෙන් පිළිගෙන ඒකමතිකව එකඟත්වයට පත්ව ඇත. අල්බුහාරිගේ කෘතියේ සත්‍යවාදී බව කෙතරම්ද යත් ඉස්ලාම් ජීවන සැලැස්ම පිළිබඳ මැනවින් දත් විද්වත්හු ඒ ගැන මෙසේ පවසමින්. එය සනාථ කොට ඇත්තාහ. අල්ලාහ්ගේ ග්‍රන්ථයට (එනම් අල්කුරානටය පසුව) ලියැවී ඇති වඩාත්ම සත්‍යවාදී ග්‍රන්ථය වනාහී සහීඅල් බුහාරි වන්නේ ය. ස්වාමීන් වහන්ස එහි මාතෘකා කිහිපයක් දැක්වෙනවා. එහි රෝම ඉලක්කම් 20හි සඳහන් හා 70 වන පරිඡේදය කෙරෙහි මෙම කොමිෂන් සභාවේ අවධානය ඔබ වහන්සේ යොමු කරනවා. එහි මාතෘකාව ජිහාද් (අල්ලාහ් වෙනුවෙන් වෑයම් කිරීම උදෙසා සටහන් කිරීම යනුවෙන් දක්වනවා). එම කොටස දැනටමත් C –

FAIR COMMENT BY JEZEEM

660 D (1) වශයෙන් ලකුණු කොට තියෙනවා. මාතෘකා පමණක් කියවන්න. ඒ අතරින් තෝරා ගත් ඒවා පමණයි.

පි: එදා යම් ප්‍රමාණයක් කියෙව්වා. නිකන් මාතෘකා හැටියට කිව්වොත් ජිහාද් සටන සඳහා දෙමාපියන්ගේ අවසරය ලබා ගැනීම. යුද්ධයේ දී දරුවන් මැරීම. යුද්ධයේ දී කාන්තාවන් මැරීම, නිවාස හා රටඉඳි ගස් ගිනි තැබීම, නිදා සිටින මිසදුටුවෙකු මැරීම, යුද්ධය රැවටිල්ලකි. යුද්ධයේදී බොරු කීම, රහසිගතව මුස්ලිම් නොවන යුධ බටයන් මැරීම, මෑතකදී විවාහ වූ තැනැත්තෙකු ජිහාද් සටනට කැඳවීම, විවාහයේ පරිසමාප්තියෙන් පසු ජිහාද් සටනට එක්වීම, යුධ කොල්ලයෙන් කම්කරුවාගේ කොටස, මිසදුටුවන් පරාජය කොට තැතිගැන්මට සලස්වන ලෙස අල්ලාහ්ගෙන් ඉල්ලා සිටීම, අනිත් ටික මම කළින් දවසේ කිව්වා.

ප්‍ර: ස්වාමීන් වහන්ස මෙම කොමිෂම නොමඟ යා හැකි හෙයින් ඔබ වහන්සේ..

පි: ඉස්ලාමීය වැළැඳ ගන්න. එවිට ඔබ සුරක්ෂිත වේ. 179යේ. මුස්ලිම්වරුන් සඳහා යුධ කොල්ලයෙන් දේපළ ලබා ගැනීම නීත්‍යානුකූලයි. ඔය වගේ ඉතින් සිය ගණනක් තියෙනවා.

ප්‍ර: ස්වාමීන් වහන්ස මේ කොමිෂම මේ මාතෘකා පමණක් කියෙව්වොත් නොමඟ යා හැකි හෙයින් සහ මේ හදීස් සංග්‍රහයට සාධාරණයක් ඉෂ්ට කර කළ යුතු හෙයින් මේ රෝම ඉලක්කම් 23 වන පිටුවෙහි යුද්ධයේ දී දරුවන් මැරීම, යුද්ධයේදී කාන්තාවන් මැරීම යනුවෙන් දක්වා තිබුණද එහි ප්‍රධාන හදීස් සංග්‍රහයේ දැක්වෙන්නේ දරුවන් හා කාන්තාවන් ඝාතනය කිරීම තහනම් කර ඇති බවට වන බව ගරු කොමිෂන් සභාවේ අවධානයට යොමු කරනවා. එම පිටුව 171 වශයෙන් දක්වා සිටිනවා. කෙසේ වෙතත් ස්වාමීන් වහන්ස

****

<u>**ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා**</u>

ප්‍ර: පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි ගරු ස්වාමීන් වහන්ස. ඔබ වහන්සේ කියන්නේ දැනටමත් මේ කොමිෂන් සභාව ඉදිරියට පත් කර ඇති මේ හදීස් ග්‍රන්ථයේ පරිවර්තනයේ දී එහි අන්තර්ගතයේ ඇති කාරණාව නෙවෙයි අවසාන වශයෙන් පොතේ අවසානයට මේ දක්වලා තියෙන්නේ කියන කාරණාවද?

පි: ඇත්ත වශයෙන්ම මේ ලියා ඇති දේ හදීසයේ තේරුම් ගන්නනම් හදීස් කියවිය යුතුමයි. එක තැනක මාතෘකාව ලියන එක නෙවෙයි ඒක විග්‍රහ කරන තැන. මේක මොකක් ද මේ කිව්වේ කියන එක බලන්නනම් ඊළඟ හදීසයට යන්න ඕනි. එතනදී තියෙනවා කොයි කාන්තාවෝද දරුවෝද මරන්න එපා කියලා. එතනදී කියනවා තමන්ගේ අය මේවා කරන්න එපා අනිත් අය කමක් නැහැ.

FAIR COMMENT BY JEZEEM

****

<u>නීතිඥ ඉරේෂ් සෙනවිරත්න මහතා</u>

ප්‍ර: දැන් ස්වාමීන් වහන්ස දැක්වූ කාරණාව සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ අවධානය යොමු කරනවා. 170 වන පිටුවේ දැක්වෙනවා ස්වාමීනි චේතනාවෙන් තොරව අත දරුවන්, කුඩා ළමුන් ඝාතනය වීමේ හැකියාවෙන් යුතුව සතුරන්ට පහර දීම අවසරලත් දෙයක් වන්නේය. අල්අබීව හෝ වද්නානම් ස්ථානයක දී නබිසල්තුමානන් මා පසුකර ගියේ ය. රාත්‍රී කාලයේ මිසදුටු යුධ බටයන්ගේ කාන්තාවන් සහ අනතුරට පත් වීමේ හැකියාවෙන් යුතුව එම යුධ බටයන්ට පහර දීම අවසර ලත් දෙයක් ද යන්න ගැන එතුමාගෙන් විමසනු ලැබීය. නබිසල්තුමානෝ මෙලෙස පැවසූහ. ඔවුහු එනම් කාන්තාවන් සහ ළමුන් ඔවුන්ට එනම් මිසදුටුවන්ට අයත් වූවෝ වෙති. නබිසල් තුමානන් මෙසේ පවසනු මම අසා ඇත්තෙමි. හීමා නම් වූ සීමාව අල්ලාහ්ට ද ඔහුගේ රසූසල්වරයාටද හැර වලංගු නොවන්නේය. ස්වාමීන් වහන්ස ඔබ වහන්සේ කියන්නේ මේ ආකාර යම් ව්‍යාකූල ස්වරූපයෙන් තමයි මේවා තිබෙන්නේ කියා?

පි: සාමාන්‍ය කෙනෙක් ඉස්ලාම් නොවන කෙනෙක් මේවා කියවන කොට තේරුම් ගත නොහැකි ආකාරයට මෙය තේරුම් කර ගන්න නම් දේවධර්මාචාරයෙකු හමු වෙලා ඔහු තමයි නිර්දේශ දෙන්නේ. නමුත් මේ කුඩා ග්‍රන්ථ වලින් හරියටම කළ යුත්ත මොකක් ද කියලා දක්වලා තියෙනවා.

ප්‍ර: මේ සම්බන්ධ උදාහරණ කිහිපයක් ඔබ වහන්සේ මේ කොමිෂන් සභාව හමුවේ ගෙන හැර දැක්වීමට බලාපොරොත්තු වෙනවා. එහි මිසදුටුවෙකු මරා දැමීම වශයෙන් දක්වා ඇති 177 පිට කෙරෙහි ගරු කොමිෂන් සභාවේ අවධානය යොමු කරනවා. අල්ලාහ්ගේ රසුල්සල්වරයානෝ අන්සාරීවරුන් පිරිසක් අබූරාෆි වෙත පිටත් කර යැවූහ. අබ්දුල්ලා හාබීන් ආතීක් රාත්‍රියේ ඔහුගේ නිවසට ඇතුළු වී ඔහු නිදා සිටිය දීම මරා දැමූවේය. ඒ කෙටියෙන් දක්වා ඇති හදීසය සවිස්තරාත්මකව 176 පිටුවෙහි දක්වා තිබෙනවා ස්වාමීනි. එහි එක් කොටසක් කෙරෙහි පමණක් කොමිෂන් සභාවේ අවධානය ඔබ වහන්සේ යොමු කරනවා. "අනතුරුව මම මගේ කඩුව ඔහුගේ බඩට තද කොට එය අස්ථියට ගෑවෙන තුරු වැරෙන් ඇතුළු කරමි. අනතුරුව මම ගැටලු පිරුණු මනසින් යුතුව එළියට පැමිණ පහළට බැසීමේ අරමුණින් ඔවුන්ට අයත් ඉනිමඟ දෙසට ගමන් කරමි." මේ අබූරාෆි යන තැනැත්තා ගේ ඝාතනය විස්තරාත්මකව දැක්වෙන හදීසයයි මේ. එමෙන්ම 188 වන පිටටත් ඔබ වහන්සේ කොමිෂන් සභාවේ අවධානය යොමු කරනවා. "අනස්බින් මාලික් අලී මෙසේ විස්තර කොට ඇත. අල්ලාහ්ගේ රසුල්සල්වරයානෝ සිය හිසෙහි හෙල්මටයක් (ආරක්ෂක හිස්වැසුමක්) පැළඳගෙන මක්කාව අත්පත් කර ගත් වසරේ

FAIR COMMENT BY JEZEEM

මක්කාවට ඇතුළු වූහ. එතුමා ඒ ඉවත් කළ පුද්ගලයෙකු පැමිණ පැවසුවේය. ඉබෙන් ජටෙල් කාබාවේ තිර රෙදි වල ඉල්ලී සිටී. නබිසල්තුමානේ මෙසේ පැවසූහ. ඔහු මරා දමන්න." ස්වාමීන් වහන්ස මේ ජිහාදය සම්බන්ධයෙන් සහීර් බුහාරි ග්‍රන්ථයේ මෙපමණකින් අපි නිමා කරමු. ඉස්ලාමයෙහි සහීබුහාරි ග්‍රන්ථයට අනතුරුව වැදගත්ම ග්‍රන්ථය කුමක් ද ස්වාමීන් වහන්ස?

පි: සහීවුර් මුස්ලිමික්

ප්‍ර: සහීමුස්ලිම්. මෙම අවස්ථාවේ දී දාරුස් සලාම් ප්‍රකාශකයන් විසින් 2007 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කරන ලද English Translation of සහීමුස්ලිම් ග්‍රන්ථයෙහි 5වන වෙළුම කෙරෙහි අවධානය යොමු කරනවා. එය ගරු මැතිතුමන්ගේ අවසරය ලැබෙන්නේනම් සළකුණු කිරීමට බලාපොරොත්තු වෙනවා. ඡායාස්ථ පිටපතක් ලබා ගැනීමට යටත්ව එය දක්වන්නම් ගරු මැතිතුමනි. එහි ස්වාමීන් වහන්ස පරිච්ඡේදය පමණක් කියවනවා ගරු මැතිතුමනි. The Book of Jihad and Expeditions එහි මාතෘකා කිහිපයක් පමණක් කියවනවා. අදාළ ග්‍රන්ථයෙන් කොටසක් නීතිඥ මහතා විසින් කියවනු ලැබේ. තවත් තිබෙනවා ස්වාමීන් වහන්ස. අදාළ ග්‍රන්ථය තව දුරටති කියවයි. ස්වාමීන් වහන්ස මේ කොමිෂමේ අවධානයට යොමු වන ප්‍රහාරය මූලික වශයෙන්ම එල්ල වුණේ මෙරට කතෝලික ජනතාව ඉලක්ක කර ගනිමින්?

පි: ඔව්.

ප්‍ර: සංචාරක හෝටල් වලට එල්ල කළ ප්‍රහාරයන් පවා කතෝලික ප්‍රජාවම ඉලක්ක කර ගත්තා යැයි හිතීමට කාරණා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් වන වැකියක් මෙම ලේඛනයේම 59වන පිටුව කෙරෙහි ගරු කොමිෂන් සභාවේ අවධානය ඔබ වහන්සේ යොමු කරනවා. අදාළ ග්‍රන්ථයේ අදාළ පිටුව නීතිඥ මහතා විසින් කියවනු ලැබේ. මෙකී පොත RGG – 55 වශයෙන් ද එහි පරිච්ඡේද සඳහන් කොටස RGG – 55 (A) පිටු අංක 5 , ඒවගේම පිටු අංක 59 RGG- 55 (B) වශයෙන් ලකුණු කරනවා. දැන් ස්වාමීන් වහන්ස මේ කතෝලිකයන් සම්බන්ධයෙන් සහ යුදෙව්වන් සම්බන්ධයෙන් මෙහිදී පෙර C 138 වශයෙන් ලකුණු කරන ලද ලේඛනයෙහි 392 පිට කෙරෙහි ඔබ වහන්සේ කොමිෂන් සභාවේ අවධානය යොමු කරනවා. ධර්ම පුස්තකය ලක් අයඅතුරින් කවුරුන් අල්ලාව හා පරමාර දිනය විශ්වාස නොකරන්නේද අල්ලාහ් සහ ඔහුගේ රසුල්වරයා තහනම් කල දෑ තහනම් ලෙස නොගන්නේ ද සත්‍ය දහම (ඉස්ලාමය) දහමක් ලෙස පිළිනොගන්නේ ද ඔවුන් (ස්වකැමැත්තෙන් යටත් වූවන්) ලෙස දැනීන් ජිස්සානම් බද්ද ලබා දෙන තෙක් ඔවුන් සමඟ නුඹලා යුද්ද වදී.

FAIR COMMENT BY JEZEEM

පි: ක්‍රිස්තියානි අයටයි මුස්ලිම්වරුන්ට පොඩි හරි chance එකක් තියෙනවා බද්දක් හරි දීලා ඉන්න පුළුවන් අපිට මොකක්වත් චාන්ස් එකක් නැහැ.

ප්‍ර: දැන් ස්වාමීන් වහන්ස ඔබ වහන්සේ ඒ පැවසූ කාරණාව සම්බන්ධයෙන් මින් පෙර ඔබ වහන්සේ දැන් පවසා සිටියා කතෝලිකයන්ට සහ යුදෙව්වන්ට ජීස්සා බද්ද ගෙවා තමන්ගේ කටයුතු පවත්වාගෙන යන්න පුළුවන් කියාලා?

පි: ඔව්.

ප්‍ර: මේ වන විට RGG 54 වශයෙන් ලකුණු කොට ඇති දාබක් සගරාවෙහි 15 වන පිට කෙරෙහි ඔබ වහන්සේ කොමිෂන් සභාවේ අවධානය යොමු කරනවා. එකී 15 වන පිටෙහි දක්වා තිබෙන්නේ ස්වාමීන් වහන්ස ඔබ වහන්සේ කියා සිටින්නේ මේ IS පාලනයට යටත් වූ යසිඩි ජනතාවගේ ඉරණම සම්බන්ධව ඒ කියෙන්නේ මේ 2014, 2015, 2016 වගේ ඉතාම මෑත කාලයේදී සිදුවූ සිදුවීමක් ගැන. මේ අවස්ථාවේදී එම කොටස කියවා සිටිනවා ස්වාමිනි.

එකී කොටස ගරු මැතිතුමණි RGG 54 B වශයෙන් ලකුණු කිරීමට අවසර ඉල්ලා සිටිනවා 15 වන පිටුව ඉස්ලාමිය රජයක් මේ කාලීනයක් යටතේ බෞද්ධයන්ගේ ඉරණමත් එය ද ස්වාමීන් වහන්ස ඔබට ඒ ගැන අදහසක් තියෙනවා නම් කෙටියෙන් දක්වන්න ස්වාමීන් වහන්ස?

පි: අනිවර්යෙන්ම අපිට ජීස්සා බද්දක්වත් ගෙවලා ඉන්න හම්බෙන්නේ නැහැ. ඒ ගොල්ලෝ කියන්නේ පිළිම වන්දනාකරුවන් දුටු දුටු තැන ඝාතනය කරන්න කියලා. නොඑසේනම් මහ රැක සිට ඔහුට පහර දෙන්න කියලා. ඔවුන් ඉස්ලාමය වැළඳගන්නාතුරු පහරදෙන්න කියලා කියන්නේ. ඉතින් ඒ අවස්ථාවල් අද අපි දකිනවා මේ මොහොත වෙද්දිත් බංගලාදේශයේ චිතගොන් කඳුකරයේ අපි දකිනවා බෞද්ධයකුට පල්ලෙහාට එන්න ඉඩ දෙන්නෑ බෞද්ධයන් කඳුකරයට සීමාවෙලා ඉන්නවා. දකුණු තායිලන්තය අපි තත්වය අත්විඳිනවා. මියන්මාරය රෝහිණියා ප්‍රදේශයේ අපි ඒ තත්වය අත් විඳිනවා. ඉතින් මේ වර්තමානයෙත් ඕනෑ තරම් උපහැරණ සජීවිව දකින්න පුළුවන් මේ කියන මේ නියමයන්ට අනුව .

ප්‍ර: දැන් මේ ගරු කොමිෂමේ කොමසාරිස්තුමිය ඔබ වහන්සේගෙන් විමසා සිටියා මේ කැලිමේ හි කුරානීය පදනම කුමක්ද කියා ?

පි: ඔව්.

ප්‍ර: එහි එකී පදනම වශයෙන් ප්‍රකටව සැලකෙන පද්‍යය පවතින පිටුව කෙරෙහි පමණක් කොමිෂන් සභාවේ අවධානය යොමු කරනවා. මීට පෙර C 138 වශයෙන් ලකුණු කරන ලද ලේඛනයෙහි 712 පිටුවෙහි 55 අංකය යටතේ දැක්වෙන පද්‍යය එහි පදනම වශයෙන් ප්‍රකටව සැලකෙනවා. එනම් සුනා අන් මූර් 55 වන පද්‍යය. ස්වාමීන් වහන්ස දැන්

FAIR COMMENT BY JEZEEM

ඔබ වහන්සේ දක්වා සිටියා මේ සූෆී ඉස්ලාම් භක්තිකයන් සම්බන්ධයෙන්. ඔවුන් මේ ඉස්ලාම් අන්තවාදයට එරෙහි සටනෙහි එක් තීරක බලවේගයක්.

පි: ඔව්.

ප්‍ර: තවත් එක කොටසක් තියෙනවා ස්වාමීන් වහන්ස මේ ඉස්ලාම් ආගම අතහැර යන්නන්.

පි: ඔව්.

ප්‍ර: එකී තැනැත්තන් පිළිබඳව ඔබ වහන්සේට යමක් ,

පි: අපිට එහෙම ගොඩක් අය මුණ ගැහිලා තියෙනවා. ඒ අය ඇත්ත වශයෙන්ම මේ ඉස්ලාමයෙන් වන විනාශය ඒ කියන්නේ මේ අන්තවාදී කල්ලි කණ්ඩායම් සහ මේ ඉගැන්වීම් තුළින් ශිෂ්ට සමාජයකට වන හානිය ගැන දැනුවත් කරන්න විශාල පරිශ්‍රමයක් දරනවා. ඒ ගොල්ලෝ දැනට ලෝකයේ ප්‍රකට නමුත් ඒ අතර තියෙනවා. ඉතිං අපේ රටේත් යම් කණ්ඩායම් දෙකක් හෝ තුනක් ඉස්ලාමය අතහැර ගොසින් ඒ ගොල්ලෝ තමන් ලබපු අත්දැකීම් එක්ක මෙහි තියෙන භයානකකම හෙළිදරව් කරා පහුගිය කාලවකවානුවේ.

ප්‍ර: ඒ සම්බන්ධයෙන් ස්වාමීන් වහන්ස Ex-Muslim Council Of Sri Lanka වශයෙන් කණ්ඩායමක් සිටිනවයි කිව්වොත් ඔබ වහන්සේ පිළිගන්නව ද?

පි: ඔව්.

ප්‍ර: ඔවුන් යම් අනතුරක සිටිනවයි කිව්වොත් ඔබ වහන්සේ පිළිගන්නව ද?

පි: ඇත්ත වශයෙන්ම ඔවුන් එන්නේ නැහැ සමහර වේලාවට ප්‍රසිද්ධ සමාජයට එන්නේ නැහැ. එක්කෙනෙක් දෙන්නෙක් හැරුණු කොට. නමුත් ඒ අය තමන්ට පුළුවන් විදියට පෑන හසුරවනවා. දැනුවත් කිරීම් කරනවා.

ප්‍ර: ඔවුන්ට පවත්නා ජීවිත තර්ජනය ඉස්ලාමීය මූල ග්‍රන්ථයන් ඇසුරෙන් දැක්වීම සඳහා ඔබ වහන්සේ මින් පෙර,

පි: එහි තියෙනවා පැහැදිලිවම රිද්දන් කිරීම කියලා. ඉස්ලාමය අතහැර ගියහොත් දවස් තුනක් ඇතුළත ඇවිල්ලා තවුබා කරන්න ඕන. ඒ කියන්නේ සමාව ගන්න ඕන. නැත්නම් මරන්න කියලා කියන්නේ.

ප්‍ර: මේ වන විට C 660 D ග්‍රන්ථයෙහි 172 වන පිටුව කෙරෙහි ඔබ වහන්සේ කොමිෂමේ අවධානය යොමු කරනවා. එහි අවසාන පද්‍යය කියවනවා ස්වාමීන් වහන්ස. “නබි සල්තුමානන් මෙසේ පවසා ඇති බැවින් යමෙකු මුස්ලිම්වරයෙකු තම ආගම බැහැර කරන්නේ නම් මරා දමන්න ඔහු.” මේ ආකාරයේ සාහිත්‍යය පුරාම දැක්වෙනවා. මේ අයගේ ආරක්ෂාව සම්බන්ධයෙන් අඩුම තරමින් මේ Ex-Muslim Council ඒවගේ සංවිධාන වල නායකයන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන්වත් ඔබ වහන්සේට යම් යෝජනාවක් කරන්න තියෙනව ද?

FAIR COMMENT BY JEZEEM

පි: ඇත්ත වශයෙන්ම අපි අර අපි කාදිනල්තුමාගේ පාර්ශවයෙන් ඉදිරිපත් වුණු අපේ නීතිඥ මහත්මානන් ප්‍රශ්නය අහන කොට අර ආගමික සංවිධානයක් ගැන කිව්වා. මේ වගේ කණ්ඩායම් වලට නෛතික වශයෙන් හෝ රැකවරණයක් ලබා ගැනීමට එවැනි ආගමික සමූළුවක අවශ්‍යතාවය තියෙනවා. ඒ ගොල්ලන්ගේ ජීවිත ආරක්ෂා කර ගැනීම ඒ ගොල්ලන්ට තියෙන ප්‍රශ්න කතා කරන්න. ඒ ගොල්ලොන්ට නෛතික වශයෙන් ගැටළු ආවහම ඒවට උපදෙස් ගන්න ඒ වගේම උපකාර කරන්න යන ආදී වශයෙන් අපිට යෝජනා කරන්න පුළුවන් ඇත්තටම එවැනි බල සහිත සභාවක් ගොඩනැගුණොත් රහසිගතව හරි ඇවිල්ලා තමන්ගේ ප්‍රශ්නය කියලා ඒ සභාව මඟින් හෝ අදාළ බලධාරීන්ට කරුණු කියන්න ක්‍රමවේදයක් සකස් කර ගන්න පුළුවන් කියලා අපි විශ්වාස කරනවා. මොකද විශාල ප්‍රමාණයක් ඉන්නවා දැන් මේ රටේ විශේෂයෙන් ඔය කාන්තා හිංසනය සම්බන්ධයෙන් ඒ ගොල්ලොන්ගේ ගෙවල් ඇතුළේ සිද්ධ වන කාන්තාවන්ට කතා කරන්න බැහැ. නමුත් දැන් අපි මේ කරුණු හෙළිදරව් කිරීම් එක්ක විශාල ප්‍රමාණයක් ඉස්සරහට ඇවිල්ලා මේ ප්‍රශ්න සාකච්ඡා කරන්න ඔවුන් කැමැත්තෙන් ඉන්නවා. බාල වයස්කාර විවාහය ගැන. ඒ වගේම විශේෂයෙන් මේ වහාබි අන්තවාදීන් විසින් ගෙන යන තාඩන පීඩන සම්බන්ධයෙන් හෙළිදරව් කරන්න.

ප්‍ර: ස්වාමීන් වහන්ස මේ ඉස්ලාමීය සාහිත්‍යයේ මේ පුපුරවා ගැනීම් සම්බන්ධයෙන් කියවෙන කොට පුපුරුවා ගැනීම් සම්බන්ධයෙන් නිතර කතා වෙන කොට මේ කන්‍යාවියන් 72 ක් සම්බන්ධයෙන් කියවෙනවා. දිවි පුදන්නන්ට කන්‍යාවියන් 72 ක් ලැබෙනවයි කියලා.

පි: කන්‍යාවියන් 72 ක් පමණක් නෙවෙයි එහේ අල්ලාහ් දෙවියන් ළඟට ගියාම ඉහුරු සමඟ වයින් ඔක්කොම හම්බ වෙනවා. ඉහුරුත් එක්ක වයින් හම්බු වෙන්නේ කියලා. එකම කොටසේ තියෙන්නේ.

ප්‍ර: එය සඳහන් වන්නේ අර සහි මුස්ලිම් ග්‍රන්ථයට අනතුරුව වැදගත්ම ග්‍රන්ථයක් ලෙස සැලකෙන ජාමිඅල් තිරුමිදි ග්‍රන්ථයෙහි බව සඳහන් කරොත් නිවැරදි ද?

පි: ඔව්.

ප්‍ර: මේ අවස්ථාවේ දී Sunna.Com වෙබ් අඩවියෙහි ඇති එකී ජාමිඅල් තිරුමිදි ග්‍රන්ථයෙහි සඳහන් හදීසය එහි අවසාන කොටස ඔබ වහන්සේ මේ කොමිෂන් සභාවේ අවධානයට යොමු කරනවා. (අදාළ ලේඛනයෙන් කොටසක් කියවයි)එකී ලේඛනය RGG 56 වශයෙන් ලකුණු කිරීමට කොමිෂමේ අවසරය ඉල්ලා සිටිනවා.

****

FAIR COMMENT
BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

මීට පෙර කොමිෂන් සභාව ඉදිරියේ ලකුණු කරන ලද RGG 55, 55A සහ 55 B යන ලේඛන වල ඡායා පිටපත් ලබාගෙන එය සහතික කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරන අතර ඉන් පසු මුල් පොත නැවතත් සාක්ෂිකරුට මුදා හරින ලෙසට කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරමි.

****

<u>නීතිඥ ඉරේෂ් සෙනවිරත්න මහතා.</u>

ස්වාමීන් වහන්ස මින් පෙර ඔබ වහන්සේ සහී මුස්ලිම් ග්‍රන්ථයේ කතෝලික ජනතාවට යම් අගතිගාමී ප්‍රකාශයක් උපුටා දැක්වුවා. ඒ සම්බන්ධයෙන් මෑතක දී පළ කරන ලද පුවත්පත් වාර්තාවකුත් ලකුණු කිරීමට කොමිෂමේ අවසරය ඉල්ලනවා. මෙය 2012 මාර්තු 15 වැනි දින www. Arabianbusiness.com අන්තර්ජාල සඟරාවේ පළ වූ ලිපියක්. Destroy all Churches in Gulf says Saudi Grand Mufti එහි දෙවන පිටුව කෙරෙහි කොමිෂමේ අවධානය යොමු කරනවා. (අදාළ පිටුව කියවයි) RGG 57 වශයෙන් එකී ලේඛනය ලකුණු කිරීමට කොමිෂමේ අවධානය යොමු කරනවා.

ප්‍ර: පෙර අවස්ථාවේ දී ඔබ වහන්සේ දක්වා සිටියා මේ සංවෘත සන්නිවේදන පද්ධති පිළිබඳව.

පි: ඔව්.

ප්‍ර: දැන් මේ ත්‍රීමා, බොටිම් තවත් එකක් ඔබ වහන්සේ?

පි: ත්‍රීමා, බොටින්, whatsapp,

ප්‍ර: සිග්නල්

පි: සිග්නල්

ප්‍ර: සිග්නල් ආදී

පි: අලුත්ම සන්නිවේදන මෙවලම්.

ප්‍ර: මෙවලම් සම්බන්ධයෙන්. දැනට අනාවරණය වී ඇති තොරතුරු අනුව සහරාන්ගේ කණ්ඩායම ත්‍රීමා යන සංවෘත සන්නිවේදන පද්ධතියක් තමයි භාවිතා කරලා තියෙන්නේ. ඒ වගේම ස්වාමීන් වහන්ස ඔවුන්ව ට්‍රැක් කිරීමට අපහසු වන්නටත් ඇත්තේ මේ බුද්ධි තොරතුරු ලැබුණත් මේ ආකාර තාක්ෂණික ක්‍රමවේද භාවිතා කිරීම හින්දයි කියලා ඔබ වහන්සේ හිතනවා?

පි: අනිවාර්යෙන්ම. මොකද ඒ ගොල්ලෝ විශාල වියදමක් දරනවා මේ තාක්ෂණික ජාලය ගොඩනගීමට. දැන් ඔය Peace TV ටීවී එක හරහා කරන්නේත් ඒකයි. දැන් එංගලන්තයේ කල්ලි තහනම් කරාට පොත් පත්

FAIR COMMENT BY JEZEEM

තහනම් කරාට ටීවී වැඩ. ඒවා Google එකෙන් මේ මේ යන්න පුළුවන් මාධ්‍යය පාවිච්චි කරලා විශේෂයෙන් සන්නිවේදනය සඳහා වූ ක්‍රියාකාරකම් වලට විශාල වශයෙන් මුදල් ආයෝජනය කරලා තියෙනවා.

මේ සම්බන්ධයෙන් ස්වාමීන් වහන්ස Wired නැමැති අන්තර් ජාල සංග්‍රහයෙන් ඔය A growing frontier for terrorist groups suspecting chat apps වශයෙන් 2019 වර්ෂයේ 09 වැනි මස 01 වැනි දින පළ කොට ඇති ලේඛනය කොමිෂන් සභාවේ අවධානය සඳහා RGG 58 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා. ඒ වගේම ඔබ වහන්සේ How terrorists use Encryption නැමැති අන්තර් ජාලයෙන් ලබා ගන්නා ලද ලේඛනයක් RGG 59 වශයෙන් ලකුණු කිරීමට අවසර ඉල්ලා සිටිනවා. ගිය දිනයේ ඔබ වහන්සේ සාක්ෂි දීමේ දී දක්වා සිටියා මේ රීටා කාන්ටිස් ගැන.

පි: එක්සත් ජනපදයේ.

ප්‍ර: එක්සත් ජනපදයේ සිටින මේ සංවෘත සන්නිවේදන පද්ධති තුළට ඇතුළු වී ඒ පිළිබඳ ඔත්තු බලනවා කිව්වොත් නිවැරදියි?

පි: ඔව්. තොරතුරු ලබා ගන්නා කෙනෙක්.

ප්‍ර: තොරතුරු ලබා ගන්නා ජාත්‍යන්තර මට්ටමේ සංවිධානයක් මෙහෙය වන්නියක්. මේ කොමිෂන් සභාවට අවසාන වශයෙන් මේ නියමය තියෙන්නේ ස්වාමීන් වහන්ස මේ සිදු වෙච්ච විපත්තිය පිළිබඳව සොයා බැලීම වගේම ඉදිරි විපත්ති වළක්වා ගැනීම. ඒ සම්බන්ධයෙන් යම් මොඩලයක් නිර්මාණය කිරීමට අවශ්‍ය යෝජනාවක් මේ කොමිෂන් සභාවේ අවධානයට යොමු කිරීම සඳහා ඇයගේ කටයුතු පිළිබඳව New Yorker සඟරාවේ 2006 මැයි 29 දින පළ කරන ලද Private Jihad How Rita Cants got into spying business නැමැති ලේඛනය RGG – 60 වශයෙන් ලකුණු කිරීමට අවසරය ඉල්ලා සිටිනවා. ස්වාමීන් වහන්ස පෙර දිනයේ ඔබ වහන්සේ වීඩියෝ පට 2ක් මේ කොමිෂන් සභාවේ අවධානයට යොමු කළා. සහරාන් හෂිම්ගේ?

පි: ඔව්.

ප්‍ර: එකී වීඩියෝ පට අන්තර්ජාලයේ පවතිනවා කිව්වොත් නිවැරදියි?

පි: ඔව්.

ප්‍ර: දෙමළ භාෂාවෙන් පළ වන facebook පිටු කිහිපයක පවතිනවා කිව්වොත් නිවැරදියි. එකී එක් face book පිටුවකින් ලබා ගන්නා ලද මුද්‍රිත පිටපතක් කෙරෙහි කොමිෂන් සභාවේ අවධානය යොමු කර සිටිනවා. එය 2017 මාර්තු 24 වන දින අබ්දුල්ලා හමා ඔස්ට් යන අය විසින් පළ කරන ලද ලේඛනයක්. එහි සහරාන් හෂීම් සහ ඔහුගේ කාර්යය පිළිබඳව දැඩි විවේචනයක් දෙමළ බසින් ඉදිරිපත් කර තිබෙනවා. එම ලේඛනය අදාළ

FAIR COMMENT BY JEZEEM

වන්නේ මීට පෙර පෙන්වූ වීඩියෝ පට දෙකෙන් එක් වීඩියෝ පටයකට අදාළව එය නිශ්චිතව දැක්වීම අපහසුයි. එකී ලේඛනයත් RGG - 61 වශයෙන් ලකුණු කරනවා. ඒවගේම 2017 අප්‍රේල් 03 දින අර වීඩියෝ පට දෙකෙන් තවත් එක් වීඩියෝ පටයක් පළ කරන ලද facebook පිටුවක මුද්‍රිත පිටපතක් ඔබ වහන්සේ කොමිෂන් සභාවට ඉදිරිපත් කරනවා. එහි ISIS terrorist Zaharan who humiliates Sri Lankan mother land and the national flag and President of this country වශයෙන් දක්වා තිබෙනවා. එයත් අරාබි භාෂාවෙන් ඔහුගේ නම තිබෙන්නේ. දැන් ස්වාමීන් වහන්ස මේ මුස්ලිම් සමාජය මේ සහරාන් හෂිම් සම්බන්ධයෙන් යම් දැඩි විවේචනයක් අවම වශයෙන් මේ ලේඛන අනුව 2017 දීවත් සිදු කර තිබෙනවා. බොහෝ දුරට ඊට පෙර පවා සිදු කර තිබෙනවා. සිංහල සමාජය මේ සහරාන් හෂිම්ගේ කටයුතු පිළිබඳව දැනුවත් කර ඇත්තේ කුමන මාධ්‍යයක් ඔස්සේ ද ස්වාමීන් වහන්ස?

පි: අපි බොහෝ විට දැක්කා වෙබ් අඩවි අතර Colombo Today වෙබ් අඩවියේ ඒ කාත්තන්කුඩි එහෙම යම් යම් ඒ ගැටුම් වල සංසිද්ධින් බොහෝ දේවල් අපි Colombo Today හරහා දකිනවා.

ප්‍ර: එම වෙබ් අඩවියේ 2017 මාර්තු 14 වන දින පළකොට ඇති කාත්තන්කුඩි මුස්ලිම් ගැටුමේ මෙතෙක් පලනොවූ දර්ශන සහ තොරතුරු වශයෙන් දැක්වෙන එම අන්තර්ජාල පිටුවෙහි මුද්‍රිත පිටපතක් ඔබ වහන්සේ ඉදිරිපත් කරනවා එහි පළමු පිටුවේම යම් පුද්ගලයෙක්ව දක්වා තිබෙනවා?

පි: සහරාන්.

ප්‍ර: සහරාන් හෂිම් වශයෙන් ඔබ වහන්සේ හඳුනා ගන්නවා?

පි: ඔය අපි සිංහල වෙබ් අඩවිවල සහරාන් ගැන කතා කරපුවා. අපි පොඩ්ඩක් දැක්කාම වෙබ් අඩවිවලින් කියෙව්වා ඒ කාලේ.

ප්‍ර: මේ වෙබ් අඩවි පරිශීලනය කරන කොට පේනවා ඔබ වහන්සේට යම් ප්‍රමුඛතාවයක් මේ වෙබ් අඩවිය තුල ලැබෙනවා කියලා?

පි: ඒ කියන්නේ ඔව් ඉස්ලාම් ප්‍රශ්නේ කතා කරන හින්දාම වෙන්න ඇති .

ප්‍ර: **එකී ලේඛනය RGG - 63 වශයෙන් ලකුණු කිරීමට කොමිෂමේ අවසරය ඉල්ලා සිටිනවා.** ඒ වගේම ඔබ වහන්සේ පෙර වීඩියෝ පට දෙකක් සහරාන් හෂිම් සම්බන්ධයෙන් දක්වා සිටියා. එකී විඩියෝ පටවල NTJ Media Unit වශයෙන් සඳහන්ව තිබූ බව නිරීක්ෂණය වුනා. එකී NTJ Media Unit අන්තර්ජාලයේ සොයා බලන කොට ඒ සම්බන්ධව තවමත් පවතින කණ්ඩායම් තුනක තොරතුරු ලැබුණා Friends who like NTJ Media Unit වශයෙන්. එකී ලේඛනත් මෙහි විමර්ශන නිලධාරින්ට වැදගත් වේ යැයි සලකා RGG - 64 වශයෙන් ලකුණු කිරීමට කොමිසමේ අවසරය ඉල්ලනවා. ඒ වගේම ස්වාමීන් වහන්ස ඔබ

FAIR COMMENT BY JEZEEM

වහන්සේ අබ්දුල් රාසික් පුද්ගලයා කියන පිළිබඳව දිර්ඝ කරුණු දැක්වීමක් පෙර අවස්ථාවේ කළා. ඒ වගේම ඔබ වහන්සේ සාක්ෂියේ දී දක්වා සිටියා පුලස්තීනි මහේන්ද්‍රන් කියන දෙමළ ජාතික තරුණිය සාරා නමින් ඉස්ලාම් ආගමට හරවා දවා කොට පසුව කටුවපිටියේ දී බෝම්බය පුපුරවා ගත් හස්තූන් කියන පුද්ගලයාට විවාහ කර දුන්නේ මේ කියන අබ්දුල් රාසීක් විසින් කියා.

පි: අබ්දුල් රාසීක්ලාත් තවුහිද් ජමාතේ තුලත් දවා කරනවා.

ප්‍ර: දැන් තවමත් ඔහු මේ යම් තරුණ වියේ පසුවන ගැහැණු දරුවන් ඉස්ලාම් ආගමට හරහා ගැනීමේ කටයුතු කරගෙන යනවාද ස්වාමීන් වහන්ස?

පි: තවමත් මේ 2020 ත් අපි එක සිද්ධියක් දැක්කා.

ප්‍ර: ඒ සම්බන්ධයෙන් සිලෝන් තවුහිද් ජමාත් CTJ කියන අබ්දුල් රාසික් නායකත්වය දරන සංගමයේ ෆේස්බුක් පිටුවෙහි මෙම වසරේ පෙබරවාරි 16 වන දින පලව ඇති ෆේස්බුක් සටහනක මුද්‍රිත පිටපත කෙරෙහි ඔබ වහන්සේ කොමිෂන් සභාවේ අවධානය යොමු කරනවා එහි පුද්ගලයන් දෙදෙනෙක් සිටිනවා ස්වාමීන් වහන්ස. පිරිමි පුද්ගලයා ඔබ වහන්සේ හදුනා ගන්නවා ද?

පි: අබ්දුල් රාසික්.

එහි තරුණ කාන්තාවක දැක්වෙනවා. ඇගේ මුහුණ බොද කර ඇති බවත් කොමිෂමේ අවධානයට යොමු කරනවා. එහි දක්වා සිටිනවා එහි දෙමළ භාෂාවෙන් තියෙන්නේ එහි ස්වයංක්‍රීය පරිවර්තනයත් මෙහිම පවතිනවා. එහි දැක්වෙන්නේ Holic Al- Quran Presented to sister who accepted Islam at CTJ Headquarters Allahamidullah. මෙකී ලේඛනය RGG - 65 වශයෙන් ලකුණු කිරීමට ඔබ වහන්සේ කොමිෂමේ අවසරය ඉල්ලා සිටිනවා.

ප්‍ර: ඒ වගේම ගිය දිනයේ දී ඔබ වහන්සේ සාක්ෂි දීමේදී හෙළිදරව් කර සිටියා දර්ගා නගරය පදනම් කොට ගත් යම් තොරතුරු තාක්ෂණ විශේෂඥයකු සම්බන්ධයෙන් IS සංවිධානයේ?

පි: ඔව්

ප්‍ර: එහි නම කියවුනත් ඔහු දැනට අත්අඩංගුවේ පසුවන හෙයින් නම කීම අවශ්‍ය නැහැ. Virtusa ආයතනයේ වැඩකරපු පුද්ගලයෙක් වශයෙන් දැක්වුයේ. එකී තැනැත්තා ගේ ෆේස්බුක් පිටු වෙහි පළවී ඇති යම් අගතිගාමී සඳහන් ගැන ඔබ වහන්සේ සඳහන් කලා. ඒ වගේම එයට ලයික් කර ඇති තැනැත්තන් පිළිබඳවත් ඒ ඒ තැනැත්තන් දක්වාම මේ ඒ විමර්ශනයන් කල යුතු බවත් ඔබ වහන්සේ සඳහන් කළා.

පි: ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මේ අවස්ථාවේ දී මේ වන විට facebook පිටුවෙන් ඉවත් කොට තිබුණත් ඉවත් කිරීමට පෙර මීට වසරකට පමණ පෙර ලබා ගත් තිර සටහන් ඔබ වහන්සේට ලැබී තිබෙනවා?

පි: ඔව්.

ප්‍ර: එකී තිර සටහන් මෙම කොමිෂමේ සහ මින් පරිබාහිර විමර්ශන නිලධාරින්ගේ අවධානයට යොමු වෙතැයි සළකමින් ඔබ වහන්සේ එකී ලේඛන සමුච්චිතව RGG – 66 වශයෙන් ලකුණු කිරීමට අවසර ඉල්ලා සිටිනවා. එහි ඉදිරියෙන්ම පවත්නා ලේඛනයෙහි The black flags of Islam will fly in Colombo වශයෙන් දක්වා සිටින බව මෙම කොමිෂමේ අවධානයට යොමු කර සිටිනවා. එයට කැමැත්ත පළ කොට ඇති පුද්ගලයන් 121 දෙනෙක් සිටින බවත් කොමිෂමේ අවධානයට යොමු කරනවා.

****

දැන් වේලාව: ප.ව.9.50
මෙතැන් සිට ල/ලේ: චන්දිමා මෙනවිය

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව:ප.ව 9.50
පෙර සටහන්: ල/ලේ නිල්මිණි මෙනවිය.
මෙතැන් සිට: ල/ලේ චන්දිමා දිල්හානි

ඥානසාර ස්වාමීන් වහස්සේ වෙනුවෙන් පෙනී සිටින නීතීඥ ඉරේෂ් සෙනවිරත්න මහතා

ප්‍ර: ඒ වගේම මේ කොමිෂමේ ගරු සභාපතිතුමා ඔබ වහන්සේගෙන් විමසා සිටියා මේ ඉක්වාන් මුස්ලිම් මතවාදය පිළිබඳව එතුමා ඔබ වහන්සේගෙන් විමසා සිටියා ඉහ්වාන් කියන්නේ මේ Muslim Brotherhood සංවිධානයම නේද කියලා?

පි: ඔව්.

ප්‍ර: ඉක්වාන් කියන්නේම බ්‍රදර්හුඩ් යන්න යැයි සැලකුවොත් නිවැරදියි ස්වාමීන් වහන්ස?

පි: ඔව්.

ප්‍ර: ඔබ වහන්සේ කියා සිටියා මෙහි මේ අන්තවාදයට පදනම සලසන ව්‍යාපාරයක් වශයෙන්?

පි: ඔව්

ප්‍ර; එකි ඒ වගේම ස්වාමීන් වහන්ස වර්තමාන අල්කයිඩා නායක අයිමන් අල්ස්වාහිරි අල්කයිඩා සංවිධානයට බැඳෙන්නට කලින් හිටියේ කොහේද ස්වාමීන් වහන්ස?

පි: බ්‍රදර්හුඩ් එකේ.

ප්‍ර මුස්ලිම් බ්‍රදර්හුඩ් එකේ තවමත් ඔහු බ්‍රදර්හුඩ් එක සාධාරණීකරණය කරමින් විඩියෝ පට නිකුත් කරනවා කිව්වොත් නිවැරදියි?

පි: ඔව්.

ප්‍ර: එමෙන්ම ඔසාමා බින්ලාඩන්ට එල්ල කරන ලද ඇමරිකානු පකිස්ථානයේදී එල්ල කරන ලද ලබනු ප්‍රහාරයේදී අත්පත් කර ගන්නා ලද ලේඛන අතරත් බිම්ලාඩන් හා බ්‍රදර්හුඩ් එක අතර සබඳතාවය හෙලිදරව් වන ලේඛන තිබී තිබෙනවා මේ සම්බන්ධයෙන් කරුණු අනාවරණය වෙන AL – Arabiya News අඩවියේ පලව ඇති After Saudi crown princess left to eliminate Brotherhood Swahiri defense . වශයෙන් දක්වා ඇති 2018 මර්තු 21 වෙනි දින පළව ඇති ලේඛනය RGG 67 වශයෙන් සලකුණු කිරීමට ඔබ වහන්සේ කොමිෂමේ අවසරය ඉල්ලා සිටිනවා. ස්වාමීන් වහන්ස ඒ වගේම මේ හදිස් වැනි ලේඛනයන්ට මෙරට ජනතාවට තියෙන පහසු ප්‍රවේශය මේ කොමිෂන් සභාව හමුවේ නිරූපනය කිරීමට ඔබ වහන්සේ මින් පෙර RGG 55 වශයෙන් ලකුණු කරන ලද සහී මුස්ලිම් ග්‍රන්ථයෙහි පස්වන වෙළුම ඇතුලත්ව වෙළුම් 07 ම මිලදී ගැනීම නිරූපනය කිරීම සඳහා Islamic Book house මරදානේ

FAIR COMMENT BY JEZEEM

පිහිටි ආයතනය විසින් 2020 ජුනී මස 14 වන දින නිකුත් කරන ලද බිල්පත්‍රයක් මෙම කොමිෂන් සභා හමුවට RGG 55 C වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

පි: ඊට කලින් මට ජමාතේ අපි හදපු ඉස්ලාම් ගැන ලියවිල්ලක් ඉදිරිපත් කරනවා ඒක කියවන්න ඕනේ නැහැ.

ප්‍ර: ඔබ වහන්සේ මීට පෙර ජමාතේ ඉස්ලාමියෙන් සංවිධානය මෙරට දේශපාලනයට පවත්නා බලපෑම සම්බන්ධයෙන් කරුණු දැක්වුවා?

පි: ඔව් නමුත් අපිට සමහර ඒ කියන්නේ අවස්ථාවේදී මඟ හැරුණු කීපයකුත් තිබෙනවා විශේෂයෙන් අපි අවධාරණය කොට කොට ඉල්ලා සිටිනවා මේ කොමිෂන් සභාවේන් ජමාතේ ඉස්ලාම් සංවිධානය ගැන විශාල අවධානයක් යොමු කල යුතුයි මොකද ඒ පකිස්ථානය මුල් කර ගෙන ත්‍රිකුණාමලයේදී ආරම්භ කරපු වැඩ පිළිවෙලක් දැන් දේශපාලන සංවිධාන ගණනාවක් ගොඩ නගලා තියෙනවා මේ ජමාතේ ඉස්ලාම් සංවිධානය හරහා PMGD අකුරණ දේශපාලන සංවිධානය ඒ වගේම FJP Front for justice and peace කියලා ත්‍රිකුණාමලය කින්නියා මස්ජුර් ශූරා සභාව නජා මොහොමඩ් එක්ක ගොඩනගපු ඒ දේශපාලන වැඩිපිළිවෙල. PMGG කාත්තන්කුඩි මුලික කරගනිමින් BCAS කැම්පස් ආයතනය හිමිකරු අබ්දුල් රහුමාන් විසින් ගොඩනගපු දේශපාලන සංවිධානය ඒ වගේම NFGG Nation Front for Good Governance මේ ඔක්කොම දේශපාලන සංවිධාන. ඒ විතරක් නෙමේ පාස්කු ඉරිදා සිදුවුන අන්තවාදී ප්‍රහාරයට සැක පිට අත්අඩංගුවට ගනිපු සුප්‍රසිද්ධ හාජ්ජියාර් මොහොමඩ් ඉබ්‍රාහිම් පමණක් නෙවෙයි. ජනතා විමුක්ති පෙරමුණත් එක්ක මේ මොහොත දක්වාත් ජමාතේ ඉස්ලාම් සංවිධානයේ නීතිඥ M.S.M ෆාරිස්ස් වැඩකටයුතු කරනවා ඒ විතරකුත් නෙමේ හජ්ජුල් අක්බාර් කියන පුද්ගලයා මොන ආකාරයට ද නිදහස් වුනේ කියන එක බරපතල ගැටලුවක් අපට. ඒක අපි ත්‍රස්ත විරෝධි කණ්ඩායමක් හැටියට අපිට. තවමත් හිතා ගන්න බැහැ.මොන පදනමෙන්ද ඔහු නිදහස් වුනේ කියලා දැන් මේ වෙනකොට නිහදස් වීමෙන් පස්සේ ජනතා විමුක්ති පෙරමුණේ හවුල්කාර සංවිධානයක් හැටියට හජ්ජුල් අක්බාරුත් ඒ වගේම ෆාරිස් කියන මේ පුද්ගලයෝ කටයුතු කරනවා. ඒ විතරකුත් නෙවේයි අවුරුදු 25 තිස්සේ ජමාතේ ඉස්ලාම් වැඩපිළිවෙලට සෘජු දායකත්වය දීලා ඒ ගොඩනගපු හජ්ජුල් අක්බාර් 2020 අප්‍රේල් 17 වෙනිදා සිකුරාදා ගුවන්විදුලි සංස්ථාවේ දේශනයකුත් කරන ඉතින් අපිට අවසාන වශයෙන් අහන්න තියෙන්නේ මොන රටක් ද කියලා මේ ත්‍රස්තවාදින් කොහොමද නිදහස් වුනේ ඔහුගේ ලේකම්වරයා නිතීඥ මහත්මයෙක්. ඒ විතරක් නෙවේ ඔහු කරපු දේශනා මේක නෙත් එෆ්.එම් වැඩසටහනේදී කිව්වා නදීර් මවුලවි ජමාතේ ඉස්ලාමිය සංවිධානය

FAIR COMMENT BY JEZEEM

වන්නේ ලංකාවේ ඉස්ලාම් රාජ්‍යයක් පිහිටුවීම පිළිබඳ එම සංවිධානයේ පුහුණු කඳවුරුවල හා දේශනාවල පැවසුවා 1996 වසරේදී මම සහභාගි වුන නේවාසික පුහුණු කඳවුරක හජ්ජුල් අක්බාර් විසින්ම එම කරුණු අප හට උගන්වනු ලැබුවා. තවද රටේ නීතියට යටත් වෙලා ජීවත්වීම අල්ලාහ් දෙවියන්ට විරුද්ධව කරන ලොකුම පවක් බවට අප හට උගන්වනු ලැබුවා. ඉතින් මෙච්චර Evidence තියෙද්දි මේ මනුෂයා එළියේ ඒ නිසා අපි සංවිධානයෙන් හඳපු මේ ලියවිල්ල විශාල අධ්‍යයනයකින් පස්සේ මේකත් අපි මේ ලබාදෙනවා.

එකී ලේඛනය තවමත් ලංකාවේ තහනම් නොවුන ජමාතේ ඉස්ලාම් අන්තවාදී සංවිධානය යන මාතෘකාවෙන් යුත් එකී ලේඛනය RGG 68 ලකුණු කිරීමට කොමිෂන් සභාවේ අවධානය යොමු කරනවා.

පි: ඒ වගේම මේකත් අපි භාර දෙන්න ඕන ඒ වගේම ඔය අපි දවස් දැන් කතා කරපු මේ මතවාදී කණ්ඩායම් නැත්නම් ලෝකය පුරා වහබ්වාදය ප්‍රචාරය කරමින් මේවා රටවල් වල පලපැදියම කරන්න ඒ මතවාදය පළපැදියන් කරන්න ඒ මතවාද සපයපු සියළුම පුද්ගලයන්ගේ පොත් සම්බන්ධයෙන් අපේ රජයේ අනුග්‍රහයෙන් ඉස්ලාම් ගුරු මාර්ගෝපදේශනය 13 පොතේ අපි සටහන් කරලා තියෙනවා අපි කලින් ඒක භාර දුන්නා. මේ ගැන කතා කලේ නැති නිසයි නැවත මතක් කලේ මොකද මේකේ සියළුම පොත්පත් ගැන දක්වලා තියෙනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: 13 ඉස්ලාම් දැනටමත් ලකුණු කරලා තියෙන්නේ.

පි: මේකේ සම්පූර්ණ විස්තරේ ලකුණු කරලා

****

<u>ඥානසාර ස්වාමීන් වහස්සේ වෙනුවෙන් පෙනී සිටින නීතීඥ ඉරේෂ් සෙනවිරත්න මහතා</u>

ප්‍ර: 13 ඉස්ලාම් ගුරු මාර්ගෝපදේශය අධ්‍යාපන ප්‍රකාශ දෙපාර්තමේන්තුව විසින් පලකොට ඇති ලේඛණයක් එකී ලේඛනය RGG 69 වශයෙන් ලකුණු කිරීමට අවසර ඉල්ලා සිටිනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මෙම ලේඛනයේ කොටසක් දැනටමත් **IZ 09** වශයෙන් ලකුණු කර ඇති බව උගත් රජයේ අධිනීතිඥවරයා දන්වයි.

****

FAIR COMMENT BY JEZEEM

ඥානසාර ස්වාමීන් වහස්සේ වෙනුවෙන් පෙනී සිටින නිතීඥ ඉරේෂ් සෙනවිරත්න මහතා

ප්‍ර: ස්වාමීන් වහන්ස මේ අවසාන වශයෙන් මේ සම්බන්ධයෙන් ඔබ වහන්සේ ඉස්ලාම් ආගමික ඉගැන්වීම් වල යම් සාදනිය ප්‍රතිසංස්කරණ සිදුවී ඇති බැව් ඔබ වහන්සේ සලකනවාද?

පි: අනිවාර්යෙන්ම දැන් මේ 2020 ප්‍රබෝධය සඟරාව ජමාතේ ඉස්ලාම් සංවිධානයෙන් පලකරනවා. මරාගෙන මැරිලා 300 ක් මුළු රටම භීතියට පත් කරලා තියෙද්දි ජමාතේ ඉස්ලාම් සංවිධානය මේ ප්‍රබෝධය සඟරාව ගහනවා මේකේ අන්තර් ගතයට ගියාම ඔය කියපු හදීස් ඔක්කෝම මෙකේ තියෙනවා.

ප්‍ර: ඉස්ලාමිය මූල ග්‍රන්ථයන්හි ප්‍රතිසංකරණ සිදුවිය යුතු යැයි ඔබ වහන්සේ හිතනවාද?

පි: ඒවා අපිට කරන එක ලේසි වෙන්නේ නැහැ නේ.ඒක මහා විශාල සටනක් බවට පත්වෙන්න හැබැයි අපිට පුළුවන්කමක් තියෙනවා. අපේ මේ පොළවට මේ පසට මේ සංස්කෘතියට ගැලපෙන ආකාරයට ඔවුන් එක්කලා විවෘත සංවාදයක් මොකද එතකොට අපි දන්නවා එතකොට සිමාව එවැනි සංවාදයකට යායුතුයි කියලා තමයි අපි කල්පනා කරන්නේ.

ප්‍ර: ස්වාමිනි වහන්ස දැන ඔබ වහන්සේගේ මතය මේ සම්බන්ධයෙන් වැදගත් යැයි

පි: ඔය පොත දෙන්නත් පුළුවන් පොත් දෙක මේ 2020 මේ ප්‍රබෝධ සඟරා දෙකක් තියෙනවා.

****

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා

ඒ දෙක ලකුණු කරන්න.අපිට ලැබෙන්න සලස්වන්න පුළුවන් නම්

පි: මෙ යහපාලනයේ විකසිත වේවා.

****

ඥානසාර ස්වාමීන් වහස්සේ වෙනුවෙන් පෙනී සිටින නිතීඥ ඉරේෂ් සෙනවිරත්න මහතා

ප්‍ර: 2020 ජනවාරි ප්‍රබෝධය සඟරාව RGG 70 වශයෙන් ලකුණු කිරීමට කොමිසමේ අවසරය ඉල්ලා සිටිනවා.
එමෙන්ම 2020 පෙබරවාරි ප්‍රබෝධය සඟරාවේ කලාපයත් RGG 71 වශයෙන් ලකුණු කිරීමට අවසර ඉල්ලා සිටිනවා

පි: මේකේ ආරම්භය 1984 සඟරාවේ ආරම්භය තාම එක දිගට පවත්වාගෙන එනවා මේ ලිපි ලියන අය ගත්තාම ඔක්කෝම අපි අර කියපු අන්තවාදී

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ජාත්‍යන්තර පාසැල්වල උගන්වන උදවිය තමයි මේ සගරාවට ලියන්නේ ඒකයි විශේෂත්වය.

ප්‍ර: අවසාන වශයෙන් ස්වාමීන් වහන්ස මේ ඉල්ලා සිටින සාදනිය ප්‍රතිසංස්කරණ හරි එහෙම නැත්නම් මේ පිළිබඳ අවධානය වැඩි අවධානයක් යොමු කරන්නේ කියන කොට ඉස්ලාමීය ඉගැන්වීම් සම්බන්ධයෙන් කියන දෙයක් තමයි මේ සියළු ආගම්වල මේ කියන දේවල් තියෙනවා කියලා. දැන් ස්වාමීන් වහන්ස බුද්ධ ධර්මයේ මෙවන් මේ දක්වා සිටි මූලග්‍රන්ථයන් තුලින් දක්වා සිටි කාරණාවලට යාන්තම් හෝ ගෑවෙන යමක් තිබෙනවාද?

පි: ඇලපිල්ලකවත් නැහැ.

ප්‍ර; තුන්පිටකයේ කොහේවත් නැහැ?

පි; තුන්පිටකයේ කොහේවත් නැහැ.මම ඒ පිටකය සම්බන්ධයෙන් මේකත් මං ඉදිරිපත් කරනවා.අපේ පෙලදහම ත්‍රිපිටකයේ ත්‍රිපිටකයේ පෙළ දහමේ ඇති දේවල් සවිස්තරාත්මකව විස්තර කරනවා අටුවාවේ අටුවාවෙන් පස්සේ තවත් විස්තර කරනවා ටීකාවේ ටීකාවේත් නැති විස්තර තියෙනවා ටිප්පනි එතකොට ත්‍රිපිටක පෙල,අටුවාව,ටීකාව,ටිප්පනී කියන මේ වැඩි විස්තර සහිතව වූ අටුවා ටීකාවන්ගේවත් ඇලපිල්ලකවත් හිංසනයක් ගැන අපිට කතා කරන්න කිසිම හිංසාවක් නැහැ.

ප්‍ර: දැන් ඇතැම් අය කියනවා ස්වාමීන් වහන්ස ඇතැම් භික්ෂූන් වහන්සේලා පවා කියනවා මහා වංශයේ පූන්න දිවයිනෙන් වැඩිය රහතන්වහන්සේලා දුටුගැමුණු රජතුමාට කරපු උපදේශයක් සම්බන්ධව දැන් ස්වාමීන් වහන්ස එය මේ බුද්ධාගමේත් මෙවැනි කාරණා තිබෙන බවට දක්වන ඒක නිදර්ශනයක් බවට යොදා ගන්නවා?

පි: සම්පූර්ණයෙන් වැරදීයි

ප්‍ර: මහා වංශය මහවහන්සය තුන්පිටකයට අයත්ද?

පි: නෑ මහ වංශය කියන්නේ ත්‍රිපිටකයට කිසිම අදාලත්වයක් නැති එකක් මේ ත්‍රිපිටකයට සංයුතිය ගැන මං ලේඛනයකුත් ඉදිරිපත් කරනවා.සුත්‍ර පිටකයේ විනය පිඨකයේ අභිධර්ම පිඨකයේ කිසිම තැනක ඒකට අදාල අටුවා ගන්ථය තියෙනවා ටීකාව තියෙනවා මේ කිසිම තැනක හින්සාව පිළිබඳව මෛත්‍රිය, කරුණාව, මුදිතාව උපේක්ෂාව හැර එක ඇස්පිල්ලක් නෑ හිංසනයක් සම්බන්ධයෙන් ඒ වගේම අපේ තියෙනවා ශාසනිනකව ගත්තාම ප්‍රධාන භික්ෂු නිකාය තුනක් සියම් ,අමරපුර,රාමඤ,සියම් නිකායේ තියෙනවා පාර්ශව 08 ක්. අමරපුර නිකායේ තියෙනවා පාර්ශව 22 ක්. එතකොට මේ එකකවත් එත් අර ගහමරා ගන්නා වූ තමන්ගේ ආගම වෙනුවෙන් එවැනි කිසිම සංවිධානයක්වත් එවැනි කිසිම පෙළඹීමක්වත් කවදාකවත් වාර්තා වෙලාත් ඇතිවෙලාත් නෑ අපි අපේ බුදුන් වෙනුවෙන් ගහම රාගන්නෙත් නෑ. වෙන කවුරුත් බුදුන් වෙනුවෙන් මරන්නෙත් නැහැ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර; ස්වාමිනි වහන්ස දැන් මේ පිළිබඳව කියන කොට කතෝලික ධර්මයේත් මෙවැනි දේවල් සඳහන් වෙනවයි කියමින් මේ ප්‍රතිසංස්කරණය යම් බාධාවකට ලක් කරනවා දැන් ස්වාමින් වහන්ස විස්තරාත්මකව දක්වන්න ඉතාම අනුවේදනිය දෙයක් තියෙනවා. මේ විශේෂයෙන් ඉස්ලාමිය ත්‍රස්ත සංවිධාන විසින් පාලනය කරන ප්‍රදේශවල ගල්ගසා මරා දැමීම ?

පි: ඔව්.

ප්‍ර: ඒ සම්බන්ධයෙන් මින් පෙර C 660 වශයෙන් ලකුණු කරන ලද ග්‍රන්ථයෙහි 613 වන පිටේ ඉතාම අනුවේදනිය සිද්ධියක් සඳහන් වන බව පමණක් ඔබ වහන්සේ දක්වනවා?

පි; ඔව්.

ප්‍ර; දැන් ස්වාමින් වහන්ස මේ වගේම සමාන සිද්ධියකට ජේසුස් වහන්සේත් මුහුණ දෙනවා? උන් වන්සේ කටයුතු කරන්නේ කොහොමද ස්වාමින් වහන්ස?

පි: අවිහින්සාවාදයෙන්.

ප්‍ර: ඔබ අතරින් පවු නොකල කෙනෙක් වේ නම් පළවෙනි ගල ගහන්න කියලා?

පි: පලවෙනි ගල ගහන්න.

ප්‍ර: මේ පහුගියදා සමුගත්ත අර්නස්ට් පෝ තොට පියතුමා මර්සලින් ජයකොඩි පියතුමා කාදිනල් තුමා වැනි අය ප්‍රමුඛ කරගත්ත කතෝලික ජනතාවගේ සමාකාමී භාවිතාවට මේ ජේසුතුමාගේ චරිතයක් හේතුවෙන්න ඇතැයි කියලා ඔබ වහන්සේ විශ්වාස කරනවාද?

පි: මං හිතනවා ඒ දර්ශනය අපේ සංස්කෘතියත් එක්ක ගලප ගත්තා මර්සිලින් ජයකොඩි මහත්මයා ලියනවා එතුමාගේ කවි පොතේ පේන පේන හැම තැනකම මහ දාගැබ් තැනීයන් කියලා ඒ සමාධිය මේ ධර්මය ඇතුලේ එතුමාට කිව්වේ පන්සලේ උපන් පියතුමා කියලා ඉතින් අපි සංස්කෘතියට අවශෝෂණය කරගත්තා ඒ නිසා කිසිම ගටඨනයක් ඇති වුනෙත් නැහැ අනිත් එක බයිබලයේ බොහෝදේවල් වර්තමානයට ගැලපෙන ආකාරයට එය සංස්කරණය කරගෙන තියෙනවා.

ප්‍ර; මාගේ සාක්ෂි විමසීම අවසන් කරන්නයි හදන්නේ ස්වාමිනි වහන්ස ඔබ වහන්සේට මෙම ප්‍රහාරයෙන් අනතුරුව විශේෂ ජනාධිපති සමාවක් හිමිවෙනවාද

පි: ඔව්.

ප්‍ර: ඒ ජනාධිපති සමාව හිමි වෙලා හිරෙන් නිදහස්වෙලා දින කීපයක් ඇතුලත ඔබහන්සේ මෙම ප්‍රහාරයෙන් වැඩිම හානියක් සිද්ධවෙච්ච කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයට වැඩම කරනවා?

පි: ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ අවස්ථාවේ සිදුවූ දර්ශනයක් මේ ඛේදවාචකයේ පරිමාණය තේරුම් ගැනීමටත් ඒ තුල ඔබ වහන්සේගේ කාර්ය බාරය තේරුම් ගැනිමටත් වැදගත් යැයි ඔබ විශ්වාස කරනවා?

පි: අනිවාර්යෙන්ම.

ප්‍ර: එකී විඩියෝ පටය මෙම අවස්ථාවේදි දර්ශනය කිරිමට කෙටි විඩියෝ පටයක් එය දර්ශනය කිරීමට කොමිෂන් සභාවේ අවසරය ඉල්ලා සිටිනවා. අදාළ විඩියෝ දර්ශනය කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රදර්ශනය කරයි.එය RGG 72 වශයෙන් ලකුණු කිරීමට කොමිෂන් සභාවේ ඉල්ලා සිටිනවා. ඒ සමඟ මාගේ සාක්ෂි විමසීම් අවසන් කරනවා. ස්තූතියි මැතිතුමනි,ස්තූතියි මැතිණියනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

සාක්ෂිකරු විසින් කොමිෂන් සභාව ඉදිරියේ ලබා දුන් සාක්ෂිය හේතුවෙන් ස්වාමින් වහන්සේට ඇතිවිය හැකි යම් අනතුරක් හෝ තර්ජනයක් විය හැකි බවට කොමිෂන් සභාවට හැඟී යන හෙයින් 2015 අංක 4 දරණ සාක්ෂි කරුවන් හා වින්දිතයන් හට ආරක්ෂාව සැපයීමේ පනතේ 25 (1) උප වගන්තිය ප්‍රකාරව මෙම ගරු ස්වාමින් වහන්සේට හිමිවිය යුතු වරප්‍රසාද සහ අයිතින් ගරු ස්වාමින් වහන්සේට ලබා දෙන ලෙසට සාක්ෂිකරුවන් සහ වින්දිතයන් ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය වෙත කොමිෂන් සභාව නියෝග කරමි.

ගරු ස්වාමින් වහන්ස කොමිෂන් සභාව ඉදිරියට පැමිණ සාක්ෂි ලබා දීමෙන් කොමිෂන් සභාවේ කාර්යය කෙරෙහි දැක්වූ දායක්තවයට කොමිෂන් සභාවේ ස්තූතිය ඔබ වහන්සේට ප්‍රකාශ කරන්නට අවශ්‍යයි.

****

<u>අතිරේක සෝලිසිටර් ජනරාල් ජනාධිපති නිතීඥ අයේෂා ජීනසේන මෙනවිය</u>

ගරු සභාපති තුමනි ඔබගෙන් ඉල්ලිමක් කරන්නට තිබෙනවා RGG 70 සහ 71 ලෙස අද දින ලකුණු කොට ඉදිරිපත් කල සඟරාවල ඡායාස්ථ පිට පත් අපට ලබා දෙන්නේ නම් ඉදිරි විමර්ශන කටයුතු සඳහා එමගින් සහයක් ලැබෙනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මිට අමරතව උගත් අතිරේක සොලිසිටර් ජනරාල්වරිය විසින් කරන ලද ඉල්ලීම අනුව කොමිෂන් සභාව ඉදිරියේ සලකුණු කරන්නට යෙදුනු RGG 70 සහ 71, දරණ ලේඛණවල ඡායා පිටපත් ලබා ගෙන එය නිතිපති දෙපාර්තමේන්තුව කණ්ඩායමට ලබා දෙන ලෙසට කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරමි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ප්‍රබෝධය පොත කොහොම ද ලැබුණේ?

පි: ගන්න පුළුවන් .

ප්‍ර: Islamic center කියන?

පි: book shop එකෙන් ගන්න පුළුවන්.මරදානෙන්.

එහෙනම් අපිට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් අපේ ගෞරවයත් පුණ්‍යානුමෝදනාවත් අශිර්වාදයත් පල කරන අතරේම මේ සාක්ෂි ලබා දීමේදී යම් වචනයකින් හරි සිත් රිදීමක් හෝ අපහසුතාවයට පත්වීමක් වුනා නම් ඒ පිළිබඳව කනගාටුව මේ වෙලාවේදී පල කරනවා. මේ අවස්ථාව ලබා දීම ගැන ස්තූති වන්ත වෙනවා.

කොමිෂන් සභාව නැවත 2020.06.19 දහවල් 12.30 ට රැස්වේ.

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශයේ නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය: 2020.06.19 වෙලාව:- ප ව. 1.00

සටහන් කළේ:- ධම්මිකා පෙරේරා විසිනි

ගරු විනිසුරු මඩුල්ල:-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා (පැමිණ නැත) - සාමාජික

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික -

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

පෙනී සිටීම:

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතිඥතුමිය සමඟ ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස්, චතුරංග බණ්ඩාර, දිලන්ත එස්.කළුදුරුවගේ සහ අරින්ද්‍ර ජයසිංහ යන මහත්ම මහත්මීන් පෙනී සිටි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අහරදගරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතිඥ රවිෂානි පීරිස් මහත්මිය කොමිසමේ සාක්ෂි විමසීමේදි පෙනී සිටීමට අවසර දෙන ලදි.

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

<u>සාක්ෂි අංක 287 සාක්ෂියට කැඳවයි.</u>

සම්පූර්ණ නම : කෝනාර මුදියන්සේලාගේ ආරියසේන.

වයස : අවුරුදු 54 යි,

ජාතිය : සිංහල,

ආගම : බෞද්ධ,

තනතුර : පොලිස් පරීක්ෂක.

දැනට සේවා ස්ථානය: ගෝවින්දපුර පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරී කරනවා.

<u>ප්‍රතිඥා දී කැඳවයි.</u>

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා:</u>

ප්‍ර : ආරියසේන මහත්මයා ඔබ ශ්‍රී ලංකා පොලිසිය සමඟ සම්බන්ධ වෙන්නේ කුමන වකවානුවේද?

පි : 1986.12.31 වෙනි දින.

ප්‍ර : කුමන තනතුරකින්ද ඔබ සම්බන්ධ වෙන්නේ?

පි : උප සේවා පොලිස් කොස්තාපල් 12013 විදියට.

ප්‍ර : මූලික පුහුණුවක් ඔබ ලබා ගන්නවද ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඉන් පසුව ඔබ දිවයින පුරා මොන මොන පොලිස් ස්ථානවලද රාජකාරී කරන්නේ?

පි : පොලිසි 23 ක විතර රාජකාරී කරලා තියෙනවා ස්වාමිණි.

ප්‍ර : ඔබ ඔය පොලිසි 23 ක විතර රාජකාරී කරමින් යන ගමනේ මුල්ම උසස්වීම ලැබෙන්නේ කොයි වකවානුවේදී ද?

පි : 97 වර්ෂයේ ස්වාමිණි. 1997 වර්ෂයේ.

ප්‍ර : 1997 වර්ෂයේ තමයි මුල්ම උසස්වීම?

පි : 97 වර්ෂයේ පොලිස් සැරයන් බවට පත් වෙනවා.

ප්‍ර : පොලිස් සැරයන් තනතුරට ඔබ උසස්වීමක් ලැබෙනවා?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඉන්පසු ඊලඟ උසස්වීම ලැබෙන්නේ කුමන වකවානුවේදී ද?

පි : 2007 වර්ෂයේ හම්බ වෙනවා ස්වාමිණි. උප පොලිස් පරික්ෂක තනතුර.

ප්‍ර : ඔබ දැන් තමාගේ රාජකාරී කාලය තුළ පැමිණිලි විමර්ශන සම්බන්ධයෙන් විශේෂ පාඨමාලා හදාරලා තියෙනවද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : මොනවද ඒ පාඨමාලා?

පි : විවිධ පැමිණිලි සහ අපරාධ විමර්ශනය සම්බන්ධයෙන්.

ප්‍ර : ඊට අමතරව අපරාධ විමර්ශනය සම්බන්ධයෙන් ඔබට මොන වගේ අත්දැකීම්ද තියෙන්නේ?

Legal Society's Copy
FAIR COMMENT BY JEZEEM

පි : මගේ සේවා කාලය ඇතුලත විවිධ අපරාධ සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කරලා තියෙනවා ස්වාමිණි.

ප්‍ර : ඔබ බඩල්කුඹුර පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති විදියට කටයුතු කරලා තියෙනවද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඊට අමතරව මොණරාගල විශේෂ අපරාධ අංශයට අනුයුක්තව රාජකාරී කරලා තියෙනවද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඔබ වවිනතිව් පොලිස් ස්ථානයට අනුයුක්ත වෙන්නේ කුමන වකවානුවේද?

පි : ස්වාමිණි ලේඛන බලා, 2018.03.29 වන දින ස්වාමිණි.

ප්‍ර : 2019.03.29 සිට කවදා දක්වා ඔබ වවිනතිව් පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරී කලාද?

පි : 2020.01.23 දක්වා ස්වාමිණි.

ප්‍ර : මේ වන කොට ඔබ කොහේද රාජකාරී කරන්නේ?

පි : දැනට මොනරාගල කොට්ඨාශයේ ගෝවින්දපුර පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරී කරනවා.

ප්‍ර : දැන් ඔබ වවිනතිව් පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරී කරන කොට ඔබට තිබ්බ තනතුර මොකක්ද මහත්මයා?

පි : උප පොලිස් පරීක්ෂක.

ප්‍ර : ඊට අමතරව ඔබට යම්කිසි අංශයක් භාර දී තිබුණද?

පි : අපරාධ විමර්ශන අංශය භාරව කටයුතු කලා ස්වාමිණි.

ප්‍ර : ඔබ වවිනතිව් පොලිස් ස්ථානයේ ස්ථාධිපති විදියට කටයුතු කලාද යම්කිසි කාලයක?

පි : වැඩ බලන ස්ථානාධිපති ලෙස කටයුතු කලා ස්ථානාධිපති තුමා බැහැර යන අවස්ථාවලදී ස්වාමිණි.

ප්‍ර : ඔබ වැඩ බලන ස්ථානාධිපති වශයෙනුත් කටයුතු කරලා තියෙනවා?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : මහත්මයාට කියන්න පුළුවන්ද වවිනතිව් පොලිස් බල ප්‍රදේශය තුළ කොච්චර ග්‍රාමසේවා වසම් තියෙනවද කියලා?

පි : 16 ක් තියෙනවා ස්වාමිණි.

ප්‍ර : සාමාන්‍යයෙන් කොතරම් ජනගහනයක් මේ වවිනතිව් පොලිස් බලප්‍රදේශය තුළ ජීවත් වෙනවද?

පි : 21357 ක් මගේ මතකයේ හැටියට.

ප්‍ර : එයින් බහුතරය ජනතාව වවිනතිව් පොලිස් බල ප්‍රදේශය තුළ ඉන්නේ කුමන ජනවර්ගයකට අයත් පිරිසක්ද?

පි : ද්‍රවිඩ ජනතාව ඉන්නවා ස්වාමිණි.

ප්‍ර : සාමාන්‍යයෙන් කීයක් විතර ඉන්නවද?

FAIR COMMENT BY JEZEEM

පි : 21279 ක් පමණ.

ප්‍ර : මුස්ලිම් ජනගහනය?

පි : මුස්ලිම් 74 ක් ඉන්නවා ස්වාමිණි.

ප්‍ර : සිංහල ජනතාව?

පි : සිංහල 6 ක් ඉන්නවා ස්වාමිණි.

ප්‍ර : දැන් මේ වව්නතිව් ප්‍රදේශයේ ජනතාවගේ සාමාන්‍යයෙන් ප්‍රධාන ජීවිකාව වෙලා තිබ්බේ මොකක්ද? මෙය ගම්බද පරිසරයක් ද ගොඩක් නාගරිකරණය වූ පළාතක්ද මේක?

පි : ගම්බද පරිසරයක් ස්වාමිණි.

ප්‍ර : විශේෂයෙන්ම මොන වගේ කර්මාන්තවලද පුද්ගලයින් නිරත වුණේ?

පි : මාළු ඇල්ලීම, ගොවිතැන් කිරීම සහ ගවයින් බලා ගැනීම.

ප්‍ර : දැන් මේ වව්නතිව් පොලිස් බලප්‍රදේශයේ ආගමික සිද්ධස්ථාන තිබුණද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : හින්දු කෝවිල් කොච්චර විතර තිබුණද?

පි : කෝවිල් 54 ක් ස්වාමිණි.

ප්‍ර : නැවත පරික්ෂා කර බලන්න?

පි : කෝවිල් 54 ක් මගේ මතකයේ හැටියට 54 ක් තියෙනවා.

ප්‍ර : මුස්ලිම් පල්ලි?

පි : මුස්ලිම් පල්ලි එකයි ස්වාමිණි.

ප්‍ර : පන්සලුත් තිබුණද ඒ පළාතේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : කොච්චර පන්සල් තිබුණද?

පි : එකක් තියෙනවා ස්වාමිණි.

ප්‍ර : මේ වව්නතිව් පොලිස් ස්ථානය ඔබ දන්නවා පොලිස් ස්ථාන වර්ගීකරණය කරනවා A,B,C වශයෙන්?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : මේ වව්නතිව් පොලිස් ස්ථානය කුමන ශ්‍රේණියකට අයත් පොලිස් ස්ථානයක්ද?

පි : C Grade වගේ තමයි මට මතක. එහෙමයි ස්වාමිණි.

ප්‍ර : සාමාන්‍යයෙන් නිලධාරීන් කීයක් විතර වව්නතිව් පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරී කටයුතු කරනවද?

පි : IP එකක්, SI දෙකක්, PS තුනක්, PC 34 ක්, WPC තුනක්, PCD දෙකක් එවකට හිටියා ස්වාමිණි.

ප්‍ර : සම්පූර්ණ මුළු ගණන?

පි : 40 ක් පමණ.

Present Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් ඔබේ පොලිස් ස්ථානයට පොලිස් බල ප්‍රදේශය තුළ පොලිස් ස්ථානය මගින් පාලනය වන මාර්ග බාධක හා පොලිස් මුරපොළවල් තියෙනවද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : මොනවද ඒවා?

පි : එක මාර්ග බාධකයක් තියෙනවා ස්වාමිණි මඩකලපුව කොට්ඨාශයයි පොලිස් බලප්‍රදේශයයි, වච්නතිව් පොලිස් බලප්‍රදේශයයි වෙන් වන ස්ථානයේ පාලම අසල මාර්ග බාධකයක් පිහිටා තියෙනවා ස්වාමිණි අවුරුදු කිහිපයක සිට.

ප්‍ර : මඩකලපුව සහ වච්නතිව් පොලිස් බලප්‍රදේශය දෙක වෙන්වන ස්ථානයේ?

පි : වෙන්වන ස්ථානයේ ස්වාමිණි.

ප්‍ර : මාර්ග බාධකය ස්ථිර වශයෙන් ම තියෙන මාර්ග බාධකයක්ද නැත්නම් වරින්වරට පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිතුමාගේ අභිමතය පරිදි පනවන මාර්ග බාධකයක්ද?

පි : නැහැ ස්වාමිණි මම ගියදා පටන් ම මේ මාර්ග බාධකය පැවතියා ස්වාමිණි.

ප්‍ර : මේ මාර්ග බාධකයේ රාජකාරී දානකොට පැය 24 පුරාත් සතිය පුරා දානවද රාජකාරී නැත්නම් ආරක්ෂක අවශ්‍යතාවයක් වුනොත් පමණයිද මේ වච්නතිව් පොලිස් මාර්ග බාධකයේ රාජකාරී දාන්නේ?

පි : දිනෙන් දින මාරු කරලා සතිය පුරා නෙමෙයි ස්වාමිණි හැම දිනකම දිනෙන් දින මාරු කර කර පැය 24 ආවරණය වන පරිදි නිලධාරීන් යොදවනවා.

ප්‍ර : ඒ කියන්නේ කොයි වෙලාවේ බැලුවත් රාජකාරියේ යෙදී ඉන්න නිලධාරීන් ඉන්නවා?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : සාමාන්‍යයෙන් මේ මාර්ග බාධකය තියෙන තැන ජනාකීර්ණ පෙදෙසක්ද, ජන ශූන්‍ය පෙදෙසක්ද මොන වගේ ස්ථානයක්ද?

පි : ජන ශූන්‍ය පෙදෙසක් ස්වාමිණි.

ප්‍ර : ඒ කියන්නේ ඒ අසල ගෙවල් එහෙම..

පි : පිහිටා නැහැ ස්වාමිණි.

ප්‍ර : දැන් මේ වච්නතිව් පොලිස් මාර්ග බාධකය දාලා තියෙන්නේ මොන පරමාර්ථ සඳහාද?

පි : ස්වාමිණි මේ ප්‍රදේශයේ හොර ජාවාරම් හා වැලි ජාවාරම් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම් හා ප්‍රදේශයට ඇතුළු වන සැක කටයුතු පුද්ගලයින් පරීක්ෂා කිරීම සඳහා.

ප්‍ර : මේ මාර්ග බාධකයට රාජකාරී වශයෙන් සාමාන්‍යයෙන් නිලධාරීන් කීයක් විතර යොදනවද?

FAIR COMMENT BY JEZEEM

පි : මා දැනුවත් පරිදි ස්වාමිණි, මා ගිය දවසේ පටන් දෙදෙනෙක් තමයි ස්වාමිණි නිලධාරීන් යොදවන්නේ.

ප්‍ර : දවස පුරා එකම නිලධාරී දෙදෙනාද දාන්නේ නැත්නම් කොහොමද රාජකාරී යොදවන්නේ?

පි : උදේ 6 ට යන නිලධාරීන් දෙදෙනා 7.18 ට විවේකය ගන්නවා. පැය 18 ට යන කට්ටිය පසුදින 6 ට විවේකය ගන්නවා ස්වාමිණි.

ප්‍ර : නැවත පිළිතුර කියන්න උදේ?

පි : උදේ 6 ට යන නිලධාරීන් දෙදෙනා පැය 18 ට විවේකය වාර්තා කරනවා එතනින් නිලධාරීන් දෙදෙනෙක් ගියාට පසුව. ඒ දෙදෙනා නැවතත් රාත්‍රී රාජකාරියෙන් පසු උදේ විවේකය වාර්තා කරනවා.

ප්‍ර : දැන් මේ මාර්ග බාධකයට නිලධාරීන් යොදන කොට සාමාන්‍යයෙන් යොදන්නේ මේ අවි සහිතවද නැත්නම් අවි නැතුව සාමාන්‍යයෙන්.?

පි : පැති අවි සහිතව ස්වාමිණි.

ප්‍ර : කොයි කාලේ ඉදන්ද මේ අවි සහිතව මාර්ග බාධකයට ඔබලා නිලධාරීන් යොදන්න ගත්තේ?

පි : ස්වාමිණි මා ගිහිල්ලත් අවුරුදු 2 ක් යනතුරුත් තිබුණා ස්වාමිණි. මා සොයා බැලීමේදී 2007.06.29 වෙනිදා තමයි පොලිසිය ආරම්භ කර තිබෙන්නේ. විමසීමක් කිරීමේදී එදින පටන් මේ දක්වාත් මේ නිලධාරීන් යොදවලා තිබිලා තියෙනවා ස්වාමිණි.

ප්‍ර : 2007 වර්ෂයේ?

පි : 2007 මේ මාර්ග බාධකය පටන් ගත්ත දිනයේ ඉදන් කියලා තමයි මට නිලධාරීන් කිව්වේ ස්වාමිණි විමසීමේදි.

ප්‍ර : මෙම මාර්ග බාධකය තියෙන තැන යම්කිසි කුටියක් වගේ දෙයක් නිර්මාණය කරලා තිබෙනවද?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : මොකටද කුටියක් නිර්මාණය කර තියෙන්නේ?

පි : නිලධාරීන්ට ස්වාමිණි වැහි වෙලාවට ඉන්න, අව්වට ඉන්න ස්වාමිණි ඒ කුටි නිර්මාණය කර තියෙන්නේ.

ප්‍ර : සාමාන්‍ය විශාල ප්‍රමාණයේ කුටියක්ද කොච්චර විතර ප්‍රමාණයේ කුටියක්ද?

පි : ස්වාමිණි කාමර 2 කින් විතර යුක්තව තමයි තියෙන්නේ. සාමාන්‍යයෙන් විශාල ප්‍රමාණයේ කුටි 2 ක් ස්වාමිණි.

ප්‍ර : කොච්චර විතර ප්‍රමාණයේ ඔබට සටහන්වල තියෙනවද යමක්?
(සාක්ෂිකරු ලේඛනයක් පරික්ෂා කරයි)
කමක් නැහැ, දැන් මෙලෙස වව්නතිව් මාර්ග බාධකය නිර්මාණය කරලා තියෙන කොට මේ වව්නතිව් මාර්ග බාධකයට නිලධාරීන් යෙදීම කරන්නේ ස්ථානාධිපතිතුමා විසින් දිනපතා යෙදීමක් කරනවද, නැත්නම් ස්ථිරවම යම්කිසි නිලධාරීන් නම් කරලා

FAIR COMMENT BY JEZEEM

ඕගොල්ලෝ මේ වවිනතිව් මාර්ග බාධකයේ රාජකාරී කරන්න කියලා ඔවුන්ට වෙනම පැවරීමක් කරලා තියෙනවද?

පි : දිනපතා නියෝග යොදනවා ස්වාමිණි.

ප්‍ර : ඒ කියන්නේ දිනෙන් දින මේ යොදන නිලධාරීන් වෙනස් වෙනවාද?

පි : වෙනස් වෙනවා ස්වාමිණි.

ප්‍ර : ඒ නියෝග යොදන්නේ කවුද සාමාන්‍යයෙන්?

පි : ස්ථානාධිපතිතුමා විසින්.

ප්‍ර : දැන් මේ මාර්ග බාධකට නියෝග යොදන්න මොනවා හරි පොතක් තියෙනවද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : මොකක්ද ඒ පොත?

පි : සාමාන්‍යයෙන් ස්ථානයේ පාවිච්චි කරන ලද CR පොතක් හෝ නැත්නම් වෙනම ලේඛනයක් අරගෙන නියෝග පොතක් ලෙස සකස් කරපු පොතක නියෝග යොදනවා ස්වාමිණි.

ප්‍ර : දැන් මේ මාර්ග බාධකයට ඔබලගේ වවිනතිව් පොලිස් ස්ථානයේ ඉදලා කොච්චර විතර දුරද?

පි : මීටර් 800 ක් පමණ ස්වාමිණි.

ප්‍ර : මේ වවිනතිව් මාර්ග බාධකය අසල යුධ හමුදා, නාවික හමුදා හෝ ගුවන් හමුදා කඳවුරු එහෙම තියෙනවද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : මොකක්ද තියෙන කඳවුර?

පි : ගුවන් හමුදා කඳවුරක් තියෙනවා ස්වාමිණි.

ප්‍ර : ඒ කියන්නේ පුද්ගලයින් ඒ ඇතුලේ ඉන්නවද?

පි : එතන ඉදලා ස්වාමිණි කිලෝ මීටර්, පාලමක් තියෙනවා පාලමෙන් එගොඩ තමයි තියෙන්නේ ස්වාමිණි. කිලෝ මීටර් 2 ක් 2 ½ ක් වගේ ඈතින් තමයි පිහිටලා තියෙන්නේ.

ප්‍ර : ඈතින් තමයි තියෙන්නේ කඳවුර ඒ අසල නැහැ?

පි : නැහැ ස්වාමිණි.

ප්‍ර : ඒ කියන්නේ මේ මාර්ග බාධකයට පොලිසිය ලඟයි ගුවන් හමුදා කඳවුරට වඩා?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : දැන් මහත්මයාගේ අවධානය යොමු කරනවා මම 2018 නොවැම්බර් 29 වන දින සම්බන්ධව. 2018 නොවැම්බර් 29 වෙනිදා ඔබ රාජකාරියට වාර්තා කළාද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : කීයටද වාර්තා කළේ?

පි : මම පාන්දර වාර්තා කළා ස්වාමිණි.

ප්‍ර : එදින ඔබට යම්කිසි විශේෂ රාජකාරියක් පැවරී තිබ්බද?

FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : මොකක්ද ඒ රාජකාරිය?

පි : එදින නියෝජ්‍ය පොලිස්පතිතුමාගෙන් ස්වාමිණි පැය මට මතක හැටියට 21 පමණ සිට 1 දක්වා අපරාධ හා වරෙන්තුකරුවන් අත්අඩංගුවට ගැනීමේ මෙහෙයුමක් තිබුණා ස්වාමිණි.

ප්‍ර : ඒ ඔබ කියන්නේ හවසනේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : දැන් සාමාන්‍යයෙන් මේ දවස ස්ථානාධිපති හිටියද මේ 2018 නොවැම්බර් 29 වෙනි දින?

පි : නැහැ ස්වාමිනි.

ප්‍ර : එතකොට ස්ථානාධිපති විදියට වැඩ බැලුවේ කවුද?

පි : මම ස්වාමිණි.

ප්‍ර : ඔබ වැඩ බැලුවා?

පි : එහෙමයි.

ප්‍ර : ස්ථානාධිපතිතුමාගේ නම කියන්න?

පි : පො.ප. නිශාන්ත.

ප්‍ර : නිශාන්ත අප්පුහාමි මහත්මයා?

පි : ඔව්.

ප්‍ර : ඔහු එදා කොහේද හිටියේ?

පි : එදින ස්ථානාධිපතිතුමා ගල්නෑව පොලිස් ස්ථානයේ පෙර වැඩ කළ පොලිස් ස්ථානයේ භාර දීම සඳහා ගොස් සිටියා ස්වාමිණි.

ප්‍ර : දැන් ඔය 2018 නොවැම්බර් 29 වෙනිදා වැඩ බලන ස්ථානාධිපති විදියට ඔබට එදා උදෑසන ගියායින් පස්සේ මොන වගේ රාජකාරීවලද ඔබට නිරත වෙන්න සිද්ධ වුණේ?

පි : මා උදේ පාන්දර ස්වාමිණි ස්ථානයේ පොත් පත් කියෙව්වා. ඊට පස්සේ පාලන අංශයේ නිලධාරීන් කැඳවලා ඒ පාලන කටයුතු සම්බන්ධයෙන් සොයා බැලුවා ස්වාමිණි. ඊට පස්සේ දිවා කාලයේ වරෙන්තුකරුවෙක් අත්අඩංගුවට ගත්තා.

ප්‍ර : ඒ රාජකාරීවල තමයි ඔබ නිරත වුණේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : දැන් ඔය දිවා කාලෙදීත් ඔය වව්නතිව් මාර්ග බාධකයට ඔබ විසින් නිලධාරීන් යොමු කිරීමක් සිද්ධ කළාද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : නියෝග දාලා යැව්වේ ඔබමද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඉන් අනතුරුව 29 වෙනි දිනම ඔබ වව්නතිව් මාර්ග බාධකයට නැවතත් තවත් නිලධාරීන් දෙදෙනෙක් රාජකාරියට යෙදෙව්වද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : කාවද යෙදෙව්වේ?

President's Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පි : ඒ යෙදෙව්වේ ස්වාමිණි 73680 දර්ශන, 51602 ශාන්ත කුමාර.

ප්‍ර : දැන් 2018.11.29 උදේ දාපු දෙන්නා නෙමෙයි මම අහන්නේ ඔබ රාත්‍රී රාජකාරී කරන්න වවිනතිව් මාර්ග බාධකයට නිලධාරීන් කී දෙනෙක් දැම්මද?

පි : දෙදෙනයි ස්වාමිණි.ඒ හිටපු දෙන්නට අමතරව තවත් දෙන්නෙක් යොමු කළා ස්වාමිණි.

ප්‍ර : හිටියේ කවුද මුලින්?

පි : 82162

ප්‍ර : නිළය කියන්න මහත්මයා පොලිස් කොස්තාපල්ද?

පි : පොලිස් කොස්තාපල් ප්‍රසන්න, පොලිස් කොස්තාපල් 8624 දිනේෂ්.

ප්‍ර : ඔවුන් දෙදෙනාව මොකටද දාලා තිබ්බේ?

පි : මාර්ග බාධක රාජකාරී පැය 18 සිට පසුදින 6 දක්වා.

ප්‍ර : මොවුන් දෙදෙනාට ඔබ නියෝගයක් වශයෙන් දැම්මාද නැත්නම් තොරතුරු පොතේ යම්කිසි සටහන් විදියටද දැම්මේ?

පි : නියෝගයක් වශයෙන් ස්වාමිණි යොදලා තියෙනවා සටහනක්. එයට අමතරව ඔවුන් රාජකාරී සඳහා වාර්තා කළා. එයට අමතරව ඔවුන්ගේ පිටවීම් සටහන දෛනික තොරතුරු සටහන් පොතේ සටහන් කරලා තියෙනවා ස්වාමිණි.

ප්‍ර : දැන් ඔබ 2018.11.29 වෙනිදා පොලිස් කොස්තාපල් ප්‍රසන්න සහ පොලිස් කොස්තාපල් දිනේෂ් යන අයට වවිනතිව් මාර්ග බාධකයට යන්න කියලා දාපු නියෝගයේ පිටපතක් ඔබට මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : පිටපතක් තියෙනවා ස්වාමිණි. එහෙමයි ස්වාමිණි ඉදිරිපත් කරන්න පුළුවන්. එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඔබ දැන් ඔය ඉදිරිපත් කරන සටහන මොකක්ද?

පි : නිලධාරීන්ට නියෝග දීම සම්බන්ධයෙන්.

ප්‍ර : ඒ නියෝගයේ ඔබ අත්සනක් යොදලා තියෙනවද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : නියෝගයේ දිනය කවද්ද?

පි : මේකේ පැහැදිලි නැහැ ස්වාමිණි 28 වෙන්න පුළුවන් ස්වාමිණි. නියෝගය පෙර දින යොදනවා ස්වාමිණි.

ප්‍ර : නියෝගය යොදලා තියෙන දිනය කවද්ද? පැහැදිලි නැද්ද?

පි : පැහැදිලි නැහැ ස්වාමිණි.

ප්‍ර : දැන් ඔබ ඔය ඉදිරිපත් කරන්නේ ඡායා පිටපතක්නේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : මුල් ලේඛනයට මොකද වුණේ?

FAIR COMMENT BY JEZEEM

පි : මුල් ලේඛනය නැහැ ස්වාමිණි. මුල් ලේඛනය දැනට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් භාරයට අරන් තියෙනවා ස්වාමිණි.

ප්‍ර : ඒ කියන්නේ ඔබලාගේ වව්නතිව් පොලිස් ස්ථානයෙන් ඔවුන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව එම ලේඛන රැගෙන ගියාද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඒ අනුව ඔබ මේ නිලධාරීන්ට දාපු නියෝගය තමයි ඔබ ඔය අද මේ කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්නේ?

පි : එහෙමයි ස්වාමිණි.

<u>ස්වාමිණි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන මාර්ග බාධක රාජකාරී නියෝග අංක 65318, C704 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.</u>

ප්‍ර : C 704 ඔබගේ අත්සන තියෙනවද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : දැන් මේ මාර්ග බාධක නියෝගයට අනුව පොලිස් කොස්තාපල් 82162 ප්‍රසන්න සහ පොලිස් කොස්තාපල් 8624 දිනේෂ් පොලිස් ස්ථානයෙන් පිටව ගියාද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඔවුන් ඊට අදාල පිටවීමේ සටහනක් දාලා තියෙනවද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඒ පිටවීමේ සටහන ඔබට අද ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : එහෙමයි ස්වාමිණි. හරි ස්වාමිණි නිවැරදියි ස්වාමිණි. පිටුව 277, ඡේදය 386 ස්වාමිණි.

ප්‍ර : ඔබ මේ ඉදිරිපත් කරන්නේ වව්නතිව් පොලිස් ස්ථානයේ සංචාරක තොරතුරු සටහන් පොතෙන් උපුටා ගන්නා ලද පිටපතක් කිව්වොත් හරිද?

පි : එහෙමයි ස්වාමිණි.

<u>ස්වාමිණි මේ සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන වව්නතිව් පොලිස් ස්ථානයේ සංචාරක තොරතුරු සටහන් පොතේ 2018.11.29 වන දින පිටු අංක 277 සහ ඡේදය 386 හි අදාල රාත්‍රී මාර්ග බාධක රාජකාරීවලට අදාල පිටවීමේ සටහන C705 වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.</u>

ප්‍ර : දැන් මහත්මයා මේ C705 සටහන පරීක්ෂා කරන්න කෝ?
(සාක්ෂිකරු අදාල සටහන පරීක්ෂා කරයි)
ඒ අනුව මේ ප්‍රසන්න සහ දිනේෂ් යන නිලධාරීන් දෙදෙනා පිටව ගොස් තියෙන්නේ කීයටද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : පැය 17.45 ට ස්වාමිණි.

ප්‍ර : ඔවුන් යම්කිසි ගිණුඅවි අරන් ගිහිං තියෙනවද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මට කියන්න පො.කොං.82162 ප්‍රසන්න අරන් ගියපු අවිය මොකක්ද?

පි : අංක: 641042 හා එම උණ්ඩ 5 ක්.

ප්‍ර : පො.කොං. 8624 දිනේෂ් අරන් ගිය ගිණුඅවිය මොකක්ද?

පි : අංක: 639927 හා එම උණ්ඩ 5 ක් ස්වාමිණි.

ප්‍ර : මේ ගිණුඅවි වලට අමතරව ඔවුන් පිටවෙන කොට තව මොනවද අරන් ගිහිල්ලා තියෙන්නේ?

පි : විදුලි පන්දම් අරන් යනවා ස්වාමිණි.

ප්‍ර : ඊට අමතරව මුදල් යම් ප්‍රමාණයක් අරන් යනවද?

පි : සාක්කු සටහන් පොත්, මුදල් අරන් ගිහිල්ලා තියෙනවා ස්වාමිණි. ප්‍රසන්න යන නිලධාරියා 82162 ප්‍රසන්න රුපියල් 200 ක්ද, පො.කොං. 8624 දිනේෂ් රුපියල් 200 ක්ද රැගෙන ගිහිල්ලා තියෙනවා ස්වාමිණි.

ප්‍ර : දැන් මේ මාර්ග බාධක රාජකාරියේදී ඔවුන්ට කරන්න පැවරිලා තිබ්බේ මෙදින මොකක්ද සටහන් අනුව?

පි : නීති විරෝධී ගව, දැව, වැලි, නීති විරෝධී රජයේ අරක්කු, මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කරන්නන් අත්අඩංගුවට ගනව. මාර්ග බාධකය හරහා ගමන් ගන්නා ලොරි, වෑන් හා රථ නවතා පරීක්ෂාවට ලක් කරන්න. වැලි ප්‍රවාහනය කරන අදාල නි.පොං.ප. තුමාගේ හා ජෙ.පොං.ප තුමාගේ නියෝග පරිදි ක්‍රියා කරන්න. ලේඛන සටහන් ගතකරන්න. රථ වාහන නඩු ලබා ගන්න තියෙන්නේ ස්වාමිණි.

ප්‍ර : එවැනි දේවල් තමයි ඔබ නියෝග වශයෙන් දිලා තියෙන්නේ මේ නිලධාරීන් දෙදෙනට සිද්ධ කරන්න?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඔවුන් ස්ථානයෙන් පිටවෙලා තියෙන්නේ 2018.11.29 හවස 5.45 ට?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : දැන් මහත්මයා මින් අනතුරුව ඒ දවසේම මේ සිද්ධියට පසුව ඔබලාගේ Division එක විසින් යම්කිසි විශේෂ රාජකාරියක් එදින ඔබලාට නියෝග කිරීමක් කළාද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : මොකක්ද ඒ විශේෂ රාජකාරිය?

පි : අපරාධකරුවන් හා වරෙන්තුකරුවන් අත් අඩංගුවට ගැනීම සඳහා මෙහෙයුමක් තිබුණා ස්වාමිණි.

ප්‍ර : ඒ මෙහෙයුම තිබ්බේ කවදා, කීයටද?

Proof Copy
FAIR COMMENT BY JEZEEM

පි : 2018.11.29 වෙනි දින පැය 21 සිට හෝ 22 සිට රාත්‍රී 1 දක්වා ස්වාමිණි.

ප්‍ර : පැය 22 සිට රාත්‍රී 1 දක්වා කියලා කිව්වොත් නිවැරදි ද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : දැන් 22 සිට රාත්‍රී 1 දක්වා වරෙන්තුකරුවන් අත්අඩංගුවට ගැනීමේ මෙහෙයුමට ඔබ නිලධාරීන් යෙදෙව්වද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : කොච්චර නිලධාරීන් යෙදෙව්වද?

පි : නිලධාරීන් 19 ක් පමණ යෙදෙව්වා.

ප්‍ර : ඒ යොදවන කොට මේ අපි කලින් කතා කරපු වචනතිව් මාර්ග බාධකයටත් තවත් නිලධාරීන් යෙදෙව්වද?

පි : එහෙමයි ස්වාමිණි දෙදෙනෙක් යෙදෙව්වා ස්වාමිණි.

ප්‍ර : කවුද ඒ දෙදෙනා?

පි : 73680 එන්. දර්ශන. PC 51602 ඩබ්.ඒ.පී. ශාන්ත කුමාර.

ප්‍ර : දැන් මේ දෙන්නත් එදින ඒ රාජකාරී සඳහා ගියාද?

පි : එක් නිලධාරියෙක් පමණක් සහභාගී වෙලා තියෙනවා ස්වාමිණි.

ප්‍ර : අනික් නිලධාරියාට මොකක්ද වෙලා තියෙන්නේ?

පි : අනික් නිලධාරියා එම රාජකාරියට සහභාගී වෙලා තිබුනේ නැහැ ස්වාමිණි.

ප්‍ර : සහභාගී වෙච්ච නිලධාරියාගේ නම මොකක්ද?

පි : 73680 දර්ශන.

ප්‍ර : දර්ශනද අනිත් එක්කෙනාද, පරික්ෂා කරලා බලන්න නැවත ?

පි : දර්ශන ස්වාමිණි සහභාගී වෙලා හිටියේ නැහැ ස්වාමිණි එදින.

ප්‍ර : දර්ශන සහභාගී වෙලා හිටියේ නැහැ?

පි : නැහැ.

ප්‍ර : රාජකාරිය සඳහා වචනතිව් මාර්ග බාධකයට එදා ගිහිල්ලා ඔය 29 වෙනිදා ඇ 10 ඉදලා ඊලඟ දවසේ උදේ 1 වෙන කල් හිටිය නිලධාරියා කවුද?

පි : 51602 ශාන්ත කුමාර.

ප්‍ර : 602 ද 607 ද හරියට බලා කල්පනා කරලා කියන්න?

පි : 607 වගේ තමා ස්වාමිණි මට මතක.

ප්‍ර : මහත්මයා දැන් ඒ විශේෂ රාජකාරියේදී සිදු කරන අවස්ථාවේදි ඔබ මොකක්ද කළේ?

පි : ස්වාමිණි මමත් වරෙන්තුකරුවන් අත්අඩංගුවට ගන්න ගියා ස්වාමිණි කණ්ඩායමක් සමඟ.

ප්‍ර : ඉන් අනතුරුව අත් අඩංගුවට අරන් ඔබ රාජකාරී නිමා කලේ කීයටද?

පි : 1.20 ට පමණ ස්වාමිණි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : 1.20 ට පමණ ඔබ රාජකාරි නිමා කරලා ඊට පස්සේ කොහාටද ගියේ?

පි : තනිකඩ බට නිවාසයට ගියා ස්වාමිණි.

ප්‍ර : කොහේද?

පි : තනිකඩ බට නිවාසයට

ප්‍ර : ඒක කොහේද තියෙන්නේ?

පි : පොලිස් ස්ථානයේ ඉදලා මීටර් 200 ක් පමණ දුරින් ස්වාමිණි.

ප්‍ර : ඉන්පසුව මොකක්ද සිද්ධ වුණේ?

පි : ඉන්පසුව මා තනිකඩ බට නිවාසයේ ඉදලා මා උපසේවයට දැනුම් දුන්නා මට පාන්දර 4 ට නැවත කතා කරන්න කියලා. ඔහු මට 4 ට කතා කළා. නමුත් මම නැවත තනිකඩ බට නිවාසයේ ඉන්න කොට 5.55 ට 5.50 ට පමණ උපසේවා නිලධාරියා දන්වා සිටියා 62068 මනෝහරන් දැන්වූ බව මාර්ග බාධකයේ නිලධාරීන් දෙදෙනෙකුට වෙඩි තබලා තියෙනවා කියලා.

ප්‍ර : ඔබට දුරකථනයෙන්ද දන්වා සිටියේ නැත්නම් ඔබගේ බට නිවාසයට පැමිණිලාද දන්වා සිටියේ?

පි : නැහැ දුරකථනයෙන් දන්වා සිටියා ස්වාමිණි.

ප්‍ර : කවුද ඔබට ඒ දැන්වීම සිද්ධ කලේ?

පි : උපසේවා රාජකාරීයේ යෙදී සිටින නිලධාරියා

ප්‍ර : පො.කො.81998 ජයවික්‍රම කිව්වොත් හරිද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : දැන් ඔබට දන්වා සිටියේ දිනේෂ් සහ ප්‍රසන්නට කුමක් වෙලා කියලද?

පි : වෙඩි තියලා ඉන්නවා කියලා ස්වාමිණි. ලේ ගලමින් වැටිලා ඉන්නවා කියලා.

ප්‍ර : ලේ ගලමින්?

පි : ලේ ගලමින් වැටිලා ඉන්නවා කියලා.

ප්‍ර : ඒ පණිවිඩය ඇහුවට පස්සේ ඔබ මොකක්ද කලේ?

පි : මම ස්වාමිණි පොලිසියට ආවා.

ප්‍ර : ඉන් අනතුරුව?

පි : ඊට පස්සේ ජංගම සංචාරයේ යෙදී සිටි නිලධාරීන්ට කතා කරලා ඔවුන් සමඟ ස්වාමිණි මේ මාර්ග බාධකයට ගියා ස්වාමිණි.

ප්‍ර : ඔබ එම ස්ථානයට යන්න පොලිසියෙන් පිටත් වෙන කොට කීයට විතර ඇතිද වෙලාව?

පි : මම යන කොට 6.05 ස්වාමිණි.

ප්‍ර : 6.05 ට තමයි ඔබ පොලිස් ස්ථානයෙන් පිටව ගියේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඔබත් එක්ක කණ්ඩායමක් ගියාද?

පි : එහෙමයි ස්වාමිණි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබ එම ස්ථානයට ගිහිල්ලා ඔබ මොකක්ද මුලින්ම සිද්ධ කලේ?

පි : මම ස්ථානයට ගොස් ස්වාමිණි යන කොට එක් නිලධාරියෙක් මාර්ග බාධකය අසල වම් පැත්තේ වැටිලා හිටියා. මම ඔහු ලඟට ගිහිල්ලා මල්ලී කියලා උස්සලා ගත්තා එතකොට අත් දෙකේ ලේ තිබුණා ඇස් දෙක ගැලවිලා තිබුණා ස්වාමිණි.

ප්‍ර : ඒ මේ මාර්ග බාධකය ගාව කියන්නේ මාර්ගය මැද ද, නැත්නම් ඔබ සඳහන් කළානේ මෙතන කුටියක් තියෙනවා කියලා?

පි : වම් පැත්තේ දොර අසල වැටිලා හිටියා මුණින් අතට ස්වාමිනි.

****

<u>ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා:</u>

ප්‍ර : ඒවෙලාවේ ඔබ එතන යනකොට වෙන පුද්ගලයෝ රැස්වෙලා හිටියද වෙන කවුරු හරි?

පි : නැහැ ස්වාමිණි.

ප්‍ර : කිසි කෙනෙකු හිටියේ නැහැ?

පි : නැහැ ස්වාමිණි.

ප්‍ර : එළිය වැටිලද එතකොට?

පි : එළිය වැටීගෙන එනවා ස්වාමිණි.

ප්‍ර : ඔබ තමයි ඉස්සෙල්ලම ගියේ?

පි : එහෙමයි ස්වාමිණි.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා:</u>

ප්‍ර : ඔබත් එක්ක තව පිරිසකුත් ගියාද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඔබලා ගියේ පයින්ද නැත්නම් වාහනයකින්ද?

පි : ජීප් එකේ ගියා ස්වාමිණි.

ප්‍ර : ඊට පස්සේ ඔබ එම ස්ථානයේ යමක් නිරීක්ෂණය කළාද?

පි : නැහැ මම ආයේ නැවත එම මුරකුටිය තුළට ගියා. යන කොට ප්‍රසන්න යන නිලධාරියා වැටිලා හිටියා. ඔහුත් මම උස්සලා බලන කොට එක ඇහැක් ගැලවිලා තිබුණා, ඔළුවේ වෙඩි පහරක් වැදිලා තිබුණා ස්වාමිණි. කැපුම් තුවාල තිබුණා මුළු සිරුර පුරා.

ප්‍ර : මුර කුටියේ ඉදිරිපස එළියේ හිටිය නිලධාරියාගේ නම කියන්න?

පි : 8624 දිනේෂ්.

ප්‍ර : මුර කුටිය තුළ හිටියේ කවුද?

පි : 82162 ප්‍රසන්න.

ප්‍ර : දැන් ඔබ මොවුන් ඔබ නිරීක්ෂණය කලායින් පස්සේ මොවුන් බිම වැටිලා ඉන්නවා, ඔබ ඉන් පස්සේ මොකක්ද සිද්ධ කලේ?

Parliament Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : මම මේ සම්බන්ධයෙන් සහකාර පොලිස් අධිකාරී 1 තුමාටද, කොට්ඨාශ භාර පොලිස් අධිකාරීතුමාට, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමාට දුරකථනයෙන් දන්වා සිටියා ස්වාමිණි.

ප්‍ර : ඔබ තේරුම් ගත්තද මොවුන් මියගිහිල්ලා කියලා ඒ මොහොතේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඔබ පරීක්ෂා කරලා බැලුවද දැන් ඔබ කිව්වානේ සාමාන්‍යයෙන් රාජකාරී යන කොට ගිණුඅවි අරන් යනවා, සහ එදින රාත්‍රියේ මොවුන් යන කොට තමන්ගේ ගිණිඅවි සහ පැති අවි සහ උණ්ඩ අරන් ගියා, එතකොට මේ මුරකුටිය අසල පරීක්ෂා කරලා බැලුවද මේ අරන් ගියපු පැති අවි තියෙනවද කියලා?

පි : තිබුණේ නැහැ ස්වාමිණි.

ප්‍ර : ඔබ ඉන්පස්සේ විමර්ශනය කරලා බැලුවද දැන් එදා රාත්‍රී රාජකාරී විශේෂ වරෙන්තු රාජකාරිවලට ඔබ කිව්වානේ ගියා කිව්වානේ පොලිස් කොස්තාපල් 51607 ශාන්ත නිලධාරියා?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඔහුගෙන් අහලා බැලුවද මේ සම්බන්ධයෙන් මොනවත් තොරතුරු ලබා ගැනීමට?

පි : අහලා බැලුවා ස්වාමිණි.

ප්‍ර : මොකක්ද ඔහු කිව්වේ?

පි : ඔහු යන කොට ඔහු විවේකය වාර්තා කලා කිව්වා 1 ට පිටත් වුණා කිව්වා ස්වාමිණි. ඒ අවස්ථාවේදී මොවුන් දෙදෙනා හිටියා කියලා කිව්වා මේ දෙදෙනත් එක්ක කතා කරලා ගියා කිව්වා පොලිස් ස්ථානයට.

ප්‍ර : ඒ කියන්නේ 2018.11.30 වන දින අලුයම 1 වන තුරුත්...?

පි : මේ නිලධාරීන් ඉදලා තිබෙනවා ස්වාමිණි.

ප්‍ර : මේ නිලධාරීන් ඉදලා තිබෙනවා කිසි ප්‍රශ්නයක් වෙලා නැහැ?

පි : එහෙමයි ස්වාමිණි.

****

<u>**ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා:**</u>

ප්‍ර : මේ මුර කුටියට විදුලි ආලෝකය එහෙම තිබුණද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : එතන අර ආරක්ෂිත ලාම්පුත් හයි කරලා තිබුණද, ෆ්ලැෂ් ලයිට්?

පි : නැහැ ස්වාමිණි සාමාන්‍ය බල්බ් හයි කරලා තිබුණා ස්වාමිණි.

ප්‍ර : බල්බ් කීයක් දාලා තිබුණද?

පි : බල්බ් 4 ක් වගේ දාලා තිබුණා ස්වාමිණි කුටිය අසලම එකක් දාලා තිබුණා.

****

FAIR COMMENT BY JEZEEM

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා:</u>

ප්‍ර : මේ ප්‍රදේශයේ මාර්ගයේ එහෙම විදුලි ආලෝකය එහෙම තිබෙනවාද?

පි : නගර ප්‍රදේශයට වෙන්නට තියෙනවා ස්වාමිණි .

ප්‍ර : මේ මාර්ග බාධකය අසල?

පි : විශාල වශයෙන් නැහැ ස්වාමිණි.

ප්‍ර : දැන් මීට අමතරව එදින රාත්‍රියේ සහ අලුයම විශේෂ වරෙන්තු මෙහෙයුමක් සිදු කරන අවස්ථාවක් නිසා ඔබලගේ සහකාර පොලිස් අධිකාරී චන්ද්‍රපාල මහතා මේ මුර කුටිය බලන්න ගිහිං තිබ්බද?

පි : පරීක්ෂාවට ලක් කළා කිව්වා ස්වාමිණි.

ප්‍ර : ඔහු පරීක්ෂාවට ලක් කරන්න ගිහිල්ලා තියෙන්නේ කීයට විතරද?

පි : රාත්‍රී 11 ට විතර ස්වාමිණි මට මතක හැටියට.

ප්‍ර : එතකොට මේ තත්ත්වය.?

පි : නැහැ ස්වාමිණි සිදුවීමක් තිබුණේ නැහැ ස්වාමිණි.

ප්‍ර : දැන් මොවුන් දෙදෙනා මියගොස් ඇති බව දැන ගත්තට පස්සේ ඔබ විසින් ඒ අවස්ථාව වෙන කොට වැඩ බලන වවිනතිව් පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විදියට ඔබ විසින් කරපු රාජකාරී මොනවද?

පි : මා ස්වාමිණි ඉන් පසුව මේ සම්බන්ධයෙන් පොලිස් ස්ථානයට දුරකථන ඇමතුමක් ගෙන මේ සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්තුමාට කරුණු වාර්තා කරන ලෙසටත්, වෛද්‍යවරයාට නියෝගයක් ලබා ගන්නා ලෙසටත්, එතකොට ඇසරේ නිලධාරීන් ගෙන්වන ලෙසටත්, නිළ සුනඛ අංශය ගෙන්වන ලෙසත්, එතකොට ස්ථාන අපරාධ පරීක්ෂණ නිලධාරීන්ට දැනුම් දෙන ලෙසත් උපදෙස් දුන්නා ස්වාමිණි. ඊට අමතරව ස්ථානයේ ආරක්ෂාව යෙදෙව්වා ස්වාමිණි.

ප්‍ර : ස්ථානයේ ආරක්ෂාවට නිලධාරීන් යෙදෙව්වා?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : කාවද යෙදෙව්වේ?

පි : මා සමඟ ගිය නිලධාරීන් ආරක්ෂාවට යෙදෙව්වා එම අවස්ථාවේදිම.

ප්‍ර : ඔබට කියන්න පුළුවන්ද ඔවුන්ගේ විස්තර?

පි : එහෙමයි ස්වාමිනි. 25553 බණ්ඩාර.

ප්‍ර : පොලිස් සාජන්?

පි : එහෙමයි ස්වාමිණි. පො.කො. 41630 අනුර.

ප්‍ර : ඊට පස්සේ ඔබ තමාගේ ඉහල නිලධාරීන්ට මේ සම්බන්ධයෙන් දැනුම් දීමක් කළාද?

පි : ඒ ගිය අවස්ථාවේදීම දැනුම්දීමක් කළා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : කවුද ඒ ඉහළ නිලධාරීන් ඒ දැනුම්දීපු?

පි : කේ.ඩී. චන්ද්‍රපාල මහත්මා සහකාර පොලිස් අධිකාරී 1. කොට්ඨාශ භාර පොලිස් අධිකාරීතුමා මෙන්ඩිස් මහතා, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කපිල ජයසේකර මහතාට දැනුම් දුන්නා.

ප්‍ර : ඔවුන්ට ඔබ දැනුම් දුන්නා මේ වෙලා තියෙන බරපතල සිද්ධිය ගැන?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඉන්පසුව ඔවුන් එම ස්ථානයට ආවද?

පි : පැමිණියා ස්වාමිණි.

ප්‍ර : ඊට අමතරව මේ ස්ථානයේ නිරීක්ෂනයට ඊට වඩා ඉහළ නිලධාරියෙකුත් ආවද?

පි : පොලිස් 12 ක නිලධාරීන් පැමිණියා. තවත් සහකාර පොලිස් අධිකාරීන් දෙදෙනෙක් පැමිණියා. ඊට අමතරව මේ සිද්ධියෙන් අනතුරුව පොලිස්පතිතුමා පැමිණියා ස්වාමිණි.

ප්‍ර : පොලිස්පතිතුමා පැමිණියේ කවද්ද?

පි : එදිනම පැමිණියා ස්වාමිණි සවස් කාලයේ.

ප්‍ර : ඒ කියන්නේ 2018.11.30 වෙනිදා කිව්වොත් නිවැරදි ද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : පොලිස්පතිතුමා කියන්නේ ඔහුගේ නම මොකක්ද පොලිස්පතිතුමාගේ ඒ වන කොට?

පි : පූජිත් ජයසුන්දර මහතා ස්වාමිණි.

ප්‍ර : ඔහු මේ මාර්ගය ඔස්සේ ද ආවේ එහෙම නැත්නම් වොපර් එකෙන්ද?

පි : වොපර් එකෙන් ආවේ ස්වාමිණි.

ප්‍ර : ඇවිල්ලා ඔබලට දීපු උපදෙස් මොනවද?

පි : ඒ ස්ථානයට ඇවිල්ලා පරීක්ෂා කළා.

ප්‍ර : මුලින්ම ආවේ අපරාධ ස්ථානයටද?

පි : නැහැ ගුවන් හමුදා කඳවුරට ඇවිල්ලා ස්වාමිණි සිද්ධිය වෙච්ච ස්ථානයට ආවා. ඒ එන කොට ස්ථානාධිපතිතුමා ඇවිල්ලා හිටියා. ස්ථානාධිපතිතුමත් එක්ක කථා කළා. පසුව කිව්වා මඩකලපුව ශ්‍රවණාගාරයේදී නැත්නම් සේවාස්ථ පුහුණු ශ්‍රවණාගාරයේදි නැගෙනහිර පළාත භාර සියළුම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා මටත් එම ස්ථානයට සාකච්ඡාවට සහභාගි වෙන්න කියලා කිව්වා.

ප්‍ර : දැන් මේ වන කොට මේ සාකච්ඡාවට සහභාගී වෙන්න යන කොට ඔබලා මහේස්ත්‍රාත් අධිකරණයට මේ සම්බන්ධයෙන් කරුණු වාර්තා කරලද නැත්නම් තවමත් වාර්තා කරලා නැද්ද,

පි : නැහැ සියළුම දේවල් කරලා තිබුණේ ස්වාමිණි.

ප්‍ර : වාර්තා කරලයි තිබුණේ?

Present Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමිණි මෘත ශරීර දෙකත් රෝහල්ගත කර තිබුණේ ස්වාමිණි.

ප්‍ර : ඔබට කියන්න පුළුවන්ද මේ සම්බන්ධයෙන් දැමූ මුල් B වාර්තාව දැම්මේ ඔබද?

පි : ඔව් මගේ අත්සනින් යුතුව දැම්මේ ස්වාමිණි.

ප්‍ර : ඊට අදාල මහේස්ත්‍රාත් අධිකරණය සහ මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංකය ඔබට කියන්න පුළුවන්ද?

(සාක්ෂිකරු ලේඛන කෙරෙහි අවධානය යොමු කරයි)

පි : ස්වාමිණි ඒකේ අංකය නම් සඳහන් වෙලා නැහැ. බල අපරාධ අංකය තියෙනවා ස්වාමිණි 10/2018 කියලා තිබෙනවා ස්වාමිණි.

ප්‍ර : ඔබ සඳහන් කලා අධිකරණයට කරුණු වාර්තා කරලා ඒ අදාල සියළුම මූලික කටයුතු ටික අවසන් වුණාට පස්සේ පොලිස්පති පූජිත් ජයසුන්දරත් සමඟ මඩකලපුවේදී යම්කිසි සාකච්ඡාවක් පැවැත්තුනාද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඒ සාකච්ඡාවේදී ඔබලාට මොනවාද ලැබුණු උපදෙස්?

පි : ඇහුවා කවුද හිටියේ කියලා මේ සිද්ධිය වෙන වෙලාවේ.

ප්‍ර : කවුද ඇහුවේ?

පි : පොලිස්පතිතුමා. ඊට පස්සේ උසස් නිලධාරීන් පෙන්නුවා වවුනතිව් OIC ඉන්නවා කියලා, ඊට පස්සේ OIC මහත්තයා කිව්වා මම නෙමෙයි වැඩ බලන OIC හිටියේ කියලා. ඊට පස්සේ මගෙන් ඇහුවා මොකද වුණේ කියලා. මම සිද්ධිය කිව්වා ස්වාමිණි පොලිස්පතිතුමාට. ඊට පස්සේ කිව්වා මේක අහඹු සිදුවීමක්, මින් ඉදිරියට වුනොත් එහෙම මෙවැනි දේවල් මම ස්ථානාධිපතිගේ වැඩ තහනම් කරනවා, ඒ නිසා තමුන්ට මම මේ සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කරන්නේ නැහැ කිව්වා, මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට මේ සියළුම රාජකාරී භාර දෙනවා කියලා කිව්වා. ඒ නිසා මේක මින් ඉදිරියට සියළුම රාජකාරී කරන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කියලා උපදෙසක් ලබා දුන්නා ස්වාමිණි.

ප්‍ර : ඒ කියන්නේ 2018 නොවැම්බර් 30 වෙනිදා මුල් B වාර්තාව දැම්මට පස්සේ ඔබගේ අත්සනින් යුතුව මෙහි කිසිදු විමර්ශන කටයුත්තක් ඔබලාගේ වවුනතිව් පොලිස් ස්ථානයෙන් සිදු වුනේ නැහැ කියලද?

පි : නැහැ ස්වාමිණි සිදු වුණේ නැහැ ස්වාමිණි.

ප්‍ර : මෙම වවුනතිව් පොලිස් ප්‍රදේශයේ ඔබගේ දැනුම හැටියට ඔබ රාජකාරී කරපු කාලය තුළදී යම්කිසි මුස්ලිම් අන්තවාදීන් විසින් අන්තවාදී කටයුත්තක් සිද්ධ කරපු වාර්තා එහෙම තිබුණද?

FAIR COMMENT BY JEZEEM

පි : නැහැ ස්වාමිණි දැන ගන්න තිබුණේ නැහැ එහෙම දෙයක්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : සාක්ෂිකරු දැන් වවිනතිව් පොලිස් බල ප්‍රදේශය තුළ පොදු ප්‍රවාහන සේවා තියෙනවද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඒ පොදු ප්‍රවාහන සේවා කියන්නේ මේ වවිනතිව් නගරයේ බස් පොලක් තියෙනවද බස් නවත්වන තැනක් තියෙනවද?

පි : එහෙමයි ස්වාමිණි බස් නතර කරන විශේෂ තැනක් නැහැ ස්වාමිණි.

ප්‍ර : ඇවිල්ලා පහුකරගෙන යනවා විතරයි?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : බස් එතනින් ආරම්භ කරන්නෙත් නැහැ, අවසන් කරන්නෙත් නැහැ?

පි : නැහැ ස්වාමිනි.

ප්‍ර : එතකොට වවිනතිව්වලට එනවා නම් බස් රියකින් කොහේ ඉදලද එන්න පුළුවන්?

පි : මඩකලපුවේ ඉදලා එන්න පුළුවන් ස්වාමිණි.

ප්‍ර : ඒකද ආසන්නම ස්ථානය?

පි : ඔව් මඩකලපුවෙන් තමයි ස්වාමිණි ගමනාන්තය පටන් ගන්නේ.

ප්‍ර : එතකොට වවිනතිව් හරහා යන බස් එකක් මඩකලපුවේ ඉදලා කොහේ යන බස් එකක්ද?

පි : ගම්මාන 4, 5 ටම යනවා ස්වාමිණි.

ප්‍ර : මොකක්ද ඒ ගම්මාන?

පි : උන්නච්චි යනවා, කරයාකන්තිව්, කාන්චිකුඩා ප්‍රදේශවලට එහෙම යනවා ස්වාමිණි.

ප්‍ර : එතකොට වවිනතිව් හරහා මඩකලපුවට යන්නෙත් ඒ බස්මද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : එතකොට ස්ථාන 4 කින් තමා වවිනතිව් හරහා මඩකලපුවට යන බස් යැවෙන්නේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : හරිද ඒක?

පි : ඔව්, ස්ථාන 3 කින් පමණ යනවා ස්වාමිණි, කෙටි පාරවල්වලින් අතුරු ගම්මානවලට ගිහිල්ලා මඩකලපුවට යනවා ස්වාමිණි.

ප්‍ර : දැන් සාමාන්‍ය දිනයක එවැනි අවසාන ප්‍රවාහන සේවාව කීයටද තියෙන්නේ වවිනතිව් හරහා?

පි : ස්වාමිණි 5 ½ ට 6 විතර ප්‍රවාහනය අවසන් වෙනවා ස්වාමිණි පොදු ප්‍රවාහනය.

Parliament Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : 5 ½ ට 6 විතර?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : ඊට පස්සේ පොදු ප්‍රවාහන සේවා නැහැ?

පි : රාත්‍රී කාලයේ නැහැ ස්වාමිණි.

ප්‍ර : දැන් ඔය මුර පොළට පොලිස් ස්ථානයේ ඉදලා කොච්චර දුරද?

පි : මීටර් 800 ක් විතර තියෙනවා ස්වාමිණි.

ප්‍ර : කියන්නේ පොලිස් ස්ථානය ආසන්නයේමයි, පේන දුරකින්?

පි : නැහැ ස්වාමිණි පේන්නේ නැහැ වංගු 6, 7 ක් විතර තියෙනවා ස්වාමිණි.

ප්‍ර : එතකොට මඩකලපුවේ ඉදලා වව්නතිව් හරහා යන වෙන වාහනයක් කියන්නේ මෝටර් බයිසිකලයක් නැත්නම් යතුරු පැදියක් නම් හම්බ වෙන එකම මාර්ග බාධකය ඔතනද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඊට පස්සේ කිසි මාර්ග බාධකයක් නැහැ?

පි : නැහැ ස්වාමිණි.

ප්‍ර : මඩකලපුව වෙනකල් කිසිම මාර්ග බාධකයක් නැහැ?

පි : නැහැ ස්වාමිණි.

ප්‍ර : වව්නතිව් ඉදලා මඩකලපුවට කොච්චර දුරද?

පි : කිලෝ මීටර් 14 ක් 15 ක් වගේ තියෙනවා ස්වාමිණි.

ප්‍ර : ඔය සිද්ධිය වෙන දවසේ රාත්‍රියේ යම් වාහනයක් සම්බන්ධයෙන් එහෙම පාරේ ගිය කිසිම තොරතුරක් තිබ්බද?

පි : සටහන් වෙලා තිබුණා ස්වාමිණි.

ප්‍ර : මොකක්ද සටහන් වෙලා තිබ්බේ?

පි : ලොරියක් අවසානයේ සටහන් කරලා තිබුණා ස්වාමිණි මගේ මතකයේ හැටියට.

ප්‍ර : කොහෙන්ද සටහන් වෙන්නේ?

පි : මාර්ග බාධකයේ.

ප්‍ර : නැහැ මම කියන්නේ වෙනත් දැන් ඔබගේ සාක්ෂියේ හැටියට මියගිය නිලධාරීන් දෙදෙනා 2018 නොවැම්බර් මාසේ 30 වෙනිදා උදෑසන 1 ½ වෙනකනුත් ජීවතුන් අතර සිටියේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : එතකොට ඔබලාට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මේ පරීක්ෂණ භාර ගත්තට ඔබලාට යම්කිසි තොරතුරුක් තිබ්බද ඒ කියන්නේ 2018 නොවැම්බර් මාසේ 29 වෙනිදා රාත්‍රියට පස්සේ 30 වෙනිදා උදෑසන අතර ඔය කියන මාර්ගයේ ගමන් ගත් යම් යතුරු පැදියක් නැත්නම් වාහනයක් සම්බන්ධයෙන්?

පි : නැහැ ස්වාමිණි මට තොරතුරක් ලැබුණේ නැහැ.

ප්‍ර : කිසිම තොරතුරක් ලැබුණේ නැහැ?

පි : නැහැ ස්වාමිණි.

FAIR COMMENT BY JEZEEM

****

<u>ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා:</u>

ප්‍ර : දැන් මහත්මයා ඔය මුරපොල පිහිටි ස්ථානය පාළු ස්වභාවයේද තියෙන්නේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : කැලෑවද එතන?

පි : කටු පඳුරු සහිත කැලෑව ස්වාමිණි එක පැත්තක. එක පැත්තක වෙල්යාය ස්වාමිණි. අනෙක් පැත්තෙන් මඩකලපුව පැත්තට වෙන්නට ලොකු කලපුවක් ස්වාමිණි.

ප්‍ර : කලපුව?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : එතකොට ධීවරයොත් ඉන්නවද ඔය කිට්ටුවද?

පි : ධීවරයෝ ඔය කිට්ටුව නැහැ ස්වාමිණි කිලෝ මීටරයක් විතර දුරින් ඉන්නේ.

ප්‍ර : මේ මුරපොළ ලඟ ඉදලා ගෙයක් හෝ කඩයක් හෝ ලඟම තියෙන්නේ කොච්චර විතර දුරින්ද?

පි : මීටර් 500 ක් විතර දුරින් ස්වාමිණි.

ප්‍ර : ඒ කියන්නේ ඊට තව පොඩ්ඩක් එහාට ගියාම පොලිසිය?

පි : ඔව්.

ප්‍ර : දැන් ඔතන වෙඩි ශබ්දයක් ඇහෙන කොට පොලිසියට ඇහෙන්න ඕන නේද ඉතින් කිලෝ මීටරයකටත් වැඩිය අඩු දුරක් නිසා?

පි : ඔව් ස්වාමිණි ඇහෙන්නේ නැහැ එදා වැහි දවසකුත් එක්ක ස්වාමිණි. එතකොට වංගු සහිතයි ස්වාමිණි.

ප්‍ර : දැන් ඔය 1 ට ස්ථානය පරීක්ෂා කරන්න රාත්‍රියේ ගිය නිලධාරියා ඉන්නවානේ?

පි : ඔව්.

ප්‍ර : ඒ නිලධාරියා ඒ ස්ථානය පරීක්ෂා කරන්න යන වෙලාවේ දී මේ පොලිස් මුරපොලේ හිටපු නිලධාරීන් දෙදෙනා සමඟම කතා බහ කරලා ඇවිල්ලා තිබුණද?

පි : සහකාර පොලිස් අධිකාරීතුමා ගියේ ස්වාමිණි.

ප්‍ර : ඔව් ඒක තමයි, දෙදෙනා සමඟ කතා බහ කරලා ඇවිල්ලා තිබුණ බවට වාර්තා වුණාද? නැත්නම් එක්කෙනාද ඒවෙලාවේ කතා බහ කරලා තියෙන්නේ?

පි : ඒක නම් මම ඇහුවේ නැහැ ස්වාමිණි උසස් නිලධාරි නිසා.

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු බන්දුල අතපත්තු මැතිතුමා:</u>

ප්‍ර : මහත්මයා දැන් ඔය පොලිස් නිලධාරීන් දෙදෙනාට නිකුත් කල ගිණිඅවි වර්ගය මොනවද?

පි : පැති අවි ස්වාමිණි.

ප්‍ර : මොකක්ද පැති අවි කියන්නේ?

පි : රිවෝල්වර ස්වාමිණි පොඩි උණ්ඩ 5 ක් දාන්න පුළුවන් පැති අර රෝස්ටරය දාලා දාන ඒවා ස්වාමිණි.

ප්‍ර : එතකොට T56 වගේ ආයුධ නෙමෙයි?

පි : නැහැ ස්වාමිණි.

ප්‍ර : ඒ ආයුධ ආපහු හොයා ගත්තද?

පි : පසුව ස්වාමිණි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් හොයා ගත්තා කියලා ආරංචි ලැබුණා ස්වාමිණි.

ප්‍ර : ඒවා වර්ගය මොනවද? බ්‍රවුනින් හරි ?

පි : නැහැ ස්වාමිණි බ්‍රවුනින් නෙමෙයි. පිස්තෝල පොඩි අවියක් ස්වාමිණි. උණ්ඩ 5 ක් දැමිය හැකි. රිවෝල්වර.

ප්‍ර : ඇයි ලොකු අවි ඔවුන්ට නිකුත් කරන්න..?

පි : ස්වාමිණි නිලධාරීන් 4 දෙනෙකුට වැඩි නම් ස්වයංක්‍රීය ගිණිඅවියක් නිකුත් කරන්න කියලා තමයි ස්වාමිණි නියෝග පෙර ලැබිලා තිබුණා ස්වාමිණි.

ප්‍ර : ඒ කියන්නේ ඔයට ඉස්සර එහෙම ඔය මාර්ගයේ වෙන මොනවත් එහෙම සිද්ධීන් වෙලා තියෙනවද?

පි : නැහැ ස්වාමිණි.

ප්‍ර : ඔබ එන්න කලින් LTTE කාලේ එහෙමත් තිබිලා තියෙනවද?

පි : ඒක නම් දන්නේ නැහැ ස්වාමිණි. LTTE කාලේදි ස්වාමිණි යුධ හමුදාවත් එක්ක තමා ඉදලා තියෙන්නේ එතන මාර්ග බාධකයේ යෙදිලා ඉදලා තිබෙන්නේ.

ප්‍ර : දැන් අර එතන තිබෙන කුටියේ මියගොස් සිටි පොලිස් නිලධාරියා යුනිෆෝම් පිටමද හිටියේ?

පි : එහෙමයි ස්වාමිණි නිළ ඇඳුමෙන් සිටියේ.

ප්‍ර : සම්පූර්ණ නිළ ඇඳුමක්?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඇයි මොකද විශේෂත්වය ඔතන මාර්ග බාධකයක් දාන්න?

පි : ස්වාමිණි මා යාමට පෙර ඉදලා එම ස්ථානයේ යොදවලා තිබ්බා ස්වාමිණි.

ප්‍ර : ඔබ දන්නේ එතන පිහිටුවන්න හේතුව මොකක්ද කියලා?

පි : නැහැ ස්වාමිණි.

ප්‍ර : ඒ කියන්නේ මීටර් 800 ක් ඈතින් නැතුව ඊට එහායින්?

පි : එහාට දැම්මා ස්වාමිනි මඩකලපුව කොට්ඨාශයේ පොලිස් බල ප්‍රදේශයට තමයි අයිති වෙන්නේ.

FAIR COMMENT — BY JEZEEM

****

<u>ගරු අදිකාරී මැතිනිය</u>:

ප්‍ර : සාක්ෂිකරු LTTE යුධ සමයේදි ඔය වචනතිව් කියන ප්‍රදේශය LTTE ග්‍රහණයට යටත් වෙලා තිබිච්ච ප්‍රදේශයක්ද?

පි : එහෙමයි මැතිනියනි.

ප්‍ර : ඒක නිසාද ඔය මුරපොලක් දැම්මේ පොලිස් ස්ථානයට ටිකක් ආසන්නයෙන් LTTE ප්‍රහාරයක් වැනි දෙයක් පොලිස් ස්ථානවලට එයි කියලා හිතලද?

පි : ඒ කාලේ ස්වාමිණි යුධ හමුදාව සමඟ ඒකාබද්ධව තිබිලා තිබෙනවා ස්වාමිණි. මුදවා ගැනීමෙන් පසුව.

ප්‍ර : දැන් මෙම සිදුවීම, යුද්ධය අවසන් වුණානේ 2009 දී, ඊට පස්සේ මෙම සිදුවීම 2018 අවසාන භාගයේදී වගේනේ වෙලා තියෙන්නේ මුරපොලේ පොලිස් නිලධාරීන්ට ප්‍රහාර එල්ල කිරීම. ඒ කාල වකවානුව තුළ ඔය වචනතිව් කියන ගමේ LTTE අය තවදුරටත් ක්‍රියාත්මක වෙනවා කියලා තොරතුරු පොලිසියට ලැබිලා තිබුණද?

පි : නැහැ ස්වාමිණි.

ප්‍ර : මුස්ලිම් අන්තවාදී සංවිධාන හරි කිසියම් හැබැයි මේ ගමේ මුස්ලිම් සුළු සංඛ්‍යාවක් නේ හිටියේ නේද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ද්‍රවිඩ ජාතිකයන් තමා 90% ක් විතර හිටියේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : අර පොලිස්පතිතුමා මඩකලපුවට එන්න කියලා රැස්වීමට ඔබත් ගියානේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඒ අවස්ථාවේදී පොලිස්පතිතුමා කිව්වද මෙහෙම ආගමික අන්තවාදී සංවිධාන තියෙනවා එවැනි සංවිධානයක් මේ ප්‍රදේශවල තියෙනවද ඒ ගැන හොයලා බලන්න එහෙම කිව්වද?

පි : එහෙම මුකුත් දැනුම් දුන්නේ නැහැ ස්වාමිණි.

ප්‍ර : LTTE ත්‍රස්තවාදය නැවත නැගී සිටිනවා කියලා එකක් කිව්වද?

පි : එහෙම කිව්වේ නැහැ ස්වාමිණි.

****

FAIR COMMENT
BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් කාදිනල් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරියට අවශ්‍ය දැයි විමසමි. අවශ්‍ය නොවන බව ප්‍රකාශ කරයි.

සාක්ෂිකරු මුදා හරිමි.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරැදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදි.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය: 2020.06.19 වෙලාව:- ප ව. 1.50

සටහන් කළේ:- ධම්මිකා පෙරේරා විසිනි

ගරු විනිසුරු මඩුල්ල:-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා (පැමිණ නැත) - සාමාජික

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික -

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

<u>පෙනී සිටීම:</u>

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතිඥතුමිය සමඟ ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස්, චතුරංග බණ්ඩාර, දිලන්ත එස්.කළුදුරුවගේ සහ අරින්ද්‍ර ජයසිංහ යන මහත්ම මහත්මීන් පෙනී සිටි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අහරදගරු අතිලතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතිඥ රවිෂානි පීරිස් මහත්මිය කොමිසමේ සාක්ෂි විමසීමේදි පෙනී සිටීමට අවසර දෙන ලදි.

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

සම්පූර්ණ නම : **ක්‍රිෂ්ණපිල්ලෙයි රවිචන්ද්‍රන්,**
වයස : **අවුරුදු 52 යි,**
ජාතිය : **ද්‍රවිඩ,**
ආගම : **හින්දු,**
තනතුර : **දැනට ප්‍රධාන පොලිස් පරීක්ෂක,**
<u>දැනට සේවා ස්ථානය</u>: **පොලිස් විද්‍යාලය, කල්අඩි.**

<u>මම මේ කියන සාක්ෂිය සැබෑවක්, සම්පූර්ණ සැබෑවක් සැබෑවක් මිස අන් කිසිවක් නොකියන බවට ප්‍රතිඥා දී ප්‍රකාශ කරමි</u>.
සාක්ෂිකරු දමිල භාෂාවෙන් ප්‍රතිඥාව ලබා දෙයි.

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා:</u>

ප්‍ර : රවිචන්ද්‍රන් මහත්මයා මම ඔබට සිංහල භාෂාවෙන් යම් ප්‍රශ්නයක් ඇහුවොත් එය තේරුම් ගෙන සිංහල භාෂාවෙන් ම උත්තරයක් දීමේ හැකියාවක් තියෙනවද?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : රවිචන්ද්‍රන් මහත්මයා ඔබ ශ්‍රී ලංකා පොලිසියට මුලින්ම සම්බන්ධ වෙන්නේ කුමන වකවානුවේද?

පි : උපසේවා උප පොලිස් පරීක්ෂක තනතුරේ ස්වාමිණි.

ප්‍ර : කොයි කාලෙද?

පි : 1989.12.18 වෙනිදා.

ප්‍ර : ඔබට එසේ සම්බන්ධ වුණායින් පස්සේ යම්කිසි මූලික පුහුණුවක් ලැබෙනවද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඔබ ඉන්පසු කුමන පොලිස් ස්ථානවලද රාජකාරී කරන්නේ?

පි : අම්පාර මූලස්ථාන පොලිසියේ සේවය කළා. ඉන්පසු පොළොන්නරු මූලස්ථාන පොලිසියේ සේවය කළා. ඉන්පසු හබරණ පොලිස් ස්ථානයේ සේවය කළා. වෙල්ලාවලී පොලිස් ස්ථානයේ. මඩකලපු මූලස්ථාන පොලිසියේ සේවය කලා.

ප්‍ර : ඔබ පොලිස් නිත්‍ය සේවයට අන්තර්ග්‍රහණය වෙන්නේ කොයි කාලේද?

පි : 2006 අවුරුද්දේ.

ප්‍ර : එසේ අන්තර්ග්‍රහණය වුණාට පස්සේ ඔබට යම්කිසි උසස්වීමක් ලැබෙනවද?

පි : උප සේවා ඉදලා නිත්‍ය සේවයට අනුයුක්ත කරනවා ස්වාමිණි.

ප්‍ර : 2010 වෙන කොට ඔබ පොලිස් පරීක්ෂක තනතුරකට උසස්වීමක් ලැබනවා?

පි : එහෙමයි ස්වාමිණි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබ මේ අපරාධ ස්ථානයක් විද්‍යාත්මකව පරීක්ෂණය කිරීම කියන විෂය කොයි කාලේද ඉගෙන ගන්නේ?

පි : ඒ 2007 අවුරුද්දේ සර්. 2007.05.22 වෙනිදා සිට 2007.06.22 වෙනිදා දක්වා කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පුහුණුවක් ලැබුවා සර්.

ප්‍ර : ඉන්පසුව ඔබ මේ අපරාධ ස්ථානයක් විද්‍යාත්මකව පරීක්ෂා කිරීම කියන කර්තව්‍යයේ දිගටම නිරත වෙනවද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඔබ ඒ සම්බන්ධයෙන් අපරාධ ස්ථාන කීයක් විතර පරීක්ෂා කරලා තියෙනවද මේ වන කොට? විශාල ප්‍රමාණයක් කිව්වොත් හරිද?

පි : 2000 ටත් වැඩි වෙන්න ඇති.

ප්‍ර : ඔබ ඒ සම්බන්ධයෙන් ගරු අධිකරණවල සාක්ෂි ලබා දීලා තියෙනවද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : දැන් මේ වන කොට ඔබ කුමන පොලිස් ස්ථානයකට අනුයුක්තවද සේවය කරන්නේ?

පි : දැනට කල්අඩි පොලිස් අභ්‍යාස විද්‍යාලයේ තමයි සේවය කරන්නේ.

ප්‍ර : මම ඔබගේ අවධානය යොමු කරනවා 2018 නොවැම්බර් 30 වන දිනට, 2018 නොවැම්බර් 30 වන දින වන කොට ඔබ කුමන පොලිස් ස්ථානයකට අනුයුක්තවද රාජකාරී සිද්ධ කළේ?

පි : මඩකලපුව මූලස්ථාන පොලිසියට අනුයුක්තව සොකෝ අංශයේ, අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ ස්ථානාධිපති වශයෙන් කටයුතු කළා ඒ කාලේ.

ප්‍ර : දැන් අපරාධ පරීක්ෂණාගාරයේ ස්ථානාධිපති ලෙසට ඔබ යටතේ නිලධාරීන් සිටියද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : කී දෙනෙක් ඔබට හිටියද?

පි : 9 දෙනෙක් හිටියා මා සමඟ.

ප්‍ර : අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ ස්ථානාධිපති විදියට ඔබට පැවරිලා තිබ්බ රාජකාරී මොනවද?

පි : මඩකලපුව කොට්ඨාශය ඇතුලේ, දිස්ත්‍රික්කය ඇතුලේ අපරාධයක් සිදු වුණොත් ඒ සම්බන්ධව පොලිස් ස්ථානාධිපති විසින් කොට්ඨාශ භාර පොලිස් අධිකාරීතුමාට දැනුම් දෙනවා. ඒත් එක්කම මටත් දැනුම් දෙනවා දුරකථන පණිවිඩ මගින්. ඒ සමඟම මම කොට්ඨාශ භාර පොලිස් අධිකාරීතුමාට දැනුවත් කරලා එතුමාගේ උපදෙස් අනුව එම ස්ථාන පරීක්ෂා කරන්න මගේ කණ්ඩායම සමඟ යනවා ස්වාමිණි.

Court Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් 2018 නොවැම්බර් 30 වෙනිදා ඔබ මේ ආකාරයෙන් යම්කිසි අපරාධ ස්ථානයක් පරික්ෂා කරන්න ගියාද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : මේකට යන්න ඔබට නියෝගය හම්බ වුණේ කාගෙන්ද?

පි : කොට්ඨාශ භාර පොලිස් අධිකාරීතුමාගෙන්.

ප්‍ර : කීයට විතරද මේ තොරතුර හම්බ වුණේ යන්න කියලා?

පි : 6.35 ට පමණ ස්වාමිණි.

ප්‍ර : උදෑසන?

පි : 6.35 ට පමණ.

ප්‍ර : මොකක් කියලද මේ ඔබට හම්බ වෙච්ච පණිවිඩය?

පි : පොලිස් නිලධාරීන් දෙදෙනෙකුට වෙඩි තියලා ඝාතනය කළා කියලා.

ප්‍ර : වෙඩි තියලා?

පි : මැරුවා කියලා.

ප්‍ර : ඒ අනුව ඔබට කොහාටද එන්න කියලා කිව්වේ?

පි : වවිනතිව් පොලිස් ස්ථානයට.

ප්‍ර : ඒ ලැබිච්ච පණිවිඩය අනුව ඔබ කුමක්ද සිද්ධ කළේ?

පි : මගේ නිලධාරීන් කණ්ඩායම සමඟ 6.40 ට විතර පිටත් වෙලා ගියා ස්වාමිණි එම ස්ථානයට. අපරාධය සිදු වූ ස්ථානයට.

ප්‍ර : ඔබත් එක්ක කවුද ගියේ, කී දෙනෙක් ගියාද?

පි : මාත් එක්ක ස්වාමිණි පොලිස් සැරයන් 27770 මංජුල, පොලිස් සැරයන් 361 විජේකෝන්, පොලිස් කොස්තාපල් 52369 කිෂෝර්, කාන්තා පොලිස් කොස්තාපල් 6758 ගෞරී, ඒ සමඟ පොලිස් සැරයන් රියදුරු 2496 ලක්ෂ්මන් නිලධාරීන් සමඟ පිටව ගියා ස්වාමිණි. WPLF 3614 කැබ් රථයේ අපරාධ ස්ථාන පරික්ෂා කිරීමේ කට්ටල සමඟ පිටව ගියා.

ප්‍ර : මේ සම්බන්ධයෙන් ඔබ පිටවීම් සටහන් දැම්මද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : කුමන තොරතුරු පොතේද දැම්මේ?

පි : සොකෝ RIB එකේ.

ප්‍ර : ඔබට ඒ සම්බන්ධයෙන් පිටුව සහ ඡේදය කියන්න පුළුවන්ද?

පි : එහෙමයි ස්වාමිණි. සොකෝ RIB 205/580.

ප්‍ර : ඔබ මෙසේ පිටව යන කොට මොනවද අරන් ගියේ උපකරණ?

පි : අරන් ගියේ ස්වාමිණි අපරාධ ස්ථානය පරික්ෂා කිරීමේ උපකරණ හා එම කට්ටලය. වර්සර් ලයිට්, දූවිලි උපුටනය, කැමරා, කෙමිකල් පෙට්ටිය, ඩ්‍රගන් ලයිට් එක, ලී ද්‍රව්‍ය පෙට්ටිය, සොකෝ ජැකට් ඒ ආදිය අරන් ගියා ස්වාමිණි.

ප්‍ර : ඔබ කැමරාවක් අරන් ගියා කිව්වා ඒක ඩිජිටල් වර්ගයේ කැමරාවක්ද?

Presidential Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමිණි, නිකෝන් D 17 වර්ගයේ කැමරාවක්.

ප්‍ර : ඔබ මෙසේ 6.40 ට උදෑසන ඔබගේ අපරාධ පරීක්ෂණාගාරයෙන් පිට වෙලා මේ අදාල සිද්ධිය වූ ස්ථානයට යන කොට කීය විතර වුණාද?

පි : විනාඩි 15 කින් ගියා ස්වාමිණි. 6.55 වෙන කොට එම ස්ථානයට ගියා. කෙටි මාර්ගයෙන් ගියේ, මම පාර දන්න නිසා කෙටි මාර්ගයකින් ගියේ ස්වාමිණි.

ප්‍ර : ඔබ එම ස්ථානයට ගියායින් පස්සේ ඔබ කුමක්ද නිරීක්ෂණය කළේ?

පි : මම යන විට ස්වාමිණි එම ස්ථානයේ හිටියා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නැගෙනහිර පළාත කපිල විජේසේකර මහතා සිටියා, ඒ වගේ මඩකලපුව කොට්ඨාශ භාර පොලිස් අධිකාරී නුවන් මෙන්ඩිස් මහතා හිටියා, සහකාර පොලිස් අධිකාරී චන්ද්‍රපාල මහත්තයා, සහකාර පොලිස් අධිකාරී ආනන්ද මහත්තයා හිටියා, ඒ සමඟ STF එකේ නිලධාරීන් හිටියා, යුධ හමුදා නිලධාරීන් හිටියා, සිවිල් පුද්ගලයෝ හිටියා, ඉන්ට් එකේ නිලධාරීන් හිටියා ස්වාමිණි.

ප්‍ර : ඔබ මෙම අපරාධ ස්ථානය පරීක්ෂා කරන්න ගත්තේ කීයට විතරද?

පි : අපි ගිය අවස්ථාවේ ඉදලා හිටිය කට්ටිය ඉවත් කරන්න කියලා අපි ආරක්ෂා පටිය යොදවලා ඒ මොහොතේ ඉදලා අපි පටන් ගත්තා ස්වාමිණි.

ප්‍ර : ඒ අනුව ඔබගේ යටතේ මේ අපරාධ ස්ථානයේ ඡායාරූප ගන්නට ඔබ කවුරු හරි නිලධාරියෙකුට වගකීම භාර දුන්නද?

පි : එහෙමයි ස්වාමිණි. කාන්තා පොලිස් කොස්තාපල් 6758 ගෞරී නිලධාරිණියට මම එයාට අවශ්‍ය උපදෙස් දීලා ඡායාරූප ගන්න කියලා කිව්වා.

ප්‍ර : දැන් ඒ ලබා ගත්ත ඡායාරූප මේ ගරු කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයට ඔබ විසින් ප්‍රකාශයක් ලබා දෙන කොට CD තැටියක මාර්ගයෙන් කොමිෂන් සභාවට ලබා දුන්නා කිව්වොත් නිවැරදි ද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : එම CD තැටිය නැවත දැක්කොත් ඔබට හඳුනා ගැනීමේ හැකියාවක් තියෙනවද?

පි : එහෙමයි ස්වාමිණි

ප්‍ර : එම CD තැටිය නැවත දැක්කොත් ඔබට හඳුනා ගැනීමේ හැකියාවක් තියෙනවද?

පි : එහෙමයි ස්වාමිණි.

ස්වාමිණි සාක්ෂිකරුට ඔහුගේ ප්‍රකාශයත් සමඟ ලබා දුන් CD තැටිය පෙන්වා සිටීමට අවසර පතනවා.

Permanent Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මේ ඔබ විසින් අපේ විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයට ලබා දුන් CD තැටියද?

පි : එහෙමයි ස්වාමිණි.

<u>ස්වාමිණි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද CD තැටිය C706 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා</u>.
ස්වාමිණි C706 විවෘත කර එහි ඇති ඡායාරූප සාක්ෂිකරුට පෙන්වීමට අවසර පතනවා.

(සාක්ෂිකරුට ඡායාරූපයක් පෙන්වා සිටී)

ප්‍ර : මහත්මයා මෙය පරීක්ෂා කරන්න, මෙම ඡායාරූපය ඔබට හඳුනා ගන්න පුළුවන්ද? එය කුමක් වශයෙන්ද ඔබට හඳුනා ගන්න පුළුවන්? හඳුනා ගන්න පුළුවන් නම් කුමක් වශයෙන්ද හඳුනා ගන්නේ?

පි : 2018.11.30 වන දින වවනතිව් පොලිස් මුරකුටියේ රාජකාරී කරපු නිලධාරීන් දෙදෙනෙක් ඝාතනය කිරීම එදා දින ගත්ත ඡායාරූපයක් ස්වාමිණි.

ප්‍ර : ඔබලා කණ්ඩායම විසින් ල බා ගත්තු ඡායාරූපයක් කිව්වොත් නිවැරදියි?

පි : නිවැරදියි.

<u>ස්වාමිණි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද මෙම ඡායාරූපය C706A වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.</u>
(C706A ඡායාරූපය සාක්ෂිකරුට පෙන්වා සිටී)

දැන් වේලාව : ප.ව. 2.00 යි.
මෙතැන් සිට ල/ලේ :- යමුණා දසනායක මිය.

President's Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව- ප.ව.2.00
පෙර සටහන් ගැනීම ල/ලේ දම්මිකා මිය.
සටහන් ගැනීමල/ලේ යමුනා දසනායක විසිනි.

<u>රජයේ අධිනීතිඥ චතුරංග බංඩාර මහතා.</u>

ප්‍ර ඔබලාගේ කණ්ඩායම විසින් ගත්ත ඡායාරූපයක් කිව්වොත් නිවැරදියි.

උ නිවැරදියි.

ස්වාමීනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා මෙම ඡායාරූපය C 706 A වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.

ප්‍ර C 706 A ඡායාරූපය සාක්ෂිකරුට පෙන්වා සිටිනවා. මහත්මයා මේ ඡායාරූපයේ දැක්වෙන්නේ වතුර තිබෙන ප්‍ර දේශයක් ඒ කොහේද ? ඒ මොකක්ද ඒ ?

උ ඒ ස්වාමීනි කලපුව තියෙන්නේ ස්වාමීනි.ඒක මාන්දිව් ගොඩවෙලා තියෙනවා කලපුව මැද හරියේ.

ප්‍ර මේ වතුර තිබෙන ප්‍රදේශය කලපුවක් ?

උ කලපුවක් ස්වාමීනි.

ප්‍ර ඉන්පස්සේ මේ ගොඩනැගිල්ලක් වශයෙන් දැක්වෙන්නේ මොකක්ද ඒ ටකරන් වලින් වගේ ඉදි කරලා තියෙන ?

උ ඒ මාර්ග බාධකයක් පොලිස් නිළධාරීන් රාජකාරි කරන මාර්ග බාධකයක් ඒ වාහන යන එන මිනිස්සු පරික්ෂා කරන එකයි වාහන සම්බන්ධ ලියන තැන ස්වාමීනි.

ප්‍ර ඊට පස්සේ ඒ ගොඩනැගිල්ලට ඉදිරියෙන් යම්කිසි ක්‍රොන්ක්‍රීට් පාරක් වගේ දැක්වෙනවා ඒ මොකක්ද ඒ පාර?

උ ස්වාමීනි ඒක මඩකලපුව ඉඳලා වවිනතිව් ප්‍රදේශයට එන ප්‍රධාන මාර්ගය කොන්ක්‍රීට් පාර තියෙන්නේ පාරට එහාපැත්තේ තියනවා ස්වාමීනි පරණ ගුවන් හමුදා කඳවුරක් ඒ වට පිට ගෙවල් කිසිම දෙයක් නැහැ ස්වාමීනි.

ප්‍ර ඒ කියන්නේ ඒ පාළු ප්‍රදේශයක්ද ?

උ පාළු ප්‍ර දේශයක් මේ පාර චුට්ටක් ඉදිරියට යනකොට වවිනතිව් දෙසට එනකොට පාර දෙකට වෙන් වෙලා එනවා.එකක් කන්දකුඩාවටයනවා එකක් වවිනතිව් පොලිස් ස්ථානයට යන්නේ.ඒ දෙපැත්තම තියෙන්නේ තනිකර කුඹුරු ස්වාමීනි.

ප්‍ර ස්වාමීනි සාක්ෂිකරුට තවත් ඡායාරූපයක් පෙන්වා සිටීමට අවසර පතනවා මහත්මයා මෙම ඡායාරූපය නිරීක්ෂණය කරන්න මේ ඔබට හඳුනාගන්න පුළුවන්ද මේ ඡායා රූපය? මෙය හඳුනාගන්න පුලුවන් නම් කුමක් වශයෙන්ද ඔබ හඳුනාගන්නේ ?

උ මේක ස්වාමීනි මාර්ග බාධක රාජකාරි කල නිළධාරීන් නැවතිලා රාජකාරි කරන ස්ථානයක් මෙම ස්ථානයේ සිල්බර කොට සහ ටකරන් ලී වල

FAIR COMMENT BY JEZEEM

සවි කරලා තියෙන කොලපාට නෙට් යොදා සවි කරන ලද මුර කුටියක් වගේ ස්වාමීනි.

සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද මෙම ඡායාරූපය C 706 B වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.

ප්‍ර මහත්මයා මෙම ඡායාරූපයේ බිම සුදු පැහැති රෙද්දකින් වහලා තියෙන්නේ ඒ මොකක්ද ඒ ?

උ ඒක පො. කො. 8624 ගනේෂ් දිනේෂ් යන පොලිස් නිළධාරියාගේ මෘත ශරීරය ස්වාමීනි.

ප්‍ර ඒ අනුව ඔහු ද්‍රවිඩ ජාතික නිළධාරියෙක්ද ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර මේ දැක්වෙන ගොඩනැගිල්ල ඔය ඔබ අපි අර කලින් දැකපු ඡායාරූපයේම විස්තර කරපු පොලිස් මුර කුටියද ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර ඔවුන් විවේක ගන්න හදපු ස්ථානයක්ද මේක ?

උ ඒක කොටස් තුනකට තියෙනවා ස්වාමීනි. මුලට තියෙන්නේ වාහනය සම්බන්ධව මේ පලවෙනියෙන්ම පේන්නේ ස්වාමීනි වාහන පරීක්ෂා කරලා ඒ වාහන සම්බන්ධව විස්තර ලියා ගෙන මේසයක් වගේ හදලා තියෙනවා අතන පොතක් තියෙනවා වාහන නතර කරන්න රතුපාට ලයිට් එකක් තියෙනවා වතුර ප්ලාස්ටික් බෝතලයක් තියෙනවා. පොලිස් තොප්පියක් තියෙනවා. ස්වාමීනි මෙතන තියෙන්නේ ස්වාමීනි පොලිස් නිලදාරීන් විවේක ගන්න කාමරයක් වගේ එතන යකඩ ඇඳක් තියෙනවා ඒකේ ඇතුලේ තමයි සිංහල පොලිස් නිළධාරියා වන වෙල්විට ගමගේ නිරෝෂන් ඉන්දික ප්‍රසන්න මැරිලා හිටියේ.

ප්‍ර ඊට පස්සේ මේ පිටිපස්සෙන්ම දැක්වෙන්නේ මොකක්ද මහත්මයා ?

උ ඒක ස්වාමීනි පොලිස් නිළධාරීන් කෑම ගන්න ස්ථානයක් ඊට මෙහා පැත්තේ පොඩි කැල්ලක් තියෙනවා ස්වාමීනි ඒ ගොල්ලන්ගේ යතුරු පැදි එහෙම ගෙනාවොත් ඒක ඇතුලේ ඒ ගොල්ලෝ පාර්ක් කරලා තිබ්බේ.රතු පාට බයික් එකක් තිබුනා ස්වාමීනි ඒක පොලිස් නිළධාරියෙකුගේ යතුරු පැදියක්.

ස්වාමීනි සාක්ෂිකරුට තවත් ඡායාරූපයක් පෙන්වා සිටීමට ගෞරවයෙන් අවසර පතනවා .

ප්‍ර මහත්මයා මෙම ඡායාරූපය පරීක්ෂා කරන්න. මහත්මයා මෙම ඡායරූපය ඔබට හඳුනාගන්න පුලුවන්ද ?

උ ඔව්.

ප්‍ර මේ කුමන ඡායාරූපයද ?

උ මේක ස්වාමීනි. පො. කො. 82162 වෙල්විට ගමගේ නිරෝෂන් ඉන්දික ප්‍රසන්න නිළධාරියා යකඩ ඇඳ උඩ නිල් පාට සුදු හා නිල්ඉරි දාපු පොලිස් මෙට්ට්‍රස් එකේ උඩ වැටිලා ඉන්න ඡායාරූපයක් ?

FAIR COMMENT BY JEZEEM

ස්වාමීනි සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද මෙම ඡායාරූපය C 706 C වශයෙන් සලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.

ප්‍ර මහත්මයා C 706 C ඡායාරූපයේ දැක්වෙන්නේ යතුරු පැදියක් වගේ ඒකක් ඒ කාගෙද ?

උ ඒක ස්වාමීනි ගනේෂ් දිනේෂ් කියන අයෙග්යතුරු පැදියක් කියලා විමර්ෂණ නිළධාරියා විසින් පවසා සිටියා. ස්වාමීනි.

ප්‍ර මේ දැක්වෙන්නේ නෙට් ඒකක්ද ,මදුරු දැලක් වගේ එකක්ද ?

උ එහෙමයි ස්වාමීනි .

ප්‍ර මේ ඔබ අර අපි කලින් දැක්ක ඡායාරූපයේ තිබ්බ මුරකුටිය ඇතුලට ගියාම දැක්වෙන ඡායාරූපයක් කිව්වොත් නිවැරදිද ?

උ එහෙමයි ස්වාමීනි.

තවත් ඡායාරූපයක්සාක්ෂිකරුට පෙන්වා සිටී.

ප්‍ර මහත්මයා මෙම ඡායාරූපය පරීක්ෂා කරන්න . මෙම ඡායාරූපය ඔබට හඳුනාගැනිමේ හකියාවක් තියෙනවාද ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර කුමක් වශයෙන්ද ඒඡායාරූපය හඳුනාගන්නේ ?

උ පො.කො. 82162 පොලිස් නිළධාරිගේ මලසිරුර , එයාගේ අත

ස්වාමීනි සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද මෙම ඡායාරූපය C. 706 D වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතමි.

ප්‍ර මහත්මයා අර ඔබ සඳහන් කරපු පොලිස් මාර්ග බාධකයේ තිබුණු මුරකුටිය ඇතුලේ සිට ගත්ත ඡායාරූපයක්ද ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර එතකොට මේ ඇඳක් එහෙම තියලා තියෙන්නේ විවේක ගන්නා ස්ථානයද ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර මේ ඉන්න නිළධාරියා කව්ද ?

උ පො. කො.82162 වෙල්විට ගමගේ නිරෝෂන් ඉන්දික ප්‍රසන්න යන නිළධාරියා.

ස්වාමීනි සාක්ෂිකරුට තවත් ඡායාරූපයක් පෙන්වා සිටී.

ප්‍ර මහත්මයා මෙම ඡායාරූපය පරීක්ෂා කරන්න මෙය ඔබට හඳුනාගන්න පුළුවන්ද ?

උ එහෙමයි ස්වාමීනි

සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද ඡායාරූපය C. 706 E වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.

ප්‍ර මහත්මයා මෙම ඡායාරූපයේ දැක්වෙන මේ කැලැබද පෙදෙසක් මේ කොහේද ඒ ?

උ කලපුව අයිනේ තිබෙන ප්‍රදේශයක් ස්වාමීනි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර කලපුව අයිනෙන් තිබෙන ?

උ කලපුව අයිනේ තිබෙන පොලිස් මුර කුටියට පිටිපස්සේ තියෙන ප්‍රදේශයක් ස්වාමීනි.

ප්‍ර පිටිපස්සේ තියෙන ?

උ පිටිපස්සේ තියෙන ප්‍රදේශයක් ස්වාමීනි.

ප්‍ර මේ දැක්වෙන මෙම පෙන්වන ලද ස්ථානය ඔබ එක වශයෙන් ලකුණු කරලා තියෙන්නේ ඒක මොකක්ද ?

උ ඒක. පො. කො. 8624 ගනේෂ් දිනේෂ් යන නිළධාරියගේ මළසිරුර ස්වාමීනි.

ස්වාමීනි සාක්ෂිකරුට තවත් ඡායාරූපයක් පෙන්වා සිටීමට අවසර පතනවා

ප්‍ර ඔබට මේ ඡායාරූපය හඳුනාගන්න පුලුවන්ද ?

උ එහෙමයි ස්වාමීනි.

ස්වාමීනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද මෙම ඡායාරූපය C. 706 F වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.

ප්‍ර ඔබ මේ 2 වශයෙන් ලකුණු කරලා තියෙන්නේ මේ මොකක්ද මේ ?

උ පො.කො. 82162 වෙල්විටගමගේ නිරෝෂන් ඉන්දික ප්‍රසන්න යන පොලිස් නිළධාරියාගේ මළසිරුර .

ප්‍ර ඔබ මහත්මයා මෙම ඡායාරූපය පරීක්ෂා කරන්න . ඔබට මෙය හඳුනාගන්න පුලුවන්ද ?

උ එහෙමයි ස්වාමීනි.

ස්වාමීනි සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද මෙම ඡායාරූපය C. 706 G වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.

ප්‍ර මහත්මයා මෙම C. 706 G. ඡායාරූපයේ අංක 3 වශයෙන් ඔබ ලකුණු කරලා තියෙන්නේ මොකක්ද ?

උ ඒක හිස්පතරොමක් ස්වාමීනි අංක 71-98 කියලා සඳහන් කරලා තිබුන හිස් පතරොමක් ස්වාමීනි.

ප්‍ර මේ පතරොම කොහේද තිබ්බේ මහත්මයා ?

උ ඒක පොලිස් මුර කුටියේ පිට කොන්ක්‍රීට් පාරයි මුර කුටියයි අතර .

ප්‍ර අතර වගේ තමයි තිබුනේ ?

උ ඔව්

ප්‍ර සාක්ෂිකරුට තවත් ඡායාරූපයක් පෙන්වා සිටිනවා. මහත්මයා මෙම ඡායාරූපය පරීක්ෂා කරන්න ඔබට මෙය හඳුනාගැනීමට හැකියාවක් තියෙනවාද ?

උ එහෙමයි ස්වාමීනි.

සාක්ෂිකරු විසින් හඳනාගන්නා ලද මෙ ඡායාරූපය C.706 H වශයෙන් ලකුණු කිරීමටඅවසර පතනවා.

Fair Comment Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර මහත්මයා C. 706 H පරීක්ෂා කරලා බලන්න මේ ඡායාරූපයෙන් දැක්වෙන මාර්ගය මොකක්ද කියලා මේ ?

උ ඒ තමයි ස්වාමීනි වවුනතිව් ප්‍රධාන මාර්ගය . ඒක ගිහිල්ලා ඉදිරියට දෙකට වෙන් වෙලා යනවා එකක් ඉදිරියට යනවා කන්නකුඩා මාර්ගයේ අනිත් එක යනවා වවුනතිව් පොලිස් ස්ථානයට යන මාර්ගය .

ප්‍ර දැන් මේ ට්‍රක් රථය මුහුණ ලා තියෙන පැත්තට ගියොත් කොයි පැත්තටද යන්නේ ?

උ මුහුණ තියෙන පැත්ත ස්වාමීනි වවුනතිව් පොලිස් ස්ථානයයට. පිටිපස්සේ මේව එකට ගියොත් මඩකලපු නගරයට.

ප්‍ර මහත්මයා මෙම ඡායාරූපය පරීක්ෂා කරන්න මෙම ඡායාරූපය ඔබට හඳුනාගන්න පුලුවන්ද ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර ඔබ කුමක් හැටියටද මෙය හඳුනාගන්නේ ?

උ මුරකුටියේ එලියේ වැටිලා තිබුණු පොලිස් නිළධාරීගේ මෘත ශරීරය .

ප්‍ර මහත්මයා ඔබට මෙම ඡායාරූපය හඳුනාගන්න පුලුවන්ද?

උ එහෙමයි ස්වාමීනි

ප්‍ර සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද මෙම ඡායාරූපය C 706 I වශයෙන් සලකුණු කිරිමට අවසර පතනවා.

ප්‍ර මහත්මයා ඔබට මේ ඡායාරූපය පැහැදිලි කරන්න පුලුවන්ද?

උ එහෙමයි ස්වාමීනි. මෙම ඡායාරූපයේ තියෙන මෘත ශරීරය ස්වාමීනි 86124 ගනේෂ් දිනේෂ් යන අයගේ මෘත ශරීරය .

ප්‍ර මුර කුටියේ එලියේ තිබ්බ මෘත ශරිරයද නැත්නම් අර මුර කුටිය තුල තිබ්බ මෘත ශරීරයද ?

උ මුර කුටියේ එළියේ තිබුණු මෘත ශරීරය ස්වාමීනි.

ප්‍ර හරි.

උ මෙම පොලිස් නිළධාරීගේ අත් දෙකම කොහුලණුවෙන් ගැට ගහලා තිබුනා ස්වාමීනි.

ප්‍ර ඔබ පරීක්ෂා කරන අවස්ථාව වෙන කොට අත් බැදලාද තිබුනේ ?

උ බැඳලා තිබුනේ ස්වාමීනි. ඉදිරිපිට අත් දෙකම . අනිත් එක එයාගේ පිටිපස තුවාලයක් තිබුනා ස්වාමීනි ගන් ෂොට් එකක් තිබුනා. ඒක පිටත් වෙලා තිබුනා. එයයි එතන එකයි එහා පැත්තේ එකයි තියෙන්නේ ස්වාමීනි .අනිත් එක ස්වාමීනි මෙයාගේ එම අවස්ථාවේ මෙයා හැන්ඩ් ෆී ෆෝන් එකෙන් කථා කර කර ඉදලා තියෙනවා ස්වාමීනි ඒ අතරේ එයාගේ වැටිලා තිබුනා කකුල් දෙක අතර සැම්සුන් ෆෝන් එකක් තිබුනා. ඒකට හැන්ඩ් ෆී සෙට් එකක් තිබුනා ස්වාමීනි

ස්වාමීනි සාක්ෂිකරුට තවත් ඡායාරූපයක් පෙන්වා සිටීමට අවසර පතනවා.

ප්‍ර මහත්මයා මේ ඡායාරූපය බලන්න ඔබට හඳුනාගන්න පුලුවන්ද ?

උ එහෙමයි ස්වාමීනි

Document Secretary Copy
FAIR COMMENT BY JEZEEM

සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද මෙම ඡායාරූපය C 706 J වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.

ප මහත්මයා ට පුලුවන්ද මේ ඡායාරූපය පැහැදිලි කරන්න?

උ එහෙමයි ස්වාමීනි. එම පොලිස් නිළධාරීගේ පාවිච්චි කරපු hand phone තමයි මේක ස්වාමීනි.

ප ඒ කියන්නේ දැන් මේ අපි C.706 I වශයෙන් සලකුණු කරපු පොලිස් නිළධාරියාම?

උ එහෙමයි ස්වාමීනි.ගනේෂ් දිනේෂ් කියන පොලිස් නිළධාරියාගේ.

ප ඔහුගේ ජංගම දුරකථනය තමයි මේ දැක්වෙන්නේ ?

උ එහෙමයි ස්වාමීනි.

ප තවත් ඡායාරූපයක් සාක්ෂිකරුට පෙන්වා සිටී.
මහත්මයා මෙය පරීක්ෂා කරන්න . මෙම ඡායාරූපය ඔබට හඳුනාගන්න පුලුවන්ද ?

උ එහෙමයි ස්වාමීනි.

ස්වාමීනි සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද ඡායාරූපය C 706 K වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.

ප මෙම ඡායාරූපය පරීක්ෂා කරලා බලලා මහත්මයාට මේ ඡායාරූපයෙන් දැක්වෙන දේවල් පැහැදිලි කරන්න පුලුවන්ද?

උ එහෙමයි ස්වාමීනි.

ප මහත්මයා මෙම ඡායාරූපයෙන් දැක්වෙන ඒ පොලිස් නිළධාරියා කව්ද ?

උ ඒක ස්වාමීනි 8624 ගනේෂ් දිනේෂ් කියන රාළහාමිගේ මල සිරුර ස්වාමීනි. ඒක අපි ගරු මහේස්ත්‍රාත්තුමාගේ උපදෙස් පරිදි අපි විශේෂ කාර්ය බලකාය නිළධාරින් කිහිප දෙනකුගේ උදව්වක් ලබා ගත්තා ස්වාමීනි සමහර විට මේක ත්‍රස්තවාදී ක්‍රියා වෙන්න පුලුවන් කියලා යට බෝම්බයක් ටයිම් බෝම්බයක් හෝ මොනවාහරි තියෙන්න පුලුවන් කියන අදහස් වලින් තමයි විශේෂ කාර්ය බලකායේ නිළධාරීන් අපිට උදව්වට ලබා ගෙන ඒ ගොල්ලෝ තමයි ඒක පරීක්ෂා කරන අවස්ථාවේ හිටියේ ස්වාමීනි.

ප මේ ස්ථානයෙන් දැක්වෙන්නේ කුමක්ද මහත්මයා ?

උ ඒක පොලිස් නිළධාරිගේ අත් දෙකම ඉස්සරහට ගැට ගහලා තිබුණු කොහු ලණුව ස්වාමීනි.
සාක්ෂිකරුට තවත් ඡායාරූපයක් පෙන්වා සිටී.

ප මහත්මයා මෙම ඡායාරූපය පරීක්ෂා කරන්න මෙම ඡායාරූපය ඔබට හඳුනාගන්න පුලුවන්ද?

උ එහෙමයි ස්වාමීනි.

ප ඔබට කුමක් හැටියටද එය හඳුනාගන්න පුලුවන්?

Assistant Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ පො.කො 82162 වෙල්විට ගමගේ නිරෝෂන් ඉන්දික ප්‍රසන්න යන නිළධාරියගේ මුර කුටියේ ඇතුලේ යකඩ ඇඳේ සුදුපාට සහ නිල්ඉරි දාපු මෙට්‍රස් එකේ පොලිස් මෙට්‍රස් එක උඩ වැටිලා තිබිච්ච ආකාරය ස්වාමීනි. ස්වාමීනි එම ඡායාරූපය C. 706 L වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා .

ප්‍ර මහත්මයා මෙම ඡායාරූපයෙන් දැක්වෙන්නේ මොකක්ද ?

උ ඒක ස්වාමීනි 13 ක් විතරක් පමණක් තිබුණා කැපුම් තුවාල පිහියෙන් ඇනලා කැපුම් තුවාල තිබුනා ස්වාමීනි අතේ පපුව ප්‍රදේශයේ කැපුම් තුවාල තිබුනා ස්වාමීනි.

තවත් ඡායාරූපයක් පෙන්වා සිටී.

ප්‍ර මේ ඡායාරූපය පරීක්ෂා කරන්න මහත්මයා මේ ඡායාරූපය ඔබට හඳුනාගැනිමේ හැකියාවක් තියෙනවාද ?

උ එහෙමයි ස්වාමීනි

මෙම ඡායාරූපය ස්වාමීනි C. 706 M වශයෙන් සලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.

ප්‍ර මෙම ඡායාරූපයෙන් දැක්වෙන පුද්ගලයා කව්ද මහත්මයා?

උ පො. කො. 82162 ගනේෂ් දිනේෂ් සහ වෙල්විටගමගේනිරෝෂන් ඉන්දික ප්‍රසන්න නිළධාරිගේ මළසිරුර ස්වාමීනි.

ප්‍ර මහත්මයා මෙම ඡායාරූපය පරීක්ෂා කර න්න ඔබට මෙය හඳුනාගන්න පුලුවන්ද?

උ එහෙමයි ස්වාමීනි මෙම ඡායාරූපය ස්වාමීනි C.706 N වශයෙන් සලකුණු කිරීමට අවසර පතනවා. මෙම ඡායාරූපයේ දැක්වෙන්නේ ඔය අපි කලින් C.706 N වශයෙන් දැක්වෙන ඡායාරූපයේ සිටින නිළධාරියාමද ?

උ ඔව් ස්වාමීනි.

ප්‍ර මහත්මයා මේ ඡායාරූපය පරීක්ෂා කරන්න මේ ඡායාරූපය ඔබටහඳුනාගන්න පුලුවන්ද?

උ එහෙමයි ස්වාමීනි.

මේ ඡායාරූපයේ ස්වාමීනි මේ සාක්ෂිකරු හඳුනාගන්නා ලද මෙම ඡායාරූපය C. 706 O වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.

ප්‍ර මේ C. 706 O ඡායාරූපයේ සිටින්නේ කව්ද මහත්මයා ?

උ පො. කො. 82162 වෙල්විට ගමගේ නිරෝෂන් ඉන්දික ප්‍රසන්න නිළධාරිගේ මෘත ශරිරය.

ප්‍ර ඒ කියන්නේ අර අපි කලින් ප්‍රථමයෙන් බලපු ඡායාරූපයේ නිළධාරියගේම මෘත ශරිරයේ ඡායාරූපයක් කිව්වොත් හරි ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර මහත්මයා ඊට අමතරව මෙම ඡායාරූප ගැනීමට අමතරව ඔබ මෙම ස්ථානය සම්බන්ධයෙන් යම්කිසි අපරාධ දල සටහනක් නිර්මාණය කරා

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කිව්වොත් අපරාධ ස්ථානය පිහිටීම දක්වන දල සටහනක් නිර්මාණය කරාද ?

උ එහෙමයි ස්වාමීනි.

ප ඔබ එම දල සටහන මෙම කොමිෂන් සභා විමර්ෂණ අංශයට ඔබ ප්‍රකාශයත් සමඟ ලබා දුන්නා කිව්වොත් නිවැරදිද ?

උ එහෙමයි ස්වාමීනි.

ප එය ඔබට නැවත දැක්කොත් හඳුනාගැනීමට හැකියාවක් තියෙනවාද ?

උ එහෙමයි ස්වාමීනි.

ප ස්වාමීනී සාක්ෂිකරුට ලේඛණයක් පෙන්වීමටඅ වසර පතනවා.මහත්මයා මෙම ලේඛණය පරික්ෂා කරන්න . මෙම ලේඛණය ඔබට හඳුනාගන්න පුලුවන්ද ?

උ එහෙමයි ස්වාමීනි.

ස්වාමීනී සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද ලේඛණය C.707 වශයෙන් ලකුණු කිරීමට අවසර ඉල්ලා සිටිනවා.

ප මහත්මයා මේ C. 707 ලේඛණය යම්කිසි පරිමාණයකට ඇන්ද ලේඛණයක්ද?

උ නැහැ ස්වාමීනි.

ප ඔබ මෙම ලේඛණය සකස් කරේ යම්කිසි මෙම ස්ථානය ගැනපිහිටීම ගැන දල අදහසක් ලබා ගැනිමේ අරමුණින් කියලා කිව්වොත් නිවැරදිද ?

උ එහෙමයි ස්වාමීනි.

ප දැන් මහත්මයාට පැහැදිලි කරන්න පුලුවන්ද මෙම C.707 දල සටහන බලලා වවිනතිව් පොලිස් ස්ථානයේ ඉඳලා මෙම ස්ථානයට එන්නේ කොහොමද කියන එක පැහැදිලි කරන්න ?

උ මේපේන්නේ ස්වාමීනි වවුනතිව් පොලිස් ස්ථානය ඒ පාරෙන් ඇවිල්ලා මේ යන්නේ කන්නකුඩා ප්‍රදේශයට ඒ පාරෙන් තමයි එන්න තියෙන්නේ ඇවිල්ලා මෙතන තමයි තියෙන්නේ පොලිස් මාර්ග බාධකය මුර කුටිය අපරාධය සිදුවු ස්ථානය . මේපාර දිගටම ගියොත් එනවා වවුනතිව් පාලම අහුවෙනවා . ඒ පැත්තට ගියොත් මඩකලපුව නගරය .

ප එතකොට මේ වවුනතිව් පාලමෙන් පාලම පැන්නට පස්සේ මඩකලපුව පොලිස් බල ප්‍රදේශයට ද ඇතුල් වෙන්නේ ?

උ එහෙමයි ස්වාමීනි පාලමේ ඉඳලා ස්වාමීනි කිලෝ මීටර් දෙකක් පමණ දුරින් ගියායින් පස්සේ තමයි ස්වාමීනි මඩකලපුව පොලිස් ඒරියා අහුවෙන්නේ ස්වාමීනි.

ප තව මේ කන්නන්කුඩා පාර කියලා තියෙන්නේ මොකක්ද මහත්මයා?

උ ඒක ස්වාමීනි ඒ මාර්ගය ගිහිල්ලා කොක්අඩිවෝලේ ප්‍රදේශයට යන්න පුලුවන් ස්වාමීනි.

ප ඊට අමතරව කලපුව දැක්වෙනවාද දිගටම ?

උ එහෙමයි ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර මේ ආශ්‍රිතව ඔබ මේ ඇන්ද සටහන ආශ්‍රිතව නිවාස එහෙම තියෙනවාද?

උ නැහැ ස්වාමීනි. ඒ ප්‍රදේශවල පේන්න එම නිවස වල කිසිම දෙයක් නැහැ ස්වාමීනි මුර කුටි ඉස්සරහ විතරයි තියෙන්නේ ස්වාමීනි පරණ ගුවන් හමුදා කඳවුර ස්වාමිනි.

ප්‍ර මේ ගුවන් හුමුදා කඳවුර තියෙන්නේ ඒ ආශ්‍රිතව ?

උ ඔව් ස්වාමීනි.

ප්‍ර විශාල ගුවන් හමුදා කඳවුරක්ද?

උ නැහැස්වාමීනි ඒ ගොල්ලන්ගේ පොයින්ට් එකක් ස්වාමීනි අක්කර බාගයක් විතර ප්‍රදේශයක් තියෙනවා ස්වාමීනි. වවුනතිව් පාලමේ ආරක්ෂා කරන්න දාපු මුරකුටියක් වගේ ස්වාමීනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

සාක්ෂිකරුගෙන් ප්‍රශ්ණ ඇසීමේ අවස්ථාවක් අතිඋතුම් මැල්කම් කාදිනල් රන්ජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරියට අවශ්‍ය දැයි විමසමි

නැත යනුවෙන් ප්‍රකාශ කරයි.

සාක්ෂිකරු මුදා හරිමි.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා තේරුම් ගෙන මෙම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදි.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

<u>2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව</u>

දිනය :- 2020.06.19 වේලාව :- ප.ව. 5.15

සටහන් කළේ :- එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

ගරු විනිසුරු මඩුල්ල :-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා (පැමිණ නැත) - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

පෙනී සිටීම :-

* අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සුහර්ෂි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතීඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, චතුරංග බණ්ඩාර මහතා, දිලන්ත එස්. කළුදුරුවගේ මහතා සමඟ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතීඥ රවිශානි පීරිස් මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

Document Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සාක්ෂි අංක : 277

01.	සම්පූර්ණ නම	:	නිශාන්ත ප්‍රභාත් කස්තුරිආරච්චි
02.	වයස	:	අවුරුදු 53යි
03.	ජාතිය	:	සිංහල
04.	ආගම	:	බෞද්ධ
05.	තනතුර	:	ප්‍රධාන පොලිස් පරීක්ෂක (කොළඹ අපරාධ කොට්ඨාශය)

සාක්ෂිකරු ප්‍රතිඥාව ලබා දෙයි.

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : කස්තුරිආරච්චි මහත්මයා ඔබ පොලිස් දෙපාර්තමේන්තුවට බැඳුණේ කවදාද?

පි : මම 1990.08.04 වෙනිදා උප පොලිස් පරීක්ෂකවරයෙකු වශයෙන් පොලිසියේ සේවයට බැඳුණා.

ප්‍ර : එතැන් පටන් ඔබ ආධුනික උප පොලිස් පරීක්ෂක....?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : නිත්‍ය සේවයට ඔබ අන්තර්ග්‍රහණය වුණේ කවදද?

පි : 2006.02.01

ප්‍ර : ඔබ 1990 අගෝස්තු 04 වෙනිදා පොලිස් සේවයට බැඳුණු අවස්ථාවේ පටන් මේ වනතුරු එම දෙපාර්තමේන්තුවේ ලබා තිබෙන උසස්වීම් මොනවාද?

පි : ස්වාමීනි මම 2007.09.25 පොලිස් පරීක්ෂක සේවයට උසස්වීමක් ලැබුණා. 2020.01.01 දිනට ප්‍රධාන පොලිස් පරීක්ෂක තත්ත්වයට උසස්වීමක් ලැබුණා.

ප්‍ර : ඔබේ මේ සේවා කාලය තුළදී ඔබ යම් යම් පුහුණුවීම් ලංකාවේ ලබලා තියෙනවද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : මොනවද ඒ?

පි : රථ වාහන ජ්‍යෙෂ්ඨ පුහුණු පාඨමාලාව, ඒ වගේම ස්ථානාධිපතිවරයෙකු ලෙස ලැබෙන පුහුණුවක් ලැබුණා කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේ.

ප්‍ර : ඔබ ඒ ඇරෙන්නට යම් වැඩිදුර අධ්‍යාපන කටයුතු ලංකාවේදී කරලා තියෙනවද?

පි : එහෙමයි ස්වාමීනි. මම කොළඹ Campus එකේ පශ්චාත් උපාධිය ලබලා තියෙනවා මානව හිමිකම් සම්බන්ධයෙන්.

Parliament Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එහෙම නම් ඔබට කියන්නට පුළුවන්ද පුහුණුව ගැන බලනකොට ඔබ විදේශීය වශයෙනුත් පුහුණුවක් ලබලා තියෙනවද කියලා?

පි : එහෙමයි ස්වාමීනි. මම ඉන්දියාවේ පාඨමාලාවක් කළා. ඊට අමතරව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ United Nation වල වසරක් ලයිබීරියාව රටේ සේවය කරලා තියෙනවා.

ප්‍ර : ඒ කියන්නේ සාම සාධක හමුදාවේ ඔබ සේවය කෙරුවේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔබ ලංකාවේ මොන මොන ප්‍රදේශවල සේවය කරලා තියෙනවද?

පි : මම මුලින්ම පිළියන්දල පොලිස් ස්ථානයේ, ඉන්පසුව කොහුවල, ඉන් අනතුරුව කෑගල්ල කොට්ඨාශය අවිස්සාවේල්ල, කොස්ගම, දැදිගම, ආපසු මම ත්‍රිකුණාමලය, මොණරාගල, පෑලියගොඩ, අනුරාධපුර සහ මඩකලපුව. අවසාන වශයෙන් දැනට කොළඹ අපරාධ කොට්ඨාශයේ රාජකාරී කරනවා.

ප්‍ර : ඒ කියන්නේ බස්නාහිර, උතුරු මැද, නැගෙනහිර කියන මේ හැම පළාතකම ඔබ සේවය කරලා තියෙනවා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : නැගෙනහිර පළාතේ ඔබ සේවය කළේ කුමන පොලිස් ස්ථානයකද?

පි : මම 2017 අගෝස්තු 01 වෙනිදා සිට ස්ථානාධිපති, කාත්තන්කුඩි ලෙස රාජකාරී භාර ගත්තා.

ප්‍ර : ඔබට පෙර කාත්තන්කුඩිය පොලීසියේ ස්ථානාධිපතිවරයා විදියට රාජකාරී කළේ කවුද?

පි : වෙදගෙදර කියලා ප්‍රධාන පොලිස් පරීක්ෂක මහත්මයෙක් රාජකාරී කළේ.

ප්‍ර : ඔබ කාත්තන්කුඩිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා විදියට 2017 අගෝස්තු 01 වෙනිදා නේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : සේවය භාර ගන්නකොට නැගෙනහිර පළාත භාරව රාජකාරී කළ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා කවුද?

පි : එවකට මම රාජකාරී භාර ගන්න අවස්ථාවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සුමිත් වීරසිංහ මහතා විශ්‍රාම ගිහිල්ලා හිටියා. ඉන් අනතුරු මම රාජකාරී වාර්තා කර ටික දිනකට පසු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කපිල ජයසේකර මහත්මා රාජකාරී වාර්තා කළා.

ප්‍ර : මා කිව්වෝතින් නිවැරදිද 2019 අප්‍රේල් මාසේ 21 වෙනිදා වනවිටත් ඔබ සඳහන් කළ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කපිල

FAIR COMMENT BY JEZEEM

ජයසේකර මහතා තමයි එම තනතුරේ රාජකාරී කළේ කියලා නැගෙනහිර?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එහෙම නම් ඔබට කියන්න පුළුවන්ද ඔබ 2017 අවුරුද්දේදී කාත්තන්කුඩිය පොලිස් ස්ථානය භාර ගන්නකොට මඩකලපුව කොට්ඨාශය භාරව හිටපු නියෝජ්‍ය පොලිස්පතිවරයා කවුද?

පි : ස්වාමීනි එවකට හිටියා නියෝජ්‍ය පොලිස්පති දැනට විශ්‍රාම ගියා ....,

ප්‍ර : මතක නැද්ද?

පි : මතකෙට ...,

ප්‍ර : හරි. ඒක මතක නැත්නම් එහෙනම් අපිට කියන්න 2019 අප්‍රේල් මාසේ 21 වෙනිදා වෙනකොට මඩකලපුව ප්‍රදේශය භාරව හිටපු ඒ කියන්නේ විශේෂයෙන් ඔබේ පොලිස් ස්ථානය භාරව හිටපු නියෝජ්‍ය පොලිස්පතිවරයා කවුද?

පි : අයේෂ කරුණාරත්න. නියෝජ්‍ය පොලිස්පති අයේෂ කරුණාරත්න.

ප්‍ර : එතකොට ඔබ සාමාන්‍යයෙන් කෙළින්ම වාර්තා කරන සහකාර පොලිස් අධිකාරීවරයා කවුද? ඔබේ පොලිස් ස්ථානය භාරව හිටපු 2017 ඔබ රාජකාරී භාර ගන්නකොට?

පි : මම රාජකාරී භාර ගන්න අවස්ථාවේ එවකට පොලිස් අධිකාරී කීර්ති කියලා මහත්මයෙක් භාරව සිටියේ. ඉන් අනතුරුව සහකාර පොලිස් අධිකාරී එල්.ආර්. කුමාරසිරි කියන මහත්මයා කාත්තන්කුඩි පොලිස් ස්ථානය භාරව කටයුතු කළා.

ප්‍ර : 2019 අප්‍රේල් 21 වෙනකොට කවුද සහකාර පොලිස් අධිකාරී විදියට කටයුතු කළේ?

පි : එල්.ආර්. කුමාරසිරි මහත්මයා භාරව කටයුතු කළේ.

ප්‍ර : දැන් ඔබ ඔබේ පදිංචිය ඔය නැගෙනහිර පළාතේ නෙමෙයිනේ නේද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔබ හංවැල්ලේද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : දැන් කාත්තන්කුඩිය පොලීසියට ස්ථාන මාරුව ලැබුණට පස්සේ ඔබේ වසම පොලිස් වසමේ තොරතුරු බලන්නට ඔබ සැරිසැරුවද රාජකාරිමය වශයෙන්?

පි : එහෙමයි ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට ඔබට දකින්නට ලැබුණද දිවයිනේ සාමාන්‍ය අනෙක් පළාත්වලට වඩා යම් වෙනස්කම් මේ පළාත්වල? (මුඩ්ලියර් C-592 සිට 595 දක්වා)

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : මොනවද ඒ දකින්නට ලැබුණු වෙනස්කම්?

පි : විශාල වශයෙන්ම කාත්තන්කුඩි නගරයේ මුස්ලිම් ජනතාව සහ දමිළ ජනතාව වැඩි වශයෙන් ජීවත් වුණා. නගරයේ කිලෝ මීටරයකට ආසන්න ප්‍රමාණයක් කඩ වීදි දෙපසටම තියෙන්නේ. වෙළඳ කටයුතු ප්‍රධාන වශයෙන්ම ජනතාව මුස්ලිම් සහ දමිළ ජනතාව පවත්වාගෙන ගියේ.

ප්‍ර : ඒ නගරයට ප්‍රවිෂ්ඨ වන ස්ථානයේ කිසියම් අනෙක් නගරවල දකින්නට නැති ආකාරයේ යම් සුවිශේෂ ලක්ෂණයක් එහෙම දකින්න තියෙනවද?

පි : එහෙමයි ස්වාමීනි. නගරයට ඇතුල් වනවාත් එක්කම විශාල ආරුක්කුවක් හදලා තියෙනවා.

(ස්වාමීනි සාක්ෂිකරුගේ අවධානයට C-592 ලේඛනය යොමු කොට සිටිනවා)

ප්‍ර : ඔබ මෙම ඡායාරූපයේ දැක්වෙන ස්ථානය හඳුනනවද?

පි : මේ නගරයට ඇතුල්වන ස්ථානය.

ප්‍ර : මොන නගරයටද?

පි : කාත්තන්කුඩි නගරයට.

ප්‍ර : කාත්තන්කුඩි නගරයට ඇතුල්වන ස්ථානය?

පි : එහෙමයි.

ප්‍ර : දැන් මා කිව්වෝතින් නිවැරදිද එහි පිවිසෙන අය පිළිගන්නට, සාදරයෙන් පිළිගන්නට සිංහල, දෙමළ, ඉංග්‍රීසි වගේම අරාබි අක්ෂරවලිනුත් යම් සටහනක් තියෙනවා කියලා?

පි : සිංහල භාෂාවෙන් නොමැති අතර, දමිළ බසින් සහ ඉංග්‍රීසි බසින් තියෙනවා.

ප්‍ර : විතරද?

පි : සහ අරාබි අක්ෂර ....,

ප්‍ර : දැන් අරාබි දන්නවා ඇතිනේ එහේ ඉඳලා නේ. අරාබි අක්ෂර පේනවද? ඉස්සරලා හිටපු සාක්ෂිකාරයෝ නම් ඔහේ සේවය කරපු අය හඳුනා ගත්තා.

පි : අරාබි අක්ෂර තියෙනවා.

ප්‍ර : මම ඔබෙන් මූලිකව අහන්නට තිබුණු ප්‍රශ්නයක්. මට පොඩ්ඩක් මතක නැති වුණා. ප්‍රධාන පොලිස් පරීක්ෂක කස්තුරිආරච්චි

Interpreter/Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මහත්මයාට මෙම ගරු කොමිෂන් සභාව ඉදිරියට පැමිණිලා සාක්ෂි දීම සඳහා නොතීසියක් ලැබුණා නේද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ නොතීසිය සමඟ මතකද ලැබුණා තවත් ලේඛනයක් දැනුම් දීමක්? ඔබට කොමිෂන් සභා පනතේ 16 වන වගන්තිය යටතේ කටයුතු කරමින් නීතීඥ සහායක් ලබාගත හැකි වන බව?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එතකොට ඔබ අද නීතීඥ සහායක් ලබා ගන්නවද මේ සාක්ෂි සටහන්වලට සම්බන්ධ වෙනකොට?

පි : නැහැ ස්වාමීනි. මම රාජකාරී කරපු කාලය තුළ මට සාක්ෂි දෙන්න පුළුවන් ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබ හොඳට තීරණය කරලා තමයි එතකොට අද ඇවිල්ලා තියෙන්නේ නීතීඥ සහායක් නැතුව නේද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබේ අවධානය මා යොමු කෙරුවේ ඔය C-592 ටනේ ඒ ප්‍රශ්නය අහන්නට ඉස්සරලා. එතකොට ඔබ කිව්වා ඔබ දැකලා තියෙනවා කියලා අරාබි අක්ෂරවලිනුත් ඒ පුවරුවල සටහන් කිරීම් සිදුවෙලා තියෙනවා කියලා නේද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ වගේම බලන්නකෝ C-595 වශයෙන් ලකුණු කරලා තියෙන ඡායාරූපය. ඒ ස්ථානය ඔබ දැකලා තියෙනවද? ඔය ආරුක්කුව දැකලා තියෙනවද?

පි : මතකයේ තියෙනවා ස්වාමීනි.

ප්‍ර : කොහේද ඒක තියෙන්නේ?

පි : මේක නගර මධ්‍යයේ වගේ මතක තියෙන්නේ.

ප්‍ර : ඕකත් තියෙන්නේ කාත්තන්කුඩියෙද? ඕකේ Batticaloa කියලා ගහලා තියෙනවා. ඔකත් කාත්තන්කුඩියෙද තියෙන්නේ? මම ගිහිල්ලා නැහැ ඒකයි මම ඇහුවේ?

පි : මඩකලපුව ප්‍රදේශයේ මතකයක් නැහැ ස්වාමීනි.

ප්‍ර : කාත්තන්කුඩියේ තමයිද තියෙන්නේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔයිට ඉස්සර වෙලා ඒ කියන්නේ C-594 ලේඛනය බලන්නකෝ ඡායාරූපය. ඒ ඡායාරූපයේ තියෙනවා නේද කොළ පැහැති පුවරුවක්?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ස්තුතියි නැවත එන්න කියලා.

පි : එහෙමයි ස්වාමීනි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එහි තියෙනවද ඒ ස්ථානය කොහේද ඔබ දැකලා තියෙනවද ඒක? ඔය පුවරුව තියෙන්නේ මොන නගරයේද කියලා?

පි : කාත්තන්කුඩි කලවංචිකුඩි දෙස සිට පැමිණෙනකොට හමුවෙන ....,

ප්‍ර : කලවංචිකුඩි ඉඳලා කොහේට එනකොටද ඒක ...?

පි : කාත්තන්කුඩි දෙසට පැමිණෙනකෙට දිස්වන පුවරුවක් ස්වාමීනි.

ප්‍ර : එතන නම් තියෙනවා ස්තුතියි, නැවත එන්න, කාත්තන්කුඩි කියලා ගහලා සිංහලෙනුත් නේද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එතකොට ඒකේ දකින්න තියෙනවා දෙමළෙන්, සිංහලෙන්, ඉංග්‍රීසියෙන් ඒ වගේම අරාබි අක්ෂරවලින්?

පි : එහෙමයි ස්වාමීනි.

දැන් වේලාව : ප.ව. 5.30 යි
මෙතැන් සිට මුතුමාලි මෙනෙවිය

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව : ප.ව.05.30 යි.
පෙර සටහන් ල/ලේ : ඉන්ද්‍රාණි මිය.
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප : දැන් ඔය කාත්තන්කුඩියේ දකින්න ලැබෙන වෘක්ෂලතා බැලුවාම ඒ වෘක්ෂලතා සාමාන්‍යයෙන් අනිත් දිවයිනේ අනිත් ප්‍රදේශවල දකින්න තියෙන්න වෘක්ෂලතා විතරමද එහේ දකින්න තියෙන්නේ?

පි : නගර මධ්‍යයේ ස්වාමිනි රට ඉඳි ගස් වගා කරලා තියෙනවා.

ප්‍ර : ඒවා ස්වභාවික රටඉඳි ගස්?

පි : නෑ ස්වාමිනි හිටවපුවා.

ප්‍ර : ඒවායේ ඵලදාව එහෙම තියෙනවාද?

පි : ඵලදාව තියෙනවා ස්වාමිනි.

ප්‍ර : එතකොට කෘතිමව හදපු රටඉඳි ගසුත් දකින්න තිබ්බද?

පි : මේ නගර මධ්‍යයේ තියෙන සියළුම කෘතිම නොව හොඳ ඒවා.

ප්‍ර : ඒ මැද තීරුවේ නේද ?

පි : මැද තීරුවේ ඔක්කොම ඵලදාව ලබා ගන්න රටඉඳි ගස්.

ප්‍ර : ඔව් එතකොට එහෙම නම් C 593 වශයෙන් ලකුණු කරලා ඔබේ අවධානයට යොමු කරන ඔය ඡායාරූපය එහි දැක්වෙන ස්ථානය ඔබ දැකලා තියෙන්නේ කාත්තන්කුඩියේද ?

පි : මගේ මතකේ හැටියට කාත්තන්කුඩි නගරයේ පමණයි මේ නගර මධ්‍යයේ මෙම රටඉඳි වගාවන් හිටවලා තිබුණේ ස්වාමිනි.

ප්‍ර : ඔබට පෙර මේ ගරු කොමිෂන් සභාවට සාක්ෂි දුන්න ප්‍රධාන පොලිස් පරීක්ෂක වෙදගෙදර මහත්මයා ඔබේ පූර්ව ගාමියා ඔබේ පොලිස් වසම සහ ප්‍රාදේශීය වසම ආශ්‍රිත සියළුම කරුණු කියලා තියෙන හින්දා මම ඔබෙන් ඒ පිළිබඳව මේ වේලාවේ කාලය වැය කරමින් අහන්නේ නෑ. හැබැයි ඔබට කියන්නට පුළුවන්ද 2018 අවුරුද්ද වෙන කොට කාත්තන්කුඩියේ මුස්ලිම් ජන කොට්ඨාශය කොපමණ පමණ වුණාද කියලා?

පි : 62000 කට ආසන්න මුස්ලිම් ජනගහනයක් හිටියා මතක විදිහට.

ප්‍ර : 2018 වෙන කොට 62000 ක්?

පි : එහෙමයි ස්වාමිනි. 66000 ක්.

ප්‍ර : මම දන්නේ නෑ 48093 කියලා තියෙන්නේ?

පි : දම්ළ ජනගහනය .

ප්‍ර : නෑ නෑ ළමයා. දැන් මම ඔබට කියන්නට පුළුවන් මේ ජන කොට්ඨාශ දැන් විවිධ අය ජීවත් වුණානේ ඔබේ ඒ කාලය තුළදී කාත්තන්කුඩියේ?

පි : එහෙමයි ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මුස්ලිම් ජන කොට්ඨාශ ජීවත් වුණාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ද්‍රවිඩ ජන කොට්ඨාශ ජීවත් වුණාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : සිහල ජන කොට්ඨාශ ජීවත් වුණාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : බර්ගර් ජන කොට්ඨාශ ජීවත් වුණාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එහෙනම් ඔබට කියන්නට පුළුවන් මොන වකවානුවේද මේ අයගේ සංයුතිය කොහොමද කියලා කාත්තන්කුඩිය ප්‍රදේශයේ ඔබේ පොලිස් වසම තුළ ඔබ 2017 නේ දැන් වාර්තා කළේ අගෝස්තු මාසේ 01 වෙනිදා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : කවදා වෙනකම් ඒ ස්ථානයේ සේවය කළාද?

පි : මම 2019 ජනවාරි මස වෙනකම් රාජකාරි කළා.

ප්‍ර : 2019 ජනවාරි මාසේ වෙනකම්?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔබට මේ කාල වකවානුව තුළදී කියන්නට පුළුවන්ද දළ වශයෙන් මුස්ලිම් ජන ගහනය කොච්චර විතර හිටියාද කියලා හැබැයි අවුරුද්දත් දෙන්න පුළුවන් නම් තමයි හොඳ?

පි : නිශ්චිත ස්වාමිනි ජනගහනයක් දෙන්න මතකයක් නෑ නමුත් වැඩිපුර මුස්ලිම් ජනතාවක් තමයි වාසය කළේ කාත්තන්කුඩි පොලිස් වසමේ.

ප්‍ර : ඔබ 2019 ජනවාරි ද අයින් වුණේ කාත්තන්කුඩියෙන් නැත්නම් 2020 ද?

පි : 2019 සමාවෙන්න ස්වාමිනි 2020 ජනවාරි.

ප්‍ර : ඒකනේ ?

පි : එහෙමයි.

ප්‍ර : 2020 නේද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට කොයි කාලේද ඔබට කියන්න පුළුවන් ඒක මතක තියෙනවාද? ඔබට මතකද අපේ විමර්ශන අංශය ඔබගේ ප්‍රකාශයන් වාර්තා කරන අවස්ථාවේදී ඔබෙන් මේ පිළිබඳව විමසුවා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ අවස්ථාවේදී ඔබ කියලා තියෙනවා ඔවුන්ට දැනුම් දීලා තියෙනවා නම් 2018 අවුරුද්දේදී මුස්ලිම් ජන කොට්ඨාශයේ ගණනය 48093 ක් වුණා කියලා ඒක නිවැරදි වෙන්න ඕනීද?

පි : එහෙමයි ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ වගේම ඔබ කියලා තියෙනවා නම් ද්‍රවිඩ ජන කොට්ඨාශයේ සංයුතිය 41211 ක් කියලා ඒක නිවැරදිද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : සිංහල ජන කොට්ඨාශය 22 ක් කියලා කියනවා නම් ඒක නිවැරදිද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ වගේම බර්ගර් ජාතිකයින් 4231 ක්

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : කාත්තන්කුඩියේ ජීවත් වෙලා තියෙනවා කියලා ඔබ කියලා තියෙනවා නම් 2018 අවුරුද්දේ අපේ විමර්ශන අංශයට ඒක නිවැරදිද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔබ දැන් මේ ප්‍රදේශයේ සැරි සැරුවයි කියලා කිව්වනේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබේ පොලිස් වසම වටා තියෙන්නේ මොන ගම් ප්‍රදේශයද?

පි : මුස්ලිම් සහ දමිළ ජන කොටස් මධ්‍යයේ තමා මුස්ලිම් ජනතාව වාසය කළේ කාත්තන්කුඩි.

ප්‍ර : නම් මොනවාද ඒවායේ?

පි : ප්‍රධාන වශයෙන් කාත්තන්කුඩි, පාලමුණ.

ප්‍ර : ඔළුවිල් තියෙන්නේ පාලමුණද?

පි : ඔළුවිල්.

ප්‍ර : තියෙන්නේ පාලමුණද?

පි : ඔළුවිල් කියලා

ප්‍ර : ඔළුවිල් තියෙන්නේ පාලමුල නෙවෙයිද? ආ... හරි කියන්නකෝ පාලමුණ ?

පි : ඔල්ලිකුලම්.

ප්‍ර : අ.....

පි : ඔල්ලිකුලම් වැනි ඒ ප්‍රධාන වශයෙන් නගර ස්වාමිනි ප්‍රධාන නගර. අනිත් දෙපසට ආරියම්පති සහ කල්ලඩි දෙපැත්තම දමිළ ජනතාව වාසය කළේ.

ප්‍ර : ඔය කාත්තන්කුඩිය මධ්‍යයේ දිවෙන මහ මාර්ගයක් තියෙනවාද?

පි : ප්‍රධාන මාර්ගයක්.

ප්‍ර : මොකක්ද ප්‍රධාන මාර්ගය?

පි : ඒක මඩකලපුවේ සිට අම්පාර දක්වා දිවෙන ප්‍රධාන මාර්ගය ස්වාමිනි.

ප්‍ර : ඔබ ඔබේ වසමේ සංචාරය කරන කොට සහ එහේ හිටපු කාලය තුළදී පාර්ශවයන් ඒ කියන්නේ සියළු ජන කොට්ඨාශ සාමයෙන් සමගියෙන් කටයුතු කෙරුවාද?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පි : මම භාර ගන්න අවස්ථාවේ ඉතාමත් සාමකාමී තත්ත්වයක් තිබුණේ ස්වාමිනි.

ප්‍ර : 2018 අවුරුද්දෙදී ඒ කියන්නේ කිසිම ප්‍රශ්නයක් කිසිම ජන කොට්ඨාශයක් විසින් වාර්තා වුණේ නැද්ද ?

පි : 2018 වර්ෂයේදී එහෙම වාර්තා වුණේ නෑ.

ප්‍ර : වාර්තා වුණේ නෑ. ගරු කොමිෂන් සභාවේ ගරු සභාපතිතුමාගේ කරන ලද දැනුම් දීම අනුව මා කැමති ඔබෙන් දැන ගන්න කාත්තන්කුඩිය නගරයේ ග්‍රාම නිලධාරී වසම් කීයක් තියෙනවාද?

පි : 58 ක් තියෙනවා ස්වාමිනි ග්‍රාම සේවා වසම්. ග්‍රාම සේවා වසම් 58 යි ස්වාමිනි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනක් තියෙනවා ස්වාමිනි. ආරියම්පති, කාත්තන්කුඩි සහ මඩකලපුව.

ප්‍ර : ඉස්සෙල්ලා කිව්වේ කීයද 65000 යි කියලා කිව්වා නේද?

පි : 62000 කට ආසන්නව.

ප්‍ර : මුස්ලිම්?

පි : මුස්ලිම්.

ප්‍ර : කොහෙන්ද ඒ තොරතුරු ගන්නේ?

පි : ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්.

ප්‍ර : ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් නේද?

පි : එහෙමයි ස්වාමිනි.

(ස්වාමිනි ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා මා විසින් සාක්ෂිකරුගේ අවධානය ඔහුගේ ප්‍රකාශයේ සඳහන් ජන සංයුතියට අදාළව යොමු කරන ලද ප්‍රශ්නයක් ඊට අදාළ පිළිතුරුත් අද දින කාර්ය සටහන් වලින් ඉවත් කර ගන්නට මන්ද එම කරුණු නිවැරදි නොවන බව පෙනී යන හෙයින් එම කරුණු නැවත සාක්ෂිකරුගේ අවධානයට යොමු කරලා ඇසීමට බලාපොරොත්තු වෙනවා.)

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>
අවසර ලබා දෙමි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>
ස්තූතියි ස්වාමිනි.

ප්‍ර : කස්තුරි ආරච්චි මහත්මයා මා නැවත ඔබේ අවධානය යොමු කරනවා මා කලින් අසන ලද ප්‍රශ්නයකට ඔබ කිව්වා කාත්තන්කුඩිය ප්‍රදේශයේ ඔබ ස්ථානාධිපතිවරයා විදිහට රාජකාරී භාර ගන්න කොට එහි මුස්ලිම්, ද්‍රවිඩ, සිංහල සහ බර්ගර් ජාතිකයින් ජන කොට්ඨාශ ජීවත් වුණාය කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට කී දෙනෙක් විතර හිටියාද මුස්ලිම් ජන කොට්ඨාශයේ ?

FAIR COMMENT BY JEZEEM

පි : ස්වාමිනි මම ප්‍රකාශය ලබා දීමට එනකොට නිවැරදි තොරතුරු ලබා ගෙන ආවේ ඒක දැනට මගේ මතකයේ නෑ.

ප්‍ර : දැන් ඔය ජන කොට්ඨාශ හතර ගත්තාම කාත්තන්කුඩිය පොලිස් වසමේ බහුතරයක් විදිහට ජීවත් වුණේ මොන ජන කොට්ඨාශයද?

පි : මුස්ලිම් ජනතාව ස්වාමිනි.

ප්‍ර : මුස්ලිම් ජන කොට්ඨාශය?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට දැන් ඔබ දන්නවාද මුස්ලිම් ජන කොට්ඨාශය ඉස්ලාම් ආගම අදහන බව?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔය කාත්තන්කුඩිය පොලිස් වසමේ සූනි මුස්ලිම්වරු ජීවත් වෙනවාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මම අදහස් කළේ කාත්තන්කුඩිය පොලිස් වසමේ මම මේ අහන්නේ කාත්තන්කුඩිය පොලිස් වසම ගැන?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මගේ වචන වැරදි වුනොත් වැරදියට තේරුම් ගන්න එපා. ඔබේ වසමේ කාත්තන්කුඩිය වසමේ ඔබ කියන්නේ බහුතරයක් මුස්ලිම් ජන කොට්ඨාශය තමයි ජීවත් වුණේ කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔබ දන්නවාද ඒ ජන කොට්ඨාශය ඔබ දන්නවානේ ඉස්ලාම් ආගම අදහනවා කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : නමුත් ඒ ජන කොට්ඨාශයේ ඔවුන් අතර යම් යම් නිකායන් තිබුණාද ඔවුන් යම් නිකායන්වලට ඒ ආගම යටතේ අයිති වෙලා හිටියාද?

පි : ඉස්ලාම් ධර්මයේ කොටස් කිහිපයක් බෙදිලා ලොකු පල්ලි පවත්වාගෙන ගියා ස්වාමිනි.

ප්‍ර : මොනවාද ඒ කොටස්?

පි : එහි ප්‍රධාන වශයෙන් බදුර්යා කියන පල්ලිය , රවුෆ් මවුලවි කියන

ප්‍ර : රවුෆ් මවුලවි යටතේ

පි : රවුෆ් මවුලවි යටතේ පවත්වන මුස්ලිම් පල්ලිය සහ තව තිබුණා පයිල්වාන් කියලා පල්ලි දෙකක් තිබුණා .

ප්‍ර : පයිල්වාන් කියන්නේ?

පි : පයිල්වාන්.

ප්‍ර : මොකක්ද ඒ?

පි : එතන ස්වාමිනි මූලික වශයෙන් එකම පල්ලියක් හැටියට තිබිලා පසුව ඒ දෙගොල්ල අතරත් ආරවුලක් ඇති වෙලා දෙකට බෙදිලා එකම ස්ථානය දෙකට බෙදා ගෙන පල්ලි පවත්වාගෙන ගියා.

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

හැබැයි ඒ ගොල්ලො ප්‍රධාන වශයෙන්ම භාවනා කටයුතු සම්බන්ධයෙන් තමා නිරත වෙලා හිටියේ. නමුත් ඒගොල්ලොත් වන්දනා කළා එම ස්ථානවල මිනි වළලලා තියෙන ඒවාට පුජාවන් පැවැත්වුවා.

ප්‍ර : එතකොට දැන් ඔය මේ තවුහිද් ජමාත් කියලා සංවිධානයක් තිබුණාද?

පි : ශ්‍රී ලංකා තවුහිද් ජමාත් කියලා තිබුණා.

ප්‍ර : ශ්‍රී ලංකා තවුහිද් ජමාත් කියලා තිබුණා?

පි : SLTJ එහෙමයි ස්වාමිනි.

ප්‍ර : යම් අවස්ථාවකදී ඔබේ කාල පරිච්ඡේදය තුළදී ජාතික තවුහිද් ජමාත් කියලා සංවිධානයක් ගැන ඔබට අහන්න ලැබුණාද?

පි : පැහැදිලි නෑ ස්වාමිනි.

ප්‍ර : ඔබ කිව්වනේ ශ්‍රී ලංකා තවුහිද් ජමාත් SLTJ තිබුණාය කියලා?

පි : ඔව්.

ප්‍ර : SLTJ එතකොට යම් අවස්ථාවකදී NTJ ?

පි : NTJ එහෙමයි නැෂනල්.

ප්‍ර : නැෂනල් තවුහිද් ජමාත් කියන සංවිධානයක් ගැන ඔබට අහන්න ලැබුණාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට තබ්ලික් ජමාත් කියලා සංවිධානයක් ගැන අහන්න ලැබුණාද ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ජමාතේ ඉස්ලාම් කියලා දෙයක් ගැන අහන්න ලැබුණාද ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් ඔබ කිව්වා මගේ ප්‍රශ්නෙකට පිළිතුරු දෙන ගමන් ඔබේ වසමේ සංචාරය කරන කොට ඔය රාජකාරී භාර ගත්තට පස්සේ ඔබ දැක්ක දෙයක් තමයි කියලා මේ කලබල නැති බොහොම සන්සුන් පරිසරයක් එහි තිබුණා කියලා? කලබල තිබුණ් නෑ කියලා?

පි : ඔව් මහජන කලබල තිබුන් නෑ නමුත් නිතරම තදබද ස්භාවකින් තිබුණ නගරයක්.

ප්‍ර : ඔව් ඒ මොකද මා කිව්වොතින් නිවැරදිද ලංකාවේ ජනගහනය බැලුවාම නගරවල වැඩිම ජනගහනයක් ජීවත් වෙන්නේ කාත්තන්කුඩිය ඔය නගරයේ කියලා?

පි : එහෙමයි ස්වාමිනි අඩුම භූමි ප්‍රමාණයක වැඩිම ජනගහනයක් ජීවත් වන

ප්‍ර : ජීවත් වෙනවා කාත්තන්කුඩියේ?

පි : එහෙමයි ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට ඔය ඔබ දැන ගෙන හිටියාද මේ මුස්ලිම් ජන කොටඨාශ එක කොටස් නිකායන්ට බෙදිලා ඒ ගොල්ලන් අතර යම් යම් මත ගැටුම් තිබුණා කියලා?

පි : මම භාර ගත්ත කාලය තුළදී එහෙම මත ගැටුම් තිබුණේ නෑ ස්වාමිනි.

ප්‍ර : ඔබ දැන ගෙන හිටියාද සූෆි මුස්ලිම් සහ වහබ්වාදීන් අතර කාත්තන්කුඩිය ඔබේ පොලිස් වසමේ නිරතුරුව අරගල තිබුණායි කියලා?

පි : එහෙමයි ස්වාමිනි මා රාජකාරී භාර ගැනීමට පෙර තිබූ තත්ත්වය ඉතාම කලබලකාරී තත්ත්වයක් සහ ප්‍රශ්නකාරී තත්ත්වයක් උදා වෙලා තිබ්බ නගරයක්.

ප්‍ර : ඇයි ඔබ විශේෂණයක් ඇතුළත් කළේ මා රාජකාරී භාර ගන්නට පෙර කියලා?

පි : මා භාර ගන්නා කාලේදී කිසිම ගැටලුකාරී තත්ත්වයක් තිබුන් නෑ ස්වාමිනි.

ප්‍ර : නමුත් ඔබ එසේ කියනවා නම් ඔබේ කාලයට පෙර ඇති වුණ ඒ යම් ගැටලු නිසා ඇති වූ ඒ අරගල නිසා ආරම්භ වුණු නඩු කටයුතු ඔබේ කාලය තුළදීත් පවතින්නට ඇති?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : නේද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට ඒ සම්බන්ධයෙන් දැන් පොලිසියේ විමර්ශන කටයුතු සිදු වන්නට ඇතිනේ ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ විමර්ශන කටයුතු කරන කොට ඔබ කොහොමද ඒ විමර්ශන අධීක්ෂණය කළේ?

පි : මා භාර ගත්තයින් පසු ස්ථානය ස්වාමිනි මට දර්ශනයට ලක් වුණා විමර්ශනයට ලක් වුණා මේ කණ්ඩායම් දෙකක් අතර NTJ සහ රවුෆ් මවුලවි කියන කණ්ඩායම් දෙක අතර ආරවුලක් ඇති වුණු බවට?

ප්‍ර : ඔව්.

පි : ඊට පෙර සෑම සිකුරාදා දිනකම මේ NTJ මෙහි ප්‍රධානීයා සහරාන් කියන පුද්ගලයා සිකුරාදා පල්ලි අවසන් වීමෙන් පසු අන්තවාදී දේශනාවල් කරමින් ධර්මය කළා ඔහු විසින් ඉස්ලාම් ධර්මයම විවේචනයට ලක් කරමින් අනික් අයත් සමඟ ගැටුම්කාරී ස්වභාවයක් තිබුණු බව මා දන්නවා.

ප්‍ර : ඒ කියන්නේ ඔබ ඔබේ පොලිසියේ විමර්ශනයන් අධීක්ෂණය කිරීමේදී ද ඔය කරුණු දැන ගත්තේ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමිනි මා විමසීමට ලක් කළා. එතකොට නඩුවක් පවත්වාගෙන ගියා ඔය දෙක අතර සිදු වුණු NTJ සහ රවුෆ් මවුලවිගේ පල්ලිය අතර තිබුණ ගැටුම්කාරී තත්ත්වයෙන් අනතුරුව.

ප්‍ර : එතකොට දැන් යම් යම් කාලයෙන් කාලයට යම් යම් නඩු කටයුතුවල කරුණු වාර්තා කිරීම් කරනවානේ වැඩිදුර විමර්ශන පිළිබඳව ගරු අධිකරණයට?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට ඒ වගේ වේලාවක එම ඉදිරිපත් කරනු ලබන වැඩිදුර වාර්තා ඔබ විසින් අත්සන් කරනු ලබනවාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබ ඒවා අත්සන් කරන්නේ ඒවා කියවලා බලලාද?

පි : දමිළ බසින් තියන ඒවා ස්වාමිනි සියළුම චෝදනා පත්‍ර සහ බී වාර්තාවන්. නමුත් ඒක තේරුම මට සිංහල තේරුම ලබා ගෙන අත්සන් කරනවා ස්වාමිනි.

ප්‍ර : ඔව් ඒ කියන්නේ යමක් අත්සන් කරන කොට වගකීම ඔබටනේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : නේද ප්‍රධාන පොලිස් පරීක්ෂක එතකොට ඒ නිසා ස්ථානාධිපතිවරයා විදියට ඔබ කියන්නේ ඔබ ඒ ගරු අධිකරණයේ ගොනු කරන්නට යන වාර්තාව ද්‍රවිඩ භාෂාවෙන් තියෙන එක කියවලා බලලා ඒක ගැන කාගෙන් හරි පැහැදිලි කිරීමක් අරගෙන අවබෝධයකින් යුතුව තමයි අත්සන් කරන්නේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ වගේම ඔබ මේ ගරු කොමිෂන් සභාවට කිව්වා ඔබ ඔබේ ස්ථානයේ කරන ලද විමර්ශන පිළිබඳවත් නිරතුරුව සොයලා බැලුවයි කියලා ඒ වගේම ඒ අයට උපදෙස් දෙන්නටත් ඇති මොනවාද කරන්නට ඕනී කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබ යටතේ 2017 අගොස්තු 01 වෙනිදා ඉඳලා 2020 ජනවාරි වෙනකම් කොපමණ පමණ නිලධාරීන් සංඛ්‍යාවක් කාත්තන්කුඩිය පොලිස් ස්ථානයේ සේවය කෙරුවාද?

පි : මා භාර ගන්නා අවස්ථාවේ ස්වාමිනි නිලධාරීන් 125 කට පමණ ආසන්නව තිබුණා.

ප්‍ර : ඔව්.

පි : ඉන් අනතුරුව කෙමෙන් නිලධාරීන් අඩු වෙලා ගියා. 90 කට වගේ ප්‍රමාණයක් මා ස්ථාන මාරුවීම් ලබා එන කොට ප්‍රමාණය අඩු වුණා.

ප්‍ර : දැන් ඔබේ පුර්වගාමීයා ප්‍රධාන පොලිස් පරීක්ෂක වෙදගෙදර මහත්මයා මේ ගරු කොමිෂන් සභාවේ සාක්ෂි දෙන ගමන් සඳහන්

FAIR COMMENT BY JEZEEM

කළා ඔහුගේ ධුර කාලය තුළදී කාත්තන්කුඩිය පොලිස් ස්ථානයේ 170 ක් පමණ වූ නිලධාරීන් සංඛ්‍යාවක් අනුයුක්ත වෙලා හිටියා කියලා? දැන් ඔබ කියනවා ඔබ සේවය භාර ගත්තාට පස්සේ ස්ථානාධිපතිවරයා විදිහට එතකොට 120 ක් හිටියා ඊට පස්සේ ඒක අනුගාණකට වගේ අඩු වුණා කියලා? ඇයි මේ පොලිස් ස්ථානයේ නිලධාරීන් සංඛ්‍යාව අඩු වුණේ?

පි : ස්වාමිනි මා සංඛ්‍යා ලේඛන වශයෙන් ස්වාමිනි එම දත්තයන් 170 බවට දර්ශනය වුණා. නමුත් වසර දෙකක් වැනි කාලේකට තමයි නිලධාරීන් ක්‍රියාන්විත ප්‍රදේශවල රාජකාරි කරන්නේ. එහෙම ක්‍රියාන්විත රාජකාරිවල රාජකාරි කරලා නිලධාරියා ස්ථාන මාරු වීම් යන කොට ඒ වෙනුවෙන් තවත් නිලධාරියෙක් බොහෝ වේලාවට ලැබෙන්නේ නෑ.

ප්‍ර : ඒ පිළිබඳව ඔබේ උසස් නිලධාරීන්ට දැනුම් දෙන්නේ නැද්ද ?

පි : සාමාන්‍ය ස්වභාවය ස්වාමිනි නිලධාරීන්ගේ ඌණතාවය නිසා ඒ විදිහට තමයි රාජකාරි ඉන්න නිලධාරීන්ගෙන් සිදු කර ගෙන යෑමට සිදු වුණේ.

ප්‍ර : ඔබ දන්නවාද සහරාන් කියන ජාතික තවුහිද් ජමාත් නායකයාත් ඒ වගේම රවුෆ් මවුලවිගේ කණ්ඩායමත් ඒ කියන්නේ සුන්නතුල් වල් ජමාත් කණ්ඩායමේ නායකයාත් ඔහුගේ සාමාජිකයනුත් අතර අලියාර් හංදියේදී යම් ගැටුමක් සිද්ධ වෙලා තිබුණා කියලා?

පි : එහෙමයි ස්වාමිනි. සිදු වීමක් තිබුණා පෙට්‍රල් බෝම්බ යොදා ගෙන සහ පිහිවලින් කඩුවලින් පහර දීලා තුවාල සිදු කරලා තිබුණා නඩුවක් පවත්වාගෙන ගියා.

ප්‍ර : ඒ කියන්නේ ඔබ ඒ කරුණු දන්නවා නේද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් එම නඩුව ඔබ රාජකාරි භාර ගන්න කොට අවසන් වෙලා තිබුණාද?

පි : නෑ දිගටම ක්‍රියාත්මක වේලාම ඒ සම්බන්ධයෙන් 09 දෙනෙක් ගරු අධිකරණයට ඉදිරිපත් කරලා තිබුණා ස්වාමිනි.

ප්‍ර : ඔව්.

පි : හතර දෙනෙක් ප්‍රදේශය හැර මේ සිද්ධියෙන් පසු ප්‍රදේශය හැර ගොස් තිබුණා.

ප්‍ර : ඔබට මතකද කවුද ඒ සිද්ධියෙන් පස්සේ ප්‍රදේශය හැර ගිහිල්ලා තිබ්බ අය කියලා?

පි : ප්‍රධාන වශයෙන්ම සහරාන් සහ ඔහුගේ මොහොමඩ් සහරාන්, මොහොමඩ් රිල්වාන් ඔහුගේ සහෝදරයා තව ආමී මොහොමඩ් යනුවෙන් ඔහු සඳහන් වෙනවා සහ තව එක් පුද්ගලයෙක් ස්වාමිනි.

ප්‍ර : මා කිව්වොතින් නිවැරදිද අත්අඩංගුවට ගැනීමට නොහැකි වෙලා තිබුණේ සහරාන්, රිල්වාන්

FAIR COMMENT BY JEZEEM

පි : මොහේයිදීන්.

ප්‍ර : ආමී මොහේයිදීන් වෙන මොහොමඩ් සහරාන්, මොහොමඩ් රිල්වාන් බදුර්දීන් මොහොමදු මොහේයිදීන් නොහොත් ආමී මොහේයිදීන්, යුෂුෆ් අන්වර් නොහොත් අසාත්

පි : අස්දත්

ප්‍ර : අස්දත් ඒ අයව අත්අඩංගුවට ගන්නට බැරිවෙලා තියෙනවා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් ඔබට කියන්නට පුළුවන්ද එහෙම අත්අඩංගුවට ගන්නට බැරි වුණොත් යම් සැකකරුවන් පොලිසියට මොකක්ද ගන්නට පුළුවන් පියවර කියලා?

පි : පොලිස් වසමේ පදිංචි වෙලා නැන්නම් ස්වාමිනි අවට ස්ථානයන්ට දුරකථන පණිවිඩයක් ලබා දෙන්න පුළුවන් ස්වාමිනි. ගරු අධිකරණයට කරුණු වාර්තා කරන්න පුළුවන් මෙම සැකකරුවන් සම්බන්ධයෙන්.

ප්‍ර : අධිකරණයට කරුණු වාර්තා කරන්නට පුළුවන් සැකකරුවන් සම්බන්ධයෙන්?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට 2017 අවුරුද්දෙත් මාර්තු මාසේ නේද මේ සිද්ධිය වෙලා තිබුණේ අලියාර් හංදියේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : 10 වෙනිදා නේද?

පි : 10 වෙනිදා.

ප්‍ර : එතකොට ඔබ ආවේ අගෝස්තු මාසේ 01 වෙනිදා ඒ අවුරුද්දේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ වෙන කොට ගරු අධිකරණයට කරුණු වාර්තා කරලා තිබුණා නේද මඩකලපුව මහේස්ත්‍රාක් අධිකරණ නඩු අංක බී/276/2017 යටතේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එහෙම නම් දැන් අධිකරණයට කරුණු වාර්තා කරලා තියෙනවා නේද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට අර අධිකරණය මඟ හරින පොලිසිය මඟ හරින ඒ සැකකරුවන් සම්බන්ධයෙන් වෙන මොනවද ගන්න පුළුවන් පියවර කියලා ඔබ කියන්න?

පි : ස්වාමිනි ඒ වෙන කොට මෙම

ප්‍ර : සාමාන්‍යයෙන් ගන්න පුළුවන් පියවර කියලා අපි ඔතෙන්ට එමු.

පි : එහෙමයි.

ප්‍ර : කියන්නකෝ සාමාන්‍යයෙන් පොලිස් නිලධාරීයෙක් විදිහට මොනවද ගන්න පියවර කියලා ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔවුන් පදිංචි ස්ථානයන් සනාථ කර ගැනීම.

ප්‍ර : ඒකනේ අපි ඉස්සෙල්ලාම කරන්නේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඊට පස්සේ ඒ පදිංචි ස්ථානයේ ඉන්නවාද කියලා බලනවා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඊළඟට එතකොට කොහොමද ඒක බලන්නේ?

පි : ඒක ග්‍රාම සේවකගෙන් සහ අවට පිරිසගෙන් ප්‍රකාශයන් ලබා ගෙන තියෙනවා මොවුන් පදිංචි වෙලා සිටිනවාද කියලා.

ප්‍ර : ඒ හැරෙන්නට වෙන මොනාද කරන්න පුළුවන්?

පි : ඉන් අනතුරුව ඔවුන්ගේ හැඳුනුම්පත් අංකයන්ට අදාළව ඔවුන් පාවිච්චි කරනවාද කියලා ජංගම දුරකථනයන් පාවිච්චි කරනවා ද කියලා වාර්තාවන් අරගෙන තිබුණා දුරකථනවල.

ප්‍ර : ඔබේ කාලයේදී ඊට ඉස්සර වෙලාද?

පි : ඊට ඉස්සර කලින්.

ප්‍ර : ඊට ඉස්සර වෙලානේ අරන් තිබ්බේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ කියන්නේ පොලිස් පරීක්ෂක වෙද ගෙදර මහත්මයා තමයි ඒක කරලා තිබුණේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් ඒ ඇරෙන්නට සාමාන්‍යයෙන් ඔවුන්ගේ බැංකු ගිණුම් වගේ දේවල් බලලා පුළුවන් නේද ගරු අධිකරණය මඟින් නියෝගයක් අරගෙන ඔවුන් ඒ ගනුදෙනු කරලා තියෙනවා ද නැද්ද කියන එක පිළිබඳව දැන ගන්න? යම් කාලයක් තුළදී ඔවුන් අධිකරණය මඟ හැරලා ඉන්නවා නම් ඒ බැංකු ගිණුම් මාර්ගයෙන් ඔවුන් ගනුදෙනු කරලා තියෙනවාද ඒ කරුණු දැන ගන්න පුළුවන් නේද Banks accounts බලලා ?

පි : එහෙම ඉල්ලීමක් අධිකරණයෙන් කරලා තිබුණේ නෑ ස්වාමිනි.

ප්‍ර : එහෙම එකක් කරලා තිබුණේ නෑ?

පි : එහෙමයි.

ප්‍ර : නමුත් කිරීමේ හැකියාව තියෙනවා නේද? කවදාවත් ඒ වගේ දෙයක් ඔබ කරලා නැද්ද ?

පි : නෑ ස්වාමිනි.

ප්‍ර : එතකොට දුරකථන විස්තර බලලා කෙනෙක්ගේ ඔහු කොහේද ඉන්නේ කියන එක පිළිබඳව සොයා බලන්නට පුළුවන් නේද?

පි : එහෙම වාර්තාවන් ලබා ගත්තොත් ස්වාමිනි ඔවුන්ගේ කිසිම ඔවුන්ගේ හැඳුනුම්පත් අංකවලට අදාළව අරගෙන තිබුණේ නෑ දුරකථන සිම්පත්.

Present Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : අරගෙන තිබුණේ නෑ. ඒ කියන්නේ හැඳුනුම්පත් ගැන අපි බැලුවොත් ඒ හැඳුනුම්පත් පාවිච්චි කරලා අලුත් දුරකථන සිම් පත් ලබා ගෙන තිබුණේ නෑ කියන එකයි ඔබ කියන්නේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මගේ ප්‍රශ්නේ ඒක නෙවෙයි කස්තුරි ආරච්චි මහත්මයා මගේ ප්‍රශ්නය ඔවුන් සාමාන්‍යයෙන් පාවිච්චි කරන ජංගම දුරකථන ඒ අංකවල අංක අරගෙන ඔවුන් ඒවා පාවිච්චි කරලා තියෙනවා ද කියලා දුරකථන තොරතුරු අරගෙන බැලුවේ නැද්ද ?

පි : එහෙමත් වාර්තාවන් අරන් තිබුණා ස්වාමිනි.

ප්‍ර : අරන් තිබුණා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔය විමර්ශනය සිදු කෙරුවේ පොලිස් පරීක්ෂක නිශාන්ත ගුණතිලක මහත්මයා කියලා මං කිව්වොත් හරිද?

පි : එවකට අපරාධ අංශයේ ස්ථානාධිපති වශයෙන් කටයුතු කළේ අයි.පී.නිශාන්ත මහත්මා.

ප්‍ර : එතකොට ඔබ ඔහුට උපදෙස් දෙන්නට ඇතිනේ කරන්නට ඕනී මොනාද කියලා ස්ථානාධිපතිවරයා විදිහට?

පි : මම භාර ගන්න කොට මහත්මා ස්ථාන මාරුවීම් ගිහිල්ලා.

ප්‍ර : ආ... එතකොට ඔහු ස්ථාන මාරුවීම් ගිහිල්ලා?

පි : එහෙමයි.

ප්‍ර : කොයි කාලේද ඔහු මාරු වෙලා ගිහිල්ලා තිබුණේ?

පි : ඒ නිශ්චිත දවසක් කියන්න බෑ ස්වාමිනි.

ප්‍ර : ඔබ දන්නේ නෑ නමුත් ඔබ විමර්ශන සිදු කරන්නට ඇතිනේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ විමර්ශන සිදු කරන කොට ඔබට අනාවරණය වුණාද පොලිස් පරීක්ෂක නිශාන්ත ගුණතිලක මහත්මයාට මොහොමඩ් සහරාන් මුහුණු පොත මඟින් මරණ තර්ජන එල්ල කරලා තිබුණා කියලා?

පි : එහෙමයි ස්වාමිනි. දැන ගන්න ලැබුණා.

ප්‍ර : ඒක සාමාන්‍ය කරුණක්ද නැත්නම් අවධානයට යොමු වෙන්න ඕන විශේෂ කරුණක්ද ?

පි : ඒ සම්බන්ධයෙන් කරුණු මතක හැටියට වාර්තා කරලා තිබුණා ගරු අධිකරණයට ස්වාමිනි ඒ සම්බන්ධයෙන් .

ප්‍ර : ඔව් ඒක වාර්තා කරපු බව මම දන්නවා ඒක නිසානේ මම ඒ ප්‍රශ්නේ අහන්නේ?

පි : එහෙමයි.

ප්‍ර : මම ඔබෙන් අහන්නේ සාමාන්‍ය පොලිස් නිලධාරීයෙක් විදිහට විශේෂයෙන්ම ස්ථානාධිපතිවරයෙක් විදිහට තමන්ගේ පොලිස් ස්ථානයේ නිලධාරීයෙක්ට විශේෂයෙන්ම අදාළ නඩුව විමර්ශනය කරනු ලබන නිලධාරීයාට අත්අඩංගුවට ගන්න ඉන්න

FAIR COMMENT BY JEZEEM

සැකකාරයෙක් විසින් මරණ තර්ජනයක් එල්ල කරලා තියෙනවා නම් එය සාමාන්‍ය කරුණක්ද විශේෂ කරුණක්ද කියලා?

පි : කාල වකවානුව සම්බන්ධයෙන් මට කියන්න දන්නේ නෑ ස්වාමිනි මා සිතන්නේ සහරාන් ඒ ඉන්න කාලය තුළ කාත්තන්කුඩි නගරයේ සිටින කාලය තුළම තමයි එවැනි සිද්ධියක් වෙලා තිබුණේ.

ප්‍ර : දැන් කස්තුරි ආරච්චි මහත්මයා දැන් මම අහන ප්‍රශ්නේට උත්තර දුන්නොත් අපි දෙන්නටම ලේසී තේරුණාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මම අහන ප්‍රශ්නේ ගැටලුවක් තියෙනවාද? නැත්නම් මට කියන්න ඕනී?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මම කාල වකවානුවක් ගැන ඇහුවේ නැනේ? මම ඇහුවේ ඉතාම සරල ප්‍රශ්නයක්. තමන්ගේ යටතේ රාජකාරී කරන යම් විමර්ශනයක් කරන නිලධාරීයෙක්ට අත්අඩංගුවට ගන්න ඉන්න සැකකාරයා විසින් යම් මරණ තර්ජනයක් කරලා තියෙනවා නම් ඒක සාමාන්‍ය දෙයක්ද පොලිස් නිලධාරීයෙක් විදිහට විශේෂයෙන්ම ස්ථානාධිපතිවරයා විදිහට එහෙම නැත්නම් ඒක විශේෂ කරුණක්ද?

පි : ඒක විශේෂ කරුණක් ස්වාමිනි.

ප්‍ර : විශේෂ කරුණක්?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ නිසා නේද ඔබේ පූර්වගාමී පොලිස් පරීක්ෂක වෙදගෙදර මහත්මයා ගරු අධිකරණයට ඒ ගැන කරුණු වාර්තා කරලා තිබ්බේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබට ඒ වාර්තා කරපු එම සටහන ඔබ දැකලා තියෙනවාද?

පි : නෑ ස්වාමිනි.

ප්‍ර : නෑ?

පි : නෑ ස්වාමිනි.

ප්‍ර : ඒ කියන්නේ ඔබ කලින් ඔබේ අදාළ ලේඛන බලලා එහෙම නෙවෙයිද උපදෙස් දුන්නේ ඔබේ නිලධාරීන්ට විමර්ශන කරන්න?

පි : ඒ සම්බන්ධයෙන් කරුණු දන්නවා ස්වාමිනි ඒ සම්බන්ධයෙන් සියළුම නිලධාරී දැනුවත් භාවයක් තිබුණා.

ප්‍ර : ඔව් ඉතින් මම අහන්නේ හා හොඳයි ඔබට ඒක මතක නැත්නම් මම මෙහෙම කිව්වොත් ඔබ දැන් දන්නවාද අලියාර් හංදියේ වුණ ගැටුම සිද්ධ වුණේ ඔබ ඔය රාජකාරී භාර ගන්නට පෙර 2017 මාර්තු මාසේ 10 වෙනිදා කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

President Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට ඔබ ඒ වගේම දන්නවාද අධීක්ෂණය කෙරුවා නම් ඕකට අදාළ නඩු කටයුත්ත මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක බී/276/17 අදාළ විමර්ශන මීට අදාළව අධිකරණයට කරුණු වාර්තා කළාය කියලා 2017 මාර්තු 11 වෙනිදා ඔබේ පූර්වගාමියා? 10 වෙනිදා සිද්ධිය වුණා 11 වෙනිදා කරුණු වාර්තා කළා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ වගේම ඔබ දැන ගෙන හිටියාද ඒ වාර්තා කරපු වාර්තා කිරීමේ ඒ කියන්නේ මුල් බී වාර්තාවේ සහරාන් ඒ වගේම ඔහුගේ සහෝදරයා වන රිල්වාන් යන අය අබුබකර් මොහොමදු මුනාබිර් යන අයට පහර දීලා තුවාල සිදු කරලා තිබුණා කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ වගේම ඔබ දැන ගෙන හිටියාද ඒ වාර්තාව මඟින් කරුණු වාර්තා කරලා තිබුණයි කියලා ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඔබේ පූර්වගාමියා ෆාරුක් මොහොමදු ෆනිල් කියන එක්කෙනා යන තැනැත්තා ඔහුගේ නිවසේ ඉදිරිපිට ඉඳලා මේ අලියාර් හංදියේ ඒ සිදු වුණ සිද්ධිය ජංගම දුරකථනයෙන් විඩියෝ කරන අවස්ථාවේදී කලින් හමුදාවේ සේවය කරපු මොහේයිදීන් ඒ කියන්නේ ආමී මොහේයිදීන් අතේ දිග කඩුවක් අරගෙන එතෙන්ට ඇවිල්ලා ඔහුගේ ජංගම දුරකථනය උදුරා ගෙන මේ තැනැත්තාව ඔහුගේ ඉඩම ඇතුළට ඇඳගෙන ගිහිල්ලා බෙල්ලේ පිහියක් තියලා අපි සියළු දේට සුදානමින් තමයි ඇවිත් ඉන්නේ කියලා ඔහුව භය කරලා තියෙනවා කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එහෙම නම් ඔබට අවබෝධයක් තියෙනවා අනෙකුත් කරුණු ඇතුළත ඔබ මේ ඔබේ කාලය තුළදීත් අත්අඩංගුවට ගන්නට බැරි වුණාය කියන සැකකරුවන් විසින් යම් යම් සාපරාධී ක්‍රියාවන් නිදහසේ ජීවත් වන සිවිල් පුරවැසියන් කෙරෙහි සිදු කළාය කියන කරුණු?

පි : එහෙමයි ස්වාමිනි.

(ස්වාමිනි මේ අවස්ථාවේදී ගරු කොමිෂන් සභාවේ අවධානය යොමු කරනවා C 666 ට. C 666 තමයි ස්වාමිනි මඩකලපුව මාවුල් නඩු අංක බී/276/17 දරන නඩු ගොනුවේ සිංහල පිටපත. එහි 64 ස්වාමිනි පැමිණිලිකරු වෙනුවෙන් ඉදිරිපත් වෙමින් සඳහන් කරලා තියෙනවා මේ නඩුවේ විමර්ශන කටයුතු සිදු කරන පොලිස් පරීක්ෂක නිශාන්ත යන නිලධාරියාට මරණ තර්ජනයක් සිදු කරලා තියෙනවා. ඒ සම්බන්ධ සාක්ෂියක් CD තැටියක් විදිහට ඉදිරිපත් කරලා තියෙනවා. ඒ වගේම 70 වැනි පිටුවේ මේ නඩු වාර්තාවේ තියෙනවා ස්වාමිනි තුන්වන ඡේදයේ තවද මේ නඩුව සම්බන්ධයෙන් විමර්ශන කටයුතු වල යෙදී සිටින ප්‍රධාන පොලිස් පරීක්ෂක නිශාන්ත නිලධාරියාට මෙම නඩුවේ ප්‍රධාන

FAIR COMMENT BY JEZEEM

සැකකරු වන සහරාන් මවුලවි යන අය මුහුණ පොත හරහා ඔහුගේ විමර්ශන කටයුතු වලට බාධා ඇති වන පරිදි තර්ජනය කර ඇත. මේ සම්බන්ධයෙන් නඩු භාණ්ඩ වශයෙන් CD තැටි දෙකක් පිළියෙල කර අධිකරණයට භාර දී ඇත. මේ සම්බන්ධයෙන් වූ CD තැටි දෙකෙන් එකක් මොරටුව විශ්ව විද්‍යාලයට යවා ඇත.)

ප්‍ර : දැන් කස්තුරි ආරච්චි මහත්මයා මම ඒ කියපු ඡේදය අහු වුණානේ ඔබට?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : අපි විමර්ශන කටයුතු තුළදී මොරටුව විශ්ව විද්‍යාලයට, කොළඹ විශ්ව විද්‍යාලයට ඒ වගේම රස පරීක්ෂකවරයාට, ජීන් ටෙක් ආයතනයට වගේ ඒ විශේෂඥ සාක්ෂි ලබා ගැනීම සඳහා යම් නඩු භාණ්ඩයක් යොමු කරන්නේ මොන වගේ අවස්ථාවකද?

පි : ඒ ප්‍රකාශයන් ඔහු කරපු සම්බන්ධයෙන් එම පුද්ගලයාද යන්න තහවුරු කර ගැනීම සඳහා.

ප්‍ර : ඒ කියන්නේ යම් චෝදනාවක් තියෙනවා නම් ඒ චෝදනාවේ සත්‍යතාවය බලා ගන්නටත් ඒ චෝදනාව තහවුරු වන ආකාරයේ ස්වාධීන සාක්ෂි ඉදිරිපත් වෙනවා නම් විශේෂඥ සාක්ෂි විශේෂයෙන්ම ඒක තහවුරු කිරීමක් සඳහා කරුණු රැස් කර ගන්න නේද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එහෙම නම් මේක වැදගත් කටයුත්තක්ද මේ පිළිබඳව දැනුම් දීලා තියෙන්නේ අධිකරණයට 2017 අප්‍රේල් මාසේ 07 වෙනිදා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔබ අධීක්ෂණය කරන කොට මේ අලියාර් හංදියේ ගැටුමට අදාළව මහේස්ත්‍රාත් අධිකරණයේ පවරලා තිබුණු නඩුව ඔබ මේ පිළිබඳව අවධානය යොමු කළාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මොකද කළේ එතකොට?

පි : මේ පුද්ගලයින් ප්‍රධාන වශයෙන්ම අත්අඩංගුවට ගන්න නොහැකියාවක් තිබුණා ස්වාමිනි.

ප්‍ර : ඇයි ඒ බැරි වුණේ?

පි : ඒ කියන්නේ මේ සිදුවීමෙන් පසු මේ ප්‍රධාන සැකකරුවන් 04 දෙනා මේ ප්‍රදේශයෙන් පළා ගිහින් තිබුණා.

ප්‍ර : කොහේටද ගිහිල්ලා තිබ්බේ?

පි : ඒ සම්බන්ධයෙන් කරුණු අනාවරණය වුණේ නෑ ස්වාමිනි.

ප්‍ර : දැන් පොලිසිය ඉන්නේ ඒවා හොයන්න නේද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඉතින් පොලිසියට ඇයි හොයා ගන්න බැරි වුණේ?

පි : නොයෙකුත් ක්‍රම විධි භාවිතා කළා ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් ඒක ප්‍රමාණවත් වන්නේ නෑ? ඇයි ඔබ 16 වෙනි වගන්තිය යටතේ ඔබට නොතීසි දීලා මේ ගරු කොමිෂන් සභාවට කැඳවලා තියෙන්නේ ඔබේ රාජකාරියේ යම් පැහැර හැරීමක් තියෙන හින්දා? ඒක නිසා ඔබට සිද්ධ වෙනවා මේ ගරු කොමිෂන් සභාව සෑහීමට පත් කරන්න ඔබ මොනවාද අරගෙන තිබ්බ පියවර. මොනාද ගත්ත පියවර මේ අයව සොයා ගන්නට අත්අඩංගුවට ගන්නට?

පි : ස්වාමිනි මේ වෙන කොට මේ පුද්ගලයෝ පමණක් නෙවෙයි මේ වසමේ සිදු වන අපරාධ සංඛ්‍යාවක් තිබුණා. එතකොට මේකත් එක්තරා සිද්ධියක් පමණයි ස්වාමිනි. ඒ උත්සාහයන් ගත්තා මේ පුද්ගලයින් අත්අඩංගුවට ගන්න. ඊට අමතරව තවත් අපරාධකරුවන් අත්අඩංගුවට ගැනීමට කාත්තන්කුඩි පොලිස් ස්ථානයට භාරව කටයුතු කරන්න සිදු වෙලා තිබුණා මේ වෙන කොට.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : ඒ අවස්ථාව වන විට පොලිස් පරීක්ෂණ මෙහෙයවන පොලිස් නිලධාරීයෙකුට මරණ තර්ජන එල්ල කරපු අවස්ථා කීයක් කාත්තන්කුඩිය පොලිසිය යටතේ විමර්ශනය වෙමින් පැවතියාද?

පි : මම දන්න තරමින් මේ පොලිස් පරීක්ෂක නිශාන්ත මහත්මයාට විතරයි ස්වාමිනි.

ප්‍ර : එතකොට මේක ඔබ පොලිස් ස්ථානය යටතේ තිබ්බ අනිත් විමර්ශන හා සන්සන්ධනය කරන්න පුළුවන්ද?

පි : සන්සන්ධනය කරන්න බෑ ස්වාමිනි. නමුත් උත්සාහයක් දැරුවා මේ පුද්ගලයෝ අත්අඩංගුවට ගැනීම ප්‍රධාන වශයෙන්ම.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර : ඔබ දැන ගෙන හිටියාද මෙම නඩුවට මෙම විමර්ශනයටම අදාළව මේ සිද්ධිය ගැන තොරතුරු ලබා දුන්න පුද්ගලයෙකුට 2017 මැයි මාසේ 17 වෙනිදා ආරියම්පති කියන ස්ථානයේදී තුවක්කුවෙන් වෙඩි තියලා තුවාල සිදු කරලා ඔහුව මඩකලපුව ශික්ෂණ රෝහලේ ප්‍රතිකාර සඳහා ඇතුළත් කරලා තිබුණයි කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට ඒක වැදගත් කරුණක් නෙවෙයිද තොරතුරු ලබා දුන්නු පුද්ගලයාට තොරතුරු දීලා මාස 02 ක් විතර ගියාට පස්සේ දැන් වෙඩි තියලා තුවාල කරලා. ඒක වැදගත් කරුණක් නෙවෙයිද මේ විමර්ශනයේදී විමර්ශකයින්ගේ අවධානය යොමු වෙන්න?

FAIR COMMENT BY JEZEEM

පි : ඒ සම්බන්ධයෙන් ස්වාමිනි ඒ පුද්ගලයා හඳුනා ගැනීමක් සම්බන්ධයෙන් ඒ ප්‍රකාශයේ තිබුණේ නෑ හඳුනා ගන්න නොහැකි කියලා. මුහුණු ආවරණය කර ගෙන ඇවිල්ලා ඒක තොරතුරු අනාවරණය වුණේ අර තුවක්කු වර්ගයක් අර සියුම් කුඩා බෝල වැනි ඒවා අදාළව වෙඩි තියන තුවක්කුවක් ස්වාමිනි එකෙන් වෙඩි තිබ්බා කියලා ඒයාගන් එකකින් ස්වාමිනි.

ප්‍ර : දැන් ඔබට ඔබේ ජීවිතයේදී විමර්ශන කොච්චර විතර ඒ කියන්නේ බය කිරීමක් කරලා තියෙනවා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබ දන්නවාද මේක සිද්ධ වුණේ 2017 නේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබ දන්නවාද 2015 පනතක් තියෙනවා අපරාධයක විඳිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමට අදාළ වන?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එමඟින් මොකද වෙන්නේ? තොරතුරු දෙන පුද්ගලයාට ආරක්ෂාවක් ලැබෙනවාද? දැන ගෙන හිටියාද ඒක ගැන එහෙම පනතක් තියෙනවා කියලා? ඒවාගේ නීතිමය විධිවිධාන තියෙන්නේ තමන්ට තොරතුරු දෙන විමර්ශන සඳහා තොරතුරු දෙන අයව ආරක්ෂා කරන්න නේද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : නමුත් ඔබ කිසිදු පියවරක් ගත්තේ නැද්ද ඔබට මේ කරුණු සොයලා බලලා විමර්ශන අධීක්ෂණ කෙරුවා නම් කස්තුරි ආරච්චි මහත්මයා මේ සම්බන්ධයෙන් ඔබේ පූර්ව ගාමීයා පියවර අරන් තිබුණේ නැති වුනත් ඔබට යම් පියවරක් ගන්න?

පි : එහි සඳහන් වෙනවා ස්වාමිනි මේ පුද්ගලයා සම්බන්ධයෙන් කවුරුන්ද යන්න අනාවරණය වෙන්නේ නැහැ පුද්ගලයා කවුද යන්න.

ප්‍ර : හොඳයි ඔබේ ජීවිතයේදී අපරාධය කරන ලද පුද්ගලයා නැත්නම් යම් සාපරාධී ක්‍රියාවක් කරන ලද පුද්ගලයා පිළිබඳව නොදන්නවා නම් ඔබ එවැනි අවස්ථාවල් වලදී ඒ පැමිණිලි එහෙම්මම ලොක් කරලා දානවාද?

පි : නෑ ස්වාමිනි.

ප්‍ර : එහෙම නම් ඔබ කරන්නේ මොකක්ද?

පි : ඒ විමර්ශන තවදුරටත් ඉදිරියට කරගෙන පවත්වාගෙන යනවා.

ප්‍ර : එහෙම නේද තමන්ගේ රාජකාරිය හරියට කරන පොලිස් නිලධාරීයෙක් කරන්න ඕනී?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට ඒක නේද පොලිස් නිලධාරීයා කළ යුතු දේ?

පි : එහෙමයි ස්වාමිනි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට එහෙම නම් ඔබ මේ අදාළ විමර්ශන ගොනුව කියවලා බලලා මේ පිළිබඳව යම් පියවරක් ගත්තාද?

පි : මේ සම්බන්ධයෙන් ස්වාමිනි අඛණ්ඩව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමා දක්වා මේකේ තොරතුරු සම්බන්ධයෙන් ගොනුවක් පවත්වාගෙන යනවා. ඒක පොලිස් ස්ථානාධිපතිවරයා හැටියට ඒ තොරතුරු එක් රැස් කරලා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමා දක්වා පොලිස් අධිකාරිතුමා යන පිළිවෙලක් තියෙනවා. ඒ දිගටම ඒක අඛණ්ඩව සිදු කර ගෙන ගියා මේ පුද්ගලයා අනාවරණය වෙන්නේ නෑ කියලා ඒ දක්වාම. එතකොට උපදෙස් උඩින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමා නැවත උපදෙස් පරිදි නැවත ඒ ගොනුව මා වෙත ආපස්සට එනවා.

ප්‍ර : උපදෙස් සමඟ ඔබට එනවා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : බොහොම හොඳයි බොහොම ස්තුතියා ඒ කරපු විස්තරයට. දැන් ඒ කියන්නේ ඔබ සහ ඔබේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඔබ අධීක්ෂණ නිලධාරීන් සමඟ ඉතා හොඳ මනා සබඳතාවයක් තිබුණා කියලනේ ඔබ කියන්නේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔබ කරුණු වාර්තා කරනවා උපදෙස් ලබා ගන්නවා ඒ උපදෙස් ක්‍රියාත්මක කරන්න ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔබට මොකක්ද ලැබුණු උපදෙස ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් මේ ආකාරයට තොරතුරුකරුට තුවාල හිංසාවක් කරපු සාපරාධී ක්‍රියාවක් කරපු තැනැත්තාව සොයා ගැනීමේ විමර්ශන ගැන?

පි : සාමාන්‍යයෙන් ස්වාමිනි උපදෙස් ලැබුණේ කෙසේ හෝ මේ පුද්ගලයාව තොරතුරු රැස් කරලා මේ පුද්ගලයා කවුද යන්න අඳුරා ගන්න. හඳුනා ගැනීමෙන් පසු ඒ පුද්ගලයාට විරුද්ධව නඩු පැවරීමේ කටයුක්තක් කරන්න ස්වාමිනි.

ප්‍ර : කස්තුරි ආරච්චි මහත්මයා මොකද කළේ?

පි : ඒ සම්බන්ධයෙන් නිලධාරී යොදවලා ස්වාමිනි එය දිගින් දිගටම ඒ තොරතුරු සොයා බැලුවත් එය අනාවරණය කර ගන්න බැරි වුණා පුද්ගලයා කවුදා එයාට ඒ වෙඩි තිබ්බේ එහෙම කළේ කවුද කියලා.

ප්‍ර : කර ගන්නට බැරි වුණා ඔබ කියන්නේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් හෙව්වට හම්බ වුණේ නෑ කියලද කියන්නේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට අර අත්අඩංගුවට ගන්නට බැරිව හිටපු අයව ඒ අයව අත්අඩංගුවට ගන්නට දිගින් දිගටම උත්සාහ කෙරුවද?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමිනි. ඒ සම්බන්ධයෙනුත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමාගේ ඉඳලා සියළුම නිලධාරීන් මේ ගොනු මේ සැකකරුවන් හතර දෙනා සම්බන්ධයෙන් නොවිසඳුන අපරාධ සම්බන්ධයෙන් එක වාර්තාවක් අනිවාර්යෙන්ම දිගින් දිගටම පවත්වා ගෙන යනවා ස්වාමිනි.

ප්‍ර : ඒ කියන්නේ ඔබ කරන ලද රාජකාරි කටයුතු සම්බන්ධයෙන් ලිඛිත සාක්ෂි තිබෙන බව?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ ගොනුවේ තියෙන්නේ සාක්ෂිනේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ කියන්නේ ඔබ එන්න ඉස්සරවෙලත් එහෙම නම් ඔය ක්‍රියාමාර්ගයමනේ දිගින් දිගටම ක්‍රියාත්මක කෙරුවේ ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබ දන්නවාද 2017 මාර්තු 27 හෝ ඊට ආසන්න දිනයකදී පොලිස් පරීක්ෂක නිශාන්ත ගුණතිලක මහත්මයා විසින් ජ්‍යෙෂ්ඨ නිලධාරීයෙක්ට පොලිස් දෙපාර්තමේන්තුවේ දැන් වූ බවට මේ ගරු කොමිෂන් සභාවට සාක්ෂි ඉදිරිපත් වෙලා තියෙනවා කියලා සහරාන් පාලමුණ ඔළුවිල් ප්‍රදේශයේ ඉඳලා ඔහුගේ දුරකථනයේ සිග්නල් එයාගේ දුරකථනය වැඩ කරන බව ඒ සංඥාවන් තියෙන බවට හෙළි වෙලා තියෙනවා කියලා?

පි : ඒ සම්බන්ධයෙන් දන්නේ නෑ ස්වාමිනි.

ප්‍ර : ඔබ දන්නේ නෑ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔබේ අවධානයට එය කවුරුවත් යොමු කළේ නැද්ද?

පි : නෑ ස්වාමිනි. මා ඒ සම්බන්ධයෙන් දැනුවත් භාවයක් නෑ.

ප්‍ර : මම මේ දැන් ඔබෙන් අහන්නේ සාමාන්‍යයෙන් ස්ථානාධිපතිවරයෙක් වශයෙන් අත්දැකීම් තියෙන පොලිස් නිලධාරීයෙක් වශයෙන් සලකන්නට ඕනී කරුණක්. ඒ වගේ කරුණක් ඒ කියන්නේ අපි අත්අඩංගුවට සාමාවෙන්න අපි කියලා කියන්නේ පොලිසිය විසින් විමර්ශකයින් විසින් අත්අඩංගුවට ගන්නට උත්සාහ කරන අත්අඩංගුවට ගැනීම පැහැර හරිමින් පොලිසිය මඟ හරිමින් පැන ගොස් සිටින සැකකරුවෙක් පාවිච්චි කරන දුරකථනයක් යම් ප්‍රදේශයක ක්‍රියාත්මක වෙනවා කියලා ලැබෙන තොරතුර ඔවුන්ට ලැබෙන ඉතා අනගි තොරතුරක් නේද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට මොකක්ද නිලධාරීන් කරන්නට ඕනී?

පි : ඒ ප්‍රදේශයට ගිහිල්ලා ස්වාමිනි පුද්ගලයා අත්අඩංගුවට ගැනීමට ක්‍රියා කරන්න ඕනී.

ප්‍ර : ක්‍රියා කරන්නට ඕනී?

Project Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔබ කිව්වා නේද දැන් නොවිසඳුන අපරාධ සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට නිරන්තරයෙන් වාර්තා කිරීමක් කරනවා කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ ක්‍රමවේදය යටතේ එවැනි තොරතුරක් තියෙනවා නම් විමර්ශකයා ගාව හරි ස්ථානාධිපතිවරයා ගාව හරි වෙනත් යම් නිලධාරීයෙක් ගාව හරි ඒ පිළිබඳව දන්වන්නට ඕනේද මේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට එහෙම දන්වන්නේ නැත්නම් ඒක රාජකාරී පැහැර හැරීමක් වෙන්නට පුළුවන්ද? ඇයි මේ දැන් අපරාධකාරයෝ හොයන්නේ. කරුණු අනාවරණය වෙලා තියෙනවා යම් දිනයක සිදු වුණු සිද්ධියකදී තවත් පාර්ශවයන් තුවාල කරලා තියෙනවා කියලා ඒකනේ මිනිස්සු හොයන්නේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට මේ හතර දෙනා හොයා ගන්නට බෑ මේ සැකකාරයෝ. නමුත් එකේ ප්‍රධාන සැකකාරයා වන සහරාන් පාවිච්චි කරන දුරකථනයේ සංඥා ඔළුවිල් ප්‍රදේශයේ තිබෙනවා කියන එක අනාවරණය වෙලා තියෙනවා නම් ඒ ගැන සොයා බැලීම සිදු කළ යුතු නැද්ද?

පි : සිදු කළ යුතුයි ස්වාමිනි.

ප්‍ර : සිදු කළ යුතුයි නේද. හොඳයි ඒ වගේම ඔබ කියන්නේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට ඒ ගැන වාර්තා කරන්නටත් ඕනී මන්ද ඒක නොවිසඳුන අපරාධයක් නිසා?

පි : එහෙමයි ස්වාමිනි. කාල වකවානුව ස්වාමිනි මාර්තු

ප්‍ර : 2017 මාර්තු 27 හෝ ඊට ආසන්න කාලයකදී තමයි තොරතුරු ලැබිලා තියෙන්නේ?

පි : මම පැමිණීමට පෙර.

ප්‍ර : No No I'm not saying that. I'm getting your view as a senior officer.

පි : very well madam.

ප්‍ර : ඔබ දන්නවාද ඔබේ ඔය අක්කරපත්තුව ප්‍රදේශයේ සමාවෙන්න කාත්තන්කුඩියේ NTJ social works කියලා සංවිධානයක් තිබුණා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මොකක්ද ඒ සංවිධානය කස්තුරිආරච්චි මහත්මයා?

පි : ඒක ස්වාමිනි සාමාන්‍ය නැෂනල් තවුහිද් ජමාත් social works කියලා තමා මේක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියා පදිංචි

FAIR COMMENT BY JEZEEM

වෙලා තිබුණේ. සාමාන්‍යයෙන් පල්ලියක් හැටියට ලියාපදිංචි වෙනවා නම් එහි සම්මේලනය කියලා මුස්ලිම් ෆෙඩරේෂන් එක යටතේ ලියා පදිංචි වෙන්න ඕනී. නමුත් මේක සහරාන් විසින් ලියාපදිංචි කරලා තිබුණේ නෑ social works හැටියට තමා මේක ලියාපදිංචි වෙලා තිබුණේ සහරාන්ගේ.

ප්‍ර : එතකොට ඒ සංවිධානය මඟින් මොකක්ද සිද්ධ වුණේ ඔබේ ප්‍රදේශයේ?

පි : ප්‍රදේශයේ මම යන කොට ස්වාමිනි ඒ ඔක්කොම

ප්‍ර : ක්‍රියාත්මක වෙන්නේ නැද්ද?

පි : ක්‍රියාත්මක වෙන්නේ නෑ.

ප්‍ර : නමුත් සංවිධානය තිබුණාද ?

පි : සංවිධානයක් තිබුණාද කියන්න දන්නේ නෑ ස්වාමිනි මොකද ප්‍රධාන සැකකරුවන් 09 දෙනෙක් සිරගත වෙලා හිටියා මේ හතර දෙනයි ප්‍රධානියා සහරාන් ඇතුළු ප්‍රදේශය මඟ හැරලා ගිහින් තිබුණා. පල්ලියක් නෙවෙයි ඒක ඇත්ත වශයෙන්ම. නමුත් පල්ලියක් හැටියට ඒ ගොල්ලො පවත්වා ගෙන ගියා.

ප්‍ර : එතකොට ඔබට ඔබ යන අවස්ථාවන වන විට මේක අක්‍රීය ස්වභාවයෙන් තිබුණා කියලා ඔබ කියන්නේ ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එහෙම නම් ඒ සංවිධානයට මුදල් ලැබුණේ කොහොමද කියලත් ඔබ දන්නේ නැතුව ඇති?

පි : නෑ ස්වාමිනි.

ප්‍ර : ඔබට මතකද කස්තුරි ආරච්චි මහත්මයා 2019 අප්‍රේල් මාසේ 26 වෙනිදා ඔබ

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මොහොමඩ් ෂරීෆ් ආදම් ලෙබ්බේ කියලා කෙනෙක්ව අත්අඩංගුවට ගත්තා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබට ඔහුව අත්අඩංගුවට ගැනීම සඳහා තොරතුරක් ලැබුණාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : කවදා කීයට විතරද තොරතුර ලැබුණේ?

පි : ඒ 26 වෙනි දිනම ස්වාමිනි තොරතුරක් ලැබුණා. පුද්ගලයෙක් මෙහෙම සහරාන්ට සම්බන්ධ පුද්ගලයෙක් බස් රථයකින් පැමිණෙනවා කියලා. මා නිලධාරී කණ්ඩායමක් එක්ක ගියා. ගිහිල්ලා තමා මේ පුද්ගලයා අත්අඩංගුවට ගන්නේ.

ප්‍ර : කීයට විතරද ඔබලා අත්අඩංගුවට ගත්තේ කවදාද?

පි : 26 වෙනි දිනම මගේ මතක විදිහට 11.30 ට.

ප්‍ර : අත්අඩංගුවට ගත්තේ?

පි : එහෙමයි ස්වාමිනි.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : උදෑසනද නැත්නම් රාත්‍රියේද?

පි : උදෑසන 11.30 ට පමණ.

ප්‍ර : පැය 11.30 ට?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබ ඒ අත්අඩංගුවට ගැනීම සිදු කළාට පස්සේ සැකකරුට මොකද කළේ ?

පි : සැකකරු උප සේවය භාරයේ තිබුණේ භාර දුන්නා ස්වාමිනි.

ප්‍ර : එම රාජකාරී අවසාන වුණාට පස්සේ කස්තුරි ආරච්චි මහත්මයා හිටියාද කාත්තන්කුඩි පොලිස් ස්ථානයේ?

පි : එදින ස්වාමිනි ඇත්ත වශයෙන්ම මේ වකවානුව වන විට ස්වාමිනි ඉතාමත්ම කාර්ය බහුල නොයෙකුත් රැස්වීම්, රැස්වීම් කියන්නේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමාගේ උපදේශන එතකොට මහජන කැලඹිලි ඇති වෙයි කියලා මහජනතාව සමඟ සාකච්ඡා පැවැත්වීම් එම කටයුතුත් මේ අතර සිද්ධ වුණා. ඉතින් එදිම මම භාර දීමෙන් අනතුරුව මා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමාගේ මහජන කැඳවීමක් තිබුණා මුළු වසම් සියළුම අයගේ පොලිස් වසම්වල ගෙනල්ලා සාකච්ඡාවක් මඩකලපුව ප්‍රදේශයේදී තිබුණා ඒකට මම සහභාගි වෙන්න ගියා.

ප්‍ර : එතකොට ඔය වකවානුවේදී කාත්තන්කුඩිය පොලිසියේ උප පොලිස් පරීක්ෂක මොහොමඩ් කියලා නිලධාරීයෙක් සේවය කෙරුවද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔහු ඔබ නැති අවස්ථාවල්වල රාජකාරී කළේ කොහොමද? ඔබ ස්ථානයෙන් බැහැර වුණු අවස්ථාවල?

පි : අපරාධ අංශයේ ස්ථානාධිපති වශයෙන් කටයුතු කළේ ස්වාමිනි.

ප්‍ර : ඒ කාලේ ඔහු තමයි අපරාධ අංශයේ ස්ථානාධිපති?

පි : අපරාධ අංශයේ ස්ථානාධිපති. එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබට මතකද ඔය 26 වෙනිදා අත්අඩංගුවට ගත්තු මොහොමඩ් සරීෆ් ආදම් ලෙබ්බේ කියන සැකකාරයාව යම් අවස්ථාවකදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දෙනවා?

පි : එහෙමයි ස්වාමිනි. මම එම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමාගේ සාකච්ඡාවෙන් පසුව මා පොලිස් ස්ථානයට පැමිණෙන අවස්ථාවේදී CID එකේ කණ්ඩායමක් ඇවිල්ලා හිටියා. ඇවිල්ලා ඔවුන් ඉල්ලා සිටියා මේ පුද්ගලයා අවශ්‍ය බවට. පසුව මා උසස් නිලධාරීන්ගේ උපදෙස් සහ නියෝග පරිදි එම සැකකරු CID එකට භාර දුන්නා.

ප්‍ර : භාර දුන්නා?

පි : එහෙමයි ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ වගේම ඔබට මතකද අබ්දුල් රවුෆ් කියලා කෙනෙක්ව ඔබ අත්අඩංගුවට ගත්තා? (Batticaloa MC 427/2019)

පි : ස්වාමිනි 48 ක් 50 කට ආසන්නව මා විසින්ම අත්අඩංගුවට ගත්ත සැකකරුවෝ ඉන්නවා.

ප්‍ර : මම දන්නේ නෑ statement එකේ කියලා තියෙන ඒවා මම අහන්නේ. රිල්වාන්ගේ බෝම්බ පිපිරිච්චි එක. ඔල්ලිකුලම්.

පි : එහෙමයි ස්වාමිනි. ඉඩම එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒක තමා අහන්නේ.

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට මම ඔබෙන් ඇහුවේ අබ්දුල් රවුෆ් කියලා කෙනෙක්ව ඔබ අත්අඩංගුවට ගත්තාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : කවදද අත්අඩංගුවට ගත්තේ කියලා මතකද?

පි : මතකයක් නෑ ස්වාමිනි.

ප්‍ර : අත්අඩංගුවට ගැනීමේ හේතුව මතකද?

පි : ඒ සහරාන් ගේ සොහොයුරා වන රිල්වාන්

ප්‍ර : ඔව්.

පි : යන අයට බෝම්බයක් පරීක්ෂා කිරීමට අත්හදා බැලීමට යන අවස්ථාවේදී ඒක පිපිරී යන අවස්ථාවේදී මේ පුද්ගලයාව අරගෙන යන්නේ මෙම ඔල්ලිකුලිම් මේ රවුෆ් කියන පුද්ගලයාගේ ඉඩමට.

ප්‍ර : ඔව්.

පි : ඉඩමට අරගෙන යන්නේ. එතකොට ඒ ඉඩමේ ඉඳලා තමා ගිලන් රථයක් මඟින් ගිලන් රථයක් නෙවේ ස්වාමිනි වෑන් රථයකින් කොළඹ දක්වා ගෙනිච්චා කියන එකට තොරතුරු තිබ්බේ. එතකොට මේ සම්බන්ධයෙන් මේ රවුෆ් කියන පුද්ගලයා දැන ගෙන සිටියා ඒ කාල වකවානුවේ. නමුත් ඒ තොරතුරු වසන් කළා.

ප්‍ර : ඔබට කියන්නට පුළුවන්ද මේ ගරු කොමිෂන් සභාවට කොයි කවදා වගේද මේ පිපිරීම සිද්ධ වෙලා තිබුණේ කියලා ?

පි : ඒක නිශ්චිතව

ප්‍ර : 2019 අප්‍රේල් 21 බෝම්බ ප්‍රහාරයට පෙරද පසුද?

පි : පෙර ස්වාමිනි. 21 වෙනිදා බෝම්බ පිපිරීමට පෙර තමයි ඒ සිදු වීම වෙලා තිබුණේ ස්වාමිනි.

ප්‍ර : ඒ කියන්නේ ඔබ කියන්නේ මේ රිල්වාන් කියන තැනැත්තා බෝම්බයක්

පි : අත්හදා බැලීමට යන අවස්ථාවේදී.

ප්‍ර : අවස්ථාවේදී ඒක පිපිරීම නිසා සිදු වූ තුවාල සිදු වීම නිසා ඔහුට මේ අබ්දුල් රවුෆ් කියන තැනැත්තා ඔල්ලිකුලම් වල ඔහුගේ ඉඩමේ

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පි : පවත්වා ගෙන ගිය ඉඩමට රැගෙන යනවා ස්වාමිනි ප්‍රතිකාර ලබා දීම සඳහා.

ප්‍ර : ප්‍රතිකාර ලබා දීමට?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට එතනින්ද රිල්වාන් කොළඹ ජාතික රෝහලට ගෙන්නේ?

පි : එහෙම තමා ස්වාමිනි තොරතුරු තියෙන්නේ.

ප්‍ර : ඔය ඔල්ලිකුලම් කොහේද තියෙන්නේ කස්තුරි ආරච්චි මහත්මයා?

පි : මේ කාත්තන්කුඩි පොලිස් වසමේ සාමාන්‍යයෙන් ඇතුළට වෙන්න මධ්‍යයට වෙන්න වගේ තියෙන ස්වාමිනි පාළු ප්‍රදේශයක්. පාළු කියන්නේ අහල පහළ දමිළ ජනතාව වැඩි වශයෙන් ඉන්නේ. මුස්ලිම් පවුල් කීපයක් පමණ ඒ හරියේ පදිංචි වෙලා ඉන්නවා.

****

දැන් වේලාව : ප.ව. 06.30 යි.

මෙතැන් සිට ල/ලේ :- සවිනි මෙය.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වේලාව: ප.ව.06.30
පෙර සටහන්:මුතුමාලි මෙනවිය.
මෙතැන් සිට: සචිනි මෙනවිය.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර: කස්තුරි ආරච්චි මහත්මයා ඔබ කිව්වනේ මේ 2017 අගෝස්තු මාසේ 01 වැනිදා තමයි ඔබ වැඩ භාර ගත්තේ කාත්තන්කුඩිය පොලිස් ස්ථානයේ එහි සේවය කරා කියලා 2020 ජනවාරි මාසයේ වෙනකන්?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ වගේම ඔබ දැන් මේ ගරු කොමිෂන් සභාවට කියනවා අබ්දුල් රවුෆ් කියන තැනැත්තාව අත්අඩංගුවට ගත්තාය කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ගැනීමට හේතුව වුණ විදියට ඔබ කිව්වේ රිල්වාන් කියන තැනැත්තා බෝම්බයක් අත්හදා බලන්නට ගිය අවස්ථාවේ දී ඒක පුපුරලා තුවාල ලැබුවහාම ප්‍රතිකාර සඳහා මේ තැනැත්තාගේ මේ ඔල්ලිකුලම් තියෙන වත්තට ගෙනාවයි කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබට කියන්නට පුළුවන් ද ඔබ ඒ ස්ථානයට යම් වෙලාවක ගියා ද කියලා?

උ: ස්වාමීනි මේ බෝම්බ පිපිරීමෙන් පස්සේ 2019 වැනිදා අප්‍රේල් 21 වැනිදායින් පස්සේ විශාල කාත්තන්කුඩි පොලිස් වසමේ යුධ හමුදාව, STF එක සහ පොලිස් ස්ථාන සියල්ලම ගෙනැල්ලා විශාල සෝදිසි මෙහෙයුම් කරා. මේ සොදිසි මෙහෙයුම් කරන් යන කොට මේ STF එකත් එක්ක මා එම ස්ථානයට ගියාම ,

ප්‍ර: කවද විතර ද ගියේ?

උ: දින වකවානු 28 ඒ ආසන්නම කාලයේ.

ප්‍ර: 2019 අප්‍රේල් 28 පස්සේ ද?

උ: එහෙමයි ස්වාමීනී. ඒක දිගටම තවත් මේකට සම්බන්ධ පුද්ගලයින් ඉන්නව ද කියන්න සොයා ගෙන යාමේ දී මෙම ස්ථානයට ගියා. මෙම ස්ථානයට ගිහිල්ලා මේ පිහිටීම අනුවයි ඒ වතුර ටැංකියක් හදලා තිබුණා ගොඩාක් උසින් මේක උඩටම මේ අපි නැග්ගා. නැගලා බැලුවාහම විශාල area එකක් පේනවා මෙතැන වටේම. ලොකු area එකක් Cover කරනවා. නමුත් මේක උඩ නැග්ගහම බිමේ තිබුණේ වගාවන්. වගාවන් කරලා තිබුණා නොයෙකුත් එළවළු සත්තු හිටියා. මේක කොටස් කරලා තිබුණා. ඉඩම් කොටස් කරන ආකාරයෙන් කොටස් කරලා තිබුණා හැබැයි මේ කොටස් ඔක්කොම මිනිහෙකුට ඇතුළ පේන්නෙ නැහැ. ටකරන් ෂීට් වලින් තමා ආවරණය කරලා තිබුණේ. අඩි 08 කට විතර පමණ ඒ කියන්නේ ඇතුළත කිසිසේත් පේන්නේ නැහැ. දොරවල්

FAIR COMMENT BY JEZEEM

යොදලා තිබුණා ආකාරය ඔක්කොම කරලා මේක යම්කිසි පුහුණුවකට සූදානම් කරපු තැනක් කියලා තමා නිගමනය වුණේ මේකට ගියාහම. ඉන් අනතුරුව එම ස්ථානයේ ඒ පුද්ගලයව අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීමේ දී තමා අනාවරණය වුණේ මෙම ස්ථානයට රිල්වාන් කියන පුද්ගලයා අර රැගෙන ආවා කියලා. ඊට පස්සේ පොලිස් භාරයට ගත්තා. ඒ ඉඩම. දැන්ටත් පොලිස් භාරයේ තියෙන්නේ. ඔල්ලිකුලම්.

ප්‍ර: ඒ කියන්නේ ඔබලා ඒ ස්ථානයට යන කොට යම් පුද්ගලයෙක් එතැන රැඳී සිටියා ද?

උ: ඔව් ඉඩමේ අයිතිකාරයා.

ප්‍ර: ඒ පුද්ගලයගේ නම මොකද්ද?

උ: රවුෆ්.

ප්‍ර: ඔහු තමයි රවුෆ්?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඒ ප්‍රශ්න කිරීම් වලින් පස්සේ විමර්ශන වලින් පස්සේ තමයි ඔබලා ඔහුව අත්අඩංගුවට ගත්තේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ ස්ථානයේ තිබිලා යම් දේවල් ඔබලා භාරයට ගත්ත ද?

උ: ස්වාමීනි එතැන පසුකාලයක දී මං භාරයට ගත්තා මේක සැක පිට ගත්තේ. හැබැයි CID එකෙන් වෙනත් පුද්ගලයෝ දෙන්නෙක්ගේ අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව ගෙනැල්ලා මෙතැනින් යම් කඩු ammunitions එතකොට. පේලට් නයිට් වැනි දේවල් එක එක rounds තිබුණා ස්වාමීනි මෙතැන. ඒක CID එකෙන් තමයි සොයා ගත්තේ. නමුත් ඒ සිද්ධිය මමත් ගියා එතැන භාරයට.

ප්‍ර: එතකොට ඔබ දැක්කද ඔබ කියන ආකාරයට ඒ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් එතැනින් සොයා ගත්තයි කියලා ජෙලට් නයිට්. ඒ වගේම කඩු විශාල ප්‍රමාණයක් ටී පනස් හයේ උණ්ඩ ඒ වගේ ම විවිධ වර්ගයේ ජීව උණ්ඩ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔය කඩු චීනයේ හා මෙරට නිෂ්පාදිත

උ: මෙරට නිෂ්පාදිත ජාති දෙකම තිබුණා ස්වාමීනි. වල දාලා තිබුණේ මෙම ස්ථානයේ.

ප්‍ර: කස්තුරු ආරච්චි මහත්මයා ඔබ 2019/04/21 වැනිදා ප්‍රහාරයෙන් පස්සේ පොලිස් නිලධාරියෙක් විදියට දැන ගත්ත ද විමර්ශකයින් දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් කඩු විශාල සංඛ්‍යාවක් මුස්ලිම් ජන කොට්ඨාශයන් සිටින සමහර ස්ථාන වලින් පල්ලි වලින් ඒ වගේම සමහර ස්ථාන වලින් සොයා ගත්තාය කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එම කඩු ඔබ දැක්ක ද ?

උ: එහෙමයි ස්වාමීනි.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: කොහොමද ඔබ දැක්කේ ඒවා?

උ: ඒවා රූපවාහිනිය මගින් දර්ශනය වෙන කොට.

ප්‍ර: රූපවාහිනිය මගින් ඔබ දර්ශනය වෙන කොට ඔබ දැක්කා?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔබ ඒ දැක්ක කඩු වල ඒ රූපවාහිනි ඔබ දැක්ක කඩුත් ඒ වගේම ඔල්ලිකුලම්වල වත්තට ගිහින් දැක්ක කඩුත් අතර යම් සමානත්වයක් තියෙන ද?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒවා සමාන කඩු. ඒ වගේ කඩු?

උ: එහෙමයි ස්වාමිනි.ග්‍රී ආලේප කරලා සුරක්ෂිතව වලදාලා තිබ්බේ ස්වාමිනි.

මා ඔබේ අවධානයට යොමු කරනවා C 418 වශයෙන් ලකුණු කරලා අපි ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරලා තිබෙන ඡායා රූපයක්.

ප්‍ර: එහි දැක්වෙන ආයුධ වලට සමාන ආයුධ එහෙම නැත්නම් කඩු ද ඔබ ඔය කියන ස්ථානයෙන් සොයා ගන්නවා දැක්කේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන්?

උ: එහෙමයි ස්වාමිනි. ස්වාමිනි මේ ආකාරයෙන්ම ඉටි කොළ වල බහා තබලා සුරක්ෂිතව වලදාලා තිබුණේ.කඩු. චීනයේ නිෂ්පාදිත කඩු.

ප්‍ර: ඔබ කාත්තන්කුඩිය පොලිස් ස්ථානයේ සේවය කරන අවස්ථාවේ දී 2019 අප්‍රේල් මාසයේ 21 වැනිදා ප්‍රහාරයෙන් පස්සේ සැකකරුවන් කියක් විතර අත්අඩංගුවට අරන් තියෙනව ද?

උ: ස්වාමීනි සියළුම යුධ හමුදා, STF එක ඔක්කොම ඇතුළුව 65 දෙනෙක් arrest කරලා තිබෙනවා. මම පුද්ගලිකව 48 ක් 50 කට ආසන්නව අත්අඩංගුවට අරන් තියෙනවා.

ප්‍ර: එතකොට එයින් එක්කෙනෙක් තමයි ඔබ කියන්නේ මොහොමඩ් සරීෆ් ආදම් ලෙබ්බේ කියලා.

උ: එහෙමයි නොහොත් ගපූර් මාමා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ 2017 අගොස්තු මාසේ 01 වැනිදා යනවා කාත්තන්කුඩි පොලිස් ස්ථානාධිපති වශයෙන්?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ යන විට ඔබ 2017 මාර්තු 10 වැනිදා අලියාර් හන්දියේ සිද්ද වුණු සිද්ධිය සම්බන්ධයෙන් දැනුමක් ලැබෙනව ද?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: කොයි අවස්ථාවේ ද පළමු වරට ඒ ඔබේ අවධානයට යොමු වෙන්නේ?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

උ: ගිහිල්ලා ටික දිනක් ගත වෙන කොට මේ සම්බන්ධයෙන් මට නිලධාරීන් සහ මේ ගැටුම සිදු වුණ රවුල් මවුලවීගේ කණ්ඩායම විසින් මේ සිද්ධිය දැනුවත් කරා.

ප්‍ර: රවුල් මවුලවී කණ්ඩායමෙන් ඇවිල්ලා ඔබට මොනවද දැනුවත් කෙරුවේ?

උ: සහරාන් කියන පුද්ගලයා තමයි මේකේ ප්‍රධානියා මේ මොහුව කෙසේ හෝ අත්අඩංගුවට අරගෙන අධිකරණයට ඉදිරිපත් කරලා දෙන්න කියන එක තමයි ඒ ගොල්ලන්ගේ ඉල්ලීම තිබුණේ ස්වාමීනි.

ප්‍ර: ඒ වන විට ඒ සම්බන්ධයෙන් උසාවිය මගින් ලබාගෙන තිබ්බ නියෝග මොනව ද?

උ: ස්වාමීනි කරුණු වාර්තා කරලා වරෙන්තු නිකුත් කරලා තිබුණා මේ 04 දෙනාටම. සැකකරුවන් 04 දෙනාටම.

ප්‍ර: මොන විදියේ වරෙන්තු ද නිකුත් කරලා තිබුණේ?

උ: දින වරෙන්තු හැටියට තමා ස්වාමීනි අධිකරණයෙන් වරෙන්තු නිකුත් කරලා තිබුණේ.

ප්‍ර: දින වරෙන්තුවක් නිකුත් කිරීමෙන් ඇති වෙන ප්‍රයෝජනය මොකද්ද?

උ: ස්වාමීනි ඒ නියමිත ඊළඟ දිනයේ දී සැකකරුවන් ගරු අධිකරණයට ඉදිරිපත් කිරිමට තමා වරෙන්තුව දින වරෙන්තුව හැටියට නිකුත් කළේ.

ප්‍ර: දින වරෙන්තුවක් ක්‍රියාත්මක කරන්න පුළුවන් මොන පොලීසියට ද?

උ: අදාළ පොලිස් වසමට ස්වාමීනි.

ප්‍ර: රටේ ඕනම තැනක ක්‍රියාත්මක කරන්න පුළුවන් ද දින වරෙන්තුවක්?

උ: පුළුවන් ස්වාමීනි.

ප්‍ර: පුළුවන් ?

උ: පුළුවන් ස්වාමීනි.

ප්‍ර: එතකොට අනෙක් පොලිස් ස්ථානයන් දන්නේ කොහොමද ඒක වරෙන්තුවක් තියෙනවා කියලා?

උ: දැනුවත් වීමක් කළොත් ස්වාමීනි විතරයි.

ප්‍ර: එතකොට දින වරෙන්තු සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් දින වරෙන්තු ලබා ගන්නා පොලිස් වසම හැර අනෙක් පොලිස් වසම් වලට දැනුම් දීමක් කරනව ද?

උ: දැනුම් දීමක් කරනව ස්වාමීනි. පදිංචි ස්ථාවරය සම්බන්ධයෙන් අනාවරණය වුණොත් දැනුවත් කිරීමක් කරනවා අදාළ පොලීසියට අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කරන්න කියලා.

ප්‍ර: පදිංචි ස්ථානය පිළිබඳ දැනුවත් වීමක් වුණොත් විතරයි?

උ: බොහෝ වෙලාවට එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එහෙම නැත්නම් සියළුම පොලිස් ස්ථාන දැනුවත් කරන්නෙ නැහැ.

උ: දැනුවත් කරන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර: විවෘත වරෙන්තුවක් කියන්නේ මොකද්ද?

Present Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

උ: විවෘත වරෙන්තුවක් ස්වාමීනි ඒකේ කාල සීමාවක් නැහැ ඕනම ස්ථානයකදී විවෘත වරෙන්තුවක් සම්බන්ධයෙන් ක්‍රියා කරන්න පුළුවන්.

ප්‍ර: ඕනම පොලිස් ස්ථානයකටත් ඒක ක්‍රියාත්මක කරන්නත් පුළුවන් නේද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට විවෘත වරෙන්තුවක් ලබා ගැනීමේ වැදගත්කම වන්නේ මේ රට තුළ තියෙන ඕනෑම පොලිස් ස්ථානයකට ක්‍රියා කරන්න පුළුවන් කිව්වොත් හරිද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දින වරෙන්තුවක් එහෙම ඕනෑම පොලිස් ස්ථානයක ක්‍රියාත්මක කරන්න බැහැ නේද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ ඔබේ කාත්තන්කුඩි පොලිස් වසමේ ස්ථානාධිපති වුණායින් පස්සේ ඔබ කියනවා ඔබට දැනගන්න ලැබෙනවා මේ සිද්ධිය දින වරෙන්තුවක් තියෙනවා කියලා.

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබ තව දුරටත් කිව්වා සහරාන් සම්බන්ධයෙන් හොයලා බැලුවා. ඔහු ප්‍රදේශයේ නැහැ කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට ඊළඟට කරන්න තියෙන්නේ හොඳම දේ විවෘත වරෙන්තුවක් ලබා ගැනීම නොවේ ද?

උ: ස්වාමීනි ඒ සම්බන්ධයෙන් මා ස්ථානාධිපති වශයෙන් පත් වුණාට පස්සේ ගරු අධිකරණයෙන් ඉල්ලා සිටියා නමුත් නඩුව බී වාර්තාවක් මගින් ගොනු කර තිබුණු නිසා විවෘත වරෙන්තුවක් දුන්නෙ නැහැ ස්වාමීනි.

ප්‍ර: කොයි කාලෙද ඔබ විවෘත වරෙන්තුවක් ඉල්ලුවේ?

උ: ඒ නඩු මම ගිහිල්ලා ආසන්නයේම ක්‍රියාත්මක වුණු නඩු වාරයක දි හෝ දෙවැනි වාරේ දී මම ඉල්ලා සිටියත් මොහු විදේශ ගත වෙනවා කියලා තොරතුරක් ලැබුණ නිසා ඉන් අනතුරුව ඊට පෙරත් අරගෙන තිබුණා කටුනායක ගුවන් තොටුපළට සහ ආගමන විගමන දෙපාර්තමේන්තුවට මේ 4 දෙනා සම්බන්ධයෙන් වාර්තාවක් යවලා තිබුණා ගරු අධිකරණය හරහා. අත්අඩංගුට ගන්න කියලා. විදේශගත විමක් සිදු වුණොත්.

ප්‍ර: එතකොට විවෘත වරෙන්තුවක් ගන්න නම් මොකද්ද අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගය?

උ: චෝදනා පත්‍රයක් ගොනු කරන්න ක්‍රමවේදයක් තිබුණේ නැහැ ස්වාමීනි එතැන පෙට්‍රල් බෝම්බ වගයක් සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීමක් කරලා තිබුණා. රස පරීක්ෂක වාර්තාව නොලැබීම හේතුවෙන් ඒ සම්බන්ධයෙන් ප්‍රමාදයක් තිබුණා ස්වාමීනි.

ප්‍ර: ඔබ කියන්නේ ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවෙන් වාර්තාවක් එන තෙක් මේ සිද්ධිය සම්බන්ධයෙන් චෝදනා පත්‍රයක් ගොනු කරන්න බැරි වුණා කියන එකද?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

උ: එහෙමයි ස්වාමිනි. ඒක අධිකරණයේ නියෝගයක් තිබුණා මේ ඒ ගොල්ලොත් අත්අඩංගුවට අරගෙන චෝදනා පත්‍රය ගොනු කරන්න රස පරීක්ෂක වාර්තාව ලැබුණාහම. එකම ක්‍රියාදාමය සිද්ධ වුණ දෙයක් නිසා ස්වාමීනි.

ප්‍ර: එතකොට සාමාන්‍යය ක්‍රමවේදය අනුව රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ වාර්තාවක් එනකන් චෝදනා පත්‍රයක් ගොනු කරන්න බැහැ කියල ද ඔබ කියන්නේ?

උ: මෙතැන විශේෂයෙන් අර බෝම්බ පිළිබඳ වාර්තාවක් ලබා ගැනීමට තිබුණු නිසා චෝදනාවක් ගොනු කිරීමේ නොහැකියාවක් තිබුණා.

ප්‍ර: නැහැ මං අහන්නේ ඒක තමා සාමාන්‍යය ක්‍රමවේදයට අනුව ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට වාර්තාවක් එනකන් චෝදනා පත්‍රයක් ගොනු කරන්නේ නැද්ද?

උ: සම්බන්ධයෙන් ගොනු කළේ නැහැ ස්වාමිනි.

ප්‍ර: දැන් එහෙම නම් ඔබ කියන හැටියට මේ විචෘත වරෙන්තුවක් ගන්න බැරි වුණේ ඔබ ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට මේ සම්බන්ධයෙන් දැනුම්දීමක් කෙරුව ද?

උ: වාර්තාවක් ලබා ගැනීමට නිලධාරීන් අවස්ථාවක දී මතකයේ හැටියට ගියා නමුත් ලබා ගන්න බැරි වුණා ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබ මේ පරීක්ෂණය භාර ගන්න කොට පෙනී ගියාද ඔබට ලැබුණු තොරතුරු වලින් මේක සාමාන්‍යය විදියේ අපරාධයක් නෙමේ මේක ආගමික මුහුණුවරක් ගන්න අන්තවාදී ක්‍රියාවක් සම්බන්ධ වෙනවා කියලා?

උ: මේ සහරාන් කියන පුද්ගලයගේ ඒ හැසිරීම් ස්වභායයි ඒ හැසුරුණු ආකාරය සම්බන්ධයෙන් මං විමසීමක් කරා නිරීක්ෂණයක් කරා එතකොට මොහුගේ දේශනා වල ඔක්කොම අන්තවාදී දේශන තිබිලා තියෙන්නේ ස්වාමීනි. සියළුම ආගම් වලට බැන වැදී ඒ සිකුරාදා දිනයන්හි ඔහු ඉස්ලාම් ධර්මය ගැන කතා කරලා තිබුණා. නමුත් ඔහු සමහර පල්ලි අතර විශේෂයෙන් රවුල් මවුලවී සහ පයිල්වාන් යන ඒවාට මේ ඉස්ලාම් ධර්මයට අදාළ නොවන කර්තවයන් මේ පල්ලි වල සිද්ධ වෙනවා කියලා විරෝධතාවයක් තිබුණා. දැඩි ලෙස. ඒක දන්නවා මං.

ප්‍ර: ඉතිං ඒ කරුණු හේතුවෙන් ඔබ හිතුවේ නැද්ද ඔබ මේකට විශේෂ සහායක් ලබා ගන්න ඕන නඩුවක් කියලා?

උ: ස්වාමීනි මේ පුද්ගලයින් මේ සිදුවීමෙන් පසුවම මේක පැහැදිලිවම අකර්මන්‍ය වෙලා තිබුණේ මං එන කොට. ඉදිරියට ඉතාම සාමකාමී ස්වභායක් තිබුණේ. මේක ක්‍රියාත්මක වුණේම නැහැ. මේ NTJ කියන සංවිධානය.

ප්‍ර: නැහැ ඒක නෙමේනේ දැන් එහෙම ඒ තත්ත්වය වෙන්න පුළුවන්. ඒ ප්‍රදේශයේ තිබ්බේ. නමුත් යම්කිසි අපරාධයක් සිදු වෙලා තියෙනවනේ ?

උ: එහෙමයි ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මං ඒක ගැනයි අහන්නේ. ඒ සිදු වෙච්ච අපරාධයේ ස්වභාවය අනුව ඒක සංකීර්ණ ආගමික අන්තවාදී මුහුණුවරක් ගන්න ප්‍රශ්නයක් කියලා ඔබට තේරුණේ නැද්ද?

උ: දිගින් දිගටම එසේ සිදුවෙන කාත්තන්කුඩි ප්‍රදේශයේ පමණක් ස්වාමීනි මේක මුස්ලිම් ඉස්ලාමිය අතරම සිදු වුණ සිදු වීමක් නිසා ඒක සම්බන්ධයෙන් එහෙම වෙයි කියලා සිතුණේ නැහැ.

ප්‍ර: ඒ රවුෆ් මවුලවීගේ කණ්ඩායමේ කට්ටිය ඇවිල්ලා කිව්වේ නැද්ද මීට කලිනුත් අපිට දිගටම මේක වුණා කියලා?

උ: දිගින් දිගටම ස්වාමීනි ඒ සිදුවීම වෙලා තිබුණා.

ප්‍ර: ඒ වුණාට ඔබ හිතුවේ නැහැ මේ අපරාධ නඩුව ඉදිරියට ගෙනි යන්න ඔබට විශේෂ සහායක් අවශ්‍ය වෙයි කියලා හිතුවේ නැහැ?

උ: එහෙම හිතුණා ස්වාමීනි නමුත් අර ඒක එතරම් භයානක විදියට වෙයි කියන එකක් සිතුණේ නැහැ ඇත්ත වශයෙන් ස්වාමීනි.

ප්‍ර: ඔබට ඒ අවස්ථාවේ දී ආරංචි වුණා ද මේ සහරාන් කියන පුද්ගලයා සහ කණ්ඩායමට යම්කිසි සහයෝගයක් දක්වන වෙන බාහිර පුද්ගලයෝ ඉන්නවා කියලා?

උ: නැහැ ස්වාමීනි ඔහු විසින්ම ගොඩනගාගත් පිරිසක් සමඟ තමා ඔහු වටේ හිටපු පුද්ගලයෝ එක්ක තමා මේ ක්‍රියාකාලාපයන් සිද්ධ කරලා තිබුණේ.

ප්‍ර: නැහැ මං බාහිර පුද්ගලයෝ කියලා අදහස් කෙරුවේ නැහැ විදේශීය අය?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබට තොරතුරු ලැබුණේ නැද්ද මේ සංවිධානයට සමඟර අවස්ථා වලදී දේශපාලන සහයෝගයක් ලැබුණා කියලා?

උ: නැහැ.

ප්‍ර: කොයි අවස්ථාවකවත් ?

උ: නැහැ ස්වාමීනි.

ප්‍ර: රවුෆ් මවුලවීගේ කණ්ඩායමේ අයවත් කිව්වේ නැද්ද එහෙම?

උ: නැහැ ඒ සම්බන්ධ දැනුවත් කිරීමක් කළේ නැහැ ස්වාමීනි.

ප්‍ර: සාක්ෂිකරු ඔබ කිව්වා නේද මේ නඩුවේ ඉදිරි ක්‍රියා මාර්ග ඔබට ගන්න බැරි වුණේ ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ වාර්තාව ආවේ නැහැ කියන එක?

උ: ප්‍රමාදයක් තිබුණා ස්වාමීනි.

ප්‍ර: හා ප්‍රමාදයක් දැන් ඔබ කියනවා ප්‍රමාදයක් කියලා. දැන් ඔබ දන්නවා නේද ඒක ආවේ කවද්ද කියලා?

උ: ඒක ගරු අධිකරණයට ලැබිලා තිබුණා ස්වාමීනි නමුත් අප වෙත ලැබීමක් සිදු වෙලා තිබුණේ නැහැ.

ප්‍ර: ඉතිං රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ වාර්තාව කොහේට ද යන්නේ සාමාන්‍යයෙන්?

උ: ගරු අධිකරණයට ලැබෙන්නේ ස්වාමීනි. නමුත් ඒ සම්බන්ධයෙන්.

ප්‍ර: අධිකරණයෙන් දැනුම්දීමක් කරනවනේ ලැබුණ ද නැද්ද කියලා?

FAIR COMMENT BY JEZEEM

උ: නැහැ ස්වාමීනි එසේ වුණා නම් අපි අනිවාර්යෙන් චෝදනා පත්‍රයක් ගොනු කරනවා ස්වාමීනි.

ප්‍ර: ආණ්ඩුවේ රස පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්තාවක් අධිකරණයට ගියාට පස්සේ අධිකරණ නඩු වාර්තාවේ ඒක සටහන් වෙන්නේ නැද්ද?

උ: සටහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර: සටහන් වෙනව ද නැද්ද?

උ: ගොනුවට ඇතුළත් වෙනවා ස්වාමීනි .

ප්‍ර: එතකොට ඒකේ Journal සටහන් වලත් සටහන් වෙනවා නේද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබ දන්නවා නේද ඔබ කියන ආණ්ඩුවේ රස පරීක්ෂණ වාර්තාව මේ නඩුවට 2018 ජනවාරී මාසයේ 26 වැනිදා ලැබිලා තියෙනවා කියලා?

උ: නැහැ ඒ සම්බන්ධයෙන් දැනුවත් වීමක් නැහැ ස්වාමීනි.

ප්‍ර: ඉතිං එහෙනම් දැනුවත් වීමක් නොමැතිව ද ඔබ ඉස්සෙල්ලා මං අහන ප්‍රශ්න වලට කිව්වේ නඩුවේ ඉදිරි ක්‍රියාමාර්ග ගන්න බැරි වුණේ ආණ්ඩුවේ රස පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්තාව ආපු නැති නිසා කියලා?

උ: පසුව මේ සිදු වීමෙන් පසුව තමා ස්වාමීනි ගරු අධිකරණයෙන් ඒ සම්බන්ධයෙන් දැනුම් දුන්නේ.

ප්‍ර: ඒක කොහොම ද වෙන්නේ. මේ නඩු වාර්තාවට ගොනු වෙලා තිබෙන්නෙත් 2018 ජනවාරී මාසයේ. ඒ කියන්නේ ඔබ මේ නඩුව ගැන වැඩි අවධානයක් යොමු කරලා නැහැ නේද ?

උ: යොමු කරා ස්වාමීනි.

ප්‍ර: යොමු කරානම් දැනගන්න එපැයි ආණ්ඩුවේ රස පරීක්ෂණ වාර්තාව 2018 ජනවාරී වෙන කොට තිබ්බා කියලා?

උ: ස්වාමීනි කරුණු දක්වන කොට ගරු අධිකරණයට කරුණු දක්වනවා සැකකරුවන් සම්බන්ධයෙන් සහ රස පරීක්ෂක වාර්තාව සම්බන්ධයෙන්.

ප්‍ර: කවුද ඒ කරුණු දක්වන්නේ?

උ: අධිකරණ නිලධාරීන් ස්වාමීනි.

ප්‍ර: ඒ අධිකරණ නිලධාරියා කවුද?

උ: එවකට

ප්‍ර: නැහැ ඔබේ පොලිස් ස්ථානයේ නිලධාරියෙක්නේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ විදියට අධිකරණයේ කරුණු දක්වන්න නම් ඒ රස පරීක්ෂක වාර්තාව ලැබුණු බව දැන ගන්න තියෙනවනේ. අපිට මේ විශ්වාස කරන්න බැරි හේතු දෙන්නේ නැතුව කියන්න ඇයි මෙතැන මේ නඩුව පරක්කු වුණේ. ඔබ ඉස්සෙල්ලා මගේ ප්‍රශ්නට උත්තර දීම සඳහා පහසු විදියට කිව්වා ආණ්ඩුවේ රස පරීක්ෂණ දෙපාර්තමේන්තුව වාර්තා ඇවිල්ලා නැහැ කියලා. ලංකාවේ හුඟක් නඩු පරක්කු වෙන්නේ ඒ හේතුව මත නේ. නමුත් මේ නඩුවේ රස පරිෂණ වාර්තාව 2018 ජනවාරී මාසය වන කොට

Presidential Secretary's Copy
LEAR COMMENT BY JEZEEM

ලැබිලා තියෙනවා. 2019 පාස්කු ප්‍රහාරය සිදු වෙනකම් චෝදනා ගොනු කරලා තිබ්බේ නැහැ නේද? ගොනු කරලා තිබුණා ද නැද්ද?

උ: නැහැ ගොනු කරලා තිබුණේ නැහැ ස්වාමිනි.

ප්‍ර: ඔබ ඉස්සෙල්ලා කිව්වා චෝදනා පත්‍රයක් ගොනු කරන්න බැරි වුණේ රස පරීක්ෂණ වාර්තා නැති හින්දා කියලා.

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: දැන් මෙතැන රස පරීක්ෂක වාර්තාව තිබෙනවා කියලා අපිට පේනවා. එහෙම නම් චෝදනා පත්‍රයක් ගොනු කරලා විවෘත වරෙන්තුවක් ගන්න පුළුවන්කම තිබ්බා නේද?

උ: ස්වාමීනි ලැබුණු බවට තොරතුරක් අපි වෙත දැනුවත් වුණේ නැහැ අධිකරණයට.

ප්‍ර: අධිකරණය දැනුවත් කරනව ද පොලීසියට නැත්නම් පොලීසියෙන් උසාවිය යන නිලධාරියා දැන ගන්නව ද?

උ: නිලධාරියා දැනුවත් කරන කොට අධිකරණයේ දැනුවත් කිරීමක් සිද්ධ කරනවා මේකට චෝදනා පත්‍රයක් ගොනු කරන්න කියලා ස්වාමීනි මේක ලැබිලා තියෙනවා කියලා.

ප්‍ර: ඉතිං ඔබගේ නිලධාරීන් ඔබ දැනුවත් කළේ නැද්ද මෙතන චෝදනා පත්‍රයක් මෙම නඩු වාර්තාවේ ඒ කියන්නේ මඩකලපුව මහේස්ත්‍රාත් අධිකරණ බී/276/14 දරණ නඩු වාර්තාවේ කොමිෂන් සභාව වෙත තිබෙන සිංහල පරිවර්තනයට අනුව 2019 පෙබරවාරී 26 වැනිදා නියෝගයක් කරනවා පැමිණිල්ලට රජයේ රස පරීක්ෂක වාර්තාවේ පිටපතක් නිකුත් කරන්න කියලා. එතකොට අවම වශයෙන් 2019 පෙබරවාරී මාසේ වනවිට මේක ඔබගේ පොලිස් ස්ථානය දැනුවත් වෙනවා රජයේ රස පරීක්ෂණ වාර්තාව ලැබිලා තියෙනවා කියලා. නමුත් මේ කොමිෂමට ලැබිලා තියෙන මුල් වාර්තාවේ සහතික පිටපතට අනුව රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තු වාර්තාව ඒ දිනය 2018 ජනවාරී 26 ඒකට මේ උසාවියේ මුද්‍රාවක් තබලා තියෙන්නේ. ඔබ මේ අත්සන් කරන වැඩිදුර වාර්තා කියවලා බැලුව ද?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒක කියවන්න ඉස්සෙල්ලා කාට හරි කියලා Translate කර ගත්ත ද?

උ: එහෙමයි ස්වාමිනි. අධිකරණ නිලධාරියයි. තවත් නිලධාරීයෙක් ගෙනැල්ලා

ප්‍ර: ඔබ දන්නව ද 2019 ජූලි 30 වැනිදා වන විට වැඩිදුර වාර්තාවක් මෙම නඩුවට ගොනු කරලා තියෙනවා. එම වැඩිදුර වාර්තාව ගොනු කරලා තියෙන්නේ වෙදගෙදරගේ නමින්. 2019 ජූලි 30 වැනිදා වන කොට වෙද ගෙදර මහත්මයා

උ: පොලිස් ස්ථානයේ නැහැ ස්වාමීනි.

ප්‍ර: ඔබනේ පොලිස් ස්ථානයේ ස්ථානාධිපති?

උ: එහෙමයි ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතකොට වෙදගෙදර මහත්මයාගේ නමින් වැඩිදුර වාර්තාවක් ගොනු වෙන්නේ කොහොම ද, ඔබ මේ වාර්තා හරියට බලලා නැහැ නේද, 2019 අගොස්තු මාසයේ 02 වැනිදා වාර්තාව ඒකත් වෙදගෙදර මහත්තයාගේ නමින් යන්නේ, 2019 අගොස්තු 30 පළවැනි වරට ඔබගේ නම එනවා එතැන්ට. ඔබ ඒ පොලිස් ස්ථානය ගිහිල්ලා හරියටම වසරකට පසු තමා ඔබගේ නම ඇතුළත් වෙන්නේ වැඩිදුර වාර්තාවේ එතකන් වෙදගෙදර මහත්තයගේ නමින් වැඩිදුර වාර්තා ගොනු කරලා තියෙන්නේ. මේකෙන් පේනවා ඔබගේ අවධානය මෙම නඩුවට නිසි ආකාරව යොමු වෙලා නැහැ කියලා. මොකද ඔබ ඉස්සෙල්ලා කිව්වා විවෘත වරෙන්තුවක් ගන්න නම් චෝදනා පත්‍රයක් ගොනු කරන්න කියලා මහේස්ත්‍රාත්වරයා කිව්වා කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඊට පස්සේ ඔබ කිව්වා ඒක කරන්න බැරි වුණේ රස පරීක්ෂණ වාර්තාව ආවේ නැති නිසා කියලා. 2018 ජනවාරි වෙන කොට රස පරීක්ෂක වාර්තාව ගොනුවට ගිහිල්ලා තියෙනවා. මොකද්ද ඔබට ඒ සම්බන්ධයෙන් කියන්න තියෙන්නේ?

උ: ස්වාමීනි ඒ සම්බන්ධයෙන් මා දැනුවත් භාවයක් වුණේ නැහැ ස්වාමීනි.

ප්‍ර: දැනුවත් භාවයක් වුණේ නැහැ කියන්නේ ඔබ ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කෙරුවේ නැහැ කියන එක නේද? කියන්න අපිට ඔබගේ අවධානය මේකට විශේෂයෙන් යොමු වුණා ද?

උ: ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරා ස්වාමීනි.

ප්‍ර: එහෙනම් කොහොමද ආණ්ඩුවේ රස පරීක්ෂණ වාර්තාවක් තිබිය දී අවුරුද්දක් ගිහිල්ලාත් ඒ චෝදනා පත්‍රයක් ගොනු වුණේ නැත්තේ?

උ: දැනුවත් කිරීමක් සිදු වුණේ නැහැ ස්වාමීනි. ඒ නිසා පැහැදිලිවම චෝදනා පත්‍රයක් ගොනු කරනවා අධිකරණ නිලධාරීන් හෝ මා ඒ සම්බන්ධයෙන් දැනුවත් වීමක් වුණේ නැහැ.

ප්‍ර: මට පොඩ්ඩක් පැහැදැලි කර ගැනීමක් කරන්න දැන් උසාවියේ තියෙන නඩුවක දී ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ වාර්තාව ලැබුණ ද නැද්ද කියන එක උසාවියට දන්වන්නේ විමර්ශන නිලධාරියා ද නැත්නම් උසාවියේ නඩුකාරවරයා පොත පෙරලලා කියනව ද මේ වාර්තාව හම්බ වුණා ද නැද්ද කියලා?

උ: ස්වාමීනි වාර්තාව අධිකරණයට ලැබෙනවා. ඉන් පස්සේ නඩුකාරතුමා විසින් දැනුවත් කිරීමක් කරනවා ලැබිලා තියෙනවා රස පරීක්ෂණ වාර්තාව මේ සම්බන්ධයෙන් චෝදනා පත්‍රයක් ගොනු කරන්න කියලා.

ප්‍ර: එතකොට විමර්ශන නිලධාරීන් කවදාවත්ම නඩු ගොනුව පරීක්ෂා කරන්නේ නැද්ද?

උ: පරීක්ෂා කළේ නැහැ ස්වාමීනි.

HAIR COMMENT BY JEZEEM

ප්‍ර: නැහැ මං කියන්නේ එදා උසාවියේ නෙමේ මං කියන්නේ නඩු වාර්තා පරීක්ෂා කරන්නේ නැද්ද රස පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් වාර්තාව ආවාද නැද්ද කියන එක බලන්න?

උ: නැහැ ස්වාමීනි.

ප්‍ර: සම්ප්‍රදායක් වශයෙන් එහෙම ද කරන්නේ?

උ: සාමාන්‍යයෙන් පරික්ෂා කරන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර: ඔබ මේ නඩුවට කවදා හරි ගිහින් තියෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: කී සැරයක් ගිහින් තියෙනව ද?

උ: අවස්ථා කිහිපයක දී ගියා ස්වාමීනි. විදේශගත වෙන්න සහරාන් සිටින අවස්ථාවේ දී ගිහිල්ලා අධිකරණයේ විනිසුරුතුමාට විවෘත අධිකරණයේ කතා කරලා ඉන් අනතුරුව සාමාන්‍යයෙන් දින පතාම උසාවි දිනයටම යනවා ස්වාමීනි.

ප්‍ර: එතකොට ඒ වේලාවට ඔබ ගිය අවස්ථාවේ වාර්තා පරීක්ෂා කරේ නැද්ද?

උ: පරීක්ෂා කළේ නැහැ ස්වාමීනි ඒ සිද්ධියෙන් පසුව අධිකරණයේ දී කිව්වා නඩුකාරතුමා රස පරීක්ෂක වාර්තාව ලැබිලා තියෙනේ මේ සිද්ධි වලින් පස්සේ.

ප්‍ර: මොන සිද්ධියෙන් පස්සේද?

උ: මේ බෝම්බ පිපිරීමේන් පසුව.

ප්‍ර: නැහැ ඒක වැරදි 2019 ජනවාරී මාසයේ දී වාර්තා වෙලා තියෙනවා මේ රස පරීක්ෂක වාර්තාව ලැබිලා තියෙනව කියලා. හරියට මං දිනය කියන්නම්. 2019 පෙබරවාරී 26 වෙන කොට ඒක සටහන් වෙලා තියෙනවා. පාස්කු ප්‍රහාරයට පෙර. දැන ගෙන හිටියේ නැහැ?

උ: නැහැ ස්වාමීනි දැනුවත් භාවයක් වුණේ නැහැ.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා.</u>

ප්‍ර: මට කියන්න මහේස්ත්‍රාත්වරයාට ඉල්ලීම ඉදිරිපත් කරන කොට හිටපු මහේස්ත්‍රාත්තුමාගේ නම දන්නවද?

උ: වරින් වර සිටියා ස්වාමීනි.

ප්‍ර: නැහැ නැහැ මේ අදාළ සිද්ධිය සම්බන්ධයෙන් ඒ කියන්නේ 2017 අගෝස්තු මාසය විතර කරුණු දක්වන කොට හිටපු මහේස්ත්‍රාත්තුමා?

උ: මතකයට එන්නේ නැහැ.

ප්‍ර: මඩකලපුව අධිකරණය තියෙන්නේ මහේස්ත්‍රාත් අධිකරණය වෙනමම නේද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දිස්ත්‍රික්ක උසාවිය වෙනමමනේ තිබෙන්නෙ?

උ: එහෙමයි ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබට මතක නැහැ. ඔබ යම් අවස්ථාවකදී අධිකරණයට ගිහිල්ලා ඔබ ඉල්ලීමක් කරාද මහේස්ත්‍රාත්තුමාගෙන් වරෙන්තුවක් නිකුත් කරන්නෙයි කියලා,

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔබ කරුණු දක්වලා කිව්වේ නැද්ද බී වාර්තාව මත මේ පුද්ගලයාව සොයා ගන්න බැහැ රස පරීක්ෂක වාර්තාවත් ලැබිලා නැහැ බී වාර්තාව මත වරෙන්තුවක් නිකුත් කරන්න කියලා ඉල්ලීමක් කරා ද ඔබ?

උ: විදේශගත වෙන බව සම්බන්ධයෙන් තමා ස්වාමීනි ඉල්ලීමක් කළේ.

ප්‍ර: ඉල්ලීමක් කළා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට ඒ අවස්ථාවේදීත් මහේස්ත්‍රාත්තුමා වරෙන්තු නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළා?

උ: එහෙමයි. සැකකරුවන් අත්අඩංගුවට අරගෙන ඉන් අනතුරුව චෝදනා පත්‍රය ගොනු කරන්න කියලා තමා උපදෙස් ලැබුණේ ස්වාමීනි.

ප්‍ර: එතකොට සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට නොහැකි නිසා යැයි මේ වරෙන්තුව ඉල්ලන්නේ කියලා ඔබ මහේස්ත්‍රාත්වරයාට දැනුම්දුන්න ද?

උ: මතකයක් නැහැ ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබට මතකද මේ ඔබේ පොලිස් බල ප්‍රදේශය තුළ යතුරු පැදි භාවිතා කරනවා ආරක්ෂක හිස් වැසුම් නැතුව ඒ කාලේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ අය එහෙම කළේ ඇයි කියලා ඔබ හෙවුවද?

උ: මං එනකොටත් ඒක මම දැක්ක දෙයක් ඒක නගරයේ.

ප්‍ර: පුරුද්දක් වශයෙන්

උ: පුරුද්දක් හැටියට ස්වාමීනි. ඒක දිගින් දිගටම ගියා. නමුත් ඒ සම්බන්ධයෙන් දැඩිව ක්‍රියා කරලා නීතිය කටයුතු කරලා ඒක නැති කරලා දැම්මා.

ප්‍ර: ඒ කියන්නේ ඔබ වැඩ භාරගත්තට පස්සේ

උ: මගෙන් අනතුරුව පස්සේ තමා හෙල්මට් නීතිය ක්‍රියාත්මක වුණේ. මං පෙර කියන තත්ත්වය දන්නේ නැහැ නමුත් මං ඒ සම්බන්ධයෙන් දැඩිව ක්‍රියා කරා.

ප්‍ර: කවද ඉඳල ද?

උ: ඒ මං ගිය අලුත ඉඳලා ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ 2017 අගෝස්තු මාසේ 01 වැනිදායින් පස්සේ ඔබ කියන්නේ කාත්තන්කුඩි ප්‍රදේශයේ මිනිස්සු හෙල්මට් දාගෙන නීතියට අනුව වැඩ කරා කියල ද?

උ: බොහෝ වශයෙන් ස්වාමීනි තරුණ පිරිස් ස්වාමීනි ඒක කළේ. තරුණ පිරිස් ජනගහනයත් එක්ක විශාල වශයෙන් මං නගරයට ගියේ නැහැ යන්න බැහැ පොලිස් ජීප් එක පස්සෙන් ඉස්සර කරලා යනවා. ඉන් අනතුරුව දැඩි ප්‍රයත්නයක් දරලා මං ඒක නැවැත්තුවා.

Proofed Secretary Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: පොලිස් ජීප් එක මොකද්ද කියන්න ආපහු?

උ: පොලිස් ජීප් එකටත් Overtake කරගෙන යනවා. හෙල්මට් නැතුව.

ප්‍ර: ඒ කියන්නේ නීතිය ක්‍රියාත්මක කරන්න ඒ අයට උවමනාවක් නැහැ කියන එක නේද පැහැදිලි වන්නේ?

උ: එහෙම තත්ත්වයක් තිබුණෙ ස්වාමීනි.

ප්‍ර: පොලිස් ජීප් එකත් ඉස්සර කරලා හෙල්මට් නැතුවත් යන

උ: ඒවටත් මං නඩු පැවැරුවා ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔබට වැටෙහුණේ මොකද්ද කාත්තන්කුඩි ප්‍රදේශයේ ඉන්න ජනතාව ලංකාවේ නීතියට නමා සුළු ස්වභාවයක් නැති නීතිය ගනන්ගන්නේ නැති උදවිය බවක් හැඟුණ ද ඔබට?

උ: එහෙමයි ස්වාමීනි. පැහැදිලිවම හැඟෙනවා.

ප්‍ර: එතකොට ඔබ ඔවුන්ට එරෙහිව ක්‍රියා මාර්ග ගත්ත ද මේ සෑම විටම?

උ: පැහැදිලිවම ස්වාමීනි. පැහැදිලිවම අරගෙන 99% ක් හෙල්මට් නීතිය ඉගැන්වුවා.

ප්‍ර: ඔබට ඔය සහරාන් නැමැති අන්තවාදියාගේ කටයුතු සම්බන්ධයෙන් ඔබ ඒ ගත කරපු ඒ කාල සීමාව තුළ ඔහුව follow කරන්න ඔහුගේ කටයුතු සම්බන්ධයෙන් තොරතුරු සොයා බලන්න ඔබට අවස්ථාව ලැබුණ ද?

උ: එහෙමයි ස්වාමීනි. ප්‍රදේශයේ සියළුම මුස්ලිම් බොහෝ ජනතාවගේ දැඩි අප්‍රසාදයට ලක් වෙලා හිටියේ සහරාන් පුද්ගලයා.

ප්‍ර: ඔබට ඔහු මුණ ගැහිලා තියෙනව ද?

උ: මං කවදාවත් දැකලා නැහැ. රූපවාහිනියේ හැරුණු කොට.

ප්‍ර: ඒ කියන්නේ ඔබට දකින්න නොලැබුණේ ඔහු පොලීසිය මඟ හැරපු නිසානේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබට දැන ගන්න හම්බවුණේ නැද්ද හොර රහසේ හෝ මේ පුද්ගලයා මේ ප්‍රදේශයට ඇවිල්ලා යනවා කියලා. මිනිසුන්ගෙන් දැනගන්න හම්බ වුණේ නැද්ද?

උ: එහෙම දැන ගන්න හම්බ වුණේ නැහැ ස්වාමීනි. එහෙම ආවානම් පැහැදිලිව මිනිස්සු ඒ පුද්ගලයාව අල්ලලා දෙනවා එච්චරට කාත්තන්කුඩි වැසියටන්ට මේ පුද්ගලයව එපා වෙලා තිබුණේ අප්‍රසන්න වෙලා තිබුණේ.

ප්‍ර: ඔබ කියන විදියට කාත්තන්කුඩියේ ජීවත් වෙන මුස්ලිම් ජනතාව බහුතරයක් මේ සහරාන්ගේ අන්තගාමී වැඩ වලට විරුද්ධව වැඩ කරපු අය ද?

උ: මම දුටුවේ එහමෙයි ස්වාමීනි. ඔහු ප්‍රදේශය හැර ගියත් සියළුම අන්තවාදී ක්‍රියාවන් නැතිවුණා.

ප්‍ර: එහෙම නම් ඉතිං බෝම්බ පුපුරන දවස දක්වා මේක කොහොම ද වර්ධනය වුණේ? ඔබ කියන විදියට වුණා නම්.

FAIR COMMENT BY JEZEEM

උ: ඔහුගේ ක්‍රියාදාමයන් මගේ පොලිස් වසමේ පිට දී සිද්ධ වෙන්න ඇති නමුත් මේ ප්‍රදේශයේ කාත්තන්කුඩි ප්‍රදේශයේ සිද්ධ වෙන පැහැදිලිවම මිනිස්සු පැහැදිලිව මේ සම්බන්ධයෙන් මේ පොලීසිය දැනුවත් කරනවා.

ප්‍ර: ඔබට මතකද අප්‍රේල් 17 වැනිදා අර ඉඩමක බයික් එකක් පුපුරපු සිද්ධිය?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මට තව දෙයක් තියෙනවා දැන ගන්න දැන් ඔබගේ මේ බල ප්‍රදේශය තුළ ධනවත් පුද්ගලයන් සිටි බව ඔබ දැනගෙන හිටියා නේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ අය ධනවත් පුද්ගලයින් බොහෝ සිටි බව ,

උ: වැඩිමනක් ධවවත් පුද්ගලයෝ මේ ප්‍රදේශවල ඉන්නේ.

ප්‍ර: එහෙම ධනවත් වුණේ කොහොම ද කියන එක පිළිබඳව ඔබ දැනගෙන හිටිය ද?

උ: මං දැනගෙන හිටියේ ව්‍යාපාර කටයුතු සිදු කරන .

ප්‍ර: මොන ව්‍යාපාර කටයුතු ද ඒ ගොල්ලෝ කළේ?

උ: රෙදි බිස්නස් කරා ඔරලෝසු බිස්නස් එතකොට හාඩ්වෙයාර් බොහොමයක් පවත්වාගෙන ගියා වැඩිපිරිසක් ස්වාමීනි.

ප්‍ර: හොඳය ඔබ ඒ සන්සන්දනාත්මකව බලන්නකෝ. ඒ හා සමාන ව්‍යාපාර ලංකාවේ අනිත් පළාත් වලත් තියෙනවනේ. ඒ පළාත් වල ඉන්න මිනිස්සුත් ඒ වගේ ධනවත් වෙලා තියෙනව ද රෙදිපිළි බිසිනස් ඊළඟට ඔරලෝසු බිස්නස් , සාරී බිස්නස් කරලා ඒ වගේ ධනවත් වෙලා තියෙන බවක් පේනව ද?

උ: ඒ සම්බන්ධයෙන් මට කියන්න දැනුවත් භාවයක් නැහැ ස්වාමීනි. නමුත් මේ ප්‍රදේශයේ බොහෝ වශයෙන් මං යන කොට අපි ඒක දැනගෙන හිටියා. මේ ප්‍රදේශයේ ධනවත් පිරිසක් ජීවත් වෙනවා කියලා.

ප්‍ර: එතකොට ඔබට හිතුණේ නැද්ද මේ ප්‍රදේශයේ මෙහෙම ධනවත් පිරිසක් ඉන්නේ මේ අය මුදල් හම්බ කරන ක්‍රමයේ මොකක් හරි විශේෂ ක්‍රමයක් ඇති සාමාන්‍යය ක්‍රමයටම නෙවෙයි මුදල් හම්බවෙන්නේ කියන එක ඔබට හිතුණේ නැද්ද?

උ: එහෙම හිතුණේ නැහැ ස්වාමීනි.

ප්‍ර: දැන් සිද්ධියෙන් පස්සෙවත් ඔබට හිතෙනව ද මේ අයට විශේෂිත මම අදහස් කරන්නේ අප්‍රේල් 21 බෝම්බ පිපුරුණාට පස්සෙවත් ඔබ දැන් ආපහු හැරිලා බලන කොට ඔබට හිතෙනව ද මේ මිනිස්සු මේ පළාතේ ඉන්න අය මේ විදියට සල්ලි තමන් ධනවත් වෙන්න සල්ලි හම්බ කර ගත්ත ක්‍රමය සාමාන්‍යය සම්ප්‍රදයට ක්‍රමයට ඔබ්බෙන් ගිය ක්‍රමයක් කියලා දැනේන්නේ නැද්ද ඔබට?

උ: එහෙම තොරතුරු ලැබෙන්නේ නැහැ ස්වාමීනි මොකද දමිළ ජනතාව ජීවත් වෙනවා ප්‍රදේශයේ විවිධ ප්‍රභූන් ජීවත් වෙනවා. මුස්ලිම් නොවන පිරිස් එහෙම දැනුවත් වීමක් එහෙම ලැබුණේ නැහැ.

ප්‍ර: සිංහල මිනිස්සු කී දෙනෙක් ජීවත් වෙනව ද?

FAIR COMMENT BY JEZEEM

උ: 20 කට වගේ ආසන්න ප්‍රමාණයක්.

ප්‍ර: ඒ අයට කාගෙන්වත් හිරිහැරයක් තිබුණේ නැද්ද?

උ: ඒ අය ඉස්ලාමය වැළඳගෙන තිබ්බේ .

ප්‍ර: ඒ අය ඉස්ලාමය වැළඳගෙන ඉන්නේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දෙමළ අය කොච්චර ජීවත් වෙනව ද?

උ: 41000 හෝ 44000 ක් ජීවත් වෙනවා ස්වාමීනි.

ප්‍ර: එතකොට ඒ අයත් ඉස්ලාමය වැළඳගෙනද ඉන්නේ?

උ: සමහර විට විවාහයක් සිද්ධ වුණොත් .

ප්‍ර: ඉස්ලාම් වැළඳ නොගත් අයට කාත්තන්කුඩියේ ඉන්න බැරිද ඔබ කියන විදියට?

උ: බොහෝ වෙලාවට විවාහයන් සිද්ධ වුණොත් එහෙම ඉස්ලාමයට යනවා.

ප්‍ර: මගේ ප්‍රශ්නය ඉස්ලාම් වැළඳනොගත්තොත් කාත්තන්කුඩියේ ඉන්න බැහැ කියන එකද?

උ: එහෙම ස්වාමීනි දැඩි තීරණ ගන්න පුද්ගලයෝ නැහැ. නමුත් බොහෝ සෙයින් මං දැක්කේ එහෙම විවාහ වෙන ඒවා පැනලා යනවා මුස්ලිම් දමිළ ඒ ආවට පස්සේ. ඉස්ලාමය වැළඳගන්නවා. මං දැක්ක ගොඩාක් ඒවා එහෙමයි.

ප්‍ර: දැන් අප්‍රේල් 21 බෝම්බය පිපිරුවාට පස්සේත් ඔබ මාස 08 ක් විතර හිටියා. කාත්තන්කුඩියේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: බෝම්බයෙන් පස්සේ මිනිසුන්ගේ සිතුම් පැතුම් සිතුවිලි සහ අදහස් මොනවද වුණේ, කොහොමද ?

උ: දැඩි බලපෑමට ලක් වුණා සියළුම ජනතාව. සහරාන්ට දොස් පවරපු එක තමා සියළුම බොහෝ පිරිසක් සහරාන් නිසයි අපිට මේ තත්ත්වය උදා වුණේ කියන හැඟීම තිබුණා ස්වාමීනි. ඒ වෙන කොටත් ඒ අවුරුදු වසර ගණන තුළ නොයෙකුත් ආගමික වැඩ සටහන් මා විසින් දියත් කරා. ඒ සියළුම ආගමිකවතාවන් වලට බෞද්ධ දමිළ ජනතාවගේ දීපවාලි උත්සව එතකොට ස්ථාර් මුස්ලිම් ජනතාවගේ ආගමික කතෝලික ආගමේ නත්තල් ඒ සියළුම උත්සවයන් ඉතාම හොඳින් මගේ පොලිස් ස්ථානයේ දී පවත්වගෙන ගියා. ආගමික සහ ජාතීන් අතර සංහිඳියාව.

ප්‍ර: ඔබ දන්නා විදියට ඔබට තේරිච්ච විදියට ඒ කියන්නේ ඔබ හිටියනේ ජනවාරී මාසේ වෙනකන් 2019?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: නැහැ 2020 ජනවාරි වෙනකන් හිටියනේ. මේ බෝම්බ පිපිරීම අප්‍රේල් 21 සිදු වුණාට පස්සේ ඒ අන්තවාදී අය ඔබ අත්අඩංගුවට ගත්ත කියලා කිව්වනේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඉතුරු වෙච්ච අයත් තව ඉන්නව ද?

Prosecutor's Copy
FAIR COMMENT BY JEZEEM

උ: සමහර විට ඉන්න පුළුවන් ස්වාමීනි. නමුත් ඔහු වටා හිටපු සහරාන් වටා හිටපු පිරිස අතරින් ඉතාම ස්වල්ප දෙනෙක් තමා මේ. මේ පිරිසුත් සහරාන්ගේ මේ දින තුනක පාඨමාලාවට සම්බන්ධ වෙලා ආපු පිරිස්.

****

<u>ගරු විනිසුරු බන්දුල අතපත්තු මැතිතුමා.</u>

ප්‍ර: කස්තුරි ආරච්චි මහත්මයා දැන් ඔබ කියන හැටියට සහරාන් මේ සාමාන්‍යය ජනතාව අතර අප්‍රිය පුද්ගලයෙක් නේද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔහු ප්‍රිය කරපු පද්ගලයොත් හිටිය ද?

උ: ඒ අයවලුන් තමා ස්වාමීනි මේ අත්අඩංගුයට පත් වෙලා ඉන්නේ කාත්තන්කුඩි ප්‍රදේශයේ.

ප්‍ර: ඒ අය අතරේ තරුණ පිරිස් හිටියේ නැද්ද, ඔහුගේ ධර්මය පිළිපදින අරෙහෙ මෙහෙ ?

උ: ඒ කාලවකවානුව ඔහු සිටින කාලවකවානුව තුළ ඔහු වටා පිරිසක් 2000 ක වගේ පිරිසක් ස්වාමීනි ඉඳලා තියෙනවා. හැබැයි මොහුගේ මේ සිදු වීමෙන් පස්සේ මේ 60 ගාණක් විතර පිරිසක් තමා අපිට මොහු සමඟ මොහුගේ ක්‍රියාදාමයන් වලට සම්බන්ධ වුණා කියලා අත්අඩංගුවට ගන්න පුළුවන් වුණේ.

ප්‍ර: මොහු නිකත් චණ්ඩියෙක් වාගේ ප්‍රදේශයේ කටයුතු කරාද?

උ: එහෙමත් හැසිරිලා තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: එතකොට මොහු ධනවත් පුද්ගලයින්ගෙන් කප්පන්ගැනීම පවා ඒවාගේ ඒවා සිදු කරලා තියෙනව ද?

උ: නැහැ. එවැනි දේවල් සිදු කරලා තිබුණේ නැහැ ස්වාමිනි. එහෙම තොරතුරු ලැබිලා නැහැ ස්වමීනි මට .

ප්‍ර: මොහුගේ මරණයෙන් පස්සේ ඒ ප්‍රදේශය සමස්ත ජනතාවම සතුටු වුණා ද?

උ: පැහැදිලිව ස්වාමීනි. ලොකු බියක් තිබුණා ස්වාමීනි ඒ පිරිසට කාත්තන්කුඩි මේ පුද්ගලයගේ පදිංචිය. ඉන්පස්සේ කොහේවත් ඒ පුද්ගලයින්ට යන්න බැරි වුණා. කාත්තන්කුඩියෙන් පිටට. මඩකලපුවට ගියත් අත්අඩංගුවට පත් වුණා. ඒ නිසා දැඩි අපහසුතාවයකට පත් වුණා මේ වැසියෝ සියළුම දෙනා. හුඟ දෙනෙක්.

****

<u>ගරු අදිකාරී මැතිණිය.</u>

ප්‍ර: කස්තුරි ආරච්චි මහත්මයා මම මේ කොමිෂමේ සාමාජික මහත්මයෙක් අහපු අර ධනවත් ව්‍යාපාරකයින් ඉන්න කිව්ව එකටම එකතු කරන්න කැමති ප්‍රශ්නයක් කාත්තන්කුඩිය ප්‍රදේශයේ නීති විරෝධී ව්‍යාපාරික කටයුතු මොනව හරි සිද්ධ වෙනව ද?

FAIR COMMENT BY JEZEEM

උ: බොහෝ බහුලව තිබුණේ ඔය ගංජා එහෙත් මම වැඩිපුරම කිලෝ 34 ක් අත්අඩංගුවට අරන් තිබෙනවා ස්වාමීනි වැඩිම අර ගත්ත සුළු වශයෙන් ඕක තමා නීති විරෝධී ක්‍රියාවකට මට අත්අඩංගුවට ගන්න පුළුවන් වුණේ. හැබැයි චෙක් පත් වංචාව ඔවුන් අතරම සිදු වුණා. බහුල ලෙසින්. මුදල් චෙක්පත් වංචාව පිටට එවැනි දේවල් .

ප්‍ර: නැහැ ගමන් ඔය පාස්පෝට් රැකටිස් කරන ඒවා ව්‍යාජ ලේඛන හදන ඒවා ගමන් බලපත්‍ර හදන වැඩ ඒ වගේ දේවල් ?

උ: විදේශගත කිරීම් තිබුණා ස්වාමීනි . සමහර අවස්ථාවලදී ඒ මුදල් ආපසු දෙන්නේ නැහැ යන්න. ආපසු යන්න බැරි වුණා කියන පණිවිඩ තියෙනවා ස්වාමීනි. ඒවා සෙට්ල් කරලා තියෙනවා ස්වාමීනි. එහෙම නැති වුණොත් විශාල වශයෙන් මුදල් ගත්ත ඒවා CID හරහා යොමු කරලා කටයුතු කරලා තිබෙනවා.

ප්‍ර: ඔබ දැන් දැනුවත් වුණා ද මෙම කාත්තන්කුඩි ප්‍රදේශය පිළිබඳව ලංකාවේ තියෙනවා මතයක් මෙම ප්‍රදේශයේ ව්‍යාපාරිකයින් ලෝකයේ තියෙන brand production ..... ව්‍යාජ Products හදලා ඒ branded name වලින් ලංකාවේ වෙළඳපොලට දානවා මං වර්ග කිහිපයක් දානවා එකක් සිගරට් එකක් සිගරට් ලයිටර්ස්, සපත්තු භාණ්ඩ ව්‍යාජ එවැනි භාණ්ඩ ඔබ පොලිස් ස්ථානාධිපති හැටියට ඉන්න කොට දැන් ධනවත් මිනිස්සු ඉන්න බවත් දන්නවනේ?

උ: එහෙමයි.

ප්‍ර: ධනවත් මිනිස්සු මේ වගේ නීති විරෝධී ඒවා කරනව නම් නීති විරෝධී නේද ඒක? අනිත් එක තමයි සුවඳ විලවුන්?

උ: එහෙමයි ස්වාමීනි. සපත්තු ව්‍යාපාරය නම් කරගෙන ගියා බහුල ලෙසින් අනිත් ඒවා සම්බන්ධයෙන් මොකද ඒවා කරගෙන ගියා නම් ඒ තොරතුරු ලැබෙනවා මොකද ඒ අතරින්මත් එනවා තොරතුරු ඒ මුස්ලිම් ජනතාව අතර මෙන්න මෙයා මේ විදියට කරනවා කියලා මටත් ඒ තොරතුරු තිබුණා මේ ගොල්ලෝ අද දිනයේ දී අලුත් ලෝකයේ යම්කිසි මේ එකක් කරොත් පසු දින කාත්තන්කුඩි මේක හදනවා කියලා.

ප්‍ර: ඉතිං ඒවා හෙව්වාම බොරු ද එතකොට?

උ: නැහැ ඒවා හිටපු කාලය තුළ අනාවරණය වුණේ නැහැ ස්වාමීනි.

ප්‍ර: හැබැයි ඒක ලංකාවේ ම ඉතිං කතා කරන මාතෘකාවක් ඔය කාත්තන්කුඩිය?

උ: එහෙමයි ස්වාමීනි මම යන කොටම මම දැනුවත් වුණා ඒ සම්බන්ධයෙන්. නමුත් මට එහෙම නීති විරෝධී එකක් සම්බන්ධයෙන් අනාවරණය වීමක් වුණේ නැහැ.

ප්‍ර: මොකද ඔබ මෙම කොමිෂම හමුවේ දී ඉදිරිපත් වෙච්ච කරුණු අනුව කාත්තන්කුඩි ප්‍රදේශයේ ජනතාවගෙන් බහුතරයක් කෘෂිකාර්මික ධීවර කර්මාන්තයේ නිරත වුණු මිනිස්සු?

උ: එහෙමයි ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ප්‍රදේශයේ ජනගහනය ලක්ෂයක් ඉන්නව නම් ඒ ජනගහනයට නම් වෙළඳපොළක් තියෙන්නේ ඒ ඒ මිනිස්සුන්ටත් ක්‍රියා ශක්තියක් තියෙන්න ඕනනේ. අර කට්ටයට ගොඩක් පොහොසත් වෙන්න,

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එකපාරටම ඒ මිනිස්සුන්ට දුප්පත් මිනිස්සුනන් ඉන්නේ බහුතරයක් කෘෂිකර්මයයි ධීවර කර්මාන්තයයි කරන අර ව්‍යාපාරික ප්‍රජාවක් අසීමිතව පොහොසත් වන්නට එහෙම ආර්ථික විද්‍යාවේ දී වෙන්න බැහැ ඒක තමයි ඔබ පොලිස් ස්ථානාධිපති නම් සොයා බලන්න ඕන නීති විරෝධී ව්‍යාපාරික කටයුතු මේ ප්‍රදේශයේ වෙනව ද කියල?

උ: ඒක ස්වාමීනි මට පමණයි මීට පෙර හිටිපු කිසිම කෙනෙකුටත් අනාවරණය වෙලා තිබුණේ නැහැ එවැනි කටයුත්තක් සිදු කරන බවට .

ප්‍ර: දැන් වච්නතිව් පොලිස් මුරපොළට අර ප්‍රහාරය එල්ල වෙච්ච වෙලාවේ ඔබ ද සිටියේ?

උ: මම කාත්තන්කුඩියේ ස්ථානාධිපති.

ප්‍ර: දැන් ඔබගේ පොලිස් ස්ථානයේ බුද්ධි නිලධාරීන් කී දෙනෙක් සිටිය ද?

උ: බුද්ධි නිලධාරීන් ස්වාමීනි පස්දෙනෙකුට ආසන්නව මට මතකයේ හැටියට ඉන්නවා.

ප්‍ර: මේ සිදුවීමෙන් පස්සේ බුද්ධි නිලධාරීන් සහ ඔවුන්ගේ තොරතුරුකරුවන් මගින් මෙම පොලිස් මුරපොලේ පොලිස් නිලධාරී දෙදෙනෙකු අමානුෂික ලෙස ඝාතනය කිරීම පිළිබඳව ඔබ තොරතුරු සෙව්වද?

උ: මෙහෙමයි ස්වාමීනි ඒ සම්බන්ධයෙන් පොලීසිය විසින් පත්කරපු පොලීසියට අදාළ නිලධාරීන් දෙන්නෙක් ඉන්නවා. ඊට අමතරව වෙනම ඉන්නවා මුළු වසම්වල තොරතුරු හොයන තොරතුරු ඒ තොරතුරු එකරැස් කරන ක්‍රමයත් තියනවා බුද්ධි තොරතුරු

ප්‍ර: නැහැ මට විදිය කියන්න එපා. දැන් ඔබ එහෙම කරානම් කිසිම දෙයක් ඔබට තොරතුරු ලැබුණ ද, මොනව හරි මේ ගොල්ලන්ව කවුද මේක කරලා තියෙන්නේ මොනවහරි තොරතුරු ලැබුණ ද?

උ: නැහැ ස්වාමීනි. ලැබුණේ නැහැ ස්වාමීනි.

ප්‍ර: ඔබ රාජකාරී කරන කාලය තුළදී නැගෙනහිර ආණ්ඩුකාරවරයා හැටියට හිටියේ කවුද?

උ: හිස්බුල්ලා.

ප්‍ර: හිස්බුල්ලා මහතාගේ නිල නිවසේ තිබී ගිනි අවි සහ උණ්ඩ සොයා ගත්ත බවට?

උ: ගිනි අවි නැහැ ස්වාමීනි පතුරොම් ප්‍රමාණයක් තිබිලා STF එක විසින් සොයා ගත්තා.

ප්‍ර: ඔබ මැදිහත් වුණේ නැද්ද ඒවා සොයා ගැනීමට ?

උ: නැහැ ඒ කාලවකවානුව තුළ දී සියළුම ප්‍රදේශයේ තෝරාගත් ප්‍රදේශයක් වැටලීම් කරලා Cordon search එකක් කරා ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔබ මේ පිළිබඳව ඔබට කිසිම තොරතුරක් නැද්ද කොමිෂම හමුවේ තොරතුරක් දන්නව නම් කියන්න . මේ ආණ්ඩුකාර හිස්බුල්ලා මහතාගේ නිල නිවසේ තිබිලා හොයා ගත්ත?

උ: ස්වාමීනි මේක හිස්බුල්ලා විසින් පාවිච්චි කරපු කාර්යාලය. ඒ කාර්යාලයේම යාබද කාර්යාලයක තමා පොලිස් නිලධාරීන් සහ යුධ හමුදා නිලධාරීන් ඉඳලා තියෙන්නේ ආරක්ෂාවට. එතකොට මේක මෙයා හැර ගිහිල්ලා තිබුණේ. නමුත් යතුරු තිබුණා මොහුගේ කාර්යාලයේ මෙයාගේ සහයකයා ළඟ. පස්සේ මේක පරීක්ෂා කරන්න ඕනි නිසා. මේක ඇරලා පරීක්ෂා කරනවා. ඒ අවස්ථාවේ තමයි STF එකට මේක හම්බ වෙන්නේ ඒ කාමරයේ තිබිලා. නමුත් ඒ සම්බන්ධයෙන් අත්අඩංගුට අරගෙන ක්‍රියා කරලා තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: ඔබ පාර්ලිමේන්තු තේරීම්කාරක සභාව හමුවේදීත් සාක්ෂි දෙන්නට ඉදිරිපත් වුණා නේද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එම තේරීම්කාරක සභාව හමුවේ දී ඔබට චෝදනාවක් එල්ල වෙලා තිබෙනවා කාත්තන්කුඩිය පොලීසිය සහරාන්ලා ඇල්ලීමට කටයුතු කිරීමටත් වඩා සහරාන්ලා සමඟ තමයි කාත්තන්කුඩිය පොලිසිය රාජකාරී කටයුතු කළේ කියලා. ඔබට මොකද්ද ඒක ගැන මේ කොමිෂම හමුවේ කියන්න තියෙන්නේ?

උ: එකම චෝදනාවක් ආවේ නැහැ. පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ ස්වාමීනි.

ප්‍ර: තියෙනවා තියෙනවා. පාර්ලිමේන්තු තේරීම්කාරක සභාවේ දී මේ වාර්තාව තමයි මගේ අතේ තියෙන්නේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: ඔබ කියන්නේ පාර්ලිමේන්තු තේරීම්කාරක සභාවේ එවැනි චෝදනාවක් ඔබට යොමු කෙරුවේ නැහැ කියල ද?

උ: මගේ මතක හැටියට ස්වාමීනි එවැනි චෝදනාවක් කළේ නැහැ.

ප්‍ර: නැහැ අපි අහන්නේ වාර්තාව ගැන නෙවෙයි අපි අහන්නේ සාක්ෂි විසමන වෙලාවේ දී?

උ: නැහැ ස්වාමීනි මතකයේ හැටියට එහෙම චෝදනාවක් එල්ල කළේ නැහැ. ඔය කාලවකවානුව වෙන කොට ස්වාමීනි සහරාන් ඇතුළු ඔය අත්අඩංගුවට පත්වුණ පිරිස තමා සහරාන් වටේ හිටියේ.

****

<u>ගරු අදිකාරී මැතිණිය.</u>

ප්‍ර: කවුද හිටියේ සහරාන් වටා?

උ: ඒ තාත්තා ඔය අත්අඩංගුවට පත් වුණ 09 දෙනයි ඔය වරෙන්තු වෙලා තිබුණු 04 දෙනයි ඒ පිරිස පමණයි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මට මතකයි මේ ප්‍රශ්නය ඔබට යොමු කළේ රාජිත සේනාරත්න හිටියේ ඒ කමිටුවේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔය රාජිත සේනාරත්න මහතා තමයි ඔබට එම ප්‍රශ්නය යොමු කළේ කියලා මම යෝජනා කරනවා?

උ: ස්වාමීනි ඒ වන කොට සහරාන් කියන පුද්ගලයා ඒ වසමේත් නැහැ මං යන කොට වසමේත් නැහැ. ඔහුගේ .

වේලාව: ප.ව.07.30
මෙතැන් සිට : නිල්මිණි මෙනවිය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

දැන් වේලාව: ප.ව.7.30
පෙර සටහන් ල/ලේ: සවිනි මෙනවිය
මෙතැන් සිට ල/ලේ: නිල්මිණි.

<u>ගරු විනිසුරු අදිකාරි මැතිනිය</u>

ප්‍ර: නැහැ නැහැ මේක ඔබට නෙමෙයි. ඔබ ගිය අවස්ථාවක දී රාජිත සේනාරත්න මහත්මයා අහන්නේ මේ සහරාන්ලා ඇල්ලීමට වඩා මේ කාත්තන්කුඩි පොලිස් ස්ථානය විසින් සහරාන්ලා සමඟ ජීවත් වීම වගේ ඔවුන් සමඟ එකට සහජීවනයෙන් එකට කටයුතු කරපු එක තමයි තිබෙන්නේ කියලා තමයි යොමු වෙලා තියෙන ප්‍රශ්නය මගේ?

පි: මගේ කාලය තුල ස්වාමිනි එසේ නොවේ.

ප්‍ර: ඒ නිසා ද ඔබ මේක ඩිනයි කරේ ඔබේ කාලයේ නෙමෙයි නිසාද?

පි: එහෙමයි ස්වාමිනි. ඒ කාලේ කිසිම සම්බන්ධයක් නැහැ.

ප්‍ර: ඔබගෙන් ඉස්සෙල්ලා කාලය ගැන මොකක්ද ඔබට හිතන්න පුළුවන් වෙන්නේ?

පි: ඒ ගැන මම කියන්න දන්නේ නැහැ ස්වාමිනි.

ප්‍ර: මොකුත් හිතන්නවත් බැහැ නේද?

පි: බැහැ. මගේ කාලය තුල නිලධාරීන් ඉතාම සුහදව සහ රාජකාරී කටයුතු කළා. නැත්නම් හෙල්මට් නීතිය ක්‍රියාත්මක කරන්නත් බැහැ ස්වාමීනි. ඒ සම්බන්ධයෙන් නඩු වාර්තාකුත් තියෙනවා 2019 වෙනකොට ස්වාමීනි 632ක් වගේ තමා නඩු තියෙන්නේ. දඩ ගත්ත මුදල් එහෙම ඒ සම්බන්ධයෙන් තියෙන්නේ.

ප්‍ර: දැන් තව ප්‍රශ්නයක් මට තියෙනවා. අප්‍රේල් 21 ප්‍රහාරය පිළිබඳව ඔබට ඊට ප්‍රථමයෙන් දැන ගන්නට ලැබුණද?

පි: නැහැ ස්වාමිනි.

ප්‍ර: ලැබුණේ නැහැ?

පි: නැහැ නැහැ ස්වාමිනි.

ප්‍ර: කවදා ද ඔබට අප්‍රේල් 21 ප්‍රහාරය ගැන දැන ගන්නට ලැබුණේ?

පි: මෙම සිදුවීමෙන් පස්සේ ස්වාමීනි. හැබැයි අර 17 වෙනිදා වුණ සිදුවීමක් එකක් තියනවා යතුරු පැදි බෝම්බයක් එක්ක සිදුවීමක්.

ප්‍ර: දැන් ඔබ මෙම කොමිෂම හමුවේ ප්‍රකාශ කරානේ සහරාන්ලා පිළිබඳව කාත්තන්කුඩි ප්‍රදේශයේ සියලුම ජනතාව අකැමැත්තෙන් සිටියා කියලා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ වගේම ඔබ මෙම කොමිෂම හමුවේ කිව්වා රිල්වාන් කියන අය මේ බෝම්බයක් test කරන්න ගිහිල්ලා කිසියම් අනතුරුකට පත්වෙලා ඔබට ඒක අප්‍රේල් 21 ප්‍රහාරයෙන් පසුව දැන ගන්නට ලැබුණා කියලා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඇයි ඔබ හිතන්නේ නැත්තේ මෙතරම් මිනිසුන්ගේ විරෝධතාවයක් සහරාන්ලා සහ ඒ කණ්ඩායමට තිබුණානම් බෝම්බයක් අත් හැදීමක්

FAIR COMMENT BY JEZEEM

වගේ දෙයකට ගිහිල්ලා අනතුරුක් සිදු වෙලා ඔහුව කාත්තන්කුඩියේ සිට කොළඹට ගෙනල්ලා ඔබ සඳහන් කර අක්කර පනස් ගාණක ද කොහේදෝ වත්තකට ගෙනිහිල්ලා තියෙනවා මෙයාව කියලා. ප්‍රථමධාරා ලබා දෙන්න?

පි: නැහැ ස්වාමීනි. ඒ යතුරු පැදි බෝම්බය පිපිරුණු ස්ථානය තමයි.

ප්‍ර: යතුරුපැදි නෙමෙයි මම අහන්නේ. අර අත්හදා බැලීමක් කරපු එක ?

පි: 2, 3 ක වගේ.

ප්‍ර: එතකොට ඇයි මේ ගමේ කිසිවෙකු හෝ ඔබට මේ තොරතුරුවත් දුන්නේ නැත්තේ මෙතරම් මිනිස්සු අකැමැතිනම් මේ කණ්ඩායමට?

පි: ස්වාමීනි එක දිගට මෙගොල්ලෝ වාසය කළේ නැහැ මේ ගමේ. යම් අවස්ථාවල දී ඇවිල්ලා පරීක්ෂා ඔය බෝම්බය අත්හදා බලලා තිබුණේ පාළු ප්‍රදේශයක මුහුදු වෙරළක.

ප්‍ර: නැහැ ඉතින් කාත්තන්කුඩියෙනේ ඔබගේ පොලිස් බල ප්‍රදේශයනේ?

පි: නමුත් ඒ මනුස්ස වාසය කරන ප්‍රදේශයක් නෙමෙයි ස්වාමීනි. එතන ඉඳලා ඔල්ලිකුලම් යනකනුත් පාළු ප්‍රදේශයක් තියෙන්නේ.

ප්‍ර: කිසිම මනුස්ස වාසයක් නැහැ?

පි: ඒ පාර පාලු ප්‍රදේශයන් තියෙනවා මනුස්ස වාසයන් නැති. අර ගෙනිච්ච ඔල්ලිකුලම් කියන ස්ථානයත් අහල පහල නිවෙස් නැහැ ස්වාමීනි. ඔක්කෝම මේ ඔය රවුන් විසින් පාවිච්චි කරපු ඉඩම කොට්ඨාශය තිබුණා ඊට එහායින් විශාල තට්ටු දෙකේ නිවාස ඒවා පදිංචි වාසයක් නැහැ. ඊට එහා පැත්තෙන් දෙමළ ගම්මානය තිබුණේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: ඔබගෙන් තව එක ප්‍රශ්නයක් අහන්න තියෙනවා. ඔබ දැන් කියන හැටියට ඔබ දන්නවා සහරාන්ගේ පියා ෂෙයිනි මල්ලි සහ ඔහුගේ පවුලේ අනිත් අය ඒ කාත්තන්කුඩි පොලිස් වසමේ දිගටම හිටියා කියලා?

පි: රිල්වාන් හැරුණු කොට තාත්තා සහ ෂෙයිනි මවුලවි හිටියා.

ප්‍ර: එතකොට ඔබගේ විමර්ශන වල දී ඔබව අවම වශයෙන් ඔවුන්ගෙන් ප්‍රකාශ ලබා ගත්තද?

පි: ස්වාමීනි ප්‍රකාශ කියන්නේ අධිකරණයෙන් ඇප ලබාගෙන ඇවිල්ලා හිටියේ.

ප්‍ර: නැහැ නැහැ ඔවුන්ගෙන් ප්‍රකාශ ලබා ගත්තාද සහරාන් ඉන්නේ කොතනද කියලා බලන්න?

පි: ඔවුන් මාසේ අන්තිමට පොලිසියට එනවා 31 වෙනිදා හෝ 30 වෙනි දින අත්සන් කරන්න. ඒ වෙලාවට ගෙනල්ලා අහනකොට කියන්නේ දන්නේ නැහැ කියලා ස්නාමීනි.

ප්‍ර: නැහැ නැහැ ඒ වගේ ප්‍රකාශ නෙවෙයි. මම කියන්නේ ඒ වගේ ප්‍රකාශයක් ලියා ගත්තද කියලා?

FAIR COMMENT BY JEZEEM

පි: නැහැ එහෙම ලියාගෙන නැහැ ස්වාමීනි.

ප්‍ර: ඇයි ලියා ගත්තේ නැත්තේ?

පි: කොහොමත් ඔවුන් දැනුවත් බව උනත් කියන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර: එහෙම ලියා ගත්තානම් ඔබට ඔවුන්ගේ දුරකතන අංක ගන්න තිබ්බා නේද?

පි: සම්බන්ධයක් නොමැති බව තමයි ස්වාමීනි කියා සිටින්නේ. ඉන්න තැනක් දන්නේ නැහැ කියලා.

ප්‍ර: සම්බන්ධයක් තියෙන කවුද කියන්නේ සම්බන්ධයක් තියෙනවා කියලා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔවුන්ගේ දුරකථන ලබාගෙන ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් කරලා අඩුගානේ බලන්න තිබුණා නේද? මොවුන් සහරාන් සමඟ දුරකතනයෙන් සම්බන්ධ වෙලා තියෙනව ද කියලා නේද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එහෙම කෙරුවද?

පි: එහෙම සිදු කරලා නැහැ ස්වාමීනි.

මෙම සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් නැවත ලබා දෙන ලෙස උගත් අතිරේක සොලිසිටර් ජනරාල් මෙනවිය ඉල්ලයි. අවසර ලබාදෙමි. ඉන් පසු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥවරයාට අවස්ථාව ලබා දෙයි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයෙෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: කස්තුරිආරච්චි මැතිතුමා මට දැන් ප්‍රශ්න අහන්න වෙන්නේ ඔබ විසින් උගත් කොමසාරිස්වරුන් වෙත ලබා දුන්න මේ පිළිතුරු සළකලා බලන හින්දායි. ඔබ ගරු සභාපතිතුමා ප්‍රශ්න කරන කොට සඳහන් කෙරුවා විවෘත වරෙන්තුවක් ලබා ගැනීම සඳහා චෝදනා පත්‍රයක් ගොනු කරන්නට ඕනිය කියලා. එහෙම කිව්වද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඇයි එහෙම කරන්න අවශ්‍ය වෙන්නේ?

පි: ඒක අධිකරණයේ නඩුකාරතුමා විසින් දුන්න උපදෙස් ස්වාමීනි. විවෘත වරෙන්තුවකට නම් චෝදනා පත්‍රයක් ගොනු කරලා සැකකරු අත්අඩංගුවට අරගෙන ඉන් අනතුරුව.

ප්‍ර: දැන් එහෙම අවශ්‍යතාවයක් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ තියෙනවද 1979 අංක 15 දරණ? අධිකරණයක නඩු කටයුතු මෙහෙය වෙන්නේ තියෙන නීති පද්ධතීන් අනුව නේද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එහෙම උවමනාවක් එහෙම නෛතික අවශ්‍යතාවක් තියෙනවද අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ හෝ වෙනයම් පනතක හෝ වෙනයම් රෙගුලාසි ?

FAIR COMMENT — BY JEZEEM —

උත්තරයක් නැහැ

ප්‍ර: හොඳයි මම එහෙනම් මෙහෙම අහන්නම්කෝ ඔබ දන්නවද සංඥය වැරදි කියන්නේ මොනවද කියලා? Cognizable offences

පි: ස්වාමීනි වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීමට පුළුවන් වැරදි ස්වාමීනි.

ප්‍ර: සංඥය නොවන වැරදි කියන්නේ මොනවද?

පි: ඒ කියන්නේ වරෙන්තුවක් අවශ්‍යයි. අධිකරණයේ වරෙන්තුවක් අවශ්‍යයි.

ප්‍ර: එතකොට අධිකරණයට කරුණු වාර්තා කරලා විමර්ශකයන් වරෙන්තුවක් ගත්තේ නැත්නම් අන්න එතකොට තමන්ගේ බලය අතික්‍රමණය කරලා තමුන් වැරද්දක් කරනවා මොකද අත්අඩංගුවට ගැනීමෙන් ඔහුට නිදහසේ මේ සමාජයේ හැසිරෙන්නට තියෙන අවස්ථාව අහිමි කරන නිසානේ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ නිසා අධිකරණයට කරුණු වාර්තා කරලා අධිකරණ අනුමැතිය අනුව තමයි එහෙම නම් අත්අඩංගුවට ගන්නට පුළුවන් වෙන්නේ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබට මතකයක් තියෙනවද දැන් ඔබ කියෙව්වායි කියලා කිව්වානේ මඩකලපුව මහෙස්ත්‍රාත් අධිකරණ නඩු අංක B276/2017 තියෙන කරුණු ඊට අදාළව කරන ලද විමර්ශන ඒ ගැන උපදෙස් එහෙම දුන්නායි කිව්වානේ නේද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මම දෙන්නම්කෝ දැන් මම ගාව තියෙන සිංහලෙන් මේක තමයි ඉස්සරවෙලාම තියෙන B Report එක. එකේ ඔය පිටුව බලන්නකෝ. ඔබේ පූර්වගාමියා ඔය පළවෙනි B වාර්තාවෙන් සඳහන් කරනවා නේද මොනවගේ වැරදි ද මොනවගේප සාපරාධී ක්‍රියාද සිදු වෙලා තියෙන්නේ නැත්නම් මේ සැකකරුවන් විසින් සිදු කරලා තියෙන්නේ කියලා?

පි: ඔව්.

ප්‍ර: ඒ අනුව සඳහන් වෙලා තියෙනවා නේද 141 වගන්තිය ඔය B වාර්තාවේ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මොකක්ද 141 වගන්තිය මඟින් කියන චෝදනාව? මාරක ආයුධ කිසිවක් ඇතිව නීති විරෝධි රැස්වීමකට සහභාගී වීම නේද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට මේ ඔබලා විමර්ශකයින් වාර්තා කරලා තියෙන කරුණු. එය වරෙන්තුවක් නැතුව සිර භාරයට ගන්නට පුළුවන් වැරැද්දක් නේද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඊට පස්සේ ඔබේ පූර්වගාමියා වාර්තා කරලා තියෙනවා නේද සිදු කරලා තියෙන වැරදි අතරින් 145 වගන්තිය යටතේ වූ වැරැද්දක් සිදු කරලා තියෙනවා කියලා සැකකරුවන්?

FAIR COMMENT BY JEZEEM

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එම වරද දණ්ඩ නීති සංග්‍රහය යටතේ මාරක ආයුධයක් ඇතිව කැරලි ගැසීමේ වැරැද්ද කියලා මා කිව්වොතින් නිවැරදි ද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එයත් වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගන්නට පුළුවන් වැරැද්දක් නේද ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: බලන්න 149 වැරැද්දක් සිදු කරපු බවට ඔබේ පූර්වගාමියා කරුණු වාර්තා කරලා තියෙනවද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දණ්ඩ නීති සංග්‍රහය අනුව 149 කියන්නේ කැරලි ගැසීම් ආදිය මැඩපැවැත්වීමේ දී රජයේ සේවකයෙකුට අඩත්තේට්ටම් කිරීම හෝ බාධා කිරීම කියන වැරැද්ද නේද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එම වැරැද්දටත් අදාළ තැනැත්තන්ව, වරදකරුවන්ව වරෙන්තුවක් නැතුව සිර භාරයට ගන්නට පුළුවන් නේද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඊළඟට බලන්න 314 වන වගන්තිය ගැනත් සඳහන් කරනවා නේද ඔය පළවෙනි B වාර්තාවේ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ ස්වෙච්ඡාවෙන්ම තුවාල සිදු කිරීම?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔබ දන්නවා ස්වෙච්ඡාවෙන්ම තුවාල කිරීමත් වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගන්න පුළුවන් වැරැද්දක්

පි: ඔව්.

ප්‍ර: 315 බලන්න. 315 වගන්තියත් සඳහන් කරලා තියෙනවා නේද ඔය වාර්තාවේ ?

පි: තියෙනවා ස්වාමීනි.

ප්‍ර: එමඟින් කියන්නේ දණ්ඩ නීති සංග්‍රහයේ අන්තරාදායක ආයුධ වලින් හෝ උපක්‍රම වලින් හෝ ස්වෙච්ඡාවෙන්ම තුවාල සිදු කිරීම නේද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ වරද සම්බන්ධයෙනුත් වරෙන්තුවක් නැතුව අත්අඩංගුවට ගන්න පුළුවන් නේද?

පි: පුළුවන් ස්වාමීනි.

ප්‍ර: ඊළඟට බලපු 317 ගැනත් ඔබේ පූර්වගාමියා සඳහන් කරනවානේ ඔය B වාර්තාවේ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ දණ්ඩ නීති සංග්‍රහය අනුව අන්තරාදායක ආයුධ වලින් හෝ උපක්‍රම වලින් හෝ ස්වෙච්ඡාවෙන්ම බරපතල තුවාල සිදු කිරීම?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒකත් පුළුවන් නේද වරෙන්තුවක් නැතුව අත්අඩංගුවට ගන්න?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔබ මා කිව්වොතින් එකඟ වෙනවද මේ වගේ සංඥය වැරදි පිළිබඳව වාර්තා වුණාම ඒ අදාළ සැකකරුවන්ව වරෙන්තුවක් නැතුව අත්අඩංගුවට ගන්නට පුළුවන් කියලා?

පි: පුළුවන් ස්වාමීනි.

ප්‍ර: නමුත් ඔබේ පූර්වගාමීයා ඔවුන් අත්අඩංගුවට අරගෙන තිබුණ් නැහැ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබේ කාලයෙත් අත්අඩංගුවට ගැනීමක් සිදු වුණේ නැහැ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: නමුත් ඔබලා කෙරුවේ දින වරෙන්තු ඉල්ලමින් සිටියා මේ ප්‍රධාන සැකකරුවන් 4 දෙනා අත්අඩංගුවට ගන්නට?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ගරු විනිශ්චයකාර තුමා ප්‍රශ්න කරනකොට ඔබ කිව්වා දින වරෙන්තුවක් කියන්නේ මොකක්ද කියලා. එතකොට ඒ දින වරෙන්තුව මඟින් නිශ්චිත කාලයක් තුළ දී පමණයි අත්අඩංගුවට ගැනීම කරන්නට පුළුවන් වෙන්නේ නේද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: නමුත් දින වරෙන්තු කිහිපයක් නිකුත් කරලා අත්අඩංගුවට ගන්නට බැරි වෙන්නේ මොන අවස්ථාවේ ද? date warrants දෙනවා. නමුත් ක්‍රියාත්මක කරන්නට බැරි මොන වෙලාවේ ද?

පි: ඒ අදාළ අවසාන දිනයට පසු.

ප්‍ර: ඊට පස්සේ ක්‍රියාත්මක කරන්න බැහැ. හරි දැන් ඕක හැමදාම කරන්නට පුළුවන් ද? කවදා හෝ සැකකරුවන් අත්අඩංගුවට ගන්නකම් ගරු අධිකරණයකින් ඔබට පුළුවන් ද දින වරෙන්තුවක් ඉල්ලන්න. ස්ථානාධිපතිවරයෙක් විදිහට ඔබ ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයෙක්නේ නේද?

පි: ඔව්.

ප්‍ර: කාත්තන්කුඩි යනකොටත් ඔබ ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයෙක්. ඒ කියන්නේ පොලිස් දෙපාර්තමේන්තුවේ සාමාන්‍යයෙන් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක්?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබට තරම් වෙනවද හැමදාම මේ නඩුව කතා කරන හැම වෙලාවේම දින වරෙන්තු ඉල්ලන්න ඔබට සරිලන දෙයක් නෙවෙයි නේද ඒක?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එහෙමනම් ඔබ විසින් ඊට වඩා පියවරක් ගත යුතුව තිබුණා නේද? ඔබට පුළුවන්කම තිබුණා නේද කස්තුරිආරච්චි මහත්මයා ගරු අධිකරණයට වාර්තා කරලා කියන්න මේ දින වරෙන්තු ක්‍රියාත්මක කිරීම සඳහා මම

FAIR COMMENT BY JEZEEM

උත්සාහ කෙරුවා. නමුත් ඔවුන් සොයා ගන්නට බැහැ. ඒ දෙන ලද ලිපින වල ඔවුන් නැහැ කියලා වාර්තා කරලා ඔබට ඒ අවස්ථාවේ දී විවෘත වරෙන්තුවක් ඉල්ලන්ට පුළුවන්කමක් තිබුණා නේද?

පි: එක් අවස්ථාවක් ස්වාමීනි ගිහිල්ලා විදේශ ගත වෙන්න යනවා කියලා ඒ අවස්ථාවේ දී විවෘත වරෙන්තුවක් ඉල්ලා සිටියා මම.

ප්‍ර: දැන් මම අහපු ප්‍රශ්නයට උත්තරය දීලා ඊට පස්සේ ඕනි එකක් කියන්න. දැන් මොකක් ද මම අහපු ප්‍රශ්නය. මම අහන්නේ දින වරෙන්තු ක්‍රියාත්මක කරන්නට බැරි වුණාම, එතකොට පුළුවන් නේද ගරු අධිකරණයෙන් ඒ තත්ත්වය වාර්තා කරලා ඒ මනුස්සයා හොයා ගන්න බැරිනම් අපිට මේක තනියම කරන්න බැහැනේ නේද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබේ පොලිස් ස්ථානයට තනියම කරන්න බැහැ. එහෙමනම් ඔබට මේ ලංකාවේ ඉන්න තිබෙන අනිකුත් පොලිස් ස්ථානවල සහයෝගය අවශ්‍ය වෙනවා.

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ නිසා ඔබ විසින් අනිත් පොලිස් ස්ථාන වලට මේක දැනුම් දෙන්න ඕනි නේද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එහෙම දැනුම් දුන්නානම් අනිත් පොලිස් ස්ථානත් මේ පිළිබඳව විමසිලිමත් වෙනවා නේද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: කස්තුරිආරච්චි මහත්මයා වරෙන්තුව අමතක කරන්න. ඔබට මේ පුද්ගලයින් 4දෙනා අත්අඩංගුවට ගන්න බැරි වුණ අවස්ථාවේ දී ඔබට පුළුවන්කම තිබුණා නේද ඔබ සෑහීමකට පත්වුණානාම් අවංකව, සත්‍ය වශයෙන් ඔබේ බලප්‍රදේශය තුළ දී ඔබේ වසම තුළ මේ ප්‍රධාන සැකකාරයෝ 4දෙනා නැති බව ඔබ සෑහීමකට පත් වුණානානම් එතකොට ඒ අයව අත්අඩංගුවට ගන්නට අනිත් අයට, අනිත් පොලිස් ස්ථානවලට පොලිස් පණිවිඩයක් දෙන්න. මෙහෙම 4 දෙනෙක් නඩුවකට අපිට අවශ්‍යයි. ඒ අය අපේ බල ප්‍රදේශයේ නැහැ. එම නිසා ඔබ බල ප්‍රදේශයේ මේ අය සොයා ගන්නට හැකිනම් ඔවුන් පිළිබඳව අපිට දැනුම් දෙන්න කියලා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: පුළුවන්කම තිබුණා. නමුත් ඔබට ඒක කරන්නට බැරි වුණා නේද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට මම ආයෙත් කිව්වොත් අර දින වරෙන්තුව ගැන. දින වරෙන්තුව ක්‍රියාත්මක කරන්න බැරි වුණා. එතකොට ඒ අවස්ථාවේ එහෙමනම් අපිට ඒ පිළිබඳව කරුණු වාර්තා කරලා ගරු අධිකරණයට විවෘත වරෙන්තුවක් ගන්න පුළුවන්කම තිබුණා නේද?

පි: එහෙමයි ස්වාමීනි.

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එහෙමනම් කස්තුරි ආරච්චි මැතිතුමා ඔබ කිව්ව විදිහට ඕක Plaint එකක් නැත්නම් පැමිණිල්ලක් ෆයිල් කරන්න අවශ්‍ය නැහැ නේද ගොනු කරන්න අවශ්‍ය නැහැ නේද විවෘත වරෙන්තුවක් ගන්න නේද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබෙන් ප්‍රශ්න කෙරුවා ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවෙන් ලැබුණු වාර්තාව ගැන?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබ ගරු කොමසාරිස්වරුන් ප්‍රශ්න කරන කොට සඳහන් කෙරුවා මේ තැනැත්තන්ට විරුද්ධව නඩු පැවරීම කරන්නට බැරි වුණේ රස පරීක්ෂක වාර්තාව ලැබිලා තිබුණේ නැති නිසා කියලා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ දන්නවා නේද අපේ නීතිකෘත්‍යයන් සැකකරුවන් අනභිමුඛව in absentia විභාග කරනවා කියලා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එහෙම විභාග කරන්නේ මොනවගේ අවස්ථාවල දී ද ? මහේස්ත්‍රාත් අධිකරණයේ එහෙම විභාග කරනවානේ. මහාධිකරණයෙත් එහෙම විභාග කරනවානේ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට දැන් එහෙම විභාග කරන්න ගරු අධිකරණයෙන් අවසර ගන්න ඕනිනේ අපි?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: අධිකරණය සෑහීමකට පත් කරන්න ඕනි මේ තැනැත්තා අධිකරණය ඉදිරියට පැමිණෙන්නේ නැහැ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: අපිට එයාව අත්අඩංගුවට අරගෙන ඉදිරිපත් කරන්නට බැහැ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ නිසා ඔහු හෝ ඇය නැතුව මේ නඩු කටයුත්ත අපිට ඉදිරියට ගෙන යන්න අවසර දෙන්න කියලා නේද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ වගේ වෙලාවක ඔබ ඒ වගේ පියවර ඔබේ ජීවිතේ අරගෙන ඇතිනේ නේද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබ එතකොට ඔය වගේ වෙලාවක මොකද කරන්නේ කස්තුරිආරච්චි මහත්තයා කොහොමද ගරු අධිකරණය සෑහීමකට පත් කරන්නේ සැකකරුවන් අනභිමුඛව නඩු පවරන්න ඕනි කියන එක නැත්නම් නඩු නීතිකෘත්‍ය ඉදිරියට ගෙන යන්නට ඕනි කියන එක.

පි: 192 පියවර යටතේ.

ප්‍ර: ඔව් ඔබ දන්නවා. ඔබ දන්නවා. බොහොම හොඳයි. අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 192 යටතේ පියවර ගන්නට පුළුවන්?

President's Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔබ දානවද මේ ගෙදර පදිංචි ඒගොල්ලන් අදාළ පුද්ගලයින්ගේ අදාළ පුද්ගලයින්ගේ ඔවුන්ගේ ප්‍රකාශයන් වාර්තා කරනවද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මේ තැනැත්තා ගෙදර ඉන්නවද ? ගෙදරින් බැහැර වෙලා ද, කවදා ඉඳන් ද නැත්තේ කියන එක ගැන ගෙදර අය අසල්වැසියන්ගෙන් ප්‍රකාශ වාර්තා කරනවද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: අදාළ ග්‍රාම නිලධාරීවරයාගේ ප්‍රකාශ වාර්තා කරනවද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ වගේම වරෙන්තුව හරි නැත්නම් ඒ පුද්ගලයා සොයා බලන්නට ගිය පුද්ගලයාගේ නිලධාරියාගේ ප්‍රකාශ වාර්තා කරනවද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔබ ස්ථානාධිපතිවරයා විදිහට ගරු මහේස්ත්‍රාත්වරයාගෙන් ඉල්ලීමක් කරනවානම් සැකකරු අනිභිමුඛව නඩු කටයුතු මෙහෙයවන්නට අවසර දෙන්නට කියලා ඒ අවස්ථාවේ දී ඔබ අර සාක්ෂි ඔක්කෝම ඉදිරිපත් කරනවා නේද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් සැකකාරයා අත්අඩංගුවට ගත්තේ නැහැ කියලා කස්තුරිආරච්චි මහත්මයා ඔබට කිසියම් නෛතික බාධාවක් තියෙනවද ඔබේ විමර්ශනයේ දී පෙනී යනවානම් දිගින් දිගටම දිගින් දිගටම දිගින් දිගටම යම් තැනැත්තෙක් අධිකරණය මඟ හරිනවා. පොලිසිය මඟ හරිනවා කියන කරුණ ඔහුට හෝ ඇයට විරුද්ධව අදාළ අධිකරණයේ නඩු පැවරීමට යම් නීතිය මඟින් යම් බාධාවක් පනවලා තියෙනවද නැත්නම් ඔබට පනවන්න පුළුවන් ද නැත්නම් මේක කවදද ඉවර වෙන්නේ මෙහෙම දිගටම තියෙන්න බැහැනේ. මේකේ අතෘප්තියට පත්වුණ පාර්ශවයක් ඉන්නවා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මොකක්ද ඔබේ උත්තරය? ඔබට නඩු පවරන්න පුළුවන් ද බැරිද?

පි: ස්වාමීනි මේකේ සැකකරුවන් ඔක්කෝම 13ක්. 13 දෙනෙක්. එතකොට මගේ දැනුමේ හැටියට නියමිත සාක්ෂි සටහන් වෙලා, ප්‍රමාණවත් සාක්ෂි තිබුණේ නැහැ මේ සිද්ධියට අදාළව. සැකකරුවන් සම්බන්ධයෙන් නිශ්චිත ප්‍රදේශයක් දැන ගැනීමට තිබුණෙත් නැහැ මේ සම්බන්ධයෙන් කරුණු වාර්තා කරන්න ගරු අධිකරණයට.

ප්‍ර: ඔබේ පිළිතුරේ මම කරුණු 2ක් දකිනවා. එකක් තමයි ඔබ කියනවා මේ නඩුවේ ප්‍රමාණවත් සාක්ෂි නැහැ සැකකරුවන්ට විරුද්ධව නඩු පවරන්න. 2 වෙනි කරුණ ඔබ කියනවා සැකකරුවන් සමහර අය සොයා ගන්නට නැහැ. ඒ නිසා ද ඔබට නඩු පවරන්නට බැරිවුණේ? උත්තරය ඔව් ද නැද්ද මේ ඔබ කිව්ව දෙයනේ. මම නෙවෙයිනේ කිව්වේ?

FAIR COMMENT BY JEZEEM

පි: චෝදනා පත්‍රයකුත් ගොනු කරලා තිබුණේ නැහැ.

ප්‍ර: ඔව් ඉතින් චෝදනා පත්‍රයක් ගොනු කරන්නේ කොයි වෙලාවේද ? ඒක තමයි අපි මේ අහන්නේ? දැන් ඔය එකක්වත් මම පටන් ගත්ත ඒවා නෙවෙයි ඔබ පටන් ගත්ත ඒවා. කියන්නකෝ ඔබට උත්තරයක් දෙන්න බැහැනේ? දැන් ඔබ කියනවානම් මෙම මඩකලපුව නඩු අංක ම.ළ. අංක B 276/2017 දරන නඩුව සැකකරුවන්ට එරෙහිව නඩු පවරන්නට ප්‍රමාණවත් කරුණු නැහැ කියලා කාත්තන්කුඩිය පොලිසියේ ස්ථානාධිපතිවරයා විදිහට ඔබේ වගකීම වුණේ මොකක්ද? ඔබ දැනගෙන හිටියද මෙම නඩුවට අදාළව සැකකරුවන් කිහිප දෙනෙක් බොහෝ කාලයක් බන්ධනාගාර ගතව හිටියායි කියලා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: කෙනෙක්ට නඩු පැවරීමට තරම් ප්‍රමාණවත් සාධාරණ කරුණු නොමැතිව ඔවුන්ව රක්ෂණ බන්ධනාගාර ගත කිරීම සාධාරණ ද? පොලිස් නිලධාරියෙක් විදිහට ඔබ එයට එකඟ වෙනවද?

පි: නමුත් එවකට තිබුණු තත්ත්වෙත් එක්ක ස්වාමීනි විශාල..

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: මොකක්ද ඔය තත්ත්වේ ? ඔබ කිව්වානේ ඔබ ගියාම පස්සේ ඔක්කෝම ප්‍රදේශයේ සාමය ඇති වුණා කියලා?

පි: එවකට ස්වාමීනි ඒ මා පැමිණීමට පෙර තිබූ තත්ත්වය ගැන මා කිව්වේ..

ප්‍ර: නෑ නෑ දැන් මේ උගත් අතිරේක සොලිසිටර් ජනරාල්තුමිය අහන්නේ ඔබ ඉස්සෙල්ලා කියපු පිළිතුරෙන්. ඔබ ඉස්සෙල්ලා කිව්වා මේ සැකකරුවන්ට විරුද්ධව නඩු පවරන්න සාක්ෂි තිබ්බේ නැහැ කියලා. එතකොට යෝජනා වුණේ එතුමියගේ එහෙමනම් පොලිස් නිලධාරියෙකුගේ වශයෙන් යුතුමකමක් තියනවා නේද අර නිකරුණේ අත්අඩංගුවේ සිටින පුද්ගලයින් සම්බන්ධයෙන් නිදහස් කර ගැනීම සිදු කරන්න ඕනි. එතකොට ඔබ කිව්වා ඒ අවස්ථාවේ දී ඒක අවශ්‍ය වුණේ නැහැ. මොකද එතන පැවැති තත්ත්වය හැටියට කියලා. නමුත් ඔබ මීට ඉස්සෙල්ලා කොමිෂන් සභාවට කිව්වේ ඔබ ගියාට පස්සේ කිසිම කලබලකාරී තත්ත්වයක් තිබුණේ නැහැ. සාමකාමී වතාවරණයක් තිබ්බේ කියලා.

****

FAIR COMMENT
BY JEZEEM

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයෙෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: කස්තුරිආරච්චි මහත්මයා වගකීමෙන් යුතුව ප්‍රධාන පොලිස් පරීක්ෂක විදිහට ඔබ පිළිතුරු දෙනවනම් හොඳයි. මට මගේ රාජකාරිය කරන්න සිද්ධ වෙනවා. දැන් බලන්න B වාර්තාව. ඔබේ පූර්වගාමීය ගොනු කරලා තියෙන ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔය හැම ඡේදයක්ම බලලා කියන්න. ඒ හැම ඡේදයකම පූර්වගාමීයා විසින් සඳහන් කරලා තියෙනවද මේ සිද්ධියට 2017 මාර්තු 10 වෙනිදා අලියාර් හන්දියේ සහරාන් හෂීම්ගේ පාර්ශවය ජාතික තවුහිද් ජමාත් සංවිධානයත් ඒ වගේම රවුෆ් මවුලවිගේ පක්ෂයත් අතර වුණ ගැටීමේ දී යම් පාර්ශවයකට විරුද්ධව සාක්ෂි තියෙනවද කියලා ඔබලා සාක්ෂි සම්පිණ්ඩනය කරනවානේ නේද? ඇත්තටම වෙනම ඔයගොල්ලෝ File කරන්න ඕන වුණාට පනත අනුව ඔබලා කරන්නේ විමර්ශනයේ කරුණුයි සැකකාරයෝයි ඔක්කෝම එකට දාලා එක වාර්තාවක් ගොනු කරනවා. හරි ඔබේ අවධානයට මම මෙහෙම යොමු කරන්නම්කෝ කලබල වෙන්නේ නැතිව මම කියන දේ අහගෙන උත්තර දෙන්න වගකීමෙන් යුතුව. දැන් අලියාර් හන්දිය කියන්නේ ප්‍රසිද්ධියේ ජනතාවට ගැවසෙන්නට පුළුවන් කාත්තන්කුඩියේ තියෙන ස්ථානයක් නේද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔව්. ඒ ස්ථානයේ පාරේ ගමන් කරමින් සිටි රැස්වීමට අවශ්‍ය නොවන අයවලුන්ට කඩු වලින් කොටලා තුවාල සිදු කරලා, පොලුවලින් පහර දීලා තියෙනවානම් එහෙම වුණ බවට යම් පුද්ගලයෙක් හෝ පුද්ගලයින් සාක්ෂි දෙනවනම් ඒ සම්බන්ධයෙන් වැරද්දක් ඒ සාපරාධී කරපු අය වරදක් කරලා තියෙනවද නැද්ද ?

පි: වරදක් කරලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර: ඒ අලියාර් හන්දිය අසල පිහිටි නිවාස වලට ගල් වලින් සහ පෙට්ට්‍රල් බෝම්බ වලින් පහර දීලා අනර්ථ සිදු කරයි කියලා කරුණු අනාවරණය වෙලා තියෙනවනම් එමඟින් අදාළ සැකකරුවන් සාපරාධී ක්‍රියාවක් කරලා තියෙනවද නැද්ද?

පි: කරලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර: අබුබකර් මොහොමදු මුනාබීර් කියන තැනැත්තා මඩකලපුව ශික්ෂණ රෝහලේ ප්‍රතිකාර ගනිමින් ඉන්න වෙලාවේ දී ඔහු ඔබේ පූර්වගාමීයාට කරන ලද විමර්ශනයේ දී දැනුම් දීලා තියෙනවානම් සහරාන් මවුලවි ඔබ අත්අඩංගුවට ගන්නට නියමිතව සිටි කෙනෙක්. පිහියක් අරගෙන තමන්ට පහර දීමට පැමිණි අවස්ථාවේ දී ඒක වැළැක් වුවාට එකී සහරාන් මවුලවි ඔහුගේ බඩේ වම්පසට ඇන්නායි කියලා ඒක සාපරාධී ක්‍රියාවක් ද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඒ අබුබකර් මොහොමදු මුනාදීර් ඒ කතාව කියනවා. ඊට අමතරව ඔහු දැන් මඩකලපුවේ ශික්ෂණ රෝහලේ ප්‍රතිකාර ලබනවා?

FAIR COMMENT BY JEZEEM

පි: ප්‍රතිකාර ලබනවා.

ප්‍ර: මිනිස්සු නිකන් hospital යන්නේ නැහැනේ නේද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ වගේම ඔහු කියනවානම් සහරාන් මවුලවිගේ මල්ලී වන රිල්වාන් කියන එක්කනාත් නියාස් කියන එක්කනාත් යකඩ කම්බි වලින් ඔහුට ඇන්නායි කියලා ඒක සාපරාධී ක්‍රියාවක් ද?

පි: සාපරාධී ක්‍රියාවක් ස්වාමීනි.

ප්‍ර: ඊට පස්සේ සහජාන් කියන එක්කනා තමාගේ කකුල අල්ලගෙන සහජාන්ගේ කකුලෙන් තමන්ට පහර දුන්නා. ඒ කියන්නේ සුළුතුවාල කිරීමක් වගේ වෙලා තිබුණානම් ඒක සාපරාධී ක්‍රියාවක් ද නැද්ද?

පි: සාපරාධී ක්‍රියාවක් ස්වාමීනි.

ප්‍ර: එහෙමනම් කස්තුරිආරච්චි මහත්මයා බැලූ බැල්මට On the face of record බැලූ බැල්මට යම් සාපරාධී ක්‍රියාවන් සිදු වුණ බවට සාක්ෂි ඉදිරිපත් වෙලා තියෙනවා නේද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ හැරෙන්නට දැන් තමන්ගේ ගෙදර ඉස්සරහ ඉඳගෙන ෆාරුක් මොහොමදු ජමීල් කියන කෙනා මේ තමන්ගේ ගේ ඉස්සරහා සිදු වෙන දේ ඔහු ජංගම දුරකතනයෙන් වීඩියෝ කරමින් ඉන්න වෙලාවේ දී ආමී මොහිදීන් ඇවිල්ලා දිග කඩුවක් අරගෙන ඔහුට තර්ජනය කෙරුවානම් ඔහුගේ ජංගම දුරකථනය උදුරගෙන ගියානම් ඒ අවස්ථාවේ දී සාපරාධී ක්‍රියාවක් වෙනවද නැද්ද? තර්ජනය කිරීමක් වෙනවා. තමන්ගේ කැමැත්තට විරුද්ධව ඔහු සන්තකයේ තියෙන දෙයක් පැහැරගෙන යනවා. බලෙන් ලබා ගැනීමක්?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට සාපරාධී ක්‍රියාවක් වෙනවා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එහෙනම් ඒ පුද්ගලයෝ ඔබලාගේ විමර්ශකයන්ට කියලා තියෙනවානම් මේ වගේ වැරදි අපිට කරා කියලා අදාළ පුද්ගලයින්ගේ නම් සඳහන් කරලා තියෙනවා නම් එතන මේ අදාළ සැකකරුවන්ට විරුද්ධව සාක්ෂි තියෙනවද නැද්ද?

පි: තියෙනවා ස්වාමීනි.

ප්‍ර: එහෙමනම් ඔබ මීට කළින් මේ ගරු කොමිෂන් සභාවට දුන්න පිළිතුරු වුණ මේ අයට විරුද්ධව සාක්ෂි නැහැ කියන කතාව හරිද උත්තරයක් නැද්ද?

පි: වැරදියි ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ ඇත්තටම කියන්න ඇත්තටම කියන්න කස්තුරිආරච්චි මහත්මයා ඔබ මේ මඩකලපුවේ මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක B276/2017 කියන නඩුවේ විමර්ශන වලට වැඩි උනන්දුවක් ගත්තේ

FAIR COMMENT BY JEZEEM

නැහැ නේද? මොකද සාමකාමී වතාවරණයක් ඔබ මේ රාජකාරී පටන් ගන්නකොට තියෙන හින්දා. ඇත්ත කියන්නකෝ අපිට. කරේ නැහැ නේද?

පි: උනන්දුවක් නොදැක්වුවත් නොවෙයි ස්වාමීනි. නමුත් අර සමහර පියවරයන් අරගෙන නැහැ 192 පියවරවල් වැනි දේවල් .

ප්‍ර: ඒ කියන්නේ ඔබට ගන්නට පුළුවන් වුණ නීතිය මඟින් ඔබට ප්‍රතිපාදන සපයලා තියෙන දේවල් ඔබ කරලා තිබුණේ නැහැ කියලා ඔබ පිළිගන්නවා නේද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එහෙමනම් ඔබ ඔබේ රාජකාරිය හරියට ඉෂ්ඨ කරලා නැහැ නේද? ඔබ ඔබේ රාජකාරිය කිරීමේ දී යම් යම් අතපසුවීම් සිදු කරලා තියෙනවා නේද එහෙනම්? ඒ නිසා නේද ඔය තත්ත්වය උදා වෙලා තියෙන්නේ ඔබ දැන් සාක්ෂි කූඩුවේ ඉඳලා මුහුණ දෙන තත්ත්වය ඇති වෙලා තියෙන්නේ ඒක නිසා නේද?

උත්තරයක් නැහැ ස්වාමීනි.

ප්‍ර: හොඳයි දැන් ඔබ කියනවා ඔබ 2017 අගෝස්තු මාසේ 01 වෙනිදා කාත්තන්කුඩිය පොලිස් ස්ථානය භාර ගන්න අවස්ථාව වෙනකොට ප්‍රදේශය සමකාමී වතාවරණයක් තිබ්බා කියලා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ වගේම ඔබ කියනවා සහරාන් හෂීම් ඒ ප්‍රදේශයේ නැති නිසා ඔහුට අකමැති පුද්ගලයන් ගොඩක් ඉන්නවා ඒ පැත්තේ. ඒ මිනිස්සු ඉතා සාමයෙන් හිටියා. මොකද මේ පුද්ගලයා දැන් එහේ නැහැ. එයාත් එක්ක තව කට්ටියත් එහේ නැහැ. දැන් ඒ කරුණ නිසා ඔබ මේ විමර්ශනයට අදාළව විවේක ගත්තා නේද?

පි: නැහැ ස්වාමීනි. එහෙම දෙයක්නම් සිදු වුනේ නැහැ.

ප්‍ර: එහෙනම් මට කියන්නකෝ ඇයි ඔබට කාත්තන්කුඩිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා විදිහට රාජකාරි භාරගත්තාට පස්සේ මේ නඩුව කිහිප අවස්ථාවක දී ගරු අධිකරණයේ කතා කෙරුවානේ නේද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ හැම අවස්ථාවක දීම ඔබ වැඩිදුර වාර්තාවන් ගොනු කිරීමට උපදෙස් දෙන්නට ඇතිනේ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට ඒ වාර්තාවන් ඔබ විසින් නේද අත්සන් කෙරුවේ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබ කිව්වා ඒවා අත්සන් කරන්නට ඉස්සර වෙලා ඒවා ද්‍රවිඩ භාෂාවෙන් පිළියෙල කරලා තිබ්බ හින්දා ඔබේ නිලධාරීන්ගේ සහාය අරගෙන ඒකේ තියෙන අන්තර්ගතය ගැන සෑහීමකට පත් වෙලා තමයි අත්සන් කෙරුවේ කියලා?

පි: එහෙමයි ස්වාමීනි.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: ඔබ හොඳට කල්පනාවෙන් ඒ කියන දේවල් ගැන අහලා ද ඕක අත්සන් කෙරුවේ ප්‍රධාන පොලිස් පරීක්ෂක ස්ථානාධිපතිවරයා විදිහට ඇයි වගකීම ගන්නේ ඔබනේ නේ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එහෙමනම් කොහොමද කස්තුරිආරච්චි මහත්තයෝ 2019.08 මාසේ 30 වෙනිදා වෙනකම් ඔබ විසින් ගොනු කරන ලද සියලුම වැඩිදුර වාර්තා වල මේ පැමිණිල්ල කරන දිනය දාලා පැමිණිල්ල විභාග කළ බව කාත්තන්කුඩි පොලිසියේ ප්‍රධාන පොලිස් පරීක්ෂක වෙදගෙදර වන මම ගරු අධිකරණයට කරුණු වාර්තා කරමි කියලා වාර්තා කළේ? ඇයි ඒ වාර්තාව ඔබ අත්සන් කළේ ? ඔබ ස්ථානාධිපතිවරයා වෙනවනම් ඔබේ නම ප්‍රධාන පොලිස් පරීක්ෂක කස්තුරිආරච්චිනම් ඇයි ඔබේ පූර්වගාමීයාගේ නම යටතේ මේවා ගොනු කෙරුවේ?

පි: ස්වාමීනි අත්සන සම්බන්ධයෙන් බලන්න.

ප්‍ර: ඔව් ඉතින් එයා transfer වුණාට පස්සේ එන්නේ නැහැනේ. ආ ඕක පෙන්වන්න. (ඉංග්‍රිසි බසින් ලේඛනයක් කියවයි) ස්තුතියි ස්වාමීනි. අපේ ගරු සභාපතිතුමා අපිට මහපෙන්නුවා සමහර වාර්තා OIC Crimeගේ නමින් තියෙනවා. 2019 පෙබරවාරි 26 වෙනිදා ගොනු කරපු එක? ඉතින් ඔයාගේ නමින්නේ තියෙන්නේ ස්ථානාධිපති පොලිස් ස්ථානය කාත්තන්කුඩිය. ආ ඕක බලලා කියන්නකෝ එහෙනම් කාගේද අත්සන තියෙන්නේ කියලා?

පි: මගේ අත්සන

ප්‍ර: 2019.04.30 පොලිස් පරීක්ෂක වෙදගෙදර. නැහැ අත්සන ඔයාගේ ද බලන්නකෝ? ඔයාගේ අත්සන ඒ තියෙන එක තමයි මේ Translate කරන්නේ. ඔබේ අත්සන නේද තියෙන්නේ ඔය 2019.04 මාසේ 30 වෙනිදා?

පි: මේ මගේ අත්සන.

ප්‍ර: අත්සන ඔබේ ද?

පි: මේකේ අත්සන මගේ ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ 2019.04 මාසේ 30 වෙනිදා අත්සන ඔබේ ස්ථානාධිපති ?

පි: එහෙමයි ස්වාමීනි.

ස්වාමීනි 2019.04 මස 30 වන දින මෙම ඉදිරිපත් කරන ලද වැඩිදුර වාර්තාවේ ඇති අත්සන තමාගේ බවට සාක්ෂිකරු විසින් හඳුනාගනු ලබන ස්ථානය C- 666 (B) වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

ප්‍ර: කස්තුරිආරච්චි මහත්මයා බලන්න 2019.07 මාසේ 30 වෙනිදා වැඩිදුර වාර්තාව ස්ථානාධිපතිවරයා විදිහට ඔබ ද අත්සන් කරලා තියෙන්නේ?

පි: නැහැ ස්වාමීනි .

ප්‍ර: නැහැ?

පි: නැහැ ස්වාමීනි මගේ අත්සන නෙවෙයි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: 2019.08 මාසේ 02 වෙනිදා ඒක ඔබේ?

පි: ඒක මගේ

ස්වාමීනි 2019 අගෝස්තු මාසේ 02 වෙනිදා මෙම සාක්ෂි ඇති වාර්තාවේ මෙම සාක්ෂිකරුගේ බවට හඳුනා ගනු ලැබූ අත්සන ඇති ස්ථානය C- 666 (C) වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා. එම වාර්තාවෙත් ප්‍රධාන පොලිස් පරීක්ෂක වෙදගෙදර විසින් ස්වාමීනි එහි සඳහන් වෙන්නේ මේ පැමිණිල්ල විභාග කළ බව කාත්තන්කුඩියේ පොලිසියේ ප්‍රධාන පොලිස් පරීක්ෂක වෙදගෙදර වන මම ගරු අධිකරණයට කරුණු වාර්තා කරමි කියලා.

ප්‍ර: එතකොට 2019 අගෝස්තු 16 වෙනිදා වාර්තාව කවුද අත්සන් කරලා තියෙන්නේ?

පි: මගේ අත්සන ස්වාමීනි.

ස්වාමීනි 2019.08 මස 16 දින වැඩිදුර වාර්තාවේ තමන්ගේ අත්සන ඇති බවට සාක්ෂිකරු විසින් හඳුනා ගනු ලැබූ අත්සන ඇති ස්ථානය C- 666 (D) අක්ෂරයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

ප්‍ර: මේ 2017 අගෝස්තු 08 වෙනිදා වැඩිදුර වාර්තාව එතකොට ඔබ රාජකාරි භාර අරන්නේ නේද ?

පි: ඒක මගේ ස්වාමීනි.

ප්‍ර: කාගෙද අත්සන?

පි: හඳුනා ගන්නවා. ස්වාමීනි

ප්‍ර: ඔව් මොකක්ද ?

පි: මගේ අත්සන ස්වාමීනි.

ප්‍ර: ඔබේ අත්සන?

පි: එහෙමයි.

ස්වාමීනි 2017.08 මස 08 දින දාතම ඇති වාර්තාවෙත් ස්වාමිනි පැමිණිල්ල විභාග කර බවට වාර්තා වෙන්නේ ප්‍රධාන පොලිස් පරීක්ෂක වෙදගෙදර මහතා එම නිසා මෙම සාක්ෂිගේ අත්සන ඇති ස්ථානය C- 666 (E) වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

ප්‍ර: ඊට පස්සේ බලන්නකෝ කස්තුරිආරච්චි මහත්මයා බලන්නකෝ 2017 සැප්තැම්බර් 6 වෙනිදා බලන්න.

පි: මගේ නොවේ ස්වාමීනි වැඩ බලන ස්ථානාධිපතිගේ අත්සන.

ප්‍ර: ඊළඟට බලන්නකෝ 2017 සැප්තැම්බර් 18 ?

පි: මගේ නෙවෙයි ස්වාමීනි.

ප්‍ර: ඔබේ නෙවෙයි?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: හැබැයි ඔබේ නමින් යන්නේ මට පෙන්නේ. අත්සන් කරපු තැන බලන්න 2017 ඔක්තෝබර් 23 ?

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඒක මගේ ස්වාමීනි.

ප්‍ර: ඒක ඔබේ?

පි: එහෙමයි ස්වාමීනි.

ස්වාමීනි එම වාර්තාවෙත් සඳහන් වෙන්නේ කාත්තන්කුඩියේ පොලිසියේ ප්‍රධාන පොලිස් පරීක්ෂක වෙදගෙදර වන මම ගරු අධිකරණයට කරුණු වාර්තා කරමි කියලා මේ පැමිණිල්ල විභාග කල බවට. එම නිසා 2017 ඔක්තෝබර් 23 දින වාර්තවේ මෙම සාක්ෂිකරුගේ අත්සන ඇති බවට හඳුනා ගත් ස්ථානය C 666 (F) අක්ෂරයෙන් ලකුණු කොට ඉදිරිපත් කරමි.

ප්‍ර: ඔබට මම අවස්ථා කිහිපයක ඔබේ වාර්තා වල අත්සන් පෙන්වලා ඔබේ අවධානය යොමු කරානේ වැඩිදුර වාර්තා වලට එතකොට ඒ වාර්තා හැම එකක්ම ඔබට පේනවා නේද ඔබ ස්ථානාධිපතිවරයා විදියට කාත්තන්කුඩිය පොලිස් ස්ථානයේ රාජකාරි කෙරුවත් ඒ පැමිණිල්ල විභාග කෙරුවේ ඔබේ පූර්වගාමීයා කියලා තමයි සඳහන් වෙන්නේ නේද?

පි: මෙකේ ස්වාමීනි කියවා බැලීමෙන් දෙමළ බසින් මේකේ බලන්න මගේ නමද තියෙන්නේ .. ස්වාමිනි මේකේ සිංහල translate එකක් තියෙන්නේ ස්වාමීනි. දමිළ එකේ මගේ නම තියෙනවද කියලා confirm කර ගන්න ඕනි මට.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

කොමිෂන් සභාවේ භාෂා පරිවර්තක විසින් සහතික කරලා තියෙන්නේ.

****

දැන් වේලාව: ප.ව.8.30

මෙතැන් සිට ල/ලේ: ධම්මිකා මිය

President Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

පෙර සටහන් කරන්නේ සචිනි මෙනවිය විසින්ය.
වේලාව ප.ව. 8.30
මෙතැන් සිට ධම්මිකා පෙරේරා විසින්ය.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප : කස්තුරි ආරච්චි මහත්මයා එහෙම නම් අද දින ඔබේ අවධානයට යොමු කරන ලද කරුණු අනුව ඔබ පිළිගන්නවා නේද ඔබට මේ මඩකලපුව මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක: B 276/2017 නඩුවට අදාලව ඔබේ බලතල තුළ තිබුණ නෛතික වශයෙන් ඔබව ආරක්ෂා කෙරෙන යම් යම් ඉල්ලීම් ඔබට ගරු අධිකරණයෙන් මෙම සැකකරුවන්ට එරෙහිව සිදුකළ හැකිව තිබුණාය කියලා?

පි : එහෙමයි ස්වාමිණි.

ප : ඒ වගේම ඔබ පිළිගන්නවා නේද අධිකරණය මත ම රැඳී නොසිට සංඥ වැරදි සිදු වුණ බවට ඔබේ ඔබේ පූර්වගාමීයා විසින් ගරු අධිකරණයට ප්‍රථම අවස්ථාවේ කරුණු වාර්තා කරලා තිබුණ මෙවැනි නඩුවකදී සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට ඔබේ පොලිස් ස්ථානයේ නිලධාරීන්ට හැකියාවක් තිබුණේ නැත්නම් දිවයිනේ සියළුම පොලිස් ස්ථානවල සහයෝගය ඇතිව ඔවුන්ව අත්අඩංගුවට ගැනීම සඳහා පොලිස් පණිවිඩයක් බැහැර කිරීම මගින් ඒ උත්සාහය දැරීමට හැකියාව තිබුණු බව?

පි : එහෙමයි ස්වාමිණි.

ප : ඔබට මොහොතකටවත් හිතෙනවද ඔබ ඔය සිටි නිද්‍රාශීලී තත්ත්වයෙන් නැගිටලා අවදි වෙලා කරන්න තිබුණ රාජකාරී මහන්සියක් නැතුව එක්කෝ අධිකරණය මාර්ගයෙන් එහෙම නැත්නම් තමන්ගේ දුරකථන මෙහෙයුම් මැදිරිය හරහා පියවර ගැනීමෙන් මේ කාත්තන්කුඩිය ප්‍රදේශයේ ඔබ කියන ආකාරයට පුද්ගලයින් අකමැති වූ ඔවුන්ට තර්ජනයක් වෙලා තිබ්බ මේ සැකකරුවන් හතර දෙනාව අත්අඩංගුවට ගත්තා නම් 2019. අප්‍රේල් මාසේ 21 වෙනිදා අහිංසක ජීවිත සිය ගානක් ඔවුන්ට අහිමි කරමින් සිදු වූ ඒ සිද්ධිය සිදු නොවන්නට ඉඩ තිබුණා කියලා?
උත්තරයක් නැහැ ස්වාමිණි. එපමණයි.

පි : අධිකරණය මගින් ගන්න ඕන ක්‍රියාමාර්ග ස්වාමිණි මගේ හැකි පමණින් උත්සාහ කෙරුවා.

****

FAIR COMMENT
BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>:

අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් උගත් ජනාධිපති නීතිඥවරයාට සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාව ලබා දෙමි.

****

<u>ජනාධිපති නීතිඥ ෂමිල් පෙරේරා මහතා:</u>

ප්‍ර : මහත්මයා ඔබ කිව්වා කාත්තන්කුඩි පොලිස් බල ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපති වශයෙන් කොපමණ කාලයක් හිටියද?

පි : ස්වාමිණි මම අවුරුදු 2 යි මාස 8 ක විතර පමණ කාලයක් රාජකාරී කළා.

ප්‍ර : කාත්තන්කුඩි පොලිස් බල ප්‍රදේශයක කල්යාඩි කියන නගරය ඇතුලත් වෙනවද?

පි : කල්අඩි.

ප්‍ර : කල්අඩි?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : නවකුඩා කියන ගම?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : අරයාන්පති කියන නගරය?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : පුල්ලිකුලම්?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : එතකොට අලංකුඩා?

පි : කාලංකුඩා.

ප්‍ර : කාලංකුඩා?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඒ සියළුම නගර තිබුණේ ඔබතුමා යටතේ කිව්වොත් හරිද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : දැන් මෙම කොමිෂන් සභාවට කියන්න පුළුවන්ද කාත්තන්කුඩි නගරයේ කිසියම් කතෝලික දේවස්ථානයක් තිබෙනවද ?

පි : කාත්තන්කුඩි නගරයේ තිබෙනවා ස්වාමිණි.

ප්‍ර : කාත්තන්කුඩි නගරයේ?

පි : කාත්තන්කුඩි මුස්ලිම් නගරය පසු වෙනවාත් සමඟම කලවංචිකුඩි දෙසට යන කොට දකුණු පස ..

ප්‍ර : මම අහන්නේ කාත්තන්කුඩි නගරයේ තිබෙනවද?

පි : ඔව් නගරයේ තමයි තිබෙන්නේ ස්වාමිණි.

ප්‍ර : මොකක්ද නම?

පි : මට දැන් නම මතක නැහැ ස්වාමිණි, ප්‍රධාන මාර්ගය ආසන්නයේම තියෙනවා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : කිසියම් කතෝලික බැතිමතුන් කාත්තන්කුඩි නගරයේ ජීවත් වෙනවද?

පි : නිශ්චිත ප්‍රමාණයක් මතකයේ නැහැ ස්වාමිණි.

ප්‍ර : මම ඔබතුමාට යෝජනා කෙරුවොත් කාත්තන්කුඩි නගරයේ 100% ක් මුස්ලිම් ජනතාව පමණක් කියලා ඔබතුමා පිළිගන්නවද?

පි : එහෙමයි ස්වාමිණි. කාත්තන්කුඩි නගරයේ..

ප්‍ර : නගරය ගැන තමයි මම ඇහුවේ 100% ක් මුස්ලිම් ජනතාව පමණයි සිටින්නේ?

පි : එහෙමයි ස්වාමිණි

ප්‍ර : බෞද්ධ ජනතාව නැහැනේ?

පි : නැහැ ස්වාමිණි.

ප්‍ර : හින්දු භක්තිකයනුත් නැහැ?

පි : නැහැ ස්වාමිණි.

ප්‍ර : දැන් ඒකට ඔබතුමාට යම් හේතුවක් කියන්න පුළුවන්ද?

පි : හේතුවක් හැටියට ස්වාමිණි වැඩි ප්‍රමාණයක් මුස්ලිම් ජනතාව ජීවත් වෙනවා.

ප්‍ර : මම කිව්වානේ 100% ක් කියලා?

පි : එහෙමයි.

ප්‍ර : දැන් ලංකාවේ ඔබතුමා දන්න හැටියට කිසිම නගරයක 100% ක් සිටිනවද යම් විශේෂ ආගමික බැතිමතුන් 100%?

පි : නැහැ ස්වාමිණි.

ප්‍ර : ලංකාවේ කාත්තන්කුඩිවල පමණයි මුස්ලිම් ජනතාව 100% ක් සිටින්නේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : මගේ ප්‍රශ්නය ඒකට යම් හේතුවක් තිබෙනවද ඔබ දන්න තරමින්?

පි : හේතුවක් දන්නේ නැහැ ස්වාමිණි.

ප්‍ර : ඒක ගැන ඔබතුමා හොයලා බැලුවෙත් නැද්ද ඇයි කියලා?

පි : ඒ ආසන්නයේම ආරියම්පති ද්‍රවිඩ ජනතාව වාසය කරන නිසා ඒ එකම නගරය කාත්තන්කුඩි සහ අවසානයේ ආරියම්පති ද්‍රවිඩ ජනතාව ජීවත් වෙන නිසා ඒ ගැන විශේෂයෙන් හෙව්වේ නැහැ.

ප්‍ර : ආරියම්පති නගරයේ කතෝලික බැතිමතුන් සිටිනවා?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඒ වගේම ආරියම්පති නගරයේ කතෝලික පල්ලියකුත් තිබෙනවා?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඒ කියන්නේ ඒ අවට කල්අඩි, නවකුඩා, ආරියම්පති එතකොට පුල්ලිකුලම්, කල්කුඩා කියන ස්ථානවලත් කතෝලික පල්ලි තිබෙනවා?

පි : තිබෙනවා ස්වාමිණි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මම තමන්ට යෝජනා කලොත්

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

එම ප්‍රශ්නය ඉල්ලා අස්කර ගනි.

****

<u>ජනාධිපති නීතිඥ ෂමිල් පෙරේරා මහතා:</u>

ප්‍ර : දැන් මේ අන්දමට කාත්තන්කුඩි නගරයේ 100% ක් මුස්ලිම් ජනතාව සිටීමට හේතුවක් වන්නේ මේ හිස්බුල්ලා ආණ්ඩුකාරතුමා කියලා කිව්වොත් හරිද?

පි : ස්වාමිණි ඒ සම්බන්ධයෙන් මට කියන්න දන්නේ නැහැ. මම යන කොටත් ඔක්කොම මුස්ලිම් ජනතාව තමයි හිටියේ.

ප්‍ර : තමා හොයලා බැලුවෙත් නැද්ද ඇයි මුස්ලිම් ජනතාව පමණක් මේ නගරයේ සිටින්නේ කියලා?

පි : මගේ දැනුවත් භාවයට අනුව ස්වාමිණි පෙර සිටම ජීවත් වෙලා තියෙන්නේ මුස්ලිම් ජනතාව කියන හැඟීම.

ප්‍ර : කිසියම් බෞද්ධ විහාරයක් තියෙනවද ඒ ලඟපාත?

පි : මඩකලපුවේ තිබෙනවා එච්චරයි ස්වාමිණි.

ප්‍ර : එතකොට හින්දු කෝවිලක් තිබෙනවද?

පි : කෝවිල් තියෙනවා. ස්වාමිණි කෝවිල් 62 ක් තිබෙනවා ස්වාමිණි.

ප්‍ර : ලඟපාත?

පි : ලඟපාතත් තියෙනවා ස්වාමිණි.

ප්‍ර : නමුත් නගරයේ නැහැ කිසිවක්?

පි : නගරයෙත් තිබෙනවා පොලිස් ස්ථානය ඉදිරිපිට තියෙන්නේ කෝවිලක් ස්වාමිණි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා:</u>

ප්‍ර : මේ අහන්නේ කාත්තන්කුඩි නගරයේ?

පි : නගරයේ නැහැ ස්වාමිණි. නගරයේ ආරියම්පති, ඒ ආසන්නයේම තියෙනවා කෝවිලක්.

****

<u>ජනාධිපති නීතිඥ ෂමිල් පෙරේරා මහතා:</u>

ප්‍ර : ආරියම්පති කියන්නේ කාත්තන්කුඩි නගරයේ නෙමෙයිනේ ඒක පස්සේ නගරය එහෙම නේද?

පි : පහුවෙනවාත් සමඟම ආරියම්පති.

****

Fair Comment by Jezeem

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා:</u>

සාක්ෂිකරුගෙන් වෙනත් ප්‍රශ්න නොමැති බව දන්වයි.
සාක්ෂිකරු මුදා හරිමි.

කොමිෂන් සභාවේ කටයුතු නැවතත් ජුනි මස 22 වෙනි දින සඳුදා පස්වරු 12 පසු වී විනාඩි 30 ට ආරම්භ කරමි.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරැදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදි

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය: 2020.06. 22 වෙලාව:- ප ව. 1.25

සටහන් කළේ:- ධම්මිකා පෙරේරා විසිනි

ගරු විනිසුරු මඩුල්ල:-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

<u>පෙනී සිටීම:</u>

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතිඥතුමිය සමඟ ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස්, චතුරංග බණ්ඩාර මහතා, දිලන්ත එස්.කළුදුරුවගේ මහතා සහ අරින්ද්‍ර ජයසිංහ යන මහත්ම මහත්මීන් පෙනී සිටි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගරු අතිලතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ජනාධිපති නීතීඥ ෂමිල් පෙරේරා මහතා සහ නීතිඥ ගිම්හානි ගමගේ මහත්මිය කොමිසමේ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදි.

Parliament Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>සාක්ෂි අංක 741 සාක්ෂියට කැඳවයි.</u>

<u>භාෂා පරිවර්ථක රුබන් මහතා භාෂා පරිවර්ථන කටයුතු සිදු කරයි.</u>

සම්පූර්ණ නම : අබ්දුල් ෆරීඩ් ෆරීඩඋම්මා.

වයස : මට දැන් අවුරුදු 61 යි, නමුත් අවුරුදු 3 ට පසුව තමයි උප්පැන්න සහතිකය ලැබුනේ තාත්තගෙන් නමුත් මගේ වයස දැන් වයස 61 යි.

ජාතිය : මුස්ලිම්,

ආගම : ඉස්ලාම්,

විවාහක/අවිවාහක බව: විවාහකයි.

ස්වාමි පුරුෂයාගේ නම: සාලි මොහොමඩ් ජිෆ්රි,

දැනට පදිංචි ලිපිනය : 91/1, සිරිධම්ම මාවත, කොළඹ 10.

මම මේ කියන සාක්ෂිය සැබෑය, සම්පූර්ණ සැබෑය, සැබෑවක් මිස අන් කිසිවක් නොකියන බවට ප්‍රතිඥා දෙමි. (ද්‍රවිඩ භාෂාවෙන් ප්‍රතිඥා දෙයි)

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය:</u>

ප්‍ර : ජිෆ්රි මහත්මිය ඔබ උපන් ගම කොහේද?

පි : උපන් ගම ගල්හින්න පල්ලිය පාර.

ප්‍ර : ඉස්කෝලේ ගිහිං තියෙනවද?

පි : ඔව් ඉස්කෝලේ ගිහිං තියෙනවා.

ප්‍ර : මොන ඉස්කෝලෙටද ගියේ?

පි : ගල්හින්න අල්මනාර් මහා විද්‍යාලයට.

ප්‍ර : ඉස්කෝලේ කීයට යන කල් ඉගෙන ගත්තද?

පි : Grade 8 යන කල්.

ප්‍ර : ඔබ විවාහ වුණේ කොයි කාලේද, මොන වර්ෂයේදී ද?

පි : 1976 August.

ප්‍ර : ඔබේ විවාහක ස්වාමි පුරුෂයාගේ නම මොකක්ද?

පි : සාලි මොහොමඩ් ජිෆ්රි.

ප්‍ර : ඔබ කොළඹ ප්‍රදේශයේ පදිංචියට ආවේ කොයි කාලෙද?

පි : ඒක 88.

ප්‍ර : 1988 කියලා කිව්වොත් හරිද?

පි : ඔව්.

ප්‍ර : කොළඹ කොහේද ඔබ පදිංචි වෙලා ඉන්නේ?

පි : 91/1, සිරිධම්ම මාවත, කොළඹ 10

ප්‍ර : ඒ කියන්නේ මරදාන ප්‍රදේශයේ?

පි : මරදාන ප්‍රදේශයේ.

ප්‍ර : ඔබට විවාහයෙන් දරුවෝ කී දෙනෙක් ඉන්නවද?

පි : හත් දෙනෙක් ඉන්නවා.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ අය දුවලද පුතාලද?

පි : පුතාලා 5 දෙනයි, දුවලා 2 යි.

ප්‍ර : ඔබේ බාලම දරුවා දුවද පුතාද?

පි : දුව.

ප්‍ර : මොකක්ද බාලම දරුවාගේ නම?

පි : ෆාතිමා ජීෆ්රී.

ප්‍ර : ෆාතිමා ජීෆ්රී දැනට ජීවතුන් අතර ඉන්නවද?

පි : නැහැ.

ප්‍ර : ඇය මියගියේ කවද ද?

පි : අප්‍රේල් 21 බෝම්බ ප්‍රහාරයෙන් මැරුණා.

ප්‍ර : කොහේදී ද ඇය මියගියේ?

පි : දෙමටගොඩ මහවිල ගාඩ්න්ස්.

ප්‍ර : දැන් තමන්ගේ දුව ෆාතිමා ජීෆ්රි මොන ඉස්කෝලෙද ඉගෙන ගත්තේ?

පි : ඉල්මා ඉන්ටනැෂනල් ස්කූල්.

ප්‍ර : ඇය ඉස්කෝලේ කීයට යන කල් අධ්‍යාපනය ලැබුවද?

පි : එයා O/L කළා. පස්සේ ගෙදර හිටියා. ගෙදර වැඩ කරනවා.

ප්‍ර : එයා ඉස්කෝලේ යන කාලේ විනෝදාංශ මොනවද, ගෙදර ඉන්න කාලෙදි මොනවද කලේ?

පි : ගෙදර වැඩ කරනවා. ඇඳුම් අයන් කරනවා.

ප්‍ර : එයා පොත් පත් කියවනවද?

පි : ඔව්, පොත්පත් අර..

ප්‍ර : මොන වගේ පොත් පත්ද කියවන්නේ?

පි : හැරී පෝටර් වාගේ අර කාටුන් ඒ වගේ කතන්දර පොත් තමා බැලුවේ. අර පොඩි පුතත් එක්ක තමයි ගොඩක් වෙලාවේ ඉන්නේ.

ප්‍ර : පොඩි පුතා කිව්වේ කවුද?

පි : අර හුසේන් පුතා. අර ඉස්සර ආවේ මෙහේ.

ප්‍ර : මේ ගරු කොමිෂන් සභාවේ මීට කලින් සාක්ෂි දුන්නද?

පි : ඔව් ඔව් සාක්ෂි දුන්නා.

ප්‍ර : තමන්ගේ පුතා?

පි : පුතා ඔව්.

ප්‍ර : ෆාතිමා ජීෆ්රි ගෙදර ඉන්න කාලේ මොනවා හරි එකතු කරනවද, එයා එකතු කරන්න ආසයිද දේවල්?

පි : දේවල් එච්චර නැහැ, අර Birthday Card වගේ ඒවා එකතු කරනවා.

ප්‍ර : නාට්‍ය චිත්‍රපටි එහෙම බලනවද, TV බලනවද ?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : TV බලනවා කාටුන් එක, හෙරිපෝටර් එක බලනවා අර පුතාත් එක්ක.

ප්‍ර : දැන් ෆාතිමා ජීෆ්රි ඉස්කෝලේ ගිහිං අධ්‍යාපනය අවසන් වුණාට පස්සේ විවාහ වෙන්න කලින් ගෙදර ඉන්න කාලේ මොනවද කළේ?

පි : ඒක තමයි මට help කරනවා, මට උයන්න, අනිත් එක රෙදි හෝදන්න ඒ වැඩ.

ප්‍ර : මම අහන්නේ ඉස්කෝලේ ඉගෙන ගෙන ඉවර වෙලා විවාහ වෙන්න කලින් මොනවා හරි පන්ති ගියාද?

පි : පන්ති ගියා අර කුකරි හොඳටම දන්නවා. කුකරි ක්ලාස් එකට ගියා. අනිත් එක අර ගෙදර ඉදලා කුර්ආන් කට පාඩම් කරනවා.

ප්‍ර : කුර්ආන ආගම එහෙම ඉගෙන ගන්න පන්ති එහෙම ගියාද කොහේට හරි?

පි : පන්ති ගියේ නැහැ, අර එකතු කරලා, අර friends එක්ක එකතු කරලා එහෙම තමයි පාඩම් කළේ ඒක.

ප්‍ර : දැන් ෆාතිමා ජීෆ්රි විවාහ වුණේ මොන වර්ෂයේදී ද?

පි : ඒක නම් අවුරුදු 7 න් ඉස්සර.

ප්‍ර : අවුරුද්ද හරියට තමන්ට මතක නැහැ?

පි : ඔව්.

ප්‍ර : එයා විවාහ වුණේ කාත් සමඟද, ෆාතිමා ජීෆ්රි විවාහ වුනේ කාත් සමඟද?

පි : ඉල්හාම් එක්ක.

ප්‍ර : සම්පූර්ණ නම දන්නවද ඉල්හාම්ගේ?

පි : ඔව්. ඉල්හාම් ඊබ්‍රාහිම් ඉල්හාම් එක්ක දන්නවා.

ප්‍ර : දැන් මේ විවාහය සිද්ධ වුණේ කොහොමද? ඒ කියන්නේ යෝජනාවකින්ද නැත්නම් අඳුනගෙනද?

පි : යෝජනාවක්. ලොකු හොටෙල් එකක තමයි එයාගේ වෙඩින් කළේ.

ප්‍ර : වෙඩින් එක ගත්තේ ලොකු හෝටලයක?

පි : ඔව්.

ප්‍ර : තැන කොහේද කියලා මතකයිද?

පි : කන්වෙන්ෂන් සෙන්ටර්.

ප්‍ර : දැන් විවාහය ලොකු උත්සවාකාරයෙන් ගත්තද?

පි : ඔව් උත්සවයෙන් ගත්තා.

ප්‍ර : දැන් තමන්ගේ දුව, ෆාතිමා ජීෆ්රිට විවාහ යෝජනාව ආවාම ඒ පවුල ගැන, දැන් දුවට බඳින්න නියමිත ඉල්හාම් යන අය ගැන එහෙම හොයලා බැලුවද?

පි : හොයලා බැලුවා තමයි මාස 2,3 න් පස්සේ තමයි ඔක්කොම රෙජිස්ට්‍රර් කළේ.

Presidential Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර : කොහොමද හොයලා බැලුවේ?

පි : හොයලා බැලුවේ එයාගේ පවුල හොඳයි කියලා අහලා තමයි කරේ අපි. ඒ කාලේ එයා හොඳටම බිස්නස් කළා.

ප්‍ර : එයා කිව්වේ කවුද?

පි : අර ඉල්හාම්. එයා තාත්තත් එක්ක අර ස්පයිසි බිස්නස් හොඳටම කළා. ඒක තමයි අහලා තමයි දුන්නේ දුව. පස්සේ එයා අර වැල්ලම්පිටියේ අර ලොකු ඔෆිස් එකක් ඇරියා. ඒකටත් අපි කිරිබත් උයලා ගියා එහේ.

ප්‍ර : වැල්ලම්පිටියේ මොකක්ද ඒ ඔෆිස් එක?

පි : ඒක නම් දන්නේ නැහැ, ඒ කාලේ අවුරුදු 6 න් ඉස්සරහානේ, 6 න් 7 න් ඉස්සරානේ,

ප්‍ර : ඒ කියන්නේ මොකක් හරි බිස්නස් කරන තැනක්ද?

පි : ඔව් බිස්නස් කරනවා. අර ස්පයිසි බිස්නස් එක.

ප්‍ර : වැල්ලම්පිටියේ කළේ ස්පයිසි බිස්නස් ද?

පි : ඔව් ඒ කාලේ එයා තාත්තත් එක්ක හොඳටම ඉන්නවා. ඒ තමා අපි දුව දුන්නේ. නැත්නම් දෙන්නේ නැහැ.

ප්‍ර : ඔය වැල්ලම්පිටිය ඔෆිස් එකට ගිහිල්ලා තියෙනවද මහත්මිය?

පි : ඔව් අපි මහත්තයා ගියා අර Open කරන්න.

ප්‍ර : වැල්ලම්පිටියේ කොහේද තියෙන්නේ?

පි : මට ඒක දන්නේ නැහැ, වැල්ලම්පිටිය දන්නවා. හොඳටම දන්නවා.

ප්‍ර : දැනන් හිටියා එහේ කරන්නේ කුළුබඩු සම්බන්ධයෙන් තමයි ව්‍යාපාර කටයුතු කරන්නේ කියලා දන්නවද, මහත්මිය දන්නවද?

පි : ඔව්, ඔව්, අර ස්පයිසි වැඩ කරන්නේ.

ප්‍ර : දැන් තමන්ගේ දුව විවාහ වුණාට පස්සේ කොහේද පදිංචි වුණේ?

පි : මහවිල ගාඩ්න්ස් තමයි පදිංචි වුණේ.

ප්‍ර : දෙමටගොඩ මහවිල ගාඩ්න්ස්?

පි : ඔව්.

ප්‍ර : දෙමටගොඩ මහවිල ගාඩ්න්ස් එකේ ගෙදර යම්කිසි කොටසකද එයා පදිංචි වෙලා හිටියේ?

පි : පළවෙනි මහලේ, කාමර 4 ක් සහිත 1 වන මහලේ එක කාමරයක ඇය ජීවත් වුණා.

ප්‍ර : සාක්ෂිකාරිය ගිහිං තියෙනවද, ඒ ගෙදරට ගිහිං තියෙනවද?

පි : මමද

ප්‍ර : ඔව්

පි : ඔව් ගිහිං තියෙනවා.

ප්‍ර : දැන් විවාහයෙන් ෆාතිමාට දරුවන් ලැබුණාද?

පි : දරුවෝ 3 දෙනෙක් ඉන්නවා.

ප්‍ර : ඒ අය දුවලද පුතාලද?

FAIR COMMENT BY JEZEEM

පි : පුතාලා.

ප්‍ර : ඇය මිය යන කාලේ වෙන කොට ඇයට තව දරුවෙක් ලැබෙන්න හිටියද?

පි : ඔව්.

ප්‍ර : තමන් ඒ ගැන දැනන් හිටියද?

පි : මාස 2 ½ යි.

ප්‍ර : දැන් විවාහ වුණාට පස්සේ තමන්ගේ දුව තමන්ගේ ගෙදර එනවා යනවද?

පි : ඔව්. එනවා.

ප්‍ර : කොච්චර කාලෙකට සැරයක් වගේද ගෙදර එන්නේ?

පි : ගෙදර එන්නේ මාසයකට සැරයක් එනවා, උදේට එනවා, හවසට එයා ඇවිල්ලා යනවා.

ප්‍ර : ඒ අවස්ථාවේදි එයාගේ ස්වාමි පුරුෂයා මේ ඉල්හාම් ගෙදර එනවද, ඕගොල්ලන්ගේ ගෙදර එනවද?

පි : ගෙදර එනවා. පස්සේ පස්සේ එන්නේ නැහැ, ගේට්ටුව ගාව එයාව බැහැල එයා ගියා. එහෙමයි පස්සේ. ඉස්සර එනවා ඉස්සරහා හෝල් එකේ වාඩිවෙලා තේ බීලා ගියා. ගොඩාක් එන්නේ නැහැ එයා.

ප්‍ර : පස්සේ පස්සේ එන්නේ නැහැ කියලා කියන්නේ විවාහ වෙලා ටික කාලෙකට පස්සේ මොකක් හරි වෙනසක් දැක්කද?

පි : ඔව් එයාට busy කියලා දුව තමයි එනවා, එයා ගොඩක් එනවෑ.

ප්‍ර : ඒ මියයන්න කොච්චර කාලෙකට වගේ ඉදලද ඔය වෙනස තමන් දැක්කේ?

පි : අවුරුද්දක් ඉස්සර වාගේ තමයි.

ප්‍ර : දැන් ඉල්හාම් එක්ක කතා බහ කරනවද ගෙදරට ආවාම?

පි : ඔව් මාත් එක්ක කතා කරන්නේ නැහැ,

(නැවත ප්‍රශ්නය ඇසීමට අවසර ඉල්ලා සිටිනවා)

ප්‍ර : දැන් මහත්මිය කිව්වානේ පස්සේ පස්සේ ආවේ නැහැ, පස්සේ පස්සේ වෙනසක් දැක්කයි කියලා?

පි : ඔව්.

ප්‍ර : ඔය කියන වෙනස දැක්කේ විවාහ වෙලා කොච්චර කාලෙකට පස්සේද ඔය විදියේ වෙනසක් දැක්කේ?

පි : අවුරුද්දකට පෙර තමයි මේ වගේ වෙනසක් දැක්කේ. බෝම්බ ප්‍රහාරය සිදු වෙන්න දවසේ සිට අවුරුද්දකට පෙර තමයි මෙහෙම වෙනසක් ඇති වුණේ. මොකද කියලා ඇහුවොත් busy කියලා කියන්නේ.

ප්‍ර : දැන් ඔබ කතා කරන්න උත්සාහ කළේ නැද්ද?

පි : මාත් එක්ක එයා ගොඩක් කතා කරන්නේ නැහැ.

ප්‍ර : දුවගෙන් අහලා බැලුවේ නැද්ද මොකක්ද මේ වෙනස කියලා?

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එයා කියනවා එයාට වැඩ අම්මා එයාට හදිසියි කියලා එයා කියනවා, දුව එනවානේ එයත් එක්ක මම ගොඩක්, මම ඒගොල්ලන්ගේ ප්‍රශ්න අහන්නේ නැහැ.

ප්‍ර : දැන් තමන්ලගේ පුතාලත් එක්ක තමන්ගේ ස්වාමි පුරුෂයත් එක්ක ඉල්හාම් කතා බහ කරනවද?

පි : ඒගොල්ලන් නිකම් කතා කරලා ඉස්සරහා වාඩි වෙලා කතා කරලා යනවා, මොනවද කතා කරන්නේ කියලා මට හොඳට පැහැදිලි නැහැ. අපි සාමාන්‍යයෙන් නිවස තුළ ඉන්නේ. එයා ඇවිල්ලා සාලේ වාඩි වෙලා ඒගොල්ලොත් එක්ක කතා කරලා යනවා, නමුත් කතා කරන්නේ මොකක්ද කියලා පිළිබඳව මා දැනුවත් නැහැ.

ප්‍ර : දැන් ඔය යම් අවස්ථාවකදී තමන්ගේ ස්වාමි පුරුෂයා තමන්ට කිව්වද මේ ඉල්හාම් එක්ක මොනවද කතා කලේ, මොකක් හරි ප්‍රශ්නයක් වුණාද ඒ වගේ දෙයක් කිව්වද?

පි : ප්‍රශ්නයක් වගේ කතා කරන්නේ නැහැ,

ප්‍ර : ආගම අදහන විදිය ගැන තමාගේ ස්වාමි පුරුෂයත් එක්කලා ඉල්හාම් කතා බහ කලාද, කතා බහක් එහෙම ඇති වුණාද?

පි : දරුවන් සමඟ එයා ආගම ගැන එහෙම කතා කරලා තියෙනවා, නමුත් මගේ ස්වාමි පුරුෂයාත් සමඟ එහෙම කතා බහක් තිබුණේ නැහැ.

ප්‍ර : දැන් පස්සේ හරි තමන්ට දැන ගන්න ලැබුණද මේ තමන්ගේ ස්වාමි පුරුෂයත් එක්කලා කතා බහක් ඇති වෙලා තියෙනවද කියලා, ආගම සම්බන්ධයෙන්, ආගම අදහන විදිය ගැන?

පි : ෆාතිමා ජීෆ්රි මගේ දුවගේ පියා වන මගේ ස්වාමි පුරුෂයා ස්වාමීන් වහන්සේලාට පළතුරු වට්ටියක් පූජා කළා. ඒවා අපේ ආගමට අනුව තහනම් කියලා ඒ පිළිබඳව සංවාදයක් මගේ ස්වාමි පුරුෂයා සමඟ ඇති වෙලා තිබුණා. ඒවා තහනම් අපේ ආගමට අනුව ඒ ස්වාමීන් වහන්සේලාට එහෙම පූජා කරන එක. ඒ පිළිබඳව සංවාදයක් ඇති වුණා.

ප්‍ර : ඒ සංවාදය ඇති වෙලා තිබුණේ ෆාතිමා ජීෆ්රී මිය යන සිද්ධිය වෙන්න කොච්චර විතර කාලෙකට කලින්ද?

පි : මට හොඳටම මතක නැහැ මාස 6 ක් 7 ක්. ඒ මගේ දුව විසින් තමයි ඒ පණිවිඩය අපිට ලබා දුන්නේ. ඒ මාස 6, 7 ට පෙර තමයි මට මතක හැටියට.

ප්‍ර : දැන් තමන්ගේ දුවගේ මේ ආගම අදහන විදිය, එයාගේ සාමාන්‍ය ජීවිතයේ එහෙම මොනවා හරි වෙනසක් තමන් නිරීක්ෂණය කළාද?

FAIR COMMENT BY JEZEEM

පි : කිසිම වෙනසක් මා දුටුවේ නැහැ. මට දැනුනෙත් නැහැ, දරුවන් සමඟ අපේ ඥාතීන්ගේ දරුවන් සමඟ හරියාකාරව ඒ සම්බන්ධකම් පවත්වගෙන ගියා. එහෙම වෙනසක් අපිට දැනුනේ නැහැ.

ප්‍ර : දැන් තමන් කිව්වානේ ඉල්හාම්ගේ වෙනසක් තමන් නිරීක්ෂණය කලයි කියලා, ඒ ගැන දුවගෙන් අහලා බැලුවේ නැද්ද?

පි : මෙහෙම දෙයක් සිදුවෙයි කියලා අපි විශ්වාස කළේ නැහැ, මේ පිළිබඳව සොයා බැලුවෙත් නැහැ. අපි හිතුවේ අපේ ඉස්ලාම් දහමට අනුකූලව ඒගොල්ලෝ ජීවත් වෙනවා මිසක් මෙහෙම ත්‍රස්ත ක්‍රියාවලට යොමු වෙනවා කියලා මම විශ්වාස කළේ නැහැ.

ප්‍ර : දැන් තමන්ගේ එක පුතෙක් තමයි මේ හුසේන් ජිෆ්රි කියලා කියන්නේ?

පි : ඔව්.

ප්‍ර : හුසේන් ජිෆ්රිගේ විවාහ උත්සවයක් පැවැත්තුවද විවාහ වෙන කොට?

පි : එයා එන්නේ නැහැ.

ප්‍ර : උත්සවයක් තිබ්බද?

පි : ඔව් තිබ්බා.

ප්‍ර : ඒ හුසේන් ජිෆ්රිගේ විවාහ උත්සවයට ෆාතිමා ජිෆ්රි සහ ඉල්හාම් සහභාගි වුණාද?

පි : අවසාන මොහොත දක්වා ඔවුන් කිව්වා අපිට ඒ උත්සවයට පැමිණෙනවා කියලා, නමුත් ඔවුන් පැමිණියේ නැහැ, මම කෝල් කරලා අහනවිට ඒගොල්ලෝ කිව්වේ ඒවට අපි සහභාගී වෙන්නේ නැහැ කියලා. මම දුවගෙන් තමයි ඒ පිළිබඳව විමසුවේ.

ප්‍ර : කොයි කාලේද මේ හුසෙන් ජිෆ්රි තමාගේ පුතාගේ විවාහ මංගල්‍ය උත්සවය තිබුණේ? අවුරුද්ද මතකයිද?

පි : අවුරුදු 3 ½ ක් වගේ ඇති. හරියට මතක නැහැ එයාට තමා දන්නේ ඒක.

ප්‍ර : 2016 වර්ෂයේ කියලා කිව්වොත් තමන් පිළිගන්නවද?

පි : ඔව්. June or July.

ප්‍ර : දැන් ඔය පවුලේ විවාහ උත්සව වලට සහභාගී වෙන්නේ නැති වුණාම දැන් තමන් දුවගෙන් ඇහුවේ නැද්ද ඇයි මේ ඕගොල්ලන්ගේ වෙනසක් මෙහෙම තියෙන්නේ, ඇයි මේ උත්සවවලට එන්නේ නැත්තේ?

පි : එයාට කැමති නැහැ කිව්වා. එයාටත් කැමති නැහැ...

ප්‍ර : මොනවත් අමනාපයක් තිබ්බද සහෝදරයත් එක්ක? මුකුත් තරහක් එහෙම තිබ්බද?

පි : තරහක් නැහැ වෙන function වලටත් එයා යන්න කැමති නැහැලු.

ප්‍ර : වෙන function කියලා කිව්වේ මොකක්ද ඔබ අදහස් කලේ?

President's Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM

පි : Family functions වලට. ගෙදරට යනවා

ප්‍ර : පවුලේ උත්සව වලට ආවේ නැහැ?

පි : ඔව් හොටෙල් වලට යන්නේ නැහැ කිව්වා.

ප්‍ර : ගෙදර තියෙන ඒවට එනවා හෝටල්වල තිබ්බොත් යන්නේ නැහැ?

පි : යන්නේ නැහැ. පොඩි පොඩි functions තියෙනවා නම් එනවා.

ප්‍ර : ඇයි හෝටල්වලට යන්නේ නැත්තේ?

පි : එයාට කැමති නැහැ කිව්වා. එහේ එන්න කියලා මම කියනවා. අපිටත් ආසයිනේ දුව එන්නට. නැහැ අම්මා අපිට කැමති නැහැ කියනවා. ඒ වගේ උත්සවලට අපි සහභාගී වෙන්නේ නැහැ අපිට කැමති නැහැ කියලා කියනවා.

ප්‍ර : ඇයි කැමති නැහැ කිව්වේ ඇයි අකමැති වෙන්න හේතුව කිව්වේ?

පි : එච්චරම මම අහන්නේ නැහැ. කැමති නැහැ කිව්වාම. ඒත් දෙන්නම හොඳටම ඉන්නවා. ඒ වෙලාවේ අපි එයාට කරදර කරන්න ඕන නැහැනේ, නිකම් හරි ඔයයි හස්බනුයි කොහොමද, හොඳටම ඉන්නවා අම්මා එහෙම තමයි හැමදාම කිව්වේ. ඒක බෝම්බ පිපිරූ මාසෙට ඉස්සෙල්ලා ගෙදර ආවා, ආවට පස්සේ එයාත් චුට්ටක් කිට්ටු වෙලා පුතා හොඳට ඔයාව බලනවද ඔව් අම්මා අපි සංතෝසෙන් ඉන්නවා කියලා කිව්වා. ඒකට අපිට ගොඩක් අහන්න ඕනේ නැහැනේ.

ප්‍ර : ස්වාමි පුරුෂයාගේ පවුලේ අය ගැන මොකක්ද තමන්ගේ දුව කියලා තියෙන්නේ තමන්ට?

පි : ඒගොල්ලන්ටත් අර කට්ටිය මුකුත් කියලා නැහැ, එයාගේ හොඳ තමයි කියන්නේ ඒගොල්ලෝ. එයාගේ නංගි, අර ඉල්හාම්ගේ නංගී කියනවා ෆාතිමා හොඳ කෙල්ලෙක් කියලා තමයි කියනවා. ඒගොල්ලොත් මුකුත් කතා කරන්නේ නැහැ.

ප්‍ර : දැන් තමන්ගේ දුව විවාහ වෙන කොට තමන්ගේ ගෙදරින් මොනවා හරි තෑගී දුන්නද දුවට?

පි : ඔව් දුන්නා.

ප්‍ර : මොනවද දුන්නේ?

පි : රත්තරන් bangles දුන්නා. අර nickels, earring ඔක්කොම දුන්නා අපි.

ප්‍ර : දැන් මේ ෆාතිමා සහ ඉල්හාම් වාහන එහෙම පාවිච්චි කළාද?

පි : ඔව්. වාහන පාවිච්චි කළා. අපි දුන්න කළුපාට ඇලියොන් කාර් එකක් ඒක තමයි පාවිච්චි කලේ. අපි ලබා දුන්න කාර් එක තමයි ඒ අය පාවිච්චි කලේ.

ප්‍ර : දැන් ඉල්හාමුයි තමන්ගේ පවුලේ තමන්ගේ පුතාලයි මේ පිරිමි ළමයින් එක්ක මොන වගේ සම්බන්ධයක්ද තිබ්බේ? ඉල්හාමුයි තමන්ගේ පුතාලායි?

FAIR COMMENT BY JEZEEM

පි : අපේ පුතාලද

ප්‍ර : ඔව් කොහොමද ඒගොල්ලොත් එක්ක තිබ්බ සම්බන්ධය?

පි : ඒගොල්ලෝ කවුරුත් සම්බන්ධය අඩුයි. ගෙදර එනවා නම් නිකම් කතා කරලා කතා කරලා ඉන්නවා. මොනවද කතා කළේ කියලා අපිට දන්නේ නැහැ ඒක. අර පොඩි පුතා තමයි ගෙදර ඉන්නේ. ඔහු සාමාන්‍යයෙන් නිවසට පැමිණියොත් විනාඩි 15 ක් වගේ කාලයක් ගත කරනවා. සාමාන්‍යයෙන් ඔහු කතා කරන්නේ පිරිමි අය සමඟ විතරයි. කාන්තාවන් සමඟ ඔහු කතා කරන්නේ නැහැ.

ප්‍ර : දැන් තමන්ට මතකද තමන්ගේ ෆාතිමා ජීෆ්රි දුව මියගිය දවස?

පි : මැරිච්ච දිනය දන්නේ නැහැ, මතක නැහැ ඒක. අවුරුදු 7 න් ඉස්සෙල්ලනේ?

(නැවත එම ප්‍රශ්නය ඇසීමට අවසර ඉල්ලා සිටිනවා)

ප්‍ර : දැන් තමන්ගේ ෆාතිමා ජීෆ්රි දුව ජීවතුන් අතර ඉන්නවද?

පි : නැහැ.

ප්‍ර : දුව මියගියපු දවස මැරිච්ච දවස තමන්ට මතකයිද?

පි : මතකයි ඒක මතකයි.

ප්‍ර : කවද ද දිනය ඒ දිනය?

පි : April 21.

ප්‍ර : මොන අවුරුද්දෙ ද?

පි : 2019 වර්ෂයේ.

ප්‍ර : මියගියේ කොහේදී ද?

පි : මහවිල ගාඩන්ස්.

ප්‍ර : මොන හේතුවකින්ද මියගියේ?

පි : අපි දන්නේ නැහැ බෝම්බ සිදුවීමක් තමයි.

ප්‍ර : බෝම්බ පිපිරීමකින් කියලා කිව්වොත් ඒක නිවැරදි ද?

පි : ඔව්.

ප්‍ර : පස්සේ දැන ගත්තද කොහොමද සිද්ධිය වෙලා තියෙන්නේ කියලා?

පි : ඔව්.

ප්‍ර : දැන් 2019 අප්‍රේල් 21 වෙනිදා උදේ ගෙදර ද හිටියේ මහත්මිය?

පි : මම ඔව්. ගෙදර හිටියේ.

ප්‍ර : අර මරදානේ පදිංචි වෙලා ඉන්න ගෙදරද එහෙමද එදත් හිටියේ?

පි : ඔව්, ඔව් හිටියේ.

ප්‍ර : දැන් උදේ ගෙදර ඉන්න කොට මොනවා කරමින්ද හිටියේ උදේ ගෙදර?

පි : අර Breakfast හදන වෙලාව.

ප්‍ර : උදේ කෑම හැදුවා ගෙදර අයට?

පි : ඔව්.

President's Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් ඒ ගෙදර උදේ කෑම එහෙම හදලා ඉන්න කොට තමන්ට මේ කෝල් එකක් එහෙම ආවද?

පි : ඔව් මට ආවා. මට ගත්තලු එයා දුව,

ප්‍ර : දුව කියලා කිව්වේ මේ ෆාතිමා ජීෆ්රි?

පි : ඔව් ෆාතිමා.

ප්‍ර : කවුද කිව්වේ දුව කෝල් ගත්තලු කියලා මහත්මියට කවුද කිව්වේ?

පි : miss call තියෙනවානේ ඒක බැලුවා, මම ගත්තේ නැහැ පස්සේ අපේ පුතාගේ wife ට කතා කරලා

ප්‍ර : පුතා කවුද? පුතාගේ නම?

පි : රිසාන් ලොකු පුතා. කතා කරලා කිව්වා

ප්‍ර : ලොකු පුතාගේ නම රිසාන්?

පි : ඔව්.

ප්‍ර : රිසාන්ගේ නෝනගේ නම?

පි : ෂිෆාරා.

ප්‍ර : එයාට කතා කරලා තියෙනවා?

පි : එයාට කතා කරලා අම්මට කතා කරන්න කිව්වලු.

ප්‍ර : ඊට කලින් තමන්ට calls දීලා නමුත් ගන්න හම්බ වුණේ නැහැ, miss calls තිබුණේ?

පි : ඔව් miss calls තිබුණේ. පස්සේ එයා කිව්වට පස්සේ මම ගත්තා.

ප්‍ර : දැන් මේ කාලේ වෙන කොට මේ මහත්මිය මොකක්ද පාවිච්චි කරපු දුරකථන අංකය?

පි : අන්තිම නොම්මරය one six හොඳටම දන්නවා.

ප්‍ර : මම කිව්වොතින් මහත්මියගේ ජංගම දුරකථන අංකය 077-1315516 කියලා අන්තිමට one six තියෙන?

පි : ඔව්, ඔව්.

ප්‍ර : ඒක හරිද?

පි : හරි.

ප්‍ර : දැන් ෆාතිමා ජීෆ්රි දුවගේ Telephone number එක දන්නවද?

පි : ඒක දන්නැහැ. One five වාගේ.

ප්‍ර : අන්තිමට ඉවර වෙන්නේ?

පි : ඔව්.

ප්‍ර : මම ඒක කිව්වොතින් බලන්න ඒක මතක් වෙනවද කියලා 077-9343215 හරිද?

පි : හරි.

ප්‍ර : දැන් සාමාන්‍යයෙන් වෙලාව මතකද කීයට විතරද දැන් තමන් මේ දුරකථන ඇමතුමක් ගත්තේ කියලා?

පි : ගත්තේ 8.45, 9 විතර ඇති. වෙලාව බැලුවේ නැහැ ඒක ඇති.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

ප : දැන් තමන් තමන්ගේ දුවගේ දුරකථනයට ඇමතුමක් ගත්තාම මොකද කිව්වේ ෆාතිමා ජීෆ්රි දුව?

පි : මම කතා කරලා ඇයි දුව කතා කරන්න කිව්වේ කියලා අහනවා. අහන කොට කියනවා, එන්ඩ අම්මා ඔයාට හරි අර ඉල්හාම් පුතාට හරි පොඩි පුතාලට හරි මොනවා හරි අසනීපයිද කියලා මම අහනවා. අහන කොට කිව්වා නැහැ අම්මා ඔයා එන්ඩ ආවයින් පස්සේ මම කියන්නම් එන්ඩම්මා කියලා කිව්වා. පස්සේ මගේ උදේ වැඩ ඉවර කළාට පස්සේ මම 10 ½ , 11 ඇති මම ගියා එතනට.

ප : කොහාටද ගියේ?

පි : අර මහවිල ගාඩ්න්ස් එකට.

ප : කොහොමද ගියේ?

පි : ඔටෝ එකෙන්.

ප : ත්‍රීවීල් එකකින් ගියා?

පි : ත්‍රීවිල් එකකින් ගියා.

ප : දැන් තමන් ඒ ගෙදරට 10 ½ ට විතර මේ ෆාතිමා ජීෆ්රි දුවගේ ගෙදරට ගියයි කිව්වා?

පි : ගෙදරට ගියා. මම වෙලාව බැලුවේ නැහැ ගියා.

ප : කමක් නැහැ ඊට ආසන්න වෙලාවක ගෙදරට ගියා?

පි : 10 ½ යි 11 විතර ඇති.

ප : ෆාතිමා කොහේද හිටියේ ගෙදර?

පි : අර පලවෙනි තට්ටුවේ හෝල් එකේ සෙටියේ වාඩිවෙලා කුර්ආන් කිය කියා ඉන්නවා යන කොට.

ප : කුර්ආනය කියව කියව හිටියා?

පි : ඔව්.ඔව්.

ප : කුර්ආන් එක කොයි වගේ එකක්ද?

පි : අර ලයිට් බ්‍රවුන් කවර් පොඩි කුර්ආන් එකක්.

ප : පොඩි කුර්ආන් එකක්?

පි : ඔව් මේ වාගේ පොඩි කුර්ආන් එකක්.

ප : දැන් ඒ පොඩි කුර්ආන් එකක් කියලා කිව්වනේ?

පි : ඔව්.

ප : ඒ කුර්ආන් එකේ අකුරු මොන පාටින්ද තිබුණේ?

පි : අරාබි.

ප : පාට අහන්නේ?,

පි : කළුපාට.

ප : ඒ ඇතුලේ නේ, අර කුර්ආන් එකේ?

පි : යන කොට එයා මෙහෙම කියව කියව ඉන්නවානේ, එයා මටත් කියනවා සූරා එක මේක ඔක්කොම ට්‍රාන්ස්ලේට් කරන්න අම්මා හොඳයි, අර සින්න සූරා එක. සූරා කියන්නේ ගාථාවක් වගේ

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

අල්කුර්ආනයේ තියෙන ඡේද පරිවර්ථනය කළයුතුයි කියලා කිව්වා. ඒකේ පරිවර්ථනය අපි දැන සිටිය යුතුයි කියලා කිව්වා. ඒක කියව කියව කුර්ආනය පිළිබඳව මේකේ තියෙන සූරා, නැත්නම් ගාථා අපි දැනගෙන ඉන්න ඕනේ, ඒ පිළිබඳව අපි අධ්‍යනය කලයුතුයි කියලා මට කිව්වා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා</u>

ප්‍ර : අහන්ඩ මොන සූරා එකද දැන ගත යුතුයි කියන්නේ?

පි : එය සාමාන්‍යයෙන් පොදුවේ සූරා කියලා තමයි කිව්වේ එහෙම විශේෂ නෙමෙයි, වඳින කොට එහෙම කියන සූරා.

ප්‍ර : දුවගේ අතේ තිබුණ කුර්ආන් එකේ පිට කවරය ලා දුඹුරු කියලයි කියන්නේ ලයිට් බ්‍රවුන්?

පි : ඔව් කලර් ලයිට් බ්‍රවුන්.

ප්‍ර : ඒකේ අකුරු මොන පාටින්ද තිබ්බේ?

පි : ගෝල්ඩ් කලර්.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය:</u>

ප්‍ර : දැන් මහත්මිය ගෙදරට යන කොට මොනවා හරි අරගෙන ගියාද?

පි : ඔව්.

ප්‍ර : මොනවාද ගෙනිව්වේ?

පි : මම එහෙම මාසෙන් මාසේ යන කොට පළතුරු, කේක් ජාති.

ප්‍ර : එදා මොනවද ගෙනිව්වේ?

පි : ඒ වෙලාවේ පැපෝ ගෙඩියයි, කෙසෙල්, රටඉදි, අනික් එක කේක් ඔක්කොම අරන් ගියා පුතාලට එයාට. ඇපල්.

ප්‍ර : දැන් දරුවෝ කොහේද හිටියේ?

පි : එයාලත් අර හෝල් එකේ සෙල්ලම් කර කර හිටියා.

ප්‍ර : දැන් මහත්මිය කිව්වානේ මේ දුව කුර්ආන් එක කියව කියව හිටියා කියලා?

පි : ඔව්. එයා කියව කියව හිටියා කියලා මමත් කිට්ටු වෙලා ලොකු සෙටි එකේ කිට්ටු වෙලා වාඩි වෙලා ඇයි දුව එන්න කිව්වේ හදිසියෙන් එන්න කිව්වේ දුක් වෙලා එන්න කිව්වේ ඇයි කියලා මම අහනවා. ඇයි කියලා අහන කොට මම කියනවා ඇයි ගෙදර කියනවා වගේ පුතාට අර ඉල්හාම් පුතාට හරි, බාලයාට හරි මොනවද අසනීපයිද ඔයාට මොනවා හරි ලෙඩද ඇයි ටක් ගාලා එන්න කිව්වේ කියලා මම අහනවා. අහන කොට නෑ අම්මා චුට්ටක් දුක වගේ හිතිලා කෝ පුතා කියලා අහනවා මම ඒ වෙලාවේ, ඉල්හාම් පුතා කෝ කියලා අහනවා, එයා කියනවා ඊයේ රෑ 1 ට

Proof Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

විතර ඇවිල්ලා බබාව කිස් කරලා අඩලා ගියා කියලා කියනවා. ඇයි දුව ඔයා කෝල් කරන්නේ නැද්ද? කෝ ඒයා කියලා අහනවා. කෝල් වැඩ කරන්නේ නැහැ අම්මේ එහෙම කිව්වා එයා. එහෙම කියලා පස්සේ කිව්වා අම්මා ඔයා පුතාලා බලාගෙන ඉන්න මට ගොඩක් කුර්ආනය කට පාඩම් තියෙනවා, මම කරන්න ඕනේ, ඔයා බබාව බලාගෙන ඉන්න කිව්වා.

දැන් වේලාව : ප.ව. 2.15 යි.
මෙතැන් සිට ල/ලේ :- යමුණා දසනායක මිය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

වෙලාව ප. ව. 2.15
පෙර සටහන් ගැනීම ල/ලේ දම්මිකා .
සටහන් ගැනීම ල/ලේ යමුනා දසනායක .

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.

ප්‍ර දැන් තමන්ගේ දුවව දකින කොට ඉස්සෙල්ලම මහවිල උද්‍යානයේ පලවෙනි තට්ටුවේ දුව මොකක්ද ඇඳගෙන හිටපු ඇඳුම ?

උ ඇඳුම අර pink color top black color dot dot වගේ pink color top එක light pink brown shall එක white color trouser එක තමා දාලා හිටියේ. මම යනකොට.

ප්‍ර එදා දුවව දකින කොට ඇඳුමේ යම් වෙනස් කමක් දැක්කාද ඇඳුමේ ?

උ නැහැ. නැහැ වෙනස් කමක් නැහැ .හැමදාම වාගේ ම හැමදාම කුරුතා ටොප් එකයි ට්‍රවුසර් එක තමයි දාන්නේ ගෙදර හිටියකොට.

ප්‍ර දැන් ඔබ කිව්වා නේද දැන් දුවට ළමයි 3 දෙනෙක් හිටියා හතරවෙනි ළමයා හම්බ වෙන්න මාස දෙකයි කියලා ?

උ ඔව්.

ප්‍ර එතකොට දැන් ඒ හතරවෙනි ළමයා හම්බ වෙන්න වෙනවා කියලා දැන ගත්තායින් පස්සේ තවත් සැරයක් ඔබ ඔබගේ දුවව දැක්කාද ?ඒ කියන්නේ අප්‍රේල් 21 ට ඉස්සෙල්ලා?

උ ඉස්සරලා එක සැරයක් ගෙදර ආවා අර ලොකුපුතාට බාල පුතා හම්බවුනා බලන්න එයා ආවා. ඒ වෙලාවේ තමයි කිව්වේ තව මට බබා හම්බ වෙන්න තියෙනවා කියලා . පස්සේ මම ඒ වෙලාවේ තමයි දැක්කේ අර බෝම්බ පිපිරෙන වෙලාවේ තමයි දැක්කේ.

ප්‍ර හා ඒ කියන්නේ හතරවෙනි බබා හම්බ වෙන්න ඉන්නවා කියලා දැනගත්තායින් පස්සේ එක සැරයක් දැක්කා ?

උ ඔව්.

ප්‍ර ඊට පස්සේ තමයි ඔය බෝම්බ පිපිරෙන්න දවසේ ආයෙත් දැක්කේ නේද?

උ ඔව් දැක්කා.

ප්‍ර එතකොට ඒ බෝම්බ පිපිරෙන දවසේ දුවව දකිනකොට දුව යම් විදියකින් පොඩ්ඩක් මහත්වෙලා වගේ හිටියාද නැත්නම් මොනවාහරි ?

උ නැහැ පොඩි ළමයින්ට දාන්නේ තුනී ටීෂර්ට් මැටීරියල් වාගේ ඒක තමයි එයා අර ටොප් එක දාලා තියෙන්නේ .ඒකයි අර වයට් කලර් ට්‍රවුසර් එකේ ඒක දාලා. දන්නේ නැහැ වෙන සාමාන්‍යයෙන් එයා අඳින විදියට තමයි එයා ඇඳගෙන හිටියේ. වෙනසක් දැක්කේ නැහැ .

****

ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මිය.

ප්‍ර ඔබට කිව්වායි කිව්වනේමේ දරුවෝ බලාන්නයි කියලා ?

උ ඔව්.

ප්‍ර පාතිමා ජින්රි මෙනවාද කලේ?

FAIR COMMENT BY JEZEEM

උ එයා කුරුවානා කියව කියවලා ඉන්නවා මම කතා කරලා තමයි වාඩිවෙලා අම්මා මාත් එක්ක කතාකරන්න එපා ඔයා බබාලා මට හරියට කරදරයි ඔයා බබාව බලාගෙන ඉන්න අම්මා අර කේක් ඔයා ගෙනාවානේ පළතුරු කේකේ ඒක දීලා අම්මා බලාගෙන ඉන්න කීවා මට එයා .

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර අම්මා බලාගන්න කියලා ඉඳලා දුව ඒ සාලේම හිටියාද නැත්නම් කාමරේද?

උ සාලෙම සාලෙම අර සැටි එකක වාඩිවෙලා එයා කුරුවාන් තමයි කිය කියා ඉන්නවා ඒ වෙලාවේ.

ප්‍ර ඒ වෙලාවේ දුවගේ මූණේ යම්කිසි වෙනස්කමක් දැක්කාද ?

උ වෙනස් කමක් නැහැ මම යනකොට චුට්ටක් ඇහැ රතුවෙලා තිබුනා.

ප්‍ර ඇහැද ඇස්ද රතුවෙලා තිබුනේ ?

උ ඇස් දෙකම රතු වෙලා .

ප්‍ර ඇයි කියලා ඇහුවේ නැද්ද ඒ වෙලාවේ ?

උ මම ඇහුවා මුකුත් නැහැ අම්මේ මට කුරුවාන් කියන්න ඕනේ කියලා කියනවා එයා අඬනවත් නැහැ නැත්නම් මම අහනවනේ. මොනවත් කොහොමද තාත්තට කියන්නද, අයියට කියන්නද, කියලා මම අහනවනේ එයා මුකුත් කියලා නෙවේ ඒ වෙලාවේ මාත් එක්ක.

****

<u>ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මිය.</u>

ප්‍ර දරුවෝ මොනවා කරමින්ද හිටියේ ?

උ කවුද.

ප්‍ර දරුවෝ බබාලා කොහේද හිටියේ ?

උ එයත් සාලයේ තමයි හිටියේ මම ඉන්නකොට මමත් අර ඩයිනින් ටේබල් එක්ක අතනින් ඉඳලා අර බබාලා හතර . මස්සිනාලාගේ බබාලා දෙන්නයි ,මගේ දුවගේ බබාලා දෙන්නයි ,හතරදෙනෙක් එහේ හිටියා . ඒ ගොල්ලන්ට මම ගෙනාපු ස්විට්ස් ටික බෙදා දෙමින් හිටියා.

ප්‍ර තමන්ගේ දුව එවෙලේ දවල්ට කෑම එහෙම කාලා හිටියාද ?

උ මම අහන්නෙ නැහැ. පස්සේ එයා රූම් එකට ප්‍රේ කරන්න ගියානේ. මම ඉන්නකොට මාස 09 ක දරුවෙක් හිටියා .එයා නිදාගෙන හිටියේ එයාව ගෙනල්ලා ඒ බබාව මන් ගාවට ගෙනල්ලා දුන්නා.එයාටත් මම පළතුරු එහෙම කැව්වා. මම දරුවට පළතුරු දෙනවිට දුව ගිහිල්ලා වන්දනා කරන්න. මම මාස නවයක දරුවට පළතුරු කවමින් හිටියා එවිට මගේ දුව වන්දනා කරන්න ගියා.

****

FAIR COMMENT BY JEZEEM

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.

ප්‍ර ඉස්සරලා කිව්වා නේද දුවත් එක්ක අරසාලේ ඉන්නකොට මාස නවයක ළමයා නිදියගෙන හිටියා කියලා ?

උ මම යනවිට බබාලා දෙන්නෙක් තමයි ඇවිල්ලා හිටියේ . මස්සිනාලගේ බාබාලා දෙන්නෙක් හිටියා. දුවගේ ළමයිනුත් හිටියා. එක්කෙනෙක් නිදා ගෙන හිටියා පස්සේ තමයි ඇහැරුනේ.

ප්‍ර එතකොට පස්සේ ඇහැරිලා ඒ සාලෙටම ආවාද නැත්නම් ඒ කාමරේම හිටියාද ?

උ දුව තමයි ඒ බබාව මට ගෙනල්ලා දුන්නේ සාලයේ .

ප්‍ර පළවෙනි තට්ටුවේ දුවලා ෆාතිමි ජිෆ්රි ඉන්න කාමරයක් තිබ්බානේ ?

උ ඔව්.

ප්‍ර දැන් ඉස්සෙල්ලාම උදේ ඒ ගෙදරට ගිහිල්ලා අර ෆාතිමා ජිෆ්රි අර සාලෙ පළවෙනි තට්ටුවේ සාලයේ ඉන්නකොට ඒ කාමරය වහලාද තිබ්බේ ඇරලාද තිබ්බේ ?

උ ඒක බැළුවේ නැහැ සාලෙට පෙන්නේ නැහැ .ඒක මුල්ලක වගේ ඒ නිසා මට ඒ පිළිබඳව දැක ගන්න ලැබුනේ නැහැ.

ප්‍ර එතකොට ඒ කාමරයට ගියාද ?

උ මම දරුවාට පළතුරු දීලා මම යනකොට දුව ඒ කාමරයේ වන්දනා කරමින් ඉන්නවා.

ප්‍ර දුව බිම කොහොමද වන්දනා කර කර හිටියේ ?

උ එක වරක් ඇය වන්දනා කරන ආකාරයත් තියෙනවා ඒක බිමට ඒ විදියට හිටියේ.

ප්‍ර ඒ කියන්නේ බිමට පාත් වෙලා දනිස් බිම තියාගෙන ?

උ දනිස පාත් කරලා හිස බිම වැදිලා බිම පාත් කරලා වන්දනා කරන ආකාරය මම දැක්කා .

ප්‍ර එතකොට ඒ වෙලාවේද අර මාස නවයක ළමයි ඇහැරුනේ ?

උ එතකොට මගේ අතේ දරුවා.

ප්‍ර එතකොට ඇයි ළමයත් එක්ක කාමරයට ගියේ ?

උ දුවගේ කාමරයට අනිත් ළමයි දෙන්නත් ගියා . ඒ පළතුරු කවමින් ඉන්නකොට ඒ ළමයිනුත් ඒ වන්දනා කරන ඒ දුව ඒ කාමරයට ගියා ඒගොල්ලන්ගේ පස්සෙන්ම මමත් ගියා.ලොකු බබාලා දෙන්නෙක් ඒ ගොල්ලන් ගියා. මම මාස නවයක දරුවා මගේ අතේ තියාගෙන හිටියා. ඔවුන් දෙදෙනා සෙල්ලම් කරගෙන ඉන්නවා ඇදේ.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මිය.

ප්‍ර ඔවුන් දෙන්නා කිව්වේ ලොකු බබාලා දෙන්නා ?

උ ලොකු බබාලා දෙන්නා. එතකොට ඒ බබාලා දෙන්නා සෙල්ලම් කරගෙන ඉන්නකොට ඉල්හාම් ගේ නංගි වන ඉබාදා මට කෑම කන්න කතා කලා.

FAIR COMMENT BY JEZEEM

ප ඉබාදා ඇවිල්ලා කෑම කන්න කතා කලාම මොකද කලේ මහත්මිය?

උ මම අර පොඩි ළමයා .

ප මාස 09 ක බබා අතේ හිටියා කිව්වානේ නේද?

උ ඔව්. බිම පොලවේ වාඩි වෙලා බිල්ඩින් බ්ලොක් ටික දීලා බබාට එයා සෙල්ලම් කර කර ඉන්නවා .

ප පොලවේ කියන්නේ කොහේද ?

උ එයාගේ කාමරේ .

ප පාතිමාගේ කාමරේම තිබ්බා බබාව ?

උ මම තම තිබ්බා ඒ වෙලාවේ එයා කිව්වා මට චුට්ටක් කැරකිල්ල වාගේ තියනවා කිව්වා දුව .

ප කරකැවිල්ල වගේ?

උ කැරකැවිල්ල වගේ ඔළුව කැරකෙනවා . බබා හම්බ වෙන්න නිසා වෙන්න ඇති මම ගෙනිච්ච ඇපල් ගෙඩිය කපලා කන්න දුන්නා. හෝදලා ඇපල් ගෙඩිය දුන්නා කන්න කියලා .

ප පාතිමාට ?

උ ඔව්.

ප දැන් ඉබාදා ඇවිල්ලා කථා කරා කියලා කිව්වානේ කෑමට ?

උ ඔව්.

ප මොකක්ද කරේ ඒ වෙලාවේ මහත්මිය ?

උ ඒ වෙලාවේ බබා වඩාගෙන ඉන්නවා දුවට කිව්වා එයා අඬගහනවානේ හොද නැහැනේ දුව මම ගිහිල්ලා කාලා එන්නම් ටග් ගාලා කියලා .

ප ඒ කියන කොට පාතිමා මොනවා කරමින්ද හිටියේ ?

උ එයා එක අතේ කුරුවානේ අර ප්රේ කෙරුවායින් පස්සේ කුරුවාන් කියනවා. එක අතේ. මම පල්ලහා යනකොට එක අතෙන් ඇපල් ගෙඩි එක අත කුරුවාන් . එක මම යනකොට. අර පොඩි කුරුවානේ එයා. මම කියනවා මම බබා වඩාගෙන යන්නම් නැහැ අම්මා මට අමාරුයි කන්න එයා නිකම් ඉන්නවානේ එයා වාඩි වෙලා . යන්න අම්මේ ටග් ගාලා එන්න කාලා එන්න අම්මා කිව්වා මට .

ප දැන් තමන් පල්ලහාට යනකොට පොඩි බබාව ඒ කාමරේ බිම තියලා තමයි ගියේ ?

උ ඔව් මම තමයි තියලා ගියේ.

ප ලොකු බබාලා දෙන්නා ?

උ බෙඩ් එකේ

ප පාතිමාගේ කාමරේ

උ කාමරේ සෙල්ලම් කර කර ඉන්නවා එයා.

ප පාතිමා කුරානයේ කියවමින් හිටියේ කොතනදිද ?

උ අර බෙඩ් එකේ වාඩි වෙලා එක පැත්තක වාඩි වෙලා අර සෙන්ටර් එකේ පුතා දෙන්නම අර ප්ලේ කරා සෙල්ලම් කරලා ඉන්නවා.

Prosecutor's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර දැන් තමන් මේ ගෙදර පළවෙනි තට්ටුවේ ඉඳලා පල්ලහාට ගියාම කව්ද හිටියේ ගෙදර ?

උ ගෙදර මම පල්ලහා ගේ ඇවිල්ලා ඉබ්‍රාහිම් අයියාගේ කාමර ඇතුලේ තමයි හිටියේ ඔක්කෝම කාමරේ ඉන්නවා .මම යනකොට ඔක්කෝම දුක් වෙලා ඉන්නවා. අර අම්මායි ඉබාදායි ඉබාදාගේ අක්කා ඉජාස්, ඉබ්‍රාහිම් නානා ,එයාගේ වයිෆ් ,ඔක්කොමලා වාඩි වෙලා ඉන්නවා මම ඇයි දුක් වෙලා ඉන්නේ කියලා අහනවා . මුකුත් කියලා නැහැ . ඒ වෙලාවේ කිව්වා හා පොඩ්ඩක් ඉන්න පෙන් ඩ්‍රයිව් එක ඒක තියනවා දාලා අහන්නකෝ

ප්‍ර කව්ද කිව්වේ පොඩ්ඩක් ඉන්න කියලා ?

උ ඉජාස් මල්ලි.

ප්‍ර පල්ලහා තට්ටුවේ ඉබ්‍රාහිම් අයියාගේ කාමරේට තමයි ගියේ ?

උ ඔව්.

ප්‍ර ඔබ ඔය ඉබ්‍රාහිම් අයියා කියලා කිව්වේ ඉල්හාම් ගේ තාත්තා කියලා කිව්වොත් හරිද?

උ තාත්තා , මම යන කොට කෑම ඔක්කෝම මේස උඩින් තියනවා .

ප්‍ර ගෙදර අය කෑම කාලා හිටියාද කවුරුහරි?

උ කවුරුත් කාලා නැහැ මම පල්ලහ ගිහිල්ලා ආවා කන්න එන්න කියලා මම කාමරේට යනවා.

ප්‍ර කොහාටද ගියේ ?

උ පල්ලහා කාමරේ . පල්ලහා ගිහිල්ලා කාමරේට තමයි යන්නේ.

ප්‍ර ඉබ්‍රාහිම් දැන් ඔය තමන් අර කියපු ඉබ්‍රාහිම් අයියගේ කාමරේ කොහේද තියෙන්නේ ?

උ අර ඩයිනින් ටේබල් එහා පැත්තේ එහා පැත්තේ කාමරයක් තියෙනවා .

ප්‍ර එතකොට ගෙදර අය ඔක්කොම හිටියේ කාමරේ ඇතුලේ ?

උ ඔව්.

ප්‍ර ඒ ගොල්ලෝ මොනවා කරමින්ද හිටියේ ?

උ නිකම් දුක් වෙලා තමයි හිටියේ. මම අහනවා ඇයි ඔක්කොමලා ඇයි ඔබලා සියළු දෙනා දුක් වෙලා ඉන්නේ කියලා මුකුත් කියලා නැහැ . ඉජාස් කියනවා ඉබාදා පෙන්ඩ්‍රයිව් එකක් ගෙනාවා .

ප්‍ර කව්ද පෙන්ඩ්‍රයිව් එකක් ගෙනාවේ ?

උ මම ෂුවර් එක දන්නේ නැහැ . දැම්මා ඉජාස් . ඉජාස් තමයි කිව්වේ ඉල්හාම් මොකක්ද මේ කියන්න කියලා අහන්න කියලා ඒ පෙන්ඩ්‍රයිව් එක ඉජාස් මා දැනුවත්ව ඉජාස් වෙන්න ඕනේ මේ පෙන්ඩ්‍රයිව් එක දැම්මේ ලැප්ටොප් එක අරගෙන දැම්මා ඉල්හාම් මොකද කියන්නේ කියලා අහන්න කියලා .

ප්‍ර ඒ කියන්නේ කාටද කිව්වේ මහත්මියටද කිව්වේ ?

උ අපි සියලු දෙනාම ඉන්න කොට තමයි එහෙම කිව්වේ .

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර දැන් ඒක වාදනය වුනාද? ලැප්ටොප් එකේ පෙන්ඩ්‍රයිව් එක දැම්මාම ඒක වාදනය වුනාද ශබ්දය ඇහුනාද මොකක්ද කියන්නේ ?

උ ඔව්. මට ඉල්හාම් ගේ වොයිස් එක දන්නවානේ අස්සලාම් අලේකුම් කියන ඒක පමණක් මට ඇහුනා.

ප්‍ර ඒ කටහඬ අඳුරාගත්තාද ?

උ අඳුරාගත්තා අර දාන එක්කනා කියලානේ දැම්මේ ඉල්හාම් මොකද කියන්නේ කියලා වොයිස් එකත් මම අඳුරනවා .

ප්‍ර වොයිස් එකත් අඳුරනවා ?

උ ඔව්.

ප්‍ර ඊට පස්සේ මොකද වුනේ දැන් අස්සලාම් අලේකුම් කියනවා ඇහුනායි කිව්වානේ ?

උ ඔව්. ඒ දාන ගමන්ම ලොකු සද්දයකින් ගේට්ටුව තට්ටු කරා. ආමි නේවි සියළුම අයවළුන් ඇවිල්ලා තට්ටු කරනවා ඊට පස්සේ ඒක ගලවලා කබඩ් එක උඩින් තිබ්බා.

ප්‍ර කව්ද ඒක ගලවලා කබඩ් එක උඩින් තිබ්බේ ?

උ මට නිශ්චිතව ඒක කියන්න බැහැ .එතන හිටපු කව්රුහරි තමයි ඒක ඉජාස් කියලා තමයි මම හිතන්නේ.

ප්‍ර කව්ද ඒ වෙලාවේ එතන හිටියේ ?

උ ඉබ්‍රාහිම් නානා එයාගේ වයිෆ් අර ඉල්හාම් ගේ අක්කා , නංගි , අම්මා

ප්‍ර පිරිමි අය කව්ද හිටියේ තව?

උ ඉජාස්. ඉජාස් ගේ තාත්තා.

ප්‍ර ඉජාස් කිව්වේ කව්ද ?ඉබ්‍රාහිම් අයියා කියපු පුද්ගලයා ?

උ ඔව්.

ප්‍ර ඒ ගෙදර තව ළමයි හිටියාද ?

උ ඒ වෙලාවේ නම් මට පෙන්නේ නැහැ.එයාගේ

ප්‍ර කාමරේ ඇතුලේ හිටියාද ?

උ ඉබාදාගේ හස්බන්ඩ් එලියේ සාලයේ පුටුව වාඩි වෙලාද දන්නේ නැහැ මම හොඳටම පේන්නේ නැහැ ඒ වෙලාවේ . එයාත් ඉන්නවා වෙන ඉජාස් ගේ වයිෆ් දරුවෝ කුස්සියේද දන්නේ නැහැ . ඒ වෙලාවේ එයත් අර කාමරේ ඉන්නේ.

ප්‍ර ඔව් දැන් අර කිව්වේ තව ගෙදර ළමයි හිටියා කියලා ?

උ ඔව්.

ප්‍ර ඒ අය කොහේද හිටියේ ඒ වෙලාවේ ?

උ කුස්සියේද දන්නේ නැහැ පොඩි ළමයා . ඉජාස් ගේ පුතාලා දෙන්නා.

ප්‍ර දැන් ගේට්ටුවට ගහනවා ශබ්දයක් ඇහුනා කිව්වා ?

උ ඔව්.

ප්‍ර එතකොට ගෙදර අය මොකද කරේ ඒ වෙලාවේ ?

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ ඒ වෙලාවේ ඒ ගොල්ලෝ ගිහිල්ලා ටක් ගාලා පිරිමි එක පැත්තක් ගැහැණු එක පැත්තකට යන්න කිව්වා . එහේ මෙහේ යන්න එපා එක පැත්තට.

ප දැන් මහත්මියගෙන් අහන්නේ මේ ගේට්ටුවට ගහන සද්දයක් ආවා කිව්වනේ ?

උ ඔව්.

ප ඒ වෙලාවේ ඔය කාමරේ ඇතුලේ හිටපු අය මොකද කරේ ?

උ ඔක්කෝම එලියේ ආවා .පෙන්ඩ්‍රයිව් එක ගලවලා තියලා ඔක්කොම එලියේ ආවා.

ප ලැප්ටොප් එක?

උ ලැප්ටොප් එක පේන්නේ නැහැ මම බෙඩ් එක උඩ තියලා තමයි පෙන්ඩ්‍රයිව් එක දැම්මේ එක මම දැකලා නැහැ ඒක. කොහේද තියෙන්නේ කියලා

ප තමනුත් එළියට ආවාද? ඔයත් එළියට ආවාද ?

උ මමත් ඔක්කෝමලා එළියට ආවා කාමරේ ඉඳලා .

ප එළියට ඇවිල්ලා කොහාටද ගියේ ?

උ එළියට එනකොට අර පොලිස් කට්ටිය කිව්වා ඒ වෙලාවේ තමයි කිව්වේ එක පැත්තක ගැහැණු එක පැත්තක පිරිමි යන්න කිව්වා . අපි කුස්සිය පැත්තේ

ප දැන් ආයෙත් අහන්නම් දැන් ගේට්ටුවට ගහනවා ශබ්දයක් ඇහුනායි කිව්වානේ ?

උ ඔව්.

ප එතකොට මේ කාමරේ හිටපු අය මොකද කලේ?

උ ඒ ගොල්ලොත් දුක් වෙලා තමයි ඉන්නේ.

ප නැහැ මම කියන්නේ ගේට්ටුවට ගහනවා සද්දය ඇහුනානේ ?

උ ඔව්.

ප එතකොට ඒ සද්දය ඇහුනාම ගෙදර කට්ටිය මොකක්ද කලේ ?

උ ඒ තට්ටු කරපු ගමන් ඒ ගොල්ලෝ ඇතුල් වුනා ඒ ගමන්ම අපිත් එළියට ආවා.

ප ඒ ගොල්ලෝ ඇතුල්වුනා කිව්වේ කව්ද

උ පොලිසියේ .හමුදාවෙන් ,ඇතුල්වුනා.

ප දැන් ඒ පොලිසියෙන් ආපු අය ඇඳගෙන හිටියේ ?

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප ඒ අයට ගෙදර ඇතුලට එන්න ගේට්ටුව ඇරලාද තිබ්බේ ඒ වෙලාවේ ?

උ ගේට්ටුව මම දැක්කේ නැහැ. මට හිතෙන්නේ ඒක තට්ටු කරේ ඒක වහලා තිබ්බ නිසා නේද.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

ප එතකොට කව්ද ගේට්ටුව ඇරියේ ?

උ ඒගොල්ලන්ගේ මස්සිනා කෙනෙක් හිටියා ඉෆ්ලාල් කියලා එයාද කව්ද කියලා මම හරියටම දැනුවත් නැහැ කව්ද ඒ ගේට්ටුව ඇරියේ කියලා . ඒක අර සාලෙන් එලියට ආවොත්තමයි පේන්නේ කව්ද ගේට්ටුව අරින්නේ කියලා එහෙම බලා ගන්න පුළුවන් අර ඇතුලේ ඉන්නකොට එහෙම පේන්නේ නැහැ .

ප දැන් ඔය ඇහුනානේද ගේට්ටුවට තට්ටු කරනවා කියලා ?

උ ඔව්.

ප පොලිසියෙන් කියලාද කිව්වේ ?

උ ඇතුලට ආවයින් පස්සේ පොලිසිය, ආමි ඔක්කෝම ආවනේ සර්.

ප ඒ දැන් ඉස්සෙල්ලා කිව්වා නේද ලැප්ටොප් එකේ මේ ඉල්හාම් ගේ කථාව අහන්න පටන් ගත්තා කියලා පෙන් ඩ්‍රයිව් එක. ?

උ ඔව්.

ප එතකොට ඇහුනානේ දොරට තට්ටු කරන සද්දයක් නේද ?

උ ඔව්.

ප ඒ කොච්චර වෙලා තට්ටු කර කර හිටියාද ?

උ විනාඩි දෙකක් තුනක් විතර තට්ටු කරනවා. ටක් ගාලා මේ ගොල්ලෝ කව්ද අරිනවා .

****

<u>ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මිය</u>.

ප ගේට්ටුව කව්ද ඇරියේ කියලා තමන් දැක්කේ නැහැ තමන් ?

උ නැහැ.

ප ඇතුලට ආවේ කව්ද කියලා දැක්කාද ?

උ පොලිසියේ අය.

ප ඒ ගොල්ලෝ නිල ඇඳුමෙන්ද නැත්නම්?

උ නිල ඇඳුමෙන් හිටියා. තවත් පිරිසක් ඇවිල්ලා හිටියා . සාමාන්‍ය ඇඳුමෙනුත් හිටියා .සාමාන්‍ය ඇඳුමෙන් හිටියා. සි. අයි. ඩි කියලාත් හිතුවා.

ප මම තමන්ගෙන් අහන්නේ දැන් ඔය පළවෙනි පාරට ගෙදර ගේට්ටුවට තට්ටු කලා කිව්වනේ ගෙදර කට්ටිය කාමරේ ඉන්නකොට ගේට්ටුවට තට්ටු කලා කිව්වානේ ඒ වෙලාවේ ආපු අය ඒ වෙලාවේ යුනිෆෝම් ඇඳපු අය ආවාද ගෙදෙට්ට ඒ ගොල්ලෝ ආවාද?

උ ඔව්.

ප දැන් පොලිසියේ කට්ටියක් ආවා කිව්වානේ ?

උ ඔව්.

ප ඒ ඇවිදිල්ලා ගෙදර අයට මොකක්ද කිව්වේ කියලා තමන්දැක්කාද ?

උ ඒ ගොල්ලන් තමයි කිව්වේ ගැහැණු එක පැත්තට පිරිමි එක පැත්තට යන්න කිව්වා ඒ ගොල්ලෝ තමයි පස්සේ දෙපැත්තට පඩි පෙල තියෙනවා . අපි ඉන්නේ කුස්සිය පැත්ත පඩිපෙළ , එහා පැත්තෙ

FAIR COMMENT BY JEZEEM

පඩිපෙළ ටක් ගාලා පොලිසිය කව්ද දන්නේ නැහැ උඩට ගියා. උඩට ගියාට පස්සේ විනාඩි 5 න් පස්සේ තමා බෝම්බ පිපිරුවේ.

ප්‍ර ඒ උඩට නැග්ග පැත්තේ කාගේ කාමරයද තියෙන්නේ ?

උ ඔව් උඩ පැත්තේ කාමර 4 ක් තියෙනවා නේ හතර තමයි හිතන්නේ මම.

ප්‍ර පාතිමා ජින්රි හිටපු කාමරය කොතනද තියෙන්නේ ?

උ ඒ කාමරය කුස්සිය පැත්තෙන් උඩ කාමරයේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර දැන් කිව්වා නේද පඩිපෙළ නැගලා විනාඩි 5 කට විතර පස්සේ තමයි බෝම්බය පිපිරුනේ කියලා ?

උ ඒ වෙලාවේ ෂුවර්ම නැහැ සර්.

ප්‍ර යම් වෙලාවක් ගත වුනානේ බෝම්බය පිපිරෙන්න ඉස්සෙල්ලා .?

උ ඔව්.

ප්‍ර එතකන් ඔය කට්ටිය පල්ලහානේ හිටියේ නේද ?

උ ඔව්. අපි පල්ලහා හිටියේ.

ප්‍ර ඒ වෙලාවේ පල්ලහාත් මොනවාද වුනේ ?

උ පඩිපෙලේ දෙන්නෙක් වාඩි වෙලා හිටියා . ඒ ගොල්ලෝකිව්වා දෙමටගොඩ පොලිසියේ සි. අයි. ඩී අය කියලා. මම කිව්වා දරුවන් අරගෙන එන්න මට ඉඩ දෙන්න කියලා ළමයි අරගෙන එන්න අවසර දෙන්න බැහැ කිව්වා. අපි බලාගන්නම් ඔයා යන්න එහෙම කිව්වා.

****

<u>ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මිය.</u>

ප්‍ර දැන් පොලිසියේ කට්ටියක් උඩට යනවා තමන් දැක්කායි කියලා කිව්වා නේද?

උ ඔව්.

ප්‍ර ගිහිල්ලා සාමාන්‍යයෙන් ඒ ගොල්ලෝ මොනවාද කරේ කියලා තමන්ට ඇහුනද ?

උ ඒක මොනවද කරේ කියලා අහන්නේ නැහැ මන් අපිට.

ප්‍ර දැන් තමන් ඊට පස්සේ කිව්වා ශබ්දයක් ඇහුනයි කියලා ?

උ ඔව්.

ප්‍ර කොහෙන්ද ශබ්දයක් ඇහුනේ ?

උ පාතිමාගේ කාමර පැත්තේ තමා.

ප්‍ර දැන් පල්ලහා හිටපු අය මොකද කරේ ඒ වෙලාවේ ගෙදර අය මොකද කරේ ඒ වෙලාවේ ?

උ ඒ වෙලාවේ ඒ ගොල්ලන් එක පැත්තට එක පැත්තට ඉන්නවානේ ගැහැණු ඒ වෙලාවේ 4 දෙනෙක් කුස්සියේ වැඩ කරන සර්වර්නට්

FAIR COMMENT
BY JEZEEM

එකත් අපිත් ඔක්කෝම හතර දෙනෙක් අට දෙනෙක් හරි අනිත් ඒවා පිරිමි කීයද දන්නේ නැහැ .

ප්‍ර දැන් ඒ පිපිරීම් වුනාට පස්සේ පොලිසියේ අය මොනවහරි කිව්වාද ඕගොල්ලන්ට ? උපදෙසක් දුන්නාද ? ගෙදරින් එලියට යන්න කිව්වාද?

උ ඒ වෙලාවේ ගෙදරින් එලියට යන්න කියලා කිව්වා.

ප්‍ර එලියට ගිහිල්ලා මොකද කරේ?

උ එලියට ගිහිල්ලා අර පාර අයිනේ අපි වාඩිවෙලා හිටියා . මට හිතුනේ දුවගේ කාමරෙනේ ශබ්දය ඇහුනේ මේ ගිය අය තමයි බෝම්බය පිපිරෙව්වා කියලා මට හිතුනේ ඒ වෙලාවේ පොලිස් ඔක්කෝම ගියානේ මොනවත් ප්‍රශ්ණයකට ඒ ගොල්ලොත් ඒ වෙලාවේ එතන මොනවහරි එකකට දුක් විඳලා සුගර් තියෙනවා නේ මෙහෙම කරලා මෙහෙම කරලා අතනින් මේවා වුනා . ගෙවල් තුනකට එහා ගිහිල්ලා මට මේ දියවැඩියාව නිසා ඒ කෑමත් මට බඩගිනි නිසා ඒ ගෙදර ගිහිල්ලා වාඩි වෙලා ඉඳලා වතුර ටිකක් බිව්වා.

ප්‍ර ඒ කියන්නේ මහවිල උද්‍යානයේම පිහිටි වෙන ගෙදරකට ගියා ?

උ වෙන ගෙදරකට ගියා.

ප්‍ර එතන කොච්චර වෙලාවක් විතර හිටියාද ?

උ පැයක් විතර.

ප්‍ර ඒ ඉන්න කොට මොකක් හරි සිද්ධියක් වුනාද ?

උ ඒ ගෙදරට මේ ගෙදර පේන්නේ නැහැ නමුත් එතන ගොඩක් පිරිස එකතු වෙලා ලොකු සද්දයක් ඇහෙනවා එහෙම මොකක්හරි සිදුවීමක් වෙලා තියෙනවා කියන එක මට දැනෙනවා නමුත් ඒක පේන්නේ නැහැ ඒ ගෙදර මොකද වෙන්නේ කියලා .

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර දැන් ෆරීඩා උම්මා මහත්මිය දැන් දුවව බලන්න ගියානේ පලවෙනි තට්ටුවට එදා උදේ අප්‍රේල් 21 වෙනිදා උදේ ?

උ ඔව්.

ප්‍ර එතකොට කිව්වානේ දුව අපිට කලන්තය වගේ කිව්වා කියලා?

උ ඔව්.

ප්‍ර අපිට කිව්වානේ ඇපල් ගෙඩියක් කපලා දුන්නා කියලා ?

උ ඔව්.

ප්‍ර දැන් ඒ ඇපල් ගෙඩිය කපන්න ඔබ උඩට යනකොට ඇපල් අරන් ගියේ නැහැනේ ?

උ මම අරන් ගියා පොඩි එක කපලා

ප්‍ර කපලාද ගෙනිව්වේ ?

FAIR COMMENT BY JEZEEM

උ නැහැ නැහැ නැහැ අරපොඩි එකනේ පොඩි ඇපල් ඒක හපලා කන්න කියලා මන් දුන්නා. පොඩි ඇපල් ගෙඩිය තමයි දුන්නේ ඒවා හපලා කන්න කියලා මන් දුන්නා.

ප හරි ඒ කියන්නේ ඔබ කියන හැටියට උදේ ඔබව දුවව හම්බවුන අවස්ථාවේ ඉඳලා දවල් කෑම කන්නඅඩ ගැහුවනේ පල්ලහාට ඉඛාදා ?

උ ඔව්.

ප ඒ වෙනකම් ඔබ පාතිමා ජිෆ්රි එක්ක පලවෙනි තට්ටුවේ හිටියා නේද ?

උ පලවෙනි තට්ටුවේ තමයි බබා එක්ක සෙල්ලම් කරලා එයාට කෑම ඔක්කොම දීලා.

ප දිගටම හිටියේ ?

උ ඔව් දිගටම උඩ තමයි එයා කුරුවාන් කිය කියා ඉන්නවා . දුව කුරුවාන් කියමින් හිටියා . මම ළමයි එක්ක හිටියා.

ප ඒ දුවගේ කාමරයට ඒ වෙලාවේ කී සැරයක් ගියාද ?

උ එක පාරයි.පොඩි බබාට මම ඒ ගෙනාපු කෑම ටික දීලා එහි ළමයාව දීලා මම කෑම කන්න තමයි මම ගියේ එතනින් . ඒ වෙලාවේ විතරයි මම ගියේ. ඒ ගොල්ලන් පල්ලහා තට්ටුවේ කෑම අනුභව කරන්න ඔක්කෝම සූදානම් කරලා මට කැඳවන කොට මම යන්නේ නැතුව ඉන්න එක සුදුසු නැහැනේ ඒ හින්දා මම එතෙන්ට ගියා.

ප ඒ කාමරයට ඔබ මීට කලිනුත් ගිහිල්ලා තියෙනවා නේද ?

උ මාසෙකකට දෙකකට පෙර මම ඒ කාමරයට ඇතුල් වෙලා තියනවා .

ප ඊට කලිනුත් සැරෙන් සැරේට දුව බලන්න එහෙට යන්න ඇතිනේ ?

උ මාසෙකට සැරයක් මම එහේ යනවා .

ප කාමරයටත් යනවාද ?

උ සාමාන්‍යයෙන් මම ඒ කාමරයට යන්නේ නැහැ . ඒ හින්දා මම ගෙනියන බඩුමුට්ටු එහෙම දීලා මම සාලයේ ඉඳලා තේ එකක් එහෙම බීලා එනවා.

ප අප්‍රේල් 21 වෙනිදා කාමරයට ගිය වෙලාවේ මොනවහරි බෑග් එකක් එහෙම දැක්කාද ?

උ මුකුත් පෙන්නේ නැහැ. අර බබාගේ බෙහෙත් බෝතල් එක , සෙල්ලම්බඩු , බිල්ඩින් බ්ලොක් සෙල්ලම් බඩු වාගේ තමයි ඒ මුකුත් මම අල්මාරි මුකුත් අරින්න නැහැනේ ඒනිසා මුකුත් පෙන්නේ නැහැ.එහෙම පේන්න මුකුත් තිබුනේ නැහැ මට.කාමර ඇතුලේ බෙහෙත් වර්ග තිබුනා ඒක පේන්න තිබිච්ච දේවල් තමයි බබාලගේ සෙල්ලම් බඩු බෙහෙත් ජාති ඒවා තමයි පේන්න තිබුනේ.

ප දුව එදා කියපු තව මොනවා හරි මතකයේ තියනවාද ?

උ එදා දවසේ අඩුවෙන් තමයි කතා කලේ මාත් එක්ක. මට මේ කුරුවානේ කියවලා ඉවර කරන්න ඕනේ ළමයි බලාගන්න කියලා තමයි මට

Prosecution Copy
HAIR COMMENT BY JEZEEM

කිව්වේ ඒක තමයි මට මතක . මේ කුරුනය මට කියවලා ඉවර කර ගන්න ඕනේ. නෝම්බි දවස් හතරක් අපිට අතහැරුනොත් ඒක පිළිබඳ නැතිව හිටියොත් අපි දානේ දෙන්න ඕනේ හාල් හරි මොනවාහරි දෙන්න ඕනේ.ඒක ගැන කිව්වා ඒක දෙන්න ඕනේ.අනිවාර්යයෙන් ඒ දානය දෙන්න කියලා කිව්වා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර දැන් ඔබ කිව්වානේ ඉබාඳා කන්න එන්න කිව්වාම පල්ලහාට ආවා කියලා.

උ ඔව්.

ප්‍ර දැන් ඒ අවස්ථාවේ ඉඳලා බෝම්බය පිපිරෙන අවස්ථාව වෙනකල් ඒ අතරතුර දුවගේ කටහඬ කොයි හරි වෙලාවක හරි ඇහුනද ?

උ එහෙම කටහඬක් ඇහුනේ නැහැ. මුකුත් ඇහුනේ නැහැ අර එහෙම කිසිම හඬක් ඇහුනේ නැහැ පොලිසිය ආවාම මම පොලිසියෙන් ඇහුවා මගේ දුවවයි දරුවවයි එක්කන් එන්න අවසර දෙන්න කියලා මම හිතුවේ ඒ ගොල්ලන්ට මොනවාහරි කරදරයක් වෙලා කියලා ඒකයි මෙච්චර. ඒ ගොල්ලන් කිව්වා ඒක අපි බලාගන්නම් අවසර දෙන්න බැහැ කියලා.

****

<u>ගරු විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා.</u>

ප්‍ර ෆරීඩා උම්මා දැන් තමුන් මීට පෙරත් දුවව බලන්න යනවානේ ඔය ගෙදරට?

උ ඔව්.ඔව්.

ප්‍ර එහෙම යන්නේ දුව අම්මේ එන්න කියලා එහෙම දැනුම් දීලද?

උ නැහැ.

ප්‍ර එහෙම එන්න කියලා ගිහිල්ලා තියෙනවාද මීට කලින් ?

උ එන්න කියලා නැහැ අපි අපිට ආසයිනේ

ප්‍ර බබාලා බලන්න ?

උ ඔව්. මාසයට පළතුරු මොනවාහරි.

ප්‍ර මේ ගමන තමයි මෙයා එන්න කියලා ගියේ නේද ?

උ ඔව්. ඒකට තමයි මෙයා එන්න කිව්වේ.

ප්‍ර යනකොට තමුන්ට මොනවද හිතුනේ මෙයා මේ දැන් එන්න කියලා කියනවා මොකක් හරි ප්‍රශ්ණයක් කියලා තමුන්ට හිතුනද ?

උ මම හිතුනේ එයා ගිහිල්ලයින් පස්සේ පුතාට හරි මොනවහරි ඇක්සිඩන්ට් බෑනට මොකක් හරි විපතක් වුනාද නැත්නම් ඇක්සිඩන්ට් එකක් වුනාද නැත්නම් දරුවන්ට මොනවහරි අසනීපයක්ද දන්නේ නැහැ කියලා තමයි මට හිතුනේ.

President Secretary Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර ඔබ ටෙලිෆෝන් කරපු වෙලාවේ දුවගෙන් ඇහුවේ නැද්ද ඇයි ඇයි මොකක්ද කියලා?

උ ඇහුවා.අම්මා එන්න අම්මා ආවායින් පස්සේ මම කියන්නම් කියලා කිව්වා.

ප්‍ර දැන් ඔබ ගෙදරට ගියානේ ?

උ ඔව්.

ප්‍ර ගෙදරට ඇතුල්වෙනකොට දොර ඇරියේ කවුද ?

උ දොර ඇරලා තමයි තියෙන්න ඇති ඔව් අර ගේට්ටුව.

ප්‍ර ගේට්ටුව ඇරියේ කව්ද ?

උ ගේට්ටුව ඇරිලා තමයි තියෙන්නේ ඒ වෙලාවේ .

ප්‍ර දැන් ගෙදර ඇතුලට ගිය ගමන් ඉස්සරහට හම්බ වුනේ කවුද ඔබට ?

උ අතනින් අර එයාගේ අම්මා ඉබාදා එතනින් නිකම් හිටියා.ආවාම එයත් එක්ක කථා කරන දුව දුකින් ඉන්න කථා කරන්නේ එන්න කියලා. දුකින් ඉන්න හින්දා මම එයාට ඒ ගොල්ලන් ඒක්ක කථා කරන්න ටක්ගාලා උඩට ගියා මම.

ප්‍ර ඒ උඩට යන්න ඉස්සෙල්ලා එක පාරටම දැන් තමුන් ගෙට ඇතුල්වෙන කොටම ඔය ගෙදර හිටපු අනිත් අය තමුන් ගෙන් ඇහුවේනැද්ද මොකද කොහොමද මුකුත්ම ඇහුවේ නැහැ?

උ මුකුත් ඒ ගොල්ලෝ කතා කරන්නේ නැහැ මමත් කතා කරන්නේ නැහැ.

ප්‍ර ඒ ගොල්ලෝ තමුන් එනවා දැක්කද ?

උ ඔව් . ඔව්.

ප්‍ර ඒ ගොල්ලෙන්ගේ මුහුණේ මොනවද පෙනුනේ තමුනට ඒ වෙලාවේ ඒ ගොල්ලොත් මොනවහරි කලබල වෙච්ච ගතියක් වගේ ?

උ කල්පනාකාරි වාගේ තියනවා . ඇඬුවේ නැහැ කල්පනාකාරි වගේ පෙනුනා එහෙම.

ප්‍ර එතකොටවත් ඇහුවේ නැද්ද ඇයි මොකද ප්‍රශ්ණය කියලා ඇහුවේ නැද්ද ?

උ නැහැ. ඇහුවේ නැහැ.

ප්‍ර ඔබ කෙලින්ම උඩ තට්ටුවට ගියා ?

උ ඔව් තට්ටුවට ගියා දුව බලන්න ගියා. ටක් ගාලා.

ප්‍ර එතකොට දුව වාඩි වෙලා හිටියා සාලයේ ?

උ ඔව්. ඔව්. සාලයේ.

ප්‍ර එයා අතේ කුරානය තිබුනා කිව්වානේ ?

උ එව්.

ප්‍ර පොඩි කුරානේ?

උ ඔව්.

ප්‍ර දැන් ඔය ගෙදරට මීට කලින් යනකොට දුව කුරානය අතේ තියාගෙන කියවනවාද දැකලා තියෙනවාද?

උ මම ඉස්සර යනකොට උඩ තට්ටුවට යන්න අඩුයි පල්ලහා සැටිය තියෙනවා ඒ තමා අර ගෙනිච්ච බඩු අර ඩයිනින්ටේබල් එක උඩ තියලා

FAIR COMMENT BY JEZEEM

පල්ලහා තමයි එයාගේ අම්මාත් එක්ක එයා උඩ කාමරයක මම පල්ලහට මම ගියාට පස්සේ එයා පහලට එනවා මම පහල මහලේ තමයි මම ඉන්නේ සාමාන්‍යයෙන් ඒ සැටියේ තමයි වාඩි වෙලා එහෙම කථා බහ කරලා එන්නේ දුව එනවා පල්ලහාට එනවා.

ප ඔබ මේ කියන්නේ කුරානය අතේ තියාගෙන දුව ඉන්නවා මී කලින් දැකලා නැහැ එහෙමනම් නේද ?

උ ඔව් කට පාඩම් කරනවා . බබා හම්බ වෙනකොට කට පාඩම් කරනවා.එදා වගේ දිගටම කුරුවානය කියවමින් මම දැකලා නැහැ . මම මේක නිමා කරන්න ඕනේ මේ කුරානය කියවලා නිමා කරන්න ඕනේ කියලා ඒ නිසා මාත් එක්ක කථා කර කර ඉන්න එපා එහෙම තමයි මට කිව්වෙ.

ප එහෙමත් කිව්වා ?

උ ඔව්. මේ කුරානය මම කියවලා නිමා කරන්න ඕනේ දරුවන්ව රැක බලා ගන්න මාත් එක්ක කථා කරන්න එන්න එපා කියලා කිව්වා.

ප දැන් තමුන්ට මතකද ඔය ගෙදර හිටපු දරුවෝ ඉස්කෝලේ ගියාද?

උ ඉස්කෝලේ ගියේ නැහැ නිකම් පොඩි අනම් මනම් ආගම ගැන ඉගෙන ගන්න ඒ දේවල් ගේ ඇතුලෙම සිද්ධ වුනේ .

ප දැන් ලොකු ළමයගේ වයස කීයද?

උ 5 යි.

ප එතකොට අවුරුදු 5 ළමයෙක් ඉස්කෝලේ යනවානේ?

උ ඔව්.

ප එතකොට ඇයි මේ දරුවව ඉස්කෝලේ ඇරියේ නැත්තේ ?

උ ඉස්කෝලේ යන්න ඕනේ නැහැ පස්සේ යන්න ඇති මේවෙලාවේ මම තමයි ඉගෙනගන්න දෙන්න ඕනේ කියලා කිව්වා එයා මාත් එක්ක අහනකොට ඇයි මෙයා ඉස්කෝලේ දාන්නේ නැද්ද කියලා අහනවා.

ප ඇහුවද තමුන්?

උ ඔව්. ඒ වෙලාවේ නෙවේ ඉස්සර ඇහුවා. මොන්ටිසෝරි දාන්න දුව කියලා ඇහුවා.

ප එයා ඒ වුනාට කැමති වුනේ නැද්ද ?

උ කැමති වුනේ නැහැ කිව්වා.

ප ඒ මොකද එහෙම කැමති නොවෙන්න හේතුවඔබ ඇහුවේ නැද්ද ඇයි එහෙම කියලා ?

උ නැහැ මට පුලුවන්නේ කරන්න කියලා කිව්ව එයා.මට පුලුවන් නේ ඒ ගොල්ලන් මාව හොඳටම පාඩම් කෙරුවා දෙන්නම ඔක්කෝම දන්නවා පාඩම් කෙරුවා දෙන්නම.

ප දැන් ඔබේ දුව හොඳට හිටපු දරුවෙක් නේද ?

උ ඔව්.

ප ඒ ළමයා මේ විදියට වෙනස් වුනේ කොහොමද ?

උ වෙනස් වුනේ අවුරුද්දකට ඉස්සර තමයි මේ වෙනස් වුනේ .

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර ඒ වෙනස ඔබ දැක්කද අවුරුද්දක් තිස්සේ මෙයා වෙනස් වෙනවා කියලා තේරුනා ද?

උ වෙනස් වෙනවා හොඳටම අර පිරිමි ළමයාත් එක්ක කතා කරන එක එහෙම වෙනස්වුනා ඒක . එහෙම එයා.

ප්‍ර ඔබ ඇහුවද ඇයි මේ වෙනස් වෙන්නේ කියලා මෙහෙම .?

උ අපිත් එක්ක නැහැනේ එහේනේ ගොඩාක් ඉන්නේ . අපි ඉන්නේ නුවර ඒක අහන්න වෙලාවක් නැහැ.

ප්‍ර අඩු ගානේ ටෙලාෆෝන් එකෙන් කථා කරන වෙලාවෙවත් ඇහැව්වේ නැද්ද?

උ ටෙලිෆෝන් එකෙන් නම් එහෙම කථා කරන්නේ නැහැ. ඒ වාගේ ඇහුවෙත් නැහැ මම . එයා හොඳටම දරුවන් බලාගෙන ගෙදර වැඩ කටයුතු කලා .ඒ නිසා මම ඒ ගැන එච්චරම සැලකුවේ නැහැ. ඒ දරුවන් හොඳට බලාගත්තා කියන හැඟීම තමයි මට තියෙන්නේ . අනිත් අයට සාපේක්ෂව දරුවන්ගේ වැඩ කටයුතු වල හරි මෙයා හරි සංවේදී.ඒ අර ආගම උගන්වන්න පොඩි බංකු ඒවාගේම ඒ භාණ්ඩ හදලා දෙන්න කිව්වාම මම හදලා දීලත් තියෙනවාඒ දරුවන්ට අදාල සයිස් එකේ ගෘහ භාණ්ඩ.ඒ දරුවන් දෙදෙනාටම ඒක.

ප්‍ර දැන් එතකොට තමුන්ට මතකයි නේද පළවෙනි වතාවටම සද්දයක් ඇහුනා කිව්වානේ තමුන්?

උ ඔව්.

ප්‍ර ඒ සද්දය ඇහිව්ව ගමන් තමුන් ඔක්කොමලා එක්ක තමුන් ඒ අයත් එක්ක එලියටදිව්වා කිව්වානේ ?

උ ඔව්.

ප්‍ර එළියට දුවනකොට තමුන්ට මතක් වුනේ නැද්ද තමුන්ගේ දුවයි ළමයිනුයි උඩ ඉන්නවා ඒ ගොල්ලන්ට මොකද වුනේ කියලා බලන්න හිතුනේ නැද්ද ?

උ ඒ වෙලාවේ ඒ වෙලාවේ හිතුනා . අර පොලිස් කට්ටිය ආවන් පස්සෙනේ මෙහෙම ඉන්නේ ඒ ප්‍රශ්ණය මම අහනවා නම් ඒ වෙලාවේ මොකද වුනේ දන්නේ නැහැ. මමටක් ගාලා ගෙදර යමු කියලා ඒ වෙලාවේ අර බෝම්බය පිපිරෙනකොට ඔක්කෝම කළු පාටනේ ඔක්කොම කළු පාට බය වෙලා ඒ වෙලාවේ අහන්නත් ගොඩක් ඔතන ඉන්න එපා යන්න යන්න කිව්වා . ආමි කට්ටිය අතනින් කට්ටිය රෙස්ට් එක ඔක්කොම එලියේ ආවට පස්සේ එක්කනා ඉබ්‍රාහිම් නානාට කිව්වා ඔයාගේ ගෙදරනේ මේක ඒවෙලාවේ අපි වෙව්ලන්න පටන් ගත්තා ඒ වෙලාවේ. එහෙම හිතන්න ආවේ නැහැ .ඒ වෙලාවේ ඒක තමයි මමඑක ගෙදරකට ගිහිල්ලා වාඩි වෙලා හිටියේ ඒකයි. බෝම්බ ගෙදරින් ආපු නිසා අපිට ඉඩ දුන්නේ නැහැ වාඩි වෙන්නවත් . මම අඬලා මටදියවැඩියාව තියෙනවා . මම ආපු මොහොතේ තමයි මෙහෙම සිදු වුනේ කියලා මට දෙන්න කියලා ඒ ගෙදරින් වතුර ටිකක් ඉල්ලාගෙන බීලා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර දැන් ඔබට ඒ ඔය සිද්ධිය වෙච්ච වෙලාවේ නිකම් තේරුනේ නැද්ද තමුන් එක්ක කතා කරපු වෙලාවේ අන්තිමටම කතා කරපු වෙලාවේ ඒ දුව කලකිරිමෙන් හරි දුව බොහොම දුකෙන් හරි ඉන්නවා කියපු නිසා දුව මේ වගේ දෙයක් කරගනී කියලා තමුන්ට පොඩි අදහසක් හරි තිබුනාද ?

උ නැහැනේ . අබමල් රේණුවකවත් මට එහෙම හිතුනේ නැහැ. ඒක ගිය අය තමයි මේක සිදු කරලා තියෙන්නේ . මොකක් හරි ප්‍රශ්ණයක් තියනවා කියලා ඒ භීතිය ඇතිවුනා .ගිය අය තමයි මේක මොකක්හරි කරලා තියෙනවා කියලා මට හිතුනේ.

ප්‍ර ඒ අය උඩට යනකොට මුකුත් අරන් ගියේ නැහැ නේද ?

උ ඇත්තටම මට ඒක හිතුනේ. දුව එහෙම කරයි කියලා මට ඒක කරයි කියලා ඇත්තටම හිතුනේ නැහැ.එයා ගාව එහෙම බෝම්බයක් තිබුනා කියලවත් මට හිතාගන්න බැහැ.ඒක තමයි වුනේ. ඇත්තටම දුව තමයි එහෙම කරලා තියෙනවා . මට හදෘ සාක්ෂිය අනුව ඒ මොහොතේ මට ඒක හිතුනේ නැහැ. මම ගෙදරට පැමිණියාට පස්සේ මගේ පුතා කිව්වා ෂැන්ග්‍රිලා එකේදි මෙයා බෑනයි ගෙදරදි ඔයාගේ දුවයි . සිනමන් ග්‍රෑන්ඩ් එකේදි ඉන්ෂාෆ් ප්‍රවෘත්ති මගින් දැන ගත්තා කියලා පුතා කිව්වා.

ප්‍ර දැන් තමුන්ට තේරෙනවා නේද තමුන්ගේ දුව කරලා තියෙන වැඩේ හරි නැහැ වැරදියි කියන එක තේරෙනවා නේද ?

උ හරි වැරදි ඒ දුව කියන්නත් මට කටට එන්නේ නැහැ. මේ මගේදුව කරපු එක අතිමහත් ද්‍රෝහි කමක්. මේ රටටත් මේ ජනතාවටත් ද්‍රෝහි වැඩක් . කොපමණ දරුවන් මව නැතුව පියා නැතුව ඇත්තටම මට ඒක. මට දුව හෝ මගේ බෑණා හෝ නැති වෙච්ච එක මට කනගාටුතාව නැහැ නමුත් මේ රටේ ජනතාව අහිමිවීම පිළිබඳව මට ලොකු කනගාටුවක් තියෙනවා. දරුවන් පිළිබඳව මට කනගාටුයි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>.

මේ අවස්ථාවේදී සාක්ෂිකාරිය සංවේදි අන්දමින් සාක්ෂි දෙන බව සටහන් කරමි.

****

<u>ගරු විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා</u>.

ප්‍ර දැන් මේක වැරදියි කියන එක තමුනුත් තේරුම් ගන්නවානේ ?

උ ඔව්.

ප්‍ර මේ වගේ අන්තවාදී අදහස් දරන අයට තමුන් මොකක් හරි පණිවිඩයක් දෙන්න කැමතිද ?

උ මේක අන්තිම වැරදියි කියන එක තමයි මගේ . සියළුම දෙනා අපි මනුෂ්‍යයෝ අපි සියලුම දෙනාටම ආදරය කල යුතුයි.ඒක තමයි අපේ ආගමේ කියවන්නේ.සියලුම දෙනා මනුෂ්‍යත්වයෙන් සලකන්න ඕනේ.

FAIR COMMENT BY JEZEEM

සියලුම දෙනාම මනුෂ්‍යයෝ කියන එක තමයිඅපේ ආගමෙනුත් කියන්නේ. අපි ඔක්කෝටම ආදරෙයි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>.

ප්‍ර සාක්ෂිකාරිය තමුන්ගේ ගෙදරින් කීයටද ගියේ?

උ පිටත් වෙන වෙලාව මට හරියට නිශ්චිතවම මට කියන්න බැහැ.නමුත් මම එහි ලගා වුනේ දහය හමාර . මට ඒ වෙලාවත් නිශ්චිතව වෙලාව කියන්න බැරුව තිබෙනවා.

ප්‍ර තමන් ගෙදරින් යනකොට පුතාලා හිටියාද ?

උ හිටියේ නැහැ මගේ ස්වාමි පුරුෂයාත් ගෙදර හිටියේ නැහැ.

ප්‍ර තමන් ගෙදරින් යනකොට ෂැන්ග්‍රිලා , සිනමන් ග්‍රෑන්ඩ් හොටෙල් එකේ වගේ බෝම්බ පිපිරිලා තිබ්බාද?

උ බෝම්බ පිපිරිලා දන්නවා. ඒ පිළිබඳ ප්‍රවෘත්ති මඟින් දැන ගත්තා කවුද පිළිබඳව දැනුවත් හිටියේ නැහැ.

ප්‍ර තමන් ඒ නිවසට වෙනදා කෙලින්ම උඩට යන්නේ නැහැ සාලයට ගිහිල්ලා ඉන්නේ?තමන් කිව්වා තමන් කෙලින්ම දුවගේ කාමරයට උඩට යන්නේ නැහැ පල්ලහා කියලා ඉන්නේ එහෙම කිව්වා නේද?

උ ඔව්.

ප්‍ර මේ දිනයේදි ඇයි තමන් කෙලින්ම උඩට ගියේ?

උ කවදාකවත් මගේ දුව එහෙම කථා කරලා දුකින් එහෙම කථා කරලා එන්න කියලා කතා කරලා නැහැ. ඒ නිසා තමයි මම ඒ අපි සාමාන්‍යයෙන් යන්නේ ඒ ගොල්ලෝ බලලා එන්න තමයි යන්නේ එදා දුකින් එන්න කියලා කියපු නිසා තමයි මම ඒක .

ප්‍ර මේ නිවසට ඇතුල් වෙන්න ගේඉදිරිපිට ගේට්ටුවෙන්ද ඇතුල්වෙන්නේ ඉස්සරහ?තමන්ගේ පලවෙනි මහලට දුවගේ යන්න තියෙන්නේ ගේ ඇතුලෙන් ගිහිල්ලාද?

උ ගේ ඇතුලෙන්ම තමයි යන්නේ.

ප්‍ර අනිත් උඩ මහල් වලට යන්න ඒ ගරාජ් එකෙන්ම තරප්පු පෙලක් තියෙනවාද ස්ටෙයා කේස් එකක් තියෙනවාද ?

උ අපි සාමාන්‍යයෙන් යන්නේ ගේ ඇතුලෙන් තියෙනඒ පඩිපෙලින් තමයි යන්නේ නමුත් ඒක මම දැනගෙන හිටියේ නැහැ .

ප්‍ර උඩ මහල්වලට වෙනම ස්ටෙයා කේස් එකක් තියෙනවා කියලා දන්නේ නැහැ?

උ අපි සාමාන්‍යයෙන් යන ඒක විතරයි මම දන්නේ එහෙම වෙනම තිබුනාද කියලා මම දැනුවත් නැහැ.

ප්‍ර තමන් ගෙට ඇතුල් වෙන විට ගෙදර අනිත් කට්ටිය කොහේද හිටියේ ඒ වලාවේ?

උ මම යනවිට දුටුවේ ඉබාදායි එයාගේ අම්මායි

FAIR COMMENT BY JEZEEM

ප්‍ර ඒ ගොල්ලන් තමන්ට මුකුත් කිව්වේ නැහැ ?

උ අපි සම්ප්‍රදායක් ලෙස අස්වලාම් අලේකුම් කියනවා ඒක කිව්වා එච්චරයිමම උඩට ගියා. මම කථා කරෙත් නැහැ ඔවුන් මා සමඟ කතා කරෙත් නැහැ.

****

<u>ගරු විනිසුරු බන්දුල අතපත්තු මහතා</u>

ප්‍ර ෆරීඩා උම්මා මහත්මිය දැන් ඔබ දුව බලන්න ගෙදෙට්ට ගියාම ගෙදර අයිතිකාරයා දුවගේ මාමා ඊබ්‍රාහිම් මොහොමඩ් මහත්මයා එහෙම දැක්කාද ?

උ එයා මම කෑම කන්න පල්ලහා ආනේ. ආවයින් පස්සේ ඒ ඔක්කොමලා කාමර තමයි හිටියේ.

ප්‍ර ඊබ්‍රාහිම් මොහොමඩ් මහත්මයා කොහොමද හැසිරුනේ ඒ වෙලාවේ කොහොමද මොන විදියටද?

උ ඔක්කොමලා දුක් වෙලා තමයි හිටියේ .එයාගේ අම්මත් අක්කත් ඔක්කොම දුක් වෙලා තමයි හිටිය කොට තමයි මම අහන්නේ ඇයි ඕගොල්ලෝ දුක් වෙලා හිටියේ කියලා .

ප්‍ර එතකොට ඔබ දුව හම්බ වෙලා කථා කරලා උඩට ගිහිල්ලා ?

උ ඒ වෙලාවේද

ප්‍ර ඔව්.

උ මම ගියේ පල්ලාහ කෑමට තමයි ආවේ පල්ලහා.

ප්‍ර එතකොට පොලිසිය ආවේ කොයි වෙලාවේද දුව එක්ක කථා කර කර ඉද්දිද ?

උ මම ද

ප්‍ර ඔව්.

උ පොලිසිය එනකොට මම පල්ලහා.

ප්‍ර පල්ලහා?

උ ඔව් පල්ලහා. ඒ වෙලාවේ දුව නැහැ ඔබත් එක්ක ?

උ නෑ හැ නැහැ. දුව කාමරේ බබාලා 3 දෙනාම දුව කාමරේ.

ප්‍ර කතා කර කර ඉදලා කොයි වෙලාවෙද දරුවා උඩට ගියේ?

උ මම උඩට ගියේ නැහැ .පහලට ඇවිල්ලා කතා කර කර ඉන්නකොට තමයි පොලිසියෙන් ආවේ.

ප්‍ර කොයි වෙලාවෙදදුව උඩට ගියේ ?

උ දුව උඩ මහලේ තමයි හිටියේ. මම යනකොට උඩ සෙටියෙ වාඩි වෙලා හිටියේ සර්.

මෙතැන් සිට සටහන් ගැනීම වන්දිමා

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප.ව: 3.15
පෙර සටහන් ල/ලේ : යමුනා දසනායක මිය
මෙතැන් සිට ල/ලේ: චන්දිමා දිල්හානි.

<u>ගරු විනිසුරු අදිකාරි මැතිනිය</u>

ප්‍ර: ෆරීඩා මහත්මිය ඔබ මහනුවර ගල්ලහින්න නේද ගම?
පි: ඔව් .
ප්‍ර: ඔබගේ පවුලේ ඔබට ඉන්නවානේද සහෝදර සහෝදරියන් 11 දෙනෙක්?
පි: ඔව්.
ප්‍ර: ඔබ ඔය ගමේ කොච්චර කාලයක් හිටියාද?කොළඹට එන්න ඉස්සෙල්ලා
පි: ඉස්සරවෙලා පොඩිකාලේ ගල්හින්නේ තමයි හිටියේ.
ප්‍ර: අවුරුදු කීයක් හිටියාද ගමේ?
පි: අවුරුදු 1988 කොළඹට පැමිණියා උපන්දා සිට 1988 දක්වා හිටියා.
ප්‍ර: ඔබේ දෙමව්පියන් කොච්චර කාලයක් හිටියාද ඔය ගමේ?
පි: අවුරුදු 12 ට පෙර ඔවුන් මියගියේ මේ.
ප්‍ර: එතකම්ම හිටියා මේ ගමේ?
පි: ඔව්.
ප්‍ර: දැන් මේ ගල්හින්න මහනුවර පාරම්පරික මුස්ලිම් ගමක්ද?
පි: ඔව්
ප්‍ර: ඔබ ගෙදර සිටින විට දෙමව් පියන් සමඟ නබි තුමාගේ උපන් දිනය සමරනවාද?
පි: ඔව් සමරනවා.පල්ලියේත් සමරනවා
ප්‍ර: එතකොට මිනිස්සුන්ට ගමේ මිනිස්සුන්ට දානය දෙනවාද?
පි: ඔව් දෙනවා. පල්ලියෙන් ස්වාකාරව ඒක අපි කටයුතු කරනවා.
ප්‍ර: ඔබගේ ගෙදර අය පල්ලියට ගියාම පල්ලියේ තියෙන ප්‍රතිමා පල්ලියේ තියෙනවානේ අර මැරිච්ච අයගේ සොහොන් කොත් ඒවා වදිනවාද?
පි: ප්‍රතිමා මුකුත් නැහැ ඒ ගොල්ලන්ව මතක් කරලා අපි මේ පල්ලියට ගිහින් කුරාන් කියවනවා.
ප්‍ර: එතකොට ඔබ දැන් 8 වෙනි ශ්‍රේණිය දක්වා ඉගෙන ගත්තා නේද?
පි: ඔව්.
ප්‍ර: ඔබ දැන් කුරානය කටපාඩම් කළාද ඔබ ඒ පුංචි කාලයේදී?
පි: ටිකක් කරලා තියෙනවා එහෙම නැහැ.
ප්‍ර; ඔබ මද්‍රාසා පාසැල් වලින් ඉගෙන ගත්තාද?
පි: නැහැ.
ප්‍ර: දැන් ඔබගේ දියණි ෆාතිමා ජිෆ්ර් ඉන්ටර් නැෂනල් ස්කූල් එකකට ගියානේද O/L වෙනකම්?
පි: ඔව්.
ප්‍ර: දැන් ඔබ මේ කොමිෂමේ දී කිව්වා ඔබගේ දියණිය කුරානය කටපාඩම් කරන්න කැමති වුනා කියලා?

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඔව්.

ප්‍ර: ඔබගේ පුතා හුසේන් මෙම කොමිසම හමුවේ කිව්වා නංගි හොදටම කුරානය කටපාඩම් කරනවා එයා දැක්කා එයා නංගිගේ ලොකු වෙනසක් තියෙනවා කියලා කුරාන් කඩපාඩම් එහෙම කරා නේද?

පි: ඔව් කරා.ඔව් ඒක කළා.

ප්‍ර: එතකොට කුරආනය කටපාඩම් කරා?

පි: ඔව්.

ප්‍ර: එතකොට ඔබගේ පුතා හුසේන් කවදා හෝ කිව්වාද අම්මා මේ නංගි Bran wash කරලා තියෙනවා කියලා?

පි: මේ බෝම්බ ප්‍රහාරයෙන් පස්සේ තමයි එහෙම.

ප්‍ර: බෝම්බ ගහන්න ඉස්සෙල්ලා කිව්වේ නැද්ද?

පි: මට එහෙම මතකයක් නැහැ.

ප්‍ර: දැන් අර මේ හුසේන්ගේ වෙඩින් එකටත් ආවේ නැහැනේ?

පි: ඔව්.

ප්‍ර: මේ දෙන්නා එතකොට පුතා කිව්වේ නැද්ද ඒ ගොල්ලන් අදහන්නෙ වෙන ආගමක් වෙන මුස්ලිම් ආගමක් ඒ ගොල්ලෝ අදහන්නේ ඒක නිසා වෙඩින්ස්වලට යන්නේ නැහැ කියලා කිව්වෙ නැද්ද?

පි: එහෙම කියපු බවක් මට දැනුවත් බවක් නැහැ. ඉල්හාම්ට කැමති නැහැ කියලා තමයි කිව්වා.

ප්‍ර: එතකොට දැන් ඔය ගොල්ලන්ගේ ෆරීඩාගේ මහත්මයායි මේ බුද්ධාගමේ පන්සල්වලට උදව් කලාද?

පි: ඔව් .

ප්‍ර: එතකොට හුසේන් පුතා කිව්වාද ඉල්හාම් කියනවා කියලා ඔයගොල්ලන් පොල් මුස්ලිම් කාරයෝ ඔයගොල්ලන් හරි මුස්ලිම් අය නෙමෙ මේ පන්සල්වලට උදව් කරන එක වැරදියි කියලා එහෙම කිව්වාද?

පි: සාමාන්‍යයෙන් ඔහු පිරිමින් සමඟ පමණයි කතා බහ කරන්නේ ඉල්හාම් ඒ නිසා ඒක පිරිමි අයට කියලා ඇති එහෙම කතාවක් නමුත් මට දවසක් දුව සඳහන් කරා මේ පිළිබඳ මේක දෙන එක අපේ ආගමට අනුකූලව ඒක තහනම් කියලා.

ප්‍ර: එතකොට මේ ෆරීඩා උම්මා ඇහුවේ නැද්ද මොකක්ද ඔය දුවගේ ආගම කියලා දැන් ෆරීඩා උම්මාගේ ආගම නෙවේනේ අදහන්නේ?

පි: ඒ වෙලාවේ බැලුබැල්මට අපි විදියට වන්දනා මාන කරනවා අපේ විදියට අපේ විදියට චාරිත්‍රවාරිත්‍ර කරනවා මේ විදියටම එයා හැසිරෙන කොට ඒ බාහිර දේවල් වලින් මට දැනුනේ නැහැ.

ප්‍ර: ෆරීඩා මේ කොමිෂමට දැන් කිව්වා අපේ ආගමට හරියන ඒවා නෙමේ ඔය කරන්නේ කියලා තාත්තා පන්සලට උදව් කරන එක කිව්වනේ එහෙම?

පි: ඔව්.

ප්‍ර: එතකොට ඇහුවේ නැද්ද එයාගේ ආගම මොකක්ද කියලා ඒ දුවගේ ආගම?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පි: දැන් ඒයාගේ දරන මතයක් තිබ්බා වෙනත් ආගම් අයට කිසිසේත්ම උදව් කරන්න එපා කියන එක ඒ මතය තමයි ඒක තමයි එයා හිතුවේ. මෙහෙම මතයක් දරණවා කියලා.මගේ ස්වාමී පුරුෂයා සියළු දෙනා එක්ක සහයෝගයෙන් වැඩකටයුතු කරනවා.

ප්‍ර: දැන් වෙනත් ආගම්වල අයට උදව් කරන්න එපා ඒගොල්ලෝ කාෆිර් කියලා කිව්වාද?

පි: මාත් එක්ක නම් එහෙම කියන් නැහැ එයා අර ඉල්හාම් එක්ක කියනවාද දන්නේ නැහැ මාත් එක්ක දුව එහෙමකියන් නැහැ.

ප්‍ර: දුව කවදාවත්ම කියලා නැද්ද කාෆිර්ලා ඒගොල්ලෝ?

පි: නැහැ මාත් එක්ක. දුව එහෙම කතා කරලා නැහැ.

ප්‍ර: දැන් ඔබ ගමේ හිටියානේ නුවර පල්ලියට ගියා නම් මොකක්ද ගිය පල්ලිය තවුහිද් ජමාත් තබ්ලික් ජමාත්ද ?

පි: අපිද.

ප්‍ර: ඔව්?

පි: සූෆි මුස්ලිම් පල්ලියකටද මොන පල්ලියකටද?

පි: අපි තබ්ලික් ජමාත් පල්ලිය තමා යන්නේ.

ප්‍ර: තබ්ලික් ජමාත්?

පි: ඔව්

ප්‍ර; එතකොට දැන් මේ ඉල්හාම් මොහොමඩ් දුවයි එහෙම ෆැමිලි එකක් වුණානේ වෙනම එතකොට ඒ අර ඒගොල්ලෝ මොන පල්ලියටද ගියේ?

පි: දුව පල්ලියට යන එක මෙයා කොහේ පල්ලියට යන එක ඉල්හාම් කුමන පල්ලියටද ගියේ කියලා මා දැනුවත් නැහැ නමුත් දුව අපි වගේම තමා අපේ ආගමට අනුව තමා ඒ චාරිත්‍ර කලේ.නමුත් අර මගුල් ගෙදර උත්සවය පිළිබඳව තමයි කැමති නැහැ කියලා කිව්වේ.මම වැඩි වශයෙන් ඒක ගැන හොයන්න ගියේ නැහැ. මොකද ඔවුන් පවුලේ සමගියෙන් ඒ ගොල්ලෝ ඉන්නවා කියලා හිතාගෙන මම ඒක ගැන ගැඹුරින් විස්තර අහන්න ගියේ නැහැ.

ප්‍ර: දැන් ඔබ ඉබ්‍රාහිම් හජියාර් අයියා කිව්වේ ගෙදර නිතරම ගියා නේද අර පල්ලෙහා සිටි එකේ ඉදගෙනන කතා කරනවා කිව්වේ උඩ තට්ටුවට යන්නේ නැතිව?

පි: ඔව්.

ප්‍ර: සාමාන්‍යයෙන් මාසයකට කී සැරයක් යනවාද? ඒ අයියලාගේ ගෙදර?

පි: අපි ගොඩාක් දවසේ අවුරුදු 2009 ගොඩාක් දවසේ නුවර තමයි ඉන්නේ අපි පැක්ට්‍රියේ තමයි ඉන්නේ.

ප්‍ර: කොළඹ ඉන්න කොට ?

පි: කොළඹ ඉන්නකොට සමහර වෙලාවට යනවා. පල්ලෙහා තමයි නිකන් කතා කරලා ඉන්නවා. ඉල්හාම්ගේ අම්මා අසනීප වෙච්ච වෙලාවේ ඒ

FAIR COMMENT BY JEZEEM

වගේ වෙලාවල් වලදී තමා අපි යන්නේ අනවශ්‍ය කතා බහ අපි ඒ ගොල්ලන් එක්ක තිබ්බේ නැහැ.

ප්‍ර: දැන් ඒ ගෙදර තුන් වෙනි තට්ටුවේ ලොකු හෝල් එකක් තියෙනවා නේද

පි: ඔව්. ෆන්ෂන් එක

ප්‍ර: දෙවියෝ වදින්නේ ඒ හෝල් එකේද?

පි: ඒක මම දැක්කේ නැහැ.

ප්‍ර: හෝල් එකක් තියනවා කියලා දන්නවානේ?

පි: හෝල් එක තියෙනවා එහෙම නමුත් වන්දනා කරනවා කියලා. පවුලේ උත්සවවලට භාවිතා කරන බව දන්නවා.ඒ මම වෙඩින් දවස්වල විතරයි එකේ ආහාර අනුභව කරන්න සුදානම් කරනවා.ඒ වගේ උත්සව වලට තමයි ඒක භාවිතා කරන්නේ

ප්‍ර: ඒ කියන්නේ ගෙදරදී ද උත්සව ගත්තේ ළමයින්ගේ

පි: ගෙදරදිත් එහෙම.

ප්‍ර: දැන් ඉල්හාම් මොහොමඩ් proposal marriage එකක්නේ නේද?

පි: ඔව්.

ප්‍ර: දැන් ඔබ කිව්වා මාස දෙකක් විතර මේ ඉල්හාම් මොහොමඩ්ලා ගැන හෙව්වා කියලා මේ දුවව බන්දලා දෙන්න ඉස්සෙල්ලා ඉල්ලාහම් මොහොමඩ්ගේ යාළුවෝ කවුද කියලා හොයලා බැලුවාද?

පි: යාළුවෝ පිළිබඳ අපි එහෙම දන්නේ නැහැ. අපි දැනුවත් නැහැ.

ප්‍ර: මොනවාද හෙව්වේ ඉල්හාම්ගේ ගෙදර අය ගැනද හෙව්වේ ?

පි: ඔහු හොඳයි ද ඉගන ගතතේ කොහොමද උගත් කම් ඒ වගේ තමයි අපි හෙව්වේ මොකක්ද ව්‍යාපාරකටයුතු ඒ පිළිබඳව ගැන තමයි හොයලා බැලුවේ.ඔහුගේ තාත්තා එක්ක ව්‍යාපර කටයුතුවලට හොදින් නිතර වුනා කියන එක තමයි අපි සොයා බලන කොට අපිට ආරංචි වුනේ.

ප්‍ර; ඉල්හාම් මොහොමඩ්ගේ වෙඩින් එකට ආපු යාළුවෝ දැක්කාද ෆරිඩා?

පි: ඒ කාන්තා පාර්ශවය වෙනම පිරිමි පාර්ශවය වෙනම ඉන්නේ.

ප්‍ර: අර මේ ඉබ්‍රාහිම් හජියාර්ගේ ගෙදර ඉස්සර පැත්තේ තිබෙනවානේ ගෙදරක් ?

පි: ඔව්.

ප්‍ර: ඒ ගෙදර ඉන්න ජමිල් මොහොමඩ් කියලා එයා යාළුයිද?

පි: ඒ පිළිබඳව ඒ නම එහෙම මුකුත් දන්නේ නැහැ එහෙම.

ප්‍ර: දැන් ඉල්හාම් මොහොමඩ්ගෙයි ෆාතිමා ජිප්රියාගේ වෙඩින් එක තිබුණානේ අර Convention hall?

පි: ඔව්.

ප්‍ර ඒකට ඇමතිවරුත් ආවාද?

පි: දෙන්නෙක් ඇවිල්ලා හිටියා රවුල් හකිම් ද කියලා එහෙම නමින් සඳහන් කරන්න බැහැ. නමුත් ඇමතිවරුන් දෙන්නෙක් පැමිණියා ඒ ළමුන් අපි දරුවන්ගෙන් ඇහුවාත් හරියමට ඒ ගොල්ලන්ගේ නම. සඳහන් කරයි.

ප්‍ර: ෆරිඩා කිව්වා දෙන්නෙක් ආවා එකෙනෙක් රවුල් හකීම්.

FAIR COMMENT BY JEZEEM

පි: මම හිතනවා දෙන්නෙක් හිටියා මේ පිරිමි පාර්ශවයෙත් මේ ඒගොල්ලෝ පැමිණුනේ දෙන්නෙක් පැමිණියා කියලා කිව්වා නමුත් ඒ පිළිබඳ විස්තර මම දන්නේ නැහැ නමුත් දරුවන්ගෙන් ඒක අහලා බලන්න පුළුවන්.

ප්‍ර: ෆරීඩාට මතක සිංහල,ද මුස්ලිම්ද, ඒ ඇමති වරු ?

පි: පැමිණි බව මට ආරංචි වුනා නමුත් ඒක කවුද පිළිබඳ නම විස්තර කොහොමද අහලා කියන්න පුවළුන්.ඒක කොයි ළමයාගේ වෙඩින් එකට ආවාද කියලා මට ඒක නිශ්චව කියන්නත් බැහැ.

ප්‍ර: ෆාරිඩා මහත්මිය දැන් මුස්ලිම් වෙඩින්වල පොටෝ ගන්නවද ගෲප් පොටෝ එහෙම පොටෝස් ගන්නවාද පැමිණිලි පොටෝග්‍රාෆ්, එහෙම ගන්නවාද මුස්ලම් වෙඩින් වල පොටෝස්?

පි: අපි ගෙදර දුව ගත්තා නමුත් එහෙම .

ප්‍ර: නැහැ හෝල් එකේදී?

පි: ඒ ගොල්ලෝ ගත්තාද දන්නේ නැහැ. අපි අපේ පැත්තෙ නම්.

ප්‍ර: වෙඩින් ඇල්බම්ස් එහෙම නැද්ද වෙඩින් ඇල්බම් එහෙම හදන්නේ නැද්ද?

පි: එහෙම කරන්නේ නැහැ.

ප්‍ර: විඩියෝ කරන්නේ නැද්ද?

පි: විඩියෝ කරන්නේ නැහැ ස්වාමිනි.

ප්‍ර: සිංහල වෙඩින්වලට ගිහිල්ලා තියෙනවාද ෆරීඩා මහත්මිය ඒවා කරනවානේ වෙඩින්ස්වල?

පි: මට හිතෙන්නෝ photo අරන් ඇති ඒක දරුවන් දන්නවා ඇති ඒ ළමයි කාගේ හරි අතේ ඒවා නමුත් විඩියෝ පිළිබඳව නම් මට නිශ්චිතව කියන්න බැහැ.ඇල්බම් නැහැ.

ප්‍ර: ෆරීඩා මහත්මිය දැන් දුවව ඉල්හාම් මොහොමඩ්ට බන්දලා දෙනකොට පැමිණිලි එක කොහොමද කියලා ඊබ්‍රාහිම් හාජියාර්ගේ එතකොට ආරංචි වුනාද positionsලා හොඳට දන්න පැමිණිලි එකක් connected එහෙම හොඳ reach එහෙම connections politically එහෙම තියෙන හොඳට ෆැමිලි එකක් කියලා එහෙම ආරංචි වුනාද මේ ගොල්ලන්ගේ ෆැමිළි එක ගැන

පි: ඒ පිළිබඳ මගේ ස්වාමිනි පුරුෂයා හොයලා බලලා ඇති ඒ පිළිබඳ එයා දැනුවත් ඇති මට ඒ පිළිබඳව.

ප්‍ර: ස්වාමී පුරුෂයා කියන්නේ නැද්ද ෆරීඩා මහත්මියට දුව බඳින්න යන ෆැමිලි එක ගැන විස්තර කියන්නේ නැද්ද?

පි: පැමිළි හොඳයි කියලා ඒ පවුල හොඳයි කියලා තමයි කිව්වේ. ඒ කියන්නේ දේශපාලඥයන් සමඟ එහෙම සම්බන්ධතා තියෙනවා කියලා මට කිව්වේ නැහැ. පවුල හොඳ පවුලක් අපේ.

ප්‍ර: දැන් මේ ඊබ්‍රාහිම් හාජියාර් කියලා කියන්නේ ඒ ගොල්ලන් පල්ලියට යනවාද ඊබ්‍රාහිම් හාජියාර් ?

FAIR COMMENT BY JEZEEM

පි: ඒ ගොල්ලෝ සිකුරාදා පල්ලියේ යනවා අනිත් අයට පල්ලි යනවා ද කියලා මට දන්නේ නැහැ සිකුරාදා යනවා.

ප්‍ර: ඒ ගොල්ලෝත් අර ඔය ගොල්ලන්ගේ වගේ හාමුදුරුවරුන්ට දුන්නා නබි තුමාගේ උපන්දිනය සැමරුවාද දානය දුන්නාද ?

පි: ඒ ගොල්ලෝ දානය නම් අපේ ගෙදරට එහෙම මගේ ස්වාමි පුරුෂයා වගේම තමයි ඊබ්‍රාහිම් ඒ මහත්තයාත් එයාත් මේ දාන කටයුතු වල නිරත වෙනවා කාට එහෙම කරේ කියලා මම දැනුවත් නැහැ. නමුත් එයත් මගේ ස්වාමි පුරුෂයා වගේම තමයි කවුරුත් සමඟ

ප්‍ර: නබි තුමාගේ උපන්දිනයට ?

පි: නබි තුමාගේ උපන් දිනයට අපිට කෑම සහන එක ගෙනත්ලා දෙනවා.

ප්‍ර: මිනිස්සුන්ට දෙනවාද ලොකුවට දානයක් මිනිස්සුන් ලොකුවට එකතු කරලා දානය දෙනවාද?

පි: ඒ ප්‍රදේශයේ සිටිනන ගොඩාක් අයට උදව් කරනවා.

ප්‍ර: ඊබ්‍රාහිම් හජියාර් ඔය ෆරිඩා කිව්වානේ තබ්ලික් ජමාත් කියලා ෆරිඩා ඉබ්‍රාහිම් හජියාර් තවුහිද්ද?

පි: ඒ පිළිබඳ මා දන්නේ නැහැ.

ප්‍ර: කොතන පල්ලියට ද යන්නේ?

පි: පිරිමි පාර්ශවය ඒ පිළිබඳ දැනුවත් ඇති මොකද අපි කාන්තා පාර්ශවය නිසා අපි ඒ පිළිබඳව .

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

සාක්ෂිකාරියගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපානන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරියට අවශ්‍ය දැයි විමසමි අවශ්‍ය නැත බව දන්වයි කොමිෂන් සභාව ඉදිරිපිට පැමිණ සාක්ෂි ලබා දීමෙන් කොමිෂන් සභාවේ කටයුතු කොමිෂන් සභාවේ කටයුතුවලට දැක්වූ සහෝගය සම්බන්ධයෙන් සාක්ෂිකරුට ස්තූති කරමි.

ප්‍ර: ලබා දුන්න සාක්ෂියට අමරව මොනවා හරි කියන්න තියෙනවාද?

පි: ඇත්තටම මගේ දුවක් හැටියට මේ මෙවැනි ආකාරයට රටට කරපු මේ ද්‍රෝහිකමට ඇත්තටම කණගාටුයි. කණගාටුව මා පල කර සිටිනවා. ඒ වගේම මුකුත් දන්නැති කුඩා දරුවන් අතහැරලා දාලා මෙහෙම ඒ වගේම රටේ දරුවනුත් විනාශ කරලා මේ තත්ත්වයට කරපු එක ගැන කණගාටුව පළකරනවා.ඒ දේවස්ථාවල එහෙම සිදු වූ දේවල් ගැන ඒ හෝටල් වල ජීවිත කීයක් අහිමි වුනාද ඒ පිළිබඳව මට ඇත්තටම මම දුක් වෙනවා සහ කණගාටුව පලකරනවා.

සාක්ෂිකාරිය මුදාහරිමි.

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදි.

FAIR COMMENT
BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය :- 2020.06.22 වේලාව :- ප.ව. 3.30

සටහන් කළේ :- කේ.එම්.චන්දිමා දිල්හානි

ගරු විනිසුරු මඩුල්ල :-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

පෙනී සිටීම:-

ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජීනසේන මෙනවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතඥ සුහර්ෂි හේරත් මහත්මිය ,ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතීඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ නීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය, රජයේ අධි නීතිඥ චතුරංග බණ්ඩාර මහතා , රජයේ අධි නීතිඥ දිලන්ත එස්. කළුදුරුවගේ මහතා රජයේ අධි නීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටියි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අහරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහත්මයා සමඟ නීතීඥ ගිම්හානි ගමගේ මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභා පති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

දැන් වාර්තා ගත කිරීම ආරම්භ කරන ලෙසට යතුරු ලේඛිකාවට නියෝග කරමි.

සාක්ෂි අංකය :- 747

සම්පූර්ණ නම :- ඉන්දික උදය කුමාර ලොකු හෙට්ටි.

වයස :- 46

ජාතිය :- සිංහල

ආගම :- බෞද්ධ

රැකියාව :- පොලිස් අධිකාරි

රාජකාරි ලිපිනය :- ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශය.

ප්‍රතිඥා පිට,

<u>ජ්‍යෂ්ඨ රජයේ අධී නීතිඥ නයනා සෙනවිරත්න මිය</u>

ප්‍ර: ඔබ දැනට පොලිස් අධිකාරිවරයෙකු වශයෙන් සේවය කරනු ලබනවා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර; දැන් කුමන අංශයකට අනුයුක්තවද සේවය කරන්නේ?

පි: ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යංශය .

ප්‍ර: ඔබ මේ වන විට පොලිස් සේවය තුළ කොපමණ කාලයක් සම්පූර්ණ කරලා තියෙනවාද?

පි: වසර 26 ට ආසන්න කාලයක් ස්වාමිනි.

ප්‍ර: ඔබ පොලිස් සේවයට බැඳුනේ කුමන තනතුරකට ද?

පි: උප පොලිස් පරීක්ෂක තනතුරට.

පි: 1994 වර්ෂය.

ප්‍ර: මා කිව්වොත් නිවැරදිද ඔබ 1994. 10 වෙනි මාසේ 01 වෙනි දින උපපොලිස් පරීක්ෂක දුරයටත් 1999.5.10 වන දින පොලිස් පරීක්ෂක දුරයටත් 2006.01.01 වන දින ප්‍රධාන පොලිස් පරීක්ෂක දුරයටත් 2013 .01.15 වන දින සහකාර පොලිස් අධිකාරි දුරයටත් 2019.07. 15 වන දින වර්තමාන ඔබේ නිලය පොලිස් අධිකාරි තනතුරේ සේවය කරනවා කියලා ඔබට උසස්වීම් ලැබුණා කියලා කිව්වෝත් ඒක නිවැරදීද?

පි: පොලිස් අදිකාරි තනතුරට මම උසස් වීම් ලැබුවේ 2019.07.15 වන දින ස්වාමිනි.

ප්‍ර; ඔබ මූලික 1994 වර්ෂයේ උපපොලිස් පරීක්ෂකවරයෙක් වශයෙන් පොලිසියට බැඳිලා ඔබ මුලින්ම සේවය කරේ කුමන අංශයකට අනුයුක්වද?

පි: ස්වාමිනි මම පොලිස් විශේෂ කාර්ය බලකායට ඉඳුරාම බඳවා ගත් නිලධාරියෙක් මම 2003 වර්ෂය වන තෙක් විශේෂ කාර්යය බලකායේ රාජකාරි කරා.

ප්‍ර: ආසන්න වශයෙන් ඔබ අවුරුදු 08 ක පමණ කාලයක් විශේෂ බලකායට අනුයුක්තව සේවය කලා කියලා කිව්වොත් ඒක නිවැරදිද?

FAIR COMMENT BY JEZEEM

පි: එහෙමයි ස්වාමීනි. අවුරුදු 08ට වැඩි කාලයක්.

ප්‍ර: ඔබ යම් කාල වකවානුවදි බස්නාහිර පළාත් බුද්ධි කොට්ඨාශයේ ස්තානාධිපති වශයෙන් සේවය කලාද?

පි: එහෙමයි 2007 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා රාජකාරි කළා.

ප්‍ර: 2007 සිට 2012 වර්ෂය දක්වා බස්නාහිර පළාත් බුද්ධි කොට්ඨාශයේ ස්ථානාධිපති වශයෙන් සේවය කරනු ලැබුවා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඉන් අනතුරුව ඔබ කුමන පොලිස් ස්ථානවලද සේවය කරනු ලැබුවේ?

පි: ඉන් අනතුරුව ස්වාමිනි මම 2012 වර්ෂයේ මැයි මාසයේ වත්තල පොලිස් ස්ථානාධිපති වශයෙන් පත්වීමක් ලබලා පිටව ගියා.

ප්‍ර: ඔබ අධීක්ෂණ නිලධාරියෙකු වශයෙන් සහකාර පොලිස් අධිකාරි දුරයට පත් වුනාට පස්සේ කුමන දිස්ත්‍රික් හාරවද කටයුතු කලේ.

පි: ස්වාමිනි මම ඇල්පිටිය ,ගාල්ල,වවුනියාව, කොට්ඨාවල රාජකාරි කලා දිස්ත්‍රික් හාර නිලධාරියෙක් වශයෙන් ඉන් අනතුරුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට 2016 වර්ෂයේ පළවෙනි මාසේ 25 වෙනිදා ස්ථාන මාරුවීමක් ලැබ පැමිණියා.

ප්‍ර: ඔබ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ කුමන අංශයවලට අනුයුක්තවද කටයුතු කරලා තියෙන්නේ?

පි: ස්වාමිනි අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ මහජන පැමිණිලි අංශය, මිනිස් වෙළඳාම හා ජාවාරම පිළිබඳ විමර්ශන අංශය සමුද්‍රික අංශය, විශේෂිත අංශය වානිජ විමර්ශන අංශ 01 අධික්ෂණ කලා ස්වාමිනි. මීට අමරතව මිනීමැරුම් අංශය සහ වානිජ විමර්ශන අංශය4 අධීක්ෂණය කලා.

ප්‍ර: ඔබ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මිනිමැරුම් විමර්ශන අංශයේ අධීක්ෂණ නිලධාරියා වශයෙන් කුමන කාලවකවානුවකට අදාලවද සේවය කලේ?

පි; 2018 ජනවාරි 26 වන දින සිට 2019.12.26 වන දින දක්වා.

ප්‍ර: ඔබ ඉන්පස්සේත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විවිධ අංශ අධීක්ෂණය කරනු ලැබුවාද?

පි: එහෙමයි ස්වාමිනි. 2019.12.27 වන දින සිට 2020 .03.02 වෙනි දින දක්වා ස්ථාන මාරුවීම් ලබා පිටව යන තෙක් වාණිජ විමර්ශන අංශ 04 සහ සමුද්‍රික අංශය අධීක්ෂණය කරා.

ප්‍ර: ඔබ දැනට සේවය කරන ළමා හා කාන්තා කාර්යංශයට ඔබ ස්ථානමාරුව ලැබුවේ කවදාද?

පි: 2020.03.03 වන දින ස්වාමිනි.

ප්‍ර; ඒ අනුව ඔබ මෙතෙක් සඳහන් කරපු කරණු අනුව 2019 අප්‍රේල් මාසයේ 21 වන දින වන විට ඔබ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මිනීමැරුම් විමර්ශන අංශයේ අධීක්ෂණ නිලධාරියෙක් වශයෙන් කටයුතු කරා කියලා කිව්වොත් ඒක හරිද?

පි; එහෙමයි ස්වාමිනි මිනීමැරුම් විමර්ශන අංශයට අමරතව වානිජ විමර්ශන අංශ 04 අධීක්ෂණය කරා.

ප්‍ර; ඔබ 2019. 4 වෙනි මාසේ 21 වෙනි දින රාජකාරියට වාර්තා කරාද ?

පි; ස්වාමිනි එදින ඉරිදා දිනයක් එදින මම පොරොත්තු සේවා රාජකාරියේ මගේ නිවසේ බියගම දෙල්ගොඩ ප්‍රදේශයේ නිවසේ තමයි සිටියේ ස්වාමිනි.

ප්‍ර: මහත්මයා පැහැදිලි කරන්න මොකක්ද පොරොත්තු සේවා රාජකාරිය කියලා කියන්නේ?

පි: පොරොත්තු සේවා රාජකාරිය කියලා කියන්නේ ස්වාමිනි යම් කිසි හදිසි කැඳවීමක් ලැබුනොත් හදිසි විමර්ශනයක් ලැබුනොත් ඒ විමර්ශනයට ඒමේ පදනම මත රැඳී සිටීම.

ප්‍ර; ඒ අනුව 2019.04.21 වෙනි දින ඔබ නිවසේ ඉන්න අවස්ථාවේදී ඔබට යම් කිසි දැනුම් දීමක් සිදු කරනු ලැබුවාද?

පි: එහෙමයි ස්වාමිනි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවි සෙනවිරත්න මහතා මගේ ජංගම දුරකථනයට ඇමතුමක් ලබා ගත්තා.

ප්‍ර: ඒ කීයට විතරද?

පි: ස්වාමීනි 9.30 ත් .9.45 අතර කාල අතර තුර.

ප්‍ර: උදැසන ?

පි: උදැස

ප්‍ර: මොකක්ද ඔබට ලැබෙන දැනුම් දීම ?

පි: ස්වාමිනි එදින 2019.04.21 වන දින එල්ලවූ පාස්කු ප්‍රහාරයට අදාලව ශ්‍රැංග්‍රිලා හෝටලයේ සිද්ධ වූ අපරාධය සම්බන්ධව විමර්ශන කටයුතු මට ආරම්භ කරන්න කියලා උපදෙස් ලබා දුන්නා.

ප්‍ර; ඒ අනුව ඔබ ශ්‍රැග්‍රිලා හෝටලය වෙත වහාම වාර්තා කරාද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර; අසාන්න වශයෙන් පැය කීයකට පමණ ඔබ අදාල ස්ථානය ළඟා වෙන්න හැකියාවක් ලැබුණාද?

පි: පැය 10.45 පමණ වුනා ස්වාමිනි මං පැමිණෙන කොට .

ප්‍ර; ඔබ යන අවස්ථාව වන විට වෙනත් විවිධ අංශවලට අයත් නිලධාරීන් එම ස්ථානයට ලඟා වී තිබුණාද?

පි: එහෙමයි ස්වාමිවණි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේනතුවේ එවකට පොලිස් අධිකාරි අම්පාවිල මහතා ඇතුලු කණ්ඩායමක් ද පොලිස් විශේෂ කාර්ය බලකායේ යුධ හමුදා නිලධාරීන් සාමාන්‍ය පොලිස් නිලධාරීන් ඇතුලු නිලධාරින් පැමිණි හිටියා අපරාධ ස්ථානයට

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර; දැන් ඔබ ශ්‍රැන්ංග්‍රිලා හෝටලයට ලඟා වුනාට පස්සේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරියෙක් වශයෙන් මොන ආකාරයටද ඔබ විමර්ශන කටයුතු ආරම්භ කළ යුතුයි කියලා තීරණය කරේ?

පි: ස්වාමිනි ඉස්සෙල්ලාම මම ඒ අපරාධ සිදුවුන පළවෙනි මහලට පිටව ගියා. ගිහිල්ලා පරීක්ෂා කරලා බලලද්දි තැන් තැන් වල මියගොස් සිටි පුද්ගලයින්ගේ මළසිරුරු තිබුණා. ඒ වගේම පළමු මහලට විශාල හානියක් සිදුවෙලා තිබුණා සම්පූර්ණ කොටස් කඩාගෙන වැටිලා බිමට වැටී තිබුණා. මේ අවස්ථාවේදී මා තීරණය කළේ විමර්ශන නිලධාරියෙක් වශයෙන් මෙම අපරාධය හා සම්බන්ධයෙන් කිසියම් තොරතුරක් ලබා ගැනිමේ සඳහා මෙම හොටල් පද්ධතිය ඇති CCTV කැමරා පද්ධතිය පරීක්ෂා කිරීම සුදුසුයි කියලා මම තීරණය කරා.

ප්‍ර; ඒ අනුව ඔබ ෂැංග්‍රිලා හෝටලයේ ඒ CCTV කැමරා ඒ භාරව සිටින කළමණාකාරිත්වය සමඟ ඒ නිලධාරීන් සමඟ සකාච්ඡා කරාද?

පි: එහෙමයි ස්වාමිනි. මම සාකාච්ඡා කළා ඒ සාකච්ඡා කරන අවස්ථාවේදී මට දැනගන්න ලැබුනා නිලධාරින් කණ්ඩායම් කීපයක් ඇවිල්ලා ඒ CCTV කැමරා පද්ධතිය පරීක්ෂා කිරීමට උත්සාහ දරා ඇති බව නමුත් ඒ අදාල ආරක්ෂා නිලධාරින් අවසර දීලා තිබුණේ නැහැ. මේ අවස්ථාවේදී ස්වාමිනි මම පැහැදිලිව කිව්වා මගේ රාජකාරියට කිසියම් බාධාවක් වුනොත් මම ඉන්න සියලුම දෙනාම අත්අඩංගුවට ගැනීමට සිදුවෙනවා කියන මගේ තීරණය ඒ ගොල්ලන්ට දැනුම් දීමක් කළා.

ප්‍ර: ඉන් අනතුරුව ඔවුන් ඒ සඳහා සහය රාජකාරි ඉෂ්ට කරන්න සහයෝගය ලබා දුන්නාද?

පි: එහෙමයි ස්වාමිනි. ඉන් අනතුරුව මට සහ පොලිස් විශේෂ කාර්ය බලකායේ එවකට පොලිස් අධිකාරි නිශේද මහතාට එම CCTV කැමරාව ඇතුලත් නිරීක්ෂණ මැදිරිය වෙත පැමිණිමට අවස්ථාව ලබා දුන්නා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර; ඒ විදියට ෂැංග්‍රිලා හෝටලයේ තිබ්බ CCTV කැමරා පද්ධතිය පරීක්ෂා කිරීමට මුලින් අවසර ලබා දුන් නැත්තේ ෂැන්ග්‍රිලා හෝටලයේ ආරක්ෂක කැමරා පද්ධතිය භාරව හිටපු ආරක්ෂක අංශයේ නිලධාරින්ද නැත්නම් කළමණාකාරිත්වද?

පි: ස්වාමිනි මට තියෙන දැනුම අනුව එම CCTV කැමරා පද්ධතිය භාරව හිටපු ආරක්ෂක නිලධාරීන් තමයි ස්වාමිනි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධී නීතිඥ නයනා සෙනවිරත්න මිය</u>

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔබ ෂැන්ග්‍රිලා හෝටලයේ මේ CCTV කැමරා පද්ධතිය ක්‍රියාත්මක වෙන ඒ අදාල කාමරයට ගියාද?

පි; එහෙමයි ස්වාමිනි.

ප්‍ර; ඉන් අනතුරුව ඔබ මොකක්ද කලේ ?

පි; ඉන් අනතුරුව ස්වාමිනි CCTV කැමරා පද්ධතිය පරීක්ෂා කරන අවස්ථාවේදී ඒ වන විටත් ස්වාමිනි මෙම බෝම්බ පිපිරීම සම්බන්ධයෙන් ආරක්ෂක නිලධාරීන් ඒ අදාළ පුද්ගලයින් හඳුනගෙන තිබුණා. පසුව ස්වාමිනි මම මෙම CCTV කැමරා පද්ධතිය නැවත පිටුපසට පරීක්ෂා කරගෙන ආවා මෙම පුද්ගලයින් කුමන ආකාරයට ද හෝටලයට පැමිණිලා තියෙන්නේ කියලා. ඉන් පසුව ස්වාමිනි මට දැන ගන්න ලැබුනා මෙම පුද්ගලයින් දෙදෙනා එක්තරා කාමරයකට ඇතුල් වෙනවා ඒ CCTV කැමරා වල දර්ශනය වෙනවා ස්වාමිනි පසුව එම කාමරය හඳුනා ගැනීම සඳහා දැනට ක්‍රියාත්මක වෙන CCTV කැමරා දර්ශනය ඔස්සේ නිලධාරියකු යොමු කර අදාළ කාමරය හඳුනා ගැනීමට කටයුතු කලා.

ප්‍ර: ඒ අනුව මේ ස්වයං ඝාතක බෝම්බ ප්‍රහාරකයන් ෂැන්ග්‍රිලා හෝටලයේ කුමන කාමරයක නවාතැන් ගෙන සිටි බවටද අදාල විමර්ශනයේදී අනාවරණය?

පි: ස්වාමිනි එම හෝටලයේ 6 වන මහලේ කාමර අංක 0616 කියන කාමරයේ තමයි මෙම දෙදෙනා රැදි සිට තිබෙන්නේ.

ප්‍ර; ඉන් අනතුරුව මේ කාමර හෝටල් කාමර වෙන් කර ගැනීම එහෙම නැත්නම් ලියාපදිංචිය සිදුවී ඇත්තේ කුමන අකාරයකටද යන්න සම්බන්ධයෙන් පරීක්ෂා කරනු ලැබුවා?

පි: එහෙමයි ස්වාමිනි.ඉන් අනතරුව මා දැනුම් දීමක් කරා ඒ ආරක්ෂක නිලධාරින්ට අදාල කාමරයේ එදින නැවතී සිටි පුද්ගලයින්ගේ නාම ලේඛනය ලබා දෙන ලෙසට

ප්‍ර; ඒ අවස්ථාවේදී ඔබට අදාල නිලධාරීන් ඔබට එදින 2019.04.21 වෙනි දින වන විට අංක 616 කියන කාමරයේ නවාතැන් ගෙන සිටියේ ලියාපදිංචි වී සිටියේ කවුද කියලා අදාල ලේඛන ඔබට භාර දුන්නාද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබ මෙම ගරු කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයට ඔබේ ප්‍රකාශය ලබා දෙන අවස්ථාවේ එහිදි ඔබ ලබා ගන්නා ලද අදාල ලේඛන වල පිටපතක් භාර දීමක් සිදු කරා ද?;

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර; එය ඔබට නැවත දැක්කොත් හඳුන ගන්න හැකිද?

පි: හැකියාව තියෙනවා ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

මේ අවස්ථාවේදී සාක්ෂිකරුට ෂැංග්‍රිලා හෝටලය කොළඹ අමුත්තන් කාමර අංක 0601 සිට 0622 කාමර වල අමුත්තන් නවාතැන් ගැනීමට ලියාපදිංචි වී ඇති පුද්ගලයන්ගේ නාම ලේඛනයක් පෙන්වා සිටී.

පි: හඳුනා ගැනීමට හැකියි ස්වාමිනි.

මේ ලේඛනය C708 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනවා.

ප්‍ර; ඒ අ මුත්තන්ගේ නාම ලේඛණය පරීක්ෂා කිරීමේදී ඒ ලේඛනයේ කාමර අංක 616යේ කවර පුද්ගලයන්ගේ නම්ද සටහන් වී තිබෙන්නේ?

පි: ස්වාමිනි කාමර අංක 616 යටතේ මොහොමඩ් ඊබ්‍රාහිම් ඉල්ලාම් යන අය සහ මුබාරක් අසාද් මොහොමඩ් යන අයගේ නම් සඳහන්ව තිබෙනවා ස්වාමිනි.

ප්‍ර; ඒ අය එහි කාමරයෙන් ලබා ගෙන ඇති දිනය සහ පිටපත් වෙච්ච දිනය කාමරයේ වර්ගයේ ආදියත් එහි සටහන් වි තිබෙනවාද? ඒ සම්බන්ධයෙන් මහත්මයාට සඳහන් කරන්න පුළුවන්ද?

පි: එහිදි ස්වාමිනි පැමිණි දිනය වශයෙන් 2019.04.20 වන දිනත් සඳහන් වෙලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර; දිනය විතරක් සඳහන් කරන්න මහත්මයා

පි; 2019.04.19 වශයෙන් තමයි ස්වාමිනි සඳහන් වෙන්නේ අරයිවල් ඩේට් වශයෙන්. පැමිණිමේ දිනය වශයෙන්.සමාවෙන්න ස්වාමිනි 2019.04.20. වෙනි දින

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: නැවත නිවැරදි කරන්න?

පි: නිවැරදි කරනවා ස්වාමිනි. නිවැරදි දිනය 2019.04.20 වන දින ස්වාමිනි.

ප්‍ර; ඒ කියන්නේ අර ඉස්සෙල්ලා සඳහන් කරපු තැනැත්තන් දෙදෙනා හෝටලයට පැමිණි දවසද?

පි; පැමිණි දිනය.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධී නීතිඥ නයනා සෙනවිරත්න මිය</u>

ප්‍ර: නම් දෙකක් සඳහන් වෙනවා නේද මහත්මයාගේ කාමරයට ආව?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: නැවතත් නම් දෙක කියන්න?

පි; මොහොමඩ් ඊබ්‍රාහිම් ඉල්හාම්, යන පුද්ගලයා 2019. 4.20 වෙනි දිනද මුබාරෆ් අසාම් මොහොමඩ් යන අය 2019.04.20 වෙනි දින සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර; ඒ අනුව කාමර අංක 616 ට අදාලව සටහන් වී ඇති දත්තයන් C708 A වශයෙන් ලකුණු ඉදිරිපත් කරනු ලබනවා මහත්මයාට ලේඛණයෙන්

President Secretary Copy
FAIR COMMENT BY JEZEEM

පරීක්ෂා කිරීමෙන් අනතුරුව එහි ලියාපදිංචිය සම්බන්ධයෙනුත් හොයලා බැලුවාද?

පි: එහෙමයි.

ප්‍ර: ඒ මොන ආකාරයට ද හොයලා බැලුවේ ?

පි: එම පුද්ගලයන් ලියාපදිංචි වීමට ඉදිරිපත් කරන දත්ත ඇතුල පෝරම දෙකක් තිබුණා එම පෝරම දෙක මා ලබා ගැනීමට කටයුතු කළා.

ප්‍ර; ඔබ මෙම කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයට ප්‍රකාශය ලබා දෙනකොට ඔබ එහි එදින පරීක්ෂා කරන ලද එකී ලේඛනය වල පිටපතුත් ලබා දුන්නාද? එය නැවත දැක්කොත් හඳුනා ගැනීමට හැකියවාක් තිබේද?

පි: එදින ලබාදුන්නා එහෙමයි දැක්කොත් හඳුනන ගන්න පුළුවන්ද?

ප්‍ර: දැනටමත් C 441 එක වශයෙන් ලකුණු කර ඇති ලේඛනයක් සාක්ෂිකරුට පෙන්වා සිටියි. දැන් ඔබට පෙන්වන ලේඛනය ඔබට හඳුන ගන්න හැකියාවක් තිබෙනවාද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර; කුමක් වශයෙන් පැහැදිලි කරන්නේ?

පි: එදින ස්වාමිනි මා භාරයට ගත් ලේඛනයක පිටපතක් වශයෙන් හඳුන ගන්නවා ස්වාමිනි.

ප්‍ර: ඒ අනුව කාමර අංක මේ 616 හි ලියාපදිංචි වූ පුද්ගලයන් දෙදෙනාගෙන් එක් අයකු වන ඊබ්‍රාහිම් ඉල්ලාහම් යන අයට අදාල ලියාපදිංචි සම්බන්ධයෙන් දත්ත ඇතුලත් ලේඛය කියලා කිව්වොත් ඒක නිවැරදිද ?

පි: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර; එහි අදාල පුද්ගලයාගේ උපන් දිනය ජාතික හැඳුනුම් පත් අංකය සහ ලිපියනය ආදියත් සටහන් වී තිබෙනවාද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර; ඒ ගැන පැහැදිලි කරන්න පුළුවන්ද ඔබට?

පි; උපන් දිනය වශයෙන් ස්වාමිනි 86.08.31 වන දිනත් ජාතික හැඳුනම් පත් අංක වශයෙන් 862442067V වශයෙනුත් ලිපිනය වශයෙන් ස්වාමිනි 658/90,මහවිල පාක්,කොළඹ 09 වශයෙනුත් දුරකතන අංකයක් වශයෙන් ස්වාමිනි + 94775073771 වශයෙනුත් සඳහන් වෙලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර; මෙම අදාළ ලිපිනය ඔබ ලබා ගැනීමෙන් අනතුරුව ඔබ මොකක්ද ගත් ක්‍රියාමාර්ගය?

පි; මේ පුද්ගලයන්ගේ විස්තර අරගෙන ස්වාමිනි මම එවකට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස් පති අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව රවි සෙනවිරත්න මහතාට දුරකථන ඇමතුමක් ලබා ගෙන මේ සම්බන්ධව දැනුම් දීමක් කලා ස්වාමිනි.

ප්‍ර: ඔබට ඒ සම්බන්ධයෙන් වැඩිදුරටත් ක්‍රියාකරන්න උපදෙසක් ලැබුණාද?

President's Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පි; එහෙමයි ස්වාමිනි.එවකට ජ්‍යෙෂ්ඨ පොලිස්පතිතුමා දැනුම් දීමක් කරා මහවිල උද්‍යානයේ පිහිටි නිවස පරීක්ෂා කිරීමට නිලධාරින් කණ්ඩායමත් එක්ක පිටව යන්න කියලා.

ප්‍ර; ඔබ ඒ අනුව නිලධාරීන් කණ්ඩායමක් මේ රාජකාරි සඳහා සුදානම් කරගත්තාද?

පි; එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ කොයි ආකාරයටද?

පි: ස්වාමිනි ඒවන විටත් මම නිලධාරින් කණ්ඩායමක් සමඟ නෙමේ එම ස්ථානයට පැමිණ සිටියේ එතකොට මම තීරණ කරා නැවත අපරාධ පරීක්ෂණ දෙපාර්තමෙන්තුව වෙත ගිහිල්ලා නිලධාරින් කණ්ඩායමක් සුදානම් කර ගෙන අදලා ස්ථානය පරීක්ෂා කිරීම සඳහා පිටව යෑමට.

ප්‍ර; ඔබ සමඟ අදාල ස්ථානය පරීක්ෂා කිරීම සඳහා යෑමට ඔබ සුදානම් කර ගත්තානේ අනෙක් නිලධාරීන් කවුද?

පි: මා සමඟ උප පොලිස් පරීක්ෂක කිසෝර් ප්‍රසාද් ,පොලිස් කොස්තාපල් 73293 කරුණාරත්න, පොලිස් කොස්තාපල් 91058 චමින්ද, පොලිස් කොස්තාපල් රියදුරු 36217 කලපුගේ යන නිලධාරීන් සමඟ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්ත W.P.G.I 9020 දරණ කාර් රථයෙන් තමයි ස්වාමිනි පිටව ගියේ.

ප්‍ර; ඔබ නිල ඇදුමින්ද සිවිල් ඇදුමින්ද පිටව ගියේ?

පි; සිවිල් ඇදුමින් පිටව ගියේ ස්වාමිනි.ආරක්ෂාව සඳහා T 56 අවියකුත් රැගෙනයන්න නිලධාරීන්ට උපදෙස් ලබා දුන්නා

ප්‍ර; ආසන්න වශයෙන් ඔබ කියට පමණද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පිටත්වුනේ?

පි: මම ස්වාමිනි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේන් පැය.14 ට පමණ පිටව ගියා.

ප්‍ර: ඔබට පැය කීයට පමණ අදාල මහවිල උද්‍යානය ස්ථානයට ළඟා වෙන්න හැකියාවක් ලැබුනද?

පි: ස්වාමිනි මගේ සටහන් අනුව පැය.14.20 ට එම ස්ථානයට පැමිණියා සටහන් යොදලා තියෙනවා නමුත් ස්වාමිනි පසුව කරන ලද විමර්ශනවලදී එම වේලාව පැය 14.30 පමණ විය යුතු බවට නිවැරදිය යුතු බවට විමර්ශනයේදී අනාවරණය වුනා ස්වාමිනි.

ප්‍ර; දැන ඔබ මහවිල උද්‍යානයේ අදාල ඒ වරිපනම් අංකය පිහිටි නිවස සොයාගත්තද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: කුමක්ද ඒ නැවත අංකය කියන්නේ ඒ නිවසේ?

පි: ස්වාමිනි 658/90 මහවිල උද්‍යානය.

ප්‍ර: කොහොමද නිවස සොයා ගත්තේ?

FAIR COMMENT
BY JEZEEM

පි: එම නිවසේ ස්වාමිනි තාප්පය ඒ කියන්නේ ප්‍රධාන පිවිසුම ආසන්නයේ තාප්පයේ අදාළ අංකය නිවසේ අංකය සටහන් කරලා තියෙනවා.

ප්‍ර: අදාල ස්ථානය ළඟා වුනාට පස්සේ මහත්මයා මොන ආකාරයට ද ක්‍රියා කලේ ?

පි: ස්වාමිනි අදාල ස්ථානයට ළඟා වෙන අවස්ථාවේදී එම ස්ථානයේ තවත් නිලධාරීන් කණ්ඩායමක් හිටියා පොලිස් ජීප් රථයක් නවතා තිබුණා ස්වාමිනි. එම නිලධාරීන් සිවිල් ඇඳුමින් සැරසිලා සිටියා කෙසේ හෝ එම නිලධාරීන් පොලිස් නිලධාරීන් බවට මා හඳුනා ගත්තා.

ප්‍ර; ඒ අයව කුමන අංශයකට අනුයුක්ත නිලධාරීන් ද කියලා ඔබ හඳුන ගත්තාද?

පි: පසුව ස්වාමිනි මන් හඳුනා ගත්තා එම පුද්ගලයින් කොළඹ අපරාධ කොට්ඨාශයට යන අනුක්ත නිලධාරීන් බව.

ප්‍ර: එහි ප්‍රධාන නිලධාරී කණ්ඩායමේ ප්‍රධාන නිලධාරියා වශයෙන් කවුද කටයුතු කරේ?

පි: ප්‍රධාන නිලධාරියා වශයෙන් උප පොලිස් පරීක්ෂක රෝහණ බණ්ඩාර නිලධාරියා කටයුතු කලා කියනවා ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබ ඒ ස්ථානයට ගියාට පස්සේ මොනවද ඔබට දක්නට ලැබුණේ?

පි: ස්වාමිනි එම ස්ථානයේ ප්‍රථමයෙන්ම අදාල කොළඹ අපරාධ කොට්ඨාශ නිලධාරීන් නිවසට ඇතුලු වුනා. ඔවුන්ට පසුපසින් ස්වාමිනි මා ඇතුලු නිලධාරීන් කණ්ඩායම අදාල නිවස ඇතුලට ඇතුලු වුනා.

ප්‍ර: නිවස කොයි වගේ නිවසක්ද?

පි: එම නිවස ස්වාමිනි තෙමහල් නිවසක් තෙමහල් නිවසක්.

ප්‍ර: වටේට තාප්ප ?

පි: නිවස වටේට තාප්ප තියෙනවා ස්වාමිනි. තාප්ප හදලා තියෙනවා ස්වාමිනි නිවසට ඇතුලු වීමට කුඩා සමානය ගේට්ටුවක් තියෙනවා ස්වාමිනි.

ප්‍ර: පොලිස් නිලධාරීන් අදාල ස්ථානයට යන අවස්ථාවේදී ගේට්ටු කොහොමද තිබුණේ?

පි; ස්වාමිනි මම සහ අවස්ථාවේදී ගේට්ටුව විවෘත කරලා තිබුණේ එතකොට කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් ඇතුලුවුනා ඉන් අනතුරුව තමයි ස්වාමිනි මම අතුලු වුනේ.

ප්‍ර: ඔබ නිවස ඇතුලට ගිහිල්ලා නිවස ඇතුලට ගියාට පස්සේ මහත්මයාට මොනවාද දක්නට ලැබුනේ?

පි: ස්වාමිනි නිවසේ පහල මහලයේ එම නිවසේ සිටින පුද්ගලයින් හඳුන ගන්න පුළුවන් වුනා. නිවසේ පුද්ගලයින් සැලකියුතු ප්‍රමාණයක් හිටියා පහල තට්ටුවේ ඒ අවස්ථාවේ දී මම දැක්කා කොළඹ අපරාධ කොට්ඨාශයෙන් ආපු නිලධාරීන් කණ්ඩායමක් ඉහල මහලයට නගිනවා.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: ඔබ නිවසේ හිමි කරු කවුද කියලා ඒ අවස්ථාවේදී ඇහුවාද හොයලා බැලුවාද?

පි: ස්වාමිනි මගේ අවශ්‍යතාවය තිබුණේ මහ ෂැංග්‍රිලා හෝටලයේ ප්‍රහාර එල්ල කරපු පුද්ගලයින් දෙදෙනා මෙම නිවසට කිසියම් සම්බන්ධතාවයක් තිබේද නැද්ද කියන එක හඳුනා ගැනීම.

ප්‍ර: ඒ අනුව ස්වාමිනි මම එම නිවසේ හිමි කවුද කියලා ප්‍රශ්න කරලා ඔහු හඳුන ගත්තා යුෂුෆ් මොහොමඩ් ඊබ්‍රාහිම් යන අය බව .

ප්‍ර: ඔබ එම පුද්ගලයන් එක්ක කතා කරාද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඉන්පසු මම තීරණය කළේ ඔහුගෙන් ප්‍රශ්න කිරීමට ඒ අනුව ස්වාමිනි නිවසට ඇතුලු වුන ස්ථානයේ තිබුණා හාන්සි පුටුවක් සහ තවත් පුටුවක් ඒ හාන්සි පුටුවේ මම වාඩිවෙලා ඊබ්‍රාහිම් යන පුද්ගලයා සමඟ ඔහුගෙන් ප්‍රශ්න කරමින් හිටියා ස්වාමිනි.

ප්‍ර: මොනවාද ඔබ ප්‍රශ්න කළේ?මොනවාද ඇහුවේ ඔබ?

පි: ප්‍රථමයෙන් ස්වාමිනි මම ඊබ්‍රාහිම් යන පුද්ගලයාගේ විස්තර ලබා ගත්තා ඉන් අනතුරුව මම නිවසේ සිටින පුද්ගලයින් එක එක පුද්ගලයින් සම්බන්ධ සටහන් ලියමින් හිටියේ ස්වාමිනි.

ප්‍ර දැන් ඔබ කිව්වා ඔබ දැක්කා කියලා කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් පඩි පෙල දිගේ උඩට යනවා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබ ඔය යුසුෆ් ඊබ්‍රාහිම් කියන පුද්ගලයා සමඟ නිවසට ඇතුලු වෙල්වෙලා ආසන්න වශයෙන් කොපමණ වෙලාවක් පමණ ඔබට කතා කරන්න මුල් අවස්ථාවේදී වෙලාව ලැබුණාද?

පි: ස්වාමිනි මම ඇවිල්ලා විශාල කාලයක් නෙමේ විනාඩි 05,10 ක් අතර කාලසීමාවක් විය යුතුයි. ඒ වෙලාවේ ප්‍රශ්න කරමින් ඉන්න කොට තමයි ස්වාමිනි විශාල පිපිරිමක් සමඟ අදාළ බෝම්බ පිපිරිම සිද්ධ වුනේ.

ප්‍ර: කොහේද බෝම්බ පිපිරිම සිදු වුනේ?

පි: ස්වාමිනි නිවසට ඉහලින් තමයි ප්‍රහාරය බොම්බ ප්‍රහාරය එල්ල වුනේ. නමුත් කුමන මහලකින් එල්ල වුනාද කියලා මට හරියටම නිශ්චිතව කියන්න හැකියාවක් තිබුන් නැහැ ස්වාමිනි.

ප්‍ර: ඒ අවස්තාවේදී ඔබ මොකද කළේ?

පි: බෝම්බ ප්‍රහාරය එල්ල වීමත් සමඟ ස්වාමිනි මේ අනපේක්ෂිත සිදු වීමක් ඉන් අනතුරුව මං ස්වාමිනි පිටතට දුවගෙන ආවා ඒ වගේම එම නිවසේ ඇතුලේ හිටපු අනෙකුත් නිලධාරීනුත් නිවසේ හිටි අනෙක් පුද්ගලයෝත් පිටතට පැමිණියා ස්වාමිනි.

ප්‍ර; ඔබ ඒ ඉන් පස්සේ ඇතුලත සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට උත්සහ කරාද?

FAIR COMMENT BY JEZEEM

පි; ඉන් පසුව ස්වාමිනි නිවසේ පිටත සිට එම නිවසේ සිදුවුන ස්ථානයේ සිදුවීම සම්බන්ධව සෑහෙනව වෙලාවක් විනාඩි 10 ක් වගේ කාල සීමාවක් ස්වාමිනි. නිරීක්ෂණය කරා. නිරීක්ෂණය කරලා ස්වාමිනි මම තිරණ කර මොකද ඒ වන විටත් කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් නැවත නිවසින් පල්ලෙහායාට ඉහලට ගිය නිලධාරීන් පල්ලෙහාට ආවේ නැහැ. මම හිතුවා ඒ නිලධාරීන්ට යම් කිසි අනතුරක් සිද්ධවෙලා ඇති කියලා හිතලා ස්වාමිනි මම නිවසේ ඉහල මහලේට යන්න තිරණය කරා.

ප්‍ර; කොහොමද යන්න තීරණය කරේ?

පි: ඒ අනුව ස්වාමිනි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් කොස්තාපල් 73293 භාරයේ කරුණාරත්න නිලධාරියා භාරයේ තිබුණා T56 අවියක් ඒ T56 මම අරගෙන එය වෙඩි තැබීමට හැකි අකාරයෙන් ක්‍රියාත්මකර නිවසේ පළමු මහළට ප්‍රථමයෙන්ම පිටව ගියා ස්වාමිනි. මාත් සමඟ තවත් නිලධාරීන් කණ්ඩායමක් ඉහළට ආවා.

ප්‍ර: කවුද ඒ අනිත් නිලධාරීන්?

පි; මට ස්වාමිනි ඒ නිලධාරීන්ගේ නම් හරියට කියන්න හැකියාවක් නැහැ මේ අවස්ථාවේ නිලධාරීන් කණ්ඩායමක් පසු පසින් ආ බව මට හොඳට මතකයි.

ප්‍ර: මොනවාද ඔබට ඒ පළවෙනි මහලට යන අවස්ථාවේ දී දක්නට ලැබුනේ?

පි; පළමු මහල ස්වාමිනි ඒ අවස්ථාව වන විටත් ගිනි ගනිමින් පැවතුනා ඒ වගේම මම දැක්කා පළමු මහලේ තමයි මේ බෝම්බ පිපිරීම සිදුවීම තිබෙන්නේ කියා එතකොට පලමු මහලේ බිත්ති කඩාගෙන වැටිලා තිබ්බා ස්වාමිනි. එසේ වුවත් තුවාලකරුවන් කිසිවකු මට නිරීක්ෂණය වුනේ නැහැ

ප්‍ර; ඔබ ඒ ස්ථානයේ කොපමණ වේලාවක් රැඳිලා හිටියාද?

පි: ඉන් පසුව ස්වාමිනි මම නිවසේ තුන්වන මහලටත් ගියා තුන් වන මහලට ගිහිල්ලා තුන්වන මහලත් පරීක්ෂා කරා එම මහලේත් කිසිවකු නිරීක්ෂණය වුනේ නැහැ. පසුව මා නිවසින් පළමු මහල හරහා නිවසේ පහලට මහල පැමිණියා ස්වාමිනි.

ප්‍ර: ඉන් අනතුරුව ඔබ යම් කිසි ආරක්ෂිත ක්‍රියාමාර්ගයක් ගන්න පියවර ගත්තාද?

පි: ඉන් අනතුරුව ස්වාමිනි නිවසේ පහල මහලට පැමිණිලා ස්වාමිනි මම තිරණය කළා පළමු මහලේ විශාල ගින්නක් ඇති වී ඇති බැවින් නිවසේ ප්‍රධාන විදුලි සැපයුම විසන්ධි කල යුතු බව.

ප්‍ර: ඒ අවස්ථාවේදී මොකක්ද මහත්මයා ගත් ක්‍රියාමාර්ගය?

පි: ඒ සඳහා ප්‍රථමයෙන්ම මං පරීක්ෂා කලා නිවසේ කොහේද ප්‍රධාන විදුලි සැපයුම තියෙන්නේ කියලා. මට ඒක හරියට හොයා ගන්න බැරිවුනා ස්වාමිනි. පසුව මම නැවත එළියට පැමිණිලා නිවසේ හිමිකරුවන යුසුෆ්

Police Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මොහොමඩ් ඊබ්‍රාහිම් යන අය ගෙන්වා ගෙන නිවසේ ප්‍රධාන විදුලි සුවිචය සොයා ගැනීමට තීරණය කරා ස්වාමිනි.

ප්‍ර; ඔහු එහිදි ඔබට සහයෝගය ලබා දුන්නාද?

පි: එහෙමයි ස්වාමිනි ඔහු මට විදුලි සැපයුම පෙන්වා දුන්නා ඒ අනුව මම එම ස්ථානයට ගිහිල්ලා ස්වාමිනි මගේ අතින්ම එම විදුලි සුවිචය විසන්දි කිරීමට කටයුතු කරා.

ප්‍ර; ඉන් අනතුරුව ඔබ නැවතත් අදාල ස්ථානයේම විමර්ශන කටයුතු ආරම්භ කරනු ලැබුවාද?

පි: ස්වාමිනි එම ස්ථානයේ විදුලි සැපයුම විසන්දි කරලා මට මතකයි සුළු වැඩි වෙලාවක් ගත වුනේ නැහැ ඉතාමත් සුළු කාලයක් ඇතුලත නැවත පිපිරිමක් සිද්ධ වුනා ස්වාමිනි නිවසේ ඉහල මහලෙන්.

ප්‍ර; ඒ දෙවන පිපිරීම සිදු වන අවස්ථාවේදී ඔබ කොහේද හිටියේ ?

පි: එතකොට මම ස්වාමිනි පහළ මහලේ හිටියේ.

ප්‍ර; නිවස තුල වෙන කවුද හිටියේ ඒ අවස්ථාවේදී?

පි: නිවස තුල ස්වාමිනි ඒ අවස්ථාවේදී පොලිස් නිලධාරීන් හිටියා මා සමඟ යුසුෆ් මොහොමඩ් ඊබ්‍රාහිම් කියන පුද්ගලයාත් හිටියා ස්වාමිනි.

ප්‍ර; දැන් නිවසේ හිමි කරු යුසුෆ් ඊබ්‍රාහිම් කියන පුද්ගලයා සහ නිවසේ සිටි අය සම්බන්ධයෙන් මොකක්ද මහත්මයා ගත්ත ක්‍රියාමාර්ග?

පි: ස්වාමිනි එම පුද්ගලයින් පොලිස් නිලධාරීන් භාරයේ බිම වාඩි කරලා තිබුනේ ඒ අවස්ථාවේ ඔවුන්ව නිවසින් පිටතට අරගෙන ගිහිල්ලා ආරක්ෂිතව තියාගෙන හිටියා ස්වාමිනි. එවැනි මෙම සම්බන්ධයෙන් ඒ වන විටත් මම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සහ එවකට අධ්‍යක්ෂව සිටි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ශානී අබේසේකර යන මහත්වරුන්ට දැනුම් දීමක් කරා ස්වාමිනි.

ප්‍ර: ඔබේ දැනුම් දීම අනුව වෙනත් අංශවලට අයත් නිලධාරීන් අදාළ ස්ථානයට ළඟා වුනාද?

පි; එහෙමයි ස්වාමිනි. එම අවස්ථාවේ පොලිස් විශේෂ කාර්ය බලකාය ඒ වගේම ගිනි නිවන හමුදාව සහ කොළඹ අපරාධ කොට්ඨාශය අධ්‍යක්ෂක තුමා එවකට පොලිස් අධිකාරි උදය හේමන්ත මහතා ඇතුලු කණ්ඩායමක් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස් පති අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව රවි සෙනවිරත්න මහතා ඇතුලු කණ්ඩායමක් එම ස්ථානයට පැමිණියා.මේ සිද්ධියට අදාලව අපරාධ ස්ථානයේ යම් කිසි පුද්ගලයයෙක් හෝ පුද්ගලයන් පිරිසක් ඔබ විසින් අත්අඩංගුවට ගෙන තිබෙනවාද?

පි: මම අත්අඩංගුවට ගැනීමක් කලේ නැහැ ස්වාමිනි නමුත් මාත් සමඟ ගියපු උපපොලිස් පරීක්ෂ කිසෝර් යන නිලධාරියා පුද්ගලයින් පිරිසක් අත්අඩගංගුවට ගත්තා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර; සිද්ධියට අදාළව රාජකාරී කටයුතු කරන්න අපරාධ පරීක්ෂාණාගාර නිලධාරීන් සො.කෝ නිලධාරීනුත් අදාළ ස්ථානයට පැමිණ තිබුණාද?

පි: එහෙමයි ස්වාමිනි මෙම අවස්ථාව වන විට දෙමටගොඩ පොලිස් ස්ථානාධිපති වරයා පොලිස් ස්ථානයට පැමිණ සිටියා ඔවුන් එවැනි අවස්ථාවේ ඔවුන් අපරාධ ස්ථානය ආරක්ෂා කිරීමට කටයුතු කල්ලා සො.කෝ නිලධාරීන් අපරාධ ස්ථානයට ගෙන්වීමට කටයුතු කරා ස්වාමිනි.

ප්‍ර: අපරාධ ස්ථානයට අදාළ නඩු භාණ්ඩ පොලිසිය භාරයට ගැනීම ඒ අනුව සිදු කරනු ලැබුවාද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: සියළුම නඩු භාණ්ඩ භාරයට ගැනීම ඒ අනුව සිදු කරාද?

පි: එහෙමයි ස්වාමිනි. සියලුම නඩු භාණ්ඩ භාරයට ගත්තේ සොකෝ නිලධාරීන් මාර්ගයෙන් ස්වාමිනි.

ප්‍ර: මෙම දෙමටගොඩ මහවිල උද්‍යානයේ සිදුවෙච්ච බෝම්බ පිපිරීමට අදාල වැඩිදුර විමර්ශන කටයුතු සිදු කරනු ලැබුවේ කවර අංශයක් විසින්ද?

පි; ස්වාමිනි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මිනිමැරුම් විමර්ශනය අංශයට තමිමෙම අපරාධය සම්බන්ධයෙන් විමර්ශන කටයුතු පැවරුණේ.

ප්‍ර: ඒ අනුව වැඩිදුර විමර්ශන කටයුතු කර ගෙන යනු ලැබුවාද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර; අද වන විටත් වැඩිදුර විමර්ශන කටයුතු සිදු කරනු ලබනවාද?

පි: මා දන්නා පරිදි ස්වාමිනි මා දැනට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්තව නැහැ. එසේ වුවද මා ස්ථාන මාරුවීම් ලබා පිටව යනතෙක් අදාල විමර්ශන කටයුතු පැවතුනා මගේ දැනුම පරිදි තවම විමර්ශන කටයුතු සිදු කරමින් පවතිනවා ස්වාමිනි.

ප්‍ර; දැන් ඒ අපරාධ ස්ථානයට අදාලව CCTV දර්ශන ලබා ගන්න කියලා ඔබ නිලධාරීන්ට උපදෙස් ලබා දුන්නාද?

පි; එසේය ස්වාමිනි. අදාල ඒ අපරාධ ස්ථානය නිරීක්ෂණය වන තිබිච්ච සියලුම CCTV කැමරා වලට ආදළ DVR අදාළ සහ උපකරණ ලබා ගැනීමට මම නිලධාරීන්ට නියෝග කලා ස්වාමිනි.

ප්‍ර; ඒ අනුව විමර්ශනයේදී CCTV දර්ශන ලබා ගැනීමක් සිදු කර තිබෙනවාද?

පි; එහෙමයි ස්වාමිනි මෙම අංක 658 /90 දරණ නිවස ඉදිරිපිට එම නිවසේ ඉදිරිපිට පදිංචි අබ්දුල් ලතීෆ් හකීම් මොහොමඩ් යන පුද්ගලයා දැනට අපේ අත්අඩංලගුවේ සිටින පුද්ගලයෙක් ස්වාමිනි ඔහුගේ නිවස අංක 658/39 A මහවිල උද්‍යානය දෙමටගොඩ ලිපිනයේ සවිකර තිබූ CCTV දර්ශන සහ දර්ශන ඇතුලත් DVR යන්ත්‍රය භාරයට ගත්තා ස්වාමීනි.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

දැන් වේලාව ප.ව.4.30
මෙතැන් සිට: ඉන්ද්‍රානි මිය.

පෙර සටහන් කළේ චන්දිමා මෙය
දැන් වේලාව : ප.ව. 4.10 යි
මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ නයනා සෙනෙවිරත්න මිය :

ප්‍ර : ඒ CCTV දර්ශන භාරව කවර නිලධාරියෙක්ද කටයුතු කරන්නේ?

පි : එම වගකීම් කොටස ස්වාමීනි ප්‍රධාන වශයෙන්ම කාන්තා උප පොලිස් පරීක්ෂකවරියකට වෙත්තසිංහ නිලධාරිනියට මම පැවරීමක් කළා ස්වාමීනි. ඊට අමතරව උප පොලිස් පරීක්ෂක අයගමත් ඒ සම්බන්ධව කටයුතු කළා ස්වාමීනි.

ප්‍ර : දැන් එකී CCTV දර්ශන නැවත මහත්මයා දැක්කෝතින් ඒක පරීක්ෂා කරලා බලලා ඒ අදාළ සිද්ධිය සම්බන්ධයෙන් වැඩිදුරටත් ඔබට සාක්ෂි ලබා දෙන්න හැකියාවක් තියෙනවද?

පි : එහෙමයි ස්වාමීනි.

(මේ අවස්ථාවේදී දැන්ටමත් C-546 වශයෙන් ලකුණු කර ඇති CD තැටියක අඩංගු CCTV කැමරා දර්ශන සාක්ෂිකරුට පෙන්වීමට අවසර ඉල්ලා සිටිනවා)

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මහත්මයා මේ අවස්ථාවේදී ඔබට දර්ශනය වන දේ සම්බන්ධයෙන් පැහැදිලි කරන්න?

පි : කොළඹ අපරාධ කොට්ඨාශයෙන් පැමිණි නිලධාරීන් ස්වාමීනි මෙම ජීප් රථයෙන් තමයි පැමිණ තිබුණේ. ඔවුන් තමයි ඔය ඉස්සරලාම නිවසට ඇතුල්වීමට උත්සාහ කරන්නේ.

ප්‍ර : දැන් මහත්මයා නිල් පැහැති කාර් රථයක් අදාළ ස්ථානයට ළඟා වෙනවා ඔබට දර්ශනය වෙනවාද?

පි : එහෙමයි ස්වාමීනි. එම කාර් රථය ස්වාමීනි මම පැමිණි කාර් රථය. මා ඇතුළු නිලධාරීන් පැමිණි කාර් රථය ස්වාමීනි.

ප්‍ර : දැන් ඉදිරි අසුනෙන් යම්කිසි පුද්ගලයෙක් බහිනවා ඔබට දර්ශනය වෙනවාද?

පි : ඒ මා ස්වාමීනි.

ප්‍ර : මොනවද ඔබ ඇඳගෙන ඉන්නේ?

පි : ස්වාමීනි රතු පාටට හුරු ෂර්ට් එකක් තමයි මම ඇඳගෙන ඉන්නේ. අතේ තියෙනවා මගේ Note book එක ස්වාමීනි. නිවසේ දොර විවෘත කළා ස්වාමීනි. ඉන් අනතුරුව ප්‍රථමයෙන්ම ස්වාමීනි කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් නිවස ඇතුළට යනවා. පසුව මම සහ නිලධාරීන් කණ්ඩායම ඇතුළට යනවා ස්වාමීනි.

ප්‍ර : CCTV දර්ශන අනුව, ඔබ පැය 2.31 ආසන්න කාලයකදී අදාළ ස්ථානයට 2.32, පැය 14 යි විනාඩි 32 කක ආසන්න කාලයේදී අදාළ ස්ථානයට ළඟා වී ඇති බවට CCTV දර්ශන අනුව පෙනී යනවා කියලා කිව්වොත් ඒක හරිද?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබ කිව්වා මේ නිවසේ හිමිකරු යූසුෆ් ඊබ්‍රාහිම් මොහොමඩ් යන අය සමඟ ඔබ සාකච්ඡා කළයි කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ ඔබට මෙතනදී පේනවද පැහැදිලි කරන්න පුළුවන්ද ඔබ කොතන ඉඳන්ද කථා කළේ කියලා?

පි : ස්වාමීනි ඔතන රතු පාට සහ සුදු පාට ටීෂර්ට් එකක් ඇඳන් ඉන්න පුද්ගලයාට ඉදිරියෙන්, මීටර් පහක් විතර ඉදිරියෙන් තියෙනවා ස්වාමීනි වම් අත පැත්තට වෙන්න තිබුණා හාන්සි පුටුවක්. ඊට ඉදිරියෙන් තිබුණා තව පුටුවක්. අන්න එතන තමයි මම ප්‍රශ්න කළේ. පළමුබෝම්බ ප්‍රහාරය ස්වාමීනි. ඒකෙන් පස්සේ ඉස්සරලාම එන්නේ මෙතන ඉන්නේ මම ස්වාමීනි රතු පාට.

ප්‍ර : මේ යන පුද්ගලයා ඔබට විමර්ශනයේදී හඳුනා ගන්න ලැබුණද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමීනි. මොහු අප විසින් අත් අඩංගුවට ගන්නා ලද අබ්දුල් ලතීෆ් මොහොමඩ් හකීම් කියන පුද්ගලයා ස්වාමීනි.

ප්‍ර : ඔබ මේ අවස්ථාවේදී කුමක්ද කරන්නේ?

පි : ස්වාමීනි මම ඒ පුද්ගලයින්ට, අර යූසුෆ් මොහොමඩ් ඊබ්‍රාහිම් කියන නිවසේ හිමිකරුට කථා කරනවා ස්වාමීනි.

ප්‍ර : ඔබ මොනවද කථා කළේ ඒ අවස්ථාවේදී?

පි : ඔහුගෙන් ස්වාමීනි මම විමසීමක් කරනවා නිවසේ ඉහළ මහලයේ සිටියේ කවුද කියලා.

ප්‍ර : මොනවද ඔබට දැන ගන්නට ලැබුණේ ඒ අවස්ථාවේදී?

පි : ඒ අනුව මට දැන ගන්නට ලැබුණා නිවසේ ඉහළ මහලයේ ඉල්හාම් අහමඩ් යන අයගේ බිරිඳ ෆාතිමා ජින්රි යන අය තමාගේ දරුවන් සමඟ රැඳී සිටි බව.

ප්‍ර : එසේම ඔබ ඒ ස්ථානයට ආපු ප්‍රධානම කාරණය තමයි අර ෂැන්ග්‍රිලා හෝටලයේ ලබා දීලා තිබිච්ච ලිපිනය?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ ලිපිනයේ නම සඳහන් පුද්ගලයන් සහ නිවස අතර සම්බන්ධතාවයක් තියෙනවද කියලා ඔබ හොයලා බැලුවද? විමසලා හිටියද?

පි : එහෙමයි ස්වාමීනි. මේ අවස්ථාව වනවිට මට දැන ගන්න ලැබුණා ෂැන්ග්‍රිලා හෝටලයේ බෝම්බ ප්‍රහාරය එල්ල කරන ලද මොහොමඩ් ඊබ්‍රාහිම් ඉල්හාම් අහමඩ් යන අය මෙම නිවසේ පුද්ගලයෙකු බව.

ප්‍ර : පුද්ගලයෙක් කියන්නේ නිවසේ හිමිකරුත් සමඟ මොකද්ද සම්බන්ධය?

පි : නිවසේ හිමිකරුගේ දරුවෙකු බව ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබට මේ අවස්ථාවේදී දර්ශනය වුණාද යම්කිසි පුද්ගලයින් දෙදෙනෙක් පොලිස් නිලධාරීන් විසින් අත් අඩංගුවට ගෙන ඒ ස්ථානයෙන් ඉවත් කරනවා?

පි : ස්වාමීනි මගේ දැනුමේ හැටියට ඔය කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් තමයි ඔය පුද්ගලයන් අරගෙන යන්නේ.

****

ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා :

ප්‍ර : මේ මොහොතේ ඔබට මොනවද හිතුණේ?

පි : ස්වාමීනි මම විශේෂ කාර්ය බලකායෙත් මේ ආකාරයටම 1996 මාර්තු 11 ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක් වුණා. එතකොට ස්වාමීනි මෙතනදී විශේෂයෙන්ම මා විශාල තැතිගැන්මක් තිබුණා

FAIR COMMENT BY JEZEEM

විශේෂයෙන්ම ඇත්තටම මේ බෝම්බ ප්‍රහාරයෙන් අපගේ ජීවිත බේරුණේ අපගේ පූරුවේ පිනකට කියලා ස්වාමීනි. ඇත්තටම මේ අවස්ථාවේ මම නිලධාරීන්ගේ ආරක්ෂාව සම්බන්ධවත් විශේෂයෙන් අවධානය යොමු කළා. මොකද බෝම්බ ප්‍රහාරයක් එල්ල කරපු නිවසක්. එතකොට ඒ කෙසේ වෙතත් ස්වාමීනි ඉහළ මාලයට ගිය නිලධාරීන් නැවත නොපැමිණීම තමයි අපිට තිබිච්ච ලොකුම ප්‍රශ්නය. ඒ අනුව තමයි ස්වාමීනි පසුව මම තීරණය කරන්නේ ඉහළ මහලයට යන්න.

ප : ඒ බෝම්බ පිපිරිච්ච ශබ්දය මුළු පළාතම දෙදරුම් කනවා වගේ විශාල ශබ්දයක් වුණාද?

පි : එහෙමයි ස්වාමීනි. අපගේ කන් අගුල් වැටුණා ස්වාමීනි. එතරම් විශාල ශබ්දයක් ස්වාමීනි ඒ පළමු බෝම්බ ප්‍රහාරය.

ප : ඒ මොහොතේ එතන හිටපු ජ්‍යෙෂ්ඨතම නිලධාරියා ඔබ නේද?

පි : එහෙමයි ස්වාමීනි.

ප : ඔබ මොකද කළේ ඒ වෙලාවේ?

පි : ස්වාමීනි ඒ වෙලාවේ මම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමාට සහ එවකට අධ්‍යක්ෂව සිටි ශානි අබේසේකර යන මහත්වරුන්ට දුරකථනය ඔස්සේ මේ සම්බන්ධව දැනුම් දීමක් කරනවා, නිලධාරීන් කණ්ඩායම් එවන්න කියලා ස්වාමීනි.

ප : දැන් අර ඉහළට ගිය නිලධාරීන්ට මොකද වුණේ කියන එක පිළිබඳව ඔබ කනස්සල්ලෙන් පසු වෙන්න ඇති නේද?

පි : එහෙමයි ස්වාමීනි.

ප : ඔබට තියෙන අත්දැකීම් අනුව එයාලට මොකද වුණේ කියන එක හොයන්න උඩට යන්න හිතුණේ නැහැ?

පි : ස්වාමීනි උඩට යන්න හිතුණා. ඒ අනුව තමයි මම දෙවෙනි වතාවට උඩට යන්නේ. නමුත් මම ඉස්සරලාම නිරීක්ෂණය කරනවා මෙතන මොකද්ද වෙන්නේ. බෝම්බ ප්‍රහාරයක් වෙච්ච තැනක්. මේ වෙලාවේ තවත් නිලධාරියෙක්ගේ ජීවිතය අනතුරට දානවද නැද්ද කියලා මට තීරණය ගන්න සිදු වුණා ස්වාමීනි. ඒ අනුව තමයි ස්වාමීනි මගේ ජීවිතය ගැන හිතන්නේ නැතුව මම ඊට පස්සේ යන්නේ ස්වාමීනි. මේ අවස්ථාවේ ස්වාමීනි මම තීරණය කරනවා නිවසේ ඉහළ මහලයට යන්න අර නිලධාරියෙක්ගේ T-56 අවියක් මම ගන්නවා. ඒ T-56 අවියත් අරගෙන ස්වාමීනි මම යනවා ඉහළ මහලයට. මාත් සමඟ නිලධාරීන් කණ්ඩායමකුත් පිටි පස්සෙන් ඉහළට එනවා.

****

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය :

ප්‍ර : දැන් ඔබ ඉහළ මහලයට ගියාට පස්සේ ඒ අවස්ථාවේදී මොනවද ඔබට දැක ගන්නට ලැබුණේ?

පි : ඉහළ මහලයට ගියාම ස්වාමීනි ඉහළ මහලයේ ඒ බෝම්බ ප්‍රහාරයෙන් ගිණි ගනිමින් පැවතුණේ ස්වාමීනි ඒ අවස්ථාවේ. බිත්ති කඩාගෙන වැටිලා තිබ්බා ස්වාමීනි. කිසිදු පුද්ගලයෙකු නිරීක්ෂණය වුණේ නැහැ. පසුව නිවසේ තුන්වෙනි මහලටත් ගියා ස්වාමීනි. එම මහලෙත් කිසිවෙකු නිරීක්ෂණය වුණේ නැහැ.

ප්‍ර : දැන් ඔබ කිව්වා මේ නිවසේ හිමිකරු යූසුෆ් ඊබ්‍රාහිම් මොහොමඩ් යන අයව ඔබ නිවසට නැවත කැඳවගෙන ගිහිල්ලා මේ විදුලි ස්විචය ක්‍රියා විරහිත කරන්න ඔබ කටයුතු කළා කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ බෝම්බ ප්‍රහාර දෙකටම පස්සෙද? නැත්නම් පළවෙනි එකෙන් පස්සේද?

පි : දෙවෙනි බෝම්බ ප්‍රහාරයට පස්සේ ස්වාමීනි. සමාවෙන්න ස්වාමීනි පළවෙනි බෝම්බ ප්‍රහාරයෙන් පස්සේ.

****

ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා :

ප්‍ර : අර කවුද උඩ ඉන්නේ?

පි : ස්වාමීනි මාත් සමඟ ඉහළට පැමිණි නිලධාරියෙක්, පොලිස් නිලධාරියෙක් ස්වාමීනි.

ප්‍ර : දැන් මේ අවස්ථාවේදී මුළු ගෙදරම ඇතුළේ දුම පිරිලද?

පි : පළමු මහලේ දුම් පිරිලා තිබුණේ. බිත්ති කඩන් වැටිලා තිබ්බේ ස්වාමීනි.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : ඔබ මේ අවස්ථාව වනවිට මේ නිවසේ සියළුම මහල් පරීක්ෂාවට සිදු කරලා ඉවර වුණාද?

පි : ස්වාමීනි සම්පූර්ණ පරීක්ෂාවක් නෙමෙයි. නමුත් Randomly පරීක්ෂාවක් කරා ස්වාමීනි පුද්ගලයින් සිටිනවද කියලා, සැක කටයුතු පුද්ගලයින් සිටිනවද කියලා.

ප්‍ර : ඔබගේ පරීක්ෂාවේදී මොකද්ද අනාවරණය වුණේ?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : කිසිම පුද්ගලයෙක් ස්වාමීනි නිවසේ කිසිම මහලක පේන්න හිටියේ නැහැ ස්වාමීනි.

****

ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා :

ප්‍ර : දෙවෙනි බෝම්බයේ ප්‍රබලත්වය අඩුයිද?

පි : දෙවෙනි බෝම්බය පළවෙනි බෝම්බයත් එක්ක සංසන්දනය කරලා බලනකොට කිසියම් බෝම්බය පිපිරීමේ ප්‍රමාණය, ඒක පිපිරීමේ අර Effect එක ටිකක් අඩුයි වගේ ස්වාමීනි.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : සාක්ෂිකරු දැන් ඔබ විස්තර කළ පරිදි අප්‍රේල් 21 වෙනිදා ඔය මහවිල උද්‍යානයේ ඔය නිවසට යනවිට ඔබට ඉදිරියෙන් කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් ඒ නිවසට ඇතුල් වුණා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එම නිලධාරී කණ්ඩායමේ ප්‍රධානියා වශයෙන් ක්‍රියා කළේ උප පොලිස් පරීක්ෂක බණ්ඩාර?

පි : රෝහණ බණ්ඩාර මහතා.

ප්‍ර : රෝහණ බණ්ඩාර මහතා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔබ නිවසට ඇතුල් වනවිට ඒ උප පොලිස් පරීක්ෂක රෝහණ බණ්ඩාර කොතනද හිටියේ?

පි : මම නිවසට ඇතුල් වෙනකොට ස්වාමීනි මම දැක්කා රෝහණ බණ්ඩාර ඇතුළු කණ්ඩායමක් නිවසේ ඉහළ මහලයට යනවා.

ප්‍ර : ඒ ඉහළ මහලයට ඔවුන්ට යන්න කියලා අණ දුන්නේ ඔබ නෙමෙයි?

පි : නැහැ ස්වාමීනි. අපිට කථා කරන්න අවස්ථාවක් ලැබුණේ නැහැ.

ප්‍ර : කොළඹ අපරාධ පරීක්ෂණ කණ්ඩායම කොට්ඨාශයේ අය එහෙමම උඩට ගියා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ ගියහම පස්සේ ඔබට යම් පුද්ගලයෝ කථා කරනවා නැත්නම් යම්කිසි කථා බහක් පළවෙනි මහලෙන් ඔබට ඇහෙනවද?

පි : පළමු මහලයේ වෙන කිසිම ශබ්දයක් මට ඇහුණේ නැහැ. මොකද මම නිවසට ඇතුල් වෙලත් නැහැ ස්වාමීනි. ඇතුල් වෙන තැන සාලයේ තමයි ස්වාමීනි මම ප්‍රශ්න කර කර හිටියේ.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට ඒ සාලයට ඔබ යනවිට ඒ පල්ලෙහා තට්ටුවේ කී දෙනෙක් හිටියද ඔබට මතක?

පි : පල්ලෙහා තට්ටුවේ ස්වාමීනි නිවසේ ....,

ප්‍ර : පල්ලෙහා තට්ටුවේ කියන්නේ බිම් මහලේ?

පි : බිම් මහලේ යූසුෆ් මොහොමඩ් ඊබ්‍රාහිම් සහ ඔහුගේ නෝනා, ඔහුගේ දරුවන් ඇතුළු කණ්ඩායම තමයි ස්වාමීනි හිටියේ.

ප්‍ර : දරුවන්ගේ කවුද කියලා නම් මතකද ඔබට?

පි : එහෙමයි ස්වාමීනි. මොහොමඩ් ඊබ්‍රාහිම් හිජාස් අහමඩ් හිටියා ස්වාමීනි. මොහොමඩ් යූසුෆ් ඊබ්‍රාහිම් ස්වාමීනි. කදීජා ජිනයිදීන් බිබී කියන්නේ ඔහුගේ භාර්යාව ස්වාමීනි. මොහොමඩ් ඊබ්‍රාහිම් ඉජාස් අහමඩ්, උස්ඩා ඉක්බාල් එයාගේ දියණියක් ස්වාමීනි. අනිස් ෆිජාස් කියලා ස්වාමීනි. ෆාතිමා ෂිහාරා කියන්නේ නිවසේ සේවිකාවක්. ඇයගේ පුතුන් දෙදෙනෙක් හිටියා ස්වාමිනි. මොහොමඩ් අනීෆා සිත්ති මර්සියා කියලා ස්වාමීනි. ඊබ්‍රාහිම්ගේ නිවසේ කියලා සේවිකාවක් ඒ හිටියේ ස්වාමීනි. ඊට අමතරව අබ්දුල් ෆරීඩ් ෆරීඩා උම්මා ඒ කියන්නේ ස්වාමීනි අදාළ බෝම්බ ප්‍රහාරය එල්ල කළ බවට සැක කරන ෆාතිමා ජිෆ්රිගේ මව ස්වාමීනි. ඒ කට්ටිය හිටියා ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබ නිවසට ඇතුල් වෙලා ඒ අය සමඟ කථා කරන්න පටන් ගන්න විට ඔබට ඒ කට්ටියගේ හැසිරීම සම්බන්ධයෙන් මොනවද පෙනුණේ, නිරීක්ෂණය වුණේ?

පි : ස්වාමීනි විශාල වෙනසක් නොතේරුණාට ස්වාමීනි ඔවුන් යම්කිසි කලබලකාරී ස්වරූපයකින් සිටි බවට මට තේරුණා. විශාල ලොකු වෙනසක් තිබුණේ නැහැ ස්වාමීනි. නමුත් සාමාන්‍ය තත්ත්වයේ හිටි පුද්ගලයින් බවට මම නිරීක්ෂණය කළේ නැහැ ස්වාමීනි.

ප්‍ර : ඔබ නිවසට ඇතුල් වෙලා, ඔබ කථා කෙරුවේ කාත් සමඟද?

පි : මම කථා කෙරුවේ ස්වාමීනි නිවසේ හිමිකරු යූසුෆ් මොහොමඩ් ඊබ්‍රාහිම් යන පුද්ගලයාත් එක්ක.

ප්‍ර : ඔහු සමඟ පමණයිද ඔබ කථා කළේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබ මේ ස්ථානයට ගිහිල්ලා මේ සිද්ධි දෙකක් වෙනවනේ. ඒ කියන්නේ පළවෙනිම බෝම්බ පිපිරීමක් සිද්ධ වෙනවා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඊට පස්සේ තවත් පිපිරීමක් සිදු වෙනවනේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඊට පස්සේ ඔබ මේ නිවස පරීක්ෂාවකට ලක් කිරීමක් සිදු කරනවද?

FAIR COMMENT — BY JEZEEM

පි : ඊට පස්සේ ස්වාමීනි විමර්ශන කටයුතු පවත්වාගෙන යන අතරතුර අවස්ථා ගණනාවකදී මේ නිවස පරීක්ෂා කරලා තියෙනවා.

ප්‍ර : ඒ කියන්නේ මෙම මහවිල උද්‍යානයේ ඔය නිවස ඉස්සරලාම පරීක්ෂාවට ලක් කරන්නේ ඔබගේ අධීක්ෂණය යටතේද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එම විමර්ශනයේදී මොනවද ඔබට සොයා ගන්න ලැබෙන භාණ්ඩ?

පි : ස්වාමීනි පිපිරීමෙන් පස්සේ ඔබතුමා විමසීමක් කරන්නේ.

ප්‍ර : ඔව්?

පි : ඒ පිපිරීමෙන් පස්සේ ස්වාමීනි අදාළ අපරාධ ස්ථානයේ තිබුණු කිසිම නඩු භාණ්ඩයක් අපේ භාරයට ගත්තේ නැහැ. එම ස්ථානයට SOCO නිලධාරීන් ගෙන්වුවා. ඔවුන් හරහා තමයි නඩු භාණ්ඩ අපේ භාරයට ගත්තේ.

ප්‍ර : එතකොට මුල් භාර ගැනීම ඔබ විසින් නෙමෙයි කරන්නේ ඒ අවස්ථාවේදී?

පි : නැත ස්වාමීනි. SOCO නිලධාරීන් භාරගෙන ඔවුන් අපට භාර දෙනවා ස්වාමීනි.

ප්‍ර : දැන් අප්‍රේල් 21 වෙනිදා මේ මහවිල උද්‍යානයට ගිහිල්ලා ඔබ බිම් මහලේ විස්තර කෙරුවනේ කණ්ඩායමක් හම්බ වුණා කියලා ඒ අවස්ථාවේදී?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එතකොට දැන් ඒ විමර්ශනවල අතරතුරදී එම කණ්ඩායමෙන් යම්කිසි පුද්ගලයෙකු හෝ පුද්ගලයින් අත් අඩංගුවට ගැනීමක් සිදු කරනවද? එහෙම නම් කවුද ඒ?

පි : එම ස්ථානයේ සිටි පුද්ගලයින් 11 දෙනෙකු අත් අඩංගුවට ගැනීමක් සිදු කරනවා මාත් සමඟ ගියපු පොලිස් පරීක්ෂක ක්‍රිසෝද් ප්‍රසාද් විසින්.

ප්‍ර : ඒ අත් අඩංගුවට ගත්ත 11 දෙනාගේ නම් තියෙනවද?

පි : එහෙමයි ස්වාමීනි. පළවෙනි එක්කෙනා ස්වාමීනි යූසුෆ් මොහොමඩ් ඊබ්‍රාහිම්, මොහොමඩ් ඊබ්‍රාහිම් හිජාස් අහමඩ්, මොහොමඩ් යූසුෆ් අෆ්ලාල් අහමඩ්, ජෙම්සිකා මුසීම්, රෙහානා මිෆ්රත්, ජමිල්දීන් නසුරුදීන්, අබ්දුල් කලාම්, සෙයිනුඩාවිත් නසීර් කාන්, මොහොමඩ් හෙයිමුදීන් මොහොමඩ් ෆයිසාර්, මොහොමඩ් නිශාබ්දීන් මොහොමඩ් මොහිදීන් ඊට අමතරව ස්වාමීනි ටී.එම්. මුජීත් නිශාන්ත කියන පුද්ගලයෙකුත් අපි අත් අඩංගුවට ගන්නවා එම ස්ථානයෙන් සැක පිට.

ප්‍ර : දැන් ඔබ කිව්වා මේ ස්ථානයට අදාළව CCTV දර්ශනත් ලබා ගැනීමක් සිදු කෙරුවා කියලා?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව් ස්වාමීනි. එම CCTV අදාළ DVR යන්ත්‍රය අපේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් භාරයට ගත්තා.

ප්‍ර : ඒක ගත්තේ කොයි ගෙදරින්ද?

පි : මෙම බෝම්බ ප්‍රහාරය එල්ල වූ නිවසට ඉදිරිපිට ස්වාමීනි.

ප්‍ර : අංකය සහිතව කියන්න?

පි : අංක 658/39 ඒ, මහවිල උද්‍යානය, දෙමටගොඩ ලිපිනය ස්වාමීනි.

ප්‍ර : එම ස්ථානයේ පදිංචිව ඉන්නේ කවුද?

පි : එම ස්ථානයේ පදිංචිකරු ස්වාමීනි අබ්දුල් ලතීෆ් හකීම් මොහොමඩ්.

ප්‍ර : ඔහුව තමයි මේ යම්කිසි අවස්ථාවක අද ප්‍රදර්ශනය කරපු CD තැටියේ යම් අවස්ථාවල දුටුවේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එම අබ්දුල් ලතීෆ් හකීම් මොහොමඩ් කියන තැනැත්තා සහ මේ සිද්ධියේදී ස්වයං ඝාතනය වුණ තැනැත්තන් අතර යම්කිසි ඥාති සම්බන්ධතාවයක් තියෙනවා කියලා ඔබගේ විමර්ශන අතරතුර ඔබට දැන ගන්නට ලැබෙනවද?

පි : ස්වාමීනි ඥාති සම්බන්ධයක් ගැන අනාවරණය වුණේ නැහැ ස්වාමීනි. එසේ වුවත් ස්වාමීනි මෙම නිවසේ හිමිකරු යූසුෆ් මොහොමඩ් ඊබ්‍රාහිම් සමඟ දැඩි සම්බන්ධතාවයක් තිබුණු බවට කරුණු අනාවරණය වුණා ස්වාමීනි.

****

ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා :

ප්‍ර : සාක්ෂිකරු ඔබ ඒ අවස්ථාවේදී ඒ නිරීක්ෂණය කරන ලද ආකාරයට දැන් මීට පෙර ඔබට තියෙන අත්දැකීම් අනුව ඔය පිපිරිච්ච බෝම්බයත් ඔබ L.T.T.E. ත්‍රස්තවාදී කාලයේ ඒ පිපිරුණු බෝම්බයත් අතර කිසියම් වෙනසක් තිබිච්ච බවක් ඔබට හැඟුණද?

පි : ඒක මට හරියට කියන්න බැහැ ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබට බෝම්බ පිපිරීම් පිළිබඳව අත්දැකීම් තියෙනවනේ?

පි : අත්දැකීම් තියෙනවා ස්වාමීනි. නමුත් ඒක හරියාකාරව මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න බැහැ ස්වාමීනි.

ප්‍ර : ඒකට හේතුව ඔබ ඒ අවස්ථාවේ හිටපු මානසික තත්ත්වයද?

පි : ඒකත් හේතු වෙන්න පුළුවන් ස්වාමීනි. ඒ බෝම්බ අතර වෙනස කියන එක මට පැහැදිලි කරන්න අමාරුයි ස්වාමීනි.

ප්‍ර : සෑම බෝම්බයක්ම පිපිරෙනකොට එක වගේම තමයි?

පි : පිපිරෙනකොට එක වගේ.

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : දැන් මේ සිද්ධිය සිදු වෙනකොට ඒ කියන්නේ අප්‍රේල් 21 වෙනකොට ඔබ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මිනී මැරුම් සම්බන්ධ විමර්ශන ඒකකයේ ප්‍රධානියෙක් හැටියට හිටියා නේද?

පි : අධීක්ෂණ නිලධාරියා වශයෙන් හිටියා ස්වාමීනි.

ප : ඔබට මතකද ඔබේ අංශය විසින් අර වවුනතිව්වල මිය ගිය පොලිස් නිලධාරීන් දෙදෙනා සම්බන්ධයෙනුත් තොරතුරු විමර්ශනය කළා ඒ කාලයේ?

පි : මිනී මැරුම් විමර්ශන අංශයෙන් ඒ සම්බන්ධයෙන් විමර්ශනය කළේ නැහැ ස්වාමීනි.

ප : ඉතිං ඒක මිනී මැරුමක්නේ?

පි : නමුත් ඒ මිනී මැරුමක් වුණාට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විවිධ අංශ තියෙනවා. අපරාධ සම්බන්ධයෙන් විමර්ශනය කරන්න මිනී මැරුම් විමර්ශන අංශය සහ විශේෂ අංශ තියෙනවා ස්වාමීනි. ඊට අමතරව තියෙනවා ස්වාමීනි සමූහ මංකොල්ල විමර්ශන අංශය. ඒ වගේ අංශවලටත් අපරාධ විමර්ශනය භාර දෙනවා.

ප : මිනී මැරුමක් වුණත් ඒක වෙනත් අංශවලට භාර දෙනවා?

පි : එහෙමයි ස්වාමීනි.

ප : ඒ කියන්නේ ඒ පරීක්ෂණ කටයුතු කරන කාලයේ ඔබ ඒ පිළිබඳව සොයා බැලීමක් කළේ නැහැ?

පි : ඒක මගේ අධීක්ෂණය යටතේ නෙමෙයි ස්වාමීනි.

ප : වෙනත් නිලධාරීන් යටතේ?

පි : වෙනත් නිලධාරීන් යටතේ.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප : ඔබට සාක්ෂිකරු ෂැන්ග්‍රිලා හෝටලයේ CCTV කැමරා පරීක්ෂා කිරීමට මුල් අවස්ථාවේදී ඉඩ නොදුන්නේ කුමන හේතුවක් මත කියලා කිව්වද?

පි : ගරු ස්වාමීනි ප්‍රශ්නය පොඩ්ඩක් පැහැදිලි මදියි.

ප : කුමන හේතුවක් මතද මුල් අවස්ථාවේදී ෂැන්ග්‍රිලා හෝටලයේ CCTV කැමරා පරීක්ෂා කිරීමට එහි නිලධාරීන් ඉඩ දුන්නේ නැත්තේ?

පි : ස්වාමීනි ඒක මට හරියට කියන්න බැහැ. නමුත් මට දැන ගන්න ලැබුණා ඒ අවසථාවේ නිලධාරී කණ්ඩායම් කිහිපයක් ඇවිල්ලා අදාළ CCTV කැමරා දර්ශන පරීක්ෂා කරන්න උත්සාහ කරලා

FAIR COMMENT BY JEZEEM

තියෙනවා. නමුත් මේගොල්ලෝ ප්‍රතික්ෂේප කරලා තියෙනවා කියලා. නමුත් මටත් මුල් අවස්ථාවේ ස්වාමීනි ඒකට අවස්ථාව ලබා දුන්නේ නැහැ. ඒ වෙලාවේ තමයි ස්වාමීනි මම පැහැදිලිව ප්‍රකාශ කළේ මට අවස්ථාවක් ලබා නොදුන්නොත් රාජකාරී බාධා කිරීම යටතේ අත් අඩංගුවට ගැනීමක් සිදු කිරීමට වෙන බව.

ප්‍ර : දැන් ඔබලා මේ බෝම්බ පිපිරුණු ස්ථානයේ, නිවසේ උඩු මහලට යාමට නිවස තුළින් ඇරුණ විට වෙනත් තැනකින් තව පඩි පෙළක් තියෙනවද?

පි : නැහැ ස්වාමීනි. එහෙම එකක් නිරීක්ෂණය වුණේ නැහැ. පසුව කරන ලද විමර්ශනවලදීත් එහෙම පඩි පෙළක් තියෙන බව අනාවරණය වුණේ නැහැ ස්වාමීනි.

ප්‍ර : ඉහළ මහලවලට යාමට?

පි : නැහැ ස්වාමීනි.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : සාක්ෂිකරු ඔබගේ විමර්ශනවලදී අනාවරණය වුණාද මේ ඊබ්‍රාහිම් පවුලේ සාමාජිකයින් යම්කිසි ආගමික අන්තවාදී ක්‍රියාවලට සම්බන්ධ වුණාද කියන එක?

පි : ස්වාමීනි කරන ලද විමර්ශනවලදී ආගමික අන්තවාදී ක්‍රියාවලට සම්බන්ධ වූ බවට සෘජුවම ප්‍රකාශ කරන්න තරම් සාක්ෂි කිසිවක් ලැබුණේ නැහැ. එසේ වුවත් ස්වාමීනි ස්වයං සාතක බෝම්බකරු ඉල්හාම් අහමඩ් විසින් සංවිධානය කරන ලද ඇතැම් පන්ති කිහිපයකට සහභාගී වී ඇති බවට කරුණු අනාවරණය වුණා ස්වාමීනි.

ප්‍ර : ඔබගේ විමර්ශනවලට අනුව ඔබ දැන් ප්‍රකාශ කළ පරිදි එවැනි දේශනවලට සහභාගී වුණ තැනැත්තන් කවුද කියලා ඔබගේ විමර්ශනයේදී අනාවරණය වුණා නම් ඒ කවුද?

පි : ස්වාමීන් යූසුෆ් ඉබ්‍රාහිම් මොහොමඩ් නිවසේ හිමිකරු සහභාගී වෙලා තියෙනවා. ඊට අමතරව ඔහුගේ ඉල්හාම් යන අයගේ සහෝදරයෙකු වන මොහොමඩ් ඊබ්‍රාහිම් ඉස්මයිල් අහමඩ් යන පුද්ගලයත් මේකට සහභාගී වෙලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : ඔබගේ විමර්ශනවලට අනුව අනාවරණය වුණාද ඒ කොහේද ඒ දේශන තිබ්බේ කියන එක?

පි : ස්වාමීනි වැල්ලවත්ත ප්‍රදේශයේ එක්තරා Hall එහෙක, එක්තරා ශාලාවක එම පන්ති පැවැත් වූ බවට විමර්ශනයේදී අනාවරණය වුණා ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබගේ විමර්ශනවලදී අනාවරණය වුණාද ඒ ස්ථානය සම්බන්ධයෙන්?

පි : ස්වාමීනි විමර්ශන කටයුතු කළේ අදාළ විමර්ශන නිලධාරීන්. මම කළේ අධීක්ෂණයක් පමණයි. අදාළ ස්ථානවලට ගියේ එම නිලධාරීන්. ඒ නිසා ඒ සම්බන්ධව නිශ්චිතවම ස්ථානය ප්‍රකාශ කිරීමට හැකියාවක් නැහැ ස්වාමීනි.

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසිමේ අවස්ථාවක් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතීඥවරියට අවශ්‍ය දැයි විමසමි. අවශ්‍ය නොමැති බව දන්වයි.

සාක්ෂිකරුව මුදා හරිමි.

ගරු කොමිෂන් සභාව නැවත ප.ව. 5.15 ට කැඳවනු ලබයි.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බව පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය: 2020.06.23 වෙලාව:- ප ව. 5.10

සටහන් කළේ:- ධම්මිකා පෙරේරා විසිනි

ගරු විනිසුරු මඩුල්ල:-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

<u>පෙනී සිටීම:</u>

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතිඥතුමිය සමඟ ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස්, චතුරංග බණ්ඩාර, දිලන්ත එස්.කළුදුරුවගේ සහ අරින්ද්‍ර ජයසිංහ යන මහත්ම මහත්මීන් පෙනී සිටි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අහරදගරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතිඥ රවිශානි පීරිස් මහත්මිය කොමිසමේ සාක්ෂි විමසීමේදි පෙනී සිටීමට අවසර දෙන ලදි.

Document Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>සාක්ෂි අංක 67 සාක්ෂියට කැඳවයි.</u>

සම්පූර්ණ නම : සුරිය මුදියන්සේලාගේ ලක්ප්‍රිය නිරෝෂාන් සූරියකුමාර.

වයස : අවුරුදු 56 යි,

ජාතිය : සිංහල,

ආගම : බෞද්ධ,

තනතුර : වැඩ තහනමට ලක්වී සිටින ප්‍රධාන පොලිස් පරීක්ෂක.

<u>දැනට පදිංචි ස්ථානය</u>: අංක 232/1/බී, දෙල්ගහවත්ත පාර, කොටිකාවත්ත.

<u>ප්‍රතිඥා දී කැඳවයි.</u>

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ශි හේරත් මහත්මිය:</u>

ප්‍ර : මහත්මයා පොලිස් සේවයට බැඳුනේ කවදාද?

පි : ස්වාමිණි මම 1986.02.10 උප පොලිස් පරීක්ෂකවරයෙක් විදියට පොලිස් සේවයට බැඳුනා ස්වාමිණි.

ප්‍ර : වර්තමානයේ ඔබේ නිළය කුමක්ද? ඔබ වැඩ තහනමට ලක්වන අවස්ථාව වන විට ඔබට තිබුණු නිළය කුමක්ද?

පි : ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුර ස්වාමිණි.

ප්‍ර : ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරට ඔබ පත් වන්නේ කවදාද?

පි : 2019.01.01 සිට තමයි ස්වාමිණි පත්වීම ලැබුණේ.

ප්‍ර : කොටුව පොලිස් ස්ථානයේ ඔබ සේවයට යන්නේ කවද ද?

පි : 2016 මැයි මාසේ 01 වෙනිදා සිට මා කොටුව පොලිසියේ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති ලෙස සේවය කරනවා ස්වාමිණි.

ප්‍ර : එසේ සේවය කරමින් සිටින අවස්ථාවේ තමයි 2019.01.01 ඔබ ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරට පත් වන්නේ හරිද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඔබ කොටුව පොලිස් ස්ථානයේ ඔබ කිව්ව ආකාරයට අපරාධ අංශයේ ස්ථානාධිපතිවරයා හැටියට තමයි සේවය කළේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : 2019 අප්‍රේල් මාසේ වන විටත් ඔබ කොටුව පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති ද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : 2019 අප්‍රේල් මාසේ 12 වෙනි දිනැතිව කොට්ඨාශ භාර කොළඹ මධ්‍යම කොට්ඨාශ භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී උපාලි ජයසිංහ මහතාගෙන් කොටුව පොලිස් ස්ථානයට යම්කිසි තොරතුරක් සහ උපදෙස් ඇතුලත් ලිපියක් ලැබුණු බව ඔබ දන්නවද?

පි : 2019 අප්‍රේල් මාසේ 20 වන දින ස්වාමිණි

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : 20 නෙමෙයි මගේ ප්‍රශ්නෙ සාක්ෂිකරු?

පි : 20 වන දින තමයි මම ඒ බව දැන ගත්තේ ස්වාමිණි.

ප්‍ර : 2019.04.12 දිනැතිව දිනය යොදලා කොටුව පොලිස් ස්ථානයට 2019 අප්‍රේල් 13 වන දින ලැබිලා තියෙන තවුහිද් ජමාත් නායක මොහොමඩ් සහරාන් විසින් මෙරට මරාගෙන මැරෙන ප්‍රහාරයක් දියත් කිරීමට සැලසුම් කරන ලද බවට තොරතුරක් සම්බන්ධව කියන මාතෘකාවෙන් ලිපියක් ලැබුණු බව ඔබ ඒ 13 වෙනිදා දැන ගත්තේ නැද්ද?

පි : නැත ස්වාමිණි.

ප්‍ර : ඔබ 13 වෙනි දින සේවයේ රාජකාරී කළාද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : අප්‍රේල් මාසේ සිංහල අවුරුද්ද වෙනුවෙන් ඔබ නිවාඩු ලබා ගත්තද?

පි : නැත ස්වාමිණි.

ප්‍ර : සෑම දිනකම රාජකාරියට වාර්තා කළාද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : 2019 අප්‍රේල් 13 දිනැතිව සාගර ලියනගේ මහතා එවකට කොටුව පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් ඔබට මෙම ලිපිය යොමු කිරීමක් කළේ නැද්ද? ඔබේ අතට පත් කිරීමක් කළේ නැද්ද?

පි : නැත ස්වාමිණි මේ සිද්ධියෙන් පස්සේ ඔය ලිපිය මට ගන්න කියලා බලකිරීම් කළා.

ප්‍ර : ඔබට අද සාක්ෂිය දීමට පැමිණිමට සිතාසියක් ලැබුණද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඒ සිතාසියට අමුණා ඔබට නීතිඥ සහාය ලබා ගැනීමට හැකියාවක් තිබෙන බව දන්වන නොතිසියක් ලැබුණද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඒ අනුව ඔබ නීතිඥ සහායක් අද දින ලබාගෙන තිබෙනවාද?

පි : නැත ස්වාමිණි.

ප්‍ර : ඇයි ලබාගෙන නැත්තේ? ඔබේ තේරීමක් අනුවද, ඔබ හිතුවද අවශ්‍ය නැහැ කියලා?

පි : එහෙමයි ස්වාමිණි මම දැනට මාස 9 ක් පඩිත් නැතුව ඉන්නේ ස්වාමිණි.

ප්‍ර : දැන් ඔබට මා ලිපියක් පෙන්වා සිටිනවා මේ අවස්ථාවේදී. ගෞරවයෙන් ගරු සභාපතිතුමනි මේ වන විට SK1 වශයෙන් සලකුණු කර තිබෙන ලේඛනය සාක්ෂිකරුට පෙන්වා සිටීමට අවසර අයැද සිටිනවා.

ප්‍ර : ඔය කියන ලේඛනය ඔබ කොටුව පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති වශයෙන් මුල් වරට දැක්කේ කවදද?

පි : මේ සිද්ධියෙන් පස්සේ මට මේ බව දැනුම් දුන්නා ස්වාමිණි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මේ සිද්ධියෙන් පස්සේ කියන්නේ?

පි : 21 වෙනිදා ප්‍රහාරයෙන් පස්සේ ස්වාමිණි.

ප්‍ර : 2019 අප්‍රේල් 21 න් පස්සේද ඔබ ඔය ලිපිය දැක්කේ?

පි : එහෙමයි ස්වාමිණි. නමුත් ස්වාමිණි මෙම ලිපිය සම්බන්ධව 2019 අප්‍රේල් 20 වෙනිදා වැඩ බලන ස්ථානාධිපති විසින් උපදෙස් පන්තියේදි අපි දැනුවත් කළා.

ප්‍ර : ඔය ලිපියේ, මා දැන් ඔබට පෙන්වා සිටි SK1 ලිපියේ SK1A වශයෙන් සලකුණු කරලා තියෙන අතින් ලියන ලද සටහනක් තියෙනවා බලන්න?

පි : ඒ සටහන තමයි ස්වාමිණි

ප්‍ර : ඉස්සෙල්ලා බලන්න?

පි : ඔව් මම බැලුවා ස්වාමිණි.

ප්‍ර : ඔය සටහනේ අත් අකුරු කාගේද කියලා ඔබට හඳුන ගන්න පුළුවන්ද?

පි : සාගර ලියනගේ මහතාගේ.

ප්‍ර : සාගර ලියනගේ මහතාගේ අත්සන ඔතන තියෙනවද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : දිනයක් තියෙනවද?

පි : 16, 13 කරපු දිනයක් තියෙනවා ස්වාමිණි.

ප්‍ර : හරියට මුල ඉදලා තියෙන දිනය ඔබට පේන හැටියට කියවන්න? 16, 13 තියෙන්නේ අවසාන අංකෙනේ, මුල ඉදලා කියන්න වර්ෂයක් හැටියට?

පි : ස්වාමිණි එයාගේ අකුරු මට කියවන්න නොහැකියි ස්වාමිණි.

ප්‍ර : දිනය සම්බන්ධයෙන් කියන්න, 2019.04.16 හරි 13 හරි වගේ පේන එක?

පි : 16 හරි 13 හරි වගේ හරි ඒ වගේ තියෙන්නේ ස්වාමිණි.

ප්‍ර : දෙපැත්තටම පේන විදියට තියෙනවා කියලා තමයි ඔබ කියන්නේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඔය කියන ඔය සටහන SK1 (A) සටහන ඔබ 2019 අප්‍රේල් 16 හෝ 13 හෝ දිනයන් දෙකෙන් එකක හෝ දුටුවද?

පි : නැත ස්වාමිණි.

ප්‍ර : ඔබේ අතට පත් කළාද එය?

පි : නැත ස්වාමිණි.

ප්‍ර : ඔබ කියන්නේ මෙය ඔබ දුටුවේ 2019 අප්‍රේල් 21 ප්‍රහාරයෙන් පසුව කියලා?

පි : පසුව නමුත් මෙම විස්තර ඇතුලත් මේ සම්බන්ධව DIG/COPA140/2019 මෙම ලිපිය ස්වාමිණි වැඩ බලන

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

ස්ථානාධිපතිවරයා විසින් උපදෙස් පන්තියේදි කියවා සියළු නිලධාරීන් දැනුවත් කළා.

ප්‍ර : කවුද?

පි : කුමාර සිරි, ප්‍රධාන පොලිස් පරික්ෂක කුමාරසිරි මහතා ස්වාමිණි.

ප්‍ර : කවදද ඒ දැනුවත් කිරීම කළේ?

පි : 20 වෙනිදා උදේ ස්වාමිණි.

ප්‍ර : 20 වෙනිදා කියන්නේ සෙනසුරාදා දිනයක් නේද?

පි : සෙනසුරාදා දිනයක් ස්වාමිණි.

ප්‍ර : ඒ කියන්නේ ස්ථානාධිපතිවරුන් සාමාන්‍යයෙන් සෙනසුරාදා දිනයට පවත්වන උපදෙස් පන්තියේදි ද ඔබ දැනුවත් කළේ?

පි : එහෙමයි ස්වාමිණි. ඊට ඉස්සෙල්ලා උපදෙස් පන්තිය තිබුණේ 14 වෙනිදා. 14 වෙනිදා අවුරුදු නිසා ඒක තිබ්බේ නැහැ ස්වාමිණි.

ප්‍ර : 14 ද සෙනසුරාදා කියන්නේ?

පි : 13 හෝ 14

ප්‍ර : 20 සෙනසුරාදා නම් කලින් සෙනසුරාදා 13 නේ?

පි : එහෙමයි ස්වාමිණි ඊට පස්සේ තිබ්බ උපදෙස් පන්තිය මෙදින ස්වාමිණි.

ප්‍ර : ඒ කියන්නේ 13 වෙනිදා තියන්න තිබිච්ච උපදෙස් පන්තිය සිංහල අවුරුද්ද නිසා පැවැත්තුනේ නැහැ, 20 වෙනිදයි උපදෙස් පන්තියක් සෙනසුරාදා උපදෙස් පන්තිය හැටියට පැවතුනේ, එම උපදෙස් පන්තියේදී ඔබ කියන්නේ මේ SK1 ලිපියට අමුණා තිබුණා යැයි සැලකෙන ලිපිවලට අදාල කාරණාව දැනුම් දීමක් සිද්ධ වුණා කියලද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : මොකක්ද ඒ කාරණාව දැනුම් දීමක් හැටියට කිව්වේ?

පි : ජාතික තවුහිද් ජමාත් නායක මොහොමඩ් සහරාන් විසින් මෙරට මරාගෙන මැරෙන ප්‍රහාරයක් දියත් කිරීමට සැලසුම් කරන බවට තොරතුරක් සම්බන්ධව ස්වාමිණි. එහි තිබුණා ස්වාමිණි ප්‍රධාන ඉලක්ක වශයෙන් ප්‍රසිද්ධ කතෝලික පල්ලි සහ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය පිළිබඳව පමණක්. මේක අපිට පැවසුවේ මේ සම්බන්ධව රහසිගතව උපක්‍රමශීලිව කටයුතු කරනවා මිසක් මේ සම්බන්ධව කිසිවක් මහජනතාවට ඉදිරිපත් කරන්න එපා කියලා මොකද මහජන කැළඹීමක් ඇති වෙන්න පුළුවන් මෙහෙම සිද්ධියක් සිදු නොවුනහොත් කියලා ස්වාමිණි.

ප්‍ර : කවුද ඒ බව ඔබට සඳහන් කළේ?

පි : ඒ බව ස්වාමිණි අපේ වැඩ බලන ස්ථානාධිපති කිව්වා මේක තියෙනවා කියලා.

ප්‍ර : පොදුවේ උපදෙස් පන්තියට සහභාගී වූ සියළු දෙනාටම කියපු කාරණාවක්ද මේක ඔබට ..?

FAIR COMMENT BY JEZEEM

පි : පොදුවේ කිව්ව කතාවක් ස්වාමිණි.

ප්‍ර : ඔබට පෞද්ගලිකව කියපු කාරණාවක් නෙමෙයි?

පි : නැත ස්වාමිණි.

ප්‍ර : දැන් මේ 20 වෙනි දින වැඩ බලන ස්ථානාධිපතිවරයෙකු ඉන්න හේතුව කුමක්ද? ස්ථීර ස්ථානාධිපතිවරයා නිවාඩුද එදා.

පි : ස්ථීර ස්ථානාධිපතිතුමා නිවාඩුයි ස්වාමිණි.

ප්‍ර : කවදද ඔහු නිවාඩු ගියේ?

පි : මට මතකයේ හැටියට ස්වාමිණි 16 නැත්නම් 17. මට ඒක හරියට මතක නැහැ ස්වාමිණි.

ප්‍ර : 20 වන දිනත් ඔහු නිවාඩු හිටියේ?

පි : නිවාඩු හිටියේ ස්වාමිණි.

ප්‍ර : දැන් 20 වෙනි දින මේ බව දැනුවත් කරලා ඔබට අපරාධ අංශයේ ස්ථානාධිපතිවරයා හැටියට විශේෂ ක්‍රියාමාර්ග ගන්න කියලා මොකක් හරි දැනුවත් කිරීමක් කළාද මේ උපදෙස් පන්තියේ අවසානයේ හෝ පන්තිය අතරතුර හෝ?

පි : නැහැ ස්වාමිණි.

ප්‍ර : ඔබ සඳහන් කරන්නට යෙදුනා මෙම සාක්ෂියේදි ඔබ සිංහල අවුරුද්දට නිවාඩු ගියේ නැහැ කියලා මේ කාලවකවානුවේදී?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඔබ දුටුවාද කොටුව පොලිස් ස්ථානයේ දැන්වීම් පුවරුවේ සහරාන් නමැති පුද්ගලයෙකුට අයිති ඡායාරූපයක් එල්වා තියෙනවා?

පි : මට හරියට ඒක මතක නැහැ ස්වාමිණි. දැන්වීම් පුවරුවේ එවැන්නක් තිබූ බවට හරියට මතකයක් නැහැ ස්වාමිණි.

ප්‍ර : ඔබට මතක නැත්තේ එල්ලලා තිබුණද නැද්ද කියන එකද නැත්නම් ඔබ දැන්වීම් පුවරුව දිහා බැලුවේ නැද්ද?

පි : දැන්වීම් පුවරුව දිහා බලනවා ස්වාමිණි නමුත් මේක විශේෂයෙන් මට මතකයක් නැහැ ස්වාමිණි.

ප්‍ර : දැන් ඔබ මේ ගරු සභාව ඉදිරියේ සාක්ෂියක් දුන්නා ඔබට මේ අවස්ථාවේ පෙන්වා සිටි SK1 ලේඛනය 2019 අප්‍රේල් 21 න් පස්සේ ඔබට එවකට සහ අදටත් කොටුව පොලිස් ස්ථානයේ ස්ථානාධිපති සාගර ලියනගේ මහතා පෙන්වා සිටියා කියලා?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : පෙන්නුවේ කොහේදි ද?

පි : මගේ ලඟටම ඇවිල්ල පෙන්නුවා.

ප්‍ර : කොහේදී ද?

පි : අපරාධ අංශයට ඇවිල්ලා.

ප්‍ර : පොලිස් ස්ථානයේ?

පි : පොලිස් ස්ථානයේ ස්වාමිණි.

ප්‍ර : පෙන්නලා මොකක්ද කිව්වේ?

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : පෙන්නලා කිව්වා මේක ප්‍රශ්නයක් වෙන්නේ නැහැ මේක භාර ගන්න කියලා. මම කිව්වා මට එපා කියලා.

ප්‍ර : මොකක්ද භාර ගන්න කිව්වේ?

පි : මේ කොලේ ස්වාමිණි. එයා endosment එක ගහලා තිබ්බ්ච එක.

ප්‍ර : endosment එක ගහලා තිබුණ එක ඒ ලිපිය ඔබට භාර ගන්න කිව්වා?

පි : ඔව්.

ප්‍ර : ප්‍රශ්නයක් වෙන්නේ නැහැ කිව්වා?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : මොකක්ද ඔබ endosment එක ගහලා තිබුණ තැන කියලා සඳහන් කරන්නේ?

පි : මෙතන මේ 4.13, 16 වගේ තියෙන දිනය දාලා තියෙන පො.ප. සුරියකුමාර, ස්ථානාධිපති, අපරාධ කියලා ගහලා තියෙන මේවා එක ස්වාමිණි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : ඔබ ඔය කුමන ලේඛනයක් බලලාද ඔහොම සාක්ෂි ලබා දෙන්නේ?

පි : දැන් මෙතන ගෙනල්ලා දුන්නා ස්වාමිණි

ප්‍ර : නැහැ, නැහැ මම කියන්නේ මෙම කොමිෂන් සභාව ඉදිරියේ ඔබ දැන් ඔබ සාක්ෂි ලබා දෙන්නේ කුමන ලේඛනයක් බලාගෙනද කියලයි මම අහන්නේ?

පි : මේ මහත්මයා ගෙනල්ලා දීපු එකක්.

ප්‍ර : නෑ ඔතන ලකුණු කරලා තියෙනවා ඒ ලේඛනය මොකක්ද කියලා?

පි : SK1 ස්වාමිණි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ශි හේරත් මහත්මිය:</u>

ප්‍ර : ඔබ ඔය සඳහන් කරන endosment එකටත් marking එකක් දීලා තියෙනවා, ඒ සලකුණු කිරීම කියන්න?

පි : SK1(A) ස්වාමිණි.

ප්‍ර : දැන් උපදෙස් පන්තියක් පැවතුනාම සෙනසුරාදා දිනයේ ස්ථානාධිපතිවරයා ඒ උපදෙස් පන්තියේ කියන්නට යෙදුනු කාරණා පොතක ඇතුලත් කරනවද?

පි : එහෙමයි ස්වාමිණි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ පොත ඔබටත් බලන්න පුළුවන් තැනකද තියෙන්නේ උපදෙස් පන්ති පොත?

පි : ඒක ස්ථානාධිපතිතුමා භාරයේ තමයි තියෙන්නේ ස්වාමිණි.

ප්‍ර : ස්ථානාධිපතිවරයාටද ඒකේ සටහන් ඇතුලත් කිරීමට බලය තිබෙන්නේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : දැන් ඔබ මේ අවස්ථාවේ පරීක්ෂාවට ලක් කළ SK1 ලේඛනය ඔය ස්ථානාධිපතිවරයා පවත්වාගෙන යන උපදෙස් පන්ති පොතේ අලවා තිබුණු ලේඛනයක් හැටියට මේ සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා නම් ඔබ මේ ලේඛනය යම් අවස්ථාවක හෝ උපදෙස් පන්ති පොතේ අලවලා තියෙනවා දැක්කද 2019.04.13 හෝ 16 දින?

පි : නැත ස්වාමිණි.

ප්‍ර : ඒ කියන්නේ සාමාන්‍යයෙන් ඔබ 13, 16 දිනවලදි උපදෙස් පන්ති පොත බලන්න ඔබට අවකාශය ලැබෙනවද නැත්නම් පොතේ මේක තිබුනේ නැහැ කියලා ඔබට කියන්න පුළුවන්ද, මේ ලේඛනය?

පි : නැහැ ස්වාමිණි ඒ උපදෙස් පන්ති පොත අපි පරීක්ෂා කරන්නේ නැහැ ස්වාමිණි.

ප්‍ර : නමුත් ඔබට ස්ථිරවම කියන්න පුළුවන් මේ SK1 ලේඛනය ඔබ අතට පත් වුණේ මේ SK1(A)කියන සටහනත් එක්ක 2019 අප්‍රේල් 21 ප්‍රහාරයට පසු දින?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : සහ ඔබට කටිනුත් සාගර ලියනගේ මහතා සඳහන් කළා ප්‍රශ්නයක් වෙන්නේ නැහැ මේ ලේඛනය භාර ගන්න කියලා?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : කොටුව පොලිස් ස්ථානයට අනුයුක්තව බුද්ධි නිලධාරීන් සිටිනවද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඔවුන් මොන ඒකකයට අයිති බුද්ධි නිලධාරීන්ද?

පි : බස්නාහිර බුද්ධි කොට්ඨාශයේ ස්වාමිණි.

ප්‍ර : රාජ්‍ය බුද්ධි සේවාවට අනුයුක්ත නිලධාරීන් කොටුව පොලිස් ස්ථානයට අනුයුක්ත කරලා ඉන්නවද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : කී දෙනෙක් ඉන්නවද?

පි : මා දන්නා තරමින් 5, 6 දෙනෙක් සිටියා ස්වාමිණි. ස්ථානාධිපතිවරයෙකුත් සිටියා ස්වාමිණි.

ප්‍ර : බස්නාහිර පළාත් බුද්ධි කොට්ඨාශයට අදාල කොටුව පොලිස් ස්ථානයට අනුයුක්ත බුද්ධි නිලධාරීන් කී දෙනෙක් හිටියද?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : එතනත් ස්ථානාධිපතිවරයෙක් එක්ක 5 දෙනෙක් පමණ හිටියා ස්වාමිණි.

ප්‍ර : කවුද ස්ථානාධිපතිවරයා හැටියට බස්නාහිර පළාත් බුද්ධි කොට්ඨාශයේ අනුයුක්ත නිලධාරීන් අතර ක්‍රියා කලේ?

පි : එවකට උප පොලිස් පරික්ෂක තිලකරත්න මහතා.

ප්‍ර : Special Branch එහෙම නැත්නම් විශේෂ කාර්යාංශයේ බුද්ධි නිලධාරීන් කොටුව පොලිස් ස්ථානයට අනුයුක්ත වෙලා හිටියද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : කී දෙනෙක් හිටියද?

පි : ඒකේ පොලිස් පරික්ෂක මහත්තයෙක් හිටියා ස්ථානාධිපති,

ප්‍ර : නම දන්නවද?

පි : නම පොඩ්ඩක් මතක නැහැ ස්වාමිණි දැන්.

ප්‍ර : මේ බුද්ධි අංශවල නිලධාරීන් කොටුව පොලිස් ස්ථානයට අනුයුක්තව හිටපු අය පොලිස් ස්ථානයේ කොහේද ස්ථානගත වෙලා හිටියේ, ඒ අය ඔක්කොම එක තැනකද, විවිධ තැන්වලද, රාජකාරී කරන කොට කොහේද ස්ථානාගත වෙලා හිටියේ?

පි : එම බුද්ධි අංශ දෙකේම නිලධාරීන් හිටියේ අතුරු මහලේ ස්වාමිණි.

ප්‍ර : බුද්ධි අංශ 3 ක් නේ?

පි : බුද්ධි අංක 2 ක් ස්වාමිණි.

ප්‍ර : ඒ කියන්නේ රාජ්‍ය බුද්ධි සේවාව සහ බස්නාහිර පළාත් බුද්ධි කොට්ඨාශය?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : Special Branch එකේ කවුරුවත් හිටියේ නැහැ?

පි : Special Branch එකෙත් හිටියා ස්වාමිණි.

ප්‍ර : එතකොට බුද්ධි අංශ 3 ක්?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඒ තුනේම අය හිටියා අතුරු මහලේ?

පි : අතුරු මහලේ ස්වාමිණි.

ප්‍ර : ඒ අයත් සමඟ ඔබ කතා බහේ සාමාන්‍යයෙන් රාජකාරියේ නියැලෙන වෙලාවට යෙදෙනවද?

පි : සාමාන්‍යයෙන් කතා බහේ යෙදෙනවා. මේ සම්බන්ධව කිසිවෙක් කතා කලේ නැහැ. තිලකරත්න මහතා නම් නිවාඩු හිටියේ ස්වාමිණි. මේ සම්බන්ධව වැඩි කිසි කෙනෙක් කතා කලේ නැහැ ස්වාමිණි.

ප්‍ර : 2019 අප්‍රේල් මාසේ 20 වන දින තෙක් ඔබට ඒ කොටුව පොලිස් ස්ථානයට අනුයුක්තව හිටි බුද්ධි නිලධාරීන්ගෙන් කිසිවකුගෙන් මේ තොරතුර දැන ගන්න ලැබුන් නැද්ද?

පි : නැහැ ස්වාමිණි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : 20 වෙනිදා උපදෙස් පන්තියේ තමයි ඔබ ප්‍රථම වතාවට මේ තොරතුරු දැන ගන්නේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : 20 වෙනිදා මේ සම්බන්ධයෙන් දැන ගත්තම ඔබ ගත්ත ක්‍රියාමාර්ගය මොකක්ද අපරාධ අංශයේ ස්ථානාධිපතිවරයා වශයෙන්?

පි : 20 වෙනිදා මේ සම්බන්ධව දැන ගත්තාම මම ස්වාමිණි ජංගම රථයේ In charge ට ගෙන්නලා මේ පිළිබඳව දැනුම් දුන්නා. නමුත් මෙහෙමයි පොත්වල නියෝග සටහන් යොදලා තිබුණේ නැහැ, නමුත් මේක ඒගොල්ලන්ගෙන් එළියට යයි කියලා මේ ගැන රහසිගතව හොයන්න කියලා දාලා තිබුණා, එයත් ඒකේ Return එකේ දාලා තිබුණා උදේ මේ පිළිබඳව රහසිගතව හොයා බැලුවා කියලා. ඒ එක්කම ජංගම රථය අපිට එකම එක කතෝලික දේවස්ථානයක් තියෙන්නේ. ඒ දේවස්ථානය අසල තමයි යොදලා තිබුණේ වැඩ බලන ස්ථානාධිපතිතුමා.

ප්‍ර : පොත්වල සටහන් යොදලා තිබුණේ නැහැ කියලා ඔබ සඳහන් කරන්නේ ජංගම රථය භාරව හිටිය නිලධාරීන් සටහන් යොදලා නැහැ කියන කාරණාවද?

පි : නැහැ, ජංගම රථය භාරව ඉන්න නිලධාරීන් සටහන් යොදලා තිබුණා.

ප්‍ර : කවුද සටහන් යොදලා නැත්තේ?

පි : නියෝග දානවානේ ජංගම රථ නියෝගනේ දාන්නේ Crime Branch එකේනේ ස්වාමිණි. ඒකේ සටහනේ සඳහන් කරලා නැහැ.

ප්‍ර : ඒ සටහන් දාන්නේ කවුද? නියෝග සටහන් දාන්නේ කවුද?

පි : මමමයි අත්සන් කරන්නේ.

ප්‍ර : ඒ කියන්නේ ඔබ ජංගම රථයට මේ තවුහිද් ජමාත් සංවිධානයෙන් ඇති වෙන්න පුළුවන් ප්‍රහාරය සම්බන්ධයෙන් උපදෙසක් දුන්නා කියන කාරණාව 20 වෙනිදා නියෝග සටහනක් යොදලා නැහැ නියෝග සටහන් පොතේ?

පි : නියෝග සටහන් යොදන්න එපා කියලා තිබුණනේ, ඒක නිසා ඒක අර කවුරු හරි පොටෝ ගහලා යවයි කියලා එහෙම යොදලා තිබුනේ නැහැ නමුත් ඒක ඒගොල්ලන්ට උපදෙස් දුන්නා මේ පිළිබඳව විමසිල්ලෙන් ඉන්න කියලා. ඒගොල්ලෝ ඒකේ සටහනක් යොදලා තිබුණා මට මතක හැටියට. ඒ එක්කම අපරාධ වැලැක්වීමේ රාජකාරී මගේ අපරාධ අංශයේ නිලධාරිනුත් යොදලා තිබුණා. ඒගොල්ලන්ගේ Return එකෙත් 20 වෙනිදා පාන්දර

FAIR COMMENT BY JEZEEM

යොදලා තිබුණා මේ පිළිබඳව සොයා බලලා පුද්ගලික ඔත්තුකරුවෝ දැනුවත් කළා කියලා.

ප්‍ර : යොදලා තිබුණා කියන්නේ ඔබ යොදපු සටහන් ගැනනේ ඔබ ඔය කතා කරන්නේ? ඔබ යොදපු සටහන තිබුණද නැද්ද කියලා මම අහන්නේ නියෝග පොතේ ඔබ සටහනක් යෙදුවද?

පි : මගේ නියෝග පොත්වල එවැනි සටහනක් නැහැ ස්වාමිණි.

ප්‍ර : ඔබ නියෝග පොත්වල සටහනක් යොදලා නැහැ ජංගම රථයට නියෝගයක් හෝ උපදෙසක් මේ මාතෘකාව යටතේ තවුහිද් ජමාත් ප්‍රහාරයට අදාලව නියෝගයක් දුන්නා කියලා සටහනක් නැහැ?

පි : නැහැ ස්වාමිණි.

ප්‍ර : එතකොට ඔබේ අපරාධ අංශයේ නිලධාරීන්ට රාජකාරී පැවරීමට අදාලව ඔබ සටහනක් යොදලා තියෙනවද මේ කාරණාවට 20 වෙනිදා දවසේ රාජකාරී යෙදවීම් වලදි මේ මාතෘකාව යටතේ විශේෂ රාජකාරියක් භාර දුන්නා කියන කාරණාවට සටහනක් ඔබ යොදලා තියෙනවද?

පි : සටහනක් යොදලා නැහැ ස්වාමිණි වාචිකව දැනුම් දීලා තියෙනවා මොකද සටහනක් යොදන්න එපා කියලානේ තියෙන්නේ ස්වාමිණි.

ප්‍ර : කොහේද තියෙන්නේ සටහනක් යොදන්න එපා කියලා?

පි : කිසිම සටහනක්, මේ පිළිබඳව කිසි දෙයක් පිටට යන්න දෙන්න එපා කියලා දැනුම් දීලා තියෙන්නේ ස්වාමිණි.

ප්‍ර : පිටට නෙමෙයිනේ, පොලිස් නිලධාරියෙක් පොලිස් නිලධාරියෙක්ට උපදෙසක් දුන්නාම එය සටහනකින් දන්වන්න ඕන නේද නියෝග පොතක් තියෙන්නේ ඒකට නේද?

පි : නියෝග පොතක් තියෙන්නේ ඒකට.

ප්‍ර : එතකොට නියෝග පොතේ ඔබ සටහන් යොදලා නැහැ කියලා පිළිතුරක් දුන්න නේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඒ නෑ කියලා ඔබ කියන්නේ නියෝග පොතේ සටහන දැම්මේ නැත්තේ පිටට මේ නියෝගය දුන්නයි කියන එක යයි කියන කාරණාවට?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඒ කියන්නේ පොලිසිය ඇතුලේ නියෝග දුන්නම ඒවා පිටට යනවද?

පි : දැන් මේ තියෙන තත්ත්වය එහෙමනේ ස්වාමිණි. දැන් ඕක පොටෝ එකක් ගහලා සමාජ ජාලාවල දැම්මොත් ස්වාමිණි.

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප : සාක්ෂිකරු අහන ප්‍රශ්නවලට උත්තරය දෙන්න තර්ක කරන්න යන්න එපා අහන ප්‍රශ්නෙට උත්තර දෙන්න?

පි : එහෙමයි ස්වාමිණි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ශි හේරත් මහත්මිය:</u>

ප : දැන් ඔබ මෙවැනි නියෝගයක් දුන්නද නැද්ද කියලා බලන්න හොයන්න තියෙන්නේ නියෝග පොතේ සටහනක් නේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප : ඒකනේ ක්‍රමවේදය?

පි : එහෙමයි ස්වාමිණි.

ප : එතකොට එවැනි සටහනක් නැහැ?

පි : නැහැ ස්වාමිණි.

ප : දැන් ඔබ කියනවා මේ සටහනක් දාන්න එපා කියලා කිව්වාය කියලා, කවුද ඔබට කිව්වේ සටහන් දාන්න එපා කියලා?

පි : ස්වාමිණි නියෝග සටහන් දානවා නම් මේක නියෝග සටහන් හොඳට පොදු නියෝගවල දාන්න පුළුවන්නේ ස්වාමිණි. මට අපරාධ අංශයේ ස්ථානාධිපතිටත් දාන්න පුළුවන් මේවා පරික්ෂා කරන්න, මේවා පරික්ෂා කරන්න, මේවා කරන්න මේවා කරන්න කියලා ස්වාමිණි. එතකොට එක එක නිලධාරියාට එක එක ඒවා දාන්න පුළුවන්. කවුරුත් ඒක කරන්නේ නැහැ නේ ස්වාමිණි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප : සාක්ෂිකරු ඔබගෙන් ඇහුව ප්‍රශ්නෙට උත්තර දෙන්න, ඔබ කලින් කිව්වා එවැනි සටහන් දාන්න එපා කියලා කවුරු හරි කිව්වා කියලා?

පි : ඔව් ස්වාමිණි වැඩ බලන ස්ථානාධිපති තමයි එදා කිව්වේ මේ පිළිබඳව එළියට තොරතුරු යන්නේ නැති වෙන විදියට රහසිගතව උපක්‍රමශීලිව මේ පිළිබඳව හොයන්න මේක නිශ්චිත තොරතුරකුත් නෙමෙයි කියලා.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ශි හේරත් මහත්මිය:</u>

ප : ඔබ අද මේ සභාවට කියන්නෙත් 20 වෙනිදා තිබිච්ච උපදෙස් පන්තියේ වැඩ බලන ස්ථානාධිපතිවරයා ඒ උපදෙස් පන්තියේදි කිව්වා කියලා මේ ලැබිච්ච තොරතුර නිශ්චිත තොරතුරක් නෙමෙයි කියන කාරණාව කිව්වා කියලා?

පි : එහෙමයි ස්වාමිණි.

President's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් සටහනක් නොදැම්මත් නියෝගයක් විදියට ඔබ කාටද නියෝග දුන්නේ? කටින් නියෝග දුන්නා කිව්වානේ, කාට කාටද කටින් නියෝග දුන්නේ?

පි : කටින් නියෝග දුන්නේ ස්වාමිණි දැන් වැඩ බලන ස්ථානාධිපතිතුමාට 20 වෙනිදා රෑ දුරකතන ඇමතුමක් පැමිණිලා තිබුණානේ ස්වාමිණි, ප්‍රහාරයක් එල්ල වෙනවා කියලා.

ප්‍ර : පොඩ්ඩක් ඉන්න මහත්මයා, මම ඇහුවේ දැන් උදේ පැවති 20 වෙනිදා උපදෙස් පන්තියෙන් තවුහිද් ජමාත් ප්‍රහාරය සම්බන්ධයෙන් ඔබව දැනුවත් වුණාට පස්සේ උපදෙසින් ඒ ලැබිච්ච තොරතුරට අදාලව ඔබ නියෝග දුන්නද කාටහරි කොටුව පොලිස් ස්ථානයේ?

පි : ඔව් වාචිකව දුන්නා ස්වාමිණි.

ප්‍ර : වාචිකව දුන්නේ කාටද?

පි : Mobile In charge සාජන් මහත්තයාගේ නම මට මතක නැහැ. මගේ අපරාධ අංශයේ සාජන් රාජපක්ෂ.

ප්‍ර : අපරාධ අංශයේ සාජන් රාජපක්ෂට දුන්න නියෝගය මොකක්ද?

පි : මේ පිළිබඳව විමසිලිමත්ව හිටින්න, ඒ වගේම පුද්ගලික ඔත්තුකරුවන් දැනුවත් කරලා මේ සම්බන්ධව තොරතුරු ලබා ගන්න. එපමණයි ස්වාමිණි.

ප්‍ර : ජංගම රථය භාරව හිටිය නිලධාරියාට දුන්න නියෝගය මොකක්ද?

පි : එයාටත් ඒ වගේ නියෝගයක් තමයි දුන්නේ ස්වාමිණි.

ප්‍ර : දැන් ඉන් අනතුරුව 2019 අප්‍රේල් 20 වෙනිදා රාත්‍රියේ වැඩ බලන ස්ථානාධිපතිවරයාට මේ තවුහිද් ජමාත් සංවිධානයේ ප්‍රහාරයක් එල්ලවීමට අදාලව තවදුරටත් තොරතුරු ලැබුණු බව ඔබට දැන ගන්න ලැබුණද?

පි : ඒ ලැබීමෙන් පස්සේ තමයි ඔය විදියට වාචිකව නියෝග දුන්නේ ස්වාමිණි.

ප්‍ර : දැන් මම ඔබෙන් ඉතාම පැහැදිලිව ඇහුවානේ ඉස්සෙල්ලා උදෑසන උපදෙස් පන්තියෙන් පස්සේ ඔබ කාට හරි උපදෙස් දුන්නද කියලා?

පි : ස්වාමිණි උදෑසන උපදෙස් පන්තියෙන් පස්සේ මගේ අපරාධ අංශයේ නිලධාරීන්ව උපදෙස් පන්තියට නොපැමිණි නිලධාරී දැනුවත් කළා ස්වාමිණි.

ප්‍ර : රාත්‍රී තොරතුරු ලැබුණට පස්සේ කාවද දැනුවත් කළේ?

පි : ඒ රාත්‍රී තොරතුරු ලැබුණට පස්සේ දැනුවත් කලේ ඔය ජංගම රථයේ In charge වයි, මගේ අපරාධ වැලැක්වීමේ රාජකාරියේ යෙදී සිටි සාජන් රාජපක්ෂවයි.

ප්‍ර : ඒ කියන්නේ උදෑසන උපදෙස් පන්තියෙන් පස්සේ දැනුවත් කළ නිලධාරීන්ට පොදුවේද ඔබ කිව්වේ, නමක් නැද්ද?

Translated Court Copy
FAIR COMMENT BY JEZEEM

පි : පොදුවේ ස්වාමිණි.

ප්‍ර : කොහේදී ද ඒ අයට පොදුවේ කිව්වේ?

පි : ඒක මගේ අපරාධ අංශයේ මගේ Office එකේදී.

ප්‍ර : ඒ කියන්නේ ඔබ Meeting ක් කැඳෙව්වද ඔබේ අංශයේ නිලධාරීන්ට?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : කවුද ඒ Meeting ට සහභාගී වුණේ?

පි : මගේ අපරාධ අංශයේ නිලධාරීන් ස්වාමිණි. උපදෙස් පන්තියට ස්ථානාධිපතිතුමාගේ උපදෙස් පන්තියට නොසිටි නිලධාරීන්ට.

ප්‍ර : උදෑසන උපදෙස් පන්තියට නොසිටි නිලධාරීන්ට ඔබේ කාර්යාලයට 20 වෙනිදා උදෑසන උපදෙස් පන්තියෙන් පස්සේ එන්න කියලා ඔබ නියෝග දුන්නද නැත්නම් ඒ උපදෙස් පන්තියේ කියපු දේවල් ඔවුන්ව දැනුවත් කළාද?

පි : දැන්වත් කළා ස්වාමිණි.

ප්‍ර : දැනුවත් කිරීමක් කළේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : එතකොට ඒ දැනුවත් කිරීමේ ඔබ විශේෂ කවුරු හරි නිලධාරියෙක්ට නියෝගයක් දුන්නේ නැහැ විශේෂයෙන් කලයුතු කාරණාවක් ගැන නියෝග ලබා දීලා නැහැ?

පි : නැහැ ස්වාමිණි.

ප්‍ර : ඔබ කියන්නේ ඔබ නියෝගයක් කටින් දුන්නා කියලා 2019 අප්‍රේල් මස 20 වෙනිදා රාත්‍රියේ වැඩ බලන ස්ථානාධිපතිවරයා ඔබට තොරතුරක් කිව්වට පස්සේ තමයි එහෙම කලා කියලා?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඒ දුන්නෙත් ඔබ ජංගම රථයේ නිලධාරියාට සහ රාජපක්ෂ කියන සාජන්වරයට වාචිකවයි ඔබ කියන්නේ?

පි : වාචිකවයි ස්වාමිණි.

ප්‍ර : ඔබ කොහේද හිටියේ ඒ වෙලාවේ?

පි : මම ස්වාමිණි බැරක්කේ රැදී සිටියා.

ප්‍ර : කීයට විතරද ඔබට මේ රාත්‍රී තොරතුර දැන ගන්න ලැබුණේ?

පි : ඔය තොරතුර දැන ගන්න ලැබුනේ ස්වාමිණි මට හරියට වෙලාව නම් මතක නැහැ ස්වාමිණි 12 ඉස්සෙල්ලා වගේ.

ප්‍ර : රෑ 12 ට ඉස්සෙල්ලද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : කොහොමද දැන ගන්න ලැබුනේ?

පි : මේ ලලන්ත රාජකාරී භාර නිලධාරියාගෙන්.

ප්‍ර : ලලන්ත නිලධාරියා බැරක්ක සඳහා රාජකාරියට පැමිණි අවස්ථාවේදී ද ඔබට කිව්වේ?

පි : නැත ස්වාමිණි මාගේ ජංගම දුරකථනයට කතා කලේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ලලන්ත නිලධාරියා ඔබේ ජංගම දුරකතනයට කතා කරලා කිව්වේ මොකක්ද?

පි : මෙහෙම මේකක් තියෙනවා කට්ටිය දැනුවත් කරන්න කියලා. ඉතින් මමත් ගිහිල්ලා ඒවෙලාවේම දැනුවත් කළා.

ප්‍ර : මහත්මයා මෙහෙම මේ එකක් තියෙනවා කිව්වාම අපිට තේරෙන්නේ නැහැනේ මහත්මයා, මහත්මයා කියන්න බලන්න මොකක්ද කිව්වේ කියලා?

පි : මෙතොදිස් පල්ලිවලට ප්‍රහාරයක් තියෙනවා කියලා ස්වාමිණි.

ප්‍ර : කවදා සිද්ධ වෙන ප්‍රහාරයක් ගැනද කිව්වේ?

පි : ඒක නම් හරියට කිව්වේ නැහැ, ඒ ආසන්න දිනයක වෙයි කියලා ස්වාමිණි.

ප්‍ර : ඔහු කොහොම දැන ගත්තයි කියලද කිව්වේ?

පි : ස්ථානාධිපතිතුමාගෙන්.

ප්‍ර : වැඩ බලන ස්ථානාධිපතිගෙන්?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඒ තොරතුර ඔබට ලලන්ත නිලධාරියා ලබා දුන්නට පස්සේ තමයි ඔබ ඔය කියන හැටියට ජංගම රථයේ නිලධාරියට සහ සාජන් රාජපක්ෂට උපදෙස් දුන්නා කියලා කියන්නේ, නියෝග දුන්නා කියලා කියන්නේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඔවුන්ට නියෝග ඔබ දුන්නේ කොහොමද ඔබ හිටියේ බැරක්කේ නේ?

පි : ඔවුන්ට නියෝග දුන්නා මම ඒ ස්ථානවලට ස්වාමිණි.

ප්‍ර : කොහේටද ඔබ ගියේ?

පි : එකක් ගියා මෙතන කොතනද කොටුව Railway Station එක ගාවට. ඒ කියන්නේ මගේ ඇන්ටි ගැයුම් කට්ටිය එතන ඉන්නේ ස්වාමිණි. ඒ හරියේ අපරාධ බහුලව වැඩියි. අනික් එක මෙතන කොටුව පොලිස් මූලස්ථානය ලඟ තියෙන්නේ කතෝලික පල්ලිය ඒ අසල තිබ්බිච්ච ජංගම රථයට ස්වාමිණි.

ප්‍ර : ඔබ මොකේද ගියේ?

පි : මගේ පුද්ගලික රථයේ මම ගියේ ස්වාමිණි.

ප්‍ර : මොකක්ද රථය ?

පි : මගේ කාර් රථයේ ස්වාමිණි.

ප්‍ර : ඔබ සටහනක් යොදලා තියෙනවද කොටුව දුම්රිය ස්ථානයේ අපරාධ වැලැක්වීමේ නිලධාරීන් හමුවීමට මම ගියෙමි. පොලිස් මූලස්ථානය අසල තියෙන පල්ලිය අසල ජංගම රථයට ගොස් උපදෙස් ලබා දුනෙමි කියලා සටහනක් යොදලා තියෙනවද?

පි : ස්වාමිණි මම සටහනක් යෙදුවද කියලා මට දැන් මතකයක් නැහැ. මම හුඟ කාලෙක ඉදලා ගෙදර ඉන්න නිසා. මම සටහනක්

FAIR COMMENT BY JEZEEM

යෙදුවා වගේ මතකයි මොකද මම සටහන නැතුව එළියේ කොහේවත් යන්නේ නැහැ ස්වාමිණි.

ප්‍ර : සටහනක් යෙදූ බවට ඔබ මේ ජනාධිපති කොමිෂන් සභාවේ විමර්ශන අංශයට ලබා දුන් ප්‍රකාශයේ කියලා නැහැනේ, ඔබ සටහනක් යෙදුවා කියලා?

පි : ප්‍රකාශයේ තියෙන්නේ මම ඇන්ටි ගැයුම් ඔපරේෂන් එකක් කෙරෙව්වා කියලා.

ප්‍ර : සටහනක් යෙදුවා කියලා කියලා තියෙනවද? සටහන ඉදිරිපත් කරන්න පුළුවන් කියලා තිබෙනවද?

පි : නැහැ ස්වාමිණි නැහැ.

ප්‍ර : සටහනක් යෙදුනා නම් ඔබට ඒක කීමට හැකියාවක් තියෙනවා නේද?

පි : ඒහෙමයි ස්වාමිණි.

ප්‍ර : දැන් ඔබ සඳහන් කරන්නට යෙදුනා ජංගම සේවයේ නියුතු නිලධාරීන් සටහනක් දාලා තියෙනවා කියලා ඔවුන්ට ලැබුණු නියෝග සම්බන්ධයෙන්. ඔබ විසින් නියෝගයක් දුන්නා කියලා ඔවුන්ගේ සටහනක් නැහැ කියලා මම කියනවා නම් මේ වන විට අහපු සාක්ෂිවලට අනුව ඔබ නියෝගයක් දුන්න බවට කිසිම නිලධාරියෙක් සටහන් යොදලා නැත්නම් ඒ සම්බන්ධයෙන් ඔබට කියන්න තියෙන්නේ මොකක්ද?

පි : නැහැ ඒහෙම මම නියෝග දුන්නා කියලාවත් ස්ථානාධිපති නියෝග දුන්නා කියලාවත් ඒකේ සඳහන් වෙලා නැහැ ස්වාමිණි. ඒකේ ඔහු දාලා තියෙනවා ඔහු ISIS ත්‍රස්තවාදීන් සම්බන්ධව විමසිල්ලෙන් රාජකාරී කළා කියලා.

ප්‍ර : කවුද දාලා තියෙන්නේ ඒහෙම?

පි : සාජන් දාලා තිබුණා මට මතකයි මම උදේ Mobil Return ඒකේ දැක්කා ස්වාමිණි.

ප්‍ර : ඒ කියන්නේ ඔබ තිබිච්ච සටහන් දැක්කා ඔබ දන්නවා තිබිච්ච සටහන් මොනවද කියලා? දැන් මොහොතකට පෙර කිව්වානේ ඔබට මතක නැහැ සටහන් මොනවද කියලා?

පි : නැහැ ස්වාමිනි මම දාපු සටහන නෙමෙයි මේ සාජන් උදේ Return ඒක දානවා ස්වාමිණි ජංගම රථයේ ගිහිල්ලා ඇවිල්ලා. ඒකේ සඳහන් වෙලා තිබුණා ස්වාමිණි.

ප්‍ර : ඔබ නියෝගයක් දුන්න බවට සටහනක් නැහැ නේ ඒකේ?

පි : ඒකේ කිසිම තැනක මා නියෝගයක් දුන්න බවට සඳහන් වෙලා නැහැ ස්වාමිනි.

ප්‍ර : දැන් මහත්මයා 2019 අප්‍රේල් 21 වන දින කොළඹ කොටුව පොලිස් බල ප්‍රදේශය තුල පිපිරීම් සිදු වුණා ඔබ දන්නවද?

පි : ඒහෙමයි ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : කොහේද පිපිරීම් සිදු වුණේ කොටුව පොලිස් බලප්‍රදේශය තුළ?

පි : කොටුව පොලිස් බලප්‍රදේශය තුල කිංස්බරි හෝටලයේ සහ ෂැංග්‍රිලා හෝටලයේ ස්වාමිණි.

ප්‍ර : අප්‍රේල් 21 වෙනි දින 2019 ඔබ රාජකාරියේ නියුක්තව සිටිය දවසක්ද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මේ පිපිරීම් වෙන අවස්ථාව වන විට ඔබ කොටුව පොලිස් ස්ථානයේ රැදිලා හිටියද?

පි : එහෙමයි ස්වාමිණි

ප්‍ර : ඔබට ඇහුණද නැත්නම් කවුරු හරි කිව්වද ප්‍රහාරය සම්බන්ධයෙන්?

පි : ශබ්දෙත් ඇහුණා ස්වාමිණි දැන ගන්නට ලැබුණා 119 දුරකථන පණිවිඩයකුත් ආවා ස්වාමිනි.

ප්‍ර : ඒ අනුව ඔබ කොහාටද ගියේ මුලින්ම?

පි : මුලින්ම මම නිලධාරීන් කණ්ඩායමක් සාදා ගෙන අපරාධ සිදු වූ ස්ථානය කිංස්බරි හෝටලයට ගියා ස්වාමිණි.

ප්‍ර : කිංස්බරි හෝටලයට ඔබ යෑමෙන් අනතුරුව යම් අවස්ථාවක ඒ හෝටලයේ සිදු වූ කාරණා සම්බන්ධයෙන් අධිකරණයට තොරතුරු වාර්තා කිරීමක් කළාද?

පි : ඒහෙමයි ස්වාමිණි

ප්‍ර : මොකක්ද ඒ තොරතුරු වාර්තා කරන ලද අංකය?

පි : 300 යි මට හරියට ඒක මතක නැහැ ස්වාමිණි

ප්‍ර : B 13100/19 කිව්වොත් පිළිගන්නවද?

පි : ඒහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ අංකය යටතේ ඔබ අධිකරණයට කරුණු වාර්තා කිරීමේදි මොනවද ඔබ මුල් අවස්ථාවේදිම කරුණු වශයෙන් ඉදිරිපත් කලේ?

පි : මම ඉදිරිපත් කලේ මෙහෙම බෝම්බ පිපිරීමක් සිදු වෙලා තියෙනවා මේ අහවලුන්ගේ සාක්ෂි සටහන් කරලා තියෙනවා ස්වාමිනි. ඒ සාක්ෂිවලට අනුව මෙහෙම මේ තුවාල සිදුවීම්. මරණයට පත්වීම් සිදු වෙලා තියෙනවා. එම නිසා මෙම ස්ථානයට මහේස්ත්‍රාත් තුමා පැමිණ මහේස්ත්‍රාත් පරීක්ෂණයක් පවත්වන්නයි, මියගිය අයට පශ්චාත් මරණ පරීක්ෂණ පවත්වන්න නියෝග ලබා දෙන්න කියලා ස්වාමිණ ඉල්ලීමක් කලේ.

ප්‍ර : කවුද ඒ B වාර්තාව අත්සන් කලේ?

පි : B වාර්තාව අත්සන් කලේ මම හරි ස්ථානාධිපති හරි මට හරියට මතක නැහැ ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදි B වාර්තාවක් සාක්ෂිකරුට පෙන්වා සිටීමට අවසර අයැද සිටිනවා.

ප : බලන්න මේ ලේඛනයේ අත්සන් තියලා තියෙන්නේ කවුද කියලා කාගේ අත්සනද කියලා?
(සාක්ෂිකරු අදාල වාර්තාවට අවධානය යොමු කරවයි)
ඔබේ අත්සනද?

පි : නැහැ මගේ අත්සන නෙමෙයි ස්වාමිණි.

ප : ස්ථානාධිපති සාගර ලියනගේ මහතාගේද?

පි : නැහැ නැහැ ස්වාමිනි.

ප : වැඩ බලන ස්ථානාධිපති වශයෙන් සිටි කුමාරසිංහ මහතාගේද?

පි : කුමාරසිංහගේ වගේ ස්වාමිනි.

ප : ඔබේ අත්සන නෙමෙයි?

පි : ඔව්. නෙමෙයි ස්වාමිනි.

ප : ඔබ **B** වාර්තාව සකස් කලේ කවුද?

පි : මා විසින් සකස් කලේ.

ප : යතුරු ලියනය කළෙත් ඔබද?

පි : නැහැ නැහැ යතුරු ලියනය කලේ ළමයෙකු ලවා ස්වාමිනි. මා විසින් සකස් කලේ.

ප : කරුණු ඇතුලත් කළේ ඔබේ අනුදැනුම මත. ඊලඟට තියෙන **B** වාර්තාව බලන්න කොටුව පොලිස් ස්ථානයෙන් ඉදිරිපත් කරලා තියෙන. වැඩිදුර වාර්තාව,

පි : එහෙමයි ස්වාමිණි.

ප : ඒ කවදාද ඉදිරිපත් කරලා තියෙන්නේ වැඩිදුර වාර්තාවක් හැටියට?
(සාක්ෂිකරු අදාල **B** වාර්තාවට අවධානය යොමු කරයි)
කවදද ඒක ඉදිරිපත් කරලා තියෙන්නේ වැඩිදුර වාර්තාව ? 2019 මැයි මස 3 වන දින?

පි : එහෙමයි ස්වාමිනි.

ප : එහි අත්සන් තබා තිබෙන්නේ කවුද?

පි : එවකට පොලිස් ස්ථානාධිපති සාගර ලියනගේ මහතා.

ප : එවකට කියන්නේ අදටත් ඔහුනේ ස්ථානාධිපති? ඔබ හඳුනනවද සාගර ලියනගේ මහතාගේ අත්සන?

පි : හොඳින් හඳුනනවා ස්වාමිණි.

ප : ඔය වැඩිදුර වාර්තාවේ ඇතුලත් කරුණු කවුද සකස් කලේ?

පි : මා විසින් සකස් කලේ ස්වාමිනි.

ප : ඔබේ අවධානයට විශේෂ ස්ථානයක් මේ අවස්ථාවේදි යොමු කරනවා සාක්ෂිකරු. ගරු සභාපතිතුමනි ඒ සඳහා අවසර ඉල්ලා සිටිනවා ඒ සඳහා.

Parliament Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

ඔය දැන් පෙන්වා සිටින කොටස කියවන්න බලන්න ඔබේ අනුදැනුම ඇතුවද ඒ කොටස ඔය වැඩිදුර වාර්තාවට ඇතුලත් කලේ?

(සාක්ෂිකරු අදාල කොටස කෙරෙහි අවධානය යොමු කරවයි)

පි : කිංස්බරී හෝටලයේ සේවයේ යෙදී සිටි ඉෂාන් රොහාන් ජයවර්ධන යන අය මියගොස් ඇති අතර, බෝම්බය රැගෙන ආ සැකකරු මොහොමඩ් අසාන් මොහොමඩ් මුබාරක් යන අයගේ මෘත ශරීරය බවට හඳුනා ගෙන ඇත.

ප්‍ර : ඒ බෝම්බය රැගෙන ආ පුද්ගලයා යන මුබාරක් නමැති පුද්ගලයෙක් සම්බන්ධයෙන් මේ කරුණු ඇතුලත් කරල තියෙන්නේ ඔබේ අනුදැනුම ඇතුවද මේ වැඩිදුර වාර්තාවට ?

පි : එහෙමයි ස්වාමිනි

ප්‍ර : ඒ පුද්ගලයා මුබාරක් කියන පුද්ගලයාව මරණ පරීක්ෂණයේදි හඳුනා ගැනීමට අදාල මෘතදේහ කොටස් සම්බන්ධයෙන් ඔබ ගත්ත ක්‍රියාමාර්ග මොනවද, ඔබ එයට සම්බන්ධ වුණේ කෙසේද?

පි : ස්වාමිනි මේ බෝම්බකරුවන් සියළු දෙනාගේම මෘත ශරීර DNA පරීක්ෂණ ඒ සියල්ල සිදු කලේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන්. මා විසින් මේ කිසිවකුගේ එම පරීක්ෂණ සිදු කලේ නැහැ ස්වාමිනි. නමුත් මේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් දැනගත් පරිදි තමයි මම මේ නම යොදලා තියෙන්නේ ස්වාමිනි.

ප්‍ර : ඒ ශරීර කොටස් මෘත ශරිරාගාරයට ගෙනයාම සඳහා ඔබ සහභාගී වුනාද?

පි : නැත ස්වාමිනි සියළුම දේ එම ස්ථානයට යන කොට මෘත ශරීර, තුවාලකාරයෝ සියල්ලම රැගෙන යමින් සිටියේ අපි ඒම ස්ථානයට යන කොට ස්වාමිනි.

ප්‍ර : ඔබේ සහභාගිත්වයක් තිබුණේ නැහැ?

පි : නැත ස්වාමිණි.

ප්‍ර : මේ කිංස්බරි හෝටලයේ පිපිරීමෙන් මියගිය පුද්ගල සංඛ්‍යාව කොපමණද?

පි : කිංස්බරි හෝටලයේ මියගිය සංඛ්‍යාව ස්වාමිණි විදේශිකයින් 8 යි, සිංහල ජාතිකයන් එක්කෙනයි ස්වාමිනි බෝම්බකරුයි 10 දෙනයි.

ප්‍ර : ඒ අයගේ නම් හඳුනා ගන්න තොරතුරු හඳුනා ගැනීමට අදාල කර්තව්‍යන්වල ඔබ නියැළුනාද ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ අනුව මොන මොන ජාතිකයන්ද විදේශිකයන් වශයෙන් මිය ගිහිල්ලා තියෙන්නේ කියලා මේ ගරු සභාවට කියන්න පුළුවන්ද?

FAIR COMMENT BY JEZEEM

පි : ස්වාමිනි පෘතුගීසි එක්කෙනයි. ස්පේන් 2 යි ස්වාමිනි. ඉන්දියන් එක්කෙනයි, චයිනීස් 4 දෙනයි ස්වාමිණි. ඔක්කොම 8 දෙනයි ස්වාමිනි.

ප්‍ර : මේ මියගිය අයවලුන් සඳහා වන්දි ගෙවීමක් රජයෙන් සිදු වුණු බව ඔබ දන්නවද?

පි නැත ස්වාමිණි.

ප්‍ර : ඔබ එම කර්තව්‍යයට සහභාගී වෙලා නැහැ?

පි : නැහැ ස්වාමිනි.

ප්‍ර : කිංස්බරි හෝටලයේ ඔබ සඳහන් කළ ජාතිකයන් වශයෙන් විදේශිය ජාතිකයන් මියගිය අයට අමතරව ශ්‍රී ලාංකික එක්කෙනයි මියගියේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔහු කිංස්බරි හෝටලයේ සේවකයෙක්?

පි : සේවකයෙක් ස්වාමිණි.

ප්‍ර : දැන් මහත්මයා ඔබ ෂැංග්‍රිලා හෝටලයේ අපරාධ ස්ථානයට ගියාට කොටුව පොලිසියේ අපරාධ ස්ථානාධිපති වශයෙන්?

පි : අනිවාර්යයෙන් මම එම ස්ථානයට ගියා ස්වාමිනි. ගිහිල්ලා ඒ පිලිබඳව තොරතුරු ලබාගෙන කොටුව මහේස්ත්‍රාත්තුමාට ඒ පිලිබඳව වාර්තා කලෙත් මා විසින් ස්වාමිනි.

ප්‍ර : මොකක්ද B අංකය කරුනු වාර්තා කරන ලද? 13099/19 B කිව්වොත් හරිද?

පි : හරි ස්වාමිනි.

ප්‍ර : මුල්ම B වාර්තාව සකස් කිරීම කලේ ඔබ විසින්ද?

පි : එහෙමයි ස්වාමිනි.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදි ඒකී 13099/19 B අංකය යටතේ අධිකරණයට ගොනු වූ ප්‍රථම B වාර්තාව සාක්ෂිකරුට පෙන්වා සිටීමට අවසර අයැද සිටිනවා.

ප්‍ර : ඒ වාර්තාව අත්සන් කරලා තියෙන්නේ කවුද?

පි : ප්‍රධාන පොලිස් පරීක්ෂක කුමාරසිරි මහතා ස්වාමිනි.

ප්‍ර : ඔබ අත්සන හඳුනනවද?

පි : ඒහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඔය ලේඛනයේ තියෙන කරුණු ඇතුලත් කිරීම කරේ ඔබේ අනුදැනුම ඇතුවද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ෂැංග්‍රිලා හෝටලයේ බෝම්බකරුවන් කී දෙනෙක් සිටි බවට ඔබට තොරතුරු දැන ගන්න ලැබුණද ?

පි : මට 2 ක් සිටි බවට තොරතුරු ලබා ගත්තා ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ අයගේ මෘත ශරීර කොටස් හෝ ශරීර කොටස් මෘත ශරීරාගාරයට ගෙන යාමේ කටයුතු වලට ඔබ සහභාගී වුනාද ?

පි : නැත ස්වාමිනි .

ප්‍ර : ඔවුන්ට අදාල DNA වාර්තා ලබා ගැනීමට අදාලව ඔබ කරුණුවලට සහභාගී වුණාද?

පි : නැත ස්වාමිනි.

ප්‍ර : ෂැංග්‍රිලා හෝටලයේ කී දෙනෙක් සම්පූර්ණ වශයෙන් මියගියාද?

පි : 33 ක් වගේ ස්වාමිනි. මගේ මතකයේ හැටියට 33 ක් පමණ ස්වාමිනි.

(සාක්ෂිකරු ලේඛනයකට අවධානය යොමු කරයි)

හරි ස්වාමිණි, ඉන්දියාවේ එක්කෙනයි. බ්‍රිතාන්‍යයෙන් 3 දෙනයි ස්වාමිනි, ඉන්දියාවෙන් 6 දෙනයි ස්වාමිනි, බෙල්ජියමෙන් එක්කෙනයි. චීන ජාතික දෙන්නයි. ඩෙන්මාර්කයෙන් 3 දෙනයි ස්වාමිනි. තවත් බ්‍රිතාන්‍යයෙන් 2 යි, තවත් ඉන්දියානු එක්කෙනයි, ජපානෙන් එක්කෙනයි ස්වාමිනි ඔක්කොම 20 ස්වාමිනි.

ප්‍ර : විදේශිකයන් 20 යි, ශ්‍රී ලාංකිකයන් කී දෙනෙක් මියගියාද?

පි : ශ්‍රී ලාංකිකයන් ස්වාමිනි 10 දෙනයි ස්වාමිනි.

දැන් වේලාව : ප.ව. 6.10 යි

මෙතැන් සිට ල/ලේ :- යමුණා දසනායක මිය විසින්ය.

President Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

පෙර සටහන් ගැනීම ල/ලේ දම්මිකා මිය.
සටහන් ගැනීම ල/ලේ යමුනා දසනායක විසිනි.
වේලාව 6-10

<u>ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ශි හේරත් මහත්මිය:</u>

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී කිංග්ස්බරි හෝටලයේ මියගිය විදේශිකයන්ගේ නම් සහ සහ ඒ ජාතිකයන් කවරේද යන කරුණු වගේම ශ්‍රී ලාංකිකයාගේ නම ඇතුලත් අධිකරණයට කරුණු වාර්තා කරන ලද වැඩිදුර වාර්තාව 2019/05/03 දිනැතිව ගොනු කොට තිබෙනවා එම වාර්තාව මෙම සභාවට C.716 වශයෙන් සලකුණු කොට ඉදිරිපත් කිරීම සඳහා අවසර අයැද සිටිනවා. ඒ වගේම ෂැන්ග්‍රිලා හෝටලයේ මියගිය පුද්ගලයන් විදේශිකයන් සහ ශ්‍රී ලාංකිකයන් ඇතුලත් එකී වැඩිදුර වාර්තාව මෙම සභාවට C 717 වශයෙන් සලකුණු කොට ඉදිරිපත් කිරීම සඳහා අවසර අයැද සිටිනවා.

****

<u>ගරු විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා</u>.

ප්‍ර සාක්ෂිකරු දැන් ඔබගේ සේවය අත්හිටුවනවානේ ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර ඒකට ආසන්නතම හේතුව හැටියට ඔබ සඳහන් කරලා තියෙන්නේ මේ පාස්කු ප්‍රහාරය ගැන තොරතුරු හෝටල් වලට අනතුරු ඇගවීමක් ලබා දෙන්න ඔබ ඒ කාර්යය කලේ කාගේ උපදෙස් මතද ?

උ ස්වාමීනි අපරාධ අංශය බාරව කටයුතු කරනවා අධ්‍යක්ෂතුමෙක් කොළඹ අපරාධකොට්ඨාශයේ සහකාර පොලිස් අධිකාරිතුමෙක්. ඒ එක්කම ස්වාමීනි ස්ථානාධිපතිතුමන් දෙදෙනාම සැප්තැම්බර් මාසේ 23, 24 වෙනිදා ගරු පොලිස්පතිතුමා සහ ගරු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමාගෙන් සහ නියෝජ්‍ය පොලිස්පති කොළඹ දිසාව තුමාගෙන් පණිවිඩ ඇමතුම් ලැබෙනවා.අබු නැමති අන්වර්ථ නාමයකින් දෙවනි ත්‍රස්ත ප්‍රහාරයක් එල්ලවීම පිළිබඳ තොරතුරු ලැබිලා තියෙනවා කියලා ස්වාමීනි.

ප්‍ර ලිඛිතව ලැබුනාද ?

උ ලිඛිතව.

ප්‍ර ඔබ ලග තියෙනවාද ?

උ මං ලඟ තියෙනවා ස්වාමීනි.

ප්‍ර දැන් ඒ තොරතුරේ මොනවද කියලා තියෙන්නේ ?

උ මේකේ තොරතුරේ ස්වාමීනි මේ තොරතුර ජගත් අබේසිරි ගුණවර්ධන මහතා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති බස්නාහිර පළාත එවලා තියෙන්නේ ස්වාමීනි . 2019/04/21 වෙනිදින පාස්කු ප්‍රහාරයේ නායක මොහොමඩ් සහරාන් සමඟ සබඳතා පවත්වා ඇති මෙතෙක් අත්අඩංගුවට ගෙන නොමැති පුද්ගලයින් සම්බන්ධව කියලා ශිර්ෂගත කරුණකට

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

අදාලව පොලිස්පතිතුමා විසින් (අයි. ජී. පී. පි. ඒ. එස්.ඩි අයි.ජී 2499/19) IGP/PA/SDIG/OUT/22499/19 යටතේ 2009/09/18 වෙනි දින මා වෙත යොමු කරන ලද මෙම ඇමුණුම සමඟ ඇමුණුම් ගත ලිපි සම්බන්ධව අවධානය යොමු කරමි.එම ලිපිය මඟින් 2019/04/21 වෙනි දින එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරය මෙහෙයවන ලද මොහොමඩ් සහරාන් සමඟ සබඳතා පවත්වා ඇති මෙතෙක් අත්අඩංගුවට ගෙන නැති පුද්ගලයින්ගේ තොරතුරු ඇතුලත් වාර්තාවක් සමග ඇමුණුම් ගත කර ඇති අතර මොවුන් නුවරඑළිය හම්බන්තොට සහ මහනුවර යන ප්‍රදේශවල පවත්වන ලද වැඩමුළු වල් වලට සහභාගි ගිනි අවි සහ පුපුරන ද්‍රව්‍ය පිළිබඳ පුහුණුවක් හා දැනුමක් ලබා ගෙන ඇති බවත් වාර්තා කර ඇත. අබ්දුල් යන අන්වර්ථ නාමයෙන් මොවුන් මොහෙමඩ් සහරාන් විසින් හදුන්වා ඇති බවත් දෙවන ප්‍රහාරයක් සඳහා දිවුරුම් දී ඇති බවත් වාර්තා කර ඇත. අන්‍යාගමිකයන් ඝාතනය කිරීමට මරාගෙ මැරෙන ප්‍රහාරයක් හෝ විවිධ ආකාරයේ ඝාතනයක් සිදු කිරීමට ප්‍රතිඥා ලබා දී ඇති මෙන්ම මෙසේ වෛරී සහගත ලෙස කටයුතු කරන පුද්ගලයන්ගේ නාම ලේඛණයක් මා විසින් මීට පෙර ඔබ වෙත යොමු කර ඇති අතර දෙවනුව හුදකලා ප්‍රහාරයක් එල්ල කිරීමේ ඇති හැකියාව ඉහළ මට්ටමක් පවතින බැවින් මෙම පුද්ගලයන් හා ඔවුන්ගේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අවධානයෙන් සිට කඩිනම් අත්අඩංගුවට ගැනීම් පියවර ගත යුතුයි.

ප්‍ර කවිද අත්සන් කරලා තියෙන්නේ ?

උ මේක අත්සන් කරලා තියෙන්නේ ජගත් අබේසිරි ගුණවර්ධන නියෝජ්‍ය පොලිස්පති බස්නාහිර පළාත.

ප්‍ර දිනය?

උ 2019/09/23.

ප්‍ර දැන් ඊට පස්සේ ඔබ මොකද කරේ?

උ ඊට පස්සේ ස්වාමීනිඒ එක්කම පොලිස්පතිතුමා විසින් එවලා තිබුනා 35 දෙනෙක් ගේ නම් ඇතුලත් වාර්තාවක්.ඒ නම් මේ සහරාන්ගේ සම්බන්ධතා කට්ටිය 35 දෙනාම . ඒ වාර්තාවත් එවලා තිබුනා.ඊට පස්සේ මට සහකාර පොලිස් අධිකාරිතුමා අපරාධ බලන එක්කෙනා මහත්මයා මට කිව්වා සුරියකුමාර මේකට ගතයුතු ක්‍රියා මාර්ග අරගෙන අදම වාර්තාවක් ඕනේ කියලා ඒ නම් ලිස්ට් එක සම්බන්ධව ඊට පස්සේ ස්වාමීනි මම කරපු දේ මගේ ඒරියා එකේ ලොකුම පිපිරීම් දෙක වුනේ ස්වාමීනි. ඒ තරම් ඝාතන වුනා. මම කරපු දේ ඒවා වනුනෙත් ඒ හෝටල්වල නවාතැන් ගෙන ඉඳලා තමයි ස්වාමීනි මම කරපු දේ හෝටල්වලට දැම්ම ලියුමක් ස්වාමීනි ඒ වෙලාවේ ස්ථානාධිපතිතුමා හිටියා නම් ඒත අත්සන් කරනවා ස්වාමීනි. පස්සේ ඒක මාධ්‍ය ජාලා වල ගියාට පස්සේ ඒ ගොල්ලන් බය වෙලා ඔක්කෝම මගේ පිටින් මේවා කරලා දැම්මා . මේක තමයි ස්වාමීනි ඒ ලියුම.

ප්‍ර කියවන්න බලන්න මොනවද තියෙන්නේ කියලා?

FAIR COMMENT BY JEZEEM

උ මම දැම්මේ ස්වාමීනි නවාතැන් ගන්නා දේශිය සහ විදේශිය පුද්ගලයන්ගේ තොරතුරු දෛනිකව ලබා ගැනීම සම්බන්ධව. මහත්මයාණෙනි, 2019/04/21 වෙනි දින ISIS ත්‍රස්තවාදීන් විසින් සංචාරක හෝටල් සහ ආගමික ස්ථාන ඉලක්ක කර ගනිමින් එල්ල කරන ලද ප්‍රහාරය මෙන් දැවැන්ත ප්‍රහාරයක් ඉදිරියේදි මෙවන් ස්ථාන හා මර්මස්ථාන ඉලක්ක කරමින් සිදු කිරීමට සුදානම් වන බවට බුද්ධි අංශ වෙත තොරතුරු ලැබී ඇත. සත්‍ය ඒක ස්වාමීනි. එම ප්‍රහාර සඳහා යොදා ගන්නා තැනැත්තන්ගේ තොරතුරු ශ්‍රී ලංකා පොලිසිය සතුව ඇත. ඒ කියන්නේ මේ ගොල්ලන්ගේ විස්තර මං ඒවා දැනුම් දීලා නැහැ ස්වාමීනි අපි ගාව තියෙනවා.එම තොරතුරු දිනපතාම පරීක්ෂාවට ලක් කිරීම සඳහා ඔබ හෝටලයට නවාතැන් ගැනීමට පැමිණෙන දේශීය සහ විදේශීය තැනැත්තන්ගේ තොරතුරු ඇතුලත් වාර්තාවක් දෛනිකව ලබා ගැනීමට අවශ්‍යව ඇත. එම තොරතුරු ඇතුලත් වාර්තාව සෑම දිනකම පෙරවරු 09.00 ට ප්‍රථම කොටුව පොලිසියේ අපරාධ විමර්ෂණ අංශයේ ස්ථානාධිපති වෙත ලැබීමට සලස්වන මෙන් කාරුණිකව දන්වා සිටිමි. තවද හෝටල් සඳහා නවාතැන් ගැනීම සඳහාත් වෙනත් කටයුතු සඳහා පැමිණෙන පුද්ගලයින් සහ ඔවුන්ගේ ගමන් මළු දැඩි පරීක්ෂාවට ලක් කිරීමට සිදු කල යුතු ඇති අතර යථා කාලයේදී මේ පිළිබඳව දැනුවත් කිරීමේ සාකච්ඡාවක් ඔබ වෙත ලබා දීමට කටයුතු කරමි. මෙවැනි ප්‍රහාර නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා ඔබ විසින් දක්වන සහයෝගය අගය කොට සලකමි කියලා ස්වාමීනි විශේෂ දැනුම්දීම සඳහා ස්ථානාධිපති සාගර ලියනගේ මහතාගේ ජංගම දුරකථන අංකය,අපරාධ විමර්ෂණ මගේ ජංගම දුරකථන අංකය ස්ථානාධිපති ස්ථානාධිපති කොටුව ප්‍ර.පො.ප., පොලිස් ස්ථානය , කොටුව කියලා ඒක ගැහුවේ. නමුත් ඒ වෙලාවේ සාගර ලියනගේ මහත්මයා හිටියේ නැහැ ස්වාමීනි. පාලන අංශයේ ස්ථානාධිපතිට කියලා මං අත්සන් කරලා 119 බයිසිකලේ අවුට් එකක් දාලා ගිහිල්ලා මේක බෙදුවේ ස්වාමීනි.

ප කොහේටද බෙදුවේ?

උ මේ හෝටල් තියනවා එකක් ඇවිල්ලා. හිල්ටන් හෝටලය, ගලදාරි හෝටලය , කිංග්ස්බරි හෝටලය, ෂැන්ග්‍රිලා හෝටලය, ටාජ් හෝටලය, ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලය.සිටි හෝටලය, ස්ටුවර්ඩ් හෝටලය, ෆෙයාවෙල් හෝටලය, ද වන් හෝටලය. මේ සියල්ලටම.

ප කවදාද බෙදුවේ ?

උ හරියටම බෙදුවේ ස්වාමීනි 2 වෙනිදා.

ප ඊට පස්සේ මොකද වුනේ ?

උ දෙවනිදා බෙදුවට පස්සේ ස්වාමීනි, මම නිවසට යමින් සිටියේ ස්ථානාධිපතිතුමා මට කතා කරලා කිව්වා මොකක්ද අර ලියුම ඒකටමාර ලෙඩක් ඉක්මනට එන්න පොලිසියට කියලා.ඊට පස්සේ මම

FAIR COMMENT BY JEZEEM

ගියා ස්වාමීනි. ඊට පස්සේ මමයි ස්ථානාධිපති පාලනයි දෙන්නම අපි ගෙන්නුවා එතෙන්ට. ස්වාමීනි ගෙන්නලා කිව්වා මේකේ තියෙන්නේ ඇත්ත තමයි නමුත් මේක පොලිස්පතිතුමාට දැකලා කව්රුහරි දාලා සමාජජලා වල හැමතැනම යනවා මේක නවත්වන්න බැහැදැන් දෙන්නටම වැඩේ වෙනවා කියලා ස්වාමීනි. ඊට පස්සේ එළි වෙනකල් කට උත්තර ගත්තා අපිදෙන්නාගේ ස්වාමීනි. මේක දේශපාලන එකකට හරවා ගන්නත් බැලුවා ස්වාමීනි. නමුත් සත්භාවයෙක් කෙරුවේ ස්වාමීනි මේ අපි මේ කිසිම දෙයක් හිතාමතා නෙමේ අපි මේ ඒත් එක්ක්ම මම මේතක කරන්න එකම හේතුවක් තමයි මැල්කම් කාදිනල් හිමිපාණන් මෙන්න මේක සමාජ ජාලාවේ දාලා තිබුනා ඊට ඔක්කෝබර් 01 වෙනිදා.

ප්‍ර මොනවද එකේ කියන්නේ ?

උ ඒකේ දාලා තිබුනේ. ජේ. ආර්. කුලතුංග ආර්. එස්. පි. මේජර් ජනරාල් විශ්‍රාමික බුද්ධි ප්‍රධානිතුමා තමයි ඒක දාලා තිබුනේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානීට, අන්තවාදී හිංසාකාරී ප්‍රහාරයක් එල්ල වීමේ තර්ජනයක් ඇති බවට අනතුරු ඇඟවීම.

ප්‍ර ඉතින් ඔබ කාගේ හරි උපදෙස් මතද ඔබ මේ ලිපිය යැව්වේ හෝටල්වලට ?

උ ස්වාමීනි හැම කෙනෙක්ම හිතන් ඉන්නේ එහෙමයි මට එහෙම එකක් නැහැ. අන්තිමට මට තමයි සාගර ලියනගේ මහත්මයාත් මේ දේවල් මමනේ යැව්වේ හරිද අතට ගෙනල්ලා දීලා ඉවර වෙලා මේක ප්‍රශ්ණයක් වෙන්නේ නැහැ කියා ගන්න කියලා ඉතින් ඒ වගේ ස්වාමීනි මමත් බිය වුනා ඒ වගේ දෙයක් ආවොත් තවත් මට ලොකු ප්‍රශ්ණයක් වෙයි කියලා ස්වාමීනි.නැතුව ඔය කිසි කෙනෙක්ගේ මේ බලපෑමක් නෙමේ මම දැන් මාස 09 ක් මොනවත් නැතුව මගේ පවුලත් එක්ක ජීවත් වෙනවා ස්වාමිනි. මාස 09 ක්.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර සාක්ෂිකරු ඔය ලියුම අරින්න පෙර දෛනික වාර්තා හෝටල් වලින් එවන්නේ නැද්ද තමන්ලට ?

උ හෝටල් වලින් එව්වේම නැහැ ස්වාමිනි.

ප්‍ර ඒ කියන්නේ තමන් නවාතැන් නවාතැන් ගන්න පුද්ගලයින්ගේ පිළිබඳ විස්තර ?

උ මුලම එව්වා. 21 ප්‍රහාරය වෙච්ච දිනවල නම් එව්වා.ඊට පස්සේ මේගොල්ලන් ඒක ගණන් ගන්නේම නැතිවුනා ඒක තමයි ස්වාමීනි මං අර දැවැන්ත ප්‍රහාරයක් කියලා අර බය කරලා මේක ගෙන්න ගන්න ක්‍රමයක් හදා ගත්තේ.

ප්‍ර අප්‍රේල් 21 දිනයට පෙර එව්වාද ඒ ගොල්ලෝ ?

FAIR COMMENT BY JEZEEM

උ ස්වාමීනි.

ප අප්‍රේල් 21 ට පෙර 2019?

උ නැහැ එව්වේ නැහැ ස්වාමීනි.

ප දෛනික වාර්තා එව්වේ නැහැ ?

උ නැහැ නැහැ ස්වාමීනි.

ප එහෙම එවන්න කියලා ඉල්ලීමක් කරලා තිබුනේ නැහැ ස්වාමීනි?

උ ඉල්ලීමක් කරලා තිබුනේ නැහැ ස්වාමීනි. බුද්ධි අංශ වලට විතරයි ඒ ගොල්ලෝ උත්තර දුන්නේ මං හිතන්නේ ස්වාමීනි.

ප බුද්ධි අංශ වලට විතරයි ?

උ එහෙමයි ස්වාමීනි.

****

ගරු විනිසුරු බන්දුල අතපත්තු මහතා.

ප ඔබ බුද්ධි අංශ වලින් ඉල්ලීමක් කලේ නැද්ද ?

උ බුද්ධි අංශ වලින් විමසීමක් කරා ස්වාමීනි.ඒ ගොල්ලෝ කිව්වෙත් මේ දෙවනි ප්‍රහාරයක් තියෙනවා අත ලගම කියලා.

ප දිනයක් කිව්වේ නැහැ ?

උ දිනයක් කිව්වේ නැහැ. කාදිනල් හිමිපාණෝ උතුමාණන් තමයි 15 ඉඳලා 25 අතර කාලයේ වෙනවා කියලා තිබුනේ. ඒක දැකලා තමයි අපේ ASP. මහත්මයා කිව්වේ මේ ඉක්මනට ක්‍රියා මාර්ග ගන්න ඕනේ කොහොම හරි කියලා මේක ගිය පාර වගේ වෙන්න බැහැ කියලා ස්වාමීනි. ස්වාමීනි මගේ ඒ ලියුම නිසා සමහර වෙලාවට ඕක වැලකුනා වෙන්නත් පුලුවන් ඒක වැලකුනා වෙන්නත් පුලුවන්. ගිය පාර මං ඒවගේ ලියුමක් දැම්මා නම් ඒකත් වැලකෙන්න තිබුනා කව්රු හරි දැම්මානම් නමුත් වුනේ නැත්නම් ඒ දාපු එක්කනත් මං වගේ මේ වගේ interdict වෙන්න තිබුනා ස්වාමීනි.

ප තමන් ඔය කියපු දේවල් කොහේට හරි කියාල විස්තර ඉදිරිපත් කරාද ?

උ කිසි කෙනෙකුට ඉදිරිපත් කරලා නැහැ ස්වාමීනි මේක අද කියන්නම ඕනේ කියලා ආවේ ස්වාමීනි.

ප ඇයි ප්‍රකාශයක් තමන්ගේ ලබාගත්ත වෙලාවේ?

උ ලබා ගත්ත වෙලාවේ නැහැ මං දැනුම් දීලා තියෙනවා ස්වාමීනි.

ප නැහැ නැහැ පොලිසියේ ඉහල නිළධාරීන්ට ප්‍රකාශයක් ලබා දෙන වෙලාවේ?

උ ඒ නිළධාරින්ට ප්‍රකාශ දෙනවෙලාවේ අපිට ඕනේ විදියට ප්‍රකාශ කරන්නේ නැනේ ස්වාමීනි.

ප ඒ කියන්නේ ?

උ අපි දෙන්නා ඉතින් ඒ ගොල්ලන්ට ඕනේ විදියට ප්‍රකාශ දුන්නා.ඒ ගොල්ලෝ කිව්වේ අපිට trancer එකක් දෙයි ප්‍රශ්ණයක් නැහැ කියලා

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

08 වෙනිදා කෙලින්ම වැටුපුත් නැතිව අපි වැඩ තහනමට ලක් කරලා ස්වාමිනි. ඒ වැඩ තහනමට ලක් කරලා තියෙන්නේ ස්වාමීනි පොලිසිය අපකීර්තිදායක මේවා කෙරුවා කියලා

ප්‍ර ඒ සම්බන්ධයෙන් පොලිස් කොමිසමට දැන්වුයේ නැද්ද ?

උ පොලිස් කොමිසමට දැන්වුවා ස්වාමීනි. පොලිස් කොමිසමේ කට්ටිය ඒ ගැන හරියට දුක්වුනා. ඔවුන් පොලිස්පතිතුමාගෙන් ඒ පිළිබඳ වාර්තා ඉල්ලුවා . තවම මේ වෙනකම් පරීක්ෂාත් නැහැ වාර්තාත් නැහැ ස්වාමීනි. මේකේ තියනවා පොලිස් සේවය අපකීර්තියට ලක් කරලා කියලා මම මේ කරපු දෙයින්.

ප්‍ර කවිද ඒ ලියුම එවලා තියෙන්නේ ?

උ ඒක එවලා තියෙන්නේ විනය හා කල්ක්‍රියා කොට්ඨාශය රොහාන් ප්‍රේමරත්න කියලා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීතුමා . ශ්‍රී ලංකා පොලිසිය සහ සමස්ත රාජ්‍ය සේවයම අපකීර්තියට පත් කර ඇති බැවින්.

ප්‍ර දැන් තමන් ගේ පඩි මොනවා හරි හම්බ වෙනවාද ?

උ කිසිම දෙයක් නැහැ ස්වාමීනි.

****

<u>ගරු විනිසුරු අදිකාරි මැතිණිය.</u>

ප්‍ර ඔබට ඉල්ලීමක් කරන්න බැරිද වැටුප් ගෙවන්න කියලා පොලිස් කොමිසමට?

උ ස්වාමීනි වැටුප් නෙමේ මාව සේවයේ පිහිටුවන්න කියලා මම ඉල්ලිම කරලා තියෙනවා interdic වෙලා මාස දෙකෙන් විතර කලේ. තවම ඒ පිළිබඳ කිසිම තොරතුරක් මට ලැබිලා නැහැ ස්වාමීනි.

ප්‍ර දැන් ඔබට විරුද්ධව විනය පරීක්ෂණයක් තියෙනවානේ ?

උ විනය පරීක්ෂණයක් තියනවා තියනවා කිව්වාට තවම විනය පරීක්ෂණයකට කතා කරලත් නැහැ ස්වාමීනි.

ප්‍ර චෝදනා පත්‍රයක් දීලත් නැහැ ?

උ නැහැ ස්වාමීනි. මම විතරක් නෙමේ ස්වාමීනි පාලන අංශයේ ස්ථානාධිපතිත්. දෙන්නම.

ප්‍ර වැඩ තහනම් වෙලා දැන් වැටුප් නැතුව අවුරුද්දක් විතර වෙනවාද ?

උ දැන් 09 ක් වෙනවා ස්වාමීනි. ඔක්තොම්බර් 08 වෙනිදා මාස 07 ක් 08 වෙනවා ස්වාමීනි. ඔක්තෝම්බර් 08 ඉඳලා ස්වාමීනි. ගෙදර යනකොට මැසේජ් එක ආවේ ස්වාමීනි.

ප්‍ර මොනවද ඔය චෝදනා දැන් අර කිව්වේ අපකීර්තියට පත් කරා කියලා ඒකේ මොනවද තියෙන්නේ තව ?

උ ශ්‍රී ලංකා පොලිසියේ කොටුව පොලිස් ස්ථානයට අනුයුක්තව අපරාධ අංශයේ ස්ථානාධිපති ලෙස කටයුතු කරන ඔබ කොටුව පොලිස් ස්ථානයට කිසිදු දැනුම් දීමක් සිදු නොකර 2019/04/21 වෙනිදින අයි. එස් අයි. එස්. ත්‍රස්තවාදීන් සංචාරක හෝටල් සහ ආගමික ස්ථාන

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ඉලක්ක කරන ලද ප්‍රහාරය මෙන් දැවැන්ත ප්‍රහාරයක් ඉදිරියේදී සිදු කරන බවට තොරතුරු ඇති බවට සඳහන් කරමින් මහජන කැළඹීමක් හා ශ්‍රීලංකා පොලිසිය අපකීර්තියට ලක්වන ආකාරයේ ලිපියක් සකස් කර එම ලිපිය පාලන අංශයේ ස්ථානාධිපති , පොලිස් පරීක්ෂක ඩබ. ඒ. වීරසිංහ විසින් අත්සන් කරවා ස්ථානාධිපති කොටුවගේ නිල මුද්‍රාව යටතේ පොලිස් වසමේ පිහිටි ප්‍රධාන පෙලේ සංචාරක හෝටල් වලට මෙය යොමු කර ඇති බවට සිදුකරන මූලික විමර්ෂන වලින් අනාවරණය වීඇත. ඒ අනුව ආරක්ෂාව සම්බන්ධයෙන් ලැබුණු තොරතුරක් ප්‍රසිද්ධියට පත්කිරීමට පෙර ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳ මා විසින් නිකුත් කරන ලද ආර්. ටී. එම්. 247 පණිවිඩයේ සඳහන් කරුණු වලට පටහැනිව ඔබ විසින් අදාල ලිපියොමු කිරීමට කටයුතු කර ඇති බවට පැහැදිලිව නිරික්ෂණය වේ.ඔබ විසින් ශ්‍රී ලංකා පොලිසිය සමස්ත රාජ්‍ය සේවයම අපකීර්තියට පත්වන ලෙස කටයුතු කර ඇති බැවින් එම ක්‍රියාවෙන් අනිකුත් නිළධාරීන්ට වැරදි පූර්වාදර්ශයක් වන බැවින් ඔබ තවදුරටත් සේවයේ තබා ගැනීමෙන් පොලිස් සේවයේ කීර්තියට, අභිමානයට හානියක් සහ කැලලක් සිදුවන බැවින්ද මේ සම්බන්ධයෙන් ඉදිරි පරීක්ෂණ කටයුතු සඳහා සෘජුව හෝ අන්‍යාකාරයෙන් ඔබගේ බලපෑම් සිදුවිය හැකි බැවින් ද 2017/4/ 24 අංක 216/06 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතින්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ බලතල ප්‍රකාරව ආයතන සංග්‍රහයේ දෙවන කාණ්ඩයේ පරිච්ඡේදයේ 31 (1) වගන්තිය අනුව ක්‍රියා කරමින් විධි විධාන ප්‍රකාරව වහාම ක්‍රියාත්මක වන පරිදි ඔබගේ රාජකාරි වැඩ තහනමට ලක් කර කේෂ්ත්‍ර පරික්ෂණ මුලස්ථානයට ස්ථාන මාරු සිදු කරමි.ඔබගේ රාජකාරි වැඩ තහනම් කාලය සඳහා වැටුප් ලබා ගැනීමට හිමිකමක් නොමැත.

ප්‍ර වැඩ තහනම් කර ස්ථාන මාරු කරනවා කියන්නේ මොකක්ද ?

උ වැඩ තහනම් කරලා ස්ථානයෙන්ම මාරු කරලා තියෙන්නේ ස්වාමීනි.

ප්‍ර ඉතින් වැඩ තහනම් කලාට ස්ථාන මාරුකිරීම කරන්න බැහැනේ ගෙදරම යන්න ඕනේ වැඩ තහනම් කරපුහාම ? ඔබ ස්ථානාධිපතිගෙන් අවසරයක් ගත්තේ නැද්ද ඔය ලියුම ගහන්න ඉස්සෙල්ලා? පෙලිස් ස්ථානාධිපතිවරයාගෙන් ?

උ මේක ස්වාමීනි අපි කට්ටිය ගෙන්වන්න තමයි ඉස්සෙල්ලා අපි ලියුම ගහන්න හැදුවේ ,?

උ මොන කට්ටිය ගෙන්වන්නද ?

උ හෝටල් වල කට්ටියව .ගෙන්වලා සාකච්ඡාවක් පවත්වන්න. ස්ථානාධිපති මේක දන්නවා ඒ ස්ථානාධිපතිතුමා ස්ථානාධිපති වෙලා නැහැ එතකොට වැඩ බලන ස්ථානාධිපති හරිද ඉතින් ස්වාමීනි එයා හුහක් අමාරුවෙන් තමයි ස්ථානාධිපතිකම රැක ගන්න උත්සාහ කලේ.

ප්‍ර: නෑ නෑ දැන් තමුන්ගෙන් අහන ප්‍රශ්වලට උත්තර දෙන්න

FAIR COMMENT BY JEZEEM

පි: එහෙමයි ස්වාමිනි

ප්‍ර මේ කොමිෂමට කථා කරන ක්‍රමයකුත් තියෙනවද ඒකක් අනුගමනය කරලා කථා කරන්න?

උ: හරි සමාවෙන්න ස්වාමිනි.

ප්‍ර මම ඔබගෙන් ඇහුවේ දැන් ඔබ ස්ථානාධිපති නෙවෙයිනේ ?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර දැන් ඔය තියෙන බරපතලම චෝදනාව තමයි ස්ථානාධිපතිවරයා නොදන්වා ඔහුගේ තනතුරු නාමය පාවිච්චි කරලා ලියුම් ගැහුවා කියන එක. දැන් ස්ථානාධිපතිගෙන් අහන්නේ නැතුවද ඔය වැඩ කරේ කියලා මං තමන්ගෙන් අහන්නේ?

උ නැහැ ස්වාමිනි ස්ථානාධිපතිතුමා මේක දන්නවා.

ප්‍ර නැහැ මං ඇහුවේ ඇහුවේ නැද්ද අවසර ගත්තේ නැද්ද මේ ලියුම යවන්න ඉස්සෙල්ලා ?

උ අපි මේ ලියුම් දාන්නේ ස්වාමිනි ඇත්තටම ස්ථානාධිපතිතුමා දැනුවත්ව තමයි මේ ලියුම දාන්නේ මොකද හේතුව අපේ ලියුම අරගෙන යන්නෙත් 119 බයිසිකලේ ස්වාමීනි. ගිහිල්ලා බාරදීලා ඇවිල්ලා රිටර්න් එකේ දානවා මේ මේ අහවල් අහවල් අය බාරදුන්න කියලා

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මහතා</u>

සාක්ෂිකරුගෙන් ප්‍රශ්ණ ඇසීමේ අවස්ථාවක් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥ වරයාට අවශ්‍ය දැයි විමසමි.අවශ්‍ය බව දන්වයි.

****

<u>ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා</u>

ප්‍ර සාක්ෂිකරු තමන් කිව්වා ස්ථානාධිපති මේක ගැන දන්නවා කියලා තමා මේ එවපු ලියුම සම්බන්ධයෙන් ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර ඒ කිසිම සාධකයක් තිබෙනවාද තමන් ලග ඒක ඔප්පු කරන්න ස්ථානාධිපති දන්නවා කියලා ?

උ ස්වාමිනි මොකද ස්ථානාධිපති තුමා නෙවේනේ අත්සන් කලේ ඒකේ ස්වාමිනි හදිසි අවස්ථාවක පාලන අංශයේ ස්ථානාධිපතිතුමා ළඟා තමයි අත්සන් කරන්නේ.

ප්‍ර ඒ කියන්නේ කිසිම තමන්ට ඒක ස්ථානාධිපති දන්නවා කියලා ඔප්පු කරන්න කිසිම සාධකයක් නැහැ?

උ නැහැ ස්වාමිනි.

ප්‍ර දැන් තමන් කිව්වා මේ අතිගරු මැල්කම් කාදිනල් රන්ජිත් හිමිපාණන් ගැන තමන් සඳහන් කෙරුවා ?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

උ එහෙමයි ස්වාමිනි.

ප මොකක්ද ඒ කිව්වේ ?

උ ස්වාමිනි එතුමා අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් විසින් අතිගරු ජනාධිපතිතුමාට වෙත ඉදිරිපත් කරන ලද ලිපියක් මගින් ඔක්තෝබර් මස 15 දින සිට 25 දින අතර කාල පරාසය තුල කිතුණු දේවස්ථාන වෙත යලිත් වරක් කිසියම් හිංසාකාරී ප්‍රහාරයක් එල්ලවීමේ තර්ජනයක් ඇති බවට අනතුරු ඇඟවීමක් ලැබී ඇති බව සඳහන් කර ඇත. තවද ඇතැම් අන්තවාදී කොටස් රටතුල දිගින් දිගටම කලබල කාරී වාතාවරණයක් ඇති කරමින් මැතිවරණ උණුසුම පවතින කාලසීමාව තුල තත්වය තවත් ව්‍යාකූල කිරීමේ හැකියාවක් පැවතිය හැකි බැවින් ඉදිරි මාසය කිහිපය පුරා පාස්කු දින ප්‍රහාරයෙන් පසු කිතුණු දේවස්ථාන සඳහා ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය අනුයුක්ත කොට ක්‍රියාත්මක කර තිබූ ආරක්ෂක වැඩ පිලිවෙල යලින් ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලීමක්ද සිදු කර ඇත. එබැවින් යොමු ගත සාකච්ඡාවේදී ලබා දුන් උපදෙස් පරිදි ඉහත සඳහන් කාල සීමාව අනාවරණය පරිදි දේවස්ථාන හා පුද්ගලයින් ආරක්ෂාව තහවුරු වන පරිදි සුදුසු ආරක්ෂක වැඩ පිලිවෙලක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිනු ලැබේ ඒ කියන්නේ .

ප එය කව්ද ලිව්වේ කාටද ලිව්වේ ?

උ මේක ජනාධිපතිතුමාට මැල්කම් කාදිනල් රන්ජිත් හිමිපාණන් එවා තිබෙන්නේ ස්වාමීනි ඊට පස්සේ ආරක්ෂක.

ප තමන් ඔය කියවන ලියුම තමන් කියවනවානේ ?

උ එහෙමයි ස්වාමීනි.

ප ඒකියවන ලියුම කව්රු විසින් කාට එවන ලද ලිපියක්ද ?

උ ජාතික බුද්ධි ප්‍රධානි විසින් ස්වාමිනි ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානිට.

ප එතකොට දැන් ඒක තමන්ට ලැබුනේ කොහොමද ?

උ මම සමාජජලා වෙන් දැක්කේ ස්වාමිනි.

ප ඒක දැන් සමාජ ජාලාවෙන් ලැබුනට පස්සේ තමා මොකක්ද ගත්ත ක්‍රියා මාර්ගය ?

උ නැහැ ස්වාමිනි මේකත් මට ලැබිච්ච බුද්ධි තොරතුරුත් සම්බන්ධව මට හිතුනා යම්කිසි ලොකු දෙයක් ඇති වෙයි කියලා ස්වාමිනි.

ප තමන්ට ලැබුනේ නැහැ ?

උ මට ලැබුනේ නැහැ . නමුත් මට ලැබුනා ස්වාමීනි අපේ පොලිස්පතිතුමාගෙන්.

ප ඒ කවද්ද ?

උ ඒත් 6/23. සැත්තැම්බර් 23 . 27

ප මොකක්ද ඒ ලිපියේ තියෙන්නේ ?

උ දැඩි අවධානයක් යොමු කල යුතු බුද්ධි තොරතුරක් නියෝජ්‍ය පොලිස්පතිතුමා ස්වාමිනි එවන්නේ. 2019/04/21 දින පාස්කු ප්‍රහාරයේ

FAIR COMMENT BY JEZEEM

නායක මොහොමඩ් සහරාන් සමඟ සම්බන්ධතා ඇති මෙතෙක් අත්අඩංගුවට ගෙන නොමැති පුද්ගලයන් සම්බන්ධව උක්ත කරුණට අදාලව පොලිස්පතිතුමා , අයි. ජී. පි. පි. ඒ. සිනියර් ඩි. අයි. ජී. 2499/219 හා පොලිස් නියෝජ්‍ය පොලිස්පතිතුමා ගේ පණිවිඩ ඔබගේ දැඩි අවධානයත් යොමු කරමි. එම බුද්ධි තොරතුර මගින් 2019/04/21 දින එල්ල වූ පාස්කු ප්‍රහාරය මෙහෙයවන ලද මොහොඩ් සහරාන් සමඟ සබඳතා පවත්වා ඇති මෙතෙක් අත්අඩංගුවට ගෙන නොමැති පුද්ගලයින්ගේ තොරතුරු ඇතුලත් වාර්තාවක් මේ සමග ඇමුණුම් ගත කර ඇති අතර මොවුන් නුවරඑළිය හම්බන්තොට සහ මහනුවර යන ප්‍රදේශවල පවත්වන ලද වැඩමුලුවලට සහභාගි වී ගිනි අවි සහ පුපුරන ද්‍රව්‍ය පිළිබඳ පුහුණුවක් සහ දැනුමක් ලබා ගෙන ඇති බවට වාර්තා කර ඇත. අබු යන අනවර්ථ නාමයෙන් මොවුන් මොහොමඩ් සහරන් විසින් හඳුන්වා දී ඇති බවත් මොවුන් දෙවනි ප්‍රහාරයක් සඳහා දිවුරුම් දී ඇති බවත් පැහැදිලිව සඳහන් කර ඇත.

ප්‍ර දැන් මේ ලිපිය තමන්ට ලැබුනා ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර ඒ සම්බන්ධයෙන් තමා යම් ක්‍රියා මාර්ගයක් ගත්තාද?

උ ඒ ගත්ත ක්‍රියා මාර්ගය තමයි මොකද 35 දෙනෙක් ගෙන් සමන්විත නාම ලැයිස්තුවක් තිබුනානේ ස්වාමීනි මම හෝටල් වලින් බලාපොරොත්තු වුනේ මොකද හෝටල්වලටනේ අපේ ඒරියා එකේ බෝම්බ දෙකක් පිපිරුනේ ස්වාමීනි. ඒ නිසා මං හෝටල් වලින්බලාපොරොත්තු වුනා මොවුන් ඇවිල්ලා නතර වුනොත් මට මොවුන් පිළිබඳ තොරතුරු ලබා ගන්න හැකියාවක් ලැබෙයි කියලා. ඒක නිසා තමයි අරක ඇරියේ ලියුම ඇරියේ ස්වාමිනි.

ප්‍ර ඒ කියන්නේ තමන් තමන්ට ලැබුනු ලිපිය මත ක්‍රියා කරලා තමයි ?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර දැන් මේ කරුණු ඔබතුමාගේ සේවය නතර කරන අවස්ථාවේදි මේ කරුණු ඉදිරිපත් කෙරුවාද ?

උ ඉදිරිපත් කරා ස්වාමිනි.මගේ ඇපිල් එකේ අභියාචනයේ සියල්ල ඉදිරිපත් කලා ස්වාමිනි.

ප්‍ර එතකොට අර අතිගරු මැල්කම් කාදිනල් රන්ජිත් හිමිපාණන් කියපු ප්‍රකාශයත් තමන් ඉදිරිපත් කෙරුවාද ?

උ ඒක ඉදිරිපත් කලේ නැහැ ස්වාමිනි. .

ප්‍ර ඒකඅදද පළමුවතාවට මේ ගරු කොමිෂන් සභාවටය ඉදිරිපත්කලේ?

උ මම ඉදිරිපත් කලේ අද ස්වාමිනි.

ප්‍ර මීට ඉස්සෙල්ලා ඉදිරිපත් කරලා නැ?

උ නැහැ ස්වාමිනි.

ප්‍ර ඇයි ඒක ඉදිරිපත් කලේ නැත්තේ ?

FAIR COMMENT
BY JEZEEM

උ ඒක ඉදිරිපත් කලේ නැහැ ස්වාමිනි ඒක අවශ්‍ය නැහැනේ ඒක මට කෙලින්ම ඇවිල්ලා තියෙනවානේ ස්වාමීනි මෙහෙම ප්‍රහාරයක් එල්ල වෙනවා කියලා.

****

<u>ගරු විනිසුරු බන්දුල අතපත්තු මහතා</u>

ප්‍ර මහත්මයා දැන් ඔබට ලැබුනු ලිපිය වගේ ලිපියක් කොම්පඤ්ඤ වීදියේ පොලිස් ස්ථානයටත් ලැබිලා තිබුනාද ?

උ ඔව් ස්වාමිනි සියලුම පොලිස් ස්ථාන වලට ලැබිලා තිබුනා. ස්වාමිනි මාව වැඩ තහනමට ලක් කලේ ස්වාමිනි මෙම ලිපිය ලැබිලා කොටුව පොලිසියේ ස්ථානාධිපතිවරයා විසින් නැවත ලිපියක් දැම්මා හෝටල් වලට මෙය මම දාපු ලිපිය තනිකර ව්‍යාජ ලිපියක් කියලා මෙහෙම ත්‍රස්ත ප්‍රහාරයක් නැහැ කියලා එහෙමම දැම්මා ස්වාමීනි. එහෙම ත්‍රස්ත ප්‍රහාරයක් නැහැ. මේක මේ බොරුවක් මෙයාගේ ව්‍යාජ ලිපියක් මාව ව්‍යාජ මිනිහෙක් ගානට මේවා කරලා මුළු මාධ්‍යයෙන් හැම තැනින්ම මේවා කරලා මාව මේ විදියට වැඩ තහනමට ලක් කෙරුවා ස්වාමීනි.

ප්‍ර ස්ථානාධිපතියි ඔබයි අතර යම්කිසි ආරවුලක් තියෙනවාද ?

උ කිසිම ආරවුලක්නැහැ ස්වාමීනි. උඩින් ප්‍රෙෂර් එකක් දෙනකොට එයා ස්ථානාධිපති වෙන්න බලාගෙන ඉන්නේ ඕන දෙයක් කරනවා එච්චරයි ස්වාමිනි.පොලිස් දෙපාර්තමේන්තුව ගැන පුදුම කලකිරීමකින් මම ඉන්නේ ස්වාමිනි. අවුරුදු 23 ක් පොලිස් පරික්ෂකවරයෙක් වශයෙන් ඉන්නේ ස්වාමීනි. පොලිස් පරික්ෂක වරයෙක් හැටියට අවුරුදු 10 යි ප්‍රධාන පොලිස් පරික්ෂක වරයෙක් වශයෙන් උසස්වීමක් ලැබිලා දවස් 8 ක් ගියේ නැහැ වැඩ තහනමට ලක් කෙරුවා ස්වාමිනි.

වෙනත් ප්‍රශ්ණ නොමැති බව දන්වයි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මිය</u>

ප්‍ර දැන් ඔබ සඳහන් කරන්නට යෙදුනු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති බස්නාහිර පළාත රථවාහන හා මැතිවරණ ජගත් අබේසිරි ගුණවර්ධන මහතාගේ ලිපියේ දිනය කියන්න ?

උ 2019/09/23 .

ප්‍ර මේ ලිපිය ඔබේ අතට පත්වුනේ කොහොමද?

උ මේ ලිපිය මගේ අතට පත්වුනේ ස්ථානාධිපතිතුමා විසින් මා වෙත යොමු කරලා .

ප්‍ර ඔබට සටහනක් දාලා තියෙනවාද ස්ථානාධිපතිවරයා විසින්? අපරාධ අංශයේ ස්ථානාධිපති වෙත කියලා ?

උ අර එදා මං ගාවට ගෙනල්ලා බාරදුන්නා වගේම ඕක අරගෙන ඇවිල්ලා බාරදුන්නා එන්ඩෝස්මන්ට් ගහලා ස්වාමීනි.

ප්‍ර එබ සතුව එම ලේඛණය තියෙනවාද ඔබට බාර දුන්න ලේඛණය?

FAIR COMMENT BY JEZEEM

උ මගේ ලඟ තියෙනවා ස්වාමීනි.

ප්‍ර මගේ ලඟ තියෙන ලේඛණය ස්වාමීනි කොටුව පොලිස් ස්ථානයේ දින මුද්‍රාවක් තියෙනවාද ?

උ තියෙනවා ස්වාමීනි.

ප්‍ර කොටුව පොලිස් ස්ථානයේ දින මුද්‍රාවක් තියෙනවාද මේක ලැබිච්ච බවට මේ ජ්‍යෙෂ්ඨ පොලිස් මේ නියෝජ්‍ය පොලිස්පති වරයා.

උ ස්වාමීනි ඕක සියල්ලම මෙහේ කොටුව පොලිස් ස්ථානයේ තියෙනවා ස්වාමිනි පොලිස් ස්ථානයට ගියාට ඒවා ලබා ගැනීමට නොහැකියි ස්වාමීනි. මේ තියෙන්නේ ස්වාමීනි නියෝජ්‍ය පොලිස්පතිතුමාගේ document එක.

ප්‍ර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වරයාගෙන් නියෝජ්‍ය පොලිස්පති අමතා 2019/09/23 වෙනි දිනැතිව ලියා තිබෙන ලේඛණයක් ඔබ මෙම කොමිෂන් සභාවේ විමර්ෂණ අංශයට බාරදුන්නානේ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර 2019/04/21 වෙනි දින පාස්කු ප්‍රහාරයේ නායක මොහොමඩ් සහරාන් සමඟ සබඳතා පවත්වා ඇති මෙතෙක් අත් අඩංගුවට ගෙන නොමැති පුද්ගලයන් සම්බන්ධව කියන මාතෘකාව යටතේ ?

උ එහෙමයි ස්වාමීනි 35 දෙනා.

ප්‍ර එම ලේඛණය ගරු සභාපතිතුමනි මෙම සභාවට බාරදී තිබෙන සාක්ෂිකරු විසින් බාරදි තිබෙන ලේඛණය C. 718 වශයෙන් සලකුණු කිරීම සඳහා අවසර අයැද සිටිනවා. ඒ වගේම ඒ 2019/09/23 දින දරණ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වරයාගේ ලිපියට ඇමුණුමක් හැටියට පොලිස්පති නිළකාර්යාලයෙන් ලැබුනා යැයි කියලා සඳහන් කෙරෙන තවත් ලිපියක් ඔබ මෙම කොමිෂන් සභාවේ විමර්ෂණ අංශයට බාර දුන්නානේ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර එහි දිනය මොකක්ද ?

උ 2019/09/18 ද ?

උ එහෙමයි ස්වාමීනි 18.

ප්‍ර එම ලේඛණය අත්සන් තබා තිබෙන්නේ සි. ඩි. වික්‍රමරත්න වැඩ බලන පොලිස්පතිවරයා කියලාද සඳහන් වෙන්නේ ඒ බාරදුන් ලේඛණයේ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර මෙම සාක්ෂිකරු විසින් ජනාධිපති කොමිෂන් සභාවේ විමර්ෂණ අංශයට ප්‍රකාශ ලබා දෙන අවස්ථාවේදි බාර දෙන ලද 2019/09/18 දිනැතිව සි. ඩි වික්‍රමරත්න වැඩ බලන පොලිස්පති වශයෙන් අත්සන් තබා තිබෙන බවට පෙනි යන ලේඛණය C. 719 වශයෙන් සලකුණු කිරීම සඳහා අවසර අයැද සිටිනවා ඔබ කියන හැටියට මේ C 719 ලෙස අපි දැන් මේ

FAIR COMMENT BY JEZEEM

සලකුණු කිරීමට කරන ලද ලේඛණයට ඇමුණුමක්හැටියට තවත් පිටු කිහිපයක් තිබුණා කියලාද ඔබ කියන්නේ ?

උ එහෙමයි ස්වාමිනි එම පිටු මම ලබා ගත්තේ නැහැ ස්වාමිනි . සැකකරුවන් ගේ නම් ලැයිස්තුවක් තියෙන 35 දෙනාගේ .

ප්‍ර ලබා ගත්තේ නැහැ කියන්නේ කොහෙන්ද ලබා ගත්තේ නැත්තේ?

උ මම පොලිසියෙන් ලබා ගත්තේ නැහැ ස්වාමිනි. මම ලබා ගත්තේ වාර්තාව පමණයි ස්වාමිනි.

ප්‍ර ඔබ මේ කොමිෂන් සභාවේ විමර්ෂන අංශයට බාරදුන් නැද්ද ඒ නම් ලැයිස්තුව ?

උ ආ ඔව් ස්වාමීනි ඒක මම ගෙන්නගෙන බාරදුන්නා. එදා කොටුවපොලිසියේ නිළධාරින් පැමිණිලා හිටියා.

ප්‍ර පිටු 07 කින් සමන්විත නම් ලැයිස්තුවක් කිව්වොත් හරිද ?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර නම් 35 ක් දෙනෙක්ගේ ඇතුලත් වන බව කිව්වොත් හරිද?

උ හරි.

ප්‍ර ඔබ කියන්නේ C. 719 දරණ ලේඛණයට පිටු 07 කින් සමන්විත නම්35 කින් යුත් ලේඛණය අමුණලා කොටුව පොලිස් ස්ථානයට ලැබුණා කියලාද ?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර ඒ අනුව ගරු සභාපතිතුමනි C. 719 ලේඛණයට අමුණා පැවති පිටු 07 කින් යුත් නම් 35 ක් ඇතුලත් එම ලේඛණය C.719 A වශයෙන් සලකුණු කිරීම සඳහා අවසර අයැද සිටිනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මහතා</u>

සාක්ෂිකරු විසින් මෙම කොමිෂම් සභාව ඉදිරියේ ප්‍රකාශ කරන්නට යෙදුණු සාක්ෂිය හේතුවෙන් ඔහුට යම් අනතුරක් නැත්නම් තර්ජනයක් ඇති විය හැකි බව කොමිෂන් සභාවට වැටහී යන හෙයින් 2015 අංක 4 දරණ සාක්ෂිකරුවන් සහ වින්දිතයන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 25 (4) උප වගන්තිය ප්‍රකාරව සාක්ෂිකරුට හිමිවිය යුතු සියලු අයිතීන් සහ වරප්‍රසාදයන් සාක්ෂිකරුට ලබා දෙන ලෙස සාක්ෂිකරුවන් සහ වින්දිතයන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය වෙත නියෝග කරමි.
සාක්ෂිකරුගෙන් වෙනත් ප්‍රශ්ණ නොමැති බව දන්වයි සාක්ෂිකරු මුදාහරිමි.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා තේරුම් ගෙන මෙම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදි.

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදුවූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය 2020.06.24 වේලාව ප. ව.1. 15

සටහන් කලේ යමුනා දසනායක විසිනි.

ගරු විනිසුරු මඩුල්ල -

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති.

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා. - සාමාජික

03. හිටපු ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා. (පැමිණ නැත) - සාමාජික

04. හිටපු ගරු අභියාචනාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05 හිටපු අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව් . එම්. එම්. ආර් අදිකාරි මහත්මිය - සාමාජික

පෙනී සිටීම

අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය. , ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය , ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය , රජයේ අධිනීතිඥ නිමේෂාද අල්විස් මෙනවිය , රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර , රජයේ අධිනීතිඥ දිලන්ත එස් කළුදුරුවගේ සහ රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ පෙනී සිටි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ගේ ඉල්ලීම සලකාබැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතිඥ ගිම්හානි ගමගේ මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර ලබා දෙන ලදි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සම්පූර්ණ නම - පුවිරාජසිංහම් ක්‍රිස්ටෝපර් කමලේන්ද්‍රන් .
වයස - අවු - 58 .
ආගම - ශ්‍රී ලංකා දෙමල කතෝලික .
තනතුර මාධ්‍ය වේදී සන්ඩේ ටයිම්ස් ආයතනය.

ප්‍රතිඥා වෙයි.

<u>රජයේ අධිනීතිඥ චතුරංග බංඩාර මහතා.</u>

ප්‍ර කමලේන්ද්‍රන් මහත්මයා ඔබ උපත ලැබුවේ කුමන පළාතේද ?
උ මම ඉපදුනේ කැගල්ල දිස්ත්‍රික්කයේ කිතුල්ගල කියන පළාතේ
ප්‍ර ඔබ පාසැල් ගියෙත් කැගල්ල පළාතෙමද?
උ නැහැ මං කොළඹ සෙන්ට් ජෝසප් විදුහලේ අධ්‍යාපනය ලැබුවා.
ප්‍ර ඔබ සඳහන් කලේ කොළඹ ශාන්ත ජෝසප් විද්‍යාලයෙන් තමයි ඔබ අධ්‍යාපනය ලැබුවේ?
උ ඔව්.
ප්‍ර ශාන්ත ජෝසප් විද්‍යාලයේ ඔබ උසස් පෙළ දක්වාම අධ්‍යාපනය ලැබුවාද ?
උ ඒකේ මං අධ්‍යාපනය ලැබුනේ එන්. සි. ජී. කියන grade nine වලට විතරයි .
ප්‍ර උසස් අධ්‍යාපනය ඔබ ලැබුවේ කොහෙන්ද ?
උ උසස් අධ්‍යාපනය ලැබුවෙ කොළඹ හින්දු college එකේ රත්මලාන.
ප්‍ර උසස් අධ්‍යාපනය ලබා ගැනීමෙන් අනතුරුව ඔබ යම්කිසි රැකියාවක් සඳහා මුලින්ම යම්කිසි වෘත්තියක් තෝරා ගන්නවාද ?
උ මම පොඩි කාලේ ඉඳලාම ආශාවක් තිබුනා ඉස්කෝලේ යන කාලේ ඉඳලාම මට මාධ්‍යවේදියෙක් වෙන්න.
ප්‍ර ඒ අනුව ඔබ මාධ්‍යවේදියෙක් විදියට යම්කිසි ආයතනයක් සමඟ සම්බන්ධ වෙනවාද?
උ පළමු වතාවට 1995 මගේ මතකේ හැටියට ස්වාධීන පත්තර සමාගමේ ඒ කියන්නේ දවස කාර්යාලයේ මම සේවයට බැඳුනා.
ප්‍ර දවස පුවත්පත් සමාගමක්ද ?
උ දවස පත්තර භාෂා තුනෙන්ම අව්වු ගහපු දෙමළ, සිංහල, ඉංග්‍රිසි මාධ්‍ය තුනෙන්ම ප්‍රකාශ කරපු ස්වාධීන පත්තර සමාගමක්.
ප්‍ර ඒදවස පුවත්පත් සමාගම සමඟ සම්බන්ධ වෙලා ඔබ සිදු කලේ මොන වගේ රාජකාරියක්ද ?
උ ප්‍රථමයෙන්ම මාව යොමු කලේ පොලිස් වාර්තා අපරාධ ගැන හොයන්න පොලිස් වාර්තා.
ප්‍ර ඔබ දවස පුවත්පත සමඟ අවුරුදු කීයක් වැඩ කළා ?

FAIR COMMENT
BY JEZEEM

උ අවුරුදු හතර හමාරක් වැඩ කලා ඒ ආයතනය බංකොලොත් වෙනකම් හිටියා වර්ෂය හරියට මතක නැහැ 1995 ඉඳලා ඒ පත්තර ආයතනය වහනකම්ම මම හිටියා.

ප්‍ර මෙම දවස පුවත්පත් සමඟ ඔබගේ රාජකාරී කටයුතු අවසන් වුනාට පස්සේ ඔබ කුමක්ද කරේ?

උ ඊට පස්සේ මම වැඩිදුර අධ්‍යාපනය ලබන්න එංගලන්තයට ගියා.

ප්‍ර එංගලන්තයේ කොහේද ඔබ වැඩිදුර අධ්‍යාපනය ලැබුවේ ?

උ london school of journalism Notinghill Gate

ප්‍ර එහි වර්ෂ කීයක් ඔබ අධ්‍යාපනය ලැබුවාද ?

උ අවුරුදු දෙකකට සීමා වෙන්න ලැබුවා දෙකක් පමණ .

ප්‍ර ඔබ london school of journalism හි අවුරුදු කිහිපයක් අධ්‍යාපනය ලැබීමෙන් පස්සේ ලංකාවට නැවත එනවාද ?

උ ඔව් ලංකාවට එනවා ආපහු.

ප්‍ර ලංකාවට එන්නේ කොයි වකවානුවේද ?

උ ලංකාවට එන්නේ හරියටම මේජර් ජනරල් කොඹෑකඩුව මහතා මැරිච්ච ඒ දවසේ ලංකාවට ආවේ මට හරියට නිච්චි නැහැ ඒ දවසේ මම තමයි ආවේ ලංකාවට.

ප්‍ර ඔබ ලංකාවට ආවාට පස්සේ යම්කිසි තවත් පුවත්පත් සමාගමක් සමග සම්බන්ධ වෙනවාද ?

උ මාස 06 ක් විතර කාලයක් මම සෙලින්කෝ ආයතනයේ උපදේශකයෙක් හැටියට adviser කෙනෙක් විදියට වැඩ කලා ඊට පස්සේ තමයි Sunday Times ආයතනයට මම නැවත සම්බන්ධ වෙන්නේ .

ප්‍ර මේ Sunday Times කියන පුවත්පත අයිති සමාගම මොකක්ද ?

උ ඒක ඇවිල්ලා විජය පුවත්පත් සමාගම.

ප්‍ර මේ විජය පුවත්පත් සමාගම යටතේ පුවත්පත් කොච්චර විතර සංඛ්‍යාවක් තියෙනවාද ?

උ දැනට 12 ක් විතර මුද්‍රණය කරනවා.

ප්‍ර සියලුම භාෂා වලින් මුද්‍රණය කරන පුවත්පත් තියෙනවාද? ?

උ ඔව්. සිංහල, ද්‍රවිඩ, ඉංග්‍රීසි සියලු ඇතුළු භාෂා වලින්.

ප්‍ර එයින් ඔබ අනුයුක්තව කටයුතු කරේ කුමන පුවත්පතත් සමඟද?

උ සන්ඩේ ටයිම්ස් පුවත්පත සමඟ.

ප්‍ර ඔබ සන්ඩේ ටයිම්ස් පුවත්පත සමඟ සම්බන්ධ වෙලා මේ වෙනකොට කොච්චර කාලයක් විතර වෙනවාද ?

උ මට මතක හැටියට අවුරුදු 20 ක් 22 ක් විතර වෙනවා.

ප්‍ර ඔබ සන්ඩේ ටයිම්ස් පුවත්පත සමඟ සම්බන්ධ වෙලා කුමන ක්ෂේත්‍ර වලට අදාලව පුවත්පත් වාර්තා කිරීම සිද්ධ කරාද ?

උ ප්‍රථමයෙන්ම මම දේශපාලන ලිපි ඵල කලා. ඊට පස්සේ එක එක වෙනත් අංශයන්වලට මාව යෙදෙව්වා අපේ කතෘතුමා විසින් ඊට පස්සේ

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සෑහෙන කාලයක් අවුරුදු 15 ක් විතර මම යුද්ධය සම්පූර්ණයෙන්ම වාර්තා කරලා තියෙනවා යුදබිමේ සිට.

ප්‍ර ඔබගේ මේ වාර්තා ලියවුන මාධ්‍යවේදී ජීවිකාව තුල ඔබ මුස්ලිම් අන්තවාදය සම්බන්ධයෙන් යම්කිසි පුවත්පත් ලිපි ලිවීමට පටන් ගත්තාද?

උ ඒ 2009 ඒ අර බෙරුවල සිද්ධියෙන් පස්සේ කලින් මුස්ලිම් පල්ලි දෙකක් අතර ඇතිවෙච්ච ගැටුමක් මුල් කරගෙන මගේ කතෘතුමාගේ ඉල්ලිම මත 2009 අගෝස්තු 09 ද කොහේද මට මතක හැටියට මම ගියා මඩකලපුවේ කාතන්කුඩි ප්‍රදේශයේ මේ මේ බෙරුවල ගැටුමටයි.

ප්‍ර දැන් ඔබ මුලින්ම මේ මුස්ලිම් කණ්ඩායම් අතර ඇතිවූ ගැටුම් සම්බන්ධයෙන් මුලින්ම ඔබ යම්කිසි පුවත්පත් ලිපියක් ලිව්වේ කවද්ද ?

උ ඒ මුලින්ම ලිව්වේ කාත්තන්කුඩි සිද්ධියට යන්න ඉස්සෙල්ලා බෙරුවල සිද්ධිය මම වාර්තා කලා. බෙරුවල මුස්ලිම් අන්තවාදීන් කණ්ඩායම් දෙකක් අතර ඇති වෙච්ච ගැටුමක් පල්ලි දෙකක් අතර .

ප්‍ර මේ බෙරුවල සිද්ධිය ඇතිවුනේ කොයි කාලේ විතරද ?

උ මගේ මතකේ හැටියට 2009 අගෝස්තු නැත්නම් ඊට ඉස්සෙල්ලා මාසේ වගේ මට මතක හැටියට.

ප්‍ර 2009 ජුනි 24 වෙනිදා සිද්ධියකට අදාලව කිව්වොත් ?

උ ඔබ හරි .

ප්‍ර ඒ සම්බන්ධයෙන් ඔබ කව්රුත් එක්කද ඔය බෙරුවල ප්‍රදේශයට ගියේ ?

උ මමත් අපේ තව හිටියා training reporter කෙනෙක් අෂිෆ් කියලා තව මාත් එක්ක වැඩ කරපු සහෝදර මාධ්‍යවිදියෙක් .

ප්‍ර මේ 2009 බෙරුවල ඇති වෙච්ච සිද්ධිය මොකක්ද කියලා ඔබට සරලව මේ කොමිෂන් සභාවට පැහැදිලි කරන්න පුලුවන්ද කමලේන්ද්‍රන් මහත්මයා?

උ එතන ඇතිවුනේ මුස්ලිම් කණ්ඩායම් දෙකක් අතර ඒ ගොල්ලන් අදහන ආගම වෙන් විදියට අදහාගෙන හිටියේ. එක කණ්ඩායමක් හිටියා ඉතාම දුගී දුප්පත් කණ්ඩයමක් තව පැත්තක් හිටියා ගොඩාක් පෝසත් කණ්ඩායමක් ඒ පල්ලි දෙක අතර නිතරම වගේ ගැටුම් ඇති වෙනවා . ගැටුම් ඇති වුනාම තමයි ඔය තත්ත්වයට වර්ධනය වෙලා පල්ලිවලට ගිහිල්ලා ගහගෙන තුන්දෙනෙක්ද කොහේද මැරුනා ඒ බෙරුවල සිද්ධියේදී අර දුප්පත් පල්ලියේ කට්ටිය .

ප්‍ර දැන් ඔබ සඳහන් කලා මේ පල්ලි දෙකක් අතර තමයි මේ ගැටුම ඇතිවුනේ කියලා?

උ ඔබ හරි.

ප්‍ර මේ පල්ලි දෙකම අයිති වෙන්නේ සුන්නි මුස්ලිම් කියන ප්‍රධාන culture එකටද ඒ නිකායටද?

උ ඒ ඔක්කෝම හිටියේ එකම culture එකක සුන්නි මුස්ලිම් කියන culture එකේතමයි .

ප්‍ර ඔබ කියන්නේ මේ සුන්නි මුස්ලිම් පල්ලි දෙකක් අතර සිදු වෙච්ච

FAIR COMMENT BY JEZEEM

ගැටුමක් ?

උ සිදු වෙච්ච ගැටුමක් තමයි .

ප ඔබට මතකද මේ පල්ලි වල නම් මොනවාද කියලා ?

උ එකක් බුකාරි පල්ලිය .

ප අනිත් පල්ලිය ?

උ අනිත් පල්ලිය මොකක්ද මට එච්චර මතකයක් නැහැ මේ ලඟම තමයි තියෙන්නේ ඒ දෙකම .

ප බේරුවල මහගොඩ ජුම්මා පල්ලිය කිව්වොත් නිවැරදිද ?

උ නිවැරදියි.

ප මේ බුකාරි පල්ලියයි බේරුගොඩ මහගොඩ ජුම්මා පල්ලියයි අතර ගත්තාම ඔබ හොයලා බැලිමක් කළාද සාම්ප්‍රදායික මුස්ලිම් මතවාද තියෙන පල්ලිය මොකක්ද සහ ඊට ප්‍රතිවිරුද්ධ මතවාදය දරන පල්ලිය මොකක්ද කියලා ?

උ අර දුප්පත් පල්ලියේ කට්ටිය තමයි මතවාද කල්ලියක් විදියට හිටියේ.

ප දුප්පත් කල්ලිය කියන්නේ මොකක්ද ?

උ අර දැන් නම මට මතක නැහැ මහගොඩ පල්ලිය.

ප මහගොඩ පල්ලිය ඔබ කියන්නේ දුප්පත් පල්ලිය ?

උ දුප්පත් පල්ලිය.

ප ඔවුන්ට තියෙන්නේ කුමන ආකාරයේ මතවාදයක්ද ?

උ ඔවුන් හරිම violence ඒකියන්නේ හරිම ගැටුම්කාරී ස්වභාවයක හැසිරෙන මිනිසුන් ඔවුන් .

ප එතකොට ඊට සාපේක්ෂව බුකාරි පල්ලිය ?

උ බුකාරි පල්ලිය හරි moderate ඒ ගොල්ලන් හරි පෝසත් ඒ ගොල්ලන් හැමෝටම උදව් කරනවා හොඳම පෝසත් පල්ලියක් ඒක.

ප moderate යනුවෙන් ඔබ අදහස් කලේ මොකක්ද ?

උ moderate කියන්නේ ඒ ගොල්ලන් හැමෝත් එකක්ම සහජීවනයෙන් ජීවත් වෙන්න පුලුවන්. සහජීවනයෙන්.

ප ඔබ මේ පල්ලි දෙක ඇතුලට ගිහිල්ලා පරීක්ෂා කරලා බැලුවාද මොකක්ද වෙච්ච සිද්ධිය කියලා ?

උ ඔව් ඒ පල්ලි දෙකටම මං ගියා .

ප ඒ අනුව එම මවුලවිලත් සමඟත් ඔබ කතා බහ කළාද?

උ ඔව්.

ප ඔබට හොයා ගන්න පුලුවන් වුනාද ඔබ සඳහන් කරානේ මේ පෝසත් කියන පල්ලිය ඒ පෝසත් කියන බුකාරි පල්ලියට මුදල් එහෙම ලැබෙන්නේ කොහොමද කියලා ?

උ ඒක විදේශයෙනුත් ලැබෙනවා කොළඹ සිටින ඉතාම ප්‍රබල මුස්ලිම් ව්‍යාපාරිකයිනුත් ඒ ගොල්ලන්ට ගිහිල්ලා පරිත්‍යාග කරනවා.

ප ඔබ කිව්වා මේ දුප්පත් පල්ලියක් තියෙනවා කියලා?

උ ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර ඒ මහ ගොඩ ජුම්මා පල්ලිය ?

උ පල්ලිය.

ප්‍ර ඒ පල්ලිය මොන වගේ මතවාදයක් ද දරන්නේ තව්හිද් මතවාදයක්ද තබ්ලික් මතවාදයක්ද කුමන ආකාරයේ මතවාදයක්ද දරන්නේ ?

උ ඒ ඉස්සෙල්ලම එකම මතවාදයේ හිටියේ ඊට පස්සේ ඒගොල්ලන්ට සැලකුවේ නැතිවුනාම ඒ ගොල්ලන් වෙන මතවාදයකට ගියා.

ප්‍ර මොකක්ද ඒ මතවාදය කියලා ඔබට අනාවරණය කරගන්න පුලුවන් වුනේ ?

උ තව්හිද් එකෙන් වෙන්වෙලා තවත් මතවාදයකට ගියා ඒගොල්ලන්.

ප්‍ර කමලේන්ද්‍රන් මහත්මයා මේ බුකාරි පල්ලියත් තව්හිද් මතවාදය දරන එකක්ද නැත්නම සාම්ප්‍රදායික මුස්ලිම් මතවාදය දරන පල්ලියක්ද?

උ ඒ ගොල්ලන් ඇවිල්ලා සම්ප්‍රදායිකයි.

ප්‍ර තව්හිද් පල්ලියක් නොවේ ?

උ නොවේ .ඒක හරි moderate

ප්‍ර හැබැයි ඔබ සඳහන් කරන්නේ මහගොඩ ජුම්මා පල්ලිය තව්හිද් මත වාදය දරන පල්ලියක් යනුවෙන්ද ?

උ නිවැරදියි.

ප්‍ර ඔබ ඉන් අනතුරුව මේ සම්බන්ධයෙන් පුවත්පත් ලිපියක් ලිව්වා කිව්වොත් නිවැරදියිනේ ?

උ හරි.

ප්‍ර එය 2009 /07/26 සන්ඩේ ටයිම්ස් පුවත්පතේ පල වුනා කිව්වොත් නිවැරදිද ?

උ ඔව් හරි.

ප්‍ර ඒ සම්බන්ධයෙන් ඔබට මේ කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමේ හැකියාවක් තියෙනවාද ඒ පත්තරයේ පල වුණු ලිපිය ?

උ මේ මොහොතේ මා ලඟ නැහැ ඒක.

ප්‍ර ඔබට හොයා ගැනීමට හැකියාවක් තිබුනේ නැද්ද ?

උ අපේ පුස්තකාලයේ මට ටිකක් අපහසුතාවයක් වුනා.

ප්‍ර දැන් ඔබ ඉන්පසුව බෙරුවල සිදුවූ අන්තවාදී සිද්ධිය අධ්‍යයනය කිරීමෙන් පස්සේ ඉන්පසුව ඔබ කුමක්ද සිද්ධ කලේ ?

උ ඊට පස්සේ මගේ කතෘතුමාගේ අනුදැනුම උඩ එයා මට කිව්වා කාත්තන්කුඩියට ගිහිල්ලා පොඩ්ඩක් හොයලා බලන්න මේ දෙක අතරේ සම්බන්ධයක් තියෙනවාද කියලා .

ප්‍ර කව්ද ඔබගේ ප්‍රධාන කතෘතුමා ඒ වකවානුව වෙන කොට ?

උ සිංහ රත්නතුංග මහත්මයා .

ප්‍ර ඒ අනුව ඔහුද මේ අදහස ලබා දුන්නේ කාත්තන්කුඩිය ප්‍රදේශයට ගිහිල්ලා පරික්ෂා කරලා බලන්න කියලා ?

උ හරි නිවැරදි.

ප්‍ර ඒ අනුව ඔබ කාත්තන්කුඩිය ප්‍රදේශයට කවද්ද යන්නේ ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ 2009 අගෝස්තු මාසේ වගේ දවසක යන්නේ.

ප ඔබ තනියමද යන්නේ නැත්නම් ඔබ සමඟ කණ්ඩායමක් යනවාද ?

උ මම ගියා මගේ රියදුරු මහත්මයා ගියා මගේඡායාරූප ශිල්පි මහත්මයා ගියා තවත් අර අෂික් කියන සහෝදරයත් මාත් එක්ක ආවා..

ප ඔබ ගිහිල්ලා කාත්තන්කුඩි ප්‍රදේශයට මුලින්ම ගිහිල්ලා ඔබ කුමක්ද සිද්ධ කලේ ?

උ මම යන්න ඉස්සෙල්ලා අපේ ඉන්න ප්‍රාදේශිය correspondent මිස්ට ෆරුල්ලාට කතා කලා කොළඹ ඉඳලා කතා කරලා ඇහුවා මට මෙහෙම දෙයක් තියෙනවා ඔයාට උදව් කරන්න ඕනේද කියලා .

ප කොහොම දෙයක් තියෙනවා ද කියලාද කිව්වේ ?

උ මම ඇහුවා එයාගෙන් මෙන්න මේ වගේ ගැටුමක් තියෙනවා මේ පැත්තේ බේරුවල ඔහේ මොනව හරි සම්බන්ධයක් තියෙනවාද කියලා . එයා කිව්වා එන්න හොයලා බලන්න මට පුලුවන් විදියට අපේ ප්‍රාදේශිය වාර්තා කරුගෙන් මම කරපු ඒ ඉල්ලිමට එයා උදව් කලා සෑහෙන්න.

ප ඒ අනුව ඔබලා මේ කාත්තන්කුඩිය ප්‍රදේශයට ගියපු දිනය මතකද ?

උ 2009 අගෝස්තු වගේ දවසක.

ප අගෝස්තු 12 වගේ කිව්වොත් ම හරිද ?

උ හරි.

ප ඔබලා ගිහිල්ලා කුමන ප්‍රදේශයද මුලින්ම නිරීක්ෂණයට ගියේ ?

උ අපි ඉස්සෙල්ලාම එයාගේ නිවසට ගියා අපේ ප්‍රාදේශිය වාර්තාකරුගේ. ඊට පස්සේ එයත් එක්ක පැය බාගයක් විතර සාකච්ඡා කරලා අපි ආවේ මේ කාරණය නිසා අපි පුලුවන්නම් මේ දෙගොල්ල අපිට මුණ ගස්සවලා දෙන්න කිව්වා.

ප මොන දෙගොල්ලද ?

ප පයිල්වාන්ගේ කට්ටයවයි සහරාන් ගේකට්ටියවයි

ප ප්‍රථමයෙන්ම ඔබ කිව්ව නම නැවතත් කියන්න ?

උ පයිල්වාන් ගේ කට්ටියවයි සහාරන් ගේ කට්ටියයි දෙගොල්ලන්ම

ප පයිල්වාන් සහ සහරාන් ගේ කට්ටිය ?

උ කට්ටිය.

ප ඒ කියන්නේ ඔබ කොළඹින් යනකොටම දැනගෙන ගියාද මේ සහරාන් යන පුද්ගලයෙක් කාත්තන්කුඩි ප්‍රදේශයේ ක්‍රියාත්මක වෙමින් ඉන්නවා කියලා ?

උ ඒ මගේ දැනුම අනුව ඒ ගොල්ලන් ඒ වගේ දේකට ලෑස්ති වෙලා කියලා මම කරුණු හොයා ගත්තා.

ප මොනවගේ දේකටද?

උ ඒ කියන්නේ මොනවා හරි නැවත වරක් ඒ ගොල්ලන් අවිහිංසාවාදී විදියකට හැසිරෙන්න යනවා කියලා

ප අවිහිංසා වාදියටද හිංසාවාදී විදියටද ?

FAIR COMMENT BY JEZEEM

උ violent way හිංසාවාදී විදියට.

ප්‍ර ඉන්පසුව ඔබ දැන් කිව්වා ප්‍රා දේශිය කාත්තන්කුඩි වල ඉන්න වාර්තාකරු සමඟ සාකච්ඡා කරලා ඉන්පසුව සැලසුම් කර ගත්තා කියලා මේක කොහොමද කරන්න ඕනේ කියලා .
දැන් ඔබ සඳහන් කලානේ කොළඹින් යනකොටම සහරාන් සහ ෆයිල්වාන් යන පුද්ගලයින් ගැන ඔබ දැනුවත්ව ගියා ඉන්පසු ඒ සම්බන්ධයෙන් එහේ ගිහිල්ලත් සාකච්ඡා කලා කියලා ඔබ කොහොමද මෙම ෆයිල්වාන් සහ සහරාන් යන කණ්ඩායම් ගැන කොළඹදීම අවබෝධයක් ලබා ගත්තේ?

උ ඊට ඉස්සෙල්ලා ඒ ගොල්ලන්ගේ අතර මත ගැටුම් තිබිලා හැම තිස්සේම ඒ ගොල්ලන් ගහගත්තා.

ප්‍ර ඒ බව ඔබ කොහොමද දැනගත්තේ ?

උ මගේ ප්‍රාදේශිය තවත් වාර්තා කරුවෙක් ඉන්නවා මඩකලපුවේ එයා මාර්ගයෙන් මම තොරතුරු රැස් කරගෙන තමයි ගියේ.

ප්‍ර ඔබ ඉන්පසු මේ සම්බන්ධයෙන් ඔබ කිව්වානේ මඩකලපුවේ සාකච්ඡා කලා කියලා ?

උ ඔව්.

ප්‍ර සාකච්ඡා කිරීමෙන් පස්සේ මුලින්ම කොහේටද ගියේ ?

උ ඉස්සෙල්ලාම ගියේ ෆවුල්ලාගේ ගෙදරට ගිහිල්ලා අර අනිත් මොඩරේට් මුස්ලිම් එක්කෙනාව හම්බවුනා.

ප්‍ර කව්ද මොඩරේට් මුස්ලිම් එක්කනා කියන්නේ ?

උ මට නම එච්චර නිච්චි නැහැ ටිකක් වයසයි .

ප්‍ර කොහේදිද හම්බ වුනේ ?

උ එයා ගේ පල්ලියේදි හම්බවුනේ.

ප්‍ර ඔය ඔබ මොඩරේට් මුස්ලිම් කියන නැත්නම් මධ්‍යස්ථ මුස්ලිම් මතවාදී දරන කියන පුද්ගලයා ඒ පළාතේ ඉන්න ප්‍රසිද්ධම කෙනාද ?

උ එයාට සෑහෙන රෙස්ට්පෙක් එකක් කරනවා සෑහෙන එයාට ප්‍රසිද්ධයක් තියෙනවා. සෑහෙන මිනිස්සු එයාව පිලිපදිනවා. ඒ කියන්නේ එයා කියන දේ අහනවා.

ප්‍ර රවුෆ් මවුලවි කිව්වොත් ඔහුගේ නම නිවැරදිද ?

උ නිවැරදියි.

ප්‍ර රවුෆ් මවුලවිව හම්බ වෙන්න ඔබ කොහේටද ගියේ ? ගියේ ඔහුගේ පල්ලියටද නිවසටද?

උ ගියේ එයාගේ පල්ලියට.

ප්‍ර ඒ පල්ලිය ඉතා විශාල පල්ලියක්ද නැත්නම් සාමාන්‍ය සෙණයේ පල්ලියක්ද ?

උ මධ්‍යස්ථ ප්‍රමාණයේ ලොකුම නැහැ එච්චර.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර මේ රවුල් මවුලවි කියන පුද්ගලයා සාම්ප්‍රදායික මුස්ලිම් මතවාද දරන පුද්ගලයෙක්ද නැත්නම් මූලධර්මවාදී මතවාදයක් දරන පුද්ගලයෙක්ද?

උ එයා ඇවිල්ලා සම්ප්‍රදායික .

ප්‍ර ඔහුත් සමඟ ඇතිවුන කතා බහේදී ඔබට මොනවද අනාවරණය වුනේ?

උ නැහැ ඒ ගොල්ලන් හැදුවේ ඒ ගොල්ලන්ගේ තියන මත ගැටුම් නැති කරලා එකට ඉන්න ඔක්කොමලා සමගිව ඉන්න . නමුත් ඒකට අනිත් පැත්තෙන් හැමතිස්සේම ඒ ගොල්ලන්ට එක එක ඒ ගොල්ලන්ට විටින් විට ප්‍රහාර එල්ල වෙනවා .

ප්‍ර අනිත් පැත්තෙන් කියලා කියන්නේ කාගේ පැත්තෙන්ද ?

උ සහරාන් ගේ පැත්තෙන්.

ප්‍ර මොනවාගේ ප්‍රහාරද එල්ල වුනා කියලා ඔහු සඳහන් කරේ?

උ එල්ල කරා කියන්නේ මේ ගොල්ලන්ගේ ගෙවල් ගිණි තිබ්බා ගෙවල් දහසකට ආසන්න ගානක්ද කොහේද ගිනි තිබ්බා ඒ ගොල්ලන්ගේ මේක තහවුරු කර ගන්න. ඒ ගොල්ලන්ගේ පැවැත්ම තහවුරු කර ගන්න සහරාන් ගේ කට්ටිය ගිහිල්ලා ගිනි තිබ්බා ගෙවල් .

ප්‍ර කියලා ඔබට සඳහන් කලේ කව්ද ?

උ එක්කන් ගිහිල්ලා පෙන්නුවා මාව . කඩ කඩලා තිබුනා, ගිනි තියලා තිබුනා.

ප්‍ර තව මොනවද ඔවුන්ට එල්ල වෙච්ච අභියෝග ?

උ අනික ඒ මිනිදස්සු සමහර කට්ටිය ඒ ප්‍ර දේශයෙන් ඉවත් වෙලා ගියා යන්න බයට කොළඹට ආවා කට්ටියක් .

ප්‍ර ඔබ කියන්නේ සාම්ප්‍රදායික මුස්ලිම් ජනතාව මේ සහරාන් ගේ කල්ලියේ අභියෝග නිසා එම පළාතත් අත්හැරලා ගියා කියලා ?

උ අවතැන් වුනා.

ප්‍ර තව මොනවද රවුල් මවුලවි ගෙන් අනාවරණය වුන කරුණු ?

උ ඒ ගොල්ලන් හැම තිස්සේම රෑට නිදියගන්නෙත් ඔක්කෝම පල්ලිය ඇතුලේ තමයි නිදියගන්නේ බවට අර ඒ ගොල්ලන් ඇවිල්ලා රෑට ගහයි කියලා . මම යන වෙලාවෙත් 100 ක් 150 ක් විතර එයාගේ පල්ලියේ හිටියා.

ප්‍ර සාමාන්‍යයන් මේ වකවානුව වෙනකොට රවුල් මවුලවි යටතේ කෙතරම් අනුගාමිකයන් පිරිසක් හිටියාද ?

උ මම දකින කොට නම් 300ක් 400 ක් විතර හිටියා ඒ වකවානුවේ.

ප්‍ර මේ රවුල් මවුලවි එක්ක ඔබගේ සාකච්ඡාවෙන් පස්සේ ඔබ ඊලඟට හම්බ වෙන්න ගියේ කාවද?

උ සහරාන්ව හම්බ වෙන්න ගියේ.

ප්‍ර සහරාන්ව සහරාන් කියලා ඔබ සඳහන් කරන පුද්ගලයාගේ සම්පූර්ණ නම ඔබට මතකද?

උ මට එච්චර නිච්චි නැහැ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර දැන් ඔබ මේ කාත්තන්කුඩිය ඔබ යනකොට ඔබ ඡායාරූප ශිල්පියෙක් සමඟද ගියේ ?

උ ඔව්.

ප්‍ර ඒ අනුව ඔබලා හම්බ වුන මවුලවිවරුන්ගේ සහ ස්ථාන වල ඡායාරූප ලබා ගැනීමක් සිද්ධ කලාද ඔය ගොල්ලොන්ගේ කණ්ඩායම විසින් ?

උ ඔව් අපි

ප්‍ර එය ඔබ විසින් ලියන ලද පුවත්පත් ලිපියේ ඒ ඡායාරූප ඇතුලත් කලාද?

උ ඇතුලත් කරලා තියෙනවා.

ප්‍ර ඊට අමතරව ඔබ විසින් ලියන ලද එම පුවත්පත් ලිපිය මේ කොමිෂන් සභා විමර්ෂණ ඒකකයට ඔබ ලබා දුන්නා කිව්වොත් නිවැරදිද ?

උ නිවැරදියි.

ප්‍ර ස්වාමිනි සාක්ෂිකරුට යම්කිසි ලේඛණයක් පෙන්වීමට අවසර පතනවා සාක්ෂිකරුට ලේඛණයක් පෙන්වා සිටිනවා ස්වාමීනි. මෙම ලේඛණය පරීක්ෂා කරන්න මෙය ඔබට හඳුනාගන්න පුලුවන්ද ?

උ පුලුවන් .

ප්‍ර ඔබ කුමක් හැටියටද හඳුනාගන්නේ ?

උ මේකේ මාගේ නම තියෙනවා.

ප්‍ර ඔබ විසින් ලියන ලද ලිපියක් ?

උ ඔව්.

ප්‍ර කවද්ද ඔබ විසින් ලියලා තියෙන්නේ ?

උ 2009 අගෝස්තු මාසේ විසි ගණන් වල වගේ මතකේ හැටියට.

ප්‍ර පරීක්ෂා කරලා බලන්න (පරීක්ෂා කර බලයි)

උ 2009 අගොස්තු 16.

ප්‍ර 2009 අගොස්තු16 වෙනිදා ඔබ විසින් මෙය කුමන පුවත්පතට ලියන ලද ලිපියක්ද?

උ සන්ඩේ ටයිම්ස් පුවත්පතේ එල කරන ලද ලිපියක් .

ප්‍ර ස්වාමිනි ඒ අනුව සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද ඔහු විසින් 2009 අගෝස්තු 16 වෙනි දින Sunday Times පුවත්පතට ලියන ලද unholy Tension in Sri Lankas Muslim East මුස්ලිම් ඊස්ට් යන මාතෘකාව යටතේ ඇති ලිපිය C.723 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.

ප්‍ර සාක්ෂිකරුට C. 723 පෙන්වා සිටිනවා ස්වාමීනි. දැන් මේ C 723 පරීක්ෂා කරලා ඔබට කියන්න පුලුවන්ද ඔබ දැන් කිව්වානේ මුලින්ම ඔබ හමුවෙන්න ගියා කියලා රවුෆ් මවුලවි කියලා පුද්ගලයෙක්ව ?

උ එයා තමයි වම් පැත්තේ ඉඳලා 3 වෙනි යට ඉන්නේ වයසක එක්කෙනා රැවුල තියෙන්නේ සුදුපාට.

ප්‍ර ඒ තමයි ඔබ මුලින් සඳහන් කරපු මේ රවුෆ් මවුලවි යන පුද්ගලයා ?

උ ඔව්.

FAIR COMMENT — BY JEZEEM

ප දැන් ඔබ කිව්වා දෙවනියට ඔබ ගියා කියලා සහරාන් කියලා මවුලවිවරයෙක් හම්බ වෙන්න ?

උ ඔව්.

ප ඔහුගේ ඡායාරූපයක් මෙතන තියෙනවාද ?

උ අර රැවුල වවාගෙන ඉන්නේ කෙලවරේ අන්තිම පින්තූරේ.

ප ඒ තමයි ඔබ සහරාන් යනුවෙන් හම්බවෙන්න ගියපු පුද්ගලයා ?

උ හරි.

ප ස්වාමීනි සාක්ෂිකරු විසින් සහරාන් මවුලවි ඇති ස්ථානය වශයෙන් පෙන්වා දුන් C. 723 ලේඛණයේ කොටස C. 723 A වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා .

ප ඔබ සාක්ෂි දෙමින් සඳහන් කරා සහරාන් යන මවුලවි වරයා හම්බ වෙන්න ඔබ කාත්තන්කුඩියට ඔබ ගියපු අවස්ථාවේදී ඔබ appointment නැත්නම් ?

උ පොඩි එයාගේ office වගේ එකකට.

ප office එකක් වගේ තැනකට ඔබ ගියා කියලා ?

උ ඔව්.

ප කව්ද මේ හමුවීම සංවිධානය කරලා දුන්නේ කව්ද ඔබට?

උ එයාගේ ටෙලිෆෝන් නොම්මරය ලබා දුන්නේ අපේ හිටපු ප්‍රාදේශීය මාධ්‍ය වේදියෙක් .

ප සහරාන් යන පුද්ගලයා ඔබට හඳුන්වා දුන්නේ මුලින්ම 2009 දී කව්රු වශයෙන්ද?

උ එයා ඇවිල්ලා up coming ඒ කියන්නේ නැඟී එන තරුණයෙක් එයා ඇවිල්ලා ගොඩක් ඩසදකැබඑ විදියට තමයි හැසිරෙන්නේ කියලා තමයි මට හඳුන්වලා දුන්නේ .

ප ඒ අනුව ඔබලා මෙම සහරාන් යන පුද්ගලයා හමු වෙන්න කොහාටද ගියේ ?

උ ගියේ කාත්තන්කුඩියේ නගරයේ ඉඳලා කිලෝ මීටර් බාගයක්වත් ගියේ නැහැ එතන ඉඳලා හරස් පාරක ගියා ඒ පාරේ අපිට වාහනයෙන් යන්න බැහැ පයින් තමයි ගියේ.

ප මුහුදු ප්‍ර දේශය පැත්තටද නැත්නම් ගොඩබිම දෙසටද ?

උ මුහුද පැත්තට.

ප ඔබ ඒ ගියේ සහරාන් ගේ කාර්යාලයටද නැත්නම් සහරාන් යන පුද්ගලයා හදපු පල්ලියක් වැනි ස්ථානයකටද ?

උ පල්ලියක් නෙමේ එයා එන්න කියපු තැනට ගියේ ඒක බැලුවම පොඩි office එකක් වගේ තමයි තිබුනේ.

ප එම ස්ථානයට වාහනයෙන් යන්න පුලුවන් වුනාද ?

උ බැහැ. පයින් ගියේ වාහනය මහ පාරේ නවත්වලා එතන ඉඳලා මීටර් 200 ක් විතර පයින් ගියා ඇතුළට මුහුදු පැත්තට.

ප කව්රු කව්රුද ගියේ ඔබ තනියෙන්මද ගියේ ?

FAIR COMMENT BY JEZEEM

උ මම , මගේ ඡායාරූප ශිල්පි සමන් , සහ අෂීන් කියන අනිත් මාධ්‍යවේදි සහෝදරයත් එක්ක.

ප්‍ර එම ස්ථානයට ඒ සහරාන් යන පුද්ගලයා හිටපු ස්ථානයට ගියායින් පස්සේ ඔබලා මොනවාද නිරීක්ෂණය කලේ එම ස්ථානය සම්බන්ධව ?

උ අපි එයත් එක්ක ඉස්සෙල්ලාම සාකච්ඡාවට ආවා ඇයි මෙහෙම වෙන්නේ මෙච්චර කරදර තියෙන්නේ මේ වගේ ගහගහන්නේ ඇයි ඔයිට ඉස්සෙල්ලාත් ඔහොම වෙලා තියෙනවා අපිට වාර්තා වෙලා තියෙනවා කොළඹට පස්සේ එයා හැම දෙයක්ම ඩිනයි කලා ප්‍රතික්ෂේප කලා අපේ නෙමේ මේක ඇති කරන්නේ අනිත් පාර්ශවය .

ප්‍ර ඒ ඔබලා අතර ඇති වෙච්ච සංවාදය සම්බන්ධයෙන්නේ ? මං ඇහුවේ එම ස්ථානයේ ඔබ මොනව හරි නිරීක්ෂණය කරාද ඔය සහරාන් හිටපු ස්ථානයේ ? මොනව හරි නිරීක්ෂනය කරාද? මොනවද ඔබ නිරීක්ෂණය කරේ?

උ මම දැක්කා ඊට යාබදව තිබ්බ කාමරේ අවි ආයුධ තිබ්බා . T. 56 .

ප්‍ර T.56 වර්ගයේ ගිනිඅවි ?

උ ඔව් . ඒ ගැන ඇහුවේ නැහැ අපි දැක්කා.

ප්‍ර ඒ කියන්නේ ඔබ වාඩි වුන තැනට ඒවා නිරීක්ෂනය වුනාද ?

උ මට මෙහෙම වාඩි වෙලා ඉන්න කොට එහා පැත්තෙන් මට පේනවා ඒක අල්ලපු කාමරේ.

ප්‍ර එම ස්ථානයේ සහරාන්ට අමතරව තව ඔහුගේ අනුගාමිකයනුත් හිටියාද ?

උ හිටියා අපිත් එක්ක කතාකරන කල් ඒ වටේම අනුගාමිකයන් එයා ආරක්ෂා කරගෙන හිටියා ඒ බිල්ඩින් එකේ.

ප්‍ර ඉන්පසුව ඔබ සහරාන්ගෙන් විමසීමක් කරේ නැද්ද මේ අවි ආයුධ සම්බන්ධයෙන් නැත්නම් ඔබ විමසීමක් කරාද ?

උ මම එයාගෙන් විමසීමක් කරේ නැහැ ආපහු මගේ ප්‍රාදේශිය වාර්තා කරුගෙන් ඇහුවා කොහොමද මෙහෙම අවි ආයුධ මේ ගොල්ලොන්ට ලැබෙන්නේ කියලා ?

උ එතකොට ඔබට මොකක්ද අනාවරණය වුනේ ?

උ මේක ඇත්තම මේක දුන්නේ ඒ කියන්නේ කාත්තන්කුඩි පල්ලියේ ලොකු මැසගර් එකක් සමුල ඝාතනයක් වුනා ලොකු ඒ සමුල ඝාතනය කරේ කරුණා කියන පුද්ගලයා ඊට පස්සේ මේ ගොල්ලන්ට ආණ්ඩුවෙන් අවි ආයුධ ඉල්ලුවා අපිවත් ආරක්ෂා කර ගන්න .

ප්‍ර මේ ගොල්ලන්ට කියලා ඔබ සඳහන් කලේ ?

උ මුස්ලිම් කට්ටිය. ඒ කියන්නේ දෙමළ කට්ටියත් එක්ක ඉන්න බැහැ අපිව මරණවා ඒ නිසා අපිව ආරක්ෂාවට අපිටත් ආයුධ දෙන්න කියලා එතකොට එවකට පැවති රජය හමුදා මාර්ගයෙන් මේ ගොල්ලොන්ට අවි ආයුධ ලබා දුන්නා.

ප්‍ර හරි දැන් ඔබ කිව්වානේ මෙම සාක්ෂි දෙනකොට කරුණා කියලා ?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ඇ ඔව්.

ප්‍ර මේ කරුණා කියන්නේ කවිද සම්පූර්ණ නම කියන්න ?

ඇ කරුණා කියන්නේ නැගෙනහිර හිටපු ප්‍රාදේශිය කොටි නායකයා විනයාර්ග මුර්ති මුරලිදරන් .

ප්‍ර ඊට පස්සේ ඔබ කිව්වානේ එවකට පැවති රජයෙන් තමයි මේවා ලබාදීම සිද්ධ කරේ කියලා ඒ කියන්නේ එවකට පැවති රජය කවිද?

ඇ එතකොට රාජපක්ෂ මහත්මයාගේ රජය.

ප්‍ර ඒ කියන්නේ දැන් ඔබ මේ කාත්තන්කුඩි ප්‍රදේශයේ වාරිකාවේ යනකොට යුද්ධය පැවති කාලයේද නැත්නම් යුද්ධය අවසන් වෙලාද ?

ඇ මම සෑහෙන්න ගිහිල්ලා තියෙනවා අවුරුදු ගාණක් නිස්සේ මම ඔය යුද්ධය වෙලාවෙත් ගිහිල්ලා තියෙනවා .

ප්‍ර දැන් මේ ලිපිය ලියන්නට අදාලව යනකොට ?

ඇ එතකොට දෙපැත්තම වෙන්වෙලා හිටියා දෙමළ මිනිස්සු කාත්තන්කුඩියට යන්නේ නැහැ කාත්තන්කුඩි මුස්ලිම් මිනිස්සු මඩකලපුව ටවුමට එන්නේ නැහැ බිස්නස් කරන්න දෙගොල්ල වෙන් වෙලා හිටියේ. විරසක වෙලා හිටියේ.

ප්‍ර හැබැයි යුද්ධය පැවතුනාද 2009 අගෝස්තු මාසේ 16 වෙනකොට නැත්නම් අවසන්ද ?

ඇ එතකොට අවසන්වෙලා ඉවරයි.

ප්‍ර මේ ආයුධ ලබා දෙන්න කව්රුහරි දේශපාලඥයෙක් එහෙම ඒ වකවානුවේ මැදිහත්වීමක් සිද්ධ වුනාද ?

ඇ ඒකට ප්‍රසිද්ධයක් තියෙනවා හිස්බුල්ලා නැමති එවකට හිටපු නියෝජ්‍ය ඇමති එයාගේ සහ ඇමති මුලිකත්වයෙන් තමයි මේ අවි ආයුධ ඒ ගොල්ලන්ට ලබා දුන්නේ.

ප්‍ර මේ අවි ආයුධ ලබා දුන්නේ යම්කිසි හේතුවක් නිසාද ? යුද්ධයක් පැවති කාලයකට අදාලව ?

ඇ ඒ ගොල්ලන්ට කරුණා එල් . ටී. ටී. ඊ. පාර්ශවයෙන් තිබිච්ච අර කාත්තන්කුඩි මොස්ක් එකේ වෙච්ච මැසකරය නිසා සමුල ඝාතනය නිසා ඒ ගොල්ලන්ට ආරක්ෂාව ඕනේ කියලා දෙමළ මිනිස්සුන්ගෙන් සහ එවකට හිටපු කොටි කට්ටියගෙන් ඒ නිසා ඒ ගොල්ලන්ට අවි ආයුධ දුන්නා.

ප්‍ර ඔබ සඳහන් කරානේ මේ කාත්තන්කුඩියේ සමුල ඝාතනයක් සිදුවුනා කියලා පල්ලියක?

ඇ පල්ලියක් ඇතුලේ .

ප්‍ර ඔබට මතකද ඒ සිදුවෙච්ච ඒ කාලවකවානුව එහෙම ?

ඇ 1999 වගේ කාලයක තමයි ඕක වුනේ මගේ මතකයේ හැටියට.

ප්‍ර ඔබට හරියටම කාල වකවානුව මතකද ?

ඇ නැහැ. මට එච්චර නිච්චි නැහැ.

FAIR COMMENT BY JEZEEM

ප ඔබට මතක විදියට මේ ආයුධ ලබා දීමට ප්‍රමුඛත්වය ගෙන කටයුතු කල දේශපාලඥයා කවුද ?

උ හිස්බුල්ලා නැමති හිටපු ඇමති .

ප ඒ කියන්නේ එම්. එල්.ඒ. එම්. හිස්බුල්ලාද.?

උ එම්. එල්.ඒ. එම්. හිස්බුල්ලා .

ප හිටපු ආණ්ඩුකාරවරයා විදියට හිටපු පුද්ගලයා ?

උ ඔබ නිවැරදියි.

ප ඔබ සඳහන් කරා මේ හිස්බුල්ලා හිටපු ආණ්ඩුකාරවරයා මැදිහත්වුනා කියලා මේ ආයුධ ලබා දෙන්න ඔබ ඒ සම්බන්ධයෙන් කොහොමද දැනගත්තේ ?

උ ඒ කියන්නේ එයා ප්‍රසිද්ධියේම අවි ආයුධ බාර දුන්නා කාත්තන්කුඩි ටවුන් එකේ . රැස්වීමක් තියලා සහරාන්ලට එයාගේ ගෝල බාලයන්ට

ප ඔබ ඒක ඔබගේ ඇස් දෙකින් දැක්කාද නැත්නම් තොරතුරු වලින්ද ?

උ තොරතුරු ආවා පින්තූරුත් ආවා ඒකේ මා ලඟ නැහැ ඒ පින්තූර මම ඒක වෙබ් සයිට් වල දැකලා තියෙනවා ගොඩක් ලෝකේ වටේම ඒ පින්තූර ගියා.

ප ඔබ සඳහන් කරා මේ අවි ආයුධ ලබා දීමට මූලික වුන එක් සිද්ධියක් විදියට කාත්තන්කුඩි මොස්ක් එකේ පල්ලියේ ඇතිවුනු සමූලඝාතන සිද්ධිය
සම්බන්ධයෙන් ?
එම සිද්ධිය සිදුවුනේ 1990 අගොස්තු මස 03 වෙනිදා කියලා කිව්වොත් ඔබට ඒ සඳහන මොකක්ද ?

උ නිවැරදියි ඒ අවස්ථාවේ මම මඩකලපුවේ ගිහිල්ලා හිටියා වෙන වැඩකට නමුත් . මම ගියාම මට යන්න දුන්නේ නැහැ පල්ලිය ඇතුලට . නමුත් මම ඒ සිද්ධිය බලන්න ගියා මට යන්න දුන්නේ නැහැ . නමුත් ඒ අවස්ථාවේ වෙන වැඩකට මම ගිහිල්ලා හිටියේ.

ප 1990 අගෝස්තු 03 වෙනිදා කියන දිනය නිවැරදි කියලා ඔබට සඳහන් කරන්න පුලුවන්ද ?

උ පුලුවන්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක්ද සිල්වා මැතිතුමා.</u>

ප ඒ 1990 අගෝස්තු මාසේ 03 වෙනි දින ඔය කාත්තන්කුඩි මුස්ලිම් පල්ලියට සිදුවූ ප්‍රහාරයෙන් පසුව කොපමණ කාලයකට පසුවද ඔබ කියන විදියට ඒ අවි ආයුධ සැපයීමක් සිදුවුනේ ?

උ මාසයක් වත් ගියේ නැහැ ඒකට ස්වාමීනි. ඊට පස්සේ හැම තැනම ඒ ගොල්ලන් අවි ආයුධ පිටින් හැමතැනම ඇවිදින්න පටන් ගත්තා.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර එතකොට 1990 ඔබ කියන විදියට සැප්තැම්බර් මාසේ ඔ බ කියන විදියට මේ අවි ආයුධ සැපයීමක් සිදුවුනේ ?

උ නිවැරදියි.

ප්‍ර එතකොට එවකට රජය කාගේ රජයද ?

උ එවකට මට එච්චර නිච්චියක් නැහැ ස්වාමීනි.

ප්‍ර කවිද එවකට ජනාධිපතිවරයා වශයෙන් හිටියේ ?

උ මගේ මතකයේ හැටියට චන්ද්‍රිකා මැඩම් හිටියේ. සමාවෙන්න එවකට ස්වාමිනි එතකොට හිටියේ ස්වාමීනි රණසිංහ ප්‍රේමදාස මහත්මයා හිටපු ජනාධිපති

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා.</u>

ප්‍ර ඔබ කලින් සඳහන් කලානේ එවකට ඔබේ මතකයේ හැටියට හිටියේ ජනාධිපති විදියට චන්ද්‍රිකා බණ්ඩාර නායක කුමාරතුංග මැතිණිය කියලා?

උ ඒ මගේ ප්‍රකාශය මා ආපහු ඉල්ලා අස් කරගෙන එය නිවැරදි විය යුතුයි.

ප්‍ර කෙසේද කොහොමද නිවැරදි වෙන්න ඕනේ ?

උ එතන හිටියේ රණසිංහ ප්‍රේමදාස මහත්මයා තමයි ජනාධිපති හැටියට .

ප්‍ර ඔබ දැන් සඳහන් කරා එම්.එල්.ඒ. එම්. හිස්බුල්ලා මහතාගේ ප්‍රධානත්වය මත ඒ පළාතේ හිටපු මුස්ලිම් වරුන්ට අවි ආයුධ ලබා දීමක් සිද්ධ කලා කියලා ඒ ලබා දීම සිද්ධ කලේ කොයි කාලෙද කියලා මතකද ඔබට ?

උ එවකට හිටපු ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහත්මයාගේ කාලේ තමයි ඔය අවි ආයුධ ඒ අයට ලබා දුන්නේ.

ප්‍ර නැවතත් මා ඔබගේ අවධානය යොමු කරනවා ඔබ සහ සහරාන් අතර ඇතිවූ කතාබහ සම්බන්ධයෙන් ? ඔබ සහරාන් හම්බ වෙලා සංවාදයක යෙදුනා නේද ?

උ ඔව්.

ප්‍ර කුමක් සම්බන්ධයෙන්ද ඔබලා දෙදෙනා සංවාදයක යෙදුනේ ?

උ අපි මේ මුස්ලිම් ගැටුම් පිළිබඳ ඒ කියන්නේ කල්ලි දෙකක් අතර ඇයි මෙහෙම වෙන්නේ කියා ?

ප්‍ර ඔහු ඒ සම්බන්ධයෙන් මොකක්ද ප්‍රකාශ කලේ ?

උ ඒ ගොල්ලෝ හැම තිස්සේම කිව්වේ අපි නෙමේ ප්‍රශ්ණ ඇති කරන්නේ මේ පලාතේ තවත් කල්ලියක් ඉන්නවා කිව්වා.

ප්‍ර මොකක්ද ඒ කල්ලිය ?

උ රවුෆ් මවුලවිගේ කල්ලිය.

ප්‍ර ඔහුගේ ස්ථාවරය වුනේ මොකක්ද මේ රවුෆ් මවුලවිගේ කල්ලිය සම්බන්ධයෙන් ?

FAIR COMMENT BY JEZEEM

උ සහරාන්ට ඕනේ වුනේ young crowd එක තරුණ කොටස එයාගේ පැත්තට අරගෙන හරි විදියට පෙළ ගස්සවලා ඒ ගොල්ලන්ගේ ජීවිතය අමුතු මාර්ගයක ගෙනියන්න.රවුෆ් මවුලවි ඇවිල්ලා මොඩරේට් එයා ඇවිල්ලා හැම තිස්සේම සාමකාමී මනුෂ්‍යයෙක් විදියට තමයි ඒ පළාතේ එයා ජීවත් වුනේ.

ප ඒ කියන්නේ සහරාන්ට යම්කිසි දේශපාලනික අරමුණක් තිබ්බාද ?

උ අනිවාර්යයෙන්ම තිබුනා.

ප මොකක්ද ඔහුට තිබ්බ දේශපාලනික අරමුණ ?

උ ඔහුට ඕනේ වුනේ අවශ්‍ය වුනේ කවද හෝ ඒ පළාතේ ප්‍රදේශයේ මහා ප්‍රබල දේශපාලකයෙක් වෙන්න.

ප ඔහු ඒක ඔබට සඳහන් කරාද ඔබගේ සාකච්ඡාවේදී ?

උ ඔව් කිව්වා සඳහන් කරා.

ප ඔබ කිව්වානේ ඔහුට අවශ්‍ය වුනා කියලා ඔබ සඳහන් කරා සහරාන්ට අවශ්‍ය වුනා කියලා ඒ ප්‍රදේශයේ ජනතාව ට ඉස්ලාම් ආගම උගන්වන්න?

උ තරුණ කොට්ඨාශය එයා එක්රැස් කරගෙන අලුත් ගමනක් යන්න එයාට ඕනේ විදියේ . දිග ගමනක් යන්න .

ප ඒ කියන්නේ ඔහු විවේචනය කරාද මේ රවුෆ් මවුලවිගේ ඉගැන්වීම?

උ අනිවාර්යයෙන්ම එයා කරයි.

ප ඒ ඉගැන්වීම් අතර රවුෆ් මවුලවිගේ ඉගැන්වීම් කල වැරදි මොනවද කියලා ඔබගේ සම්මුඛ සාකච්ඡාවේදී ඔබට කිව්වාද ?

උ ඒ ගොල්ලන් කියන්නේ බාහිර ඒ කියන්නේ traditional මුස්ලිම් විදියට තමයි එයා යන්නේ ඒකෙන් අපි ඉවත් වෙන්න ඕනේ.

ප එයා යන්නේ කියලා කියන්නේ traditional විදියට කව්රු යන්නේ කියලාද ඔබට කිව්වේ ?

උ traditional විදියට රවුෆ් මවුලවි යන්නේ කියලා සහරාන් මට ප්‍රකාශ කලා

ප එතකොට එයින් වෙනස්ව කොයි ආකාරයකට යන්න ඕනේ කියලාද සහරාන් ගේ මතවාදය වුනේ 2009දි?

උ මේ ගොල්ලන්ට හැම තිස්සේම අවශ්‍ය වෙලා තිබුනා ඒ පලාතේ සම්පූර්ණයෙන් බලයක් ගොඩනඟා ගෙන දෙමළ මිනිසුන් එක්ක ගැටෙන්න .

ප මේ සහරාන් ගේ මතවාදය දරන කණ්ඩායමට ?

උ කණ්ඩායම

ප ඔහුට දෙමළ මිනිසුන් සමඟ ද ගැටෙන්න උවමනාව තිබුනේ නැත්නම් විරුද්ධ මතවාදි දරන මුස්ලිම් මිනිසුන් සමඟද ගැටෙන්න අවශ්‍යතාවය තිබුනේ ?

උ පාර්ශව දෙක සමඟම. දෙමළ කොට්ඨාශ සහ එයාට විරුද්ධ වෙන අනික් රවුෆ් මවුලවිගේ කල්ලියත් එක්ක. පාර්ශව දෙකත් එක්ක.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර ඔබ සහරාන් සමඟ ඇතිවූ සංවාදයේදී විමසිමක් කලාද ඔහු ඒ වන විට මේ හිංසාවාදිව ආගම ප්‍රචාරණය සම්බන්ධයෙන් යන වැඩ පිළිවෙල අනුමත කරනවාද කියලා ?

උ ආපහු පැහැදිලි කරන්න.

ප්‍ර සහරාන් එක්ක ඔබ සංවාදයක් ඇතිවුනා කිව්වානේ ඒ සංවාදයේදි සහරාන්
ප්‍රකාශ කලාද මේ තමන්ගේ ආගම ප්‍රචාරණය කරන්න ඕනේ හිංසාවාදිව අවි පෙන්වලා යන ප්‍රතිපදාවකද නැත්නම් අවිහිංසාවාදිව ආගම ප්‍රචාරණය කල යතුද කියලා ඔහුගේ මතවාදය වුනේ ?

උ මට වැටහුන විදියට එයා අවි බලයෙන් එයා මිනිසුන්ව එයාගේ පැත්තට හරවා ගන්න තමයි එයාට අවශ්‍ය වෙලා තිබුනේ.

ප්‍ර 2009 වෙනකොටත් ?

උ ඔව් තරුණ කොටස්.

ප්‍ර ඔබ සහරාන් සමඟ පැවති සම්මුඛ සාකච්ඡාවේදි ඔහුගෙන් විමසිමක් කලාද ඔහුගේ අනුගාමිකයන් මෙහොමඩ් රිස්වි යන අයව පැහැර ගැනීමකට ලක්කරලා හිරිහැර කිරීමක් සිද්ධ කරාද යන කාරණය සම්බන්ධයෙන් ?

උ එවකට මට මතක හැටියට එරාවුර් ප්‍රදේශයේදි එයාගේ අනුගාමිකයෙක්ව පැහැර ගෙන ගිහිල්ලා පහර දීමක් සිදු කරලා තිබුනා.

ප්‍ර සහරාන්ගේ අනුගාමිකයන් පැහැර ගැනීම නෙවේ සහරාන්ගේ අනුගාමිකයන් විසින් මොහොමඩ් රිස්වි යන අයව පැහැර ගැනිමක් සිද්ධ කිරීම සම්බන්ධයෙන් ?

උ ඔව් වාර්තා වුනා මට .

ප්‍ර ඔබ ඒ සම්බන්ධයෙන් සහරාන් ගෙන් විමසා සිටියාද ?

උ ඔව්. ඒකට කිව්වා ඒ ගොල්ලෝ මම සම්බන්ධ නැහැ කිව්වා.

ප්‍ර ඔහු සම්බන්ධ නැහැ කිව්වා ?

උ නැහැ කිව්වා.

ප්‍ර ඔහු ඊට අමතරව ඔබ විමසීමක් කරලා බැලුවද අර අසරණ සාම්ප්‍රදායික මිනිසුන් ගේ ගෙවල් 100 ක් විතර ගිනි තියලා තිබ්බනේ?

උ ඔව්.

ප්‍ර ඒ සම්බන්ධයෙන් සහරාන් සම්බන්ධද කියලා ඔබ සහරාන් ගෙන් විමසිමක් කරලා බැලුවාද ?

උ ඔව්.

ප්‍ර එතකොට මොකක්ද ඔහුගේ ප්‍රතිචාරය වුනේ ?

උ ඒ කියන්නේ අපිට පහර දෙන්න ආපු අවස්ථාවේ අපි පෙරළා පහර දුන්නා .

ප්‍ර කියලා තමයි ඔහු සඳහන් කරේ?

උ සඳහන් කරේ.

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර මේ මොහොමඩ් රිස්වි යන අය පැහැර ගැනීමේ සිද්ධිය සම්බන්ධයෙන් ඔබ එවකට සිටිය නියෝජ්‍ය පොලිස්පති එඩිසන් ගුණතිලක සමඟ කතා බහ කළාද?

උ ඔව් කථා කළා.

ප්‍ර මොකක්ද ඔබට දැන ගන්නට හම්බවුනේ කතා බහෙන් ?

උ ඒ ගොල්ලන් කිව්වා මේ මතවාද ගැටුම් තියෙනවා මේක අපිට බේරන්න බැහැ මෙතන තියෙන්නේ ලොකු දේශපාලන අර්බුදයක් ඒ නිසා අපි මේවට මැදිහත් වෙන්න බැහැ කිව්වා රජයේ නිළධාරීන් හැටියට.

ප්‍ර දේශපාලන අර්බුදයක් විදියට ඔබ අදහස් කලේ මොකක්ද කියලා ඔබ විමසලා බැලුවද ?

උ ඔව් ඒ කියන්නේ ඒ ගොල්ලන් මොනව හරි එවකට ඒගොල්ලන්ට විරුද්ධව හරි මොනවහරි ක්‍රියා මාර්ගයක් ගත්තොත් නීතිමය ක්‍රියා මාර්ගයක් ගත්තොත් පහුවදා ඊලඟ සතියේ වෙන කොහාට හරිපළාතකට ඒ ගොල්ලන්ව transer කරනවා .

ප්‍ර එවැනි දෙයක් ඔබට ප්‍රකාශ කරාද එම පුද්ගලයා?

උ ප්‍රකාශ කරා.

ප්‍ර පුද්ගලයා ?

උ එඩිසන් ගුණතිලක එවකට හිටපු ඩී. අයි. ජී මහත්මයා මඩකලපුව.

ප්‍ර ඊට අමතරව සහරාන්ගේ අනුගාමිකයෙක් වන අබ්දුල් සමාඩ් නැමති පුද්ගලයාව ඝාතනය කිරීමකට අදාලව සිද්ධියක් සිදුවුනාද ඔය ආසන්නයේම?

උ ඔව් සිද්ධ වුනා

ප්‍ර ඔබ ඒ සම්බන්ධයෙන් එරාවුර් පොලිස් ස්ථානයෙන් තහවුරු කර ගැනිමක් කරාද ?

උ කරා.

ප්‍ර මෙම අබ්දුල් සමාඩ් යන පුද්ගලයා මේ සහරාන්ගේ අනුගාමිකයෙක් විදියට ඔහු මොනවද කරලා තියෙන්නේ ?

උ එයා ඝාතනය කරපු ඒ ප්‍රදේශයේ මිනිසුන්ව සම්පූර්ණයෙන් එයා අවි බලයෙන් යටත් කරගෙන හිටියේ බය කරලා ඒ කියන්නේ එතන හිටියේ හරි දුප්පත් මිනිස්සු ඒ ගමේ හිටියේ.

ප්‍ර ඒ කියන්නේ මේ අබ්දුල් සමාඩ් කියන පුද්ගලයාත් තව්හිද් මතවාදය දරන පුද්ගලයෙක්ද ?

උ මතවාදය දරන පුද්ගලයෙක්.

ප්‍ර එතකොට ඔහුව ඝාතනය කරලා තිබ්බා ඔබ ඒ කාත්තන්කුඩිය visit එකට ආසන්න දවසක ?

උ ආසන්න දවසකදී.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

ප්‍ර කව්රු විසින්ද මේ අබ්දුල් සමාඩ් යන සහරාන් ගේ කණ්ඩායමේ පුද්ගලයාව සාතනය කරලා තියෙන්නේ ඔබ ඒ ගැන හොයලා බැලුවාද?

උ හොයලා බැලුවා එතකොට තවත් කල්ලියක් එනවා මඩකලපුවට ඊලඟ ආසන්න නගර කොළඹ පැත්තට වෙන්න චෙන්කල්අඩි , එරාවුර් . ඒ පැත්තෙත් ඉන්නවා රැඩිකල් කල්ලියක් එරාවුර් ප්‍රදේශයේ තමයි මට මතක හැටියට එයා මරලා තිබුනේ .

ප්‍ර ඒ කියන්නේ මේ සහරාන්ට පහර දුන්නේ තවත් තව්හිද් කල්ලියක්ද නැත්නම් සාම්ප්‍රදායික කල්ලියක්ද ?

උ සාම්ප්‍රදායික කල්ලියක්.

ප්‍ර ඊට අමතරව ඔබට හැකිවුනාද භද්‍රයා ජුම්මා මොස්ක් යන පල්ලිය නිරීක්ෂණයට යන්න ?

උ මම ගියා.

ප්‍ර එහි ඡායාරූපයක් එහෙම ඔබගේ Article එකේ තියෙනවානේ ?

උ Article එකේ තියෙනවා .

ස්වාමිනි සාක්ෂිකරුට C. 723 පෙන්වා සිටිනවා

ප්‍ර මේ ඡායාරූපයේ දැක්වෙන්නේ ඔබ ඔය කියන භද්‍රයා ජුම්මා පල්ලියද ?

උ ඒ පල්ලිය තමයි.

ප්‍ර පල්ලිය කිව්වොත් නිවැරදියි?

උ නිවැරදියි.

ප්‍ර ස්වාමිනි එම පල්ලියේ ඡායාරූපයේ දැක්වෙන කොටස C. 723 B වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා

ප්‍ර මේ පල්ලිය රැඩිකල් මතවාදී දරන පල්ලියක් ද නැත්නම් සාම්ප්‍රදායික මතවාද දරන පල්ලියක්ද ?

උ මේගොල්ලන් සාම්ප්‍රදායිකයි.

ප්‍ර සාම්ප්‍රදායිකයි කියන්නේ මොන වගේ මතවාදයක්ද ?

උ මේ ගොල්ලන් ඇවිල්ලා අවිහිංසාවාදී ඒ කියන්නේ කාත් එක්කවත් ගැටුම් ඇති කර ගන්න කැමති නැහැ.

ප්‍ර ඒ කියන්නේ ඕනෑම ජාතියක ආගමක කෙනෙක්ට මේ මොස්ක් එක ඇතුලට යන්න පුලුවන්ද ?

උ මමත් ගියා මට කෑම වේලකුත් දුන්නා දවල්ට.

ප්‍ර සාමාන්‍යයෙන් මුස්ලිම් පල්ලිවලට යන්නේ පිරිමි පාර්ශව විතරයි මේ වගේ ඒවට කාන්තාවන්ට වුනත් යන්න පුලුවන්ද ?

උ මේ පල්ලියට කාන්තාවන් ඕනේ තරම් එන්න ඒ ගොල්ලෝ අවසර දෙනවා .

ප්‍ර ඔබගේ අත්දැකිමට අනුව ඒ කියන්නේ මෙය මොඩරේට් පල්ලියක් කිව්වොත් නිවැරදිද ?

උ ඒක හරි.

FAIR COMMENT BY JEZEEM

ප දැන් මේක ඒ ප්‍රදේශයේ තියෙන යම්කිසි නිකායකට අයිති පල්ලියක්ද ?

උ ඔව්.

ප මොකක්ද ඒ නිකාය ?

උ සුෆිස් ලා.

ප සූෆි මුස්ලිම් පල්ලියක්ද මේක ?

උ ඔව්.

ප දැන් මේ C. 723 B දරන ඡායාරූපය බලනකොට කමලේන්ද්‍රන් මහතා දක්නට ලැබෙනවා සෑහෙන්න අලාභහානි වෙච්ච ස්වරූපයක් ?

උ ඔව්.

ප ඒකට හේතුව ඔබ විමර්ෂණය කරලා බැලුවාද ?

උ ඔව්.බැලුවා .

ප මොකක්ද ඒකට හේතුව ?

උ ඔය පල්ලියට පහර දුන්නේ සහරාන් ෆයිල්වාන් නැමති පුද්ගලයා මැරුවට පස්සේ ඔය පල්ලියේ තිබිච්ච සෙමට්‍රියේ තමයි වැලලුවේ .

ප නැවත කියන්නකෝ මේ පල්ලියට පහර දුන්නේ සහරාන් නැමති පුද්ගලයාද නැත්නම් ඔහුගේ අනුගාමිකයන්ද ?

උ එයාගේ මුලිකත්වයෙන් එයාගේ අනුගාමිකයන්.

ප කොයි කාලේ විතරද පහර දීලා තියෙන්නේ ?

උ මා ඒ ගිය කාලෙට යන්න මාස දෙකකට කලින්.

ප ඒ කියන්නේ 2009 වර්ෂයේම?

උ ඒ කාලේ තමයි ඔකට පහර දුන්නේ අර ගෙවල් කඩපු කාලේ තමයි ඔකත් කැඩුවේ .

ප පහර දීලා තියෙන්නේ ? මේ ගොඩනැගිලි වලට විතරද පහර දීලා තියෙන්නේ නැත්නම් යම්කිසි පුද්ගල හානිත් සිද්ධ කරලා තියෙනවාද ?

උ මේක ඇතුලේ පුද්ගල හානි වුනේ නැහැ ගොඩනැගිල්ලට ඇතුලේ සෑහෙන්න අලාභ හානි කරලා තියෙනවා.

ප දැන් මේ ඡායාරූපයේ ඉදිරිපසින් දැක්වෙනවා කොල පැහැති යම්කිසි ඉදි කිරීමක් ඒ ඉදිකිරිම මොකක්ද?

උ නෑ එතන ඒ ගොල්ලන් දැන් කව්රුහරි visitors ලා ගියාම ඒ ගොල්ලන්ට සමහර කට්ටියව ඉන්න එකමඩේෂන් දෙන්නේ ඒ හරියේමයි කෑමක් දෙනවා ඉන්නත් දෙනවා.

ප දැන් මේ පල්ලිය ඔබ සඳහන් කලා ෆයිල්වාන් පුද්ගලයා ?

උ එයා මේකේ අනුගාමිකයෙක්.

ප දැන් ඔහුට මේ සම්බන්ධයෙන් මොකක්ද සිද්ධ වුන සිදුවිම ? ෆයිල්වාන් නැමති පුද්ගලයා ?

උ ෆයිල්වාන් නැමති පුද්ගලයා මියගියාට පස්සේ මේ පල්ලියේ සෙමට්‍රියේ තමයි වැළලුවේ එයාව මුස්ලිම් සෙමට්‍රියේ. ඊට පස්සේ ඒ මිනිය ගොඩ අරගෙන පාරට ගෙනල්ලා දැම්මා සහරාන් ගේ කට්ටිය .

FAIR COMMENT BY JEZEEM

ප්‍ර ඔබ සඳහන් කරන්නේ මේ ඡායාරූපයෙන් දැක්වෙන පල්ලියේ සොහොන් පවත්වාගෙන යනවා කියලා ?

උ ඔව්.

ප්‍ර ඒ සොහොනක වැළලුවාද ෆයිල්වාන් නැමති පුද්ගලයා ?

උ ඔව්.

ප්‍ර මේ ෆයිල්වාන් නැමති පුද්ගලයත් මවුලවි වරයෙක්ද ?

උ මවුලවිවරයෙක්.

ප්‍ර ඔහු සූෆි මුස්ලිම් සඟයට අයත් මවුලවි වරයෙක්ද ?

උ ඔව්.

ප්‍ර ඔහුට මේ පල්ලියත් එක්ක තියෙන සම්බන්ධය ඔබ දන්නවාද ?

උ ඔව්.

ප්‍ර මොකක්ද සම්බන්ධය ?

උ එයා ඇවිල්ලා ගමේ ඉන්න ගොඩාක් මිනිසුන්ව මේ පල්ලියට එක්කහු කරලා සාමකාමී විදියට තමයි එයා මේ පරිසරය ගොඩනඟා ගන්න එයාගේ අදහසක් තිබුනේ .

ප්‍ර ඒ අනුව සහරාන් ඔහුගේ මලසිරුරට මොකක්ද සිද්ධ කලේ ?

උ එතනින් ගොඩ අරගෙන කාත්තන්කුඩි town එකට ගෙනල්ලා පාරේ විසි කරලා දැම්මා.

ප්‍ර දැන් ඔබ සඳහන් කරානේ මේ ෆයිල්වාන් නැමති පුද්ගයාගේ මල සිරුර ඒ ආදාහනය කරපු තැනින් නැවත ගොඩ අරන් කාත්තන්කුඩි නගරයට රැගෙන ආවා කියලා ?

උ ඔව්.

ප්‍ර නගරයට රැගෙන එන්නද පමණක්ද කලේ නැත්නම් මේ මල සිරුරට මොකක්ද කරේ ?

උ ඒ මළ සිරුර විකෘති කරලා තිබුනා. ඒ කියන්නේ ගිනි තියලා වගේ විකෘති කරලා තිබුනා.

ප්‍ර ඔබ මේ පල්ලියට නිරීක්ෂණය කරන්න ගියානේ මහත්මයා

උ ඔව්.

ප්‍ර ඔබට නිරීක්ෂණය වුනාද ඔය නිරීක්ෂණය කරන දවස් වෙන කොට මේ පල්ලිය ඇතුලේ සොහොන් කොත් හදපු ප්‍රදේශ තිබ්බාද කියලා ?

උ තිබුණා.

උ ඒක තිබ්බේ මේ පල්ලිය තුලද නැත්නම් පල්ලිය පරිශ්‍රයේ වත්තේද?

උ වටපිටාවේ

ප්‍ර සොහොන් කොත් කීයක් විතර තිබ්බාද මට මතක හැටියට .?

උ මට දැනට ඒක නිවිවි නැහැ ස්වාමිනි.

ප්‍ර ඔබ සඳහන් කරා මෙම ෆයිල්වාන් නැමති මවුලවි වරයාගේ දේහය සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් දැන් සාක්ෂි දුන්නා. ඒ ෆයිල්වාන් නැමති මවුලවි වරයාගේ දේහය ආදාහනය කරන කොට මේ සාම්ප්‍රදායික

FAIR COMMENT BY JEZEEM

මුස්ලිම්වරුන් විසින් එම දේහය preserve කරන්න නැත්නම් වැඩිදුර ට ආරක්ෂා කරන්න යම්කිසි ක්‍රියා මාර්ගයක් ගත්තාද ?

උ ගොඩක් කාලෙට ඒ බොඩි එක ඒක ඇතුලේ තියා ගන්න තමයි ඒ ගොල්ලන් ට්‍රයි කරේ

ප්‍ර ඒ කියන්නේ මොනවාහරි කෙමිකල් දාලා සංරක්ෂණය ?

උ සංරක්ෂණය කරලා මොනවාහරි as a symbolic එයා මේ පල්ලියට සෑහෙන දායකත්වයක් දිලා නිසා පල්ලියේ මතකයකට තමයි එයා ගොඩක් කාලයකට preserve කරලා.

ප්‍ර දැන් මේ සූෆි පල්ලිය වන්දනා කිරීමට එන පුද්ගලයින් මේ දේවස්ථානය ඇතුලේ තියෙන සොහොනුත් වන්දනා කරනවාද ?

උ ඔව්.

ප්‍ර ඔබ ඒවා දැකලා තියෙනවාද ?

උ ඔව් මම දැකලා තියෙනවා.

ප්‍ර ඉන් අනතුරුව ඔබ ආලිම් නැමති අන්වර්ථ නාමයෙන් හඳුන්වන තවත් පුද්ගලයෙක් හමු වෙන්න ඔබගේ මේ කාත්තන්කුඩි ගමනේදී ඔබ ඒ සඳහා කටයුතු යොදා ගත්තාද?

උ ඔව්.

ප්‍ර මේ ආලිම් යන අන්වර්ථ නාමයෙන් හැඳින්වෙන පුද්ගලයා ඔබ එසේ හඳුන්වන්නට හේතුව මොකද ?

උ ඒ කියන්නේ ඔහුගේ නම ප්‍රකාශ කරන්න එපා කිව්වා.

ප්‍ර photo එකක් ගත්තේ නැනේ .

උ නෑ එයාගේ ගත්තේ නැහැ.

ප්‍ර ඒ ආලිම් යන පුද්ගලයා මොකක්ද ඔබට සඳහන් කරේ. ?

උ එයා කිව්වේ දැන් ඉන්න මේ තරුණ කොටස් ඇවිල්ලා සෑහෙන්න රැඩිකල් වාදය පැත්තට හැරිලා යනවා ඒ නිසා අපිටත් මේ ප්‍රදේශයේ ජීවත් වෙන්න සෑහෙන්න අමාරුයි කියලා කිව්වා.

ප්‍ර ඊට අමතරව අවි පුහුණුවක් සම්බන්ධයෙන් ඔබට සඳහන් කලාද ඔහු?

උ ඔව් ඒකත් මට සඳහන් කලා .

ප්‍ර මොකක්ද ඒ සම්බන්ධයෙන් සඳහන් කලේ ?

උ ඒ ගොල්ලන් දකිනවා තරුණ කොටස් මුහුදු වෙරළට ගිහිල්ලා අවි පුහුණුවෙනවා.

ප්‍ර ඒ කියන්නේ මේ ජීව උණ්ඩ යොදා ගෙන අවි පුහුණුවක් සිද්ධ කලා කියලාද ඔබ සඳහන් කරන්නේ ?

උ ඔබ හරි.

ප්‍ර අ ඒ අනුව මේ ආලිම් නැමති අන්වර්ථ නාමයෙන් හැඳින්වෙච්ච පුද්ගලයා එසේ අවි භාවිතා කරපු තැනැත්තෙක්ද ඔහු පුහුණු කරන තැනැත්තෙක්ද ?

උ නැවත සඳහන් කරන්න ඔහු අවි පුහුණු කරුවෙක්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර ඔබ ඊට අමතරව මෙම ඡායාරූපයේ දැක්වෙනවා C. 723 ලේඛණයේ ෆවුසුල් හමීම් සහ අස්මිල් නැමති පුද්ගලයින් දෙදෙනෙක් ඔවුන් කව්ද?

උ ඔවුන් තරුණ කොටස් එහේ ඉන්න

ප්‍ර ඔවුන් සමඟ ඔබ කරන ලද සම්මුඛ සාකච්ඡාවේදි මොනවද අනාවරණය කර ගත්තේ ?

උ මම ඒගොල්ලන්ගේ මේ ගැටුම් පිළිබඳ සෑහෙන්න විමර්ෂණය කළා. ඒගොල්ලෝ කියනවා මේ දෙගොල්ල අතරේ හැම තිස්සේම දැන් ගැටුමක් තියෙනවා කියලා.

ප්‍ර ඊට අමතරව ඒ පළාත භාර සහකාර පොලිස් අධිකාරි කන්දේවත්ත මහත්මයාත් සමඟත් ඔබතුමාගේ කාත්තන්කුඩි ගමනේදි සාකච්ඡා කරාද ?

උ ඔව්.

ප්‍ර මොනවද ඒ සම්බන්ධයෙන් ඔහුත් එක්ක ඇති වෙච්ච ඔබගේ සංවාදයේදි අනාවරණය වුනේ ?

උ මම එයාගෙන් ඇහුවා ඇයි මේ ගැටුම් මේක ඔයගොල්ලේ නිරාකරණය කරන්නේ නැත්තේ ඇයි කියලා ?

ප්‍ර එතකොට ඔහු මොකක්ද ප්‍රකාශ කලේ ?

උ එයා කිව්වා අපිට උඩින් බලපෑම් එනවා මේවට විරුද්ධව කිසිම ක්‍රියා මාර්ගයක් ගන්න එපා නොදැක්ක වගේ ඉන්න කියලා.

ප්‍ර ඔබ හොයලා බැලුවාද මේ පල්ලිවලට නැත්නම් මේ අන්තවාදී කණ්ඩායම් වලට කොහොමද සල්ලි එන්නේ කියලා මේ සහකාර පොලිස් අධිකාරිතුමා මාර්ගයෙන් ?

උ ඔව් මම විමසිමක් කලා .

ප්‍ර එතකොට ඔබට මොකක්ද ඔහු මඟින් අනාවරණය වුනේ ?

උ ගොඩක් සල්ලි එන්නේ specially all the Middle East sector කියලා තමයි

ප්‍ර සහ ඊට අමතරව 2009 කාලේ ඉදන්ම දේශිය තරුණයන් විදේශිය රටවලට යන බවත් ඔබ කරුණු හොයා ගත්තාද ?

උ සෑහෙන තරුණ කොටස් විශේෂයෙන්ම ආගමික උගන්වන්න ගොඩක් තරුණ කොටස් ඒ වෙලාවේ ඒ ප්‍ර දේශයේ බැහැරව මැදපෙරදිග විශේෂයෙන් සවුදි අරාබියට ආගමික අධ්‍යාපනය ලබන්න ඒගොල්ලන් ස්පොන්සර් කරලා අරන් තියෙනවා .

ප්‍ර ඔබ ඊට අමතරව 2009 දි කාන්තන්කුඩිය ප්‍රදේශයේ යම්කිසි ඡායාරූප වගේකුත් ලබා ගත්තා නේද
මේ පුවත්පත් Article එක ලියන්න යනකොට?

උ හරි.
C723 නැවත පෙන්වා සිටිනවා

FAIR COMMENT BY JEZEEM

C. 723 ලේඛනයේ දැක්වෙන තිරයේ දැක්වෙන ඡායාරූපය ඔබ සමඟ ගිය ඡායාරූප ශිල්පියා විසින් ලබා ගත්ත ඡායාරූපයක්ද ?

උ සමන් කාරියවසම් මගේ ඡායාරූප ශිල්පියා විසින් ලබා ගත්ත ඡායාරූපයක්.

ප්‍ර ඒ කියන්නේ 2009 වර්ෂයේ අගෝස්තු මස ලබා ගත්ත ඡායාරූපයක් ?

උ අපි ටවුමට ඇතුල් වෙනකොට ගත්ත දෙවෙනි ඡායාරූපය ඕක.

ප්‍ර ස්වාමීනි මෙම ඡායාරූපය C. 723 C වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.

ප්‍ර දැන් මේ ඡායාරූපයෙන් දැක්වෙන්නේ 2009 වර්ෂයේ කාත්තන්කුඩි නගරයද ?

උ ඔව්.

ප්‍ර දැන් ඔබට මෙහි පුවරුවේ කුමක්ද නිරීක්ෂණය වෙන්නේ ?

උ WELCOME TO KATHTHANKUDI CITY

ප්‍ර ඒ කියන්නේ 2009 වෙන කොටත් මේ අරාබි භාෂාවෙන් පුවරු වල සඳහන් පිළිගැනීමේ තොරණ් ආදිය නිර්මාණය කරලා තියෙනවා කිව්වොත් නිවැරදිද ?

උ නිවැරදියි.

ප්‍ර ඔබගේ පුවත්පත් ලිපියේ තවත් ඡායා රූපක් දැක්වෙනවා C. 723 ලේඛණය සාක්ෂිකරුට පෙන්වා සිටිනවා මේ දැක්වෙන ඡායාරූපය ඔබ ලබා ගත්ත ඡායාරූපයක්ද ?

උ අපේ මාණ්ඩලික ඡායාරූප ශිල්පි සමන් කාරියවසම් විසින් ලබා ගත්ත ඡායාරූපයක් .

ප්‍ර ස්වාමීනි එම ඡායාරූපය C. 723 D වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.

ප්‍ර දැන් මේ අනුව මහත්මයා මේ නිකාබය ඇඳන් ඉන්න කාන්තාවක් කියලා කිව්වොත් නිවැරදිද ?

උ නිවැරදියි.

ප්‍ර ඒ කියන්නේ 2009 වසර වෙන කොටත් කාත්තන්කුඩිය ප්‍රදේශයේ මෙවැනි ඇඳුම් ඇඳගත් කාන්තාවන් බහුලව හිටියාද නැත්නම් ඔහේ හිටියේ අතලොස්සක්ද ?

උ මේක අනිවාර්ය කරලා තිබ්බා ඔනෑම ළමයෙකුට ඉස්කෝලේ යන ළමයින්ට පවා ඔය ඉස්කෝලේ යන ළමයි ඉස්කොලේ ඇරිලා එනකොට ගත්ත පින්තූරයක් .

ප්‍ර අනිවාර්ය කරලා තිබ්බේ සාම්ප්‍රදායික මුස්ලිම් පල්ලිය විසින්ද නැත්නම් ඔය නැඟී එන රැඩිකල් තවුහිද් කට්ටිය විසින්ද ?

උ රැඩිකල් කට්ටිය විසින් . මෙවැනි ඇඳුම් අනිවාර්ය කරලා තිබුනා ඒ කියන්නේ පාසැලට යනකොටත් සහ කොහේ ගියත් මෙවැනි විදියට තමයි ඒගොල්ලන් ගෙදරින් එලියට බහින්න ඕනේ.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර ඒ වෙනකොට දැන් ඔබ කාත්තන්කුඩි නගර මාධ්‍යයේ ඇවිදගෙන යන්න ඇතිනේ ?

උ ඔව්.

ප්‍ර 2009දි වැඩිපුර ජනතාවක් හිටියේ ඔවැනි නිකාබය ඇදගෙනද නැත්නම් සාමාන්‍යයෙන් සාරියෙන් ඔළුව වහගෙන නැත්නම් වර්ණවත් එකක් බැඳගෙනද ?

උ බහුතරයක් හිටියේ මේ විදියට සැරසිලා . මේ විදියට ඇඳුම් ඇදලා තමයි හිටියේ

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u> .

ප්‍ර මේ විදියට කියන්නේ නිකාබය ගැන ?

උ නිකාබය ඇඳලා මේ ගොල්ලන්ගේ ඇස් දෙක විතරයි දකින්න පුලුවන් .

මින්පසු සටහන් ගැනිම ල/ ලේ ඉන්ද්‍රාණි .

.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පෙර සටහන් කළේ යමුනා මිය
දැන් වේලාව : ප.ව. 2.15 යි
මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

ගරු සභාපතිතුමා :

ප්‍ර : දැන් සාක්ෂිකරු ඔය සහරාන් කියන මවුලවීවරයෙක් හැටියටද ඔබ ඒ අවස්ථාවේදී ඔහුව හඳුනා ගත්තේ?

පි : ඔව්.

ප්‍ර : ඒ මවුලවීවරයා මේ ඉස්ලාම් ආගමේ මොන නිකාය වශයෙන්ද ඔහු හැඳින්වුවේ?

පි : දැනට ස්වාමීනි මට මතක නැහැ එච්චර. සූෆි නෙමෙයි ඒකේ අනිත් පැත්තේ ඒගොල්ලෝ හිටියේ.

ප්‍ර : ඔබ මේ කොමිසමේ පොලිස් ඒකකයට ප්‍රකාශයක් ලබා දුන්නා නේද?

පි : ඔව්.

ප්‍ර : ඒකේදී ඒ නම දුන්නාද?

පි : ඔව්. මට මතක හැටියට මම දුන්නා.

ප්‍ර : ඔබ කියලා තිබ්බේ තවුහිද් කියලා කිව්වා...?

පි : ඔව්. තවුහිද් ජමාත්.

ප්‍ර : ඒකද නිවැරදි?

පි : නිවැරදියි ස්වාමීනි. තවුහිද් ජමාත්.

ප්‍ර : සහරාන් මවුලවී ඔහුව හැඳින්වුවේ තවුහිද් ජමාත් කොට්ඨාශයට නිකායට අයිතියි කියලා නේද?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : එතකොට ඒ අවස්ථාවේදී ඔබගේ නිරීක්ෂණවලට අනුව සහරාන් හෂීම්ට කොපමණ අනුගාමිකයින් හිටියද?

පි : ඒ වෙලාවේ අපි දැනුවත්ව පනහකට ආසන්න සංඛ්‍යාවක් හිටියා.

ප්‍ර : ඔබ ඊට පසුව කිව්වා සහරාන් මවුලවී සමඟ සාකච්ඡා කරපු නිවසේ ඔබ ගිනි අවි යම් සංඛ්‍යාවක් දැක්කා කියලා?

පි : ඔව් ස්වාමීනි මම දැක්කා.

ප්‍ර : ඔබ ඒ ගිනි අවි හඳුනා ගත්තාද මොන වර්ගයේද කියලා?

පි : T-56 වර්ගයේ.

ප්‍ර : ඔබ ඊට කලින් T-56 ගිනි අවි දැකලා තියෙනවාද?

පි : මම දැකලා තියෙනවා.

ප්‍ර : එතකොට ඔබට ඒක හඳුනා ගැනීමේ හැකියාවක් තියෙනවද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : තියෙනවා ඔව්.

ප්‍ර : සහරාන් ඔබ සමඟ කළ සාකච්ඡාවේදී ඔහු කිව්වද සාම්ප්‍රදායික මුස්ලිම්වරු ගමන් කරන මාර්ගය නිවැරදිද නැද්ද කියන එක?

පි : වැරදියි කියලා කිව්වා.

ප්‍ර : ඇයි වැරදියි කියලා කිව්වේ ඔහු?

පි : ඒගොල්ලන්ට ඕන දැන් අපේ තරුණ කොටස් සමාජයේ අපිට ඕන විදියට හදාගෙන අපි අළුත් ගමනක් යන්න ඕන. ඒ කියන්නේ ඒගොල්ලන් හැමෝම සෞදිවලින් තමයි ඒගොල්ලන් ඔක්කොම Follow කළේ සෞදි. Islamic Basis තමයි Follow කළේ. So he want to convert every body ඔක්කොමලව ඒ පැත්තට හරවලා ඒ විදියේ සමාජයක් ගොඩ නගන්න තමයි ඒ වෙලාවේ මෙයාගේ ලොකුම අදහසක් තිබුණේ.

ප්‍ර : ඔබට යම් දැනුමක් තියෙනවද සෞදි අරාබියේදී අනුගමනය කරන ඉස්ලාම් මතවාදය මොකද්ද කියලා?

පි : No. I can't.

ප්‍ර : දැන් ඔබ සහරාන් මවුලවී ගැන මේ සාකච්ඡාව කරන්න ගිය ගමනේදී මොහොමඩ් රිස්වි කියන පුද්ගලයෙක් සම්බන්ධයෙන් ඔබට යම් තොරතුරක් ලැබුණද?

පි : ඔව්.

ප්‍ර : මොකද්ද ඔබට දැන ගන්න ලැබුණේ?

පි : එයත් එයාගේ අනුගාමිකයෙක්. මගේ මතකයේ හැටියට.

ප්‍ර : සහරාන්ගේ අනුගාමිකයෙක්ද නැත්නම් සහරාන්ට විරුද්ධ එක්කෙනෙක්ද?

පි : විරුද්ධ එක්කෙනෙක්.

ප්‍ර : එතකොට ඔහුට මොනවා හරි වෙලා තිබ්බද සහරාන්....?

පි : ඔව්. එයාට පහර දීමට ලක් වෙලා තිබ්බා.

ප්‍ර : ඊට අමතරව ඔබට ඔබගේ තොරතුරු රැස් කිරීමේදී ආරංචි වුණාද යම්කිසි පුද්ගලයෙකු වෙඩි තබලා ඝාතනය කරලා තිබ්බා කියලා?

පි : ඔව්.

ප්‍ර : කවුද ඒ පුද්ගලයා?

පි : නමින් මට සටහන් කරන්න මතකයක් නැහැ ස්වාමීනි.

ප්‍ර : ඔබ මේ කොමිසමේ පොලිස් ඒකකයට ප්‍රකාශයක් ලබා දුන්නා නේද?

පි : ඔව්.

ප්‍ර : ඒ අවස්ථාවේදී ඒ නම ලබා දුන්නාද?

පි : ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මේ පොලිසියට දුන්න ප්‍රකාශනයේ ඒ තැනැත්තා අබ්දුල් සමාඩ් කියලා කිව්වා නම් ඒක නිවැරදිද?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : එතකොට අබ්දුල් සමාඩ් කියන පුද්ගලයයි, සහරාන් මවුලවී අතරයි තිබ්බ සම්බන්ධය මොකද්ද?

පි : එයා ඇවිල්ලා එයාගේ අනුගාමිකයෙක්.

ප්‍ර : ඔව්. අනුගාමිකයෙකුට අමතරව වෙන විශේෂ කාර්යයක් ඔහුට තිබ්බද කරන්න?

පි : ඔව් තිබුණා.

ප්‍ර : මොකද්ද ඒ කාර්යය?

පි : ඒ කාර්යය ස්වාමීනි එයාට තිබුණේ හම්බවෙන අවි ආයුධ හංගලා තියන්නයි, වෙඩි බෙහෙත් හංගලා තියන්නයි, එහෙම නැතුව පැනලා යන L.T.T.E. කට්ටියගේ තුවක්කු ටික මිලදී ගන්නයි 2009 න් පස්සේ.

ප්‍ර : එතකොට ඔබ කියන කරුණුවලට අනුව අබ්දුල් සමාඩ් කියන තැනැත්තා සහරාන්ගේ කණ්ඩායමේ අවි ආයුධ රැස්කර ගැනීම භාරව සිටි පුද්ගලයා කියලා කිව්වොත් හරිද?

පි : නිවැරදියි.

ප්‍ර : ඔහුව තමයි මරා දාලා තිබ්බේ?

පි : දාලා තිබ්බේ.

ප්‍ර : එතකොට ඔබට එම ගමනේදී තවත් පුද්ගලයෙකු හම්බ වෙනවද මොහොමඩ් රිස්වි කියලා?

පි : ඔව්.

ප්‍ර : කවුද මොහොමඩ් රිස්වි කියන්නේ?

පි : මගේ මතකයේ හැටියට ස්වාමීනි එහේ ඉන්න තරුණ එක්කෙනෙක්.

ප්‍ර : එයාට මොනවා හරි අනතුරක් වෙන්න තිබ්බද?

පි : ඔව් තිබුණා.

ප්‍ර : මොකද්ද ඒ අනතුර?

පි : එයාව පැහැරගෙන ගිහිල්ලා මරන්න හැදුවා.

ප්‍ර : කවුද එයාව පැහැරගෙන ගිහිල්ලා මරන්න හැදුවේ?

පි : හැදුවේ ඇවිල්ලා සහරාන්ගේ කල්ලිය.

ප්‍ර : ඔබ තවදුරටත් ඔබගේ සාක්ෂියේදී කිව්වා යම් තවත් පුද්ගලයෙකු හම්බ වුණා. ඔහුගේ නම අනාවරණය කරන්න එපා කිව්වා කියලා?

පි : එපා කිව්වා.

President's Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ තැනැත්තව ඔබ අලීම් ලෙස හැඳින්වුවා?

පි : නිවැරදියි.

ප්‍ර : එතකොට ඒ අලීම් කියන තැනැත්තා මොනවා හරි පුහුණුවක් වෙලා තිබ්බද?

පි : නැහැ. එයා තරුණයෙක් ඒ කියන්නේ එයාට ඕන Violence නැතුව, ඒ කියන්නේ රණ්ඩු දබර කරන්නේ නැතුව ජීවත් වෙලා යහපත්ව ඉන්න.

ප්‍ර : හොඳට මතකයෙන් මතක් කරලා කියන්න?

පි : සමාවෙන්න ස්වාමීනි මට එච්චරම මතකයක් එන්නේ නැහැ.

ප්‍ර : ඔබ ඒ ගමනේදී ඊට පස්සේ මුහුදු වෙරළට ගිහිල්ලා යම්කිසි පොල් ගස් නිරීක්ෂණය කෙරුවද?

පි : ඔව්.

ප්‍ර : මොකද්ද ඒ පොල් ගස්වල ඔබ නිරීක්ෂණය කළේ?

පි : පොල් ගස්වල කරටි කැඩිලා තිබුණා වෙඩි තියලා.

ප්‍ර : කවුද ඒ වෙඩි තියලා ඒ කඩලා තියෙන්නේ?

පි : ඒ සහරාන්ලාගේ පුහුණු වෙන කට්ටිය.

ප්‍ර : එතකොට එයින් ඔබට අනාවරණය වුණේ යම්කිසි වෙඩි තැබීමේ පුහුණුවක් වෙලා තිබුණා කියලා?

පි : පුහුණුවක් වෙලා තියෙනවා මුහුදු වෙරළේ.

ප්‍ර : එම පුහුණුව, වෙඩි තැබීමේ පුහුණුව කෙරුවේ කවුද කියලා ඔබට මතකද ඔබට හම්බ වුණා නේද ඒ තැනැත්තව?

පි : ඔව්. එයාගේ තව ළඟම ඉන්න හොඳම විශ්වාසම කෙනා තමයි තරුණයන් එක්කන් ගිහිල්ලා ඒ පැත්තේ වෙඩි පුහුණු ලබා දුන්නේ.

ප්‍ර : ඔබ දැන් ගිහිල්ලා සහරාන්ගේ කණ්ඩායමත්, සහරාන්ට විරුද්ධ කණ්ඩායමත් හම්බ වුණානේ. එහිදී ඔබට යම් තොරතුරු ලැබුණද සහරාන්ගේ කණ්ඩායමට මේ ආධාර අනුබල දෙන්නේ කවුද කියලා මුදල් වශයෙන්?

පි : අනිවාර්යයෙන්.

ප්‍ර : කවුද?

පි : එයාට දුන්නේ හිටපු එවකට ඇමති හිස්බුල්ලා. ඒ.එල්.එම්. හිස්බුල්ලා.

****

FAIR COMMENT
BY JEZEEM

ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා :

ප : කමලේන්ද්‍රන් මහත්මයා ඔබ මේ කොමිසමට ඉදිරිපත් කරන සාක්ෂි සළකා බලනකොට අපිට වැටහෙන්නේ මේ සහරාන්ගේ කටයුතු සම්බන්ධයෙන් ඔබ මීට අවුරුදු එකොළහකට ඉස්සරලා පුවත්පතට වාර්තා කරලා තියෙනවා. එතකොට ඒ කාලයේත් සහරාන් ඔහුගේ අන්තවාදී ක්‍රියාවන් ආරම්භ කරපු සමය වෙන්න පුළුවන් කියලා හිතනවද?

පි : හරි ස්වාමීනි.

ප : දැන් මේ කාලයේ ඒ කියන්නේ මම මේ කථා කරන්නේ ඔබ එහේ ගිය 2009 අගෝස්තු මාසය වගේ. ඒ කාලය වෙනකොට සහරාන් ඔහුගේ ආගමික මතවාදය අනිත් අය අතර පතුරවන්න අවි යොදා ගත්ත බව ඔබ වටහා ගත්තද?

පි : ඔව්. මට තේරුණා. එයා ඒ කියන්නේ අවි බලයෙන් තමයි එයාගේ පැත්තට කට්ටියව යොමු කර ගන්න එයා ගොඩාක් උත්සාහ කළේ ඒ අවස්ථාවේ.

ප : එතකොට ඒ කාලය වෙනකොට ඒ කියන්නේ මීට අවුරුදු එකොළහකට ඉස්සරලා ඔහු අවි බලයෙන් ඔහුගේ මතයට මුස්ලිම් ජනතාව නැඹුරු කර ගැනීම සඳහා උත්සාහයක් දැරුවා කිව්වොත් ඒක හරිද?

පි : එලෙස තමයි එයා ක්‍රියා කළේ.

ප : දැන් ඔබ දැකපු විදියට ඔබගේ මතකය මම ගෙනිව්වොත් මේ අවුරුදු එකොළහක් ඇතට, සහරාන්ගේ අනුගාමිකයෝ බොහොම සුළු පිරිසයි නේද ඒ කාලයේ හිටියේ?

පි : නිවැරදියි ස්වාමීනි.

ප : පසුගිය පාස්කු බෝම්බ ප්‍රහාරය සිද්ධ වෙන්න ගත වෙච්ච දිනය, ඒ කියන්නේ 2019 අප්‍රේල් වෙනකොට අවුරුදු දහයක් තිස්සේ ඔහුගේ වටා එකතු වෙච්ච අනුගාමිකයින් සංඛ්‍යාව බොහෝ වැඩි වෙලා තියෙන බවක් ඔබට වැටහෙනවද?

පි : මට තේරෙනවා ස්වාමීනි. ගොඩාක් වැඩි වෙලා තියෙනවා.

ප : ඔබ මෑත කාලයේදී කවදද කාත්තන්කුඩිය බලන්න ගියේ?

පි : මම දැන් අවුරුදු තුනකට විතර ඉස්සරලා ගිහිල්ලා තියෙනවා. ඒ මගේ පෞද්ගලික සංචාරයක් සඳහා.

ප : 2009 කාත්තන්කුඩිය බලන්න යනකොට දැකපු කාත්තන්කුඩියත්, ඔබ ඔය අවුරුදු දෙක තුනකට ඉස්සරලා යනකොට දුටු කාත්තන්කුඩියත් අතර ලොකු වෙනසක් තිබුණාද?

පි : අනිවාර්යයෙන් ස්වාමීනි. ඒක ලංකාවේ වෙන ප්‍රදේශයක් වගේ.

ප : විස්තර කරන්න බලන්න කොහොමද කියලා?

FAIR COMMENT BY JEZEEM

පි : ඒක ඇවිල්ලා ඒගොල්ලන්ට ඕනකම තිබුණේ ඒ Aria එක Convert කරන්න. Its like another model Saudi Arabia ඒ කියන්නේ සෞදි අරාබියාවේ නගරයක් විදියට තමයි පත් කරන්න පාර මැදම හිටවලා තියෙනවා සම්පූර්ණ රටඉදි ගස්. හැම දෙයක්ම ඒගොල්ලන්ට ඕන විදියට ඒගොල්ලන් කරගෙන යනවා. ඒගොල්ලන්ගේ ප්‍රාදේශීය සභාවත් ඒගොල්ලන්ට ඕන විදියට තමයි තීන්දු දෙන්නේ. හැම දෙයක්ම ඒගොල්ලන්ට මොනවද කරන්න ඕන, ඒ විදියටම තමයි ඒගොල්ලන් Want to convert that area to model Saudi Arabia. Saudi Arabia වගේ Model එකක් හදන්න තමයි ඒගොල්ලන් Try කළේ.

ප්‍ර : දැන් ඔබ දැකපු විදියට, ඒ කියන්නේ මෑත කාලයේ ඔබ ගියහම දැකපු විදියට ඒ තත්ත්වයට වර්තමානයේ කාත්තන්කුඩියේ ජීවත්වන මිනිස්සු කැමති බවද ඔබට තේරුණේ එහෙම නැත්නම් ඒ අය ඒකට වැඩි ...?

පි : ඒගොල්ලන්ට ඒක තමයි අවශ්‍ය වෙලා තිබ්බේ.

ප්‍ර : ඒ බව ඔබට වැටහුණාද?

පි : වැටහුණා ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබ මේ 2009 ගිය අවස්ථාවේදී කාත්තන්කුඩියට සහරාන් සහ ඔහුගේ අනුගාමිකයින් කිහිප දෙනා හම්බ වෙන්න ඔබ අර පොඩි ගොඩනැගිල්ලකට ගියානේ?

පි : ඔව්.

ප්‍ර : එතනදී සහරාන් ඔබට කිව්වා නේද ඔහුගේ පින්තූර ගත්තට කමක් නැහැ කියලා?

පි : ඔව්.

ප්‍ර : ඒ වුණාට ඔහු එපයි කිව්වා නේද ඔහු හිටපු තැන පින්තූර ගන්න ගොඩනැගිල්ල?

පි : ඔව්. අර ගොඩනැගිල්ල ගන්න එපා කිව්වා. ඒ කියන්නේ අවි ආයුධ ටික අපට පෙනෙයි කියලා.

ප්‍ර : එතකොට ඔබට වැටහුණාද ඔහු මේ අවි ආයුධ භාවිතය ඒ අවස්ථාවේදී හොර රහසේ කිරීමට යම් උත්සාහයක් දරපු බවක්?

පි : ඒක ඒ ප්‍රදේශයට ගියහම ඕන කෙනෙකුට වැටහෙනවා ස්වාමීනි ඔහු ඒක ප්‍රසිද්ධියට තමයි කරන්නේ. අපි අර මාධ්‍යවේදීන් නිසා අපට අවස්ථාවක් දුන්නා අර ඒක ඒ වෙලාවේ එළිවෙයි කියලා රටට.

ප්‍ර : දැන් ඔබට මතකද ඔහු එතනදී කිව්වා අර ගෙවල් සීයක් පුච්චලා තිබුණනේ?

පි : ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප : ඒක ගැන අහනකොට නැහැ අපි ඒවා කළේ නැහැ කියලා. දැන් ඔබ ඔහු සමඟ කරන ලද සංවාදයෙන් සහ ඔබ ඒ පළාතේ කරන ලද නිරීක්ෂණ චාරිකාවෙන් සොයා ගත් තොරතුරු අනුව ඔහු කිව්වේ ඇත්තක්ද බොරුවක්ද කියලා ඔබ වටහා ගත්තද?

පි : එයාගේ අනුගාමිකයෝ තමයි ඔක්කොම ගෙවල්වලට පහර දීලා අලාභහානි කළේ.

ප : ඒ තොරතුරු ඔබ ගත්තේ...?

පි : මම මගේ අනිත් Sources වලින්, මගේ ඉන්න කට්ටියගෙන් මම හොයා ගත්තා.

ප : දැන් අවසාන වශයෙන් මම ඔබෙන් අහන්න කැමතියි කමලේන්ද්‍රන් මහත්මයා මේ මුස්ලිම් අන්තවාදීන් 2009 දී ඔවුන්ගේම සහෝදර මුස්ලිම් පිරිසක් මේ විදියට අවි ආයුධ පෙන්වලා, බිය ගන්වලා ඔවුන් මේ උත්සාහ කරලා තිබුණේ මොන වගේ කාර්යයක් සඳහා පෙරමුණ ගන්නද ඔබ දැකපු ....?

පි : ඒගොල්ලන්ගේ මතවාදය මුළු ලංකාවටම පතුරවන්න.

ප : ඒ දරපු උත්සාහය මේ පහුගිය අවුරුදු දහයක තුළ කොයි ආකාරයට වර්ධනය වෙලා තියෙනවද කියලා ඔබට අද කියන්න පුළුවන්ද?

පි : සියයට දෙසීයක් විතර වර්ධනය වෙලා තියෙනවා. අපේ ඉන්න පාලකයන් ඒවා නොදැක තමයි ඉන්නේ. ඒකයි අපිට කණගාටු.

ප : ඔබ නැවත වරක් කාත්තන්කුඩිය පැත්තේ ළඟදී ගිහිල්ලා මේ පිළිබඳ තොරතුරු සොයා බලලා අළුත්ම තත්ත්වය වාර්තා කරන්න හිතුවේ නැද්ද?

පි : දැන් මට සෞඛ්‍ය තත්ත්වය එච්චර හොඳ නැහැ. ඒ නිසා මම වැඩිය ඇත යන්නේ නැහැ දැන්.

හරි. බොහොම ස්තුතියි.

****

ගරු බන්දුල අතපත්තු මැතිතුමා :

ප : කමලේන්ද්‍රන් මහත්මයා ඔබ කාත්තන්කුඩියට ගිය වෙලාවේ ඔය සම්ප්‍රදායික මුස්ලිම් ජාතිකයන් හම්බ වුණාද?

පි : ඔව්.

ප : ඔවුන් කිව්වද ඔවුන් ගෙවල්වල ඉන්න බයයි. ඒකනිසයි පල්ලිවල ඉන්නේ කියලා?

පි : ඔව් ස්වාමීනි.

ප : දවල් වරුවේ ඒගොල්ලන්?

FAIR COMMENT BY JEZEEM

පි : දවල් වරුවේ ගැහැණු විතරක් ගෙවල්වල ඉන්නවා. රෑට පිරිමි කට්ටිය පල්ලියේ ඉන්නවා.

ප්‍ර : එතකොට ගැහැණු කට්ටිය රෑට?

පි : ගැහැණු කට්ටිය ගෙදර ඉන්නේ. ගැහැණුන්ට මොකුත් කරන්නේ නැහැ ඒගොල්ලන්. පිරිමි කට්ටිය තමයි එළව එළව පහර දෙන්නේ.

ප්‍ර : ඉතිං ඔබ කිව්වේ නැද්ද මොකද්ද මේකට මොකද්ද ගන්න Solution එක මොකද්ද?

පි : එතන Solution එක එකම විකල්පය අපේ දේශපාලන නායකයෝ තමයි මේකට සම්පූර්ණම වග කියන්න ඕන ඒ ප්‍රදේශයේ. ඒ ප්‍රදේශයේ ඉන්න දේශපාලන නායකයෝ තමයි මේකට විසඳුමක් දෙන්න ඕන. මේක බේරලා දෙන්න ඕන.

ප්‍ර : එතකොට සහරාන්ගේ පිරිස ඉඳන් ඒගොල්ලන්ට අවි ආයුධ පෙන්වලා තර්ජනය කරලා එහෙම තිබ්බද?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : ඒවා ප්‍රසිද්ධියේ පෙන්වලා තියෙනවද?

පි : ප්‍රසිද්ධියේ පෙන්වලා තියෙනවා. ඒ නිසා ඒ මිනිස්සු එළියට එන්නේ නැහැ බයයි. ගැහැණු දවල්ටවත්, රෑටවත් එන්නේ නැහැ ගෙදර තමයි. පිරිමි තමයි වැඩට ගිහිල්ලා රෑට පල්ලියට ගිහිල්ලා බුදිය ගන්නේ.

ප්‍ර : ඒ සම්ප්‍රදායික මුස්ලිම් ජාතිකයෝ මොකද්ද සාමාන්‍යයෙන් රැකියාව වශයෙන් කළේ?

පි : ගොඩක් ඇවිල්ලා ගොවියෝ සහ ධීවරයෝ නැත්නම් රජයේ කාර්යාලවල ඉතා ස්වල්පයයි වැඩ කෙරුවේ රජයේ කාර්යාලවල. ගොඩක් කට්ටිය කළේ ධීවර රස්සාවයි, ගොවිතැනයි සහ වී මෝල්. ඒවා තමයි කළේ.

ප්‍ර : ඔවුන්ගේ රැකියාවලටත් බලපෑම් කරලා තිබ්බද?

පි : ඔව්. දැඩි ලෙස බලපෑම් කරලා තිබ්බා.

ප්‍ර : ඒ කියන්නේ මාළු අල්ලන්න යන්න දෙන්නේ නැද්ද?

පි : මාළු අල්ලන්න දෙන්නේ නැහැ. ඉඩ කඩම් මංකොල්ල කනවා. අක්කර සිය ගණන් තියෙන කුඹුරු ටික ඒ මිනිස්සුන්ට අක්කර දහයක්වත් වගා කරන්න දෙන්නේ නැහැ. ඒවා ඔක්කොම ඒගොල්ලන් පැහැරගෙන මේගොල්ලන් වගා කරනවා ඒවාවල ගිහිල්ලා.

හොඳයි. බොහොම ස්තුතියි.

****

FAIR COMMENT BY JEZEEM

ගරු අදිකාරි මැතිණිය :

ප : කමලේන්ද්‍රන් මහතා ඔබ දැනට වසර තුනකට ඉස්සරලා කාත්තන්කුඩි ප්‍රදේශයට ගියානේ.

පි : Yes මැඩම්.

ප : ඒ අවස්ථාවේදී ඔබ දුටුවාද දැන් ඔය කාත්තන්කුඩියේ තියෙන සෞදි අරාබියේ Model ගමක් හදන එකට අමතරව තව ටිකක් පල්ලෙහාට එනකොට පූනානි පැත්තේ හදන විශ්ව විද්‍යාලය?

පි : අපි මෙතනට ගත්තොත් මැඩම් ඒගොල්ලන් දැන් වැලිකන්දටම ඇවිල්ලා ඉවරයි. පුනානි නෙමෙයි වැලිකන්දටම ඇවිල්ලා ඉවරයි ඒගොල්ලෝ. ඒ කියන්නේ ආණ්ඩුවේ ඉඩම් සම්පූර්ණ මංකොල්ල කාලා තියෙන්නේ.

ප : ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද ඔය වැලිකන්දේ මොනවද වෙන්නේ කියලා?

පි : වැලිකන්දේ වෙන්නේ ඔක්කොම කරන්නේ ගංජා වගා කරනවා.

ප : කවුද කරන්නේ?

පි : මුස්ලිම් කට්ටිය.

ප : මුස්ලිම් කට්ටිය Re settlements ත් කරලා තියෙනවා වැලිකන්දේ?

පි : Re selltelement නෙමෙයි Forcefully Colonization.

ප : Forceful Colonization?

පි : Forceful Colonization ඒගොල්ලන්ගේ දේශපාලකයෝ.

ප : ඒක සිංහලෙන් කියන්නේ කොහොමද?

පි : ඒ කියන්නේ....,

ප : බලහත්කාරයෙන් ජනාවාස...?

පි : බලහත්කාරයෙන් කොළණියක් ඇති කරලා තියෙනවා ඒගොල්ලන්ගේ.

ප : ජනාවාසකරණය?

පි : ජනාවාස කරලා ඒගොල්ලන්ගේ ස්ථිර කරන්න, ඒ ප්‍රදේශය තව තවත් ස්ථිර කරන්න.

ප : දැන් කමලේන්ද්‍රන් මහතා හොඳට දන්නවනේ නැගෙනහිර පළාතේ යුද්ධය නිසා අවතැන් වෙච්ච සිංහල සහ ද්‍රවිඩ මිනිසුන් හිටියනේ. මොකද මුස්ලිම් අය ද්‍රවිඩ අයටත් ප්‍රහාර එල්ල කළා?

පි : ඔව් මැඩම්.

ප : ඔබ දුටුවාද එම සිංහල සහ ද්‍රවිඩ ජනතාව යුද්ධයෙන් පසු නැවත පදිංචි කරවීමේ වැඩසටහන් ක්‍රියාත්මක වුණ බව?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ගොඩාක් ද්‍රවිඩ කට්ටිය රට ඇරලා ගියා මැඩම්. සිංහල මිනිස්සු තව තව ඉස්සරහට ආවා මැඩම්.

ප්‍ර : කොහාටද?

පි : ඒ කියන්නේ වැලිකන්දටත් මෙහා ආවා බයට, ඒගොල්ලනුත් එක්ක ඉන්න බැහැ කියලා.

ප්‍ර : නැහැ නැහැ. මම අහන්නේ ඒ මිනිස්සු හිටපු ඒගොල්ලන්ගේ ප්‍රදේශවල?

පි : සමහර ඉඩම් මේගොල්ලන් අත්පත් කරගෙන තියෙනවා. සමහර ඒගොල්ලන් කැමැත්තෙන් විකුණලත් තියෙනවා ඒ මිනිසුන්ට එහේ ජීවත් වෙන්න බැහැ කියලා.

ප්‍ර : බලෙන් අත්පත් කරගෙන මොනවද කරලා තියෙන්නේ?

පි : ඒගොල්ලන් ගොවිතැන් කරනවා.

ප්‍ර : ඊට අමතරව පල්ලි වගේ ඒවා හදනවා?

පි : පල්ලි හදනවා, වැලි ගොඩ දානවා. කරන්න පුළුවන් උපරිම Damage එක කරනවා. විනාශය කරනවා.

ප්‍ර : දැන් ඔබ කාත්තන්කුඩියට 2009 ගියාට පස්සේ ආයේ ගියානේ මෑතකදී?

පි : ඔව් ගියා.

ප්‍ර : එතකොට ඔබ දුටුවාද කාත්තන්කුඩියේ විශේෂිත වූ ව්‍යාපාරික ප්‍රජාවක් බිහිවෙලා ඉන්නවා කියලා කාත්තන්කුඩිය තුළ?

පි : ඔව්. එහේ ඉන්නේ හොඳම සල්ලිකාරයෝ.

ප්‍ර : කවුද ඒ හොඳම සල්ලිකාරයෝ කියන්නේ?

පි : ඒ ඇවිල්ලා මුස්ලිම් කට්ටිය.

ප්‍ර : මොනවද ඒගොල්ලෝ කරන්නේ?

පි : ඒගොල්ලෝ කරන්නේ කොළඹ තියෙන ඕනම Model එකක් ඒගොල්ලන්ට පැය දෙකෙන් හදන්න පුළුවන්. සපත්තුවක්ද, කාර් එකක්ද, මෝටර් බයිසිකලයක්ද පැය දෙකෙන් ඒගොල්ලන්ට හදන්න පුළුවන්.

ප්‍ර : මොනවද ඒ කරුණු, නීති විරෝධී කර්මාන්තයක්ද ඒ කරන්නේ?

පි : නීති විරෝධි නෙමෙයි. Duplicate එකක් හදනවා ඒගොල්ලන්.

ප්‍ර : විස්තර කරන්නකෝ පොඩ්ඩක් මේ කොමිසමට මොනවද ඒ කරන්නේ?

පි : පිටරටින් අපි මොනවා හරි භාණ්ඩයක් ගෙනාවොත් ඒ භාණ්ඩය ඒගොල්ලන් මෙහෙන් එහාට අරන් ගිහිල්ලා ඒ භාණ්ඩයට සමාන භාණ්ඩයක් ඒගොල්ලන් නිෂ්පාදනය කරලා අහපුවු කොළඹට එවනවා.

Fair Comment by Jezeem

ප : ඒ කියන්නේ ලොකු කර්මාන්තශාලා තියෙනවාද?

පි : ලොකු කර්මාන්තශාලා තියෙනවා. ගොඩක් තියෙන්නේ රෙදි. සරම්, සපත්තු හැම දෙයක්ම තියෙනවා එහේ. ලොකු කර්මාන්තශාලා. හාල් මෝල් තියෙනවා විශාල ප්‍රමාණයක්. පොළොන්නරුවට වැඩිය ලොකු මෝල් තියෙනවා එහේ.

ප : ඊට අමතරව නීති විරෝධී කටයුතු කරනවාද ව්‍යාපාර ඔය කියන්නේ අර Human Trafficking?

පි : අනිවාර්යයෙන් කරනවා. ගොඩක් කරනවා.

ප : මොනවද කරන්නේ Human Traffick?

පි : Human Traffic කියන්නේ මනුස්සයෝ එක එක ප්‍රදේශවලට අරිනවා මේගොල්ලෝ. පොඩි ළමයිට හොර Passport දීලා ගෙනල්ලා, හොර Birth Certificate හදලා දීලා, Passport කන්තෝරුවට පගාව දීලා ඒ ළමයිව සෞදිවලට ඇරලා එහෙන් ඒ සල්ලි හම්බ කරලා මෙහාට ගේනවා.

ප : ඒ අර අළුතෙන් බිහිවෙන ධනවත් ව්‍යාපාරික පන්තිය නීති විරෝධී කටයුතු කරලා පොහොසත් වෙනවා වගේ දැනුණද ඔබට?

පි : පැහැදිලිව පේනවා ඒක. ඒ කියන්නේ දුක් මහන්සි වෙලා හම්බ කරන සල්ලි නෙමෙයි ඒවා.

ප : දැන් ඔබ අර 2009 Sunday Times වලට ලිව්වනේ Article එකක්. ඒකෙන් පස්සේ ඔබට ආරක්ෂක අංශවලින්, ශ්‍රී ලංකා රජයේ ආරක්ෂක අංශවලින් කථා කරලා ඔබගෙන් ඇහුවද මේ මොකද්ද කියලා?

පි : අද මේ කොමිසම ඇරෙන්න කිසි කෙනෙක් මගෙන් ඔය ගැන විමසුවේ නැහැ. කිසිම කෙනෙක් විමසුවේ නැහැ අද වෙනකම්.

ප : අර ඔබ සඳහන් කළානේ මඩකලපුවේ හිටියා කියලා DIG එඩිසන් ගුණතිලක මහත්මයා?

පි : එඩිසන් ගුණතිලක මහත්මයා ඔව්.

ප : එතුමාවත් ඇහුවේ නැද්ද මේ මගේ පැත්ත ගැන මොනවද මේ ලියලා තියෙන්නේ කියලා?

පි : නැහැ. ඇහුවේ නැහැ.

ප : ඒ වගේම එඩිසන් ගුණතිලක මහතා කිව්වානේ මේවා මේ දේශපාලන ප්‍රශ්න. අපිට මොකුත් කරන්න බැහැ මාරු කරනවා කියලා?

පි : ඔව්.

ප : ඔබ ඇහුවේ නැද්ද කවුද ඔය දේශපාලනඥයෝ කියලා මේක පිටිපස්සේ ඉන්න?

පි : ඒ කියන්නේ ආණ්ඩුවේ ඉන්න ප්‍රබලම මුස්ලිම් ඇමතිවරු.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : කවුද ඔබට කියන්න පුළුවන්ද නම්?

පි : එවකට හිටිය ලොකුම ඇමතිවරයා හිස්බුල්ලා.

ප්‍ර : වෙන කවුද?

පි : තව ඒ පැත්තට හිටියා ගොඩක් කට්ටිය. නම් වශයෙන් නම් මට හරියටඅමාරුයි කියන්න ටක් ටක් ගාලා. හිස්බුල්ලා නම් හෙන Powerfull Minister කෙනෙක්. නැත්නම් පුනානි ඔව්වර අක්කර ගාණක් ආණ්ඩුවෙනි ගනියිද. හැට ගාණක Campus එකක් ගහන්න සල්ලි කොහෙන්ද. සෞදියෙන් ආපු සල්ලිනේ. ඉඩම දුන්නේ කවුද, ආණ්ඩුවෙන්නේ දුන්නේ.

ප්‍ර : අක්කර සීයකට වැඩියෙන් දීලා තියෙනවා?

පි : අක්කර සීයක් නැහැ මැඩම්. අක්කර හතළිහයි දුන්නේ. නමුත් තව අක්කර...,

ප්‍ර : ඇල්ලුවා?

පි : අක්කර විස්සක් ඇල්ලුවා. තව පිටිපස්සෙන් ඇල්ලුවා. මහවැලි H කලාපයෙන් හරි C කලාපයේ, ඔව් H කලාපය මට මතක හැටියට.

ප්‍ර : ඒ වගේම කමලේන්ද්‍රන් මහත්මයා කිව්වා දැන් මේ තරුණ පිරිස් සෞදි අරාබියට යනවා කියන එක අධ්‍යාපනය සඳහා ඒගොල්ලන්ට අනුග්‍රහය ලැබුණා තමන්ගේ සල්ලිවලින් නෙමෙයි ශිෂ්‍යත්ව වගේ දේවල් වලින් ගිහිල්ලා ඔවුන් ඉස්ලාම් ආගම ඉගෙන ගැනීම කළේ කියලා. ඔබ හමු වුණානේ සාම්ප්‍රදායික මුස්ලිම්වරුන්. දැන් ඔවුන්ගෙන් ඔබට දැන ගන්නට ලැබුණාද හෝ ඔවුන්ගෙන් ඔබ ඇහුවාද මේ කාත්තන්කුඩිය ප්‍රදේශයේ මේ අන්තවාදී ඉස්ලාම් ආගමික මතය ආරම්භ වුණේ කවදා ඉඳලද කියලා?

පි : ඕක ලංකාවේ පටන් ගත්තේ මද්‍රසා හදන්න පටන් ගත්තා. පොඩි කට්ටියව අනිවාර්යයෙන්ම ආගම උගන්වන්න පටන් ගත්තා. ලංකාව වටේම දැන් මද්‍රසාස් තියෙනවා.

ප්‍ර : මොන අවුරුද්දෙද ඔය නැගෙනහිර පළාතේ කාත්තන්කුඩිය ප්‍රදේශයේ දැන් මේ සූෆි මුස්ලිම්වරුන් එක්ක ගහ ගන්න සහරාන්ලගේ තවුහිද් කියන සංවිධානය ඇති වුණානේ. සහරාන්ට පෙරත් වගේ ඔබ ඇහුවේ නැද්ද මොන අවුරුද්ද, කාල වකවානුව ඇහුවේ නැද්ද මේ අන්තවාදී ආගමික මතවාදය නැගෙනහිර පළාතේ කොයි කාලයේද ආරම්භ වුණේ කියලා?

පි : ඕක ආරම්භ වුණේ මැඩම් යුද්දෙන් පස්සේ වගේ. යුද්ධය ඉවර වුණාට පස්සේ තමයි ඒක ගොඩාක් ඉදිරියට ආවේ. ඒ කාලයේත් තිබුණා. යුද්ධ කාලයේත් තිබුණා. නමුත් ගොඩාක් ඉස්සරහට ආවේ මේක යුද්ධයෙන් පස්සේ, 2009 න් පස්සේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට ඔබට නිකම්වත් දැන ගන්නට ලැබුණේ නැද්ද මේ සෞදි අරාබියේ ගිහිල්ලා ඉගෙන ගෙන එන කිසියම්, මට ඔබට නම කියන්න බැහැ. කිසියම් ආගමික අන්තවාදී මතවාදයක් කියලා?

පි : මතවාදය තමයි පතුරවන්නේ. ඔව්. ඒක තමයි අර හැමතැනම මද්‍රසාස් කියලා හදන්නේ පිරිමි ළමයිට උගන්වන්න වෙන වෙනම හදලා ...,

ප්‍ර : ඔබට දැන ගන්න ලැබුණේ නැද්ද ඒ ආගමික අන්තවාදී මතවාදයේ නම මොකද්ද කියලා. දැන් මේ සූෆිසම් එහෙම කියලා තියෙනවනේ?

පි : ඔව්. සූෆිසම්.

ප්‍ර : ඒ වගේ?

පි : ඒක මට හරියට කියන්න බැහැ මැඩම් දැන්.

හොඳයි. බොහොම ස්තුතියි.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : සාක්ෂිකරු ඔබ කිව්වා මීට අවුරුදු තුනකට පෙර ඔබ නැවත කාත්තන්කුඩියට යනවා කියලා. ඒ කියන්නේ 2017 වර්ෂයේදී. දැන් 2009 වර්ෂයේදී ඔබ ගිහිල්ලා සහරාන්ව හම්බ වෙනවනේ. 2017 වර්ෂයේදී ඔබ ගියහම සහරාන්ව හම්බ වෙන්න හැදුවද?

පි : නැහැ.

ප්‍ර : ඇයි නැත්තේ?

පි : එතකොට මට තේරුණා මේක එච්චර අපේ පත්තරයට අවශ්‍ය වෙන්නේ නැහැ කියන එක. ඒ කියන්නේ හේතුව ඒ මතවාදය අපිට පළ කරන්න බැහැ. ප්‍රතිපත්තියක් වශයෙන් ඒ මතවාදය අපේ පත්තරයක් හැටියට National Paper, ජාතික පත්තරයක් නිසා එහෙම මතවාද පළ කරන්න බැහැ. ඒක මගේ Responsibility එක.

ප්‍ර : ඒ කියන්නේ එවැනි මතවාදයක් හෙළි කිරීමෙන් යම්කිසි අනතුරක් වෙයි කියලා ....?

පි : අනතුරක් නෙමෙයි තව කෙනෙකුට අපි හිත රිද්දවනවා. The hurting somebody.

ප්‍ර : ඒ තව කෙනෙක් කියලා ඔබ කියන්නේ කවුද?

පි : අපේ මහජනතාව. අපි අනික අනවශ්‍ය දේවල් මිනිස්සුන්ගේ Brain එකට දානවා බය කරන්න. එතකොට ඒ මිනිසසු තවත් බය වෙනවා දුප්පත් මිනිස්සු.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් ඔබ මේ කොමිසමට ප්‍රකාශ කෙරුවා සහරාන්ට අවි ආයුධ ලබා දුන්නේ එම්.එල්.එම්. හිස්බුල්ලා කියන දේශපාලනික .....?

පි : හිස්බුල්ලා. ආණ්ඩුව හරහා හිස්බුල්ලා අනුග්‍රහයෙන් තමයි ලැබුණේ. With his sponsorship government supplied the weapons.

ප්‍ර : සිංහලෙන් කියන්න?

පි : ආණ්ඩුවේ අනුග්‍රහය ඇතුව හිස්බුල්ලා හරහා මාර්ගයෙන් තමයි ඔය තරුණ කල්ලියට සහරාන් කියන කල්ලියට අවි ආයුධ ලැබුණේ.

ප්‍ර : එතකොට ඒ කියන්නේ එවකට තිබ්බ ආණ්ඩුව කියන්නේ ඔබ කිව්වේ ...?

පි : 93. කරුණාටත් අවි ආයුධ දුන්නේ ප්‍රේමදාස මහත්මයා. මේගොල්ලන්ටත් දුන්නේ මේගොල්ලන්.

ප්‍ර : දැන් ඔබ දැන් කාත්තන්කුඩියට ගියේ 2009 නේ?

පි : ඔව්.

ප්‍ර : ඒ අවස්ථාවේදී ඔබ කරන ලද තොරතුරු එක්ස්ස් කිරීම තුළින් ඔබට තවත් තොරතුරු ආවාද මේ සහරාන්ට සහයෝගය දක්වන වෙනත් දේශපාලනඥයෙක් ගැන?

පි : අනිවාර්යයෙන්.

ප්‍ර : කවුද ඒ?

පි : ඒ ඇවිල්ලා හිස්බුල්ලා තමයි කෙළින්ම ප්‍රධාන පුද්ගලයෙක්.

ප්‍ර : වෙනත් දේශපාලනඥයින් හිටියාද?

පි : එතන තව පොඩි පොඩි ප්‍රාදේශීය මට්ටමින් හිටියා. ජාතික මට්ටමින් හිටියේ හිස්බුල්ලා කියන ඇමතිතුමා සහ එයාගේ පුතත් හිටියා ස්වාමීනි එතන.

ප්‍ර : එයාගේ පුතා කියන්නේ කවුද?

පි : හිස්බුල්ලාගේ පුතාත් හිටියා එතන.

****

ගරු අදිකාරී මැතිණිය :

ප්‍ර : මිස්ට කමලේන්ද්‍රන් දැන් ඔබ පෙන්නුවනේ අර 2009 ගියහම අර බුර්කාව ඇඳගෙන ඉස්කෝලේ යන ළමයි?

පි : ඔව් මැඩම්.

ප්‍ර : ඔබ දැක්කාද ඔබ 2009 ගිය වෙලාවේ සාම්ප්‍රදායික මුස්ලිම් කාන්තාවන් කොහොමද ඇන්දේ කියලා?

පි : ඔය ඇඳුම තමයි ඒගොල්ලන්ට අනිවාර්ය කරලා තිබුණේ. ඔය ඇඳුම නැතුව ගෙදරින් එළියටවත් එන්න බැහැ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : සියළුම. සාම්ප්‍රදායික අයටයි ඔක්කොටම?

පි : සියළුම. පොඩි ළමයාගේ ඉඳලා මහළු කාන්තාව දක්වා ඔය විදියට තමයි පාරේ ඇවිදින්න ඕන. ගෙදරින් එළියට යනවා නම් ඔය ඇඳුම ඇඳගෙන තමයි පාරට එන්න ඕන.

ප්‍ර : ඉතිං අර ඔබ හම්බ වෙච්ච සාම්ප්‍රදායික අර මුස්ලිම් මවුලවීතුමා වයසක?

පි : ඔව්.

ප්‍ර : එයාගෙන් ඇහුවේ නැද්ද මේ ඇඳුම මොකද්ද? මේක ඔබලා කියපු ඇඳුමක්ද ඇහුවේ නැද්ද මේක?

පි : ඇහුවහම ඒකට දෙන උත්තරය අපේ දේශගුණයටත් මේ ඇඳුම අපට ගැළපෙනවා.

ප්‍ර : ගැළපෙනවා?

පි : ගැළපෙනවා.

ප්‍ර : සාම්ප්‍රදායික අයත් ඒ ඇඳුමට ...?

පි : ඒක තමයි. ගෙදර වයසක කාන්තාව ඉඳලා, පොඩි ළමයාගේ ඉඳලා එළියට එනවා නම් ඕක වහගෙන තමයි එන්නේ.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : සාක්ෂිකරු ඔබ ඔබගේ ප්‍රකාශයේ සඳහන් කෙරුවා ඔබ මේ පත්තර වාර්තාවේ 2009 දී ලිව්වම පස්සේ ඔබගෙන් ඒ සම්බන්ධයෙන් විමසීමක් කරපු එකම ස්ථානය මෙම කොමිෂන් සභාව කියලා?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : ඒ සම්බන්ධයෙන් ඔබ කරපු ප්‍රකාශය හින්දා මම පැහැදිලි කිරීමක් කරනවා. මෙම කොමිසම මේ වනතෙක් කළ කාර්යභාරයට නීතිපති දෙපාර්තමේන්තුවේ සහ පොලිස් දෙපාර්තමේන්තුවේ මේ කොමිසමට සම්බන්ධ කරලා තියෙන කොටස්වල දෙක උපරිම දායකත්වයක් ලබා දීලා තියෙනවා කියන එක මම සඳහන් කරන්න ඕන. ඔබගේ වාර්තාව හොයාගෙන අපට ලබා දුන්නේ නීතිපති දෙපාර්තමේන්තුවේ කණ්ඩායම. විශේෂයෙන්ම ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා. ඒක හින්දා ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ ස්තුතිය ඒ කණ්ඩායම් දෙකටම පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නවා.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මෙම සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් අවශ්‍යද යන්න අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතීඥවරයාගෙන් අසමි. අවශ්‍ය බව ප්‍රකාශ කරයි. අවසර ලබා දෙයි.

****

නීතීඥ ගිම්හානි ගමගේ මහත්මිය :

ප්‍ර : සාක්ෂිකරු ඔබ පවසා සිටියා සහරාන් සමඟ 2009 දී ඔබ සම්මුඛ සාකච්ඡාවක් පැවැත් වූ බව?

පි : ඔව්.

ප්‍ර : මට දැන ගන්නට අවශ්‍ය වන්නේ ඔබ ඔහු සමඟ කළ සම්මුඛ සාකච්ඡාවේදී ඔබට දැන ගන්නට ලැබුණාද එම පළාතේ සිටින ක්‍රිස්තියානි හෝ කතෝලික ජනතාවත් සමඟ ඔහු ගැටුමක් ඇති කරගෙන තිබුණාද ඒ කාලයේදී කියලා?

පි : ඔහුට පෙරත් ඒ නැගෙනහිර ප්‍රදේශයේ මඩකලපුව දිස්ත්‍රික්කයේ නිතරම ආගම් දෙක අතරේ ගැටුම් තිබුණා.

ප්‍ර : ආගම් දෙක අතරේ කිව්වේ?

පි : කතෝලික ආගමයි, ඉස්ලාම් ආගමයි අතරේ පොඩි පොඩි ගැටුම් තිබුණා.

ප්‍ර : පැහැදිලි කරන්න පුළුවන්ද මොන වගේ ගැටුම්ද කියලා?

පි : ඒ ගැටුම් කියන්නේ ඔතන තිබුණේ එකම ප්‍රධානම දේ තමයි මඩකලපුවේ තමයි කාත්තන්කුඩියේ මිනිස්සු ඔක්කෝම ව්‍යාපාර තියෙන්නේ. ඒගොල්ලන්ගේ ගෙවල් පමණයි කාත්තන්කුඩියේ තියෙන්නේ. නමුත් දෙමළ මිනිස්සු ඇවිල්ලා ඒ මිනිස්සුන්ගේ ඉඩ කඩම් මේවා කරගෙන, වගා කරගෙන, ගෙවල් හදාගෙන ඉන්නකොට ඒගොල්ලන් ඇවිල්ලා කොහොම හරි බල කරලා හරි මොනවා හරි කරලා අත්පත් කර ගන්නවා. නැත්නම් සල්ලි දීලා හරි ගන්නවා ඒගොල්ලන්.

ප්‍ර : ඔබ පවසා සිටින්නේ දැන් මේ Radical මුස්ලිම් අය කියන, සහරාන්ගේ අන්තවාදී කණ්ඩායමේ අය කතෝලිකයන්ට සහ ක්‍රිස්තියානි පවුල්වල අයටත් කරදර කළා කියලද?

පි : ඒක එදා ඉඳලම තිබුණ ප්‍රශ්නයක් ඕක.

ප්‍ර : දැන් ඔබත් කතෝලිකයෙක් නේද?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔබ කතෝලිකයෙක් වශයෙන් ඔබ සහරාන්ව මුණ ගැසෙනකොට ඔබ පැවසුවද ඔබත් කතෝලිකයි කියලා?

පි : මගේ නම කියලා.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔහු ඔබ සමඟ කථා කරන්න කැමති වුණාද?

පි : ඔව්. කැමති වුණා.

ප්‍ර : එතකොට ඔහුගේ සාකච්ඡාවේදී ඔබට දැන ගන්නට ලැබුණාද ඔහු කතෝලිකයන් පිළිබඳව දරන මතයක් සම්බන්ධව?

පි : ඒක පෙනෙන්නට නම් මට තිබුණේ නැහැ ඒ වෙලාවේ.

ප්‍ර : ඔහු ඒ පිළිබඳව ...?

පි : එහෙම අදහසක් මට ප්‍රකාශ කර සිටියේ නැහැ.

ප්‍ර : ඔබ ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු කළේ සාම්ප්‍රදායික මුස්ලිම් අය සහ Radical මුස්ලිම් අය අතර තිබෙන ගැටුම් සම්බන්ධව කථා කිරීම පමණයි?

පි : නිවැරදියි.

ප්‍ර : ඔබට මට ඊට අමතරව මට දැන ගන්නට අවශ්‍ය වන්නේ ඔබට අදහසක් වශයෙන් කියන්න පුළුවන්ද ඇයි මේ සහරාන්ගේ කණ්ඩායම කතෝලිකයන්වම, ක්‍රිස්තියානි අයවම ඉලක්ක කරගෙන මෙවැනි ප්‍රහාරයක් ඇති කරන්නට හේතුව සම්බන්ධව?

පි : මම ඇත්ත කිව්වොත් එහෙම මෙතන ඒගොල්ලන්ට ඕන වුණේ ඒ වෙලාවේ ලොකු ගැටුමක් ඇති කරන්න ලංකාවේ. ඒ වෙලාවේ ඔය කොච්චිකඩේ පල්ලියයි, මඩකලපුව පල්ලියයි, කටුවාපිටිය පල්ලියයි වැඩියෙන්ම ඉන්නේ Strong Catholics ලා. ඒ කියන්නේ හරි දෙයියන්ට බයයි. මේ මිනිස්සුන්ට පල්ලිවලට ගැහුවහම අනිවාර්යයෙන්ම මිනිස්සු කුපිත වුණොත් එහෙම මිනිස්සු ගිහිල්ලා මරණවා. එතකොට ලොකු ගැටුමක්. හොඳ වෙලාවට ඒ ගැටුම එන්නේ නැතුව එවකට හිටපු ඒ ආරක්ෂක අංශ සහ ඔක්කොමලා ඒකට මැදිහත් වෙලා ඒ තත්ත්වය පාලනය කර ගත්තා.

ප්‍ර : ඔබ කලින් ප්‍රකාශ කළා ඔහු කිව්වා කියලා දෙමළ අය, හින්දු අයව මේ පළාතෙන් අයින් කරන්න ඕන හින්දු අය සමඟත් ඔහුට ගැටුමක් තිබුණා කියලා. එතකොට පළමුව ඔවුන්ට ...?

පි : නිරන්තරයෙන්ම ඔය හින්දු මුස්ලිම් ගැටුම් තිබුණා ඒ ප්‍රදේශයේ.

ප්‍ර : එතකොට පළමු ප්‍රහාරය ක්‍රිස්තියානි අයව ඉලක්ක කර ගත්තේ ඇයි කියලා කියන්න පුළුවන්ද?

පි : පුළුවන්. ඒ කියන්නේ මඩකලපුවේ ලොකුම සල්ලිකාරයා, ටවුමේ ඉන්නේ ඔක්කොම කතෝලික මිනිස්සු. ඒගොල්ලන් සල්ලි කියන්නේ හොඳ ඉගෙන ගත්ත, උගත් හොඳ රස්සාවල් කරන මිනිස්සු. ඒගොල්ලන් එතනින් අතුගාලා දාන්න ඕන, අයින් කරලා දාන්න ඕන ඒ ප්‍රදේශයෙන්ම. එතකොට තමයි ඒගොල්ලන්ගේ අර මතවාදය ඒක ඇතුළට ගේන්න පුළුවන්. එතකොට අනිත්

FAIR COMMENT BY JEZEEM

මිනිස්සු සල්ලි තියෙන මිනිස්සු ගෙවල් විකුණලා, ඉඩම් විකුණලා ළමයිනුත් එක්ක පුළුවන් යුරෝපීය රටකට හරි කොහේ හරි යනවා. එතකොට හිස් වෙන ප්‍රදේශ ඔක්කෝම ඒගොල්ලන් සල්ලි දීලා කොහොම හරි අල්ල ගන්නවා.

ප්‍ර : ඒ මඩකලපුව කතෝලික අයනේ. එතකොට මඩකලපුවේ කතෝලික අයව එළවන්න කොළඹ ප්‍රහාරයක් දියත් කිරීම සම්බන්ධව?

පි : ඒක කුපිත කිරීමක්. ඒ කියන්නේ මුළු ලංකාවම කුපිත වුණා නම් එහෙම එදා ලේ විලක් වෙලා ලංකාව.

බොහොම ස්තුතියි.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : සාක්ෂිකරු ඔබගෙන් පෙර අසන ලද ප්‍රශ්නයකට කිව්වා මේ මුස්ලිම් ජනතාව බලහත්කාරයෙන් කොළඹ වශයෙන් පදිංචි කිරීමක් සිදු කරනවා කියලා?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : එය ඔබගේ නිරීක්ෂණයක්ද?

පි : මම ඒක ඕනම මෙහෙන් කොළඹින් බැහැරව යන ඕනම කෙනෙකුට පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් පොඩ්ඩක් එළියට ගියහම පැහැදිලිව පේනවා ඒක. අක්කර සිය ගණන් දහස් ගණන් කොහොමද ඒගොල්ලන් අත්පත් කරගෙන තියෙන්නේ කියලා.

ප්‍ර : එතකොට ඔබගේ තොරතුරුවලට අනුව, නිරීක්ෂණවලට අනුව ඒක යම්කිසි සංවිධානාත්මක විදියකටද සිදු කරන්නේ?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : එම සංවිධානාත්මක විදියට එම ක්‍රියාවලිය කරන්නේ යම් පුද්ගලයෙකුද නැත්නම් කණ්ඩායමක්ද?

පි : ඒගොල්ලන් ඕක කරන්නේ අර මතවාද පල්ලියේ ඉන්න කණ්ඩායම් වශයෙන් තමයි අල්ල ගන්නේ. ඉන්න මිනිස්සු එළවනවා. සමහරවිට මුස්ලිම් කට්ටියත් එළවනවා ඒගොල්ලෝ. Specialy Ottamawady Area දැන් ඔට්ටමාවඩි Area එකේ එතනත් ආපහු මුස්ලිම් මුස්ලිම් ගැටෙනවා ඒගොල්ලන්. දුප්පත් මිනිස්සු එළවලා ගිහිල්ලා ඒ ඉඩම් ටික බලෙන් අල්ලා ගන්නවා.

ප්‍ර : එතකොට ඔබ කියන බලහත්කාරයෙන් සිදු කරන මුස්ලිම් කොළඹීය සෑදීමේ ක්‍රියාවලියට ඒ කණ්ඩායම් විතරයිද නායකත්වය දෙන්නේ?

පි : නැහැ. පිටරටිනුත් ඒගොල්ලන්ට ආධාර එනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මොන රටවල්වලින්ද?

පි : විශේෂයෙන්ම මැද පෙරදිග රටවල්වලින්.

ප්‍ර : ඊට අමතරව ලංකාව තුළ යම් වෙනත් කණ්ඩායමක් ඉන්නවද?

පි : ඉන්නවා.

ප්‍ර : කවුද ඒ?

පි : ලොකු වෙළෙන්දෝ, Business කාරයෝ.

ප්‍ර : ඔවුන් පමණද?

පි : තවත් සෑහෙන කල්ලියක් ඉන්නවා. ඒ කියන්නේ සිංහල, දෙමළ, හින්දු, කතෝලික, Buddihsam ඇරෙන්න අනිත් ඒගොල්ලන්ගේ කණ්ඩායම් ඒගොල්ලන්ට තමයි හැම තිස්සෙම ඒගොල්ලන්ව ඉස්සරහට ගේන්න බලන්නේ.

මෙම කොමිසම ඉදිරියට පැමිණ සාක්ෂි ලබා දීමෙන් කොමිෂන් සභාවේ කාර්යයට දැක් වූ දායකත්වය සම්බන්ධයෙන් සාක්ෂිකරුට කොමිෂන් සභාවේ ස්තුතිය පළ කරනවා. සාක්ෂිකරු කොමිෂන් සභාවට ලබා දුන් සාක්ෂිය හේතුවෙන් 2015 අංක 04 දරන සාක්ෂිකරුවන් හා වින්දිතයන් හට ආරක්ෂාව ලබා දීමේ සහ පහසුකම් සැළසීමේ පනතේ 25(4) උප වගන්තිය ප්‍රකාර සාක්ෂිකරුට හිමි වියයුතු අයිතීන් සහ වරප්‍රසාද ඔහුට ලබාදෙන ලෙසට සාක්ෂිකරුවන් හා වින්දිතයන් හට ආරක්ෂා කිරීමේ හා පහසුකම් සැලසීමේ ජාතික අධිකාරිය වෙත නියෝග කරනවා.

ප.ව. 2.40 යි.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බව පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය: 2020.06.25 වේලාව:ප.ව.07.30 යි.
සටහන් කළේ ල/ලේ - මුතුමාලි

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා
-සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

පෙනී සිටීම:-

* අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, චතුරංග බණ්ඩාර මහතා, දිලන්ත එස්.කළුදුරුවගේ මහතා සහ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සාක්ෂි අංකය	:	449
නම	:	**දොන් නිශාන්ත ලෝරන්ස් රාමනායක**
වයස	:	**අවුරුදු 48**
ජාතිය	:	**සිංහල**
ආගම	:	**රෝමානු කතෝලික**
රැකියාව	:	**අගරදගුරු පදවියේ සමාජ සේවා ආයතනය වන සෙත්සරණ ආයතනය අධ්‍යක්ෂක පියතුමා**

සාක්ෂිකරු ප්‍රතිඥා දී කැඳවයි.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය</u>

ප්‍ර : පියතුමනි ඔබතුමා මේ අවස්ථාව වෙන කොට යම් කිසි ආයතනයකට අනුබද්ධව ද සිටින්නේ?

පි : ඔව්.

ප්‍ර : මොකක්ද ඒ ආයතනය?

පි : සෙත්සරණ කරීටාස් කොළඹ ආයතය.

ප්‍ර : කොහේද එය පිහිටා තිබෙන්නේ?

පි : අගරදගුරු නිවස ඇතුලතමයි. කොළඹ, බොරැල්ලේ අගරදගුරු නිවස තුළ.

ප්‍ර : මේ සෙත්සරණ කරීටාස් ආයතනයේ කාර්ය භාරය මොකක්ද?

පි : බස්නාහිර පළාතේ සමාජ සේවාවන් අගරදගුරු හිමිපාණන්ගේ මහ පෙන්වීම තුළ කරන්නා වූ කාර්ය භාරයක් තිබෙනවා. උදාහරණයක් විදිහට දුප්පත් අසරණ ජනතාවගේ අවශ්‍යතාවයන් ඉටු කර ගන්න අප අසලට එන මීසම්භාර පියවරුන් විදිහට ඒ අයව අප ළඟට එවන අයගේ අවශ්‍යතාවයන් ඉටු කරලන්න අපි බැඳී සිටිනවා. ඒ වගේම විපත් අවස්ථාවන් වලදී කඩිනමින් වැඩ කටයුතු කරන්නේ අගරදගුරු පදවිය තුළ බස්නාහිර පළාත තුළ අපේ ආයතනය තුළයි.

ප්‍ර : දැන් මේ සෙත්සරණ කරීටාස් කොළඹ ආයතනයට ශ්‍රී ලංකාව පුරාම සිටින ඕනෑම කෙනෙකුට පැමිණ ඔවුන්ට අදාළ පිහිටක් ලබා ගැනීමට හැකියාව තිබෙනවාද?

පි : අපේ ආයතනය තුළ එසේ කරන්නට අදාළ හැකියාවක් නෑ. අපේ ආයතනය පිහිටා තිබෙන්නේ බස්නාහිර පළාතට විතරයි. නමුත් යම් කිසි කෙනෙක් අපේ ආධාරයක් උපකාරයක් පැතුවොතින් අපි ලංකාව පුරා මේ ආයතනයේ අනු ශාඛා පිහිටුවලා තියෙනවා. ඒ ශාඛා වෙතට අපිට යොමු කර ගැනීමේ හැකියාවක් තිබෙනවා.

ප්‍ර : බස්නාහිර පළාත කියලා කිව්වම ශ්‍රී ලංකාව තුළ තිබෙන පරිපාලන දිස්ත්‍රික්ක පළාත් වලට අනුව තිබෙන බස්නාහිර පළාතද?

පි : ඔව්.

Registrar/Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : පරිපාලන දිස්ත්‍රික්ක තුන අදාළ වන ආකාරයට තිබෙන පළාතද පියතුමනි?

පි : ඔව්. කළුතර, ගම්පහ, කොළඹ කියන දිස්ත්‍රික්ක තුන ආවරණය වන පරිද්දෙන් අපේ වැඩසටහන් ක්‍රියාත්මක කරනවා.

ප්‍ර : මේ ආයතනය පිහිටුවා තිබෙන්නේ මොන කාලයේදීද ?

පි : අපගේ ආයතනය පිහිටුවා තිබෙන්නේ 1986 දී. අපේ ධර්මයත් එක්කම එන ආයතනයක් විදිහට තමයි ක්‍රියාත්මක වෙන්නේ. ඒ ආයතනය දැනට සිටින වත්මනයේ සිටින කාදිනල් හිමිපාණන් ප්‍රථම අධ්‍යක්ෂක ධුරය දරමින් වැඩසටහන් ක්‍රියාත්මක කරලා තියෙනවා 1986 දී.

ප්‍ර : අගරදගුරු සම්මේලනය යනුවෙන් පනතක් පිහිටු තිබෙනවනේ පියතුමනි?

පි : ඔව්.

ප්‍ර : ඒ පනත යටතේ දැක්වෙන සමාජ සේවා කටයුතු කිරීම සඳහා තිබෙන ආයතනයක් හැටියට මෙය පිහිටුවා තිබෙනවා කිව්වොත් හරිද?

පි : හරි. එම පනත 1983 අංක 17 කියන පනත යටතේ ලියා පදිංචි කරලා තිබෙනවා. ඒකේ මූලික වගකීම තියෙන්නේ ශ්‍රී ලංකා රදගුරු මණ්ඩලයේ සමාජ සේවා කටයුතු කරන්නට තිබෙන කොමිෂන් සභාවක් තියෙනවා ස්වාමිනි. අන්න ඒ කොමිෂන් සභාවේ අනු ශාඛා විදිහට තමයි මා අධ්‍යක්ෂක ධුරය දරන මේ බස්නාහිර පළාතේ මේ කාර්ය කරමින් සිටින්නේ.

ප්‍ර : පියතුමනි 2019 අප්‍රේල් මස 21 වෙනි දින බෝම්බ පිපිරීම් කිහිපයක් ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානවල සිදු වුණු බව ඔබතුමා දන්නවානේ?

පි : ඔව්.

ප්‍ර : එම පිපිරීම්වලින් පිපිරීම් තුනක් පල්ලිවල සිදු වුණු බව අපි කවුරුත් දන්න කාරණාවක්. ඒ අතරින් ඔබතුමා අධ්‍යයක්ෂක වශයෙන් සිටින සෙන්සරණ කරීටාස් කොළඹ යනුවෙන් සඳහන් කෙරෙන ආයතනයෙන් පිහිටාධාර ලබා දෙනු ලැබූ පල්ලි වශයෙන් ගන්න පුළුවන් මොනවාද?

පි : ඇත්තටම බස්නාහිර පළාත තුළ සිද්ධ වෙච්ච සිද්ධස්ථානය දෙකේ දේවස්ථාන දෙකේ මූලික වශයෙන් තමයි අපිට අගරදගුරුතුමා මේ වගකීම පවරලා තිබුණේ. ඒ කියන්නේ කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේදී බෝම්බ ප්‍රහාරයකට ලක් වුණු ජනතාවත් කොච්චිකඩේ සිද්ධස්ථානයේ බෝම්බ ප්‍රහාරයට ලක් වෙලා අවතැන් වෙච්ච තුවාල ලැබූ ජනතාවට තමයි අපගේ ප්‍රමුඛතාවය ලබා දුන්නේ. නමුත් අගරදගුරුතුමාගේ ඉල්ලීම පරිදි මඩකලපුවේ සියෝන් දේවස්ථානයටද අපගේ මුල්‍යමය

Page 3 of 39

- 7552 -

දායකත්වය ලබා දුන්නා. ඒක දෙයාකාරයකින් සිද්ධ වුණා. නමුත් අපගේ ප්‍රමුඛතාවය අපි දුන්නේ බස්නාහිර පළාතේ සිදු වෙච්ච දේවස්ථාන දෙකට.

ප්‍ර : ඔබ වහන්සේගේ පිළිතුරේ මා වෙනසක් දුටු නිසා මා මේ ප්‍රශ්නය අහනවා. ඔබ වහන්සේ දේවස්ථානය සහ සිද්ධස්ථානය වශයෙන් වචන දෙකක් පාවිච්චි කළා. ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්න මේ ගරු සභාවට?

පි : ස්වාමිනි සිද්ධස්ථානයක් කියලා කියන්නේ එහි පරිපාලන කටයුතු බොහෝ විට සිද්ධ වෙන්නේ ඒ අදාළ වසම තුළ සිටින රදගුරුතුමාගේ නියෝග අනුවයි. දේවස්ථානයක පරිපාලන කටයුතු සියල්ලම සිද්ද වෙන්නේ ඒ අදාළ මීසමේ සිටින පියතුමාගේ මඟ පෙන්වීම තුළයි. උදාහරණයක් විදිහට සිද්ධස්ථානයක් ඒ සිද්ධස්ථානයේ පරිපාලක පියතුමාට බෑ ඕනේ වේලාවට වහන්න ඕනේ වේලාවට අරින්න. සිද්ධස්ථානයක් වුණාම එයට නීති මාලාවක් ඒ තියන රදගුරු වසමේ ඉන්න රදගුරුතුමා අපේ එනම් අගරදගුරු හිමිපාණන් දීලා තියෙනවා නීති මාලාවක් මේ වේලාවට මේක අරින්නට ඕනේ මේ වේලාව දක්වා විවෘතව තබන්නට ඕනේ. මේකේ වත් පිළිවෙත්වලට සැමවිටම ජනතාවට ළඟා වෙන්න පුළුවන් අවස්ථාවක් තිබිය යුතුයි. දේවස්ථානයක ඊට වඩා වෙනස්. ඒක අපිට ආරක්ෂාවක් නැත්නම් එහෙම කියන්න කවුරුවත් නැත්නම් හොර සතුරෝ එනවා නම් අපිට වේලාවකට වහලා කියන්න පුළුවන්. සිද්ධස්ථානයක් කිසි විටකත ඒ කාල පරාසය තුළ වසා තබන්නට බැහැ ඕනේ වේලාවක යන්න එන්න පුළුවන්. ඒ වගේම එහි තව විශේෂ ලක්ෂණයක් තියෙනවා ස්වාමිනි ඒ තමයි එහි වත් පිළිවෙත් වෙනස් කරන්නට ඒ වේලාවල් වෙනස් කරන්න සිද්ධස්ථාන පියතුමාට හැකියාවක් නෑ. ඒක නිසා ඒක අපි කියමුකෝ එදා ඉඳන් පැවත ගෙන ආවා නම් සවස පහට දේව මෙහෙයක් තියෙනවා කියලා ඒක වෙනස් කිරීමේ හැකියාවක් සිද්ධස්ථාන පරිපාලක පියතුමාට බැහැ. නමුත් අගරදගුරුතුමාගේ නියමය සහ එතුමාගේ ඉල්ලීම පරිදි ඒක වෙනස් කිරීමට හැකියාවක් තිබෙනවා.

ප්‍ර : ඒ අනුව මේ කොච්චිකඩේ පල්ලිය සිද්ධස්ථානයක් හැටියට ද සැලකෙන්නේ පියතුමනි?

පි : ඔව් කොච්චිකඩේ දේවස්ථානය ශාන්ත අන්තෝනි සිද්ධස්ථානය ලෙස නම් කරලා ප්‍රකාශයට පත් කරලා තියෙනවා. ඒක අවුරුදු 200 කට කිට්ටු වෙන්න ආසන්න කාලයක් තිස්සේ ඒ සිද්ධස්ථානයේම එම ස්ථානයේ තියෙනවා. ඒක ඒ නිසාම

FAIR COMMENT
BY JEZEEM

ලංකාව තුළ හරිම ප්‍රසිද්ධ සිද්ධස්ථානයක් ලෙස ඕනෑම කෙනෙක් හඳුනන තැනක් විදිහට අවබෝධ කර ගෙන තියෙනවා.

ප්‍ර : ඒ අනුව කොච්චිකඩේ මෙම සිද්ධස්ථානය පියතුමනි ඕනෑම අවස්ථාවක පුද්ගලයෙක්ට ඇතුල් වෙලා තනිව ගොස් වැඳුම් පිදුම් කිරීමට හැකියාවක් තිබෙන ආකාරයේ ස්ථානයක් කිව්වොත් හරිද?

පි : හරි නිවැරදි.

ප්‍ර : දේව මෙහෙයක් තිබෙන වේලාවක් විය යුතු වන්නේ නැහැ ඔවුන්ට තමන්ගේ ඒ යාඥා තමන්ටම කර ගන්න පුළුවන් කියලා කිව්වොත් හරිද පියතුමනි?

පි : හරි.

ප්‍ර : ඔබ වහන්සේ සඳහන් කළා කොච්චිකඩේ මේ පල්ලිය ශාන්ත අන්තෝනි මුනිවරයාට අදාළව පැවැති පල්ලියක් වශයෙන්. කටුවාපිටිය පල්ලිය එවැනි මුනිවරයෙක්ට නම් කරන ලද්දක්ද?

පි : ඔව් එහි කැප කරලා තිබෙන්නේ දේවස්ථානයෙන් සහ ඒ ප්‍රදේශයේ සිටින ජනතාව අපි මීසමක් කියලා කියන ජනතාව ශාන්ත සෙබස්තියන් මුනිතුමාට තමයි එම දේවස්ථානය කැප කරලා තිබෙන්නේ.

ප්‍ර : පියතුමනි ඔබ වහන්සේ පැහැදිලි කරන්න මේ ගරු සභාවට ශාන්ත අන්තෝනි මුනිවරයාගේ සහ ශාන්ත සෙබස්තියන් මුනිවරයාගේ තිබෙන විශේෂත්වයන්. ඔවුන් කතෝලික ආගමේ හැටියට පිළිගැනෙන්නේ මොන කාරණාවන් වලට අදාළ මුනිවරයන් හැටියටද?

පි : ඇත්තටම අපේ සංස්කෘතිය තුළ සහ දේශය තුළ මේ දෙදෙනා තමයි ප්‍රබලම ශුද්ධ වන්තයෝ දෙදෙනා විදිහට නම් දරා තිබෙන්නේ කතෝලික ජනතාව තුළ. ඒකට හේතු කිහිපයක් තිබෙනවා. පළවෙනි හේතුව තමයි ස්වාමිනි මූලික වශයෙන්ම තිබෙන්නේ ශාන්ත අන්තෝනි මුනිතුමන් හරිම ප්‍රසිද්ධයි නැතිවුණු දේවල් සොයා දෙන මුනිවරයා විදිහට. ඒක නිසා ඒ ගීතිකාවේ පවා සඳහන් වෙනවා නැති වූ දේ සොයා දෙන මුනිඳුනි අප දෙස බැලුව මැනව කියලා. ඒක නිසා ජනතාව හේදයකින් තොරව මේ සත්‍යතාවය අපිට මෙය සත්‍යතාවයක්. අනිත් අයටත් සමහර විටක සත්‍යතාවයක් වෙන්න පුළුවන්. යමක් නැති වුණාම අහිමි වුණාම ඕනෑම කෙනෙක් ගිහිල්ලා භාරයක් වෙන ස්ථානයක් තමයි මේ ශුද්ධ වූ අන්තෝනි මුනිතුමා කියලා කියන්නේ. ඒක කොච්චිකඩේ විතරක් නෙවෙයි ලංකාවේ ඕනෑම තවත් දේවස්ථාන තියෙනවා ශුද්ධ වූ අන්තෝනි මුනිතුමන්ට කැප කරලා. ඒ නිසා ජනතාව ගොඩක් ආදරය කරන ශුද්ධ වන්තයෙක් විදිහට නම් දරා තිබෙනවා නැති වුණු දේවල් සොයා දෙන්නා විදිහට.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : පියතුමනි මම මොහොතකට ඔබ වහන්සේට බාධා කරනවා ඊළඟ පල්ලියට අදාළ පැහැදිලි කිරීමට පෙර. ඔබ වහන්සේගේ පිළිතුරේ සඳහන් වුණා භේදයකින් තොරව පිහිට පතා පුද්ගලයන් මෙහි එනවා කියලා එයින් අදහස් කරන්නේ අන්‍ය ආගමිකයන් ඇඳී එනවා කියන කාරණාවද?

පි : අනිවාර්යෙන්ම අපිට ඒක සාක්ෂියක් විදිහට ගන්න පුළුවන් මේ සිදු වීමේදී ස්වාමිනි අපි ළඟ තිබෙනවා දත්ත ටික තොරතුරු ටික අපි මේ සෑම නිවසක්ම බැහැ දකින්න ගියා විපතට පත් වෙච්ච අයව. ඒකේදී අපි සමීක්ෂණයක් කළා survey එකක් කරලා තොරතුරු හොයා ගත්තා ඒකේදී අපි ළඟ තියෙන දත්ත ඔබතුමන්ලාට අපිට පුළුවන් ඉදිරිපත් කරන්න මූලික වශයෙන්. ඒක අපි ළඟ තියෙනවා මෙහෙම තොරතුරු කටුවාපිටියේ මියගිය සංඛ්‍යාව මේ වන විට මූලිකව මුලදී තිබුණේ 113 යි කියලා ජූනි මාසේ 11 වෙනිදා සහ ජූනි මාසේ 20 වෙනිදා කටුවාපිටිය දේවස්ථානයෙන් තවත් දෙදෙනෙකු රෝහල් ගත වෙලා හිටපු දෙදෙනෙකු මිය ගියා. ඒ නිසා මුළු සංඛ්‍යාව 115 ක් විදිහට අපිට වාර්තා වෙනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : අද දින වන විට?

පි : අද දින වන විට. ඒ 115 මිය ගිහිල්ලා තියෙන්නේ ස්වාමිනි පවුල් 78 ක් තුළ තමයි මේ 115 මිය ගිහිල්ලා තියෙන්නේ . ඒ වගේම කොච්චිකඩේ සිද්ධස්ථානය ගත්තොකින් එහෙම ඒ සිදුවීමෙන් 54 ක් ඒ මොහොතේ මිය ගිහිල්ලා තියෙනවා. අද වන විට 56 ක් මිය ගිහිල්ලා තියෙනවා. ජනවාරි මාසයේ 21 වෙනිදා සහ තුන්වෙනි මාසේ මාර්තු මාසේ 12 වෙනිදා තව දෙදෙනෙක් රෝහල් ගත වෙලා මිය ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා සියළුම 56 දෙනෙක් කොච්චිකඩේ සිද්ධස්ථානයේ මිය ගිහිල්ලා තියෙනවා.

ප්‍ර : සමාවෙන්න පියතුමනි. ඔය කියන මරණ සංඛ්‍යාව ස්වයං සාතකයන් ගණන් ගන්නේ නොමැතිව ?

පි : නොමැතිව.

ප්‍ර : ඔය කොච්චිකඩේ 56 ක් මිය යන්නේ පවුල් කීයකින්ද පියතුමනි?

පි : පවුල් 42 කින් ස්වාමිනි. එය තවත් විග්‍රහ කළොතින් කටුවාපිටිය මිය ගිය අතරින් ඒ 115 අතරින් 32 දෙනෙක් දරුවන්. පිරිමි දරුවන් 09 දෙනෙක් සහ ගැහැණු දරුවන් 23 ක් 32 ක් ළමයි 115 න් මිය ගිහිල්ලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර : 115 න් 30 ක්?

පි : 32 ක් දරුවෝ. ඒ දරුවන් තවත් වෙන් කරන්න පුළුවන් පිරිමි දරුවෝ 09 දෙනයි. ගැහැණු දරුවෝ 23 ක් ලෙස. ඒ වගේම

Fair Comment by Jezeem

කොච්චිකඩේ සිද්ධස්ථානයේ 56 න් 10 දෙනෙක් දරුවෝ. 06 දෙනෙක් පිරිමි. 04 දෙනෙක් ගැහැණු දරුවෝ.

ප්‍ර : මේ දරුවන් වශයෙන් ඔබතුමා නිර්ණායක ගන්නේ අවුරුදු 18 ට?

පි : 18 ට වඩා පහළ ස්වාමිනි. ඒ එක්කම තවත් ඉදිරියට ගියොත් එකේ තවත් ටිකක් බැලුවොතින් අපිට හමු වෙනවා කොච්චිකඩේ දේවස්ථානයේ හින්දු දමිළ හින්දු පවුල් ඒ කියන්නේ මිය ගිය අයෙන් 13 දෙනෙක් සිටිනවා. ඒ වගේම

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය</u>

ප්‍ර : පවුල් 13 ක්?

පි : පවුල් 13 ක් සිටිනවා. ඒ මිය ගිය අය ඉන්න පවුල් 13 ක් හින්දු. ඒ වගේම කොච්චිකඩේ සිද්ධස්ථානය ගත්තොතින් එහෙම ඒකෙන් බෞද්ධ පුද්ගලයෝ 05 දෙනෙක් මිය ගිහිල්ලා තියෙනවා. ඒ වගේම කොච්චිකඩේ සිද්ධස්ථානය මුස්ලිම් එක දරුවෙක් මිය ගිහිල්ලා තියෙනවා. අවුරුදු 15 ක දරුවෙක්. සිය ආච්චිත් එක්ක ආච්චි කතෝලික වැදුම් පිදුම් කරන්න මේ දරුවා හැම ඉරිදාම ආච්චි සමඟ මේ සිද්ධස්ථානයට පැමිණෙන බව ආච්චි ප්‍රකාශ කළා. ආච්චිත් මේ සිදු වීමෙන් තුවාල ලැබුවා. නමුත් මරණයට පත් වුණේ නැහැ. ඒ මුස්ලිම් පවුලේ එකම දරුවා පිරිමි දරුවා අවුරුදු 15 ක මිය ගියා. එයින් අපිට අනාවරණය වෙනවා මේ සිදු වීම තුළත් භේදයකින් තොරව මෙතෙන්ට පැමිණෙනවා කියලා බෞද්ධ සොයුරු සොයුරියනුත් මෙහේ ගිහිල්ලා තියෙනවා මුස්ලිම් සොයුරු සොයුරියනුත් මිය ගිහිල්ලා තියෙනවා . ඉස්ලාම් සොයුරු සොයුරියනුත් මිය ගිහිල්ලා තියෙනවා. ඒ වගේම තුවාල ලබලත් තියෙනවා. හැබැයි මුස්ලිම් සොයුරු සොයුරියන් තුවාල ලැබුවා කියලා අපිට සඳහනක් වෙලා නෑ ස්වාමිනි.

ප්‍ර : ඔබ වහන්සේ ඒ පැහැදිලි කළේ විවිධ ආගම්වලට අයත් අය සිද්ධස්ථානයක් වීම හේතුවෙන් කොච්චිකඩේ ශාන්ත අන්තෝනි මුනිවරයාගේ පල්ලියට පැමිණීම මත මිය ගියා තුවාල ලැබුවා කියන කාරණාවට අදාළව දත්ත තොරතුරුත් එක්ක කරුණු?

පි : ඔව්.

ප්‍ර : ඒ වගේම ඔබ වහන්සේට පියතුමනි කියන්න පුළුවන්ද කටුවාපිටිය පල්ලියේ ශාන්ත සෙබස්තියන් මුනිවරයා මොනවට ප්‍රසිද්ධයි කියලද ඔබ වහන්සේගේ ධර්මයට අනුව පිළිගැනෙන්නේ?

පි : ඒකෙත් ස්වාමිනි ඉතිහාසයක් තියෙනවා මෙතුමා තරුණ හරිම ජව සම්පන්න පුද්ගලයෙක්. මේ වන්දනා මාන කරන්න පෙර මිය යන්නට පෙර මෙතුමා රෝම ආධිරාජ්‍යයේ සොල්දාදුවෙකු විදිහට තමයි සේවය කරලා තියෙන්නේ. ඒ සේවය කරක කාලේ

FAIR COMMENT BY JEZEEM

මෙතුමාගේ ඉන්න ප්‍රධානීයා සේනාධිපතියා හැමවිටම කියලා තියෙනවා මෙයාට ජේසුව අදහන අයව උඹලා විනාශ කරන්නට ඕනේ. ඉඩක් දෙන්නට එපා. ඒක නියෝගයක්. ඒ නියෝගය මේ සොල්දාදුවා ඉෂ්ඨ කරලා නැහැ. ඒක නිසා එක්තරා අවස්ථාවකදී මෙයාගේ ප්‍රධානීයා බලපෑම් කරලා මෙයාට අවවාද කරනවා මෙයා ඒ අවවාදය පිළිගන්නේ නෑ. ඒ අයට නිදහසේ වැඳුම් පිදුම් කරන්න අවසර දුන්නා කියලා ඉතිහාසයේ සඳහන් වෙනවා. ඉන් අනතුරුව අපි දකිනවා මෙයාගේ ප්‍රධානීයා මේ සෙබස්තියන් කියන සොල්දාදුවගේ ප්‍රධානීයා මෙයාට දඬුවම් කරනවා මේ සෙබස්තියන්ට උඹ මේ දේ කරන්නට එපා කියලා ගහනවා හොඳටම ගහලා පැත්තකට දාලා තියෙනවා ඒත් මෙයා සුවය ලබනවා. ඒත් මෙයා ඒ විදිහටම ඉඩ දෙනවා. කිසිම දෙයක් කරන්නේ නැතුව. අවසානයේදී මෙයාට ස්වාමිනි ඊතලවලින් විඳලා මෙයා මරණයට පත් කරලා මෙයාව හඟවනවා සංගල තියනවා වළක් වගේ තැනක මෙයා මියා ගියා කියලා. හැබැයි අවසානයේදී දවස් ගාණකින් මෙයා මිය ගිහිල්ලා නැහැ. මෙයා නැවතත් ඒ තුවාල සුවපත් වෙලා කාන්තාවකගේ පිහිටෙන් මෙයාව අරන් ගිහිල්ලා බෙහෙත් දාලා සුවපත් කරලා මෙයා නැවත අරගෙන එනවා මෙයා නැවතත් යනවා තමන්ගේ ප්‍රධානීයා ළඟට ගිහිල්ලා මෙයා අභියෝග කරනවා මම මැරෙන පුද්ගලයෙක් නෙවෙයි. ඒ ඔබ නසන්න කියන අදහන අයව නසන්න කියලා කියන දෙවියන් වහන්සේ ජේසුස් වහන්සේ මට පණ දුන්නා කියලා. ඉන් පස්සේ මේ ප්‍රධානීයාම නැවතත් මෙයාව මරණවා ඊතලවලින්ම විඳලා. ඒ අවස්ථාවේදී මෙයා මැරෙනවා. ඒ නිසා සභාවේ කතෝලික අයගේ ලොකු ඇදහිල්ලක් විශ්වාසයක් තියෙනවා මෙයා සුවය දෙන ශුද්ධ වන්තයෙක් විදිහට. ඒක අපේ සංස්කෘතියේ ලොකු ප්‍රබල චරිතයක් බවට පත් වෙලා තියෙනවා. ඒ වගේම එඩිතර චරිතයක් බවට පත් වෙලා තියෙනවා. ඒක ප්‍රධාන ලක්ෂණයක් විදිහට අපිට දකිනවා. අපේ ශ්‍රී ලංකා දේශය තුළ ප්‍රබලම වශයෙන් ඉන්න ශාන්තුවරයො දෙදෙනෙකු විදිහට තමයි අන්තෝනි මුනිතුමා සහ සෙබස්තියන් මුනිතුමා නම් දරලා තියෙන්නේ ස්වාමිනි අපේ සංස්කෘතිය තුළ.

ප්‍ර : ඔබ වහන්සේගේ මේ පැහැදිලි කිරීමට අනුව ශාන්ත සෙබස්තියන් මුනිවරයාට කැප කරන ලද පල්ලියක සුවය ලැබීම සඳහා පුද්ගලයන් ඒ හාස්කම් සඳහා එම පල්ලිවලට පැමිණෙනවා කිව්වොත් හරිද?

පි : අනිවාර්යෙන්ම මේ කටුවාපිටිය දේවස්ථානයත් ඒ වගේ. ස්වාමිනි ඒකටත් අවුරුදු සෑහෙන අවුරුදු 175 ක් විතර පරණ දෙයක්. ඒක නිසා එහි ප්‍රතිමාවක් තියෙනවා මේ සෙබස්තියන් මුනිතුමාගේ

FAIR COMMENT BY JEZEEM

ඒකට ගොඩක් කතෝලිකයෝ ගරු කරනවා. ඒකේ හාස්කම් තියෙනවා කියලා විශ්වාස කරනවා . ඇවිදින්න බැරි දරුවෝ මේ සිදු වීමෙන් පස්සේ මේ විපතෙන් පස්සේ මේ දේවස්ථානය විවෘත කළාට පස්සේත් අම්මා වඩා ගෙන එන දරුවා එතනින් තිබ්බට පස්සේ මාස ගණනක් ඇවිදින්න බැරිව හිටපු දරුවා මේ ප්‍රතිමාව ඉස්සරහා අම්මා තියලා යාඥා කරද්දී මේ දරුවා ඇවිදිනවා කියන සත්‍යතාවය සාක්ෂිය මාස තුනකට ඉස්සෙල්ලත් පියතුමන්ලා අපි ඒ අවස්ථාවට ගියාම ඒ අම්මා මේ දරුවව අතින් ඇඳගෙන අඩාගෙන අපි ළඟට ආවා. පියතුමනි මේ දරුවා මගේ දරුවා දැන් ඇවිදිනවා කියලා. ඒ අර අපි විශ්වාස කරනවා ඒ ප්‍රතිමාව හාස්කම් සහිත ප්‍රතිමාවක් කියලා. ඒ වගේම තව සත්‍යතාවයක් අපි විශ්වාස කරනවා ජනතාව අතර හරිම ප්‍රචලිතයි. ඒ තමයි ඒ දේවස්ථානයේ තියෙනවා ළිඳක්. ඒ ළිඳෙන් නෑවාම සුවය ලබනවා කියලා. ඒක වසූරිය රෝගයත් එක්කම අතීතයේදී මේ ළිඳ හරිම ප්‍රසිද්ධ ළිඳක්. ඒ ළිඳත් මේ දේවස්ථාන භූමියේ හරිම ලස්සනට පිළියෙල කරලා තියෙනවා ගොඩක් නාන්නේ නෑ. එක පනිවිටුවක් අරගෙන මේකෙන් නාපුහාම තමන්ගේ රෝග සුවපත් වෙනවා කියලා තියෙනවා. එතකොට මේ සෙබස්තියන් මුනිතුමා මැරෙන්නේ බ්‍රහස්පතින්දා දවසක. ඒ නිසා බ්‍රහස්පතින්දා දිනය හරි සුප්‍රසිද්ධයි සෙබස්තියන් මැතිතුමාට. ඒ නිසා සෑම දේවස්ථානයකම ඒ සෙබස්තියන් මුනිතුමාගේ නම් බ්‍රහස්පතින්දා එතුමට මේ හාර හාර වෙන්න කතෝලිකයන් අතර තියෙනවා අදහසක් ඒ දවසේ යන අදහසක්. එතකොට අන්තෝනි මුනිතුමා මිය යන්නේ අඟහරුවාදා දිනයක. ඒ නිසා අන්තෝනි මුනිතුමාගේ දේවස්ථානයත් අඟහරුවාදා කියන සංකල්පය ප්‍රචලිත වෙන්නේ එතුමා ස්වර්ගයට යන දවස නිසා. අපිට මරණය දවස කතෝලික අපිට ස්වර්ගීය දිනය ස්වර්ගයේ උපදින උපන් දිනය විදිහට තමයි අපි නිර්වචනය කරන්නේ. ඒ නිසා ගොඩක් අපි අවස්ථාවලදී ඔය දින දෙක ඔය මුනිද්‍රයන් දෙදෙනාට කැප කරලා තියෙනවා.

****

දැන් වේලාව : ප.ව.07.50 යි.
මෙතැන් සිට ල/ලේ :- සචිනි මෙය.

FAIR COMMENT
BY JEZEEM

වේලාව:ප.ව.7.50
පෙර සටහන්: මුතුමාලි මෙනවිය.
මෙතැන් සිට: සචිනි මෙනවිය.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය.</u>

ප්‍ර: ඒ අනුව පියතුමනි කටුවාපිටිය පල්ලිය සිද්ධස්ථානයක් හැටියට ඕනෑම කෙනෙකුට ඕනෑම වෙලාවකට ඇතුල්වීමට හැකි ආකාරයට සකස් කරලා නොතිබුණත් ඔය හාස්කම් හේතුවෙන් ඕනෑම ආගමක කෙනෙක්ට හෝ එවැනි පිහිටක් අවශ්‍යය කෙනෙක්ට ඕනෑම අවස්ථාවක ඇතුළත් වෙන්න පුළුවන් ආකාරයකට පවත්වාගෙන ගිය පල්ලියක් කිව්වොත් හරිද?

උ: ඒකත් සැබෑවක්. මොකද ඔය පසුබිම තුළ බ්‍රහස්පතින්දා දවස් වලට ඒ ප්‍රදේශයේ අය විතරක් නෙවෙයි අනිකුත් පිට පළාත් වලින් පවා භාරහාර වෙන්න භාරහාර ඔප්පු කරන්න කෑම අරගෙන ගිහිල්ලා භාරහාර ඔප්පු වුණාම ඒ කෑම ටික බෙදලා දෙන්න ඉන්න අයට මෙතැන ඒ දේවස්ථානයටත් ජනතාව ඇඳී යනවා තාමත්.

ප්‍ර: ඔබ වහන්සේ සතුව තිබෙන දත්ත අනුව කටුවපිටිය පල්ලියේ මිය ගිය 115 දෙනා අතර එවැනි අනන්‍යාගමික හෝ අන් ජාතීන් කතෝලික නොවන අය මිය ගිය බවට කරුණු ඉදිරිපත් කරන්න පුළුවන් ද මේ සභාවට?

උ: පුළුවන් ස්වාමීනි. මා අර පෙර කිව්ව වගේම කටුවපිටිය දේවස්ථානයේ මුස්ලිම් දරුවෙකු මිය යනවා. දුවෙක්. ගැහුණු ළමයෙක්. ඒ වගේම බෞද්ධ පිරිමි දරුවෙකු මිය යනවා. නමුත් ඔහු තරුණයෙක්. තමන්ගේ විවාහය සිද්ධ කරගන්නා අදහසින් ඒ ප්‍රදේශයේ සිටින කතෝලික තරුණියක් එක්ක සම්බන්ධ වෙලා ඒ දවසේ දී ඔවුන් මේ බෞද්ධ සොයුරා මේ තමන් විවාහ වෙන්නට අදහස් කරන ගැහැණු ළමයත් එක්ක උත්සව දිනයක් නිසා කෑමට ආරාධනා කරලා තිබෙන දිනයක් නිසා මේ දේවස්ථානයට ගිහිල්ලා ඒ ආශීර්වාද ලබාගැනීමට යනවා ඒක නිසා අපි දකිනවා බෞද්ධ එක පිරිමි දරුවෙක් වැඩිහිටියෙක් විදියට මිය යනවා. ඒ වගේම තව පවුලක් තියෙනවා එම පවුලේ අම්ම කතෝලික තාත්තා මුස්ලිම්. ඒ පවුලේ ඉන්නේ දියණියන් දෙදෙනෙක්. එක දියණියක් අවුරුදු 21 ක් වගේ වෙනවා දෙවැනි දියණිය අස්ලා කියලා මුස්ලිම්. ඇය කතෝලික වෙලා තිබුණේ නැහැ ඇයට අවුරුදු 14 යි. නමුත් කතෝලික ආගමට ලොකු ලෙන්ගතුකමක් දක්වනවා. අම්මා ලොකු දුවව ගන්නවා මගේ ආගමට දෙන්න කියලා. පොඩිදුවට තාත්තා කියනවා ඔයාට කැමති තීරණයක් ගන්න කියලා. තාත්තා මුස්ලිම්. මේ දියණිය අක්කගේ අභාෂයට අම්මගේ අභාෂයට හැදෙනව වැඩෙනවා. නමුත් කතෝලික වෙලා නැහැ ක්‍රිස්තියානි වෙලා නැහැ. හැබැයි ක්‍රිස්තියානි වෙන්න ආසාවෙන් හිටපු දියණියක් ගොඩක් ලොකු ලෙන්ගතුකමක් දක්වන දියණියක්. මෙන්න මේ දියණිය මුස්ලිම් විදියට එදා අක්කත් එක්ක

FAIR COMMENT BY JEZEEM

අම්මත් එක්ක දේවස්ථානයේ දී හසුවෙලා මේ අස්ලා කියන අවුරුදු 14 ක දියණිය කටුවාපිටිය දේවස්ථානයේ දී මිය යනවා. ඒ දේවස්ථානය තුළ අපි දකිනවා මුස්ලිම් සොයුරියක් සහ බෞද්ධ සොයුරෙක් එම දේවස්ථානයේ දී මිය ගිහිල්ලා තියෙනවා. අනන්‍යාගමිකයන් විදියට.

ප්‍ර: ඒ අනුව ඔබ වහන්සේ සතුව මේ දත්ත ඇතුළත්ව යම්කිසි ලේඛනයක් තිබෙනවා ද මේ පල්ලි දෙකෙහි කටුවපිටිය පල්ලියේ සහ කොච්චිකඩේ පල්ලියෙහි ඔබ වහන්සේ ඔය පැහැදිලි කරන ලද ආකාරයට මිය ගිය ඒ 115 දෙනා කටුවපිටිය පල්ලියේ කුමන ආගම් වලට අයත් අයද, කොච්චිකඩේ පල්ලියේ මිය ගිය 56 දෙනා කුමන ආගම් වලට අයත් අයද කියන කාරණාව පැහැදිලි කරන ආකාරයේ ලේඛනයක් තිබෙනවා ද?

උ: ඔව්. මා සතුව තිබෙනවා. එම ලේඛනයේ තුවාල වුණු අයගෙත් සඳහනක් තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: ඔබ වහන්සේ මේ ඉදිරිපත් කරන ලද ලේඛනයේ තුවාලලත් අයගේ ප්‍රමාණයන් දැක්වීමකුත් කරලා තිබෙන නිසා සාක්ෂියක් වශයෙන් ඔබ වහන්සේට පැහැදිලි කරන්න පුළුවන් ද කොච්චි කඩේ පල්ලියෙන් කොපමණ ප්‍රමාණයක් පුද්ගලයින් තුවාල ලැබුව ද කියන කාරණාව?

උ: ඔව් ස්වාමීනි මේක අපි සංඛ්‍යා ලේඛන වලට ගත්තේ මේ මරණ ටික බැලුවට පස්සේ අපේ ක්ෂණිකවම 224 දෙනෙක් ස්වාමීලා කන්‍යා සොහොයුරියන් පියතුමන්ලා යොමු කරලා මේ සෑම නිවසක්ම බැහැ දැකලා එක සතියක් ඇතුළත දී මේ තොරතුරු ටික අපි ලබා ගත්තා එතකොට ආරම්භයේ දී අපිට තියෙනවා වාර්තාවක් විදියට කොච්චිකඩේ 128 දෙනෙක් තුවාල ලබලා අපේ ලේඛන ගත වෙලා තිබෙනවා.

ප්‍ර: පවුල් වශයෙන් ගත්තොත් පියතුමනි?

උ: පවුල් වශයෙන් මූලික වශයෙන් ඒ තුවාල ලැබූ අයගේ අපිට තියෙනවා පවුල් කොච්චිකඩේ 121 සහ කටුවා පිටියේ 260 ක් විදියට අපි ලියා පදිංචි කරගෙන තිබෙනවා.

ප්‍ර: කොච්චිකඩේ පල්ලියේ පුද්ගලයන් වශයෙන් තුවාල ලැබූ අය 128 යි එය පවුල් වශයෙන් 121 කින් පවුල් ඒ වගේම කටුවාපිටිය පල්ලියෙහි ?

උ: තුවාල ලැබුවන් 253 දෙනෙක් සහ පවුල් 260 ක් තුළ තමයි මේ 253 දෙනා සිටින්නේ. එතකොට සම්පූර්ණ වශයෙන් තුවාල ලැබුවන් ඒ සතිය ඇතුළ දී අපි වාර්තා කරගත්තා 381 ස්වාමීනි. 381 විදියට අපි ළඟ තොරතුරු සියල්ල තිබෙනවා. ඒ සතිය තුළ ස්වාමීනි මේ වෙන කොට අපි ළඟ තිබෙන දත්ත වාර්තාව අනුව බොහෝ දෙනෙක් සුවය ලබලා තිබෙනවා. නමුත් වෛද්‍යය ප්‍රතිකාර සඳහා යන එන මට්ටමේ අය ඉන්නවා. නමුත් පූර්ණ සුවය ලබලා නැහැ. නමුත් ඒවා අවධානමකින් තොරව ඉන්නවා. නමුත් අවධානම් තත්ත්වයේ ඉන්නවා ස්වාමීනි තවමත් අද වන විටත් කටුවාපිටිය 20 දෙනෙක් සහ කොච්චිකඩේ 17 දෙනෙක් critical කියන අවධානම් මට්ටමේ ඉන්න අය. එතකොට 37 දෙනෙකු තාමත් අපි ප්‍රතිකාර සඳහා යොමු කරන්න මූල්‍යමය අවශ්‍යතා ලබාදීලා

FAIR COMMENT BY JEZEEM

ඔවුන්ගේ ජීවිත සාමාන්‍යය තත්ත්වයකට ගන්න උත්සහා කරනවා. ඒ අතර පිරිසක් ඉන්නවා සාමාන්‍යය තත්ත්වයට ගන්නට බැරි paralyse එහෙම නැත්නම් අපි කියන අංශභාගී තත්ත්වයේ ඉන්න රෝගීන් ඉන්නවා කකුල් කපපු රෝගීන් ඉන්නවා සඳහටම අත් පණ නැති රෝගීන් ඉන්නවා ස්වාමීනි. ඒ වගේ පිරිසක් අනුව තමයි 37 දෙනෙක්ලා අපි මේ වෙන කොට ප්‍රතිකාර වලට යොමු කරලා තියෙනවා. ස්වාමීනි අන්තිම රෝගියා අපේ ගෙදර අරන් ගියේ ගිය සිකුරුදා. මාස 14 කට පස්සේ තමයි ස්වාමීනි අන්තිම රෝගාතුරයා රෝහලේ හිටිය අන්තිම රෝගියාව අම්ම කෙනෙක් තිළිණි හර්ෂණී කියලා තමන්ගේ දරුවා අහිමි වුණා. ඒ වගේ තමයි තමන්ට ඇහැක් නැහැ අහිමි වුණා. ඒ වගේම උකුලෙන් පහළ පණ නැහැ. ඒ වගේම ඇඟිලි 10 න් එක ඇගිල්ලයි වැඩ කරන්නේ ඒ වගේම තවමත් බුලට්ස් ඇගේ තිබෙනවා. ප්‍රතිකාර මූලික නමුත් ඉවර කරලා Surgery ඔක්කොම කරලා තව මාස 14 යි දවස් ගාණකට පස්සේ අපි විශේෂ කාමරයක් ඇයට නිර්මාණය කරලා දීලා ගෙදර ඇයව මේ වෙන කොට කටුවපිටියේ තමන්ගේ නිවසේ විශේෂ කාමරය තුළ වෛද්‍ය උපදෙස් මත සහ විශේෂයෙන්ම හෙදියෙක් එක්ක පැය 24 ම ඒ කාමරේ නතර කරලා ඒ අම්මව තියලා තියෙනවා අවුරුදු 33 යි වයස.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේ දී පියතුමන් විසින් ඉදිරිපත් කරන්නට යෙදුණු කටුවාපිටිය සහ කොච්චිකඩේ පල්ලියේ මිය ගිය අයවලුන් තුවාල ලැබූ අයවලුන් ඔවුන්ගේ ජාතීන් වශයෙන් ආගම් වශයෙන් ද වයස් කාණ්ඩ වශයෙන් ද ලිපිනයන් ද සහිතව ඇතුළත් කරමින් සකස් කරන ලද සම්පූර්ණ ලේඛන කට්ටලය ඇතුළත් මෙම ගොනුව සලකුණු කිරීමට මුලින්ම අවසර අයැද සිටිනවා C 730 වශයෙන් ඉන් අනතුරුව ගරු සභාපතිතුමනි ගෞරවයෙන් අවසර අයැදි සිටිනවා මේ C 730 ලේඛනයේ කටුවා පිටිය පල්ලියේ මිය ගිය අයවලුන්ගේ සංඛ්‍යාව දැක්වෙන ලේඛනය C 730 A වශයෙන් ද එම C 730 A කියන ලේඛනයට ගරු සභාපතිතුමනි කොටස් දෙකක් තිබෙනවා. මන්ද පසු අවස්ථාවකදී මිය ගිය අය දෙදෙනාගේ නම් වෙන්ව සඳහන් කරලයි තියෙන්නේ. ඒ වගේම කොච්චිකඩේ පල්ලියේ මිය ගිය අයවලුන්ගේ නම් කරන ලද ලේඛනය C 730 B වශයෙන් ද කටුවපිටිය පල්ලියෙහි තුවාල ලත් අයගේ නම් ඇතුළත් ලේඛනය C 730 C ලේඛනය වශයෙන් ද කොච්චිකඩේ පල්ලියේ තුවාලලත් අයගේ නම් ඇතුළත් ලේඛනය C 730 D වශයෙන් ද සලකුණු කිරීමට අවසර අයැද සිටී.

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>.

ප්‍ර: පැහැදිලි කර ගැනීමක් සඳහා පියතුමනි දැන් ඔබතුමා මීට කලින් සාක්ෂි දෙමින් කිව්වා මේ සෙත්සරණ ඔබ වහන්සේ ඉන්නේ මේ බස්නාහිර පළාත සම්බන්ධයෙන් කටයුතු කරනවා කියලා?

උ: එහෙමයි.

ප්‍ර: දැන් ඔබ වහන්සේ කොමිෂමට සපයනු මේ දත්තයන් ඒ කියන්නේ මිය ගිය අය තුවාල ලැබූ අය ඒ දත්තයන් වල අඩංගු වන්නේ එම සිද්ධි වලින් සම්පූර්ණයෙන්ම රට එක්කෝ හිටපු පළාත ගැන මේ නොසලකා හැරලා තුවාල වුණු සහ මියගිය සංඛ්‍යාව ද?

උ: ඔව්, ස්වාමීනි තව ලේඛනයක් මා සතුව තිබෙනවා බස්නාහිර පළාතෙන් පිටත පවුල් 32 ක් ඉන්නවා ස්වාමීනි කොච්චිකඩේ සිද්ධස්ථානයෙන් විපතට පත් වුණ ඒකත් හොඳ කරුණක් වෙනවා අපට මොකද මේකට හැම ප්‍රදේශයෙන්ම එනවා කියන එකට පවුල් 32 ක් ඉන්නවා ස්වාමීනි වෙන පිටපළාත් වලින් ඒ කියන්නේ නුවර එළිනේ ඉන්නවා. මස්කෙළියෙන් ඉන්නවා. හැටන් වලින් ඉන්නවා. යාපනයෙන් ඉන්නවා. මේ පිටස්තර ඒකේ ලේකනයකුත් මා සතුව තියෙනවා ස්වාමීනි පවුල් 32 ක් හැබැයි එකත් මේකට අඩංගු කරලා තියෙන්නේ ඒ ආකාරයෙන්ම ස්වාමීනි අපේ සෙත්සරණ ආයතනය වගේම හැම රදගුරු වසමකම තිබෙනවා මේ වගේ සමාජ සේවා ආයතනය කරන ආයතනයක්. අන්න ඒ ආයතනයට අපි මේ දත්ත සපයලා සමහර අය මේ කුලී පදනම මත ස්වාමීනි ජීවත් වෙනවා. නමුත් ඒ ගොල්ලන්ගේ හරි නිවාස තියෙන්නේ වතුකරයේ. ගොඩක් අය ඉන්නේ වතුකරයේ. එතකොට ඒ අය තමයි සොයුරි සොයුරියන් එහේ ඉන්නේ. අම්මල තාත්තල එහෙ ඉන්නේ. එතකොට ඒ අය මේ ප්‍රතිකාර ලබන පවුල් Affected කියලා අපි ගණන් ගත්තා. මේ සෑම මිය ගිය හෝ තුවාල ලැබූ පවුලක් අපි නම් කරා Affected කියන වචනය පාවිච්චි කරා. ඒ ඒ පවුල් විදියට තමයි ස්වාමීනි අපි ඒ සෑම කෙනෙක්ම ලියා පදිංචි කරගෙන මේ වැඩ සටහන ආගම් භේදයක් මේ ජාති භේදයක් නොරව අපි ස්වාමීනි මේ වැඩසටහන ක්‍රියාත්මක කරනවා. මේකේ විශේෂත්වයක් තියෙනවා ස්වාමීනි මේ සිදුවීම වෙලා දවස් දෙකකට පසුව අපි අගරදගුරුතුමා අපෙන් ඉල්ලීමක් කරනවා මේකට ගැළපෙන පියතුමන්ලා එක්ක මේකට වැඩපිළිවෙළක් හදන්න කියලා ස්වාමීනි. අපි ඒ වැඩපිළිවෙල නිර්මාණය කරනවා විශේෂ නමක් යොමු කරලා මේකේ අංග 03 කට අගරදගුරුතුමා උපදෙස් දෙනවා ක්‍රියාත්මක කරන්න කියලා අපි අර Need Assesment එක ගත්තට පස්සේ ස්වාමීනි. අපි හඳුනගන්නවා අංග තුනක්. මේ ගොල්ලන්ට අවශ්‍ය කරනවා අධ්‍යාත්මික වැඩසටහන් මොකද මේක අධ්‍යාත්මික ගෙනදෙන තැනක තමයි සිද්ධ වුණේ. ලොකු ප්‍රශ්න මේ ගොල්ලොන්ගේ පවුල් ජීවිත වල ඇති වෙන්න පටන් ගත්තා පියතුමන්ලා ප්‍රතික්ෂේප කරන්න පටන් ගත්තා අපිට දෙයියො මෙහෙට මොකද කළේ

FAIR COMMENT BY JEZEEM

කියලා එතකොට අපි හඳුනාගත්තා. අධ්‍යාත්මික ලොකු ආරවුලක ජීවත් වෙනවා කියල ඊට පස්සේ අධ්‍යාත්මිකව මේ ගොල්ලන්ට වැඩ සටහනක් පටන් ගත්තා. ඒ වගේම කවුන්සලින් උපදේශන වැඩසටහනකුත් Trauma කවුන්සලින් එහෙම වෙනස් කරලා ඒකට නිපුණ පළපුරුදු තියෙන සුදුසුකම් තියෙන professional කණ්ඩායමක් එක්ක කවුන්සලින් වැඩසටහන් පටන් ගත්තා. ඉන් අනතුරුව පටන් ගත්තා සමාජ සේවා social Aspect එක social යටතේ කරුණු 05 ක් යටතේ ස්වාමීනි අපි මේ පවුල් වල තිබෙන අවශ්‍යතාවයක් Analyse කරලා ඒ අවශ්‍යතාවයන් ඉටු කරන්න ක්‍රියාත්මක වුණා. ඒකේ සංක්ෂිප්ත පත්‍රිකාවකුත් අප සමඟ තියෙනවා ස්වාමීනි භාෂා 03 නෙන්ම අපි මේ පත්‍රිකාව ජනතාව අතරට බෙදලා දුන්නා. ක්‍රියාත්මක වෙද්දි අපිට දුරකථන ඇමතුම් වලින් සම්බන්ධ කරගෙන මේ වැඩසටහනේ දී අපිත් එක්ක සම්බන්ධ වෙන්න පුළුවන් කියලා ස්වාමීනි. ඒ පත්‍රිකාවේ මේ සියළුම කරුණු ඇතුළත් කරලා තියෙනවා. එතකොට පළවෙනි සතිය වෙද්දී අපි වැඩසටහන සූදානම් කරලා දත්ත ටික Analyse කරලා මේ වැඩසටහන තුන් ආකාරයකින් ස්වාමීනි අප පදවිය තුළ ක්‍රියාත්මක කරා. ඒ වගේම පිට පදවි වලත් දමිළ භාෂාවෙන් අර තැන් තැන් වල ඉන්න අයටත් උපදෙස් දීලා ඒ ප්‍රදේශයේ ඉන්න කවුන්සලස්ලා ඒ ගෙවල් වලට යවලා සමහර විට රෝගාතුර වෙලා රෝගීයා තමන්ගේ දරුවා ස්වාමීපුරුෂයා hospital එකේ ඉද්දි ඒ අය ඉන්නේ වෙන පළාත් වලට. එතකොට ඒ ගොල්ලන්ට උපදේශනය දීලා සහ ඒ වැඩ කටයුතු මෙහෙන් ක්‍රියාත්මක වන අවශ්‍ය කරන වියහියදම් දරලා ඒ අය එහෙට ගෙන්වලා දවසක් දෙකක් තියාගෙන මේ රෝගීයාව බලලා යන්න ඒ වගේ දීර්ඝ වැඩසටහනුත් අපි නිර්මාණය කරලා අද වන තුරුත් ඒ වැඩ සටහන ක්‍රියාත්මක වෙනවා ස්වාමීනි.

ප්‍ර: ඔබ වහන්සේ මේ පැහැදිලි කරන්නට යෙදුණු විශාල වැඩපිළිවෙල තුළ එහි සහනය ලැබූ තුවාල ලත් අයවලුන්ට අදාළ ඡායාරූප කිහිපයක් ඔබ වහන්සේට මේ ගරු සභාවට ඉදිරිපත් කිරීමට හැකියාවක් තිබෙනව ද?

උ: ඔව් ස්වාමීනි. අපිට හැකියාවක් තිබෙනවා කිහිපයක් අපිට ඉදිරිපත් කරන්න පුළුවන්.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේ දී එකී ඡායාරූප දර්ශනය කිරීමට ද හැකියාවක් තිබෙනවා නිරය මත එය දර්ශනය කිරීමට අවසර අයැද සිටිනවා. ඉන් අනතුරුව ඒවා සලකුණු කිරීමට ද අවසර අයැද සිටිමි.

උ: ස්වාමීනි මේ ඔබ දකිනේ ස්වාමීනි පවුලක අම්ම අහිමි වෙච්ච දියණියකගේ දර්ශනයක් ඒ පවුලේ ඉන්නෙ දියණියන් තිදෙනෙක් විතරයි. ගැහුණු ළමයි තිදෙනෙක් විතරයි මේ ඉන්නේ. සමාවෙන්න ස්වාමීනි. ඩැරන් කියන දරුවා තමයි ස්වාමීනි මේ ඉන්නේ මේ දරුවා සම්පූර්ණ පිළිස්සීමට ලක් වුණා ස්වාමීනි. ඒ වගේම මේ දරුවගේ

FAIR COMMENT BY JEZEEM

සුවිශේෂී තත්ත්වය තමයි අම්මා මිය ගියා ස්වාමීනි. මේ දරුවා අවුරුදු 10 යි ඉංග්‍රීසි බසින් තමයි මේ දරුවා ඉගෙනුම ලබමින් සිටියේ. මේ දරුවා හැමදාම කිව්වේ මට රතු පටියක් ගෙනැල්ලා මාව අශිර්වාද කරන්න කියලා තමයි English වලින් හැමදාම කිව්වේ. අපි දවස් කිහිපයක්ම උත්සාහ කළා ස්වාමීනි රෝහලට ඇතුළු වෙන්න අපිට අවසර දුන්නේ නැහැ පිළිස්සීම් සහිතව තියෙන නිසා. මේ දවස් 17 කට පස්සේ අගදරුතුමා මේ දරුවට විශේෂ අවසරයක් අරගෙන ගිහිල්ලා ඒ ස්ථානයේ දී ආශිර්වාද කරන දසුනක් තමයි තියෙන්නේ ස්වාමීනි. මේ දරුවා තාමත් පිළිස්සීම් සහිතව විශේෂ ආවරණයක් එක්ක තමයි ජීවත් වෙන්නේ ඒ වගේම ඒ දරුවා කුලී නිවාසක පදනමක ඉන්නේ. ඒ වගේම අපේ ජාතික රෝහලෙන් තමයි මේ දරුවට මූලික ප්‍රතිකාර කළේ ස්වාමීනි. නමුත් බෙහෙත් හේත් වලට අපි ලොකු විශාල වියදමක් මේ දරුවට දීලා තියෙනවා. හිසේ තුවාල තියෙනවා. ඒ වගේම මුහුණ ප්ලාස්ටික් සෙජරි එකට ලක් කරන්න නියමිතව තියෙනවා. තාම කල් ඇති බව තමයි අපිට දැනුම් දීලා තියෙන්නේ ස්වාමීනි. ඒ නිසා මනෝ උපදේශනය මේ දරුවටත් පවුලේ සියළු දෙනාටත් අපි යොමු කරමින් ඉන්න අවස්ථාවක් තමයි අපිට දැනුම් දෙන්න පුළුවන් ස්වාමීනි මේ පුතා ගැන.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේ දී මේ ඡායාරූප පිළිබඳව පියතුමන් විසින් විස්තර කිරීම් කරන බැවින් ඡායාරූප 08 කින් යුත් එම කට්ටලය C 731 වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා. එයින් පළමු ඡායාරූපය මේ අවස්ථාවේ දී පියතුමන් විසින් පැහැදිලි කිරීම් කරන ලද ඡායාරූපය C 731 A වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා. ගෞරවයෙන් නිවැරදී කිරීමට අවසරක් අයැද සිටිනවා. ගරු සභාපතිතුමනි ඡායාරූප 08 ඇතුළත් කරන ලද CD තැටිය C 731 වශයෙන් ද ඉන් අනතුරුව එක් එක් ඡායාරූපය වෙන් වශයෙන් එහි මුද්‍රිත පිටපත් වෙන් වෙන්ව සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා. මේ අවස්ථාවේ දී එම දර්ශනය කරන ලද ප්‍රථම ඡායාරූපයට අදාළ එහි මුද්‍රිත පිටපත පළවෙනි ඡායාරූපය C 731 A වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා.

උ: මේ ඉන්නෙත් ස්වාමීනි ඒ දරුවම තමයි. මෙම රෝහලෙන් පිට වෙලා අගදරගුරුතුමන් බැහැ දකින අවස්ථාවක තමයි ඒ එහා පැත්තේ ඉන්නේ ස්වාමීනි පියා. පියාත් පිළිස්සීමට ලක් වෙලා සිටින පියෙක් විදියට තමයි තියෙන්නේ. ඒ පියාගේ අත ආවරණයක් ඇති කරලා තියෙන ආකාරයත් අපිට දැන ගන්නට පුළුවන්. මේ දරුවගේ තාමත් මේ ප්ලාස්ටික් සැත්කම අපි කරලා නැහැ. ඒ සම ඒ ආකාරයෙන් තාම සවිමත් වෙලා නැති නිසා මේ දැන් අම්මා නැතිව ඉන්නේ ස්වාමීනි. මේ කුලී රැකියාව තමයි කරන්නේ. ආච්චිගේ නිවහනේ තමයි මේ දරුවෝ දෙදෙනා තියලා මේ

FAIR COMMENT BY JEZEEM

පියා රැකියාවක් කරලා ආදායම උත්පාදනය කරගන්නට උත්සාහ කරන්නේ. කුලී නිවහනක දැනට ඔවුන් පදිංචිව සිටිනවා ස්වාමීනි.

එම පැහැදිලි කිරීම කරන ලද ඡායා රූපයේ මුද්‍රිත පිටපත C 731 B වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා.

උ: මේ ස්වාමිනි සයුර සත්සර කියන දරුවා. කටුවපිටියේ තුවාල ලබලා ඔළු කටුව දවස් 28 ක් ගලවලා තියලා ඒ ඔපරේෂන් එකෙන් පස්සේ ඒ ඔළුව නැවතිලා ඔළුකටුව සවිකරලා අපිට බලන්න ගිය අවස්ථාවකදී අපි ගත්ත ඡායාරූපයක් මේක අපිට බලන්න යන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. හයිකරාට සවිකරාට පසුව තමයි තියෙන්නේ මෙයා මානසිකව සෑහෙන්න කව පීඩා විඳින දරුවෙක්. මෙයාගේ අම්මා නැති වුණා ස්වාමීනි. නමුත් මේ සිදුවීමෙන් නෙවෙයි මීට පෙර තමයි අම්මා නැති වෙලා තියෙන්නේ තාත්තත් එක්ක ජීවත් වෙන දරුවෙක් හරිම අහිංසක දරුවෙක් විදියට තමයි ගමේ ප්‍රසිද්ධ. ඒ දරුවගේ තත්ත්වය තාම හරියට කතා කරන්නේ නැහැ තිගැස්සීම තියෙනවා වෛද්‍යයවරු මනෝ චික්සක වෛද්‍යයවරු වෙත යොමු කරලා තියෙනවා. කාලයත් එක්ක සුවය ලබයි කියලා තමයි ඉන්නේ. මේ දරුවා බලා ගන්න ඉන්නේ ස්වාමීනි ආච්චි කටුවපිටිය ඒ නිවහනේ. හරිම අමාරුයි මේ දරුවව නිවහනේ තියාගන්න. ඒ වගේම කකුල තාමත් කොටවෙලා තියෙන්නේ ඔපරේෂන් එකෙන් පස්සේ ඒ වගේම අපේ එක අතක ඇඟිලි වැඩ කරන්නේ නැහැ. ශල්‍යායකර්ම වලට භාජනය කරලා තියෙනවා. ඒ වගේම අගදරුගුරුතුමාගේ ඉල්ලීම පරිදි ඉන් පස්සේ ප්‍රතිකාර සියල්ලම පෞද්ගලික රෝහල් වල තමයි මේ දරුවා වෙනුවෙන් කළේ. ඉතිං මොළේ තුවාල සිදුවී ඇති බවටත් සාක්ෂි වෛද්‍යයවරු කියලා තියෙනවා. ඒ වගේම පාදය සහ අත් වල බෝම්බවල කොටස් තිබෙන බවත් ඒ නිසාම අප්‍රාණික තත්ත්වයේ තියෙන බවත් ඒවා අයින් කරන්නට නොහැකි බවත් අපිට වෛද්‍යයවරු ප්‍රකාශ කරලා තියෙන ඡායාරූපයක් ස්වාමීනි මේ තියෙන්නේ.

එම පැහැදිලි කිරීම කරන ලද ඡායා රූපයේ මුද්‍රිත පිටපත C 731C වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා ගරු සභාපතිතුමනි.

උ: මේ ස්වාමිනි කටුවපිටිය දේවස්ථානයේ පවුලේ දරුවා දෙදෙනයි ස්වාමියයි සියළු දෙනාම මිය ගිහිල්ලා අම්ම විතරක් අනුෂා කුමාරි කියන මේ තැනැත්තිය පමණයි මේ නිවහනේ දැන් මේ පවුලේ ඉතුරු වෙලා ඉන්නේ. හැබැයි ඇයත් ඒ ආකාරයෙන්ම අධික ලෙස තුවාල ලැබුවා. ඒ අවස්ථාවේ දී ගෙදර ගෙනාපු අවස්ථාවේ දී ගත්ත ඡායාරූපයක් තමයි අපි දකින්නේ. අවුරුදු 17 ක පුතණුවන්. අවුරුදු 21 දියණියක් මිය ගියා. ඒ වගේම ස්වාමිපුරුෂයත් මියගියා. යම්කිසි වත්කමක් තියෙන පවුලක් විදියට නම් දරලා තිබෙන පවුලක්. සුවිශේෂී වෙන්නේ මේ මිය ගිහිල්ල

FAIR COMMENT BY JEZEEM

දවස් 12 වැනි දවසේ දී ඇයගේ අතට හමුවෙනවා ලිපිය දියණිය තෝරාගෙන තියෙනවා කියලා විශ්ව විද්‍යාලයට තේරීපත් වෙච්ච ලිපිය ඇයගේ අතට ලැබුණා. ඒ ලිපියත් එක්ක තමයි ඇය තාමත් නිදාගන්නේ.තාමත් ඇයව ගොඩ ගන්නට අපහසුතාවයකින් ඉන්නේ. ගොඩක් සුවය ලබලා ඉන්නවා. නමුත් හරිම අවධානම් තත්ත්වයක ඉන්න අම්ම කෙනෙක් විදියට තමයි අපිට හඳුන්වන්න පුළුවන් කිහිප අවස්ථාවකදීම තමන්ගේ ජීවිතය අහිමි කරගන්න උත්සාහ කරා. මේ වගේ අම්මලා 08 දෙනෙක් ඉන්නවා. තනි එක්කෙනෙක් විදියට එකතුවෙලා අම්මලා දෙදෙනෙක් සහ පිරිමි 06 දෙනෙක් මේ අපිට ලොකු අවධානමක් තිබෙනවා ස්වාමීනි මේ 06 දෙනා සම්බන්ධයි. එක්කෙනෙක් මොනවහරි කරගත්තොත් මේ 06 දෙනාම වහාබීලා මිය යන මට්ටමේ ඉන්නේ. ඒ නිසා දවස ගාණෙ උදේ හවස අපේ කවුන්සලස්ලා මේ අයත් එක්ක හරිම සම්බන්ධතාවයකින් ඉන්නේ. දවසට හොඳට ඉන්නවා. ඊළඟ දවසේ ආයි කඩා වැටිල නොකා නොබී ඉන්නවා. දැන් එක්කෙනයි ඉතුරු වෙලා ඉන්නේ. උත්සාහයක් දැරුවා මේ අයව අගදරුගුරුතුමා තාමත් උත්සාහ කරනවා මේ අයව විදේශ රටකට යොමු කරලා මේ මතකය අමතක කරලා ජීවත් වෙන්න. මේ ඉන්නේ එවැනි කාන්තාවකගේ ඡායාරූපයක්.

එම පැහැදිලි කිරීම් කරන ලද ඡායා රූපය C 731 D වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි මෙම ඡායාරූපයේ පෙනී සිටින කාන්තාව අප දැනටමත් මේ සභාව ඉදිරියේ C 435 වශයෙන් සලකුණු කර තිබෙන විඩියෝ පටයක පෙනී සිටින ලද කාන්තාව බවට ගරු සභාවේ අවධානය යොමු කර සිටිනවා මේ අවස්ථාවේ දී.

උ: මේ ස්වාමීනි කොව්විකඩේ සිද්ධස්ථානය තුළ තුවාල ලැබූ කෞෂල්‍යා මදුෂානි කියන මව අවුරුදු 29 යි. ඇයට දියණියක් සිටිනවා අවුරුදු දෙකක. ඒ වගේම විවාහක ස්වාමීපුරුෂයා අවුරුදු 29 යි. නගර සභාවේ තමයි මේ ස්වාමීපුරුෂයා සේවය කරන්නේ. මේ කකුල් දෙකම පිළිස්සීමට ලක් වුණා. කැඩුණා එක කකුලක්. දැන් මේ වෙන කොට ඇය රෝද පුටුවෙන් නැගිටිලා අත්වාරු සමඟ වැඩ කටයුතු කරගෙන යන්න උත්සාහ කරනවා. ඇයත් සිටින්නේ කුලී නිවසයක. නමුත් මේ දරුවොත් එක්ක මේ අම්මට යම්කිසි සහනයක් ලබා ගන්න අමාරුයි දරුවා පොඩි නිසා සැමවිටම අම්මව හොයන්නේ. ඒ නිසා තුවාල සුව කිරීමේ ප්‍රවණතාවය අඩුයි. ඒ වගේම කිරිදෙන්න ගියාම වෛද්‍යවරු උපදෙස් දිලා තියෙනවා කිරි දැන් අම්මට එරෙනවා අඩුයි ඒක නිසා දරුවගේ හැදීමේ වර්ධනයට ඒ උපදෙස් දෙන්න කියලා ඒක නිසා හරිම දුක් මුසු තත්ත්වයක තමයි ස්වාමීනි මේ මවත් තාමත් සිය නිවසේ ඉන්නේ. ඉතිං කිහිප අවස්ථාවකම අඬා වැළපිලා ඒ දරුවත් එක්ක ජීවිතය හානි කරගනීදෝ කියන

LAW COMMENT BY JEZEEM

ප්‍රශ්නාර්ථයක ඉන්න තවත් අම්ම කෙනෙක් විදියට තමයි අපිට හඳුන්වන්න පුළුවන් ස්වාමීනි.

එම පැහැදිලි කිරීම කරන ලද ඡායා රූපය C 731 E වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා.

උ: මේ ඔබ දකින්නේ ස්වාමීනි කනගිලිංගම් රීගන් කියන පවුලේ පුංචිම දරුවා. මේ පවුල කොච්චිකඩේ සිද්ධස්ථානය තමයි ස්වාමීනි මේ දේවස්ථානයේ මෙහෙයට සහභාගි වෙන්නට යන්නේ. පවුලේ 04 දෙනෙක් ඉන්නවා. අපිට හඳුන්වන්න පුළුවන් ස්වාමීනි මේ පවුල කොච්චිකඩේ සිද්ධස්ථානයේ ජීවතුන් අතර ඉන්න හරිම ක්‍රිටිකල්ම ෆැමිලි එක විදියට. ඒකට හේතුව ස්වාමීනි භාර්යාවත් එක හා සමානවම අවුරුදු 38 යි භාර්යාවට. මේ දරුවත් එක්කම ප්‍රහාරයට ලක් වෙලා තුවාල ලැබුවා කකුල් දෙකම ඒ වගේම ඉණ ප්‍රදේශය තාමත් ඔත්පලව සිටින්නේ. Wheelchair එක ස්වාමීනි මේ වෙන කොට මේ දරුවට මාස 04 යි ඒ සිදුවීම් වෙද්දී මේ දරුවා සම්පූර්ණයෙන්ම පිළිස්සුණා ස්වාමීනි. සමහර වෛද්‍යයවරු කිව්වේ ඇඟිලි ටික කපලා ඉවත් කරන්න වෙයි කියලා. ඒ තරමටම මොලොක් මේ දරුවගේ මේ ගෙදර ඉන්න ගත්ත ඡායාරූපයක්.අපිට රෝහලේ දී ඡායාරූප ගන්න හැකියාවක් තිබුණේ නැහැ. මේ සුවපත් වෙලා ඉන්න ඡායාරූපයක ලක්ෂණයක් තමයි තාමත් ස්වාමීනි ඇය ශල්‍යයකර්මයකට භාජනය කරන්න බැරි බව වෛද්‍යයවරු ප්‍රකාශ කරලා තියෙනවා. නමුත් විශේෂ ආලේපනයක් ක්‍රීම් එකක් තුළින් මේ සම ශක්තිමත් කරන්න වෛද්‍යයවරු උපදෙස්දීලා විදේශ රටකින් මේකට අවශ්‍යය කරන ප්‍රතිකාර මේ ක්‍රීම් එක දැනට ගෙන්නලා ආලේප කරන්න වැඩකටයුතු කරනවා. මේ පවුලේ ස්වාමීනි තිදෙනෙක්ම තුවාල ලැබුවා. තමන්ගේ වැඩිමල් සොහොයුරත් ඒ වගේමයි. තවත් දරුවෙක්. දරුවෝ 02 දෙදෙනෙක්ම ඉතාමත් දැඩි ලෙස තුවාල ලැබූ පවුලක්. අම්මත් රෝගාතුරයි දැනට තාමත්. ඒ වගේම කුලී නිවහනක ඉන්නේ. අපි ඔවුන්ට නිවහනක් තාවකාලිකව දැනට සපයලා තියෙනවා. කුලී ගෙවාගෙන පදනමක තාත්තට තාමත් රැකියාවට යන්න බැහැ. මාස 14 ක් ගියත් මේ පවුල බලාගෙන ඉන්නේ. ඒවගේම අපි උයන්න Cook කෙනෙක් මේ ගෙදරටසැපවුවා. අවශ්‍ය කරන සියළු දේවල් මාස 08 ක් යනකන් සියළු දෙයින් මේ නිවහනට සැපවුවා. මාසයකට ලක්ෂ 02 ක් යි 40 ක විතර වියදමක් දරලා මාස 08ක් විතර මේ පවුල බලා ගත්තා. හැබැයි මේ පවුලේත් ප්‍රශ්න කිහිපයක් ඇති වුණා ස්වාමීනි. ජනමාධ්‍යයට මේ පවුල කිව්වා මොකුත් කළේ නැහැ කියලා ඊට පස්සේ අපිට සිද්ධ වුණා Social media එකට කියන්න එහෙම නෙවෙයි අපි මේ දේවල් කරලා තිබුණා කියලා. ඒ වගේම ප්‍රශ්නාර්ථ තිබිච්ච පවුලක්. ආගම් දෙකක තමයි ස්වාමීනි ඉන්නේ. තාත්ත එක ආගමක අම්ම එක ආගමක. ඉතින් කවුන්සලස්ලා යොමු කරත් ඒ ගොල්ලන්ට කිසිම සහයෝගයක්

FAIR COMMENT BY JEZEEM

කවුන්සලස්ලට දක්වන්නේ නැති ස්වභාවයක් තමයි තියෙන්නේ මේ ගොල්ලොන්ට තියෙන්නේ මුළු පවුලම විදේශගත රට යන්න තමයි අගදරුතුමාට හැම විටම රට යවන්න කියලා තමයි ඉල්ලුවේ. නමුත් යූඑන් එකටක් ඒ ගොල්ලෝ කිව්වා මාධ්‍යයටත් කිව්වා නමුත් කිසිම පිළිසරණක් ඔවුන්ට ලැබුණේ නැහැ. එහෙම යවන්න හැකියාවකුත් නැති බව අපිත් ප්‍රකාශ කළා ඉස්සෙල්ලා සුවය ලබන්න කියලා ඒ ජාතික රෝහලේ ප්‍රතිකාර ලබමින් ඉන්න කොට දරුවා දෙදෙනා හිටියේ තවත් රෝහල් දෙකක. මේ තාත්තා දිවිනසා ගන්න උත්සහා කරා රීගන් කියන තාත්තා මේ දෙවැනි කසාදය තමයි ඒ තාත්තා ඉන්නේ. සමාවෙන්න ස්වාමිනි දෙවැනි කසාදය කරගෙන ඉන්නේ අම්මා. අම්මා බැඳලා ඉන්නේ දෙවැනි වතාවට. වේදනාකාරී අත්දැකීමක් ඒ ගොල්ලොත් යම් කිසි ආකාරයක ජීවිතය කලකිරීමක් සහ දිවිනසා ගන්නවා කියන මට්ටමක ඉන්නවා පවුලක් විදියට හිටිය නිසයි අපි ඒ ඡායාරූපය මේ ස්ථානයට ගෙනාවේ.

එම පැහිදිලි කිරීම කරන ලද ඡායාරූපය මුද්‍රිත කරන ලද පිටපත C 731 F වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා.

උ: මේ දකින්නේ ස්වාමීනි ඒ පවුලේ ඊළඟ දරුවා වැඩිහිටි දරුවා. එයාගේ ඊළඟ පුතා මෙයත් තාමත් රෝගාතුර වෙන්නේ සම්පූර්ණ පිළිස්සීමට ලක් වෙලා ඉන්න අවස්ථාවක දී ගෙදර ගෙනාපු අවස්ථාවක දී ගත්තු ඡායාරූපයක් ස්වාමිනි. බඩේ ඔපරේෂන් එකක් කරලා නමුත් හරියට පෙනහැල්ල ළඟ තාමත් ඒ යකඩ බෝලයක් තියෙනවා කියලා හඳුනාගෙන තියෙනවා. නමුත් ඔබරේෂන් කරලා ගන්න බැහැ. ඒක නිසා ශ්වසන ආබාධයක් එකක් තමයි මේ දරුවා තාම ඒ පවුලේ ඉන්නේ.

එම පැහැදිලි කිරීම කරන ලද ඡායාරූපය C 731 G වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා.

උ: ස්වාමීනි මේ ඉන්නේ ඒ පවුලේ සියළු දෙනා තමයි ස්වාමීනි. තුවාල ලබලා ඔය ගෙදර ඉන්න ඔය ඉන්නේ ඔය රීගන් කියන්නෙ අම්මා. එයාගේ ස්වාමීපුරුෂයා ඔය ගෙදර ඉන්න ඡායාරූපයක් තමයි ස්වාමීනි මාස 03 ට විතර පස්සේ අපි නිවසට ගිහිල්ලා ගත්තු ඡායාරූපයක්. ඔවුන්ට මේ වෙන කොට අපේ සහයෝගය සියල්ල දීලා තියෙනවා නමුත් මානසිකව බොහෝ සේ ඇඳ වැටිලා ඉන්න පවුලක් විදියට නම් කරන්න පුළුවන්.

එම පැහැදිලි කිරීම කරන ලද ඡායාරූපයේ මුද්‍රිත පිටපත C 731 H වශයෙන් සලකුණු කිරීමටත් අවසර අයැද සිටිනවා.

ප්‍ර: දැන් පියතුමනි ඔබ වහන්සේ පැහැදිලි කිරීම් කරා මූලික වශයෙන් මේ 2019 අප්‍රෙල් 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාර වලින් තුවාල ලත් සහ මිය ගිය අයවලුන් සංඛ්‍යාවන් වශයෙන් ද ඔවුන්ගේ ඇතැම් අයගේ

FAIR COMMENT BY JEZEEM

ඡායාරූපත් ඉදිරිපත් කරා. ඒ කරුණු ඉදිරිපත් කළේ කටුවපිටිය පල්ලිය සහ කොච්චිකඩේ පල්ලියට අදාළව. පියතුමනි ඔබ සතුව තිබෙනවා ද මේ ඔබ වහන්සේ සඳහන් කරන්නට යෙදුණු තුවාල ලත් මියගිය අයවලුන් සඳහා සෙත්සරණ ආයතනයෙන් ලබාදෙන ලද මූල්‍යමය සහ වෙනත් ආධාරයන් වෙන් වෙන් වශයෙන් දැක්වෙන ආකාරයේ ලේඛනයක් ?

උ: ඔව් ස්වාමීනි. ඒ ලේඛනයේ මට සමාවෙන්න ඒ ලේඛනයේ මුල් පිටුවල තියෙන්නේ අපිට ලැබිච්ච මුදල් එක්කමයි ස්වාමීනි. ඒක අයින් කරලා මට ඉදිරිපත් කරන්න පුළුවන් ස්වාමීනි. ඒ පවුල් 280 ටම කොයි ආකාරයෙන් ද මූල්‍යමය දායකත්වය ලබා දීලා තියෙන්නේ කියලා ස්වාමීනි ලබා දීමට හැකියාවක් තිබෙනවා.

ප්‍ර: මූලික වශයෙන් කොච්චිකඩේ පල්ලියෙහි මූල්‍යමය ආධාරයන් ලබාදෙන ලද සියළුම තොරතුරු ඇතුළත් ලේඛනය ගරු සභාවට ලබා දෙන්න පියතුමනි. මේ ලේඛනයේ පවුල් වශයෙන් තමයි ඔබ වහන්සේ මේ කරුණු දත්ත ඇතුළත් කරලා තියෙන්නේ කිව්වොත් හරිද?

උ: හරි ස්වාමීනි. ඒකේ අපි කළේ ඒ සෑම උපකාරයක්ම කළේ පවුල් අරමුණු කරගෙන මිසක් මොකද ලෙඩ රෝගාතුර වෙලාඉන්න අයට සල්ලි අතට දෙන්න හැකියාවක් නැහැ රැක බලා ගන්න අයට තමයි ස්වාමීනි අපි ඒ උපකාර සෑම දෙයක්ම පවුල් අරමුණු කරගෙන තමයි ලබාදුන්නේ.

ප්‍ර: ඒ අනුව කොච්චිකඩේ පල්ලියෙන් අතවරයට පත් වූ මිය ගිය මහ තුවාලලත් අයවලුන් සංඛ්‍යාවක් වශයෙන් පවුල් වශයෙන් කියකට ආධාර සපයලා තියෙනව ද?

උ: කොච්චිකඩේ සිද්ධස්ථානය පවුල් 114 කට ස්වාමිනි මූල්‍යමය ආධාරය සපයලා තියෙනවා. ඒකේ මුළු එකතුවත් තියෙනවා. මිලියන 41 යි දශම 9 ක් විදියට ස්වාමීනි. එකේ සමහර පවුල් වලට මූල්‍යමය ආධාරය දුන්නේ නැති ප්‍රශ්න කිහිපයක් තිබුණා ස්වාමීනි. මුළු පවුලම අහිමි වෙච්ච අවස්ථාවක දී අපි ඥාතීන්ට මූල්‍යම ආධාරය ලබා දුන්නේ නැහැ. එහෙම පවුලක් තියෙනවා ස්වාමීනි ඒක අතහැරුණා. ඒ වගේම විවාහයන් දෙකක් කර ගත්තු ස්වාමිපුරුෂයෙක් මිය ගිහිල්ලා තිබෙනවා ස්වාමීනි විවාහයන් 02 ක් සහ Living together තවත් කාන්තාවත් එක්ක සම්බන්ධතාවයක් පවත්වලා මේ තුන්දෙනාටම දරුවෝ සිටිනවා ස්වාමීනි. නමුත් ඒ ගොල්ලොන්ට තුවාල ලබපු අය නැහැ ස්වාමීනි. ඒක නිසා අපි මූල්‍යමය දායකත්වය මේ නීතිමය ප්‍රශ්න තිබිච්ච පවුලක් විදියට ඒ පවුලට දුන්නේ නැහැ ස්වාමීනි. අනිත් අයට ඒ ආධාර පවුල් 114 කට අදාළ මූල්‍යමය දායකත්වය ලේඛනය තිබෙනවා.

කොච්චිකඩේ පල්ලියහි සිදුවූ බෝම්බ පිපිරීමෙන් අනතුරට පත් පවුල් වශයෙන් පවුල් 114 කට සෙත්සරණ කැරිටාස් කොළඹ ආයතනය මඟින් ලබා දෙන ලද මිලියන 41 යි නමසිය හතර දහස් හතරක මුදලක් ඇතුළත් එකී ලේඛනය මෙම සභාවට C 732 වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ වගේම පියතුමණි කටුවපිටිය පල්ලියට අදාළව අනතුරට පත් පවුල් වලට දෙන ලද මූල්‍යමය ආධාරයන් ඇතුළත් කරන ලද ලේඛනයක් ඔබ වහන්සේ සතුව තිබෙනව ද?

උ: තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: ඒ ලේඛනයට අනුව පවුල් කියකට මූල්‍යමය ආධාර සපයලා තියෙනව ද?

උ: පවුල් 281 ට මූල්‍යයමය ආධාරය සපයලා තියෙනවා ස්වාමීනි. මිලියන වශයෙන් ගත්තොතින් එහෙම මිලියන 95.579 ක මුදලක් තිබෙනවා ස්වාමීනි.

කටුවාපිටිය පල්ලියේ බෝම්බ පිපිරීමෙන් අනතුරට පත් පවුල් වලට ලබා දෙන ලද මූල්‍යමය ආධාර සටහන් කරමින් පවතින මෙම ලේඛනය මෙම සභාවට C 733 වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා. එකී ලේඛනයට අනුව පවුල් 281 ට මූල්‍යමය ආධාර ලබා දී තිබෙන බවත් එහි මුදල රුපියල් මිලියන 95 පන්සිය හැත්ත නමදහස් නමසිය හැත්තෑවයි ශත හතලිස් අටක මුදලක් බව පෙනී යන බවටත් ගරු සභාවේ අවධානය යොමු කර සිටිනවා.

ප්‍ර: දැන් පියතුමණි මේ මූල්‍යමය ආධාරයන් ලබාදීමේ දී මේ මියගිය අයවලුන්ට සහ තුවාලලත් අයට රජයෙන් ලබා දෙන මුදල් ලැබුණා ද නැද්ද කියන කාරණාව පිළිබඳ සැලකිල්ලක් ගත්ත ද නැත්නම් ඔබ වහන්සේලාගේ ආයතනයෙන් ස්වාධීනව ඔබ වහන්සේලා විසින් කරන ලද තක්සේරුවකට අනුව මුදල් ලබාදීමක් සිද්ධ කරාද?

උ: ස්වාමීනි අපි කළේ ඒ විදියට තමයි අපි කරන තක්සේරු ක්‍රමවේදය අනුව තමයි මේ සෑම මුදලක්ම ලබා දුන්නේ. අපි රජය දෙනකන් හෝ දුන්න ද නැද්ද කියලා බලාගෙන හිටියේ නැහැ නමුත් අපි ඒ දේවල් ලබා දුන්නා අපේ ආයතනයෙන් අගරදගුරුතුමාගේ ඉල්ලීම පරිදි.

ප්‍ර: දැන් මේ මුදල් ලබා දී තිබෙන සෙත්සරණ ආයතනයේ පිහිට ලබාගත්ත අයවලුන් කතෝලිකයින් පමණයි ද ?

උ: නැහැ ස්වාමීනි. මේකෙන් අපේ පිහිට පැතූ අපි රෙජිස්ට්‍රර් කරගත්තු ලියාපදිංචි කර ගත්තු සෑම පවුලකටම බෞද්ධ හින්දු මුස්ලිම් ඒ අයගේ සෑම කෙනෙකුටම ඔය වාර්තාවේ අඩංගු වෙලා තිබෙනවා වෙනසක් නොකර ඒ සහන සේවා කටයුතු අපි දියත් කරලා තිබෙනවා.

මෙහි දී C 731 වශයෙන් ගරු සභාවට පියතුමන් විසින් ඉදිරිපත් කරන ලද ලේඛන ගොනුවෙහි සම්පූර්ණ වශයෙන් කොච්චිකඩේ සහ කටුවාපිටිය පල්ලියේ තුවාල ලත් මියගිය අයවලුන් පවුල් වශයෙන් ආදී වශයෙන් සියළු තොරතුරු සංක්ෂිප්තව දක්වා තිබෙන ලේඛනයක් තිබෙනවා. එම ලේඛනය C 730 E වශයෙන් සලකුණු කිරීම සඳහා අවසර අයැද සිටිනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: පියතුමණි සියෝන් පල්ලියට අදාළව මඩකලපුවේ සියොන් පල්ලියට අදාළව සෙත්සරණ කැරිටාස් කොළඹ ආයතනයෙන් යම්කිසි ආධාර මුදලක් ලබාදීමක් සිදු වුණා ද?

උ: ඔව් ස්වාමීනි අපි ප්‍රථම පියවර විදියට අගදරුතුමන් මා සමඟ තවත් පියතුමෙක් සහ අපේ මිතුරු ස්වාමීන් වහන්සේ දෙනමක් සමඟ මෙම ස්ථානයට ගොස් අපි මෙම මූල්‍යමය ආධාරය කරා ස්වාමීනි. ඒකේ ලිපි ලේඛන මා සතුව තිබුණා. ප්‍රථමයෙන්ම අපි මෙය කළේ කරිටාස් එහෙඩ් ඒ කියන්නේ මඩකලපුව ප්‍රදේශයට අයත් අපේ වගේම ආයතනයක් තිබෙනවා කතෝලික සභාවේ ඒකට අපි නම් කරන්නේ එහෙඩ් කියලා. එකේ Short form එකෙන් තියෙන්නේ සෙත්සරණ වගේම ආයතනයක් කරිටාස් එහෙඩ් මලකලපුව කියලා ආයතනයට අපි ලක්ෂ 50 ක් මුදලක් අපි Deposit කරා ඒකේ තිබෙනවා. ඉන් අනතුරුව ඒ ගොල්ලොන්ගෙන් අපි ඉල්ලුවා මේ පවුල් ටික බැහැ දැකලා දැඩි අවශ්‍යතා තියෙන අය හඳුනාගෙන මේ ලක්ෂ 50 බෙදා දීමට කටයුතු කරන්න කියලා ස්වාමීනි. ඒ ගොල්ලෝ ඒ පවුල් ටික කඩිනමින් හඳුනාගෙන ඒ පාස්ටර් සමඟ එකතුවෙලා පාස්ටර් රොෂාන් සමඟ එකතු වෙලා මේ පවුල් ටික හඳුනාගෙන අපිට 05 වැනි මාසේ 29 වැනිදා ආරාධනා කළා එම මුදල් බෙදන්න අපිත් එක්ක එකතු වෙන්න කියලා. Batticaloa වලට එන්න කියලා අපි පියතුමන්ලා සහ අගරදගුරුතුමාට ඒ තිබ්බිව ආරක්ෂක හේතූන් මත යන්න බැහැයි කියලා අවසර දුන්නේ නැහැ. අපිව ඒ සඳහා යොමු කරලා අපි ස්වාමීනි ඒ මුදල බෙදාදීමට කටයුතු කරා පළවෙනි ලක්ෂ 50 ජනතාව අතරට පත් කරා. ඒක පත් කළේ අර එහෙඩ් කියන ආයතනයත් එක්ක ඒ අය ඒ සියළුම දත්තයන් අපිට යොමු කරලා තියෙනවා ස්වාමීනි කොයි ආකාරයෙන් ද ඒ මුදල පරිහරණය කළේ පළවෙනි ලක්ෂ 50 කියලා.

ප්‍ර: ඒ කරුණු ඇතුළත් කරන ලද ලේඛනයක් වශයෙන් ඔබ වහන්සේ සතුව තිබෙනවා ද ලක්ෂ 50 ක මුදලක් සියෝන් පල්ලිය වෙත ලබාදීම තහවුරු කිරීමේ ලේඛනයක් සහ ඒවා කොයි කොයි අයවලුන් අතර බෙදී ගියා ද කියන කරුණු ඒ මුදල් ප්‍රමාණය සඳහන් කරමින් ලේඛනයක් වශයෙන් තිබෙනවා ද මේ අවස්ථාවේ දී ලේඛනයක් වශයෙන් ඉදිරිපත් කිරීමට?

උ: ඔව් ස්වාමීනි. මා සතුව ඒ ලේඛනය තිබෙනවා. Email එකකින් දැනුම් දුන්නා මුදල් දැම්මා කියලා .ඒ ගොල්ලො A acknowledgement එක එවලා තිබෙනවා. ඉන් අනතුරුව බෙදා දුන්නු ආකාරය Summary Sheet එකක් තියෙනවා. ඉන් අනතුරුව බෙදා දුන්නේ කාටද කියලා ලැයිස්තුව තියෙනවා ස්වාමීනි.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේ දී සෙත්සරණ කැරිටාස් ආයතනය මඟින් මඩකලපුව සියෝන් පල්ලිය වෙත පළමු අදියරෙහි ලබා දෙන ලද ලක්ෂ 50 ක මුදල එම මුදල ලබා දුන් බව සඳහන් කරමින් ඒවා

FAIR COMMENT BY JEZEEM

සාරාංශයක් වශයෙන් දක්වමින් ඉදිරිපත් කර තිබෙන ලේඛනය සභාවට C 734 වශයෙන් සලකුණු කිරීමටත් එම ලේඛනයට අමුණා එම සාරාංශයෙන් දැක්වෙන මුළු මුදල වෙන් වෙන් වශයෙන් කවරෙකුට වෙන් වෙන් මුදල් ප්‍රමාණයන් සහිතවම බෙදී ගියාද කියන කාරණාව පැහැදිලිව දැක්වෙන පිටු 04 කින් යුත් ඇමුණුම C 734 A වශයෙන් සලකුණු කිරීමටත් ගෞරවයෙන් අවසර අයැද සිටිනවා.

ඌ: ඒ වගේම ස්වාමීනි එහිදී අපි ගත්ත ඡායාරූප වල පිටපත් කිහිපයකුත් මා සතුව පවතිනවා. ඒකත් ඉදිරිපත් කරන්න පුළුවන්. ඒකේ තිබෙනවා ස්වාමීනි මා අතින්ම ඒ අදාළ අයට ලැයිස්තුවේ තියෙන අය අතරින් කිහිපදෙනෙක්ට ඒ මූල්‍යමය ආධාරය ලබා දෙන ඡායාරූප තියෙනවා. අපේ මිතුරු ස්වාමීන් වහන්සේ නමක් සමඟ තමයි අපි ඒ Batticaloa දේවස්ථානයට ගියේ. ගිහිල්ලා ඒ තව තැනක දවසක් නතර වෙලා තමයි මේ කාර්යය කළේ මෙතැන ඉන්නවා ස්වාමීනි ඒ රෝෂාන් දේවගැතිවරයත් ඒ දේවස්ථානයේ ඡායාරූප ටිකකුත් අප සතුව තිබෙනවා ඒකත් ඉදිරිපත් කරන්න හැකියාවක් තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: සියෝන් පල්ලියෙහි සෙත්සරණ ආයතනයෙන් මූල්‍යමය ආධාරය ලබා ගන්නා ලද දේවගැතිවරයා සමඟ ඔබ වහන්සේ පෙනී සිටින ඡායාරූපයක් තිබෙනවා ද?

ඌ: එහෙමයි .

එම ඡායාරූපය මෙම සභාවට C 734 B වශයෙන් සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා.

ප්‍ර: ඒ වගේම පියතුමනි එම සියෝන් පල්ලියට අදියර දෙක වශයෙන් නැවත මුදල් ලබාදීමක් සෙත්සරණ ආයතනයෙන් සිදු වුණා ද?

ඌ: ඔව් ස්වාමීනි ඉන් අනතුරුව රදගුරුතුමා රටේ ස්වභාවය බලලා ආරක්ෂක හේතූන් මත රදගුරුතුමා මේ දේවස්ථානය බැහැ දැකීමක් කරා ස්වාමීනි. 06 වැනි මාසේ 2019.06 වැනි මාසේ බැහැ දැකීමක් කරා අන්න ඒ බැහැ දකින වෙලාවේ දී චෙක් පතක් මිලියන 05 ක මුදලක් අඩංගු චෙක් පත මේ රොෂාන් දේවගැතිතුමාට භාර දුන්නා. එකේ පිටපතක් තිබෙනවා ස්වාමීනි. ඒ චෙක් පතේ පිටපතක් තිබෙනවා අගරදගුරුතුමා හිමිපාණන් අතින් දුන්න නිසා අපි ලේඛනයකට අත්සනක් ගත්තේ නැහැ. නමුත් අප සතුව එකේ ඡායාරූප කිහිපයක් මා සතුව තියෙනවා ස්වාමීනි ඉදිරිපත් කරන්න පුළුවන් ඒ චෙක් පතම භාර ගන්න එක සහ ඉන් පස්සේ අපි ඉල්ලීමක් කරා ස්වාමීනි අපි පිළිගත්ත කියලා මූල්‍යමය මේකක් ආපු නැති නිසා අපි ලිපියකින් දේවගැතිතුමාට ඉල්ලුවා මේක භාර ගත්ත කියලා අපිට දෙන්න කියලා එතුමා ඒක ලබා දුන්නේ නැහැ. මේ වෙන කොට එතුමා දේශයේ නැහැ. අපි කොල් කරලා බැලුවාහම ස්වාමීනි එතුමා ඉන්නේ කැනඩාවේ. ඉතින් ආවට පස්සේ තොරතුරු ලබා දෙන්නම්

FAIR COMMENT BY JEZEEM

කියලා කිව්වා . ඉතිං අපිත් දැක්කා ස්වාමිනි මාධ්‍යය හරහා ලබා දුන්නේ නැති බව සාක්ෂියක් කියනවා. ඒ දේවගැතිතුමා මෙතැන සාක්ෂි දී තිබුණත් දේවගැතිතුමාට නෙවෙයි අපි ලබා දුන්නේ අපි යන කොට හිටියේ ඒ දේවස්ථානයේ ප්‍රධාන දේවගැතිවරයා විදියට නම් කර තිබුණු රොෂාන් දේවගැතිතුමා ස්වාමීනි. මේ අවස්ථා දෙකේම අපි යන කොට හිටියේ ප්‍රධාන දේවගැතිවරයා විදියට රොෂාන් දේවගැතිවරයා. අගරදගුරුතුමා බැහැ දකින අවස්ථාවේ ස්වාමීනි ඉන්නේ රොෂාන් දේවගැතිවරයා තමයි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: දැන් පියතුමනි ඔබ වහන්සේ කියපු හැටියට සියෝන් දේවස්ථානයෙන් සිදු වූ මරාගෙන මැරෙන ප්‍රහාරය සම්බන්ධයෙන් සම්පූර්ණ වශයෙන් මිලියන 5. 5 ක් ?

උ: නැහැ ස්වාමීනි මිලියන 10 ක්.

ප්‍ර: මිලියන 10 ක් දීලා තිබෙනවා?

උ: එහෙයි ස්වාමීනි.

ප්‍ර: ඒ මිලියන 10 ම දුන්නේ වෙක් පත් වලින් ද?

උ: එහෙමයි ස්වාමීනි. ඒ පළවෙනි මිලියන 05 දුන්නේ අපි කියපු විදියට සෙඩෙක් ඒ කියන්නේ අපේ ආයතනය හරහා මිලියන 05 ක් ඒ ආතනයට දීලා ඒ ආයතනය බෙදා දුන්නා ස්වාමීනි. ඉතුරු මිලියන 05 දුන්නේ කෙළින්ම වෙක් පතකින්. මේ දේවගැතිතුමාට ස්වාමිනි අගරදගුරු හිමිපාණන් හරහා ස්වාමිනි.

ප්‍ර: දැන් මං ඔබ වහන්සේගෙන් අහන්නේ දෙවැනි වෙක්පත සම්බන්ධයෙන්.

උ: එහෙයි.

ප්‍ර: ඒ දෙවැනි වෙක්පත ලියලා තිබ්බේ කාගේ නමට ද?

උ: ඒක Cash වෙක් පතක් තමයි ස්වාමීනි දුන්නේ. නමුත් ඒක අර Realize කරලා තියෙනවා . අපි ඒකේ Document එක ගත්තා ස්වාමීනි. ඒක Realize කරලා තියෙනවා දවස් දෙකකට පස්සේ. ඇයගේ භාර්යාවගේ නම ද කොහෙද තමයි ඒකේ තියෙන්නේ. අපි බැංකුවෙන් ලිඛිතව ඉල්ලුවා මේ වෙක්පත Realize වෙච්ච එකේ තොරතුරු දෙන්න කියලා. ඒ වගේම ඒක අපිට බැංකුව ලබා දුන්නා ඉල්ලීම පරිදි. ඒ වගේම රොෂාන් .

ප්‍ර: සමාවෙන්න පියතුමනි ඒ කියන්නේ දෙවැනි වෙක්පත Cash වෙක් පතක්. ඒ බැංකුවෙන් කරන විමසීමට අනුව එම මුදල ලබා ගෙන තිබෙන්නේ කවුද කියලා සොයා ගන්න පුළුවන් වුණා ද?

උ: පුළුවන් ස්වාමීනි .

ප්‍ර: කවුද නම කියන්න?

උ: ස්වාමිනි කොමර්ෂල් බැංකුවේ අරුණ ගිරිනාදන් සුරේෂ්. නොම්බර 05 Upper Square Road Batticaloa . NCI Number එක තියෙනවා ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: කියන්න.

උ: අරුණ ගිරිනාදන් සුරේෂ්.

ප්‍ර: NIC Number කියන්න පියතුමනි.

උ: 781721670 V ස්වාමීනි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය.</u>

ප්‍ර: ඔබ වහන්සේ සතුව එම දෙවන අදියරේ ලබා දෙන ලද මිලියන් 05 ක මුදල මුදල් චෙක්පතක් හැටියට දුන්න ඒ මුදලේ චෙක්පතේ ඡායාස්ථ පිටපතක් තියෙන ලේඛනයක් තිබෙනවා ද ?

උ: තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: ඒ වගේම එම චෙක්පත මාරුකරන ලද බව දැක්වෙන බැංකුවෙන් ලබාගන්නා ලද දත්ත ඇතුළත් ලේඛනයක් තිබෙනවා ද?

උ: තිබෙනවා ස්වාමීනි.

චෙක්පතෙහි ඡායාස්ථ පිටපත මේ අවස්ථාවේ දී සභාවට C 735 වශයෙන් සලකුණු කිරීමටත් එම චෙක්පත මුදල් කිරීමක් සිදු කරන ලද දත්ත ඇතුළත් කොමර්ෂල් බැංකුවෙන් ලබා ගන්නා ලද දත්ත සටහන් ඇතුළත් ලේඛනය C 736 වශයෙන් සලකුණු කිරීමටත් අවසර අයැද සිටිනවා.

උ: ස්වාමීනි ඒකට අදාළ ඡායාරූපත් මා සතුව තිබෙනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: පියතුමනි ඔය දෙවන චෙක්පතෙන් ලබාදුන් මිලියන 05 මුදල ඒ අනතුරට පත් වූ තැනැත්තන්ට ලබාදීමක් සිදු වෙලා තියෙනවද කියලා ඔබ වහන්සේලා

උ: අපි විමසිමක් කළා ස්වාමිනි. ඒකට උත්තර දෙන්න එතුමා ආවට පස්සේ අදාළ ලිපි ලේඛන අප වෙත යොමු කරන්න නම් කියලා වාචිකව රොෂාන් පාස්චර් කැනඩාවේ සිට මම ඇමතූ වෙලාවක මට වාචිකව කිව්වා මම කිව්වා මට ඊමේල් එකකින් ඒක දැනුවත් කරන්න කියලා ස්වාමීනි. මේ වෙනකන් ඒක ලිඛිතව අපිට දැන්වීමක් කළේ නැහැ ඒ දේ කරනවා කියලා වාචිකව පමණයි තිබෙන්නේ ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ වහන්සේලා ඒ සියෝන් දේවස්ථානයට ඊට පසු අවස්ථාක ගියාද?

උ: ඊට පස්සේ ගියේ නැහැ ස්වාමීනි.

ප්‍ර: නමුත් විමසීමක් කරලා බැලුව ද ඒ තුවාල වුණු තැනැත්තන්ගෙන් මුදල් ලැබුණ ද කියලා?

උ: එහෙම කරෙත් නැහැ ස්වාමීනි මේක අපේ දේවස්ථානයක් නෙවෙයි නිසා එය සොයා බැලීම කළේ නැහැ ස්වාමීනි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: රොෂාන් පියතුමා ලංකාවට එන දවසක් ඔබ වහන්සේට දැන්නුවා ද?

උ: නැහැ ආවට පස්සේ ලියකියවිලි දෙන්නම් කියලා තමයි ස්වාමීනි කිව්වේ.

ප්‍ර: එන දවසක් දැන්නුවේ නැහැ?

උ: දැන්නුවේ නැහැ.

****

<u>**ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා.**</u>

ප්‍ර: ගරු පියතුමනි දැන් මේ දෙවැනි චෙක්පත Cash චෙක් එකක් දෙන්න හේතුවක් තියෙනව ද?

උ: ඒ ස්වාමීනි අගරදගුරුතුමා ක්ෂණිකව තමයි තීරණය කළේ හෙට අපි යමුයි කියලා. එතකොට අපි වෙන හේතුවක් තිබුණේ නැහැ ඒක විශ්වාසවන්තකම නිසා මුදල ලෑස්තු කරගන්න කියල කිව්වා ස්වාමීනි. අපිට තොරතුරක් එහෙන් අපි හොයලා බැලුවාහම මෙයා තනිකරම තනියම තමයි කරනවා කියල තමයි ඊට පස්සේ තමයි අපිට දැන ගන්න ලැබුණේ මෙතුමගේ වැඩපිළිවෙල ගැන. එතකොට අපි ප්‍රමාදයි කියන එක අපිට ආරංචි වුණා. නමුත් විශ්වාසවන්තකම නිසා එතුමගේ නමට හරි ප්‍රශ්නයක් ඇති වෙයි කියලා තමයි Cash චෙක්පතක්ම අපි ලබා දුන්නේ ස්වාමීනි.

ප්‍ර: විශ්වාසය කඩ කරා කියලා දැන් ඔබ වහන්සේට හිතෙනව ද?

උ: ඔව් ස්වාමීනි. ඒකට හේතුවක් තමයි ඒ ගොල්ලො Acknowledgement එකමත් අපිට එව්වේ නැහැ ස්වාමීනි. අපිම කියලා තමයි Acknowledgement එකක් හරි ඉල්ල ගන්න කටයුතු කරන්න සිද්ධ වුණේ. ඒක තාමත් ලැබුණේ නැහැ ස්වාමීනි.

ප්‍ර: ඒ සම්බන්ධයෙන් යම් නීතිමය පියවරක් ගන්න ඔබ වහන්සේ බලාපොරොත්තු වන්නේ නැද්ද?

උ: බලාපොරොත්තු වෙනවා ස්වාමීනි. මට වාචිකව පිළිතුරක් දුන්නු නිසා ලංකාවට පැමිණේය කියන බලාපොරොත්තුව තුළ නිහඬ වෙලා ඉන්නවා ස්වාමීනි දැනට අපි.

ප්‍ර: ඒ වුණාට පියතුමනි බලාපොරොත්තුව දුන්නේ කවදා එනව ද කියලා නෙවෙයිනේ 2025, 2030 එයිද නොවෙයි ද කියලා දන්නෙත් නැනේ

උ: නීතිමය පියවරක් ගන්න අපි බලාපොරොත්තු වෙනවා ස්වාමීනි. එහි ඡායාරූප කිහිපයකුත් තිබෙනවා ස්වාමීනි අපිට ලබා දෙන්න පුළුවන් අවශ්‍ය නම් ඒකේ අගරදගුරුතුමා ඒක භාර දුන්න වෙලාවේ සහ ඒ බැහැ දකින්න ගිය වෙලාවේ ඒකෙත් එතුමගේ අතේ Cover චෙක් එකක් කියලා තේරේන්නේ නැහැ . නමුත් කවරය අතේ තියන් ඉන්න ඡායාරූපයක් තමයි අපි ඒකේ අත්සනක් ගත්තේ නැහැ ස්වාමීනි මොකද ඒකේ Ethical කියන අදහස තුළ නැති නිසා තමයි මේ සිදුවීම වුණේ.

****

FAIR COMMENT BY JEZEEM

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය.</u>

ඒ අනුව ගරු සභාපතිතුමනි මේ පැහැදිලි කිරීමට අනුව C 735 ලෙසට මේ වන විටත් සලකණු කරන ලද වෙක්පත සියෝන් පල්ලියේ එවකට සිටි පියතුමන් වන රොෂාන් පියතුමාන් වෙත භාර දීම සිදු කරන කරුණු සඳහන් වන ඡායාරූපයක මුද්‍රිත පිටපත C 735 A වශයෙන් සලකුණු කිරීමට ගෞරවයෙන් අවසර අයැද සිටිනවා.

ප්‍ර: පියතුමනි මෙම සියොන් පල්ලිය කතෝලික පල්ලියක් ද?

උ: නැහැ ස්වාමීනි එය කතෝලික පල්ලියක් නෙවෙයි. ඒක බයිබල් පල්ලියක් කියලා තමයි හඳුන්වලා තියෙන්නේ. ඒක කතෝලික සභාවේ පිළිගත්තු Main Line Churches කියලා පිළිගත්තු පල්ලි වර්ග 07 ක් තියෙනවා. ඒකටත් මේක අයිති වෙන්නේ නැහැ. අපිත් එක්ක සම්බන්ධතා පවත්වන හෝ අපේ නායකත්වය පිළිගන්න දේවස්ථානයක් නෙවෙයි ස්වාමීනි ඒ සියෝන් දේවස්ථානය.

ප්‍ර: මෙම ගරු සභාව ඉදිරියේ සාක්ෂි ලබා දුන් තිරුකුමාරන් පියතුමන් සියෝන් පල්ලියෙහි දැනට නායකත්වය හොබවන අයෙකු වශයෙන් සාක්ෂි ලබාදුන් පියතුමන් කරුණු ඉදිරිපත් කරන්නට යෙදුණා අද වන විටත් ඒ සාක්ෂි ලබාදුන්න දිනය වන විටත් සියොන් පල්ලිය ප්‍රතිසංස්කරණය කිරීමක් සිදුවෙලා නැහැ. පල්ලිය හැදිලා නැහැ. හදන්නට ආධාරයක් ලැබෙන්නෙත් නැහැ කියන කාරණාවට අදාළව. ඒ කරුණු සම්බන්ධයෙන් ඔබ වහන්සේට කරුණු යම්කිසි දෙයක් දැනගන්නට ලැබිලා තියෙනව ද ඔබ වහන්සේ දන්න කාරණාවන් තිබෙනව ද මේ ප්‍රතිසංස්කරණයක් සිදු නොවුණු කාරණාව සම්බන්ධයෙන් ?

උ: ඔව් ස්වාමීනි. අපි ඔය වැඩසටහන දියත් කරද්දී ඒ කියන්නේ විනාශ වෙච්ච දේවස්ථාන ගොඩනගන්න එවකට සිටි රජයේ පොරොන්දුවක් අගරදගුරුතුමාට දුන්නා. ඔය දේවස්ථාන තුනම. එතකොට අපේ පදවියට බස්නාහිර පළාතට අයිති දෙක සහ ඔය මඩකලපුවේ දේවස්ථානය. ඒ අවස්ථාවේ දී ඔය පාස්ටර්ව මෙහෙට එන්නට එවකට සිටි සජිත් ප්‍රේමදාස ඇමතිතුමා ආරාධනා කරා අගරදගුරු මැදුරටම ඔය රැස්වීම මෙහෙයවන දවසේ දී.

ප්‍ර: ඔය පාස්ටර් යනුවෙන් ඔබ වහන්සේ සඳහන් කරන නම සඳහන් කරන්න?

උ: රොෂාන් දේවගැතිතුමා ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ දැනට විදේශගතව සිටින ඔබ වහන්සේගේ මෙම සෙත්සරණ ආයතනයෙන් මුදල් මිලියන 05 ක Cash චෙක්පත සහ මුල් අවස්ථාවේ බෙදා දෙන ලද අවස්ථාවේ දීත් සහභාගිවුණු පියතුමා තමයි රොෂාන් පියතුමා කියන්නේ?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: ඔහු තමයි ඔබ වහන්සේ ඔය සඳහන් කරන රැස්වීමට සහභාගි වෙන්න පැමිණියේ?

FAIR COMMENT BY JEZEEM

උ: පැමිණෙන්නට කියලා ආරාධනා කරා ස්වාමීනි. ඒකට එතුමා පැමිණියේ නැහැ. ඒ ආරාධනාවේ දී තිදෙනෙකුට ආරාධනා කරල තිබුණා. ප්‍රාදේශීය ලේකම් සහ දිසාපතිතුමා. අගරදගුරු මැදුරට ආවා මේ සාකච්ඡාවට ඒ දෙදෙනා. නමුත් මේ පාස්ටර් පැමිණියේ නැහැ ස්වාමීනි. පළවෙනි මගේ මතකයේ තියෙන ප්‍රමාණය. ඉන් පස්සේ ස්වාමීනි මේ අමාත්‍යතුමා සෑම අඟහරුවාදාවකම මේ දේවස්ථානය ගොඩනැගෙන ආකාරය පිළිබඳව විවිධ සමාලෝචන රැස්වීම් පැවැත්තුවා. එතකොට නේවි එකට තමයි භාර දුන්නේ කොච්චිකඩේ සිද්ධස්ථානය. ඒ වගේම කටුවාපිටිය සිද්ධස්ථානය ශ්‍රී ලංකා යුධ හමුදාවට . ඒ වගේම සියෝන් දේවස්ථානය ශ්‍රී ලංකා යුධ හමුදාවට. ඒ අවස්ථාවේ දී ස්වාමීනි එක රැස්වීමක දී ප්‍රාදේශීය ලේකම්තුමිය මඩකලපුවේ ප්‍රකාශ කරා ඉල්ලීමක් කරලා තියෙනවා ස්වාමීනි මේ දේවස්ථානයෙන් මඩකලපුවේ සියොන් දේවස්ථානය තිබෙන තැන හදන්න එපා අපි වෙන තැනක් යෝජනා කරනවා මේ පාස්ටර් කිව්වා කියලා තමයි ස්වාමීනි සඳහන් කළේ. අපි වෙන තැනක් දෙනවා එතැන මේ දේවස්ථානය හදන්න කියලා.

වේලාව: ප.ව.08.50
මෙතැන් සිට: නිල්මිණි මෙනවිය.

President Secretary's Office

FAIR COMMENT
BY JEZEEM

දැන් වේලාව: ප.ව.8.50
පෙර සටහන් ල/ලේ: සචිනි මෙනවිය.
මෙතැන් සිට ල/ලේ: නිල්මිණි.

ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් ජයවීර මහත්මිය

ප්‍ර: මඳක් බාධා කරනවා පියතුමනි. මේ පාස්ටර් කිව්වහම නමින් සඳහන් කරන්න. ගරු සභාවට තේරුම් ගැනීම සඳහා.

පි: රෝෂන් දේවගැතිතුමා, ප්‍රාදේශිය ලේකම්තුමියට කියලා තියෙනවා අපි වෙන ඉඩමක් ඔබතුමියට හොයලා දෙනවා මේ දේවස්ථානය ගොඩනඟන්න කියලා. ඒ කරුණ ප්‍රාදේශිය ලේකම්තුමිය අපත් එක්ක බෙදා ගත්තා ඒ මූලික රැස්වීමේ දී අපගේ අගරදගරු මැදුර තිබිච්චි රැස්වීමේ දී. එතකොට ප්‍රධානීන් බොහෝ දෙනෙක් එම රැස්වීමට පැමිණ සිටියා ස්වාමීනි ඇමතිතුමත් සමඟ. ඒක නිසා ඒ සතිපතා තිබිච්චි පළිවෙනි රැස්වීමේදී ඊට පස්සේ ඇමතිතුමා කිව්වා ඔබතුමන්ලා සතිපතා එන්න ඕනි නැහැ. මාසයකට සැරයක් එන්න කියලා. ඒ කියන්නේ ප්‍රාදේශිය ලේකම්ට සහ දිසාපතිතුමාට. ඊළඟ මාසේ එතුමන්ලා පැමිණියේ නැහැ. නමුත් අමාත්‍යාංශයේ නියෝජිතයෙකු හරහා කරුණු ඉදිරිපත් කරා එතන තාම ඉඩම අරගෙන නැහැ කියන කරුණ. ඊට පස්සේ ඔහොම මාසයක් දෙකක් ගියාම ස්වාමීනි ඒ රැස්වීමේදී වාචික සාකච්ඡා කෙරුණු කරුණක් විදිහට කිව්වා. දැන් ඒ ඉඩමට විරුද්ධත්වයක් දක්වනවා. ඒගොල්ලෝ හොයාගෙන ඉන්න මිලදී ගන්න යන ඉඩමට විරුද්ධත්වයක් දක්වනවා. ඒක නිසා ඒ ඉඩම ගන්න හැකියාවක් නැහැ. මේ තියෙන තැනම හදලා දෙන්න කියලා ගරු ස්වාමීනි. ඉන් පස්සේ ඒ රැස්වීමේ තීරණයක් ගත්තා යුධ හමුදාවට දීලා ඒ කටයුත්ත කරන්න කියලා ස්වාමීනි. ඔන්න ඔය කරුණු ටික අපගේ රැස්වීමේ දී වාචිකව සාකච්ඡා කර ගත්තු තොරතුරුක් විදිහට ගරු සභාව ඉදිරියේ මට දැනුම් දෙන්න පුළුවන් ස්වාමීනි.

ප්‍ර: පියතුමනි මේ සෙත්සරණ ආයතනයෙන් ඔබ වහන්සේ මේ පැහැදිලි කළ ආකාරයට මේ වන විටත් ලේඛන වශයෙන් ඉදිරිපත් කරලා තියෙන මේ මුදල් ප්‍රමාණයන් බෙදා හැරීම සඳහා ඒ මුදල් ලැබුණේ කොහෙන්ද?

පි: ස්වාමීනි රදගුරු හිමිපාණන් මේ සිදුවීමට දවස් 3කට පස්සේ විශේෂ ගිණුම් කිහිපයක් විවෘත කරා. බැංකු කිහිපයක. කැමැති කෙනෙකුට මේ විපතට පත් වෙච්ච ජනතාවට උදව් කරන්න ඉදිරිපත් වෙන්න කියලා. එතකොට ඒ ගිණුම් ස්වාමීනි 6ක් විවිධ බැංකු වල විවෘත කරලා තිබෙනවා රදගුරුතුමාගේ නමින්. Archbishop of Colombo කියලා. අන්න ඒ ගිණුම් 6ට තමයි මේ සෑම මුදලක්ම පරිත්‍යාග කළේ ජනතාව.

ප්‍ර: අද වන විට මේ ගිණුම් වල සම්පූර්ණ වශයෙන් එකතු වූ මුදල කොපමණක්ද පියතුමනි?

FAIR COMMENT BY JEZEEM

පි: අද වන විට ස්වාමීනි එහි සම්පූර්ණ මුදල මිලියන 518.089ක් විදිහට වාර්තා වෙලා තිබෙනවා ස්වාමිනි. ඒ තියෙන්නේ 2020.03.31 වන දින දක්වා ස්වාමීනි.

ප්‍ර: මේ ගිණුම් වලට හෝ රදගුරුතුමාට පෞද්ගලිකව හෝ වරක් බස්නාහිර පළාත් ආණ්ඩුකාර ධූරය දැරූ අසාද් සාලී මහතා විසින් මුදලක් ලබාදීමක් සිද්ධ කරාද?

පි: අපිට එහෙම ලිඛිතව සිදුවීමක් කරලා නැහැ ස්වාමීනි. නමුත් චෙක් පතක් රදගුරු හිමිපාණන්ට එතුමාගේ ආයතනය විසින් ලබාදීමේ තොරතුරක් තියෙනවා ස්වාමීනි.

ප්‍ර: එතුමාගේ ආයතනය කියන්නේ මොකක්ද?

පි: අසාද් සාලී එතුමා එතකොට සේවය කරලා තියෙන්නේ Western Province එකේ Governor විදිහට ඉන්න කාලේ. නිකුත් කරන ලද චෙක් පතක් රදගුරු හිමිපාණන්ට ලබාදිලා තියෙනවා ස්වාමීනි. චෙක් පත් 2ක් පල්ලි 2කට. ලක්ෂ 25 ගාණේ. එතකොට ස්වාමීනි ඒ චෙක් පතේ Copyය ස්වාමීනි මා සතුව පවතිනවා. ඒක ලබාදීලා තියෙන්නේ ස්වාමිනි ප්‍රථමයෙන්ම 2019.04.29. එතකොට ඒක ස්වාමීනි අපේ අතට රදගුරුතුමාගේ අතට පත්වෙද්දී එක දවසයි තියෙන්නේ ඒක Realize කරන්න. ඊට පස්සේ ඒක වලංගු නැති චෙක් පතක් බවට පත් වෙනවා. රදගුරුතුමාට මේ චෙක් පත හම්බවෙන්නේ ස්වාමිනි 7 වැනි මාසේ 19 වෙනිදා ස්වාමිනි. නමුත් අසාද් සාලීය කියන ඇමතිතුමාගේ

ප්‍ර: 2019.07.02?

පි: සමාවෙන්න 2019.07.29 තමයි චෙක් පතේ තියෙන්නේ ස්වාමිනි.

ප්‍ර: රදගුරුතුමාට ලැබෙන්නේ කවද්ද?

පි: 07 මාසේ 19 වෙනිදා තමයි ස්වාමිනි එකේ සඳහන් කරලා තියෙන්නේ ලිඛිතව ඒ Finance Manager අත්සන් කරලා තියෙනවා. රදගුරුතුමාට එන්න කියලා. මේක අදම දාන්න හෙටින් මේක මෙව්වා වෙනවා කියන සඳහනත් එක්ක තමයි ස්වාමීනි මේක දීලා තියෙන්නේ. හැබැයි මේ චෙක් පත රදගුරුතුමාට ගෙනල්ලා තියෙන්නේ රවී කරුණානායක ඇමතිතුමා ස්වාමිනි. එතකොට ඒ චෙක්පත් 2කම ඩිපොසිට් කරලා තියෙනවා. යොමුකරලා තියෙනවා මේ රදගුරු හිමිපාණන්ගේ බැංකු ගිණුම් වලට. ඒක Realize වෙලත් තියෙනවා ස්වාමීනි. හැබැයි අපට සඳහන් නැහැ ස්වාමීනි මේකේ මෙතුමා දුන්නා කියලා. එක දෙයක් විතරයි තියෙන්නේ Account Pay චෙක් එක යට තියෙනවා Finance Assistance Administrative Officer for Secretary to the Governor Western Province කියලා ස්වාමිනි.

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: ඒ වෙක් පත් දෙකේම තියෙන්නේ බස්නාහිර පළාත් ආණ්ඩුකාරවයා ගේ කාර්යාලයෙන් ගෙවපු විදිහටද?

පි: එහෙයි ස්වාමිනි. අත්සන් කරලා තියෙන්නේ. තිදෙනෙක් අත්සන් කරලා තියෙනවනා ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ ඔය ගෙවීම් වලින් පෙන්නේ ඔය රජයේ මුදලක් තමයි ලබා දීලා තියෙන්නේ?

පි: එහෙයි ස්වාමීනි

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් ජයවීර මහත්මිය</u>

ප්‍ර: ඔබ වහන්සේ සතුව තිබෙනවා ද එකී බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයාගේ කාර්යාලයෙන් නිකුත් කරායැයි සැළකෙන වෙක් පත් 2කෙහි ඡායාස්ථ පිටපත් 2ක්?

පි: එහෙමයි ස්වාමීනි. මගේ ළඟ මුල් පිටපත් විදිහට ගත්තු Cortify කරපු 2ක් තියෙනවා ස්වාමිනි.

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී ලංකා බැංකුව බම්බලපිටිය ශාඛාවෙන් නිකුත් කර තිබෙන වෙක් පත් 2ක් මෙම සභාවට C – 737 සහ C- 738 වශයෙන් සළකුණු කිරීම සඳහා අවසර අයැද සිටිනවා.

පි: තවත් තොරතුරක් ලබාදීමට කැමැතියි ස්වාමීනි මේ සම්බන්ධයෙන්. රදගුරුතුමාට ෆැක්ස් මඟින් ඒකට ලිපියක් ලැබිලා තියෙනවා ස්වාමීනි බස්නාහිර පළාත් ආණ්ඩුකාර ලේකම්තුමාගෙන් මේ සම්බන්ධයෙන් මේ මුදල පාවිච්චි කිරීම 2019.04.28 දින තමයි ෆැක්ස් මඟින් එවලා තියෙනවා ලිපියක් මෙන්න මේ මුදල මේ අමාත්‍ය බස්නාහිර පළාත් ආණ්ඩුකාර කාර්යාලය වෙතින් ලබා දෙනවා කියලා. එවකට එන්න බැරි නිසා වෙන්න ඇති ෆැක්ස් එකෙන් ලබාදුන්නු පිටපතක් මා සමඟ තිබෙනවා ස්වාමීනි. ඉන් අනතුරුව අපි ඒකට උත්තරයක් යවලා තිබෙනවා ස්වාමිනි. මේ මුදල් අපි භාර ගත්තා මේ කටයුතු වලට යොමු කරනවා කියලා මගේ ආයතනයේ Letter Head එකක යොමු කරලා තිබෙනවා. පී. සෝමසිරි බස්නාහිර පළාත් ආණ්ඩුකාර ලේකම් නාවලපාර , රාජගිරිය කියන ලිපිනයට 2019.12.23 දින මේ මුදල අපි මේ සඳහා භාර ගත්තා කියන ලිපි මා සතුව තිබෙනවා ස්වාමීනි.

ගරු පියතුමා විසින් සඳහන් කරන්නට යෙදුණු එම ලේඛනය බස්නාහිර පළාත් ආණ්ඩුකාර කාර්යාලයේ ලේකම්වරයා විසින් මෙම චෙක්පත් යොමු කරන ලද බවට සඳහන් කිරීමක් යෙදුණා එම චෙක් පත් භාරගත් බවට සෙත්සරණ කැරිටාස් කොළඹ ආයතනයෙන් නිකුත් කරන ලද ලේඛන 2ක් මේ වන විටත් AS 9 සහ AS10 වශයෙන් මෙම සභාව

FAIR COMMENT BY JEZEEM

ඉදිරියේ සළකුණු වී තිබෙන බව සභාවේ අවධානයට යොමු කර සිටිනවා ගෞරවයෙන්.

ප්‍ර: දැන් ඔබ වහන්සේගේ දැනීමට අනුව කතෝලික මීසමකට අයත් නොවුණත් මේ සියොන් පල්ලියෙහි යම්කිසි හාස්කම් ස්වභාවයක් තිබුණු පල්ලියක් බවට දැන ගැනීමක් ඔබ වහන්සේට තියෙනවද?

පි: එහෙම පෙර කිසිම දැන ගැනීමක් නැහැ ස්වාමීනි. නමුත් ඔය බයිබල් ආගම් කියන අයගේ ස්වභාවයක් තිබෙනවා ස්වාමීනි. ඒගොල්ලෝ සුව කරන ස්වභාවයක් තිබෙනවා කියලා තමයි ජනතාවට අදහස දීලා ජනතාව ගෙන්වා ගැනීමට තියෙන්නේ. ඒක නිසා ඒගොල්ලොන්ගේ වත්පිළිවෙත් පවා ස්වාමීනි ගොඩක් Live යන විදිහට එහෙම නැත්නම් හරිම Music එක්ක යන විදිහට තිබෙන නිසා හිත් ඇදගැනීමේ ස්භාවයක් ඒවගේ Sects වල තිබෙනවා ස්වාමීනි. ඒ වගේ සංග වල ඉතින් ඒ තැන් වලදී ඒගොල්ලෝ කියනවා සුවය ලබලා සාක්ෂි දෙනවා කියනවා ස්වාමීනි. එහෙම නැතුව මේ දේවස්ථානයේ එහෙම වෙනවා කියලා එහෙම දැනුමක් නැහැ ස්වාමීනි.

ප්‍ර: සිදු වුණ බවට දැනුමක් නැති වුණත් ඔබ වහන්සේට අවබෝධයක් තියෙනවා මේ හාස්කාම් තිබෙන බව සඳහන් කරමින් පුද්ගලයන් ඊට සහභාගී වීමක් සිදු වුණා කිව්වොත් හරිද?

පි: ඒ දේවස්ථානයේ නෙවෙයි ස්වාමීනි. පොදුවේ එහෙම වෙනවා කියන පිළිගැනීම ජනතාව අතර තියෙනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: පියතුමනි ඔබ වහන්සේ කියපු විදිහට මේ බෝම්බ ප්‍රහාර වලින් තුවාල ලැබූ සහ මියගිය තැනැත්තන්ට ලබා දුන් යම් මුදල් ප්‍රමාණයන් සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුවත් කෙරුවා. එම මුදල් ලබාදීමේ දී අනුගමනය කරපු නිර්නායකයන් පිළිබඳව ඔබතුමන්ට කොමිෂන් සභාව දැනුවත් කරන්න පුළුවන්ද?

පි: ප්‍රථමයෙන්ම ස්වාමීනි පෙර කියපු විදිහට අපි මේ Evaluation එක ඉවර කරාට පස්සේ ස්වාමීනි ඒගොල්ලන්ගේ අවශ්‍යතා දැන ගත්තා. ඒ අවශ්‍යතා අනුව තමයි පළවෙනි නිර්ණායකය විදිහට අපි පාවිච්චි කරේ. හැබැයි ඒක දැනගන්න ස්වාමීනි සති 2ක් පමණ ගියා. නමුත් සති 2කට යන්න ඉස්සෙල්ලා රදගුරු හිමිපාණන් අපිට උපදෙස් දුන්නා. ක්ෂණිකව මේ ගොල්ලන්ට මළගෙවල් වල වැඩකර ගන්න යම්කිසි උදව්වක් දෙන්න කියලා. ඒ නිසා හැම මිය කෙනෙකුටම ස්වාමීනි ලක්ෂය බැගින් අපි වෙක් පත් නිවෙස් වලට ගිහිල්ලා සමහර අයට මුල්‍යමය ආධාරය ලබා දුන්නා ස්වාමීනි. ඒ මළ ගෙවල්වල වැඩ කර ගන්න කියලා. ඒ රෝගාතුර වෙලා හිටිය හැම කෙනෙකුටම රුපියල් 50,000 ගානේ ස්වාමීනි

FAIR COMMENT BY JEZEEM

පළවෙනි පියවර විදිහට සුළු තුවාල තිබුණා. සෑම කෙනෙකුටම ඒ උපකාරය කරා ස්වාමීනි. ඉන් අනතුරුව ස්වාමීනි සෑම වෛද්‍ය බිලක්ම පෞද්ගලික රෝහල් වල අවශ්‍යතා බලලා ඒ සියලුම බිල් ප්‍රමුඛතාවය දුන්නා ස්වාමිනි මේ විපතට පත් වෙච්චි පවුල් වල ඉන්න රෝගාතුර අයට ඒ ප්‍රමුඛතාවය දීලා එකේ එක Criteria එකක් විදිහට පාවිච්චි කරලා රදගුරු හිමිපාණන් කමිටුවක් හරහා මේ ඉල්ලීමක් කරලා ඒක විමර්ශනය කරලා ඒ අයගේ බිල් ඔක්කෝම ගෙව්වා ස්වාමීනි. සමහර අයට අපි බිල් ගෙවන්න පෙර අපිම රෝහල් සුදානම් කරලා දුන්නා මේ ශල්‍ය කර්මය කරගෙන යන්න ඒ ප්‍රතිපාදන ඔක්කෝම රදගුරු නිවසින් ගෙවනවා කියලා. ඒක Criteria එකක් ස්වාමිනි. තව Criteria එකක් තමයි ස්වාමිපුරුෂයා මියගිහිල්ලා හෝ ආබාධිත තත්ත්වයට හිටියොතින් මේ ගොල්ලන්ට මුදලක් නැහැ ජීවත් වෙන්න. ඒක නිසා එක එක අපි හඳුනා ගත්ත පවුල් වලට අවශ්‍යතාවය ඇති පවුල් වලට මාස්පතා යම්කිසි මුදලක් දුන්නා එදිනෙදා ජීවත් වෙන්න. විශේෂයෙන්ම ලෙඩ්ඩුන්ව බලන්න යන්න. ඒ වතාවරණය අනුව බස් තිබුණේ නැහැ යන්න. ඒගොල්ලන්ට යන්න වුණේ පෞද්ගලික දේවල් වල. ත්‍රීවිල්වල. ඒ පසුබිම තුළ මේ ගොල්ලන්ට අතේ මුදල් නැති නිසා මුල්‍යම දායකත්වය ඒ ආකාරයෙන් තවත් Criteria එකක් විදිහට සැල කරලා මුල්‍යම ආධාරය දුන්නා. ඒ සෑම එකක් දෙද්දීම ස්වාමිනි අපි ඒ අදාළ මුදල භාර ගත්තා කියලා රිසිට් පතක අත්සන යොදලා අපේ Finance වෙනම තියෙනවා ස්වාමීනි අපේ මුල්‍යමය අංශයක් අපේ ආයතනයේ. ඒකේ රෙගුලාසි යටතේ තමයි ස්වාමිනි මේ සියල්ල අපි දියත් කළේ. ඒකේ සියලුම වාර්තා ඒ අත්සන් ලේඛන කීයක් ගත්තද ඔක්කෝම අපි අර ලබා දුන්නු එකට ගැලපෙන ලේඛන අප සතුව හෝ අප ආයතනය සතුව තිබෙනවා ස්වාමීනි. ඒ සියල්ලම දැන් අපි Audit එකකට මුල්‍යම මේකකට යොමු කරමින් තියෙන අවස්ථාවක තමයි මේ අප පැමිණියේ ස්වාමීනි.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර: ගරු පියතුමනි ඔබ වහන්සේ යම් අවස්ථාවක සඳහන් කර තිබෙනවා පසුගිය රජය කාලේ රාජ්‍ය මට්ටමින් සහ ජාත්‍යන්තර සංවිධාන මඟින් ප්‍රධානයන් රාශියක් මේ අගතියට පත් පාර්ශවයන්ට ලබාදීමට ලැබිලා තිබෙනවා. නමුත් ඒ පිළිබඳව ඔබ වහන්සේලාගෙන් විමසීම් කරනවා මේ අගතියට පත් ජනතාවට ඒ ප්‍රධානයන් නොලැබුණු බව.මේ කරුණ පැහැදිලි කරන්න බලන්න.

පි: එහෙමයි ස්වාමීනි ඒ කාලේ අපිට මතකයි ප්‍රසිද්ධියේ ඩුබායි රාජ්‍යයෙන් මුස්ලිම්වරුන්ගේ සංවිධානයකින් පැමිණිලා එවකට සිටි ජනාධිපතිතුමාට මගේ මතකයේ විදියට නෙළුම් පොකුණේ ඩමී වෙක් එකක් පරිනැමුවා ස්වාමීනි ඩොලර් මිලියන 5 කද කොහේද මගේ මතකයේ විදියට ඩොලර්

FAIR COMMENT BY JEZEEM

මිලියන 5 ක මුදලක ඩමී එකක් පිරිනැමුවා මේ විපතට පත් ජනතාව වෙනුවෙන් අපේ දායකත්වය ලබාදෙනවා කියලා ස්වාමීනි. ඔය කරුණ තමයි අපි ඔතන සඳහන් කළේ ස්වාමීනි නමුත් ඒක කිසිම දායකත්වයක් ජනතාවට ලැබුණේ නැහැ ස්වාමීනි ඒ කාලේ හිටපු ඒ අදාළ වගකිව යුතු පුද්ගලයන්ගෙන් ස්වාමීනි. ඒක නිසා තමයි අපි සාක්ෂි දෙද්දි මා ඔය කරුණ ගැන සඳහන් කළේ.

ප්‍ර: ඉතිං ඔබ වහන්සේ පොඩ්ඩක් සොයලා බැලුවද මොකද වෙලා තියෙන්නේ කියලා?

පි: ඔව් එහෙමයි ස්වාමීනි රදගුරුතුමා අපි සොයලා බැලුවා රජයට කීප විටක්ම කිව්වා ඒ වගේම අමාත්‍යයවරුන්ටත් කිව්වා මේ ගැන සොයන්න කියලා. ඊට පස්සේ අදාළ ජනාධිපතිතුමාටත් ඒ එක්තරා අවස්ථාවක දී ස්වාමීනි රදගුරුතුමා හමුවෙන්න ඇමති පිරිසක් පැමිණියා විශේෂයෙන්ම කතෝලික ඇමති පිරිසක් හමුවෙන අවස්ථාවේ මාවත් කැඳෙව්වා ඒ අවස්ථාවේ දී ප්‍රබල අමාත්‍යයවරයෙකුට රවී කරුණානායක ඇමතිවරයට කිව්වා මේ පිළිබඳව සොයා බලන්න කියලා කාදිනල් හිමිපාණන් මෙහෙම සල්ලි ආවා ආවද නැද්ද ආවනම් ඒ වලින් මොනවද කළේ කියලා. ඒ අවස්ථාවේ දී එතුමා යම්කිසි කෙනෙකුට දුරකථන ඇමතුමක් දුන්නා ඒ කෙනා අපිට ඇහුණේ නැහැ ස්වාමීනි කාටද කියලා එතුමා කිව්වා එහෙම දෙයක් තාම නැහැ හොයලා බලලා කියන්නම් කියන දේ තමා රදගුරුතුමාට ආපහු ඒ ඇමතිවරයා දුන්න පිළිතුර. ඒ මේ රජය තියෙන කොට නෙමේ පෙර රජය තිබියදී තමා ස්වාමීනි ඒ පිළිබඳව විමර්ශනය කළේ කවුරුත් අපිට ඒකට රදගුරුතුමා ඉල්ලීමක් කරත් මේ වනතුරුත් අපිට පිළිතුරක් ඇවිල්ලා නැහැ. මේ වනතුරුත් ඒ පිළිබඳව තාම අපිට කිසිම සාක්ෂියක් නැහැ කියන්න තියෙන හැමකෙනාටම කිව්වා ස්වාමීනි.

ප්‍ර: ඒ නිසයි ඔබ වහන්සේ ඔබතුමන් හිතුවේ අපිට කියන්න ඕන කියලා කොමිසමට ?

පි: අනිවාර්යෙන්ම.

ප්‍ර: ඒ එක්කම ඔබතුමන්ගෙන් විමසන්න කැමති දැන් මේ අගතියට පත් අයගේ පවුල්වල අය ණය ලබාගෙන තිබුණා. ලීසිං තිබුණා, ෆිනෑන්ස් පහසුකම් ලබාගෙන තිබුණා. ඒ අය මේ අසනීප වෙලා රෝගබාධ මේ ආබාධිත වෙලා දීර්ඝ කාලීනව මේ ඔත්පලවෙලා ඉන්න කොට ඒ අයගේ මේ මූල්‍යයම ගෙවීම් තිබෙන ඒවා ඒ කරන්න ක්‍රමයක් නැහැ කියලා ඔබ වහන්සේ ඒ පිළිබඳව අවධානයක් යොමු කරාද?

පි: එහෙයි ස්වාමීනි. අපි කොමිසන් සභාවටත් කිව්වා. ඒකෙදි ස්වාමීනි අපේ මේ සහන සේවාවේ ස්වාමීනි මිලියන ගණන් තමයි ලෝන්ස් සහ ණය මේ විපතට පත්වෙච්ච පවුල්වල තිබුණේ. එතකොට අපි ඒක Priority එකේ ප්‍රමුඛතාවයට ගත්තේ නැහැ ස්වාමීනි අපිට මුල් කාලයේ එච්චර මුදලක් ලැබිලා තිබුණේ නැහැ ස්වාමීනි . දැන් මේ පවුල් තියෙනවා

FAIR COMMENT BY JEZEEM

ස්වාමීනි 36% පොළියට මිලියන 15 ක් ගත්තු පවුලකුත් තියෙනවා ස්වාමීනි තමන්ගේ ව්‍යාපාර කටයුත්ත කරගෙන යන්න ඒ පවුලත් අගතියට පත්වුණා ආව්චි තුවාල වුණා. දියණිය මැරුණා. හැබැයි ඒක අරන් තියෙන්නේ ස්වාමීනි මේ පෞද්ගලික ආයතනයකින්. Brescia Finance Company කියන මීගමුව ප්‍රදේශයේ ප්‍රසිද්ධ තැනකින්. ඒකට කිසිම Document එකක් නැතුව මූල්‍යමය දායකත්වය දෙනවා හැබැයි 36% ක පොළියට ස්වාමීනි. මේ අය කරන ව්‍යාපාරයත් එක්ක මේක ගෙවීම් කරගෙන ගියා ස්වාමීනි. නමුත් මේ සිදුවීමත් එක්ක ඒ ගොල්ලොන්ට වෙච්ච විපත්ති සහ ඒ ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම කඩා වැටුණා ස්වාමීනි. ඒ අවස්ථාවේ දී ඒ ගොල්ලෝ ගොඩාක් අසරණ වුණා. මේ තමන්ට හිමි ඉඩම පවා අහිමිවෙච්චි කියලා. අපිත් ස්වාමීනි කතාකරා ඒ අදාළ ආයතනවලට මේ ගොල්ලොන්ට සහනයක් දෙන්න කියලා. ඒ ගොල්ලො දුන්නේ Period එකක් විතරයි. අපි රජයට යොමු කරා මේ වගේ ආයතන කවුද අවසර දුන්නේ 36% පොළියකට ගන්න කියලා. අපි ඒක රජයට එවකට සිටි රජයටත් අපි යොමුකරා. මේ වගේ ප්‍රශ්න තියෙනවා කියලා. ඉතිං ඒ වගේ පවුල් කිහිපයක් තියෙනවා ස්වාමීනි මා ළඟ දැනටත් තියෙනවා ස්වාමීනි. ඒකේ ලේඛණය විපතට පවුල් වල ණය විස්තරය. අපිට පුළුවන් දේවල් සමහර අය ස්වාමීනි පෙලක් අය කිව්වා ස්වාමීනි ඒ පවුලේ ණය වෙනුවෙන්ම මේ දෙන මුදල වියදම් කරන්න කියලා. එහෙම වියදම් කරලා ණය නිදහස් කරපු කිහිපදෙනෙකුත් ස්වාමීනි අපේ ලැයිස්තුවල ඉන්නවා. නමුත් මා සතුව තියෙන මේ ටිකේ තාමක් මේ ගොල්ලෝ නිදහස් වෙලා නැහැ ස්වාමීනි නිවාස ණය තියෙනවා. ඒ වගේම තාමත් අපේ ඉන්නවා නාවික හමුදාවේ සොල්දාදුවෙකුත් කොව්චිකඩේ සිද්ධස්ථානයේ දී මියගියා ස්වාමීනි. බෞද්ධ දරුවෙක්. එතුමාගේ හරිම සෝචනීයයි. එයා හැමදාම අපි දකිනවා මේ අන්තෝනි මුනිද්‍රයා සහ මේ විශේෂයෙන්ම කොව්චිකඩේ සහ නාවික හමුදාව අතර ලොකු සම්බන්ධතාවයක් අතීතයේ ඉදම්ම තියෙනවා ස්වාමීනි. සෑම නාවික හමුදාවේ කෙනෙක්ම මොන ආගමක හිටියත් එතැන්ට ගිහිල්ලා තමයි ඒ ගොල්ලෝ නෞකාවේ යන්නේ. ඉතිං මේ දරුවත් ඒ වගේම තමයි. අන්න ඒ දරුවගෙත් අපිට තියෙන තොරතුරු අනුව ණයක් තියෙනවා ස්වාමීනි තවත් ඒ වගේ තියෙන ණය ලැයිස්තුව මා සතුව තියෙනවා. ඉතිං මම රදගුරු හිමිපාණන් මීට මාසෙකට මේ Covid වලට එන්න පෙර බ්‍රහස්පතින්දා අග්‍රාමාත්‍යවරයා සමඟ රැස්වීමක් පවත්වලා මේ කරුණු කාරණා ඉදිරිපත් කරා ස්වාමීනි. විශේෂයෙන්ම ප්‍රශ්න කිහිපයක් තියෙනවා මේ ජනතාවගේ එකක් තමයි මේක. ඊළඟ ප්‍රශ්නය තමයි නිවාස ප්‍රශ්නය. ඒ එවකට හිටි රජය පොරොන්දු වුණා ස්වාමීනි රදගුරු හිමිපාණන්ට කටුවාපිටියේ අවතැන් වෙච්ච ජනතාව කුලියට ඉන්නව නම් ඔබ වහන්සේ අපිට ඉඩම් අරන්දෙන්න අපි ගෙවල්

FAIR COMMENT BY JEZEEM

හදලා දෙනවා කියලා ස්වාමීනි. මිලියන 50 ක් වියදම් කරලා මිලියන 50 යි දශම 05 ක් වියදම් කරලා ස්වාමීනි ඉඩම් දෙකක් අපි කටුවාපිටිය ප්‍රදේශයේ මිලදී ගත්තා. මිලදී අරගෙන මුල්ගලත් තිබ්බා ස්වාමීනි. ඒ ඒ ගොඩනැගිලි සියල්ලම සූදානම් කරා නිවාස සංවර්ධන අධිකාරියත් එක්ක මේ ඔක්කොම Block කරලා මුල්ගල් තියලා නිවාස ටික හදාගෙන යන්න. එතකොට නිවාස ඒ නැති දැනටත් කුලියට ඉන්න පවුල්වල ස්වාමීනි. එතකොට ඒකත් තව ප්‍රශ්නයක් ස්වාමීනි අපිට තිබෙන. ඉතිං මා කැමති ඔබතුමන්ලගේ අවධානය මේ පවුල් කිහිපයට සහ මේකට සමාවෙන්න මම කියන්න ගිය කරුණ අග්‍රාමාත්‍යතුමාටත් මේ ලේඛන අපි භාර දුන්නා. අග්‍රාමාත්‍යතුමා ඉල්ලීමක් කරා ඒ අවස්ථාවේ හිටියා මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාට උපදෙස් දුන්නා මේ ලැයිස්තුවට කරුණාකරලා Waive off කරන්න කියලා ඒ අදාළ ආයතනවලින් ඉල්ලීමක් කරන්න කියලා ස්වාමීනි. නමුත් අවාසනාවකට කෝවීඩ් එකත් එක්ක මේ ඒ ලැයිස්තුවට කිසිම පිළිතුරක් තාම ලැබිලා නැහැ මේ පවුල්වලට ස්වාමීනි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය.</u>

කටුවාපිටිය සහ කොච්චිකඩේ පල්ලිවල අගතියට පත් පවුල්වලට අදාළව පැවති ණය ප්‍රමාණයන් සඳහන් කරමින් පැහැදිලි කිරීම කරන ලද පියතුමන් විසින් එම පැහැදිලි කරන ලද කරුණු ඇතුළත් ලේඛනය එහි සාරාංශය සහිත මුල් ලේඛනය C 739 වශයෙන්ද සලකුණු කිරීමටත් එම 739 ලේඛනයට අමුණා ඇති නම් වශයෙන් සහ ගෙවන ලද මුදල්වල කරුණු ඇතුළත් වූ පිටු දෙකකින්යුත් ඇමුණුම C 739 A වශයෙනුත් සලකුණු කිරීම සඳහා අවසර අයැඳ සිටිනවා.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර: පියතුමිනි මගේ අවසාන ප්‍රශ්නය. සබරගමුව විශ්ව විද්‍යාලයේ වෛද්‍ය ශිෂ්‍යාවක් සම්බන්ධයෙන් යම් ගැටලුවක් ඔබ වහන්සේලා මතු කරලා තිබ්බා.

පි: එහෙයි ස්වාමීනි.

ප්‍ර: ඒක ගැන පැහැදිලි කිරීමක් කරන්න.

පි: එහෙයි ස්වාමීනි.එම පවුලේ ස්වාමිපුරුෂයා ප්‍රසිද්ධ මේ බෝම්බ පිපිරීමේ ප්‍රසිද්ධ හෝටලයක Restaurant Manager විදිහට සේවය කරපු නිමල් සොයුරාගේ දියණිය. එම පියා මිය ගියා blast එකෙන්. හැබැයි දේවස්ථානයේ නෙමෙයි ස්වාමීනි. නමුත් ඒ කතෝලිකයෙක්. ඒවගේම අවසානවන්ත සිදු වීමක් අය ඔහුට වැඩට යන්න තියෙන්නේ හවස. නමුත් මේ සුවිශේෂී දිනය නිසා ආගමික වැඩකටයුත්තක් හවස කරන්න තියෙන නිසා මෙයා ෂිෆ්ට් එක මාරු කර ගන්නවා. උදේට යනවා වැඩට. පාන්දර

FAIR COMMENT BY JEZEEM

4 වැඩ මුරයට යනවා. හවස තිබිච්චි එක වෙනස් කරලා. එතකොට තමයි බෝම්බයට ලක් වෙන්නේ. හවස ආයේ එතුමා බාරව ඉන්නේ එම ප්‍රදේශයේ තියෙන දේවස්ථානයේ වැඩ කටයුත්තක්ට නියැලෙන්න තිබෙන නිසා තමයි මේ පියා උදේ වරුවට යන්නේ. ඉතින් මේ පියා මිය යනවා. මේ පියාගේ පවුලේ ඉන්නේ භාර්යාවයි දියණියන් දෙදනෙකු තමයි. එතකොට ඒක සිදු කාලයේ වැඩිහිටි දියණිය ස්වාමීනි සබරගමු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පළවෙනි ශ්‍රේණියේ ඉගෙනු ලබන ශිෂ්‍යාවක් විදිහට ඉන්නේ. එතකොට මේ විපත් එක්ක මේ පවුලට දරා ගන්න බැරි වේදනාවක් ඇති වුණේ පුදුමාකාර බැඳීමකින් හිටිය පවුලක් විදිහට තමයි. මේ පවුල සඳහන් කරන්නේ. ඒකට හේතුව මේ පවුල පවුල් ව්‍යාපාරය කියන කතෝලික සභාවේ ව්‍යාපාරයක් තිබෙනවා ස්වාමීනි. ඒගොල්ලෝ හරිම පවුල් ජීවිතය පිළිබඳව සුහදව දකින හරිම එකමුතු ජීවිතක් ගත කරන්නේ. ඒ පවුල් ව්‍යාපාරයේ සිටින උපදේශක යුවලක් තමයි මේ යුවල. මේ යුවලගේ ජීවිතයේ සුවිශේෂි දෙයක් තමයි කිසිදාක තරහා වෙලා නින්දට යන්නේ නැති යුවලක්. ඒවගේම තමයි මේ දරුවෝ දෙදෙනා හැසිරෙන්නේ දෙමාපියොත් එක්ක හැසිරෙන්නේ හරිම යාළුවෝ වගේ කිසි රහසක් නැහැ. අන්න එවන් පසුබිමක මේ භාර්යාවට මේක දරා ගන්න බැරිව ස්වාමීනි රෑට නිදා ගන්නේ නැති ස්වාභාවයක් තිබුණා ස්වාමීනි. ඒ නිසා වෛද්‍යවරු ප්‍රතිකාර කරා ගොඩ ගන්න අමාරු වුණා. උපදේශනයට යොමු කරා. මේ මව දවසින් දවස පුදුමාකාර පීඩාකාරී තත්ත්වයකට පත් වෙලා දිවිනසා ගන්න මට්ටමකට ආවා. එතකොට අපිට උපදෙස් දුන්නා Counselorsලා පුළුවන්නම් මේ වැඩිහිටි දියණිය දෙවැනි දියණිය 9 ශ්‍රේණියේ ඉගෙන ගන්න කුඩා දියණියක්. ඒ දියණිය අම්මාව කොච්චර සනසන්න බැරි වුණා. මේ වැඩිහිටි දියණියව ගෙදර තියාගෙන මේ අධ්‍යාපන කටයුතු කරන්න. දැනට ඒ කාලේ වෙද්දී ස්වාමීනි ඒ දියණිය එහෙ නතර වෙලා තමයි ඒ උසස් අධ්‍යාපනය කරගෙන ගියේ. අපි ඉල්ලීමක් කරා ස්වාමීනි එතකොට UGC එකටත් ඉල්ලීමක් කරා පුළුවන්නම් මේ ප්‍රදේශයේ උදේ හවස යන්න පුළුවන් තැනකට වෛද්‍ය විද්‍යාලයකට මේ දියණියව ලබා දීලා මේ ගෙදරට සහනයක් දෙන්න කියලා ස්වාමීනි. ඊට පස්සේ ඒකට අපිට පිළිතුරක් ලැබුණේ නැහැ ස්වාමීනි. ඉතින් ඒක නිසා තමයි කොමිෂන් සභාවට ඒ ප්‍රශ්නයත් යොමු කළේ. අපි විශේෂයෙන්ම ලේකම්තුමාට පෞද්ගලිකව ලිපියකුත් යොමු කරා ස්වාමීනි. මේ අපේ ජනාධිපති පරීක්ෂණ කොමිසම් සභාවේ ලේකම්තුමාට මේ පිළිබඳව පුළුවන් හැකියාවක් තිබෙනවානම් ඒ දියණියව මේ කොළඹ ප්‍රදේශයට ගන්න කියලා. දැන් වෙනකොට ස්වාමීනි තත්ත්වය ගන්න බැරි වුණා. නමුත් ඥාති සොයුරියක් මේ ගෙදර ඉන්න නිසා අම්මා යම්කිසි මට්ටමකට ගොඩ ඇවිල්ලා තිබෙනවා. නමුත් රෑට නින්ද යන්නේ නැති තත්ත්වයක් තිබෙන්නේ. රෑට බෙහෙත් පෙති දීලා තමයි තිබෙන්නේ. ඇගේ මානසික මට්ටම තාමත් අර මුල් කාලයට

FAIR COMMENT BY JEZEEM

වඩා යම්කිසි මට්ටමකට හොඳයි. මේ කාලේ දියණිය ගෙදර ඉන්න නිසා ස්වාමිනි මේ මාස 3ක කාලයේ දී යම්කිසි වෙනසක් මේ මවගේ සහ කුඩා දියණියගේ තිබෙනවා. නමුත් අපි ඉල්ලීම කරන්න කැමැතියි ඒ දියණිය ඒ විශ්ව විද්‍යාලයේ Batch වෙලා තමයි ස්වාමීනි ඉන්නේ. ඉතින් අධ්‍යාපනයෙන් ඉහළට යනවා. මේ වේදනාවන් ඔක්කොම තියාගෙන. මේ මරණ වෙලා , දානගෙවල් තියාගෙන මේ දේවල් එක්ක දක්ෂ දියණියක් ස්වාමීනි. නමුත් ඇයව Select වෙලා තියෙන්නේ ඒ විශ්ව විද්‍යාලයට.

හොඳයි ඒ සම්බන්ධයෙන් සළකා බලන්නම් බොහොම ස්තුතියි.

****

<u>ගරු විනිසුරු බන්දුල අතපත්තු මැතිතුමා</u>

ප්‍ර: ගරු පියතුමනි දැන් මේ දෙමාපියන් අහිමි වෙච්ච බාල වයස්කාර දරුවෝ එහෙම ඉන්නවද?

පි: එහෙයි ස්වාමීනි එක පවුලක් එහෙම ඉන්නවා ස්වාමීනි. ඒගොල්ලෝ මගේ මතකය ස්වාමීනි කොච්චිකඩේ එකේ තමයි අම්මා තාත්තා දෙන්නාම අහිමි වෙන්නේ. ඒගොල්ලන්ට අපි නීතිමය උපදෙස් දීලා තියෙනවා ස්වාමීනි භාරකරුවෙකු පත් කරගන්න කියලා ඥාතීන්ට. එතන පොඩි ආරවුලක් තියෙනවා. මාමා කෙනෙක් සහ නැන්දා කෙනෙක් මේ දරුවෝ දෙදෙනා භාර ගන්න යනවා. හැබැයි එක දරුවෙක් ස්වාමීනි අවුරුදු 17යි. දැන් 18යි. අනිත් දරුවා අවුරුදු 15යි වගේ ඉන්නේ ස්වාමීනි. එතකොට ඒ දෙදෙනා අතර පුංචි කඹ ඇදිල්ලක් තියෙනවා ස්වාමීනි. ඒ නැන්දා සහ මාමා අතර. අපි නීතියට යොමු කරා අපේ නීති කමිටුවක් ඉන්නවා ස්වාමීනි. නීති උපදෙස් දුන්නා මේ දේ කොහොමද කරන්නේ කියලා.

ප්‍ර: දැන් එතෙක් ඒ ළමයි කොහොමද ජීවත් වෙන්නේ?

පි: ස්වාමීනි අපි මාස පතා එගොල්ලන් දෙදෙනාට නැන්දා කෙනෙක් යටතේ තමයි ඉන්නේ ස්වාමීනි දැනට. දැන් මුල්‍යමය ආධාරයක් ලබාදෙනවා. ඒ දරුවෝ දෙන්නාගේ අධ්‍යාපනය වෙනුවෙන් අපි ශිෂ්‍යාධාර වැඩසටහනක් සුදානම් කරලා තියෙනවා. මේකට මේ පවුල් 382කටම ඒ පවුල් වල ඉන්න දරුවන්ගේ සාමාන්‍ය උසස් පෙළ දක්වා දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් ශිෂ්‍යාධාර වැඩ සටහනක්. ඒ වැඩසටහන තුළින් ඔවුන්ට මාස්පතා යම්කිසි මුදලක් එක එක වයස් බාණ්ඩ අනුව ස්වාමීනි යොමු කරනවා. ඒගොල්ලන්ගේ බැංකු පොත් වලට යනවා. Guardianගේ හරි දෙමාපියන්ගේ හරි. 25%ක් ඉතිරි වෙනවා ස්වාමීනි ඒ දරුවන්ගේ. ඒක නිසා මේ දරුවාටත් ඒ මුදල යනවා. ඊට අමතරව මාසෙකට අපි යම්කිසි මුදලක් ඒ භාරකාරයෙක් විදිහට ඉන්න නැන්දාගේ ගිණුමට අපි බැර කරනවා ස්වාමීනි.

ප්‍ර: එයින් පසු විපරමක් කරන්නේ නැද්ද ඒ නියම විදිහට

FAIR COMMENT BY JEZEEM

පි: කෙරෙනවා ස්වාමීනි. ඒ පවුල ඉන්න ස්වාමීනි හැටන් ප්‍රදේශයේ. එතකොට අපේ තියෙන ඒ ජාලාගත කිරීම අනුව network එක හරහා අපේ තියෙනවා මහනුවර වසමට අයත් අපේ සෙත්සරණ වගේම ආයතනයක් මහනුවර. ඒගොල්ලන්ගේ ශාඛාවක් හරහා ස්වාමීනි මේ පවුල ඒ ප්‍රදේශයේ ඉන්න මීසම් භාර පියතුමා හරහා මේකකට ලක් කරලා ඒගොල්ලන්ගේ අවශ්‍යතාවලට යොමු කරලා තිබෙනවා ස්වාමීනි.

බොහොම ස්තුතියි පියතුමනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ගරු කොමිෂන් සභාවේ කටයුතු නැවත 2020.06.26 වන දින පස්වරු 12.30ට රැස්වේ.

දැන් වෙලාව: ප.ව.9.25

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බව පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM